
# තෙසැත්තෑ ඥාණ කථා

අති පූජනීය කැන්දලියද්දපාළුවේ
ධම්මිස්සර මාහිමි

වර්ෂ 1972



# චිරං තිට්ඨතු සද්ධම්මෝ

## පඤ්ඤාපාරමී එකතුව

2019 10 05 Paññápárami Na Uyana Free Distribution

# ආචරිය පූජා

ගම්පහ, මාලිගාතැන්නේ විවේක සේනාසනයේ ආදිකර්තෘ භූත, මහා විහාර වංශික ශ්‍යාමෝපාලි වනවාසනිකායේ ප්‍රධාන අනුශාසක ධූරීන,

අතිගරු මැණික්දිවෙල

## ශ්‍රී දේවානන්දාභිධාන

අස්මදාචාර්ය මා හිමිපාණන් වහන්සේ ගේ යහගුණයට මෙම ධර්ම පුස්තකය පූජෝපහාරයක් වේවා !

–සම්පාදක

# පිළිගැන්වීම

ශ්‍රී ලංකා සම්බුද්ධ ශාසනාරම්බරයේ වර්තමාන සමයේ උදාවූ ඔසධී තාරකාවක් බඳු මහරගම ශ්‍රී වජ්‍රඥානධර්මායතනයට මෙම ධර්මපුස්තකය ගෞරවයෙන් පිරිනැමේ.

# පැසසුම

කැන්දලිගැද්දපාළුවේ ධම්මිස්සර ස්ථවිරයන් වහන්සේ විසින් ලියන ලද තෙසැත්තෑ ඥාන වස්තු ඇතුළත් මේ පොත ලැබ මදක් කියැවීමි. පොත පිළිසෙල කොට ඇති සැටියෙන් මෙය සාමාන්‍ය මහ ජනයාට පමණක් නොව උගත් ගිහි-පැවිදි හවතුන් විසිනුත් පඨන පාඨනය කළයුතු අගනා ග්‍රන්ථයෙකැයි කිය යුතුය. හැම නුවණක් පිළිබඳ වැ මහගු විස්තරයක් එයි. පොත සකසා ඇති සැටි මනහර ය. පෙළ අටුවා ටීකා බලා මහදුත්සාහයෙන් සකසා ඇති මේ පොතෙන් කිය වන්නහුට මහත් ධර්ම ඥානයක් ලැබෙන බව පැසසුම් පෙර වුම පමසම්හ.

**බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර**

බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය
මහානායක ස්ථවිර
ශ්‍රී කඳුරාමය
උඩුඹුල්ල,
බුලත්ගම,
බලන්ගොඩ.
1972. 7. 19.

# පෙරවදන

බුද්ධ සංකල්පය ප්‍රාග් බෞද්ධ යුගය තෙක් දිවෙන්නකි. වේදාන්-තයන්හි බෙහෙවින් දක්වෙනුයේ "මුනි" සංකල්පය යි. එද විශිෂ්ය අවබෝධ ඥානයක් ලැබූ දාර්ශනිකයන් සඳහාම ව්‍යවහාර විය. "බුද්ධ කෝලාහල" යනු කලක් තිස්සේ බුදුකෙණෙකුන් වහන්සේ පිළිබඳ ජනතාව අතර හැඟීම්, පැතීම්, බලාපොරොත්තු සහගත වීම්, ඇති ක වන්නක් විය. එසේම බොරු බුදුවරුන්ගේ පහළ වීමට ද එය පිටුවහල් වූ බව, "අපිත් බුදුමු"යි තමන් ම තමන් හඳුන්වා දුන් ඒ ඒ ජනකොට්ඨාස විසින් පුදන ලද, පිළිගන්නා ලද, ශාස්තෘවරයන්ගේ පහළ වීමෙන් පිළිගත යුතුය. ඇතැම් ශාස්තෘවරු "ජින" හෙවත් කෙලෙසුන් දිනූ, කෙලෙස් නැති, අය ලෙස ශ්වේතාම්බර, දිගම්බර පැවිදි කොමස් ඇති කොට විසූ හ.

## පසුබිම

එහෙයින් ම, ශාක්‍යමුනි – මහාමුනි – සම්‍යක් සම්බුද්ධ-අනන්ත ජින ආදී නම් වලින් අප ලොවුතුරා තථාගත සම්මා සම්බුදු හාමුදුරු-වන් වහන්සේ හඳුන්වනු ලැබූ හ. බුද්ධ කාලය එන විට නානාවිධ දර්ශනවාදයන්ගෙන් දඹදිවතලය රැව් – පිළිරැව් දෙන තරම් විය. එහෙත් එපමණෙකින් නො නැවතුණු උසස් පෙළේ දර්ශනවාදීන්, ඒකාන්ත සත්‍ය දර්ශනයක් සොයමින් රට පුරා සැරිසරන්නට වූ බව, වාර්තාගත සත්‍යයකි. ඇතැමෙකු උග්‍ර තපස් ක්‍රම අනුගමනයෙන් සත්‍යය සෙවීමට උත්සාහ ගත් බව, අප බෝසතාණන් වහන්සේ පවා එසේ ක්‍රියාකාරී වූ බව, අරියපරියේසනාදි සූත්‍රාන්තයන්ගෙන් පැහැදිලි වේ.

## දර්ශන දිවාකරයාණෝ

මෙතෙක් සියලු දාර්ශනිකයන් දැක් වූ දර්ශන-පථයන් අශුද්ධ බව සකෙලෙස් සන්තානිකයන් විසින් සිතන ලද බව,

"පාතුරහොසි මගධෙසු පුබ්බෙ
ධම්මො අසුද්ධො සමලෙහි චින්තිතො"

යනුවෙන් මහවග බ්‍රහ්මයාචන කථාහි සඳහන් වේ

මෙසේ ශාශ්වත = උච්ඡේද - අහේතුකාදී නානා අන්තයන්ට වැටෙන තර්ක-විතර්කවාද දර්ශනයන්ගෙන් හැසි-ගැවසී එකෙකින් එකක් පසුබස්සවන, නිරුත්තර කරවන, පසුතලයක් පිළිසෙල වී තිබුණු සමයෙක, ඒකාන්ත සත්‍ය - දර්ශනය අවබෝධකර, දෙසීමෙන්, සම්මා සම්බුදුරජාණන් වහන්සේ අසහාය දර්ශන දිවාකරාණෝ වූ - සේක. එසේම අනිත් කිසිම ශාස්තෘවරයෙකු විසින් නො පැවසූ පරිදි,

“ඤාණං ච පන මෙ දස්සනං උදපාදි”

“මට ඥාන-දර්ශනය උපන්නේය, දෙවියන්, මරුන්, බඹුන්, මහණ බමුණන් සහිත මේ ලෝකයෙහි කිසිවෙකු විසිනුදු අකෝප්‍ය, අකම්ප්‍ය, සත්‍ය-දර්ශනය අභිනව, සුවිශාරද ව දැක්වූ-සේක. දෙසූ-සේක.

## ඥානරශ්මි

හිරු පායත් ම, අනෙකුත් සියලු ම ආලෝකයන් නිෂ්ප්‍රභ වන් නා සේ, සම්බුද්ධ ඥාන දර්ශන රශ්මීන් විහිදෙත් ම, අන්‍ය දර්ශනයන් අඳුරු වූයේ තවමත් එසේ ම ය. හැමදාමත් එසේම ය. එම සම්බුද්ධ ඥාන-රශ්මීන් ත්‍රිපිටක ධර්මයෙහි, වෙසෙසින් අභිධර්මයෙහි, එයිනුත් පට්ඨානයෙහි, ඒකරාශී වූයේ, ගැබ් වූයේ, සම්බුද්ධ ශ්‍රී ශරීරයෙන් සවණක් සම්බුද්ධ රශ්මීන් විකිරණය වන තරම් සියුම් වූ, තියුණු වූ, ගැඹුරු වූ අර්ථයෙන් සාරවූයේ ය.

## තෙ සත්තති ඤාණ.

තුන් මසක් මුළුල්ලෙහි සම්මා සම්බුදු රජාණන් වහන්සේ, අනන්‍ය සාධාරණ ඥානයෙන් දෙවියන්ට වදාළ අභිධර්මය, මිනිසුන් අතුරෙන් පළමුව ඇසූ සද්ධර්ම චක්‍රය බුදුරදුන් අනුව පවත්වන, නුවණට අගතැන්පත්, සැරියුත් මහ රහතන් වහන්සේ, එම ධර්මය “ධම්මසංගණී” ආදී ප්‍රකරණ සතක් කොට, උද්ග්‍රහණ-ධාරණය සඳහා, සිය ශිෂ්‍ය පිරිසට ප්‍රධාන වශයෙන් ප්‍රගුණ කර වූ-සේක. එසේ ම සම්බුද්ධ ඥානයන් විස්තර කිරීමට ද තමන් වහන්සේට වඩා, සුදුස්සකු නුදුටු, සද්ධර්ම සේනාපතීන් වහන්සේ සම්බුදු නුවණ විස් තර කරමින්, පටිසම්භිදා මග්ගපාළිය දෙසූ-සේක.

- එහි විස්තර වන, තුන් සැත්තෑවක් ඥානයන් මනා ව විස්තර කරමින්, මේ ධර්ම ග්‍රන්ථය අපේ ගම්පහ මාලිගාතැන්නේ විවේක සේනාසනවාසී ත්‍රිපිටකාචාර්ය කැන්දලියද්දපාලුවේ ධම්මිස්සර ස්ථවිර යන් වහන්සේ විසින් පූජ්‍යතම මැණික්දිවෙල ශ්‍රී දේවානන්ද මහා

වංශික ශ්‍යාමෝපාලි වනවාස මහා සංඝ සභාවේ අනුශාසක සවාමීන්ද්‍ර යන් වහන්සේ ගේ උපදෙස් අනුසාරයෙන් ලියන ලද අතර, මෙහි සුගැඹුරු තැන් අප සමග ද සාකච්ඡා කොට සකසන ලද බව ද, එසේම පෙරවදනක් ලියන ලෙස සාදරයෙන් ආරාධිත බවද, කෘතඥතා පූර්වකව සඳහන් කරමි.

## ගැඹුර මතුකොට

ඇසුමතින් ඉතා ගැඹුරු හැයි සිතෙන මෙම සම්බුද්ධ සදෘශ-කථා වන් මතුකෙරෙමින් සම්බුද්ධ චරිතය ද අවශ්‍ය අන්දමින් විදහා දක්වමින්, හැමට තේරෙන ලිහිල් බසින්, ත්‍රිපිටක ධර්මයන් විමසමින්, මෙකලට අවශ්‍ය අගනා ධර්ම ග්‍රන්ථයක් බෞද්ධ ජනතාව අතරට පත් කිරීම බෞද්ධ ලෝකයාගේ ප්‍රසාද ගෞරවයට භාජන විය යුතු කරුණෙකි. ත්‍රිපිටක පාලිය ම අනුව යමින් පොතට අනුරූප විස්තර යන් ඉදිරිපත් කරණ අතර, ඒ පිළිබඳ ගැටලු විසඳා දීමෙන් කර්තෘන් වහන්සේ සවකීය ධර්මඥතාය ප්‍රදර්ශනය කර ඇත.

## අවිසඳයි

එහෙත් මෙහි අප සමග සාකච්ඡා නොකළ කරුණක් පොත මුද්‍රණයෙන් පසු දක්නට ලැබිණ. පෙර වදන වනාහී ග්‍රන්ථයට පිවිසෙන දොරටුව හෙයින් විශේෂයෙන් ග්‍රන්ථයෙහි හොඳ මෙන්ම, දුර්වල තැන් ද එහි සඳහන් විය යුතුමය. එය සද්ධර්ම ශාසනයාගේ චිරස්ථිය පිණිස පවත්නේ මය.

මෙහි (13) තෙළෙස්වන පරිච්ඡේදයේ 338-341 වැනි පිටුවල දක්වා ඇති, සමාධි භාවනා හා සමාධි සූත්‍ර පිළිබඳ ධර්ම විස්තරය කෙසෙයාත් දේශනා බව පළමු ව සිහි කළ යුතුය. සමාධි භාවනාවෙන් පමණක් නොව ඥානානිසංසය ද නිවන් ලබාදෙන-පටිසම්භිදා-විමොකඛාදිය ලබා දෙන බව දේශනාවෙහි එයි. සමාධි භාවනා වඩා, නිකම් නො ඉඳ, විදර්ශනා වැඩීමෙන්, ඒ සියල්ල සිද්ධවෙයි. සමාධි සූත්‍රය පිළිබඳ කරමක විස්තරයක් කළ යුතු සේ පෙනේ.

## පුද්ගලයෝ සතර දෙනෙකි

1. අර්පණා ධ්‍යාන (චෙතොසමථ) ලාභී - අධිපඤ්ඤා ධම්ම- විපස්සනාව නො ලැබූ පුද්ගලයා.
2. අධිපඤ්ඤා ධම්ම විපස්සනා ලාභී -අර්පණා ධ්‍යාන නො ලැබූ පුද්ගලයා.

3. දෙකම නො ලැබූ පුද්ගලයා.

4. දෙකම ලැබූ පුද්ගලයා.

1. මෙහි-අර්පණා ධ්‍යාන ලාභී පුද්ගලයා එහි පිහිටා අධිපඤ්ඤා ධම්ම විපස්සනාව ලැබීම සඳහා උත්සාහ කළ යුතුය.

2. අධිපඤ්ඤා ධම්ම විපස්සනා ලාභී පුද්ගලයා එහි පිහිටා, අර්පණා ධ්‍යානය ලැබීම සඳහා උත්සාහ කළ-යුතු ය.

3. දෙක ම නො ලැබූ පුද්ගලයා දෙක ම ලැබීම සඳහා උත්සාහ කළ=යුතු ය.

4. දෙක ම ලැබූ පුද්ගලයා මතුවෙහි ආශ්‍රවක්ෂය කර ඥානය, (අර්හත්වය) සඳහා උත්සාහ කළ යුතු ය.

මෙහි දක්වන ලද අධිපඤ්ඤා ධම්ම විපස්සනාව නම්, අටලොස් මහා විදර්ශනාවෙහි දශ සතර වැනි, විදර්ශනා ඥානයයි. භංගානුපස්සනා විදර්ශනාවෙහි උපරිම අවස්ථාව ලෙස සැලකිය යුතුයි. අර්පණා ධ්‍යානයක් නො මැති ව, එතෙක් දුර විදසුන් වැඩිය හැකි බව, එම සූත්‍රයෙහි දක්වේ. යථා භූත ඥාන-දර්ශනය, ආදීනවානු දර්ශනය, ප්‍රතිසංඛ්‍යානුදර්ශනය, සහ විවෘතානු දර්ශනය යන සතර පමණකි. මේ මාර්ග-ඥානයට ඉතා කිට්ටු විදර්ශනා ඥානයන් ය.

## යානික

එතෙක් දුර සමථයෙන් ලද අර්පණා ධ්‍යානයක් නොමැතිව විදසුන් නුවණ ලැබිය හැකි බව, වටහා ගනිමින් මෙම සමාධි සූත්‍රය දක්වන ලද්දේ, යුගනද්ධ හෙවත් සමථ-විපස්සනා දෙකම, එකවර වඩා, මග නැණ උපදවන සමථ යානික පුද්ගලයා පිළිබඳ ව බව වටහා ගත යුතුව ඇත.

සමථ පුබ්බංගම විපස්සනා-විපස්සනා පුබ්බංගම සමථ=යුගනද්ධ හා ධම්මුද්ධච්ච විග්ගහිත විදර්ශනා වශයෙන් අඞ්ගුත්තර චතුක්ක නිපාතයේ ම, නව ඩිංගක් එහා පටිපදා වර්ගයේ අවසන් සුතුර බැලී මෙන් වැටහේ. එහෙයින් සර්වධර්මදර්ශී වූ, සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ ගේ නෙයාර්ථ දේශනාවන් පුද්ගලාධ්‍යාශයෙන් පවත්වන ලද මෙබඳු දේශනාවන් නීතාර්ථ කොට, සෑම පුද්ගලයකු සඳහා නො වන බව සැලකිය යුතු ය.

එම පටිපදා වර්ගයේ නව වැනි සුතුර "සසංඛාර පරිනිබ්බායී" යනු සුක්ඛ විපස්සක රහතන් වහන්සේ බව, අංගුත්තර අටුවාව කියයි.

මෙසේ විමසා බලා, සමාධි සූත්‍රයේ සමථයානිකයා විසින් යා
යුතු මාර්ගය දේශනා කර වදාළ බව=ඒ මග ප්‍රධාන මග බව = පිළිගත
යුතු ය. අනිත් සුද්ධ විපස්සනා යානිකයා අර්පණා ධ්‍යාන නො
ලබා ම විදර්ශනා වඩා මාර්ග-ඵල උපදවන ප්‍රඥා විමුක්ත පුද්ගලයා
වන්නේ ය. නො එසේ වතොත් චතුක්ක නිපාතයේ ම පටිපදා මගී
යේ නව වැනි=දස වැනි සූත්‍රයන් අස් කළ යුතු ය. එමතු ද? සංයුත්
සඟියේ සුසීමාදී සූත්‍ර රැසක් පමණක් නොව, සතිපට්ඨානයේ ඉරියා
පථ සම්පජඤ්ඤාදී පර්වයන් ද විශුද්ධි මාර්ගය සහ විමුක්ති මාර්ගය
යන අතිසම්භාවනීය භාවනා ග්‍රන්ථයන්ද අත්හල යුතු වන්නේ ය.

නෙය්‍යත්ථ දේසනා නීතත්ථ දේසනා ලෙස ගැනීම ධර්මය අධර්මය
කර දක්වීමක්, බුදු සසුනට පහර ගැසීමක්, බුදුරදුනට ගැරහීමක්
බව දේශනා කර ඇත. එසේම මිථ්‍යාදර්ශනයට වැටීමෙන් ඉබේ ම
සසුනෙන් බැහැර වීම ද වන්නේ ය,

“පුඤ්ඤානි පරලෝකස්මිං—පතිට්ඨා හොන්ති පාණිනං”
“පුණ්‍යයෝ ප්‍රාණීන්ට පරලොවදී පිහිට වෙත්”

මෙබඳු දේශනා මෙසේ ම පිළිගැනීම බුදු නියමය නොවේ. අර්ථය
පමුණුවා (නෙය්‍යත්ථ) දෙසිය යුතු ය. බහුල වශයෙන් පරලොව දී
පිහිට වන නමුත්, මෙලොවත් පිහිට වන පින් කොටසක් ඇති බව
යන්තම් බුදුදහම් දන්නෝ ද දනිති.

## ත්‍රිවිධ ශාසනය

ශීල සමාධි ප්‍රඥා යනු ත්‍රිවිධ ශාසනය යි. කිසිම බෞද්ධ භාවනා
නුයෝගියෙක් මේ තුනෙන් පරිබාහිර නො වේ. එහෙත් ඒවා සම්
පූර්ණ වන්නේ ක්‍රමයෙනි.

සෝවාන් පුද්ගලයා - සීලය සම්පූර්ණ කෙරේ. සමාධිය තරමකට
කෙරේ. ප්‍රඥාව තරමකට කෙරේ.

අනාගාමී - සීලයත් සමාධියත්, සම්පූර්ණ කෙරේ. ප්‍රඥාව තර
මකට කෙරේ.

රහතන් වහන්සේ-ශීල සමාධි ප්‍රඥා තුන ම සම්පූර්ණ කෙළේ වේ.

සමාධිය සම්පූර්ණ වන අනාගාමී ආර්යයන් වහන්සේ අනාගාමී
මගින් කාමරාග - පටිඝයන් ද සමුච්ඡේද කළ ලෝකෝත්තර, උසස්
අර්පණා නිපදවා ඇති හෙයින්, ප්‍රථම ධ්‍යානාදී ලෞකික ධ්‍යාන
නිපදවීම එතරම් බරෙක් නොවේ. යම් හෙයකින් සුක්ඛ විපස්සක

අනාගාමි ආයුෂ්මත් වහන්සේ කළුරිය කරන්නේ බඹලොව ශුද්ධාවාසයන්හි ඉපදිය යුතු හෙයින් මරණාසන්න මොහොතෙහි හෝ රූපාවචර චතුර්ථ ධ්‍යානලාභී වීම ධර්මතාසිද්ධ ය.

## නිගමනය

ත්‍රිපිටක ධාරී මහ තෙරවරුන් ද, පෙර ඇතැම් සූත්‍රාන්තයන් පිළිබඳ ව පැකුළුණු තැන් එමට ඇත. එහෙයින් ඉමහත් ශ්‍රද්ධා-ගෞරවයෙන් ත්‍රිපිටක ධර්මයෙහි හසළ දැනුමක් ලබා සම්භාවනීය උතුමන් ඇසුරු කරක නමුදු, මේ බඳු තන්හි යම් පැකුළුම්=හැකුළුම් ඇතිවීම පුදුමයක් නො වේ. එහෙයින් මතුත් යෝගාවචරයන් මෙම ප්‍රශ්නයෙහි නො හැප්පෙනු පිණිස, පට්ඨාන පාළියෙන් කරුණු දක්වා මෙය සනාථ කළ යුතු බව වැටහේ. ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලයෝ ද සප්‍රත්‍යය කාම ධර්මයෝ ය. ධ්‍යාන ප්‍රත්‍ය-මාර්ග ප්‍රත්‍යාදී ප්‍රත්‍ය ශක්තීන් සූවිසි ප්‍රත්‍යයෙහි ලා ඇතේ. ඒ ඒ ධ්‍යාන මාර්ග සිත්හි සහජාත නාමධර්මයෝ ම ප්‍රත්‍ය-ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. මෙහි ලා උපනිඃශ්‍රය ප්‍රත්‍ය ශක්තිය ප්‍රමාණ වශයෙන් ගතුයුතු ය. "කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො" යන විපි පාළියට දෙන ලද අනුවාදයෙහි ප්‍රකෘති-උපනිඃශ්‍රය, කාමාවචර කුසල් තවත් කාම කුසලයන්ට ද, රූපාවචර කුසල් රූපාවචර කුසලයන්ට හා අරූපාවචර කුසලයන්ට ද උපනිඃශ්‍රය ප්‍රත්‍යය වන සැටි වදරා ඇත. එහෙත් රූපාවචර හෝ අරූපාවචර කුසල් ලෝකෝත්තර කුශලයන්ට උපනිඃශ්‍රය ශක්තිය ලබා නොදේ.

"පඨමං ඣානං – දුතියස්ස ඣානස්ස
දුතියං ඣානං – තතියස්ස ඣානස්ස
තතියං ඣානං – චතුත්ථස්ස ඣානස්ස
චතුත්ථං ඣානං – ආකාසානඤ්චායතනස්ස
ආකාසානඤ්චායතනං – විඤ්ඤාණඤ්චායතනස්ස
විඤ්ඤාණඤ්චායතනං – ආකිඤ්චඤ්ඤායතනස්ස
ආකිඤ්චඤ්ඤායතනං – නෙවසඤ්ඤානාසඤ්ඤායතනස්ස
උපනිස්සය පච්චයෙන පච්චයො"

මෙසේ වදාරා යම්සේ ප්‍රථම ධ්‍යානයට එම පරිකර්මාදී (කාමාවචර) භාවනා උපනිඃශ්‍රය වේද, එසේම ලෝකෝත්තර ප්‍රථම ධ්‍යානයවූ සෝවාන් මාර්ග සිතට එම විදර්ශනා පරිකර්මය ම (කාමාවචර) උපනිඃශ්‍රය ශක්තිය ලබා දෙන බව දක්වා වදාළ සේක.

"පඨමස්ස මග්ගස්ස පරිකම්මං පඨමස්ස මග්ගස්ස
උපනිස්සය පච්චයෙන පච්චයො"

සනාදීන් ප්‍රථම මාර්ගයට පරිකර්ම වශයෙන් උපදනා විදර්ශනා ඥාන සිත් ප්‍රථම මාර්ග සිතට උපනිඃශ්‍රය ශක්තිය ලබා දේ. යම් හෙයකින් අර්පණා ධ්‍යාන නොමැතිව සෝවාන් ආදී මාර්ග ඵල ධර්ම උපදවිය නො හැකි නම්,

“පඨමං ඣාන – පඨමස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො”

යැයි වදාරණුවා නියතය. එසේ නො වදාළේ කිසි ම රූපාවචර-අරූපාවචර ධර්මයක අභිධර්ම ක්‍රමයෙන් උපනිඃශ්‍රය ශක්තිය ලෝකෝත්තර ධර්මයකට නැති හෙයින් බව සංග්‍රාහිකවයෙන් තොරව ධර්මය විමසා බැලීමෙන් නුවණින් යුතුව සම්‍යගවබෝධය ම ගරු කෙරෙත් වා! මේ නීතාර්ථ දේශනා ය.

## ලෞකික – ලෝකෝත්තර

ලෝකෝත්තර ප්‍රථම ධ්‍යානය නම්, සෝවාන් මාර්ගයයි. එය, “ලොකුත්තරං මග්ගං භාවෙති, ඣානං භාවෙති.” යනාදී විසි මහා නයෙහි ධම්මසඞ්ගණියෙහි දක්වා ඇත. ලෝකෝත්තර සිත්හි යෙදෙන්නේ ලෞකික සමාධිය නොවේ. පරිකර්මාදී කාමාවචර සිත්හි යෙදුණු සමථාදී අංගයෝ ම ලෝකෝත්තර තත්වයට පත්වෙති. සමථයානික යෝගියා ද අර්පණා-උපචාර සමාධියකින් නැගිට ධ්‍යානාංගයන් ලක්ෂණා දි වශයෙන් අරමුණු කොට එයින් වස්තු රූපය අරමුණුව කාම-රූප දෙක්හි ම විදර්ශනාව සම්පූර්ණ කොට මාර්ග සිත් උපදවා ගනී, හුදෙක් බලවත් චිත්තෛකාග්‍රතාව නිසා තියුණු වූ ඉන්ද්‍රියයන් ඇති ඔහුට විදර්ශනාව ඕජාවත් ව, බලවත් ව සිදු වෙයි.

ශුද්ධ විදර්ශකයාගේ ද විදර්ශනා සිත්හි ම ක්‍රමයෙන් දියුණු වන ඒකාග්‍රතාදිය ක්‍රමානුකූල ව ම චිත්ත විශුද්ධිය සපයා මාර්ග සිතට උපකාරි ව මාර්ගාංග සම්පූර්ණ කෙරේ. එහෙයින් “කුසලානි මග්ගංගානි සම්පයුත්තකානං ඛන්ධානං මග්ග පච්චයෙන පච්චයො” යැයි පට්ඨානයේ වදාළ සේක.

ඉහත සඳහන් සමාධි සූත්‍රයෙහි ම චිත්ත විසුද්ධිය (අර්පණා ධ්‍යාන) නො ලබා දිට්ඨි විසුද්ධි ආදිය පසු කොට අභිසඞ්ඛධම්ම විදසුන් නුවණට පැමිණි යෝගාවචරයා ගැන පැවසෙන බව සැලකිය යුතුය. චිත්ත විසුද්ධිය අර්පණාධ්‍යානය පමණක් නො වන බව එයිනුදු ඔප්පු වේ. එහෙයින් ධර්මා ධර්ම විනිශ්චයෙහි දී සාහසික නොවී, ඉතා ඉවසිලිමත් ව, සුපරීක්ෂාකාරී විය යුතුම ඇත. නැත හොත් නාගයා ගේ වල්ගෙන් ඇල්ලීම වැනි අනිටු විපාක ඇති වන බව ධර්මයෙහි දක්වේ.

## හොඳම පිළිතුර

නමකථා හෝ අන්‍යාදර්ශනයන් මෙන් වරක් දෙකක් කියවා තේරුම් ගැනීම අපහසු නිසාදෝ අභිධර්මය බමුණු ගුඩු දහමකැයි ඇතැම් උගතුන් නගන ගෝරනාඩුවට හොඳම පිළිතුර මෙබඳු ලිහිල් බසින් අභිධර්මය එළි දැක්වීම බව පැවසිය යුතුය. සැලකිලිමත් ව මෙ බඳු ගැඹුරු දහම් ගත් පරිශීලනය කළ කෙනෙකුන් විසින් නම්, කිසි දිනෙකත්, එබඳු වැරදි දෘෂ්ටීන්ට නො බසිනු ඇත. මහත් ආයාසයකින් ප්‍රබල පරිශ්‍රමයකින් මෙ බඳු ගතක් සැකසීමේ වෙහෙස දත්තෝ එබඳු ගත් සකසන්නෝ මය. එහෙයින් උගත්-නූගත්, භෝගී-අභෝගී හැමට අතිශය ප්‍රයෝජන වත් ශාසනෝපකාරී මහඟු ධර්ම ග්‍රන්ථයක් බෞද්ධ ලෝකයා වෙත ඉදිරිපත් කිරීම පිළිබඳ ව අපේ ආශීර්වාදය ත්‍රිපිටකාචාර්ය අපේ කැත්දලියැද්දපාළුවේ ධම්මිස්සර ස්ථවිරයන් වහන්සේ වෙත පිරිනමමින් හැමට ශාන්තිය පතමිය.

මෙයට,

ශාසනසප්‍රීතිකාමී,

යාගොඩ ධර්මප්‍රභ ස්ථවිර,

බෝධිග්‍රාම භාවනා මධ්‍යස්ථානය,
අලුත්ගම - බෝගමුව,
යක්කල.
25, 7. 72.

# සම්පාදකයන්ගෙන්.......

මා හදා වඩා ඇතිකළ දෙමාපියන් - භාෂා ශාස්ත්‍ර ඥාන දියුණු කරදුන් ආචාර්ය වරයන් - දුර්ලභ ප්‍රව්‍රජ්‍යාව දෙවා වදාළ, ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලා - ධර්ම ඥානය ලබා දුන් ධර්මාචාර්යයන් වහන්සේලා, සහ ශ්‍රේෂ්ඨ උත්තමයන්වත් මටත් පින් පිණිස ධර්ම පුස්තකයක් ලිවීමේ අදහස මගේ සිතෙහි පවතිද්දී, මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීම සඳහා මූලික ආරාධනය අප ගුරු දේවයාණන් වහන්සේ ගෙන් ම සිදු කෙරිණි.

ලැබුණු මාතෘකාව (සොසැත්තෑ ඥාණ කථා) අති ගම්භීර එකක් නමුත් ශක්ති ප්‍රමාණයෙන් සකස් කිරීමට මම දිරි ගතිමි. පුදුමයකි! මෙම කර්තව්‍යය මා සිතුවාටත් වඩා ඉතා කෙටි කාල සීමාවක් ඇතුළතදී (මාසනවය සි) අවසානයකට පත්විණි.

සාමාන්‍ය ධර්මයක් නමුත් පාඨක ලෝකයාට අවබෝධ වන සේ ලිවීම ඉතා දුෂ්කර බව අපි දනිමු. මෙම ග්‍රන්ථය හුදෙක් ශාන්ති නායක බුදුපියාණන් වහන්සේ ගේ අතිගම්භීර ප්‍රඥා සාගරය විස්තර වන්නක් හෙයින් කෙසේ ලියම් ද? නො හැකිමැයි. එහෙත් මා ගත් උත්සාහයේ ප්‍රතිඵල කෙතෙක් දුරට සාර්ථක විණිදැයි විමසීම ඥානවන්තයකට අයත් කර්තව්‍යයකි. මෙම ග්‍රන්ථයෙහි යම් යම් වරදක් ඇතොත් එය මට පැවරේවා! පැසසීමක් වේතොත් එය මගේ ආචාර්ය-උපාධ්‍යාය ආදී උතුමන්ට හැරේවා!

## අනුස්මෘති:

සත් පුරුෂධර්ම දියුණු කිරීමෙහි ලා රැකවරණය සලසන සම්‍යක් දෘෂ්ටික දෙව්වරු-මෙවැනි කිසකට නිසි සේ ගුණ-නැණ දෙකින් වෙළූ මාගේ ආචාර්යෝත්තම වූ අතිගරු මැණික්දිවෙල ශ්‍රී දේවානන්ද මාහිමිපාණන් වහන්සේ - උපාධ්‍යාය ධූරන්දර වූ මහා විහාර වංශික ශ්‍යාමෝපාලී වනවාස නිකායේ මහානායක, අතිගරු වතුරුවිල ශ්‍රී ඥානානන්ද මාහිමිපාණන් වහන්සේ- නිශ්‍රයාචාර්යයන් වහන්සේ වූ, ශ්‍රී වජ්‍ර ඥානධර්මායතනයේ අධ්‍යක්ෂක අතිගරු අම්පිටියේ රාහුල ස්වාමීන් වහන්සේ-ධර්ම ශාස්ත්‍රයෙහි මා ශික්ෂිතයෙකු කළ මහරගම ශ්‍රී වජ්‍ර ඥානධර්මායතනයෙහි අනුශාසක ධූරීන, අතිගරු මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ඇතුළු පූර්වකාලීන ආචාර්ය මණ්ඩලය-ආදර කරුණාවෙන් මා හදා වඩා ඇති කළ මාගේ මා පියන්-

පැවිදි වූ මුල් අවධියේ පටන් කල්‍යාණ මිත්‍ර උතුමෙකු වූ ගරු තිබ්බටුවාවේ පියනන්ද සවාමීන් වහන්සේ - ග්‍රන්ථය ගැන පැසසුමක් ලියූ අග්ගමහා පණ්ඩිත සාහිත්‍යසූරි, පූජ්‍යපාද බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක සවාමීන්ද්‍රයාණන් වහන්සේ - මෙම ග්‍රන්ථය සංශෝධනය කිරීමෙන් හා ප්‍රස්තාවනාවක් සපයා දීමෙන් මහඟු උපකාරයක් කළ අභිධර්මවිශාරද, පූජ්‍ය ශාගොඩ ධර්මප්‍රභ සවාමීන් වහන්සේ- ග්‍රන්ථ කරණ කාලසීමාව තුළදී කරුණාවෙන් ඇප-උපස්ථාන සැලැස් වූ පූජ්‍ය, කැකුළන්දෙල විජයානන්ද සවාමීන් වහන්සේ, මුද්‍රණ ආරම්භයේ සිට ම සහාය දුන්, ගරු ගිණිගත්හේනේ ඤාණසීහ ආයුෂ්මතුන් වහන්සේ හා ගරු ඇරැපොල විපස්සි ආයුෂ්මතුන් වහන්සේ - පෑස් බැලීමට සහාය වූ ගරු කඳුබොඩ විජයවංස ආයුෂ්මතුන් වහන්සේ—

මුද්‍රණ කටයුතු සඳහා මා විසින් ඉදිරිපත් කළ, නියෝජිත පින්වතුන්- ඊට ආධාර සැපයූ මාලිගාතැන්නේ විවේක සේනාසනසථ දායක මහා සභාව- ඉතාමත් ලස්සන චිත්‍රයක් හා සාරානාථ බුද්ධප්‍රතිමාවේ බ්ලොක් එකක් නොමිලේ සදා දීමෙන් මහඟු උපකාරයක් කළ, මීගමුවේ ඇන්. ඇස්. ගොඩමාන්න චිත්‍ර ශිල්පී මහතා - ග්‍රන්ථ මුද්‍රණ වියදම් දරූ සියලු පින්වතුන්-කෙටිකාලසීමාවක් තුළ දී මනා ලෙස මුද්‍රණය කර දුන් මරදාණේ සමයවර්ධන මුද්‍රණාලයේ කළමනාකාර මහතා ඇතුළු එහි සේවක පිරිස-

මෙතෙක් ගිහි-පැවිදි සත්පුරුෂ සැමදෙන කෘතඥතාවයෙන් යුක්තව පින් පවරමින් සමරමි.

අප හැමට නිවන් සුව සැලසේවා!

කැන්දලියද්දපාළුවේ ධම්මිස්සර

විවේක සෙනසුන
මාලිගාතැන්න,
බුත්පිටිය.
1972 ජූලි 25.

(සැළකිය යුතු:- ග්‍රන්ථය පරිශීලනය කරද්දී පොතෙහි අග ඇති ශුද්ධි පත්‍රය ද බලන්න.)

# ආශ්‍රිත ග්‍රන්ථ


1. පටිසම්භිදාමග්ග සිංහල පරිවර්තනය
2. පටිසම්භිදාමග්ගට්ඨකථා — සද්ධම්මප්පකාසනී
3. පටිසම්භිදාමග්ග ගණ්ඨි පදවණ්ණනා
4. විසුද්ධිමග්ග—පාලි
5. විශුද්ධිමාර්ගය—සිංහල
6. විශුද්ධිමාර්ගය—පුරාණ සන්නය
7. සඞ්ඛ්‍යාධම්මදීපිකා
8. විභඞ්ගප්පකරණ
9. ධම්මසඞ්ගණිපකරණ
10. පට්ඨානප්පකරණ, චන්ද්‍රවිමල සන්නය
11. අභිධර්මාර්ථ සඞ්ග්‍රහය
12. අභිධර්මාර්ථ පුරාණ සන්නය
13. විභඞ්ගට්ඨකථා—සම්මෝහවිනෝදනී
14. දීඝනිකාය
15. මජ්ඣිමනිකාය
16. අඞ්ගුත්තර නිකාය
17. ඉතිවුත්තක පාලි.
18. පාරාජිකා පාලි.
19. සුත්තනිපාතට්ඨකථා.
20. ධම්මපදට්ඨකථා
21. බුත්සරණ
22. ධර්මප්‍රදීපිකා
23. මහානිද්දෙසපාලි
24. ජාතකට්ඨකථා—සුමේධ කථා
25. මනෝරථපූරණී—අඞ්ගුත්තරනිකායට්ඨකථා
26. පපඤ්චසූදනී—මජ්ඣිමනිකායට්ඨකථා
27. ශ්‍රී වජ්‍රඥානසාහිත්‍යය—(පාරමීකථා)
28. අභිධර්ම චන්ද්‍රිකා
29. සූවිසි ප්‍රත්‍යධර්ම
30. අට්ඨසාලිනී—ධම්මසඞ්ගණී අට්ඨකථා

# ලක්ඛණ විඤ්ඤත්ති.

## (ලකුණු හැඳින්වීම)

| | |
|---|---|
| ප. ම. (සිං. ප.) | = පටිසම්භිදා මග්ග සිංහල පරිවර්තනය |
| වි. ම. | = විසුද්ධි මාර්ගය |
| ප. ම. අ. | = පටිසම්භිදාමග්ගට්ඨ කථා |
| අ. නි. | = අඞ්ගුත්තර නිකාය |
| පා. පා. | = පාරාජිකාපාළි |
| වි. ප. | = විභඞ්ගප්පකරණ |
| ඉ. වු. පා. | = ඉතිවුත්තකපාළි |
| ධ. සං. ප. | = ධම්මසඞ්ගණීපකරණ |
| (එ. නි) | = එකකනිපාතය ආදී වශයෙනි |
| ම. ස. සූ. | = මහා සතිපට්ඨාන සූත්‍රය |
| සු. නි. අ. | = සුත්තනිපාත අට්ඨකථා |
| අ. සං. | = අභිධර්මාර්ථ සඞ්ග්‍රහය |
| ධ. ප. අ. | = ධම්මපදට්ඨකථා |
| අ. | = අට්ඨකථා |
| ම. නි. පා. | = මහානිද්දෙසපාළි |
| ම. නි. | = මජ්ඣිමනිකාය |
| දී. නි. | = දීඝනිකාය |
| පි. | = පිටුව. |

# පටුන


| | පිටු |
|---|---|
| බුදුරජාණන් වහන්සේ | 1 |
| ඤාණනාමාවලිය | 6 |

## 1. ප්‍රථම පරිච්ඡේදය

| | |
|---|---|
| 1. සුතමය ඤාණය | 7 |
| සුතමයඤාණ පූරණය | 7 |
| සුතමයඤාණයට පදනම්වූ බුද්ධකාරක ධර්මයෝ | 10 |
| මහාපාරමිතා දසය | 12 |
| ත්‍රිවිධ චර්‍යා | 13 |
| පංචමහාපරිත්‍යාග | 13 |
| සතර සංග්‍රහ වස්තු | 14 |
| සයවැදෑරුම් අදහස් | 14 |
| මහා කරුණාව | 15 |
| බුද්ධ කාරක ධර්ම පූරණයෙහි උපාය ක්‍රමය | 16 |
| ධර්මයේ ගම්භීරත්වය | 20 |

## 2 වැනි පරිච්ඡේදය

| | |
|---|---|
| සුතමයඤාණය යනු කවරේද? | 22 |
| සුතමයඤාණයට අයත් ධර්ම රාශිය | 23 |
| "පඤ්චවිමුත්තායතනානි" | 26 |
| "ඡ අනුත්තරියානි" | 27 |
| "සත්තනිද්දසවත්ථූ" | 28 |
| "අට්ඨ අභිභායතනානි" | 28 |
| "නව අනුපුබ්බවිහාරා" | 31 |
| "දසනිජ්ජරවත්ථූ" | 32 |
| "දස කසිණ" | 33 |
| "අටළොස්ධාතු" | 35 |
| "ඉන්ද්‍රියධර්ම විසිදෙක" | 36 |

## 3 වැනි පරිච්ඡේදය

| | |
|---|---|
| "චත්තාරො ආහාරා | 40 |
| "සත්තවිඤ්ඤාණට්ඨිති" | 41 |
| "අට්ඨලොකධම්මා" | 42 |
| "අසම්මොහා" | 43 |
| "සත්ත අනුසයා" | 43 |

"නවතණ්හාමූලක" 44

"දසමිච්ඡත්ත" 46

## 4 වැනි පරිච්ඡේදය

කායගතාසතිය 48

ආනාපානසතිය 53

ඉරියවු භාවනාව 66

කුඩා ඉරියවු භාවනාව හෙවත් චතුසම්පජඤ්ඤ 68

ද්වත්තිංසාකාර භාවනාව 73

ධාතුමනසිකාරය 79

නවසීවථික භාවනා 82

ආහාරෙපටික්කූලසඤ්ඤ 84

## 5 වැනි පරිච්ඡේදය

"ඡ අනුස්සතිට්ඨානානි" 89

බුද්ධානුස්සතිය 89

ධම්මානුස්සතිය 99

සඞ්ඝානුස්සතිය 103

සීලානුස්සතිය 112

චාගානුස්සතිය 112

දෙවතානුස්සතිය 115

## 6 වැනි පරිච්ඡේදය

"සත්තබොජ්ඣඞ්ගා" 117

බොජ්ඣඞ්ග භාවනාව 134

"නවපාරිසුද්ධිපධානියඞ්ගානි" 136

## 7 වැනි පරිච්ඡේදය

"අකුප්පාචෙතොවිමුත්ති" 140

"සත්තඛීණාසවබල" 141

"නව අනුපුබ්බනිරොධා" 142

හානභාගියාදි ධම්මචතුෂ්කය 143

## 8 වැනි පරිච්ඡේදය

2. සීලමය ඤාණය 145

සීලයෙහි ආනිසංස 147

සීලයෙහි ප්‍රභෙද 149

සීලයාගේ සංකිලෙස කිළුටුවීම 183

සීල විපත්තියෙහි ආදීනව 186

සීල සම්පත්තියෙහි ආනිසංස 187

ධූතඞ්ග 190

## 9 වැනි පරිච්ඡේදය

පරියන්තපාරිසුද්ධි සීලාදි පඤ්චකය 194
සීලය පිළිබඳ විවිධ විවරණය 198
කම්පථ විස්තරය 201
ත්‍රිවිධ ශික්ෂා සහ අර්හත් මාර්ගය තෙක් ප්‍රහාණාදි පඤ්චශීලය ගමන් කරන අයුරු 207

## 10 වැනි පරිච්ඡේදය

8. සමාධිභාවනාමය ඤාණය 209
සමාධියෙහි ප්‍රභේද 210
දස පළිබෝධ 213
කල්‍යාණ මිත්‍රයා 216
චරිත විභාගය 218
කම්මට්ඨාන විභාගය 221
දස අසුභ 226
මරණසති භාවනාව 230
උපසමානුස්සති භාවනාව 236

## 11 වැනි පරිච්ඡේදය

මෙත්තා භාවනා 240
මෛත්‍රී භාවනා ක්‍රම 247
කරුණා භාවනාව 261
මුදිතා භාවනාව 263
උපෙක්ඛා භාවනාව 264
සතර ආරුප්‍ය භාවනා 267

## 12 වැනි පරිච්ඡේදය

සමථ භාවනාවට නුසුදුසු විහාර 276
පඤ්ච නීවරණ 283
පඤ්චනීවරණයක් විමසීමේ සතිපට්ඨාන භාවනාව 306
ධ්‍යාන 310
ධ්‍යාන සතරෙහි ඇති සම්පූර්ණ ශාන්තභාවය දැක්වීම සඳහා දේශනා කළ උපමා සතරක් 329

## 13 වැනි පරිච්ඡේදය

පටිසම්භිදා මග්ගයෙහි දැක්වෙන සමාධිභාවනාමය ඤාණයට අයත් විස්තර 333
විදර්ශනා යෝගීන් සඳහා සූත්‍රයක් 341

## 14 වැනි පරිච්ඡේදය

4. ධම්මට්ඨිති ඤාණය 348
ධම්මට්ඨිති 348

| | |
|---|---|
| සප්තවිශුද්ධි ක්‍රමය | 352 |
| පඤ්චස්කන්ධය | 355 |
| පඤ්චස්කන්ධයෙහි ලක්ෂණරසාදිය | 392 |
| ආයතන විභාගය | 404 |
| දිට්ඨි විසුද්ධිය | 408 |


## 15 වැනි පරිච්ඡේදය


| | |
|---|---|
| පටිච්චසමුප්පාදය | 414 |
| අවිජ්ජා පච්චයා සඞ්ඛාරා | 426 |
| සංඛාරා පච්චයා විඤ්ඤාණං | 435 |
| විඤ්ඤාණපච්චයා නාමරූපං | 446 |
| නාමරූප පච්චයා සළායතනං | 453 |
| සළායතන පච්චයා ඵස්සො | 455 |
| ඵස්ස පච්චයා වේදනා | 456 |
| වේදනා පච්චයා තණ්හා | 457 |
| තණ්හා පච්චයා උපාදානං | 459 |
| උපාදාන පච්චයා භවො | 462 |
| භව පච්චයා ජාති | 464 |
| ජාති පච්චයා ජරාමරණං | 465 |


## 16 වැනි පරිච්ඡේදය


| | |
|---|---|
| පට්ඨාන ක්‍රමය | 474 |
| පටිසම්භිදාමග්ගයෙහි දක්වෙන ධම්මට්ඨිතිඤාණ විස්තරය | 518 |
| කංඛාවිතරණ විශුද්ධිය | 519 |


## 17 වැනි පරිච්ඡේදය


| | |
|---|---|
| 5. සම්මසන ඥානය | 522 |
| මග්ගාමග්ග ඥාණදස්සන විශුද්ධිය | 524 |
| නය විදර්ශනා ක්‍රම | 530 |
| 6. උදයබ්බය ඥානය | 546 |
| 7. භඞ්ග ඥානය | 558 |
| 8. ආදීනව ඥානය | 559 |


## 18 වැනි පරිච්ඡේදය


| | |
|---|---|
| 9. සංඛාරුපෙක්ඛා ඥානය | 565 |
| ත්‍රිවිධ විමොක්ෂමුඛ | 572 |
| ආර්‍යපුද්ගලයන් සත්දෙනා | 574 |
| 10. ගොත්‍රභූ ඥානය | 575 |

11. මග්ගඤාණය 588
12. ඵල ඤාණය 590
13. විමුක්ති ඤාණය 591
14 පච්චවෙක්ඛණ ඤාණය 592

## 19 වැනි පරිච්ඡේදය

15. වත්ථුනානත්තඤාණය 596
16. ගොචරනානත්ත ඤාණය 599
17. චරියානානත්තඤාණය 596
18. භූමිනානත්ත ඤාණය 902
19. ධම්මනානත්ත ඤාණය 609

## 20 වැනි පරිච්ඡේදය

20 – 24 තෙක්
ඤාතට්ඨඤාණාදි ඤාණපඤ්චකය 619
පටිසම්භිදාඤාණනිද්දේසය 621
25. අත්ථපටිසම්භිදා ඤාණය 625
26. ධම්මපටිසම්භිදා ඤාණය 627
27. නිරුත්තිපටිසම්භිදා ඤාණය 627
28. පටිභානපටිසම්භිදා ඤාණය 628
29, 30, 31. විහාරට්ඨ – සමාපත්තට්ඨ
විහාරසමාපත්තට්ඨඤාණ 628
32. ආනන්තරික සමාධිඤාණය 633
33. අරණවිහාර ඤාණය 635

## 21 වැනි පරිච්ඡේදය

34. නිරෝධසමාපත්ති ඤාණය 640
35. පරිනිබ්බාණ ඤාණය 645
36. සමසීසට්ඨ ඤාණය 646
37. සල්ලෙඛට්ඨඤාණය 652
38. සල්ලෙඛ සූත්‍රයෙහි ඇතුලත්වූ සල්ලෙඛ ධර්ම සිවුසාළිස 653

## 22 වැනි පරිච්ඡේදය

38. විරියාරම්භ ඤාණය 658
39. අත්ථසංදස්සන ඤාණය 660
40. දස්සනවිසුද්ධිඤාණය 665
41. ඛන්තිඤාණය 667
42. පරියොගාහණ ඤාණය 668
43. පදෙසවිහාර ඤාණය 668
44 – 49 තෙක් විවට්ටඤාණ 670

## 23 වැනි පරිච්ඡේදය


50. ඉද්ධිවිධ ඥාණය 657

විකුර්වන ඍද්ධිය 693

51. සොතධාතු විසුද්ධි ඥාණය 695

52. චේතොපරිය ඥාණය 697


## 24 වැනි පරිච්ඡේදය


53. පුබ්බෙනිවාසානුස්සති ඥාණය 702

54. දිබ්බචක්ඛු ඥානය 706

පරිකර්ම භාවනා විධිය 708

දිව්‍ය චක්ෂුරභිඥානයෙහි ක්‍රියාකාරිත්වය 709

55. ආසවක්ඛය ඥානය 711

ආශ්‍රව ධර්ම 712

ආශ්‍රවයන් ප්‍රහාණය කළයුතු පිළිවෙල 714

ත්‍රිවිධ ඉන්ද්‍රියන්ගේ අවස්ථාභේද 717


## 25 වැනි පරිච්ඡේදය


56, 57, 58, 59, 60. 61, 62, 63 යන අධිකාරයන්ට
ඇතුලත්වූ චතුසච්චඥාණද්වය හෙවත්
දුක්ඛාදී අට ඥාණයෝ 719

දුක්ඛාර්ය සත්‍යය 720

දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යය 7[illegible]0

දෙවදෑරුම් සත්‍ය ඥාන 732

දුක්ඛඥාණය, සමුදය ඥාණය, නිරෝධ
ඥාණය, මග්ග ඥාණය 730

64, 65, 66, 67 අධිකා ඇතුලත්වූ සුද්ධික පටිපදා
ඥාණචතුෂ්කය 736

චතුපටිසම්භිදාවෝ 737


## 26 අවසාන පරිච්ඡේදය


ඡඅසාධාරණ ඥාන 739

68. ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥාණය 740

69. ආසයානුසය ඥානය 722


70. යමක පාටිහීර ඥානය 746

යමක ප්‍රාතිහාර්‍ය විලාශය 748

71. මහා කරුණා සමාපත්ති ඥාණය 750

72, 73. සබ්බඤ්ඤුත ඥාණය හා
අනාවරණ ඥාණය 756

චුද්දස බුද්ධ ඥාණයෝ 760



ධම්මචක්කප්පවත්තන මුද්‍රාව

# තෙසැත්තෑ ඥාණ කථා

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

## බුදුරජාණන් වහන්සේ

---

උපදීම, පැවතීම, විනාශවීම යන අඞ්ගත්‍රයකින් සමන්විත වූ පරතෙරක් නොමැති ලෝකයන් අතුරෙන් "මඟුල් සක්වල" නම් ලත් මේ ලෝකයෙහි පවා "බුද්ධ" යන ශබ්දය ඇසෙනුයේ කලාතුරකිනි. (සෙසු ලෝක බුද්ධ ශූන්‍යයයි) මේ ශබ්ද මාත්‍රය එතරම් දුර්ලභ නම් බුදුවරයන්ගේ පහලවීම අතිශයින්ම දුර්ලභ බව තේරුම් ගැනීම එතරම් අපහසු නැත. බුදුරජාණන් වහන්සේ යනු දුඃඛාදි චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් ස්වයම්භූඥානයෙන් (අනුන්ගේ උපදේශයක් නො මැතිව තමන්වහන්සේගේම නුවණින්) අවබෝධ කොට වදාළ මහා ශ්‍රේෂ්ඨයාණෝය. සකල බුද්ධිමතාණෝය. උන්වහන්සේ ලෝකයෙහි දතයුතු යම්තාක් ධර්ම ඇද්ද ඒ සියල්ල අතැ'ඹුලක් (අත්ලෙහි වූ නෙල්ලි ගෙඩියක්) සේ හැම අයුරින්ම අඩුවක් නොමැතිව දැන වදාල සේක. ශීල සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්තිඥාන දර්ශන, ආදී අනේක ගුණයන්ගෙන් උත්තරීතර වන සේක. වාසනා සහිත සියලු කෙලෙසුන් නසා ලොවට අසම වූ සේක. අසම වූ බුදුවරයන්ට සමවූ හෙයින් අසමසම නම් වන සේක. දෙව් - මිනිස් - බඹ - යක් ආදී ප්‍රභේද ගත හැම සත්වයන්ගේ සියලු දුක් නැති කොට ශාන්ති මාර්ගය පෙන්වා දුන් එකම අනුශාසකයාණෝය.

බුදුරජාණන් වහන්සේට මෙම මහගු පදවිය කුල පරම්පරාවෙන් ආවේද නැත. ධන බලය නිසාද ලැබුණේ නොවේ. මහජනයාගේ සම්ඡන්දයෙන් ආවේද නොවේ. හුදෙක් තමන් වහන්සේගේ තුබූ පාරමී කුශලයන්ගේ බලවේගයෙන් උදාවූවකි.

මේ පදවිය ලබා ගැනීම සඳහා උන්වහන්සේ කාහටත් නො හැඟෙන පරිච්ඡේදත් කල්ප ගණනාවක් ද, ප්‍රසිද්ධ ලෙස චතුරාසංඛ්‍ය කල්ප ලක්ෂයක්ද බුද්ධකාරක ධර්ම පිරූහ. මුළු කාල සීමාව අසංඛ්‍ය කල්ප ලක්ෂ විස්සෙකි. මෙය මනොප්‍රණිධාන, වාග්ප්‍රණිධාන, සුවිසි විවරණ වශයෙන් අවස්ථා ත්‍රයකින් සමන්විතය.

බෝධිසත්ව කාලයේදී කෙත් - වත් - විමත් - රන් ආදියද ඇස් - ඉස් - මස් - ලේ ද, අඹුදරුවන්ද, සිය ජීවිතයද පුදමින් දානය ද, හැම දුසිරිත් මඩිමින් හැම සුසිරිත් වඩමින් ශීලය ද, කාමයෙහි ආදීනව හා නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිශංස දකිමින් නෛෂ්ක්‍රම්‍යය ද, හැම අවස්ථාවේදීම කරදරයකට මුහුණ පාන්නේ නැතිව බුද්ධත්වය සඳහා සිදුකළ යුතු සියල්ලද සිදු කිරීමේ උපාය ඥානය යෙදීමෙන් ප්‍රඥාව ද, යහපත් දෑ සිදු කිරීමේ දී පසු බස්නේ නැතිව ඉදිරියටම යමින් වීර්යය ද, ලෝකයාගෙන් පැමිණෙන සියලු දුක් කරදර හිරිහැර විඳිමින් ක්ෂාන්තිය ද, ජීවිතය විනාශ වුවත් බොරුවක් නොකීමෙන් සත්‍යය ද, යහපත් දෑ සිදු කිරීමට තදින්ම ගන්නා අධිෂ්ඨානයද, සියලු සත්වයන් තම දරු කැල මෙන් දක්නා මෛත්‍රිය ද, ලාභාලාභාදි අෂ්ටලෝක ධර්මයන්හි නොසෙල්වෙන උපේක්ෂාවද, යන මේ දශය, පාරමී - උප පාරමී - පරමත්ථ පාරමී වශයෙන් ත්‍රිවිධාකාරයකින් යුක්තව සමත්‍රිංසත් පාරමී ධර්ම (30) වන සේ පිරූහ.

තවද ඥාතීන්ට සංග්‍රහ කිරීමවූ ඥාත්‍යත්ථචර්යාව, ලෝකයාට හිත -සුව සැලසීමවූ ලෝකත්ථචර්යාව, කරන කියන-හිතන සියලු දෑ සිය නුවණට අවහිර නොවන සේ නුවණින් සිදු කිරීම වූ බුද්ධිචර්යාව, යන ත්‍රිවිධ චර්යාව ද, සුදුසු කල දීමය, ප්‍රිය වචන කථා කිරීමය, අනුරූ කරන්නවුන්ගේ අභිවෘද්ධිය - දියුණුව-පිණිස කටයුතු කිරීමය, නිසි තන්හි සමානාත්මතාවය, යන සතර සංග්‍රහ වස්තූහු ද, උතුම් දරුවන් දීමය, ඇස් - සන් - නාසාදී ශරීරාවයව දීමය, අනඝී ධනය දීමය, උතුම් භාර්යාවන් දීමය, ජීවිත පරිත්‍යාගය, යන මහා පඤ්ච පරිත්‍යාගයන්දූයි මේ ආදී බුද්ධ කාරක ධර්ම, බොහෝ කලක් පුරුදු කටයුතු වූ දීඝ කාලාභ්‍යාසයෙන්ද; නිරතුරුව පුරුදු කටයුතු වූ නෛරන්තරාභ්‍යාසයෙන් ද හැම ලෙසින්ම සම්පූර්ණව පුරුදු කටයුතු සංකල්‍යාභ්‍යාසයෙන් ද, කීර්ති - ප්‍රශංසා අපේක්ෂාවක් නොමැති

ව තමාටත් අනුන්ටත් හිත සුව පිණිසම පුරුදු කටයුතු සත්
කෘත්‍ය,භ්‍යාසයෙන්ද; යන සතර වැදෑරුම් ක්‍රමයට පුරා, වෙසතුරු
අත් බැවෙන් පසු තුසිත දෙව් ලොව උපන්හ.

එහිදී දෙව් - බඹුන්ගේ අයැදුමෙන් පස් මහ බැලුම් බලා
ඇසළ මස පුණු පොහෝද උතුරු සල නැකතින් පිරූ පින් ඇති
සීලාදි ගුණයෙන් සමන්විත මායාදේවීන් කුස පිළිසිඳ, දුරඟ
මිණි රුවනක් සේ මව් කුස වැඩී දසමස් ඇවෑමෙන් වෙසඟ මස
පුණු පොහෝද, "ලුම්බිණි" සල් උයනෙහිදී මෙලොවට බිහිවී
මෙන් පසු, නොයෙක් රජ සැප විඳ, සසර කලකිරී, ගිහිගේ
අතහැර, තපසට ගොස්, සාවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට වෙසඟ
මැදි පොහෝ දිනකම ඇසතු බෝ මුලදී, සව් කෙලෙසුන් නසා
බුද්ධත්වයට පත්වූ සේක.

## අසහාය දර්ශන විශාරදයාණෝ.

එදා, දඹදිව අස්සක් මුල්ලක් නැර මිථ්‍යා දර්ශනවාදීන්ගේ
දේශනයන්ට සවන් දුන් මිථ්‍යා දෘෂ්ටික සමාජයක් බිහි වූ කාල
සීමාවක් විය. 'අපි බුදුවරයෝවෙමු, අපි රහත්යමු, යනාදීන් ප්‍රතිඥා
කෙරෙමින් ඒ ඒ තැන සැරි සරමින් ලෝකයා මුලාවේ දමමින්
මාසය කල ශාස්තෘවරයෝ සදෙනෙක් වූහ. ඔව්හු නම් පූරණ
කාශ්‍යපය. අජිතකේශකම්බලය, මක්ඛලී ගෝශාලය, ප්‍රකුධ
කාත්‍යායනය, සඤ්ජයබෙල්ලට්ඨිපුත්‍රය, නිගණ්ඨනාථපුත්‍රය, යන
මොව්හුය. මොවුන්ගෙන් ඇතැමෙක් අහේතුකවාදීහුය, ඇතැ
මෙක් ශාශ්වතවාදීහුය. ඇතැමෙක් උච්ඡේදවාදීහුය මේ අයුරින්
ඔවුන්ගේ මත දෙසැටක් (62) බවට පත්වීමෙන් මුළු දඹදිව
වැසියන් අතර පමණක් නොව අන් රටවල්හි වැසියන් කෙරෙහි
ද පැතිරෙමින් පැවතිණ.

ශාන්ති නායක බුදුරජාණන් වහන්සේ, තමන් වහන්සේගේ
ම ඥානයෙන් ලත් අවබෝධය මුළු දඹදිව දේශනා මාර්ගයෙන්
පතුරුවමින් ඒ සියලු මිථ්‍යා දර්ශන, ආගම්, වාද බිඳ දැමූහ.
තථාගත දර්ශනය මධ්‍යාහ්න සූර්යයා සේ දඹදිව අස්සක් මුල්ලක්
නැර විහිදීමෙන් තමන්වහන්සේ අසහාය දර්ශන විශාරදයාණෝ
වූහ. දර්ශන ආගම්වාදීහු කේශර සිංහ රාජයා දුටු ජරසිගාලයන්
මෙන් හිස් ලුහු අත දිවූහ. ඇතැමෙක් මෙලොව ඉපදීමෙන් වැඩ
නැතැයි සිය පණ නසා ගත්හ. "පූරණ කාශ්‍යප තෙමේ තාගේ
වලහම් පෙරහර තබා, තා අත නැඹු කලය හා බාන මට දෙයි,'
කියා එ දෙක උදුරා පියා හැර ගෙන පලා ගොස් කර කළය

බැඳගෙන ගග දියෙහි හී ගැලී කළ කටින් මස් පැනීස් බුබුළු නග නගා සෑදීයි ප්‍රාතිහාර්‍ය යැ කොටැ මිනැ අවීචි මහ නරකයෙහි උපන." – (බුත්සරණ 105 පිටුව)

මෙසේ සියලු දර්ශන – ආගමවාදීහු හිරු දුටු කදෝ පැණියන් මෙන් නිස්ප්‍රභ කෙරෙමින් බුදුරජාණන් වහන්සේ තම දර්ශනයේ ඇති යථාර්ථය-ඇති සැටි – කෙළ ගණන් මිනිස් ගණයාට අවබෝධ කරවීමෙන් ඔවුන් හැම සැනසිලි බවට පත් කළහ.

## මහා ගුණවතාණෝ.

ශිෂ්ට මනුෂ්‍ය සමාජය ගරු කරනු ලබන සෑම ගුණයක්ම බුදුරජාණන් වහන්සේ තම චරිතයෙන් ලොවට නිතැතින්ම විදහා පෑමෙන් මහා ගුණවතාණෝ වූහ. අනික් කිසිවෙකුට නො මැති මහා කරුණා, මෛත්‍රී, ක්‍ෂාන්ති, කෙළෙහි ගුණ සැලකීම, පූජනීය බව, ආදී විශිෂ්ට ගුණ වගාවක් තමන් වහන්සේ තුළ තුබූ බව, ඇසුරු කළවුන්ම අවබෝධ කොට ලොවට ප්‍රකාශ කිරීම නිසා ගුණයෙන් මහත් බව හෙළි විය. කුල, ජාති, ආගම ආදී කිසිදු භේදයක් නො තකා; ධර්මාවබෝධයට සුදුසු සියලු දෙන, තම දරු කැල මෙන් සිතා සමානාත්මතාවය ලොවට විදහා පෑ එකම ශ්‍රේෂ්ඨයාණෝ බුදුරජාණන් වහන්සේමය

"එක පුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජන සුඛාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං, කතමො එකපුග්ගලො? අරහං සම්මා සම්බුද්ධො" – අ. නි., එ. නි.

මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස, සැප පිණිස, දෙව් මිනිසුන්ට වැඩ පිණිස, හිත පිණිස, මේ ලෝකයෙහි එක් පුද්ගලයෙක් උපදියි. ඒ කවරහුද යත්? අර්හත් වූ සම්‍යක් සම් බුදු රජාණන් වහන්සේ ය.

## මහා ඥාණවතාණෝ;

ලෝකයෙහි දතයුතු යම්තාක් සවිඤ්ඤාණක, අවිඤ්ඤාණක, – සිත් ඇති – නැති – වස්තු භේද, ඒ සියල්ල අඩු වැඩි නැතිව හැම ලෙසින්ම දැනගත් එකම උතුමාණෝ බුදුරජාණන් වහන්සේයැ. උන්වහන්සේගේ ඥානය දතයුතු දෙයෙහි කෙළවර තෙක්ම පැවතිණ. පෙරලා දතයුතු සියල්ල ඥානයෙහි මුල් කෙළවර තෙක්ම පැවතිණ. එයින් කීහ සැරියුත් හිමියෝ; "යාවතකං ඤෙය්‍යං

තාවතකං ඤාණං, යාවතකං ඤාණං, තාවතකං ඤෙය්‍යං, ඤෙය්‍යස්ස පරියන්තකං ඤාණං, ඤාණ පරියන්තකං ඤෙය්‍යං"= මහා නිද්දෙස පාලි"

අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයට අයත් සියලු ධර්ම විෂයෙහි උන්වහන්සේගේ ඥානය විදහා පැවතිණ. හැම ක්‍රියාවක්ම ඥානාන්විතය. නුවණට අනුවය. මෙහයින් බලන කල බුදුරජාණන් වහන්සේ මහා පැණවතාණෝ බව අවිවාදයෙන් පිළිගත හැක.

බුදුරජාණන් වහන්සේ තුල තුබූ ඒ ඤාණ සමුදය අතුරෙන් මේ ග්‍රන්ථයෙන් හෙළිවනුයේ "පටිසම්භිදාමග්ග" පාලියෙහි ආ සැත්තෑ තුනක් වූ ඥාන විශේෂයෝ යි.

## ඤාණ නාමාවලිය

1. සුතමය ඤාණය
2. සීලමය ඤාණය
3. සමාධි භාවනාමය ඤාණය
4. ධම්මට්ඨිති ඤාණය
5. සම්මසන ඤාණය
6. උදයබ්බයානුපස්සනා ඤාණය
7. භඞ්ගානුපස්සනා ඤාණය
8. ආදීනව ඤාණය
9. සංඛාරුපෙක්ඛා ඤාණය
10. ගොත්‍රභූ ඤාණය
11. මග්ග ඤාණය
12. ඵල ඤාණය
13. විමුත්ති ඤාණය
14. පච්චවෙක්ඛණ ඤාණය
15. වත්ථුනානත්ත ඤාණය
16. ගොචරනානත්ත ඤාණය
17. චරියානානත්ත ඤාණය
18. භූමිනානත්ත ඤාණය
19. ධම්මනානත්ත ඤාණය
20. ඤාතට්ඨ ඤාණය
21. තීරණට්ඨ ඤාණය
22. පරිච්චාගට්ඨ ඤාණය
23. එකරසට්ඨ ඤාණය
24. ඵුසනට්ඨ ඤාණය
25. අත්ථපටිසම්භිදා ඤාණය
26. ධම්මපටිසම්භිදා ඤාණය
27. නිරුත්තිපටිසම්භිදා ඤාණය
28. පටිභානපටිසම්භිදා ඤාණය
29. විහාරට්ඨ ඤාණය
30. සමාපත්තට්ඨ ඤාණය
31. විහාරසමාපත්තට්ඨ ඤාණය
32. ආනන්තරිකසමාධි ඤාණය
33. අරණවිහාර ඤාණය
34. නිරොධසමාපත්ති ඤාණය
35. පරිනිබ්බාණ ඤාණය
36. සමසීසට්ඨ ඤාණය

37. සල්ලෙඛට්ඨ ඤාණය
38. විරියාරම්භ ඤාණය
39. අත්ථසංදස්සන ඤාණය
40. දස්සනවිසුද්ධි ඤාණය
41. ඛන්ති ඤාණය
42. පරියොගාහණ ඤාණය
43. පදෙසවිහාර ඤාණය
44. සඤ්ඤාවිවට්ට ඤාණය
45. චෙතොවිවට්ට ඤාණය
46. චිත්තවිවට්ට ඤාණය
47. ඤාණවිවට්ට ඤාණය
48. විමොක්ඛවිවට්ට ඤාණය
49. සච්චවිවට්ට ඤාණය
50. ඉද්ධිවිධ ඤාණය
51. සොතධාතුවිසුද්ධි ඤාණය
52. චෙතොපරිය ඤාණය
53. පුබ්බෙනිවාසානුස්සති ඤාණය
54. දිබ්බචක්ඛු ඤාණය
55. ආසවක්ඛය ඤාණය
56. දුක්ඛ ඤාණය
57. සමුදය ඤාණය
58. නිරොධ ඤාණය
59. මග්ග ඤාණය
60. දුක්ඛ ඤාණය
61. දුක්ඛසමුදය ඤාණය
62. දුක්ඛනිරොධ ඤාණය
63. දුක්ඛනිරොධගාමිනී පටිපදා ඤාණය
64. අත්ථපටිසම්භිදා ඤාණය
65. ධම්මපටිසම්භිදා ඤාණය
66. නිරුත්තිපටිසම්භිදා ඤාණය
67. පටිභානපටිසම්භිදා ඤාණය
68. ඉන්ද්‍රියපරොපරියත්ත ඤාණය
69. ආසයානුසය ඤාණය
70. යමකපාටිහීර ඤාණය
71. මහාකරුණා සමාපත්ති ඤාණය
72. සබ්බඤ්ඤුත ඤාණය

73 අනාවරණ ඤාණය

මෙහි 67, තෙක් සාධාරණ ඤාණයි. සෙසු සය අසාධාරණයි.

## ප්‍රථම පරිච්ඡේදය

# 1. සුතමය ඤාණය

ධර්මදේශකයන් වෙත කන් යොමු කිරීමෙන් අසා දැනගත් ධර්ම රාශිය කෙරෙහි පවත්නා වූ ප්‍රභේදගත - බෙදීම් බවට ගිය- ප්‍රඥාව සුතමයඤාණ නම්. සොතාව ධානෙ පඤ්ඤා, සුතමයෙ ඤාණං'' කන් යොමු කිරීමෙහි නුවණ සුතමය ඤාණ යැයි සැකෙවින් සඳහන් වෙයි.

## සුතමය ඤාණ පූරණය

මීට විසතාසංඛ්‍යකල්ප ලක්ෂයකට මත්තෙහි, එක් කාල සීමාවකදී අපේ බෝසතාණෝ ගන්ධාර රට දිළිඳු කුලයෙක පිළිසිඳ ගත්හ. පසු කලෙක පියා මරණයට පත් වූයෙන් තම මෑණියන් රැක බලා ගනිමින් සිටිද්දී; වෙළඳාම සඳහා සුවණ්ණදීපයට යන්ට සිදු විය. මෑණියන්ද කැටුව නැව් නැග යන අවස්ථාවේදී හදිසි කුණාටුවක් හමා නැව බිඳුණෙන්, මේ තරුණයා තම මෑණියන් කර තබා ගෙන පීනීමට පටන් ගත්තේය. අස හාය වීර පුරුෂයකු ගැන විමසමින් සිටි බ්‍රහ්ම රාජයෙක් මොහු දැක, "මොහු ලවා බුදු බව පැතීම සිදු කළහොත් මැනවැයි සිතා දිවයිනක් මවා පෑවේය. එය දුටු පුරුෂයා මහත් සතුටින් ගොඩ වූ පසු මෑණියෝ "මා දිවි ගැලවූ පුතා බුදුවේවා! යි දොහොත් මුදුන් දී ප්‍රාර්ථනා කළහ. මේ ප්‍රථමයෙන් බුද්ධත්වය ප්‍රාර්ථනා කළයුතු දිනය හෙයින් ඒ තරුණයාද මෑණියන්ගේ පැතුම සිතින් පිළිගත්තේය.

## සුමේධ තවුසාණෝ

එතැන් සිට අසංඛ්‍ය කල්ප සොළසක් ඇතුළතදී, ශාන්ති නායක බුදුරජාණන් වහන්සේලා පන්ලක්ෂ දෙලොස් දහස් - 5, 12, 000 - දෙනා වහන්සේ හමුව, උන්වහන්සේලාගේ සුමධුර

ධර්මදේශනාවන්ට සවන් දී සුතමය ඥාණය උපදවා ගැනීමට පදනම දමා ගත්හ. මේ කාල සීමාව මනෝප්‍රණිධාන, වාග් ප්‍රණිධාන දෙකයැ. මෙසේ මුහුකුරා ගෙන එන නුවණක් ඇති බෝධිසත්වයෝ ලොව පහළ වූ දීපඞ්කර බුදුරජාණන් වහන්සේගේ කාලයේදී දඹදිව අමරවතී නුවර, ආනන්ද, වසී යන මාපියන් නිසා "සුමේධ" නමින් උපන්හ. ක්‍රමයෙන් වැඩිවියට පැමිණි මේ කුමරු සියලු ශිල්පයන්හි පරතෙරට පැමිණෙත්ම මාපියන්ගේ මරණ සිදු වූයෙන් අයකැමියා ගණන් පොතක් රැගෙන ඔහු ඉදිරියෙහිදී මව්පියන් සතු ධන සම්පත්තිය ගැන කීවේය. වස්තුවෙහි හරයක් නොමැති බව සුතමය ඥාණයේ උපකාරයෙන් වැටහුණු සුමේධ කුමරා, ඒ සියලු ධනය නගරයෙහි බෙර හසුරුවා යාචකාදීන්ට දුන්නේය. දෙලොස් දහසක් ගබඩාවන්හි තුබූ රන් - රිදී - කහවණු ආදිය ඒ ධන සම්පත්තියයි. එක් පෙල කිවියෙකුට මේ දන්දීම පෙනුනේ මෙසේයි.

‘‘භෙරිනාද සුඝෙට්ඨන - යාචකාලි සමාගතෙ
දානක්ඛජ්ජකබ්බෙසෙන සත්තාහං ජිනසි තතො’:

-ජිනචරිතය,

බෙර හඬ නමැති සුවඳින් යාචකයන් නමැති මීමැස්සන් පැමිණි කල්හි දීම නමැති රොන් සමූහයෙන් සත් දිනක් සතුටු කළේය. ධන සම්පත්තිය පරිත්‍යාග කළ සුමේධ කුමරා දිනක් රහසිගතව, තම මන්දිරයේ උඩුමහල්හි සිටිමින් මෙසේ සිතීය.

“පුනබ්භවෙ පණ්ඩිත පටිසන්ධිග්ගහණං නාම දුක්ඛං, තථා නිබ්බත්ත නිබ්බත්තට්ඨානෙ සරීරභෙදනං, අහඤ්ච ජාති ධම්මො ජරාධම්මො ව්‍යාධිධම්මො මරණධම්මො, එවම්භූතෙන මයා අජාතිං අජරං අව්‍යාධිං අදුක්ඛමසුඛං සීතලං අමතමහා නිබ්බාණං පරියෙසිතුං වට්ටති.”

පණ්ඩිතය, නැවත නැවත භවයෙහි පිළිසිඳ ගැනීම දුකකි. එසේම ඉපදුන ඉපදුන තැන මරණයද දුකකි. මමද - ජාති - ජරා - ව්‍යාධි - මරණ සවභාව කොට ඇත්තෙක්මි. මෙසේ වූ මා විසින් ජාති - ජරා - ව්‍යාධි නැති දුක් සැප දෙකින්ම තොර අමෘත මහා නිර්වාණය සොයන්නට වටී.”

එදා ලෝකයෙහි බුදුවරයෙකු උපදින්නටත් මත්තෙහිදී ධනයේ ඇති නිස්සාර ගතියත්, සසර දුකින් නිදහස් වූ නිර්වාණ

යෙහි ශාන්ත ගතියත් ආකසම්කව – ඉබේටම – වැටහුණේ පෙර බුදුරජාණන්වහන්සේලාගේ ධර්මදේශනාවන්ට ඇහුන්කන් දීමෙන් ලබාගත් සුතමය ඥාණය නිසායැ.

## ප්‍රථම විවරණය

මෙසේ සසර ආදීනව දුටු සුමේධ කුමරා සියලු ගිහි සැප හැර දමා, හිමාලය වෙත ගොස්, ශක්‍රයාගේ අණ පරිදි විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයා විසින් මැවූ තවුස් පිරිකර ගෙන සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් මහණවී, භාවනා කර අභිඥා සහිත අෂ්ට සමාපත්ති උපදවා ගත්තේය. එසමය වනවිට දීපඞ්කර බුදුරජාණන් වහන්සේ ලොව පහළවී සිටි බැවින් රඹගම් නුවරැ උන්වහන්සේගේ වැඩම වීම සඳහා මාර්ගය සුද්ධකරමින් සිටිද්දී සුමේධ තවුසාණෝ අහසින් යනුමෝ මෙය දැක, තමාත් කොටසක් ඉල්ලා ගෙන ශුද්ධ කරන්ට වූහ. දීපඞ්කර බුදුරජාණන් වහන්සේ සාරලක්ෂයක් මහරහතන් වහන්සේ කැටුව මේ ස්ථානයට වැඩම කල බව දුටු සුමේධ තවුසාණෝ අඩක් නොනිමි මග මඩ මතුයෙහි වැතිර උන්වහන්සේලාට වඩින්නට ආරාධනා කළහ. මේ අසහාය වීර පුරුෂයා දැක වදාළ දීපඞ්කර බුදුපියාණෝ "මොහු ඒකාන්ත බුදුවෙති'යි විවරණදුන්හ. එපමණක් නොව සෘද්ධිමත් සාමනෙත් රහත් වහන්සේලා එවේලෙහි හිමාලය වෙත ගොස් නෙලා ගෙන ආ සමන් මල් අටමිටක්ද පූජා කළහ, සෙසු රහතන්වහන්සේ ද, සමන් මල් පූජා කළෙත්, මේ තවුසාණෝ ඒ මල් මතුයෙහි පළඟ බැඳ හිඳ පාරමී ධර්මයන් මෙනෙහි කළහ. පාරමීහු නම්:-

"දානං සීලංච නෙක්ඛම්මං – පඤ්ඤා විරියෙන පඤ්චමං
ඛන්ති සච්චමධිට්ඨානං – මෙත්තුපෙක්ඛාතිමා දස"

දානය, ශීලය, නෛෂ්ක්‍රම්‍යය, ප්‍රඥා, වීර්‍යය, ක්ෂාන්තිය සත්‍යය, අධිෂ්ඨානය, මෛත්‍රිය, උපේක්ෂාය, යන මේ දශ ධර්මයෝයැ. තවද, මේ දශ පාරමීහු බුද්ධ බෝධිසත්ව වූ මා විසින් පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී, යන ත්‍රිවිධාකාරයෙන් සමතිසක් වශයේ පිරිය යුතු බවද දුටහ. මත්තෙහිත් බුද්ධ කාරක ධර්ම – පාරමී – සොයා නොදැක, මෙපමණකැයි සිතා අවසානයට පත් වූහ. මේ අයුරින් තමන්ගේ නුවණින්ම බුද්ධ කාරක ධර්ම ගවේෂණයෙහි – සෙවීමෙහි – යෙදුනේ හුදෙක් සුතමය ඥාණයේ අනුහසිනි.

## බෝධිසත්ව චරිතයෙහි මධ්‍යය:-

සුමේධ කාලයේ සිට වෙස්සන්තර ආත්ම භාවය තෙක් ඒ අතර කාල සීමාවේදී බුදුරජාණන් වහන්සේලා විසිතුන් නමක ගෙන් බුදුවීම සඳහා විවරණ ගත්හ. පාරමී පූරණ සමය තිසා උපන් හැම ආත්මයකදීම සෙසු මිනිසුන්ට වඩා නුවණින් වැඩි හිටීම බෝධිසත්වයන්ගේ ඇති විශේෂතාවයයි. මිනිස් බැව්හි පමණක් නොව තිරිසන් ජීවිත ලැබුව ද ඇතැම් විට මිනිසාට වඩා නුවණින් යුතුව ක්‍රියා කළ බව ජාතකකථාවෝ දෙස් දෙත්. වානරින්ද, කුක්කුර, සුවණ්ණහංස, ආදී ජාතක ඊට නිදසුන්ය. මනුෂ්‍ය ආත්ම භාව අතුරෙන් ඉතාමත් ශ්‍රේෂ්ඨ ඥානයෙන් යුක්තව ක්‍රියා කළේ මහෞෂධ සමයේදීය. තමා ඇතුළු සේනාවන් උපායෙන් රජ ගෙදරට හසුවූ කල්හි මහෞෂධ පණ්ඩිතයෝ සියුම් නුවණ යොදා රජතුමා මුලාකර ගැලවූහ. එපමණක් නොව රහස් උමගකින් දේවිය හා රජ දුවණිය, සඟවා ගෙන ගොස් තබා, තම සේනාවද ඒ මාර්ගයෙන් ගලවා, පසුව විරුඬ, රජතුමාගෙන් ප්‍රශංසාද ලැබූහ.

සෙසු ආත්මයන්හිදී ද බෝධිසත්වයන්ගේ ප්‍රඥව මැනවින් බැබලුණේය. හැම අවස්ථාවේදිම ඒ ප්‍රඥව යෙදුයේ කරුණා සහගතවමය. හැම බුද්ධ කාරක ධර්‍ම පිරුණේද කරුණාව අනුව ගිය නුවණකිනි. "කරුණූපාය කොසල්ලපරිග්ගහිතා දානාදයො ගුණා පාරමියො නාම" යනුවෙන් "පාරමී" ශබ්දයට දුන් විග්‍රහයෙන්ද ඒ අදහස මැනවින් හෙළිවෙයි.

මෙසේ චතුරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් වනතුරු පාරමී ධර්ම පුරමින් තමන්වහන්සේ සුතමය ඥාණය සම්පූර්ණ කිරීමෙහි යෙදුනහ. ඇතැම් අවස්ථාවන්හිදී මහගු සක්විති සැපත පවා ශාසනයට පුදමින් ඥාන පූරණයෙහි යෙදුණහ. මෙසයින් පිරූ සුතමය ඥාණයෙන් ගහබි බෝධිසත්වයෝ අන්තිම වරට තුසිත දෙව්ලොව උපන්හ.

### සුතමය ඥාණයට පදනමවූ බුද්ධකාරක ධර්මයෝ

දශ පාරමී, ත්‍රිවිධ චර්‍යා, පඤ්චමහාපරිත්‍යාග, සතර සංග්‍රහ වස්තු, ෂඩ්විධ අධ්‍යාශ, මහා කරුණා යන මොවුහු බුද්ධ කාරක ධර්මයෝය.

**දශ පාරමී:** "පාරං එති ගච්ඡති එතාහිති පාරමියො" යන නිර්වචන හෙයින් පරතෙර නම්වූ නිර්වාණයට පමුණු වන

යම් ධර්ම කෙනෙක් වෙද්ද ඔවුහු පාරමීහු නම්. දානාදි දශ වැදෑරුම් ධර්මයෝ මෙයින් කියවෙත්. තම කැමැත්ත පරිදි නිර්වාණය අවබෝධ කර ගන්නා අවස්ථා ත්‍රයක් ඇති හෙයින් දස වැදෑරුම් පාරමීහු තිස් ආකාර වෙත්. බුද්ධ බෝධිසත්වයන් විසින් මේ තිස ම සම්පූර්ණ කරන හෙයින් උන්වහන්සේලාගේ ඒ පාරමීහු මහා පාරමිතාවෝ නම් වෙත්. "පරමත්ථ පාරමී" යනුද නමෙකි. දෙවැනි තැනවූ පච්චේක බෝධි ඥානයට අවශ්‍ය වනුයේ විසි පාරමීහුය. ඔව්හු "උප පාරමී" නම්. තුන් වැනි තැනවූ අර්හත් බෝධි ඥානයට අවශ්‍ය වනුයේ දශ පාරමී පමණි. ඔවුහු 'පාරමී' නම්.

තවද, පාරමී සම්පූර්ණ කිරීමෙහිලා අනුගමනය කරන අයුරු තෙවැදෑරුම්ය. එනම්:- කෙත් - වතු - ධන - ධාන්‍යාදි වස්තූන් ගැන ආශාව නොතබා දානාදි දස පාරමී පිරූම, ඇස් - ඉස් - මස් - ලේ ආදිය ගැන ආසාව නොතබා දානාදි දශ පාරමී පිරූම ජීවිතය ගැනද ඇල්ම නොතබා දානාදි දස පාරමී පිරූම, යනුයි. මෙයින් පළමුවැනි ක්‍රමය අර්හත් ඥානයට ප්‍රමාණවත්ය. දෙවැනි ක්‍රමය පච්චේක බෝධි ඥානයට ප්‍රමාණවත්ය. තුන්වැන්න ලොව්තුරු බෝධි ඥානයට ප්‍රමාණවත්ය.

"තණ්හා මාන දිට්ඨීහි අනුපහතා කරුණූපාය කෝසල්ල පරිග්ගහිතා දානාදයො ගුණා පාරමියො" ආසාව, මානය, වැරදි දැකීම, යන කෙලෙස් වලින් කැලැල් නොවූ කරුණාවෙන් හා නැනට සුදුසු නුවණින් වටවූ දානාදි ගුණ සමූහය පාරමීහු නම්. සනුවෙන් දුක්වෙන පරිදි නිවන් අවබෝධය සඳහා කරන්නාවූ කුශල් තෘෂ්ණාදි කෙලෙස් වලින් තොරවිය යුතුය. කරුණාදී ගුණයන් ගෙන් පෝෂිත විය යුතුය. දෙව් - මිනිස් - පස්කම් ආදී ලෞකික සැප කෙරෙහි බලාපොරොත්තු ඇතිව කරන්නාවූද, "මා හා සමාන පින් කරන කෙනෙකු නව නැතැයි මාන, අහංකාර, අදහසින් කරන්නාවූ ද, සමථ - විදසුන් නොවඩා, දානාදී කුසලයන්ගෙන්ම නිවන් අවබෝධ වේයයි වැරදි හැඟීම් ඇතිව කරන්නාවූද, සියලු කුසල් "පාරමී" ගණයට ඇතුළත් නොවේ. හැම සතුන් කෙරෙහි මහත් කරුණාවෙන්, තමනුත් අනුනුත් පරිස්සම් කරගෙන නැනට සුදුසු නුවණින් කරන්නාවූ දානාදි කුශල්ම පාරමී නම් වෙයි. මහා පාරමිතා පුරන්නාවූ බෝධිසත්වයන් වහන්සේ; තම සක්විති ජීවිතය පමා ඇල්මක්, අහංකාරයක්; නොමැතිව යමින් "තෙමේද සසරින් නිදහස්වී සියලු සත්වයන්ද සසරින් නිදහස් කරමී'යි යන අදහස් ඇතිව මහා කරුණාවෙන් හා උපායඥානයෙන් යුක්තවම කුශල් කළහ.

## මහා පාරමිතා දසය

(1 ) කරුණාවෙන් හා උපාය නුවණින් යුතු, තම ජීවිතය, ඇස්-ඉස් ආදී අවයව, ධන - ධාන්‍යාදී බාහිර වස්තු, අනුනට දීමේ දී ඇතිවන අලෝභ චේතනාව - අදහස - දාන පරමත්ථ පාරමිය.

(2,) ඒ අයුරින්ම ගුණයෙන් යුතු, කය - වචන දෙකෙහි ශීලාචාර ගතිය හා ඒ දෙක වෙහෙසවා තමාටත් අනුන්ටත් කටයුතු සැලසීම, යන සිරිත් විරිත් පැවතුම සීල පරමත්ථපාරමිය.

(3.) කාමයෙහි ආදීනව හා වැඩක් නැති ගතිය දැක, කිනම් කරදරයක් වුවත් එය නොතකා, රජ සැප වුවත් අතහැර දමා, වනගත වී, රූපාදි කාම් සැපතින් අස්වීමේ අදහස නෙක්ඛම්ම පරමත්ථ පාරමිය.

(4.) සසර මිනිස් ජීවිතය ලැබෙන කිනම් කාලසීමාවකදී වුවද, එදා පවත්නා සියලු ශිල්ප, ශාස්ත්‍ර, හැදෑරීම. හා ඒවාහි දක්ෂකම ද, සතුරු මිතුරු කාගේත් සිත් දිනාගෙන ක්‍රියා කිරීමේ හැකියාවද, හැම කටයුත්තකදීම අන් සියලු දෙනාටම වඩා වැඩිහිටි බවක් දැනෙන සේ නුවණ යෙදවීමද, ජීවිතය පිළිබඳ නියම අවබෝධයක් ඇතිවීමද, වනගත වූවාට පසු තම ශක්තියෙන් වුවද සමත විදසුන් වැඩීමට හැකියාව ඇතිවීමද, සෙසු තිරිසන් ආත්මයන්හිදීද ඒ හැම දෙනාගේ සිත් දිනාගෙන කටයුතු කිරීමද, ආදී වශයෙන් එන නුවණ, පඤ්ඤා පරමත්ථපාරමිය.

(5;) තමාටත් අනුන්ටත් හිතසුව සැලසේ නම් එබඳු දේ කිනම් කරදරයක් පැමිණියත් සිදු කිරීමේ දැඩි වීර්‍යය වීරිය පරමත්ථපාරමිය.

(6.) තමාගේත් අනුන්ගේත් වැඩට අවහිරකිරීම සඳහා ,සතුරන් යොදන සියලු වධ හිංසා, සුළං රැලක් වදින්නාසේ වත් නොතකා ඒ හැම ඉවසීම ඛන්ති පරමත්ථපාරමිය.

(7.) ජීවිතය විනාශ වුවද බොරු නොකීම, යමක් සඳහා පොරොන්දු වීනම් එය කිනම් බාධාවක් පැමිණියත් අත නොහැර ඉටු කිරීම, සච්චපරමත්ථපාරමිය.

(8.) යහපත් දෙයක් සිදු කිරීම සඳහා සිත්හි තබාගත්තේ නම්, තම ජීවිතය විනාශ වූවත් ඒ දේ සිදුකිරීමට ගන්නා දැඩි අදහස, අධිට්ඨාන පරමත්ථපාරමිය.

(9.) ලෝවැස්සාට හිතසුව නිතර එලවන අදහස මෙත්තා පරමත්ථ පාරමිය.

(10.) තමාටත් ලෝවැස්සාටත් යහපත සැලසීමේදී ලැබෙන ලාභ, ප්‍රශංසාදියෙහිත්, ඒ වැලකී ගියහොත් ලැබෙන අලාභ, නින්දාදියෙහිත් එකසේ කම්පා නොවී සිටීම උපෙක්ඛා පරමත්ථපාරමිය.

## ත්‍රිවිධ චර්යා:

ඥාත්‍යර්ථ චර්යා, ලෝකාර්ථ චර්යා, බුද්ධ චර්යා යනුයි.

[1] තිරිසන් මිනිස් ආදී කෙබඳු ජාතියක, කෙබඳු කුලයක, කෙබඳු තත්වයක ජීවත් වූවද, හිතා'හිත සියලු නෑයින්ගේ දියුණුව සඳහා වෙනසක් නොමැතිව, එකසේ උදව් දීම ඥාත්‍යර්ථ චර්යා යැ.

[2] ලෝවැසි හැම සතුන්ගේම හිතසුව පිණිස' ලාභාදිය බලාපොරොත්තුවෙන් තොරව හුදු කරුණාවෙන් උදව් දෙමින් හැසිරීම ලෝකාර්ථචර්යායැ.

[3] නෑයින්ටත් ලෝවැස්සාටත් දියුණුව සඳහා කටයුතු කරද්දී එන හැම උවදුරක්ම වලක්වමින්, තමාද වැලකෙමින් දියුණුවද නොපිරිහෙලා සිදුකිරීම සඳහා යොදවන නුවණද කාමයෙහි ආදීනව, කාමයන්ගෙන් නික්මීමේ ආනිශංස, ශීලාදි ගුණයන් පිරීමේ ආනිශංස, ආදි ඒ හැම ධර්ම පිළිබඳ විසිඳුණු නුවණද, බුද්ධචර්යා යැ.

## පඤ්ච මහා පරිත්‍යාග:

"වරසුතධන භරියානං - අඞ්ගානං ජීවිතස්ස ච"

වටිනා දරුවන්, භාර්යාවන්, ධන, අඞ්ග, ජීවිත, යන මේ පස නො මසුරුව දීම පඤ්චමහාපරිත්‍යාග නම්. ජීවිතයකට ඉතාම අවශ්‍ය වූ මේ පස බුද්ධකාරකධර්ම පූරණ බෝධිසත්වයන් විසින් කිසිදු ආලයක් නො කොට, සත්වසමූහයා වෙත මහාකරුණාව උපදමා අනුනට දියයුතු; අපේ බෝධිසත්වයන් වහන්සේ වෙස

තුරු අත්බැව්හිදීම මෙහිත් තුනක් එකවිට දන් දුන්හ. ඊට පෙර නොයෙක් ආත්මයන්හිදී මෙ දීමනාව පුරුදු කළහ. සිවි රාජසම යේදී තම ඇස් දන් දුන්හ. ව්‍යාඝ්‍රධේනුවට ජීවිතය දන් දුන්හ. එසේම සුතසෝම සමයේදී පෝරිසාදයාට ජීවිතය කැප කළහ මෙසේ මේ වටිනා වස්තු බුදුබව සඳහා ම දුන්හ.

## සතර සඞ්ග්‍රහ වස්තු

"චතූහි සඞ්ගහවත්ථූහි ජනං රඤ්ජයතී' ති රාජා"

සතර සඞ්ග්‍රහ වස්තුවෙන් මහජනයා තමා වෙත සිත් අලවා ගනුයේ රජනම්' යන විග්‍රහ වාක්‍යයේ පරිදි සතර සඞ්ග්‍රහ වස්තු බොහෝ සෙයින් බරව එනුයේ රජතුමා කෙරෙහිය. බෝධිසත්ව යන් පාරමී පූරණ කාලයේ නොයෙක් ආත්මයන්හි රාජ්‍යභාවය ලබාගත් හෙයින් උන්වහන්සේ මේ සතර සඞ්ග්‍රහ වස්තු වලින් කිසිවෙකුට දෙවැනි නොවන සේ යුක්ත වූහ. ඒ සතර සඞ්ග්‍රහ වස්තුහු නම්:-

"චත්තාරිමානි භික්ඛවෙ සඞ්ගහ වත්ථූනි, කතමානි චත්තාරි? දානං පෙය්‍යවජ්ජං අත්ථචරියා සමානත්තතා" ති අ. නි. ච. නි. යන දේශනා පරිදී දන්දීම; ප්‍රියවචන කථාකිරීම, හිතසුව පිණිස හැසිරීම, සුදුසු කල සමානාත්මතාවය – දුක සැප දෙකෙහිම උදවුදීම, යන සතරයි. මේ සතර බුද්ධ බෝධි සත්වයන් වහන්සේ තම ජීවිතය නොතකා ආරක්‍ෂා කිරීමෙන් මහජනතාවගේ සිත් දිනා ගත්හ.

## සය වැදෑරුම් අදහස්:-

"ඡ අජ්ඣාසයා බෝධිසත්තා බෝධිපරිපාකාය සංවත්තන්ති, අලෝභජ්ඣාසයා ච බෝධිසත්තා ලෝභෙ දෝසදස්සාවිනො, අදෝසජ්ඣාසයා ච බෝධිසත්තා දෝසෙ දෝසදස්සාවිනො, අමෝහජ්ඣාසයා ච බෝධිසත්තා මෝහෙ දෝස දස්සාවිනො නෙක්ඛම්මජ්ඣාසයා ච බෝධිසත්තා ඝරාවාසෙ දෝස දස්සාවිනො, පවිවෙකජ්ඣාසයා ච බෝධිසත්තා ගණසඞ්ගණිකාය දෝස දස්සාවිනො, නිස්සරණජ්ඣාසයා ච බෝධිසත්තා සබ්බභවගතීසු දෝස දස්සාවිනො," වි.ම.ක ග.නී. 86 පිටුව.

1. ලෝභයෙහි වරද දකිමින් පවතින අලෝභ අදහස.
2. ද්වෙෂයෙහි – තරහවීමෙහි – වරද දකිමින් පවතින අද්වේෂ – මෛත්‍රී – අදහස.
3. මෝහයෙහි වරද දකිමින් පවත්නා ප්‍රඥා අදහස.

4. ගිහිගෙහි වරද දකිමින් පවත්නා නික්මීමේ අදහස.

5. සමූහ සමූහව වාසය කිරීමේ වරද දකිමින් පවත්නා කාය - චිත්ත - උපධි යන තෙවදෑරුම් විවේක අදහස.

6. සියලු සත්ත්ව ලෝකයෙහි වරද දකිමින් පවත්නා එයින් නිදහස්වීමේ අදහස. යන මේ අදහස් සය බෝධිසත්ත්ව සමයේදී පැවතිණ.

## මහාකරුණාව

බොධිසත්ත්ව චරිතයේ අත්සක් මුල්ලක් නැර රැඳුණේ මහා කරුණාවයි. සසර දුකින් නිදහස් වීමට පමණක් නම් සාමාන්‍ය වශයෙන් පවත්නා වූ කරුණා ගුණය ප්‍රමාණවත්ය. මහාකරුණාවක් අවශ්‍යවනුයේ තමන් ලත් නිවන් සුවය සෙසු ලෝකයාටත් ලැබෙන පරිද්දෙන් ඊට මාර්ගය දක්වා ඔවුන්ද සසර දුකින් නිදහස් කර ගැනීමටය. සුමේධ තවුස් සමයේ අතට පත් නිවන් සුවය හැර දමා, නැවත සසරට පිවිසියේ සෙසු සත්වයන් කෙරෙහි තුබූ මහා කරුණාව නිසාය.

මහා කරුණා ගුණයේ බලමහිමය විදහා පෙනෙනුයේ බුද්ධ චරිතයෙනි. තමන් වහන්සේට නොයෙක් අයුරින් එරෙහිව සිටි දේවදත්ත තෙරුන්, මැරී අවීචියට යන අවසථාවේදී තමන්වහන්සේගේ සරණ යැම නිසා මතු පසේබුදු වන බව දැන, එපමණක්ම සලකා, සඞ්ඝ භේදය කරනත් ඔහු පැවිදි කරවීම, අමුසොහොනෙහි අසරණව වැටී සිටි සෝපාක දරුවාට පිහිටවීම, විශාලා මහනුවර තුන් බිය නැති කිරීම, ආලවක දරුවා මරණයෙන් හැලවීම, සච්චකයා මිථ්‍යාදෘෂ්ටියෙන් මුදවා ගැනීම, සසර දුකින් මිදීමට සුදුස්සෙකු නුවණැසින් දුටු විට යොදුන් ගණන් දුර වුවද හුදකලාව වැඩම වීම, යන මේ කරුණු ඒ අසහාය බලමහිමයෙන් බිඳෙකි.

තවද, දවසේ පැය හැටෙන් පැ දෙකක් පමණක් විවේක සුවය ගෙන, සෙසු හැම කල්හිම දෙව්-මිනිසුන් ගේ හිත සුවපිණිස යෙදෙමින්, මිනිසාටත් දෙවියාටත් බඹුටත් පැණවිසඳීම කුහුඹුවාටත් එකසේ කරුණා ගුණය යොදමින්, දහම් දෙසීම, සිකපද පැණවීම, ඉඳුපෙළහැර පෑම, ආදී හැම බුදු කිසක්ම කිසිදු තැනක අඩුවක් නොමැතිව, වෙහෙසටද නො පත්වී, ඒ හැම සිදුකිරීමෙන් අද්භූත උත්තමයාණෝ වූහ. එයින් කීහ.

"සබ්බඥ සබ්බසත්තානං - හිතායච සුඛායච
උස්සුතෙනා අකිලාසුච - අහො අච්ඡරියො ජිනො"

සියලු සත්වයන්ගේ හිතසුව පිණිස හැමදා යෙදුනා වූ බුදු රජාණන් වහන්සේ වෙහෙසට පත් නොවූහ. අහෝ! බුදුරජාණන් වහන්සේ පුදුමයෑ.

## බුද්ධකාරක ධර්ම පූරණයෙහි උපාය ක්‍රමය

ඉහත සඳහන් සියලු බුද්ධකාරකධර්ම බෝධිසත්වයන් වහන්සේ උපාය ක්‍රම සතරකින් යුක්තව සම්පූර්ණ කළහ.

1. අනවසෙසස සමහරණය : ඉතිරිවක් නොමැතිව සම්පාදනය කිරීම.

2. සක්කච්ච කාරිතා : හැම ගුණයක්ම ඉතා කැමැත්තෙන් මනාලෙස සිදුකිරීම.

3. සාතච්චකාරිතා : අතරක් නොතබා හැමදා පුහුණු කිරීම් වශයෙන් සම්පාදනය කිරීම.

4. චිරකාලාභියොගය : බොහෝ කලක් පුරුදු කිරීම් වශයෙන් සම්පාදනය කිරීම.

## බෝධිසත්වයන්ගේ මෙලොව ඉපදීම

සුතමය ඥාණානුසාරයෙන් බුධත්වයට සුදුසු හැම ගුණයක්ම පිරූ බොධිසත්වයන් වහන්සේ දෙවියන්ගේ ආරාධනයෙන් පසු පස්මහ බැලුම් බලා, ඇසළ පුණු පොහෝ දිනක, උතුරුසල නැකැතින් මහාමායා දේවීන් කුස පිළිසිඳ ගත්හ. එදා සිට බිහිවන තෙක් අද්භූත දරුවෙකුසේ මැණියන් කුස විසූහ. වෙසක් පුණු පොහෝද ලුම්බිණීසල් උයනේදී බ්‍රහ්මයන් පෑ රන් දැලට බිහිව, අභීත සිංහ නාද පවත්වා, එතැන් සිට පන්සියයක් කිරිමවුන්ගේ උපකාරද ඇතිව වැඩුණහ,

වේදයෙහි පරතෙරට පත් බමුණන් විසින් කියනලද අනාවැකි නිසා, සුදොවුන් මහරජතුමා ගිහිගෙයි කලකිරෙන්ට නොදී, හාත්පස ආරක්ෂා සංවිධානය කළේය. කුමන කරුණකින් නමුත් අඩුවක් වේදෝ යන බියෙන් මෙලොව සියලු සැප තම එකම දරුවාට හැරෙන පරිද්දෙන් ප්‍රාසාද, පොකුණු, උද්‍යාන, ආදී හැම දෙයක්ම සලසාදී සක්විති මිණිරුවනක් සේ රැක ගත්තේය.

## මහාභිනිෂ්ක්‍රමණය

පියරජු විසින් ගිහිගෙහි රඳවා ගැනීමට කොතෙක් උත්සාහ ගතද, එහි ප්‍රතිඵල අහෝසිවී, ජරා, ව්‍යාධි, මරණ, ප්‍රව්‍රජ්‍යා, යන සිවු නිමිති දැකීමෙන් උද්වේගයට පත්වූ බෝධිසත්වයන් වහන්සේට, ඇසළ පුණු තුදුස්වක්දා, තම රජමැදුර, වැතිර නිදන නළඟනන් නිසා අමුසොහොනක් සේ වැටහී, පුරුදු කරන ලද සුතමය ඥාණයේ අනුහසින් එවේලෙහි සසර ආදීනව පෙනී ගියේය. ඉක්බිති එදින මැදියම් රැයේ, ''සත් දිනකින් සක්විති රජසැපත ඒයැ'යි කියමින් වසවත් මරු වලක්වත්දීත් ඒ සැපත අළුයම් දැමූ කෙළ පිඬක් සේ පිළිකුල්කොට මහාභිනිෂ්ක්‍රමණය කළහ.

## තවුස් ජීවිතය

අනෝමා නදියේ පරතෙරට පැමිණි බෝසතාණෝ මහ බඹු දුන් අටපිරිකර රැගෙන, ඉසි පැවිද්දෙන් පැවිදි වී, එතැන් සිට උග්‍ර යෝගී ක්‍රම පුහුණු කිරීමට පටන් ගත්හ. එක් දිනකට මුං ඇට තැම්බූ වතුර සවල්පයකින් පවා ජීවිතය රැක ගැනීමට මහත්සි ගත් බෝසතාණෝ එදා බමුණන් අතර තුබූ උසස්යයි පිළිගත් ප්‍රතිපත්ති සියල්ලම නොපිරිහෙලා සතුටින් සම්පූර්ණ කළහ සැම ශාස්තෘවරයෙකුගේම ප්‍රතිපත්ති මාලාව ඉතා ටික දිනකින් අන්තිම ශිඛීපෙත්තටම පුහුණු කිරීමෙන් වෙහෙසට පත්වූ පසු, සසර දුකින් ගැලවීමක් මේ කිසිදු ප්‍රතිපත්තියක නැතැ'යි වැටහී, ඒ සියල්ල අතහැර දැමූහ.

## බුඩත්වයට පත්වීම හෙවත් සුතමය ඥාණ නාමැති සූයෝදය

සැහීමකට පත් නොවන ගිහි සැපෙහි ආදීනව දැක, තවුස් ජීවිතයට බට බෝසතාණෝ, ගසෙන් වැටුණු මිනිසාට සේ නා ඇත්තාසේ අනුගමනය කල කෂ්ට = කටුක - ප්‍රතිපදා වෙන් වෙහෙසට පත්වූයෙන් ඒ අංශ දෙකම අතහැර මධ්‍යම ප්‍රතිපදාවට - මැදුම් පිළිවෙතට - බැස ගනිත්ම භවයෙන් වැසුණා වූ සුතමය ඥාණ නැමැති සූර්යයාගේ අරුණළු - අරුණාලෝකය - නැග එන්ට පටන් ගත් බව වටහා ගත්හ. මෙසේ පවතින අතර වෙසක් පුණු පුදුස්වකදා, සුජාතා දුන් කිරිපිඩු වළදා, රන්තලිය උඩුගං ඔිලා යවද්දී ඒ අරුණාලෝකය සැබෑ එකක් බව දැනී, එදා රාත්‍රි අහස පොලොව ගැට ලන්නාසේ මහත් උත්සාහ යොදවා සමත විදසුන් වඩන්නට වූහ.

ශ්‍රුතමය ඤාණ නමැති සූර්යයාගේ එක් රශ්මි මාලාවක් වූ පූර්වේනිවාසානුස්මෘති ඥානය - පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ - රාත්‍රි පූර්ව යාමයේ දී පහළ විය. දෙවැනි රශ්මි මාලාව වූ දිව්‍යචක්ෂුරභි ඥානය - දිවැ'ස - මධ්‍යම යාමයෙහි පහළ විය. ඉක්බිති කෙළවරක් නොමැති කාලයක සිට, සිතෙහි රැව් - පිළිරැව් දෙමින් පැවති, කාමාදි ආශ්‍රව ධර්ම නමැති ඝනාන්ධකාර වලාකුල් දෙවාරයක පහවීමෙන් පසු, මධ්‍යම යාමය අවසන් වෙද්දී, තුන්වැනි වාරය වූ අර්හත් මාර්ග ඥානය ආශ්‍රවක්ෂයකර ඥානය පහළ වෙත්ම සියලු වලාකුල් විනාශවී ශ්‍රුතමය ඤාණ නමැති සූර්යයාත් වෙසක් පුණු පොහෝ දින ලොවට එළිය දෙන ප්‍රකෘති සූර්යයාත් යන හිරු දෙදෙනම එකවිට උදාවූහ. වෙන වචනයෙන් කියතොත් බෝසතාණෝ හිරු පායද්දී සර්වකෙලෙසුන් නසා සර්වඥතා ඥානය ඉපද වූහ. එනම් බුදුවූහ.

## සර්වඥතාඥානය ලැබූ බව දෙව්බඹුන්ට හැඟවීම

බුද්ධත්වයම පත්වීමෙන් පසු, ලබාගත් විමුක්ති සුවය විඳිමින් ඒ අසුනෙහි ම සතියක් සිටිද්දී, බුදුවන තෙක් අවටින් බලා සිටි දිව්‍ය බ්‍රහ්මයෝ "සිද්ධාර්ථ බෝධිසත්වයෝ තවමත් බුදු නුවූහ" යි සැක සිතූහ, ඒ සැක දුරුකිරීමෙන් තමන් වහන්සේ ලෝකයේ එක ම ශ්‍රේෂ්ඨයා බව හැඟවීම සඳහා, දින හතකින් පසු, ඒ පළඟින් නැගිට, අභිඥපාදක චතුර්ථධ්‍යානයට සමවැදී, අහසට වැඩ යමාමහ පෙළහර පෑහ. ඒ දුටු දෙව් බඹහු දෙසොත් මුදුන් දී සාධු නාදය පවත්වා සර්වඥතා ඥානය ඉපදවූ බව එක හෙලා පිළිගත්හ.

## උපක ආජීවකයාට හැඟවීම

බුදුරජාණන් වහන්සේ දෙවැනි වර, මිනිසුන් අතුරෙන් ප්‍රථමයෙන්, සර්වඥතා ඥානය ලැබූ බව හැඟවූයේ උපක ආජීවකයාට යැ: කිසියම් කරුණක් සඳහා "උපක" නම් ආජීවකයෙක් මහමග එද්දී, ගයාවටත් බෝධිමූලයටත් අතර ඉතා සන්සුන් ලීලාවෙන් වැඩම කරන බුදුරජාණන් දැක "ඔබ වහන්සේ කාගේ ශිෂ්‍යයෙක් ද? කාගේ ධර්මයක් රුචිකරන්නේද" යි ඇසීය. එවිට බුදුපියාණෝ සර්වඥතා ඥානය ලබාගත් එකම ශාස්තෘවරයා තමන් වහන්සේ බව ආජීවකයාට හැඟෙන පරිද්දෙන් මෙසේ වදාළ හ.

“සබ්බාභිභූ සබ්බවිදූහමස්මි
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං

න මෙ ආචරියො අත්ථි - සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලොකස්මිං - නත්ථි මෙ පටිපුග්ගලො

අහංහි අරහා ලොකෙ - අහං සත්ථා අනුත්තරො
එකොම්හි සම්මා සම්බුද්ධො-සීතිභූතොස්මි නිබ්බුතො” ති

(මම) සියලු ධර්මයන් මැඩපැවැත් වූයෙමි. සියලු ධර්මයන් දැන ගත්තෙක්මි. ත්‍රෛභූමික - තුන්ලොවට අයත් - සියලු ධර්මයන්හි නො ඇලුනෙක්මි. සියලු ධර්මයන් හැරියෙක්මි. තෘෂ්ණාවේ අවසානය වූ රහත්භාවයෙහි ඇලුනෙක්මි. මා විසින් ම (මෙසේ) දැනගත් හෙයින් කවරෙකු ඇදුරු කොට දක්වම් ද? මට ගුරුවර යෙක් නැත. මා හා සමානයෙක් ද නැත. දෙවියන් සහිත ලෝකයෙහි මට සමවූයෙක් ද නොමැත. මම ලෝකයෙහි රහත්මි. මම අනුත්තර වූ අනුශාසකයාණෝ වෙමි. කෙලෙස් ගිනි නිවීමෙන් සිසිල්වූයේ එක ම සම්‍යක්සම්බුද්ධ වෙමි.

උපක ආජීවක තෙමේ; තමා නො සිතූ පරිද්දෙකින් පිළිතුරු ලැබුණු නිසා; ඊට විරුද්ධව කිසිවක් කියාගත නොහී ‘එසේත් විය හැකියැ’ යි අනුමානයෙන් පිළිගෙන, හිස සලා තමන් ගත් මඟ යන්ට ගියේය. මෙසේ කෙටියෙන් දැක්වූ සර්වඥ තාඥානය පිළිබඳ විස්තරය නුවණ මෙරූ කෙනෙක් ඇසුවේ නම්, හේ ඒකාන්තයෙන් ම රහත් වන්නේය. මේ සුතමය ඥාණය මිනිසා කෙරෙහි විදහා පෑ මුල් ම වාරය යි.

## ප්‍රථම ධර්මදේශනය

දුෂ්කර ක්‍රියා සමයේ දී බෝසතාණන් අත්හල පස්වග තවුසෝ බරණැස ඉසිපතනයේ වාසය කරමින් බෝසතාණන් ගැන නොයෙක් විට සාකච්ඡා කළහ. එදා ඇසළ පුණු පොහෝ දිනයකි. ඇතින් වඩින්න වූ බුදුරජාණන් වහන්සේ දුටු

තවුසෝ 'උන් වහන්සේ තවම බුදු වී නැතැ' යි සිතා පැන් නැබීම ආදියක් නො කොට අසුනක් පමණක් පැණවූහ. බුදුරජාණන් වහන්සේ මැඩහුන් කල්හි ද සමාන අයෙකුට සේ ගරු සැලකිලි දැක්වූ හෙයින්, තමන් වහන්සේ සර්වඥතා ඥානය ලබාගත් බව ශ්‍රී මුඛයෙන් වදාරා, දහම් දෙසීම සඳහා කන් යොමු කරත්තැ' යි තමන් වහන්සේ ගේ ම ඕනෑකමින් කන් යොමු කරවා "දම්සක් පැවතුම් සුතුර" දෙසූ සේක ශ්‍රාවක පාරමී ඥානයට අවශ්‍ය වූ සුතමය ඥාණයක් තුබූ කොණ්ඩඤ්ඤ තවුසා පමණක් මිනිසුන් අතුරෙන් ඒ අවස්ථාවේ දී නිර්වාණය අවබෝධ කරගත්තේ ය. සුතමය ඥාණය මුහුකුරා සිටි අසූඅට කෝටියක් දෙව්බඹහු මේ දෙසුමට කන් දී සිටි හෙයින් ඒ හැම නිවන් අවබෝධ කර ගත්හ

## ධර්මයේ ගම්භීරත්වය

සුතමය ඥාණයෙන් බුදුපියාණන් අවබෝධ කරගත් ධර්ම සමූහය අතිශයින් ම ගැඹුරු ය අවබෝධයට දුෂ්කරය..

"අධිගතො ඛො මයායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො"

මා විසින් අවබෝධ කරගත් මේ ධර්මය ගැඹුරු ය. දැකීමට අපහසු ය. සුවසේ අවබෝධ කරගත නොහැකිය. (එසේ ම මේ ධර්මය) ශාන්තය. මිහිරිය. තර්ක මාත්‍රයෙන් - වාදයෙන් - බැසගත නො හැක. ඉතා සියුම්ය. නුවණැත්තන් විසින් දත යුතුය.

බුදුරජාණන් වහන්සේ මිනිසුන් කෙරෙහි දහම් නො දෙසීම ට අදහස් කළේ මෙම ගැඹුරු බව නිසාම ය. ඒ බැව් සහම්පතී බ්‍රහ්මයාට දුන් පිළිතුරෙන් පෙනේ.

"අපාරුතා තෙසං අමතස්ස ද්වාරා - යෙ සොතවන්තො
පමුඤ්චන්තු සද්ධං
විහිංස සඤ්ඤී පගුණං න භාසිං ධම්මං පණීතං මනුජෙසු
බ්‍රහ්මෙ

බ්‍රහ්මය, දහම් දෙසා ඔවුනට නො වැටහුනේ නම් දෙසූ මට ම එය වෙහෙසෙකැයි යන සිත් ඇතිව පුහුණු වූ ද, මිහිරි ධර්මය නො දෙසීමි. අසනු කැමති යමෙක් ඇත්නම් පැහැදීම ඇතිකර ගනිත්වා! දැන් ඔවුනට අමාමහ නිවණෙහි දොර හරින ලදී.

බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය අතුරෙන් ඉතාම ම ගැඹුරු පටිච්චසමුප්පාදය යි. එනම් හේතු ඵල න්‍යාය යි. මෙය තෘෂ්ණාවෙන් වෙළුනා වූ මිනිසුනට විෂය නො වූ එකකි. "ආලයරාමා ඛො පනායං පජා ආලයරතා ආලයසමුද්දිතා, ආලයරාමාය ඛො පන පජාය ආලයරතාය ආලයසමුද්දිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාදො" මේ සත්ව සමූහයා වනාහී පස්කම් සැපයෙහි ම ඇලී ගැලී වාසය කරන්නේය. මෙවැන්නන්ට "මේ හේතුව නිසා මේ දේ හටගන්නවාය" යන ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය දැකීමට ඉතා අපහසු ය. මෙහි එන ප්‍රත්‍යසමුත්පාදය නම් "අවිජ්ජා පච්චයා සංඛාරා සංඛාර පච්චයා විඤ්ඤාණං" යනාදී වශයෙන් ඉගැන්වෙන හේතුඵල ධර්ම ක්‍රමය යි. (ධම්මට්ඨිති ඤාණය බලන්න.)

පටිච්ච සමුප්පාදය ගැඹුරු වූවාටත් වඩා ඉතා ම ගැඹුරු ප්‍රත්‍ය නිරෝධය වූ නිර්වාණය යි. "ඉදම්පි ඛො ඨානං සුදුද්දසං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං" සියලු සංස්කාරයන් ගේ සංසිඳීමක් ඇද්ද සියලු උපධීන් ගේ අතහැරීමක් ඇද්ද, තෘෂ්ණාව අවසන් වූ ඇලීම් නැති නිර්වාණය නම් වූ මේ ස්ථානය (මෙ ධර්මය) දැකීමට – අවබෝධ කර ගැනීමට ඉතාමත් අපහසුය. පටිච්ච සමුප්පාදය විස්තර වශයෙන් දෙසූ යමකමහාපට්ඨාන, සමන්ත මහාපට්ඨාන, ධම්මසඞ්ගණී ආදී අභිධර්ම කාණ්ඩ ඉගෙණුමත්, දර ගැනුමත්, අවබෝධයත් ඉතා දුෂ්කරය. මේ සුතමය ඤාණයෙන් අවබෝධ කරගත් ධර්මයේ ඇති ගම්භීර භාවය යි.

ප්‍රථම පරිච්ඡේදය නිමි.

# 2 පරිච්ඡේදය

## සුතමය ඤාණය යනු කවරේද?

මෙහි අ. ‘සුත” ශබ්දයේ තේරුම් හතක් ඇති බව ශබ්ද ශාස්ත්‍රඥයෝ පවසත්. (i) සේනාය පසුතො - සේනාව සමග යනුයේ, මෙහි සුත ශබ්දය ගමන් කිරීම් අර්ථයෙහි යෙදී ඇත. (ii) “සුතධම්මස්ස පස්සතො - ප්‍රකට - පැහැදිලි - ධර්මය බලනුයේ යන තැන පැහැදිලි කිරීමෙහි සුත ශබ්දය යෙදිණ. (iii) අවස්සුතාවස්සුත පුරිසපුග්ගලස්ස - රාගයෙන් තෙත් වූ නොවූ පුද්ගලයාගේ” යන මෙහි තෙත් වීමෙහි සුත ශබ්දය ආයේ ය. (iv) “යෙ ඣාන පසුතාධීරා - යම් ධීරයෝ ධ්‍යානයෙන් යුක්ත වූවාහු ද” යන මෙහි සුත ශබ්දය යෙදීම් අර්ථයෙහි ය. (v) “තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පකං - තොප විසින් බොහෝ වූ පින් රැස් කරණ ලදී’ යන මෙහි සුත ශබ්දය රැස් කිරීමෙහි යෙදිණ. (vi) “දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං - දක්නා, අසන, දැනගන්නා ලද’) යන මෙහි ශබ්දයෙහි යෙදිණ. (vii) බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො - බොහෝ අසන ලද්දේ, අසන ලද දේ දරාගත්තේ, අසන ලද දේ රැස්කරගන්නා ලද්දේ, යන මෙහි සුත ශබ්දය කන් යොමු කිරීමෙන් දැනගන්නා ලද දෙයෙහි යෙදිණ. මේ තේරුම් අතුරෙන් “සුතමය ඤාණය” යන්නෙහි “සුත ශබ්දය, සත්වැනිව කියූ කන් යොමුකිරීමෙන් දැනගන්න ලද දෙයෙහි යෙදුනු බව සලකා ගත යුතු.

සුතමය: “සුතෙන පභතො ඵස්සාදිකො ධම්මපුඤ්ජො සුතමයො” - ප. ම. අ. ඇසීමෙන් හැදුනු, එක්තැන්වුණු, ස්පර්ශ ආදී ධර්ම සමූහය - පොදිය - සුතමය නම්.

## සුතමය ඤාණය:

“තස්මිං සුතමයෙ ධම්මපුඤ්ජෙ පවත්තං තං සම්පයුත්තං ඤාණං සුතමයෙ ඤාණං” - ප. ම. අ. ඒ සුතමය වූ ධර්ම සමූහයෙහි පැවති, ඒ හා යෙදුනු නුවණ සුතමය ඤාණය යි. “සභාව සාමඤ්ඤලක්ඛණ වසෙන ධම්මෙ ජානාතීති ඤාණං” යනු හෙයින් ඤාණ යනු ඇති පරිදි ඔවුනොවුන් ගේ හැටි වශයෙන්

ධර්මයන් දැනගැනීමය. මෙසේ ශබ්දශාස්ත්‍ර විග්‍රහ අනුසාරයෙන් සුතමය ඤාණය ගැන අවබෝධයක් ඇතිවන පරිද්දෙන් සැකැසීම අප ගේ අදහස හෙයින් එය තරමක් දුරට සාවකාශව කීණෑ යි හඟිමි.

## සුතමය ඤාණයට ඇතුලත් වූ ධර්ම රාශිය

“කථං සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං? ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යාති සොතාවධානං තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං. ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යාති සොතාවධානං තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං. ඉමෙ ධම්මා පහාතබ්බා ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං, ඉමෙ ධම්මා භාවෙතබ්බාති -පෙ- ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බාති -පෙ- ඉමෙ ධම්මා හානභාගියා -පෙ- ඉමෙ ධම්මා ඨිතිභාගියා -පෙ- ඉමෙ ධම්මා විසෙසභාගියා -පෙ- ඉමෙ ධම්මා නිබ්බෙධභාගියා -පෙ- සබ්බෙ සංඛාරා අනිච්චා ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං, සබ්බෙ සංඛාරා දුක්ඛා ති -පෙ- සබ්බෙ ධම්මා අනත්තාති -පෙ- ඉදං දුක්ඛං අරියසච්චං ති -පෙ- ඉදං දුක්ඛසමුදයං අරිය සච්චංනති -පෙ- ඉදං දුක්ඛ නිරොධං -පෙ- ඉදං දුක්ඛ නිරොධ ගාමිනී පටිපදා අරියසච්චනති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං”

කෙසේ නම් සෝතද්වාරානුසාරයෙන් දැනගත්තා ලද ධර්ම සමූහයෙහි වූ ප්‍රඥාව සුතමය ඤාණය වන්නේ ද? මේ ධර්මයෝ විශේෂයෙන් දතයුත්තාහයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාල ධර්ම සමූහය සෝතාවධාන නම්, එය දැනගත්තා වූ ප්‍රඥාව සුතමය ඤාණය නම් වෙයි. මේ ධර්මයෝ පිරිසිඳ දතයුත්තාහයි වදාල ධර්ම සමූහය සෝතාවධාන නමි. එය දැනගත්තා වූ ප්‍රඥාව සුතමය ඤාණ නම් වෙයි. මේ ධර්මයෝ පහකළ යුත්තාහයි - පෙර මෙන් තේරුම් යොදාගන්න. - මේ ධර්මයෝ වැඩිය යුත්තාහයි -පෙ- මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහ යි -, මේ ධර්මයෝ පරිහානි පක්ෂයෙහි සිටියාහුය යි -, මේ ධර්මයෝ ස්ථිති පක්ෂයෙහි සිටියාහු ය යි -, මේ ධර්මයෝ විශෙෂ පක්ෂයෙහි සිටියාහුය යි -, මේ ධර්මයෝ නිර්විද පක්ෂයෙහි - ලෝභස්කන්ධාදිය ප්‍රදාලනය (පැළීම) කිරීම පක්ෂයෙහි - සිටියාහුය යි -, සියලු සංසකාර ධර්මයෝ අනිත්‍යයහ යි - සියලු සංස්කාර ධර්මයෝ දුඃඛයහ යි - සියලු

චාතුර්භූමික ධර්මයෝ අනාත්මයහ යි -, මේ දුඃඛාය්‍යී සත්‍යය යි-, මේ දුඃඛ සමුදයාය්‍යී සත්‍යය යි -, මේ දුඃඛ නිරෝධාය්‍යීසත්‍යය යි -, මේ දුඃඛ නිරෝධගාමිනී ප්‍රතිපදාය්‍යී සත්‍යයයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නම්. එය දැනගන්නා වූ ප්‍රඥාව සුතමය ඥාණ නම් වේ.

මෙහි බණ වර සංඛ්‍යකින් පරිමිත වූ ධර්ම සමූහයක් ඇතුළත් වෙයි. මූලික මාතෘකා ලෙස අභිඤ්ඤෙය්‍යා'දී කරුණු සොළොසක් එයි. මේ හැම විස්තර කිරීමට ආරම්භ කළහොත් මුළු තුන් පිටකය ම කෙළවර තෙක් දැක්විය යුතුය. එහෙයින් පොත දික් ගැසෙන්නට නොදී, විශෙෂයෙන් ම දතයුතු ධර්ම කොටස් පමණක් මෙහිලා විස්තර කරමි.

## මූලික මාතෘකා සොළොස

1. අභිඤ්ඤෙය්‍යා ධම්මා විශෙෂයෙන් දතයුතු ධර්මයි.
2. පරිඤ්ඤෙය්‍යා ධම්මා : පිරිසිඳ දතයුතු ධර්මයි.
3. පහාතබ්බා ධම්මා : ප්‍රහාණය කළයුතු ධර්මයි.
4. භාවෙතබ්බා ධම්මා : වැඩිය යුතු ධර්මයි..
5. සච්ඡිකාතබ්බා ධම්මා : අවබෝධ කළයුතු ධර්මයි.
6. හානභාගියා ධම්මා : පිරිහීමට නැමුණු ධර්මයි.
7. ඨිතිභාගියා ධම්මා: පිරිහීමටද දියුණුවටද නොපැමිණි ධර්ම.
8. විසෙසභාගියා ධම්මා : දියුණුවට නැමුණු ධර්ම
9. නිබ්බෙධභාගියා ධම්මා : කලකිරීමට නැමුණු = ආය්‍යී මාර්ගය සෙවුනු ධර්ම.

(10) සබ්බෙ සංඛාරා අනිච්චා: සියළු සංස්කාරයෝ අනිත්‍යයහ.

(11) සබ්බෙ සංඛාරා දුක්ඛා: සියලු සංස්කාරයෝ දුඃඛයහ.

(12) සබ්බෙ ධම්මා අනත්තා: සියලු ධර්මයෝ අනාත්මයහ.

(13) දුක්ඛං අරියසච්චං: පස්කඳ දුක, ආය්‍යීසත්‍යයකි.

(14) දුක්ඛ සමුදයං අරියසච්චං: ඊට හේතුව ආය්‍යී සත්‍යයකි.

(15) දුක්ඛ නිරොධං අරියසච්චං: දුක නිවීම ආය්‍යී සත්‍යයකි.

(16) දුක්ඛ නිරොධ ගාමිනී පටිපදා අරිය සච්චං: දුක් නිවීමට හේතු වූ පිළිවෙත ආය්‍යී සත්‍යයකි.

## අභිඤ්ඤා නිද්දෙසය, එකකාදී දසය.

‘‘එක් ධර්මයක් විශෙෂ ඥානයෙන් දතයුතුය. කවරේද? සියලු සත්වයෝ ආහාරය ප්‍රත්‍ය කොට පවත්නාහුය. ධර්ම දෙකක් විශෙෂ ඥානයෙන් දතයුතුය. කවරේද? දෙවැදෑරුම් ධාතුහුය. ධර්ම තුනක් විශෙෂ ඥානයෙන් දතයුතුය. කවරේද? තෙවැදෑරුම් ධාතුහුය. ධර්ම සතරක් විශෙෂ ඥානයෙන් දතයුතුය. කවරහුද? චතුස්සත්‍යයෝය. ධර්ම පසක් විශෙෂ ඥානයෙන් දතයුතුය. කවරහුද? පස් වැදෑරුම් විමුක්තායතනයෝය. ධර්ම සයක් විශෙෂ ඥානයෙන් දතයුතුය කවරහුද? සයානුත්තරීය ධර්මයෝය. ධර්ම සතක් විශෙෂ ඥානයෙන් දතයුතුය. කවරහුද? සතක් වූ නිද්දස වස්තුහුය. ධර්ම අටක් විශෙෂ ඥානයෙන් දතයුතුය. කවරහුද? අට වැදෑරුම් අභිභායතනයෝය. ධර්ම නවයක් විශෙෂ ඥානයෙන් දතයුතුය. කවරහුද? නවානුපූර්විහාරයෝය. ධර්ම දසයක් විශෙෂ ඥානයෙන් දතයුතුය. කවරහුද? දස නිර්ජර වස්තුහුය – ප. ම. සි. ප.

මේ දසුත්තර ධර්ම ක්‍රමය ඉතා කෙටියෙන් මෙහි ලා විස්තර යක් කරමි.

(1) ‘‘සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා’’ සියලු සත්වයෝ ආහාර නිසා ජීවත් වෙත්. මෙම ධර්මය පළමු වැන්නයි. පෙර දක්වූ පරිදි මෙය විශෙෂ ඥානයෙන් දතයුතුය. අපට පෙනෙන නො පෙනෙන කවර සත්වයෝ වුවද ජීවත්වන්නෝ ආහාරයෙනි

එසේම ආහාර නම් වූ ජීවත්වීමෙහිලා උපකාරීවන එකම ධර්මය දැනගත් කල්හි, මතු බලාපොරොත්තුවන හේතුඵල ධර්ම විසඳා ගැනීමට විශෙෂ උපකාරයි. ‘‘ආහාරො නාම එකො ධම්මො අභිඤ්ඤෙන ඤාණෙන ජානිතබ්බො, පච්චයෙහි අභිඤ්ඤාතෙ පච්චයුප්පන්නාපි අභිඤ්ඤාතා හොන්ති’’ ප. ම. අ. ආහාර නම් වූ එකම ධර්මය වැඩි නුවණින් දත යුතුය. ප්‍රත්‍යයත් - හේතුත් - දැනගත් කල්හි එයින් හටගත් ඵලධර්ම ද ප්‍රකට වූයේ වෙයි. මක්නිසාද? ඒ හේතුඵල දෙක ඔබ්බනොවුත් බලාපොරොත්තු ඇති හෙයිනි. ආහාර පිළිබඳ වැඩි විස්තර මතුවට එයි.

(2) ‘‘ද්වෙ ධාතුයො’’

ධාතු දෙකකි. සංඛත ධාතු, අසංඛත ධාතු යනුයි.

i. සංඛතධාතු: හේතු ප්‍රත්‍යයෙන් හටගත් දේයි. එනම් පඤ්ච ස්කන්ධයයි. "අනෙකෙහි පච්චයෙහි සඞ්ගම්ම කතා පඤ්චක්ඛන්ධා සඞ්ඛතා ධාතු" නොයෙක් ප්‍රත්‍යයන් විසින් රැස්ම කළා වූ රූපාදී ස්කන්ධපඤ්චකය සඞ්ඛත ධාතු නම්.

ii. අසංඛත ධාතු: නිර්වාණයයි. "කෙහි චි පච්චයෙහි අකතං නිබ්බාණං අසඞ්ඛතාධාතු" කෙබඳු ප්‍රත්‍යයන් විසින් නමුත් නොකළා වූ නිර්වාණය අසඞ්ඛත ධාතු නම්.

(3) "තිස්සො ධාතුයො" ධාතු තුනෙකි.
කාමධාතු, රූපධාතු, අරූපධාතු

i. කාමධාතු: යටින් නිරය උඩින් පරනිර්මිතවසවර්ති දෙව් ලොව යන මේ දෙකත් සමග ඒ අතර ඇති කාමභූමි එකොළොසෙහි පවත්නා ස්කන්ධ, ධාතු, ආයතන, රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, යන මොහුයි. කෙටියෙන් කාම රූප දෙකින් යුත් ශරීරය යි.

ii. රූපධාතු: යටින් බ්‍රහ්මපාරිසජ්ජය, උඩින් අකනිට්ඨය; මේ ලෝක දෙකත් සමග ඒ අතර ඇති දසය වැදෑරුම් රූප භූමීන්හි පවත්නා සිත් හා සිතුවිලිද, රූපාවචර ධ්‍යානයට සමවැදුනහුගේ සිත් හා සිතුවිලිද, යන මෙතෙක් රූපධාතු නම්.

iii. අරූපධාතු: ආකාසානඤ්චායතනාදී අරූපලෝකයන්හි හැසිරෙන සිත් හා සිතුවිලි අරූපධාතුයි.

(4) "චත්තාරි අරියසච්චානි" ආර්‍ය සත්‍ය සතර මතු විස්තර වෙයි.

(5) "පඤ්චවිමුත්තායතනානි" කෙලෙසුන්ගෙන් නිදහස ලැබෙන තැන් පහකි. එනම්:-

i. 'අත්තනො හිතත්ථාය පරෙහි පවත්තිත ධම්මදෙසනා සවණං' තමාට හිත පිණිස අනුන් විසින් පවත්වන ලද ධර්ම දේශනා ඇසීම, එක් විමුක්තායතනයකි. කෙලෙසුන් ගෙන් නිදහස් වීමට අවස්ථාවකි. සැරියුත් හිමි, මුගලන් හිමි, දරුචීරිය, ආදී බණ ඇසූ විට ම මාර්ග ඵල ඉපිද වූවෝ මේ විමුත්තායතනයට පත්වූවෝ වෙත්.

ii. පරෙසං හිතත්ථාය අත්තනො යථාසුතධම්මදෙසනා. අනුන්ට හිත පිණිස තමා විසින් ඉගෙණගත් අයුරින් ධර්ම දේශනා කිරීම, දෙවැනි විමුක්තායතනයයි. මෙසින් අදහස් කරනුයේ ධර්මදේශනා කරන කල්හි ඒ දෙසකයාගේ සිත කෙලෙසුන් ගෙන් මිදී පවතින බවයි.

iii. යථාසුතස්ස ධම්මස්ස සජ්ඣාය කරණං. ඉගෙණගත් ධර්මය කටපාඩමින් සජ්ඣායනා කිරීම.

iv. යථා සුතස්ස ධම්මස්ස චෙතසා අනුවිතක්කනං. ඉගෙණගත් ධර්මය සිතින් නැවත නැවත මෙනෙහි කිරීම.

v. කසිණාසුභාදීසු අනුකූලං ආරම්මණං. කසිණ, අශුභ, ආදී සමථ භාවනාවන් අතුරෙන් තමාට ගැලපෙන භාවනා අරමුණක සිත රැඳවීම. විදර්ශනාවක් මීට ම සම්බන්ධයි. මෙය විමුක්තායතනයක් බව අමුතුවෙන් කිවයුතු නොවේ. ඒකාන්ත විමුක්තායතනයක් හෙයිනි.

(6) "ඡ අනුත්තරියානි" දෙවැනි නොවන ඉතා උසස් කරුණු සයකි. "අනුත්තරියානි එත්ථ නත්ථි එතෙසං උත්තරන්ති අනුත්තරානි, අනුත්තරානි එව අනුත්තරියානි ජෙට්ඨකානීති අත්ථො" අනුත්තරිය යන මෙහි, මොවුනට වඩා උසස් දෙයක් නැත්තේනුයි අනුත්තර නම්. ඒ අනුත්තර වූ දෑම අනුත්තරිය යි. ඉතා ශ්‍රෙෂ්ඨ දේය යන තේරුමයි. එබඳු කරුණු සය, අනුත්තරිය සය නම්.

i. දස්සනානුත්තරිය: දැකීම් අතුරෙන් උසස් දැකීම. ඉතා පැහැදීමක්, ආදරයක්, ගෞරවයක්, ලැදියාවක් ඇති ව, වෙනසක් නැතිව යමෙක් බුදු, පසේබුදු, රහත් යන උතුමන් දක්නට යේද, ඒ උත්වහන්සේලා ගේ දැකීම දස්සනානුත්තරියයි. උතුම් දැකීමයි.

ii. සවණානුත්තරිය: මුලින් දක්වූ පරිදි ශ්‍රද්ධාදී ගුණයෙන් යුතුව බුද්ධාදී උතුමන් ගේ දෙසුම් ඇසීම සවනානුත්තරියයි.

iii. ලාභානුත්තරිය: බුද්ධාදි උතුමන් කෙරෙහි ශ්‍රද්ධාව ඉපදවීම.

iv. සික්ඛානුත්තරිය: ශ්‍රද්ධාවෙන් ශාසනයට බැසගැනීම වූ පැවිදි වූ තැන් සිට පුරා අවසන් කළ ශීලය, සමාධිය, ප්‍රඥාව, යන අධිශික්ෂාත්‍රය, සික්ඛානුත්තරිය යි.

v. පාරිචරියානුත්තරිය: බුදු පසේබුදු, රහත්, යන උතුමන්ට ආදර ගෞරවයෙන් උපස්ථාන කිරීමයි.

vi. අනුස්සතානුත්තරිය; බුද්ධාදී උතුමන්ගේ ගුණ සිහිකිරීම.

(7) "සත්තනිද්දසවත්ථු" නිදෙස් කරුණු සත.

i. "අධිසික්ඛා සමාදානෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච සික්ඛා සමාදානෙ අවිගතපෙමො"

දැනුත් මත්තෙහිත් සික්පද සමාදන් වීමෙහි තියුණු කැමැත්ත, පහනොවූ ඇල්ම, පළමුවැනි නිදෙස් කරුණයි.

ii. ධම්මනිසන්තියා තිබ්බච්ඡන්දො, හොති ආයතිඤ්ච ධම්මනිසන්තියා අවිගතපෙමො" දැනුත් මත්තෙහිත් ධර්මය විමසීම -විදසුන් - පිළිබඳ බලවත් කැමැත්ත, දෙවන නිදෙස් කරුණයි. මෙය ද කොතෙක් බලාපොරොත්තු වුවද වරද නැත.

iii. ඉච්ඡාවිනයෙ -පෙ- දැනුත් මත්තෙහිත් ලෝභය දුරුකිරීමෙහි කැමැත්ත තුන් වැනි නිදෙස් කරුණයි.

iv. පටිසල්ලානෙ-පෙ-දැනුත් මත්තෙහිත් පව්වලින්, පළිබෝධයන් ගෙන් නිදහස වූ විවේකය පිළිබඳ කැමැත්තයි, මෙය කාය-චිත්ත- උපධි යනුවෙන් තුන්වැදෑරුම්ය.

v. වීරියාරම්භෙ-පෙ- කුශල් දියුණු කිරීමේ උත්සාහය.

vi. සතිනෙපක්කෙ -පෙ- සිහිය පිළිබඳ නිපුණ - දක්ෂ - භාවය.

vii. දිට්ඨිපටිවෙධෙ - පෙ - යහපත් දැකීමෙන් සිවුසස් වටහා ගැනීම. මේ කරුණු සත කිසිදු වරදක් නො මැති හෙයින් නිද්දස වත්ථු නම්.

(8) "අට්ඨ අභිභායතනානි අභිභවිතය - මැඩපවත්වන-කසිණ නිමිති ක්‍රම අට මෙහි "ආයතන"යනු ධ්‍යානලබාගැනුමට උපකාරී වූ කසිණ නිමිති යි. ඒ කසිණ නිමිති අනුව ප්‍රතිභාගාරම්මණයන් උපදවත්ම අර්පණාවට පත්වීම නිසා ඒ ධ්‍යානයන් "අභිභායතන" නමින් හැඳින් වෙයි. පෙර ඉපද වූ ධ්‍යානයට වඩා ශක්තිමත් බව, දක්ෂබව මෙයින් කියැවේ. "අභිභූයමානානි ආයතනානි එතෙසං ඣානානන්ති අභිභායතනානි, ආයතනානීති අධිට්ඨානට්ඨෙන ආයතන සංඛාතානි කසිණාරම්මණානි" මැඩ පවත්වනු ලබන ආයතන මේ ධ්‍යානයන්ට ඇත්තේනුයි. අභිභායතන නම්. ආයතන යනු අධිෂ්ඨානාර්ථයෙන් - ඉටාගැනීම යන තේරුමින් - ආයතනවූ කසිණ ප්‍රතිභාගාරම්මණයෝ යි. ශක්තිමත් භාවයෙන්

සුඛුම ප්‍රතිභාගාරම්මණයත් මැඩපවත්වමින් උපදවනු ලබන ධ්‍යාන, "ආභිභායතන" නම් ලබන බව මෙයින්ද තේරුම් කෙරිණ. එබඳු ධ්‍යාන අටෙකි. මේවා සූත්‍රාන්ත ක්‍රමය, අභිධර්ම ක්‍රමයැයි දෙයාකාරයකින් දැක්වෙයි. මහාපරිනිර්වාණ සූත්‍රය මහා සකුළුදායි සූත්‍රය, සඞ්ගීති සූත්‍රය ආදී තන්හි එනුයේ සූත්‍රාන්ත ක්‍රමයයි. ධම්ම සඞ්ගණියේ රූපාවචර කුසල කථායෙහි එනුයේ අභිධර්ම ක්‍රමයයි.

## සූත්‍රාන්ත ක්‍රමයේ අභිභායතන අට:-

(1) අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති.

(2) අජ්ඣත්තා රූපසඤ්ඤී – පෙ – අප්පමාණානි – පෙ –

(3) අජ්ඣත්තං අරූපසඤ්ඤී -පෙ- පරිත්තානි -පෙ-

(4) අජ්ඣත්තං අරූපසඤ්ඤී -පෙ- අප්පමාණානි -පෙ-

(5) අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති.

(6) අජ්ඣත්තං අරූපසඤ්ඤී -පෙ- පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි තානි අභිභුය්‍ය -පෙ-

(7) අජ්ඣත්තං අරූපසඤ්ඤී -පෙ- ලොහිතානි -පෙ-

(8) අජ්ඣත්තං අරූපසඤ්ඤී -පෙ- ඔදාතානි -පෙ-

ඇතැම් යෝගාවචරයෙක් තම සිරුරෙහි ඒ ඒ කොටස් අනුව බලා කසිණපරිකර්ම කරත්. ඒ මෙසේය. කෙස්හි හෝ පිතෙහි හෝ ඇස් තරුවෙහි හෝ ඇති පැහැය සලකා නීලකසිණයැයි පරිකර්මකරයි. මේදයෙහි හෝ සිවියෙහි අතුල් පතුල්වල හෝ ඇසෙහි කහපාට ඇති තන්හි හෝ පැහැය ගෙන පීතකසිණ වශයෙන් ද, මස්හි හෝ ලෙයෙහි හෝ දිවෙහි හෝ පැහැය ගෙන ලෝහිත කසිණ වශයෙන්ද, ඇටෙහි හෝ දත්හි හෝ නියෙහි හෝ ඇස්හි සුදු තැන්වල හෝ පැහැය ගෙන ඔදාත කසිණ වශයෙන්ද පරිකර්ම කරයි. මෙසේ මේ වර්ණකසිණ සතර, තමාගේම සිරුර දෙස බලා පරිකර්ම වශයෙන් ගත්තිසා, "අජ්ඣත්තං රූප

සඤ්ඤී"ති යෙදිණ. එහෙත් ප්‍රතිභාග නිමිත්ත උපදිනුයේ බාහිර වූ කසිණාරම්මණයක් ගෙනි. එහෙයින් "එකො බහිද්ධාරූපානි පස්සති ඇතැමෙක් බාහිර වූ කසිණාරම්මප්‍රතිභාග නිමිති බලයි' යනු මෙයින් යෙදිණ. ඒවා සුළු වශයෙන් වැඩීම නිසා 'පරිත්තානී' යැයි ද, මහත්වශයෙන් වැඩීම නිසා 'අප්පමාණානි' යැයි ද සඳහන් විය. 'සුවණ්ණදුබ්බණ්ණානි' යන්නෙන් ඒ කසිණාරම්ම-ණයන් ගේ ඇති යහපත් පැහැය හා දුර්වර්ණ බව දැක්විණි.

"තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවංසඤ්ඤී හොති" ඒ කසිණ ප්‍රතිභාගාරම්මණයන් මැඩපවත්වා ධ්‍යාන උපදවමින් ''මම දනිමි, මම දකිමි,'යි යනුවෙන් හැඟීම ඇතිකරගනියි. එනම් බඩගිනි ඇති පුද්ගලයෙක් සැන්දක් පමණ බත්ලැබ'' මෙහි කෑ යුතු දෙයක් නොමැතිය' යි ඒ බත් කවල්පය එක් පිඩුවක්කොට අනුභව කරයි. එමෙන් ඤාණුත්තරිව - නුවණින්වැඩිහිටි - පුද්ගලයාද මෙහි සමවැදිය යුතු දෙයක් නො මැතියයි සුළුකොට සලකා, ඒ ලබාගත් ප්‍රතිභාගාරම්මණයන් අභිභවනය කොට වහ වහා ධ්‍යාන උපදවයි යනුයි. ප්‍රතිභාගාරම්මණයන් උපදිනවාත් සමගම ධ්‍යාන උපදවයි යනු තේරුමයි. ධ්‍යාන ඉපදවීමේ දක්‍ෂභාවය මෙයින් කියැවේ. මෙසේ පළමුවැනි, දෙවැනි, අභිභායතන අධ්‍යාත්මයෙහි වඩනා ලද පරිකර්ම කසිණාරම්මණයන් ඇති පුද්-ගලයන් සඳහා දේශනා කරන ලදී.

තුන් වැන්නෙහි "අජ්ඣත්තං අරූපසඤ්ඤී" යනුපෙර කී පරිදි තමාගේ සිරුරෙහි ඒ ඒ කොටස් අනුව, වර්ණකසිණ පරිකර්ම නො කළ සංඥා ඇත්තා සඳහා යෙදිණ. අජ්ඣත්තං අරූප සඤ්ඤීති අලාභිත්තායවා අනත්ථිකත්තාය වා අජ්ඣත්තරූපෙ පරිකම්මසඤ්ඤා විරහිතො" යනුවෙන් දක්වෙනුයේ නොලැබීම නිසා හෝ නො කැමති නිසාහෝ ආධ්‍යාත්මයෙහි වර්ණකසිණ පරිකර්ම සංඥා නැති තැනැත්තා අජ්ඣත්තං අරූපසඤ්ඤී නම් වෙයි යනුයි.

පස්වැන්නෙහි ''නීලානි නීලවණ්ණානි-'' යනාදිවශයෙන් දැක්වූයේ පැහැදිලි නීලකසිණය යි. සෙසු අභිභායතන ද මෙසේම පැහැදිලි වර්ණකසිණයන් සඳහා දේශනා කරන ලදී. (නිල් වූ නිල් පාට වූ නිල් දැකීම් ඇති, නිල් ආලෝක ඇති මේ වශයෙන් තේරුම සලකා ගතයුතු).

## අභිධර්ම ක්‍රමයට අභිභායතන:-

මෙහි වෙනස ඇත්තේ පළමුවැනි, දෙවැනි, අභිභායතන යන්හි "අජ්ඣත්තං අරූපසඤ්ඤී" යනුවෙන් යෙදීම පමණි. "යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති" යම් වේලාවෙක රූපී බඹලොව ඉපදීම සඳහා මාර්ගය වඩාද, තමා පිළිබඳ රූපයෙහි කරන ලද කසිණ පරිකර්ම සංඥා නොමැතිව, සුළුවශයෙන් වඩනාලද බාහිර කසිණ ප්‍රතිභාගාරම්මණයන් දක, ඒවා "මම දනිමි, මමදකිමි"යි යනුවෙන් ආභොග කොට, මැඩපවත්වා කාමයන් ගෙන් වෙන්වීම් ආදී ලක්ෂණයන්ගෙන් යුත් ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසෙසි.

මෙසේ "අජ්ඣත්තං අරූපසඤ්ඤී" යනුවෙන් අභිභායතන අටම සඳහන් වෙයි. සූත්‍ර ක්‍රමයෙහි මෙන් අභිධර්මක්‍රම යෙහි ද "අජ්ඣත්තං රූපසඤ්ඤී"යි නොවදාළේ කුමක් නිසාද යනු මෙහිලා මතුවන ප්‍රශ්නයෙකි. ඊට පිළිතුරු සපයන අටුවාචාරීහු මෙසේ පවසත්. "අජ්ඣත්තරූපානං අනභිභවනීයතො, තත්ථ වා ඉධ වා බහිද්ධා රූපානෙව අභිභවිතබ්බානි, තස්මා තානි නියමතො වත්තබ්බානීති තත්‍රාපි ඉධාපි වුත්තානි" -අත්ථසාලිනී 188 පිටුව.

තමාගේ සිරුරෙහි කෙස් ආදියෙන් උපදවා ගත් කසිණාරම්මණයන් අභිභවනය නො කළයුතු හෙයින් ය. (ප්‍රතිභාගාරම්මණ නූපදින නිසා ඒ කසිණාරම්මණයන් මැඩ පැවැත්වීමට දෙයක් නොමැත යන අදහසයි) එහෙයින් එහි හෝ මෙහි හෝ බාහිරවූ ප්‍රතිභාගාරම්මණ කසිණ නිමිත්තම අභිභවනය කළ යුතුය. ඒ නිසා අභිධර්මයෙහිදී "අජ්ඣත්තං අරූපසඤ්ඤී"යි දෙසූහ. තවද, "ඉදං පන සත්ථු දෙසනාවිලාසමත්තමෙව" යනුවෙන් මෙසේ දෙසීම ශාස්තෲන් වහන්සේගේ දේශනා විලාශ මාත්‍රයකැයි ද දක්වෙයි; සෙස්ස සූත්‍ර ක්‍රමයෙහි දක්වූ පරිදිමැයි.

(9) "නව අනුපුබ්බවිහාරා" මුලපටන් සමවැදීමේ පිළිවෙල නවයයි. "පුබ්බං පුබ්බං අනු අනුපුබ්බං" පූර්ව පූර්ව සමාධියට අනුවගියේ අනුපූර්ව නම්. එනම් මුල් මුල් සමවැදීමට අනුව යැමයි. "අනුපුබ්බං විහාරි තබ්බතො සමාපජ්ජිතබ්බතො විහාරා, අනුපුබ්බවිහාරා" පිළිවෙලින් සමවැදීම වශයෙන් වාසය කළ

යුතු නිසා අනුපූර්ව විහාර නම්. ප්‍රථම, ද්විතීය, තෘතීය චතුර්ථ පඤ්චම, යන ධ්‍යාන පහ සහ ආකාසානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන අරූපධ්‍යාන සතර' මේ නවය අනුපූර්ව විහාර නාමයෙන් එයි. විස්තර මතුවටයි.

(10) "දසනිජ්ජරවත්ථූනි" වැරදි විනාශ කරන කරුණු දහය, "මිච්ඡාදිට්ඨාදීනි නිජ්ජරයන්ති නාසයන්තීති, නිජ්ජරානි; වත්ථූනීති, කාරණානි, නිජ්ජරානි ච තානි වත්ථූනි චාති නිජ්ජර වත්ථූනි, සම්මා දිට්ඨාදීනං එතං අධිවචනං" මිථ්‍යාදෘෂ්ටි-වැරදි දැකීම්-ආදී ධර්ම විනාශ කරන්නුයි නිජ්ජරනම්. වත්ථු යනු කරුණුයි ඒ නිර්ජරවීම කරුණු නිජ්ජරවත්ථු යි. එනම් සම්මාදිට්ඨි ආදී ධර්මයනට මේ නමකි ආදී ශබ්දයෙන් සම්මාසඞ්කප්ප- වාචා- කම්මන්ත-ආජීව වායාම - සති - සමාධි - විමුත්ති - විමුත්තිඤාණ ගතයුතුය. සම්මාදිට්ඨි ආදී ධර්ම දසය, ක්‍රමයෙන් වැරදි දැකීම් - කල්පනා - වචන ක්‍රියා - ජීවත්වීම් - උත්සාහය -සිහිය - එකඟකම නුවණ -මිදීම යන මොව්හු විනාශ කරත්.

එකකාදී ධර්ම දසය මෙතෙකින් අවසානය. මෙතැන්සිට දක්වනුයේ ඉදිරි ඤාණවිස්තරය තේරුම් ගැනීමට අවශ්‍ය වන ධර්ම කොටස් පමණි එහෙත් ඉදිරියෙහි විස්තර කළයුතු දෑ.

**28 ඡධාතු:** ධාතු සය දතයුතුය.

මෙහි 'ධාතු' යනු ස්වභාවයයි. එනම් හැටියි. "අත්තනො සභාවං ධාරෙන්තීති ධාතු" තමාගේ හැටි, ගතිය, දරනුයි ධාතු නම්. එවැනි ධාතු දෙයාකාරය. අජ්ඣත්තික ධාතු-තම ජීවිතය පිළිබඳ ධාතු හා බාහිර ධාතු-අවට පවතින ධාතු යනුයි. මෙහි සඳහන් වනුයේ තම ජීවිතයෙහි ඇති ධාතූන් අතුරෙන් ප්‍රධාන සයකි.

( i ) පඨවිධාතු: සිරුරෙහි පවතින තදගතිය, තද ස්වභාවය, පඨවිධාතුයි මෙය සිරුරට අයත් සෙසු රූප පිහිටා සිටීමට ආධාරය.

(ii ) ආපොධාතු: සිරුරෙහි පවත්නා තෙත් ගතියයි. රූප පොදිගසනුයේ මෙම ධාතුයෙනි. ආපොධාතු නො මැති නම් රූප විසිරීයයි.

(iii) තෙජෝධාතු: එහිම පවත්නා මෝරන ගතියයි. රූපයන්ගේ බේරීම කෙරෙනුයේ මේ ධාතුයෙනි. තෙජෝ ධාතුව නැතහොත් බාල, තරුණාදී ශරීරයේ අවස්ථා නොපෙනේ.

(iv) වායෝධාතු: සෙලවෙන ගතියයි. හුස්ම පැමැත්ම, ලේ ගමනය, අවයව සෙලවීම, කථාකිරීම, ආදී දෑ කෙරෙනුයේ මේ ධාතුයෙනි.

(v) ආකාසධාතු: කිසිවකට සම්බන්ධ නැති සවභාවයයි. සිරුරෙහි එබඳු ධාතුවක් ඇත. කන් සිදුරු, නාස් සිදුරු, මුඛය බඩවැල, ආදී ස්ථානයන්හි මේ ධාතුව ප්‍රකට වෙයි. රූප යත් වෙන් කරනුයේ මේ මගිනි.

(vi) විඤ්ඤාණධාතු: අරූපි ධර්ම වශයෙන් පවත්නා සිතන ගතියයි. මෙය චක්ඛුවිඤ්ඤාණාදී වශයෙන් විස්තර මතු සඳහන් වෙයි.

**29. දස කසිණ: කසිණ දසය (දත යුතුය)**

කසිණ යනු සියල්ලයි. "සකලට්ඨේන කසිණං" මේ විග්‍රහයයි. සමථභාවනාවට බොහෝ සේ උපකාර වන දෙයකි කසිණය. එය අරමුණු ගැනීමට පහසු වනසේ අරුණුවන් මැටි ආදී බාහිර ද්‍රව්‍යයකින් සාදාගත හැක. එසේ සාදාගත් කසිණය ද, එයින් ගත් අරමුණ ද, අරමුණෙන් උපදවාගත් ධ්‍යානයද, යන කසිණ නමින්ම හඳුන්වයි. එවැනි කසිණ දසයකි. පඨවිකසිණය, ආපෝ කසිණය, තෙජෝ කසිණය, වායො කසිණය, නීලකසිණය, පීත කසිණය, ලොහිත කසිණය, ඕදාත කසිණය, ආලෝක කසිණය, ආකාස කසිණය, යන දසයයි.

i පඨවි කසිණය: අරුණුවන් මැටියෙන් සාදගනු ලබන, තත්‍රට්ඨක ගෙනයාමට නො හැකි, සංහාරිමක - ගෙනයාමට හැකි යන දෙආකාරයකින් යුත් කසිණ මණ්ඩලයයි. ගෙනයාමට හැකි කසිණ මණ්ඩලය එක් වියත් සතරඟුල් වියයුතු. මෙය ඉදිරි පිට තබා ගෙන භාවනා කර, උපදවා ගනුලබන ධ්‍යානයද මේනමින් ම ව්‍යවහාර වන බව මතක තබා ගත යුතුය. වැඩි විස්තර විශුද්ධිමාර්ගයෙන් බලා දතයුතුය.

ii ආපො කසිණය: ජලයෙන් සකස් කරගත් මණ්ඩලයයි. පාත්‍රය වැනි භාජනයකට පිරෙන තෙක් ජලය දමා, ඇල වෙන්නේ නැතිව, තබාගතයුතුය. මෙහි ප්‍රමාණය ද එක් වියත් සතරඟුල් වනවා නම් වඩාත් හොඳය. මෙයට පිරිසුදු ජලයම අවශ්‍ය හෙයින් වර්ෂාව පවතින විටෙක, පෙරහනක් බැඳි භාජනයක් එළි මහනෙක තබා, එහි රැස්වූ ජලය ගත යුතු.

iii **තේජෝ කසිණය:** ගින්නෙන් සකස් කරගත් මණ්ඩලයයි.
මෙය සකස් කරගන්නහු විසින් හොඳ දර දමා, සුළඟ නද
නැති තැනක ගිනි මැලයක් ගසා, ඒ ඉදිරි පිට කවාකාරම-
මණ්ඩලය සේ හිල් කළ වස්ත්‍රයක් තිරයක් මෙන් සිටින පරිදි
සිට වූ ලී දෙකක බැඳගත යුතුය ඒ බැඳි රෙද්දෙන් මෑහා
සිට හිල් කළ මණ්ඩලය දෙස බලමින් භාවනා කළයුතුය.

iv **වායෝ කසිණය:** සුළඟෙහි අරමුණ තබා ගැනීමය. මෙය
පෙර කසිණ මෙන් මණ්ඩලාකාරව සකස් කරගැනීමට නො
හැකිබව සිහිකටයුතු. මෙම කසිණය දැකීම, හැප්පීම, (දිටඨ,
පුටඨ) යන දෙයාකාරයෙන් නිමිත්ත ගතයුතුය. ගස් වැල්වල
කොළ, දළු, සෙලවීම, තම සිරුරෙහි කෙස්, ලොම් සෙලවීම,
මෙසේ දැකීම් වශයෙන් ද, මනා සිහියෙන් හුන් කල තම
සිරුරෙහි අවුත් වදින සුළඟ, ගැන සැලකීම, හැප්පීම වශ
යෙන්ද අරමුණ ගතයුතුය.

v **නීල කසිණය:** නිල් පාට කසිණ මණ්ඩලය. මේ සාදගත
යුතු එකකි. නිල් පැහැය ඇති මල්, නිල් මානෙල්, නිල් කට
රොළු, ආදියෙන් පෙර කී පරිදි එක් වියත් සතරඟුල් ප්‍රමා
ණය ඇති වට්ටියකට හෝ එවැනි භාජනයකට හෝ නැටි
යටට සිටින සේ පිරෙන කොට අතුරා ගතයුතුය. නැත
හොත් නිල් වස්ත්‍රයක්, නිල් සායම් තැවරූ යමක් සූදානම්
කරගත යුතුය. ඒ සූදානම් කරගත් මණ්ඩලය නීල කසිණ
යයි.

vi **පීත කසිණය:** කිනිහිරි මල් වලින් හෝ කහපාට වස්ත්‍රාදිය
කින් හෝ සාදගත් කසිණ මණ්ඩලය යි. ප්‍රමාණය පෙර
පරිදියි.

vii **ලෝහිත කසිණය;** බඳුවද මල් ආදී රතු පැහැයෙන් සාද
ගත යුතුය.

viii **ඕදාත කසිණය:** සුදු පැහැය ඇති මල් ආදියකින් සාදගත
යුතුය.

ix **ආලෝක කසිණය:** සූර්‍යාලෝකයෙන් හෝ චන්ද්‍රාලෝක
යෙන් හෝ ක්‍රමවත් ලෙස තනාගත් අරමුණ ආලෝක කසි
ණයයි. සාදගත යුත්තේ මෙසේය. කවාකාර සිදුරකින් බිත්
තියට එළිය වැටේ නම් ඉතා පහසුය. එසේ නැතිනම් කල
යක පහනක් දල්වා කටබැඳ, කවාකාර සිදුරක් කලයෙහි

තබා, ඒ පෙදෙස බිත්තියට සිටිනසේ තැබූ විට කවාකාර ආලෝකය පෙනේ. ඒ කසිණ මණ්ඩලයයි.

x **ආකාශ කසිණය**: කවාකාර ක්‍රමයෙන් ගන්නා අහසෙහි අරමුණ. හොඳට සෙවිලි කළ වහලයක සිදුරකින් අහසදෙස බැලිය යුතු. එසේ නොමැති නම් එවැනි වහලයක හෝ සණ සම් කඩක හෝ එක් වියත් සතරඟුල් වනසේ සිදුරක් කර එය අහස දෙසට යොමුකර, තබා බැලිය යුතු. ඒ ආකාස කසිණයයි.

මේ අයුරින් සාදාගත් කසිණ මණ්ඩල දෙස බලමින් ඒ කසිණයන් ගේ පාලි නාමය ම ගෙන කියමින් වැඩිය යුතුය. එසේ භාවනා කරන කල්හි ඒ කසිණ අරමුණු තම සිතෙහි ඇඳීගොස් පිහිටියේ නම්, ඒ සිතෙහි ඇඳී සිටි කසිණ මණ්ඩල "උග්ගහනි-මිත්ත" යනුවෙන් හඳුන්වයි. තමා වැඩූ කසිණයට අනුව ලබාගත් උග්ගහනිමිත්ත පහසු තැනකට ගොස් වඩත හැක. එසේ වඩද්දී ඒ කසිණ අරමුණ පලාගෙන, ඊට වඩා පැහැදිලි, ලස්සන කසිණාරම්මණයක් උපදියි. එය "පටිභාගනිමිත්ත" නම්. මෙසේ කසිණයන් පිළිබඳ, පරිකම්, උද්ග්‍රහ, ප්‍රතිභාග, වශයෙන් අරමුණු තුනක් ඇත. මුලින් ම තනාගත් කසිණය පරිකම් නිමිත්තයි. මෙසේ කසිණ දසයෙකි.

**80. අටළොස්ධාතු**: ධාතු දහ අට (දත යුතුය)

i **චක්ඛුධාතු**: ඇසෙහි රූප දැක්මට සමත් වූ කළු ඉංගිරියාව, මෙය රූපයන්ගේ සටහන් වැටෙන ස්වභාවය දරන හෙයින් ධාතු නම්.

ii **සොතධාතු**: කන් බිලෙහි ඇති, ශබ්ද අවුත් වදනා තැන වූ රෝමුවක් ගසයි. ශබ්ද සටහන් දරන හෙයින් ධාතුයි.

iii **ඝාණධාතු**: නැහැයේ ඇතුළේ මූ එළු කුරයක් බඳු සටහන් ඇති තැන. ගඳ සුවඳ දැනෙනුයේ මෙතැනටය.

iv **ජිව්හාධාතු** දිව මැද උපුල් පෙත්තක් බඳු රසයන් දැන ගන්නා තැන.

v **කායධාතු**: චක්ඛුධාතු ආදී සතර තැන් හැර ඉතිරි සිරුර සැම තැනම, පැතිරී පවත්නා බාහිර දේ හැප්පීමට සුදුසු, පුළුන් පෙදක ඉස්ස ගිතෙලක් බඳු ගතිය යි.

vi රූපධාතු: ඇසට ලක්වන වර්ණ විකාරයි. පැහැයේ වෙනස.

vii සද්දධාතු: කණට අරමුණු වන, බෙර ආදියෙන් නැගෙන ශබ්දාකාරය.

viii ගන්ධධාතු: නැහැයට ලක්වන ගඳ සුවඳයි.

ix රසධාතු: දිවට දැනෙන මිහිරි තිත්ත රස ආදීයයි.

x ඵොට්ඨබ්බධාතු: සිරුරට දැනෙන හැප්පීම්ස්වභාවය. මෙය පඨවි, තෙජෝ, වායෝ, යන ධාතුමාත්‍රයක්ම බව කියැවේ.

xi චක්ඛුවිඤ්ඤාණධාතු; සොතවිඤ්ඤාණධාතු, ඝාණවිඤ්ඤාණධාතු, ජිව්හාවිඤ්ඤාණධාතු, කායවිඤ්ඤාණධාතු, යන පස පිළිවෙලින් ඒ ඒ තැන්වල උපදින සිත හා සිතුවිලි ගතයුතු.

xvi මනොධාතු: පඤ්චද්වාරාවර්ජන, කුශලාකුසල විපාකාහෙතුක වූ සම්පටිච්ඡන සිත් දෙක යන මොහුයි.

xvii ධම්මධාතු: සිතුවිලි දෙපණස, සියුම් රූප සොළස, නිවණ, යන මොහුයි.

xviii මනොවිඤ්ඤාණධාතු: පෙර කී චක්ඛුවිඤ්ඤාණාදී දසය, මනොධාතුත්‍රිකය (තුන) යන සිත් තෙළෙස (13) හැර ඉතිරි සසැත්තෑ සිත් ය (76)

සිරුර පිළිබඳ, නාමරූප සොයන්නා වූ විදර්ශක යෝගාවචර හට මේ අටළොස් ධාතු විස්තර ඉතා උපකාරය. විඤ්ඤාණ නාමයෙන් ආ ධාතුහුද, මනොධාතු ද, ධම්මධාතු ද, නාමධර්මයෝයි සෙස්ස රූපධර්මයෝයි. මෙවායින් බාහිර වූ වෙනත් නාමරූප ධර්ම ශරීරයෙහි නො මැත. සියල්ල ධාතු බෙදීමට හසුවිය.

31. ඉන්ද්‍රියධර්ම විසිදෙක. (දතයුතුය)

"ඉන්දට්ඨං කාරෙන්තීති ඉන්ද්‍රියං" අධිපතිකම කෙරෙත්නුයි ඉන්ද්‍රිය නම්. තම තමාට අයිති වැඩෙහිදී ප්‍රධාන වේ යන තේරුමයි, මෙහිදී කියැවෙනුයේ. එබඳු ධර්ම විසිදෙකක් ඇත. එද නාම රූපධර්ම මැයි. ඔව්හු නම්.

චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝාණින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, මනින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය,

සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, සමාධින්ද්‍රිය, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය, යනුයි.

මෙයින් චක්ඛුන්ද්‍රියාදී ඉන්ද්‍රිය සයදෙන පෙර ධාතු විස්තරයේ දී සඳහන් වූ පරිදියි. ඔව්හු දැකීම් ආදී තම තමාට අයත් කෘත්‍ය යෙහි අධිපතිකම දරන හෙයින් 'ඉන්ද්‍රිය' නම් ලබත්. 'චක්ඛුමෙව දස්සනලක්ඛණෙ ඉන්දට්ඨං කාරෙතීති චක්ඛුන්ද්‍රියං' ඇසම දැකීම් ස්වභාවයෙහි ප්‍රධානකම කෙරේනුයි චක්ඛුන්ද්‍රිය නමි. සෙසු ඒවාද මේ ක්‍රමයෙන් ගතයුතුය.

vii ජීවිතින්ද්‍රිය: මැරෙන්නට නොදී ජීවිතය පාලනය කරනුයේ ජීවිතින්ද්‍රිය නමි. මෙය දෙවැදෑරුම්ය. රූප ජීවිතින්ද්‍රිය, අරූප ජීවිතින්ද්‍රිය, කියායි. රූපධර්ම පාලනය කරනුයේ රූපජීවිතින්ද්‍රියයි, අරූප වූ චිත්ත-චෛතසිකයන් පාලනය කරනුයේ අරූපජීවිතින්ද්‍රියයි.

viii ඉත්ථින්ද්‍රිය: සිරුරෙහි 'මේ ස්ත්‍රියක්ය' යන හැඟීම ඇතිවීමට උපකාරවන ගතිය ඉත්ථින්ද්‍රියයි. අත්-පාහි මෘදු ස්වභාවය, පයොධර, මූත්‍රාමාර්ගය, යන මේ ආදිය ඒ ඉන්ද්‍රිය ධර්මය ප්‍රකට කරන තැන්ය. නමුත් මුළු සිරුරෙහිම මේ ඉන්ද්‍රිය බලපවත්නා බව දතයුතුය.

ix පුරිසින්ද්‍රිය: 'මේ පුරුෂයෙක්ය'' යන හැඟීම ඇති වීමට උපකාරවන ගතිය යි. ගොරෝසු අත් පා, දැලිරැවුළු, මූත්‍රාමාර්ගය, ආදිය එය ප්‍රකට කරන තැන්ය.

x සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය, යන පස වේදනාවෝයි. සිරුරට දැනෙන සැප වේදනාව සුඛින්ද්‍රියයි. දුක් වේදනාව දුක්ඛින්ද්‍රියයි. සිතට දැනෙන සැප වේදනාව සොමනස්සින්ද්‍රියයි. දුක් වෙදනාව දොමනස්සින්ද්‍රියයි. සිරුරටත් සිතටත් දැනෙන මැදහත් වේදනාව උපෙක්ඛින්ද්‍රියයි.

xv සද්ධින්ද්‍රිය: ශ්‍රද්ධාව ම අධිපතිවූයේ සද්ධින්ද්‍රියයි. ශ්‍රද්ධා යනු ඇදහීමයි. මෙහිදී ගතයුත්තේ බුද්ධාදී උතුමන් ගේ ගුණ ඇදහීමය. එනම් විශ්වාස කිරීමයි.

xvi විරියින්ද්‍රිය: කුසීතකම මැඩපවත්වා කුශලයන්හි යොදවන උත්සාහගතිය විරියයි එයම ඉන්ද්‍රියවූයේ විරියින්ද්‍රියයි. මෙය බල, සම්මප්පධානාදී නාමයන් වශයෙන්ද එයි.

xvii සතින්ද්‍රිය: සිහි කරන නිසා සති නම්. එනම් සිහියයි. සතර සතිපට්ඨාන, සතිබල, ආදී වශයෙන්ද එයි.

xviii සමාධින්ද්‍රිය: කුසල් පිළිබඳ සිතෙහි එකඟ කම, නො විසුරුණු බව සමාධි නම්. එය ම ඉන්ද්‍රිය නාමයෙන් ආයේය.

xix පඤ්ඤින්ද්‍රිය: ඉතිරිමක් නොමැතිව හාත් පසින්ම දැන ගන්නා ස්වභාවය ප්‍රඥා නම්. මෙය පසුව විස්තර වේ.

xx අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය: සෝවාන් මාර්ගය පිළිබඳ යෙදුණු නුවණයි. "අනමතග්ගසංසාරවට්ටෙ අනඤ්ඤාතං අමතං පදං චතුසච්චධම්මමෙව වා ජානිස්සාමීති පටිපන්නස්ස උප්පජ්ජනතො ඉන්ද්‍රියට්ඨසම්භවතො ච අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියං" කෙළවරක් නැති සසරෙහිදී නො දක්නා ලද අමාමහ නිවණ හෝ සිවුසස් දහම හෝ දැන ගන්නෙමි'යි පිළිපදින්නහුට උපදින බැවින් ද, අධිපතිකම දරණ හෙයින්ද අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය යතු අටුවා විස්තරයයි.

xxi අඤ්ඤින්ද්‍රිය: සකෘදාගාමි, අනාගාමි, රහත් යන මාර්ගතුනෙහි හා සෝවාන්, සකෘදාගාමි, අනාගාමි යන ඵල තුනෙහි යෙදුනු නුවණයි මුල් මාර්ගයෙන් දැන ගන්නා ලද්ද නො ඉක්මවා පවතින, ඒ මගින්ම දන්නා ලද, සිවුසස් දහම් හුගේ දන්නා බැවින් අඤ්ඤින්ද්‍රිය නම්.

xxii අඤ්ඤාතාවින්ද්‍රිය: අර්හත් ඵලය හා යෙදුනු නුවණයි. 'අඤ්ඤාතාවිනො චතුසච්චෙසු නිට්ඨිත ඤාණකිච්චස්ස උප්පජ්ජ-නතො ඉන්ද්‍රියට්ඨසම්භවතො ච අඤ්ඤාතාවින්ද්‍රියං' සිවුසස් අවබෝධ කළ, සිවුසස් දහම්හි නිමවන ලද ඥාන කෘත්‍ය ඇති, ගෙවූ ආශ්‍රව ධර්ම ඇතියහුට උපදින බැවින් ද අධිපති කම දරන හෙයින්ද අඤ්ඤාතාවින්ද්‍රිය නම්.

මේ ඉන්ද්‍රියන් තුන් දෙනා ලෝකෝත්තර මය. සද්ධින්ද්‍රිය ආදී හු ලෞකිකයහ. විදසුන් නුවණ වැඩීම සඳහා නාමරූප විමසන යෝගියාට මේ දෙවිසි ඉන්ද්‍රිය ඉතා උපකාරයි. ලෝකෝත්තර ඉන්ද්‍රිය තුන හැර ඉතිරි ඉන්ද්‍රිය නාමරූප වශයෙන් දෙපරිදි වෙයි.

## 32. හේතු - ඵල, හේතු නිරෝධය. (දතයුතුය)

අභිඤ්ඤානිද්දේශයෙහි ඊළඟට දක්වෙනුයේ නාමරූපධර්මයන් පිළිබඳ හේතු, නිරෝධ, දතයුතුය යන කොටසයි. එයින් මෙහිලා රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, යන ස්කන්ධ පඤ්චකය පමණක් දක්වමි.

“රූපය දතයුතුය, රූපයන් ගේ හේතුව දතයුතුය, රූපයන්ගේ නිරෝධය දත යුතුය. රූපය නිරෝධයට පැමිණෙන මාර්ගය දතයුතුය. වේදනා දතයුතුය යනාදී වශයෙන් සෙසු ස්කන්ධයන්ද මෙසේම සලකා ගතයුතුය. මේ විස්තරයේ කෙටි අදහස ස්කන්ධ, ධාතු, ඉන්ද්‍රිය, ආදී වශයෙන් බෙදී ගියා වූ ජීවිතයෙහි නාමරූපධර්මයන්ගේ හේතුව, එයින් හට ගත් දේ, හේතු විනාශය විනාශ කිරීමේ මාර්ගය, යන සත්‍යධර්ම මනාලෙස දැනගත යුතුය යනුයි.

මෙතෙකින් අභිඤ්ඤානිද්දේශය විස්තර කිරීම අවසානයි.

# 3 වැනි පරිච්ඡේදය

## 33 පරිච්ඡේදය නිර්දේශයෙහි එකකාදි දසය.

"කෙසේ නම් මේ ධර්මයෝ පිරිසිඳ දතයුත්තාහුය යි දේශනා කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම සමූහය සෝතාවධාන නම් වේද? එය දැනගන්නා වූ ප්‍රඥාව සුතමය ඥාණය නම් වේද? එක් ධර්මයක් පිරිසිඳ දතයුතුය. එනම් උපාදානයන්ට අරමුණු වූ ඵස්සය යි. ධර්ම දෙකක් පිරිසිඳ දතයුතුය. නාමයත් රූපයත්ය. ධර්ම තුනක් - පෙරමෙනි - ත්‍රිවිධ වෙදනාවෝයි. ධර්ම සතරක් - සතර ආහාරයෝය. ධර්ම පනක් - උපාදානස්කන්ධ පසය. ධර්ම සයක් - අධ්‍යාත්මික ආයතන සය. ධර්ම සතක් - විඥානස්ථිති සතය. ධර්ම අටක් - අෂ්ටලෝක ධර්මය. ධර්ම නමයක් සත්වාවාසයෝය; ධර්ම දසයක් - දස ආයතනයෝය.' ප. ම. සිං. ප.

බුදුරජාණන් වහන්සේ මෙසේ බෙදා දක්වමින් කොටස් කර වදාළ පිරිසිඳ දතයුතු ධර්ම සමූහයෙන් මෙහි විස්තර කරනුයේ ධර්ම කොටස් කීපයකි. සෙසු ධර්ම මෙම ග්‍රන්ථය පරිශීලනය කරන්නහුට සොයා ගැනීම එතරම් අපහසු නැත.

## 34. "චත්තාරෝ ආහාරා" ආහාර සතරෙකි. (පිරිසිඳ දතයුතුය)

"ආහාරෙන්ති පච්චයා, පච්චයාහි අත්තනො ඵලං ආහරන්ති ති ආහාරා" ආහාර යනු ප්‍රත්‍යයෝ යි. පසයයි මොවුහු වනාහි තමාගේ ඵලය, බලාපොරොත්තුව, ගෙනෙත්තු යි ආහාර නම්. අප ගේ බලාපොරොත්තුව වූ ජීවත්වීම, හොඳ රූප දැකීම, ශබ්ද ඇසීම ආදී දෑ අපට සැපයෙනුයේ ආහාරයෙන් බව මෙයින් පැහැදිලි කෙරිණි. එබඳු ආහාර සතරෙකි.

1. කබලීකාර ආහාරය: පිඩුකොට ගනු ලබන ආහාරය යි. බත්, පිටවු, අල වගී ආදී දෑය. පිඩුකොට ගත නො හැකි වුවත් ජීවත්වීමට අවශ්‍ය වන ආහාරයට ගැනෙන සියලුම දෑ කබලීකාර ආහාර ගණයට අයත් වෙයි. කිරි, සුප් ආදිය මීට ඇතුලත්. "!සා [illegible] ඔජට්ඨමක

රූපානි ආහාර තීති ආහාරො" කබලීකාරාහාරය වනාහි ඕජාව අටවැනි කොට ඇති රූප ගෙනෙන - ලැබෙන නිසා ආහාර නම්. (ඔජාව අටවැනි කොට ඇති රූප: පඨවී, අපො, තෙජො, වායො, වණ්ණ, ගන්ධ, රස, ඔජා යන අටයි)

ii. ඵස්සාහාරය: ස්පර්ශ ආහාරය යි.

ඇස්, කන්, ආදී ඉඳුරන් සය දෙනාට අරමුණු වශයෙන් හැප්පෙන රූප, ශබ්දාදිය යි. මෙය සවැදෑරුම් ය. චක්ඛු සම්ඵස්සය, සොතසම්ඵස්සය, ඝාණසම්ඵස්සය, ජිව්හා සම්ඵස්සය, කායසම්ඵස්සය, මනොසම්ඵස්සය යනුයි.

iii. මනොසඤ්චෙතනාහාරය:

සිතෙහි යෙදුනු සිත හා සිතුවිලියි. කාම, රූප, අරූප යන හවත්‍රයෙහි - තුන්ලොවෙහි - ම හැසිරෙන කුශලාකුශල කර්ම මෙයින් ගැනේ.

iv. විඤ්ඤාණාහාරය:

හවයෙක පිළිසිඳ ගැනීමට උපකාරීවන සිත්ය. "විඤ්ඤාණන්ති එකූනවීසති භෙදං පටිසන්ධි විඤ්ඤාණං, තං හි පටිසන්ධි නාමරූපං ආහාර තීති ආහාරො" විඤ්ඤාණ යනු දහනම වැදෑරුම් පිළිසිඳ ගන්නා සිත්වලට නමකි. එය වනාහි පිළිසිඳ ගැනීමේදී නාමරූප දෙක ම එළවන පමුණුවන නිසා ආහාර නම්. ප්‍රතිසන්ධි සිත් එකුන්විස්ස (19) අභිධම්මාර්ථ සංග්‍රහයෙන් බලන්න.

35, "සත්ත විඤ්ඤාණට්ඨිති" ප්‍රතිසන්ධිවිඥාන = පිළිසිඳ ගන්නා සිත් පිහිටන තැන් සත. (පිරිසිඳ දත යුතුය)

I නානත්තකායා නානත්තසඤ්ඤිනො:

නොයෙක් අයුරු සිරුරු ඇති, නොයෙක් පිළිසිඳ ගැනීමේ සිත් ඇති, මිනිස්සු, ඇතැම් දෙවියෝ, ඇතැම් විනිපාතික ප්‍රේතයෝ යන මොව්හු පළමුවැනි විඥානස්ථිතියට ගැනෙත්.

II නානත්තකායා එකත්තසඤ්ඤිනො:

එක ම සිතකින්, එක්වැනි සිතකින් පිළිසිඳ ගත් නොයෙක් අයුරු සිරුරු ඇති දෙවියෝ, ප්‍රථමධ්‍යාන විපාක සිතින් උපන් බ්‍රහ්මයෝ යන මොහුයි.

III එකත්තකායා නානත්තසඤ්ඤිනො:

එක් අයුරු සිරුරු ඇති, නොයෙක් අයුරු පිළිසිඳ ගන්නා සිත් ඇති ආභස්සර වැසි දෙවියෝය.

IV එකත්තකායා එකත්තසඤ්ඤිනො: සුභකිණ්හකයෝය.

V ආකාසානඤ්චායතනූපගා: පළමුවැනි අරූපී බ්‍රහ්මයෝ

VI විඤ්ඤාණඤ්චායතනූපගා: දෙවැනි අරූපී බ්‍රහ්මයෝ.

VII ආකිඤ්චඤ්ඤායතනූපගා: තුන්වැනි අරූපී බ්‍රහ්මයෝ

මේ සප්ත විඥානස්ථිතීහුය.

36. "අට්ඨලොකධම්මා" අටලෝ දහම් (පිරිසිඳ දතයුතුය)

"ලොකප්පවත්තියා සති අනුපරම ධම්මකත්තා ලොකස්ස ධම්මාති ලොකධම්මා" ලෝකයේ පැවැත්ම ඇති කල්හි ඊට අනුව කරකැවෙන, ස්වභාව ධර්මයා විසින් කරන ලද ලෝක ධර්ම, ලෝකධර්මයෑයි අටුවාව සඳහන් කරයි. මෙයින් අදහස් කරනුයේ ලෝකයේ සැම ද පවතින ස්වභාවධර්ම යනුයි. එබඳු ධර්ම අටෙකි. "අට්ඨිමෙ භික්ඛවෙ ලොකධම්මා ලොකං අනුපරිවත්තන්ති, ලොකො ච අට්ඨලොකධම්මෙ අනුපරිවත්තතීති. කතමෙ අට්ඨ? ලාභො ච අලාභො ච අයසො ච යසො ච නින්දා ච පසංසා ච සුඛං ච දුක්ඛං ච, ඉමෙ ඛො භික්ඛවෙ අට්ඨලොකධම්මා ලොකං අනුපරිවත්තන්ති ලොකො ච ඉමෙ අට්ඨලොකධම්මෙ අනුපරිවත්තති" අ. නි. මහණෙනි, ලෝකධර්ම අටෙකි. මොව්හු ලෝකයා අනුව කරකැවෙත්. ලෝකයා ද මොවුන් අනුව කරකැවෙයි. කවර නම් අටක්ද? ලාභය, අලාභය, යසය, අයසය, නින්දාය, ප්‍රශංසාය, සුඛය, දුඃඛය යනුයි. මේ දහම් අටදෙනා ලෝකයේ වසන සියලු සත්වයනට සාධාරණය. ලෝකනිස්සරණය කළ - ලෝකයෙන් ඇත්වූ බුදු, පසේබුදු, රහත් යන උතුමනට ද පරිනිර්වාණය තෙක් බලපවත්වයි. සෙස්සන් ගැන කියනු කිම?

පරිඥෙය්‍ය නිර්දේශය මෙතෙකින් අවසානය.

---

37. ප්‍රහාතව්‍ය නිර්දේශයෙහි ඒකකාදි දසධර්මයෝ:

"කෙසේ නම් ඒ ධර්මයෝ පහකළ යුත්තාහයි වදාළ ධර්ම සොතාවධාන නම් වේද? එය දැනගත්තා වූ ප්‍රඥාව සුතමය ඥාණ නම් වේද? එක් ධර්මයක් පහකළ යුතුය. එනම් අස්මි මානය යි. ධර්ම දෙකක් පහකළ යුතුය. අවිද්‍යාවත් භව තෘෂ්ණා වත්ය. ධර්ම තුනක් - පෙරමෙනි. ත්‍රිවිධ තෘෂ්ණාවෝයි. ධර්ම සතරක් - සතර ඕඝයෝයි ධර්ම පහක් - පඤ්චනීවරණයෝය. ධර්ම සයක් - සවැදෑරුම් තෘෂ්ණාකායයෝයි ධර්ම සතක් - සප්තානුසයෝය. ධර්ම අටක් - මිච්ඡත්තධර්ම අටය. ධර්ම නව යක් - නවයක් වූ තෘෂ්ණා මූලකයෝය ධර්ම දසයක් - දස මිච්ඡත්ත ධර්මසෝය: - ප. ම. සිං, ප

ප්‍රහාතව්‍ය - අත්කළ යුතු - ධර්ම මෙසේ ආරම්භකොට අඩ බණවරක් පමණ දේශනා කළහ. ඒ හැම ධර්ම කොටඨාසයක් ම සුතමය ඥාණ විස්තරයෙහිලා ඇතුළත් වුවත් මෙහිදී විස්තර කරනුයේ එයින් ධර්ම කොටස් කිපයක් පමණි.

38. "අස්මි මානො" මම යන හැඟීම පහකළ යුතුය.

"රූපාදිසු පඤ්චසු උපාදානක්ඛන්ධෙසු අස්මීති මානො අස්මිමානො" රූපාදී පඤ්චස්කන්ධයෙහි "මම යැ" යි හැඟීම මැනගැනීම - අස්මිමාන නමි. මම ය, මාගේ ය, යනාදී වශයෙන් සිතාගනු ලබන වැරදි හැඟීම, වේ අස්මිමානය බව වැඩිදුරටත් තේරුම්ගත යුතුය. අත්කළ යුතු ධර්ම අතර මෙය ප්‍රධානයි. එසේ ම රහත් වන තෙක් ප්‍රහාණය ද නොවේ. එතරම් බලවත්ය මේ නිසා ඇතැම් විදශීකයෝ ද මූලාවෙත්

39. "සත්ත අනුසයා" නිදාගත්තාක් මෙන් හැංගී පවතින කෙලෙස් සත. (පහකළ යුතුය)

"අනුසෙන්තීති අනුසයා" සිත අනුව - සිතපල්ලේ නිදාගතිත් නුයි අනුසය නමි. එවැනි කෙලෙස් හතක් පවතී.

i කාමරාගානුසය: පස්කම් සැප කෙරෙහි ඇල්ම.

ii පටිඝානුසයා ද්වේෂය; තරහගතිය, ක්‍රොධය ආදී ගතියි.

iii මානානුසය: මානය - සෙය්‍යසෙය්‍යාදී වශයෙන් නව වැදෑරුම්ය.

iv දිට්ඨානුසය: වැරදි දැකීම යි. එනම් මිථ්‍යාවිශ්වාසය යි.

v විචිකිච්ඡානුසය: බුද්ධාදී අටතැන සැකය යි.

vi භවරාගානුසය: භවය පිළිබඳ ඇල්ම.

vii අවිජ්ජානුසය: දුඃඛාදී ආර්‍ය්‍ය සත්‍යයන් නො දැකීම.

මේ අනුසය ධර්ම සතයි.

40· "නව තණ්හා මූලකා" ආශාව මුල්කොට ඇති ධර්ම නවය.
තෘෂ්ණාව මූලිකව ධර්මයෝ නවදෙනෙක් වෙත්.

'තණ්හා මූලං එතෙසන්ති තණ්හාමූලකා' මොවුන්ට තෘෂ්ණා මුල්වූයේනු යි, තණ්හා තණ්හා මූලක නම් යනු අටුවා යි.

i තණ්හං පටිච්ච පරියෙසනා: ආශාව නිසා රූපාදිය සෙවීම.

ii පරියෙසනං පටිච්ච ලාභො: සෙවීම නිසා ලැබීම.

iii ලාභං පටිච්ච විනිච්ඡයො: ලැබීම නිසා හොඳ නරක විසඳුම.

iv විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො: විසඳීම නිසා ඒවාහි ඇල්ම.

v ඡන්දරාගං පටිච්ච අජ්ඣොසානං: ඒ ඇල්ම නිසා එයට ම බැසගැන්ම.

vi අජ්ඣොසානං පටිච්ච පරිග්ගහො: බැසගැන්ම නිසා අල්ලා ගැනීම.

vii පරිග්ගහං පටිච්ච මච්ඡරියං: අල්ලා ගැනීම නිසා මසුරු කම.

viii මච්ඡරියං පටිච්ච ආරක්ඛො: මසුරුකම නිසා රැක ගැන්ම.

ix ආරක්ඛාධිකරණං දණ්ඩාදාන සත්ථාදාන කලහ විග්ගහ විවාද තුවං තුවං පෙසුඤ්ඤ මුසාවාද අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති; රැකගැනීමේ හේතු නිසා දඬුගැනීම - ගහගැනීම, ආයුධ ගැනීම, කෝලාහල, වාද, බැණදෙඩීම, කේලාම්, මුසාවාද ආදී බොහෝ පව් රැස් වෙති.

තෘෂ්ණාව නිසා සිදුවන දු පිළිබඳ පැහැදිලි විස්තරයක් මෙයින් හෙළිවිය.

41. "දස මිච්ඡත්ත" අසත්‍ය - බොරු දසයකි (පහකල යුතුයි)

i. **මිච්ඡාදිට්ඨි:** වැරදි දැකීම, **"නත්ථි දින්නං නත්ථි යිට්ඨං නත්ථි හුතං නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො නත්ථි අයං ලොකො නත්ථි පරොලොකො නත්ථි මාතා නත්ථි පිතා නත්ථි සත්තා ඕපපාතිකා නත්ථිලොකෙ සමණ බ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා"**

දීමෙන් විපාක නැත, මහාදන දීමෙන් වැඩක් සිදුනොවේ, ලඟට පමුණුවා දීමෙන් කළා වූ කුශලාකුශල කර්මයන්ට විපාක නැත, මව්පියන්ට සැලකීමෙන් විපාක නැත, මෙලොවක් නැත, පර ලොවක් නැත, මරණින් පසු හටගන්නා සත්වයන් නැත, මෙ ලොව මනා සේ පිළිපන් මහණ බමුණෝ නැත. මෙසේ වැරදි දැකීම දසාකාරයකින් පවතී- තවද ශාස්වත, උච්ඡේද යනුවෙන් බලවත් වැරදි දැකීම් දෙකක් ද ඇත, "ආත්මය විනාශ නොවන්නේය. මරණයෙන් සිදුවනුයේ ගෙයක් හැර අනික් ගෙයකට යන්නාසේ මේ සිරුරින් අනෙක් සිරුරකට මාරුවීමකි" මේ අයුරින් පවත්නේ ශාස්වත දෘෂ්ටිය යි. "සත්වයා මරණින් පසු නැවත උපදින්නේ නැත, ඔහුගේ ජීවිතය මෙතැනින් අවසාන යි' මේ අයුරින් පවත්නේ උච්ඡේද දෘෂ්ටිය යි, මෙසේ බෙදීගිය මිථ්‍යාදෘෂ්ටිය බලවත් අකුසලයකි. "මිච්ඡාදිට්ඨි පරමානි භික්ඛවෙ වජ්ජානි" මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය ලොකුම වැරැද්දකි යි බුදු පියාණෝ වදාළහ. සියලු මිථ්‍යාදෘෂ්ටිහු දෙසැටක් වෙත්.

ii **මිච්ඡාසඞ්කප්ප:** වැරදි කල්පනා, සිතුවිලි, සියලු වැරදි සිතුවිලි තුන් වැදෑරුම් ය. කාම සංකල්පනා, ව්‍යාපාද සංකල්පනා, විහිංසා සංකල්පනා යනුයි ප්‍රිය මනාප රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්චකාම සැප සෙවීම පිළිබඳ කල්පනා ද, කෙත්-වතු-ධන-ධාන්‍යා දී දේ සපයා ගෙන, ඒවායින් "පස්කම් සැප විඳිමි, මෙලොව ජීවත් වන මුළු කාලසීමාව ම ඒවායින් සතුටු වෙමි. පරලොවක් ගැන කාටද කියන්න පුළුවන්" යනුවෙන් පවතින හැඟීම්ද, කාම සංකල්පනා යි. සත්වයන් ගේ විනාශය කැමති වන, ඒ සඳහා ම තරහ ඇතිවන, අදහස් ව්‍යාපාද සංකල්පනා යි. සතුන් මැරීමේ,

හිංසා පීඩා කිරීමේ, අදහස් විහිංසා සංකල්පනා යි. තවද පෙර කී මිථ්‍යාදෘෂ්ටීන්ට අනුව පවත්නා අදහස් ද වැරදිකල්පනාවන්ට ඇතුළත් වෙයි.

iii **මිච්ඡා වාචා;** වැරදි කියමන. මෙයට බොරුව, කේලම හිස් වචන, නරක වචන යන සතර ඇතුළත්ය. තවද වැරදි දැකීම්, කල්පනා කිරීම් අනුව කියනු ලබන වචන ද ඇතුළත් වන බව දතයුතුය.

iv **මිච්ඡා කම්මන්ත:** වැරදි ක්‍රියා-වැඩ-යි. සතුන් මැරීම හොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම මෙයට අයත්ය.

v **මිච්ඡා ආජීව:** වැරදි දිවි පැවැත්ම, වැරදි අදහස්, වචන, ක්‍රියා අනුව යමෙක් රැස්කර එයින් ජීවත් වෙයි නම් ඒ වැරදි දිවි පැවැත්ම යි. අධාර්මික ජීවිතය යනු ව්‍යවහාර යි. එසේ ම පඤ්චවිධ - පස්වැදෑරුම් - වෙළඳාම් වලින් ජීවත් වීම, මිනුම් - කිරුම් - ගනුදෙනු කිරීම් ආදියෙහි දී කපටිකම් කිරීම, යන මෙ වැනිදෑ ද මිච්ඡා ජීවයට ඇතුළත් වෙයි. (පඤ්චවිධ වෙළඳාම: සත්ථ වණිජ්ජා, සත්තවණිජ්ජා, මංසවණිජ්ජා, මජ්ජවණිජ්ජා, විසවණි-ජ්ජා යනුයි. එනම් ආයුධ වෙළඳාම, වහල් වෙළඳාම, මස් පිණිස සතුන් වෙළඳාම මත්වන දෑ වෙළඳාම, වස විස ද්‍රව්‍ය වෙළඳාම් යන පසයි)

vi **මිච්ඡා වායාම;** වැරදි උත්සාහය - පෙර සඳහන් කළ දෑ සිදුකිරීම සඳහා ගන්නා වෑයම මෙයින් කියවේ.

vii **මිච්ඡා සති:** වැරදි සිහිය. මෙය ද පෙර සඳහන් කළ වැරදි දැකීම්, සිතීම්, කිරීම්, කීම් ආදියෙහි පවත්නා සිහිය යි.

viii **මිච්ඡා සමාධි** වැරදි එකඟකම. මුලින් සඳහන් කළ දෑයෙහි යෙදීමේදී ඇතිවන සිතෙහි පවත්නා සුළු තැන්පත් ගතිය.

ix **මිච්ඡා ඤාණ:** වැරදි නුවණ. සතුන් මැරීම ආදී පව් කිරීමේදී ඇතිවන, ''මම එය හරි නුවණින් සිදුකෙළෙමි'' යි යනාදී උපාය අදහස්ය. මෙය මෝඩකමෙකි. පව්කරන්නාට නුවණ සේ වැටහෙයි.

x **මිච්ඡා විමුක්ති** වැරදි මිදීම. ''අවිමුත්තානෙයෙව සන්තා විමුත්තිසඤ්ඤා'' නො මිදුනාහුගේ ම ''මිදුනෙමි'' යි යන හැඟීම යි. මෙය බාහිර ශාසනයන්හි යෝගීන්ටත්, බුද්ධ ශාසනයෙහි

විදර්ශනා භාවනා කරමින් සිටිද්දී ආලෝකාදිය පහළ වීම නිසා "මම මිදුණෙමි" යි හැඟීම ඇතිකරගන්නා යෝගීන්ටත් ඇති වෙයි.

මේය දස මිච්ඡත්ත

---

මෙසේ විස්තර කළ සියලු කෙලෙස්ද, ඒ අනුව ගිය කෙලෙස්ද, අස්කළ යුතු දෑ වශයෙන් බුදුරජාණන් වහන්සේගේ සූත්‍රමය ඥාණයට ඇතුළත් විය. මෙතෙකින් ප්‍රහාතව්‍ය නිර්දේශය සමාප්ත කරමි. විස්තර දැනගනු කැමැත්තෝ පටිසම්භිදාව බලත්වා!

තුන්වැනි පරිච්ඡේදය නිමි.

# 4 වැනි පරිච්ඡේදය

## 42. භාවිතව්‍ය නිර්දේශයෙහි ඒකකාදි දසධර්මයෝ

“කෙසේ නම් මේ ධර්මයෝ වැඩිය යුත්තාහයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නම් වේද? එය දැනගන්නා වූ ප්‍රඥාව සුතමය ඥානය නම් වේද? එක් ධර්මයක් වැඩිය යුතුය. එනම් සුඛවේදනාව සමඟ යෙදුනු කායගතාසති ධ්‍යානයයි. ධර්ම දෙකක් වැඩිය යුතුය. සමථයත් විදර්ශනාවත් ය. ධර්ම තුනක් වැඩිය යුතුය. ත්‍රිවිධ සමාධිය යි. ධර්ම සතරක් වැඩිය යුතුය. සතර සතිපට්ඨානයෝය. ධර්ම පහක් වැඩිය යුතුය. අඞ්ග පසක් ඇති සමාධිය යි ධර්ම සයක් වැඩිය යුතුය. සය වැදෑරුම් අනුස්සති ට්ඨානයෝය. ධර්ම සතක් වැඩිය යුතුය. සත්තබොජ්ඣඞ්ගයෝ ය. ධර්ම අටක් වැඩිය යුතුය. ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය යි· ධර්ම නවයක් වැඩිය යුතුය. පිරිසිදු බවට ප්‍රධාන අඞ්ග වූ නව වැදෑරුම් වූ පාරිශුද්ධිය යි. ධර්ම දසයෙක් වැඩිය යුතුය. දසකසිණායතනයෝ ය.” – ප. ම. සිං. ප.

මේ කරුණු දහය අතුරෙන් විස්තර කරනුයේ කීපයකි. සෙසු කරුණු ඉදිරි ඥාන විස්තරයේ දී පැහැදිළි වෙයි. එහෙයි කී.

## 43. කායගතා සතිය

සිරුර අනුව ගිය සිහිය කායගතාසතිය යි. මෙය සමථ භාවනා ක්‍රමයෙකි. ඉතා වටිනා, මහත් අනුසස් ලබාගත හැකි භාවනාවක් බව බුදුරජාණන් වහන්සේ දෙසූහ. ඒ මෙසේය.

“එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො මහතො සංවේගාය සංවත්තති, මහතො අත්ථාය සංවත්තති, මහතො යොගක්ඛෙමාය සංවත්තති, මහතො සතිසම්පජඤ්ඤාය සංවත්තති, ඤාණදස්සන පටිලාභාය සංවත්තති, දිට්ඨධම්ම සුඛවිහාරාය සංවත්තති, විජ්ජාවිමුත්ති ඵලසච්ඡිකිරියාය සංවත්තති; කතමො එකධම්මො? කායගතාසති”– අ නි.එ.නි-

මහණෙනි, එකම ධර්මයක් වඩන ලද්දේ පුහුණු කිරීම් වශයෙන් බොහෝ වඩන ලද්දේ මහත් වූ සංවේගය = කලකිරීම පිණිස, මහත් වූ දියුණුව පිණිස, මහත් වූ යෝගයෙන් (කාමාදී සිවු යෝග) බිය නැති වීම පිණිස, මහත් වූ සිහි නුවණ පිණිස සිවුසස් නුවණින් දැකීම වූ සෝවාන් ආදී මාර්ග පිණිස, මෙලොවම නිවන් සුව විඳීම පිණිස, විදසුන් නුවණ ආදී අට වැදෑරුම් විදීම් සෝවාන් ආදී ඵල, අවබෝධ පිණිස පවතියි. කවර නම් එක ම ධර්මයක් ද යත්? කායගතාසතිය යි.

මේ සූත්‍රයෙහි සඳහන් පරිදි කායගතාසති භාවනාවෙන් මහත් වූ ආනිශංස සතක් ප්‍රධාන වශයෙන් ලබාගත හැකිය. සෙසු අනුසස් නුවණැත්තාට ඒ අනුසාරයෙන් දත හැකිය. එහි එන අනුසස් සත පිළිබඳ සාමාන්‍ය විස්තරය මෙසේය.

(1) මහත් වූ සංවේගය පිණිස පැවතීම;

සංවේගය යනු ජීවිතය පිළිබඳ කලකිරීම යි. කායගතාසතිය වඩත් ම සිරුර මනා සේ විමසීමෙන් පෙර තුබූ හොඳය, ලස්සන ආදී වැරදි හැඟීම් නැති වී, මහත් පිළිකුල් ගතියක් කල කිරීමක්, ඇතිවෙයි. බුදුරජාණන් වහන්සේ මේ භාවනා ක්‍රමය දෙසූ මුල් කාලයේ බොහෝ භික්ෂූහු සිරුර ගැන කලකිරී මිගලණ්ඩික නම් වූ සමණකුත්තකයෙකු ලවා ජීවිත විනාශ කරගත් බව පාරාජිකා පාලියෙහි දැක්වෙයි. එපමණක් නොව තමන් විසින් ද අනුන් ලවා ද, ජීවිත තොර කරගත්හ. ඒ බව මෙසේ දැක්වේ.

“තෙන ඛො පන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං, තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූනං අනෙකපරියායෙන අසුභකථං කථෙසි, අසුභාය වණ්ණං භාසති, අසුභ භාවනාය වණ්ණං භාසති ආදිස්ස ආදිස්ස අසුභ සමාපත්තියා වණ්ණං භාසති- -පෙ- තෙ අනෙකාකාරවොකාරං අසුභ භාවනානුයොගමනුයුත්තා විහරන්ති, තෙ සකෙන කායෙන අට්ටීයන්ති හරායන්ති ජිගුච්ඡන්ති, සෙය්‍යථාපි නාම ඉත්ථීවා පුරිසොවා දහරො යුවා මණ්ඩන ජාතිකො සීසං නහාතො අහිකුණපෙන වා කුක්කුර කුණපෙන වා මනුස්සකුණපෙන වා කණ්ඨෙ ආසත්තෙන අට්ටීයෙය්‍ය හරායෙය්‍ය ජිගුච්ඡෙය්‍ය, එවමෙව තෙ භික්ඛූ සකෙන කායෙන අට්ටීයන්තා හරායන්තා ජිගුච්ඡන්තා අත්තනාපි අත්තානං ජීවිතා වොරොපෙන්ති, අඤ්ඤමඤ්ඤම්පි ජීවිතා වොරොපෙන්ති, මිගලණ්ඩිකම්පි සමණ කුත්තකං උපසඞ්කමිත්වා එවං වදෙන්ති” සාධුනො

ආවුසො ජීවිතා වොරොපෙහි ඉදං තෙ පත්තචීවරං භවිස්සතී'ති, අථ ඛො මිගලණ්ඩිකො සමණකුත්තකො පත්තචීවරෙහි භටො සම්බහුලෙ භික්ඛූ ජීවිතා වොරොපෙත්වා ලොහිතකං අසිං ආදාය යෙන වග්ගුමුදා තෙනුපසංකමි'' පා. පා. ත. පා:

ඒ කාලයේ මහානී භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර මහවනයේ කූටාගාර ශාලාවෙහි වැඩ වෙසෙත්. එකල්හි වහාහි බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට නොයෙක් අයුරින් සිරුර පිළිබඳ පිළිකුල් කථාව කෙරෙත්. පිළිකුලෙහි අයුරු, පිළිකුල් භාවනාවේ ආනිශංස, පිළිකුල් භාවනාවට සම වැදීමේ ආනිශංස දේශනා කරත්. - පෙ - ඒ ඇසූ භික්ෂූහු නොයෙක් අයුරින් සිරුර පිළිබඳ අශුභ භාවනා කරමින් වෙසෙත්. (එවිට) ඔව්හු තම සිරුර ගැනම පිළිකුල් කරත්. තරුණ භාවය රැක ගැනීමට කැමති, තරුණ ස්ත්‍රියක් හෝ තරුණ පුරුෂයෙක් ස්නානය කළ පසු සපි කුණක් හෝ බලු කුණක් හෝ මිනිස් කුණක් හෝ ඔහුගේ බෙල්ලෙහි පටලැවුනොත් පිළිකුල් කරන්නේ යම්සේද එසේම තම සිරුර ගැන පිළිකුල් කරන්නාවූ ඒ භික්ෂූහු තෙමේම තම ජීවිතය නැතිකර ගනිත්. ඔවුනොවුන් ලවාද ජීවිත විනාශ කරවා ගනිත්. ''මිගලණ්ඩික'' නම්වූ සමණකුත්තකයා (කහරෙදි පෙරවූ ගිහියා) වෙත පැමිණ මෙසේද කියත්. ''ඇවැත්නි, අපගේ ජීවිත විනාශ කළහොත් ඉතා හොඳය. ඔබට මේ පාත්‍රා සිවුරු වන්නේය'' කියායි. ඉක්බිති ඒ මිගලණ්ඩික සමණ කුත්තකයා පාත්‍රා සිවුරු වලින් වේතනය - පඩිය - ලැබුයේ බොහෝ භික්ෂූන් විනාශ කර ලේ තැවරුණු කඩුව ගෙන වග්ගුමුදා ගඟ වෙතට පැමිණියේය. මේ අයුරින් කායගතා සතිය මහත් කලකිරීම සඳහා පවතින්නකි.

බුදුරජාණන් වහන්සේ ඉහත සඳහන් කරුණ මුල් කොට, පසුව සැනසිලි ගෙන දෙන, ''ආනාපාන සතිය'' දෙසූහ.

(ii) මහත්වූ අර්ථය පිණිස පැවතීම:

අර්ථය නම් දියුණුවයි. කායගතාසති භාවනාවෙන් ලැබෙන මහත්වූ දියුණුව අනෙකක් නොව සිත පිළිබඳ දියුණුවයි. සිතෙහි වරින් වර නැගී එන රාග, ද්වේශ, මෝහ, මාන, ඊර්ෂ්‍යා, මද, ප්‍රමාද ආදී කෙලෙස් මේ භාවනාවෙන් වහ වහා යටපත් කොට සිත සත් සුන් වෙයි. පස්කම සේවීම, අඩුවී ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, ආදී කුශල් සිත් උපදියි. ඉතා ඉක්මනින් කාමච්ඡන්දාදි නීවරණ යටපත් කොට ධ්‍යාන ලබා ගැනීමටත් විදසුන් නුවණ ඇතිකර ගැනුමටත් හැකිමේ. මේ අයුරින් කායගතාසති භාවනාව සිත පිළිබඳ මහත් වූ දියුණුව පිණිස පවතියි.

## (iii) මහත්වූ යෝගක්ෂේමය පිණිස පැවතීම.

යෝගක්ෂේමය යනු නිර්වාණයට නමකි. සත්වයා බලවත් ලෙස සසරෙහි යොදවන කාමාදී සිවු යෝගයන්ගෙන් නිදහස් වූ අභය භූමියක් නිසා නිර්වාණයට මේ නම යෙදිණ. ඒ සිවු යෝගයෝ නම් කාම, භව, දිට්ඨි, අවිජ්ජා, යනු වෙත්. කම් සැප සෙවීමේදීත්, ඒවායෙහි යෙදීමේදීත් ඇතිවන රාගය කාමයෝග නමි. කුශලාකුශල කර්ම රැස් කිරීමේදීද, ඒවායින් දිව්‍ය, මනුෂ්‍ය, සැප බලාපොරොත්තු වෙද්දීද, ඇතිවන ආසාව භවයෝගයයි. මේ කීමේ කර්ම, උප්පත්ති, යන දෙවදෑරුම් භවයයි: දසමිච්ඡත්තන අතුරෙන් මිථ්‍යාදිට්ඨි යනුවෙන් දක්වූ වැරදි දැකීම දිට්ඨියෝග නමි, දුඃඛාදී සත්‍ය ධර්ම නොදැනීම අවිජ්ජා යෝගයයි. මේ සතර යෝගයන් නිසා සත්වයා සසරින් නිදහස් නොවී එහිම රැඳෙයි. ඒවායින් අස්වීමෙන් ලැබෙන සැනසුම - ක්ෂේමය – යෝගක්ෂේමයයි. කායගතාසතිය, සිත දියුණුවීම නිසා යෝගයන් දුරු කොට නිවණ ලැබීම පිණිස පවතින්නකි.

## (iv) මහත්වූ ස්මෘති සම්ප්‍රජන්‍යය පිණිස පැවතීම.

සිරුර පිළිබඳ පිළිකුල නිතර නිතර සිතමින් එහිම සිත රැඳවූ විට මහත්වූ සිහිය පිණිස එය උපකාර වේ. බාහිර රූපාදී වෙතත් අරමුණු කරා සිත නොයයි. එසේම සිරුරෙහි ඒ ඒ කොටස් රතුය. කළුය, දුඹුරුය, වටය, දිග්ය, ආදී වශයෙන් නොසිතා ඒ හැම පිළිකුල්ය යන හැඟීම දියුණුකර ගැනීමෙන් මහත් නුවණක් ලබන හැක. මේ නුවණම සිත දියුණු කිරීම සඳහා පවතින සාත්ථක සම්ප්‍රජන්‍යය ලෙසද කෙලෙසුන්ගෙන් සිත නිදහස්කර ගැනීම සඳහා පවතින සප්‍රාය සම්ප්‍රජන්‍යය ලෙසද, මමය, මාගේය, ආදී වැරදි හැඟීම් වලින් නිදහස්වීම සඳහා පවතින අසම්මෝහ සම්ප්‍රජන්‍ය ලෙසද සැම තැනකදීම පිළිකුල මෙනෙහි කරන නිසා ගෝචර සම්ප්‍රජන්‍ය ලෙසද වැඩ කරයි. මේ චතුසම්පජඤ්ඤ - නුවණ පිහිටුවන ක්‍රම සතරයි. මෙසේ කායගතා සතිය මහත් වූ සිහි නුවණ පිණිස පවතින්නකි.

## v ඥාන දර්ශන ප්‍රතිලාභය

සෝවාන් ආදී මාර්ග ඥාන ලැබීම සඳහා කායගතාසතිය බොහෝ උපකාරය මතුවට විස්තර කෙරෙන බොහෝ ඥාන මේ සඳහාම පවතියි. ලෝකෝත්තර මාර්ගයන්හිදී දුක්ඛාදි ආර්ය සත්‍ය ධර්ම සතර තම නුවණින්ම දක්නා හෙයින් ඒ මාර්ගඥානට ඥාන දර්ශන යන නාමය ව්‍යවහාර වෙයි. එය ලැබීම ඥාන දර්ශන

ප්‍රතිලාභ නම්. කායගතාසතිය අනුව සිත දියුණුකර සමාධිත-මොහොතක් පවතින –, උපචාර, අර්පණා, යන ධ්‍යාන ලබා, ඒ ධ්‍යාන මත සිතිටා විදසුන් වැඩීමෙන් සිවුසස් නුවණින් දැකීම සිදුවේ.

vi දෘෂ්ටධර්ම සුඛ විහරණය

මෙලොවදීම නිවන් සුවයෙන් සුවසේ විසීම දෘෂ්ට ධර්ම සුඛ විහරණ නම්. පෙර කී පරිදි මාර්ගයනට අනුව සිවුසස් අවබෝධ වත්ම නිවන් සුව ඵල නාමයෙන් උපදියි. නැවත තමාට කැමති වේලාවක ඒ ඵලයනට සම වැදීමෙන් මෙලොවදීම නිවන් සුව යෙන් සුවසේ විසිය හැක. එහෙයින් කායගතාසතිය දිට්ඨධම්ම සුඛ විහරණ සඳහා පවතින්නකි.

vii විද්‍යා, විමුක්ති, ඵල සාක්ෂාත්කරණය. .

වෙසෙස් නුවණ, මිදීම, ඵල යන මේවා ලබාගැනීම මෙයින් කියැවේ. එහි වෙසෙස් නුවණ - විද්‍යා තෙවැදෑරුම්ය පෙර විසූ කඳපිළිවෙල පිළිබඳ නුවණ' සත්වයන්ගේ මැරීම් ඉපදීම් දක්නා නුවණ, කාමාදී ආශ්‍රව ධර්ම ප්‍රහාණය කරණ නුවණ යනුයි. අටවැදෑරුම් විද්‍යාවක්ද ඇත. එනම්.

"විපස්සනා ඤාණං මනොමයිද්ධි - ඉද්ධිප්පභෙදොපිච දිබ්බසොතං පරස්ස චෙතො පරියාය ඤාණං-පුබ්බෙනිවාසානුගතඤ්ච ඤාණං දිබ්බඤ්ච චක්ඛු සවසංඛයොච-එතානි ඤාණානි ඉධට්ඨ විජ්ජා විපස්සනා ඤාණ; විදසුන් නුවණ, මනොමයිද්ධි; තම රුව වැනි රූ මැවීමේ නුවණ, ඉද්ධිප්පභෙද; නොයෙක් ඉර්ධි - සෘද්ධි පෙළහර පෑමේ නුවණ, දිබ්බසොතං; දිව කණ, පරස්සචෙතො පරියාය ඤාණං; අනුන්ගේ සිත් දන්නා නුවණ; පුබ්බේනිවාසානුගතඤ්ච ඤාණං; පෙර තමාගේ ජීවිත තුබූ අයුරු සිහි කිරීමේ නුවණ; දිබ්බඤ්ච චක්ඛු; දිව ඇස, ආසවසංඛයො; සිතෙහි පල්වෙන කාමාදිය ගෙවීමේ නුවණ, යන මේ අටයි.

සියලු කෙලෙසුන් මුලිනුපුටා දමමින් සසර දුකින් නිදහස් වෙමින් උපදනා සෝවාන් ආදී ලෝකෝත්තර මාර්ග විමුක්ති නම්. ඒ අනුවම උපදින සැනසුම් ගති ඵලයි. මෙසේ සඳහන් කළ විද්‍යා, විමුක්ති, ඵල, අවබෝධ කර ගැනීම සඳහා කායගතාසතිය උපකාර වේ.

තවද ආනිසංස රාශියක්ම අඞ්ගුත්තර නිකායේ ඒකක නිපාත යෙහි සඳහන්ව ඇත. ඒවා ද දැනගන්න.

මෙම කායගතා සතිය ක්‍රම දහතරකින් දියුණු කළ හැකිය. පටිසම්භිදා මග්ගට්ඨ කථායෙහි කායගතාසති යන්නට දක්වූ පාඨයෙහි කෙටියෙන් සඳහන් වෙයි; ඒ මෙසේය. 'කායගතාසතීති කායගතාසති සුත්තනෙන වුත්තා ආනාපාන චතුඉරියාපථ බුද්ධක ඉරියාපථ ද්වත්තිංසාකාර චතුධාතු නවසිවථික පටික්කූලවවත්ථාපක මනසිකාර සම්පයුත්තා යථානුරූපං රූපජ්ඣාන සම්පයුත්තාච සති" කායගතා සති යනු සූත්‍රාන්තයෙහි ප්‍රකාශ කරන ලද ආනාපාන, සිව් ඉරියව්, කුඩා ඉරියව්, දෙතිස් කුණප, සිවුද, නවසීවථික, පටිකකුලසඤ්ඤමනසිකාරය, යන මෙවාහි යෙදුනු, එසේම එයට අනුරූප වූ රූපාවචර ධ්‍යානයන්හි යෙදුනු සිහියයි. මෙහි ක්‍රම පසළොසක් දක්වේ.

ආහාරෙ පටිකකූල සඤ්ඤා හැර සෙසු ක්‍රම තුදුස මහා සතිපට්ඨාන සූත්‍රයෙහි ආ පිළිවෙලයි: එහි අනාපාන, ඊර්‍යාපථ චතුසම්පජඤ්ඤ, ද්වත්තිංසාකාර, චතුධාතු, නවසීවථික, යනුවෙන් ඒ තුදුස දක්වේ. නවසීවථික, භාවනා ක්‍රම නවයෙකි.

## 1. ආනාපානසතිය

ආශ්වාස, ප්‍රශ්වාස, - හුස්ම ඉහල හැනීම පහත හෙලීම, පිළිබඳ පවත්නා සිහිය අනාපානා සති නමි. මේය ඉතා වටිනා භාවනා ක්‍රමයෙකි. සියලු බුදුවරු බුඩත්ත්වයට පත්වනුයේ අනාපානා සති භාවනා වෙති. "අයම්පි ඛො භික්ඛවෙ ආනාපාන සති සමාධි භාවිතො බහුලීකතො සන්තොචෙව පණීතොච අසෙචනකොච" සුඛොච විහාරො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති වූපසමෙති" පා,පා, ත, පා, මහණෙනි, මේ ආනාපාන සති සමාධිය වනාහි වඩන ලද්දේ බොහෝ කොට වඩන ලද්දේ ශාන්ත ද ප්‍රණීත ද අසෙචනක ද සැප විහරණය ද වූයේ උපන් උපන් ලාමක වූ අකුසල ධර්මයන් එතැනින් ම අතුරුදහන් කෙරේ. සංසිඳෙයි. මෙසේ ආනාපාන සතියෙහි ආනිශංස ඉතා උසස් අයුරින්ම බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. එහි විස්තර මෙසේය.

"සන්තොචෙව පණීතොච" ආනාපාන සති භාවනාව ඉතා සැනසිලි, මිහිරි, එකෙකි. දස අසුභ සේ ගොරෝසු, පිළිකුල්, අමිහිරි අරමුණක් නොවේ. භාවනාව සඳහා වාඩිවනවිට ම අමුතු සුවයක් හැඟීමක් දැනෙයි. එසේම අන් භාවනාවන් සේ අරමුණ සෙවීමට අපහසු නැත. (සවාභාවික ලෙසම පවතින බැවිනි) මෙසේ මෙය ඉතා ශාන්ත, ප්‍රණීත, කාටත් පහසු හොඳම හොඳ භාවනාවෙකි.

"අසෙචනකොච" පෙර සඳහන් පරිදි ශාන්ත, ප්‍රණීත, කර ගැනුමට අමුතුවෙන් යමක් එක්කළ යුතු නොවේ. (එක් කළ යුතු නොවේ) "නාස්ස සෙචනාති අසෙචනකො" මෙය එක් කිරීමක් නැතිනිසා අසෙචනකය. (සේචනය යනු ජලය එක් කරන්නාසේ වැක්කිරීමය එකතුකිරීමයි.) අසෙචනක නිසාම අමිශ්‍රය. එහෙයින්ම පාටියෙක්කය. එනම් වෙන්ව පැවැත්මයි, විසිවන ශත වර්ෂයේදී (1900) ලක්දිව බොහෝ තැන්වල පුහුනු කරනු ලබන විදර්ශනා භාවනා ක්‍රමයෙහි ආරම්භයට මෙම ආනාපානා සතිය බොහෝ දෙනා එකමුතු කරගෙන ඇත. මන්නිසාද? ඒ විදර්ශනා ක්‍රමයෙහි ආරම්භයත් උදරයෙහි පවතින පිම්බීම් හැකිලීම් දෙක අරමුණු කොට පවතින්නකි. ඒ පිම්බීම්, හැකිලීම්, දෙක සිදුවනුයේද ආශ්වාස, ප්‍රශ්වාස නිසාය. එහෙයින් ඒ විදර්ශනා ක්‍රමයෙහි ආරම්භයත් ආනාපානාසතියෙහි මෙන් හුස්ම අරමුණු කොටම පවතින නිසා එහි ආරම්භය ආනාපානා සතිය මැයි තර්ක කරත්. එහෙත් "අසෙචනකො" යනුවෙන් ආනාපානා සතිය වෙනම ම ඇති භාවනා ක්‍රමයක් නිසා මේ දෙක සමාන ලෙස නොසැලකිය යුතු.

"සුඛොච විහාරො" ආනාපාන සතිය දියුණු කර එයින් ක්ෂණික, උපචාර, අර්පණා, යන ත්‍රිවිධ සමාධි උපදවා ගත් කල් හිද එයම පාදක කොට සමවැදුන කල්හිද, කායික වූද චෛතසික වූද මහත් සැපයක් ඇති වෙයි. ඒ ධ්‍යාන සිත් වලින් හට ගත් රූපද ප්‍රණීත-මිහිරි=බැවින් අමුතුම සැනසුමක්, සිසිලක් උපදී. එහෙයින් ආනාපාන සතිය සැපවත් විසීමෙකි.

මෙසේ ආනිශංස රාශියක් දක්වෙන හෙයින් රාගාදී ලාමක අකුශල ධර්මයන් එක එකා තුබූ තැනින් ම අතුරුදහන් වී සිත සමාහිත වෙයි. උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති" යනුවෙන් වදාළේ මේ නිසාය.

තවද ආනාපාන සති භාවනාව නිර්වාණාවබෝධය දක්වාම ගමන් කරන බැවින් නිබ්බෙධ භාගිය - සසර කලකිරී එයින් නිදහස් වීමට ම හැමෙත්තකි. සෙසු සමථ භාවනාවෝ ධ්‍යාන පඤ්චකය අවසන් කොට ඇත්තෝ වෙත්. මෙහි ධ්‍යාන, මාර්ග ඵල ද උපදියි.

## ආනාපානසති භාවනා ආරම්භය.

"ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතොවා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා සො සතොව අස්සසති සතො පස්සසති" - ගිරිමානන්ද සූත්‍රය

මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ වනසෙනසුනකට ගියේ හෝ රුක් මුලකට ගියේ හෝ හිස් ගේකට ගියේ හෝ පලග බැඳ (එරමිණිය ගොතා) කය කෙලින් තබා සිහිය තමා වෙත ම එළවා ගෙන හිඳියි. හේ සිහි ඇතිව ම හුස්ම ගනියි. සිහි ඇති වම හුස්ම හෙළයි. මෙසේ භාවනා ක්‍රමයෙහි ආරම්භය දේශනා කළහ. සුදුසු සෙනසුන්-: ආනාපානාසති භාවනාවට සුදුසු තැන් තුනක් බුදුරජාණන් වහන්සේ පෙන්වූහ. එනම් වනසෙනසුන, රුක්මුල, හිස් ගේ - ශූන්‍යාගාරය, යනුයි. බාහිර ශබ්දාදියෙන් ද මහ ජනයාගේ ගැවසීමෙන් ද, නිදහස් නිසා මේ තැන් සිහිය මනාසේ පිහිටුවා ගැනීමට ඉතා උපකාරයි. වනසෙනසුන් තෝරා ගැනීමේදී ඉතා ශාන්ත පරිසරයක් ඇති විශාල ගස් වලින් යුත්, පැන් පහසුකම් ඇති, දුඩි වන සතුන්ගෙන් මිදුනු, ගමෙහි සිට දුනු පන්සියයක් දුර පිහිටි එකක් විය යුතුය. "ආරඤ්ඤකං පන සෙනාසනං පඤ්ච ධනුසතිකං" ආරණ්‍ය සේනාසනය වනාහි දුනුපන්සියයකින් ඈත වූවකි යනු දේශනා පාඨයි. මේ දැක්වූයේ උත්කෘෂ්ඨ විශයෙනි.

රුක්මුල් තෝරාගැනීමේදී කෙත්, වතු, ගම්, නගරාදී සීමා දැක්වීමේදී රජය විසින් සලකුණු කළ ගස්, අතහැරිය යුතුය. එසේම මිනිසුන් විසින් පුදන, ලාටු ගන්නා, ගෙඩි ඇති, වවුලන් ලගින බෙන ඇති ගස්ද නොගත යුතු. සෙනසුනෙහි හෝ විහාරයෙහි හෝ මැද වැවුණු ගස්ද අත්හල යුතුය. මේ කරදර යන්ගෙන් මිදුනු සෙවනැති ගස් මුල් ආනාපනසති භාවනාවට යෙහෙකි හිස් ගෙවල් සෙවීමේදී මැසි මදුරුවන්ගෙන් වන සතුන්ගෙන් කරදර නොවන තැන් විය යුතු එසේම මත් පැන් සාදන, සතුන් මරණ, ආයුධාදිය තැබූ, වන මිනිසුන් ලැගුම් ගන්නා, තැන්ද නොවිය යුතු. මේ පලිබෝධ - කරදරයන්ගෙන් නිදහස් වූ ගෙයක් අනාපානාසති භාවනාවට සුදුසුය.

තවද "සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රිය සංවරේන සමන්නාගතො

ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං" දී. නි. සුභ සූත්‍රය යන දේශනායෙහි දක් වූ පරිදි සුදුසු සෙනසුන් නවයක් ද ඇත. එනම් වන සෙනසුන්, රුක්මුල්, පවු අසල, දිය ඇල අසල, ගල් ලෙන්, සොහොන්, ඉතා දුර වන සෙනසුන්, එළිමහන් තැන්, පිදුරු, - තණ, බට ආදියෙන් සෙවිලි කළ පැල්, යනුයි. මේ සැම සෙනසුනක්ම පෙර කී පරිදි බාහිර කරදරයන්ගෙන් තොර විය යුතු අතර බුදුරජාණන්වහන්සේ වදාළ සේනාසන අඞ්ග වලින් ද යුක්ත විය යුතු. සේනාසන අඞ්ග පසෙකි." කථඤ්ච භික්ඛවෙ සෙනාසනං පඤ්චඞ්ගසමන්නාගතං හොති? ඉධ භික්ඛවෙ සෙනාසනං නාතිදූරං හොති නච්චාසන්නං ගමනාගමනසම්පන්නං දිවා අප්පකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං අප්පඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සං ඛො පන හොති, තස්මිං ඛො පන සෙනාසනෙ විහරන්තස්ස අප්පකසිරෙනෙව උප්පජ්ජන්ති චීවරපිණ්ඩපාත සෙනාසනගිලානපච්චයාභෙසජ්ජපරික්ඛාරා, තස්මිං ඛො පන සෙනාසනෙ ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡ පරිපඤ්හති ඉදං භන්තෙ කථං ඉමස්ස ඛො අත්ථොති, තස්ස තෙ ආයස්මන්තො අවිවටංචෙව විවරන්ති අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති අනෙක විහිතෙසු කඞ්ඛාට්ඨානීයෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති, එවං ඛො පන භික්ඛවෙ සෙනාසනං පඤ්චඞ්ගසමන්නාගතං හොති." වි. ම. ප. නි. 90 පිට.

මෙහි සඳහන් සේනාසන අඞ්ග පස මෙසේය.

i. ඉතා දුර, ඉතා ළඟ, නොවූ යාම් ඊම් පහසු එකක් විය යුතු (පිඬු පිණිස හැසිර වළඳා, රෑ වූ විට ආපසු ඒමට හැකි නම් ඒ ගමනා ගමන සම්පන්න නම්)

ii. දිවා කාලයෙහි මිනිසුන්ගෙන් නොගැවසුනු, රෑ වන සතුන් ගේ බිය ජනක කෑ ගැසීම් අඩු මහා ශබ්ද අඩු එකක් විය යුතු.

iii. මැසි මදුරුවන් අඩු, දූවිලි සහිත සුළං හෝ තද සුළං හෝ නොහමන, හිරු රැසින් කරදර නොවන, නා පොළො ආදී විෂ සහිත සතුන් අඩු සෙනසුනක් විය යුතු.

iv. වැඩි කරදරයක් නොමැතිව සිවුරු -පිඬු-සෙනසුන්, බෙහෙත් යන සිවුපසය ලැබෙන තැනක් විය යුතු.

v. තුන් පිටකය හොඳට ඉගෙණගත්, ඒ හැටියටම පිළිපදින උගත් භික්ෂූන් වාසය කළ යුතු අතර ඒ භික්ෂූන්ද තමා වෙත කලින් කල අවුත් පැණ අසන, තමා අසන පැණ විසඳන සැක තැන් දුරු කරන පිරිසක් විය යුතු.

සුදුසු අසුන: මෙසේ සෙනසුන් අවයව වලින් යුත් සුදුසු සෙනසුනක හෝ සෙනසුන් සොයා ගැනීමට නොහැකි යෝගීන් විසින් පෙර කී සේ නිදහස් ඇති යම් කිසි තැනක් හෝ සොයා ගෙණ, කුඹා පළි බෝධ වූ සිවුරු සෝදා ගැනීම් ආදියෙන්ද නිදහස් වී දිවා ආහාරයෙන් - දනයෙන්-පසු අඟල් අටක් පමණ උස යෝගාසනයක හෝ පහසු අයුරින් සිටිය හැකි එවැනි අසුනක හෝ කොඳු ඇට පෙළ කෙලින් සිටින සේ එරමිණිය ගොතා වාඩි විය යුතු. මෙසේ වාඩිවීම නිසා ශරීර වේදනාවක් නොමැතිව බොහෝ වේලාවක් සිටිය හැක. උවැසියනට නම් සුදුසු වනුයේ අඩ්ඪපර්යංකයයි. එනම් පා දෙක පිටුපසට නමා ගෙන වාඩිවීමයි. "නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය" යි මේ අයුරින් සිරුර කෙළින් තබා වාඩිවීම සඳහාය.

සිහිය පිහිටුවීම: මෙසේ වාඩි වී සිතට නැගෙන නොයෙක් සිතුවිලි පැත්තකට කරදමා, නම් නැහැයේ අග හෝ තොල් අග හෝ මෙතෙනකී කර, එහි අවුත් වදනා සුළං රැල වෙත සිහිය තැබිය යුතු ය. මේ භාවනාව කරන්නහු විසින් මුලින්ම සිත තබාගත යුතු වැඩ දෙකකි. පළමු වැන්න සිතට නැගෙන නොයෙක් අරමුණු පැත්තකට කිරීමයි. දෙවැන්න පෙර කී සේ හුස්ම වදිනා තැන සිහිකිරීමයි. මේ දෙක හැර අනික් කිසිවක් නො කළයුතු. එවිට පහසුවෙන් සිත තැන්පත් වෙයි. "පරිමුඛං සතිං උපට්ඨපෙත්වා" යනුවෙන් වදාළේ මේ සඳහාය. පටිසම්භිදායෙහි මෙසේ තේරුම් කර ඇත. "පරීති පරිග්ගහට්ඨො මුඛන්ති නීය්‍යානට්ඨො සතීති උපට්ඨානට්ඨො, තෙන වුච්චති පරිමුඛං සතිං" 'පරි" යනු හාත් පසින්ම සලකා බැලීම යන තේරුමයි. (නොයෙක් අරමුණු පැත්තකට කිරීම මෙයින් කියැවේ) "මුඛං" යනු පමුණුවා ගැනීම යන තේරුමයි. (හුස්ම වදිනා තැනට සිහිය ගැනීමයි) සති යනු එළවා ගැනීම යන තේරුමයි. (පමුණුවා ගත් සිහිය හුස්ම වදිනා තැනම තබා ගැනීමයි) මෙයින් භාවනාවට සිහිය පිහිටුවා ගත යුතු අයුරු පැහැදිලි වෙයි.

මෙසේ සූදානම් වූ පසු සිහිය අන් අතකට යන්ට නොදී සිහි ඇතිව ම ආශ්වාස - හුස්ම ගැනීම - කළ යුතු. සිහි ඇතිව ම ප්‍රාශ්වාස-හුස්ම හෙළීම-කළ යුතු. "සො සතොව අස්සසති සතො පස්සසති" යි වදාළේ මේ නිසාය. සසර බොහෝ කාලයක සිට නොයෙක් අරමුණු ඔස්සේ මෙතෙක් සිත් සේ දිවූ සිත එක තැනක පිහිටුවා ගැනීම ඉතා අපහසු කාරණකි. වනයෙහි සිත්සේ හැසුරුණු කුළු ගොනා හීකරු කරගැනීමට අපහසු වන්නාක් මෙනි. එසේ වුවත් දක්‍ෂ මිනිසා කුළු ගොනා ශක්තිමත් කණු වෙක බැඳ හීකරු කර ගන්නා සේ දක්‍ෂ යෝගාවචරයා ද කුළු ගොනෙකු බඳු තම සිත සිහි නැමති රැහැනින් ඉහල පහල හෙලන හුස්ම - ආනාපාන - නමැති ශක්තිමත් කණු වෙහි බඳියි.

මෙතෙකින් ආනාපාන සති භාවනා ආරම්භය අවසානයි.

## ආනාපාන සති භාවනා ක්‍රමය.

දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති. දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති. රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති. රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති: සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති. පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති- චිත්තසංඛාර පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තසංඛාර පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති. චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. නිරොධානුපස්සී අස්සසිස්සාමීති

සික්ඛති. නිරෝධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති අයං වුච්චතානන්ද ආනාපානසති -ගිරිමානන්ද සූත්‍රය.

**ක්‍රම දසයකි.** ආනාපාන සති භාවනාව මේ සූත්‍රයෙහි ක්‍රම දසයකට සඳහන්ව ඇත. සතිපට්ඨාන සූත්‍රයෙහි ඇත්තේ සතර පමණි. ඊට හේතුව, කායානුපස්සනා වශයෙන් දේශනා කළ බැවිනි. ඒ සතර කායානුපස්සනාවට අයත්ය. මෙහි වේදනානුපස්සනාදී සෙසු අනුපස්සනා තුනද ඇතුළත්ය. එහෙයින් ක්‍රම සොළසක් විය. නිර්වාණාවබෝධය තෙක් පවත්නා එකම සමථ භාවනාව ආනාපාන සතියයි. සෙසු සමථ භාවනා ධ්‍යාන තෙක් පමණි ගමන් කරනුයේ

## කායානුපස්සනාවට අයත් ක්‍රම සතර:

i. දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති.
දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති.

ii රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති.
රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති.

iii. සබ්බකාය පටිසංවේදී අස්සසිස්සාමීති - පස්සසිස්සාමීති සිකඛති.

vi. පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති - පස්සසිස්සාමීති සිකඛති.

1. දිග් ලෙස හුස්ම ගනිමින් දිග්ලෙස හුස්ම ගනිමියි දනියි. දිග් ලෙස හුස්ම හෙලමින් දිග් ලෙස හුස්ම හෙලමියි දනියි.

2. කෙටිලෙස - පෙරමෙනි -

3. සියලු ආශ්වාස ප්‍රශ්වාස ශරීරය හොඳහැටි දනිමින් ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි

4. රළු වශයෙන් වැටහෙන සියලු හුස්ම සංසිඳුවමින් ගන්නෙමි, එසේ හෙලන්නෙමියි හික්මෙයි.

මෙහිදී සලකා බැලිය යුතු කරුණු කීපයකි. වෙනත් අරමුණු නවත්වා, ඒ දෙසම සිහිය යොමු කිරීම සඳහා උත්සාහයෙන් නම් දිග් ලෙස හුස්ම නොගත යුතුය නොහෙළිය යුතුය. මක් නිසාද එයින් තමා අධික වෙහෙසට පත් වන හෙයිනි. බුදුරජාණන් වහන්සේ දිග් ලෙස හුස්ම ඉහල පහල යන අයුරු මෙනෙහි කරන්නටයැයි වදාළේ, ඇතැමෙකුට ඇතැම් වේලාවන්හිදී දිග් ලෙස හුස්ම ඉහල පහල යන හෙයින්ද, ඇතැමෙකුට කෙටි ලෙස හුස්ම ඉහල පහල යන හෙයින්ද, යන කරුණු දක්නා නිසාය. එහෙයින් යෝගියා විසින් තමාගේ ස්වාභාවික ලෙස සිදුවන හුස්ම ඉහල පහල යෑම මෙනෙහි කළ යුතුය. මේ සඳහා මනා සිහියක් අවශ්‍යය. මඳක් නමුදු සිහියෙහි විචෘතියක් - වෙනස් වීමක් = ඇත්නම් එවැන්නාට අනාපාන සතිය නුසුදුසුය. එයින් වදාළහ. "නාහං භික්ඛවෙ මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස ආනාපාන සති භාවනං වදාමි" මහණෙනි, මම මුළා වූ සිහි ඇති මෝඩයාට ආනාපාන සති භාවනාව නොවදාරමි කියායි. මෙසේ කරුණු නොදත් ඇතැම්හු මහළු වියට පත් වී, සිරුර කෙළින් තබා ගැනීමටවත් නො හැකි, තනියෙහි සිටද, යමක් සිහිකර ගැනීමට පවා සිහිය නොමැති නමුත් මේ භාවනාව වැඩීමට මහත්සි ගනිත්. එය හුදෙක් සිනහවට පමණක් ලක්වන කරුණක් වෙයි.

ආනාපාන සතිය වැඩීමට පහසු වන්නේ රාගාදී කෙලෙස් පැන නැගීම් අඩු ශරීරයේ නිරෝගිකම් ඇති, ධර්මය පිළිබඳ වැටහීම් ඇති, හොඳ සිහියෙන් වෙසෙන, ශ්‍රද්ධාදී ගුණයන්ගෙන් යුක්තවූවන්ට පමණි.

දිග්ලෙස, කෙටිලෙස, හුස්ම ඉහල පහල යැවීමේ නවාකාරය"

පෙර කී පරිදි සිහි ඇතිව මේ භාවනාව පවත්ගත් යෝගියා ඊලඟට කළ යුත්තේ මේ නව වැදෑරුම් ක්‍රමය පුහුණු කිරීමයි. එනම්:-

i බොහෝ වේලාවක් හුස්ම ඉහලට ගැනීම

ii පහතට හෙළීම.

iii බොහෝ වේලාවක් ඒ දෙකම සිදුකිරීම.
මෙසේ පුරුදු වන විට බලවත් කැමැත්තක් ඇතිවෙයි.

vi ඒ කැමැත්තෙන් පෙරටත් වඩා සියුම්ලෙස ඒ තුන් ක්‍රමය සිදුකිරීම.

එවිට සතුටක් ඇතිවෙයි.

vii ඒ සතුටෙන් පෙරටත් වඩා සියුම් ලෙස, බොහෝ වේලාවක් වරක් හුස්ම ගැනීම, වරක් හෙලීම, වරක් ඒ දෙකම කිරීම, යනුයි.

මේ නවාකාරය පටිසම්භිදාමග්ගයෙහි දක්වෙනුයේ දීඝ, රස්ස, ආශ්වාස ප්‍රශ්වාස අරමුණු කොටය. මෙහිදී කෙටියෙන් දක්වූයේ මුලින් සඳහන් පරිදි යෝගාවචරයාගේ ස්වභාවික ආශ්වාස ප්‍රශ්වාස දක්වූවමනා හෙයිනි. නමුත් භාවනාව පුහුණුවත්ම තම හුස්ම දිග්ලෙසද කෙටිලෙසද වැටේගේ. එවිට මේ නවාකාරය සුදුසු වූ පරිද්දෙන් සිහිකරගත හැක.

**සිත සමාහිත වීම:** ඉහත දක්වූ අයුරින් සතුටින් බොහෝ වේලාවක් දිග් ලෙස පෙරටත් වඩා සියුම් ලෙස හුස්ම ඉහල පහල යවද්දී අරමුණු කරගත් දීඝ ආශ්වාස ප්‍රශ්වාසයෙන් සිත පෙරලෙයි. එනම් ප්‍රතිභාග නිමිත්ත උපදියි. පෙර සිත පැවතියේ පරිකර්ම නිමිත්තයෙහිය, ආශ්වාස ප්‍රශ්වාස සියුම් කරත්ම, එයට වඩා සියුම්, එහෙත් පැහැදිලි ප්‍රතිභාග නිමිත්තට සිත නැංවෙයි. ඒටයි පෙරලේ යනුවෙන් සඳහන් කලේ. (ප්‍රතිභාග නිමිත්ත ඉහතදී තේරුම්කර ඇත.) ඒ ප්‍රතිභාග නිමිත්ත උපන් කල්හි විතර්කාදී ධ්‍යානාඞ්ගයන් ඉදිරිපත්ව කාමච්ඡන්දාදී නීවරණයන් යටපත් කොට උපචාර, අර්පණා, යන දෙවදෑරුම් ධ්‍යානයන්ට සිත නංවයි. නැවත නැවත වඩත්ම දෙවැනි, තුන්වැනි, සතරවැනි, පස්වැනි, ධ්‍යානයන් ඉපදවිය හැකිය. මෙතෙක් දක්වූයේ ක්‍රම දෙකක් පමණි.

එහිම දෙවැනි කොටස

iii සියලු ආශ්වාස ප්‍රශ්වාස කය ප්‍රකට ලෙස දනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. එසේම ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

iv රළු වශයෙන් මැටහෙන ආශ්වාස ප්‍රශ්වාසකය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. එසේම ප්‍රශ්වාස කරන් නෙමියි හික්මෙයි. මේ දෙවැනි ක්‍රම දෙකයි.

මෙහි සඳහන් සියලු හුස්ම පැහැදිලි ලෙස දැනීමට නම් ආනාපාන සතිය බොහෝ කාලයක් වැඩිය යුතුය. සුළු වේලාවකදී පැහැදිලි කරගැනීමට මහන්සි ගතහොත් අමාරුවේ වැටේ.

එහෙයින් ඒ සඳහා පුහුණු කර, ඒ සියලු හුස්මෙහි මුල, මැද අග, විමසිය යුතුය. ආශ්වාස කිරීමෙහිදී හුස්මෙහි මුල නැහැය අගයි. ප්‍රශ්වාස කිරීමේදී නම් නැබයි. ඒ දෙකෙහිදීම හුස්මෙහි මැද හෘදයයි. ප්‍රශ්වාස කිරීමේදී මුල නැබයි. අග නැහැයයි. මෙසේ මුල, මැද, අග, හොඳට වැටහේ නම් භාවනාව දියුණු බව සැලකිය යුතු.

ඊලඟට සඳහන් රළු ආශ්වාස ප්‍රශ්වාස නම් පෙර භාවනාවට පටන් ගැනීමේ සිටම පවතින දීඝ, හ්‍රස්ව, ආශ්වාස ප්‍රාශ්වාසයෝයි. ඒ සියලු ඖදාරික රළු ගති නැති කර ගනිමියි යන හැඟීම ඇතිව ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මිය යුතුය.

(2) වේදනානුපස්සනාවට අයත් කොටස් සතර

i පීතිපටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති, පස්සසිස්සාමීති සික්ඛති.

ii සුඛපටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති, පස්සසිස්සාමීති සික්ඛති.

iii චිත්තසංඛාර පටිසංවේදී අස්සසිස්සාමීති – පෙ –සික්ඛති.

v පස්සම්භයං චිත්තසංඛාරං අස්සසිස්සාමීති – පෙ – සික්ඛති

මුලින් ලබාගත් ධ්‍යානයන් අතුරෙන් පළමුවැනි, දෙවැනි, ධ්‍යානයන්හි ප්‍රීතිය ඇත. ඒ ධ්‍යාන දෙකෙහිද තුන්වැනි ධ්‍යාන යෙහිද සුඛය ඇත. මේ ප්‍රීති, සුඛ, දෙදෙනා ගැන අරමුණු වශ යෙන් හෝ නුමුලාවීම් වශයෙන් හෝ පැහැදිලි ලෙස දැනගත යුතුය. එසේ දැනීම ඇතිව යන තේරුම සඳහායි "පීතිපටිසං වෙදී සුඛපටිසංවෙදී" යනුවෙන් වදාළේ, එසේම ධ්‍යාන සඳහා අරමුණු වශයෙන් කියැවෙයි. විදර්ශනා සඳහා නුමුලාවීම් වශ යෙන් දැනීම කියැවෙයි. එම තේරුම් දෙකම මෙහිලා සුදුසුය. මෙසේ පැහැදිලි ලෙස දැනගෙන අවසානයට පත්වන තෙක් භාවනාව පුහුණු විය යුතුය. මේ පීති, සුඛ, දෙදෙනා වේදනා වෝයි.

චිත්තසංඛාර, යනු සතර වැනි ධ්‍යානයෙහි ඇති වේදනා සංඥා, දෙකයි. එහෙයින් ඒ දෙක පැහැදිලි ලෙස දැනගැනීම සඳහා පුහුණු විය යුතු අතර, දැනගත් පසු සැහැල්ලු කරගැනීම

සඳහා ද පුහුණු විය යුතු බව තුන්වැනි චිත්තසංඛාරපටිසංවෙදී-' සිවුවැනි - පස්සම්භයං චිත්තසංඛාරං - ක්‍රමයන්ගෙන් කියැවෙයි.

## චිත්තානුපස්සනාවට අයත් කොටස් සතර

i චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, පස්සසිස්සාමීති සික්ඛති.

ii අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, -පෙ-

iii සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, -පෙ-

vi විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, -පෙ-

මෙහි "චිත්තපටිසංවෙදී යනු තම සිත ප්‍රථම ධ්‍යානාදියට පත් වූයේයයි පැහැදිලි ලෙස දැක ගැනීමයි. එසේ දැනගෙන ඒ ඒ අනුව ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මිය යුතුය. ඒ ලබාගත් ධ්‍යාන සමග යෙදුනු සිත, එහිම ඇති ප්‍රීතියෙන් තුල් මත් කරමින් හික්මීම "අභිප්පමොදයං චිත්තං" යන පදයෙන් දැක්විණ. විදර්ශනා වශයෙන් නම් ප්‍රීතිය යෙදුනු ධ්‍යානයට සම වැදී එයින් නැගී එහි ඇති ප්‍රීතිය ඛය වය- ගෙවීම, විනාශවීම, වශයෙන් බලමින් සිත සතුටු කරමින් හික්මීමයි. ධ්‍යානයන්ට අනුව අරමුණෙහි සිත මනාකොට පිහිටුවමින් අශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මීම "සමාදහං චිත්තං" යන වැකියෙන් කියැවේ. එයම විදර්ශනා ක්‍රමයට ධ්‍යාන සමඟ යෙදුනු චෛතසික ඛය වය වශයෙන් බලමින් අරමුණෙහි මනාකොට පිහිටුවමින් හික්මීමයි.

මෙහි මනාසේ පිහිටුවීම නම් ලීන, උද්ධච්ච, (හැකුළුනු විසුරුණු) යන දෙකට පත්වන්ට නොදී ආරක්‍ෂා කර ගැනීමයි. එහිලා ක්‍රමය මෙසේය.

රෙණුමහි උප්පලදලෙ සුත්තෙන - නාවාය නාලියා
යථාමධුකරාදීනං - පවත්ති සම්පවණ්ණිතා
ලීන උද්ධත භාවෙහි - මොචයිත්වාන සබ්බසො
එවං නිමිත්තාභි මුඛං - මානසං පටිපාදයෙ"

අතිදක්‍ෂ මී මැස්සා අසවල් ගසෙහි මල් පිපුණේයයි දැන, වේගයෙන් පියාඹා එනුයේ, ඔහුගේ වේගය වැඩි නිසා ඒ මල් පසුකර ගෙන ඈතට පියාඹයි. පෙරළා ආපසු එනුයේ සෙසු මැස් සන් විසින් රොන් ගන්නා ලද ගස්ම දකියි. අදක්‍ෂ මී මැස්සා හෙමින් හෙමින් පියාඹනුයේ එතැනට එනවිට මල්රොන් වැටී

ඇත. මේ දෙදෙනාටම මල්රොත් බිමට නො හැකි වෙත්. සමදක්ෂ - වේගවත් නොවී, හෙමිනුත් නැතිව - පියාඹා යන මීමැස්සාට එම රොත් බිමට අවසථාව සැලසේ. තවද ශල්‍යකර්ම' (කැපුම් පැලුම් වැඩ) ඉගෙණ ගන්නා වෛද මහතා අතිදක්ෂ නම් (කලබල වැඩි නම්) කැපීම සඳහා ඔහුට දුන් නෙළුම් කොළය වේගයෙන් ආයුධය බහා සපා විනාශ කරයි. අදක්ෂ වෛද මහතා නෙළුම් කොළයෙහි ආයුධය තැබීමටද බිය වෙයි. සම දක්ෂයා ම ඒ ක්‍රියා වෙහි සමත් වෙයි. මකුළු දැලෙහි නූල හැනීම, නැව් පැදවීම, තෙල් තැලිය ගෙන යාම, යන මේ උපමාද පෙර කී සේ යොදා ගන්න.

මෙසේ උපමාවන් අනුව තේරුම් ගත් යෝගියාද ලීන, උද්ධච්ච, භාවයෙන් සිත මුදවමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

භාවනාවට පටන් ගත් අවස්ථාවේ පටන්ම රාගාදි කෙලෙස් ද, කාමච්ඡන්දාදී නීවරණයන්ද, තම සිතෙන් අස් කරමින් ආශ්වාස ප්‍රශ්වාසකරන්නෙමියි හික්මිය යුතුය. ප්‍රථම ධ්‍යානයෙන් නීවරණයන් අස්වූ පසු විතර්කාදි ධ්‍යානාඞ්ගයන් රළුයයි සිතා ඒවා සිතෙන් අස්කර හැනිමට අදහස් ඇතිව හික්මිය යුතු විදර්ශක යෙකු නම් සිතෙහි පවත්නා නිත්‍ය, සුභ, සුඛ, ආත්ම' යන වැරදි හැඟීම් දුරු කරමින් ආශ්වාස ප්‍රාශ්වාස කරන්නෙමියි හික්මිය යුතුය. මේ "විමොචයං චිත්තං" යන පාඨයෙන් දැක්වූ ක්‍රමයයි. 'චිත්තපටිසංවේදී" ආදි සිවු අයුරු චිත්තානුපස්සනාවයි.

## ධම්මානුපස්සනාවට අයත් කොටස් සතර:-

i අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, පස්සසිස්සාමීති සික්ඛති.

ii විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, පස්සසිස්සාමීති සික්ඛති.

iii නිරෝධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, පස්සසිස්සාමීති සික්ඛති.

iv පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, පස්සසිස්සාමීති සික්ඛති.

මෙහි තේරුම් ගතයුතු කරුණු සතරෙකි. එනම් අනිත්‍යය අනුව බලනුයේ, විරාගය - නිරෝධය - පටිනිස්සග්ගය අනුව බලනුයෙ, යනුයි. නාමරූප ධර්මයන්ගේ හෙවත් සංස්කාර ධර්මයන්ගේ අවස්ථා තුනෙකි. උප්පාද - ඉපදීම, වය - විනාශය ඨිතස්ස අඤ්ඤථත්ත - ඇති දෙයෙහි වෙනස්වීම, යනුයි, "තීනිමානි භික්ඛවෙ සංඛතස්ස සංඛත ලක්ඛණානි, කතමානි තීනි? උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති." යනුවෙන් බුදුරජාණන් වහන්සේ සංස්කාරයන්ගේ ඒ ලක්ෂණත්‍රය දේශනා කළහ. මහණෙනි, සංස්කාරයන්ගේ ලක්ෂණ තුනෙකි ඒ කවරේද? ඉපදීම පැනේ. විනාශය පැනේ. ඇති සංස්කාරයන්ගේ වෙනස්වීම පැනේ. යනු එහි අදහසයි. කරුණු මෙසේ හෙයින් ආනාපාන සති භාවනාව දියුණු කරගෙන යන යෝගියාද තම සිරුර වශයෙන් පෙනෙන නාම රූප ධර්ම නැතහොත් සංස්කාර ධර්ම විනාශවීම නිසා "අනිත්‍යය" යන හැඟීම අනුව බලමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මිය යුතුය.

ii. විරාගානුපස්සී - මෙහි විරාග යනු වෙන්වීමයි. එය දෙවැදෑරුම්ය. ඛය විරාගය, අච්චන්ත විරාගය; යනුයි. මොහොතක් පාසා සිදුවන සංස්කාරයන්ගේ විනාශය ඛය විරාග නම්. ක්ෂණ-භඞ්ග යනුද මීටම නමකි. සදහටම සංස්කාරයන්ගෙන් වෙන්වීම අච්චන්ත විරාගයයි. මෙයින් නිර්වාණය කියැවේ. මෙසේ මේ දෙවැදෑරුම් විරාගය දකිමින් ඒ අනුව ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මිය යුතුය.

iii. නිරෝධානුපස්සී:- සංස්කාර ධර්මයන්ගේ විනාශය නිරෝධ නම්. මෙයද ඛය, අච්චන්ත, වශයෙන් දෙපරිද්දිය. මොහොතක් පාසා සිදුවන බිඳීම - ක්ෂණභඞ්ගය - ඛය නිරෝධයයි. ලෝකෝත්තර මාර්ගයන්හිදී ඇතිවන සම්පූර්ණ විනාශය වූ නිර්වාණය අච්චන්ත නිරෝධ නම්. මෙයින් පළමුවැන්න විදර්ශනා වශයෙනි. දෙවැන්න මාර්ග ඵල වශයෙනි. මේ දෙවැදෑරුම් විනාශය අනුව බලමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මිය යුතුය.

iv. පටිනිස්සග්ගානුපස්සී:- නිත්‍ය, සුභ, සුඛ, ආත්ම යන වැරදි හැඟීම් දුරු කිරීම පටිනිස්සග්ග නම්. පරිච්චාග, පක්ඛන්දන, වශයෙන් එය දෙවැදෑරුම් ය' විදසුන් වඩන වේලාවේදී සංස්කාරයන්ගේ වහ වහා බිඳි බිඳී යන හැටි දකිමෙන් සිතෙහි පවතින නිත්‍යාදී හැඟීම්, රාගාදි කෙලෙස්, ඒ වේලාවට නමුත් - තදඞ්ග ප්‍රහාණය - අත් හැරීමක් සිදුවෙයි. එය පරිච්චාග පටිනිස්සග්ගය

යි. ඒ සමගම කෙලෙසුන්ගෙන් දුරු වූ නිවණ අරමුණු කරමින් එයට සිත නැඹුරු කර, රාගාදි කෙලෙස් දුරින්ම දුරු කරයි. එය පක්ඛන්දන - පතිත - පටිනිස්සග්ගයයි. මෙසේ දෙවැදෑරුම් දුරු කිරීම අනුව බලමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

සොළොස් ආකාර ආනාපානසති භාවනාව අතුරෙන් මුලින් දක්වූ දොළොස් ආකාරය සමථ - විදර්ශනා වශයෙන් දෙශිතයි. අවසාන සිවු අයුරු හුදු විදසුන් වශයෙන්ම දෙශිතය. කායගතාසතියේ පළමුවැන්න වූ ආනාපාන සතිය පිළිබඳ විස්තරය මෙතෙකින් අවසානය.

## 2. ඉරියවු භාවනාව

යෑම, සිටීම, හිඳීම, නිදීම යනුවෙන් ඉරියවු සතරෙකි. මේ සිවු ඉරියවු අතර, ශරීරය ඒ මේ අතට හැරීම්, නැමීම්, ආදිය ද සිදුවෙයි. ඒහෙයින් ඉරියවු භාවනාව කොටස් පසකින් යුක්තය. ප්‍රධාන වශයෙන් පවතින ඉරියවු සතර නිසා මීට "චතු ඉරියාපථ භාවනාය"යි ව්‍යවහාර වේ. මෙහි භාවනා ක්‍රමය මෙසේය.

පුනචපරං භික්ඛවෙ ගච්ඡන්තො වා ගච්ඡාමීති පජානාති ඨිතො වා ඨිතොම්හීති පජානාති, නිසින්නො වා නිසින්නොම්හීති පජානාති, සයානො වා සයානොම්හීති පජානාති, යථා යථා පනස්ස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති.

– ම. ස. සු.

i යන්නේ යන්නෙමියි දන ගනියි.

ii සිටියේ සිටියෙමියි දන ගනියි.

iii හුන්නේ හිඳිමියි දන ගනියි.

iv නිදන්නේ නිදන්නෙමියි දන ගනියි.

v සිරුර යම් අයුරකින් පවතියි ද ඒ පවතින අයුරින් ම දන ගනියි. මේ ඒ කොටස් පහයි.

ඉරියවු භාවනාවෙහි පළමු කොට සිතාගත යුතු කරුණු කීපයෙකි. බලු, නරි, ගව, මුව, ආදී සත්හුද සතර ඉරියවු පවත්වති. එසේ වුවත් ඔවුන්ගේ සිතෙහි තම ජීවිතය ගැන හැඟීමක් නැත. යෑම, සිටීම, ආදිය පමණක්ම දනිත්. ඉරියව් භාවනා කරන යෝගියා එසේ නොව ජීවිතය පිළිබඳ හැඟීමක්

ඇතිව ඉරියව් පැවැත්විය යුතුය. ජීවිතය යනු කුමක්ද? එහි පැවැත්ම කෙසේද? එහි ඇති නියම ස්වභාවය කුමක්ද? ආදී වශයෙන් සිතීත්ම ප්‍රශ්නයන් නගමින් තම ධර්ම ඥානය වූ පරිද්දෙන් විසඳා ගත යුතුය. තවද බුදුරජාණන් වහන්සේ විසින් දෙසූ පරමාර්ථ ධර්ම නො පෙරළෙන ස්වභාවය-ඉගෙණ ගත යුතුය. එසේ ඉගෙණ ගත් යෝගියෙකුට හැර සෙස්සන්ට ඉරියව් භාවනාව නොකළ හැකිය. මක්නිසාද? ජීවිතය පිළිබඳ ක්‍රියාකාරිත්වය - යෑම්, සිටීම්, ආදී වැඩ පිළිවෙල - නොදත කල හොත් මූලාවේ වැටෙන හෙයිනි. සමහර විට සිනහවටද කරුණු වෙයි.

කරුණු තේරුම් නොගෙන බොහෝ දෙනෙක් ඉරියව් භාවනාවයැයි කියා "ගොළුබෙලි" ගමන් අරඹත්. රාජ්‍ය වර්ෂ 1955 දී පමණ ලක්දිව උදුවූ "අපි නියම ශ්‍රමණයෝ වෙමු" යි හැඟෙන සේ ජනතාවට මුහුණ දුන් තවුස් සමාජය, පෙර කී සේ ගොළුබෙලි ගමනම ක්‍රියාවේ යෙදවිය. එයින් සිදුවූයේ ඔවුන්ම මූලාවේ වැටීම පමණි. ඉරියව් භාවනාව කළ යුත්තේ එවැනි ගොළුබෙලි ගමනද, වේගයෙන් යන අශ්වාදීන්ගේ ගමන ද, බිය වුවන් සේ වට පිට බලමින් යන මුව, රිලා, ආදීන්ගේ ගමනද, යන මේ ගමන් නවත්වා, ශීලාචාර ලෙස කෙරෙන ගමන් ඇරඹීමත්, ඒ අනුව පෙර කී ලෙස සිහි නුවණ දෙක යෙදවීමත්ය. සාමාන්‍ය මිනිසා ඇතැම් විට තිරිසන් සතුන්සේ ගමන් කරයි. එයද නොමැනවි. කරුණු මෙසේ හෙයින් බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට පැණ වූ "සේඛියා" නම් වූ නීති මාලාවේ සඳහන් ක්‍රමයට ගමන් යොදා ගැනීම මේ භාවනාවට ඉතා යෝග්‍යය. ඒ සේඛියා නම් :

"සුසංවුතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා සුසංවුතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා, ඔක්ඛිත්තචක්ඛු -පෙ- උක්ඛිත්තකාය -පෙ- න උජ්ජග්ඝිකාය -පෙ- අප්පසද්දෙ -පෙ- න කායප්පචාලකං -පෙ- න බාහුප්පචාලකං -පෙ- න සීසප්පචාලකං -පෙ- අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා" - භික්ඛුපාතිමොක්ඛ.

මනා හික්මීමක් ඇතිව, තමා වෙසෙන තැනින් බැහැර තන්හි යන්නෙමියි හික්මිය යුතු. එසේ එහි හිඳින්නෙමියි හික්මිය යුතුය. යට හෙළා ලූ ඇස් ඇතිව - පෙරමෙනි - වස්ත්‍රය ඔසවන්නේ නැතිව -, මහත්සේ සිනා නොවී -, ශබ්ද අඩුව-, කය - අත් හිස සොලවන්නේ නැතිව තමා වෙසෙන තැනින් බැහැර තන්හි යන්නෙමියි හික්මිය යුතුය. එසේ හිඳින්නෙමියි හික්මිය යුතුය යනුයි

සිහි නුවණ යෙදවීම: ඉමස්ස පන භික්ඛුනො ජානතො සත්තූපලද්ධිං පජහති, අත්තසඤ්ඤං උග්ඝාටෙති, කම්මට්ඨානඤ්චෙව සතිපට්ඨාන භාවනා ච හොති" ම. ස. ප; අ.

(ජීවිතය පිළිබඳ ධම් සඥා වශයෙන් හැඟීම් ඇති) මේ භික්ෂුව ගේ දූනිම "සත්වයාය', යන හැඟීම දුරුවෙයි. ආත්මය යන හැඟීමද දුරුවෙයි. කම්ස්ථානයද සතිපට්ඨාන භාවනාව ද වෙයි.

කරුණු මෙසේ හෙයින් පළමු කොට කවරෙක් යේද? කාගේ ගමනක්ද? කුමන කරුණකින් සැවේද? යනාදි වශයෙන් තමා විසින්ම ප්‍රශ්න සිතෙහි නංවා ගැනීමෙන් සිරුර පිළිබඳ සිහිය යොදවා ගත යුතුය. ඉක්බිති ඒ ප්‍රශ්නයන්ට සිතින්ම පිළිතුරු සැපයීමෙන් නුවණ යොදා ගත හැක. ඒ පිළිතුරු මෙසේය. කවරෙක් යේදැයි සිතූ නමුත් මෙහි යන කෙනෙක් නැත. එසේ නම් යන්නේ කෙසේද? යන්ට ඕනෑයයි සිතූ විට ඒ සිතෙන් වායෝ ධාතුවක් හට ගනී. ඒ වායෝ ධාතුවේ පැතිරීමෙන් "විඤ්ඤත්ති" නම්වූ හැඟීම ඇති වේ. එවිට අත්-පාමුලිනවී සිරුර ඉදිරියට එළවේ. එයට තමයි යෑමයි කියනුයේ, සිටීම්, හිඳීම්, නිදීම් යන ඉරියව්ද වටහා ගත යුත්තේ මේ ක්‍රමයෙනි.

මෙසේ සලකාත්ම සත්වයාය, මමය, මාගේ ගමනය, ආදී ආත්මීය හැඟීම් දුරුවී, ධ්‍යාන ඉපදවීමටත්, විදර්ශනා නුවණ ඉපදවීමටත් අවශ්‍ය සිහි, නුවණ දෙකම හටගනියි. පස් මැදැරුම් ඉරියවු භාවනාව මෙතෙකින් නිමි.

## 3. කුඩා ඉරියවු භාවනාව නොහොත් චතුසම්පජඤ්ඤ.

යෑම්, සිටීම්, ආදී මූලික ඉරියවු සමගම ඊළඟට සිහි නුවණ යෙදිය යුත්තේ ඒ අතර පවතින කුඩා ඉරියවු වෙතය. ජීවිතය සඳ උපකාරී වන වස්ත්‍ර, ආහාර, ආදිය ගැනීම්ද, එදිනෙදා සිදු කරන මල පහකිරීම් ආදියද ඇතුළත් වනසේ මේ කුඩා ඉරියවු භාවනාව දෙසුන. එසේම සෑම ඉරියවු පැවැත්වීමකදී සිහියත් නුවණත් දියුණුවන අයුරින් දෙසූ හෙයින් "සම්පජඤ්ඤ" යන නාමයෙන්ද මේ භාවනාව හැඳින්වෙයි. සම්පජඤ්ඤය සිව් අයුරකින් පවතී. එහෙයින් "චතුසම්පජඤ්ඤ නමි. කුඩා ඉරියවු භාවනා ක්‍රම සතකි, ඒ මෙසේය.

පුනචපරං භික්ඛවෙ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති." ම. ස. සු.

i ඉදිරියට යාමෙහිද ආපසු හැරීමෙහිද මනාසේ සිහි නුවණ යෙදූයේ වෙයි.

ii ඉදිරි බැලීමෙහිද වටපිටාව බැලීමෙහිද මනාසේ සිහි නුවණ යෙදූයේ වෙයි.

iii අත් - පා හැකිලීමෙහිද දිග හැරීමෙහිද මනාසේ සිහි නුවණ යෙදූයේ වෙයි.

iv දෙපට සිවුර, පාත්‍රය, සිවුර, අඳනය, දැරීමෙහි මනාසේ සිහි නුවණ යෙදූයේ වෙයි. (ගිහි පින්වතුන් විසින් තම වස්ත්‍රාදියයි)

v වැළඳීම, බීම, කෑම, රස විඳීම යන මේ ආදියෙහිදී මනාසේ සිහි නුවණින් යුක්ත වූයේ වෙයි.

vi මල පහ කිරීමෙහි ද මූත්‍ර කිරීමෙහි ද මනාසේ සිහි නුවණ යෙදූයේ වෙයි.

vii යෑම, සිටීම, හිඳීම, නිදීම, නිදි වැරීම, කතා කිරීම, නිශ්ශබ්ද වීම යන මේවා යෙහි දී ද මනා සේ සිහි නුවණ යෙදූයේ වෙයි.

කුඩා ඉරියව් මෙපමණකැයි නො සිතිය යුතු. හුදෙක් භාව නාව සඳහාම යෙදුනුහුට නො කර අත්හරින්නට ම නො හැකි ඉරියව් කොටසකි මේ. භික්ෂුවට වුවත් ඒ අතර තුරදී පාත්‍රා පිළිස්සීම්, සිවුරු මැසීම්, බණකීම්, ලිවීම් ආදී ඉරියව් රැසක් පවත්වන්නට සිදු වෙයි. ගිහි පින්වතුනට නොයෙක් ඉරියව් ඇති බව අමුතුවෙන් කීමට අනවශ්‍යය. එහෙයින් ගිහි - පැවිදි සෑම යෝගී යෙකු විසින් ම ඒ සියලු තන්හි මනා ලෙස නුවණ යොදවා ගැනීමයි සිදුකළ යුත්තේ.

සේඛියා: බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ගේ සංවරය පිණිසත්, ශීලාචාරකම රැකගැනීම පිණිසත්, එසේම සෞඛ්‍යය ආරක්ෂා කරගැනීම පිණිසත් "සෙඛියා" නමින් නීති මාලාවක් පැණවූහ. ඒ සියල්ල පන්සැත්තෑවකි (75) සිවු ඉරියවු භාවනා වේදී කීපයක් සඳහන් කර ඇත, ඒවාත් සමග ඒ පන්සැත්තෑව ම මැනවින් ආරක්ෂාකරගත හොත් මේ භාවනාවට බොහෝ උපකාරී වෙයි. තමන් ගතයුතු ආහාර ප්‍රමාණය, එයට අවශ්‍ය ව්‍යඤ්ජන ප්‍රමාණය, ඒ ආහාරය වැළඳිය යුතු අයුරු, එසේම පැන් බියයුතු, දහම් දෙසිය යුතු. මළ මූ පහකළ යුතු අයුරු ද යන මේවා ඒ පන්සැත්තෑ වෙහි එන කෙටි අදහස් ය. භික්ෂුවක් නිසා පැණ වූවද ගිහි පින්වතුන් විසිනුත් ඒ අනුව හික්මුණ හොත් මේ කුඩා ඉරියවු භාවනාව පහසුවෙන් පුහුණු කළ හැකි නිසයි. මෙහි ලා දැක්වූයේ, විස්තර ප්‍රාතිමෝක්ඛදීපිකාවෙන් බලන්න.

චතුසම්පජඤ්ඤ:

i සාත්ථක සම්පජඤ්ඤය; දියුණුවීම සඳහා පවත්නා මනා නුවණ

ii සප්පාය සම්පජඤ්ඤය: සුදුසු බව සඳහා පවත්නා මනා නුවණ

iii ගොචරසම්පජඤ්ඤය: හැසිරීම සඳහා පවත්නා මනා නුවණ

iv අසම්මොහසම්පජඤ්ඤය: නුමුළාවීම සඳහා පවත්නා මනා නුවණ.

මුලින් සඳහන් කළ භාවනා කොටස් හත කෙරෙහි ම මේ සිවු මැදැරුම් සම්පජඤ්ඤ යෙදේ. එහෙයින් ඒ සිදු කරන සෑම ඉරියවුවක්ම මේ සතරට අනුව සිහි නුවණ යොදවා බැලිය යුතුය. එසේ බැලීම චතුසම්පජඤ්ඤභාවනාවයි. චතුසම්පජඤ්ඤ පිළිබඳ කෙටි හැඳින්වීමක් මෙන්න.

**1.** සාත්ථකසම්පජඤ්ඤ: "තත්ථ අභික්කමන චිත්තෙ උප්පන්නෙ චිත්තවසෙනෙව අගන්ත්වා "කින්නු ඛො මෙ එත්ථ ගතෙන අත්ථො අත්ථි නත්ථීති අත්ථානත්ථං පරිග්ගණ්හිත්වා අත්ථ පරිග්ගණ්හනං සාත්ථකසම්පජඤ්ඤං"-ස. ප. අ. ඒ චතුසම්පජඤ්ඤභාවනාවෙහි. 'ඉදිරියට යමි'යි සිතක් උපන් කල්හි ඒ අනුව නොගොස් 'මෙහි යෑමෙන් මට වැඩක් ඇද්ද නැද්දැයි වැඩ,

අවැඩ විමසා වැඩය-දියුණුව- විමසා ගැන්ම සාත්ථක සම්ප්‍රජන්‍යය නම්. ඉදිරියට යාමෙහි දියුණුව වනුයේ බුද්ධාදී උතුමන්, චෛත්‍ය, බෝධි, භික්ෂූන්, තම කමටහනට සුදුසු අරමුණු, දැකීම සඳහා යැමයි. මක්නිසාද? තම සිතෙහි ශ්‍රද්ධාදී ගුණ දියුණු වීම, සුදුසු කමටහන් හමුවීම, සිත එකඟකර ගැනීම, ඒ සමාධිය මත පිහිටා විදසුන් වඩා රහත්වීම, යන මෙතෙක් කරුණු ඒවායින් සැලසෙන හෙයිනි. ආපසු ඒමත් මේ ක්‍රමයෙනි. මෙසේ සෑම ඉරියව්වකදීම භාවනාව දියුණුවන අයුරින් සිදුකර ගැනීම සාත්ථක සම්ප්‍රජන්‍යය යි.

2. සප්පාය සම්පජඤ්ඤ: "තස්මිං පන ගමනෙ සප්පායාසප්පායං පරිග්ගණ්හිත්වා සප්පාය පරිග්ගණ්හනං සප්පාය සම්පජඤ්ඤං" ඒ ඉහත කී යැමෙහි සුදුසු නුසුදුසු බව විමසා සුදුස්සම විමසා ගැන්ම සප්පාය සම්පජඤ්ඤය යි. එහි සුදුසු නුසුදුසු පිළිවෙල මෙසේය. භාවනාව දියුණු වන තැන් වූවත් ඒ තැන්හි සමහර දිනයන්හි බොහෝ මිනිසුන් ගැවසිය හැකිය. ඒ අතර තමාට ඇතිතාක්ම වස්ත්‍රාභරණයන් ගෙන් සැරසුණු දෙවඟනන් බඳු තරුණ ස්ත්‍රීහු ද වෙත් නම්, එවැනි දිනක ගියහොත් රාගාදී කෙලෙස් ඉපදී සීලය පවා අපිරිසුදුවීමට පුළුවන. එසේම ඇතැම් විට 'මගේ භාවනාව නැති වූයේය'යි ක්‍රෝධය ද ඒමට පුළුවන. මේ දෙයයුරම සිදුවනුයේ මෝඩකම නිසාය. එහෙයින් එතැන මෝහය ද ඇත. කරුණු මෙසේ හෙයින් මෙබඳු තැන් යෝගියාට නුසුදුසුය. අසප්පාය යැ. එසේ නො මැති නම් සප්පාය - සුදුසු යි. සෙසු ඉරියව් ද මේ අයුරු ය.

3 ගොචර සම්පජඤ්ඤ: "එවං පරිග්ගහිත සාත්ථක සප්පායස්ස පන අට්ඨතිංසාය කම්මට්ඨානෙසු අත්තනො චිත්තරුචියං කම්මට්ඨානං සංඛාතං ගොචරං උග්ගහෙත්වා භික්ඛාචාර ගොචරෙ තං ගහෙත්වාව ගමනං ගොචරසම්පජඤ්ඤං නාම" ස. ප. අ. මෙසේ විමසන ලද සාත්ථක, සප්‍රාය, ඇතියහුගේ, අටතිස් කමටහන් අතුරෙන් තමාගේ සිතට කැමති කමටහණ-භාවනාව - නමැති ගෝචරය - සුදුසු හැසිරීම - ඉගෙණ පිඩු පිණිස හැසිරෙන තන්හි එය ඇරගෙන ම යාම ගෝචර සම්පජඤ්ඤය නම්.

බණකීම්, පිරිත් කීම්, ආදී බාහිර දෑ නොකොට භාවනා පමණක් වඩන යෝගාවචර භික්ෂුව සලකා යැ මෙසේ කීයේ. සෙස්සෝ - ගිහි පැවිදි දෙපිරිසම - සලකාගත යුත්තෝ ගමනෙහිදී මෙන් ම අනික් සියලු කුදු මහත් ඉරියවු පැවැත්වීමෙහි දී ද

‘ආනාපානසතිය, හැර සෙසු පුරුදු භාවනාවක් කෙරෙහි සිත තබා ගෙන සිටීමට යෑ. භාවනා අරමුණ සිතෙන් බැහැර යාමට නොදී රැකගෙන ඒ ඉරියවු පැවැත්ම ගොචරසම්පජඤ්ඤය යි.

යෝගී භික්ෂූන් සතර දෙනා: තස්සාවිභාවත්ථං ඉදං චතුක්කං වෙදිතබ්බං, ඉධෙකච්චො භික්ඛු හරති න පච්චාහරති, එකච්චො පච්චාහරති න හරති, එකච්චො පන නෙව හරති න පච්චාහරති, එකච්චො හරති ච පච්චාහරති ච’ ස. ප. අ. ඒ ගෝචර සම්පජඤ්ඤය පැහැදිලිවීම සඳහා මේ සතර දත යුතුය.

i මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් (කමටහන) ඇරගෙන යයි. පසුව ගෙන නො එයි.

ii ඇතැම් භික්ෂුවක් ආපසු ගෙන එයි. ඇරගෙන නො යයි.

iii ඇතැම් භික්ෂුවක් ඇරගෙන ද නො යයි. ආපසුද ගෙන නො එයි.

iv ඇතැම් භික්ෂුවක් ඇරගෙනද යයි. ආපසුද ගෙන එයි.

මෙයින් සිවුවැනි භික්ෂු ඉතා ශ්‍රේෂ්ඨය. පළමුවැනි, දෙවැනි භික්ෂු සාමාන්‍ය යි. තුන්වැනි භික්ෂු ගැන කවර කථාද? බුද්ධශාසනයෙහි ඉතා උසස් පිළිවෙතකි මේ ‘ගතපච්චාගත’ වත. එහෙයින් මෙය පිළිපැදීම මහත් අනුසස් සඳහා පවතීයි. බුදු, පසේබුදු, මහා නුවණ ලබන රහත්හු, යන උතුමෝ මේ ප්‍රතිපදාව ආරක්ෂා කළාහු වෙත්. යෝගියා ද මේවා බලාපොරොත්තුවේ නම් පුහුණු කළ යුතුය.

iv අසම්මෝහසම්පජඤ්ඤ: “අභික්කමාදිසු අසම්මුය්හනං අසම්මෝහසම්පජඤ්ඤං නාම” ඉදිරියට යෑම් ආදියෙහි දී නුමුළාවීම අසම්මෝහසම්පජඤ්ඤ නම්. සෑම කුදු මහත් ඉරියවු පැවැත්වීමේදී නිත්‍ය, සුඛ, සුබ, ආත්ම යන වැරදි හැඟීම් දුරු කොට, ශරීර පිළිබඳවත්, ඉරියවුවල නියම අයුරුත් විමසීම අසම්මෝහසම්පජඤ්ඤය බව වැඩිදුරටත් තේරුම් ගතයුතුය. සිරුරෙහි පවතිනුයේ දෙතිස් කුණප, අටළොස් ධාතු, සය වැදෑරුම් ආයතන යන මේවායි. කෙටියෙන් සලකාත් හොත් කුණු පොදියකි. ධාතු පුඤ්ජයකි. මෙසේ සලකමින් ඉරියවු පවත්වයි නම් ‘මමය, මම යමි, මගේ මමත’ යනාදී වශයෙන් ආත්මීය හැඟීම් ගැනීමෙන් මුළා නොවේ.

මෙසේ විස්තර කළ චතුසම්පජඤ්ඤ භාවනාවෙන් සිත සමාහිත කරගත් කල්හි' එය පාදක කොට විදසුන් වැඩීමෙන් මාර්ග ඵල අවබෝධ වෙයි.

<u>කුඩා ඉරියව් භාවනා ක්‍රමය නිමි.</u>

# 4. ද්වත්තිංසාකාර භාවනාව

කායගතාසති භාවනාවට අයත් ද්වත්තිංසාකාර - දෙතිස් අයුරු - භාවනාව හුදෙක් සමාධිය සඳහාම දෙසූවකි. ආනාපාන සතිය දෙසූයේ සමථ, විදර්ශනා වශයෙනි. ඉරියාපථ, චතුසම්පජඤ්ඤ, ධාතුමනසිකාර, භාවනා විදර්ශනා වශයෙනි. නවසීවථික ය වදාළේ බොහෝ සෙයින් සසර කලකිරීම සඳහා යැ. එහෙයින් මෙම ද්වත්තිංසාකාරය ප්‍රථම ධ්‍යානය පමණක් ලබාදෙන්නක් බව දතයුතු, (විදර්ශනා කිරීමට නම් ඒ ධ්‍යානය හා යෙදුනු චිත්ත චෛතසිකයන් ද ඒ ආශ්‍රයේ පවතින රූපධර්ම ද අනිත්‍යාදි විසින් වෙනම බැලිය යුතු.)

"පුනච පරං භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං උද්ධං පාද තලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති, අත්ථි ඉමස්මිං කායෙ, කෙසා ලොමා නඛා දන්තා තචො, මංසං නහාරූ අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං, හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං, අන්තං අන්ත ගුණං, උදරියං කරීසං මත්ථලුඞ්ගං, පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො, අස්සු වසා ඛෙලො සිඞ්ඝානිකා ලසිකා මුත්තන්ති" -ම. ස. සූ.

මහණෙනි, නැවත ද ඒ යෝගාවචර භික්ෂු මේ සිරුරෙහි ම පතුල්වලින් උඩ, කෙස්වලින් යට හමෙන් වටවී පිරුණා වූ නොයෙක් අසුචි-කුණප-සිඟි තුවණ යොදවා බලයි. මේ සිරුරෙහි කෙස්, ලොම්, නිය, දත්, සම; නහර, ඇට, ඇටමිදුළු, වකුගඩු හෘදය, අක්මාව, දලබුව, බඩදිව, පෙණහැලි, බඩවැල. අතුනුබහන නො පැසුණු අහර, මල-පැසුණු අහර-, (හිස්මොල) පිත්, සෙම්, සැරව, ලේ, ඩහදිය, මේදතෙල්, කඳුලු, වුරුනුතෙල්, කෙළ, සොටු සඳමිදුලු, මුත්‍රා ඇත. (කියායි)

උපමාව: යම්කිසි නුවණැති (ඇස් ඇති) මිනිසෙක් ධාන්‍යයන් ගෙන් පිරුණු, දෙපැත්ත ම බැඳි, මල්ලක් ලිහා "මේ හාල් ය, මේ

කුරහත්ය, මේ මෑය, මේ මුංය" යනාදී වශයෙන් වෙන වෙන ම බලන්නේ යම්සේ ද, එසේම යෝගාවචර භික්ෂුවක් ධාන්‍ය මල්ල නමැති සිරුර සිඟි නුවණින් ලිහා එහි ඇති ධාන්‍ය නමැති කුණප සමූහය වෙන වෙනම නුවණින් විමසා බලයි.

**පටන්ගැනීම :** ද්වත්තිංසාකාර භාවනාව කිරීමට කැමති ගිහි පැවිදි සියලු දෙනා, මේ කම්ටහන හොඳට පුරුදු කල්‍යාණ මිත්‍රයෙකු වෙත එළඹ, මෙහි ඇති හැම අයුරක්ම ඉගෙන ගතයුතු. ඒ සමඟම ඒ ඒ කොටස් පිළිබඳ මනා වැටහීමක් ගුරුවරයා ලඟදීම ලබාගතයුතු. බොහෝ කොටස් නමාට නොපෙනෙන නිසා හැම ගැටළුවක් ම පැටලුම් ඇරගතයුතු. භාවනාව කියාදෙන ගුරුවරයා විසිනිදු පහත දැක්වෙන ක්‍රම සියල්ල පැහැදිලි කර දිය යුතුවා සේම ජීවිතය එපාවීමකට පත්වන්ට නොදී ආරක්ෂාවන අයුරුද තේරුම් කරදිය යුතු. මේ ක්‍රම නො සැලකුවහොත් ඇතැම්විට යෝගාවචරයා ජීවිතය හානිකර ගැනීමට සූදානම් වන්ට පුළුවන. භාවනා ක්‍රමය දෙසූ මුල් කාලයේදී වූ අකර තැබ්බයක් මීට කලින් සඳහන් කර ඇත. (භික්ෂූන්ගේ ජීවිත විනාශය)

**සප්තවිධ උග්‍රහකෞශල්‍යය - ඉගෙනීමේ සත් වැදෑරුම් දක්ෂකම.**

"යොගාපිස්ස කම්මට්ඨානං කථෙන්තෙන සත්තධා උග්ගහකොසල්ලං දසධා මනසිකාර කොසල්ලං ආචික්ඛිතබ්බං, තත්ථ වචසා මනසා වණ්ණතො සණ්ඨානතො දිසතො ඔකාසතො පරිච්ඡෙදතොති එවං සත්තධා උග්ගහකොසල්ලං ආචික්ඛිතබ්බං." - ම. ස. සූ. අ.

ඔහුට කම්ටහන් කියාදෙන්නහු විසින් සත් පරිද්දෙකින් ඉගෙනීමේ දක්ෂකම ද දසපරිද්දෙකින් මෙනෙහි කිරීමේ දක්ෂකම ද කියයුතුයි. එහිලා වචනයෙන්, සිතින්, වර්ණ වශයෙන්, සටහන් වශයෙන්, දිශා-පැති- වශයෙන්, පිහිටිතැන් වශයෙන්, සීමා වශයෙන්දැයි. මෙසේ සත් වැදෑරුම් ඉගෙනීමේ දක්ෂකම කිව යුතු. මෙතැන් සිට දක්වනුයේ පිළිවෙළින් භාවනාව දියුණු කර ගැනීමට උපකාරවන අයුරින්ය. එහෙත් ඒ ඒ කුණප කොටස් හරියාකාර තේරුම් ගැනීමට සාමණේර බණදහම් පොතෙහි එන පිළිකුල් සන්නය, සතිපට්ඨානසූත්‍ර පුරාණ සන්නය ඉගෙන ගතයුතු. මෙහිලා එය විස්තර කිරීමට ගියහොත් ග්‍රන්ථය විශාල වේ.

i වචසා: තුන් පිටකයෙහි පරතෙරට ගිය භික්ෂූ නමුන් මේ භාවනාව මුලින් ම කළයුත්තේ සජ්ඣායනා ක්‍රමයෙනි. එනම් කටපාඩමින් මුලසිට අගටත් අගසිට මුලටත් කීමයි. ඒ මෙසේය.

"කෙසා ලොමා නඛා දන්තා තචො, මංසං නහාරු, අට්ඨි අට්ඨිමිඤ්ජං, වක්කං, හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං, පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො, අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං" මේ මුලසිට අගටයි.- අනුලෝම ක්‍රමයයි.

මුත්තං ලසිකා සිඞ්ඝාණිකා ඛෙළො වසා අස්සු, මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං, මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං, පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං, තචො දන්තා නඛා ලොමා කෙසා" මේ අගසිට මුලටයි - ප්‍රතිලෝම ක්‍රමයයි.

මෙසේ අනුලෝම ප්‍රතිලෝම ක්‍රමයට බොහෝ කාලයක් ඉබේ වම කියවෙන තෙක් සජ්ඣායනා - පාඨම් - කළයුතු. ඉන් පසු මුලසිට කොටස් පහ බැගින් හතරක් ද ඉතිරි කොටස හය බැගින් දෙකක්ද බෙදා ගෙන කිවයුතු. ඒ ක්‍රමය නම් මෙසේය.

පළමුවැන්න:- කෙසා ලොමා නඛා දන්තා තචො; මෙය දින පහක් (5) කිවයුතු. ඊට පසු

තචො දන්තා නඛා ලොමා කෙසා; මෙයද දින පහක් (5) කිවයුතු. ඊට පසු මේ දෙකම එකතු කොට දින පහක් කිව යුතු. මුළු කාලසීමාව දින පසලොවකි. (15) මෙසේ පුහුණු කළයුතු.

දෙවැන්න: මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං: මෙය පෙර කී පරිද්දෙන් අනුලෝම වශයෙන් දින පහක්ද ප්‍රතිලෝම වශයෙන් දින පහක් ද, ඒ දෙකම වශයෙන් දින පහක් දැයි දින පසලොවක් සජ්ඣායනා කළ යුතු.

ඊට පසු: වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසා; මෙසේ කියා නැවත කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං; යි කිවයුතු. මෙසේ දින පසළොසක් කියයුතුය.

මෙසේ පසේ කොටස් සතරද, හයේ කොටස් දෙකද යොදා ගෙන මාස හයක් සම්පූර්ණ වන සේ සජ්ඣායනා කළ යුතු බව අටුවාව කියයි. සජ්ඣායනා කරනු ලබන පාලිවාක්‍ය අත් කඩදාසියක පැහැදිලිව ලියාගෙන තබා ගන්න. මෙහිලා එය නො දුක් වෙයි.

ii මනසා: ඉක්බිති එය ම සිතින් සිතිය යුතු. කටපාඩමින් කිය වද්දී හොඳට සිහි නුවණ යෙදවූ විට පහසුවෙන් මෙනෙහි කිරීමට පුළුවන. එසේ කළයුතු.

iii වණ්ණතො: ඊට පසු ඒ ඒ කුණපයන් ගේ පාට - පැහැය - එකක් පාසා විමසිය යුතු. මේ පිළිබඳ විස්තරය ද ඉහත සඳහන් කළ පොත් වලින් ඉගෙණ ගත යුතු,

iv සණ්ඨානතො: කුණපයන් ගේ සටහන්, හැඩි, පිහිටි අයුරු විමසීම.

v දිසතො: උඩ යට යන දිසා දෙකින් කවර දිසාවෙහි දැයි විමසීම.

vi ඔකාසතො: පිහිටි තැන් විමසීම, අසවල් තැනයයි සැලකීම.

vii පරිච්ඡෙදතො: සීමා විමසීම. මේ කුණපය අසවල් අසවල් අසවල් කුණපයන්ට මැදිව ඇත. ආදීවශයෙන් ද, මේ කෙස් ලොම් නොවේ, ලොම් කෙස් නොවේ යනාදි වශයෙන් සභාග විසභාග විමසිය යුතු.

දසවිධ මනසිකාර කොශල්‍යය- මෙනෙහි කිරීමේ දසවැදෑරුම් දක්ෂකම,

i අනුපුබ්බතො: මුල පටන් අගතෙක් අත් නොහැර මෙනෙහි කිරීම්. වශයෙන්. සියල්ල පිළිවෙලින් මෙනෙහි කළයුතු.

ii නාතිසීඝතො: වඩා ඉක්මන් නැතිව මෙනෙහි කිරීම් වශයෙන්

iii නාතිසනිකතො: වඩාමත් හෙමින් නැතිව මෙනෙහි කිරීම වශයෙන්.

iv වික්ඛෙප පටිබාහනතො: සිතෙහි විසුරුණු ගතිය දුරුකිරීම් වශයෙන්. පිටතින් පැමිණෙන රූප, ශබ්දාදී නොයෙක් අරමුණු කෙරෙහි හෝ සිතෙහි පැන නගින රාගාදී

කෙලෙසුන් කෙරෙහි හෝ සිත නො යොදවා ඒ වික්ෂෙප ගතිය - විසුරුණු ගතිය - දුරුකොට මෙනෙහි කිරීම් වශයෙන්.

v පණ්ණත්ති සමතික්කමනතො: ව්‍යවහාරය ඉක්වීම් වශයෙන්, කෙස් ය, ලොම් ය, නිය ය, යනාදී එතෙක් පැවති ප්‍රඥප්තිය - පැණවීම (ව්‍යවහාරය) - ඉක්මවා, ඒ නාම ගැන නො සිතා පිළිකුල්ය යන හැඟීම තබා ගැනීම් වශයෙන්. වර්ණාදිය සැලකිය යුත්තේ පුහුණු වීමට පමණි.

vi අනුපුබ්බමුඤ්චනතො: පිළිවෙලින් අත හැරීම් වශයෙන්.

දෙතිස් කුණප මෙනෙහි කිරීම පුහුණු වූ පසු ඒ යෝගියාට කේසා'යැයි සිතත් ම මුත්තං යි යන තෙක් කිසි තැනක අමතක නොවී සිහි වෙයි. නමුත් ඒ හැම කුණපයක්ම හොඳහැටි අවබෝධ නොවේ නම් ඔහු විසින් නො වැටහෙන කොටස් අතහැරිය යුතුය. මෙසේ පිළිවෙලින් අතහැර හොඳට තේරුම් යන කොටස් පමණක් මෙනෙහි කිරීමෙන් අර්පණා ඉපදවිය හැක. (මදුරන් ලුහු බඳින වැදි උපමාවක් අටුවාවෙහි දක්වෙයි)

vii අප්පණාතො: අර්පණා-ධ්‍යාන- - වශයෙන්. අර්පණා එකක් පමණ උපදියි.

viii අධිචිත්ත සුත්තන්තතො: අධිචිත්ත සූත්‍ර වශයෙන්.

"අධිචිත්තමනුයුත්තෙන භික්ඛවෙ භික්ඛුනා තීණි නිමිත්තානි මනසිකාතබ්බානි, කාලෙන කාලං සමාධි නිමිත්තං මනසිකාතබ්බං, කාලෙන කාලං පග්ගහ නිමිත්තං මනසිකාතබ්බං, කාලෙන කාලං උපෙක්ඛා නිමිත්තං මනසිකාතබ්බං" -පෙ- අ. නි.

මහණෙනි, සිත දියුණු කිරීමෙහි යෙදුනාවූ භික්ෂු විසින් කරුණු තුනක් මෙනෙහි කළ යුතුයි. කලින් කල සිතෙහි සමාහිත බව මෙනෙහි කළ යුතුය. කලින් කල රුකුල් දියයුතු බව මෙනෙහි කළ යුතුය. කලින් කල මැදහත්බව මෙනෙහි කළ යුතුය.

මෙසේ වදාළ හැටියට පිළිකුල් භාවනාව කරන්නාහු පමණක් නොව සමථ විදර්ශනා වඩන සියලු යෝගීන් විසින් මේ කරුණු තුනට අනුව පිළිපැදිය යුතුය. හැම කල්හිම සමාධියට පත් සිතම

මෙනෙහි කරන්නට ගියහොත් කම්මැලි භාවට අසුවෙයි. රුකුල් දීම-වීර්‍යය ම මෙනෙහි කළහොත් උද්ධච්චය - විසුරුණු ගතිය-ට වැටේ. මැදහත් බවම සිතුවහොත් කාමාදි ආශ්‍රවයන් විනාශ කිරීමට පොහොසත් නොවේ. එහෙයින් කලින් කල සමාධි, පග්ගහ, උපෙක්ඛා යන කරුණු තුන මෙනෙහි කිරීමෙන් බලාපොරොත්තු සියල්ල ඉටුවේ. සියලු කෙලෙසුන් ගෙන් මිදිය හැකි.

තවද මෙය පැහැදිලි කර ගැනීමට උපකාර වන උපමාවක් මේ සූත්‍රයෙහි ඇත. රන් කරුවෙක් ආභරණයක් සෑදීමට පටන් ගෙන, ඒ රිදී කැබැල්ල විටින් විට කෝවට දමා බටය කින් පිඹියි. විටින් විට වතුර ඉසියි විටින් විට ඒ දෙකම අත්හැර මැදහත් වෙයි. ඒ රන්කරුවා නිතර ම ගිනි පිඹියේ නම් රිදී කැබෙල්ල දැවී යයි. ජලය ඉස්සොත් නිවී යයි. මැදහත් ම වුවහොත් වැඩට යෙදවීමට තරම් හරි නොයයි. එහෙයින් ඒ රන් කරුවා මුලින් කී පරිදි ක්‍රියා කොට ඒ රිදී කැබෙල්ලෙන් වටිනා ආභරණයක් සාදයි. සමාධිය වඩන්නහු විසිනුදු අනුගමනය කළ යුත්තේ මේ රන් කරුවාගේ ක්‍රමයයි. එවිට කෙලෙසුන් දමා ලෝකෝත්තර මාර්ග ඵල නමැති වටිනා ආභරණ බිහිවේ. මේ අධිචිත්ත සූත්‍රාන්ත ක්‍රමයයි.

ix සීතිභාව සුත්තන්තතො: සීතිභාව සූත්‍රාන්ත වශයෙන්

“ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනුත්තරං සීතිභාවං කාතුං” මහණෙනි, කරුණු සයකින් යුක්ත වූ භික්ෂු ඉතා උසස් සිසිල් බව-නිවණ- අවබෝධ කරගැනුමට සුදුසුය. ඒ කරුණු සය මෙසේය.

i යම් විටෙක සිතට නිග්‍රහ කළ යුතුද එවිට නිග්‍රහ කිරීම.

ii යම් විටෙක සිතට රුකුල් දියයුතු ද එවිට රුකුල් දීම.

iii යම් විටෙක සිත සතුටු කළයුතුද එවිට සතුටු කිරීම.

iv යම් විටෙක සිතට මැදහත් විය යුතුද එවිට මැදහත්වීම.

v ලෝකෝත්තර මාර්ග ඵලයනට නැමී පැවැත්ම.

vi නිවණෙහි ද ඇලුණෙක් වීම, යනුයි.

මෙහි සිතට නිග්‍රහකිරීම යනු උත්සාහය නිසා මෙනෙහි කිරීමේ වේගය අධික වූ විට පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන

බොජ්ඣඞ්ග තුන වැඩීමයි. එවිට සිත සන්සුන් වෙයි. රුකුල් දීම නම් සමාධි නිමිත්තම ඇසුරු කිරීමෙන් සිත හැකුළුනු ස්වභාවයට පත්වූ විට ධම්මවිචය, විරිය, පීති, බොජ්ඣඞ්ග තුන වැඩීමයි. සතුටු කිරීම යනු ජාති ජරා, ව්‍යාධි, මරණ, සතර අපාදුක, අතීත හා අනාගත සසරට මුල් වූ දුක, වර්තමාන ආහාර සෙවීමේ දුක යන සංවේග කරුණු අට සිහිපත් කර කරනු ලබන භාවනාව ගැන සතුට ඉපදවීමයි. මැදහත් වීම නම් සිත මැනවින් අරමුණෙහි පවතී නම් නිරුද්දිය නො කොට මැදහත් වීමයි. අසුත් හොඳට යද්දී මැදහත් වන සාරථියා මෙනි. මේ පිළිබඳ වැඩි විස්තර බොජ්ඣඞ්ග භාවනා කොටසෙහි දී දැක්වෙයි. එය ඉදිරියටය.

මෙසේ සත් වැදෑරුම් ඉගෙණීමේ දක්ෂකමත්, දසවැදෑරුම් මෙනෙහි කිරීමේ දක්ෂකමත් සම්පූර්ණ වූ කල්හි කාමච්ඡන්දාදි නීවරණ ධර්මයන් යටපත් වී ප්‍රථමධ්‍යානය උපදියි. මෙහි පරිකර්ම භාවනාව වනුයේ කට පාඩම් කිරීමේ පටන් සත් වැදෑරුම් ඉගෙණීමේ දක්ෂකම දක්වාය සත් වැදෑරුම් ඉගෙණීමේ දක්ෂකම වැටහීම, මෙහිලා උග්ගහනිමිත්ත යි. පටිභාග නිමිත්ත නම් හැම අශුචින් ම පිළිකුල වැටහීමයි.

කායගතාසතිය නම් වූ ද්වත්තිංසාකාර භාවනාවෙන් ප්‍රථම ධ්‍යානය ලැබූ පසු එහි පවතින ධ්‍යාන සිත හා චෛතසික ද, රූප ධර්ම ද, විදර්ශනා කිරීමෙන් මාර්ගඵල ඉපදවිය හැක. නැතහොත් ධාතුකර්මස්ථානයට උපකාර කරගත හැකිය.

**ද්වත්තිංසාකාර භාවනාව නිමි.**

## 5. ධාතු මනසිකාරය.

ධාතු යනු ස්වභාවයයි. සිරුරෙහි ස්වභාව ධර්ම සතරක් පවතී. එනම් තදගතිය, බැඳෙන ගතිය, පැසෙන ගතිය, සෙලවෙන ගතිය, යනුයි. මේ සතර පඨවි, ආපො, තෙජො, වායො, යන නාමයන්ගෙන් ධර්මයෙහි එයි. තම සිරුරෙහි පවත්නා මේ පඨවි ආදී ධාතු සතර මෙනෙහි කිරීම ධාතුමනසිකාරයයි ධාතු කම්මට්ඨාන යනුදු නමකි. මෙහි භාවනා ක්‍රමය මෙසේය.

“පුනචපරං භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං යථා ඨිතං යථා පණිහිතං ධාතුසො පච්චවෙක්ඛති, අත්ථි ඉමස්මිං කායෙ පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායො ධාතු”ති-ම. ස. සූ

මහණෙනි. නැවත ද භික්ෂු මේ සිරුර ම සිටි අයුරින් පිහිටි අයුරින් ධාතු වශයෙන් සලකා බලයි. "මේ සිරුරෙහි පඨවිධාතු ආපො ධාතු තෙජො ධාතු වායො ධාතු ඇත" කියා යි.

නුවණ දියුණු යෝගියාට මෙසේ කෙටියෙන් දෙසූ ධාතු මනසිකාරය ප්‍රමාණවත් ය. මක්නිසාද? හේ ධර්මය පිළිබඳ හැඟීමක් ඇති හෙයිනි. ඒ ධර්මය යනු පරමාර්ථ වශයෙන් දෙසූ අභිධර්මයයි. මේ ධාතු සතර පරමාර්ථ ධර්මයන් අතුරෙන් රූප පරමාර්ථයට අයත්ය. මෙසේ දැනුමක් ඇතිය හු විසින් තම සිරුරෙහි පවතින ඒ සවභාවයන් ගැන පළමු කොට සිත තැබිය යුතුය. "මගේ ශරීරයේ පඨවි ධාතු - තද ගතිය - ඇත. ආපො ධාතු- කැටිගසන ගතිය-ඇත. තෙජො ධාතු - පැසවන ගතිය - ඇත. වායො ධාතු - සෙලවෙන, පිම්බෙන ගතිය,-ඇත." කියා යි. එවිට ඔහුට පෙනෙනුයේ "මම" නොවේ ධාතු සතරෙකි. යනු වෙති. උපමාවකි: ගවයන් මරණ තැනැත්තෙක් ගවදෙනක මරා, ගොඩ වල් සතර කට මස් බෙදා සතර මං සන්ධියක තබා, ඒ මැද සිට බලයි. එවිට ගවදෙනක නොපෙනෙයි. මස් ගොඩවල් සතරක් පමණක් පෙනේ. මේත් එමෙනි.

"සෙය්‍යථාපි භික්ඛවෙ ගොඝාතකො වා ගොඝාතක න්තෙවාසී වා ගාවිං වධිත්වා චාතුම්මහාපථෙ බිලසො පටිවි භජිත්වා නිසින්නො අස්ස" - ම. ස. සු. යනු දේශනා පාඨයි.

මෙපරිද්දෙන් සිත තබා, මෙනෙහි කිරීමෙන් සිත තැන්පත්වූ පසු, ඒ ධාතු සතර ආශ්‍රයේ පවතින, ඒවායින් ම සකස්වුනු (උපාදින්නකරූප)- ඇස, කණ ආදී රූප කොටස් අටළොසක් මෙනෙහි කළ යුතුය. (සම්මසන රූප අටළොසකි) ඉක්බිති ඒ මෙනෙහි කිරීමේ සිත හෝ හෘදය රූපය හෝ සලකා බලා නාම ධර්මයන් විමසිය යුතුය. මෙසේ නාම රූප ධර්මයන් සොයා, ඒවා ඇතිවීමට හේතු ද සොයා ක්‍රමානුකූලව උදයබ්බයඤාණාදී ඤාණානුසාරයෙන් මාර්ග ඵල අවබෝධ කටයුතු.

මන්දප්‍රාඥ- නුවණ නොදියුණු- යෝගාවචරයා විසින් කළ යුත්තේ පළමු කොට, පෙර සඳහන් පරිදි ද්වත්තිංසාකාරය ප්‍රගුණ කිරීමය. ඊට පසු ඒ කොටස් තිස් දෙක ධාතු වශයෙන් බෙදා බැලිය යුතුය. මෙහි ඇත්තේ ධාතු කොටස් දෙකකි. ඉතිරි කොටස් දෙක, දෙතිස් කුණප ඇසුරේ ම පවතියි. ඒවා ද විමසිය යුතු ඒ ධාතු කොටස් මෙසේය.

i පඨවි ධාතුවට අයත් කොටස් විස්සකි.

කෙසා, ලොමා, නඛා, දන්තා, තචො, මංසං, නහාරු, අට්ඨි, අට්ඨිමිඤ්ජා වක්කං, හදයං, යකනං, කිලෝමකං, පිහකං, පප්ඵාසං, අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, මත්ථලුංගං, මේවාහි පඨවි ධාතුව අධික ලෙස පවතියි

ii ආපොධාතුවට අයත් කොටස් දොළොසකි.

පිත්තං, සෙම්හං, පුබ්බො, ලොහිතං, සෙදො, මෙදො, අස්සු, වසා, ඛෙලො, සිංඝාණිකා, ලසිකා, මුත්තං, මේවාහි ආපොධාතුව අධික ලෙස පවතියි.

iii තෙජෝ ධාතුව සිව් අයුරකින් පවතී.

1. යෙන ච සන්තප්පති: යම් ගින්නකින් තැවෙයිද, (එය)

2. යෙන ච ජීරියති: යම් තෙජෝ ධාතුවකින් දිරයිද, (එය)

3 යෙන ච පරිඩය්හති: යම් තෙජෝ ධාතුවකින් හාත් පසින්ම දවයිද (එය)

4. යෙනච අසිත පීත ඛායිත සායිතං සම්මාපරිනාමං ගච්ඡති.

යම් තෙජෝ ධාතුවකින් වැළඳූ, පිවූ, කෑ, රසබැලූ දෑ, මනාලෙස පැසවීමට යයිද (එය) යනුයි.

මෙසේ එනුයේ තෙජෝ ධාතුවෙහි පවත්නා කෘත්‍යයන් වූ සන්තාපන, ජීරාපන, පරිඩයහන, පරිපාචන, යන සතර බව දතයුතු.

iv වායෝධාතුව සයාකාරයකින් පවතී.

1. උද්ධංගමා වාතා: උඩට නැගෙන වාතය, ඇනුම් යෑම්, වමනය, හික්කාව ආදිය කෙරෙනුයේ මෙයිනි.

2. අධොගමා වාතා: යටට බස්නා වාතය, මල-මූ, කෙළ, සෙම්, සොටු, ආදිය පිටකිරීම මෙයින් සිදුවෙයි.

3. කුච්ඡිසයාවාතා: කුසෙහි බඩවැලින් පිටත පවත්නා වාතය.

4. කොට්ඨාසයා වාතා: බඩවැල් ඇතුළේ පවත්නා වාතය.

5. අඞ්ගමඞ්ගානුසාරිනො වාතා: සතර දිගේ ලේ ගමන් කරන, සිතේ නිවේදනය අනුව කෙරෙන අත්පා ආදී අවයව සෙලවීමට උපකාරී වන වාතයයි.

6. අස්සාසො පස්සාසො: හුස්ම ඉහල පහල යන්නා වාතය.

මෙසේ ධාතු සතර පිළිබඳ සාමාන්‍ය දැනීමක් ඇතිවූ පසු, දෙතිස් කුණප මෙනෙහි කිරීමේදී කියූ කොටස් "මේ පඨවි ධාතුය මේ ආපො ධාතුය," යනාදි වශයෙන් ඒ හැම කොටසක් කෙරෙහි ම ධාතුය යන හැඟීම තබා ගතයුතුය. "පිළිකුල"ය වශයෙන් සිත තබාගත්තේ ද්වත්තිංසාකාරයේදීය. එය මෙහිදී අත්හැර ධාතුය යන හැඟීම ඇතිකරගත යුතුය. සෙසු ධාතු දෙක පවතින, වැඩ කරන, අයුරු විමසමින් සිත පිහිටුවිය යුතු.

එසේ සිත පිහිටු වූ පසුත් ධාතු පිළිබඳ වැටහීමක් නො මැති නම් ඒවායේ ලක්‍ෂණ, රස, මෙනෙහි කරමින් නැවත නැවත පුහුණු කර, එසේත් නොවැටහෙහි නම් කුණප එකක් පාසා සතර ධාතු පවතීයයි ද, සෙසු කොටස් දහයෙහිද ඒ සතර ම ඇතැයිද සිතිය යුතු. එවිට ක්‍රම එක්සිය හැට අටකට (168) අනුව බැලුවේ වෙයි. තවත් නො වැටහුනේ නම් විශුද්ධිමාර්ගයේ සමාධි නිර්දේශය බලා තේරුම් ගත යුතුය.

ඇතැම් යෝගියෙකුට මෙපමණ උත්සාහයක් අවශ්‍ය වනුයේ සසරදී භාවනා නො කළ නිසා ඊට උවමනා නුවණ නො මැති හෙයිනි. ධාතු සතර වැටහුණු පසු ඒ සමගම උපචාර සමාධිය මත පිහිටා (මෙයින් අර්පණා-ධ්‍යාන නූපදී) සෙසු රූපධර්ම විමසා, ඉක්බිති නාම ධර්මයන් ද සොයා ගෙන විදර්ශනා වැඩීමෙන් මාර්ග ඵල ඉපිදවිය හැක.

**ධාතු මනසිකාරය නිමි.**

## 6-14, නවසිවථික භාවනා

සිවථික යනු මළ සිරුරට නමකි. මළ සිරුරු නවයක් අර මුණු කොට වැඩිය යුතු භාවනා ක්‍රම මෙසේ කියැවේ. "පුනචපරං භික්ඛවෙ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං එකාහමතං වා ද්වීහමතං වා තීහමතං වා උද්ධුමාතකං

විනීලකං විපුබ්බකජාතං, සො ඉමමෙව කායං උපසංහරති අයම්පි ඛො කායො එවං ධම්මො එවං භාවී එතං අනතීතො'ති" - ම. ස. සූ. මහණෙනි, නැවත ද භික්ෂු දින එකක්හෝ දෙකක් හෝ තුනක් හෝ ඉක්ම් ඉදිමුණු නිල් පාට වූ, සැරව මැගිරෙන, සොහොනෙහි දමනලද මළ සිරුර දක්නේය. ඉන් "මේ සිරුරත් මෙසේ සවභාව ඇත්තේය. මෙසේ වන්නේය. මෙය නො ඉක්මවූයේය'යි මේ ශරීරයම (තමාගේ සිරුරම) එළවා -සමානකර- බලයි.

මෙම ක්‍රමයෙන් දෙසූ මළ සිරුරු නවයක් පිළිබඳ දෙශනාවක් ඇත. මෙහිලා නම් පමණක් සඳහන් කරමි. දියුණු සමාජයක් උදා වූ මේ කාලයේ මළ සිරුරු සොහොනෙහි ඔබිනොබ නො දමන හෙයින් එබඳු භාවනාවක් කිරීමට අවසථාව නො සැලසේ එහෙයිනි.

(1) මැරී දිනක් හෝ දෙකක් හෝ තුනක් හෝ ඉක්මී ඉදුමුණු නිල්පාට වූ සැරව ගලන මළ සිරුර, පළමුවැනි සීවථිකයයි.

(2) බලු, කපුටු, නරි, ආදී සතුන් විසින් කනුලබන මළ සිරුර.

(3) මස් ලේ සහිත නහර වලින් සම්බන්ධවූ ඇටසැකිල්ලක් බවට පත් මළ සිරුර.

(4) මස් නැති ලේ වලින් තැවරුණු නහරින් සම්බන්ධවූ ඇට සැකිල්ල බවට පත් මළ සිරුර.

(5) මස් ලේ නැති නහරින් සම්බන්ධ ඇටසැකිල්ල වූ මළ සිරුර.

(6) ඇට කැබලි ඔබිනොබ විසිරුණු ඇටසැකිල්ල වූ මළ සිරුර.

(7) හක් ගෙඩියක් සේ සුදු වූ ඇට සැකිල්ල වූ මළ සිරුර.

(8) අවුරුදු ගණනක් ඉක්මීම නිසා ඇට කැබලි පොදි ගැසුණු මළ සිරුර.

(9) කුඩා කුඩා කැබලිවලට පත්, එවාද කුණු වී සුණු බවට පැමිණි මළ සිරුර. යනුයි. මේ භාවනාද දියුණු කර ගැනීමෙන් මාගී ඵල ඉපදවිය හැක.

# 15. ආහාරෙ පටික්කූලසඤ්ඤා භාවනාව.

ජීවිතයට අවශ්‍ය ආහාර සතරක් පරිච්ඡෙදය ධර්ම විස්තර කළ කාණ්ඩයේ දක්වා ඇත. මෙහිදී දක්වනුයේ 'කබලීකාර ආහාර' නම් වූ ඕජාව උපදවන ආහාරය පිළිබඳව ය. ඛජ්ජ, භොජ්ජ, ලෙය්‍ය, පෙය්‍ය, යනුවෙන් ඕජා උපදවන ආහාරය සිවු වැදෑරුම් ය. කඩා කෑ යුතු ආහාර "ඛජ්ජ" නම්. බත්, මුං, ආදී වැළඳිය යුතු ආහාර "භොජ්ජ" නම්. මී පැණි, සකුරු ආදී ලෙවිය යුතු ආහාර "ලෙය්‍ය" යි. කිරි, සුප්, ආදී බිය යුතු ආහාර 'පෙය්‍ය' යි. මේ සිවු වැදෑරුම් ආහාරය ගැන "පිළිකුල්ය" යන හැඟීම දෘඪ වීම "ආහාරෙ පටික්කූලසඤ්ඤා" නම්.

මෙය භාවනා කරනු කැමති යෝගියා විසින් තමා වෙසෙන ආරාමයේ සිට බැහැර ගොස් අහර සොයා, වැළඳූ පසු, ඒවා දිරවා ගොස් මල මූ බවට පත්වීමෙන් පසුද සිදුකරනු ලබනු ඒවා බැහැර කරන තැන් සේදීම තෙක් පිළිවෙලින් මෙනෙහි කළයුතු. එහෙයින් ඒ පිළිබඳ විධානය කරන අයුරු මෙහිලා විස්තර කරමි.

## පිළිකුල මෙනෙහි කරන දස ආකාරය:-

(1) ගෑම් - ඊම් වශයෙන්: කල්ප ගණනකිනුදු සොයා ගැනීමට අපහසු මේ බුද්ධශාසනයෙහි පැවිදි වූ මා විසින් අළුයම අවදිව සිරුර කිස ආදිය සපයා, ඇත් බෝ වෙත එළඹ, වත් සපයා ශ්‍රද්ධාදී ගුණධර්ම හැකිතාක් සිහිකොට, තමාට පුරුදු භාවනාවක් කළයුතු. මෙසේ පැය කීපයක් යැවූ පසු කුසට වදිනා අහරකින්න නිසා එබඳු සැනසීමක් ඇති විවේක සුවය ද අතහැර, එසේ ම සුදු පැහැයෙන් බැබලෙන සෑය ද සිලි සිලි යන අනුකරණයෙන් කන සිත දෙකම සනසන බෝධීන් වහන්සේ ද, ජීවමාන බුදුපියාණන් වහන්සේ වැඩ සිටින්නාක් වැනි වූ විහාර මන්දිරය ද, බල බලා, 'අහෝ! මම ආහාරයක් නිසා මෙබඳු මනහර දෙසින් නික්ම යෙමි' යි සංවේග උපදවා ගෙන, මිණිකුණු සොයා යන හිවලෙකු මෙන් අහර සොයා ගෙන ගමට යා යුතු යයි සිහිකළ යුතු. තවද පියෙකු බඳු ඇදුරු - උවැදුරු හිමියන් ද සොහොයුරන් බඳු සෙසු භික්ෂූන් ද ගැන නො බලා, පැන් පොකුණු, සක්මන් මළු, ආදී සෙනසුන් සුවය ද අතහැර මිනී හිස් කබලක් වැනි පාත්‍රයක් ගෙන ඇට සැකිල්ලක් වස්ත්‍රයකින් වෙලන්නාක් මෙන් සිවුරු පොරවා, ගම් පිවිසිය යුතු සෙනසුනෙන් බැහැරගිය තැන් පටන් බලුබෙටි, අසුචි, සෙම්, සොටු, ආදී දුගඳ හමන දෑ

මඩිමින්, මඩ ගොහොරු, කැලිකසල, බලුකුණු, බලල් කුණු ආදී නොයෙක් අපිරිසුදු දෑ බලමින්, සමහරවිට හිස් මොල පිටත යන තරම් කුණුගඳ වදිමින් යා යුතු. ආපසු අරමට එද්දීත් මේ අයුරින් සිතා ,ඒ සියල්ල 'මේ ආහාරය නිසා නේද'යි ආහාරය කෙරෙහි ම පිළිකුල් බව තැබිය යුතුය. මේ ගමනා ගමන වශයෙන් පිළිකුල මෙනෙහි කිරීමයි.

2. ගෙයක් පාසා සෙවීම වශයෙන්:

ගමට පිවිසි මා ඉතා දුප්පත් සැඩොල් - රොඩී දරුවෙකු සේ හිස් පාත්‍රයක් රැගෙන හැම ගෙයක් පාසා ම යායුතු වෙයි. එසේ යන කල්හි ඇතැම් ගෙවල දරුවන් පැහැරූ අසූචි, කැසි; සොටු' වමනය ආදිය තම දෙපයින් මැඩිය යුතු. එසේම කුණුවූ අල, ඇනු ආදිය ද, ගොම්, එළුබෙටි, කුකුල්බෙටි, ඌරුබෙටි ආදී නොයෙක් දෑ ද පෑගිය යුතු. ගෙවල වෙසෙන කුඩා දරුවන් ගේ නැහැයෙන් වැගිරෙන සොටු, කබ, කඳුළු ආදිය දැකිය යුතු. ඇතැම් විට දින ගණනක් පල්වූ කුණු මලවල් ද දක්නට සිදුවේ. මෙසේ ගිය කල්හි ද ඇතැම් මිනිසුන් විසින් කියනු ලබන නරක වචන, නපුරු වචන ඉවසිය යුතු. සමහර විට ඉදල් කොනු පාර ද වදින්ට පුළුවන. ඒ හැම ඉවසිය යුතු. මෙසේ නොයෙක් අයුරින් සිතා ඒ සියල්ල සිදුවූයේ "මේ ආහාරය නිසාය" යි ආහාරය කෙරෙහි ම පිළිකුල ඉපදවිය යුතුය.

3. පරිභෝග කිරීම් වශයෙන්:

ආහාරය සොයාගත් පසු පහසු තැනක හිඳ වැළඳීමේ දී සිහිය යොදමා කල්පනා කරමින් මෙසේ සිතිය යුතු. "දැන් මේ ආහාරය, මගේ අත දිගේ රූරා වැටෙන ඩහදියෙන් ද නිය අස්සේ තුබූ කුණුවලින්ද, වටපිටාවෙන් හමන දූවිලි සහිත වාතයෙන් ද, ඇතැම් විට නිලමැස්සන්, කුඩාමැස්සන් අවුත් ඒ මත වැටීමෙන් ද, එසේම වටපිටින් ආහාරය දිහාවම බලා සිටින බලු - කපුටු සතුන් ගේ කෙළ හැලීම නිසා ඔවුන් ගේ අධික ආසාවෙන් ද, යන නොයෙක් දෑ මේ ආහාරය ට සම්බන්ධවීමෙන් පිළිකුල් බවට පත්විය. දහඩිය සහිත අතින් වෙන වෙනම තුබූ ආහාර කොටස් එකට ඇනූපසු ආහාර සුවඳ දුනුනත් දැකීමෙන් පිළිකුල්ය. ඉක්බිති මුඛයට තබන් ම දත් දිගේ රූරා හැලෙන කෙළවලින් ද දත්මලයෙන් ද, නාසයෙන් මුඛයට වැටෙන නාලය දිගේ ආ සොටුවලින් ද, කලවම් වී බලුවමනයක් බඳු බවට පත්වෙයි. එසේවූ ආහාරය ඇසට නොපෙනෙන හෙයින් ගිලදමයි." මේ අයුරින් පරිභෝග කිරීම් වශයෙන් පිළිකුල්ය යන හැඟීම ඇතිකර ගත යුතුය.

### 4 පිත් සෙම් ආදිය ආශ්‍රය කිරීම් වශයෙන්:

බුදු, පසේබුදු, සක්විති ආදී උතුමන්ගේ ගලනාලය අවට ඇත්තේ පිත්, සෙම්, සැරව, ලේ යන පල්වෙන සතර දෙයින්, එකකි. සෙසු සැම දෙනාටම මේ සතර ගලනාලය අවට ඇත්තේය. එහෙයින් මුඛයේ සිට ආහාර යන්නේ මේ පිත් සෙම්, සැරව, ලේ තැවරී තැවරීය. එවිට එය පරම පිළිකුල් බවට පත්වූ බව මෙනෙහි කළ යුතුය. මේය ආශ්‍රය කිරීම් වශයෙන් මෙනෙහි කිරීම.

### 5. තැන්පත් වන තැන වශයෙන්:

ආහාරය හොස් තැන්පත් වන්නේ රන්, රිදී ආදී වටිනා බඳුනෙක නොවේ. අවුරුදු හැටක් වයස් කෙනෙකුගේ ආහාරය වැටෙනුයේ අවුරුදු හැටකින් ම පිරිසිදු නො කළ, අවුරුදු හැටක් ම පල්වෙමින් තුබූ වැසිකිළි වලක් බඳු අමාශයටය. එහිදු පෙර කී සෙම්, සැරව ආදී සතර දෑ එකතු වී මේ ආහාරය කෑඳ බිරෑ වෙන බහාලූ දින ගණනාවක් ම පල්වූ බලුවමනෑක් බවට පත් වෙයි. ඒ සමග ම ආහාර දිරවන තෙජො ධාතුමත්, එකතු වී හිරු රැසින් කැකෑරෙන අසුචි වලක් සේ බුබුළු දමමින් කරකැවෙයි. මේ තැන්පත් වන තැන හැටියට සිහිකිරීමයි.

### 6. නොපැසීම් වශයෙන්:

ආහාරය දිරවන තෙජොධාතුව – ජඨරාග්නිය – අඩු අයට කෑ ආහාර අමාශයේ පල්වෙමින් පවතී. එසේ තුබූ කල්හි ගැරඬි කුණු, හයිකුණු, මීයන් ආදී මැරි කුණු වූ ගවරවලක් බවට පත් වෙයි. මෙසේ නො පැසීම් වශයෙන් සිහිකළ යුතු.

### 7. පැසීම් වශයෙන්:

ආහාරය පැසුණු කල්හි එයින් රන්, රිදී ආදී වටිනා දෑයක් නම් නො නිපදවේ. හුදෙක් නිපදෙනුයේ අසුචි, මූත්‍ර, සැරව, ලේ, ඛහදිය ආදී ඉතා අපිරිසුදු දෑ ය. මෙසේ පැසීම් වශයෙන් පිළිකුලෑ සිතිය යුතු.

### 8. ප්‍රයෝජන වශයෙන්:

ආහාර හොඳට පැසවුවහොත් සෑදෙනුයේ මල මූ ආදිය යි නො පැසවූවහොත් දද, කුෂ්ට, පාණ්ඩු ආදී රෝගයි. මේය ප්‍රයෝජන. මෙයිනුත් පිළිකුල සිතිය යුතු .

**9. අප්‍රධාන ප්‍රයෝජන වශයෙන්:**

ආහාරය ගන්නා කල නම් බොහෝ සතුටින් ගනියි. එහෙත් එයින් හටගත් මල-මූ - පහකරද්දී නැහැය වසාගෙන ම පිට කරයි. එසේ ම නොයෙක් රසවත් ආහාර ප්‍රීතියෙන් ඉල්පි ඉල්පී සමූහ සමූහව අනුභව කරත්. එහෙත් ඒවායින් හටගත් මල-මූ පිට කරද්දී දොරවල් වසාගෙන, කාටත් නොහැඟෙන සේ වස්ත්‍ර ද ලිහා ඉතා රහසිගතව, නැහැය මූඛය තදින් වසාගෙන පිට කරත්.

"අන්නං පානං ඛාදනීයං - භෝජනඤ්ච මහාරහං
එකද්වාරේන පවිසිත්වා - නවද්වාරේහි සන්දති

අන්නං පානං ඛාදනීයං - භෝජනඤ්ච මහාරහං
භුඤ්ජති සපරිවාරෝ - නික්ඛාමෙන්තෝ නිලීයති

අන්නං පානං ඛාදනීයං - භෝජනඤ්ච මහාරහං
භුඤ්ජති අභිනන්දන්තෝ - නික්ඛාමෙන්තෝ ජිගුච්ඡති

අන්නං පානං ඛාදනීයං - භෝජනඤ්ච මහාරහං
එකරත්තිපරිවාසො - සබබං භවති පූතිකං" - වි. ම. 264

ඉතා උසස්යැයි හැඟෙන ආහාර, පාන, කැවිලි, භෝජන එක දොරකින් පිවිස දොර නවයකින් ගලයි. (මලමග, මූමග, ඇස් දෙක, කන් දෙක, නාස්පුඩු දෙක, මුඛය මේ නවදොරයි) ii ආහාරාදී බොජුන් පිරිවර සහිත (නෑදෑ හිතමිත්‍රාදීන් සමඟ) වළඳයි. පිටකරනුයේ හැංගෙයි. iii ආහාරාදිය සතුටින් වළඳයි. පිටකරද්දී පිළිකුල් කරයි. iv ආහාරාදිය එක් රැයක් තුබූ කල්හි සියල්ල කුණු බවට පත්වේ.

10. ගැල්වීම් වශයෙන්; ආහාරයට පළමුකොට අත යවත්ම අතෙහි ඉඳුල් ගෑවෙයි. පසුව එය සේදීමට බොහෝවේලාව ද ගත වෙයි. ඉක්බිති මුඛයට ගනුත්ම දත්, දිව, තොල්, උගුර, ගල නාලය, ආමාශය, බඩවැල්, අධෝමාගීය යන මේ තන්හි ද, ශිර මාගීයෙන්හොස් ලොම් සිදුරු, නැහැය, ඇස, කණ, මුඛය යන මේ තන්හි ද ඒ ආහාරය දුර්ගන්ධ බවට පත් ව ගෑවෙයි. එසේ ම ලේ සැරව, වුරුණු තෙල් ආදියට පත්වීමෙන් සිරුර සෑම තැනකම ගැල්වේ. එ හැම තැනකම ගැල්වුනු පසු ඒ තැන් පිරිසිදු කිරීමට ගංගා ජලය ද ප්‍රමාණවත් නො වේ. පැයක් නමුදු නොසෑද

සිටියහොත් මිනීකුණක් මෙන් දුගීඳය. මෙසේ ශරීරයේ පැතිරී ගැවීම් වශයෙන් ආහාරය "පිළිකුල්ය" යන හැඟීම් ඉපිද විය යුතු.

ආහාරයෙහි පටික්කූල සඤ්ඤාව දියුණු වූ පසු නීවරණ ධර්ම යන් යටපත්ව "පිළිකුල්ය" යන එක් අරමුණෙහි පිහිටීමෙන් සිත උපචාර සමාධියට පත්වෙයි. ඒ මත පිහිටා, සෙසු ඵස්සාහාරාදිය විමසා බලා රූපධර්ම හා නාමධර්ම සොයා ගෙන විදසුන් වැඩීමෙන් මාර්ගඵල ඉපදවිය හැකිය.

මෙතෙකින් භාවේතබ්බ නිර්දේශයෙහි "කායගතාසති" යන්න විස්තර කළ, පසළොස් වැදෑරුම් කායගතාසති භාවනා කොටස නිමි.

## 5 වැනි පරිච්ඡේදය

### 44. "ඡ අනුස්සතිට්ඨානානි"

"ඡ අනුස්සතිට්ඨානානීති පුනප්පුනං උප්පජ්ජනතො සතියො එව අනුස්සතියො, පවත්තිතබ්බට්ඨානස්මිං යෙව පවත්තත්තා සද්ධාපබ්බජිතස්ස කුලපුත්තස්ස අනුරූපා සතියොතිපි අනුස්සතියො, අනුස්සතියොඑව පීති ආදීනං ඨානත්තා අනුස්සතිට්ඨානානි කතමානි ඡ? බුද්ධානුස්සති ධම්මානුස්සති සඞ්ඝානුස්සති සීලානුස්සති චාගානුස්සති දෙවතානුස්සති" - ප. ම. අ. 89 පිටුව.

ඡ අනුස්සතිට්ඨානානි යනු නැවත නැවත උපදින බැවින් සිහිය ම අනුස්සති නම්. (හයක් නිසා පාලි වචනය බහු වචනයෙන් යෙදිණ) කුලපුත්‍රයාට සුදුසුවූ සිහියද අනුස්සති නම්. අනුස්සතීහු ම ප්‍රීති ආදියට කරුණු වූ බැවින් "අනුස්සතිට්ඨාන" නම්. කවර නම් හයක්ද? බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සඞ්ඝානුස්සතිය, සීලානුස්සතිය, චාගානුස්සතිය, දෙවතානුස්සතිය, යනුයි.

පටිසම්භිදා මග්ගයෙහි ශ්‍රුතමය ඥානයට ඇතුලත් භාවෙතබ්බ - වැඩිය යුතු - ධර්ම අතර එකකාදී දශයේ ආ හය වැන්න වූ අනුස්සතිට්ඨානයන් හයදෙනා මෙහිලා විස්තර කර තැබීම, ශ්‍රද්ධා, ඥාන, දියුණු කර ගැනීමට අධික කැමැත්තක් ඇතියනට මහත් රුකුලක් වීමට පුළුවන.

### 1 බුද්ධානුස්සතිය

"බුද්ධං ආරබ්භ උප්පන්නානුස්සති බුද්ධානුස්සති, බුද්ධගුණාරම්මණාය සතියා එතං අධිවචනං" - වි. ම. 147 පිටුව.

බුදුරජාණන් වහන්සේ ඇරබ උපන් අනුස්සතිය - අනුව සිහිකිරීම - බුද්ධානුස්සති නම්. බුදුගුණ අරමුණ නිසා ඇති වූ සිහියට නමකි.

ශාන්ති නායක බුදුරජාණන් වහන්සේගේ ගුණ සමුදාය නොකඩවා සිහි කිරීම බුද්ධානුස්සති භාවනාවයි. මෙය වැඩීමට

කැමති සැදැහැවත් ගිහි පැවිදි පින්වත්හු පළමුකොට බුදුරජාණන් වහන්සේ ගේ අසහාය රූප ශරීරය, වාග් විලාසය - දේශනාවේ පිළිවෙල - ඥාණ විලාසය, යන මේවා සිහිකර අධික ශ්‍රද්ධාව උපදවා ගතයුතුය, එහෙයින් මෙහිලා ප්‍රථමයෙන් දක්වනුයේ ඒ පිළිබඳ කෙටි හැඳින්වීමකි.

රූප විලාශය: බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී ශරීරය සුළු ලකුණු - අනුව්‍යඤ්ජන අසූවකින් පිරිවැරූ මහපුරිස් ලකුණු- මහා පුරුෂ ලක්‍ෂණ - දෙතිසකින් සමන්විතය. යුක්තය. "අසීත්‍යානුබ්‍යඤ්ජණ පතිමණ්ඩිත ද්වාතිංසාකාර මහා පුරිස ලක්ඛණ විචිත්තරූපකායො'යි සඳහන් වනුයේ එහෙයිනි. ඒ මහා පුරුෂ ලක්‍ෂණ හා අනුව්‍යඤ්ජන ගැන මෙහිලා විස්තර කිරීමට අවකාශ මද හෙයින් කැමතියහු විසින් දීඝනිකායේ ලක්ඛණ සූත්‍රය, ධර්මප්‍රදීපිකාවේ 3 වැනි පිටුව බැලිය යුතු.

වාක් විලාසය; "අට්ඨඞ්ග සමන්නාගතො ඛො පන තස්ස භගවතො මුඛතො ඝොසො නිච්ඡරති විස්සට්ඨොච විඤ්ඤෙය්‍යොච මඤ්ජුච සවනීයොච බින්දුච අවිසාරීච ගම්භීරොච නින්නාදීච යථා පරිසං ඛො පන සො භගවා සරෙන විඤ්ඤාපෙති න චස්ස බහිද්ධා පරිසාය ඝොසො නිච්ඡරති බ්‍රහ්මස්සරො ඛො පන සො භගවා කරවීකභාණී" - නිද්දෙසපාඨ (ධර්මප්‍රදීපිකා 19 පිටුව)

භාග්‍යවතුන් වහන්සේ ගේ මුඛයෙන් විස්සට්ඨ, විඤ්ඤෙය්‍ය, මඤ්ජු, සවනීය, බින්දු, අවිසාරි, ගම්භීර, නින්නාදී, යන අඞ්ග අට කින් යුක්තවූ ඝෝෂයක් පිටවෙයි. ඒ භාග්‍යවතුන් වහන්සේ යම් පිරිසක් කෙරෙහි ස්වරයෙන් විඥාපනය - දැනුම්දීම - කෙරෙයිද ඒ ඝෝෂාව පිරිසෙන් පිට නො පැතිරෙයි. ඒ භාග්‍යවතුන් වහන් සේ බ්‍රහ්මස්වරයහ. ඉතා උසස් නාදයක් ඇත්තෙක. කරවීක භාණියහ. නාදය මිහිරියහ.

බුදුරජාණන් වහන්සේ ගේ වාග් විලාශය මේ පාඨයෙන් පැහැදිලිවේ උන්වහන්සේ කොතරම් පිරිසකට ධර්මදේශනා කළත් ඒ සැමට ළඟ ඉඳගෙන අසන්නාක්මෙන් වැටහේ. එසේ ම ඒ පිරිසෙන් පිට අගලකුදු ඈතට ශබ්දය නොයයි. හැම දෙනාටම තම තමන්ගේ භාෂාවෙන් දේශනා කරන්නා සේ වැටහේ. මෙබඳු අද්භූත ගතියක් ඇතිවනුයේ ඒ ස්වරය අඞ්ග අටකින් සමන්විත හෙයිනි. ඒ අට නම්:-

i විස්සට්ඨ: සෙම් ආදියක් පටලැවෙන්නේ නැතිව මනාසේ ශබ්දය පිටවීම.

ii විඤ්ඤෙය්‍ය: ඒ පිටකරන ශබ්දය ඇසෙන සියලුම දෙනාට තේරුම්ගත හැකිය.

iii මඤ්ජු: කණට මී පැණි වත්කරන්නාසේ මිහිරිය.

iv සවණීය: ඒ දේශනා කරන සියල්ල ඇසිය යුතුයි. ඉවත දැමීමට කිසිවක් නොමැති බවයි.

v බින්දු: දුම් පිරුණු මුඛයකින් දුම්ගුලි යවන්නාසේ ඒ ශබ්ද කරන අකුරු වටකුරුව - අඩුවක් නො මැතිව පිටවීම.

vi අවිසාරී: අසන පිරිසෙන් එහා නොයන බැවින් නො පැතිරෙයි.

vii ගම්භීර: ශබ්දය ඉතාමත් ගැඹුරුය.

viii නින්නාදී: ශබ්දය නිකුත්වන විට ඇතිවන අෝංකාරය ඇති බවයි.

"විස්සට්ඨමඤ්ජු විඤ්ඤෙය්‍යා - සවණීයා විසාරිනො
බින්දුගම්භීර නින්නාදී - ඓවමට්ඨඞ්ගිකො සරො" පා. නි.

තවද සතර තැනකට ජාමිණ, බුදුරජාණන්වහන්සේගේ ශබ්දය මහත් වෙයි. කවර සතර තැනක්ද යත්; විනය නීති පැණවීම, ඒ ධර්ම කොටස් බෙදීම, හේතු ප්‍රත්‍යය දේශනා කිරීම, මිථ්‍යා දෘෂ්ටි බෙද දක්වීම, යනුයි. බුදුරජාණන් වහන්සේ යම් විධියකින් ජරා දුර්වල වූණී නම් ශ්‍රාවකයන් සතර දෙනෙකු ඇදක් මත තබා උපස්ථාන කළත් ඉතා දුර්වල බැව් ඇති විටෙක නමුත්] උන්වහන්සේගේ දේශනා විලාශයෙහි නම් කිසිදු අඩුවක් නොවෙයි. ඥානයෙහි දුර්වල බවක් ද නො පෙනෙයි. "මඤ්චකෙනාපි චෙපි මං සාරිපුත්ත පරිහරිස්සථ, නෙවත්ථි තථාගතස්ස පඤ්ඤාවෙය්‍යත්තියස්ස අඤ්ඤථත්තං" ශාරිපුත්‍රය, ඇඳකින් මාව පරිහරණය කළත් තථාගතයන්ගේ නුවණෙහි ඇති දක්ෂකම වෙනස් බවෙක් නම් නො පැතේ. මේය වාග් විලාශය.

**ඥාන විලාශය:** සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානු පරිවත්ති, සබ්බං වචීකම්මං ඤාණානු පරිවත්ති සබ්බං මනොකම්මං ඤාණානුපරිවත්ති”

= නිද්දෙසපාළි.

බුදුරජාණන්වහන්සේගේ සියලු කාය - වාග් - මනඃ කර්මයෝ - ක්‍රියා - වචන - සිතුවිලි ඥානයට අනුව පවතිත්. නුවණ බැහැර නොයයි යනු අදහසයි. උන්වහන්සේ අළුයම දෙලොස් කෝටි අසූහාර දහසක් මහාකරුණා සමාපත්තියට සම වදිත්. එපමණ අර්හත් ඵල සමාපත්තියට සමවදිත්. සවස ද එසේමය. සිතූ යම් දෙයක් ඇද්ද ඒ සියලු දය ඉතිරිවක් නැතිව උන්වහන්සේට පෙණෙයි. අතීත, වර්තමාන, අනාගත කාල තුනෙහිම නුවණ නොහැප්පී පවතියි.

“සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණංපවත්තති. සබ්බෙසං සත්තානං භගවා ආසයං ජානාති අනුසයං ජානාති චරිතං ජානාති අධිමුත්තිං ජානාති අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ මාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ පජානාති”

= නිද්දෙසපාළි.

බුදුරජාණන් වහන්සේගේ නුවණ සත්වයන් කෙරෙහි පවතියි. සියලු සත්වයන්ගේ ආසය - නිතර ලැගෙන පුරුදු අදහස් (මිථ්‍යාදෘෂ්ටි, යථාභූත ඥානය, විදර්ශනා ඥාන) අනුසය -තිදිගත් කෙලෙස්, චරිත - ශ්‍රද්ධාදිය - , අධි මුක්ති - ප්‍රාර්ථනා දන්නා සේක. එසේම කෙලෙස් අඩු, කෙලෙස් වැඩි, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් තියුණු, ඒවා අඩු, සුන්දරාකාර සත්වයන්, පව්කාරයන්, ධර්මය අවබෝධ කරවීමට හැකි, නොහැකි වාසනාව ඇති, නැති, සියලු සත්වයන් දන්නා සේක.

තවද, ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපතී, ශ්‍රමණ, යන කවර පණ්ඩිතයෙකු හමුවූ අවුත් වාද කළත් උන්වහන්සේ පැරදවීමට නොහැකිය. ඒ පැමිණි පුද්ගලයා ඇතැම් විට පැවිදි වෙයි. නැත හොත් සරණ යයි. ඇතැම් විට වාදයට අවුත් ප්‍රශ්න නගත් සේම නැත. මෙහිලා සච්චක, බකබ්‍රහ්ම, ආදී පණ්ඩිතමානීන් ගේ සිද්ධිද සිහිකටයුතු. මෙපරිද්දෙන් බුදුරජාණන් වහන්සේ ගේ රූපකාය සම්පත්තිය, වාග් විලාශය, ඥාන විලාශය, අචින්ත්‍යයහ. සිතා කෙළවර කිරීමට නොහැක. අමාව්‍යයහ. කියා නිමකළ නොහැක. අතුල්‍යයහ. කිසිවෙකුට සමාන නැත. අවෙද්‍යයහ. දැනීමෙන් නිම කළ නොහැක.

මෙසේ සිතා බුදුරජාණන් වහන්සේ කෙරෙහි අධික ශ්‍රද්ධාවක් උපදවා ගත යුතුය, දෙවනුව බුද්ධානුස්මෘති භාවනාවෙහි ඇත්තා වූ ආනිශංස ගැන සැලකිමෙන් නුවණ පාදාගත යුතුය.

## බුද්ධානුස්සතියෙහි ආනිසංසː–

"එක පුග්ගලස්ස භික්ඛවෙ පාතුභාවා මහතො චක්ඛුස්ස පාතුභාවො හොති, මහතො ආලොකස්ස පාතුභාවො හොති, ඡන්නං අනුත්තරියානං පාතුභාවො හොති, චතුන්නං පටිසම්භිදානං සච්ඡිකිරියා හොති. අනෙකධාතු පටිවෙධො හොති. නානාධාතුපටිවෙධො හොති, විජ්ජාවිමුත්ති ඵලසච්ඡිකිරියා හොති, සොතාපත්ති ඵලසච්ඡිකිරියා හොති සකදාගාමි ඵලසච්ඡිකිරියා හොති, අනාගාමි ඵලසච්ඡිකිරියා හොති. අරහත්තඵල සච්ඡිකිරියා හොති, කතමස්ස එකපුග්ගලස්ස? තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස" අ. නි. එ.

මහණෙනි, එකම පුද්ගලයකුගේ පහළවීම නිසා මහත් වූ නුවණැසක්; මහත් වූ ආලෝකයක්, මහත් වූ එළියක්, පහළ වූයේ වෙයි. ඉතා උසස් කරුණු සයක් පහළ වූයේ වෙයි. (ඡානුත්තරිය – දස්සනාදිසය) අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන, යන සිවුපිළිසිඹියාවන්ගේ අවබෝධ කිරීමක් වෙයි. නොයෙක් ධාතු (අටළොසධාතු) ගැන අවබෝධය ඇතිවෙයි. ත්‍රිවිද්‍යා, අෂ්ට විද්‍යා, මාර්ග, ඵල සාක්ෂාත් කිරීමක් ඇති වෙයි. සෝවාන් – සකෘදාගාමි – අනාගාමී – රහත් යන සිවු ඵලයන්ගේ අවබෝධ කිරීමක් ඇති වෙයි. කවර නම් එක පුද්ගලයෙකුගේ ද? තථාගත වූ අර්හත් සම්‍යක් සම්බුදු රජාණන්වහන්සේගේ (පහළවීම) ය.

තමද තමන් දන්නා තරම් දෑ අනුව අනුසස් සිහිකර, තමා, ලබාගත් දුර්ලභ මනුෂ්‍ය ජීවිතය ගැනද සලකා බලා, ඉක්බිති සමාදන් වූ සීලය ආවර්ජනා කොට, තුනු රුවන් වෙත හැකි තාක් පුද පූජා පවත්වා, තුන් දොරින් සිදුවූ සියලු වරදට සමාව අයැද, තම ජීවිතය බුදුරජාණන් වහන්සේ වෙත පූජා කොට, ලාභ, කීර්ති, ආදී ලාමක අපේක්ෂාවක් නොමැතිව හුදු ශ්‍රද්ධා වෙන් ම බුදුගුණ සිහි කිරීමට ආරම්භ කළ යුතුය.

## බුදුගුණ භාවනාව:-

"ඉතිපිසො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසධම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති."

i සො භගවා ඉතිපි අරහං : ඒ භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ මේ මේ ගුණයෙන් අර්හත් නම් වන සේක.

මේ අයුරින් බුදුගුණ නවයට වාක්‍ය නවයක් යොදාගත යුතු. ඉක්බිති එකක් පාසා මනාසේ කියමින් සිහිකර, නැවත ඒ ඒ ගුණයට ඇත්තාවූ හැම විස්තරයක්ම වෙන වෙනම සිහි කර මින් දහස් වාර, ලක්ෂවාර, ආදී වශයෙන් බොහෝ සිහි කළ යුතුය. මෙතැන් සිට බුදුගුණ විස්තරය දක්වමි.

1 අරහං ගුණය : මෙය සිව් ක්‍රමයකින් පවතී.

i ආරකත්තා අරහං : දුරින්ම දුරුවූ හෙයින් අර්හත්ය. මාගේ බුදුපියාණන් වහන්සේ රාග, ද්වෙෂ, මොහ, මද, මානාදී සියලු කෙලෙසුන් කෙරෙහි දුරු වූ හෙයින් අර්හත් නම් වන සේක.

ii අරීනං අරානං හතත්තාති අරහං : සතුරන් ද දැවිද සිඳ දැමූ හෙයින් අර්හත්ය. මාගේ බුදුපියාණන් වහන්සේ රාගාදී කෙලෙස් නමැති සියලු සතුරන් නැසූ බැවින් අර්හත් නම් වන සේක. එසේම ඉපදීම්, පැවතීම්, විනාශවීම්, වශයෙන්ද කාම, රූප, අරූප, වශයෙන්ද, කර්ම, කිලෙස, විපාක වශයෙන් ද, කරකැවෙන්නාවූ සංසාර නමැති රෝදයෙහි අවිද්‍යාදී වශයෙන් පටිච්චසමුප්පාදයේ එන සියලු ප්‍රත්‍ය - ප්‍රත්‍ය සමුත්පන්න ධර්ම නමැති දැවි, තමන්වහන්සේගේ ඥාන නමැති කඩුදේින් කපා විනාශ කළ බැවින් අර්හත් නම් වන සේක.

iii පච්චයාදීනං අරහත්තාති අරහං :

ප්‍රත්‍යාදීන්ට සුදුසු බැවින් අර්හත්ය.

මාගේ බුදුපියාණන් වහන්සේ මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම යන සියලු දෙනා විසින් පුදනු ලබන සිවුරු, පිණ්ඩපාත, සේනාසන, බෙහෙත් යන සිව් පසය ද, ශීලාදී ගුණයන්ගෙන් පුදනු ලබන පූජාද, මෙසේ ආමිෂ, ප්‍රතිපත්ති, යන දෙවැදෑරුම් පූජාවන් පිළි ගැනීමට සුදුසු වූ හෙයින් අර්හත් නම් වන සේක.

iv පාපකරණෙ රහාභාවාහි අරහං :

රහසින්වත් පව් නොකරන බැවින් අර්හත්ය. මාගේ බුදු පියාණන් වහන්සේ නුවණැත්තන්ගේ නින්දාවට ලක්වන කිසිදු පවක් රහසින්වත් නොකරන හෙයින් අර්හත් නම් වන සේක.
(බුදුපියාණෝ සම්නිර්දේශනය.

"සවාසනෙ කිලෙසෙ සො - එකො සබ්බෙ නිඝාතිය
අහු සුසුද්ධ සන්තානො - පූජානඤ්ච සදාරහො"

ඒ බුදුපියාණන් වහන්සේ හුදකලාව (තනියම) වාසනා - පුරුදු - සහිත වූ සියලු කෙලෙස් විනාශ කොට ඉතා පිරිසිදු වූ සිතක් ඇති කෙනෙක් වූහ. හැම කල්හි පූජාවන්ට සුදුසු වූවාක් මෙන්ම රහසින් නමුදු පව් නොකරන සේක.

## 2. සම්මා සම්බුධ ගුණය :

"ජස සබ්බධම්මෙ සම්මා සම්බුධො" උන්වහන්සේ සියලු ධර්මයන් මනා ලෙස අවබෝධ කළ සේක. ඒ මාගේ බුදුපියාණන් වහන්සේ මෙලොව දතයුතු යම්තාක් දේ ඇද්ද?

ඒ සියලු ධර්මයන් අනුන්ගේ කිසිදු උපදේශයක් නොමැතිව, තමන් වහන්සේ විසින්ම අනූනවද දේශනා කිරීමට හැකි පරිද්දෙන් මනාලෙස අවබෝධ කර වදාල බැවින්සම්මාසම්බුද්ධ නම් වන සේක.

"අභිඤ්ඤෙය්‍ය ධම්මෙ අභිඤ්ඤෙය්‍යතො සම්මා සම්බුධො"

දතයුතු ධර්මයන් දතයුතු වශයෙන් මනා ලෙස අවබෝධ කළ සේක. ඒ මාගේ බුදුපියාණන් වහන්සේ හාත්පසින්ම දතයුතු වූ සියලු ධර්මයන් ඒ වූ පරිද්දෙන්ම මනාලෙස අවබෝධ කොට වදාළ බැවින් සම්මා සම්බුද්ධ නම් වන සේක.

"පරිඤ්ඤෙය්‍ය ධම්මෙ පරිඤ්ඤෙය්‍යතො සම්ම සම්බුධො"

ඒ මාගේ බුදුපිමාණන් වහන්සේ පිළිසිඳ දතයුතු යම්තාක් ධර්ම ඇද්ද ඒ සියලු ධර්මයන් පිරිසිඳ දතයුතුය යන වශයෙන්ම මනාකොට අවබෝධ කොට වදාළ බැවින් සම්මා සම්බුද්ධ නම් වන සේක;

"පහාතබ්බං පහාතබ්බතො සම්මා සම්බුද්ධො"

ඒ මාගේ බුදුපියාණන් වහන්සේ අස්කළ යුතු සියලු ධර්මයන් අස් කළ යුතු ධර්ම වශයෙන්ම මනාලෙස අවබෝධ කොට වදාළ බැවින් සම්මා සම්බුද්ධ නම් වන සේක.

"සච්ඡිකාතබ්බං සච්ඡිකාතබ්බතො සම්මා සම්බුද්ධො"

ඒ මාගේ බුදුපියාණන් වහන්සේ අවබෝධ කළයුතු ධර්මයන් ඒ වූ පරද්දෙන්ම මනාලෙස අවබෝධ කොට වදාළ බැවින් සම්මා සම්බුද්ධ නම් වන සේක.

"භාවෙතබ්බං භාවෙතබ්බතො සම්මා සම්බුද්ධො"

ඒ මාගේ බුදුපියාණන් වහන්සේ වැඩිය යුතු සියලු ධර්මයන් ඒ අයුරින්ම මනා ලෙස අවබෝධ කොට වදාළ බැවින් සම්මා සම්බුද්ධ නම් වන සේක.

'සබ්බකාලගතෙ ධම්මෙ - සබ්බෙ සම්මා සයං මුනි
සබ්බාකාරෙන බුජ්ඣිත්වා - එකො සබ්බඤ්ඤුතං ගතො,,

මුනිවරයන් වහන්සේ අතීත, අනාගත, වර්තමාන යන සියලු කාලයන්ට අයත් සියලු ධර්ම, හුදකලාවම හැම අයුරින් අවබෝධ කොට සියල්ල දත් කෙනෙකු බවට පත්වූ සේක

## 3. විජ්ජාචරණ සම්පන්න ගුණය :

මාගේ බුදුපියාණන් වහන්සේ ත්‍රිවිද්‍යා - නොමැදූරුම්. නුවණ- අෂ්ට විද්‍යා, පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වූ හෙයින් විජ්ජාචරණ සම්පන්න නම් වන සේක.

ත්‍රිවිද්‍යා : පූර්වේනිවාසානුස්මෘති ඥානය, දිව්‍යචක්ෂුරභි ඥානය, ආශ්‍රවක්ෂයකර ඥානය, යනුයි.

අෂ්ට විද්‍යා : විදර්ශනා ඥානය, මනෝමය ඍද්ධි ඥානය, ඍද්ධි විධ ඥානය, දිව්‍යශ්‍රොත්‍ර ඥානය, පරචිත්තවිජ්ජානන ඥානය, හා ත්‍රිවිද්‍යා යනුයි.

පසළොස් චරණ ධර්ම ; ශීලය, ඉන්ද්‍රිය සංවරය, ආහාරයෙහි ප්‍රමාණය දැනීම, අප්‍රමාදය, (ජාගරිය ධර්ම) ශ්‍රද්ධාව, හිරිය; ඔත්තප්පය, බහුශ්‍රැතකම, වීර්‍ය්‍යය' සිහිය, නුවණ, ධ්‍යාන සතර යනුය.

මාගේ බුදුපියාණන් වහන්සේ පෙර විසූ ජීවිත පිළිබඳ සිහි කරන නුවණ වූ පූර්වේනිවාසානුස්සෘති ඥානයෙන් යුක්තවූ සේක. මෙසේ සෙසු ගුණද යොදා සිහි කළ යුතුය.

## 4. සුගත ගුණය :

මාගේ බුදුපියාණන් වහන්සේ යහපත් වූ ගමන් ඇති බැවින් ද, මනහර තැන වූ නිවණට වැඩි හෙයින් ද, අරි අටගි මගෙහි, කෙලෙසුන් සුන් කරමින් මනාසේ ගමන් කළ බැවින් ද; යහපත් සේ නික්මෙන වචන මාලාවක් ඇති බැවින් ද සුගත නම් වන සේක.

## 5. ලෝක විදූ ගුණය :

මාගේ බුදුපියාණන් වහන්සේ ලෝකයෙහි පවත්නා වූ සත්ව ලෝකයන් ද, ආහාර - නාමරූප - සුඛ දුක්ඛ උපෙක්ඛා යන තෙ වැදෑරුම් වෙදනා - සිවු ආහාර ආදී සංස්කාර ලෝකයන්ද; හිරු - සඳ - මහමෙර - මිනිස් ලෝ- දෙව් ලෝ - සක්වල ආදී නොයෙක් අයුරින් පැතුරුණු අවකාශ ලෝකයන් ද, අඩුවක් නොමැතිව මනාසේ දැන වදාල බැවින් ලෝකවිදූ නම් වන සේක.

## 6. අනුත්තරෝ පුරිස ධම්මසාරථී ගුණය :

මාගේ බුදුපියාණන් වහන්සේ සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඥාන දර්ශන, යන ගුණයන්ගෙන් ද, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් ද, යනාදී කවර ගුණයකින් හමුදූ තමන් වහන්සේට වඩා වැඩිකිරියකු ලොව කොතනකවත් නොමැති බැවින් තමන් වහන්සේම උසස් නිසා "අනුත්තර" නම් වන සේක. එසේම තමන්වහන්සේගේ දැකීමෙන්, දේශනාවෙන්, ඥානයෙන්, දමනයට සුදුසු සියලුදෙනාම දමනය කර ගැනීමෙහි ලා අසුන් හික්මවන රියැදුරෙකු බඳු උපමා ඇති හෙයින්ද, ඒ දමනය අන් කිසිවෙකු විසින් නොකළ හැකි බැවින් ද 'අනුත්තර පුරිස ධම්මසාරථී', නම් වන සේක.

## 7. "සත්ථා දෙවමනුස්සානං" ගුණය :

මාගේ බුදුපියාණන් වහන්සේ මා ඇතුලු දෙව් මිනිසුනට, මෙලොව දියුණුව පිණිස ද, පරලොව දියුණුව පිණිස ද, නිවන් අවබෝධය පිණිසද, අනුශාසනා කළ බැවින් සියලු දෙව් මිනිසුන් ගේ ශාස්තෘ නම් වන සේක.

## 8. බුද්ධ ගුණය :

මාගේ බුදුපියාණන් වහන්සේ සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, රහත් යන සිවු මාර්ගයනට අනුව ජාති, ජරා, මරණාදි දුක්ද, ඒවා හටගැනීමට හේතුවූ අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන, කර්ම, භව, ආහාරාදී දෑ ද, ඒ හේතූන්ගෙන් නිදහස් වූ නිවණ ද, එය අවබෝධකර ගැනීමේ පිළිවෙත වූ යහපත් දැකීම, කල්පනා, වචන, ක්‍රියා, ජීවිත, වීර්‍ය්‍ය, සිහිය, එකඟකම, යන අරි අටඟි මගද, මනාසේ අවබෝධ කළ බැවින් බුද්ධ නම් වන සේක.

## 9. භගවා ගුණය :

මාගේ බුදුපියාණන් වහන්සේ ලෞකික ලෝකෝත්තර සැප ඵලනත්නාවූ දාන ශීලාදී අනේක ගුණයන්ගේ පරතෙරට පැමිණි මෙන් තමන් වහන්සේට වඩා වාසනා ගති ඇත්තෙකු නොමැති බැවින් භාග්‍යවත් නම් වන සේක. එසේම රාග - ද්වේෂ - මෝහාදි කෙලෙසුන්ද, කාමච්ඡන්දාදී නීවරණ ද, කාමාශ්‍රවාදී ආශ්‍රවයන් ද, මේ ආදී සියලු කෙලෙස් පුළුස්සා දැමූ හෙයින් (භග්න) භාග්‍යවත් නම් වන සේක. ලෝකයෙහි පවත්නා ඉසුරු බව, නවලොව්තුරු දහම්, යසස, පැහැපත් සිරුර, කැමති දෑ ලැබීම, හොඳ වීර්‍ය්‍ය, යන සවැදෑරුම් භග ධර්මයන්ගෙන් යුක්ත වූ හෙයින් ද භාග්‍යවත් නම් වන සේක. කාම - රූප - අරූප - ලෝකෝත්තර යන චාතුර්භූමික (භූමි සතරට අයත්) සියලු ධර්මයන් නානා අයුරින් බෙදූ බැවින්ද, ධ්‍යාන සමාපත්ති වූ දිව්‍ය විහරණ, මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා, නම් වූ බ්‍රහ්ම විහරණ, නිවන් සුව විඳින ආර්‍ය්‍ය විහරණ, යන තෙවැදෑරුම් විසීම් ආශ්‍රය කළ හෙයින්ද භාග්‍යවත් නම් වන සේක. තවද වමාරා දැමූ තෘෂ්ණාදිය ඇත්තේනුයි භාග්‍යවත් නම් වන සේක.

මෙසේ නවමහා ගුණ බොහෝ වාරයක් සිහි [illegible] ප දවා ගත හැකි උපචාර සමාධිය වූ එකග්ගතා චෛතසිකය ද ඒ සමඟ යෙදුනු ශ්‍රද්ධා, සමාධි වීර්‍ය්‍ය, ප්‍රඥා, යන චෛතසිකද, ඒ චෛතසිකයන් ඇසුරු කළ සිතද, සෝයා " නාමධර්මමේයා,යි පරිග්‍රහ කළ යුතු. මේන මෙනම් සිත තැබිය යුතුය. ඉක්බිති ඒ චිත්ත චෛතසිකයන්ට ආධාර වූ වස්තු රූපය දැන, ඒ අනුසාරයෙන් සියලු රූප ධර්මයන්ද විමසා ඒ සියලු නාම රූපයන් අනිත්‍යාදී වශයෙන් නිගමනයකට බැස ගැනීමෙන් විදර්ශනා මාර්ගය පැදී සක්කාය දිට්ඨි ආදී සියලු කෙලෙස් විනාශකර මාර්ග ඵල උපදවිය හැක.

# 2. ධම්මානුස්සතිය

"ධම්මං ආරබ්භ උප්පන්නානුස්සති ධම්මානුස්සති, ස්වාක්ඛාතතාදි ධම්මගුණාරම්මණාය සතියා එතං අධිවචනං" ධර්මය අරමුණු කොට උපන්නා වූ අනුස්සතිය ධම්මානුස්සති නම්. මනා කොට දේශනා කරන ලදි. යනාදී ධර්ම ගුණ අරමුණු කොට ඇති සිහියට මේ නමකි.

ධම්මානුස්සතිය භාවනා කරනු කැමති ගිහි පැවිදි පින්වතුන් බුදුපියාණන් වහන්සේ විසින් මහා කරුණාවෙන් මනා කොට දේශනා කර වදාළ සද්ධර්මයෙහි දුර්ලභකම, වටිනාකම, ගැඹුරු බව සිහිකිරීමේ ආනිශංස, යනාදිය පළමු කොට මෙනෙහි කළ යුතුය.

**දුර්ලභත්වය :**

කිච්ඡො මනුස්සපටිලාභො - කිච්ඡං මච්චාන ජීවිතං
කිච්ඡං සද්ධම්ම සවණං - කිච්ඡො බුද්ධානමුප්පාදො"

අවයවයන් හා සිහි නුවණ දෙකින් යුක්ත මිනිසත් බව ලබා ගැනීම දුර්ලභ එකකි. ඒ ලබාගත් මිනිස් ජීවිතය පාපමිත්‍රයන් ගෙන් ඈත්වී යහපත් මිතුරන්ගේ ඇසුර ඇතිව ආර්ථික දියුණුව කින් හා ගුණ ධර්ම දියුණුවකින් යුක්තව පැවැත්වීමට ලැබීමත් දුර්ලභය. කල්ප ගණනකිනිදු පහළ නොවෙන්නා වූ බුදුවරයන් වහන්සේගේ ඉපදීම, ඉහත කී මිනිස් ජීවිතයක් ලබාගත් මොහොතකදී සිදුවීමත් අතිශයින්ම දුෂ්කරය. ඒ අතර ජීවිත කරදර සියල්ලක් අතහැරදා ගොස් ධර්ම ශ්‍රවණය කරන්ට ලැබීම තවත් දුර්ලභ කරුණකි.

**වටිනාකම :** බුදුරජාණන් වහන්සේ වැඩ සිටින කාලයේදී මහා රුස්වීම් සූවිස්සකදී (24) සූවිසි අසංඛෙය්‍යක් සත්වයන් සසර දුකින් නිදහස්වී නිවන් පුර ගොස් සැනසුණ බවද, ඉන් මෙහා අග්‍ර ශ්‍රාවක - මහා ශ්‍රාවකාදීන්ගේ දෙසුම්හිදී නිවන් දුටු සත්වයන් ගැනද. මෙතෙක් සම්මුති ථෙරවාදී භික්ෂූන්ගේ දෙසුම් නිසා ඇති වූ යහපතද මේ ආදී කරුණු සිහි කිරීමෙන් සද්ධර්මයෙහි ඇති වටිනාකම සිතාගත හැකි.

**ගැඹුරු බව:** "අධිගතො ඛො මයායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො" - මහාවග්ගපාලි" - මා විසින්

අවබෝධකර ගත් මේ ධර්මය ගැඹුරුය. දැකීමට අපහසුය. අවබෝධ කිරීමටද දුෂ්කරය. (එහෙත්) සැනසුම්ය. මිහිරිය. වාද කිරීමෙන් සොයා ගත නොහැක. සියුම්ය. නුවණැත්තන් විසින් ම දත යුතුය.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්ව අටවැනි සති අන්තයේදී මෙසේ සිතා වදාළේ තමන් වහන්සේ අවබෝධ කර වදාළ සද්ධර්මයෙහි ඇති ඉතා ගැඹුරු බවමය. "මෙබඳු ගැඹුරු ධර්මයක් රාග - ද්වේෂ - මෝහාදීයෙන් උත්සන්න වූ සත්වයාට දෙසීමෙන් සිදුවනුයේ මට ම වෙහෙස වීමෙකි" යි ද කල්පනා කළහ. එහෙත් සහම්පති බ්‍රහ්මයාගේ ඇරයුමෙන් පසු සත්වයා අතර සිටින කෙලෙස් අඩු පුද්ගලයන් දැක වදාළ හෙයින්ය. අද අපට ඒ නිර්මල සද්ධර්මය ඇසීමට මග පෑදී තිබෙනුයේ. මෙසේ නොයෙක් අයුරින් සද්ධර්මයේ ගැඹුරු බව සිහිකළ යුතුය

ආනිසංස : 'එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො එකන්ත නිබ්බිදාය එකන්ත විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. කතමො එකධම්මො? ධම්මානුස්සති. අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො එකන්ත නිබ්බිදාය එකන්ත විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සංවත්තති."

අ. නි. එ. නි.

මහණෙනි, එකම ධර්මයක් (භාවනාවක්) වඩන ලද්දේ බොහෝ කොට වඩන ලද්දේ කලකිරීම පිණිසම, නිවීම, සංසිඳීම, හාත්පසින් දැනීම, අවබෝධය, නුවණ, පිණිස පවතියි. කවර නම් එකම ධර්මයක් ද? ධම්මානුස්සතිය යි පෙත්ස සුබෝධ යැ. මෙසේ ආනිශංස සැලකිය යුතු.

## ධම්මානුස්සතිය වඩන අයුරු:

සැදැහැවතා විසින් කළයුතු මූලික දෑ බුද්ධානුස්සතියෙහි සඳහන්ව ඇත. ඒ අයුරින් ජීවිතයත් සිතත් සකස් කරගෙන ධර්මයෙහි ගුණ එකක් පාසා මෙනෙහි කළ යුතු.

"ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති"

1. "භගවතා ධම්මො ස්වාක්ඛාතො" භාග්‍යවත් බුදුපියාණන් දෙසූ ධර්මය මනා කොට දෙශනා කරන ලදී.

2. "භගවතා ධම්මො සන්දිට්ඨිකො" - පෙර මෙනි - තමා විසින් ම නුවණින් දැකගත යුතුය.

3. "භගවතා ධම්මො අකාලිකො" - පෙ - කල් නොයවා විපාක දෙයි.

4. "භගවතා ධම්මො එහිපස්සිකො" - පෙ - එව, බලව,යි කිවහැකි වූ සත්‍යයකි.

5. "භගවතා ධම්මො ඔපනයිකො" පෙ - තමසිතෙහි උපදවා ගත යුතුය.

6. "භගවතා ධම්මො විඤ්ඤූහි පච්චත්තං වෙදිතබ්බො" පෙ- නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුතුය.

ප්‍රථමයෙන් මේ ගුණ සය කටපාඩමින් කිවයුතුය. මෙයින් පළමුවැනි ගුණය ත්‍රිපිටක ධර්මයට අයත්ය. සෙසු පසම ලෝකෝත්තර ධර්ම නවයට ඇතුලත්ය. ඉක්බිති එකක් පාසා පහත සඳහන් අයුරින් දහස්වාර, ලක්ෂවාර සිහිකළයුතුය. එවිටය නියම් ප්‍රයෝජන වනුයේ.

**ස්වාක්ඛාත ගුණය:**

බුදු පියාණන් දෙසූ ධර්මය මුල-මැද-අග යහපත්ය. එක පදයකින් නමුදු ආර්‍ය සත්‍යධර්මයන් අවබෝධයට සමත්ය. ඉතා සැලකිය යුතු තේරුමක් දෙන හෙයින් සාර්ථය. අකුරු, පද වාක්‍ය, වාක්‍යබෙදීම, සැදුනු අයුරු, විස්තර, යන මෙතෙක් ව්‍යාකරණ ලක්ෂණයන් ගෙන් යුක්ත හෙයින් සබ්‍යඤ්ජනය ව්‍යඤ්ජන සම්පත්ති යෙන් යුක්තය. කිසිදු තැනක අඩුවක් නැති හෙයින් හැම අයුරින්ම සම්පූර්ණ ය. "මේ දේ වැඩිය"යි බැහැර කළයුතු දෙයක් නො මැති හෙයින් පරිශුද්ධ- පිරිසුදු- ය. සීල, සමාධි, ප්‍රඥ යන ත්‍රිවිධ ශික්ෂා හා පාලි ධර්මයද, ඒවාහි සාරය වූ අධිශීල, අධි චිත්ත, අධිප්‍රඥ, යන ධර්මයන්ද, මෙසේ දක්වූ ශාසන, මාර්ග, යන දෙවැදෑරුම් බ්‍රහමචර්‍යාවක්-උතුම් හැසිරීමක් - ඇති හෙයින් ද, මෙසේ මෙතෙක් ගුණයන් ගෙන් යුක්ත වූ හෙයින් ස්වාක්ඛාතය, එනම් මනාකොටදේශනා කරණ ලදී.

**සන්දිට්ඨික ගුණය:**

බුදුපියාණන් දෙසූ ධර්මය, පිළිපැදීමට පටන් ගත් තැන් සිට එහි ආනිශංස තමාට ම පෙනෙන හෙයින් සන්දිට්ඨිකය. මේ මාර්ග ඵලයනට මෙහා දක්වූ ආර්යමාර්ගය යි. නිවන් ලැබීමේ පාරයි. සෝවාන් ආදී ලෝකෝත්තර ධර්ම නවය තමා විසින්ම තමාගේ නුවණින් ම දතයුතු හෙයින් සන්දිට්ඨිකය. මෙසේ ලෞකික, ලෝකෝත්තර, ධර්ම සන්දිට්ඨිකය.

**අකාලික ගුණය:**

බුදුපියාණන් දෙසූ ධර්මය නවලෝකෝත්තර ධර්මය පිළිපන් තැනැත්තහුට ඒ මොහොතේදීම, විපාක ලැබෙන හෙයින් අකාලිකය. කල් නොයවා විපාක දෙයි යනු තේරුමයි මාර්ග උපදිත් ම ඵල උපදින බව මෙයින් දක්වේ.

**එහි පස්සික ගුණය:**

බුදු පියාණන් දෙසූ නවලෝකෝත්තර ධර්මය වෙනස් නොවන හෙයින් ද, ඇති දෙයක් හෙයින් ද, ඉතා පිරිසුදු හෙයින්ද, කවර කෙනෙකුට වුවද ‘එව බලව’ යි කිව හැකි නිසා එහි පස්සිකය.

**ඕපනයික ගුණය:**

බුදුපියාණන් දෙසූ ධර්මය තම සිතෙහිම ඵලවිය - උපදවා ගත යුතු හෙයින් ඕපනයිකය. උපනයනය ගතියෙන් යුක්තවූයේ ඕපනයිකයයි. උපනයනය නම් එළවා ගැනීමයි. ලබා ගැනීමයි.

**විඤ්ඤූහි පච්චත්තං වෙදිතබ්බ ගුණය:**

බුදුපියාණන් දෙසූ නවලෝකෝත්තර ධර්මය නුවණැත්තන් විසින් වෙන වෙන ම දතයුතු හෙයින් මේ ගුණය රඳා පවතී.

මෙනයින් ඉතා ශ්‍රද්ධාවෙන් යුතුව භාවනා කරත් කරත් සිතෙහි බලපාන කාමච්ඡන්දාදී නීවරණ අහුරන ධර්ම යටපත් කර සිත උපචාර සමාධි බවට පත්වෙයි. ඒ බවදත් යෝගාවචරයා උපචාර සමාධියෙහි ඇති චිත්ත - චෛතසික ධර්මයන් සොයා දැනගෙන, ඒවා රඳා පැවතීමට හේතු වූ හෘදය වස්තු රූපය ඇතුළු

රූපධර්මයන් සොයා ඒ හැම අනිත්‍යාදී විසින් මෙනෙහි කර, ක්‍රමයෙන් කෙලෙසුන් ගෙන් නිදහස් වී සෝවාන් ආදී මාර්ග ඵල උපදවයි.

"ධම්මාරාමො ධම්මරතො – ධම්මං අනුවිචින්තයං
ධම්මං අනුස්සරං භික්ඛු – සද්ධම්මා න පරිහායති" ධම්මපදය

දහම්හි රුචිදෙන; දහම් ඇලුම් කරන, දහම් සිහිකරන, භික්ෂු සදහමින් නොපිරිහෙයි.

## 3. සඞ්ඝානුස්සතිය.

'සඞ්ඝං ආරබ්භ උප්පන්නානුස්සති සඞ්ඝානුස්සති සුපටිපන්නතාදි සඞ්ඝගුණාරම්මණාය සතියා එතං අධිවචනං." සඞ්ඝරත්නය අරමුණු කොට උපන් අනුස්සතිය සඞ්ඝානුස්සතියයි. සුපටිපන්නතා ආදී සඞ්ඝ ගුණ අරමුණු වූ සිහියට මේ නමකි.

සඞ්ඝානුස්සතිය වඩනු කැමැත්තහු පළමුකොට 'සඞ්ඝ' යන පදයෙන් කියැවෙන අදහස, ඒ අදහසට අනුව වෙන්කර ගතයුතු පිරිස, උන් වහන්සේලාගේ වටිනා කම, ශ්‍රේෂ්ඨ බව, ආදී දෑ දැන ගතයුතුය. මෙම ග්‍රන්ථයෙහි අන් තැනක විස්තරයක් නො එන හෙයින් මෙහිලා කෙටි හැඳින්වීමක් කෙරේ.

**'සඞ්ඝ' යන පදයෙහි අදහස:**

"සමූහට්ඨේන සඞ්ඝො" සමූහාර්ථයෙන් සඞ්ඝ නම්. යම් සත්ත්ව කොට්ඨාසයක් සමූහව–රාශී වී–සිටිත් නම් ඔවුන් සඳහා "සඞ්ඝ" නාමය යෙදීම ව්‍යාකරණ රීතිය යි. බ්‍රහ්මසඞ්ඝ, ක්‍ෂත්‍රිය සඞ්ඝ, දෙව සඞ්ඝ, සකුණසඞ්ඝ, මේ ආදී යෙදීම් වලින් ඒ රීතිය පැහැදිලි වෙයි. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක පිරිස ද, එසේ සමූහව, එකතුව, විනය කර්මාදීන්හි පෙනී සිටින හෙයින්ද, ශීලාදී ගුණ ධර්මයන් නිසා එකම පිරිසකට අයත් වන හෙයින් ද, 'සඞ්ඝ' යන පදයෙන් කියැවේ. මෙහිලා සඳහන් කරනුයේ ඒ "සඞ්ඝ" නාමයයි. "දිට්ඨිසීල සාමඤ්ඤේන සඞ්ඝටිතො'ති සඞ්ඝො" දැකීම්, හැසිරීම්, ආදී මහඟු ගුණයන් ගෙන් හැපී, ගැවසී, ඇති හෙයින් ඒ බුද්ධ ශ්‍රාවක වූ සමූහයා 'සඞ්ඝ' යනු ද අනෙක් අදහසකි. ඒ එසේ මැ. බුද්ධශ්‍රාවකයෝ එකම දෘෂ්ටියෙක, එක ම ශීලයෙක පිහිටියෝයි, පෞද්ගලික වශයෙන් ඇතැම් භික්ෂූන් ගේ

යම් යම් අඩුපාඩු ඇති වූවත් බුදුරජාණන් පැණ වූ "නව දහස් එක්සිය අසූ කෝටි පනස්ලක්ෂ තිස්සය දහසකින්" සමන්විත මහාශීලයක් පෙරමුණෙහි තබාගෙන, එය සම්පූර්ණ වන තෙක් සිල් පුරත්තෝයි. එසේම ලෝකයෙහි පවත්නා ශාස්වත, උච්ඡේද මිථ්‍යාදෘෂ්ටීන්ට නො වැටී මධ්‍යම ප්‍රතිපදා නමැති එකම සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටියෝයි. මේ අයුරින් ගමන් කර අවසන් වූ පසු ඒ හැම සියලු ආකාරයෙන් ම සමාන බවට වැටෙත්. ඒ ශ්‍රාවක සමූහයා ආර්‍ය්‍යයෝ නම් වෙත්. මෙපරිද්දෙන් මුළු ශ්‍රාවක පිරිස සම්මුති, ආර්‍ය්‍ය, වශයෙන් කොටස් දෙකකට බෙදේ.

සම්මුති සඞ්ඝ රත්නය: සසර දුකින් නිදහස්වීමේ එකම බලාපොරොත්තුවෙන් ගිහි ගෙයින් නික්ම, පෙර සඳහන් මහා ශීලයක් පිරීමට පොරොන්දුවීම් වශයෙන් උපසම්පදාවක පිහිටි, යටත් පිරිස වශයෙන් සතර පාරාජිකා ආරක්ෂා කරන්නාවූද භික්ෂූන් ගේ පටන් උපසම්පදා මහාශීලය සම්පූර්ණ කර, සමාධි වඩා, සෝවාන් මාර්ගචිත්තක්ෂණයට පෙර ඇති ගෝත්‍රභූ චිත්තක්ෂණය තෙක් ප්‍රඥාව වැඩූ, සියලු කල්‍යාණ පෘථග්ජන භික්ෂූහු සම්මුති සඞ්ඝ රත්නය යි.

විනය ක්‍රමයේ හැටියට මේ සඞ්ඝරත්නය, චතුවග්ගික, පඤ්චවග්ගික, දසවග්ගික, වීසතිවග්ගික, අතිරේකවීසතිවග්ගික, වශයෙන් පස් වැදෑරුම් වෙයි. භික්ෂූන් සතර නමකගෙන් යුක්තව විනය කර්මයක් කරයි නම්, ඒ චතුවග්ගික යි. සෙස්සද මෙසේය. සම්මුති සඞ්ඝ රත්නය 'සඞ්ඝානුස්සතියෙහි' ලා නො එන හෙයින් මීට වඩා විස්තර අනවශ්‍යය.

ආර්‍ය්‍ය සඞ්ඝරත්නය.

සෝවාන් මාර්ග ඥානය ඉපදවූවා වූ උපසම්පදා ආර්‍ය්‍යයන් වහන්සේ ගේ පටන් අර්හත් ඵලය ලැබූ උපසම්පදා ආර්‍ය්‍යයන් වහන්සේ තෙක් වැඩ සිට උතුමෝ ආර්‍ය්‍ය සඞ්ඝ රත්න නම් වෙත්. සැලකිය යුතු; මේ අනුස්මෘති කථාවේදී සිහිකළ යුත්තේ හැම අයුරින්ම සම්පූර්ණ වූ මේ උපසම්පදා ආර්‍ය්‍ය සඞ්ඝරත්නය ය. සෙසු ආර්‍ය්‍යයෝ සෝවාන් ආදී මාර්ග ඵල ඉපද වූ නමුදු කෝටියක් සංවරශීලයෙන් සමාන නුවූවෝය. උපසම්පදා භික්ෂුවකට කෝටියක් සංවර ශීලයෙහි නො පිහිටා සිටිය හොත් මාර්ග ඵල නූපදී, සෙස්සෝ නම තමාට අයත් ශීලයෙහි ම පරිපූරකාරීහුම වෙත්; තමද පැවිදි නො වූ ආර්‍ය්‍යයනුදු පෙනෙන හෙයින්, ඇතැම් අය

පත්කම් සැපත පවා වළඳන බව විශාඛා, අනාථපිණ්ඩික, ආදී ආර්‍යයන් ගේ චරිතයන් ගෙන් පෙනේ. මහාවිනයකම් සිදුකළ හැක්කේ උපසම්පදා ආර්‍ය භික්ෂූහුමය.

## ආර්‍ය සඞ්ඝරත්නයෙහි බෙදීම:-

සියලු ආර්‍යයෝ අටවැදෑරුම් වෙත්. සෝවාන් මාර්ගසථ, එම ඵලසථ, සකෘදාගාමි මාර්ගසථ, එම ඵලසථ, අනාගාමි මාගීසථ, එම ඵලසථ, අර්හත් මාර්ගසථ, එම ඵලසථ, යනුයි. තවද උපාසක, උපාසිකා, සාමණේර, සාමණේරී, සික්ඛමානා, භික්ෂු, භික්ෂුණී, වශයෙන් සත් වැදෑරුම්ය. (සික්ඛමානා: උපසම්පදාව බලාපොරොත්තු වෙන් විකල් බොජුන් සික පදය ඇතුළත් සික්පද සයක් අවුරුදු දෙකක් නො කඩවා පුරණ සාමණේරීහුයි) මෙයින් උපසම්පදා මහා ශීලයට අයත් වන්නෝ භික්ෂු, භික්ෂුණී, දෙපිරිස පමණි.

(අනුපසම්පන්නයෝ රහත් වුවද විනය කර්මයනට නො අසුවෙත්)

තවද රතන සූත්‍රයෙහි දැක්වෙන "යෙ පුග්ගලා අට්ඨසතම්පසත්ථං" යන වැකියෙහි තේරුම් දෙකක් පවතියි. යම් පුද්ගලයෝ අට දෙනෙක් බුද්ධාදී සත් පුරුෂයන් විසින් ප්‍රශංසා කරන ලද්දෝ ද යනු එක් තේරුමකි. අනෙක නම් යම් එක්සිය අටවැදෑරුම් පුද්ගල කෙනෙක් ප්‍රශංසා ලැබුවාහුද, යනුයි. දෙවැන්නේ හැටියට ආර්‍යයෝ එක්සිය අට වැදෑරුම් වෙත්. ඔව්හු නම්;

"එකබීජී කොලංකොල සත්තක්ඛත්තුපරමාති තයො සොතාපන්නා, කාමරූපාරූපභවෙසු අධිගතඵලා තයො සකදාගාමිනො, තෙ සබ්බෙපි චතුන්නං පටිපදානං වසෙන චතුවීසති, අන්තරාපරිනිබ්බායී උපහච්චපරිනිබ්බායී සසංඛාරපරිනිබ්බායී අසංඛාරපරිනිබ්බායී උද්ධංසොතො අකනිට්ඨගාමීති අවිහෙසු පඤ්ච, තථා අතප්ප-සුදස්ස සුදස්සීසු, අකනිට්ඨෙසු පන උද්ධංසොතවජ්ජා චත්තාරොති චතුවීසති අනාගාමිනො, සුක්ඛවිපස්සකො සමථයානිකොති ද්වෙ අරහන්තා, චත්තාරො මග්ගට්ඨාති චතුපඤ්ඤාස; තෙ සබ්බෙපි සද්ධාධුර-පඤ්ඤාධුරානං වසෙන ද්විගුණා හුත්වා අට්ඨසතං හොන්ති"- සු. නි. අ. (ර. සූ.)

සෝවාන් ඵල ලාභීහු තුන් දෙනෙකි. මරණයෙන් පසු භවයෙහි එක් වරක් උපදින 'එකබීජී', සයවර තෙක් ඒ ඒ භවයට උපපත්ති වශයෙන් යන කෝලංකෝල, සත්වැනි වර, පරම-කෙළ

වර-කොට ඇති සත්තක්ඛත්තුපරම, යන මොහුයි. කාම, රූප, අරූප, යන තුන් වැදෑරුම් භවයෙහි ඉපදීමට ශක්තියක් ඇත්තා වූ සකෘදාගාමීහු තුන් දෙනෙකි. මේ සය දෙනා ශාසනයෙහි දක්වෙන ප්‍රතිපදා සතරට අනුව ආයතීභාවයට පත්වූවෝ හෙයින් ප්‍රතිපදා ක්‍රමයෙන් ගුණ කළවිට සුවිසිදෙනෙකි, ඒ ප්‍රතිපදා සතර:

i දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, ii දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, iii සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, iv සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා.

පරිකර්ම භාවනාවට බැසගත් තැන් සිට උපචාර සමාධිය ලබන තෙක් ඇති භාවනාව 'පටිපදා' නම්. එතැන් සිට ධ්‍යාන වශයෙන් හෝ මාර්ග වශයෙන් යෙදී හෝ උපදින අභිඥාවෙහි ඇත්තාවූ ප්‍රඥාව අභිඥා නම්. ඇතැම් යෝගියෙකුට සමාධි භාවනාව දුක් සහිත වෙයි. කාමච්ඡන්දාදී නීවරණ ධර්මයන්ගේ බලපෑම ඊට හේතුයි. එසේම වස්තුවිශදතා ආදී දශවිධ අභිඥා කෞශල්‍යය නොලැබුව හොත් 'අභිඥාව' දන්ධ වේ. දන්ධ යනු හෙම්හිට පැවැත්මයි. මෙසේ ඉතා අමාරුවෙන් හෙම්හිට මාර්ග ඵල උපදවන්නා, 'දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤ' නම් වෙයි. සෙසු තුන් දෙනා මේ අනුසාරයෙන් සිතා ගන්න. (මෙහි තේරුම් අපහසු පද ඉදිරියෙහි දැක්වෙයි)

අනාගාමීහු පස් දෙනෙකි:-

i සුද්ධාවාස බ්‍රහ්මලෝකයෙහි ඉපිද, එහිදී අඩක් ආයුෂ විඳ පිරිනිවන් පාන්නා. 'අන්තරා පරිනිබ්බායි'

ii එහි ඉපිද අඩක් ආයුෂ ඉක්මවා පිරිනිවෙන්නා 'උපහච්ච පරිනිබ්බායි'

iii එහි ඉපිද, උත්සාහ නො කොට සෙසු මාර්ග-ඵල උපදවා පිරි නිවෙන්නා. 'අසංඛාර පරිනිබ්බායි'

iv එම උත්සාහ කොට රහත් වී පිරිනිවෙන්නා. 'සසංඛාර-'

v අකනිට්ඨය හැර සෙසු ශුද්ධාවාසයන්හි ඉපිද ක්‍රමයෙන් ගොස් අකනිට්ඨා බඹලොවදී රහත් වී පිරිනිවෙන්නා. 'උද්ධංසොතො අකනිට්ඨගාමී'

ඔවුහු අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, යන සිවුබඹලෝ වශයෙන් ගත්කල විසිදෙනෙකි. අකනිට්ඨයෙහි පස්වැන්නා නොමැති හෙයින් එහි සතර දෙනෙකි. මෙසේ සියලු දෙන සූවිස්සකි. මෙලෙසින් සෝවාන්, සකෘදාගාමි, අනාගාමීහු අටසාළිස් (48) දෙනෙක් වෙත්. රහත් හු දෙදෙනෙකි. අර්පණා සමාධිය නූපදවා විදර්ශනා වඩා රහත් වූ සුක්ඛ විපස්සකයා සමාධි උපදවා විදර්ශනා වඩා රහත් වූ සමථ යානිකයා, යනුයි. දූත් සියලු ඵල ලාභීහු පණස් දෙනෙකි. මාර්ගස්ථ සතර දෙනා සමග පනස් සතර දෙනෙකි. මේ සියලු දෙනා භාවනාවට බැසගත් තැන් සිට උපුලන ධර්ම දෙකක් ඇත. එනම් ශ්‍රද්ධා, ප්‍රඥා, දෙකයි. එහෙයින් මේ ශ්‍රද්ධා ධුර, ප්‍රඥා ධුර, දෙකෙන් ගුණ කළ කල්හි එක්සිය අටදෙනෙක් ආර්යයෝ වෙත්. (3+3=6, 6×4=24; 5×4=20+4=24; 24+24=48+2=50; 50+4=54×2=108;)

## ආර්යසඞ්ඝරත්නයෙහි ශ්‍රේෂ්ඨත්වය.

"ඒකං සමයං භගවා සක්කේසු විහරති කපිලවත්ථුස්මිං, මහාවනෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි, දසහි ච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච" -මහාසමය සූත්‍රය.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයට අයත් කිඹුල්වත් නුවර මහවනයෙහි රහත් වූ ම පන්සියයක් පමණ භික්ෂූන් සමග වැඩ වෙසෙත්. භාග්‍යවතුන් වහන්සේද, භික්ෂු සමූහයා ද, දැකීම සඳහා දසදහසක් සක්වල දෙවියෝ බොහෝ සෙයින් රැස්වූවාහු වෙත්;

මෙහි සඳහන් වූ රහත් පන්සියදෙනා වහන්සේ නම් එදා බුදු පියාණන් නැයින් ගේ දියදබරය සංසිඳවීමෙන් පසු, උන්වහන්සේ කෙරෙහි පැහැදී මහණ වූ ශාක්‍ය-කෝලිය දෙවංශයට අයත් ඥාති භික්ෂූහුය. මුන් වහන්සේලා පැවිදි වූ අළුත, තම භාර්යාවන් ගේ දූත් ආයාචනා නිසා සසුනෙහි කලකිරීමට පත් වූ බව දැනගත් බුදුපියාණෝ, ඒ හැමදෙන කුණාල විල සමීපයට කැඳවාගෙන ගොස්, කුණාල ජාතකය දෙසීමෙන් අභිඥා සහිත සෝවාන් ඵලයට පත් වූහ. ඉක්බිති කිඹුල්වත් නුවර මහවනයට වැඩම කර, ඉතිරි මාර්ග ඵලයන් උපදවනු සඳහා කමටහන් දුන් පසු, හුදකලාව භාවනා කොට, වැඩි වේලාවක් ගත නොවී රහත් ඵලයට

පත්වූහ, තමන් වහන්සේලා ලැබූ උසස් තත්වය දැනුම් දෙනු සඳහා බුදු පියාණන් හමුවීමට එකතම පසු එකතම වැඩමවීම් වශයෙන් රැස්වූහ.

මහා සමය සූත්‍රයෙහි සඳහන් වන පරිදි, ඒ මොහොතේ දී මේ අද්භූත සිද්ධිය දුටු දසදහසක් සක්වල දෙවියෝ රැස්වූ පසු ශුද්ධාවාස බ්‍රහ්මරාජයන් සතර දෙනෙක් ද වෙනම ප්‍රශංසා ගාථා බැඳගෙන, එතැනට පැමිණියෝ ය. ඔව්හු පැමිණ පිළිවෙළින් තමන් ගේ ගාථා බුදුපියාණන් ඉදිරිපිට දී කීහු පළමුවැන්නා:-

"මහා සමයො පවනස්මිං - දෙවකායා සමාගතා
ආගතම්හ ඉමං ධම්මසමයං - දක්ඛිතායෙ අපරාජිත
සඞ්ඝන්ති"

මේ මහාවනයෙහි දෙවියෝ රැස්ව මහාසමාගමයෙකි. කිසි කෙනෙකු විසිනුත් නො පැරදවිය හැකි සඞ්ඝරත්නය දැකීම සඳහා අපි මේ ධර්මසමාගමයට පැමිණියෙමු. මෙසේ කියා ඉදීමට අවකාශ නො මැතිව, නීල කසිණ සමාපත්තියට සමවැදී මුළු මහා වනය බබුලුවමින් නික්ම ගොස් පෙරදිග සක්වල කෙළවර සිටියේය. (අවකාශ නොලබුයේ දේව සමාගමයෙහි අධිකත්වය නිසාය)

දෙවැන්නා මෙසේ කීය:-

"තත්‍ර භික්ඛවො සමාදහංසු - චිත්තං
අත්තනො උජුකමකංසු
සාරථීව නෙත්තානි ගහෙත්වා - ඉන්ද්‍රියානි
රක්ඛන්ති පණ්ඩිතා"

එහි රැස් වූ සියලු ආයුෂ්මතුන් සිත් සමාහිත කළාහුය. තමන් ගේ සිත් ඍජු කළහ. පණ්ඩිත වූ උන් වහන්සේලා තෝත් ලනු ගත් අස් රියැදුරන් මෙන් පසිඳුරන් රකිත්. මෙසේ කියා ඒ බ්‍රහ්මයා පීත කසිණයට සමවැදී දකුණු සක්වල කෙළවරට ගොස් සිටියේය.

තුන් වැන්නා මෙසේ කීය:-

"ඡෙත්වා ඛීලං ඡෙත්වා පලිඝං - ඉන්දඛීලං ඌහච්චමනෙජා
තෙ චරන්ති සුද්ධා විමලා - චක්ඛුමතා සුදන්තා
සුසුනාගා"

පසැස් ඇත්තා වූ බුදුපියාණන් වහන්සේ විසින් හික්මවූ තරුණ ඇත්පැටවු වැනි ඒ භික්ෂූහු රාගාදී හුල්, එබඳු වූ ම දොරගුල්, උදුරා තෘෂ්ණා නැතිව පිරිසුදුව හැසිරෙත්. මේ බ්‍රහ්මයා මෙසේ කියා ලෝහිත කසිණයට සමවැදී පැසුළු දිග සක්වල කෙළවරට ගොස් සිටියේය.

සිවු වැන්නා මෙසේ කීය:-

යෙ කෙචි බුද්ධං සරණාගතාසෙ - න තෙ ගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං - දෙවකායං පරිපූරෙස්සන්ති”

යම් කෙනෙක් බුදුන් සරණ ගියාහු නම් ඔව්හු සතර අපායට නොයත්. මිනිස් සිරුරු අතහැර දේව සමූහයා සම්පූර්ණ කරත්. මෙසේ කියා ඕදාත කසිණ සමාපත්තියට සමවැදී, උතුරුදිග සක් වල කෙළවරට ගොස් සිටියේය.

බ්‍රහ්මරාජයන් සතර දෙනා නික්මුණු පසු බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා, මහණෙනි, දසදහසක් ලෝකධාතූන්හි බොහෝ දෙවියෝ රැස්වූවාහු වෙත්. මහණෙනි, පෙර අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ රජාණන් වහන්සේලා වූහුනම් උන්වහන්සේලා ගේ මෙබඳු සමාගමයන්ට මගේ සමාගමයට මෙන් දෙවියෝ රැස් වූවාහුය. අනාගතයෙහි බුදුරජාණන් ගේ සමාගමයන්ට ද එසේ යැ'යි දෙසූහ. මෙයින් පෙනෙනුයේ අතීත, අනාගත, වර්තමාන, යන තුන් කාලයෙහි ම වැඩ සිටින ආර්‍යසඞ්ඝරත්නයෙහි ඇති ශ්‍රේෂ්ඨත්වයයි.

තවද සාරිපුත්ත, මොග්ගල්ලාන, කස්සප, අනුරුද්ධ, රාහුල, ආදී අග්‍ර ශ්‍රාවක- මහාශ්‍රාවක උතුමන් වහන්සේලාගේ ජීවන චරිත හා සමාධි - ප්‍රඥාවන් ගේ විශුද්ධභාවය-දක්ෂකම-සිහිකිරීමෙන්ද සඞ්ඝ රත්නය කෙරෙහි අධික ශ්‍රද්ධාවක් උපදියි, මෙසේ දන්නා තරම් සඞ්ඝ අද්භූත කරුණු සිහි කළ කල්හි බුදුරජාණන් වහන් සේ මැදිකරගෙන පෙනෙන තෙක් මානයේ අවට ආර්‍ය සඞ්ඝ රත්නය වැඩ සිටින ආකාරයක් පෙනේ. ඒ පෙනෙන සඞ්ඝාරම්මණය සිතෙහි තබාගෙන, ඉක්බිති එකක් පාසා ගුණ සිහිකළ යුතුය.

## සඞ්ඝරත්නයේ නවමහාගුණ:

“සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා’ති”

1. “භගවතො සාවකසඞ්ඝො සුපටිපන්නො”

භාග්‍යවත් බුදුපියාණන් ගේ ශ්‍රාවක වූ සඞ්ඝරත්නය මනාපිළිවෙතට පිළිපන් සේක.

2. -එම- උජුපටිපන්නො: ඍජු පිළිවෙතට පිළිපන් සේක.

3. -එම- ඤායපටිපන්නො; ක්‍රමවත් වූ පිළිවෙතට පිළිපන් සේක.

4. -එම- සාමීචිපටිපන්නො; සමගි පිළිවෙතට පිළිපන් සේක.

“යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා”

යම් මේ පුරුෂයුග සතරකින් යුත් පුරුෂයන් අට දෙනෙක් වෙත් ද (මුල් ගුණ සතර මාර්ගස්ථ පුද්ගලයන් සඳහා දේශනා කොට, මේ හැර වූ යේ රහත් ඵලයට පත් වූ පසු ප්‍රතිපත්තිය සම්පූර්ණ බැවින් ශෛක්ෂ - හික්මෙන = අශෛක්ෂ යන දෙවැදෑරුම් ආර්යයන්ගේ ගුණ දැක්වීමටය)

5. භගවතො සාවක සඞ්ඝො ආහුණෙය්‍යො”

භාග්‍යවත් බුදුරජාණන් ගේ (අෂ්ටාර්ය පුද්ගලයන්ට අයත්) ඒ ශ්‍රාවක සමූහයා දුර සිට නමුත් ගෙනවුත් දෙන දෑ පිළිගැනීමට සුදුසු වූ සේක.

6. = එම = පාහුණෙය්‍යො; පිළියෙල කර තුබූ ආගන්තුක සත්කාරය පවා පිළිගැනීමට සුදුසු වූ සේක.

7. = එම = දක්ඛිණෙය්‍යො; පරලොව සුව පතා ගෙන දෙන දෑ ද පිළිගැනීමට සුදුසු වූ සේක.

8. = එම - අඤ්ජලිකරණීයො; ඇඳිලි බැඳ කෙරෙන නමස්කාර
යටද සුදුසු වූ සේක.

9. = එම = ලොකස්ස අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං;

ලෝකයාගේ උසස් පින් කෙත නම් වන සේක. මේ වාක්‍ය නවය මනා සේ කටපාඩමින් කියා, පසුව එකක් පාසා විස්තර වශයෙන් ගුණ මෙනෙහි කළ යුතුය. ඒ මෙසේය.

බුදුපියාණන් වහන්සේගේ ආර්‍ය්‍ය සඞ්ඝරත්නය, ඉතිරි මාර්ග-ඵල ලැබෙන තෙක් නො නවතින්නාවූ එයටම නැමුණාවූ ලෝකෝත්තර ධර්මයට අනුව පිළිපන්නාවූ උතුමෝය, එහෙයින් සුප්‍රතිපන්නයහ. සතුන් මැරීම් ආදී කයෙහි ඇත්තාවූ ඇදගති ද, බොරුකීම් ආදී වචනයෙහි ඇත්තාවූ ඇදගති ද, ආශාව ආදී සිතෙහි ඇත්තාවූ ඇදගති ද (කාය-වචී-මනොවඞ්ක) නො මැති හෙයින් හා ඉතාමත් අවංක ප්‍රතිපදාවක ගමන් කරන බැවින් ද, සම්මාදිට්ඨි ආදී ක්‍රමානුකූල ප්‍රතිපදාවක ගමන් කරන බැවින් ද, ඍජු ප්‍රතිපන්නයහ. අවිරුද්ධ බැවින් ඤාය යන නාමය ලැබූ නිර්වාණයටම පිළිපන් බැවින් ද, එය ලබා දෙන්නාවූ අවිරුද්ධ ප්‍රතිපදාව වූ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයට පිළිපන් බැවින්ද ඤාය ප්‍රතිපන්න නම් වෙත්; සමීචීන = සුදුසු වූ - මාර්ගයෙහි ගමන් කරන බැවින් ද, සමීචීනකර්මාහී - විනයකර්මාදීන්ට සුදුසු වූ- බැවින් ද, සාමීචි නම් ලත් දක හුනස්නෙන් නැගිටීම, වැඳීම, පා සේදීම, අසුන් පිළියෙල කිරීම් ආදී උසස් ගෞරවයට සුදුසු වූ හෙයින් ද සාමීචිප්‍රතිපන්නයහ.

තවද, බොහෝ දුර සිට ගෙනවුත් පූජා කරන සිවුරු, පිණ්ඩ පාතය ආදී සිවුපස පිළිගැනීමට සුදුසු වූ බැවින් ද, ආවහනීය වූ දුර සිට පවා අවුත් කරන හෝම ආදී පූජා ද (මහාදන) පිළි ගැනීමම සුදුසු වූ බැවින් ද, ආහුණෙය්‍ය නම් වෙත්. නොයෙක් පළාත් වලින් පැමිණෙන ඤාති මිත්‍රාදීන් පිළිගැනීමට සූදානම් කළ ආගන්තුක සංග්‍රහ සමුදු පිළිගැනීමට සුදුසු වූ බැවින් පාහුණෙය්‍යයහ. පරලොව දිව්‍ය - මානුෂික වූ සම්පත් ප්‍රාර්ථනා කොට දෙනු ලබන දක්ෂිණාව පිළිගැනීමට හැම අයුරින්ම සුදුසු වූවාසේ ම මහත් ඵල, මහානිශංස කිරීමේ ශක්තියකින් යුක්ත වූ බැවින් ද දක්ෂි ණෙය්‍යයහ. අඤ්ජලි නම් දෙනොත් මුදුනෙහි තබා වැඳීම, ශක්‍ර-බ්‍රහ්මාදීන්ගෙන් පවා ලබා ගැනීමට සුදුසු වූ බැවින් අඤ්ජලි කරණීය ගුණයෙන් යුක්තයහ. එසේම ආර්‍ය්‍ය සඞ්ඝරත්නය, ලෝකය දිව්‍ය, මානුෂික, නිර්වාණ යන ත්‍රිවිධ ඵල නෙලා ගැනීම

සඳහා රෝපනය කරනු ලබන පින් නමැති බිජුවට ආර්ය්‍ය සඞ්ඝ රත්නය නමැති කුඹුරෙහි ඉසීමෙන්- වැපිරීමෙන් බලාපොරොත්තු වනවාටත් වඩා ඵල නෙලා ගැනීමට හැකි හෙයින් උත්තම වූ පින් කෙතනම් වන සේක.

මෙසේ ආර්ය්‍ය සංඝරත්නයේ ගුණ මෙනෙහි කිරීමෙන් සිත උපචාර සමාධියට පත්වීමෙන් සමාහිත වෙයි. ඊට පසු විදර්ශනා කර මාර්ග ඵල ඉපදවිය හැකිය.

## 4. සීලානුස්සතිය.

තමාගේ ම පිරිසුදු ශීලය මෙනෙහි කිරීම ශීලානුස්මෘති භාවනාවයි. මෙය වඩනු කැමැත්තහු පළමු කොට සිල්වතකු විය යුතු. ඉක්බිති විවේක ඇති තැනකට ගොස් තුණුරුවන් වැදීම ආදී මූලික වැඩ අවසාන වූ පසු මෙසේ මෙනෙහි කළයුතු "අහෝ වත මෙ සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි"- වි. ම. 166 පිටුව.

සාධු, සාධු, මගේ සිල් අගින් හෝ මුලින් හෝ නො කැඩුණු හෙයින් අඛණ්ඩය, මැද සිකපදයක් නමුදු නොකැඩී ඇති බැවින් අච්ඡිද්‍රය. පිළිවෙලින් සිකපද දෙක, තුන ආදී වශයෙන් නොකැඩී ඇති හෙයින් අසබලය; අතරින් පතර සිකපද කැඩී නැති නිසා අකල්මාෂය, එසේම නිවන් සඳහාම පූරණ හෙයින් මගේ සිල් තෘෂ්ණා දාසභාවයෙන් මිදී (ලෞකික සම්පත් ප්‍රාර්ථනා නොකොට ආරක්ෂා කරන හෙයින්) භුජිස්ස බවට පත්ව ඇත. එපමණක් නොව බුද්ධාදී නුවණැත්තන් විසිනුදු ප්‍රශංසා කිරීමට සුදුසු බවට පත්ව ඇත. තෘෂ්ණාවෙන් හෝ "ශීලයෙන්ම නිවන් ලැබේය" යන වැරදි නිගමනයෙන් හෝ මිදී ඇති හෙයින් අපරාමට්ඨය, (තෘෂ්ණා, දෘෂ්ටි දෙකට ගැටී නැත) ධ්‍යාන හෝ මාර්ග හෝ උපදවා ගැනීමට තරම් පිරිසුදු හෙයින් සමාධිසංවත්තනිකය. (සමාධියට නැඹුරු වී ඇත.)

මෙසේ මෙනෙහි කරන්ම ශීලය පිරිසිදු වීම ගැන සතුටක් ඇතිවීමෙන් කාමච්ඡන්දාදී නීවරණ යටපත් වෙයි.

## 5. චාගානුස්සතිය.

"චාගං ආරබ්භ උප්පන්නානුස්සති චාගානුස්සති මුත්තචාගාදි චාගගුණාරම්මණාය එතං අධිවචනං"- වි. ම.

දීම අරමුණු කොට උපන් අනුස්සතිය චාගානුස්සති නමි. බලාපොරොත්තු නොමැතිව දෙන දීමනාදී ත්‍යාග ගුණ අරමුණු කරන සිහියට මේ නමකි.

චාගානුස්සති භාවනාව වඩනු කැමති නම් පළමුකොට දීමෙහි ආනිශංස දැන, දෙවනුව සෑම අවස්ථාවේදීම දීමට ම සිත් ඇතිව විසිය යුතු. ඉක්බිති එක්බත් ආලෝපයක් නමුදු පැහැදුනු සිතින් දී ඒ දීමනාව මෙනෙහි කළයුතු.

**මෙහි අනුසස්:**

“දදං පියො හොති භජන්ති නං බහුං
කිත්තිඤ්ච පප්පොති යසොස්ස වඩ්ඪති
අමඞ්කුභූතො පරිසං විගාහති.
විසාරදො හොති නරො අමච්ඡරී” අ. නි.

දෙන්නා බොහෝ දෙනාට ප්‍රිය වෙයි. බොහෝ දෙනෙක් ඔහු ආශ්‍රය කරත්. ප්‍රශංසාවට ද භාජන වෙයි. යසස ද වැඩේ. මසුරු නැති මිනිසා විසාරදයෙක් වෙයි. (එනම්) බියසුළු ගතියක් නැතිව පිරිස් කරා යෙයි. එසේම නිර්භය ඇත්තේ වෙයි.

“ද්වෙ මෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති, කතමෙ ද්වෙ? අනිස්සා ච අමච්ඡරියඤ්ච” අ. නි; දු. නි.

මහණෙනි, මේ ධර්ම දෙක ශෛක්‍ෂ භික්‍ෂුවගේ නො පිරිහීම පිණිස පවතිත්. කවර නම් දෙකක්ද? ඊර්ෂ්‍යා නොකිරීමද, මසුරු නොවීම ද යන මේ දෙකයි.

සෝවාන් ආදී ආර්ය්‍ය මාර්ග ඵල ලැබූ ශෛක්‍ෂයන් වහන්සේවද රහත් ඵලය ලැබෙන තුරු දන්දීම අනුදැන වදාළ බව මේ සූත්‍ර පාඨයෙන් පැහැදිලි වෙයි. අප ගැන කවර කථාද? මසුරු නො වීමට නම් දිය යුතුය.

“එක් සමයෙක්හි සමත් රජ කුමරී පන්සියයක් රථ පිරිවරින් දෙව්රම් ගොස් පන්සියයක් කුමරියන් පිරිවරා බුදුන් කරා එළඹ වැඳ එකත්පස්ව හිඳ පැන පුළු වුසී. භාගවත්හුගේ ශ්‍රාවකයෝ දෙදෙනෙක් ශ්‍රද්ධායෙන් සමයහ. ශීලයෙන් සමයහ. ප්‍රඥායෙන් සමයහ. ඔවුන් දෙදෙනා කෙරෙන් එක්කෙනෙක් තමන් ලද දූයක් අත්හව බෙදා දී වළඳ කෙරෙනි. එක්කෙනෙක් නොදී වළඳ

කෙරෙති. මේ දායක අදායක දෙදෙනා දිව්‍යලෝකයෙහි උපන් කල විශෙෂ ඇති හෝ "යු. එකල බුදුහු අපරිභොග දුෂ්පරිභොග අසාථානනියොජන ශ්‍රද්ධාදෙයවිනිපාතක කුල දූෂණයට නො පමුණුවා සාරාණීය ධර්මයෙහි සිට දුන් දායකයා දිව්‍ය වූ ආයුෂයෙන් දිව්‍ය වූ වර්ණයෙන් දිව්‍ය වූ සුඛයෙන් දිව්‍ය වූ යසසින් දිව්‍ය වූ ආධිපත්‍යයෙන් සෙසු දෙවියන් අභිභවන ශක්‍ර දෙවරාජයා සෙයින් අදායකයා අභිභවන පරිදි දක්වා වදාළහ." - ධර්ම ප්‍රදීපිකා 92 පිටුව.

ශීලාදී අනෙක් ගුණයෙන් සම වුවත් දීමනාවෙන් සමාන නැති නම් ඇතිවන්නාවූ අඩුපාඩුකම් මේ අයුරින් බුදුපියාණන් පෙන්වාදී ඇති බව මේ පාඨයෙන් දක්වේ. එහෙත් ඒ දීමනාව ද කළයුතු අයුරු ද පැහැදිලි කර වදාළහ. එනම් තමා ද වළඳා, විනාශ ද නො කොට, නුසුදුසු අයුරින් ද නො දී, සැදැහැයෙන් දෙන දේ කුල සංග්‍රහයක් වන අයුරින් ද නො දී, දාන ගුණ සිහිකිරීම ධර්මයෙහි පිහිටා දිය යුතුය. මෙසේ හෙයින් භික්ෂූන් නමුදු මේ ධර්මයෙහි පිහිටා දීමෙන් පෙර කී පරලොව සැප ලබාගත හැක.

## චාගානුස්සතිය වඩන අයුරු

පිරිසුදු ශීලයක පිහිටා, "අතෙහි වූ බදුනෙහි අවසාන බත් පිඩුව නමුදු දී වළඳමි"යි අධිෂ්ඨාන කොට, දීමෙහි ගුණ සිහිකළ යුතුය. "ලාභා වත මෙ සුලද්ධං වත මෙ යොහං මච්ඡෙර මල පරියුට්ඨිතාය පජාය විගතමලමච්ඡෙරෙන චෙතසා විහරාමි, මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දාන සංවිභාගරතො" මට වූයේ හුදෙක් ලාභයෙකි. මක්නිසාද? "ආයුං ඛො පන දත්වා ආයුස්සභාගී හොති, දිබ්බස්සවා මානුසස්සවා" ආයුෂය දී දිව්‍ය වූ ද මනුෂ්‍ය වූ ද ආයුෂයට හිමිකාරයෙක් වෙයි, යන තථාගත දේශනාව අනුව "මා දුන්නේ ආහාරය නොවෙයි ආයුෂයයි. ඇයි? ආහාරයෙනි ආයුෂය රැකෙන්නේ. ඒ නිසා ආහාරය දෙන් ම ආයුෂයද දුන්නා හා සමානය" එහෙයින් මම ඒ ආයුෂය දී මතු දිව්‍ය හෝ මනුෂ්‍ය හෝ ආයුෂයට හිමිකාරයෙක් වූයෙමි. මට වූයේ මහත් ලාභයෙකි. ඒ මම මසුරු මලින් වෙළී සිටියාවූ මිනිසුන් අතර, මසුරු මලයක් නැති අදහසින් වාසය කරමි. මම දීමනාවේදී මතු බලාපොරොත්තුවක් නැතිවම දෙමි. දන්දීම සඳහාම සෑදී පැහැදී සිටිමි. මා අනුන් විසින් ඉල්ලීමට සුදුස්සෙකු විය යුත්තේ වෙමි. බෙදා වැළඳීමෙහි ආනිශංස දැන, එහි ඇලුනෙක් වෙමි.

මේ අයුරින් නැවත නැවත දනයෙහි ගුණ සිහිකරන්නා යෝගියාගේ සිත ලෝභයෙන් දුරුවෙයි. මෛත්‍රියෙහි පිහිටයි. නුවණ දියුණු වෙයි. ගුණයට පැහැදීම, ප්‍රීතිය ආදී කුශල පාක්ෂික සිතුවිලි හටගැන්මෙන් සිත සත්සුන්වී උපචාර සමාධියට පත්වෙයි.

## 6. දෙවතානුස්සතිය.

"දෙවතා ආරබ්භ උප්පන්නානුස්සති දෙවතානුස්සති දෙවතා සක්ඛිට්ඨානෙ ඨපෙත්වා අත්තනො සද්ධාදි ගුණාරම්මණාය සතියා එතං අධිවචනං" දෙවියන් අරමුණු කොට උපන් අනුස්සතිය දෙවතානුස්සති නම්. දෙවියන් සාක්ෂිස්ථානයෙහි තබා තමාගේ ශ්‍රද්ධාදී ගුණ අරමුණු කොට උපන් සිහියට මේ නමකි.

මෙය වඩනු කැමති යෝගියා පළමුකොට චාතුර්මහාරාජිකාදී සද්ව්‍යලෝකයන්හිද, පරිත්තාභාදී බ්‍රහ්මලෝකයන්හිද වෙසෙන දෙවියන් මෙනෙහි කළයුතු. ඉක්බිති 'ඔව්හු එබඳු දිව්‍යසැපතකට පැමුණුනේ හුදෙක් ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග ප්‍රඥ යන පඤ්ච ධර්මයන් බොහෝ කොට දියුණු කිරීමෙනි, මම ද දුන් සිතෙහි පවතින ශ්‍රද්ධාව දියුණුකර ගනිමි. පිරිසුදු සිල් ඇත්තෙක් වෙමි, හැකිතාක් ධර්මය ඉගෙන ගනිමි; දීම පුරුදු කරමි; නුවණ දියුණු කර ගැනීමේ හැම පිළිවෙතක්ම රැකගනිමි." යනාදී වශයෙන් පෙර කී ශ්‍රද්ධාදී ගුණ පසම සිහිකළ යුතුය.

මෙසේ දෙවතානුසමෘති භාවනාමෙහි යෙදුනාවූ යෝගියාගේ සිතෙහි රාගාදී පාපධර්ම යටපත්වී මෛත්‍රී ආදී ගුණ මතුවෙයි, හැම ගුණයක්ම දියුණුකර ගැනීමේ බලවත් කැමැත්ත ඇතිවෙයි. බොහෝ කොට වැඩුයේ නම් සිත උපචාර සමාධියට පත්වෙයි.

### ජානුස්සති අතිරේකය:

ඉහත සඳහන් අනුස්සති සය, සෝවාන් ආදී ආර්‍ය්‍ය උත්තම යන් විසින් පුරුදු පුහුණු කළයුතු බව, ආර්‍ය්‍ය වූ විශාඛා මහා උපාසිකාවට දෙසූ, අඞ්ගුත්තර නිකායේ තික නිපාතයට ඇතුළත් වූ "උපොසථ"! සූත්‍රයෙන් පැහැදිලි වෙයි. "ඉධ විසාඛෙ අරිය සාවකො තථාගතං අනුස්සරති" විශාඛාවෙනි, මේ ශාසනයෙහි

ආර්ය ශ්‍රාවකයා බුදුරජාණන් සිහිකරයි. මෙසේ පෙහෙවස් විසීමේ නියම ප්‍රයෝජනය ගැනීමට අනුස්සති සය වැඩියයුතු යැයි ද වැඩි දුරටත් දේශනා කොට ඇත.

මක්ඛිසාද යත්:- අනුස්සති සය වශයෙන් එන බුද්ධ; ධම්ම, සඞ්ඝ, සීල, චාග යන පඤ්ච අනුස්සති වැඩීමෙන් පිළිවෙලින් සිතෙහි උපදිනුයේ ප්‍රඥ; ශ්‍රැත, ශ්‍රද්ධා, ශීල, ත්‍යාග යන ගුණ සයය. මේවා මනාසේ දන්නේ ආර්ය ශ්‍රාවකයාය. සෙසු පෘථක් ජනයෝ ඇසීම් මාත්‍රයෙන් දතුවෝය, එසේ නොව ආර්ය ශ්‍රාවකයෝ ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දතුවෝය. (දේවතානුස්සතිය යනු ද ශ්‍රද්ධාදී පඤ්චධර්මය මැයි) ආර්ය ශ්‍රාවකයාට විශේෂ වුවත් සෙසු ශ්‍රද්ධාවනත, ශීලසම්පන්න පින්වතුන්ට ද දියුණු කිරීමට පුළුවන. ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥ යන ධර්මයෝ නිවන් සඳහා බොහෝ උපකාරීහුය, එහෙයින් කවර කෙනෙකු වුවත් ජානුස්සතිය දියුණු කිරීමට උත්සාහ ගත යුතුය.

# 6 වැනි පරිච්ඡේදය.

## (45) සත්තබොජ්ඣඞ්ගං (භාවෙතබ්බ)

සුතමය ඤාණට ඇතුලත් වැඩිය යුතු එකකාදි ධර්මදශයෙහි සත්වැනි වූ බොජ්ඣඞ්ග ධර්ම සත මිලඟට විස්තර වෙයි. සමත-විදසුන් භාවනා දෙකට මෙය ඉතා අවශ්‍යයි,

“සත්තබොජ්ඣඞ්ගා, සතිසම්බොජ්ඣඞ්ගො ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, සමාධිසම්බොජ්ඣඞ්ගො, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො” - වි. ප. 173 පි.

බොජ්ඣඞ්ග සතකි. සතිසම්බොජ්ඣඞ්ගය, ධම්මවිචය-විරිය-පීති - පස්සද්ධි - සමාධි - උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය යනුයි.

බොජ්ඣඞ්ග: “බොධාය සංවත්තන්තීති බොජ්ඣඞ්ගා” සිවුසස් අවබෝධ කර දෙන්නාවූ නුවණ පිණිස පවතින්නුයි බොජ්ඣඞ්ග නම්. සිවුසස් අවබෝධ කරන නුවණට “බොධි” යනු යෙදෙති. ඒ බෝධිය සඳහා පවතින ධර්ම බොජ්ඣඞ්ග බව දතයුතු. “බොධි වුච්චති චතුසු මග්ගෙසු ඤාණං, තස්ස අඞ්ගානි බොජ්ඣඞ්ගානි” මේ පාඨයෙන් දක්වෙනුයේ ඒ අදහසයි.

තවද, යාය ලොකුත්තරමග්ගක්ඛණෙ උප්පජ්ජමානාය ලීනුද්ධච්ච පතිට්ඨානායූහනකාමසුඛත්තකිලමථානුයොග උච්ඡේදසස්සතාභිනිවෙසාදීනං අනෙකෙසං උපද්දවානං පටිපක්ඛභූතාය සතිධම්මවිචයවීරිය පීති පස්සද්ධි සමාධි උපෙක්ඛා සංඛාතාය ධම්මසාමග්ගියා අරියසාවකො බුජ්ඣතීති බොධි, තස්ස බොධිස්ස අඞ්ගා බොජ්ඣඞ්ගා”

ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි උපදින ලීන-ලිහිල්-උද්ධච්ච-විසුරුණු - පතිට්ඨාන - නැවතී සිටීම, ආයූහන - උත්සාහය, කාමසුඛ - කම්සැප සෙවුම්, අත්තකිලමථානුයොග - සිරුර තැවීමෙහි යෙදුනු, උච්ඡේද - උච්ඡේද දෘෂ්ටිය, සස්සත = සාස්වත දෘෂ්ටිය, අභිනිවෙස = එයට ම බැසගැනීම ආදි නොයෙක් කරදර යන්ට ප්‍රතිපක්ෂ = විරුද්ධ වූ සති ආදී ධර්ම සත සංඛ්‍යාත ධර්ම

සමඟිය - එකමුතුකම - නිසා ආර්‍ය්‍ය ශ්‍රාවකයා අවබෝධ කෙරේ නුයි "බොධි" නම්. එනම් නුවණයි. ඒ නුවණට කරුණු වූයේ බොජ්ඣඞ්ග නම්.

## 1. සතිසම්බොජ්ඣඞ්ගය

"සරතීති සති" සිහි කෙරේනුයි සති නම්. ඒ සිහිය පෙර කිලෙස සතර මාර්ග ඥාන ඉපදීමට කරුණක් වන හෙයින් සම්බොජ්ඣඞ්ග නාමය ලබයි. සතිය ම බොජ්ඣඞ්ග වූයේ සතිබොජ්ඣඞ්ගයයි.

"තත්ථ කතමො සතිසම්බොජ්ඣඞ්ගො? ඉධ භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා හොති අනුස්සරිතා, අයං වුච්චති සතිසම්බොජ්ඣඞ්ගො" - වි. ප. 173 පි.

එහි (බොජ්ඣඞ්ග අතුරෙහි) සතිසම්බොජ්ඣඞ්ගය නම් කවරේද? මේ සාසනයෙහි භික්ෂු සිහියෙන් යුක්තවූයේ වෙයි. උසස් සිහි නුවණින් යුක්තවූයේ කල පැරණි දේද, කියූ පැරණි දේද, සිහි කරන ලද්දේ වෙයි. ඊ ඊපිට ම සිහි කරන ලද්දේ වෙයි.

පෙර භාවනාවන්හිදී කරන ලද පරිකර්ම, උග්‍රහ, ප්‍රතිභාග, නිමිති ද, ද්වත්තිංසාකාර වශයෙන් වචනයෙන් පුරුදු කරන ලද දේද, ඊටත් පෙර කර්මස්ථාන ඉගෙනීම, සජ්ඣායනාද, එයිනික්බිති ත්‍රිපිටක ධර්ම වාචෝද්ගත කිරීම් ආදියද යන මෙතෙක් දෑ සිහි කිරීමේ දක්ෂකම සතිසම්බොජ්ඣඞ්ගය බව බුදුපියාණෝ මේ පාඨයෙන් පැහැදිලි කළහ.

සතිසම්බොජ්ඣඞ්ගය අධ්‍යාත්මික - තමා පිළිබඳ ධර්ම අරමුණු කොට ද, බාහිර ධර්ම අරමුණු කොට ද යන දෙවැදෑරුම් ක්‍රමයට උපදී. ඒ දෙයාකාරයෙන්ම මාර්ග ඥාන සඳහා උපකාර වේ. ආධ්‍යාත්මික ධර්ම යනු තම සිතෙහි ඉපදුනු ශ්‍රද්ධා, විරිය, සති, සමාධි ප්‍රඥා ආදීහුයි. බාහිර ධර්ම නම් කසිණාරම්මණ, අශුභාරම්මණ; ඉගෙණගත් දෑ ආදීහුය.

"තත්ථ කතමො සතිසම්බොජ්ඣඞ්ගො? ඉධ අජ්ඣත්තං ධම්මෙසු සති, අත්ථි බහිද්ධා ධම්මෙසු සති, යදපි අජ්ඣත්තං ධම්මෙසු සති තදපි සතිසම්බොජ්ඣඞ්ගො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති. යදපි බහිද්ධා ධම්මෙසු සති තදපි -පෙ- සංවත්තති" - වි. ප.

එහිලා සතිසම්බොජ්ඣඞ්ගය නම් කවරේද? ආධ්‍යාත්මික ධර්මයන්හි සිහියක් ඇත. බාහිර ධර්මයන්හි සිහියක් ඇත. යම් ආධ්‍යාත්මික ධර්මයන්හි සිහියක් ඇද්ද, ඒ සතිසම්බොජ්ඣඞ්ගය, විශේෂ ඥානය, අවබෝධය, නිර්වාණය සඳහා පවතී. සෙසු පාඨ ද මේ ක්‍රමයි.

මෙහි සඳහන් ආධ්‍යාත්මික ධර්ම නම් තමා කෙරෙහි පවතින සංස්කාර ධර්මයි. බාහිර ධර්මත් මේ ක්‍රමයෙන් ගතයුතු. වෙනස: ඒ සමථයයි. මේ විදර්ශනාවයි. තවද අභිධර්ම ක්‍රමයෙන් සති සම්බොජ්ඣඞ්ගය මෙසේ දැක්වේ.

“තත්ථ කතමො සතිසම්බොජ්ඣඞ්ගො? යා සති අනුස්සති සම්මාසති මග්ගඞ්ගං මග්ගපරියාපන්නං අයං වුච්චති සතිසම්බොජ්ඣඞ්ගො”– වි. ප,

එහිලා සතිසම්බොජ්ඣඞ්ගය නම් කවරේද? මාර්ගාඞ්ග වූ මාර්ගයට ඇතුළත්වූ යම් සිහියක් නැවත නැවත උපදින සිහියක් සම්‍යක් සමෘතියක් – හොඳ සිහියක් වේද මේ සතිසම්බොජ්ඣඞ්ග යයි කියනු ලැබේ. මග්ගඞ්ග; ආර්යඅෂ්ටාංගික මාර්ගයට ඇතුළත්, මග්ගපරියාපන්න; ලෝකෝත්තර මාර්ගයකට ඇතුළත්.

මෙසේ සතිසම්බොජ්ඣඞ්ගය යෝගාවචරයාට මාර්ගඵල සිත් උපදවන තෙක් උපකාරී වන බව මේ දේශනාවන්ගෙන් පැහැදිලි වෙයි. තවද සිවු පිරිසුදු ශීලයට අයත් ඉන්ද්‍රියසංවර ශීලය සම්පූර්ණ කිරීමට හැම අයුරින්ම උපකාරී වනුයේ බොජ්ඣඞ්ග නාමයෙන් ආ සිහිය ම ය. එපමණක් නොව තිසරණ සමාදානයේ පටන් රහත් වනතෙක් සෑම තැනකදීම අතහැරෙන්නට නොදී රැකිය යුතු එක ම චෛතසිකය සිහියයි. එහෙයින් බුදුපියාණෝ මෙසේ වදාළහ. “සතිඤ්ච ඛ්වාහං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමි” මහණෙනි, හැම තැනකදීම සිහිය අවශ්‍ය යැයි මම කියමි. සිහිය කොපමණ වැඩි වුවත් හොඳක් මිස නරකක් නොමැත.

## සතිසම්බොජ්ඣඞ්ගය ලැබෙන අයුරු

“අත්ථි භික්ඛවෙ සතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස භීය්‍යො භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති”– වි. ප. අ (ස. වි.) 193 පි.

මහණෙනි; සතිසම්බොජ්ඣඞ්ගයට හේතුවන කරුණු ඇත. එහිලා නූපන් සතිසම්බොජ්ඣඞ්ගය ඉපදීමටත්, උපන් සති සම්බොජ්ඣඞ්ගය දියුණු වීමටත් බොහෝ කොට නුවණින් මෙනෙහි කිරීම හේතුවේ.

මේ බොජ්ඣඞ්ගය උපදවා ගැනීමටත්, එය පවත්වා ගැනීමටත් එයින් වැඩක් ගැනීමටත් ඇති එකම ක්‍රියාව සෑම දෙයක් කෙරෙහි ම නුවණින් මෙනෙහි කිරීමයි. නැතහොත් එනුයේ අයෝනිසෝමනසිකාරයයි. නුනුවණින් මෙනෙහි කිරීමයි. රාග, ද්වේෂ, මෝහාදී නොයෙක් ක්ලේශකර ධර්ම උපදිනුයේ එහෙයිනි. තවද උපදවාගත් ධ්‍යාන විනාශ වීමටත්, විදර්ශනාව හෙමිහිට පැවතීමටත් හේතුවනුයේ අයෝනිසෝමනසිකාරය මැයි. එහෙයින් ඉදුරන් රැකගැනීමේ පටන් හැම තැනකදීම යෝනිසෝමනසිකාරය යොදවාගත යුතුය. යෝනිසෝ මනසිකාරය සෝතාපත්ති අඞ්ග සතරින් එකකි.

තවද සතිසම්බොජ්ඣඞ්ගය උපදවා ගැනීමට කරුණු සතරක් උපකාර වෙයි.

i සතිසම්පජඤ්ඤං: සිහිනුවණ කායානුපස්සනා භාවනාවෙහි චතුසම්පජඤ්ඤයෙහි දක්වූ කුඩා ඉරියවු පැවැත්වීම් වශයෙන් එන සත් තැනක ක්‍රියාවේ යෙදවීමෙන් මෙය ලබත හැක.

ii මුට්ඨස්සති පුග්ගල පරිවජ්ජනතා: මුලා සිහියෙන් යුතුව ක්‍රියා කරන පුද්ගලයන් දුරුකිරීම. (බත් දැමූ විට කපුටු වන් බඳු අය)

iii උපට්ඨිත සති පුග්ගල සෙවනතා: එළඹසිටියාවූ සිහි ඇතිය වූන් ඇසුරු කිරීම.

iv තදධිමුත්තතා: සිහිය උපදවා ගැනීමට ම නැමුණු සිත් ඇත්තෙකු වීම.

මේ කරුණු සතරින් යුක්ත වූ පසු අර්හත් මාර්ගයෙන් සතියේ සම්පූර්ණ බව සිදුවෙයි.

## 2. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය

“චතුසච්චධම්මෙ විචිනාතීති ධම්මවිචයො” සිවුසස් දහම් විමසනුයි ධම්මවිචය නම්. එය ම සතරමාර්ගයන්ට කරුණුවූයේ

ධම්මවිචය සම්බොජ්ඣඞ්ගයයි. දුඃඛාදි ආර්‍ය්‍ය සත්‍ය ධර්මයන්ට ඇතුළත් සියලු ධර්ම, අර්ථ, ලක්‍ෂණ, රස ආදි වශයෙන් විමසන නුවණ මෙයින් දක්වෙයි. ඉන් මෙහා සමාධි භාවනාවේදී උපචාර, අර්පණා සමාධි සමඟ යෙදුනු ප්‍රඥා චෛතසිකය ද, විදර්ශනාවට උපකාර වන හෙයින් සම්බොජ්ඣඞ්ග නාමය ලබයි. මෙසේ සමථ, විදර්ශනා චිත්තවිථීන්හි යෙදෙන ප්‍රඥා චෛතසිකය ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය බව දතයුතු.

**සමථවශයෙන්:** ''සො තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය විචිනාති පවිචයති, පරිවීමංසමාපජ්ජති අයං වුච්චති ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො''-වි. ප.

ඉහතින් සඳහන් මුල් දෙශනා පාඨයේ දක් වූ අයුරින් භාවනාවට පටන් ගත් යෝගී භික්ෂු එසේ සිහි ඇතිව වෙසෙනුයේ ඒ සති නමැති ධර්මය නුවණින් විමසයි. හාත් පසින්ම විමසයි. මෙය සමථ භාවනාවේදී උපදිනු ලබන ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය යි. (ඒ සිහිය කසිණාදි සමථ කර්මස්ථානයන් අනුව පවතින්නකි.)
**සමථ-විදර්ශනා ද්වය වශයෙන්:** ආධ්‍යාත්මික, බාහිර, යන දෙවැදෑරුම් ධර්ම පිළිබඳ නුවණින් විමසීම, ඒවායේ ඇති ලක්‍ෂණ, රසාදිය විමසීම නිත්‍ය සුභාදී විපරීත-පෙරළුනු-අදහස් දුරු කොට අනිත්‍යාදී වශයෙන් සිත තැබීම, යනාදිය ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය යි. මෙහි ධර්ම විමසීම් ආදියෙහි යෙදුනු නුවණ නිසා ඉපදුනු සිතේ ඒකාග්‍රතාම සමථ වශයෙන් පවතී.

## ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය ලැබෙන අයුරු:-

බෙදීම් බවට ගිය ධර්මයන් කෙරෙහි යොනිසොමනසිකාරය-නුවණින් සිහිකිරීම;- ධම්මවචය සම්බොජ්ඣඞ්ගය ඉපදීමට ඇති ප්‍රධාන හේතුව ය.

''අත්ථි භික්ඛවෙ කුසලාකුසලා ධම්මා සාවජ්ජා අනවජ්ජා හීනපණීතා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භීයො භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති'' වි. ප. අ. (ස. වි) 194 පි.

මහණෙනි, කුශල, අකුශල, වැරදි සහිත, වැරදි නැති ලාමක, උසස්, දුක් විපාක දෙන, සැප විපාක දෙන, මේ වශයෙන් බවු

නොවුන්ට විරුද්ධ ධර්ම ඇත. එහිලා යෝනිසෝමනසිකාරය බොහෝ කොට පුරුදු කිරීම නූපන් ධම්මවිචයබොජ්ඣඞ්ගය ඉපදීමටත් උපන් ධම්මවිචය බොජ්ඣඞ්ගය දියුණු වී සම්පූර්ණ වීමටත් හේතුව ය.

නුවණින් සිහිකිරීම දියුණු කර ගත් කල්හි එකිනෙකට විරුද්ධ ධර්ම සොයා ගැනීමට හැකිවනවාත් අතර, නුවණ වසා දමන්නාවූ ධර්ම ප්‍රහාරය කිරීම සඳහා ඒවා වෙන් කර ගැනීමටත් ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය උපකාර වෙයි. එහෙයින් එම බොජ්ඣඞ්ගය ඉපදීම සඳහාත් දියුණුව සඳහාත් පවතිනුයේ යෝනිසෝ මනසිකාරයයි.

තවද, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය උපදවාගැනීමටත් දියුණු කර ගැනීමටත් උපකාරවන කරුණු සතක් සම්මෝහවිනෝදනී යෙහි එයි. "සත්තධම්මා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති" යනුයි.

i පරිපුච්ඡකතා: ස්කන්ධ, ධාතු, ආයතන, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ගඞ්ග, ධ්‍යාන, සමථ, විපස්සනා, යන ධර්මයන් පිළිබඳ විමසීම බොහෝ වීම. (ප්‍රශ්න කිරීම)

ii වත්ථුවිසදකිරියතා: ආධ්‍යාත්මික, බාහිර, වස්තූන් පිළිබඳ විසදබව. එනම් දික්වූ නිය-කෙස් තැබිම, මහාසේ සිරුර පිරිසිදු කිරීම, යනාදිය ආධ්‍යාත්මික වස්තුවිශද කිරියතාවය යි. සිවුරු පාත්‍රාදිය පිරිසුදු ලෙස තබා ගැනීම බාහිර වස්තුවිසද කිරීයතාවය යි. මේ දෙකම නුවණ ඇති වීමට හේතුයි. තෙල්, පහන්වැටි ආදිය අපිරිසුදු වූවහොත් ද ල්වන පහනේ ආලෝකය අඳුරු සේම අපිරිසුදු සිරුරක් ඇතිවත්ම නුවණ ද නො බැබලේ, තෙල් ආදිය පිරිසුදු නම් පහන් එළිය බැබලෙන්නාසේ ආධ්‍යාත්මික, බාහිර වස්තු පිරිසුදු නම් නුවණද බැබලේ. එහෙයින් වස්තුවිශදක්‍රියතාවය ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය ඉපදීමට හේතුවෙයි.

iii ඉන්ද්‍රියසමත්තපටිපාදනා

ශ්‍රද්ධා, වීර්‍ය, සමෘති, සමාධි, ප්‍රඥා, යන ඉන්ද්‍රියධර්මයන් සමසමසේ තබා ගැනීම.

iv දුප්පඤ්ඤපුග්ගල පරිවජ්ජනා:. මෝඩයන් ඇසුරෙන් අත හැරීම.

" පඤ්ඤවන්තපුග්ගලසෙවනා: නුවණැත්තන් ඇසුරු කිරීම.

vi ගම්භීරඤාණචරියා පච්චවෙක්ඛනා: ස්කන්ධ, ධාතු, ආදී ගැඹුරු ධර්මයන් හි නුවණ හැසිරවීම පිළිබඳ සිහිකිරීම.

vii තදධිමුත්තතා: ධම්මවිචය සම්බොජ්ඣඞ්ගයටම සිත නැඹුරු වීම.

## 3. විරිය සම්බොජ්ඣඞ්ගය.

විරිය යනු උපදවා ගනු ලැබූ සති ආදී ධර්මයන් පිරිහීමට නො දී රැකගැනුමටත්, දියුණු කිරීමටත් ගනු ලබන චෛතසික වීර්‍ය්‍ය යි. විරිය ම සතර මාර්ගයන්හි පවතින නුවණට කරුණුවූයේ නුයි විරිය සම්බොජ්ඣඞ්ග නමි. කාමච්ඡන්දාදී නීවරණ ධර්මයන්වද, නිත්‍ය, සුභාදී අනන්ත වශයෙන් ගනුලබන වැරදි අදහස් වලට ද, පැමිණෙන්ට නොදී සිත ආරක්‍ෂා කරගනුයේ මේ විරිය සම්බොජ්ඣඞ්ග යෙනි. නීවරණ ධර්ම වලකාලීම සමථ වශයෙනි. නිත්‍යාදීන්ට වැටෙන්ට නොදීම විදර්ශනා වශයෙනි. එසේ ශීල පූරණයේ දී ආජීවපාරිශුද්ධි ශීලය සම්පූර්ණ කෙරෙනුයේ වීර්‍ය්‍යයෙනි. එහිදී බොජ්ඣඞ්ග නාමය නො ලැබුවත් පසුව බොජ්ඣඞ්ග ධර්ම රැස්වීම සහභාගි වෙයි.

සමථ වශයෙන්:- "යස්ස තං ධම්මං පඤ්ඤාය විචිනතො පවිචිනතො පරිවීමංසමාපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං, අයං වුච්චති විරියසම්බොජ්ඣඞ්ගො" - වි. ප. ඒ ධර්ම විමංසනයෙහි යෙදුනා හු ගේ ඒ ධර්ම නුවණින් විනිසීම නිසා, හාත්පසින් විමසන නිසා, නොසෙල්වෙන ආරබ්ධවීර්‍ය්‍යයක් වෙයි. මේ විරියසම්බොජ්ඣඞ්ගයැයි කියනු ලැබේ.

පෙර කී ලෙස විරුද්ධ-අවිරුද්ධ ධර්ම සෙවීමෙහි දී ඇති වන පසුබට නොවන, පෙරමුණෙහිම ගමන් කරන කිසි තැනකදී නොසෙල්වෙන උත්සාහය මේ බොජ්ඣඞ්ගයෙන් කියැවේ.

සමථ - විදර්ශනා වශයෙන්:- "අත්ථි කායිකං විරියං අත්ථි චෙතසිකං විරියං, යදපි කායිකං විරියං තදපි විරිය සම්බොජ්ඣඞ්ගං, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. යදපි චෙතසිකං විරියං තදපි විරියසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති" -වි. ප.

කායික වීර්‍යයක් ඇත. චෛතසික වීර්‍යයක් ඇත. මේ දෙවැදෑරුම් විරියසම්බොජ්ඣඞ්ගය විශෙෂ ඥානය-අවබෝධය-නිර්‍වාණය සඳහා පවතී.

මෙහි කායික වීර්‍යය නම්, වාඩි වීමට, සක්මන් කිරීමට, යනාදිය සඳහා යොදවන වීර්‍යයයි. ' මගේ සිත ආශ්‍රවයන් ගෙන් මිදෙන තෙක් නොනැඟිටිමි, යි සිතා ගන්නා වීර්‍යය චෛතසිකයි. මේ දෙක ම විරියසම්බොජ්ඣඞ්ගය බවද, ඒ අතර සංස්කාර ධර්මයන් සොයා ගැනීම සඳහා තර්කාහත විතර්කාහත කරන වීර්‍යයන් එයට ම ඇතුලත් වන බව ද දතයුතුය.

## විරිය සම්බොජ්ඣඞ්ගය ලැබෙන අයුරු:

“අත්ථි භික්ඛවෙ ආරම්භධාතු නික්කමධාතු පරක්කමධාතු, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා විරිය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති” -වි. ප. අ.

මහණෙනි, ආරම්භධාතු, නික්කමධාතු, පරක්කම ධාතු ඇත. එහිලා නුවණින් මෙනෙහි කිරීම, නූපන් විරිය සම්බොජ්ඣඞ්ගය ඉපදීමටත්, උපන් විරිය සම්බොජ්ඣඞ්ගය දියුණු වී සම්පූර්ණ වීමටත් හේතු වෙයි.

ආරම්භධාතු යනු භාවනාව පටන් ගැනීමට ගන්නා වීර්‍යයයි. (ධාතු නම් සවභාවයයි. පටන් ගැනීමේ සවභාවය ආරම්භධාතුයි) එයම ක්‍රියාවේ යෙදවීමට ගන්නා වීර්‍යය නික්කමධාතුයි. කවර කරුණක් නිසාවත් අත්හරින්නේ නැතිව ඉදිරියටම එය (භාවනාව) ගෙන යෑමේ වීර්‍යය පරක්කමධාතු නම්. මේ තෙවැදෑරුම් වීර්‍යය ඉපදීමටත්, දියුණු වී සම්පූර්ණ වීමටත් උපකාර වන ප්‍රධාන කරුණ නුවණින් මෙනෙහි කිරීමයි. තමාගේ සිත තුල මේ විරිය සම්බොජ්ඣඞ්ගය ඇද්දැයි සලකා බැලීමයි.

තවද කරුණු එකොළොසක් විරිය සම්බොජ්ඣඞ්ගය සඳහා පවතී. එනම්:-

i අපායභය පච්චවෙක්ඛණතා:

නරක, තිරිසන්, ප්‍රේත, අසුර, යන සිව් අපායෙහි ඇත්තා වූ භයානක දුඃඛරාශිය සලකා බැලීම.

ii ආනිසංස දස්සාවිතා:

"'මහණ' දැන් ඔබ වීර්‍ය කළයුතු කාලය යි. කුසීතව සිටිය හොත් නව ලෝකෝත්තර ධර්ම උපදවා ගැනීමට නො හැකිය" යනාදී වශයෙන් වීර්‍යයෙන් ලැබෙන ඵලානිසංස ලෝකෝත්තර ආනිශංස සිහි කළ යුතුය.

iii ගමනවීථි පච්චවෙක්ඛණතා:

බුදු, පසේබුදු, මහරහත් උතුමෝ වීර්‍යය නිසාම එබඳු උසස් තත්ත්වයක් ලබා ගත්හ. ඒ මාර්ගයෙහිම මා ද යා යුතුය. මේ අයුරින් සලකා බැලීමයි.

iv පිණ්ඩපාතපචායනතා:

පිණ්ඩපාතයේ හොස් දැහැමිව ලැබුණ දේට ගරු කළ යුතුය. ඒ සඳහා උත්සාහ ගැනීම.

v දායජ්ජමහත්තපච්චවෙක්ඛණතා:

ආර්‍ය වූ දායාදයේ උසස් කම සැලකීම.

vi සත්ථුමහත්තපච්චවෙක්ඛණතා:

බුදුපියාණන් ගේ ඇති ශ්‍රෙෂ්ඨත්වය ගැන සැලකීම.

vii ජාතිමහත්තපච්චවෙක්ඛණතා:

තමා උපන් ජාතියෙහි ඇති ශ්‍රෙෂ්ඨත්වය, නැතහොත් මිනිස් ජාතියේ ඇති වටිනා කම සැලකීම.

viii සබ්‍රහ්මචාරිමහත්තපච්චවෙක්ඛණතා:

සැරියුත්, මුගලන්, මහකසුප්, ආදි ශ්‍රෙෂ්ඨ උත්තමයන් වහන්සේලාගේ පසුපස ගමන් කරන බැව් සැලකීම.

ix කුසීතපුග්ගලපරිවජ්ජනතා:

කම්මැලියන් ඇසුරු කිරීමෙන් දුරුවීම.

x ආරද්ධවිරිය පුග්ගලසෙවනතා:

ඇරඹූ විරිය ඇති පුද්ගලයන් ඇසුරු කිරීම.

xi තදධිමුත්තතා: වීර්‍යයට ම නැඹුරු වූ සිතැත්තෙකු වීම.

## 4. පීති සම්බොජ්ඣඞ්ගය:-

"පීනයතීති පීති" සතුටු කෙරේනුයි ප්‍රීති නම්. ප්‍රීතිය කය, සිත, දෙක ම පිනවන්නකි. නොසතුටු ගතියට හාත් පසින් ම විරුද්ධ ය. මහා නිදාඝයකදී සිසිල් ජලය පිරුණු පොකුණක් දුටු මගියෙකු යම් සේ සතුටු වේද, එබඳු සතුටුවීම ප්‍රීති නම්. (නිදාඝ-පෑවුම) පස් වැදෑරුම් ප්‍රීතියක් ධර්මයෙහි ඇතුළත් ය. එනම් ඛුද්දක, ඛණික, ඔක්කන්තික, උබ්බේග, ඵරණ, යනුයි. ශරීරයේ ලොමුදැහැ ගැනීමට පමණක්ම සමර්ථ ප්‍රීතිය ඛුද්දක නම්. මොහොතක් පාසා විදුලියක් මෙන් සිරුරෙහි පැතිරෙනුයේ ඛණික ප්‍රීතිය යි. මුහුදෙහි රළ මෙන් නැගි නැගී එනුයේ ඔක්කන්තික ප්‍රීතිය යි. ශරීරය පුළුන් රැලක් මෙන් ඔසවා තැබීමට සමත් සේ පැනනගින ප්‍රීතිය උබ්බේග නම්. පුණ්ණවල්ලික මහාතිස්ස හිමිට මෙනි. මුළු ශරීරය ම කුල්මත් කරමින් උපදිනුයේ ඵරණ ප්‍රීතිය යි.

කාමච්ඡන්දාදී නීවරණ දුරුකිරීමේදී ද, කසිණාදී සමථපරිකර්ම ගැන සිතීමේදී ද, සංස්කාරයන් ගේ ස්වභාවය දැක ඒවායින් නිදහස් වීමට සිතීමේදී ද, උපදින ප්‍රීතිය, සතර මාර්ග ඥාන සඳහා උපකාර වන හෙයින් ප්‍රීතිසම්බොජ්ඣඞ්ග නම්. පෙර කී පස් වැදෑරුම් ප්‍රීතිය සමථ-විදර්ශනා යෝගීන් දෙදෙනාට ම උපදියි.

"ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා අයං වුච්චති පීති සම්බොජ්ඣඞ්ගො" ඇරඹූ වීර්‍ය්‍ය ඇතියහුට නිරාමිෂප්‍රීතියක් උපදියි. එය පීතිසම්බොජ්ඣඞ්ගය යි. සිහිය උපදවා ගැනීමේ පටන් ඔහු කෙරෙහි පැවති කාමවස්තු වලින් නිදහස් වූ සැපත නිසා හටගත් ප්‍රීතිය පීතිසම්බොජ්ඣඞ්ගය යි දැක්විතයැ. තවද තිසරණ සමාදානයේ පටන් දියුණුවේගෙන එන ශාසනික ප්‍රීතිය, වරින් වර ඇති වී තදඞ්ග වශයෙන් කෙලෙස් ප්‍රහාණය කෙරෙන හෙයින් එය ද පීතිසම්බොජ්ඣඞ්ගයට ඇතුළත් වෙයි.

තවද, "අත්ථි සවිතක්ක සවිචාරා පීති, අත්ථි අවිතක්ක අවිචාරා පීති, යදපි සවිතක්ක සවිචාරා පීති යදපි පීතිසම්බොජ්ඣඞ්ගො -පෙ- යදපි අවිතක්ක අවිචාරා පීති තදපි පීතිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. විතර්ක, විචාර, සහිත ප්‍රීතිය ද, රහිත ප්‍රීතියද යන දෙක ම විශේෂ ඥානය, සිව්සස් අවබෝධය, නිර්වාණය පිණිස පවතිත්. මෙහි සවිතක්ක සවිචාර ප්‍රීතිය යනු සංස්කාර ධර්මයන් අනිත්‍යාදී වශයෙන් බලන්නාහුගේ ද, පරිකර්ම භාවනා පටන් ප්‍රථම ධ්‍යානය

කෙනක් සමථ භාවනා වඩන්නහුගේ ද, තදඞ්ග වශයෙන් කෙලෙස් ප්‍රහාණය කරන්නහුගේ ද, සිතෙහි උපදින, අරමුණට නැංවීම් සහිත, එහි හැසිරවීම් සහිත, ප්‍රීතිය යි. කුශල් අරමුණක සිත නිතර නිතර යෙදවීමෙන් ලැබෙන ප්‍රීතිය බව සැලකිය යුතු. අවිතක්ක අවිචාර ප්‍රීතිය ලෝකෝත්තර වශයෙන් ම පවතින්නකි. රූපාවචර, අරූපාවචර, සිත්හි පවතින අවිතක්ක අවිචාර ප්‍රීතිය බොජ්ඣඞ්ග නොවන බව අටුවාව පවසයි. මක් නිසා ද? සම්මසන යට නො හැගෙන හෙයිනි. මෙසේ දෙපරිද්දෙකින් පවතින ප්‍රීතිය, සම්බොජ්ඣඞ්ග නාමය ලබයි. (අවිතක්ක: අරමුණට නැංවීමක් නැති, අවිචාර: එහි හැසිරීමක් නැති)

## පීති සම්බොජ්ඣඞ්ගය ලැබෙන අයුරු:

මෙයට ද ප්‍රධාන වශයෙන් උපකාර වනුයේ යෝනිසෝ මනසිකාරය යි. නුවණින් සිහිකිරීමයි. අකුශල පක්ෂයට බර නොවී, කුශල ධර්මයන් දියුණු වන පරිද්දෙන් සිහි නුවණ යෙදවූ කල්හි පීතිසම්බොජ්ඣඞ්ගය උපදියි. පෙර කී සේ කාමාවචර, රූපාවචර, ලෝකෝත්තර, යන තෙවැදෑරුම් කුශලයන්හිදීම එය උපදවා ගත හැකිය.

තවද, පීති සම්බොජ්ඣඞ්ගය උපදවා ගැනීමට උපකාර වන කරුණු එකොළසක් අටුවාවෙහි දක්වෙයි. එනම්.

i බුද්ධානුස්සති: බුදු ගුණ සිහි කිරීම.

ii ධම්මානුස්සති: දහම් ගුණ සිහි කිරීම.

iii සඞ්ඝානුස්සති: අරිසඟ ගුණ සිහි කිරීම.

iv සීලානුස්සති: තම සිල්ගුණ මෙනෙහි කිරීම.

v චාගානුස්සති: තම දීමේ ගුණ සිහිකිරීම.

vi දෙවතානුස්සති: දෙවියන් ශාක්ෂිතන්හි තබා තම ශ්‍රද්ධාදි ගුණ සිහි කිරීම.

vii උපසමානුස්සති: නිවණෙහි ඇති මහගු බව මෙනෙහි කිරීම.

viii ලූඛ පුග්ගල පරිවජ්ජනතා: ගොරෝසු පුද්ගලයන් දුරු කිරීම.

ix සිනිද්ධ පුග්ගල සෙවනතා: මනා හැසුරුම් ඇති, ගරුකට යුතු අය ආශ්‍රය කිරීම.

x පසාදනීය සුත්තන්තපච්චවෙක්ඛණතා: ශ්‍රද්ධා, ප්‍රීති, උප දින සූත්‍ර මෙනෙහි කිරීම.

xi තදධිමුත්තතා: ප්‍රීතිය උදවා ගැනීමට ම නැමුණු සිතැත්තෙකු වීම.

## 5. පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය.

චිත්ත - චෛතසිකයන් ගේ ගොරෝසු ගතිය නැති වී සැහැල්ලුබවට පත්වීම පස්සද්ධි නම්. මෙය දෙවැදෑරුම්ය. කාය පස්සද්ධි, චිත්ත පස්සද්ධි යනුයි. වේදනා, සඤ්ඤා, සංඛාර නම් වූ චේතනා, යන සකන්ධ ත්‍රය වූ චෛසික තුනෙහි සැහැල්ලු භාවය කාය පස්සද්ධි නම්. විඤ්ඤාණ නම් වූ සිතෙහි සැහැල්ලු බව චිත්ත පස්සද්ධි නම්. මේ දෙක ශොභන චෛතසික දෙකකි. ශීල සමාදානයේ පටන් කුශල ධර්මයන්හි යෙදෙන අවස්ථාවන්හි දී ද, කසිණාදී පරිකර්ම භාවනා; උපචාර, අර්පණා, භාවනාවන්හිදී ද, සංස්කාර ධර්මයන් සෙවීමේදී හා අනිත්‍යාදී විසින් සැලකීමේදී ද, යන මෙතෙක් තන් හිදී උද්ධච්ච - නොසන්සුන් = ගති විනාශ කොට සිත සන්සුන් බවට පත්කරනුයේ පස්සද්ධි චෛතසික දෙකෙනි.

"පීතිමනස්ස කායොපි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති, අයං වුච්චති පීතිසම්බොජ්ඣඞ්ගො" - වි. ප. පෙර කී පීතිසම්බොජ්ඣඞ්ගයෙන් යුක්තවූ සිත් ඇතියහු ගේ වේදනාදී සකන්ධ ත්‍රය සංඛ්‍යාත කය-චෛතසික = සංසිඳෙයි. විඤ්ඤාණ සංඛ්‍යාත සිත සංසිඳෙයි. ක්‍රමයෙන් සති, ධම්මවිචය, විරිය, පීති, යන බොජ්ඣඞ්ගයන් තම සිතෙහි ඉපදීමේනුයි මේ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය ඇතිවනුයේ. ඒ අදහස මේ පාඨයෙන් පැහැදිලි කර වදාළහ. එසේ ම සමථ - විදර්ශනා වශයෙන් පවතින කාය = චිත්ත පස්සද්ධීහු තිවන් පිණිස පවත්නා බවද වදාළහ.

"අත්ථි කායපස්සද්ධි, අත්ථි චිත්තපස්සද්ධි, යදපි කාය පස්සද්ධි තදපි පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. යදපි චිත්තපස්සද්ධි තදපි පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති" - වි. ප.

කාය පස්සද්ධියක් ඇත. චිත්ත පස්සද්ධියක් ඇත. මේ දෙක ම විශේෂ ඥානය, අවබෝධය, නිර්ණය, පිණිස පවතී.

## පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය ලැබෙන අයුරු:

යොනිසොමනසිකාරය පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය ඉපදීමටත්, දියුණුවීමටත් ප්‍රධාන හේතුයි.

“අත්ථි භික්ඛවෙ කායපස්සද්ධි චිත්තපස්සද්ධි, තත්ථ යොනිසොමනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නාය වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භියොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති” වි. ප. අ. (ස. වි.)

මෙහි අදහස පෙරකී සේ යි.

තවද, ධර්ම හතක් පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය ඉපදීම සඳහා පවතී. “අපි ච සත්තධම්මා පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති”

i පණීත භොජන සෙවනතා: මිහිරි, සැහැල්ලු, ආහාර වැළඳීම.

ii උතුසුඛ සෙවනතා: සිරුරට සැපවූ දේශගුණය සේවනය කිරීම.

iii ඉරියාපථසුඛසෙවනතා: නිදීම හැර පහසු ඉරියව්වෙක විසීම.

iv මජ්ඣත්තපයොගතා: තමාට අවශ්‍ය දෑ නොලැබෙන විට තමාගේත් අනුන්ගේත් කර්මය ගැන සැලකීම.

v සාරද්ධකාය පුග්ගල පරිවජ්ජනතා: නිතර දඟලීම් හි යෙදුණු පුද්ගලයන් ඇසුරු කිරීමෙන් දුරුවීම.

vi පස්සද්ධකාය පුග්ගලසෙවනතා: මනාසේ හික්මුණු පුද්ගලයන් ඇසුරු කිරීම.

vii තදධිමුත්තතා: පස්සද්ධියට ම නැමුණු සිතැත්තෙකු වීම.

## 6. සමාධි සම්බොජ්ඣඞ්ගය

"කුසල චිත්තෙකග්ගතා සමාධි" කුසල් සිතෙහි එකඟකම නොවිසුරුණු ගතිය, සමාධි නමි. (මේ පිළිබඳ විස්තරය සමාධි භාවනාමය ඤාණයෙහි දක්වේ) සමාධියම මාර්ග ඥානයන්ට අඞ්ගවූයේ නුයි. සමාධි සම්බොජ්ඣ නමි. ශීල සමාදානයේ පටන් හැම කුශලධර්මයන්හි ම යෙදෙන, සිතෙහි තැන්පත් ගතිය මේ බොජ්ඣඞ්ගයෙන් කියැවේ.

පස්සද්ධ කායස්ස සුඛිනො චිත්තං සමාධියති" කාය චිත්ත පස්සද්ධි වලින් යුක්තව සුවසේ වසන්නහු ගේ සිත සමාහිත වෙයි. "අයං වුච්චති සමාධි සම්බොජ්ඣඞ්ගො" මෙය සමාධි සම්බොජ්ඣඞ්ගයැයි කියැයි කියනු ලැබේ. බොජ්ඣඞ්ග ධර්මයන් ගෙන් නැඟී සිටි, විදර්ශනාව යෙදුනු සමාධිය ම සමාධි සම්බොජ්ඣඞ්ග නාමය ලබන බව මේ දේශනා පාඨයෙන් දර්ශිතයි.

"අත්ථි සවිතක්කො සවිචාරො සමාධි අත්ථි අවිතක්කො අවිචාරො සමාධි, යදපි සවිතක්කො සවිචාරො සමාධි තදපි සමාධිසම්බොජ්ඣඞ්ගො -පෙ- යදපි අවිතක්කො අවිචාරො සමාධි තදපි -පෙ- නිබ්බානාය සංවත්තති.

තේරුම පෙර සේයි. මෙහි සවිතක්ක සවිචාර සමාධි යනු සංස්කාර ධර්මයන් විමසන බව්ලාවන්හිදී ද, ප්‍රථම ධ්‍යානය තෙක් ඇති සමථ භාවනාවන්හිදී ද, ඇත්තාවූ සිතෙහි එකඟකමයි, බොජ්ඣඞ්ගයට තුඩු දෙනුයේ එයින් පළමු වැන්නයි. දෙවැන්න සෙසු ධ්‍යානයන්ට තුඩු දෙන්නකි. අවිතක්ක අවිචාර සමාධි නම් ලෝකෝත්තර මාර්ගයන්හි යෙදුනු සමාධිය හා දෙවැනි, තුන් වැනි, සිව්වැනි, ධ්‍යානයන්හි ඇති සමාධියයි. ධ්‍යානයන්හි යෙදුනු සමාධිය, බොජ්ඣඞ්ග නො වන බව අටුවාව පවසයි.

### සමාධිසම්බොජ්ඣඞ්ගය ලැබෙන අයුරු

"අත්ථි භික්ඛවෙ සමථ නිමිත්තං අව්‍යග්ගනිමිත්තං තත්ථ යොනිසොමනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස -පෙ- සමාධි සම්බොජ්ඣඞ්ගය ඉපදීමට ප්‍රධාන හේතුව යොනිසොමනසිකාරය බව මේ පාඨයෙන් දක්වෙයි. මෙහි සමථ, අව්‍යග්ග, යනු නම් දෙක, සමාහිත හිතට ම යෙදුනු ඒවායි, තවද, "එකාදස ධම්මා සමාධි සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති" කරුණු එකොළොසක් සමාධිසම්බොජ්ඣඞ්ගය ඉපදීම පිණිස පවතියි.

i. **වත්ථුවිසදකිරියතා:** ඇඳුම්, පෙරවුම්, පිරිසුදුව තබාගැනීම.

ii. **ඉන්ද්‍රියසමත්තපටිපාදනා:** ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් සම බවට පත් කර ගැනීම.

iii. **නිමිත්තකුසලතා:** කසිණාදී නිමිතිවල හෝ සංස්කාරාදී නිමිතිවල හෝ භාවනා පුහුණුකරගැනීම් වශයෙන් දක්ෂකම.

iv. **සමයෙ චිත්තස්ස පග්ගණ්හතා:** සුදුසු කල සිතට රුකුල් දීම

v. **සමයෙ චිත්තස්ස නිග්ගණ්හතා;** සුදුසු කල සිතට නිග්‍රහ කිරීම.

vi. **සමයෙ සම්පහංසනතා:** සුදුසු කල සිත සතුටු කිරීම.

vii. **සමයෙ අජ්ඣුපෙක්ඛනතා:** සුදුසු කල මැදහත්වීම.

viii. **අසමාහිත පුග්ගලපරිවජ්ජනතා:** නොහික්මුණු අය දුරු කිරීම,

ix. **සමාහිතපුග්ගලසෙවනතා:** හික්මුණු අය ඇසුරු කිරීම.

x. **ඣානවිමොක්ඛ පච්චවෙක්ඛනතා:** ධ්‍යාන අෂ්ටවිමොක්ෂ සිහි කිරීම.

xi. **තදධිමුත්තතා:** සමාධියටම සිත නැඹුරු කිරීම.

## 7. උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය:

මැදහත් වීම් සවභාවය උපෙක්ඛා විමසා බලද්දී ද, අනිත්‍යාදී විසින් මෙ වූ සති ආදී සෙසු චෛතසික විසුර බවකට හෝ පත්වීමට නොදී ආර යෙදේ නම් එහිදී මැදහත් වන චෙ මෙහිදී ගතයුතු. (උපෙක්ඛාව කිස මෙසේ වෙත් කිරීමට යෙදීණ) කරුණු වූයේනුයි උපෙක්ඛාසම්බො

"සො තථා සමාහිතං චි හොති අයං වුච්චති උපෙක්ඛා

සති සම්බොජ්ඣඞ්ගයේ සිට පිළිවෙළින් සිත එකඟ කරගත් කල්හි, හෝ එසේ සමාහිතවූ සිතට මනා සේ මැදහත්වන ලද්දේ නුසී උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය නම්. අසුන් මනා සේ ගමන් කරන කල්හි මැදහත් වන සාරථියෙකු මෙනි.

“අත්ථි අජ්ඣත්තං ධම්මෙසු උපෙක්ඛා, අත්ථි බහිද්ධා ධම්මෙසු උපෙක්ඛා” යනාදී වශයෙන් දේශනා කළ ආධ්‍යාත්මික ධර්ම, බාහිර ධර්ම, දෙක්හි පවත්නා මැදහත්වීම් දෙක ම උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය බව දතයුතුය. මේ දෙකම විශෙෂ ඥානය, අවබෝධය, නිර්වාණය පිණිස පවතියි.

## උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය ලැබෙන අයුරු

යොනිසොමනසිකාරය මූලික හේතුව වන අතර, තවත් කරුණු පහක් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය ඉපදීම පිණිස පවතී.

i. සත්තමජ්ඣත්තතා: සත්වයන් පිළිබඳ මැදහත් බව, මෙය ක්‍රම දෙකකින් උපදී. “නුඹ, නුඹේම කර්මයෙන් අවුත්, නුඹේ ම කර්මයෙන් පරලොව යෙහි” යනුවෙන් තමා කෙරෙහි ද, පෙරලා මෙසේ ම අනුන් කෙරෙහි ද කර්මය ම සිතාමැදහත් වීමයි.

ii. සංඛාර මජ්ඣත්තතා: තමාගේ පිරිකර පිළිබඳ මැදහත්වීම. මෙය ද දෙවැදෑරුම් ය. අස්වාමික භාවය - අයිතිකාර යෙකු නැති බව - තාවකාලික භාවය - එවේලේට පමණක් උපකාරී වන බව යනුයි. සිවුරු, පාත්‍රාදිය තමාට අයත් බවක් ඇති නම් ඒවා දිරායාමට නොදී රැකගත හැකිය. එහෙත් කවදා හෝ තමා නො කැමැත්තෙන් වුවත් දිරායයි. මෙසේ සිතීම අස්වාමිකභාව වශයෙනි. “මේ පිරිකර වැඩි කල් නො පවතී” යනාදී වශයෙන් සිතීම තාවකාලික ක්‍රමය යි. මේ දෙවැදෑරුම් ක්‍රමයට පිරිකර පිළිබඳ සිතත්ම උපෙක්ෂාව උපදියි.

iii සත්තසඞ්ඛාරපුග්ගලකෙලායන පරිවජ්ජනතා: සත්වයන්, කෙරෙහි ද, බාහිර පිරිකර කෙරෙහි ද, “මමය, මාගේය’ යන හැඟීම් ඇති අය දුරු කිරීම.

iv. සත්තසඞ්ඛාර මජ්ඣත්තපුග්ගල සෙවනතා: පෙර කී ලෙස සත්වයන්, පිරිකර, කෙරෙහි මැදහත්වූ පුද්ගලයන් ඇසුරු කිරීම.

V. තදධිමුත්තතා: උපෙක්‍ෂාවටම නැමුණු සිතැත්තෙකු වීම.

**බොජ්ඣඞ්ග සතක් ම වීමට හේතු.**

සිතෙහි පවතින හැකුළුනු ගතිය හා විසුරුණු ගතිය නැතිවීම් වශයෙන් ද, ඒ සැම තැනකට ම අවශ්‍ය වශයෙන් ද, යන මේ කරුණු නිසා සතක් ම වේ. ඒව අඩු හෝ වැඩි හෝ නො වේ. "ලීනුද්ධච්ච පටිපක්ඛතො සබ්බත්ථිකතො ච" ලීන උද්ධච්ච යන්ට ප්‍රතිපක්‍ෂ වශයෙන්ද, සැම තැනකට ම අවශ්‍ය බැව් වශයෙන්ද සතක් ම විණ. යම් අටුවායි.

යම් මිනිසෙක් සවල්ප ගින්නක් දල්වනු කැමතිව, එහි තෙත් වූ තණද, තෙත් වූ ගොම වැරටි ද, තෙත් වූ දර ද දමන්නේ නම් දිය සහිත සුලං දෙන්නේ නම්, පස් වලින් වසන්නේ නම් හේ ඒ සවල්ප ගින්න දල්වන්ට දක්‍ෂයෙක් නො වෙයි. යම් මිනිසෙක් සවල්ප ගින්නක් දල්වනු කැමතිව වියළි තණ–ගොම වැරටි–දර, දමන්නේ නම් මුඛයෙන් පිඹින්නේ නම් පස් වලින් නොවසයි නම් හේ ඒ ගින්න දැල්වීමට දක්‍ෂයෙකි. එසේම යෝගියා තම සිත හැකුළුණු අවස්ථාවේදී පස්සද්ධි – සමාධි – උපෙක්ඛා බොජ්ඣඞ්ග ත්‍රය වඩයි නම් ඔහුට හැකුළුණු සිත නැගුටුවා ගැනුමට නොහැකි වෙයි.

"එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ ලීනං චිත්තං හොති අකාලො තස්මිං සමයෙ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, අකාලො සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, අකාලො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, තං කිස්ස හෙතු? ලීනං භික්ඛවෙ චිත්තං, තං එතෙහි ධම්මෙහි දුස්සමුට්ඨාපයං හොති"

මහණෙනි, එසේ ම යම් වේලාවෙක හැකුළුණු සිතක් වෙයිද එකල්හි පස්සද්ධි – සමාධි – උපෙක්ඛා බොජ්ඣඞ්ග වැඩීමට කාලය නො වෙයි. මක්නිසාද? මහණෙනි, හැකුළුනාවූ සිත ඒ ධර්ම වලින් නැගුටුවා ගැනුමට අපහසු වෙයි.

"යස්මිංච ඛො භික්ඛවෙ ලීනං චිත්තංහොති කාලො තස්මිං සමයෙ ධම්මවිචය – විරිය – පීතිබොජ්ඣඞ්ගස්ස භාවනාය, තං කිස්ස හෙතු? ලීනං භික්ඛවෙ චිත්තං තං එතෙහි ධම්මෙහි සුසමුට්ඨාපයං හොති" මහණෙනි, යම් වේලාවක හැකුළුනු සිතක් වෙයිද, එකල ධම්මවිචය, විරිය, පීති, බොජ්ඣඞ්ග ත්‍රය වැඩීමට කාලයයි. මක්නිසාද? මහණෙනි,

හැකුළුණු සිත ඒ ධර්මයන්ගෙන් නැගුටුවා ගැනීමට පහසු වෙයි; මෙය සවල්ප ගින්නක් දල්වාගනු කැමැත්තෙක් වියලි තණ - ගොම වැරටි - දර දමන්නාක් මෙනි, හේ එවිට ඒ ගින්න දල්වයි.

යම් වේලාවක සිත විසුරුණු ගතියක් - උද්ධච්ච වේ නම් එවිට ධම්මවිචයාදී බොජ්ඣඞ්ග තුන නො වඩා, පස්සද්ධි ආදී බොජ්ඣඞ්ග තුන වැඩිය යුතු බව ද, මේ සූත්‍රයේම සඳහන් වෙයි. එයට හේතු: විසුරුණු සිත ඒ ධර්මයන්ගෙන් සංසිඳුවා ගැනීමට අපහසුය. විශාල ගින්නක් නිවාගනු කැමැත්තෙක් වියලි තණ - ගොම වැරටි - දර ආදිය නො දමා, තෙත් වූ තණ ආදිය දමන්නේ යම්සේ ද එමෙනි.

තුන් වැනි කරුණ; හැම තැනකට ම සිහිය අවශ්‍ය බව. සිත ලීන - උද්ධච්ච භාවයන්ට පත්වූ බව දැනගැනීමටද "දැන් මගේ සිතෙහි පවතිනුයේ ධම්මවිචය ආදී බොජ්ඣඞ්ගයෙක, මේ බොජ්ඣඞ්ගයෙන් මෙවැන්නක් කෙරේ" යනාදී වශයෙන් තමන් දියුණු කරන ධර්මයන් ගෙන් සිදුවන ක්‍රියා දැනගැනීමට ද, එසේම පරිකර්ම භාවනාවේ පටන් ඊට අවශ්‍ය සෑම කරුණකදීම අවශ්‍ය වනුයේ සිහියයි. "සතිඤ්ච ඛ්වාහං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමි" මහණෙනි, මම සිහිය හැම තැනකට ම අවශ්‍ය ධර්මයෙකැයි කියමි' යනුවෙන් බුදුපියාණෝ වදාළේ එහෙයිනි.

මෙසේ කරුණු තුනක් මුල් කොට බොජ්ඣඞ්ග ධර්ම සතක් ම දේශනා කළහ,

## බොජ්ඣඞ්ග භාවනාව

මෙය මූලික කර්මස්ථානයක් නො වේ. කායානුපස්සනා කර්මස්ථානයක් දියුණු කරද්දී තම සිතෙහි ඇතිවන හැකිළීම්-ලීන- ආදී කරදර වලින් නිදහස් වීමට අවශ්‍ය වන කර්මස්ථානයකි. බොජ්ඣඞ්ග භාවනාව නො වැඩුව හොත් සිහිය, නුවණ, ප්‍රීතිය, වීර්‍යය, සැහැල්ලු බව, සමාහිත බව, යන මේවා නූපදිත්. කර්මස්ථානයෙහි ලා ඇතැම්විට නො ඇල්මත්, නැතහොත් අති ධාවනයක් - ඕනෑවට වඩා කිරීම - ඉපදීමෙන් සිත පිළිබඳ මහත් අවුල් ජාලාවක් ඇතිවෙයි. සබ්බාසව සූත්‍රය දේශනා කරද්දී භාවනාවෙන් අස්කළ යුතු ධර්ම හැටියට දැක්වූ සේක් මේ නො ඇල්ම හා අතිධාවනයයි. මෙසේ හෙයින් යෝගීහු මූලික භාවනාවක් දියුණු කරන කල්හි තම සිත පිළිබඳ විමසා, එහි එවැනි දුර්වලකම් නැතිකර ගැනුමට බොජ්ඣඞ්ග භාවනා කළයුතු.

සතිපට්ඨාන සූත්‍රයේ බොජ්ඣඞ්ග භාවනා කරන අයුරුත් එයම විදර්ශනාවට නංවන අයුරුත් දක්වෙන බැවින් මෙහි ඒ ක්‍රමය දක්වීම උචිතයැයි හැඟේ.

"කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගෙසු? ඉධ භික්ඛවෙ භික්ඛු සන්තං වා අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගං අත්ථි මෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගොති පජානාති, අසන්තං වා අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගං නත්ථි මෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගොති පජානාති, යථා ච අනුප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති, යථා ච උප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හොති, තඤ්ච පජානාති"

බොජ්ඣඞ්ග භාවනාව ක්‍රම සතරකින් පවතී.

i. තම සිතෙහි බොජ්ඣඞ්ග ධර්ම ඇත්නම් ඇතැයි දැනගැනීම.

ii. තම සිතෙහි බොජ්ඣඞ්ග ධර්ම නැත්නම් නැතැයි දැනගැනීම.

iii. නූපන් බොජ්ඣඞ්ග ධර්ම ඉපදීමක් වෙයි නම් එය ද දැනගැනීම.

vi උපන් බොජ්ඣඞ්ග ධර්ම භාවනාවෙන් සම්පූර්ණ බවක් වෙයිද එය ද දැනගැනීම යුතුයි.

මෙසේ තම සිත ගැන විමසා, නූපන් බොජ්ඣඞ්ග ධර්ම උපදවා ගැනුමටත්, උපන් බොජ්ඣඞ්ග ධර්ම දියුණුකර ගැනීමටත් මුලින් ඉපදීමේ හා දියුණුවීමේ කාරණ වූ යොනිසොමනසිකාරය ආදී කරුණු සොයා ගතයුතු වෙත්. එවිට භාවනාව සම්පූර්ණ වෙයි.

## විදර්ශනාවට නංවන අයුරු:

"ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති, බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති, සමුදය ධම්මානුපස්සී වා ධම්මෙසු විහරති වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති සමුදයවයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති අත්ථි ධම්මාති වා සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය න ච අනිස්සිතො ච විහරති න ච කිඤ්චි ලොකෙ උපාදියති, එවම්පි ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගෙසු"

මේ දේශනා ක්‍රමය සිහියේ තබාගත් යෝගියා විසින් තම සිතෙහි පවතින සති, ධම්මවිචය, වීරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන බොජ්ඣඞ්ග ධර්මයන් අනුව බලමින් වාසය කරන අතර, ඇතැම් විට බාහිර වශයෙන් පවතින බොජ්ඣඞ්ග ධර්ම ගැන ද බැලිය යුතු, මෙසේ මනාසේ විමසා ගත් පසු බොජ්ඣඞ්ග ධර්ම පෙර කී ලෙස උපදින අයුරුත් ඒවාට විරුද්ධ ධර්මයන් සේවනය කිරීමට යාමෙන් පිරිහෙන අයුරුත් දතයුතු අතර ඒ දෙකම විමසිය යුතු. එසේම සිතෙහි උපදින බොජ්ඣඞ්ග ධර්ම, බාහිර බොජ්ඣඞ්ග ධර්ම, යන දෙපක්ෂයෙහි ම ඇත්තා වූ සෑම ධර්මයන් ගේම ස්වභාවය වූ ඉපදීම, විනාශවීම, බැලිය යුතු. මේ උදය ව්‍යානුපස්සනාවය.

මෙසේ බලත්ම "මෙහි සත්වයෙක් පුද්ගලයෙක් නොමැත. ධර්ම පමණක් ඇත." යන අනාත්ම සංඥා සහිත සිත පහළ වෙයි. ඒ සිහිය හුදෙක් ඥානය, සිහිය; දියුණුවීම සඳහාය. ඒ ඥාන, සමාති, දෙක නිසා කිසි සංස්කාර ධර්මයක් තෘෂ්ණා දෘෂ්ටි දෙකින් නො අල්ලයි. දැඩි ගැන්මක් ද නො කෙරේ.

මෙනයින් බොජ්ඣඞ්ග ධර්ම භාවනාව විදර්ශනා වීථියට බැස ගමන් කරමින් සියලු සංයෝජන ධර්ම විනාශ කර මාර්ග ඵල අවබෝධ කර දෙයි.

බොජ්ඣඞ්ග විස්තරය නිමි.

## 46. "නව පාරිසුද්ධිපධානියඞ්ගානි"

සත්වයාගේ පිරිසිදු භාවයට ප්‍රධාන වූ උසස් අඞ්ග නවය, නව පාරිසුද්ධිපධානියඞ්ග නම්. "පධානියඞ්ගන්ති පරිසුද්ධභාවස්ස පධානං උත්තමං අඞ්ගං" යනු විග්‍රහයි.

"කතමෙ නවධම්මා භාවෙතබ්බා? නවපාරිසුද්ධිපධානියඞ්ගානි, සීලවිසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගං, චිත්තවිසුද්ධි – පෙ – දිට්ඨි විසුද්ධි – පෙ කඞ්ඛාවිතරණ විසුද්ධි පෙ –, මග්ගාමග්ග ඤාණ දස්සනවිසුද්ධි – පෙ – පටිපදාඤාණදස්සන විසුද්ධි – පෙ – ඤාණදස්සන විසුද්ධි පෙ – පඤ්ඤා විසුද්ධි – පෙ – විමුත්ති විසුද්ධි – පෙ – ඉමෙ නව ධම්මා භාවෙතබ්බා" – දී. නි. දසුත්තර සූත්‍රය.

**1. සීලවිසුද්ධිපාරිසුද්ධිපධානියඞ්ගය.**

"විසුද්ධිං පාපෙතුං සමත්ථං චතුපාරිසුද්ධිසීලං" විශුද්ධිය සඳහා පැමිණවීමට හැකි සිව් පිරිසිදු සිල්, සීලවිසුද්ධිපාරිසුද්ධිපධානියඞ්ග නම්. සිත කෙලෙස් වලින් පිරිසිදු වීමෙහිදී මෙය ප්‍රධාන කරුණක් වෙයි. සීලමය ඤාණ විස්තරයේදී පැහැදිලි වන බව සිහි කටයුතු.

**2. චිත්තවිසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගය.**

"චිත්තවිසුද්ධීති විපස්සනාය පදට්ඨානභූතා අට්ඨසමාපත්තියො" විදර්ශනාවට පදනම වූ අෂ්ට සමාපත්තීහු චිත්තවිසුද්ධියයි. එය කාමච්ඡන්දාදී නීවරණ ධර්මයන් කෙරෙන් සිත පිරිසිදු වීමෙහිලා ප්‍රධාන වන හෙයින් චිත්තවිසුද්ධිපාරසුද්ධිපධානියඞ්ග නම්. අෂ්ට සමාපත්තීහු නම් රූපාවචර ධ්‍යාන සතර හා අරූපාවචර ධ්‍යාන සතරය. විස්තර මතුවටයි.

**3. දිට්ඨිවිසුද්ධි පාරිසුද්ධි පධානියඞ්ගය.**

දිට්ඨිවිසුද්ධීති සප්පච්චය නාමරූප දස්සනං" ප්‍රත්‍ය සහිත නාම රූප දැකීම දිට්ඨි විසුද්ධියයි. සත්වයෙක්ය, පුද්ගලයෙක්ය" යනාදී මැරදි හැඟීම් වලින් සිත පිරිසිදු වීමෙහිදී මෙය ප්‍රධාන, උසස්, අඞ්ගයක්-කරුණක් - වෙයි. එහෙයින් පාරිසුද්ධිපධානියඞ්ග නම්. විස්තර ධම්මට්ඨිතිඤාණයේදී ය.

**4. කඞ්ඛාවිතරණ විසුද්ධි පාරිසුද්ධි පධානියඞ්ගය.**

"කඞ්ඛාවිතරණවිසුද්ධීති පච්චයාකාර ඤාණං" කඞ්ඛාවිතරණ විසුද්ධි යනු ප්‍රත්‍ය ධර්මයන් අතීතාදී තුන් කාලයෙහිම පවතින අයුරු දක්නා නුවණයි. "මේ සත්වයා කොහි සිට ආයේද? යනාදී වශයෙන් පවතින සැක කෙලෙසක් දුරුවී සිත පිරිසිදු වීමට උසස් කරුණක් නිසා පාරිසුද්ධිපධානියඞ්ග නම්

**5. මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගය.**

මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධීති උදයබ්බයානුපස්සනාකාලෙ උප්පන්නානං ඔභාස, ඤාණ, පීති පස්සද්ධි, සුඛ, අධිමොක්ඛ, පග්ගහ, උපට්ඨාන, උපෙක්ඛා, නිකන්තීති, දසවිපස්සනුපක්කිලෙසා අමග්ගො, වීථිපටිපන්නං උදයබ්බය ඤාණං මග්ගොති එවං මග්ගාමග්ගෙ ඤාණං නාම."

සංස්කාර ධර්මයන් පිළිබඳ උදය - ඉපදීම, වය = විනාශය යන උදයබ්බයට අනුව බලන්නා වූ අවස්ථාවේදී උපන්නා වූ ආලෝකය, විදර්ශනා ඥානය, ප්‍රීතිය, සැහැල්ලු ගතිය, සැපය, අධික ශ්‍රද්ධාව, උත්සාහය, වැටහීම, මැදහත්වීම, සියුම් තෘෂ්ණාව යන විදර්ශනාව කිලුටු කරන ධර්ම දසය, විදර්ශනා මාර්ගය නොවේය, විදර්ශනා වීථියට බැස ගත් උදයබ්බය ඤාණය මාර්ගයය, මෙසේ අමාර්ගය මාර්ගය දැන ගන්නා වූ නුවණ මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධියයි. විදර්ශනා උපක්ලේශයන් ගෙන් සිත පිරිසිදු කරන හෙයින් පධානියඞ්ග නම්.

6. පටිපදාඤාණදස්සන විසුද්ධිපාරිසුද්ධිපධානියඞ්ගය.

“පටිපදා ඤාණදස්සන විසුද්ධීති වීථිපටිපන්නානං නවවිපස්සනා ඤාණානි” විදර්ශනා වීථියට පිළිපන් විදර්ශනා ඥාන නවය පටිපදා ඤාණ දස්සන විසුද්ධි නම්. මෙය නිත්‍ය, සුභ, සුඛ, ආත්ම, යන වැරදි හැඟීම් දුරු කරන හෙයින් පාරිශුද්ධිපධානියඞ්ග නම්.

නව විදර්ශනා ඥාන; උදයව්‍ය ඥානය, භඞ්ග ඥානය, භය ඥානය, ආදීනව ඥානය, නිර්විද්‍යා ඥානය, මුඤ්චිතුකම්‍යතා ඥානය, ප්‍රතිසංඛ්‍යා ඥානය, සංස්කාරෝපෙක්ෂා ඥානය, අනුලෝම ඥානය යනුයි. විස්තර මතු දැක්වෙයි,

7. ඤාණදස්සන විසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගය.

“ඤාණදස්සන විසුද්ධීති චතුඅරියමග්ගඤාණං” ආර්ය මාර්ග ඥාන සතර ඤාණ දස්සන විසුද්ධි නම්. සියලුම කෙලෙස් අවස්ථා සතරකදී සහමුලින්ම විනාශ කොට පිරිසිදු කරන හෙයින් පාරිසුද්ධිපධානියඞ්ග නම්.

8. පඤ්ඤා පාරිසුද්ධි පධානියඞ්ගය.

“පඤ්ඤාති අරහත්ත ඵල පඤ්ඤා” අර්හත් ඵලය හා යෙදුණු නුවණ ප්‍රඥාවයි. සියලු දුක් වලින් නිදහස් වූ හෙයින් මෙය පාරිශුද්ධි පධානියඞ්ග වශයෙන් එයි.

9. විමුත්ති පාරිසුද්ධි පධානියඞ්ගය.

“විමුත්තීති අරහත්තඵල විමුත්ති” අර්හත් ඵල වශයෙන් හැම අයුරින්ම මිදීම විමුක්තියි. එනම් නිර්වාණයයි නිර්වාණය පාරිසුද්ධිපධානියඞ්ගයකි.

ශ්‍රුතමය ඥාණයට ඇතුලත් භාවිතව්‍ය ධර්ම නිර්දේශයේ එකකාදී ධර්ම දසයෙන් අවශ්‍යයෙන් ම දතයුතු, එසේම වැඩිය යුතු, භාවනා කොටස් කීපයක්ය මෙසේ දක්වූයේ. සමථ – විදර්ශනා දෙකම වැඩිය යුතුය. යනු කෙටි හැඳින්වීමයි. මෙසේ යම් යම් ධර්ම සමූහයක් වඩනා ලද්දාහු වෙත් ද, ඒ ඒ සියලු ධර්මයෝ තම තමාට අයත් කෘත්‍ය ඇත්තාහුය. මේ වශයෙන් දැනීම ඥානයයි. හැම අයුරින්ම දැනීම ප්‍රඥායයි. එහෙයින් මේ ධර්මයෝ වැඩිය යුත්තාහයි වදාළ ධර්ම සමූහය සොතාවධාන නම්. ඒ බව දැන ගන්නා ප්‍රඥාව ශ්‍රුතමය ඥාණයයි කියනු ලැබේ.

හයවැනි පරිච්ඡේදය නිමි.

# 7 වැනි පරිච්ඡේදය.

## 47. සච්ඡිකාතබ්බ නිද්දෙසයෙහි එකකාදී දසධම්ම:

"කෙසේ නම් මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහයි වදාළ ධර්ම ශ්‍රොතාවධාන නම් වේද? එය දැනගන්නා වූ ප්‍රඥාව සුතමය ඥාණය නම් වේද? එක් ධර්මයක් ප්‍රත්‍යක්ෂ කළ යුතුය. එනම් නො පිරිහෙන චෙතො විමුත්තියයි කියන ලද අර්හත් ඵලය යි. ධර්ම දෙකක් -පෙ- විද්‍යාවත් විමුක්තියත්ය. ධර්ම තුනක් -පෙ- ත්‍රිවිද්‍යාවෝය. ධර්ම සතරක් -පෙ- ඵලසතරය. ධර්ම පහක් -පෙ- ස්කන්ධපසය. ධර්ම සයක් -පෙ- අභිඥාසය. ධර්ම සතක් -පෙ- ක්ෂීණාශ්‍රවයන් ගේ බල සතය. ධර්ම අටක් -පෙ- විමොක්ෂ අටය. ධර්ම නවයක් -පෙ- පිළිවෙළින් නිරුද්ධ කළයුතු ධර්ම නවය. ධර්ම දසයක් -පෙ- අශෛක්‍ෂ ධර්ම දසය. මහණෙනි, සියල්ල ප්‍රත්‍යක්ෂ කළ යුතුය" ප. ම. සිං. ප.

මෙසේ ප්‍රධාන වශයෙන් ධර්ම පස් පණසක් ප්‍රත්‍යක්ෂ කළ යුතු යැයි වදාළ බව පටිසම්භිදාමග්ගයෙහි දැක්වෙයි. කවද, සියල්ල ප්‍රත්‍යක්ෂ කළයුතු යැයි දේශනා කළ ධර්ම සමූහයට ඇස, රූපය, ඇසෙහි උපන් සිත, එහින් හටගත් ස්පර්ශය, වේදනාව මේ ආයතනයන් පිළිබඳවද, පඤ්චස්කන්ධය පිළිබඳවද, මේ ආදී ධර්ම රාශියක් ඇතුළත් වෙයි. ඒ හැම නො දක්වා, ඉතා කෙටියෙන් මතු විස්තර නො වන කරුණු කීපයක් මෙහිලා දැක්වෙයි.

## 48. අකුප්පා චෙතොවිමුත්ති.

මේ අර්හත් ඵල විමුක්තියට නමකි. කවර කරුණකින් නමුදු දූෂ්‍ය නො වන, නො සෙලවෙන, නො පිරිහෙන හෙයින් "අකුප්පා" නම් වෙයි. ඒ එසේම ය. අර්හත් ඵලය සියලු කෙලෙසුන් ගෙන්, සියලු ස්කන්ධයන් ගෙන්, සියලු මාරයන් ගෙන්, මිදුනු, සඳ සුවය සලසන, හැම අයුරින්ම පිරිසුදු ඉතා සැනසීමක් ඇති දෙයකි. තත්වයකි. එහෙයින් කිසිදු කරුණක් නිසා නමුත් එයට හානියක් නොවේ. ඉන්ද්‍රඛීලයක් මෙනි. "ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි අකුප්පා මෙ චෙතො විමුත්ති අයමන්තිමා ජාති නත්‍ථිදානි පුනබ්භවොති - ධම්මචක්කසූත්‍රය - මට අර්හත් මාර්ග නමැති ඥාන දර්ශනයක් පහළ විය. මගේ චිත්තවිමුක්තිය

සො පෙල්වෙයි. මේ අන්තිම ජාතියයි දත් නැවත ඉපදීමක් නැත.' යනුවෙන් සඳහන් වූයේ තමන් වහන්සේ ලබාගත් අර්හත් මාර්ගය, එම ඵලය ඉතා සපිර වූවක් හෙයිනි.

අකුප්පා චෙතො විමුත්තිය, ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්ම සමූහය අතුරෙන් ප්‍රධාන එකකි: බුදුපියාණන් වහන්සේට සියල්ල දැන ගන්නා නුවණ ද පහළ වූයේ මේ ධර්මයෙනි.

## 49. "සත්තඛීණාසව බල."

රහතන් වහන්සේලාගේ බල සත.

i. දුක්ඛසච්චපටිවෙධො: දුක්ඛ සත්‍යාවබෝධය.

"යං භික්ඛවෙ ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සංඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති ඉදම්පි භික්ඛවෙ ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවාති"- ප. ම. අ. (ස. ප.)

මහණෙනි, ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් යම් බලයක් කරණ කොට අනිත්‍ය වශයෙන් සියලු සංස්කාර ධර්මයෝ තත් වූ පරිද්දෙන් මනා නුවණින් දක්නා ලද්දාහු වෙද්ද, මහණෙනි, ක්ෂීණාශ්‍රව භික්ෂුව ගේ මෙය ද බලයෙකි. මේ බලය නිසා ක්ෂීණාශ්‍රව භික්ෂු "මගේ ආශ්‍රවයෝ ගෙවීගියාහුය"යි ආශ්‍රවයන් ගේ විනාශය ප්‍රතිඥා කරයි, හඟවයි.

කරුණු මෙසේ හෙයින් දුඃඛ සත්‍යයාගේ අවබෝධය රහතන් වහන්සේට ඇති බලයක් බව දතයුතු.

ii. සමුදය සච්චපටිවෙධො: සමුදය සත්‍යාවබෝධය.

"පුන ච පරං භික්ඛවෙ ඛීණාසවස්ස භික්ඛුනො අඞ්ගාර කාසූපමා කාමා නි යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති' මහණෙනි, නැවතද ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් කාමවස්තූහු ගිනිගෙන දිලිසෙන අඟුරු වලකට උපමා යැයි මනා නුවණින් තත් වූ පරිදි දක්නා ලද්දේ වෙද්ද" යන මෙයින් රහතන් වහන්සේලාගේ දෙවැනි බලය දක්වූ සේක. සංස්කාර ධර්මයන් ගේ ඉපදීමට හේතුවූ තෘෂ්ණාව නිසා කාමවස්තු හටගනී. ඒ කාමවස්තු ගිනි ගෙන දිලිසෙන අඟුරු වලකට උපමා කොට බලන්නම ඒවාට හේතු වූ තෘෂ්ණාව ද දක්කේ වෙයි. මේ දැකීම තත් වූ පරිදි මනා

නුවණින් කෙරෙන හෙයින් එය බලයෙකි, මක්නිසාද? නැවත ඒ සිත කාමවස්තුන්ට බර නො වන හෙයිනි. මේ බලය කරණ කොට රහතන් වහන්සේලා "මගේ ආශ්‍රවයෝ ගෙවීගියාහුය"යි හඟවත්.

iii. නිරොධ සච්ච පටිවෙධො: නිර්වාණාවබෝධය.

"පුන ච පරං භික්ඛවෙ ඛීණාසවස්ස භික්ඛුනො විවේක නින්නං චිත්තං හොති විවේක පොණං විවේක පබ්භාරං විවෙකට්ඨං නෙක්ඛම්මාභිරතං ඛ්‍යන්තිභූතං සබ්බසො ආසවට්ඨානීයෙහි ධම්මෙහි"

ආශ්‍රවයන්ට හේතුවූ ධර්මයන් කෙරෙන් හැම අයුරින්ම ගෙවීම් බවට ගිය = ආශ්‍රව නැති - විවේකයට නැමුණු සිතක් තිබීම තුන්වැනි ඛීණාසව බලයයි. මේ බලය නිසා උන්වහන්සේ ආශ්‍රවයන් ගෙවීගියාහු යයි හඟවත්. මෙයින් නිරෝධ සත්‍යය දක්වූ සේක.

iv. මග්ගසච්චපටිවෙධො: මාර්ගසත්‍යාවබෝධය.

"පුන ච පරං භික්ඛවෙ ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා" සතර සතිපට්ඨානයන් මනා ලෙස වඩා අවසන් කිරීම සිවුවැනි බලයයි.

V පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි.

ශ්‍රද්ධා; ස්මෘති, වීර්‍ය, සමාධි, ප්‍රඥා යන ඉන්ද්‍රිය ධර්මයන් මනා ලෙස වඩා අවසන් කල බව පස්වැනි බලයයි.

vi. සත්තබොජ්ඣඞ්ගා භාවිතා හොන්ති සුභාවිතා:

බොජ්ඣඞ්ග ධර්ම සත මනාසේ වඩා අවසන් කිරීම බලයකි.

vii. අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො:

සම්මාදිට්ඨි ආදී මාර්ගාඞ්ග අට වඩා අවසන් කළ බව සත්වැනි ශෛක්ෂ බලයයි. මේ බලය නිසා ද රහතන් වහන්සේ "මගේ ආශ්‍රවයෝ ගෙවීගියාහුයැ"යි හඟවයි. සිවුවැනි බලයේ සිට ඇති මේ සතර ම මාර්ග සත්‍යයයි. මෙසේ සිවුසස් අවබෝධය ක්ෂීණාශ්‍රව බල බව කෙටියෙන් දතයුතු.

50. "නව අනුපුබ්බ නිරොධා" පිළිවෙලින් නැවැත්වෙන ධර්ම නවය.

i. ප්‍රථමධ්‍යානයට සමවැදුනහු ගේ කාමසංඥා, නවතී. පස්කම් හැඟීම.

ii. ද්විතීය ධ්‍යානයට සමවැදුනහු ගේ විතර්ක, විචාර, දෙක නවතී.

iii. තෘතීය ධ්‍යානයට සමවැදුනහු ගේ ප්‍රීති ධ්‍යානාඞ්ගය නවතී.

iv. චතුර්ථ ධ්‍යානයට සමවැදුනහු ගේ ආශ්වාස, ප්‍රශ්වාස දෙක නවතී.

v. ආකාසානඤ්චායතන ධ්‍යානයට සමවැදුනහු ගේ රූපසඤ්ඤා කසිණාරම්මණ නවතී.

vi. විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට සමවැදුනහු ගේ ආකාසානඤ්චායතන සඤ්ඥාව නවතී.

vii. ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට සමවැදුනහු ගේ විඤ්ඤාණඤ්චායතන සංඥාව නවතී.

viii, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට සමවැදුනහු ගේ ආකිඤ්චඤ්ඤායතන සංඥාව නවතී.

x. සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියට සමවැදුනහුගේ සංඥා, වෙදනා දෙක නවතී.

මේය අනුපූර්ව නිරොධ ඥානය.

ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්ම සමූහය ද සොතාවධාන නමි. එය දැන ගන්නාවූ ප්‍රඥාව සුතමය ඥානයයි. මෙහි විස්තර නො කළ ඇතැම් කොටස් මතුවට සම්බන්ධයි.

## 51. හානභාගියාදී ධර්ම චතුෂ්කය:

"කෙසේ නම් මේ ධර්මයෝ පිරිහීම් පක්ෂයෙහි වූහ. මේ ධර්මයෝ සිටිති පක්ෂයෙහි වූහ. මේ ධර්මයෝ විශෙෂ පක්ෂයෙහි වූහ. මේ ධර්මයෝ කලකිරීම් පක්ෂයෙහි වූහ"යි මදාළ ධර්ම සමූහය සොතාවධාන නම වේද? එය දැනගන්නාවූ ප්‍රඥාව සුතමය ඥානය නම් වේද?" – ප. ම. සිං. ප.

බුදුරජාණන් වහන්සේ හානභාගිය ආදී ධර්ම සමූහය දේශනා කිරීම සඳහා මේ ප්‍රශ්න මාලාව නැගූ සේක. එහි කොටස් සතරෙකි. හානභාගිය, ඨිතිභාගිය, විසෙසභාගිය, නිබ්බෙධභාගිය

යනුයි. මේ සතර ප්‍රථමධ්‍යානාදී ධ්‍යාන අටට බෙදී යාමෙන් දෙතිස් ආකාර වේ. ඒ හැම මුල් ප්‍රශ්නයන්ට පිළිතුරු වන අතර ශ්‍රුතමය ඤාණයට ඇතුලති. පිරිහීමට තැමුණු ධ්‍යාන හානභාගියයි. පිරිහීමක් ද දියුණුවීමක් ද නැතිව සිටි ධ්‍යාන ඨිතිභාගිය යි. දියුණු වීමට තැමුණු ධ්‍යාන විශෙෂ භාගියයි. කලකිරීම සඳහා, එනම් මාර්ග ඥාන සඳහා තැමුණු ධ්‍යාන නිබ්බෙධ භාගියයි.

ප්‍රථම ධ්‍යානය ලැබූ තැනැත්තාට කාමසහගත හැඟීම් පවතී නම් ඒ හානභාගිය ධර්මය, ඒ ධ්‍යානයා අනුව ම සිහිය නැවතී සිටියේ නම් ඨිති භාගිය යි. දියුණුව සඳහා පවතින අවිතර්කාදි අනුව ගිය මෙනෙහි කිරීම් පැවතීම විශෙෂ භාගියයි. ලෝකෝත්තර මාර්ගය සෙවීම් වශයෙන් පවතින මනස්කාර නිබ්බෙධ භාගියයි. සෙසු ධ්‍යානයන් ද මේ අනුව සිතාගතයුතු.

ඉක්බිති ශ්‍රුතමය ඤාණයට ඇතුලත් වනුයේ අනිත්‍යාදි ලක්ෂණත්‍රය, ආර්‍යසත්‍ය සතර, යන මොහුය. විස්තර මතුවටය.

හානභාගියාදී ධර්ම චතුෂ්කය නිමි.

මෙතෙකින් පරිච්ඡෙදයාදී ධර්ම කොටස් විස්තර අවසාන කරමි. විස්තර නො කළ බොහෝ කරුණු මතු ඤාණයන්ට සම්බන්ධ බව සැලකිය යුතු.

ශාන්තිනායක බුදුරජාණන් වහන්සේ පෙර දක්වූ පරිදි විශත්‍යාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි ඒ ඒ බුදුරජාණන් වහන්සේලා ගේ මනොහර දේශනාවන්ට කන් යොමුකළ හෙයින් මෙසේ නොයෙක් අයුරින් බෙදීගිය, මුළු මහත් ත්‍රිපිටකයට ඇතුලත් ධර්ම රාශියක් පිළිබඳ කිසිදු අඩුවක් නො මැතිව දැන ගැනීමේ මහා ශ්‍රුතමය ඤාණයකින් යුක්තවූ සේක.

“ශ්‍රුතමය ඤාණ කථා නිමි”

## 8. වැනි පරිච්ඡේදය

# 2. සීලමය ඤාණය

'සුත්වාන සංවරෙ පඤ්ඤා, සීලමයෙ ඤාණං' අසා හික්මීමෙහි නුවණ සීලමය ඤාණයයි. සුතමය ඤාණයට අතුලත් වූ ධර්ම රාශිය මනා ලෙස ශ්‍රවණය කර ඒවා අනුව හික්මීමෙහි නුවණ සීලමය ඤාණ නමැයි දතයුතු.

මෙහි ශීලය, ශීලමය, ශීලමය ඥානය, යන පද ත්‍රය පිළිබඳ විස්තරය ප්‍රථමයෙන් විමසිය යුතු.

සීල යනු හික්මීම යි. "එසො සීලනට්ඨෙන සීලං" මෙහි හික්මීම යන තේරුමෙන් සීල නම් යනුවෙන් විග්‍රහ කෙරේ. හික්මීම දෙයාකාරයකින් සිදුවේ. සමාධානය, උපධාරණය, යනුයි. කාය, වචන, දෙකත් කෙරෙන මැඩ, සිල්වත්වීම වශයෙන් ලකා කර ගැනුම සමාධානය යි (සං+ආධාන=මනාසේ තැබීම) කුශල ධර්මයන් ගේ පිහිටීම් වශයෙන් ආධාර වීම උපධාරණය යි සිල් වතා විපිළිසර-පසු තැවිලි - නොවේ. ඒසමාධානාර්ථය ඇති බැවිනි. අසවල් අසවල් සික පදය කැඩුනේය, යි සිතා පසුතැවිලි වීම විපිළිසර නම්. සිල්වතාට කුශල ධර්මයන් පිහිටීමේ ගතියක් පවතී (ධ්‍යාන, මාර්ග-ඵල) ඒ උපධාරණාර්ථය ඇති හෙයිනි. දුශ්ශීලයාට කුශල ධර්මයන් පිහිටීමේ ගතියක් නැත.

"සීලමෙව පකතං සීලමයං" ශීලය නිසා ම සෑදුනේ සීල මය නම්. රිදියෙන් සෑදූ දෙය රිදීමය, ලෝහයෙන් සෑදූ දෙය ලෝහමය, කියන්නාක් මෙනි. සීලමය හා යෙදුනු නුවණ සීලමය ඤාණ නම් වේ

සීලමය ඤාණයට ඇතුලත් වූ ප්‍රධාන කරුණු -

1. අසංවරයෙහි ආදීනව ප්‍රත්‍යවේක්ෂා කිරීම.

2. සංවරයෙහි ආනිසංස ප්‍රත්‍යවේක්ෂා කිරීම.

3. සංවරයෙහි පාරිශුද්ධිය ප්‍රත්‍යවේක්ෂා කිරීම.

4. සංවරයෙහි කිළුටුවීම පිරිසුදු කර ගැනීම ප්‍රත්‍යවේක්ෂා කිරීම,

මේ සතර සීලමය ඤාණයට ඇතුළත්ය. මෙයින් අදහස් කරනුයේ දුශ්ශීල භාවයෙහි දොෂ, ශීලවන්ත භාවයෙහි ආනිශංස, ශීලයෙහි පිරිසුදු බව, සීලයෙහි කිළුටුවීම හා පිරිසුදු වීම, යන මේ කරුණු මනාසේ නුවණින් සිහිකර බැලීම සීලමය ඤාණයෙන් සිදු කෙරෙන්නක් බවය. සීලමය ඤාණය සිල්වතෙකු ගේ පදනම යි.

## සීලයෙහි ලක්ෂණ, රස, ප්‍රත්‍යුපස්ථාන, පදස්ථාන;

ලක්ෂණ යනු ස්වභාවයයි. හැටියි. සීලයෙහි ස්වභාවය හික්මීමයි පෙර සඳහන් සමාධාන, උපධාරණ, යන ක්‍රම දෙකින් යුක්ත වූ සීලතය ම - හික්මීම මෙහි ලක්ෂණ බව දතයුතුය. තේරුම් ලිහිල් කරගැනුමට උපමාවක් ඇත. නිල්, රතු, කහ, ආදී වශයෙන් ලෝකයේ පවතින නොයෙක් රූපයන්හි ඇත්තේ එකම ස්වභාවයකි එනම් පෙනෙන ගතියයි. පාට නොයෙක් අයුරු වුවත් ඒ හැම පෙනෙන ගතියක් උසුලයි. එමෙන් නොයෙක් සීල කොටස් දක් වුවත් ඒ හැම කොටසකම ඇත්තේ එකම ස්වභාවය යි. එනම් හික්මෙන ගතිය යි. සීලනලක්ෂණය යි සඳහන් වූයේ එයට ය.

'සීලනං ලක්ඛණං තස්ස - භින්නස්සාපි නෙකධා
සනිදස්සනත්තං රූපස්ස - යථාභින්නස්සනෙකධා''- ව. ම.

නොයෙක් අයුරින් බෙදීගිය රූපයන්ගේ ලක්ෂණය - හැටි-සනිදර්ශන භාවයයි. පෙනෙන ගතිය යි. එමෙන් නොයෙක් අයුරින් බෙදීගිය සීලයන් ගේ ලක්ෂණය ද හික්මීම යි

ii රස: රස නම් කෙරෙන වැඩයයි සීලයෙහි රස දෙකකි. කෘත්‍ය රසය හා සම්පත්ති රසයයි එනම් අත්හැරීම හා ලැබීමය.

''දුස්සීල්‍ය විද්ධංසනතා - අනවජ්ජගුණා තථා
කිච්චසම්පත්ති අත්ථෙන - රසො නාම පවුච්චති''

දුශ්ශීල භාවය විනාශ කිරීම ද, නිරවද්‍ය ගුණ ලැබීම ද, කෘත්‍ය සම්පත්ති අර්ථයෙන් රසය යි කියනු ලැබේ. අත්හැරිය යුත්තේ දුසිල් බවය. ලබාකරගත යුත්තේ ධ්‍යානාදී නිවැරදි ගුණය. මේ දෙක ම සීලයෙන් සිදු කෙරේ. රස යනු එයයි

iii **පච්චුපට්ඨාන:** වැටහෙන කාරණය යි. එනම් හැඟෙන දේය. සීලයෙහි වැටහෙන කරුණ පිරිසුදු බවයි, සිල්වතා තමා ගැන හැරී නුවණින් බැලූ කල්හි තමාගේ කය, වචන, සිත, යන තුන් දොර ම පිරිසුදු බව අවබෝධ කර ගනියි. එය පච්චුපට්ඨානය.

iv **පදට්ඨාන:** ආසන්න කාරණය යි. ළඟ ම ඇති දේය. සීලයෙහි ආසන්න කාරණය ලජ්ජා, බිය, දෙකයි. මේ නිසා දුසිල් වීමට නො හැක. හිරි, ඔතප්, දෙක නැති තැන මිනිසා තිරිසනෙකි. එහෙයින් සීලයෙහි මූල කරුණක් දෙනෙකා හිරි, ඔතප්, දෙක වේ.

"සොචෙය්‍ය පච්චුපට්ඨානං - තයිදං තස්ස විඤ්ඤුහි
ඔත්තප්පඤ්ච හිරිඤ්චෙව - පදට්ඨානන්ති වණ්ණිතං"

සීලයාගේ පිරිසුදු බව වැටහෙන කාරණයැයි ද, හිරි ඔතප් දෙක ආසන්න කාරණයැයි ද නුවණැත්තන් විසින් වර්ණනා කරන ලදී.

## සීලයෙහි ආනිසංසා:

සීලයෙහි ප්‍රධාන ආනිශංසය අවිප්පටිසාරයයි. විපිළිසර- පසු තැවීම් - නො වීමයි. "අවිප්පටිසාරත්ථානි බො ආනන්ද කුසලානි සීලානි, අවිප්පටිසාරානිසංසානි" ආනන්දය, යහපත් සිල විපිළිසර නො වීම අනුසස් කොට ඇත්තේ ය. විපිළිසර නො වීම ගෝරුම කොට ඇත්තේ ය.

"අකතං දුක්කටං සෙය්‍යො - පච්ඡා තපති දුක්කටං
කතං ච සුකතං සෙය්‍යො - යං කත්වා නානුතප්පති"

- ධම්මපදය

අකුශලය නො කිරීම මැනවි. අකුසලය පසුතැවිලි ඇති කරයි. යමක් කොට නො තැවෙයි නම් එබඳු දෑ කිරීම මැනවි.

තවද සීලයාගේ ආනිසංස පසක් අඞ්ගුත්තර නිකායේ පඤ්චක නිපාතයෙහි සඳහන් වෙයි.

"පඤ්චිමෙ ගහපතයො ආනිසංසා සීලවතො සීලසම්පදාය" ගෘහපතියනි, සිල්වතාගේ සීලසම්පත්තිය නිසා මේ ආනිසංස පසකි. මෙසේ දක්වෙන සිල් අනුසස් පස කෙටියෙන් මෙහිලා දක්වමි.

i සිල්වතා නො පමාව හේතුකොට ගෙන මහත් වූ වස්තු සමූහයක් ලබයි.

ii සිල්වතා ගේ යහපත් ගුණ ඝෝෂාවක් පැන නගියි.

iii කවර පිරිසක් අතරට වුවත් බිය නැතිව එළඹෙයි.

iv මරණ මොහොතෙහි දී නො මුලා වී කළුරිය කරයි.

v මරණින් පසු චාතුම්මහාරාජිකාදී සදිව්‍යලෝකයන්හි උපදියි.

තවද, තමන් ඇසුරු කරන පිරිසගෙන් ගෞරවය, ආදරය, ආදී සැලකිය යුතු තත්වයක් ලබා ගැනීමට නම් සිල්වත් විය යුතුය. සිල්වතාට නුවණැති කවර කෙනෙක් වුවත් ප්‍රශංසා කරත්. ගුණ පතුරුවත්. ශාසනයෙහි පැවිදි වූ කුල පුත්‍රයන්ට සීලය හැර අන් පිහිටක් නො මැත. මුළු රටෙහි ගලා බසින සියලු ගංගා ජලය ඇරගත් නමුදු සත්වයන් ගේ කෙලෙස් කහට සේදීමට නො හැක. එහෙත් සීල නමැති ජලයෙන් සියලු කෙලෙස් කහට සෝදා හැරීමෙන් නිර්මල වේ. ජල රැඳුනු සුළඟින් හෝ සුදු හඳුන් ආදී සුවඳ හමන ද්‍රව්‍යකින් හෝ මැණික්, සඳරැස්, ආදී ද්‍රව්‍යකින් හෝ සත්වයන් ගේ කෙලෙස් පරිලාහය-දැවිලි ගතිය. සංසිඳීමට කිසිසේත් නො හැකි වෙයි එනමුත් ඉතාමත් සිසිල් වූ ආර්‍යයන් සතු සීලයෙන් ඒ සියලු පරිලාහ සංසිඳෙයි.

"යො ච වස්සසතං ජීවෙ - දුස්සීලො අසමාහිතො
එකාහං ජීවිතං සෙය්‍යො - සීලවන්තස්ස ඣායිනො"

-ධම්මපදය

යමෙක් දුශ්ශීලව, සිතෙහි එකඟ කමක් නො මැතිව අවුරුදු සියයක් ජීවත් වනවාට වඩා, සිල්වත්, සිතෙහි එකඟ කමක් ඇති තැනැත්තහුගේ එක් දිනක් ජීවත්වීම උතුම්ය. මෙසේ සීලයාගේ ආනිශංස රාශියක් පවතී.

(මජ්ඣිම නිකායේ මූලපණ්ණාසකයෙහි ආකංඛෙය්‍ය සූත්‍රය බලන්න.)

## සීලයෙහි ප්‍රභේද - බෙදීම්.

සීලයෙහි ප්‍රභේද රාශියකි. ඒ හැම දැක්වීම උග්හට යැ. එසේ වුවත් අප සැම ට අවශ්‍ය, සීලමය ඥාණයට ද ඇතුලත්, සිල්

කොටස් කීපයක් මෙහිලා දක්විය හැක. පෙර කී නික්මීම් අවි යෙන් සීලය එක් වැදෑරුම්ය. චාරිත්‍ර-වාරිත්‍ර, ආභිසමාචාරික-ආදි බ්‍රහමචරියක, ලෞකිය-ලෝකුත්තර, වශයෙන් දෙවැදෑරුම් ය. හීන මධ්‍යම-උත්තම, අත්තාධිපතෙය්‍ය ලෝකාධිපතෙය්‍ය ධම්මාධිපතෙය්‍ය, වශයෙන් තෙවැදෑරුම්ය, හානභාගිය-ඨිතිභාගිය-විසෙස භාගිය-නිබ්බෙධභාගිය, පකති-ආචාර-ධම්මතා පුබ්බහෙතුක, ප්‍රාතිමොක්ෂ සංවර, ඉන්ද්‍රියසංවර, ආජීවපාරිශුද්ධි, ප්‍රත්‍යසන්නිශ්‍රිත, වශයෙන් සිවුවැදෑරුම්ය. පස්වැදෑරුම් සිල් කොටස් මතුවට යෑ.

i චාරිත්‍ර ශීලය: පැවතිය යුතු සිරිත්හි යෙදීම චාරිත්‍ර ශීලය යි. කුල, ජාති, ගොත්‍ර, ප්‍රදෙශ, යනාදී වශයෙන් පැවත ගෙන එන යම් යම් හොඳ සිරිත් වෙත් නම් ඒවාහි යෙදීම මෙයින් කියැවේ. සාමාන්‍ය අදහස යි. සීලමය කුසණයට ඇතුලත් වනුයේ විශෙෂ චාරිත්‍ර ශීලයකි. එනම්: බුදු, පසේබුදු, මහරහත්, යන උතුමන් විසින් ගෙන ආ ඉතා උසස් සිරිත් හි යෙදීම චාරිත්‍ර ශීල නම්. නැතහොත් "යං භගවතා ඉදං කත්තබ්බන්ති පඤ්ඤත්තසික්ඛාපදපූරණං තං චාරිත්තං" බුදුරජාණන් වහන්සේ විසින් නිවන් ලබා ගැනුම් සඳහා "මේ දේ කළ යුතුයැ"යි යම් සිකපද සමූහයක් පණවා ඇද්ද ඒවා සම්පූර්ණ කිරීම චාරිත්‍ර ශීල වශයෙන් ගතයුතු.

ii වාරිත්‍ර ශීලය: වැලකිය යුතු ශීලයයි. මිනිස් කම රැක රැක ගැනුම සඳහා යම් වචනයක් හෝ ක්‍රියාවක් හෝ දෙකම හෝ අත්හරියි ද, ඒ වාරිත්‍ර ශීල නම්. උතුරු මිනිස් කම සඳහා යම් අත්හැරීමක් වේද, එය උසස් වාරිත්‍ර ශීලය යි. සීලමය කුසණ යට අයත් වනුයේ බුද්ධාදී උතුමන් ගේ සම්පූර්ණ කළ වාරිත්‍ර ශීල ය ය. "මේ දේ නො කළයුතුය"යි බුදුරජාණන් වහන්සේ පණවා වදාළ ශික්ෂාපද ආරක්ෂා කිරීම වාරිත්‍ර ශීලය බව කෙටියෙන් දත යුතු.

මෙසේ චාරිත්‍ර, වාරිත්‍ර, වශයෙන් ශීලය දෙවැදෑරුම්ය.

iii ආභිසමාචාරික ශීලය: උතුම් හැසිරීම සඳහා පැණවූ දෑයෙහි යෙදීම ආභිසමාචාරික ශීලනම්. නැතහොත් මහවග, සුලු වග, (මහාවග්ග, චුල්ලවග්ගපාලි) සඳහන් කුඩා වූ ද ඉතා කුඩාවූ ද (ඛුද්දානුඛුද්ද) සිකපද රැකීම ආභිසමාචාරික ශීලය යි ආභිසමාචාරික ශීලය උපසම්පදා භික්ෂූන් සඳහා පැණවූවකි.

iv ආදි බ්‍රහ්මචරියක ශීලය: සෝවාන් ආදි මාර්ග බ්‍රහ්මචර්‍යාවට මුලින් රැකිය යුතු ශීලය ආදි බ්‍රහ්මචරියක නම්. එනම් ආජීවඅෂ්ටමක ශීලය යි. "පුබ්බෙව ඛො පනස්ස කායකම්මං වචීකම්මං ආජීවො සුපරිසුද්ධො හොති" පෙරදී ම ඔහුගේ කායකර්ම, වාග්කර්ම, ආජීවය, පිරිසුදු වූ යේ වෙයි. යනුවෙන් සඳහන් වන පරිදි ආජීවඅෂ්ටමක ශීලය මාර්ගයට පෙර සම්පූර්ණ විය යුතුය. ආජීවය අටවැනි කොට ඇත්තේ ආජීවඅෂ්ටමක ශීලයයි.

තවද, භික්ෂු භික්ෂුණී දෙපක්ෂයට මූලික වශයෙන් පණවා වදාළ ශික්ෂාපද සමූහය ආදි බ්‍රහ්මචරියක ශීලයයි. එනම් උභය ප්‍රාතිමොක්ෂයට ඇතුළත් පාරාජිකා, සඞ්ඝාදිසෙස, නිස්සග්ගි පචිති, සුද්ධපචිති, පාටිදේසනිය, සෙඛියා, අධිකරණ, යන සත් වැදෑරුම් මහාශීලය යි. මෙය මාර්ග බ්‍රහ්මචර්‍යාවට පෙරදීම සැපයිය යුතුය. එහෙයින් ආදිබ්‍රහ්මචරියක නම්. පෙර දක්වූ ආභිසමාචාරික ශීලය නො පිරුවහොත් මේ ආදි බ්‍රහ්මචර්‍යක ශීලය කෙසේ වත් නො පිරේ. කුඩා සිකපද රැකුනොත් මහාසිකපද රැකීම එතරම් අපහසු නැත.

මෙසේ ආභිසමාචාරික ආදි බ්‍රහ්මචරියක, වශයෙන් දෙවැදෑරුම්ය.

v ලෞකික ශීලය: මාර්ග සිතට මෙනා ඇති සියලු සිල් ලෞකිකය. ඒවායින් කාමාවචරාදි භූමීන්හි සැප විපාක සැලසේ. එසේ ම සසර දුකින් එතර වීමටද ද ප්‍රත්‍ය - හේතු වේ.

"විනයො සංවරත්ථාය, සංවරො අවිප්පටිසාරත්ථාය, අවිප්පටිසාරො පාමොජ්ජත්ථාය, පාමොජ්ජං පීතත්ථාය, පීති පස්සද්ධත්ථාය, පස්සද්ධි සුඛත්ථාය, සුඛං සමාධත්ථාය, සමාධි යථාභූත ඤාණදස්සනත්ථාය, යථාභූතඤාණදස්සනං නිබ්බිද ත්ථාය, නිබ්බිදා විරාගත්ථාය විරාගො විමුත්තත්ථාය, විමුත්ති විමුත්තිඤාණ දස්සනත්ථාය, විමුත්තිඤාණදස්සනං අනුපාද පරිනිබ්බාණත්ථාය"

විනය සංඛ්‍යාත ශික්ෂාපද සමූහය හික්මීම පිණිසය. හික්මීම නො පසුතැවීම පිණිස. නො විපිළිසරවීම තරුණ ප්‍රීතිය පිණිසය, තරුණ ප්‍රීතිය දියුණු ප්‍රීතිය පිණිසය. දියුණු ප්‍රීතිය චිත්ත-චෛතසික සැහැල්ලු භාවය පිණිසය. සැහැල්ලු බව සැපය පිණිසය. සැපය සමාධිය පිණිසය. සමාධිය ඇති සැටි දක්නා නුවණ පිණිසය. ඒ නුවණ කලකිරීම පිණිසය. එය නො ඇල්ම පිණිසය. මිදීම මිදීමේ නුවණ දැකීම පිණිසය. එය උපාදානයන් ගෙන් නිදහස් වී පිරිනිවීම පිණිසය.

vi ලෝකෝත්තර ශීලය: මාර්ග-ඵලයන් හා යෙදුනු ශීලයයි. එනම් ආර්ය අෂ්ටාංගිකමාර්ගයට අයත් වූ සම්මාවාචා-කම්මන්ත-ආජීව යන අංග ත්‍රය යි. මේවා එකට ම යෙදුනු විටයි ලෝකෝත්තර.

මෙසේ ලෞකික, ලෝකෝත්තර; වශයෙන් දෙවැදෑරුම්ය.

vii හීන ශීලය: කීර්ති, ප්‍රශංසා දිය බලාපොරොත්තුවෙන් හෝ අනුන් පහත් කොට තමා උසස් වශයෙන් පෙනී සිටීමේ අදහසින් හෝ ඡන්ද, චිත්ත, විරිය, වීමංස, යන සතර සෘද්ධි පාද ධර්මයන් ගේ අඩුකමින් හෝ රකින ශීලය හීන නමි.

viii මධ්‍යම ශීලය: පින් පල ලැබුමේ අදහසින් හෝ ඡන්දාදී සෘද්ධි පාද ධර්මයන් ගේ තරමකට යෙදීමෙන් හෝ අත්තුක්කංසන, පරවම්භන, දෙකෙන් තොරව හෝ පැවතියේ මධ්‍යම ශීලයයි.

ix ප්‍රණීත ශීලය; සතර සෘද්ධිපාදයන් ගෙන් යුත් ශීලය හෝ ආර්ය තත්වයක් ඇති සිල හෝ පාරමී වශයෙන් පවතින සිල හෝ ප්‍රණීත ශීල යි.

මෙසේ හීනාදී වශයෙන් ශීලය තෙවැදෑරුම්ය.

x අත්තාධිපතෙය්‍ය ශීලය: තමා මුල්කොට රක්නා ශීලය අත්තාධිපතෙය්‍ය නමි. එනම් "තමා ගේ තත්වය ගැන සලකා බලා මා වැනියෙකු මෙවැනි දේ නො කළ යුතුය" මේ දේ කළ යුතුය'යි සිතා රකිනු ලබන සීලය යි.

xi ලෝකාධිපතෙය්‍ය ශීලය: අනුන් ගේ නින්දා අපහාසාදී යව බියෙන් ලෝකයා මුල් කොට රකිනු ලබනුයේ ලොකාධිපතෙය්‍ය ශීලය නමි.

xii ධම්මාධිපතෙය්‍ය ශීලය: ධර්මයෙහි ගුණ සිහිකර "මෙ වැනි ධර්මය මා වැන්නෙකු විසින් පිදිය යුතුය'යි සලකා ධර්මය මුල් කොට රකිනු ලබන ශීලය ධම්මාධිපතෙය්‍ය නමි.

මෙසේ අත්තාධිපතෙය්‍යාදී වශයෙන් ශීලය තෙවැදෑරුම්ය.

xiii හානභාගිය ශීලය: පිරිහීමට නැමුණු සීලය යි,

"යො'ධ සෙවති දුස්සීලෙ - සීලවන්තෙ න සෙවති
වත්ථුවීතික්කමෙ දොසං - න පස්සති අවිද්දසු
මිච්ඡාසඞ්කප්පබහුලො - ඉන්ද්‍රියානි න රක්ඛති
එවරූපස්ස වෙ සීලං - ජායතෙ හානභාගියං"

නුවණ නැති යමෙක් දුශ්ශීලයන් ආශ්‍රය කරයි ද ශීලවන්ත යන් ආශ්‍රය නො කරයිද, ශික්‍ෂා පද කැඩීමේ වරද නො දකියි ද, (හේ) වැරදි අදහස් බොහෝ කොට ඇත්තේ ඇස, කණ, ආදී ඉඳුරන් නො රකියි. මෙවැනියකු ගේ ශීලය ඒ කාරණයෙන් පිරිහීමට නැමීගත් ශීලයක් ය. මෙසේ බොහෝ සිකපද ඉක්මවමින් කිසිදු සංවරයක් නො මැතිව, කුලප්පු වූ මුවන් මෙන් (ගහනම් ගොවිය) වාසය කරමින් තුනුරුවන් කෙරෙහි ද වැරදි අදහස් ඇතිව වාසය කරන්නහු ගේ ශීලය හානභාගිය යි.

xiv ඨිති භාගිය ශීලය: පිරිහීමක් ද දියුණුවක් නොමැති ශීලය යි. මෙහි ඨිති යනු නැවතී සිටීමයි.

"සො සන්තුට්ඨො හොති - සීලසම්පත්තියා ඉධ
කම්මට්ඨානානුයොගම්හි - න උප්පාදෙති මානසං
තුට්ඨස්ස සීලමත්තෙන = අඝටන්තස්ස උත්තරිං
තස්ස තං ඨිති භාගියං - සීලං භවති භික්ඛුනො"

මේ ශාසනයෙහි යමෙක් තම සීලසම්පත්තියෙන් සතුටු වෙයිද, භාවනා කිරීමට සිතකුදු නූපදවයි ද, එසේ ශීල මාත්‍රයෙන් සතුටු වන, මත්තෙහි භාවනා සඳහා වෑයම් නො කරන, ඒ භික්‍ෂුව ගේ ශීලය ඨිතිභාගිය වෙයි.

xv විසෙස භාගිය ශීලය: සම්පූර්ණ ශීලයක් ඇතිව, සමථ භාවනා කරන්නහු ගේ ශීලය මෙයින් කියැවෙයි.

"සම්පන්නසීලො ඝටති - සමාධත්ථාය යො පන
විසෙසභාගියං සීලං - හොති එතස්ස භික්ඛුනො"

සිල්වත්ව, සමාධිය සඳහා යමෙක් වෑයම් කරයි ද, ඒ භික්‍ෂුව ගේ ශීලය විශෙෂභාගිය වෙයි.

xvi නිබ්බෙධ භාගිය ශීලය: විදර්ශනාවට නැමීගත් ශීලය යි.
"අතුට්ඨො සීල මත්තෙන - නිබ්බිදං යොනුයුඤ්ජති
හොති නිබ්බෙධ භාගියං - සීලමෙතස්ස භික්ඛුනො"

යමෙක් ශීලමාත්‍රයෙන් ම සතුටු නොවී විදර්ශනා භාවනාව සඳහා යෙදෙයි ද, ඒ භික්ෂුව ගේ ශීලය නිර්වේදභාගිය යි. නිවණට නැමුණු සීලයයි.

මෙසේ හානභාගියාදී වශයෙන් ශීලය සිවු වැදෑරුම්ය.

xvii පකති ශීලය: ස්වභාවයෙන් ම (ඉබේට ම) රැකෙන ශීලය යි. යම් මනුෂ්‍ය සමාජයක් ඒ ඒ වැරදි ක්‍රියා වලින් ස්වභාවයෙන් ම අත් වී සිටී යි නම් ඔවුන් ගේ ශීලය ප්‍රකෘතියි. උතුරුකුරු වැසියෝ ස්වභාවයෙන් ම පන්සිල් රකිත්. එමෙනි, තම තමාට අයත් සිල් රැක, පසුව එය ප්‍රකෘති තත්වයට පත්කරගනියි නම් ඉතා යෙහෙකි.

xviii ආචාර ශීලය: ඒ ඒ රටවල, සමාජයන්හි, කුලයන්හි පවතින ඇතැම් සිරිත් රැකීම ආචාර ශීලය යි. පෙර බෝසතාණන් ඉපදුන “ධර්මපාල” පරපුර සිල්වත් එකකි. හිඳුනු භවයා දෙවියෙකු කොට සලකත්. මේ ආදිය ආචාර වශයෙන් පවතින සිල් ය.

xix ධම්මතා ශීලය: අද්භූත සිද්ධියක් වශයෙන් පවතිනුයේ ධර්මතා ශීලය යි. සිද්ධාර්ථ කුමාරයා මව්කුසෙහි ඉපදුන ද, සිට බෝධිසත්වමාතාව වූ මහාමායාදේවියට කාමසේවනයෙහි සිතකුදු නූපන්නේ ය. මේ ධර්මතා ශීල යි.

xx පුබ්බහෙතුක ශීලය: පෙරත් ශීලාදී ගුණධර්මයන් රැකී උතුමන් ගේ ඉපදුන ද සිට රැකෙන ශීලය පූර්වහේතුක නම්. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ, පිප්පලී මානවක කාලයේ දී, ආවාහ කරගත් භද්‍රාකාපිලානි සමඟ එක යහනෙහි නිදාගත් නමුදු බ්‍රහ්මචර්යාව රැකගත්හ. මේ පූර්වහේතුක ශීලයයි.

මෙසේ පකති ආදී වශයෙන් ශීලය සිවුවැදෑරුම්ය. මෙතෙක් දක්වූ සිල් කොටස් විස්ස, සාමාන්‍යයෙන් ශීලය ගැන හැඟීමක් ඇතිකර ගැනීම සඳහා පවතින්නකි. සසර දුකින් නිදහස් වීමට හැම අයුරින් උපකාරී වන, සෝවාන් ආදී ලෝකෝත්තර මාර්ග හතක් ම සම්පූර්ණ කළයුතු මහා ශීලය මෙතැන් සිට විස්තර කෙරේ.

# මහා ශීලයවූ චතුපාරිසුද්ධි සීලය.

ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර සීලය, ආජීව පාරිශුද්ධි ශීලය, ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය, යන සතර මහා ශීලය යි. සමාධි නමැති වැව් මත, ප්‍රඥා නමැති ප්‍රාසාදය ගොඩනැගීමට මූලික පදනම - අත්තිවාරම - වනුයේ මේ චතුපාරිශුද්ධි ශීලයයි. ශක්තිසම්පන්න අත්තිවාරමක් නොමැතිව වැව් - කණු - පිහිටුවීමට නො හැක. මේත් එමෙනි. සිවුපිරිසුදු සීලය නො මැති නම් සමාධි කෙසේ උපදී ද?

"පමාදං අප්පමාදෙන - යදා නුදති පණ්ඩිතො
පඤ්ඤාපාසාදමාරුය්හ - අසොකො සොකිනිං පජං
පබ්බතට්ඨොව භුම්මට්ඨෙ - ධීරො බාලෙ අවෙක්ඛති"

-ධම්මපදය

නුවණැත්තා ප්‍රමාදය අප්‍රමාදයෙන් දුරුකොට ශීල, සමාධි, පුරා, ප්‍රඥා නමැති ප්‍රාසාදයට නැගී, පර්වත මුදුනට නැගියෙක් බිම සිටින්නන් බලන්නා සේ, සසර දුකින් ශෝකයට පත් බොහෝ ජනතාව දෙස නිශ්ශෝකීව බලයි. ප්‍රඥාව ප්‍රාසාදයට උපමා කොට දේශනා කළ තැනකි මේ.

කරුණු මෙසේ හෙයින් නිවන් දැකීමේ මාර්ගය වූ මධ්‍යම ප්‍රතිපදාවේ මූලික පදනම මේ චතුපාරිශුද්ධි ශීලය බව දතයුතු. මධ්‍යම ප්‍රතිපදා යනු ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා ධර්මයි.

## 1. ප්‍රාතිමොක්ෂ සංවර ශීලය.

"ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු" - වි. ප. (ඣානවිභඞ්ග) 185 පි.

මේ ශාසනයෙහි භික්ෂු ආචාර ගෝචර දෙකින් යුක්තව සුළු වරදෙහි පවා බිය දකිමින් සමාදන් වූ ශික්ෂාපදයන්හි හික්මෙයි ද, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් වාසය කරයි. මෙසේ දැක්වූයේ ප්‍රාතිමොක්ෂ සංවර ශීලයයි. කෙටියෙන් දක්වත් හොත් පෙර සඳහන් කළ චාරිත්‍ර, වාරිත්‍ර, යන දෙවැදෑරුම් ශීලයට අයත් ශික්ෂාපද සමූ

හය මනා සේ රැකීම යි. ඒ ශික්ෂාපද සමූහය සකාඛු-කඳු-සතකින් සමන්විතයි. එනම්: පාරාජිකා, සඞ්ඝාදිසෙස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කට, දුබ්භාසිත, යනුයි.

ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය පෙළෙහි ආ ක්‍රමයෙන් විස්තර කළ යුතුය. සීලමග ලක්ෂණය ගැන අවබෝධයක් ඇතිවීමට එය මහත් රුකුලකි.

ප්‍රාතිමොක්ෂ සංවර ශීලය සඳහා දේශනා කළ පාලි පාඨයෙහි විස්තර දැනගතයුතු පද නවයකි. එනම්: මෙහි, භික්ෂු, ප්‍රාතිමොක්ෂ, සංවර, සංවුත, ආචාර, ගොචර, කුඩා වැරදි, ශික්ෂාපද, යනුයි.

මෙහි (ඉධ) යනු මේ ශාස්තෘ ශාසනයෙහි ය. තීර්ථකාදී අන් තැනක, අන් සසුනක, අන් ආගමක, අන්‍ය දෘෂ්ටියක නො වේ. මේ තථාගත ශාසනයෙහි, මේ ධර්ම විනයෙහි, මේ බුද්ධාගමෙහි යන තේරුම යි. මෙයින් බුදුපියාණන් වහන්සේ දේශනා කළේ සෙසු කිසිදු ධර්මයෙක, විනයෙක, ශාසනයෙක, ප්‍රාතිමොක්ෂ සංවර ශීලයක් නො මැති බවයි. ඇත්තේ එකම තථාගත ශාස්තෘශාසනයෙහි යැ. ශාසනයෙහි ඇත්තා වූ වටිනාකම, දුර්ලභබව, ශ්‍රේෂ්ඨ ගතිය, මේ පදයෙහි ඇතුළත්ව පවතියි. මෙතැන පමණක් නොව දේශනාවෙහි ඇති සෑම තැනකම 'ඉධ' යනුවෙන් සඳහන් කළේ මේ අදහස ම ය.

“ඉධාති ඉමිස්සා දිට්ඨියා ඉමිස්සා ඛන්තියා ඉමිස්සා රුචියා ඉමස්මිං ආදායෙ ඉමස්මිං ධම්මෙ ඉමස්මිං විනයෙ ඉමස්මිං ධම්ම විනයෙ ඉමස්මිං පාවචනෙ ඉමස්මිං බ්‍රහ්මචරියෙ ඉමස්මිං සත්ථු සාසනෙ තෙන වුච්චති ඉධාති” - වි. ප.

මෙහි කෙටි අදහස: ඉධ යනු මේ බුදුරජාණන් විසින් දක්නා ලද ශාසනයෙහි, එයම කැමති වන නිසා ඉවසීමෙහි, කැමැත්ත-ගැනීම-හැටි-හික්මීම් ඒ දෙකම-පාලි - උතුම් හැසිරීම - ආනුශාසනාවෙහි යන්නයි. මෙසේ පද දසයකින් වර්ණිත වූයේ “බුද්ධ ශාසන” යන පදයයි. විස්තර සම්මොහවිනොදනියෙහි.

භික්ඛු: “භික්ඛූති සමඤ්ඤාය භික්ඛු පටිඤ්ඤාය භික්ඛු භික්ඛතීති භික්ඛු භික්ඛකොති භික්ඛු භික්ඛාචරියං අජ්ඣුපගතොති භික්ඛු භින්නපටධරොති භික්ඛු භින්දතීති පාපකෙ අකුසලෙ ධම්මෙති භික්ඛු භින්නත්තා පාපකානං අකුසලානං ධම්මානං භික්ඛු ඔධිසො කිලෙසානං පහානා භික්ඛු අනොධිසො කිලෙසානං පහානා භික්ඛු සෙක්ඛො භික්ඛු අසෙක්ඛො භික්ඛු නෙවසෙක්ඛනාසෙක්ඛො භික්ඛු අග්ගො භික්ඛු භද්‍රො භික්ඛු මණ්ඩො භික්ඛු සාරො භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නො භික්ඛු”- වි. පා.

භික්ඛු යන්නෙහි ගතයුතු තේරුම් රැසක් මේ දේශනා ප්‍රාඨයෙන් පැහැදිලි වේ. ලිහිල් කර ගැනුම සඳහා තේරුම් කරනුයේ එක් එක් පදයක් පාසා ය.

“සමඤ්ඤාය භික්ඛු” ව්‍යවහාරය නිසා භික්ෂු නම්. පොදුවේ සලකන විට සාමණේරයන් ද ඇතැම් පූජකයන් ද “භික්ෂු” නාමයෙන් කියැවේ. පස්වග මහණුන්ට ද බුදුපියාණෝ ආමන්ත්‍රණය කළෝ “භික්ඛවෙ” කියා යි. එහෙයින් ශීලාදී ගුණධර්ම පූරණ, කහ පැහැය ඇති වස්ත්‍ර දරන්නන්ට ලෝකයා “භික්ෂු” යයි ව්‍යවහාර කරයි.

“පටිඤ්ඤාය භික්ඛු” මෙහි “පටිඤ්ඤා” යනු හැඟවීම් අදහසින් කියන වචනය යි. තමා ද භික්ෂුවකැයි වචනයෙන් හඟවන නිසා ද භික්ෂු නම්. දුශ්ශීලයෝ හොරු, මේ ආදී හු රහස් තැනක සිටිද්දී; යමෙක් සැක සිතින් “මෙහි කවුද”යි අසත් නම් එවිට ඔව්හු “මෙහි භික්ෂුහුයැ”යි හැඟවීම් අදහසින් කියත්. එහෙත් ඔව්හු භික්ෂුහු නො වෙත්.

“භික්ඛතීති භික්ඛු” සිඟානුයි භික්ෂු නම්. භික්ෂුවගේ ප්‍රධාන ආහාරය විය යුත්තේ සිඟීමෙන් ලද දෙයයි. එය ද සිඟන්නන් සේ නො ඉල්විය යුතුය. ඉල්ලන බව හැඟෙන පරිද්දෙන් හැසිරිය යුතු. එසේ හැසිරීම සිඟායාමයයි කියනු ලැබේ. එහෙයින් භික්ෂු නම්.

“භික්ඛකොති භික්ඛු” සිඟීම ස්වභාවය වේනුයි භික්ෂු නම්. සඞ්ඝික දාන, පෞද්ගලික දාන, නිමන්ත දාන, ආදී සෑම ලැබීමම අතිරේකයි. පිඬු සිඟීමෙන් ලැබීම මූලිකයි.

“භික්ඛාචරියං අජ්ඣුපගතොති භික්ඛු” සිඟීමෙන් ලදදේ වන භික්ෂාව පිණිස බැසගත්තේනුයි. භික්ෂු නම්. නැතහොත් බුද්ධාදී ආර්යයන් බැසගත් භික්ෂාචර්යාවට තමා ද බැසගත්තේනුයි භික්ෂුයි.

මේ පද ත්‍රයෙන්ම භික්ෂුව හැඳින්වූයේ සිවුපසය මුල් කොට යැ. ආහාර පමණක් නොව සිවුරු, සෙනසුන්, බෙහෙත් යන මේවා ද භික්ෂුව ලබාගත යුත්තේ ඉල්ලීමෙන් හෝ වෙන යම් මාර්ගයකින් හෝ නොව තමාට අවශ්‍ය බැව් හැඟෙන පරිද්දෙන් සෙවීමෙනි. භික්ෂු ජීවිතයේ සැහැල්ලු ගතිය, නිරහංකාර බව, ධාර්මිකකම, ඉහත කී නාමත්‍රයෙන් පැහැදිලි වෙයි. තවද බුදුරජාණන් වහන්සේ භික්ෂුව සඳහා දේශනා කළ නිඃශ්‍රය කරුණු සතරෙන් එකකි සිඟීම. ‘පිණ්ඩියාලොප භොජනං නිස්සාය පබ්බජ්ජා, තත්ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො” පිඬු පිණිස හැසිර සොයාගත් ආහාරය නිසා යැ පැවිද්ද. එහිලා ඔබ විසින් දිවි ඇති තෙක් උත්සාහ කළ යුතු. භික්ෂුවක් නම් එහුගේ සවභාවය වියයුත්තේ සිඟීමයි.

‘භින්නපටධරොති භික්ඛු” බිඳී ගිය රෙද්දක් දරානුයි භික්ෂු නම්. “අග්ඝඵස්සවණ්ණභෙදෙන භින්නං පටං ධාරෙතීති භින්නපටධරො” වටිනාකම, මනා ස්පර්ශය, ලස්සන ගතිය, යන මේවා නැති කළ වස්ත්‍රයක් දරන නිසා භින්නපටධර නම්. එසේමය. කොපමණ වටිනා වස්ත්‍රයක් වුවද කඩ කඩ කොට කැපීමෙන් වටිනාකම බිඳේ. බොහෝ තැන් මහණ බැවින් සැප දායී හැඟුම (මනා ස්පර්ශය) බිඳේ. ගස්වල මුල්, කොල, පොතු, මල් යන මේවා රැගෙන තම්බා, ඒවාහි කහට පෙවීමෙන් වර්ණය- පාට - බිඳේ. මෙසේ සකස් කරගත් සිවුරක් දරන නිසා භික්ෂු යනු නමකි.

‘‘භින්දති පාපකෙ අකුසලෙ ධම්මෙති භික්ඛු” ලාමක පහත් - අකුසල ධර්මයන් බිඳීනුයි භික්ෂු නම්, සේ අකුශල ඵාවර- සවිර - කරන්නෙක් නොවිය යුතුය. මහ වහා මොහොතින් මොහොත නැගී එන රාගාදී පාපධර්ම බිඳිය යුතුය. එනම් අස් කළ යුතුය. මෙසේ පාපධර්ම ප්‍රහාණය කරන හෙයින් භික්ෂු නම්.

‘‘භින්නත්තා පාපකානං අකුසලානං ධම්මානං භික්ඛු” ලාමක අකුසල ධර්මයන් බිඳින ලද බැවින් භික්ෂු නම් වෙයි. මේ නාමයෙන් කියැවෙනුයේ රහත් උතුමෝය. උන්වහන්සේලා සියලු පාප ධර්ම අර්හත් මාර්ග ඥානයෙන් සිඳ බිඳ විනාශ කළාහුයි.

"ඔදිසො කිලෙසානං පහාණා භික්ඛු" මෙහි 'ඔධි' යනු සීමාවයි. සීමා දෙකකි. කෙලෙස් සීමා, මාර්ග සීමා, යනුයි. මෙහි ගතයුත්තේ මාර්ග සීමායි, මාර්ග සතරෙකි. සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත්, යනුයි රහත් මාර්ගය හැර ඉතිරි මාර්ගයන්ගෙන් කෙරෙනුයේ සීමා සහිත කෙලෙස් ප්‍රමාණයක් නැසීමයි. එහෙයින් ඒ මාගී සීමායි. මෙසේ මාගී සීමා වශයෙන් කෙලෙස් ප්‍රහාණය කරන බැවින් භික්ෂු යයි නමකි.

"අනොදිසො කිලෙසානං පහාණා භික්ඛු" සීමාවක් නොමැතිව කෙලෙස් ප්‍රහාණය කරන බැවින් භික්ෂු නම්. ඒ රහතන් වහන්සේයි. අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙස් ප්‍රහාණය වන බැවිනි.

"සෙක්ඛො භික්ඛු" පුථුජ්ජන කල්‍යාණකෙන සද්ධිං සත්ත අරියා, තිස්සො සික්ඛා සික්ඛන්තීති සෙක්ඛා" පෘථග්ජන - මාර්ග නූපද වූ - කල්‍යාණයන් සමග ආර්යයෝ සත් දෙන, තෙවැදෑරුම් ශික්ෂායන්හි හික්මෙත්නුයි සෙක්ඛ නම්. මෙසේ ශෛක්ෂ නාමයෙන් යුක්ත වූයේ භික්ෂු නම් වෙයි.

"අසෙක්ඛො භික්ඛු" ත්‍රිවිධ ශික්ෂාවන්හි හික්මී අවසන් වූ හෙයින් භික්ෂු නම්. මේ රහතන් වහන්සේලා ගැනයි

"නෙවසෙක්ඛානාසෙක්ඛා භික්ඛු" ශෛක්ෂ හෝ අශෛක්ෂ හෝ නොවූ, සෙසු නොහික්මුණු භික්ෂූහු මේ ගණයට වැටෙත් ඔවුනු හික්මෙත්නෙත් නැත. අවසානයක් ගැන කියනු කිම? එවැනි අයට ද නාම මාත්‍රයෙන් භික්ෂු යයි නමකි.

අග්ගො භික්ඛු; අග්ග යනු කෙළවරයි. ශාසනයෙහි කෙළවර සතරෙකි. සීලග්ග, සමාධග්ග, පඤ්ඤග්ග විමුත්තග්ග යනුයි. මේ සතර කෙළවරට පැමිණි හෙයින් භික්ෂු නම් වෙයි.

භද්‍රො භික්ඛු: යහපත් නිසා භික්ෂු නම්.

සාරොභික්ඛු: හරයක් ඇති නිසා භික්ෂුය. හරය නම් සීලසාර, සමාධිසාර, පඤ්ඤාසාර, විමුත්තිසාර, යනුයි.

මණ්ඩො භික්ඛු: පැහැදිලි ජීවිතයක් ඇති නිසා භික්ෂුය.

සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නො ති භික්ඛු: සමගි සඞ්ඝයා කරණ කොට ශාසනයට සුදුසු, දොස් නැති, ඥත්ති චතුර්ථ විනය කර්මයෙන් උපසම්පදා වූයේනුයි භික්ෂු නම්. උපසම්පදා ගැන සමන්ත පාසාදිකා බලනු.

ප්‍රාතිමොක්ෂ සංවර දේශනා පාඨයට ගත යුත්තේ මේ ඥත්තිචතුර්ථ විනය කර්මයෙන් උපසම්පදා වූ භික්ෂු නාමයයි මෙසේ බුදුරජාණන් භික්ෂු නාමය හැඳින්වීම සඳහා පද අටළොසක් යෙදූහ. එයින් සමඤ්ඤාය, පටිඤ්ඤාය, යන පද ද්වය හැර ඉතිරි පද සොළොස මෙහිලා නියමිතයි,

“පාතිමොක්ඛ”: මේ ශික්ෂා පද ශීලයට නමකි. “යො නං පාති රක්ඛති තං මොක්ඛෙති මොචෙති ආපායිකාදීහි දුක්ඛෙහීති පාතිමොක්ඛං” ඒ ශික්ෂා පද ශීලය වනාහි රක්නහු අපායාදී දුකින් මුදා රකියි. ඒ නිසා ප්‍රාතිමොක්ෂ නම්. යනු කෙටි අදහසයි. ශික්ෂා පද ශීලය රැකීම නිසා ඒ ශීලයෙන්ම රකින්නහු සතර අපා දුකට හෝ සසර දුකට හෝ නොවැටී රැකේ.

“සංවර”: කයින් වචනයෙන් සිදුවන වැරදි වැළැක්වීම සංවර නම්. “කායිකො අවීතික්කමො, වාචසිකො අවීතික්කමො” යනු දේශනා පාඨයි. කය සම්බන්ධ වූ වැරදි නො ඉක්මවීම, වචනය සම්බන්ධ වූ වැරදි නො ඉක්මවීම, මේ එහි අදහසයි. සංවර පදය මතුවට විස්තර වෙයි.

“සංවුතො” මේ පදය තේරුම් කරනුයේ මුල් පදයක් සමඟයි. සාමාන්‍ය තේරුම “සංවුතොති පිහිතො” සංවූත නම් වසන ලද බවයි. කය, වචන, දෙක වැරදි කෙරෙන්ට නොදී වසා ගැන්මයි. ඊළඟ අදහස: “ඉමිනා පාතිමොක්ඛ සංවරෙන උපෙතො හොති, සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො තෙන වුච්චති පාතිමොක්ඛසංවර සංවුතො” ඉහතින් කී ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්ත වූයේ ප්‍රාතිමොක්ෂ සංවර සංවූත නම්. මේ කෙටි අදහසයි.

ආචාර: යහපත් හැසිරීම ආචාරයි. මෙය කයින්, වචනයෙන්, යන දෙකෙන්ම සිදුවන්නකි. භික්ෂුව යහපත් හැසිරීමෙන් යුක්ත විය යුතු. ප්‍රාතිමොක්ෂය විවරණ කරන දේශනා පාඨයෙහි මෙසේ දක්වෙයි. තත්ථ කතමො ආචාරො? කායිකො

අවීතික්කමො වාචසිකො අවීතික්කමො කායිකවාචසිකො අවීතික්කමො අයං වුච්චති ආචාරො, සබ්බොපි සීලසංවරො ආචාරො. ඉධෙකච්චො න වෙළුදානෙන පත්තදානෙන න පුප්ඵදානෙන න ඵලදානෙන න සිනානදානෙන න දන්තකට්ඨදානෙන න චාටුකම්‍යතාය න මුග්ගසූප්‍යතාය න පාරිභට්‍යතාය න ජඞ්ඝපෙසනිකෙන න අඤ්ඤතරඤ්ඤතරෙන බුද්ධපටිකුට්ඨෙන මිච්ඡාජීවෙන ජීවිතං කප්පෙති අයං වුච්චති ආචාරො" - වි. ප. 187 පි.

•

ආචාර යනු කුමක්ද? කය - වචන දෙක නො ඉක්මවීම ආචාරයි. (නොඉක්මවීම නම් වැරදි නොකිරීමයි.) ශීලයෙන් ලද සියලු හික්මීම් ආචාර නම්. තවද සිවුපසය ලබා ගැනුම නිසා හෝ ගිහියන් සිත් ගැනීම සඳහා හෝ ආරාමයට අයත් හුණ, කොළ, මල්, ගෙඩි, නහනසුණු, දැහැටි, නො දෙයිද, ගිහියන්ගේ සිත් ගන්නා පිණිස, තමා පහත් තැන තබා, ඔවුන් වහා කී දේ නමුත් උසස් තැන තබා, තමා ප්‍රියයෙකු කර ගන්නා අදහසින් කීමක්, එවැනිම වූ අදහසින් බොරු වැඩි කොට කීමක්, දරුවන් වඩා ගෙන ආදරය කොට දක්වීමක්, ගිහියන්ගේ පණිවුඩ ගෙන යෑමක්, නොකරයි ද, බුදුපියාණන් පිළිකුල් කළා වූ වෙදකම්, නැකැත් කීම්, ආදී සෙසු දෑ ද කරමින් වැරදි ජීවිකයක් නො ගෙවයි ද, ඒ හැම ආචාර නම් වෙයි.

තවද ක්‍රමයෙකි: "අපි ච භික්ඛු සගාරවො සප්පතිස්සො හිරොත්තප්ප සම්පන්නො සුනිවත්ථො සුපාරුතො පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සම්මිඤ්ජිතෙන පසාරිතෙන ඔක්ඛිත්ත චක්ඛු ඉරියාපථසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ ජාගරියානුයුත්තො සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො අප්පිච්ඡො සන්තුට්ඨො ආරද්ධවීරියො ආභිසමාචාරිකෙසු සක්කච්චකාරී ගරුචිත්තිකාර බහුලො විහරති අයං වුච්චති ආචාරො" වි. ම. 14 පි.

සෙසු භික්ෂූන් කෙරෙහි ගෞරව හා යටහත් පහත් පැවතුම් ඇතිව, ලජ්ජා - බිය දෙකෙන් යුක්තව මනා ලෙස හැඳ පොරවා ගෙන, අත් = පා හැකිලීම, දිග හැරීම, ආදී ඒ ඒ ක්‍රියා අනුන් පැහැදෙන සේ සිදුකරමින්, භ්‍රාන්ත වූ මුවකු සේ නොයෙක් දිග් නොබලා, යට හෙලාලූ ඇස් ඇතිව, හැම ඉරියව්වක්ම මනාසේ පවත්වමින්, ඇස්, කන්, නාසාදී ඉඳුරන් සංවර කරගෙන, ආහාරයෙහි ද පමණ දනිමින්, දවසේ බොහෝ වේලා භාවනා

කරමින්, සිහි නුවණින් යුතුව, ලද දෑයකින් සතුටුව, ඇරඹූ උත්සාහයකින් යුතුව, පෙර සඳහන් කළ ආභිසමාචාරික සිල් පුරමින්, ඒවා සකස් ලෙස කරමින්, ඒවා කෙරෙහි ගෞරව අදහස් දියුණු කෙරෙමින් යම් භික්ෂුවක් වෙසෙසි ද, ඒ ආචාර නම්.

තවද, අඤ්ඤො මෙ ආකප්පො කරණීයොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං" යන දසධම්ම සූත්‍රයේ සඳහන් දේශනා පාඨය සිහි කරමින්, හැම අවස්ථාවේදීම ගිහි පිත්වතාට වඩා වෙනස් වූ දුටුවන් පහදින, පැහැදුනවුන් වඩාත් පහදින, අයුරින් කාය - වචන දෙක රැක ගැනුම ආචාර නම්වෙයි. (සාම තේර බණ දහම් පොතෙහි දිනචරියාව ද බලන්න)

අනාචාරයකුදු ඇත. එසද තේරුම් ගත යුත්තේ මේ දැක්වූ ආචාර ධර්මයන්ගේ විරුද්ධාර්ථය සලකමිනි. එහි අමුතුවෙන් දැක්විය යුත්තක් නොමැත. ආචාර නොපැවැත්ම අනාචාරයි.

"ගොචර" සුදුසු ස්ථානයන්හි හැසිරීම ගොචරයි. ස්ථාන නම් පිණ්ඩපාතයෙහි, අනෙකුත් අවශ්‍ය කරුණක් ඇතිවූ විටකදී හැසිරිය යුතු තැන්ය. ඒවා භික්ෂුවට ගැලපෙන, සුදුසුතැන් විය යුතු. "ගොචරොති පිණ්ඩපාතාදීනං අත්ථාය උපසඞ්කමිතුං යුත්තට්ඨානං" මේ අටුවා පාඨයි. මෙහිදී නුසුදුසු ස්ථාන ප්‍රථමයෙන් දත යුතුය. බුදුරජාණන් වහන්සේ එය මෙසේ දැක්වූහ.

"තත්ථ කතමො අගොචරො? ඉධෙකච්චො වෙසියගොචරො වා හොති විධවාගොචරො වා ථුල්ලකුමාරිගොචරො වා පණ්ඩකගොචරො වා භික්ඛුණීගොචරො වා පානාගාරගොචරො වා, සංසට්ඨො විහරති රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි අනනුලොමිකෙන සංසග්ගෙන යානි වා පන තානි කුලානි අස්සද්ධානි අප්පසන්නානි අනොපානභූතානි අක්කොසකපරිභාසකානි අනත්ථකාමානි අහිතකාමානි අඵාසුකාමානි අයොගක්ඛෙමකාමානි භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති අයං වුච්චති අගොචරො"
- වි. ප. 187. පි.

මෙහි සාමාන්‍ය අදහස: අගොචරය නම් කවරේද? මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් මෙබඳු තැන් ඇසුරු කරයි. එනම් වෙසඟනන්, සැමියන් නොමැති ස්ත්‍රීහු, විවාහ නොවූ වැඩි වයස් ස්ත්‍රීහු, කෙලෙස්දැහැ ඇති පණ්ඩකයන්, භික්ෂුණීන් වාසය කරන

තැන් හා මත්පැන් හල්ය. එසේම රජුන්, මහ ඇමතියන්, තීර්ථක යන්, ඔවුන්ගේ ශ්‍රාවකයන්, යන මොවුන් සමඟ ශාසනයට නො ගැලපෙන අයුරින් ආශ්‍රය කරයි. ශ්‍රද්ධාවක්, පැහැදීමක් නොමැති දීමෙහි සිත් මාත්‍රයකුදු නො මැති, භික්ෂූන්ට නින්දා අපහාස කරන, බැණවදින, අහිත ලෙස ක්‍රියා කරන, සිවු වණක් පිරිසගේම දියුණුවට කැමති නැති කුලයන් ආශ්‍රය කරයි. මේ අගෝචරයි.

ගෝචර යනු මෙබඳු තැන්වලින් හා නුසුදුසු හැසිරීම් වලින්, නුසුදුසු කුලයන්ගෙන් වෙන්වීමයි. එසේම ඉතා සැදැහැති, දීමට අතහිත පුරුදු කළ, හැම දිනම කසාවතින් බැබලෙන, භික්ෂූන්ගේ ඇඟ වදින සුළඟින් සිසිල් වූ, යම් කුලයන් වෙත් නම් ඒවාහි හැසිරීම ගෝචර නම්. තම ශීලයට, භාවනාවට, භික්ෂු ජීවිතයට, කැලැල් නොවන ගිහි - පැවිදි පිරිස් සිටිනා තැන්හි හැසිරීමද ගෝචරයි.

තවද ප්‍රධාන ගෝචර තුනෙක් ඇත. එනම් උපනිඃශ්‍රය ගෝචර, ආරක්ඛ ගෝචර, උපනිබන්ධ ගෝචර යනුයි. යමෙකු ඇසුරු කිරීමෙන් තෙමේ ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා යන පඤ්ච ධර්මයෙන් දියුණු වේද, ඔහු ඇසුරු කිරීම, උපනිඃශ්‍රය ගෝචරයි. එසේම අල්පේච්ඡ කථා, සන්තුට්ඨි කථා, සල්ලේඛ කථා, පවිවේක කථා, අසංසග්ග කථා, සීල - සමාධි - ප්‍රඥා, - විමුත්තිඤාණදස්සන කථා, යන දස කථාවෙන් යුත් කල්‍යාණ මිත්‍රයා ආශ්‍රය කිරීමද උපනිඃශ්‍රය ගෝචරයි.

යමෙක් ගමට හෝ මාර්ගයට හෝ බැස ගමන් කරද්දී වටපිට නො බලා, වියදඬු පමණින් දිග් බලාගෙන, සංවරව යෙද්ද, ඒ ආරක්ඛ ගෝචරයි. එනම් ඇස ආදී ඉඳුරන් රැකීමයි. සතර සතිපට්ඨානයන්හි සිත ලං කොට බැඳීම උපනිබන්ධ ගෝචරයි. කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා; ධම්මානු පස්සනා, යන මොහු සතර සතිපට්ඨානයෝයි.

“අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී” කුඩාවූ ද වරදවල් කෙරෙහි බිය දක්නේ.

“තත්ථ කතමෙ අනුමත්තාවජ්ජා? යානි තානි වජ්ජානි අනුමත්තකානි ඔරමත්තකානි ලහුකානි ලහුකසම්මතානි සංයමකරණීයානි චිත්තුප්පාදකරණීයානි මනසිකාර පටිබද්ධානි ඉමෙ වුච්චන්ති අනුමත්තාවජ්ජා” අනුමාත්‍ර වරද නම් කවරේද? යම් කුඩා වරද, ඊටත් කුඩා වරද, සැහැල්ලු වරද,

සැහැල්ලුයයි සම්මත වරද, හික්මියයුතු මාත්‍රායක් ඇති වරද, සිතූ මාත්‍රයෙන් පිළියම් කළයුතු, මෙනෙහි කිරීම් සම්බන්ධ වූ වරද, වේද්ද, ඒවා අනුමාත්‍ර - කුඩා - වැරදීයයි කියනු ලැබේ. ඉතාමත් කුඩා වරද ද මෙහිලා සංගෘහීතය. මෙසේ කුඩා වරදෙහි පවා පාරාජිකා, සඞ්ඝාදිසෙසාදි මහවරදක් සේ සලකා බියදක්තේ යනු අදහසයි.

"සමාදාය සික්ඛති සික්ඛාපදෙසු" සිකපදයන්හි සමාදන් වී හික්මෙයි.

"තත්ථකතමා සික්ඛා? චතස්සො සික්ඛා භික්ඛූනං භික්ඛු සික්ඛා, භික්ඛුණීනං භික්ඛුණීසික්ඛා, උපාසකානං උපාසක සික්ඛා, උපාසිකානං උපාසිකාසික්ඛා, ඉමෙ වුච්චන්ති සික්ඛායො" ශික්ෂා සතරෙකි. භික්ෂු ශික්ෂා, භික්ෂුණී ශික්ෂා, උපාසක ශික්ෂා, උපාසිකා ශික්ෂා යනුයි. මෙයින් ගතයුත්තේ තමාට අයත් ශික්ෂායි. භික්ෂුවට අයත් සියලු ශික්ෂා එකක් නමුදු අත් නොහැර සමාදන් විය යුතු. ඔහුට උපසම්පදාමාලකයේදී සිහිකර දෙනුයේ සතර අකරණීය වශයෙන් පාරාජිකා සතර පමණි. එහෙත් උපසම්පදාව පිළිගත් භික්ෂුතෙමේ උපසම්පදාවට අයත් සියලු ශික්ෂා පිළිගත්තේ වෙයි. එයම සමාදානය යි.

ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, චතුපාරිශුද්ධි ශීලයෙහි පළමු වැන්නයි. එය ආරක්ෂාකර ගැනීමට ඉතා ම අවශ්‍ය වනුයේ ශ්‍රද්ධාවයි. චාරිත්‍ර වශයෙන් ආ ආචාර - ගොචර දෙක රැකිය යුත්තේ වීර්‍ය ය ශ්‍රද්ධා දෙකකි. මෙසේ ශ්‍රද්ධා, වීර්‍ය දෙකෙන් ප්‍රාතිමොක්ෂ සංවර ශීලය රැකිය යුතු.

## 2. ඉන්ද්‍රියසංවර ශීලය.

ඉන්ද්‍රිය - ඉඳුරන් - සයකි. ඇස, කණ, නැහැය, දිව, සිරුර, සිත, යනුයි. මොවුන් නිසා සිතට රාගාදී කෙලෙස් පිවිසේ. ඒ කෙලෙසුන් ගේ ඊම වැළැක්ම ඉන්ද්‍රිය සංවරයයි. එයම භික්ෂුව ගේ ශීලය - ස්වභාවය - නුයි ඉන්ද්‍රියසංවර ශීල නම්. ප්‍රාතිමොක්ෂ සංවරයෙහි පිහිටි භික්ෂු තෙමේ රාග, ද්වෙෂ, මෝහාදී කෙලෙස් ගලාගෙන එන මේ ප්‍රධාන දොරටු ද සිහි, නුවණ නමැති ආරක්ෂක සින් හොඳ රැකවරණ කළයුතු. ඒ කරන අයුරු බුදුරජාණන් වහන්සේ මෙසේ දක්වූහ.

"සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති, සොතෙන සද්දං සුත්වා - පෙ - ඝාණෙන ගන්ධං ඝායිත්වා පෙ - ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය -පෙ- මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති"

ඒ ප්‍රාතිමොක්ෂ සංවරයෙහි පිහිටි භික්ෂු තෙමේ ඇසින් රූපයක් දැක, කෙලෙස් වශයෙන් ලොකු නිමිති - ලකුණු - කුඩා නිමිති නො ගනියි. යම් ඇසක් අසංවරව වාසය කරන්නහු කරා විෂමලෝභය, දොම්නස් ගතිය, ආදී ලාමක අකුශල ධර්මයන් රූපය අනුව තම සිත වෙත ගලා එයි ද, එසේ පවතින ඇස සංවරය පිණිස පිළිපදියි. ඇස රකියි. ඇස පිළිබඳ සංවරයට පැමිණෙයි. කණ ආදී ඉඳුරන් පිළිබඳව ද මෙසේ ම ය.

මෙයින් තේරුම් ගතයුතු කොටස් කීපයකි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම, යන බාහිර වස්තූන් සපයදෙනා ඇස, ආදී ඉඳුරන්ට ගොදුරු වන්නේ ඒවා පිළිබඳ සිත් පහළ වූ කල්හි ය. එසේ නො මැතිව ඇස ආදී ඉඳුරන්ට කෙසේ නමුදු රූපාදියක් නො ගත හැකිය. ඇසින් රූපයක් දැක, කණින් ශබ්දයක් අසා, ආදී වශයෙන් දේශනා කළේ ඒ ඒ ඉඳුරන්හි උපදින සිත දක්වමිනි. ඉඳුරන් පිළිබඳ සිතක් නූපන්නොත් අරමුණු ගැන්මක් නො කෙරේ. එහෙයින් ඇසින් රූපයක් දැකයයි දක්වූ කල්හි ගතයුත්තේ ඇස පිළිබඳ සිතෙන් (චක්ඛුවිඤ්ඤාණ) රූපයක් දැක යනුයි. තවද අදහසක් ඇත. සිතට රූපාදිය නො පෙනේ. සිත ඇස නො වන හෙයිනි. එහෙයින් ඇසත් සිතත් දෙක ම සම්බන්ධ වූ විට රූපය පෙනේ. සෙසු අරමුණුත් එසේම ය. තවද ඇසත්, සිතත්, රූපයත්, යන කරුණු තුන ම එක් තැන් වූ විටයි රූපයක් පෙනෙනුයේ. "චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො" ඇසත්, රූපයත්, නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. ඒ තුනෙහි එක්වීමෙන් ස්පර්ශය හටගනී. (චක්ෂුස්පර්ශය නම් රූපය දැකීමයි.)

ලෝකයෙහි පවතින සියලු ම රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන්ට වඩා ස්ත්‍රී - පුරුෂ දෙපක්ෂය පිළිබඳ රූපාදිය ඔවුනොවුන්ට ප්‍රධානය. ඒ පිළිබඳ තථාගත දේශනය මෙසේය.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි, යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිරූපං, ඉත්ථිරූපං භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති; නාහං භික්ඛවෙ අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියාචිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවෙ පුරිසරූපං, පුරිසරූපං භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති"
-අ.නි.එ.නි.

මහණෙනි; යම් රූපයක් පුරුෂයාගේ සිත හාත්පසින් වෙළා සිටියි ද, ස්ත්‍රීරූපය හැර එබඳු එක ම රූපයක් මම නුවණැසින් නොම දකිමි. මහණෙනි, ස්ත්‍රී රූපය පුරුෂයාගේ සිත හාත්පසින් වෙළාගෙන සිටියි. මහණෙනි, ස්ත්‍රියගේ සිත හාත්පසින් ම වෙළාගන්නා වූ පුරුෂ රූපය හැර අන් එක ම රූපයක් මම නුවණැසින් නොම දකිමි. මහණෙනි, පුරුෂ රූපය ස්ත්‍රියගේ හාත්පසින් වෙළාගෙන සිටියි.

මෙසේ ම ස්ත්‍රී-පුරුෂ ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ගැන ද දේශනා ඇතුළත්ය.

නිමිති හා අනුබ්‍යඤ්ජන:

දිග් වූ කෙස්, දිග් ඇස්, මෘදු මුහුණ, පියයුරු, සිහිනිඟටිය, මොළොක් අත්-පා ආදිය ස්ත්‍රිය පිළිබඳ නිමිති ය. ඒ නිමිති අනුව යැවෙන අත් - පා ලතාවකට සෙලවීම්, මුකුළු සිනා, සිරුර පැද්දෙන සේ යාම, මේ ආදිය අනුබ්‍යඤ්ජන නමි. පුරුෂයා පිළිබඳ නම් රවුළු, වටකුරු ඇස්, හොරෝපු මුහුණ, මහත් ඉඟටිය, ආදීහු නිමිති ය. ඒ අනුව ගිය සිනා, යෑම් ආදිය අනුව්‍යඤ්ජනයි.

සංවරය හා අසංවරය:

සංවරය යි කියනුයේ නොබැලීම නොව දුටු පසු රාගාදි කෙලෙස් නූපදවා ගැන්මයි, රූපයක් හෝ අනෙක් අරමුණක් හෝ සිතට හමුවන්නේ සිත් කීපයක් ම ඉපදුන පසුවය. අරමුණක් නිසා පළමුවෙන් උපන් සිතෙහි සෙලවීමක් ඇතිවෙයි. එය "භවඞ්ගචලන" නමි. ඉක්බිති සෙලවුන සිත නිදගත් අවස්ථාවෙන් අස් වෙයි. ඒ භවඞ්ග උපච්ඡේදයයි. ඒ සමගම "මේ අරමුණ පැමිණියේ කවර තැනකින්ද"යි විමසීමේ සිත වූ "පඤ්චද්වාරාවර්ජන" සිත උපදියි. පැමිණි තැන විමසා ගත් කල්හි ඒ අරමුණ පිළිගන්නා සම්පටිච්ඡන සිත ද, හොඳ නරක විමසන සන්තීරණ සිත ද, ඒ හොඳ නරක දෙක වෙන්කොට සලකන වොත්ථපන සිත ද, පිළිවෙලින් උපදියි. මෙතැනදී සිහි නුවණ උපදවා

රාගාදියක් උපදින්නට නොදී රැකගැනීමය සංවරයයි කියනුයේ. සිහි මුළාවක් හෝ මෝඩකමක් හෝ ඇති වුවහොත් එය මැනවැයි හෝ නරකැයි හෝ ගැනීමෙන් ජවන් සිත් දිවූ පසු රාගාදී කෙලෙස් හමුදාව සිත තුළට වදී. අසංවරය නම් ඒ ය.

මෙසේ ඇස, කණ, ආදී ඉඳුරන් සදෙනා නිසා උපදින රාගාදී කෙලෙස් වළක්වා ගැනීම ඉන්ද්‍රිය සංවර ශීලයකි. ඉඳුරන් සදෙනා රැකගැනීම භික්ෂු ජීවිතය ඔප වැටෙන්නකි. එමෙන් ම සසර දුකින් නිදහස් වීමට ද මහත් රුකුලෙකි.

"චක්ඛුනා සංවරෝ සාධු – සාධු සෝතෙන සංවරෝ
ඝාණෙන සංවරෝ සාධු – සාධු ජිව්හාය සංවරෝ
කායෙන සංවරෝ සාධු – සාධු වාචාය සංවරෝ
මනසා සංවරෝ සාධු – සාධු සබ්බත්ථ සංවරෝ
සබ්බත්ථ සංවුතෝ භික්ඛු – සබ්බදුක්ඛා පමුච්චති" – ධම්මපදය

ඇස, කණ, දිව, නැහැය, සිරුර, වචනය, සිත, යන හැම තැනින්ම සංවරවීම යහපති. හැම තැන ම සංවර වූ භික්ෂු සියලු දුකින් නිදහස් වෙයි. ඉන්ද්‍රියසංවර ශීලය රැකීය යුත්තේ සිහි නුවණ දෙකිනි. යොනිසොමනසිකාරය සාධකයි.

## 3. ආජීවපාරිශුද්ධි සීලය.

ආජීව යන්නෙන් ජීවත්වීම – ජීවිකාව – ගැනේ. ජීවත්වීම මුල්කොට පණවා වදාළ සමැදුරුම් සිකපද රැකීම හා කුහනා ලපනාදී අධාර්මික ජීවත්වීම් වලින් වැළකීම ආජීව පාරිශුද්ධි ශීලයයි. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තවූ භික්ෂුව තම ජීවිතය දැහැමි කරගත යුතුය. ජීවත්වීමේ අදහසින් භික්ෂුවකට නොගැළපෙන දෑ කළහොත් එයිනුදු තෘෂ්ණාදී කෙලෙස් උපදී. එහෙයින් වැරදි සෙවීම් වලින් සම්පූර්ණයෙන්ම අන්විය යුතුය. "ජීමත් වන්නේ කෑමට නොව කන්නේ ජීවත්වීමටය" යන ආප්තෝපදේශය සිතට ගනිමින් පෝෂණය සඳහාම ජීවත් නො වී, ඒ ජීවිතයෙන් ගතයුතු නියම හරය වූ ශීල, ගුණ' ඥාන, වගාව දියුණු කළයුතු.

### ආජීවය මුල්කොට පණවා වදාළ සිකපද සය:

i ආජීව හෙතු ආජීව කාරණා පාපිච්ඡෝ ඉච්ඡාපකතෝ අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති ආපත්ති පාරාජිකස්ස.

නැති ගුණ හඟවනු කැමති, ලෝභ ගතිය ස්වභාව කොට ඇති භික්ෂුවක් ජීවත්වීම සඳහා තමා ළඟ නැති උත්තරිමනුෂ්‍ය ධර්ම - උතුරු මිනිස් දහම් (ධ්‍යානාදිය) - හැඟෙන පරිද්දෙන් කියයි නම් ඒ පාරාජිකා වරදකි.

ii ආජීව හෙතු ආජීවකාරණා සඤ්චරිත්තං සමාපජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

ජීවත්වීම සඳහා එවේලෙහි තමුදු වැරදී හැසිරීම පිණිස පුරුෂයෙකු ගේ කැමැත්ත ස්ත්‍රියකට හෝ ස්ත්‍රියක ගේ කැමැත්ත පුරුෂයෙකුට හෝ කියයි ද සඞ්ඝාදිසෙස වරදකි. (මේ මගුල් කපු කමයි )

iii ආජීව හෙතු ආජීවකාරණා යො තෙ විහාරෙ වසති සො භික්ඛු අරහා ති භණති පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස.

ජීවත්වීම සඳහා (තමා ගැනම, තමාගේ නම නොකියා) "ඔබගේ විහාරයෙහි යමෙක් වෙසෙසි ද ඒ භික්ෂූ රහත්යැ" යි කියයි ද, අසන්නා දැනගතහොත් ථුල්ලච්චය = ලොකු වරද-කි

iv ආජීව හෙතු ආජීවකාරණා භික්ඛු පණීතභොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස.

ජීවත්වීම සඳහා භික්ෂුවක් මිහිරි බොජුන් අසනීපයක් නො, මැතිව තමා පිණිස දැනුම් දී ගෙන්වා ගෙන වළඳයි ද, ඒ පචිති වරදකි.

v ආජීවහෙතු ආජීවකාරණා භික්ඛුණී පණීත භොජනානි -පෙ- පාටිදෙසනියස්ස

භික්ෂුණියක් යටකී පරිද්දෙන් කළහොත් ඈට පාටිදෙසනීය වරදකි.

vi ආජීවහෙතු ආජීවකාරණා සූපං වා ඔදනං වා අගිලානා අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

භික්ෂුණියක් ව්‍යඤ්ජන හෝ බත් හෝ අසනීපයක් නො, මැතිව තමා උදෙසා ගෙන්වා ගෙන වළඳයි ද දුකුලා වරදකි.

ඉක්බිති භික්ෂුව ගේ ජීවත්වීම කැළැල් වන කුහනාදි ලාමක පැවතුම් රාශියක් ම දේශනා කොට ඇති බැවින් මෙහිලා ඉක්කිපයක් සඳහන් කෙරේ.

ප්‍රධාන ලාමක පැවතුම් පහකි. කුහනා, ලපනා, නෙමිත්තකතා, නිප්පෙසිකතා, ලාභෙනලාභං නිජිගිංසනතා, යනුයි.

1. කුහනා: "තත්ථ කතමා කුහනා? ලාභසක්කාරසිලොක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පච්චය පටිසෙධන සංඛාතෙන වා සාමන්තජප්පිතෙන වා ඉරියා පථස්ස වා අට්ඨපනා ඨපනා සණ්ඨපනා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං අයං වුච්චති කුහනා" – වි. ප.

එහි කුහනා යනු කවරේද? ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා බලාපොරොත්තු ඇති, නැති ගුණ හඟවනු කැමති, ආසාවෙන් මඩනා ලද, භික්ෂුවක ගේ යම් සිවුපසය මැලකීම් වශයෙන් හෝ ලං කොට කථා කිරීම් වශයෙන් හෝ යෑම් ඊම් ආදී ඉරියව්වක ගේ යම් වෙනස් ගතියක් පෑම් වශයෙන් හෝ කුහක බවක් ඇත්නම් ඒ කුහනා නම්.

මේ දේශනා පාඨයෙහි කුහක ගති තුනෙකි. සිවුපසය මැලැක්ම, ලං කොට කථා කිරීම, ඉරියවු පැවැත්ම යනුයි. මෙම තුන් අයුරින් ම තම සිත ඇතුලේ පවතින නැතිගුණ හඟවන කුහක ගති පෙන්නුම් කෙරේ.

## 1. පච්චය පටිසෙධන කුහනාව:

ඇතැම් භික්ෂුවක් දායකයන් විසින් සිවුරු, ආහාර, සෙනසුන් (ලැගුම් ගෙවල්) බෙහෙත් යන සිවුපසය අතුරෙන් යමකින් පවරද්දී, හේ බොහෝ ලබාගනු කැමැත්ත සිතෙහි ඇතිව මෙසේ කියයි. "මේ වටිනා සිවුරු භික්ෂූන්ට කුමකටද? උන්වහන්සේට සුදුසු කසල ගොඩකින් හෝ සොහොනකින් හෝ අහුලාගත් රෙදි කැබලි වලින් මසාගත් සිවුරක් නෝද? මේ තරම් හොඳ දානය කුමකටද? උන්වහන්සේ වළඳනුයේ ගෙයක් පාසා ගොස් ලැබෙන යමක්. මේ ප්‍රාසාද වැනි කුටි, කාමර, කුමකටද? හිඳගත් විට දණහිස් දෙක නො තෙමේ නම් ඒ මදිද? ඔය ගිතෙල්, මී පැණි, ආදී වටිනා බෙහෙත් භික්ෂුවකට අවශ්‍ය නැත. උන් වහන්සේට බුදුරජාණන් වහන්සේ නියම කර වදාළේ හෝ මූත්‍රයෙන් සාදාගත් අරළුය" කියායි. මේ වචනයන්ට රැවටුනු දායකයෝ "අනේ

අපේ හාමුදුරුවන් කිසිම දෙයක් පිළිගන්නේ නැතැ"යි කියා සිතමින් සිට කෙසේ හෝ උන්වහන්සේට රෙදි කැබෙල්ලක්වත් බත් සැන්දක්වත් පිළිගන්වා ගතහොත් බොහෝම හොඳයැ"යි කියමින් පිළිගන්වත්. එවිට ඒ භික්ෂු බණ දෙසන්නට පටන් ගනියි. "දායක වරුනි, මට ඔය දේවල් වලින් අවශ්‍ය කමක් නැහැ. එසේ නමුත් මා නො ගතහොත් ඔබලා පිනෙන් පිරිහෙනවනෙ. ඉතින් ඔබලාට ශ්‍රද්ධාවක් ඇත්නම් දෙන්ට දේකුත් ඇත්නම් මා නො ගත්තොත්!" මෙසේ කියා එතැන් සිට ලොරි ගණන් සිවුපසය ගනියි. මේ සිවුපසය වැලැක්වීම වූ කුහනාවයි.

## 2. සාමන්තජප්පන කුහනාව:

මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් නැති ගුණ හඟවනු කැමතියේ ආශාවෙන් මඩනා ලදුව "මා මෙසේ කීයේ නම් මහජනයා මට ගෞරව කරයි" යනුවෙන් අදහස් ඇතිව, ධ්‍යාන මාර්ග ඵල තමා ලඟ ඇතැයි අනුනට හැඟෙන පරිද්දෙන් ඒවාට ලංකර, තමාගේ සිවුරු, පාත්‍රාදිය පෙන්වා මෙසේ කියයි. "මෙවැනි සිවුරක් යම් භික්ෂුවක් දරයි ද, ඒ එසේ මෙසේ කෙනෙක් නො වේ, මහේශාක්‍ය කෙනෙකි. පුණ්‍යවන්තයෙකි. මෙබඳු පාත්‍රයක්, මෙබඳු පටියක්, මෙබඳු පාවහන් යුවලක් ආදී ඒ ඒ දෑ පෙන්වමින් මෙවා පරිහරණය කරන්නාවූ යම් භික්ෂුවක් වෙයි නම් හේ ඉතා උසස් කෙනෙකි. පින්වතෙකි. එසේ ම මෙවැනි ගුරුතුමෙක්, සමාන භික්ෂුවක්, ආශ්‍රය කරන භික්ෂුව ද මහේශාක්‍ය කෙනෙකි." ආදී නොයෙක් අයුරින් මුහුණ හකුළු හකුළා නළල රැළි ගස්වමින්, මුහුණ ඔබිනොබ හරවමින් මහ ජනයා විශ්මය වන ලෙස කථා කරයි. මෙසේ වූයේ සාමන්ත ජප්පන කුහන වත්ථුවයි.

## 3. ඉරියාපථ කුහනාව:

මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් නැති ගුණ හඟවනු කැමතිව, ආශාවෙන් මඩනා ලදුව, "මේ අයුරින් සිටියහොත් මහජනයා සලකයි" යනුවෙන් අදහස් කර මෙසේ පවතියි. හොඳ භාවනානුයෝගියෙකු සේ සෙමෙන් යයි. ඉතා හෙමින් යයි. ඉතා හෙමින් පය තබයි. ඉතා හෙමින් ගනියි, නැවති විමසන්නාක් මෙන් ඒ මේ අත බලා වාඩිවෙයි. "මීට වඩා මේ අයුරින් ගියහොත් මැනවැ"යි තව තවත් අමුතු ඉරියව් පවත්වයි. බලා සිටිද්දී

හෙමින් ගොස්, තැන තැන වේගයෙන් යයි (පෙරවිසූ තාපස නිකායිකයින් මෙනි.) මෙසේ මහජනයා විශ්මය - පුදුම වන අයුරින් ඉරියවු පැවැත්වීම ඉරියාපථ කුහනාවයි.

ලපනා: ''තත්ථ කතමා ලපනා? ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං ආලපනා ලපනා සල්ලපනා උල්ලපනා සමුල්ලපනා උන්නහනා සමුන්නහනා උක්කාචනා සමුක්කාචනා අනුප්පියභාණිතා චාටුකම්‍යතා මුග්ගසුප්පතා පාරිභට්‍යතා අයං 'වුච්චති ලපනා'' - වි. ප.

ලපනා නම් කවරේද? ලාභ, සත්කාර, කීර්ති, බලාපොරොත්තු ඇති, නැති ගුණ හගවනු කැමති, ලෝභයෙන් මඩනා ලද යම භික්ෂුවක ගේ අනුහට කියන යම් කියමනක් වේද ඒ ලපනා ආදී කියමන් ලපනා නම්.

මෙහි ලපනාව තෙලෙස් අයුරකින් සඳහන්ය, ඔව්හු නම්:- විහාරයට පැමිණි මිනිසුන් සමග මුලින් ම කථා කිරීම ලපනායි. (සිවුපසය ලබාගැනීමේ අදහසිනි) ''පින්වත්නි, කුමක් සඳහා ද පැමිණියෝ? දානයකට ආරාධනා කරන්ට ද? ආ! එහෙනම් හොඳයි. මා පසුව එන්නම්'' යනුවෙන් හෝ ''අර ඇමතිතුමා මා ගැන දූත් හොඳට පැහැදිලා, අසවල් මුදලාලි අසවල් මහත්මයා මා ගැන ඒ අය සතුටුයි.'' මේ ආදී වශයෙන් හෝ පළමුකොට කථා කිරීම ලපනා යන්නෙන් වැඩිදුරටත් පැහැදිලි වෙයි. ඇසූ කෙනෙකුට එසේ කීම සල්ලපනායි'

දායකයෝ කලකිරෙති'ති බියෙන් ඔවුනට ද ඉඩ දී කථා කිරීම !''උල්ලපනා''යි. සමුල්ලපනා යනු ''මේ තැනැත්තා මහා දානපතියෙක්, හොඳට මුදල් ඇති කෙනෙක්, පින් ගුලක් ආදී වශයෙන් දායකයා උසස් කොට කීමයි. හැම අයුරින් ම උසස් කොට කථා කිරීම උන්නහනායි. නැවත නැවත දායකයා වෙලෙන පරිද්දෙන් කීම සමුන්නහනායි ඔසවා කීම උක්කාචනායි. ඒ මෙසේ යි: ''අසවල් දායකයා මා ගැන දනියි. ඔහුට යමක් ඇත්නම් දෙන්නේ මටම යි'' යනාදී කියමන්ය. හැම අයුරින් ම ඔසවා කීම සමුක්කාචනායි. අනුප්පියභාණිතා යනු ඇත්තට හෝ ධර්මයට හෝ අනුව නො බලා නැවත නැවත සිත් ගන්නා පරිද්දෙන් මිහිරි තෙපුල් කීමයි. තමා පහත් කොට කීම චාටුකම්‍යතා යි. මුග්ගසූප්පතා නම් මුං තැම්බූ විට ඇතැම් ඇට තැම්බෙයි. ඇතැම් ඇට අමුව තිබෙයි. එමෙන් ඇත්ත අඩු කොට, බොරු

වැනි කොට කියමනාම යි. දායකයන් ගේ දරුවන් දුටු කල කිරි මවුන් සේ වඩාගැන්ම පාරිභට්ටතා යි, ඔවුන් සුරතල් කිරීම් ආදිය ද මීට ම ඇතුළත් ය. යන මේ දහතුන ලපනා යන වැරදි දිවි පැවැත්ම සඳහා කියනා වචනයි.

නෙමිත්තකතා "තත්ථ කතමා නෙමිත්තකතා? ලාභ සක්කාරසිලොක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යං පරෙසං නිමිත්තං නිමිත්තකම්මං ඔභාසො ඔභාසකම්මං සාමන්තජප්පා පරිකථා අයං වුච්චති නෙමිත්තකතා" – වි. ප. නෙමිත්තකතා පස් වැදෑරුම් ය.

i නිමිත්ත: සිවුපසය ලබා ගැනීම සඳහා අනුන් ගේ සිත් දිනා ගැනීමට කියනු ලබන වචන, කරනු ලබන ක්‍රියායි.

ii නිමිත්තකම්ම: තමාට අවශ්‍ය මේ යයි නො කියා හැඟෙන පරිදි යමක් කිරීමයි. දායකයෙකු දුටු විට කුසට අත තබා ඉවත ගත් කල්හි "අනේ! මේ හාමුදුරුවන් කුසගින්නේය" යි සිතා දානය සපයයි. එවැනි ක්‍රියා නිමිත්ත කම්යි.

iii ඔභාස: සිවුපසය ගැන කථා කිරීම "අසවල් ගෙදර ඊයේ බොහෝ භික්ෂූන්ට දානය දුන්හ. අසවල් භික්ෂුවක මාහැඟි සිවුරක් ලැබුණා" ආදී කියමන්ය.

iv ඔභාසකම්ම: කෙළින් ම නො කියා අවශ්‍ය බව වචනයෙන් හැඟවීමයි. ගොයම් කපන ගොවීහු දැක, "ගොවිමහතුනි, මෙදා අස්වැන්න හේම හොඳට ඇති නේද? හාමුදුරුවන්ටත් ඔවායින් දානය වළඳන්ට ලැබෙයි නෙ..." යනාදී කියමන්ය.

v සාමන්තජප්ප; සිවුපසය ලැබෙන පරිදි ලං කොට කථා කිරීම යි, මේ නෙමිත්තකතා නම් වූ වැරදි ජීවිතයයි.

නිප්පෙසිකතා: "තත්ථ කතමා නිප්පෙසිකතා? ලාභ සක්කාර සිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං අක්කොසනා වම්භනා ගරහනා උක්ඛෙපනා සමුක්ඛෙපනා ඛිපනා සංඛිපනා පාපනා සංපාපනා අවණ්ණහාරිකා පරපිට්ඨිමංසිකතා අයං වුච්චති නිප්පෙසිකතා" –වි. ප.

නිප්පෙසිකතා එකොළොස් ආකාරය.

i අක්කොසනා: දස වැදෑරුම් ගර්හා කරුණු වලින් ගර්හා කිරීමය. –හැරගීම්– ඒ දසය නම්: "චොරොසි බාලොසි

මූළ්හෝසි ඔට්ඨෝසි ගොණෝසි ගද්‍රභෝසි නේරයිකෝසි තිරච්ඡානගතෝසි නත්ථි තුය්හං සුගති දුග්ගතියෙව තුය්හං පාටිකඞ්ඛා'' ධ. ප අ 107 පි. (තෝ සොරෙක් වෙහි, පහත් කෙනෙක් වෙහි, මෝඩයෙක් වෙහි, ඔටුවෙක් වෙහි, ගොණෙක් වෙහි කොටළුවෙක් වෙහි, තිරිසනෙක් වෙහි, තට සුගතියක් නැත, තට දුගතියම කැමති විය යුතු යනුයි.

ii වම්භනා: නින්දා කිරීම වශයෙන් කීම.

iii ගරහනා: නුඹට ශ්‍රද්ධාවක් නැත, ආදී වශයෙන් දෝෂාරෝපණය කිරීම.

iv උක්ඛෙපනා; නින්දා අදහසින් ම ගුණ නැතියෙකුට "නුඹ හරිම ගුණවතා"යි ආදී වශයෙන් කීම.

v සමුක්ඛෙපනා හැම අයුරින් ම එසේ නින්දා අදහසින් ඔසවා කීම.

vi ඛිපනා: "මොහු ගේ ජීවිතයෙන් ඇති ප්‍රයෝජන කුමක්ද? මොහු බිජුවට කන්නෙක!" මේ ආදී වශයෙන් කවටකම් කිරිම. (බිජුවට යනු රෝපණය නො කරන ශ්‍රද්ධා බීජයයි.)

vii සංඛිපනා: "කව්ද මොහු නො දෙන්නෙක් කියන්නෙ? මොහු හැමදා ම 'නැහැ' යන වචනය නමුත් දෙනව නේද? මේ ආදී වශයෙන් පෙරටත් වඩා කවටකම් කිරීම.

viii පාපනා: නො දෙන්නා ගේ අගුණ පැමිණවීම.

ix සංපාපනා: හැම අයුරින් ම එසේ අගුණ පැමිණවීම.

x අවණ්ණභාසිතා: අගුණ කියමනට බියෙන් හෝ මොහු නොදේදැයි හැම තැන ම ගොස් අගුණ කියා පෑම.

xi පරපිට්ඨිමංසිකතා ඉදිරිපිට ගුණ කියා නැති තැන අගුණ කීම.

මෙසේ විස්තර කළ වැරදි ජීවත් වීමටය නිප්පෙසිකතායයි කියනුයේ. හුණ පතුරෙන් පිට සූරන්නා සේ ගුණ සූරා දමන හෙයින්ද, සුවඳ වගී සුණු කොට සුවඳ ලබන්නා සේ කීමෙන් වෙහෙසට පත්කොට ලාභ ලබන හෙයින් ද ඒ නාමය යෙදිණ.

ලාභෙන ලාභං නිජීගිංසනතා "තත්ථ කතමා ලාභෙන ලාභං නිජීගිංසනතා? ලාභසක්කාර සිලොකසන්නිස්සිතො පාපිච්ඡො ඉච්ඡාපකතො ඉතොලද්ධං ආමිසං අමුත්‍ර හරති, අමුත්‍ර වා ලද්ධං ආමිසං ඉධාහරති, යා එවරූපා ආමිසෙන ආමිසස්ස එට්ඨිගවෙට්ඨි පරියෙට්ඨි එසනා ගවෙසනා පරියෙසනා අයං වුච්චති ලාභෙන ලාභං නිජීගිංසනතා"- වි: ප.

ලාභ, සත්කාර, කීර්ති, බලාපොරොත්තු ඇති, නැති ගුණ හගවනු කැමති, ලෝභයෙන් මඩනා ලද. භික්ෂුවක් මෙතැනින් (මේ ගෙදරින්) ලද පිණ්ඩපාතය, අනෙක් තැනට ගෙන යයිද, එතැනින් ලද පිණ්ඩපාතය, මෙතැනට ගෙන එයිද, මෙබඳු වූ ආමිෂයෙන් ආමිෂය සොයන යම් සෙවීමක් වෙයිද, නැවත සෙවීමක් වේද, මෙය ලාභයෙන් ලාභය සෙවීම යැයි කියනුලැබේ

තවද, තමා ලද සිවුරු, රෙදි, ඇඳ, පුටු, ආදී දෑයක් නමුදු ලාභ බලාපොරොත්තුවෙන් හුවමාරු කරයිද, එයත් වැරදි සෙවීමට ම ඇතුලත් ය ඒ සඳහා සික්ඛපදයක් ද ඇත. "යො පන භික්ඛු නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං" යම් භික්ෂුවක් නොයෙක් අයුරු කැපබඩු ගණුදෙනුවට පැමිණේ නම් නිසගි පචිතිසි.

කුහනාලපනාදී වැරදි ජීවිකා ක්‍රම විස්තරයයි මේ. තවද, යම් භික්ෂුවක් ශාසනයට නො ගැලපෙන වෙදකම් කිරීම්, නැකත් කීම, නිමිති කීම්, ශාස්ත්‍ර කීම් ආදී දෑ ජීවිකා වෘත්තිය සඳහා කරයි නම් එද ආජීවය කෙලෙසන ජීවිකායි.

මෙසේ සියලු වැරදි වලින් නිදහස් වූ දැහැමෙන් සෙමෙන් ලද දෑයින් සතුටුව, මදයැයි නො ඉල්ලා, ටිකකින් නමුත් කැමති වෙමින්, අනුනට පහසුවෙන් සැලකිය හැකි ජීවිතයකට පුරුදුව, වැඩි පිරිකර රැස් කිරීමක් ද නො මැතිව සැහැල්ලු නිරහඞ්කාර ලෙස ජීවත්වීම ආජීවපාරිශුද්ධි සීලයයි.

මේ ආජීවපාරිශුද්ධි ශීලය ශරීරය වෙහෙස කිරීමෙන් සම්පූර්ණ කළයුතු හෙයින් වීර්යයෙන් සැපයි යුතු.

"අඤ්ඤා හි ලාභූපනිසා - අඤ්ඤා නිබ්බාන ගාමිනී
එවමෙතං අභිඤ්ඤාය - භික්ඛු බුද්ධස්ස සාවකො
සක්කාරං නාභිනන්දෙය්‍ය - විවෙකමනුබ්‍රූහයෙ"

—ධම්මපදය.

සිවුපසය ආදී ලාභ උපදවන පිළිවෙත අනෙකකි. නිවන් ලබන පිළිවෙත අනෙකකි. මේ දෙක තේරුම් ගත් බුදුසව් තෙමේ සත්කාරයට සතුටු නොවී විවේකය වඩන්නේය. විවේකය තුන් වැදෑරුම්ය, කාය, චිත්ත, උපධි, යනුයි. හුදකලාවීම කායවිවේක යයි. නීවරණ ධර්‍ම දුරුකිරීම චිත්තවිවේකයයි. සංස්කාරයන් ගෙන් නිදහස් වීම උපධි විවේකයයි.

ආජීවපාරිශු සීලය මෙතෙකින් අවසානයි.

## ප්‍රත්‍යසන්නිඃශ්‍රිත ශීලය.

භික්‍ෂුවකට ජීවත්වීම සඳහා උපයෝගී වන සිවුරු, පිණ්ඩ- පාත, ආහාර, සෙනසුන්, බෙහෙත්, යන මේ සතර, "පච්චය"- ප්‍රත්‍යය නම්. ජීවත්වීමට හේතුවන යන අදහසයි. මේවා පරිභෝග – පාවිච්චි – කිරීමේදී උපදින ලෝභය, ද්වේෂය, මෝහය ආදී පාපධර්මයන් නූපදවා ගැනීම සඳහා සිහි නුවණින් යුතුව මෙනෙහි කරමින් පරිභෝග කිරීම ප්‍රත්‍යසන්නිඃශ්‍රිත සීලයයි. "පටිසංඛාන සුපරිසුද්ධා චතුපච්චය පරිභොගෙ පච්චයසන්නි- ස්සිත සීලං නාම" සිහි නුවණින් සලකා බැලීම නිසා පාපධර්මයන් ගෙන් නිදහස්ව පිරිසුදු වූ සිවුපස මැළදීම පච්චයසන්නිස්සිත සීලය බව විශුද්ධිමාර්ගය කියයි. සිහි නුවණින් සලකා බැලීම ප්‍රත්‍යවෙක්‍ෂා නම්. ":පස්විකුම්" සිංහල වචනයයි.

චීවර ප්‍රත්‍යවෙක්‍ෂා ක්‍රමය: සිවුරු පස්විකන අයුරු.

"පටිසංඛායොනිසො චීවරං පටිසෙවාමි යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදෙව හිරිකොපීන පටිච්ඡාදනත්ථං."

සිහි නුවණින් සිවුර පොරවමි. හුදෙක් ශීත, උෂ්ණ, මැසි, මදුරු, සුළං, අව්රැස්, දිග සපුන් ගේ පහස, නැතිකර ගැනුම සඳහා ය. හුදෙක් ලජ්ජා තැන් වසාගනු සඳහාම ය.

සිවුරක් පෙරවීම නිසා සිදුවන, සිදුවිය හැකි කරදර ද, අශීලාචාරකම ද වලකා, සැරසීම්, ඔපදැමීම්, වැඩියක් බලාපොරොත්තුවීම්, නිසා ඇතිවිය හැකි රාගාදී කෙලෙස් ද නූපදවා ගැනුමට බුදුරජාණන් වහන්සේ ඉගැන් වූ අයුරුයි මේ. මෙයින් නිසණ්

යන්නේ හැසිරෙන අත්තකිලමථානුයෝගයට හෝ වැඩියක් සැර සිම වශයෙන් කෙරෙන කාමසුඛල්ලිකානුයෝගයට හෝ නො වැටී ඊට මැදින් විසිය යුතු අයුරු පෙන්වයි. විස්තර මෙසේ දත යුතු.

**පටිසංඛායොනිසො** "උපායෙන පථෙන පටිසංඛාය ඤත්වා පච්චවෙක්ඛිත්වාති අත්ථො" උපාය නුවණින් දැන ප්‍රත්‍යවේක්ෂා කොට යන තේරුමයි. මෙහි ප්‍රත්‍යවේක්ෂාකිරීම ම "පටිසංඛායොනිසො" යනුවෙන් දේශිතය. උපාය නුවණ යනු පෙර දැක්වූ පරිදි අන්ත දෙකට නො වැටී, නියම ප්‍රයෝජන සැලකීමෙන් මධ්‍යම ප්‍රතිපදාවට බැසගන්නා ඥානය යි. කෙලෙස් දුරු වීමටයැයි සිතා සිවුරු සම්පූර්ණයෙන් අත්කිරීමෙන් අතිධාවනය කට හෝ හැකිතාක් වැලඳීමෙන් ආශාව දුරුවේය යන හැඟීම ඇතිකොට ප්‍රතිපදාව ලිහිල් වශයෙන් ගැනීමකට හෝ නො පත්ව සිහියත් නුවණත් යෙදවීම "පටිසංඛායොනිසො" යන්නෙන් කියැවේ.

**චීවරං** : තුන් සිවුරෙන් එකකි. තුන් සිවුර නම් සඞ්ඝාටි - දෙපට සිවුර, උත්තරාසඞ්ග - තනිපට සිවුර, අන්තරවාසක - අඳනය, යනුයි. මෙයින් යමක් හැද පෙරවයි නම් ඒ සඳහා එකක් දැක්වූහ. සෙසු සිවුරුත් මෙයට ම ඇතුලත් ය. එනම් අංසකඩය, කාන කඩය, නිසීදනය - හිඳගන්නා ඇතිරිල්ල, කණ්ඩුපටිච්ඡාදනය - කොරි, දද, ආදී තුවාල වැසෙන ලෙස අඳිනා සිවුර, වස්සික සාටික - වැසිසළු, මුඛපුඤ්ඡන - මුහුණ පිසින තුවා, යන අතිරේක සිවුරුත් ගත යුතුය.

**පටිසෙවාමි** : පෙරවමි, හඳිමි, පරිභොග කරමි යනුයි. **යාවදෙව** : මේ පදය යෙදූයේ මතු කියනු ලබන ප්‍රයෝජන හැර, අන් කරුණක් නිසා නො වේය යන සිහිය ඉපදවීමටය. හුදෙක්, තනිකර, මේ නිසා ම, යන තේරුමයි.

**සීතස්සපටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය**: සීත, උෂ්ණ, වැළැක්ම පිණිස යන අදහස යි. ශීත, උෂ්ණ, දෙපරිද්දෙකින් ශරීරයට ඇති වේ. ශරීරගත පඨවි ආදී ධාතූන් ගේ කැලඹීමෙන්, නැතහොත් සෘතු පෙරළීම් නිසා පිටතින් පැමිණී මෙන් යනුයි. ශරීරයට දැනෙන ශීත ගතිය සිවුර නිසා වලක්වා ගැන්මට පුළුවන. එහෙත් ශරීරයෙන් හටගන්නා උෂ්ණය වැළැක්මට නුපුළුවන. එහෙයින් මෙහිදී ගතයුත්තේ පිටතින් පැමිණෙන ගිනිරස්නය. වලක්වා ගැනීමට යන්නය. මෙසේ ශීත, උෂ්ණ දෙක වැළැක්වීම සිවුරෙන් සිදුවේ.

ඩංස මකසවාතාතපසිරිංසප සම්ඵස්සානං: මෙහි පද පහකි. ඩංස, මකස, වාත, ආතප, සිරිංසපසම්ඵස්ස, යනුයි. විදින මැස්සෝ ඩංස නම් වෙත්. මකස යනු මදුරුවෝයි. දූවිලිසහිත හෝ රහිත හෝ සුළං වාත නම්. හිරුගෙන් එන රස්නය ආතපයි. සිරුර තැවෙන, තැම්බෙන නිසා මේ නම යෙදිණ නයි. පොළොං කුණකටු, කරවල්, ආදී දිග විස සතුන් සිරිංසප යි. ඔවුන් ගේ ස්පර්ශය-ගෑවීම-දෂ්ටකිරීම සම්ඵස්ස නම්. මෙතෙක් කරදර දේවල් පටිඝාතාය-වැළැක් ම පිණිසය - මේ සිවුරු වළඳනුයේ.

හිරිකොපීනපටිච්ඡාදනත්ථං: ලජ්ජා කටයුතු තැන් වසා ගැන්ම සඳහා යම් තැනක් විවෘතව- හැර තුබූ කල්හි ලජ්ජාව කිපෙයි ද, නැතිව යයි ද, එබඳු තැන් "හිරිකොපීන" නම්. කිහිලි දෙක, රහස් පෙදෙස, ආදී තැන් ලජ්ජා ස්ථාන යි. වසා ගැන්ම පටිච්ඡාදනය නම්.

තවද, මේ සිවුරු පරිභෝගය අප්‍රධාන, ප්‍රධාන, යන ප්‍රයෝජන දෙකක් ඇත. ශීත, උෂ්ණාදී දෑ වැළැක්වීම අප්‍රධාන ප්‍රයෝජනයි. ලජ්ජා තැන් වසා ගැන්ම ප්‍රධාන ප්‍රයෝජනයි. "යාවදෙව" යන පදය දෙවරක් යෙදූයේ එහෙයිනි.

මේ චීවර ප්‍රත්‍යවේක්ෂා ක්‍රමයයි.

## පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය:

"පටිසංඛායොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසු විහාරො ච"

සිහි නුවණින් පිණ්ඩපාතය-ආහාරය - වළඳමි. (කුමක් සඳහාද?) ක්‍රීඩා පිණිස, -මද-සිරුර පිනවීම්-සැරසුම් පිණිස නොවේ. හුදෙක් මේ සිරුරේ පැවැත්ම පිණිසය. කුසගින්න නැති කර ගැනිම පිණිසය. උතුම් හැසිරීමට උපකාර පිණිසය. මෙසේ පෙර තුබූ කුසගිනි වේදනාව ද නැති කරමි. වැඩිපුර ගැන්ම නිසා ඇති වන අළුත් වේදනාව ද නූපදවමි. මේ නිසා ජීවිත ගමනය, නිවැරදි බව, පහසු විසීම, වන්නේ ය. මෙසේ පිණ්ඩපාතය ගැන නුවණින් සලකා වළඳයිනම් හේ මැදුම් පිළිවෙත ගමන් කරන්නෙකි.

මෙය විස්තර කරනුයේ පෙර දැක් වූ පද අත්හැර ය.

පිණ්ඩපාතං: පිණ්ඩපාතය. එනම් භික්ෂුව ගේ ආහාරය. එය පිඬු පිණිස හැසිරීමෙන් ලද නිසා පිණ්ඩපාත යනු නමකි. "පිණ්ඩොල්‍යෙන පතෙත පතිතත්තා පිණ්ඩපාතො" පිඬු පිණිස හැසිරීමෙන් පාත්‍රයෙහි වැටුණු බැවින් පිණ්ඩපාත නම්. නැතහොත් "පිණ්ඩානං පාතො පිණ්ඩපාතො" බත් ආදී ආහාර පිඬුවල වැටීම පිණ්ඩපාතයි. මේ තේරුම් දෙක ම ශාසන නියම යේ අයුරින් ගත හැක. භික්ෂුව ගේ ආහාර සපයා ගැනීමේ මූලික ක්‍රමය පිණ්ඩපාතය යැමයි. ඒ ගියපසු ඒ ඒ තැනින් පාත්‍රයට පිඬු ලැබෙයි. එහෙයින් ඒ ලැබූ ආහාරය පිණ්ඩපාතයි, දෙවැන්න භික්ෂුවට සඞ්ඝිකදාන, පෞද්ගලිකදාන, ආදී අතිරේක දාන ද නියමිත ය. එතැන්හිදී ද තම පාත්‍රයට පිඬු ලැබේ. එම තේරුම ද ගත හැක. මෙසේ පිඬු පිණිස හැසිරීමෙන් හෝ අනෙක් සාරූප්‍ය-සුදුසු ක්‍රමයකින් හෝ ලද ආහාරය පිණ්ඩපාත නම්.

ආහාරය ප්‍රධාන වශයෙන් පස් වැදෑරුම් ය. ඔදන, සත්තු, කුම්මාස, මච්ඡ, මාංස, යනුයි. "පඤ්චභොජන" යනු ද නමෙකි. වී, කුරක්කන්, ඉරිඟු, තිරිඟු, තණ, බඩහමු, ආදී ධාන්‍ය තැම්බූ ආහාර "ඔදන" නම්. ඒවා කබලෙහි බැද සෑදූ රස වර්ගී කුම්මාස යි. ජලයෙහි වෙසෙන, මිනිසා ආහාරයට යනු ලබන, සතුන් ගේ මස් "මච්ඡ" නම්. මංස යනු කැප ගොඩමස් ය. මේ වර්ගී පස ප්‍රධාන කොට ඇති, කනු ලබන සියලු ආහාර පිණ්ඩපාත නම් වෙයි. (පිණ්ඩපාතය, මස් මාළු දෙකින් තොර විය යුතුය යනු කාගේ පැණවීමක් ද යනු විමසිය යුතු.)

නෙවදවාය: කුඩා දරුවන් සේ සෙල්ලම් පිණිස නොවේ,

නමදාය : තරුණ පිරිස සේ කලබලගති පැවැත්වීම සඳහා නොවේ මෙහි "මද" යනු ඒ ඒ කරුණු නිසා ඇති වන කලබල ගතියයි. මත්වීම, ඒ නිසා ම හොඳ නරක දෙක විමසා ගැනීමට නො හැකිවීම, දක්ෂකම් පෙන්වීම, නලියන ගතිය, වැඩිහිටියන් ගේ අණට කීකරු නො වීම, මේ ආදිය මදයෙහි ස්වභාවය යි.

මෙසේ මත්වීම සඳහා පවතින කරුණු සත් විස්සක් විභඞ්ග යෙහි එයි. එනම්. ජාතිය, කුලය, නීරෝගිකම, තරුණකම, වැඩි කල් ජීවත්වීම, යම් යම් දේ ලැබීම, සැලකුම් ලැබීම, ගෞරව ලැබීම, ප්‍රධාන තනතුරු, බොහෝ පිරිස් ඇති බව, ධනය, ශරීර වර්ණය, උගත්කම, වැටහීමේ නුවණ, පැරණි සිදු වූ දේ සිහියේ

ඇති බව, පිණ්ඩපාතික ප්‍රතිපදාව, නින්දා නො ලබන බව, හොඳට ඉරියවු පැවැත්ම, සෞඛ්‍යය, කීර්තිය, ශීලය, ධ්‍යාන, ශිල්ප, හොඳ උස සිරුරක් ඇති බව, ඒ උසට සරිලන මහත ඇති බව හොඳ සටහන් ඇති සිරුරක් ඇති බව, අඞ්ග සම්පූර්ණ ශරීරයක් ඇති බව, යන මොහු යි.

න මණ්ඩනාය : අඟ - පසඟ පිනවීම පිණිස නො වේය. අන්තඃ පුර ස්ත්‍රීහු, වෙසඟනන්, සල්ලාලයන්, මේ ආදීහු ආහාර ගනුයේ පිණවීම සඳහා ය. මේ ආහාරය නිසා මගේ අත-පය, මුහුණ, ඉඟටිය, ආදී තැන් හොඳට වැඩේවා'' යන හැඟීම ඔවුන් තුළ බලපවත්ව යි. භික්ෂුව පිණ්ඩපාතය ගතයුත්තේ එසේ නොව පණ රැකගැනුම සඳහා ය.

න විභූසනාය: සැරසීම පිණිස නොවේ. නැටුම්, ගැයුම්, වැයුම්, ආදිය දක්වන, ජනයාගේ සිත් ඇදගනු සඳහා පෙනී සිටින, (ප්‍රදර්ශන) මිනිසුන් ආහාර ගන්නා විට සලකනුයේ සිරුරු පැහැපත් කර ගැනුමය. භික්ෂුව එසේ නොව පෙරකී සේ යත්නම් ජීවිතය රැකගැනුමට ය, පිණ්ඩපාතය වැළඳිය යුත්තේ.

ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය: මේ සිරුරේ නොසිඳී පැවැත්ම පිණිස ය. ආහාරයක් නො ගතහොත් ජීවත්විය හැක්කේ දින කතකි ඒ නිසා ආහාරය නො මැති විට ජීවිතය සිඳේ. මරණයට පත්වේ. එසේ නො වීම සඳහායි පිණ්ඩපාතය ගත යුත්තේ. තවද, ඇදහැලෙන ගෙයකට රුකුල් දෙන ගෙහිමියෙකු සේ, නද දෙන කඩ ඇණයට තෙල් දමන ගැල්කරුවෙකු සේ, ආ දෙස යන දෙස නො පෙනෙන කාන්තාරයක පුත්‍රමාංශය අනුභව කිරීමට සූදානම් මාපියන් සේ, ජීවිතයේ පණ රැකගැනීමට පමණක් මේ පිණ්ඩපාතය වළඳමි යනු තේරුමයි.

(කන්තාරෙ පුත්තමංසංව - අක්ඛස්සබ්භඤ්ජනං යථා
එවං ආහරි ආහාරං - යාපනත්ථායමුච්ඡිතො)

විහිංසූපරතියා : කුසගින්න නැතිකර ගැනීම පිණිසය.

බ්‍රහ්මචරියානුග්ගහාය: උතුම් හැසිරීමට රුකුල දීම පිණිසය. බ්‍රහමචරියාව දෙවැදෑරුම් ය. සාසන බ්‍රහමචරියා, මග්ග බ්‍රහම චරියා, යනුයි. ශික්ෂා සමාදානයේ පටන් ලෝකෝත්තර මාර්ගය දක්වා ප්‍රතිපත්තිය සාසන බ්‍රහමචරියාව යි. මාර්ග, ඵල මග්ග බ්‍රහ්ම චරියාව යි. ඒ දෙකට ම රුකුල් දීම ආහාරයෙන් සිදුවේ. සිරුර

නො පැවතුන හොත් දෙක ම අවශානය. රහත් වූව ද සිරුර පවතින තෙක් ආහාර ගතයුතු ය.

ඉති පුරාණඤ්ච වෙදනං පටිහංඛාමි, නවඤ්ච වෙදනං උප්පාදෙස්සාමි: මෙසේ පුරාණ වේදනා දුරු කරමි. අළුත් වේදනා නූපදවමි. කුසගින්න පුරාණ වේදනා යි. ආහාරය ගත්විට එය දුරුවෙයි. ආශාව නිසා වැඩියෙන් ආහාර ගත් කල්හි අළුත් වේදනා උපදී. මෙයින් අදහස් කරනුයේ කුසගිනි නිවීමේ ප්‍රමාණයට ආහාර ගත යුතුයි.

ඇතැමෙක් ආහාර ගෙන නැගිටීමට නොහැකිව අත් බිම ගසා නැගිටින "ආහාරහත්ථක" බමුණන් මෙන් බොහෝ කොට වළඳත් ඇතැමෙක් "අලංසාටක" නම්ලත් ඉණ බැදි වස්ත්‍රය පවා ළිහා දමන බමුණන් සේ ද, ඇතැමෙක් "තත්‍රවට්ටක" නම් වූ කා එතැන ම පෙරළෙන බමුණන් සේ ද, ඇතැමෙක් කාකමාසක නම් වූ, කපුටෙකු හොට දමා කෑහැකි තරම් ආහාර ගත් බමුණන් සේ ද; තවෙකෙක් "භුත්තවමිත" නම් වූ කා එහි ම වමනය දමන බමුණන් සේ ද, ආහාර ගනිත්. ඒ සියලු වැඩිපුර භෝජන, මේ අළුත් වේදනා නූපදවයි යන පාඨයෙන් වලක්වයි. පරිමිත භෝජනය නියමිත යි.

"චත්තාරො පඤ්ච ආලොපෙ - අභුත්වා උදකං පිවෙ
අලං ඵාසු විහාරාය - යුත්තයොගස්ස භික්ඛුනො"

සතර, පස්, පිඩක් වැළඳීමට ඉඩ තබා පැන් පිවිය යුතුය. එය යෝගාවචර භික්ෂුවට පහසු විහරණය සඳහා ප්‍රමාණවත්ය. මේ පරිමිත භෝජනය යි.

යාත්‍රා ච මෙ භවිස්සති: මගේ ජීවිත ගමන ද වන්නේය. ජීවිත ගමනය සිදුවනුයේ ජීවිතින්ද්‍රිය - ජීවත්වීමේ ශක්තිය - පැවතුන හොත් පමණි. එහෙයින් ඒ ජීවිතින්ද්‍රිය රැකගැනුමට පමණක් ආහාර ගත යුතුය. ගිලනෙක් බෙහෙත් වළඳනුයේ රෝගය සුව කර ගැනීමට පමණි. එසේ ම භික්ෂුව ද ආහාර ගතයුත්තේ පණ රැකගැනීමට පමණි.

අනවජ්ජතා ච ඵාසුවිහාරො ච : නිවැරදි බව ද, සැප විහරණය ද, යනුයි. පණ රැකගැනුම සඳහා ආහාර සොයන භික්ෂුව වැරදි සෙවීම් වලට නො බසී. නිවැරදි මගින් ලත් සුළු ආහාර සෙත් පවා දිවි ගලවයි. එහෙයින් නිවැරදිකම රැකෙයි. පමණට

ගන්නා නිසා සැප පහසු විසීම සිදුවෙයි. පමණට වඩා ගතහොත් අරති, තන්දි, විජම්භිකා, විඤ්ඤූගරහා, ආදී දොස් උපදියි. (පින් කම්හි නො ඇල්ම අරති යි. තන්දි යනු අලස කමයි. ඇඟමැලි කැඩීම විජම්භිකා නම්. විඤ්ඤූගරහා නම් නුවණැත්තන් විසින් නින්දා කිරීම යි.)

පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය නිමි.

## 3. සේනාසන ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය:

“පටිසංඛායොනිසො සෙනාසනං පටිසෙවාමි යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතප සරීසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං.”

සිහි නුවණින් සෙනසුන පරිහරණය කරමි. හුදෙක් සීත, උෂ්ණ, මැසි-මදුරු සුළං-අව්රැස්-දිග්සපුන් යන මොවුන් ගේ හැප්පීම-ස්පර්ශය, නැතිකර ගැනුම් සඳහා ය. එසේ ම පීඩාදායක-කරදර-දේශගුණය දුරුකරගැනීමටත් සිත භාවනාවෙහි ඇලුම් කර ගැන්මටත්, සඳහා ය.

මෙය ද විස්තර කරනුයේ නො දක්වූ පද පමණි.

සෙනාසනං: “සයනඤ්ච ආසනඤ්ච, යත්ථ යත්ථ හි සෙති විහාරෙ වා අඩ්ඪයොගාදිම්හි වා තං සෙනං, යත්ථ යත්ථ ආසති නිසීදති තං ආසනං, තං එකතො කත්වා සෙනාසනං.”

– වි. ම. 25 පි.

නිදාගන්නා තැන් ද, හිඳිනා තැන් ද; මේ පද දෙක එකට යෙදූවිට සේනාසනය යි. එහි, යම් විහාරයෙක හෝ ගුරුළා ගේ පියාපත් වැනි වහලක් ඇති ගෙයක හෝ මේ ආදී තැනක නිදයිද, එතැන “සෙන” නම්. යම් තැනක හිඳ ගනියිද එතැන “ආසන” නම්. නැවතී කරන ප්‍රධාන ඉරියව් දෙක සලකා සේනාසන නාමය සැදුනු බව මෙයින් පෙනේ. එයින් අදහස් කරනුයේ භික්ෂුව වැඩි වේලාවක් ඒ ඉරියව් දෙක යවයි නම් එය කළයුත්තේ සුදුසු, සැප, තැනක බවයි. ඒ සුදුසු තැන නම් කාය විවේකයට ඔබින, අඞ්ග පහකින් යුත් සෙනසුනයි. (මෙය සුතමය ඤාණයෙහි ආශ්‍රය.)

උතුපරිස්සය විනොදනං: උතු යනු සීත, උෂ්ණ, ආදියයි. ඒවායින් ඇතිවන කරදර "පරිස්සය" නම්. එය නැතිකර ගැනීම සඳහා සෙනසුන පරිභෝග කරමි.

පටිසල්ලානාරාමත්ථං: මෙහි "පටිසල්ලාන" යනු සිත භාවනාවට අනුව එකග කරගැනීමය. එහි සිත ඇලවීම පටිසල්ලානාරාමයයි. සෙනසුන පරිභෝග කරනුයේ මෙසේ දක්වූ කරුණු දෙක සලකාගෙනය.

## 4. ගිලානපච්චයභෙසජ්ජ පරික්ඛාර ප්‍රත්‍යවෙක්ෂා ක්‍රමය:

"පටිසංඛායොනිසො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවාමි, යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය, අබ්‍යාපජ්ඣපරමතායාති"

සිහි නුවණින් ගිලන් පස, බෙහෙත් පිරිකර වළඳමි. හුදෙක් රෝගයක් නිසා උපන් වේදනාවන් නැසීම පිණිසය. නිදුක් වීම පිණිසම ය.

ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං: මෙහි ගිලාන යනු රෝගය යි. පච්චය නම් විරුද්ධ දෙය යි. රෝගයට විරුද්ධ-හතුරු-දෙය ගිලානපච්චය නමි. ඒ කුමක් ද? බෙහෙත් ය. භිසජ් යන නාමයක් වෙදතුමා නියම කරන දෑ භෙසජ්ජය. එයට බොහෝ ද්‍රව්‍ය අවශ්‍ය නිසා "පරික්ඛාර" පිරිකර නාමය යෙදිණ. අරළු, බුළු, නෙල්ලි, රසකිඳ, ආදී බෙහෙත් වගී ගිලනාට අවශ්‍යය. මෙසේ බෙහෙත් වලට ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරයැ යි නැඳින් විණ.

මෙසේ දක්වූ සතර වැදෑරුම් ප්‍රත්‍යවේක්ෂා කාල දෙකකදී කළ යුතුය. එනම් පිළිගන්නා කාලය, වළඳනා කාලය, යනුයි. ප්‍රත්‍යවේක්ෂා කරන අයුරු ද දෙපරිදි ය ධාතු වශයෙන් හෝ පිළිකුල් වශයෙන් හෝ, නැතහොත් ඉහත දක්වූ ක්‍රමයෙන්, යනුයි. ධාතුමනසිකාරය, ආහාරෙපටික්කූල සඤ්ඤා, යන භාවනා දෙක වඩන්නහුට අමුතුවෙන් සිවුපස පස්විකුමක් අනවශ්‍යය. මක් නිසාද? ධාතුමනසිකාරයේ දී ආහාරයත් තමාත් ධාතු වශයෙන් ම සිත තබන අතර, ආහාරෙපටික්කූලසඤ්ඤාවේ දී පිළිකුල වශයෙන් සිත තබන හෙයිනි. ප්‍රත්‍යවේක්ෂා අවශ්‍ය වනුයේ එවැනි භාවනාවක් නො කරන්නහුට ය.

සිවු පසය ම පරිභෝග කාලයේ දී ප්‍රත්‍යවෙක්ෂා කළයුතුම ය. නැතහොත් ඉණ, ථෙය්‍ය, පරිභෝගයන්ට අසු වෙයි. පරිභෝග සතරෙකි. ථෙය්‍ය, ඉණ, දායජ්ජ, සාමි; යනුයි.

i දුශ්ශීල ව සිවුපසය පරිභෝග කිරීම ථෙය්‍ය පරිභොගය යි. හොරා කෑම යනුයි.

ii සිල්වත්ව ප්‍රත්‍යවෙක්ෂා නො කොට පරිභොග කිරීම ඉණ පරිභෝගය යි. එනම් ණයට කෑමයි.

iii සෝවාන් මාර්ගස්ථ ආයුෂ්මා ගේ පටන් අර්හත් මාර්ගස්ථ ආයුෂ්මතුන් වැඩ සිටින සප්තශෛක්ෂයන් ගේ පරිභෝගය දායජ්ජ යි. එනම් දායාදය පරිභෝගය යි. පියා වූ බුදුරජාණන් වහන්සේ නිසා ම උපදින හෙයිනි. දායකයන් දුන් නමුත් උන් වහන්සේ අනුදන වදාළ නිසා සිවුපසය උන් වහන්සේ ගේ ම ය. එහෙයින් එය අයත් වීම දායාදය යි. තවද සිල්වත් භික්ෂුව ප්‍රත්‍යවෙක්ෂා කොට වළඳයි නම් එය ද අයත්වනුයේ දායජ්ජපරිභෝගයටය. උන්වහන්සේ ගේ බලාපොරොත්තුව ද ශෛක්ෂභාවයට පත්වීමයි. එහෙයිනි.

iv රහතන් වහන්සේලා ගේ පරිභෝගය සාමිපරිභෝගයයි. තෘෂ්ණා දාසත්වයෙන්-ආශාමි නමැති දාසකමින් - අත් මිදුනු හෙයින් උන් වහන්සේලා ස්වාමීහුය. ප්‍රධානීහුය.

මෙහෙයින් දක් වූ ප්‍රත්‍යසන්නිඃශ්‍රිත ශීලය රැකිය යුත්තේ නුවණින් ය. ඥානය ප්‍රධාන යි. ප්‍රාතිමොක්ෂසංවර ශීලයට ශ්‍රද්ධා-වීර්‍ය්‍ය දෙක; ඉන්ද්‍රියසංවර සීලයට සිහිය, ආජීවපාරිසුද්ධි සීලයට වීර්‍ය්‍යය, ප්‍රධාන කරුණු වෙයි.

"කිකීව අණ්ඩං චමරීව වාලධිං
පියංව පුත්තං නයනං ව ඒකකං
තථෙව සීලං අනුරක්ඛමානකා
සුපෙසලා හොථ සදා සගාරවා."

කිරල් ඩෙනුව බිජුරක්නා සේ, සෙමර මුවා වලිගය රක්නා සේ එක පුතෙකු ඇති පියෙක් ඒ පුතු රක්නා සේ, එක් ඇහැක් ඇතියෙක් ඒ ඇස රක්නා සේ, සීලය රකිමින් හැමදා ප්‍රියශීලී-පැහැදීම ඇතිවන ගති ඇතිව-ගෞරව සහිත වන්න.

මෙතෙකින් සතර සංවර සීලය හෙවත් චතුපාරිශුද්ධි සීලය නිමි.

## සීලයාගේ සංකිලෙස - කිලුටුවීම.

චතුපාරිශුද්ධි සීලය කිළුටු වීමට හේතුවන කරුණු රාශියකි. එයින් ප්‍රධාන වශයෙන් ගනු ලබන්නේ ඛණ්ඩාදි භාවයයි. දෙවනුව ක්‍රොධ, උපනාහ, ආදී පාපධර්මයි. එසේ ම ශ්‍රද්ධාදී ගුණයන් දුර්වල වීම, සිහි නුවණ මදගතිය, පාපයට නො බිය බව; වැරදි කල්පනා ඉපදවීම, පාපමිත්‍ර ආශ්‍රය, මේ ආදී කරුණු හේතුවේ.

අපිරිසුදු සීලය ඛණ්ඩ, ඡිද්ද, සබල, කම්මාස, යන කොටස් සතරෙකි. නැතහොත් ඛණ්ඩාදිය නිසා සීලය අපිරිසුදු වේ,

i ඛණ්ඩශීලය: "යස්ස සත්තසු ආපත්තික්ඛන්ධෙසු ආදිම්හි වා අන්තෙ වා සික්ඛාපදං භින්නං හොති, තස්ස සීලං පරියන්තෙ ඡින්නසාටකො විය ඛණ්ඩං නාම හොති" - වි. ම. 38 පි. යමෙකු ගේ වනාහි ප්‍රාතිමොක්ෂසංවර ශීලයට අයත් වැරදි සමූහ සත අතුරෙන් මුල හෝ අග හෝ ශික්ෂාපදයක් කැඩී ඇත්නම් ඔහු ගේ ඒ ශීලය කෙළවර ඉරීගිය වස්ත්‍රයක් සෙයින් ඛණ්ඩ-කැඩුණු-නම් වෙයි.

ii ඡිද්දසීලය: යමෙකුගේ සිල් මැදින් කැඩී ඇත්නම් ඒ ඡිද්දයි.

iii සබල සීලය: පිළිවෙලින් එක දෙක බිඳී ඇත්නම් ඒ සබල-පුල්ලිගැහුනු-සිල්ය. කළු, සුදු, ආදී ලකුණු ඇති ගවයකු සිරුර මෙනි.

iv කම්මාස සීලය: යමෙකු ගේ සිල් අතරින්පතර බොහෝ සික පද කැඩී ඇත්නම් එය කබර ඉසුණු ගවයෙකු ගේ සිරුරක් මෙන් කම්මාස - කබර නමි.

මෙසේ ශීලය කිළුටු වීමට හේතුවන්නේ සත්වැදෑරුම් ලෙස සිදුවන ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවය යි. "සත්තවිධමෙථුන සංයොගය" යනු එය යි. ඒ මෙසේය.

"ඉධ බ්‍රාහමණ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා සම්මාබ්‍රහ්මචාරී පටිජානමානො න හෙව ඛො පන මාතුගාමෙන සද්ධිං ද්වයංද්වය සමාපත්තිං සමාපජ්ජති, අපි ච ඛො මාතුගාමස්ස උච්ඡාදනං නහාපනං සම්බාහනං සාදියති, සො තදස්සාදෙති, තං නිකාමෙති, තෙන ච විත්තං ආපජ්ජති, ඉදම්පි ඛො බ්‍රාහ්මණ බ්‍රාහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පි" = අ. නි. ස. නි.

i බ්‍රාහ්මණය, මේ ලෝකයෙහි ඇතැම් මහණ කෙනෙක් හෝ බමුණෙක් හෝ හොඳ හැසිරීමකින් යුතුව සිටින්නේ යයි හඟවා, ස්ත්‍රියක සමග කෙරෙන නරක හැසුරුම කට - සංවාසය - නො පැමුණුනත් ස්ත්‍රියක විසින් කැරෙන ඇඟ ඉලීම්, නෑවීම්, ඇඟ මිරිකීම්, ඉවසයි. හේ එයම මැනවැයි ආශ්වාදනය - එයින් සුවයක් විඳීම - කරයි. එයම කැමති වෙයි. ඒ නිසාම සතුටු වෙයි. බ්‍රාහ්මණය, මේ තමයි උතුම් හැසිරීමේ කැඩීමද සිදුරු වීම ද, පුල්ලි ගැහීම ද, කබර ද වනුයේ.

මෛථුනයෙහි නො යෙදුනත් ස්ත්‍රියගේ අත් - පා මෙහෙවර ඉවසීම, ශීලයක් කිළුටු වීමට මූලික කරුණක් බව මෙයින් පෙනේ.

ii -පෙ- නපි මාතුගාමස්ස උච්ඡාදනං නහාපනං සම්බාහනං සාදියති, අපි ච ඛො මාතුගාමෙන සද්ධිං සංජග්ඝති, සංකීලති, සංකෙලායති, - පෙ - එසේ මාගමකගේ ඇඟ ඉලීම් ආදිය නො ඉවසුවත් ඇ සමග රාගයෙන් සිනාසෙයි. සෙල්ලම් කරයි හිතවත්කම දක්වයි. (මමත්වය) මේ නිසාද ශීලය කිළුටු වෙයි.

iii - පෙ - අපි ච ඛො මාතුගාමස්ස චක්ඛුනා චක්ඛුං උපනිජ්ඣායති පෙක්ඛති, -පෙ- පෙර සේ නොමැති වුවත් ස්ත්‍රියක් සමග රාගයෙන් ඇසින් ඇස බලයි ද, එය ද ශීලය ඛණ්ඩාදී අපිරිසිදු භාවයට හේතුය.

iv - පෙ - අපි ච ඛො මාතුගාමස්ස සද්දං සුණාති තිරොකුඩ්ඩං වා තිරොපාකාරං වා හසන්තියා වා භණන්තියා වා ගායන්තියා වා රොදන්තියා වා - පෙ - තවද බිත්තියෙන් එහා හෝ බැම්මකින් එහා හෝ සිනාසෙන්නාවූ හෝ කථාකරන්නා වූ හෝ ගීතාදිය කියන්නා වූ හෝ හඬන්නා වූ හෝ මාගමකගේ ශබ්දය - හඬ - රාගයෙන් අසයි නම් එද එක්තරා මෛථුන සංයෝගයකි' සිල් කිළුටු වේ.

v -පෙ- අපි ච ඛො යානිස්ස තානි මාතුගාමෙන සද්ධිං හසිත ලපිත කීලිතානි තානි අනුස්සරති - පෙ -

එසේම පෙර ස්ත්‍රියක සමග සිදුකළ සිනාසීම්, කථා කිරීම්, සෙල්ලම් කිරීම්. රාගයෙන් නැවත නැවත සිහි කරය ද, එයත් එක් මෛථුන සංයෝගයෙකි. ශීලය කිළුටු වීමකි.

vi - පෙ - අපි ච ඛො පස්සති ගහපතිං වා ගහපති පුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගිභූතං පරිචාරයමානං - පෙ - නැවත ද පස්කම් සැප තින් යුක්ත වූ ඒවායින්ම සේවය ලබන්නා වූ ගැහැවියෙකු - ගිහියෙකු -, හෝ ගැහැවි පුතෙකු හෝ එසිත් සුවයක් විඳිමි බලාපොරොත්තුවෙන් බලයි නම් එද මෛථුන සංයෝගයෙකි. ශීලය කිළුටු වේ.

vii - පෙ - අපි ච ඛො අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති, ''ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි, අඤ්ඤතරො වා'ති, සො තදස්සාදෙති තං නිකාමෙති තෙන ච විත්තිං ආපජ්ජති. ඉදම්පි ඛො බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පී'ති.

ඉහත සඳහන් කරුණු සයම නැත ද, යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ''මම මේ ශීලය නිසා, වත - තපස - උතුම් හැසිරීම නිසා ප්‍රසිද්ධ දෙවියෙක් හෝ අප්‍රසිද්ධ දෙවියෙක් හෝ වන්නෙමි,, එක්තරා දේවගතියක් පතා ගෙන, බඹසර හැසිරෙයි ද, හේ එයම කැමති වෙයි ද සතුටු වෙයි ද, බ්‍රාහ්මණය, මෙයද බ්‍රහ්මචරියාවේ කැඩීම, සිදීම, පුල්ලි ගැසීම, කබර ගැසීම, මෙසේ සත්වැදෑරුම් ස්ත්‍රී - පුරුෂ සම්බන්ධතාවන් ශීලය අපිරිසිදු වීමට මහෝපකාරී වේ.

තවද සිතෙහි උපදින ක්‍රොධාදී පාපධර්ම ද ශීලයක් කිළුටුවීමට උපකාරී වෙයි. එබඳු පාපධර්ම කීපයක් මෙහි දක්වේ. කොධො; තරහ ගතිය, උපනාහො; වෛරය වෙලා ගැනීම, මක්ඛො; අනුන්ගේ ගුණ මකා දැමීම, පලාසො, අනුන්ගේ ගුණ දක්වා තමාගේ ගුණ සමඟ සමාන කිරීම, ඉස්සා; අනුන්ගේ සැපත නො ඉවසීම, මච්ඡරිය; තමගුණ සඟවන ගතිය, මායා; තමාගේ වරද සැඟවීම, සාඨෙය්‍ය; නැති ගුණ රැවා දක්වීම, (කපටිකම) ථම්භ; කණුවක් සේ ගුණයට නො නැමෙන ගතිය, සාරම්භ; පළිගැනීම, මාන; මැන ගැනීම, මේ ආදීහු හටගත් සිතක් ඇත්තහුගේ සීලය ඛණ්ඩාදී අපිරිසිදු භාවයට පැමිණේ.

තවද ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, ස්මෘති, කරුණා, මෛත්‍රී ආදී ගුණයන්ගේ දුර්වලවීම නිසා ද ශීලයක් කිළුටු වීමට හේතුයි. එසේම සිල්

නැති, වැරදි බොහෝ ඇති. නරක මිතුරන් ආශ්‍රම කිරීමත්, පස් කම් ගැන නිතර නිතර සිතීමත් කිළුටු වීමට කරුණුයි. ඒ සියල්ලටම වඩා සිල් අපිරිසිදුවීමෙහි ලා ප්‍රධාන කරුණ වනුයේ ස්ත්‍රිය වේ. "ඉත්ථි මලං බ්‍රහ්මචරියස්ස එත්ථායං සජ්ජතෙ පජා" සං. නි, බඹසරට මලකඩය - කිළුටු - ස්ත්‍රියයි. මක්නිසාද? ඈ කෙරෙහි මුළු සත්ව සමූහයාම ඇලේ. එහෙයිනි.

සීලයාගේ වොදාන - පිරිසිදුවීම.

"තං පනෙතං වොදානං ද්විහාකාරෙහි සම්පජ්ජති, සීල විපත්තියා ආදීනව දස්සනෙන සීලසම්පත්තියා ච ආනිසංස දස්සනෙන" ඒ පිරිසිදුවීම වනාහි ක්‍රම දෙකකින් සිදුවෙයි. එනම් ශීලය කිළුටු කර ගැනීමේ දොස් දැකීමෙත් හා ශීලය සම්පූර්ණ කිරීමේ හොඳ දැකීමෙත් ය.

## සීල විපත්තියෙහි ආදීනව:

"පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා දුස්සීලස්ස සීල විපත්තියා" මහණෙනි, දුශ්ශීලයාගේ ශීල විපත්තිය නිසා ආදීනව පසෙකි.

i ගුණ දියුණු කර ගැනීමෙහි ලා දක්වන අලස ගති නිසා ශ්‍රද්ධාදී ආර්‍ය ධන සතෙන් පිරිහෙයි. ගිහියෙකු නම් වස්තුවෙන් ද පිරිහෙයි.

ii ඔහුගේ ලාමක අගුණ හැම තැනම පැතිරෙයි.

iii හේ - දුශ්ශීලයා - මහජනයා අතරට එනුයේ බිය සහිතවය.

iv මරණ මොහොතේ දී හොඳගති කිසිවක් සිහිකර ගැනීමට නොහැකිවීමෙන් මුලාවී කළුරිය කරයි.

v ඒ නිසාම මරණින් පසු නරක, තිර්යක් ප්‍රේත, අසුර යන සතර අපායෙන් එක් තැනෙක උපදියි.

තවද යට දක්වන පරිදි මහත් නින්දාවකට, හරයක් නොමැති බවකට, දුශ්ශීලයා පැමිණේ. ඔවුහු නම්:-

i "දුස්සීලො පුග්ගලො දුස්සීල්‍ය හෙතු අමනාපො හොති දෙව මනුස්සානං" දුසිල් බැව් නිසා දුසිල් තෙමේ දෙව් මිනිසුන්ට එපා වෙයි. අසතුටු වෙයි.

i අනනුසාසනීයො සබ්‍රහ්මචාරීනං : යහළුවන්, සොහොයුරන් විසින් අනුශාසනා මත්තෙහි දියුණුවට කියනු ද - මට නුසුදුසුය.

iii දුක්ඛිතො දුස්සීල ගරහාසු : දුසිලත්ව නින්දා කරන කල්හි ගේ දුක් වෙයි.

iv විප්පටිසාරී සීලවතං පසංසාසු : සිල්වතුන්ට පසසන කල්හි ගේ පසු තැවෙයි.

v සාණසාටකො විය දුබ්බණ්ණො හොති : හණ වස්ත්‍රය මෙන් දුර්වර්ණය.

vi දුක්ඛසම්ඵස්සො : ඇසුරු කළ කෙනෙකු ද සතර අපා දුකට හෙළන බැවින් කොස් කටුවක් සේ ලංවීම දුක් ය.

vii අප්පග්ඝො : යමක් දීම නිසා එහි විපාක අඩු හෙයින් වටිනා කමක් නැත. වටිනාකමෙන් සවල්ප ය.

viii දුබ්බිසොධො : අවුරුදු-ගනන් පල් වූ වැසිකිළි වළක් සේ පිරිසිදු කිරීමට අපහසු ය.

ix ඡවාලාත මිව උභතො පරිබාහිරො : දෙකෙළවර දැවුණු නොහොත් දර කැබෙල්ලක් සේ ගිහි කමටත් නැත. පැවිදි කමටත් නැත. දෙපසින්ම වෙන් වූවෙකි.

x අසංවාසාරහො මතකලෙබරො විය : මිතුරුකම් පැවැත්වීමට, නොහැකි මළ සිරුරක් මෙනි.

මෙසේ නොයෙක් නින්දා කරුණු වලට දුශ්ශීල යා ගොදුරු වෙයි. අග්ගික්ඛන්ධොපම සූත්‍රය ද දුශ්ශීලත්වයෙහි ආදී නව දක්වෙන්නකි.

## සීල සම්පත්තියෙහි ආනිසංස :

ශීල විස්තරයේදී මුලින් ම සඳහන් කළ මහත් වූ භෝගස්කන්ධ ලැබීම ආදී ආනිශංස පහ ද, දුශ්ශීල භාවයෙහි දැක්වූ විපාක යන්හි විරුද්ධ අංශය ද, සීල සම්පත්තියෙහි ආනිසංසයි; තව ද ආකංඛෙය්‍ය සූත්‍රයෙහි ආනිසංස මාලාවක්ම සඳහන් වෙයි. ඒවා කෙටියෙන් මෙසේ දක්වෙයි.

"ආකංඛෙය්‍ය චෙ භික්ඛවේ, භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච අස්සං මනාපො ච ගරුභාවනියො චාති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං" - ම. නි. (මූ. ප. ආ. සු.)

මහණෙනි, ඉදින් භික්ෂුව එක්ව වාසය කරන්නවුන්ගේ ප්‍රිය බවට, මනාප බවට, ගරු කටයුතු බවට, පත්වීම සඳහා බලා පොරොත්තු වන්නේ නම් සිව් පිරිසිදු - චතු පාරිශුද්ධි - සීලයම පුරන්නෙක්, සමථ භාවනාවෙහි යෙදී නිතර ධ්‍යාන සේවනය කරන්නෙක්, විදර්ශනානුවණින් යුක්තව හුදකලාව භාවනා දියුණු කරන්නෙක්, වන්නේය. (වියයුතු) තවද යම් පිරිසකගේ සිවුරු, පිණ්ඩපාත, සෙනසුන්, බෙහෙත්, වළඳයි ද ඔවුන්ට මහත්ඵල මහානිසංස වීම සඳහා නම් සිල්ම පිරිය යුතු. නෑ හිතමිතුරන් ආදී මිය පරලොව ගිය යම් කෙනෙක් පැහැදුනු සිතින් මා සිහි කරත් නම් ඔවුනට මහත් ඵල මහානිසංස වීමට සිල්ම පිරිය යුතුය. කුශලයන්හි සිත නොයෙදෙන ගතිය, පස් කම් සැපතෙහි ඇලෙන ගතිය; ඉසිලීමට නම් - ඒවා දුර අත් කිරීම - සිල්ම පිරිය යුතුය, එසේම හුදකලා වාසයෙහිදී ඇති වන තැති ගැනීම්, බියවීම්, ඉසිලීමටත් සිල්ම පිරිය යුතු. ධ්‍යාන, අෂ්ටවිධ විමොක්ෂ, මාර්ග - ඵල, පූර්වේනිවාසානුස්මෘති ආදී ඥාන නිර්මාණය, මේවා ලබා ගැනීමට නම් සීලයෙහිම පරිපූරකාරී විය යුතු. මේ සීල පාරිශුද්ධිය නිසා ලැබෙන ආනිශංසයෝයි.

තවද, "සික්ඛානිසංසා භික්ඛවෙ විහරථ පඤ්ඤුත්තරා විමුත්තිසාරා සතාධිපතෙය්‍යා, සික්ඛානිසංසානං භික්ඛවෙ විහරතං පඤ්ඤුත්තරානං විමුත්තිසාරානං සතාධිපතෙය්‍යානං ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකංඛං, දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා" - ඉ. වු.

මහණෙනි, අධිප්‍රඥව ප්‍රධාන කොට ඇත්තාහු, අර්හත් ඵලය හරය කොට ඇත්තාහු, සතර සතිපට්ඨානයන් අධිපති කොට ඇත්තාහු ත්‍රිශික්ෂාධර්මයෙහි ආනිසංස ඇත්තෝව වාසය කරවු මහණෙනි, ඒ ධර්ම ඇතියනට මේ ප්‍රයෝජන දෙකෙන් එකක් කැමති විය යුතුය. මෙලොවදීම අර්හත් ඵලය, කෙලෙස් ඉතිරි වුවහොත් අනාගාමි ඵලය. මේ දේශනාවෙන් ඉතා උසස් ආනිශංස දක්වූහ.

“සම්පන්න සීලා විහරථ සම්පන්න පාතිමොක්ඛා පාති, මොක්ඛ සංවර සංවුතා විහරථ ආචාරගොචර සම්පන්නා, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛථ සික්ඛා පදෙසු; සම්පන්න සීලානං භික්ඛවෙ විහරතං සම්පන්න පාතිමොක්ඛානං, පාති මොක්ඛසංවරවුතානං විහරතං ආචාරගොචර සම්පන්නානං සමාදාය සික්ඛතං සික්ඛාපදෙසු කිස්ස භික්ඛවෙ උත්තරිං කරණීයං? චරතොපි - ඨිතස්ස - නිසින්නස්ස - සයානස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස අභිජ්ඣා විගතා හොති, ව්‍යාපාදෙ විගතො හොති, ථීන මිද්ධං විගතං හොති, උද්ධච්ච කුක්කුච්චං විගතං හොති, විචි කිච්ඡා පහීණා හොති, ආරද්ධං හොති විරියං අසල්ලීනං, උප ට්ඨිතා සති අපම්මුට්ඨා, පස්සද්ධො කායො අසාරද්ධො, සමා හිතං චිත්තං එකග්ගං, සයානොපි භික්ඛවෙ භික්ඛු ජාගරො එවම්භූතො ආතාපි ඔත්තප්පී සතතං සමිතං ආරද්ධ විරියො පහිතත්තොති වුච්චති” - ඉ වු.

මහණෙනි, සම්පූර්ණ සිල් ඇතිව, සම්පූර්ණ ප්‍රාතිමෝක්‍ෂ සංවරයෙන් යුතුව වාසය කරවු ප්‍රාතිමෝක්‍ෂ සංවරයෙන් සංවර, වූවාහු ආචාර ගෝචර දෙකෙන් යුතුව වාසය කරවු. සමාදන් වූ ශික්‍ෂා පදයන්හි කුඩා වරදෙහි පවා බිය දකිමින් හික්මෙවු එසේ වාසය කරන්නවුන්ට මත්තෙහි කළයුතු දෑ කුමක් ද? හැසිරෙන සිටිය - හිඳගත් - නිදාගත් භික්‍ෂුවගේ ද නිදිවරණ තුරු විෂම ලෝභය, ක්‍රොධය, ථිනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා, යන නීවරණයන් අස්වූයේ වෙයි. හේ වීර්‍ය්‍ය නොපසල්වෙන යේ ඇරඹූයේ වෙයි. මුලා නොවූ සිහියක් එළඹියේ වෙයි. දරදඬු නොවූ නාම - රූප කය සැහැල්ලුය. සිත සමාහිතය. මහණෙනි, ඒ භික්‍ෂුව නිදාගත් නමුදු නිදිවරණ තෙක් කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව සසරට බිය වූයේ, නිතර ඇරඹූ වීර්‍ය්‍ය ඇත්තේ නිවණෙහි පිහිටි සිත් ඇතියහු යයි කියනු ලැබේ.

තවද යමෙකුගේ සීලය නිර්මල නම් ඔහුගේ පා සිවුරු දූරිම ප්‍රශාද ජනකයැ. පැවිද්ද සඵලයැ. සිල් ඇති භික්‍ෂුවගේ සිතට අත්තානුවාද භය - තමාගෙන් නින්දා ලැබෙය යන බිය, පරානුවාද භය, දණ්ඩ භය, - දඬුවම්-, දුර්ගති භය, යන සතර බිය හිරු දුටු අඳුරු සේ නො වදියි අහසෙහි සඳ බබලන්නාක් මෙන් සීල වන්ත භික්‍ෂුව සිටින තපෝ වනය බබලයි. සිල්වත් භික්‍ෂුවගේ ශරීරය ද සුවඳවත් ය. සිල් සුවඳ ගැන කියනු කිම? සියලු සුවඳ වඟී පරදවා සිල් සුවඳ දස දිග පැතිරේ· සිල්වතා කෙරෙහි කළ

සුළු උපකාරය පවා විශාල ආනිශංස ගෙන දෙයි. මෙලොව ලැබෙන සියලු වරද වලින් සිල්වතා නොපෙලයි. පරලොව ලැබෙන සියලු දුක්වල මුල හාරා දමයි. මිනිස් ලොව, දෙව්ලොව, ඇති සියලු සැප වුවත් සිල්වතා කැමති වෙයි නම් දුර්ලභ නොවේ. ඉතා සාන්ත වූ නිර්වාණ සුවයක් වේද, එය කෙරෙහි සිල්වතාගේ සිත දුවයි. මෙසේ නුවණැත්තා සීලයෙහි ඇති අනුසස් නොයෙක් ආකාරයෙන් බලයි.

මෙසේ සීලයාගේ විපත්ති හා සම්පත්ති දෙක දැකීමෙන් වොදානය - පිරිසිදුවීම - සිදුවෙයි.

තවද චතුපාරිශුද්ධි සීලය හැම අයුරින්ම පිරිසිදුවීම සඳහා බුදුරජාණන් වහන්සේ "ධූතඞ්ග" නාමයෙන් පිරිය යුතු වත් කොටසක් දක්වූ සේක. ඒ ධූතඞ්ග සීල පාරිශුද්ධිය සඳහා පමණක් නොව සමථ විදර්ශනා භාවනා දෙකට හොඳම පදනමක් ද වෙයි. අල්පෙච්ඡ - ටිකක් කැමතිවීම-, සන්තුට්ඨි - ටිකකින් සතුටුවීම, ආදී නොයෙක් ගුණයන්ගේ රැස්වීම සඳහා ද ධූතඞ්ග පවතියි. එහෙයින් සීල පාරිශුද්ධිය සඳහා ධූතඞ්ග සමාදන් විය යුතු.

ධූතඞ්ග තෙළෙසකි. පංසුකූලිකඞ්ගය, තෙචීවරිකඞ්ගය, පිණ්ඩපාතිකඞ්ගය, සපදානචාරිකඞ්ගය, ඒකාසනිකඞ්ගය, පත්තපිණ්ඩිකඞ්ගය, ඛලුපච්ඡාභත්තිකඞ්ගය, ආරඤ්ඤකඞ්ගය, රුක්ඛමූලිකඞ්ගය, අබ්භොකාසිකඞ්ගය, සොසානිකඞ්ගය, යථාසන්ථතිකඞ්ගය, නෙසජ්ජිකඞ්ගය, යනුයි.. මේවා පිළිබඳ විස්තර දක්වනුයේ ඉතා කෙටියෙනි.

**1. පංසුකූලිකඞ්ගය :**

ඉවත දැමූ රෙදි කැබලි සොයා, දිරා ගිය තැන් අස්කොට, ඒවායින් සිවුරක් මසා, තමා එතෙක් පෙරවූ දායකයන් දුන් සිවුර, ප්‍රතික්ෂෙප - අස් - කොට, "පංසුකූලිකඞ්ගං සමාදියාමි" පංසුකූලික අඞ්ගය - වත - සමාදන් වෙමි" යි තුන් වරක් කියා සමාදන් වී එය පොරවා ගෙන විසීම පංසුකූලිකඞ්ගය නම්.

**2. තෙචීවරිකඞ්ගය:**

දෙපට සිවුර, තනිපට සිවුර, අඳනය, යන මේ තුන් සිවුරු සෙසු සිවුරු වලින් වෙන් කොට, "චතුත්ථක චීවරං පටික්ඛිපාමි, තෙචීවරිකඞ්ගං සමාදියාමි" සතර වැනි සිවුර අත්හරිමි, තෙචීවරි

කඞ්ගය සමාදන් වෙමි"යි පෙර සේ තුන් වරක් කියා සමාදන් වී පසු සිවුරු අත්හැර තුන් සිවුරෙන්ම විසීම තෙචීවරිකඞ්ගයයි.

3. පිණ්ඩපාතිකඞ්ගය:

සඞ්ඝික දන, ගමික දන, දිනපතා ලැබෙන දන, පොහොය දිනට පමණක් ලැබෙන දන, ආදී සියලු දන අත්හැර, "අතිරෙක ලාභං පටික්ඛිපාමි, පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි" වැඩිපුර ලැබෙන ලාභ අත්හරිමි, ,පිණ්ඩපාතිකඞ්ගය සමාදන් වෙමි" යි කියා සමාදන්වී, පිඬු පිණිස හැසිර ලද දෙයක් වැළඳීම පිණ්ඩ පාතිකඞ්ගයි.

4. සපදානචාරිකඞ්ගය:

ලෝභයෙන් ගෙයක් හැර ගෙයකට පිණ්ඩපාතයේ ගිය පුරුද්ද අත්හැර, "ලොලුප්පචාරං පටික්ඛිපාමි, සපදාන චාරිකඞ්ගං සමාදියාමි" තෘෂ්ණායෙන් හැසිරීම ප්‍රතික්ෂෙප කරමි, සපදානචාරිකඞ්ගය සමාදන් වෙමි" යි කියා සමාදන් වී එතැන් සිට ලැබුණා හෝ නො ලැබුණා හෝ පිළිවෙළින් ගෙයක් පාසා පිණ්ඩපාතයේ යෑම සපදානචාරිකඞ්ගය නමි.

5. එකාසනිකඞ්ගය:

කීප තැනක වාඩිවී වැළඳීමේ පුරුද්ද අත්හැර "නානාසන භොජනං පටික්ඛිපාමි, එකාසනිකඞ්ගං සමාදියාමි" නොයෙක් අසුන්හි හිඳ වැළඳීම අත් හරිමි, එකාසනිකඞ්ගය සමාදන් වෙමි"යි කියා සමාදන්වී එතැන් සිට දන ශාලාවට ගිය පසු. තමාට ලැබෙන අසුන ගැන විමසා එහි හිඳ වැළඳීමේ පිළිවෙත එකාසනි කඞ්ගයයි.

6. පත්තපිණ්ඩිකඞ්ගය:

කෝප්ප, පිරිසි, ආදී භාජන කීපයක් ළඟාකර ගෙන වැළ දීමේ පුරුද්ද අත්හැර, "දුතියක භාජනං පටික්ඛිපාමි පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමි" දෙවැනි බඳුන අත්හරිමි, පත්තපිණ්ඩිකඞ්ගය සමාදන් වෙමි" යි කියා සමාදන්වී එතැන් සිට සියලු ආහාර වර්ග, පැන්, පාත්‍රයෙහිම වැළඳීම පත්තපිණ්ඩිකඞ්ගයයි.

7. ඛලුපච්ඡාභත්තිකඞ්ගය:

බත්, ධාන්‍ය බැඳ සෑදූ ආහාර, පිට්ටු, මාළු, මස්, යන ආහාර වර්ග (පඤ්චභොජනය) පහෙන් එකක්, උපසම්පදා භික්ෂුවක් වළඳන කල්හි දෙරියන් හමාරක ප්‍රමාණය අත්පසට එළවූවායින්

පසු අතින් හෝ කීමෙන් හෝ ප්‍රතික්ෂෙප කළහොත් නැවත සිඳ වැළඳීම තහනම්ය. සෙසු භික්ෂුවක් අත් ආහාරයක් දුනහොත් වැළඳීමට පුළුවන. දෙන්නා වූ ඒ ආහාරය "අතිරිත්ත" නම්. මේ අතිරිත්ත භෝජනය ද අත්හරින අදහසින් යුතුව, "අතිරිත්ත භොජනං පටික්ඛිපාමි, බලුපච්ඡාභත්තිකඞ්ගං සමාදියාමි" අතිරිත්ත භෝජනය අත්හරිමි, බලුපච්ඡාභත්තිකඞ්ගය - පවාරණය වීමෙන් පසු නො වැළඳීමේ ව්‍රත - සමාදන් වෙමි" ය කියා සමාදන්ව එතැන් සිට පෙර කී පඤ්චභොජනය පවාරණය වූ පසු නැවත නොවැළඳීම බලුපච්ඡාභත්තිකඞ්ගයයි. (පවාරණය නම් වැළඳීම තහනම් වීමය)

## 8. ආරඤ්ඤකඞ්ගය:

ගමෙහි කෙළවරෙහිම ඇති ගෙහි පසු පස සිට මැදුම් මිනිසෙකු විසින් ගසනු ලබන ගල් කැටය වැටෙන තැන සිට, නැවත ගල් කැටයක් ගැසූ පසු එය වැටෙන තැනින් එහා - (ලෙඩ්ඩුපාත දෙකකින් එහා) වනය නම්. නැතහොත් මුලින් ගල් කැටය වැටුණ තැන සිට දුනු පන්සියයකින් එහා වනයයි. මෙසේ විමසා ගත් වනයකට යෑමේ අදහස සිත්හි තබාගෙන' "ගාමන්තසෙනාසනං පටික්ඛිපාමි,. ආරඤ්ඤකඞ්ගං සමාදියාමි,' ග්‍රාමාන්ත සේනාසනය - විහාර, ආවාස, ප්‍රසාදාදිය - අත් හරිමි. ආරඤ්ඤකඞ්ගය සමාදන් වෙමි" යි කියා සමාදන්ව, මුළු කාලසීමාව ම හෝ අවුරුද්දේ වැසි කාල සීමාව වූ වර්ෂා ඍතුව හැර හෝ ග්‍රීෂ්ම ඍතුවෙහි හෝ අරණ්‍යයෙහි අරුණු නැංවීම- එළිවනතෙක් සිටීම් - ආරඤ්ඤකඞ්ගය නම්.

## 9. රුක්ඛමූලිකඞ්ගය:

සෙවිලි කළ හෝ උඩින් යම් යම් කිසිවකින් වැසුණු හෝ ගෙයක, ලෙනක, වාසය නොකරමි යන අදහස උපදවා "ඡන්නං පටික්ඛිපාමි, රුක්ඛමූලිකඞ්ගං සමාදියාමි" උඩින් වැසුණු තැන අත්හරිමි, රුක්ඛමූලිකඞ්ගය සමාදන් වෙමි" යි කියා සමාදන් වී මීහිසුන්, වවුලන්, විෂසතුන් මේ ආදීන්ගෙන් කරදර නොවන, සෙවනැති ගසක් මුල විසීම, අරුණු නැංවීම, රුක්ඛමූලිකඞ්ගයයි.

## 10. අබ්භොකාසිකඞ්ගඞ්ගය:

"ඡන්නඤ්ච රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි. අබ්භොකාසිකඞ්ගං සමාදියාමි" සෙවිලි කළ ගෙය, රුක් මුලද අත් හරිමි, අබ්භොකාසිකඞ්ගය සමාදන්වෙමි" යි කියා සමාදන්ව සැම කල්හි එළි මහනෙහි විසීම අබ්භොකාසිකඞ්ගය නම්.

**11. සොසානිකඞ්ගය:**

සොහොන් රාත්‍රිය ගත කිරීමේ අදහස ඇතිව, වේලාසනම සොහොනට යන මඟ දෙපස විමසා, ඉක්බිති විහාරයෙහි අධිපති හිමියන්ට හා ගමේ ප්‍රධානියාට ද දැනුම් දී, "න සුසානං පටික්ඛිපාමි, සොසානිකඞ්ගං සමාදියාමි" සොහොන් නොවූ තැන් අත් හරිමි. සොසානිකඞ්ගය සමාදන් වෙම" යි කියා සමාදන්වී රාත්‍රී මධ්‍යම යාමයේ අප්‍රසිද්ධ මාර්ගයෙන් සොහොනට ගොස් විසීම සොසානිකඞ්ගයයි.

**12. යථාසන්ථතිකඞ්ගය:**

"සේනාසන ලොලුප්පං පටික්ඛිපාමි, යථාසන්ථතිකඞ්ගං සමාදියාමි" සෙනසුන් ආශාව හැර පියමි, යථාසන්ථතිකඞ්ගය සමාදන් වෙමියි කියා සමාදන්ව තමාට ලැබුන සේනාසනයක විසීම යථාසන්ථතිකඞ්ගය නම්.

**13. නෙසජ්ජිකඞ්ගය:**

තමා වසන තැන ඇති නිදාගත හැකි සියලු ආසන තැන්පත් කොට තබා, "සෙය්‍යං පටික්ඛිපාමි, නෙසජ්ජිකඞ්ගං සමාදියාමි" නිදා ගැනීම අත්හරිමි, නෙසජ්ජිකඞ්ගය සමාදන් වෙමි" යි කියා සමාදන්වී මුළු දිවා රෑ දෙකම හිඳීම, සිටීම, සක්මන් කිරීම යන ඉරියව් තුනෙන් විසීම නෙසජ්ජිකඞ්ගයයි.

ධුතඞ්ග සමාදන් විය යුත්තේ ධුතඞ්ගධාරී භික්ෂූන් වෙතිනි. නැතහොත් චෛත්‍ය, බෝධීන් වහන්සේ, ප්‍රතිමා වහන්සේ යන ස්ථාන තුනෙන් එකක් වෙත පැමිණ, එහි ඇති සියලු වත් ඉටු කොට අධික භක්තියෙන් යුක්තව බුදුරජාණන් වහන්සේ වෙතින් සමාදන් වන්නාසේ හැඟීම් ඇතිව සමාදන් විය යුතු. ඉක්බිති කිසිවෙකුට ඒ බව නොදන්වා, නොහැඟෙන පරිද්දෙන් රැකිය යුතු. හැම අයුරින්ම ධුතඞ්ග රැකීමට පහසු වන්නේ හුදකලාව = තනියම - විසීමෙනි.

මෙසේ ධුතඞ්ග ආරක්ෂා කිරීමෙන් චතුපාරිශුද්ධි සීලය දූරග මිණක් සේ ඉතා පිරිසිදු බවට පත්වන්නේ යයි සැලකිය යුතු. ධුතඞ්ග සියල්ලම රැකිය හැක්කේ උපසම්පදා භික්ෂුවට පමණි. භික්ෂුණීයට ආරඤ්ඤක - ඛලුපච්ඡාභත්තික - අබ්භෝකාසික - රුක්ඛමූලික - සොසානික, යන අඞ්ග පහ හැර අන් අට රැකිය හැකිය. සාමණේරයනට හැක්කේ තෙචීවරිකඞ්ගය හැර ඉතිරි දොළොස. සාමණේරීනට සතයි උපාසක, උපාසිකා දෙපිරිසට හැකි වන්නේ පත්තපිණ්ඩිකඞ්ගය, ඒකාසනිකඞ්ගය, යන ධුතඞ්ග දෙක පමණි.

අටවන පරිච්ඡේදය නිමි.

# 9 වැනි පරිච්ඡේදය

පටිසම්භිදාමග්ගයෙහි සීලමය ඥාණයට ඇතුළත් ධර්ම විස්තරය මෙතැන් සිට දැක්වෙයි.

“අසා හික්මීමෙහි ප්‍රඥාව කෙසේ සීලමය ඥාණය වේද? සිල් පසෙකි. පරියන්තපාරිසුද්ධි අපරියන්තපාරිසුද්ධි පරිපුණ්ණපාරිසුද්ධි අපරාමට්ඨපාරිසුද්ධි පටිප්පස්සද්ධිපාරිසුද්ධි ශීලය යන මොහු යි” -ප. ම. සිං. ප.

## 1, පරියන්තපාරිසුද්ධි සීලය:

මෙහි “පරියන්ත” යනු කෙළවරක් ඇත යන අදහසයි. ‘සපරියන්ත” යයි දැක්වියයුතු තැන, පෙර අකුර මකා දමා පරියන්ත යැයි දැක්වූහ. ජලයෙහි වාසය කරන සතා “උදකාසය” නමි. මෙහි ද උයන්න මකා දමා “දකාසය” යි ව්‍යවහාර කරන්නාක් මෙනි. කෙළවරක් ඇති ශීලය පරියන්ත පාරිසුද්ධි ශීලයි. කතමං පරියන්තපාරිසුද්ධිසීලං? අනුපසම්පන්නානං පරියන්තසික්ඛාපදානං ඉදං පරියන්තපාරිසුද්ධිසීලං” පරියන්තපාරිසුද්ධි සීලය නම් කවරේ ද? කෙළවර සහිත ශික්ෂාපදයන් ඇති උපසම්පදා නොවූවන් ගේ යම් සීලයක් වේද; එය පරියන්තපාරිසුද්ධි සීලයි උපසම්පදා නොවූවන් ගේ සීලය පරියන්තපාරිසුද්ධිසීලය බව මෙයින් දැක්වූහ. අනුපසම්පන්නයෝ නම් සාමණේර, සාමණේරී, සික්ඛමානා, උපාසක, උපාසිකා, යන පස් කොටසයි මොවුන්ගේ සීලය සීමාසහිතය. එහෙයින් පරියන්ත යි.

ඔවුනට අයත් ඒ ඒ ශික්ෂාපද කොටස් මෙසේය.

සාමණේර, සාමණේරී, දෙපක්ෂයට මකාරාන්ත, නිග්ගහීත, නත යන ක්‍රම දෙකින් යුත් සරණ ගමනය හා දසසික්ඛාපද යි. බුද්ධම් සරණම් ගච්ඡාමි; බුද්ධං සරණං ගච්ඡාමි, මෙසේ කියා සරණ යෑම ඒ ක්‍රම දෙකයි. පාණාතිපාත අදින්නාදාන, අබ්‍රහ්මචරිය, මුසාවාද, සුරාමේරයමජ්ජපමාදට්ඨාන, විකාල භෝජන, නච්චගීතවාදිත විසූකදස්සන, මාලාගන්ධවිලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨාන, උච්චාසයන මහාසයන, ජාතරූපරජත පටිග්ගහණ, යනු දස සික්ඛාපද යි.

සික්ඛමානා: උපසම්පදාව අපේක්ෂා කොට-බලාපොරොත්තු ඇතිව- අවුරුදු දෙකක් නො කඩකොට දස සික්ඛාවත්ගෙන් විකාල භොජන් සිකපදය තෙක් ශික්ෂාපද සයක් රක්නා සාමණේරීහු යැ. සෙසු ශික්ෂාපද සතර අප්‍රධානයි.

උපාසක-උපාසිකා: පඤ්චසීලය, බ්‍රහ්මචරියක පඤ්චසීලය, විකාලභෝජන ශික්ෂාපදය ඇතුළත් එකභත්තිකජ්ඣක සීලය, ආජීවාෂ්ටමක සීලය, අෂ්ටාඞ්ග සීලය, එය ම මෛත්‍රිය ඇතුළත් කොට ඇති නවාඞ්ගුපෝසථ සීලය, ගෘහස්ථ දශ ශීලය, යන මෙතෙක් සිල් අයත් ය.

## 2. අපරියන්තපාරිසුද්ධි සීලය:

"නත්ථි එතිස්සා පරියන්තො අපරියන්තො" ඒ සීලයට කෙළවරක් නැත්තේනුයි අපරියන්ත නම්. එනම් උපසම්පදාවූවන් ගේ සීලයයි. "කතමං අපරියන්තපාරිසුද්ධිසීලං? උපසම්පන්නානං අපරියන්තසික්ඛාපදානං ඉදං අපරියන්තපාරිසුද්ධි සීලං" යනු දේශනා පාඨයි.

"නවකොටි සහස්සානි - අසීතිං සත කොටියො
පඤ්ඤාසං සතසහස්සානි - ඡත්තිංසා ච පුනාපරෙ"

නව කෙළ දහස් එක්සිය අසූකෝටි පනස්ලක්ෂ සතිසැකි. මේ උපසම්පදාවූවන් ගේ සිකපද සමූහයයි මෙසේ සීමාවක් දක්වූ වත්, ඒවා රැකීමට ඇති, ලාභ, යස, ඤාතී, අඞ්ග, ජීවිත යන මොවුන් ගේ වශයෙන් කෙළවරක් නොමැති නිසා අපරියන්තයැයි වදාළහ.

## 3 පරිපූර්ණ පාරිසුද්ධි සීලය:

හැම අයුරින් ම සම්පූර්ණ වූ සීලය යි.

"සමාදානතො පභුති අඛණ්ඩිතත්තා ඛණ්ඩිතාපි කතපටිකම්මත්තා චිත්තුප්පාදමත්තකෙනාපි මලෙනවිරහිතත්තා ච පරිසුද්ධජාතිමණි විය සුපරිකම්මකත සුවණ්ණං විය ච පරිසුද්ධත්තා අරියමග්ගස්සපදට්ඨානභූතා අනූනවෙඝන පරිපුණ්ණො" -ප. ම. අ. සමාදානයෙහි පටන් නොකැඩුණු බැවින්, කැඩුණ ද පිළියම් කරන ලද බැවින්, සිත් මාත්‍රය කිතුදු අපිරිසුදු කමෙන් වෙන් වූ බැවින් ද, ඉතා පිරිසුදු (ස්වභාවයෙන් ම පිරිසුදු) ජාති මැණිකක් මෙන් ද, මනා සේ ඔප දමන ලද රන් කැබැල්ලක්

මෙන් ද, පිරිසුදු නිසා ආයර්‍යමාර්ගයට හේතුවන බැවින් අඩුවක් නො මැති නිසා පරිපූර්ණ නම්. මෙසේ ඒ මොහොතේ නමුත් සෝවාන් ආදී මාර්ග ඵල ඉපදවීමට සමත් වූ සීලය පරිපූර්ණපාරිසුද්ධි සීලය යි. මෙය තවදුරටත් මෙසේ පැහැදිලි වෙයි "කතමං පරිපුණ්ණපාරිසුද්ධි සීලං පුථුජ්ජනකල්‍යාණකානං කුසල ධම්මෙ යුත්තානං සෙක්ඛපරියන්තෙ පරිපූරකාරීනං කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං පරිච්චත්තජීවිතානං ඉදං පරිපුණ්ණ පාරිසුද්ධි සීලං"–ප. ම. පරිපූර්ණපාරිසුද්ධි සීලය නම් කවරේද? කුශල ධර්මයන් හි යෙදුණු ශෛක්ෂයන් ගේ මූල් කෙළවර වූ සෝවාන් මාර්ගය තෙක් පුරණ, ජීවිතය ගැනද බලාපොරොත්තුවක් නැතිව, ශීලයට ම ජීවිතය කැප කොට පුරන්නා වූ කල්‍යාණ පෘථග්ජනයන් ගේ යම් ශීලයක් ඇද්ද, එය පරිපූර්ණපාරිසුද්ධි සීල නම්.

## 4 අපරාමට්ඨපාරිසුද්ධි සීලය:

පරාමර්ශනය නො වූ – නො ගැවුනු – සීලය අපරාමට්ඨපාරිසුද්ධි සීලය යි. කුමකින් නො ගැවෙද්ද? "මමය මගේ ය" යන හැඟීම ඇති සක්කායදිට්ඨියෙන් ය. "සක්කායෙ දිට්ඨි සක්කාය දිට්ඨි" නම් සිරුර පිළිබඳ වැරදි හැඟීම සක්කාය දිට්ඨිය යි. මෙබඳු දිට්ඨියෙන් වෙන් වූ සීලය අපරාමට්ඨ නම්. 'කතමං අපරාමට්ඨ පාරිසුද්ධි සීලං? සත්තන්නං සෙක්ඛානං ඉදං අපරාමට්ඨපාරිසුද්ධි සීලං" සප්තශෛක්ෂයන්–සෝවාන් මාර්ගස්ථ වූ තැනැත්තා සිට අර්හත් මාර්ගස්ථ වූ පුද්ගලයා තෙක් ඇති ආයර්‍යයන් සත් දෙනා–ගේ සීලය අපරාමට්ඨසීලය යි වදාළහ. සෝවාන් මාර්ගක්ෂණයෙහි දී සක්කාය දිට්ඨිය ප්‍රහාණය වෙයි. එහෙයිනි.

## 5 පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීලය.

සංසිඳ වූ සීලය යි. කුමක් සංසිඳවීද? රාග, ද්වෙෂ, මෝහාදී සියලු කෙලෙස් දහ දැවිලි–යි. ඒ කෙලෙස් දහ සංසිඳ වූ උතුමන් ගේ සීලය පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීල නම්. "කතමං පටිප්පස්සද්ධිපාරිසුද්ධි සීලං? තථාගත සාවකානං ඛීණාසවානං පච්චෙක බුද්ධානං තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං ඉදං පටිප්පස්සද්ධිපාරිසුද්ධි සීලං" පටිප්පස්සද්ධිපාරිසුද්ධි සීලය නම් කවරේද? ක්ෂීණාශ්‍රව වූ තථාගත ශ්‍රාවකයන් ගේ, පසේ බුදුරජාණන් වහන්සේලා ගේ, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේලා ගේ, යම් සීලයක් වෙයි ද එය පටිප්පස්සද්ධි සීල නම් වෙයි.

මෙහි "පටිප්පස්සද්ධි" යනු යෙදුනේ අර්හත් ඵලය සඳහා යැ. එය ලැබූ විට සිතෙහි පැවති කෙලෙසුන් ගේ උෂ්ණගතිය ද සංසිඳෙයි. අර්හත් මාර්ගයේදී සියලු කෙලෙස් ප්‍රහාණය කෙරේ. එතකුදු වුවත් කෙලෙස් තුබූ චිත්තසන්තානය, ඒ කෙලෙසුන් ගේ බොහෝ කල් විසීමෙන්, ගැවසීමෙන්, ඇති වූ උෂ්ණය නො නිවේ. සතෙකු නිදාගත් තැන, සතා ගියපසු ද උෂ්ණය තිබෙන්නාක් මෙනි. අර්හත් ඵලය ලබත් ම ඒ උෂ්ණගතිය ද සංසිඳෙයි. නිවෙයි. එහෙයින් අර්හත් ඵලය "පටිප්පස්සද්ධි" නමි.

මෙසේ පර්යන්තපාරිශුද්ධි සීලාදී වශයෙන් සීලය පස් වැදෑරුම් ය.

තවද පර්යන්ත, අපර්යන්ත, යන සිල් කොටස් දෙක ලාභ යස, ඤාති, අඞ්ග, ජීවිත, යන කරුණු නිසා බෙදී ගොස් දස වැදෑරුම් වන ලෙස පටිසම්භිදායෙහි දැක්වේ. "කතමං තං සීලං සපරියන්තං? අත්ථි සීලං ලාභපරියන්තං, අත්ථි සීලං යසපරියන්තං, අත්ථි සීලං ඤාතිපරියන්තං, අත්ථි සීලං අඞ්ගපරියන්තං, අත්ථි සීලං ජීවිතපරියන්තං" - ප. ම. ඒ සපර්යන්ත සීලය නම් කවරේද? ලාභය කෙළවර කොට ඇති සීලයක් ඇත; යස ඤාති-අඞ්ග-ජීවිත කෙළවර කොට ඇති සීලයක් ඇත.

ඇතැමෙක් සමාදන් වූ ශික්ෂාපද යම්කිසි ලාභයක් නිසා කඩා දමත්. ඔහු ගේ සීලය ලාභය කෙළවර කොට ඇති හෙයින් ලාභපර්යන්ත නම්. සෙස්ස ද මෙසේය. වදාළේ මැයි 'කතමං තං සීලං ලාභපරියන්තං? ඉධෙකච්චො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං ලාභපරියන්තං" මෙබඳු වූ සිල් ඛණ්ඩාදී දෝෂයන් ගෙන් දූෂිතය. තෘෂ්ණා දාසත්වයෙන් නො මිදේ, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරනු නො ලැබේ. තෘෂ්ණා දෘෂ්ටි දෙ-දෙනාගෙන් අල්ලා ගන්නා ලද්දේ ය. සමාධිය පිණිස ද නො පවතී. ලාභාදි කරුණු පසෙන් නිදහස්, ජීවිතය සීලයට ම කැපකොට රක්නා සීලය අපර්යන්තසීල නමි. එය හැම අයුරින් ම ප්‍රශංසාර්හය. පැසසීමට සුදුසුය. මෙසේ ලාභාදී කරුණු නිසා සීලය දස වැදෑරුම්ය

# සීලය පිළිබඳ විවිධ විවරණය.

පටිසම්භිදාමග්ගයෙහි ධර්ම, ජාති, ප්‍රත්‍යය, සමෝධාන, සම්ප්‍රයුක්ත, යන මේ පඤ්චධර්මයට අනුව විවරණයක් මීලඟට දැක්වෙයි. මෙම කොටස් පිළිබඳ විස්තරය සීලමය ඥාණය වටහා ගැනීමට මහත් රුකුලක් වන හෙයින් මෙහිලා සඳහන් කරමි.

**1.** ධර්ම: සීලයා ගේ ධර්ම සතරෙකි. එනම් චෙතනා, චෛතසික, සංවර, අව්‍යතික්‍රම, යනුයි. "කිං සීලං ති චෙතනා සීලං චෙතසිකං සීලං සංවරො සීලං අවීතික්කමො සීලං" මේ පටිසම්භිදායෙහි දැක්වූ අයුරුයි.

i චෙතනා ධර්මය (සීලය)

"පාණාතිපාතාදීහි වා විරමන්තස්ස වත්තපටිපත්තිං වා පූරෙන්තස්ස චෙතනා" -ප. ම. අ. චෙතනා ධර්මය නම් සතුන් මැරීම් ආදී පව්කම් වලින් වැලකෙන්නහු ගේ හෝ වත්පිළිවෙත් පුරන්නහු ගේ හෝ ඒ වේලාවේදී පවතින චෙතනා චෛතසිකය යි. චාරිත්‍ර වාරිත්‍ර යන සිල් කොටස් දෙක අතුරෙන් යමක් පුරයි ද, ඒ පුරණ අවස්ථාවේදී සිතෙහි උපදින චෙතනා චෛතසිකය පමණක් මෙහි දී ධර්ම වශයෙන් ගත් බව සලකාගතයුතු. මක්නිසා ද? ඒ සිතෙහි යෙදෙන සෙසු චෛතසික වලට වඩා මෙම චෛතසිකය ප්‍රධාන හෙයිනි. එසේ ම කුශල හෝ අකුශල හෝ කර්ම වනුයේ ද චෙතනාව ම ය. "චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි" මහණෙනි, මම චෙතනාව කර්මයැයි කියමි යනුවෙන් වදාළේ ද එහෙයිනි.

කුශල වශයෙන් චෙතනාව සත් වැදෑරුම්ය. ඒ සප්ත කර්ම පථයයි. ඔව්හු නම් පාණාතිපාත, අදින්නාදාන, කාමෙසුමිච්ඡාචාර, මුසාවාද, පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාපා, යනුයි. (සතුන් මැරීම, හොරකම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම, කේලාම්, සැඩ වචන, හිස් වචන) මේ සත් වැදෑරුම් අකුශල කර්මයන් ගෙන් වැලකෙන්නහු ගේ චෙතනාව, චෙතනා නම්. වදාළේ මැයි. පටිසම්භිදායෙහි අපි ච චෙතනා සීලං නාම පාණාතිපාතාදීනි පජහන්තස්ස සත්තකම්මපථ චෙතනා" තවද චෙතනා සීල යනු සතුන් මැරීම් ආදිය අත්හරින්නහු ගේ සත් වැදෑරුම් කර්මපථ චෙතනාවෝ යි. විස්තර මතුවට එයි. මේ චෙතනා ධර්මයි.

ii චෛතසික ධර්‍ම: "චේතසිකං සීලන්ති පාණාතිපාතාදීහි විරමන්තස්ස විරති" මෙහි චෛතසික නම් විරතිය. විරති තුනෙකි. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, යනුයි, මොවුහු චෛතසික ධර්‍මයෝයි. තවද සිතෙහි පවතින විසම ලෝභය- අභිජ්ඣා, ක්‍රෝධය - ව්‍යාපාද, මෝහය-මිථ්‍යාදෘෂ්ටි, යන පාපධර්‍මයන් ගෙන් වෙන් වූ අනභිජ්ඣා, අව්‍යාපාද, සම්මාදිට්ඨි, මොවුහු ද චෛතසික ධර්‍ම වශයෙන් ගැනෙයි. "චේතසිකං සීලං නාම අභිජ්ඣං පහාය විගතාභිජ්ඣෙන චේතසා විහරතීති ආදිනා නයෙන වුත්තා අනභිජ්ඣා අව්‍යාපාද සම්මාදිට්ඨි ධම්මා" මේ අටුවා පාඨයි. මෙසේ ආ චෛතසික සීලයා ගේ ධර්‍මයි.

iii සංවර ධර්‍ම: සංවර යනු හික්මීමයි. එය ද සීලයා ගේ ධර්‍මයෙකි. සංවරය වනාහි පස් වැදෑරුම් වෙයි. පාතිමොක්ඛ සංවරය, සතිසංවරය, ඤාණසංවරය, ඛන්තිසංවරය, විරිය සංවරය, යනුයි. එහි. පාතිමොක්ඛසංවරය යනු පෙර දක්වූ ශික්ෂාපද සමූහයෙන් යුක්තවීම ය. "ඉමිනා පාතිමොක්ඛ සංවරෙන උපෙතො හොති සමුපෙතො අයං පාතිමොක්ඛ සංවරො" යනු අටුවා පාඨයි. ඉන්ද්‍රියසංවර සීලය සතිසංවරයයි. කෙලෙස් සැඩ දියපහර වල් වන තෘෂ්ණා, දෘෂ්ටි, අවිද්‍යා, දුශ්චරිත හා ඉතිරි කෙලෙස් යන පඤ්චධර්‍මය නුවණින් වළකා ගැනීම ද, සිව්පසය නුවණින් පරිහරණය කිරීම ද, ඤාණ සංවර නම්. ශීත උෂ්ණ ආදී ස්වාභාවික වශයෙන් තමා වෙත පැමිණෙන ද ඉවසීම ඛන්තිසංවරය යි. විරිය සංවරයයනු කාමවිතර්කී, ව්‍යාපාදවිතර්කී, විහිංසාවිතර්කී සිතෙන් බැහැරලීමට යොදන උත්සාහය යි. ආජීවපාරිශුද්ධි ශීලය ද මීටම ඇතුලති. මේ පඤ්චකය ම ධර්‍ම වශයෙන් ගතයුතු.

iv අව්‍යතික්‍රම ධර්‍ම: සමාදන් වූ ශීලය කයින් හෝ වචනයෙන් හෝ නො බිඳීමේ ගතිය යි. එය ද ධර්‍මයෙකි. මෙතයින් ශීලය ධර්‍ම වශයෙන් සතර වැදෑරුම් ය. නැතහොත් සතර වැදෑරුම් ධර්‍ම ශීලයා ගේ ධර්‍ම යි.

**2.** ජාති: පටිසම්භිදාමග්ගයෙහි ශීලය ජාති වශයෙන් ද බෙදා ඇත. ශීලයෙහි ජාති තුනෙකි. කුශල, අකුශල, අව්‍යාකෘත, යනුයි. "කුසලං සීලං අකුසලං සීලං අබ්‍යාකතං සීලං" මේ දේශනා පාඨයි. සැලකියයුතු. ලෝකයෙහි ඒ ඒ සත්ත්වයන් ගේ ස්වභාවයට ද සීල නාමය යෙදේ. එහෙයින් සතුන් මැරීම ආදී පාපකර්‍ම කරන්නහු ගේ ද එබඳු සීලයක් ඇත. එය අකුශල සීලයි. සීලමය ඤාණයෙන් අකුසල සීලය සම්පූර්ණයෙන් ම බැහැර වේ.

කුශල සීල නම් පෘථග්ජනයන් ගේ හා සප්තශෛක්‍ෂයන්ගේ සීලයයි. රහත් වූ උතුමන්ගේ සීල අව්‍යාකෘතයි. මෙසේ ජාති වශයෙන් තුන් වැදෑරුම් වෙයි.

3. ප්‍රත්‍යය: සීලය ප්‍රත්‍යය වශයෙන් දෙපරිද්දිය. සංවරය, අව්‍යතික්‍රමය, යනුයි. එනම් හික්මීම හා නො ඉක්මවීම යි. මේ දෙක ප්‍රත්‍යය-හේතු-වීම නිසා සීලයක් නො සෙල්වී පවතින අතර දියුණු වට ද කරුණු වෙයි.

සතුන් මැරීමෙන් වෙන්වීමේ සිට රහත් මාර්ගය තෙක් මේ ප්‍රත්‍යය දෙක ගමන් කරන බව පටිසම්භිදායෙහි දැක්වේ. එයින් කාය-වචන දෙකින් සිදුකරන සංවරය හා අව්‍යතික්‍රමය ද ඕලාරික වශයෙන් සිතෙන් සිදුකරන සංවරය හා අව්‍යතික්‍රමය ද මෙහි ලා පසුව විස්තර කෙරේ. මෙහි කෙටි අදහස: දස අකුසල කම්පථ, දශකුසල කම්පථ, යනුයි.

4. සමෝධාන: සමෝධාන යනු එක්වීමයි. සීලයා ගේ සමෝධාන සතරෙකි. චේතනා, චෛතසික, සංවර, අව්‍යතික්‍රම, යනුයි. (මේවා විස්තර කර ඇත) මේ ධර්ම සතර එක්වීම සීලයාගේ සමෝධානයයි. ඉහත සඳහන් අර්හත් මාර්ගය තෙක් ගමන් කරන සීලය මේ සමෝධාන සතරට ඇතුලත් වෙයි.

තවද පහාණ, වේරමණී, චේතනා, සංවර, අවීතික්කම, යන ධර්ම පහ හා එක්වීම ද සීලයා ගේ සමෝධානය යි. එහි අත්හැරීම ප්‍රහාණය යි. වෙන්වීම විරමණය යි. සෙසු පද සුගමය. මේ කරුණු පහ අනුව සියලු සිල් බෙදී යයි. නිදර්ශන: සතුන් මැරීමෙන් වෙන්වීම විරමණයයි. එනම් වේරමණී සීලයයි. අත්හැරීම ප්‍රහාණ සීලයි. ඒ නිසාලද හික්මීම සංවර නම්. සතුන් මැරීමෙන් වෙන්වීමේ අදහස චේතනා සීලයි. සතුන් නො මැරීම අව්‍යතික්‍රම සීලය යි. සෙසු සීල ද මෙසේ ම බෙදී යෙයි. මේ සීලයා ගේ සමෝධානය යි.

5. සම්ප්‍රයුක්ත: සීලයා ගේ සම්ප්‍රයුක්ත ධර්ම චේතනා චෛතසික මුල් කොට ඇති, ඒ හා සමඟ යෙදුනු චිත්ත චෛතසිකයෝයි. ඒ සියල්ලට සම්ප්‍රයුක්ත - එකට යෙදුනු-ධර්ම වශයෙන් සීල නාමය යෙදෙන බව මේ කරුණෙන් පැහැදිලි වෙයි.

මෙසේ ධර්මාදි පඤ්චධර්මයන් ගේ වශයෙන් සීලය බෙදී යන බව පටිසම්භිදාමග්ගයෙහි දැක්වෙයි.

## කුශල, අකුසල, කර්මපථ විස්තරය.

1. අකුශල කර්මපථ: "න කුසලන්ති අකුසලං" කුශල් නොවූයේ අකුශල යි. කර්ම යනු චේතනාවයි. අකුශල් පිළිබඳ චේතනා අකුශල කර්ම නම්. පථ යනු මාර්ගයයි. අකුශල කර්ම කායාදී ද්වාරත්‍රයෙන් – දොරටු තුනෙන්- සිදු කළ විට එය අපායට යෑම සඳහා මාර්ගයක් - උපායක් වූ හෙයින් අකුශල කර්මපථ නම්. ගරුකර්මාදී වශයෙන් ප්‍රතිසන්ධියේදී ඉදිරිපත් වනුයේ මේ අකුශල කර්මපථයෝයි. ක්‍රියාවට නොයෙදූ අකුශලකර්ම ප්‍රතිසන්ධියක් දීමට ශක්ති මඳ හෙයින් ප්‍රවෘත්ති විපාක සපයයි.

## අකුශල කර්මපථ දශයෙකි:

"පාණාතිපාතො අදින්නාදානං කාමෙසුමිච්ඡාචාරො, මුසාවාදො පිසුණාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපා අභිජ්ඣා ව්‍යාපාදො මිච්ඡාදිට්ඨීති ඉමෙ පන දස අකුසල කම්මපථා නාම" - අත්ථසාලිනී 111 පි. සතුන් මැරීම, සොරකම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම, කේළාම්කීම, ඵරුස-රළු-වචන කීම, හිස් වචනකීම, විෂම ලෝභය, ක්‍රෝධය, මිථ්‍යා දෘෂ්ටිය, යන මේ දහය වනාහි අකුශල කර්මපථයෝ නම් වෙත්.

i සතුන් මැරීම : "පාණාතිපාත" මෙහි පාණ යනු ලෝකයේ පවතින ව්‍යවහාරයෙන් සත්ත්වයා ය. පරමාර්ථ වශයෙන් ජීවිතින්ද්‍රිය යි. අතිපාත යනු අතර දී බිඳ හෙළීමයි. "පාණස්ස අතිපාතො පාණාතිපාතො" සත්ත්වයා ගේ හෙවත් ජීවිතින්ද්‍රියා ගේ ස්වාභාවික පැවැත්මට අවකාශ නොදී අතර තුර විනාශයට පත් කිරීම පාණාතිපාත - මැරීම - නම්.

මෙය කර්මපථයක් බවට පත්වීම සඳහා අඞ්ග-කරුණු පසෙකි. පාණො-ජීවිතින්ද්‍රිය; පාණසඤ්ඤිතා- ජීවිතින්ද්‍රියක් ඇති බව හැඟුම, (පණ ඇති බව දැනගැනීම) වධකචිත්තං-මැරීමේ සිත, උපක්කමො-කයෙන් හෝ වචනයෙන් හෝ කෙරෙන උපාය, තෙන මරණං-ඒ උපක්‍රමයෙන් මරණයට පත්වීම, යන මොහුයි.

ප්‍රාණඝාත කර්මපථය ගුණයන් ගෙන් හීන වූ තිරිසන් සතුන් අතුරෙන් කුඩා සතුන් පිළිබඳ නම් අල්පසාවද්‍ය යි, වරද ටිකයි, මහත් සතුන් පිළිබඳ මහාසාවද්‍ය යි. එසේ වනුයේ ලොකු සතා මැරීමට මහත් උත්සාහයක් ගතයුතු හෙයිනි. මිනිසුන් අතුරෙන් ගුණවත්හු නම් මහා සාවද්‍ය යි. ගුණ හීන නම් අල්පසාවද්‍ය යි.

සම ගුණයන් වුවහොත් ක්‍රොධාදී පාපධර්ම හෝ උත්සාහය (උපක්‍රමය) හෝ අඩු වූ යේ අල්පසාවද්‍ය යි. වැඩි වූ යේ මහාසාවද්‍යයයි. මේ අල්පසාවද්‍ය, මහාසාවද්‍යය, ක්‍රමය යි.

වැඩි විස්තර කැමතියෝ සමන්තපාසාදිකාව බලත්වා!

ii අදින්නාදාන : අන්සතුදේ සොරෙන් ගැනීම.

“න දින්නං අදින්නං” නුදුන් දේ අදින්න නමි. ආදාන යනු ගැනීමයි. (අදින්න + ආදාන) නුදුන් දේ ගැනීම අදින්නාදාන යනු පද සාධනය යි. තවද අදින්න නම් අන්සතුදේ යි. “අදින්නන්ති පරපරිග්ගහිතං” එය සොර සිතින් ගැනීම අදින්නාදාන නමි.

මෙය සම්පූර්ණ වීමට අංග පසක් සම්පූර්ණ විය යුතුය. පරපරිග්ගහිතං-අන්සතු වීම, පරපරිග්ගහිත සඤ්ඤිතා-අන් සතු බව හැඟුම, ථෙය්‍ය චිත්තං-සොරසිත උපක්කමො-කායෙන් හෝ වචනයෙන් හෝ උපක්‍රමය; තෙන හරණං - ඒ උපායෙකින් ගැනීම, යන මොහුයි. අදින්නාදාන කර්මපථය වස්තුව කුඩා වූ යේ අල්පසාවද්‍යය යි. මහත් වූ යේ මහාසාවද්‍යය යි (වටිනාකම අඩු වැඩි වීම) සමාන නම් ගුණ හීනයන් සතු දෑ ගැනීම අල්පසාවද්‍යයි. ගුණයෙන් වැඩිහිටියන් සතු දේ ගැනීම මහාසාවද්‍යයි.

iii කාමෙසුමිච්ඡාචාර : කාමයන්හි වරදවා හැසිරීම.

මෙහි කාමෙසු යනු මෛථුන-ස්ත්‍රී-පුරුෂ සංයෝගය-යන්හි යි. “මිච්ඡාචාරොති එකන්තනින්දිතො ලාමකො ආචාරො” මිච්ඡාචාර නම් හැම අයුරින් ම නින්දා සහගත වූ ලාමක හැසිරීමයි. මෛථුනය පිළිබඳ ලෝක සම්මතය ඉක්මවා, නො යා යුතු අය කෙරෙහි ගොස් පැවැත්ම කාමෙසුමිච්ඡාචාරය බව වැඩි දුරටත් වටහා ගත යුතු.

පුරුෂයා ගේ වශයෙන් නො යා යුතු තැන් විස්සෙකි. (එනම් වරදවා නො හැසිරිය යුතු ස්ත්‍රීහු විසිදෙනෙකි.)

1. මාතුරක්ඛිතා: මෑණියන් විසින් ආරක්‍ෂා කරනු ලබන ස්ත්‍රිය.
2. පිතුරක්ඛිතා : පියා විසින් = පෙර මෙනි =
3. මාතාපිතුරක්ඛිතා : දෙදෙනා විසින් =

4. භාතුරක්ඛිතා : සොහොයුරා විසින්-

5. භගිනිරක්ඛිතා : සොහොයුරිය විසින්-

6. ඤාතිරක්ඛිතා : නෑයන් වියන් -

7. ගොත්තරක්ඛිතා : කුලය විසින්-

8. ධම්මරක්ඛිතා : දහැම් කුලයන් විසින් -

9. සාරක්ඛා : බාල කාලයෙදී ම වෙන් කර ගත් ස්ත්‍රිය.

10. සපරිදණ්ඩා : "ඈ ලඟට ගියහොත් මෙතෙක් දඩයැ"යි දඩ නියම කරන ලද ස්ත්‍රිය.

11. ධනක්කීතා : මිල දී ගත් ස්ත්‍රිය.

12. ඡන්දවාසිනී : කැමැත්ත අනුව වසන්නී.

13. භොගවාසිනී : සම්පත් නිසා වසන්නී.

14. පටවාසිනී : වස්ත්‍ර නිසා වසන්නී.

15. ඕදපත්තකිනී : මාපියන් විසින් පැන් වත්කොට පැවරූ ස්ත්‍රිය.

16. ඔභතචුම්බටා : තමා විසින් පැන් තොටදී දක, දිය වත් කොට ලැබූ ස්ත්‍රිය.

17. දාසී ච භරියා : දාසකමෙත් සිටින භාර්‍ය්‍යාව.

18. කම්මකාරී ච භරියා : වැඩකාරී වූ භාර්‍ය්‍යාව.

19. ධජාහටා : යුද්ධ භූමියෙන් කැඳවාගෙන එනු ලැබූ ස්ත්‍රිය.

20. මුහුත්තිකා : මුදල් දී මොහොතකට ගත් ස්ත්‍රිය (වෙශ්‍යාව)

ස්ත්‍රීන් ගේ වශයෙන් සාරක්ඛා; සපරිදණ්ඩා; සහ ධනක්කීතා දී දස දෙනා යන දෙළොස් දෙනා විසින් අන් පුරුෂයන් ලඟට ගියහොත් ඇලාට ඒ නොයා යුතු තැන්ය.

කාමයන්හි වරදවා හැසිරීමේ කර්මපථය, ගුණ අඩු වූවන් පිළිබඳ අල්පසාවද්‍යය. ගුණයෙන් වැඩි නම් මහාසාවද්‍ය යි. කර්මපථයක් වීමට අඞ්ග සතරක් සම්පූර්ණ විය යුතුය. අගමනීය වත්‍ථු-නොයායුතු තැනක් වීම, (ස්ත්‍රී-පුරුෂ) තසම්ං සෙවන චිත්තං= ඔහු කෙරෙහි හෝ ඇය කෙරෙහි හෝ සේවනය කිරීමේ සිත; සෙවන

පපඤ්චයොගෙ-එක්වනමයෙහි උපාය, මග්ගෙනමග්ගපටිපත්ති = මාර්ගයට බැස ගැනීම, (ස්ත්‍රී-පුරුෂ ලිඞ්ග පිළිබඳවයි.) අධිවාසනං ඉවසීම.

iv මුසාවාද : බොරුකීම. මුසා යනු බොරුවයි.

"මුසාති අභූතං අතච්ඡං වත්ථු" වාද යනු කීමයි. "වාදොති තස්ස භූතතො තච්ඡතො වචනං" වාද නම් ඒ නො සිදු වූ බොරුවූ දේ ඒ අයුරින් ම කීමය. මෙසේ නො සිදු වූ බොරුවක් කීම මුසාවාද නම්. මෙය කර්මපථයක් වීමට අඞ්ග සතරෙක් ඇත. අතථං වත්ථු-නො සිදුවූ දේ, විසංවාදන චිත්තං-මුලාකිරීමේ සිත, තජ්ජො වායාමො - බොරුවක් කීම සඳහා කටගත් උත්සාහය, පරස්ස තදත්ථවිජානනං-අනුන් විසින් එය බොරුවක්ම බව දැන ගැනීම, යනුයි.

මෙය අල්පසාවද්‍ය වනුයේ කියූ බොරුවට අරමුණු වූ කරුණ වටිනාකමින් හෝ මටිනා කෙනෙකුගෙන් හෝ අඩු වූ කල්හි ය. මහත් වූයේ මහාසාවද්‍ය යි. ගිහියන් විසින් තමා ගේ වස්තුව නො දෙනු කැමැත්තෙන් නැතයැයි කීම් වශයෙන් අල්පසාවද්‍යය. සාක්ෂි වී අදහස කැඩීමට කීව හොත් මහාසාවද්‍යයයි. පැවිද්දන් විසින් නම් තෙල් සවල්පයක් ලැබී; සිනාසෙනු කැමැත්තෙන් "අද ගමේ තෙල් ගංගාවකි"යි මේ ආදී වශයෙන් කීම අල්පසාවද්‍යයයි. නො දුටු දෙයක් දුටුවෙමි යි කියයි නම් මහාසාවද්‍යයයි.

v පිසුණාවාචා: කේලාම් කීම. යමෙකුට යම් වචනයක් කීමෙන් ඔහුගේ සිතෙහි තුබූ ප්‍රියභාවය නැති කරයි ද එසේ ම තමා කියන වචනය තමාටත් වැඩක් නො සිදුවෙයි ද එබඳු වචන කීම "පිසුණාවාචා" නම්. කෙටි අදහස : ඔවු නොවුන් භේදකරවීමේ අදහසින් කියන වචන පිසුණාවාචා යි. "ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙ සං භෙදාය, අමුත්‍රවා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය" මෙතැනින් අසා මොවුන් ගේ බිඳුවීම පිණිස එතැන - ඔහුට - නො කියයි. ඔහුගෙන් අසා ඔවුන් ගේ බිඳුවීම පිණිස මෙතැන නො කියත්. මේ කේලාම් කීමේ අයුරුයි.

කේලාම් කීම කර්මපථයක් වීමට කරුණු සතරෙකි. භේදකර වියයුතු අන්‍යයෙකු වීම. "මොවුන් මේ කීමෙන් බිඳී යති"යි යන බිඳුවීමේ අදහස හෝ "මෙසේ කීවහොත් මම ඔවුන්ට ප්‍රිය වෙමි" යි යන අදහස හෝ ඇති බව, ඒ කීමට ගනු ලබන උත්සාහය,

ඒ කීම ඔවුන් පිළිගැනීම, යනුයි. ගුණ අඩු අය බිඳුවීමෙන් අල්ප සාවද්‍යය ද, වැඩි අය බිඳුවීමෙන් මහාසාවද්‍යය ද වනබව දතයුතු.

vi ඵරුසාවාචා : නරක වචන කීම. යම් වචනයක් කීසා තමා ද අනුන් ද ඵරුෂ-සැඩ-කරයි ද, එබඳු වචන කණට හෝ සිතට හෝ සුවයක් නො මැති නිසා ඵරුස නම්. මෙයට අඞ්ග තුනෙකි. ඵරුස වචනයක් කිවයුතු අන්‍ය කෙනෙකුවීම, කිපුණා වූ සිත, දස ආක්‍රොසයන්ගෙන් ආක්‍රොස කිරීම, - බැණ දෙඩුම-, යනුයි. ගුණ අඩු වූවන් කෙරෙහි බැණ දෙඩුම් අල්පසාවද්‍ය යි. එසේම සිතෙහි මෘදු භාවයක් ඇතිව,'හික්මවා ගැනීමේ අදහසින් කීම ද අල්ප සාවද්‍යයි. සෙස්ස මහාසාවද්‍යයි.

vii සම්ඵප්පලාපා : හිස් වචන කීම, කිසිදු තේරුමක් නො මැති වචන මෙයින් කියැවේ. "යෙන සම්ඵං පලපති නිරත්ථකං සො සම්ඵප්පලාපො" යම් වචනයකින් වැඩක් නැති වචන කියයි ද, ඒ සම්ඵප්‍රලාප යි. මෙහි අඞ්ග දෙකකි. රාම රාවණා දී වැඩක් නැති කථාවක් ඉදිරිපත් කිරීම, එබඳු කථාකීම යනුයි. මෙය කර්මපථයක් වනුයේ අසන්නා පිළිගතහොත් පමණි. කීමට ගන්නා ආරම්භය ස්වල්ප නම් අල්පසාවද්‍යයි. (හදිසියෙන් කීමයි) සූදානම් වී කීවහොත් මහාසාවද්‍යයි.

viii අභිජ්ඣා : විෂමලෝභය. "අභිජ්ඣායතීති අභිජ්ඣා" අන් සතු දේ කෙරෙහි එල්ල කොට බැලීම අභිජ්ඣා නම්. එනම් "අහෝ මෙය මට ඇත්නම් හොඳයි" සිතා අනුන්ගේ වස්තුව දෙස බලා ආශාව ඉපදීවීම ය. මෙහි අඞ්ග දෙකකි. අන් සතු දේ වීම, තමා වෙත හැරවීම; යනුයි. කර්මපථ වනුයේ ,'මෙය මට ඇත්නම් හොඳයැ"යි සිත ඉපදුව හොත් පමණි. ලෝභයෙන් බැලූ පමණින් නොවේ. අල්පසාවද්‍ය, මහාසාවද්‍ය භාවය, අදින්නාදානයෙහි මෙනි.

ix බ්‍යාපාද : ක්‍රෝධය - තරහ-යි. "හිත සුඛං බ්‍යාපාදයතීති බ්‍යාපාදො" සිතෙහි පවතින සැපය කුපිත කරනුයේ ව්‍යාපාද නම්. අනුන් විනාශයට පත්කිරීම ලක්ෂණය යි. අඞ්ග දෙකකි. අන් කෙනෙකුවීම, ඔහු විනාශ කරන සිත, යනුයි. මෙය කර්මපථයක් වනුයේ "මොහු කෙසේ හෝ විනාශ කරමි"යි සිතූ කල්හි ය. සාමාන්‍ය ක්‍රෝධය කර්ම පමණි. සාවද්‍යභේදය ඵරුස වචනය මෙනි.

x **මිච්ඡාදිට්ඨි :** වැරදි දැකීම. "යථාභුච්චගහණාභාවෙන මිච්ඡාපස්සතීති මිච්ඡාදිට්ඨි" තත් වූ පරිදි නො ගත්තා හෙයින් වැරදි ලෙස දකීනුයි මිථ්‍යාදෘෂ්ටි නම්. 'දන් දීමෙන් විපාක නැත" මේ ආදී වශයෙන් වෙනස් අයුරින් දැකීම මිථ්‍යාදෘෂ්ටියේ ස්වභාවය යි. හැටියි. මෙහි අඞ්ග දෙකකි. දක්නා දේ ගන්නා අයුරින් වැරදි බව, යම් අයුරකින් වටහා ගනියි ද එසේ ම නමාට වැට හීම, යනුයි. කම්පථ වනුයේ නත්ථික, අහෙතුක, අකිරිය, යන මිථ්‍යාදෘෂ්ටි තුනය සෙස්ස කම් පමණි.

"පාණාතිපාතා සංවරට්ඨෙන සීලං අවීතික්කමට්ඨෙන සීලං" සතුන් මැරීම සංවරවීම් අර්ථයෙන් සීල නම්. නො ඉක්ම වීම් අර්ථයෙන් සීල නම්. මෙසේ පටිසම්භිදායෙහි දක්වූ හෙයින් දශ අකුශල කම්පථයන් පිළිබඳ දැනුමක් ලබා ගැනීමට ය මෙහිලා විස්තර කළේ. සැලකිය යුතු: සතුන් මැරීම සංවර වීම අර්ථයෙන් සීලයයි දක්වූ තැන, සතුන් මැරීම සීලයක් කියා නො සිතා එයින් වෙන්වීමෙන් ඇතිවන සංවරය සීලයක් බව වටහා ගත යුතුය. නො ඉක්මවීමත් එසේය.

2. **කුශල කම්පථ :** මෙහි කුශල ශබ්දයේ තේරුම් කීපයක් ඇත. "කුච්ඡිතෙ පාපකෙ ධම්මෙ සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති කුසලං" පිළිකුල් කටයුතු ලාමක ධර්ම-අකුශල් සොලවත්, කම්පා කරත්, විනාශ කරත්නුයි කුශල නම් මේ එක් තේරුමකි. දෙවැන්න. "කුච්ඡිතෙන වා ආකාරෙන සයන්ති පවත්තන්තීති කුසා, තෙ කුසෙ ලුනන්ති ඡින්දන්තීති කුසලං" පිළිකුල් අයුරින් සයනය කරත් පවතිත්නුයි කුස නම්. ඒ කුසයන් කපත් සිඳිත්නුයි කුශලා යි යන තේරුම ය. තුන්වැන්න : "කුච්ඡිතානං වා සානතො තනුකරණතො කුසං ඤාණං, තෙන කුසෙන ලාතබ්බා ගහෙතබ්බා පවත්තෙතබ්බාති කුසලං" පිළිකුල් කටයුතු අකුසල් තුනී කරන බැවින් කුස යනු නුවණට නමකි. ඒ කුස සංඛ්‍යාත නුවණින් සිඳිය යුතු, (පිටතට) ගත යුතු, (කැපෙන අයුරින්) පැවැත්විය යුතු, හෙයින් කුශල නම්. යන තේරුමය.

කම්පථ පෙර කී සේයි. කුසල් පිළිබඳ කම්පථ, කුශල කම්පථ යි. (සුගතිමඨ යන මාර්ගය මෙහිලා පථ වශයෙන් ගත යුතු)

කුශල කම්පථ දශයෙකි. සතුන් මැරීම් ආදී සත් වැදෑරුම් අකුශල කම්පථයන් ගෙන් වෙන්වීම හා අනභිජ්ඣා, අව්‍යාපාද, සම්මාදිට්ඨි, යන දශයයි. අනභිජ්ඣා-විෂම ලෝභයෙන් දුරුවීම, අව්‍යාපාද-මෛත්‍රිය, සම්මාදිට්ඨි-යහපත් දැකීම.

අකුශල කර්මයන් ගෙන් වෙන් වීම ක්‍රම තුනකින් සිදුවෙයි.

i සම්පත්ත විරති : සමාදන් නො වී තමා ගේ තත්ත්වය ගැන සලකා බලා සතුන් මැරීම ආදියෙන් වෙන්වීම.

ii සමාදාන විරති : සමාදන් වී තත්ත්වය ගැන බලා හෝ අකුශල් ය කියා හෝ වෙන්වීම.

iii සමුච්ඡේද විරති : සෝවාන් ආදී ආර්‍යමාර්ගයන්හි දී ඇතිවන සම්පූර්ණයෙන් ම වෙන්වීම යි.

"පඤ්චසීලානි, පාණාතිපාතස්ස පහානං සීලං, වෙරමණී සීලං චෙතනා සීලං, සංවරො සීලං, අවීතික්කමො සීලං" සිල් පසෙකි. සතුන් මැරීම ප්‍රහාණය කිරීම ශීලයකි. වෙන්වීම- චෙතනාව - සංවරය- නො ඉක්මවීම ශීලයකි. මේ පස් වැදෑරුම් ශීලය ප්‍රථමයෙන් දශකුශලයන් පිළිබඳව ම පටිසම්භිදා මග්ගයෙහි දක්වූ හෙයින් මෙහිලා විස්තර කෙළේ.

## ත්‍රිවිධ ශික්ෂා සහ අර්හත් මාර්ගය තෙක් ප්‍රහාණාදී පඤ්ච ශීලය ගමන් කරන අයුරු:

ඉහත සඳහන් කළ සංවර, අව්‍යතික්‍රම දෙකින් යුක්ත ශීලයෙහි යම් සිත නො විසුරුණු තත්ත්වයක් වේ ද එය සංවර වීමෙන් පිරිසුදු භාවයෙහි පිහිටීම නිසා අධිචිත්ත ශික්ෂා යි. සමාධියි. සිත පිරිසුදු භාවයෙහි පිහිටිය තැනැත්තාට අවික්ෂේපපාරිශුද්ධියක්- එකඟකම- මෙන් ලැබුණු පිරිසුදු කම-ලැබේ එහි උපකාරයෙන් තත්වූ පරිදි අවබෝධ කරගැනුමට හේතුවන ඥනය උපදියි. ඒ අධිප්‍රඥා ශික්ෂා යි. මාර්ග ඵලයන් හි යෙදුනු නුවණයි. එතෙක් පවතින සංවරය අධිශීල ශික්ෂා යි.

මෙසේ ත්‍රිවිධ ශික්ෂාවෙන් යුක්ත වූ තැනැත්තා ඒ ශික්ෂා ත්‍රය මෙනෙහි කරමින් හික්මෙයි. දැන ගනිමින් හික්මෙයි. නුවණින් දකිමින් හික්මෙයි ප්‍රත්‍යවෙක්ෂා කර මින් හික්මෙයි. සිත පිහිටුවමින් හික්මෙයි. ශ්‍රද්ධා, වීර්‍ය, සති, සමාධි, ප්‍රඥාවනට අනුව හික්මෙයි. මෙසේ හික්මීමෙන් විශේෂයෙන් දතයුතු ප්‍රහාණය කළ යුතු, අවබෝධ කළ යුතු, වැඩිය යුතු, ධර්ම වූ අභිඥෙය්‍ය-ප්‍රහාණ- සාක්ෂාත්-භාවිතව්‍යයන් දැන ගනියි මේ දුඃඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්‍ය සත්‍යයෝ යි.

ඉක්බිති සතුන් මැරීමෙන් වෙන්වීමේ සිට අර්හත් මාර්ග තෙක් ගමන් කරන ප්‍රහාණාදී සිල් කොටස් සඳහන් වෙයි එය කෙටියෙන් මෙසේ දැක්විය හැක.

දශ අකුශල කර්මපථ, පඤ්චනීවරණ, පඤ්චධ්‍යානාඞ්ග, සතර අරූපාවචර ආරම්මණ, නිත්‍ය-සුභ, සුඛ-ආත්ම-නන්දි-රාග-සමුදය-උත්පාදන-ඝන-කර්ම රැස්කිරීම-ස්ථිර-නිමිත්ත-යන සංඥා, තෘෂ්ණා ප්‍රාර්ථනය ද, සක්කාය දිට්ඨි, රාගය, මොහය, ආලය, යන ධර්ම හා අවිද්‍යා, සංයෝජන ද ඒ ඒ මාර්ගයෙන් ප්‍රහාණය කරන කෙලෙස් ද, යන මෙතෙක් ධර්ම සංග්‍රහ වේ.

මෙ එක් එක් ධර්මයක් පාසා, අත් හැරීම ප්‍රහාණ සීලයයි. වෙන්වීම වේරමණී සීලයයි. චේතනාව චේතනා සීලයි. නික්මීම සංවර සීලය යි නො ඉක්මවීම අව්‍යතික්‍රම සීලය යි. දක්වා ඇත.

මෙතෙක් දැක්වූ සියලු සීලයන් පිළිබඳ පවත්නා පැහැදිලි නුවණ, සීලමය ඤාණය යි. අවසානය මෙසේය. "විශිෂ්ට ඥානයෙන් දතයුත්ත දකිමින් හික්මෙයි. පිරිසිඳ දතයුත්ත පිරිසිඳ දකිමින් හික්මෙයි. දුරු කටයුත්ත දුරුකරමින් හික්මෙයි. වැඩිය යුත්ත වඩමින් හික්මෙයි ප්‍රත්‍යක්ෂ කටයුත්ත ප්‍රත්‍යක්ෂ කරමින් හික්මෙයි එය දැනීම් අර්ථයෙන් ඤාණය නම් වෙයි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම් වෙයි. එහෙයින් අසා සංවරවීමෙහි ප්‍රඥාව සීලමය ඤාණයැයි කියනු ලැබේ."–ප. ම. සිං. ප.

මේ දැක්වූයේ අභිඥා, පරිඥා; ප්‍රහාණ, සාක්ෂාත්, භාවිතව්‍ය, ධර්මයෝයි.

### සීලමය ඤාණය නිමි.

### නව වැනි පරිච්ඡේදය අවසානයි.

# 10 වැනි පරිච්ඡේදය.

## 3. සමාධි භාවනාමය ඤාණය.

"සීලමය ඤාණයෙන් සංවරයෙහි පිහිටා, එක් අරමුණෙක සිත මනා කොට පිහිටුවීමෙහි ප්‍රඥාව සමාධි භාවනාමය ඤාණ නම්.

සීලමය ඤාණ විස්තරයෙන් දක්වූ ප්‍රභේදගත – බෙදීමට ගියා වූ – සීලයන් අනුව ගිය නුවණින්, කාය, වචන, සිත, යන තුන් දොර ම හික්මවා ගෙන කසිණාදී සමථ භාවනා අරමුණක, සිත කාමච්ඡන්දාදී නීවරණ ධර්මයන් ගෙන් දුරු කොට පිහිටුවා හැනීමට උපකාරී වූ නුවණ සමාධි භාවනාමය ඤාණය බව වැඩි දුරටත් අවබෝධ කට යුතු. මෙතැන් සිට සමාධිභාවනාමය ඤාණය පිළිබඳ විස්තරයක් අටුවාදී ධර්ම න්‍යායන්ට අනුව ලියැවෙයි.

සමාධි: සමාධි නොයෙක් අයුරින් ඇත. ඒ හැම දක්වීම අනවශ්‍යය. මෙතැනට අවශ්‍ය වනුයේ "කුසල චිත්තෙකග්ගතා සමාධි" කුසල් සිතෙහි එකඟ කම සමාධි යන අදහසය මෙහි කුසල පිළිබඳ විස්තරයක් සීලමය ඤාණයෙහි අවසානයේදී දක්වා ඇත. කුසල් සිත්හි පවතින නො විසුරුණු ගතියම අවික්ඛෙපයයි - සමාධි නම්;

භාවනා: වැඩීමයි. "භාවීයති වඩ්ඪීයතීති භාවනා" වඩනු ලැබෙනුයේ භාවනා නම් මේ වාක්‍යය කර්ම සාධකයි. "යමෙකු විසින් යමක් වඩනු ලැබේද" යන කර්ම වාක්‍යයේ බලාපොරොත්තු වන උක්තය - කියැවෙන පදය - හිත යනුවෙන් අර්ථ ගතයුතු. වඩන්නේ අන් කිසිවක් නොව සිතයි. එහෙයින් සිත වැඩීම භාවනා නම්.

"සමාධි එව භාවනා සමාධිභාවනා" සමාධිය ම භාවනා වූයේ සමාධිභාවනා නම්. නැතහොත් "සමාධිස්ස භාවනා වඩ්ඪනා සමාධිභාවනා" සමාධියගේ වැඩීම සමාධිභාවනා නම්. මෙසේ ගත්කල "එකඟ වූ කුසල් සිත නැවත වැටෙන්ට නො දී මතු මතු දියුණු කිරීම සමාධිභාවනා" යයි අදහස එයි. ප්‍රධාන

මාර්ගයට පැමිණෙන ශාඛා මාර්ගයනට ද මාර්ග නාමය යෙදෙන්නාසේ කුසල් සිත එකඟ කරගැනීමට උපකාර වන භාවනා ක්‍රම ද සමාධි භාවනා නාමයෙන් එයි. ඒ සමාධි භාවනා අනුව ගිය ප්‍රඥාව සමාධිභාවනාමය ඤාණයයි.

## සමාධියෙහි අර්ථ, ලක්ෂණ, රස, පච්චුපට්ඨාන පදට්ඨානයෝ:

සමාධියෙහි අර්ථ නම් සමාදානයයි. "සමාධානට්ඨෙන සමාධි" සමාධානාර්ථයෙන් සමාධි නම්. "කිමිදං සමාධානං?" සමාධානය යනු කුමක්ද? 'එකාරම්මණෙ චිත්තචෙතසිකානං සමං සම්මා ච ආධානං ඨපනන්ති වුත්තං හොති" සමාධානය නම් එක අරමුණෙහි සිත, සිතුවිලි සමව, මනා සේ ලංවීම, නැතහොත් පිහිටීම යි. යම් ධර්මයක් නිසා චිත්ත - චෛතසිකයෝ එක අරමුණෙක සමානව මනා සේ විසිරීමට නොදී සිටිද්ද ඒ ධර්මය සමාධාන නම්. අළු රැසකට දිය බිඳක් හෙළූ විට කැටිවන්නාක් මෙනි.

## සමාධියෙහි ලක්ෂණාදිය:-

> "ලක්ඛණන්තු අවික්ඛෙපො වික්ඛෙපද්ධංසනං රසො
> අකම්පන මුපට්ඨානං - පදට්ඨානං සුඛං පන" - ප. ම. අ.

අවික්ෂේපය - නො විසිරෙන ගතිය සමාධියෙහි ලක්ෂණය යි. එනම් ස්වභාවයයි. රසය නම් වික්ෂේපය දුරු කිරීම යි, (රසය යනු කෘත්‍යයයි) පච්චුපට්ඨානය - වැටහෙන කාරණය අවිකම්පනයයි. නො සෙල්වීමයි පදට්ඨාන - ආසන්න කාරණය සැපයයි.

## සමාධි ප්‍රභේද:

අවික්ෂේප වශයෙන් සමාධිය එක් වැදෑරුම් ය. උපචාර - අර්පණා, ලෞකික - ලෝකෝත්තර; වශයෙන් දෙවැදෑරුම්. හීන-මධ්‍යම - ප්‍රණීත, වශයෙන් තෙවැදෑරුම් ය. සිවු වැදෑරුම් සමාධි යක් ද ඇත. එනම් දුක්ඛාපටිපදා දන්ධාභිඥාදී සතර; ධ්‍යානාදී වශයෙන් පස් වැදෑරුම් ය. සමාධියෙහි ප්‍රභේද මෙපමණක් ම නොවේ. සියල්ල දක්වීමට ගියහොත් ප්‍රපඤ්චව - ප්‍රමාද වේ. මේ කෘතියෙහි එන විස්තරය ප්‍රස්තුතයට ප්‍රමාණවත් වේයයි සලකමි.

i උපචාර සමාධි: ආනාපාන, කායගතාසති, හැර ඉතිරි අනුස්සති අට, ආහාරෙ පටික්කූලසඤ්ඤා, චතුධාතුවවත්ථාන යන මේ කර්මස්ථානයන් ගෙන් ලැබූ සිතෙහි එකඟකම ද

ධ්‍යානයන් ලබන සමාධින් ගේ පෙරටුව උපදින එකඟ කම ද, උපචාර සමාධි නමි. අර්පණාවට ලඟින් පවත්නා නිසා උපචාර නම යෙදිණ.

ii අර්පණා සමාධි: කුශලයන් ගේ කාමාවචර තත්ත්ව මැඩලන, ගෝත්‍රභූ චිත්තක්ෂණයට අනතුරුව උපදින එකාග්‍රතාවශ- එකඟකම අර්පණා සමාධි නමි. විතර්කාදී ධ්‍යානාඞ්ග පඤ්චකය රැස් වූ විට අර්පණා යි,

iii ලෞකික සමාධි: කාමාවචර, රූපාවචර, අරූපාවචර, කුශල් පිළිබඳ සිතෙහි එකඟකම ලෞකික සමාධිය යි. උපචාර, පඤ්චධ්‍යාන, සතර අරූප්‍ය යන මොහුයි.

iv ලෝකෝත්තර සමාධි: සෝවාන් ආදී ආර්‍ය මාර්ගයෙහි යෙදුනු සමාධිය යි මෙසේ සමාධිය දෙවැදෑරුම් ය.

v හීන සමාධි: ලැබූ විගස ඇති එකඟකම හීන සමාධියි

vi මධ්‍යම සමාධි: වැඩිය පුහුණු නො කළ සමාධිය යි

vii ප්‍රණීත සමාධි: මැනවින් පුහුණු කළ සමාධිය යි, මෙසේ සමාධිය තෙවැදෑරුම්ය.

viii දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා සමාධි: නීවරණ ධර්මයන් ගේ බලපෑම නිසා ප්‍රතිපදාව දුක් සහගත වූ හෙමිහිට පවත්නා නුවණ ඇති සමාධිය.

ix දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා සමාධි: ප්‍රතිපදාව දුක්සහගත වූ වේගයෙන් පවත්නා නුවණ ඇති සමාධිය.

x සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා සමාධි: නීවරණ ධර්මයන් ගේ බලපෑම අඩු නිසා ප්‍රතිපදාව පහසු වූ හෙමිහිට පවත්නා නුවණින් යුත් සමාධිය.

xi සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා සමාධි: ප්‍රතිපදාව පහසු වූ වේග යෙන් පවත්නා නුවණින් යුත් සමාධිය.

මෙසේ සමාධිය සතර වැදෑරුම් ය. විස්තර යුතමය ඤාණ යෙහිදී දක්වී .

ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය, පඤ්චමධ්‍යානය මේ වශයෙන් සමාධිය පස් වැදෑරුම ය, විස්තර මතු වටයි.

## සමාධියෙහි සංකිලෙස හා වොදාන:

සංකිලෙස යනු කිළුටුවීමයි. සමාධියෙහි කිළුටුවීම නම් පිරිහීමට හේතු වන ධර්මයෝයි. “තත්ථ පඨමස්සඣානස්ස කාම සහගත සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති හානභාගිනී පඤ්ඤා” ප්‍රථමධ්‍යාන ලාභියාට – පළමුවැනි ධ්‍යානය ලැබූ තැනැත්තාට පඤ්චකාමයන් අනුව ගිය හැඟීම් මෙනෙහි කිරීම පිරිහීමට නැමුණු නුවණ යි; වදාළ බැවින් පඤ්චකාමවස්තු නිතර නිතර මෙනෙහි කිරීම සමාධිය ගේ කිළුටුවීම යි. එසේම ද්විතීය ධ්‍යානාදී ලැබූවහු පෙර පෙර ධ්‍යානයන්හි පවතින ධර්ම මෙනෙහි කිරීම ද සමාධියේ කිළුටුවීම බව දතයුතු.

වොදාන නම් දියුණුවට හේතුවන ධර්මයි. “වොදානන්ති විසෙසභාගියො ධම්මො” ප්‍රථම ධ්‍යානය ලැබූවහු ද්විතීය ධ්‍යාන යෙහි ඇත්තා වූ ධර්ම මෙනෙහි කිරීම සමාධිය දියුණුවීමට හේතුයි. ඒ වෝදාන නමි. සෙසු තන්හි ද මෙසේ ය.

## ලෞකික සමාධිය උපදවන අයුරු:

සමාධිය ලෞකික, ලෝකෝත්තර, වශයෙන් දෙපරිදි වන බව ඉහත දැක්විණ, එයින් ලෝකෝත්තර සමාධිය උපදවන අයුරු, ඉදිරියට දැක්වෙන, ප්‍රඥාභාවනා ගැන ලියැවෙන ධර්මවස්තු ඥාණාදී ඥාණවිස්තරයන් ගෙන් දතහැක. මෙහිදී දක්වනුයේ ලෞකික සමාධිය උපදවන අයුරුයි.

“යො පනායං ලොකියො සො වුත්තනයෙන සීලානි විසොධෙත්වා සුපරිසුද්ධෙ සීලෙ පතිට්ඨිතෙන, ය්වාස්ස දසසු පලිබොධෙසු පලිබොධො අත්ථි තං උපච්ඡින්දිත්වා, කම්මට්ඨාන දායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා අත්තනො චරියානු කූලං චත්තාලීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වා, සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහාරෙ විහරන්තෙන ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වා සබ්බං භාවනා විධානං අපරිහාපෙන්තෙන භාවෙ තබ්බො”ති – වි. ම. 66 පි.

යම් මේ ලෞකික සමාධියක් වේද, එය එය ඉහතින් කී සිල් පිරිසිදු කොට, පිරිසුදු සීලයෙහි පිහිටියහු විසින්, පලිබෝධ දසය අතුරෙන් යම් පලිබෝධයක් ඔහුට ඇද්ද, එය නැති කොට, කම්ස්ථාන දෙන කල්‍යාණ මිත්‍රයෙකු වෙත එළඹ, තමා ගේ

චරිතයට ගැලපෙන, සතලිස් කම්සථාන අතුරෙන් එකක් ගෙන, සමාධි භාවනාවට නුසුදුසු විහාර හැර, සුදුසු විහාරයක වෙසෙමින්, කුඩා පලිබෝධ ද දුරුකොට, සියලු භාවනා නියමයන් නො පිරිහෙලා ගනිමින් වැඩිය යුතු.

මේ සමාධි භාවනා ක්‍රමය කෙටියෙන් දක්වූ පරිදියි. මෙයින් දතයුතු යමක් ඇද්ද, ඒවා මෙතැන් සිට දැක්වෙයි.

## දස පලිබෝධ:

පලිබෝධ යනු කරදරයි. චිත්ත සමාධිය වැඩීමට කරදර වලින් නිදහස් විය යුතුය, ගිහි - පැවිදි දෙපක්ෂයටම කරදර පවතී. රැකියාවන්, වස්තු, අඹු - දරුවන්, මේ ආදිය ගිහි පක්ෂයට ඇති කරදරයි. පැවිද්දහුට මූලික වශයෙන් පවතිනුයේ විහාර සතු දේ, ඉඩම්, වස්තුව රැක ගැනීම, බහුශ්‍රැතකම, උපාධිලාභීන් වය, හා විහාරස්ථානයෙහි මූලිකත්වයයි. මෙබඳු කරදර පැවිද්දා විසින් දුරු කිරීමට කළ යුත්තේ සිවු පිරිසිදු සීලයෙහිම මනාසේ පිහිටීමයි. ඒ සීලයෙන්ම මේ පලිබෝධ අහෝසි වේ. ලාභය, තෘෂ්ණය ආදී ලාමක බලාපොරොත්තු නිසාවෙනි පැවිද්දා මූලික කරදර වගාකර ගනුයේ.

සිවු පිරිසිදු සීලයෙහි පිහිටියහුට ඇති පලිබෝධ දසයෙකි.

ආවාසො ච කුලං ලාභො - ගණො කම්මඤ්ච පඤ්චමං
අද්ධානං ඤාති ආබාධො - ගන්ථො ඉද්ධීති තෙ දස”

ආවාසය, කුලය, ලාභය, සමූහයා, කර්මාන්ත, ගමන්, ඤාතීන් රෝග, ඉගෙනීම, ලෞකික සෘද්ධි යන මොහුයි.

1. ආවාස; එක කාමරයක් හෝ පිරිවෙණක් හෝ ආරාමයක් හෝ වෙයි ද, ඒ ආවාස නම්. මෙය හැම දෙනාටම පලිබෝධ පිණිස නො පවතියි. යමෙක් ඒවාහි අළුත් වැඩියා කිරීම්, භාණ්ඩ තැන්පත් කිරීම්, ආදිය කරයි ද, පිටත ගියත් සිත එහි පවතියි ද එබන්දහුටම කරදර සඳහා පවතී. පිරිසිදු සීලයකම පිහිටියහුට අයිති, එසේම අල්පේච්ඡතාදී ගුණ සඳහා පවතින, අට පිරිකර පමණක් වෙයි ද, ආවාසය ගැන බලාපොරොත්තුවක් නොමැති ද, එබන්දහුට කාමර ආදී කෙබඳු ආවාසයක සිටියද පලිබෝධ නැත.

2. කුල : නෑ කුලය හෝ උපස්ථායක කුලය හෝ යමක් කුලය පලිබෝධය සඳහා පවතිනුයේ සැප දුක් දෙකෙහි තමා ද

ඒ අනුව සැප - දුක් විඳිමයි ඒ නිසාම කුල තමා සමග තද බැඳීමක් ඇති කෙරෙයි. ඔවුහු වන්දනා ගමන් ගියත් තමා ද ඔවුන් යාමට සැරසෙයි. අද බොහෝ පැවිද්දෝ කුල සංසර්ග විහරණයෙන් යුක්ත වූවෝ වෙත්.

3. ලාභ : සිවු පසයයි. එනම් සිවුරු පිණ්ඩපාත - ආහාර, සෙනසුන්, බෙහෙත්, යනුයි. මෙය පලිබෝධ වනුයේ පුණ්‍ය වන්ත - පින් ඇති - පැවිද්දාටය. ඔහු සඳහා ඇත ප්‍රදේශයන්හි වෙසෙන දායකයින් පවා සිවු පසය ගෙන එනු ලැබේ. එසේ පැමිණි විට ඔවුන්ට ධර්ම දේශනා කළයුතු. වැඳීම් ආදිය සඳහා ඉදිරිපත් විය යුතු. එසේම එක් දිනකුදු තමා විහාරයේ නොසිටිය හොත් දායකයෝ අවුත් "අසවල් ස්වාමීන් වහන්සේ කොහිද? උන්වහන්සේ වැඩම කළේ කවර දිශාවකටද? අද ආපසු වඩින්නේ නැද්ද?" මේ ආදී වශයෙන් මහත් කලබල කරති. එහෙයින් හැම දිනම ඔවුන්ගේ දාන, වන්දනාදියට සහභාගි විය යුතු. මෙසේ සිවුපසය ඇතැම් පැවිද්දෙකුට පලිබෝධ සඳහා පවතී.

4. ගණ : සමූහයායි. මොවුහු අනිකෙක් නොව තමාගෙන් ඉගෙණ ගන්නා ගෝල - ශිෂ්‍ය පිරිසයි. වැඩිපුර ශිෂ්‍යයන් ලඟා කරගත් පැවිද්දාට දානය වළඳන්ට නමුදු අවසථාවක් නො මැත. ඔවුන්ගේ කුදු මහත් කාර්‍ය්‍යයන් වලටම කාලය ගෙවන්ට සිදු වෙයි. එහෙයින් එබන්දහුට පමණක් ගණ පලිබෝධය පවතී.

5. කම්ම : අළුත් වැඩියා කිරීමය. ආවාස, විහාර, ධර්ම ශාලාදිය අළුත් වැඩියා කිරීමට ආරම්භ කළ විට ඒ සඳහාම තමාගේ කාලය යැවිය යුතු. වඩුවන්, පෙදරේරුවන්, ආදී කාර්මිකයන්ගේ අඩු - වැඩි කම් කළ නො කළ වැඩ, ඒවැනි හොඳ - නරක, මේ ආදිය සෙවිය යුතුය. මේවා ගැන බැලීමට නො පවරා ගත්තහුට පලිබෝධ නැත.

6. අද්ධාන : මාර්ග ගමනයි. එනම් යම් යම් ගමන් යෑද ගැනීමයි. පැවිදි වීමට සිටින කුල දරුවෙකු නිසා හෝ සිවු පසය ලබා ගැනීම සඳහා කෙනෙකුගේ සිත් දිනා ගැනීමට හෝ තමා වෙසෙන තැනින් බැහැර යායුතුය මෙබඳු ගමන් බහුලව ඇත්තහුට මහණකම් කිරීමට - භාවනා කිරීමට - අවකාශ නැත. එහෙයින් පලිබෝධයෙකි එබඳු දෙයක් ඇත්නම් එය වහා ඉටු කොට කාය විවේකය කළ යුතුය.

7. ඤාති : නෑයන් ය. පැවිද්දාට නෑයන් දෙවගෙකි. ආරාමයෙහි වෙසෙන ඇදුරු-ආචාර්ය, උවැදුරු - උපාධ්‍යාය, හා එකට වැඩ වෙසෙන භික්‍ෂූන් යන මොවුහු එක් වගෙකි. (කොටසෙකි) අනෙක තම මා - පිය, සහෝදරාදීහුයි. මොවුහු පළිබෝධ සඳහා පවතිනුයේ ගිලන් වූ කල්හි ය. එනම් රෝගී වූ අවස්ථාවේදීය.

පැවිද්ද විසින් උපාධ්‍යායන් ගිලන් වුවහොත් දිවි ඇති තෙක් උපස්ථාන කළ යුතුය. තම භාවනා ගැන නො සිතිය යුතුය. පැවිද්දාට ආචාර්යවරු කීප දෙනෙකි. පැවිදි කළ ගුරුතුමා, උපසම්පදාවේදී ඉදිරිපත් වන ගුරුතුමා, කම් වාක්‍යය කියන කම්මාචාර්ය, නිශ්‍රයාචාර්ය, උද්දේසාචාර්ය, ආදීහුයි. මේ ආචාර්යවරුන් ගිලන් වුවහොත් උපාධ්‍යායන්ට මෙන් උපස්ථාන කළ යුතු. එකට සිටින භික්‍ෂූන් ද, උපසම්පදා අපේක්‍ෂකයන් - බලාපොරොත්තු වන වුන්, ප්‍රව්‍රජ්‍යාපෙක්‍ෂකයන් ද එසේම ය.

මා - පිය දෙදෙන ගිලන් වුවහොත් උපාධ්‍යායන්ට මෙන් දිවි ඇති තෙක් උපස්ථාන කළ යුතු. මෙසේ කළ යුත්තේ ඔවුන් පවරා දිය යුතු කෙනෙකු නොමැති වූ කල්හි ය. පැවරීමට කෙනෙකු ඇත්නම් ඒ උපස්ථාන බාරදිය හැක. ඉදින් මා - පිය දෙදෙන තමාගෙන්ම උපස්ථාන ලැබීමට බලාපොරොත්තු නම් කළ යුතුමය. සහෝදරයන් හා නෑයන් ගිලන් වූ විට, ඒ ගැනම නොයෙන ට නො ගොස් ඔවුන්ගෙන් කෙනෙකු හමුකරගෙන නැග දුක් විචාල යුතු. තමා සතු බෙහෙත් ආදිය දීමට සුදුසු මා-පියන්ට පමණි සොහොයුරන් සඳහා තම තමා සතු දේ දී, පසුව ගත යුතු. නුදුනහොත් දෙස් පැවරීම නුසුදුසුය. සොහොයුරාගේ භාර්යාව ද සොහොයුරියගේ ස්වාමියා ද දියයුත්තේ සොහොයුරාට; සොහොයුරියට, දෙන අදහසිනි. නැතහොත් ශ්‍රද්ධාදෙය නම් පාතයට අසු වේ. (සැදැහැයෙන් දුන් දේ විනාශ කිරීමයි) මෙසේ නෑයන් ලෙඩවීම පළිබෝධයෙකි.

8. ආබාධ : යම්කිසි රෝගයක්. තමාට රෝගයක් කරදර කරයි නම් එයට බෙහෙත් කිරීමෙන් නැතිකර ගත යුතුය. නොයෙක් බෙහෙත් කළත් ආබාධය නො සංසිඳේ නම් "මේ කුණු සිරුර කෙතෙක් පෝෂණය කළත් වැඩක් නැත, මෙතෙක් සසර ඇවිදිනුයේ ද මේ සිරුර නිසාම ය" මේ ආදී වශයෙන් සිතා සිරුරට නිඳා කොට භාවනා කළ යුතු.

9. ගන්ථ : ධර්මය ඉගෙණීම, ධාරණය කර ගැනීම, ග්‍රන්ථ පළිබෝධයයි. ධර්මය මතක තබා ගැනීම සඳහා නිතර කට පාඩම්

කියයුතු. පොත්යි ලිවිය යුතු. ධර්ම සාකච්ඡා පැවැත්විය යුතු. මෙසේ එයටම යෙදුනු විට පළිබෝධ සඳහා පවතියි.

10. ඉද්ධි : පෘථග්ජනයන්ගේ සෘද්ධියයි. ලෞකික නිසා පරිහරණය කිරීමට අපහසුය. ඉක්මනින් ඇද හැලේ. මෙය සමාධියට පළිබෝධ නොවේ. විදර්ශනාවට පළිබෝධයි. එහෙයින් විදර්ශකයා විසින් ලෞකික සෘද්ධීන්හි සිත නො අලවා විදර්ශනා කළ යුතු.

සමාධි භාවනා කරන්නහු විසින් සෘද්ධි පළිබෝධය හැර ඉතිරි නවය දුරුකට යුතුය.

## ද්විධ කර්මස්ථාන:

පැවතිය යුතු වශයෙන් කර්මස්ථාන - භාවනා - දෙවැදෑරුම්ය. සබ්බත්ථක කම්මට්ඨාන, පාරිහාරිය කම්මට්ඨාන යනුයි. එනම්. හැම තැනදීම පැවතිය හැකි කර්මස්ථාන සහ නිතර වැඩීම් වශයෙන් දියුණු කළ යුතු, චරිතයට සුදුසු, මූලික කර්මස්ථානයි. මෛත්‍රී, මරණ සති, අශුභ සඤ්ඤා යන භාවනා සබ්බත්ථක කම්මට්ඨාන නම් චරිතානුකූලව තෝරාගත් ආනාපාන සති ආදී භාවනා පාරිහාරිය කර්මස්ථාන නම් වෙයි. සමාධි භාවනා කරන්නහු විසින් සියලු දෙනා කෙරෙහිම මෘදු - මොළොක් - සිත පැවැත්විය යුතුය. එහෙයින් මෛත්‍රී සිත පළමු කොට තමා වෙත හරවා, ඉක්බිති ආචාර්ය, උපාධ්‍යාය, සබ්‍රහ්මචාරික, සාමණේර, භණ්ඩුක, කප්පියකාර, ආරාමික, යන මොවුන් කෙරෙහි පිළිවෙලින් මෛත්‍රිය හැරවිය යුතුය ඊට පසු විහාර සීමාවෙහි අධිගෘහිත දෙවියන්, ගොදුරු ගම්වැසියන්, නගර වැසියන්, සියලු සතුන්, මේ සැමදෙනා කෙරෙහිම මෛත්‍රී වැඩිය යුතු. මෙසේ මෛත්‍රී කළ විට ඒ සැමදෙනාම තමාගේ යහළුවන් සේ වැටහෙයි. ඒ නිසාම සැපසේ විසිය හැක. දෙවියන්ගේ ආරක්ෂාව ද සැලසේ. මරණය ගැන සිහි කිරීම නිසා සංවේග - කලකිරීම් - බහුල වෙයි. පසුබට නොවී නිතර සිහි - නුවණ යොදවමින් කළයුත්ත වහා කරයි. එසේම අශුභ සඤ්ඤා ඇත්තහුට කොපමණ ලස්සන රූපයක් දුටුවත් සිත නො ඇලේ. මෙසේ මේ භාවනා තුන හැම තැනදීම පැවැත්විය යුතු හෙයින් සබ්බත්ථක කම්මට්ඨාන නම්,

## කල්‍යාණ මිත්‍රයා :

ඉහතින් කී දෙවැදෑරුම් කර්මස්ථාන දෙන තැනැත්තා කර්මස්ථාන දායක නම්. හේ කල්‍යාණ මිත්‍රයෙකු

විය යුතු. නියම කල්‍යාණ මිත්‍ර උතුමාණෝ බුදුරජාණන් වහන්සේ ය. "මමං හි ආනන්ද කල්‍යාණ මිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති" ආනන්දය, කල්‍යාණ මිත්‍ර වූ මා වෙත අවුත් ඉපදීම ස්වභාව කොට ඇති සත්ත්වයෝ ඉපදීමෙන් නිදහස් වෙත්." යි මෙසේ බුදුරජාණන් වහන්සේ විසින්ම තමන් වහන්සේ කල්‍යාණ මිත්‍රයා බව හඳුන්වන ලදී. එසේම බුදුරජාණන් වහන්සේ වෙතින්ම කර්මස්ථාන ගැනීමට හැකි නම් එය ඉතා උසස් ය. කිසිදු තැනකදී අඩුවක්, භාවනා කරන කල්හි සිත් පෙරළුමක් නොවේ.

උන්වහන්සේ පිරිනිවන් පෑ පසු පිළිවෙළින් අග්‍ර ශ්‍රාවක, මහා ශ්‍රාවක, යන උතුමන්ගෙන් ගතයුතු. උන්වහන්සේලාත් පිරිනිවියෝ නම් චතුර්ථධ්‍යානය ලබා රහත් වූ උතුමන් ගෙන්ද, නැත හොත් ධ්‍යානලාභී සෝවාන් ආදී මාර්ග - ඵල ලාභීන්ගෙන් ද, උන් වහන්සේත් නැතහොත් ධ්‍යානලාභීන්ගෙන් ද, නැතහොත් ත්‍රිපිටකධාරී, ද්විපිටකධාරී, ඒකපිටකධාරී, එක් නිකායක් දරන, මේ ආදී වශයෙන් පිළිවෙළින් ගත යුතුය. එසේත් නොමැති නම් පහත සඳහන් කල්‍යාණ මිත්‍ර ගුණ වලින් යුත් කෙනෙකු වෙතින් ගත යුතු. කල්‍යාණ මිත්‍ර ගුණ නම් -

"පියො ච ගරු භාවනීයො - වත්තා ච වචනක්ඛමො
ගම්භීරඤ්ච කථං කත්තා - නො චට්ඨානෙ නියොජයෙ"

සීලයෙන් ගුණයෙන් හැම දෙනාටම ප්‍රිය කෙනෙකු වීම, සීල ගුණ නිසාම ගරු තත්ත්වය තිබීම හැමදෙනාටම අවවාද දෙන්නෙකු වීම, ඉතා සැලකිලි දක්වමින් කරනු ලබන සම්භාවනයට සුදුස්සෙකුවීම, හොඳ - නරක සියලු වචන ඉවසීමේ ගුණය, ගැඹුරු ධර්ම කියා දෙන බව, නුසුදුසු තන්හි, නුසුදුසු වැඩෙහි නො යොදවන ගතිය, යන කරුණු සතයි.

කර්මස්ථාන ගැනීමට යන තැනැත්තහු විසින් ද, ආචාර්යයන් වහන්සේ වෙත එළඹිය යුත්තේ ඉතා ගෞරවයෙනි. ඒ පිළිබඳ පිළිපැදිය යුතු දේ මහාවග්ගපාළි විනය පොතෙහි සඳහන්ව ඇත. එයින් ගතයුතු කෙටි අදහස: ඉතා යටහත්, කීකරු, ස්වභාවයකින් යුතුව ආචාර්යයන් වහන්සේට කළ යුතු හැම වතක්ම නො පිරිහෙලා කරමින් උන්වහන්සේගේ සිත පැහැදවිය යුතුය. කොතැනක නමුත් කලකිරීමක් ඇති වුවහොත් දහස් වර වුවද වැඳ සමාව අයැදිය යුතු. ජීවිතයෙහි තද ගතිය - කායදඬු - හැර ගැනීම සමාධියට මහත් රුකුලෙකි. ආචාර්යයන් වහන්සේ වෙත එසේ පවතින්නට යයි නියම කරනුයේ ඒ තද ගතිය නැතිකර හැනුමට ය.

"නිධීනං ව පවත්තාරං - යං පස්සෙ වජ්ජදස්සිනං
නිග්ගය්හවාදිං මෙධාවිං - තාදිසං පණ්ඩිතං භජෙ
තාදිසං භජමානස්ස = සෙය්‍යො හොති න පාපියො

ධම්මපදය

යමෙක් නිධානයක් - වස්තුවක් - පෙන්වන්නෙකු මෙන් ඇති වරද විමසා බලනා, තරවටු කොට ඒ වරද කියාදෙන නුවණැති කෙනෙකු දකී නම් එවැනි සත්පුරුෂයෙකු ආශ්‍රය, කරන්නේය. එබන්දනුට ආශ්‍රය කරන්නහුට යහපතක්ම වේ. නපුරක් නොවේ.

මෙබඳු කල්‍යාණ මිත්‍රයාගේ ආශ්‍රය නිසා තැම අයුරින්ම තමාගේ අභිවෘධිය සැලසේ. එබඳු කෙනෙකු වෙත එළඹිය යුතු.

## චරිත විභාගය :

සිතෙහි පවතින රාගාදි අදහස් උත්සන්න වීමෙන් ඇතිවන පුද්ගලයාගේ පැවැත්ම, හැසිරීම චරිත නම්. චරිත සයෙකි. රාග චරිත, ද්වේෂ චරිත; මෝහ චරිත, ශ්‍රද්ධා චරිත, විතර්ක චරිත, බුද්ධි චරිත යනුයි. මෙහි රාගය පඤ්ච කාමයන් කෙරෙහි පවතින තද ආශාව බහුලව පවතින තැනැත්තා රාග චරිතයා නම්. සෙසු චරිත ද මෙසේ වටහා ගත යුතු. තවද රාග - ශ්‍රද්ධා, ද්වේෂ - බුද්ධි, මෝහ = විතර්ක, මේ වශයෙන් චරිතයන්ගේ සමාන ගති පවතී. රාග චරිතයා බොහෝ දුරට ශ්‍රද්ධා චරිතයාට සමානය. ද්වේෂ චරිතයා බුද්ධි චරිතයාට ද, මෝහ චරිතයා විතර්ක චරිතයාට ද, එසේම සමානය. ඒ සමාන භාවය මෙසේ දතයුතු.

දානාදි කුශල ධර්මයන් සිදු කරද්දී රාග චරිතයාට ශ්‍රද්ධාව බල වත් ලෙස උපදියි. මක්නිසාද? ශ්‍රද්ධාව රාගයට කිට්ටු පැවැත්මක් ඇති හෙයිනි. ඒ එසේමැයි. අකුශලයට බැසගත් කල්හි රාගය සිනිඳුය. මොලොක්ය. කුසලයට බැසගත් කල්හි ශ්‍රද්ධාව ද එසේම මෘදුය. රාගය රූපාදි පඤ්චකාමයන් සොයයි. ශ්‍රද්ධාව ශීලාදී ගුණ සොයයි. රාගය තමාට අහිත පිණිස පවතින යම් යම් කාමගුණික වස්තු අත නොහරියි. ශ්‍රද්ධාව හිත පිණිස පවතින දානාදීන් නො අත් හරියි. මෙසේ රාග චරිතයාට ශ්‍රද්ධා චරිතයා සමාන ය. ද්වේෂ චරිතයා කුශල් කරද්දී ප්‍රඥාව බලවත් වෙයි. මක්නිසාද? ආසන්න ගුණ රඳා පවතින හෙයිනි. පාප කර්මයන් හිදී ද්වේෂය තදය. අරමුණෙහි නො ඇලෙයි. එසේම කුශල

කර්මයන්හිදී බුද්ධිය නදන. වහා එහි නො ඇලෙයි. දොෂය නැති දෙස්ම සොයයි. බුද්ධිය ඇති දෙස් සොයයි. මෙසේ දොෂ චරිතයා බුද්ධි චරිතයාට සමානය.

මෝහ චරිතයා තුපත් කුශල් ඉපදවීමට උත්සාහ කරද්දී එයට අකුල් හෙලීම සඳහා පවතින නොයෙක් විතර්ක = කල්පනා - උපදවයි මොහය විතර්කයට ආසන්න ගුණ ඇති හෙයිනි. මෝහය අවුල් සහිත නිසා එක් අරමුණක නො පිහිටයි විතර්කයද නොයෙක් අයුරින් කල්පනා කිරීම නිසා අවුල් වී එක් අරමුණක නො පිහිටයි. මෙසේ මෝහ චරිතයා විතර්ක චරිතයාට සමානය.

"මොහු මෙබඳු චරිතයෙකැයි" යි හැම අයුරින්ම අවබෝධ යක් ඇතිවනුයේ අනුන්ගේ සිත් දන්නා නුවණ වූ චෙතොපරිය ඥාණය ලත් තැනැත්තහුට පමණි. සෙස්සෝ ඔහුගෙන්ම විම සිය යුතු වෙත්, නැතහොත් ඔහුගේ පැවතීම් අනුව බලා මෙබන් දෙකු විය යුතුයැයි සාමාන්‍ය අවබෝධයක් ලබාගත යුතුය. ඊට උපකාර සඳහා පවතින කරුණු කීපයකි. එනම්.

"ඉරියාපථතො කිච්චා - භොජනා දස්සනාදිතො
ධම්මප්පවත්තිතො චෙව - චරියායො විභාවයෙ"

යාම - ඊම ආදී ඉරියව්, හැමදීම ආදී වැඩ, වැළඳීම, දකින අයුරු, බහුලව පවතින කෙලෙස්, යන මොහුම්.

## රාග චරිතයාගේ ස්වභාවය. (හැරි)

රාග චරිතයාගේ යාම, හිඳීම, සිටීම, නිදාගැනීම් ආදී හැම ඉරියව්වක්ම ප්‍රසාද ජනකය. පැහැදෙන සුළුය. හදිසියෙන් සිදු කරනු ලබන කිසිදු ඉරියව්වක් ඔහු කෙරෙහි නොපවතියි. ඔහු විසින් කරනු ලබන හැමදීම, සිවුරු පඬු පෙවීම්, ආදීවත් (වැඩ) ද ඉතාමත් පැහැදිලිය. ලතාමකට කෙරේ. සිවුරු පෙරවුම ද කදිමට, අනුන් පැහැදෙන ලෙස, පිරමඬුලු කොට සිදු කෙරෙයි. ආහාර වැළඳීම ද ඉතා ශාන්තය. මිහිරි ආහාරයට බොහෝ කැමතිය. එබඳු දෙයක් ලැබූ විගස මහත් සතුටට පත්වේ. ආහාර මනාසේ සකස් කොට, කලබල ගතියක් නැතිව වළඳයි. වළඳන අයුරු බලා ඉඳීමට පවා ප්‍රිය ජනකය.

යම රූපයක් ලස්සන නම් ඒ දෙස ද, ශබ්දාදී දෑයක් මිහිරි නම් ඒ දෙසද, සිත යොමු කරමින් බොහෝ වේලා බලමින්, අස මින්, සිටියි. රාග චරිතයා කෙරෙහි බහුල වශයෙන් රැවටීම,

කපටිකම්, මානය, නැති ගුණ හැඟවීමෙන් බොහෝ දේ ලබාගනු කැමැත්ත, කොතෙක් ලැබුණත් මදි ගතිය, එකම උසස් තැනැත්තා තමායයි ගනු ලබන හැඟීම, චපල ගති, මේ ආදී දෑ පවතියි. මේ රාග චරිතයා දැන ගැනීමට උපකාර වන කරුණු ය. ඉහතින් දක්වූයේ මායා, සාඨෙය්‍ය, මාන, පාපිච්ඡතා, මහිච්ඡතා, සිඬග, චාපල්‍ය, යන කෙලෙස් ය)

ශ්‍රද්ධා චරිතයාගේ හැඩහුරුකමත් මෙසේම ය. එහෙත් දීම, සිල්වතුන් දැකීමේ කැමැත්ත; බණ ඇසීමේ කැමැත්ත මේ ආදිය ශ්‍රද්ධා චරිතයාගේ ආවේණික ගතියි.

## ද්වේෂ චරිතයාගේ ස්වභාවය,

මොහු ගේ ඉරියවු ඉතා රළුය. ගොරෝසුය. ගේ පාදයෙන් දූවිලි නංවමින් වහා පා තබමින් ඉක්මනින් යයි. සිටීයේද ගල්කණුවක් සේ නොසෙල්වී තදින් සිටියි. නිදා ගන්නා කල්හි කෙසේ හෝ අසුන පණවාගෙන, කපා හෙළූ ගසක් වැටෙන්නානාසේ වැතිරෙයි ඔහුගේ හැමදීම් ආදී වැඩද ඉතා රළුය. ලස්සනක්, හොඳක් හෝ නොසලකයි. කෙසේ හෝ එය අවසන් කිරීමටය. බලාපොරොත්තුව. වැළඳීමේදීද රළු ආහාර ප්‍රිය කරයි. විශාල ලෙස ගුලි ගසා මුඛය පිරෙනසේ වළඳියි. සුළු අමිහිරි දෙයක් වුවත් අනුවූවිට තද දොම්නසක් උපදවයි.

ද්වේෂ චරිතයා කොපමණ ලස්සන රූවක් දුටුවත් මිහිරි ශබ්දයක් ඇසුවත්, ඒ සැම දෙයක් කෙරෙහිම දොස් සොයයි. ගුණයක් ඇතද නො ගනියි. යයි නම් නැවත නොඑන පරිද්දෙන් බලාපොරොත්තුවක් නොමැතිවම යෙයි. මොහුට වැඩි වශයෙන් පවතිනුයේ තරහ, වෛරය, ගුණමකුබව, ගුණ සමාන කිරීම, අනුන්ගේ වස්තු නො ඉවසීම, තම සතු දෑ සැඟවීම, මේ ආදී කෙලෙස්ය. (ඒ දක්වූයේ ක්‍රොධ, උපනාහ, මකඛ, පලාස, ඉස්සා, මච්ඡරිය. යන මොහුය.

බුද්ධි චරිතයාගේ පැවතීම් ආදිය ද මේ අයුරින්ම සිතා ගත යුතු අතර, ඔහු කෙරෙහි කීකරුකම, යහපත් මිතුරන් ඇසුරු කිරීම, ආහාරයෙහි පමණ දැනීම, සිහි-නුවණ නිදිවැරීම-භාවනා-කලකිරියයුතු තැන කලකිරීම, ආදී යහපත් ගතිද පවතින බව සැලකිය යුතු.

## මෝහ චරිතයා ගේ ස්වභාවය

මෝහ චරිතයා ගේ ඉරියව් පැවැත්ම අවුල් සහිතය. බිය හැඟුණෙකු මෙන් ඔබිනොබ හැසිරෙයි. සිටියේද කලබල වූවකු සේ වටපිට බලමින් මහත් අසංවර ගතියක් පෙන්වයි. ගේ නිඳව යනුයේ බොහෝසේ සකස්වීමක් නොමැතිවය. කෙසේ හෝ අසුන පණවාගෙන, මූනින් අතට වැටී, මුහුණ හකුලාගෙන නිදයි. අවදිවනුයේ ද බියවූවෙකු සේ ය. ඔහුගේ හැමදීම් ආදී ක්‍රියා යහපත් ගතියෙන් තොරයි. සිවුරු පෙරවූවත් ඒවා එහෙ-මෙහෙ එල්ලෙමින්, ලිහිල්ව පවතී. ආහාර අනුභවයේදී රසක් ගුණයක් නො බලා, අසුවූ දේ, භාජනයෙහිත් අතෙහිත්, මුඛයෙහිත් තවරාගනිමින් වලදයි.

මෝහ චරිතයාට හමුවන අරමුණු වලදී අනුන් ගේ කීම් අනුසාරයෙන් ගැනීමට තමනිසා ගේ හොඳ - නරක දෙක විමසා, ගැනීමට නොහැකිව මධ්‍යස්ථ වෙයි. ඔහු කෙරෙහි අලස බව විසුරුණු සිත් පැවතුම, පසුතැවීම්, සැක, මේ ආදී පාපධර්ම පවතියි.

විතර්ක චරිතයා ගේ හැඩහුරුකම් මෙසේ වූව ද ඔහු කෙරෙහි කතා කිරීමේ කැමැත්ත, සමූහ සමූහව විසීමේ කැමැත්ත, පිනෙහි නොඇලෙන ගතිය. එක තැනක නොපිහිටි සිත් ඇති බව, රෑ කල්පනාකර දිවා ඒ අනුව ක්‍රියාවේ යෙදවීම, මේ ආදී ගති-ගුණ පවතියි.

මෙසේ දැක්වූ චරිත විභාගය අනුව, කර්මස්ථාන දෙන කල්‍යාණ මිත්‍රයා හෝ තමා හෝ තම චරිතය ගැන විමසා, ඊට අනුරූපවූ කර්මස්ථානයක් ගතයුතුය.

## කර්මස්ථාන විභාගය

සමථභාවනා කර්මස්ථාන සතළිසෙකි. "තත්ථ සමථ සඞ්ගහෙ තාව දස කසිණානි, දස අසුභා, දස අනුස්සතියො, චතස්සො අප්පමඤ්ඤායො, එකා සඤ්ඤා, එකං වවත්ථානං, චත්තාරො ආරුප්පා චෙති සත්තවිධෙන සමථ කම්මට්ඨාන සඞ්ගහො" අ. සං. 9 පරි.

2019 10 05 Paññápárami Na Uyana Free Distribution

## කොටස් සතෙකි

1. දස කසිණ, 2. දස අසුභ, 3. දස අනුස්සති, 4. සතර අප්පමඤ්ඤා, 5. ආහාරෙපටික්කූල සඤ්ඤා (එකාඤ්ඤා) 6. ධාතුවවත්ථානය, 7. සතර ආරුප්ප යනුයි. එක්වූ කල්හි සතළිසෙකි.

දස කසිණ: පඨවි කසිණය, ආපො කසිණය, තෙජො කසිණය, වායො කසිණය, නීල කසිණය, පීත කසිණය ලොහිත කසිණය, ඔදාත කසිණය, ආකාස කසිණය ආලොක කසිණය.

දස අසුභ: උද්ධුමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛායිතක, වික්ඛිත්තක, හතවික්ඛිත්තක, ලෝහිතක, පුලවක, අට්ඨික යන අසුභයෝය.

දස අනුස්සති: බුද්ධ, ධම්ම, සඞ්ඝ, සීල, චාග, දෙවතා, උපසමා, මරණ යන අනුස්සති අට හා කායගතා සති, ආනාපානසති දෙකය.

අප්පමඤ්ඤා සතර: මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යනුයි.

ආරුප්‍ය සතර: ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යනුයි-

ආහාරෙ පටික්කූල සඤ්ඤා, චතුධාතුවවත්ථාන, යන දෙකක් සමග සියල්ල සම සතළිසෙකි.

කම්සථාන විභාගයෙහිදී මූලික වශයෙන් දතයුතු කරුණු දෙකක් ඇත. ඒ නොදතහොත් කම්සථාන පැහැදිලි නොවේ.

1. ත්‍රිවිධ භාවනාව: පරිකර්ම භාවනා, උපචාර භාවනා අර්පණා භාවනා යනුයි. ආරම්භයේ සිට තදඞ්ග-සාමාන්‍ය-වශයෙන් නීවරණයන් යටපත් වනතෙක් කරනු ලබනුයේ පරිකර්මභාවනා ය. එතැන් සිට නීවරණයන් විෂ්කම්භන මධ්‍යම වශයෙන් යටපත් කොට, කාමාවචර අවසථාව ඉක්මවන්නාවූ ගොත්‍රභූ සිත තෙක් කරනු ලබනුයේ උපචාර භාවනායි. විතර්කාදි ධ්‍යානාඞ්ග පහලවූ තැන් සිට ඉදිරියට කරගෙන යනු ලබන භාවනා අර්පණා නම්.

2. ත්‍රිවිධ නිමිත්ත: පරිකර්ම, උද්ග්‍රහ, ප්‍රතිභාග යනුයි. දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ දැනීමෙන් හෝ සිතට ගැනීමට උත්සාහ කරන අරමුණු පරිකර්ම නිමිති නම්. සිතට ගත් පසු සිහෙහි පවතිනුයේ උද්ග්‍රහ නිමිත්තය. ඉක්බිති ඒ උද්ග්‍රහ නිමිත්තයෙන් නැගී ආ, හැම අයුරින් ම පැහැදිලි අරමුණු ප්‍රතිභාග නිමිති නම්.

මෙසේ තෙවැදෑරුම් භාවනා සහ තෙවැදෑරුම් නිමිති කර්මස්ථාන පිළිබඳ කරනු ලබන වින්‍යාසයේදී බෙදීමේදී-අතිශයින්ම උපකාර සඳහා පවතී.

“යං වුත්තං චත්තාලීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වා ති එත්ථ සංඛ්‍යාත නිද්දෙසතො උපචාරප්පණාවහතො ඣානප්පභෙදතො සමතික්කමතො වඩ්ඪනාවඩ්ඪනතො ආරම්මණතො භූමිතො ගහණතො පච්චයතො චරියානුකූලතො ඉමෙහි තාව දසහි ආකාරෙහි කම්මට්ඨාන විනිච්ඡයො වෙදිතබ්බො - විශුද්ධිමග්ග 81 පි.

සතලිස් කර්මස්ථාන අතුරෙන් එක් කමටහනක් ගෙනයැයි යමක් කියන ලදී ද එහි සංඛ්‍යා නිර්දේශාදී වශයෙන් පළමුකොට මේ දස අයුරින් කර්මස්ථාන විසඳීම දතයුතුය.

## දස ආකාර කර්මස්ථාන විනිශ්චය

i සංඛ්‍යා නිර්දේශ වශයෙන්: මෙතෙක් කර්මස්ථානයැයි දක්වීමය. මෙය ඉහතින් බෙදා දැක්වූ සමසතළිස් කර්මස්ථාන යි.

ii උපචාරඅර්පණාවහ වශයෙන්; බුද්ධ-ධම්ම-සංඝ-සීල-දේවතා-චාග-මරණ-උපසම යන අනුස්සති භාවනා අට හා ආහාරෙ පටික්කූලෙ සඤ්ඤා, චතුධාතු වවත්ථාන, යන දසය උපචාර- සමාධිය පමණක් ලැබෙන කර්මස්ථානයෝයි. සෙස්ස අර්පණා සමාධි ලැබෙන ඒවායි.

iii ධ්‍යාන ප්‍රභේද වශයෙන්! කායගතාසතිය සමඟ දස අසුභ, ප්‍රථම ධ්‍යානය පමණක් ලබාදෙයි. ආනාපාන සතිය සමඟ දස කසිණ චතුර්ථ ධ්‍යානය තෙක් හමත් කරයි. මෙත්තා, කරුණා, මුදිතා මේ බ්‍රහ්මවිහාර තුන වැඩීමෙන් තෘතීය ධ්‍යානව ඉපදවිය හැක. බ්‍රහ්මවිහාර වඩා ධ්‍යාන ඉපදවූ පසු උපෙක්ඛා බ්‍රහ්ම

විහාරය වැඩීමෙන් ද, කසිණ වඩා ධ්‍යාන ලැබූ පසු සතර ආරූප්‍ය වැඩීමෙන්දැයි යන ක්‍රම පහෙත්ම චතුර්ථධ්‍යාන තත්වය ඉපදවිය හැක. (ප්‍රථම ධ්‍යානයෙහිවූ විතර්ක, විචාර, දෙදෙනා අවස්ථා දෙකකදී යටපත් කළහොත් පඤ්චම ධ්‍යානයක් එයි.)

iv ඉක්මවීම් වශයෙන්; අඞ්ග, ආරම්මණයැයි ඉක්මවීම් දෙකකි. ධ්‍යාන තුනක් හෝ සතරක් හෝ ඉපදවීමට හැකි සියලු කර්මස්ථාන අඞ්ග ඉක්මවන ඒවාය. (අඞ්ගසමතික්‍රමණයෝයි) විතර්කාදි ධ්‍යානාඞ්ග ඉක්මවා ලැබිය යුත්තෝයි. එහෙයිනි. සතර ආරූප්‍ය කර්මස්ථාන ආරම්මණ සමතික්‍රමණය වෙයි. ආලෝක කසිණය හැර, ඉතිරි කසිණාරම්මණ නවය ද, ඒ ඒ ආරූප්‍ය සිතට අරමුණු වූ අරමුණු ද, ඉක්මවන නිසාය. උපෙක්ඛා බ්‍රහ්ම විහාරය අඞ්ග ඉක්මවන කර්මස්ථානයෙකි එහිදී ඉක්මවනුයේ සතුටු ස්වභාවයයි. සෙසු කර්මස්ථානයන්හි ඉක්මවිය යුත්තක් නොමැති.

v වැඩීම් නොවැඩීම් වශයෙන්; වැඩීම් යනුවෙන් මෙහිදී සලකා ගත යුත්තේ අරමුණ තමා වටා පැතිරවීමයි. එහෙයින් එසේ කළ හැක්කේ දස කසිණයන්ගෙන් පමණි, කසිණාරම්මණය තමා සතුටු ප්‍රමාණය දක්වා වැඩිය හැක. ඒ වැඩීම නිසාමයි දිව්‍ය-කණ, දිවැස, පරසිත් දන්නා නුවණ. යන නුවණ තුනෙන් ඇසීම, දැකීම, අන් සිත දැකීම, සිදුකිරීමට හැකිවනුයේ.

vi අරමුණු වශයෙන්, දස කසිණ, දස අසුභ, ආනාපාන සති, කායගතාසති යන මේ භාවනා දෙවිස්ස ප්‍රතිභාග නිමිත්ත අරමුණ වශයෙන් පවතී. සෙසු භාවනාවන්හි මෙය නූපදී. අනුස්සති භාවනා දසය අතුරෙන් ආනාපාන සති හා කායගතා සති හැර ඉතිරි අට ද, ආහාරෙ පටික්කූලෙ සඤ්ඤා, ධාතු කර්මස්ථාන, විඤ්ඤාණඤ්චායතන නෙවසඤ්ඤා නාසඤ්ඤායතන යන භාවනා දෙළොස ස්වභාවධර්මයන්-පවතිනදෑ-අරමුණු පිණිස පවතී, ප්‍රතිභාග නිමිත්ත උපදින භාවනා දෙවිස්ස නිමිත්ත-ලකුණු-අරමුණුකොට පවතී. තවද විපුබ්බක, ලෝහිතක, පුළුවක, යන අසුභ භාවනා තුන සහ ආනාපානසතියද, ආපෝ - තේජෝ-වායෝ-ආලෝක යන කසිණ සතරද, සෙල වෙන අරමුණු වශයෙන් පවතී. එහෙත් ප්‍රතිභාග නිමිත්ත නිශ්චලයි.නොසෙලවෙයි.

vii භූමි වශයෙන්; දස අසුභ ආහාරෙ පටික්කූලසඤ්ඤා, කායගතාසති, මේ දෙළොස දෙව්ලොව නැත. බ්‍රහ්මලෝකයෙහි ඒ දෙළොස හා ආනාපානසතිය ද නො පවතියි අරූපලෝකයෙහි ඇත්තේ සතර ආරූප්‍ය පමණි. මිනිස් ලොව සියල්ල පවතියි.

viii ගැනීම් වශයෙන්; අරමුණු ගැනීමේ ක්‍රම තුනෙකි. දිට්ඨ-දැකීමෙන්, මුට්ඨ හැප්පීමෙන්, සුත-ඇසීමෙන් යනුයි. වායෝ කසිණය හැර ඉතිරි කසිණ නවය ද දස, අසුභ ද, යන දහනවය දැකීමෙන් අරමුණු ගතයුතුය. කායගතා සතියෙහි තචපඤ්චකය ද දැකීමෙන් ගතයුතු ඉතිරි කුණප ඇසීමෙන් ගතයුතුය. ආනාපාන සති අරමුණ ගතයුත්තේ හැප්පීමෙනි. වායෝ කසිණය හැප්පීමෙන් හා දැකීමෙන් ගතයුතුය. ඉතිරි භාවනා අටලොස ඇසීමෙනි. උපෙක්ඛා බ්‍රහ්මවිහාර හා සතර ආරූප්‍ය මේ පස ආරම්භයේ දී - පටන් ගැනීමේදී- නොගතයුතුය.

ix හේතුවීම් වශයෙන්; ආකාශ කසිණය හැර ඉතිරි කසිණ නවය, සතර ආරූප්‍යයනට හේතුයි. අභිඥා ඉපදවීමට කසිණ දසයම හේතුවේ. මෙත්තාදී බ්‍රහ්මවිහාර තුන, උපෙක්ඛා බ්‍රහ්ම විහාරයට ප්‍රත්‍යවේ. යට යට ආරූප්‍ය භාවනා මතු මතු ආරූප්‍යයනට උපකාරයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නිරෝධසමාපත්තියට, හේතුවේ. හැම භාවනාවකින්ම ගනු ලබන චිත්ත විවේකය විදර්ශනාවට උපකාර පිණිස පවතී.

x. චරිතානුකූල වශයෙන්; රාග චරිතයාට ඉතා සුදුසු වන්නේ දස අසුභ හා කායගතාසතියත්ය. ද්වේෂ චරිතයාට බ්‍රහ්මවිහාර සතර හා වර්ණ කසිණවූ නීල, පීත, ලෝහිත, ඕදාත සතරය. ආනාපාන සති කම්ස්ථානය මෝහ චරිතයාට හා විතර්ක චරිතයාට ද සුදුසුය. බුද්ධානුස්සති ආදී අනුස්සති සය ශ්‍රද්ධා චරිතයා සඳහායි. බුද්ධි චරිතයාට සුදුසුවන්නේ මරණ සති, උපසමානුස්සති, චතුධාතු වවත්ථාන, ආහාරෙ පටික්කූල සඤ්ඤා යන සතරය. සෙසු කසිණ භාවනා සහ සතර ආරූප්‍ය සියලු චරිතයන්ට සුදුසුය. එහෙත් විතර්ක චරිතයා කසිණ අරමුණ ගතයුත්තේ. කුඩා වශයෙනි.

කම්ස්ථාන සතළිස අතුරෙන් දස කසිණ, කායගතාසතිය, ආනාපානසතිය, ඣානුස්සතිය, ආහාරෙ පටික්කූලසඤ්ඤා, චතු ධාතු වවත්ථාන යන කම්ස්ථාන විස්ස සුතමය ඥාණ විස්තරයේදී දැක්විණ. සෙසු විසි කම්ස්ථාන පිළිබඳ හැඳින්වීමක් මෙතැන් සිට දැක්වෙයි.

අසුභ දසය, මරණසතිය, උපසමානුස්සතිය, බ්‍රහ්මවිහාර සතර, ආරූප්‍ය සතර, මේ ඒ විස්සය.

## දස අසුභ

i උද්ධුමාතක අසුභය; ඉදිමුණු මළසිරුරට මේ නමකි. "භස්තා විය වායුනා උද්ධං ජීවිතපරියාදානා යථානුක්කමං සමුග්ගතෙන සූනභාවෙන උද්ධුමාතත්තා උද්ධුමාතං" හුළං පිරුණු මයිනහමක්සේ මරණින් පසු පිළිවෙලින් නැගුනා වූ ඉදිමීම් සවභාවයකින් යුක්තවූ බැවින් "උද්ධුමාත" නම් "උද්ධුමාතමෙව උද්ධුමාතකං" උද්ධුමාතයම උද්ධුමාතකයි. (ස්වාර්ථයෙහි "ක" ප්‍රත්‍යයයි) නැතහොත් ඉදීම නිසා පිළිකුල් සවභාවයට පැමුණුනේ උද්ධුමාතකයි. (කුච්ඡිතාර්ථයෙහි "ක" ප්‍රත්‍යයයි)

ii විනීලක අසුභය: නානා වර්ණයට පැමුණුනු මළ සිරුර "විනීලං වුච්චති විපරිභින්නවණ්ණං" මිශ්‍ර වූ වර්ණ ඇත්තේ විනීල යැයි කියනු ලැබේ එයම විනීලකයි නැතහොත් නොයෙක් පාට නිසා පිළිකුල් බවට පත් වූයේ විනීලකයි මෙම මළ සිරුර මස් වැඩි තැන් රතුය. සැරව ඇති තැන් සුදුය. සමෙන් වැසුන නිසා බොහෝතැන් නිල් පැහැයයි. මෙබඳු මළ සිරුර විනීලක අසුභයයි.

iii විපුබ්බක අසුභය ; සැරවගලන මළසිරුර "පරිභින්නට්ඨානෙසු විස්සන්දමානපුබ්බං විපුබ්බං, විපුබ්බමෙව විපුබ්බකං" බිඳී ගිය තන්හි වැගිරෙන්නාවූ සැරව ඇත්තේනුයි විපුබ්බනම්. එයම විපුබ්බකයැ නැතහොත් සැරව ගලන හෙයින් පිළිකුල්වූයේනුයි විපුබ්බක නම්.

iv විච්ඡිද්දක අසුභය: කැබලි දෙකකට වෙන්වූ මළ සිරුර "විච්ඡිද්දං වුච්චති ද්වෙධා ඡින්නෙන අපධාරිතං" දෙකඩ කොට සිඳීමෙන් වෙන්වූයේ විච්ඡිද්දයැයි කියනු ලැබේ. විච්ඡි විච්ඡිද්දකය නැතහොත් වෙන්වීම නිසා පිළිකුල් වූයේ විච්ඡිද්දක නම්. (මෙය වඩන්නහු විසින් නො ගැවෙන සේ ලී කැබෙල්ලකින් ලංකර ගත යුතුයැ)

v වික්ඛායිතක අසුභය; හිවල් ආදී සතුන් විසින් කනු ලැබූ මළ සිරුර "ඉතො ච එතො ච විවිධාකාරෙන සොණසිඟාලාදීහි ඛායිතන්ති වික්ඛායිතං" එහෙත් මෙහෙත් නොයෙක් අයුරින් බලු-සිවල් ආදීන් විසින් කන ලද්දේනුයි වික්ඛායිත නම්. එයම වික්ඛායිතකයි. නැතහොත් ඔවුන් කෑ නිසා පිළිකුල් වූයේ වික්ඛායිතකයැ.

vi විකඛිත්තක අසුභය; බලු-කපුටන් විසින් එහෙ මෙහෙ විසුරුවා දැමූ මළ සිරුරු කැලිය. "විවිධං ඛිත්තං විකඛිත්තං" නොයෙක් අයුරින් දමන ලද්දේ විකඛිත්ත නම්. එයම විකඛිත්තකයි. විසිරුණු නිසා පිළිකුල් බවට පත් වූයේ විකඛිත්තකයා. (මේ අශුභය ද ලී කැබැල්ලකින් ඒ ඒ කැබලි ලංකොට මළ සිරුර ලෙස සකස්කරගත යුතුය. අතින් නොඇල්ලිය යුතු එසේම සම්බන්ධ කිරීමද නො මැනවී.)

vii හතවිකඛිත්තක අශුභය; සතුරන් විසින් හෝ වධක යන් විසින් හෝ ආයුධයෙන් කපා එහෙ මෙහෙ වැටෙන සේ දැමූ මළ සිරුරේ කැබලිය, "හතඤ්ච පුරිම නයෙන විකඛිත්තංචාති හතවිකඛිත්තං" කසන ලද්දේ ද, එය පෙරසේ ම දමන ලද්දේ ද හතවිකඛිත්ත යි. හතවිකඛිත්තක ද එය මැයි. නැතහොත් පිළිකුල් වූ ඒ සිරු කැබලි හතවිකඛිත්තක අසුභය යි. (මෙය ද පෙරසේම ලංකර ගතයුතු)

viii ලොහිතක අසුභය; ලේ ගලන මළ සිරුර "ලොහිතං කිරති, වික්ඛිපති ඉතොචිතොච පග්ඝරතීති ලොහිතකං" එහෙත් මෙහෙත් ලේ වැගිරෙනුයේ ලෝහිතක නම්. ලේ ගැලීම නිසා පිළිකුල්වූයේ ලෝහිතකයයි යනු අතික් තේරුමයි.

ix පුලවක අසුභය; පණු කැලත්ගෙන් ගැවසුන මළ සිරුර "පුලවා වුච්චන්ති කිමයො පුලවෙ කිරතීති පුලවකං" පුලවා නම් පණුවෝ කියයි යනු ලැබේ. ඒ පණුවන් වූ පුලවයන් විසිරේනුයි පුලවක නම්. නැතහොත් පණුවන්ගේ ගැවසීම නිසා පිළිකුල් වූයේනුයි පුලවක නම්.

x අට්ඨික අසුභය; ඇට සැකිල්ල වූ මළ සිරුර. "අට්ඨියෙව අට්ඨිකං" ඇට ම අට්ඨික නම්.

මේ දස අසුභයන්ගෙන්ගනු ලැබූ නිමිත්ද, ධ්‍යාන ද, ඒ ඒ නාමයන්ගෙන් ම ව්‍යවහාරිතයි.

## අසුභ භාවනා වැඩිය යුතු ක්‍රමය

අසුභ භාවනා ක්‍රමය ඉතා දුෂ්කරය සියලු භාවනා අතුරෙන් මෙතරම් දුෂ්කර භාවනා ක්‍රමයක් නැති වර්තමාන කාලයේදී අසුභ සොයා ගැනීමට අපහසුය. එදා මළ සිරුරු දැමීම, වැලලීම දෙක ඉතා කලාතුරකින් සිදුවූවකි. බොහෝ සෙයින් ම සිදුවූයේ සොහොනට ගෙනගොස් දැමීම පමණි. එහෙයින් එදා භාවනායෝ

ඕන්ට අසුභ සොයාගැනීමට හැකිවිය. අද ඒ සිරිත නොමැති හෙයින් අසුභ භාවනා කරන්නවුන් ද තුනී විය. එසේ වුවත් අසුභ භාවනා ක්‍රමය දැනගැනීම යෙහෙකි. සසර කලකිරීම සඳහා ම පවතී.

අසුභ වඩනු කැමැත්තහු විසින් කර්මස්ථාන දෙන කල්‍යාණ මිත්‍රයෙකු වෙත එළඹ, පෙර සඳහන් සියලු වත් පිළිවෙත් ඉටු කර භාවනා ක්‍රමය අසාගතයුතු. කල්‍යාණ මිත්‍රයා විසිනුදු ධ්‍යාන ලැබෙන තෙක් භාවනා විධි සියල්ල කිවයුතුය. ඒ භාවනා පිළිවෙල කෙටියෙන් මෙසේ දතයුතු.

නිශ්ශබ්දවිවේක සෙනසුනක වෙසෙමින් අසුභයක් ගැන හාත්පස විමසිය යුතු. ඉදින් අසුභයක් හමුවීනම් වේලාසනම ගොස් එතැනට යන එන ගමන් මාර්ගය හා අවට ඇති ගස්, වැල්, හුඹස් ආදී හැම ලකුණක් ම සිහිතබා ගතයුතු. අසුභය අවට ඇති සියලු ලකුණු ද, අසුභය ඇති දිසාව ද, විමසිය යුතු. ඉක්බිති ඒ අසුභ ය ස්ත්‍රියකගේ ද පුරුෂයෙකුගේදැයි විමසා ස්ත්‍රියක ගේ නම් අත්හල යුතු. මක්නිසා ද? මළ සිරුරෙහි වුව ද පුරුෂයාට රාගය හටගනියි. එහෙයිනි.

මෙසේ විමසා ඒ හැම ලකුණක්ම සිත තබාගෙන ආපසු එන කල්හි ද පෙර සේම ම මාර්ග දෙස ලකුණු තබාගත යුතු. ඉක්බිති සෙනසුනෙහි සඞ්ඝ ස්ථවිරයන් වහන්සේට දැනුම් දී, අමනුෂ්‍යයන්ට ප්‍රිය වූ මස්, පිටි කෑම ආදිය නො වළඳ, සිතෙහි නොපසුබට උත්සාහයකින් යුතුව හුදකලාව – තනියම – මධ්‍යම රාත්‍රියේදී ගමන ඇරඹිය යුතු (සොසානික ධුතාඞ්ගය බලන්න) එසේ යන කල්හි බිය ජනක කරුණු ඇතිවුවත් ඒ ගැන නොසලකා (වේලාසනම ගමන් මාර්ගය බලූ නිසා බිය විය යුතු නැත.) අසුභය ඇති දිසාවට ම පා නැගිය යුතු. ඇතැම්විට අමනුෂ්‍යයින් ගේ කෑගැසීම් ආදිය ඇසෙන්නට පුළුවන එහෙත් ඔවුනට හිංසා නො කළ යුතු මෙසේ නොබියව හොත් උඩු සුළං ඇති පෙදෙසේ හෝ යට සුළං ඇති පෙදෙසේ හෝ නොසිට ඒ අතර, අසුභයට ඉතා ලංවත්තේත් නැතිව දුරිනුත් නොසිට, උස් හෝ පහත් හෝ තැන් ද අත්හැර සමතැනක වාඩිවී එකොළොස් ආකාරයකින් නිමිත්ත-අරමුණ ගතයුතු.

i වණ්ණතො: වර්ණ වශයෙන් කළු කෙනෙකුගේ සුදු කෙනෙකුගේදැයි පාට වශයෙන් මෙනෙහි කළයුතු.

ii **ලිඞ්ගතො:** ස්ත්‍රී පුරුෂ වශයෙන් නො මැතිව බාල, තරුණ, මහළු වයස්හි පිහිටියහුගේ මළ සිරුරක් යැයි සිත තබාගත යුතු. ව්‍යවස්ථා කටයුතු.

iii **සණ්ඨානතො:** සටහන් වශයෙන්; අත, පය, හිස, කණ මූබය, නාභිය ආදී වශයෙන් බලා සටහන් තබාගත යුතු.

iv **දිසතො:** දිසා - පැති වශයෙන්; සිරුරෙහි දිසා දෙකකි. නාභියෙන් යට යට දිසාවයි. උඩ උඩ දිසාවයි. එසේ නැතහොත් තමා සිටින පැත්ත හා අසුභය ඇති පැත්ත වෙන්කර බැලිය යුතු.

v **ඔකාසතො:** අවකාශ - ඉඩ - ඇති තැන් වශයෙන්, "මෙ සිරුරෙහි මේ ඉඩ ඇති තැන අත, මෙතැන පය" මේ ආදී වශයෙන් ඉඩ ඇති තැන් විමසිය යුතු.

vi **පරිච්ඡෙදතො:** "මේ සිරුර යට දිසාවෙන් පතුලින් ද උඩ දිසාවෙන් කෙස් වලින් ද හාත්පස සමින් ද වට වී කුණප දෙතිසකින් යුක්ත වූයේය" යි පරිච්ඡෙද වශයෙන් විමසිය යුතු

vii **සන්ධිතො:** සන්ධි වශයෙන්; සිරුරෙහි සන්ධි එක්සිය අසූවෙකි. ඉදිමී, කුණුවී, ගිය ශරීරයන්හි එතෙක් සන්ධි විමසීමට නො හැකිය. එහෙත් ඉහටිය, අත්හි ඇති උරහිස් සන්ධි, වැලමිටි සන්ධි, මණිබන්ධ සන්ධි, පාවල ඇති කටි සන්ධි, දණහිස් සන්ධි, බොලට සන්ධි, යන මෙතෙක් සන්ධි ප්‍රකටය. ඒ වශයෙන් ව්‍යවස්ථාපනය - විමසීම - කළ යුතු.

viii **විවරතො:** හිස් තැන් වශයෙන්, අත්වලටත්, කඳටත් අතර, පා' දෙක අතර, හිසටත් කඳටත් අතර, (බෙල්ල වටේ) මේ ආදිය විමසිය යුතු.

ix **නින්නතො:** පහත් තැන් වශයෙන්; කන් සිදුරු, නාස් සිදුරු මූබය, නාභිය, කුස, කඳ දෙපැත්ත, මේ ආදී පහත් තැන් විමසිය යුතු.

x **ථලතො:** පිරුණු තැන් වශයෙන්; නළල, පපු පෙදෙස, කුස, අත් - පා සන්ධි අතර, මේ ආදිය විමසිය

xi **සමන්තතො:** සිරුර හාත්පසම විමසිය යුතු. වරක් සිරුරෙහි උඩ දිසාව ද, වරක් යට දිසාව ද, තවත් වරක් කඳ දිසාව ද, මෙසේ හැම තැනම ඇස් දල්වමින් පියවමින් විමසිය යුතු.

මෙසේ එකොළොස් අයුරින් බලමින් අසුභයෙහි නාමය සිහියේ තබාගෙන "උද්ධුමාතකං උද්ධුමාතකං" යනාදි වශයෙන් පරිකර්ම භාවනා කළ යුතු.

ඉක්බිති පරිකර්ම භාවනාවෙන් ගත් උග්ගහ නිමිත්ත සිත තබාගෙන පෙර කී සේ මාර්ගී සලකුණු සලකා ආපසු පැමිණිය යුතු. එසේ අවුත් පහසු තැනක හිඳිමින් උග්ගහ නිමිත්ත පරිකර්ම වශයෙන් වැඩිය යුතු. උග්ගහ නිමිත්ත අහෝසි - නැතිවී ගියේ නම් අසුභය දක්නට ගිය මාර්ගය මුල පටන්ම නැවත සිහි කොට, අර මුණගත් පිළිවෙල කල්පනා කළ යුතු. එවිට නැවත වැටහේ. මෙසේ වඩත්ම උග්ගහ නිමිත්තට වඩා හාත්පසින්ම පැහැදිලි ප්‍රතිභාග නිමිත්ත උපදියි. උද්ධුමාතක අසුභයෙහි නම් ප්‍රතිභාග නිමිත්ත වැටහෙනුයේ කුස පුරා ආහාර අනුභව කොට නිදාගත් මහත් මිනිසෙකු පරිදිය. ප්‍රතිභාග නිමිත්ත වැඩූ කල්හි ක්‍රමානුකූලව උපචාර, අර්පණා ධ්‍යාන උපදියි. විදර්ශනාවට ද එය පාදක කර ගත හැක. මේ අසුභ භාවනා ක්‍රමය ඉතා සංක්ෂේපයෙනි.

## මරණ සති භාවනා

"මරණ" යනු එක් භවයෙක්හි පවත්නා ජීවත්වීමේ ශක්තිය වූ ජීවිතින්ද්‍රිය විනාශ වීමයි. සසර වසන සියලු සත්වයාට මේ මරණය සාධාරණය. ඔවුහු සියලු දෙන එක් ආත්මයෙක සීමා සහිත කාලයක් ජීවත් වී මරණයට පැමිණෙත්. වදාළේ මැයි:- සබ්බෙ සත්තා මහාරාජ මරණ ධම්මාමරණපරියොසානා මරණං අනතීතා', - සං නි. මහරජ, සියලු සත්වයෝ මරණය ස්වභාවය කොට ඇත්තෝය. මරණය කෙළවර කොට ඇත්තෝය. මරණය නො ඉක්ම වූවෝ ය.

මරණය තෙවැදෑරුම් ය. ඛණික මරණය, සම්මුති මරණය, සමුච්ඡේද මරණය, යනුයි මොහොතක් පාසා සිදුවන නාම - රූප ධර්මයන්ගේ විනාශය ඛණික මරණයයි. නාම ධර්මයන් පවතිනුයේ එක් චිත්තක්ෂණයෙකි "උප්පාදඨිති භඞ්ගවසෙන ඛණත්තයං එකචිත්තක්ඛණං නාම" යනුවෙන් සඳහන් පරිදි එක් චිත්තක්ෂණය නම් ඉපදීම, පැවතීම, විනාශය, යන කුඩා මොහොතවල් තුනයි. මෙසේ නාම ධර්ම චිත්තක්ෂණයක් පාසා විනාශ වෙයි. රූප ධර්මයන් පවතිනුයේ චිත්තක්ෂණ සතළොසකි. (දහසයි) 'තානි පන සත්තරස චිත්තක්ඛණානි රූප ධම්මානමායු" මෙසේ නාමරූප ධර්මයන්ගේ ක්ෂණික විනාශය

ඛණික මරණයයි. "ගස මළේ ය, අසවලා මළේය" යනාදිය සම්මුති මරණයයි. රහතන් වහන්සේගේ මරණය සමුච්ඡේද නම්. නැවත නූපදින හෙයිනි.

තවද මරණය දෙවැදෑරුම් ය. කාල මරණය, අකාල මරණය, යනුයි. කාල මරණය දෙපරිදි ය. ආයුක්ඛය මරණය, පුණ්‍යක්ඛය මරණය යනුයි. මිනිසාගේ නියම ආයුෂ ගෙවා මරණයට පත් වීම ආයුක්ඛය මරණයයි. පින් අවසන්වීම නිසා සිදුවන මරණය පුණ්‍යක්ඛය මරණ නම්. හදිසියෙන් සිදුවනුයේ අකාල මරණයයි

මරණය ගැන නිතර නිතර සිහි කිරීම මරණ සති නම්. මරණස්ස සරණං මරණසති" මරණයාගේ සිහි කිරීම මරණ සතියයි. මරණානුස්මෘතිය වඩනු කැමැත්තහු විසින් යට කී නයින් සීලයෙහි පිහිටා, විවේකස්ථානයක හිඳ, මෙසේ සිහි කළ යුතු. "අද්ධුවං ජීවිතං ධුවං මරණං, අවස්සං මයා මරිතබ්බං, මරණ පරියොසානං මේ ජීවිතං, ජීවිතමේව අනියතං මරණං නියතං'' ධ. ප. අ. 530. ජීවිතය අස්ථිරය, මරණය ස්ථිරය, ඒකාන්තයෙන් සිදු වන්නේය. මා විසින් ඒකාන්තයෙන් මළ යුතුය. මගේ ජීවිතය මරණය කෙළවර කොට ඇත්තකි. අනියත වන්නේ ජීවිතය මැයි. මරණය නියතයි. එය සිදුවනම කරුණකි.

සති - සිහිය, සංවෙග - කලකිරීම; ඤාණ - නුවණ මේ ධර්ම මත පිහිටා සිටයැ මරණානුස්මෘතිය වැඩිය යුත්තේ. එසේ නොමැති නම් මා - පිය මරණයන්හිදී ශෝකය හට ගනී. සතුරෙකුගේ මරණයකදී සතුට උපදී. සාමාන්‍ය මරණයකදී සංවෙගය නූපදී. තමාගේ ම මරණය සිහි කළහොත් තැති ගැනීම ඇති වෙයි. මෙසේ හෙයින් සති, සංවෙග, ඤාණ, උපදවා යෝනිසෝ මනසිකාරය, බහුලව පවත්වමින් ඒ ඒ තැන දුටු, ඇසූ, මරණ ගැන සිහිකොට, එපරිද්දෙන්ම මාගේ මරණය වන්නේ යයි වැඩිය යුතු. "අත්තූපමාය සම්පස්සං භාවයෙ මරණස්සතිං." අනුන් උපමා කොට බලමින් මරණ සතිය වඩන්නේය යනු න්‍යායයි. මෙසේ සිහි නුවණ යොදවා මරණ සතිය වඩන්නා නීවරණ ධර්ම යටපත්වී මරණ සති පිහිටා සිත උපචාර සමාධියට බැසගන්නේ ය.

යමෙකුට නීවරණ ධර්ම යටපත් නොවෙයි නම් ඔහු විසින් අට ආකාරයකින් මරණය ගැන සිහි කළ යුතු. "වධකපච්චුපට්ඨාන තො, සම්පත්තිවිපත්තිතො, උපසංහරණතො, කාය බහුසාධාරණතො, ආයුදුබ්බලතො අනිමිත්තතො ආයුපරිච්ඡේදතො, ඛණපරිත්තතො, ති ඉමෙහි අට්ඨහාකාරෙහි මරණං අනුස්සරිතබ්බං" වි. ම.

වධකයකු සේ වැටහීමෙන්, සම්පත් නැතිවී යාම වශයෙන්, එලවා බැලීම් වශයෙන්, ශරීරය බොහෝ දෙනාකුට අයිති බව වශයෙන්, ආයුෂයාගේ දුබ්ල බව වශයෙන්, ලකුණු නොතැබීම් වශයෙන්, ආයුෂයාගේ සීමාව දැකීම් වශයෙන්, වහ වහා සිදුවීම් වශයෙන්, යනු ඒ අටාකාරයයි.

## 1. වධකයකුසේ වැටහීමෙන් මරණය සිහි කළයුතු අයුරු

මරණය නම් ඉපදුන දා සිටම පසුපස එන්නකි. රජුගේ නියමය පරිදි සොරා පසු පස එන වධකයෙකු මෙනි. ඒ වධකයා කොයි මොහොතේදී තමාගේ හිස සිඳීදැයි සොරා ඒ ගැන නිතරම සිතයි. එසේම උත්පත්තියේ සිටම එන්නා වූ මරණයද කොයි මොහොතේදී සිදුවේදැයි සිතිය යුතු. තවද භූමියෙන් මතු වන නයි පෙණයක් බඳු හතු වර්ග, පොළොවෙන් මතුවන විටම නැවතත් පොළොවටම පතිත - වැටෙන - වන බව හඟවන්නා සේ පස් සුණක් - පිඩක් - මුදුනෙහි ඇතිව මතුවෙයි. එපරිදිම සත්වයාද එක් භවයෙක ඉපිදීමේදී ඒ සමගම මරණය ද ඇර ගෙන එයි. එසේම උදා වූ හිරුගේ ස්වභාවය අවර දිග් බලාම ගමන් කිරීමය. එමෙන් සත්වයාගේ ස්වභාවය ද මරණාභිමුඛව - මරණය දෙසට මුහුණ ලා - ගමන් කිරීමයි. මෙසේ උපන්නා වූ මා විසින් ද "මරණය නමැති වධකයා, කර්මය නමැති රජුගේ විධානය - නියමය - පරිදි මා පසු පස හිස ගසා දැමීමට එන්නේ ය"යි වධකයෙකු එන පරිද්දෙන් මරණය ගැන සිහිකළ යුතු.

## 2. සම්පත් නැතිවී යාම් වශයෙන්:

සම්පත් නම් දීර්ඝායුෂ, නිරෝගිකම, යෞවන බව, පරිවාර-ඥාති මිත්‍රාදී බොහෝ දෙනා -, ධනය ඇස් - කණ් - නාසාදි ඉඳුරන්; ශරීර වර්ණය, මේ ආදියයි. මේ සියල්ල තමාට යහපත් ලෙස වැටහෙනුයේ විපත්තියක් - බාධක කරුණක් - පැමිණෙන තෙක් පමණි. එබන්දක් පැමිණුන වහාම බියටත් ශෝකයටත් පැමිණේ. ලැබුණා වූ සම්පත්තීන්ගේ ස්වභාවය ද විනාශවී යාමය. ඒ එසේ මැයි 'සබ්බං ආරෝග්‍යං ව්‍යාධි පරියෝසානං, සබ්බං යොබ්බනං ජරාපරියෝසානං, සබ්බං ජීවිතං මරණ පරියෝසානං.' සියලු නිරෝගීකම් ලෙඩවීමෙන් අවසන් වෙයි. සියලු තාරුණ ගති ජරාවට පත්වීමෙන් කෙළවර වෙයි. සියලු ජීවිත මරණයෙන් අහෝසි වෙයි. මෙසේ සම්පත් විපතට පත්වීම් වශයෙන් මරණය ගැන සිහි කළ යුතුය.

### 3. එළවීම් වශයෙන්:

මරණයට පත්වූ අන්‍යයන් සමග තමන්ගේ ජීවිතය එළවා බැලීම් වශයෙන් මරණය සිහි කළ යුතුය. මීට උපසංහරණයැයි සඳහණි. එසේ එළවා බැලිය යුතු ක්‍රම සතකි. කීර්ති, පුණ්‍ය, ශක්ති, ඍද්ධි, ප්‍රඥා, යන මොවුන්ගේ මහත් බව වශයෙන් හා බුදු, පසේ බුදු, උතුමානන් වශයෙනි. ලොවුතුරා බුදුරජාණන් වහන්සේ ගේ පරිනිර්වාණය ගැන ප්‍රථමයෙන් සිහි කළ යුතු. මක්නිසාද? උන්වහන්සේ ඉහත කී සියලු දැයින් මහත් බවම අසමසම බවට පත් වූ හෙයිනි.

"සොපි සො භගවා අසීත්‍යානුබ්‍යඤ්ජනපතිමණ්ඩිත ද්වත්තිංසාකාර මහාපුරිසලක්ඛණ විචිත්‍රරූපකායො සබ්බාකාරපරිසුද්ධ සීලක්ඛන්ධාදි ගුණරතනසමිද්ධ ධම්මකායො යසමහත්ත පුඤ්ඤමහත්ත ථාමමහත්ත ඉද්ධිමහත්ත පඤ්ඤාමහත්තානං පාරඞ්ගතො අසමො අසමසමො අප්පටිපුග්ගලො අරහං සම්මාසම්බුද්ධො, සොපි සලිලවුට්ඨිනිපාතෙන මහා අග්ගික්ඛන්ධො විය මරණ වුට්ඨිනිපාතෙන ඨානසො වූපසන්තො"

– වි. ම. 176 පි.

අනුව්‍යඤ්ජන අසූවකින් යුක්ත වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් ශොභා සම්පන්න රූප ශරීරයක් ද, සියලු ආකාරයෙන් පිරිසිදු ශීල සමූහ ආදී ගුණ නමැති රත්නයන්ගෙන් සමෘද්ධ ධර්ම ශරීරයක් ද, ඇත්තා වූ යසසින්, පුණ්‍යයෙන්, ශක්තියෙන්, ඍද්ධියෙන්, ප්‍රඥායෙන්. අතිමහත් බැවිනි පරතෙරට ගියාවූ අසම වූ අසමසම වූ අප්‍රතිපුද්ගල වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ රාජොත්තමයාණන් වහන්සේ ද ජල බිඳු වැටීමෙන් මහත් ගිනි කඳක් නිවෙන්නාසේ මරණය නමැති ජලය වැටීමෙන් වැඩසිටි තැනින්ම නිවී ගිය සේක, මෙසේ බුදුරජාණන් වහන්සේත් පිරිනිවීමට පත් වූ සේක් නම් මා ගැන කවර කථාද? ඒකාන්තයෙන් මටද මරණය සිදුවන්නේමයයි මරණය සිහිකළ යුතු.

තවද, පසේ බුදුරජාණන් වහන්සේලා, ප්‍රඥාවෙන් අග්‍ර වූ සැරියුත් මහතෙරුන් වහන්සේ ඍද්ධියෙන් අග්‍ර වූ මුගලන් මහරහතන් වහන්සේ, නීරෝගී කමෙන් අග තැන්පත් බක්කුල හිමියෝ, මේ ආදී ගිනි කඳන් සේ බැබලුන උතුමෝ ද මරණයට පත්වූමෝ නම් මා ගැන කවර කථාද? එපමණක්ද?

නැත, දූගී බවට පත්වන තෙක් දත් වැට පැමැත් වූ අනාථ පිණ්ඩික සිටුතුමා, පඤ්චකල්‍යාණයෙන් හා ඇතුන් පස්දෙනෙකුගේ පමණ බලයෙන් යුක්ත වූ විශාඛාවෝ එක් රැයකට කහවණු දහසක් මිල කොට ලැබිය යුතු සිරිමා නමැති ගණිකාවෝ, මේ ආදී බොහෝ දෙනෙක් කොපමණ උසස් අයුරින් ජීවත් වුවත් මරණයට යටත් වූහ. මා ගැන කවර කථා දැ? මෙසේ අනුන් හා සම කොට මරණය සිහිකළ යුතු.

## 4. සිරුර බොහෝ දෙනෙකුට සාධාරණ වශයෙන්:–

මරණානුස්මෘතිය වඩන්නහු තම ශරීරය ගැන මෙසේ බැලිය යුතු. "මේ ශරීරය අසූ කුලයක පණුවන්ට සාධාරණය. ඔවුන් අතුරෙන් සම ඇසුරේ සිටින්නහු සම් කති. මස් ඇසුරේ සිටින්නහු මස් කත්. නහරයන්හි වෙසෙන්නෝ නහර කත්. ඇට ඇතුලේ වෙසෙන්නෝ ඇට කත්. ඇට මිදුලු ඇතුලේ සිටින්නෝ ඇට මිදුලු උරා බොත්. ආමාශයෙහි වෙසෙන්නෝ පළමු පළමු වැටුණු ආහාර ලගිලගියේ ගිලිත්. ඒ සියලු පණුවන්ට ශරීරය සොහොනක් වෙයි. වැසිකිළියක් වෙයි. ගිලන් හලක් වෙයි

තවද, 'ඉධ භික්ඛවෙ භික්ඛු දිවසෙ නික්ඛන්තෙ රත්තියා පණිහිතාය ඉතිපටිසංචික්ඛති, බහුකා ඛො මෙ පච්චයා මරණස්ස, අහි වා මං ඩංසෙය්‍ය, විච්ඡිකො වා මං ඩංසෙය්‍ය, සතපදී වා මං ඩංසෙය්‍ය, තෙන මෙ අස්ස කාලකිරියා, සො මමස්ස අන්තරායො, උපක්ඛලිතස්ස වා පපතෙය්‍යං, හත්තං මෙ භුත්තං ව්‍යාපජ්ජෙය්‍ය, පිත්තං වා මෙ කුප්පෙය්‍ය, සෙම්හං වා මෙ කුප්පෙය්‍ය, සත්ථකාවාමෙ වාතා කුප්පෙය්‍යුං, තෙන මෙ අස්ස කාලකිරියා, සො මමස්ස අන්තරායො"

මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ දිවා ගෙවුනු පසු රාත්‍රියෙහි සිහිය පිහිටුවා ගෙන මෙසේ සලකා බලයි. "මගේ මරණයට බොහෝ හේතු ඇත. සර්පයෙක් හෝ දෂ්ට කරන්නේය. ගෝණුස්සෙක් හෝ දෂ්ට කරන්නේය. පත්තෑ ආදී සතෙක් හෝ දෂ්ටකරන්නේ ය. ඒ නිසා මගේ මරණය වන්නේය. ඒ මගේ අනතුර වන්නේය. ගලක මුලක හෝ දූවටී වැටෙන්නෙමි, මා අනුභව කළ ආහාරය හෝ කිපෙන්නේ ය. පිත හෝ කිපෙන්නේය. සෙම හෝ කිපෙන්නේ ය. ආයුධයකින් පහර දෙන්නාක් මෙන් වැට හෙන ශස්ත්‍රක වාතය හෝ කිපෙන්නේ ය. ඒ නිසා ද මාගේ මරණය වන්නේ ය. ඒ මාගේ අනතුර වන්නේ ය.

මෙසේ බොහෝ දෙනෙකුට මේ සිරුර සාධාරණ වශයෙන් සැලකිය යුතු.

## 5. ආයුෂය දුර්වල වශයෙන්:

සත්වයා ගේ ආයුෂය ඉතා දුර්වලය. ආශ්වාස - ප්‍රශ්වාස යම් මොහොතක නැවතුන හොත් එවිට මළේ නම් වන්නේ ය. නැත හොත් පඨවි ආදී ධාතු කිපීම, ශීත උෂ්ණාදිය සමව නො පැවතීම මේ ආදී කරුණු නිසාද මරණය වන්නේ ය. මෙසේ සත්වයාගේ ආයුෂය දුර්වලයැ යි සලකා මරණය සිහි කළ යුතු.

## 6. ලකුණු නො තැබිය හැකි වශයෙන්:- (අනිමිත්තතො)

ශරීරය පිළිබඳ කරුණු පහක් මෙසේ මෙසේ සිදුවේය යි වේලාසනම ලකුණු නොතැබිය හැකිය. එනම් නියම කල නො හැකිය ජීවිතයෙහි බාල, තරුණ මහළු, යන කෙබඳු කාල සීමා වක මරණයට පත්වන්නේය යි ලකුණු වශයෙන් කිව නො හැක. අසවල් රෝගයෙන් ම මැරේය, උදේ සවස ආදි අසවල් වේලාවේ දී මැරේය, මැරුණු පසු අසවල් තැන මළ සිරුර දමන්නේය, මළ පසු ඒ සත්වයා අසවල් තැන. උපන්නේය, යන කරුණු ද කලින් නො කියහැකි. මෙසේ අනිමිත්තපඤ්චකයෙක් වෙයි.

' ජීවිතං ව්‍යාධිකාලො ච-දෙහනික්ඛපනංගති
පඤ්චෙතෙ ජීවලොකස්මිං-අනිමිත්තා න ඤායරෙ"

## 7. ආයුෂයා ගේ සීමාව සැලකීම වශයෙන් "අද්ධාන පරිච්ඡෙදතො"

මනුෂ්‍යයා ගේ ආයු කාලසීමාව කෙටිය. අවුරුදු අනූවක් හෝ සියයක් හෝ ගෙවා මරණයට පත්වනු යේ කලාතුරකින් කෙනෙකි. "අප්පමායුමනුස්සානං හීලෙය්‍ය නං සුපොරිසො" මනුෂ්‍යයා ගේ ආයුෂය ස්වල්පය. එය නුවණැත්තා හෙලාදක්නේ ය. මෙසේ මිනිසා ගේ ජීවත්වීමේ කාලසීමාව අඩු බව මෙනෙහි කරමින් මරණ සතිය වැඩිය යුතු.

## 8. වහවහා සිදුවීම් වශයෙන්:- "ඛණපරිත්තතො"

"අතීත චිත්තක්ඛණෙ ජීවිත්ථ න ජීවති න ජීවිස්සති, අනාගත චිත්තක්ඛණෙ න ජීවිත්ථ න ජීවති ජීවිස්සති, පච්චුප්පන්න චිත්තක්ඛණෙ න ජීවිත්ථ ජීවති න ජීවිස්සති" අතීත

චිත්තක්ෂණයෙහි ජීවත් විය. ජීවත් නො වෙයි. ජීවත් නො වන්නේය. මෙයින් වර්තමාන, අනාගත, කාලයකට නො පැමිණි බව දක්වේ. අනාගත චිත්තක්ෂණයෙහි ජීවත් නූවේය. ජීවත් නො වෙයි. ජීවත් වන්නේ ය. මෙයින් අතීත, වර්තමාන, කාලයකට නො පැමිණිබව දක්වයි. වර්තමාන චිත්තක්ෂණ යෙහි ජීවත් නූයේ ය. ජීවත් වෙයි. ජීවත් නො වන්නේය මෙයින් අතීත, අනාගත කාලයකට නො පැමිණි බව දක්වෙයි. මෙසේ භූතා සුළු මොහොතක් ජීවත් වන බව සැල කිය යුතු කරන්න රෝදය කරකැවෙන කල්හි පොළොවට අසුවන්නේ නිම්වලල්ලේ සුළු කොට සෙකි. මෙන් එමෙනි.

මෙසේ අට අයුරින් මරණය ගැන සිහි කරන කල්හි නීවරණ ධර්ම යටපත් වී සිත උපචාර සමාධි බවට පත්වෙයි. ස්වභාවධර්මය නිසා ද, සංවේග කටයුතු නිසාද මරණ සතියෙන් අර්පණා නූපදී. උපචාර සමාධියට පත් වූ කල්හි තම කැමැත්ත පරිදි විදර්ශනාව වඩා මාර්ග=ඵල ඉපදවිය හැක.

## උපශමානුස්සති භාවනා.

රාගාදී කෙලෙසුන් ගෙන් සම්පූර්ණයෙන් නිදහස් වී ලබන සැනසුම් සුවය "උපසම" නම්. එනම් නිවන් සුවය යි. ඒ නිවන් සුවය අරමුණු කොට නැවත නැවත සිහිකිරීම උපසමානුස්සති නම්,

බුදුරජාණන් වහන්සේ, ගිරිමානන්ද හිමියන් ගිලන්වූ බව දූත්වූ ආනන්ද හිමියන්ට වදාළ දස සඤ්ඤා අතුරෙන් විරාග සඤ්ඤා, නිරෝධ සඤ්ඤා, දෙක උපසමානුස්සති භාවනාවයි.

### 4. විරාග ස්ඤ්ඤාව.

"ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතොවා රුක්ඛමූල ගතො වා සුඤ්ඤාගාරගතොවා ඉති පටිසංචික්ඛති, එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිබ්බානන්ති, අයං වුච්චතානන්ද විරාග සඤ්ඤා"

ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ අරණ්‍යයකට හෝ වෘක්ෂමූලයකට හෝ ශූන්‍යාගාරයකට හෝ ගියේ මෙසේ සලකා බලයි. "සියලු සංස්කාරයන් සංසිඳීමකට පත්වන, සියලු උපධි-අල්ලා ගැනීම-අත්හැරීමක් ඇති, තෘෂ්ණාව ක්ෂයවූ, කිසිදු තැනක

ඇලීමක් නැති, යම් මේ නිර්වාණයක් වේ ද, එය ඉතා සත්පුත් ය. ඉතා මිහිරිය." කියායි. ආනන්දය, මෙය විරාග සංඥාවයැයි කියනු ලැබේ.

## 2. නිරෝධ සංඥා

"ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉතිපටිසංචික්ඛති, එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො නිරොධො නිබ්බානන්ති. අයං වුච්චතානන්ද නිරොධ සඤ්ඤා" මෙහි අදහස පෙර පරිදියි. වෙනස "කිසිදු ඇලීමක් නැත" යන්න නිවීමක් ඇති කියා යෙදීමයි. (නිරෝධ යන පදයයි)

උපසමානුස්මෘතිය වඩනු කැමතියහු විසින්, බුදුරජාණන් වහන්සේ වදාළ ඉහත සඳහන් විවේක තැන හිඳ නිවණෙහි ගුණ, ශාන්ත-සුන්දර ගති මෙනෙහි කළ යුතුයි. ඒ මෙසේ ය:- නිර්වාණය. සියලු සංස්කාර ධර්මයන් ගෙන් සංසිඳුනු ශාන්ත ධර්මයකි. ඉපදීම, වෙනස් ගතියට පත් වීම, විනාශය, යන පැවතුම් තුන සංස්කාර ධර්මයන්ගේ ස්වභාවය යි. හැටියි. "තීණිමානි භික්ඛවෙ සංඛතස්ස සංඛතලක්ඛණානි, කතමානි තීණි? උප්පාදො පඤ්ඤායති වයො පඤ්ඤායති ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති" -අ. නි. දු. නි. මහණෙනි, හේතු ප්‍රත්‍යයන් ගෙන් හටගත් සංස්කාර ධර්මයන් ගේ ලක්ෂණ ත්‍රයකි. කවර නම් තුනක් ද? ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පැවැත්මෙහි වෙනස් ගතිය පෙනේ" යනුයි.

මෙසේ සංස්කාර ධර්මයන් ගේ විපරිනාම-පෙරළෙන ගති-ය බලා, ඉක්බිති නිර්වාණ ධර්මයෙහි නො පෙරළෙන ගතිය සැලකිය යුතු. එහි ඉපැත්මක් පැවැත්මක් විනාශයක් නො මැත. එය හැම අයුරින් ම ස්ථිර ය සදාකාලික ය. ශාන්තය. සුන්දරය. මේ "සබ්බ සංඛාර සමථ ගුණය යි.

තවද, නිර්වාණ ධර්මය සියලු උපධීන් ගෙන් අස්වූවකි. උපධීහු සිවු වැදෑරුම් වෙත්. කාමූපධි, ඛන්ධූපධි, කිලෙසූපධි, අභිසංඛාරූපධි, යනුයි. රූපාදී පඤ්චකාම වස්තූන් කෙරෙහි ඇල් ම කාමූපධි යි. රූප, වේදනා, සඤ්ඤා, චේතනා චෛතසිකය හැර ඉතිරි සංඛාර, විඤ්ඤාණ, යන මොව්හු ඛන්ධූපධි නම්. ලොභ, දෙස, මොහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ථින, මිද්ධ, යන මොව්හු කිලෙසූපධී යි. කුශලා කුශල චේතනාවෝ අභිසංඛාරූපධි නම්. මෙසේ පත්

වැදෑරුම් වූ සියලු උපධීන් අත්හළ කල්හි ලැබෙන සැනසිලි ගති යකි. නිර්වාණ ධර්මය. "සබ්බූපධිපටිනිස්සග්ගො" සියලු උපධී අත් හැරීම" යන ගුණ පදය නිර්වාණය සඳහා ම දෙසූවකි. එහෙයින් නිර්වාණය ඉතා ශාන්තය, සුන්දර ය.

රූපයන් කෙරෙහි ඇල්ම රූපතණ්හා-ආදී එක්සිය අට වැදෑරුම් වූ තෘෂ්ණාව, සම්පූර්ණයෙන් ගෙවීම් බවට පත්වනුයේ නිර්වාණ ධර්මය අවබෝධ කළ කල්හිය. එතෙක් ඒ තෘෂ්ණාව නොයෙක් නාමයන් ගෙන පෙනී සිට නමා මුලා කෙරේ. කෙලෙස් වැඩිරෙන අවස්ථාවේ දී රාගය, ආශාව, ඇල්ම, ලෝභය, ආදී නාමයන් ගෙන් එයි කුශල භාවනාවකින් යටපත් කිරීමට සූදානම් වූ කල්හි කාමච්ඡන්ද නාමයෙන් එයි. ධ්‍යානයන් ගෙන් එය දුරුකළ විට කාමරාගානුසය, භවරාගානුසය, යන නාමයන් ගෙන් සිත තුළ සැඟවී පවතියි. විදර්ශනා ඥානයට අනුව කෙලෙස් ප්‍රහාණය කරද්දී කාමරාග, රූපරාග, අරූපරාග, යන නාමයන් ගෙන් ඉදිරිපත් වෙයි. ඒ සියලු තෘෂ්ණා වෝ අර්හත් මාර්ගක්ෂණ යේදී ගෙවීම් බවට යෙත්. එහෙයින් නිර්වාණ ධර්මය "තණ්හක්ඛය" නම්.

එසේ ම නිර්වාණය විරාග ධර්මයකි. කිසිදු අයුරකින් අල්ලා ගැනීමක් එහි නැත. ඒ නිසාම "රොධ" සංඛ්‍යාත සංසාර බන්ධනාගාරයෙන් හිරගෙයින් - නිදහස් වූයේ නිරෝධ නම්. සියලු කෙලෙස් ගිනි, නිවුනු හෙයින් ද නිරොධ යි. මෙහෙයින් ශාන්ත නිර්වාණ සුඛය විරාග, නිරොධ, යන විශේෂණ නාමයන් ගෙන් ගුණ ප්‍රකාශ විණි.

තවද, නිර්වාණ යෙහි ඇත්තා වූ ශාන්ත ගතිය විදහා දැක්වීමට බුදුරජාණන් වහන්සේ මෙසේ ද වදාළහ. "යාවතා භික්ඛවෙ ධම්මා සංඛතා වා අසංඛතා වා විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායති, යදිදං මදනිම්මදනො පිපාසවිනයො ආලය සමුග්ඝාතො වට්ටුපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං" මහණෙනි, මදයන් ගෙන් දුරු වූ, පිපාසය විනාශ වූ ඇල්ම මුලිනුපුටා දැමූ, සරකැවීම බිඳ දැමූ, ආශාව ගෙවූනු, ඇල්මෙන් තොර, ගෙවීම් බවට ගිය, යම මේ විරාග ධර්මයක් වේ ද, එය සංඛත වූ ද අසංඛත වූ ද සියලු ධර්මයන්ට මඛා ශ්‍රෙෂ්ඨයැයි කැගෙයි.

ලෝකයේ අසංඛත ධර්ම දෙකකි. අහස හා නිර්වාණය යි. ප්‍රත්‍යයන් ගෙන් හට නොගත් දේ අසංඛතයි. අහස හා නිර්වාණ කිසිදු

ප්‍රත්‍යයකින් නො හටගත් දේ ය. මේ අසංඛත ධාතු දෙකෙන් නිර්වාණය අග්‍රයැයි වදාළ පරිදියි. ඒ මක්නිසාද? අහස හිස් දෙයකි. නිර්වාණ ඇති දෙයකි ශූන්‍යතාවයෙන් වෙන්වූවකි. මේ දේශනායෙහි ආ ගුණයන් අතුරෙන් විස්තර වශයෙන් ඉහත සඳහන් වනුයේ ගුණ සතරක් පමණි. ඒ ගුණ මෙසේ ය. නිර්වාණ ධර්මය මද නිම්මදය. එනම් ජීවිත-ආරෝග්‍ය - යෞවනාදී මත්වන සියලු කරුණු වලින් නිදහස් වූවකි. එසේ ම කොතෙක් පානය කළත් (ලැබුණත්) පිපාසය නො සංසිඳෙන, මහ මුහුදු දිය බඳු රාගය, නිර්වාණයට පැමිණෙත් ම විනාශය වෙයි. දුරුවෙයි. එහෙයින් නිර්වාණය පිපාස විනයයි. සසර සියලු ඇලීම් දුරු කරන හෙයින් "ආලය සමුග්ඝාත" නම්. කාම, රූප, අරූප, යන තෙවැදෑරුම් වෘත්තය කරකැවීම හෝ එසේ කරකැවීමට හේතුවන කර්ම, ක්ලේශ, විපාක, වෘත්ත ත්‍රය හෝ අචිහිර වූ හෙයින් නැවත කරකැවීමට නො හැකි වන සේ විනාශ වූ හෙයින් "වට්ටුපච්ඡේද" නම් වෙයි. මෙසේ ශාන්ත නිර්වාණ සුඛය නොයෙක් අයුරින් බෙදී ගිය ගුණ සමුදායකින් යුක්ත ප්‍රණීත ධර්මයෙකි.

උපසමානුස්මෘති භාවනාව මෙසේ නිතර නිතර දියුණු කිරීමෙන් නීවරණයන් යටපත්ව සිත උපචාර සමාධි බවට පත්වෙයි. ඉතා ගැඹුරු ධර්මයක් නිසා අර්පණා නූපදී. එහෙත් යටපත් කළ නීවරණයන් ඇති හෙයින් ඒ උපචාර සමාධි මත පිහිටා විදර්ශනා වැඩීමෙන් මාර්ග-ඵල ඉපදවිය හැක.

මේ උපසමානුස්සති භාවනාවයි.

## 11 වැනි පරිච්ඡෙදය.

සමාධි භාවනා අතුරෙන් "බ්‍රහමවිහාර" නාමයෙන් දක්වෙන භාවනා සතරෙකි. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යනුයි. ඉතා උසස්වූ හෙයින් ද, බ්‍රහ්මයන් පරිදි සත්ත්වයන් කෙරෙහි පැවතුම් ඇති හෙයින් ද, ඉතා ශ්‍රෙෂ්ඨ උත්තමයා වූ ශාන්ති නායක බුදු රජාණන් වහන්සේ විසින් අවිජහිත - නො අත්හළ-පැවතුම් හෙයින්ද බ්‍රහ්මවිහාර නාමය මේ සතරට යෙදිණ.

## 1. මෙත්තා භාවනා.

තමා සැපයට සැනසීමට කැමැත්තේ යම් සේ ද, තමා අවට වෙසෙන ලොකු කුඩා සියලු සත්ත්වයෝ ද එසේ ම සැපයට සැනසීමට කැමැත්තෝය යි සිතා තමා කෙරෙහි දක්වන හිතවත් කම සියලු සත්ත්වයන් කෙරෙහි ම පැතිරවීම නැතහොත් දක්වීම "මෛත්‍රී-මෙත්තා" නම්. මෛත්‍රියෙහි අයුරු සෙනහ - ආදරය - කිරීමයි. "මෙජ්ජතීති මෙත්තා ස්නිය්හතීති අත්ථො" යම් සවභාවයක් නිසා සිතෙහි ආදරයක් ඇතිවේද ඒ සවභාවය මෛත්‍රී යනු එහි අදහස ය. ඒ ආදරය ගෙහසිත ප්‍රේමය නොව හිතවත් බව යි. තව ද තේරුමකි. "මිත්තෙ වා භවා මිත්තස්ස වා එසා පවත්තතීති මෙත්තා" මිතුරා කෙරෙහි වූයේ හෝ මිතුරා ගේ ම පැවැත්මය යි හෝ මෛත්‍රී නම්. මිතුරා කෙරෙහි දක්වන ආදරය, හිතවත්කම, හැම දෙනා කෙරෙහි ම පැවැත්වීම මෛත්‍රිය බව සලකාගත යුතු. මෙය ද්වෙෂයට-තරහ ගතියට-හාත්පසින් ම විරුද්ධයි එසේ ම මෛත්‍රී නාමයෙන් මුලා කරන රාගයකුදු පසෙකින් වෙයි. එ ද මෛත්‍රියෙහි සතුරෙකි.

මෛත්‍රී භාවනාව කරනු කැමැත්තහු විසින් පළමු කොට ද්වෙෂයෙහි ආදීනව-දොස්-ද මෛත්‍රියෙහි ආනිසංස ද සැලකිය යුතු.

### ද්වෙෂයෙහි ආදීනව:

ද්වෙෂය යම් සිතක හටගත්තේ නම් පළමු කොට ඒ සිත ම දැවීම් සවභාවයට පැමිණේ. දැවීම නම් දොම්නසයි. ඉක්බිති සිරුරෙහි ගමන් කිරීමෙන් මිනිසා රකුසෙකු කරයි. ඔහු ගේ මුහුණ,

ඇස්, ආදිය බියජනක වෙයි. කථාව රළුය. ගමන සැඩය. "මේ දේ හොඳය, මේ දේ නරකය" යනුවෙන් විමසා ගැනීමට නුවණක් ඔහුට නැත. එහෙයින් ද්වේෂයෙන් දූෂිත වූ පුද්ගලයාට නො කළ හැකි අපරාධයක් නැත. නො කියහැකි නපුරු වචනයක් නැත. නො බිය හැකි විසක් නැත. කෙබඳු අපරාධයක් වුවද සුළු මොහොතකින් සිදුකර අවසන් වෙයි. ශාසනයෙහි දුක්වෙන, මරණින් පසු දෙවන ආත්මභාවය ඒකාන්තයෙන් ම නිරයෙහි උපදින, ආනන්තරිය වූ පඤ්ච මහා පාපයන් ද කරනුයේ ද්වේෂ නමැති රකුසා පැමිණි කල්හි ය. (පඤ්චමහාපාප නම් වැදූ මව, පියා, රහතුන්, මැරීම හා බුදුන් ගේ සිරුරින් ලේ සෙලවීම, සඞ්ඝ භේදය, යන පසයි)

තවද ද්වේෂයෙන් දූෂිත වූ පුද්ගලයා පැරණි වණයක්-තුවාලයක් -හා සමාන බව බුදුරජාණන් වහන්සේ වදාළහ. "කතමො ච භික්ඛවෙ අරුකූපමචිත්තො පුග්ගලො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො කොධනො හොති උපායාස බහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති බ්‍යාපජ්ජති පතිත්ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සෙය්‍යථාපි භික්ඛවෙ දුට්ඨාරුකො කට්ඨෙන වා කඨලෙන වා සට්ටිතො භියො සොමත්තාය අස්සවනොති, එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො කොධනො =පෙ-" – අ. නි; ති. නි.

මහණෙනි, වණයකට බඳු උපමා වූ සිත් ඇති පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් ක්‍රෝධ ඇතිව, දැඩි සිත් තැවුල් බහුලවූයේ වෙයි. සුළු දෙයක් කීවත් එය ම දැඩි ලෙස අල්ලයි. කිපෙයි, නපුරු ලෙස සිතයි. තදින් ගෙන දැඩි වෙයි. කිපීම, තරහ, නොසතුට, පල කරයි. මහණෙනි, පුරාණ වණයක් ලී කැබෙල්ලකින් හෝ කැබිලිති කැටයකින් හෝ ගසනු ලැබුයේ බොහෝ සෙයින් ම සැරව ගලයි ද, එසේ ම පෙර කී ද්වේෂ සහගත පුද්ගලයා ද එබඳු ය. පුරාණ වණයකට සමාන ය.

තවද ද්වේෂී පුද්ගලයා යහපත, අයහපත; නොදනියි "කුද්ධො අත්ථං න ජානාති, කුද්ධො ධම්මං න පස්සති" අර්ථ නර්ථ නො දන්නා පමණක් නොව හේ යුතු-අයුතු දහම ද නො බලයි. දර කැබලි දෙකක් ස්වල්ප වේලාවක් එකට හැප්පීමෙන් ගිනි හටගනියි. ඒ හටගත් ගින්න පළමුකොට දවනුයේ ඒ ලී කැබෙලි දෙකය. එසේම ද්වේෂී පුද්ගලයා තෙමේ ද්වේෂයෙන් තැවී, දැවී, ඉක්බිති පළිගැනීම් වශයෙන් එකට එක කර දෙදෙනාම විනාශ වෙත්.

"කට්ඨස්මිං මත්ථමානස්මිං - පාවකො නාම ජායති
තමෙව කට්ඨං ඩහති - යස්මා සො ජායතෙ ගිනි
එවං මන්දස්ස පොසස්ස - බාලස්ස අවිජානතො
සාරම්භා ජායති කොධො සොපි තෙනෙව ඩය්හති"

එපමණක් නොව මරණින් පසු ඒකාන්තයෙන් නරකයෙහි උපදියි. එහෙයින් වදාළහ:- "ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ, කතමෙහි ද්වීහි? කොධෙන උපනාහෙන ච" මහණෙනි, ධර්ම දෙකකින් යුත් තැනැත්තා, ගෙනා බරක් බිම තබන්නා සේ නරකයෙහි උපදියි. කවර නම් දෙකක් ද? ක්‍රෝධය හා උපනාහය යි. ක්‍රෝධය ම වෛර වශයෙන් පළිගැනීමට අදහස් කරනුයේ උපනාහ නමි. බුදුරජාණන් වහන්සේ අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයාට දේශනා කළේ ක්‍රෝධ පුද්ගලයා වසලයෙක්-රොඩියෙක්-හැටියට ය.

"කොධනො උපනාහී ච - පාපමක්ඛී ච යො නරො
විපන්නදිට්ඨි මායාවී - තං ජඤ්ඤා වසලො ඉති"

යම් මිනිසෙක් කිපෙන සුළු වෙයි ද, ක්‍රෝධය නිතර නිතර සිතෙහි වෙළාගනියි ද, ලාමක වූ ගුණ මකන ස්වභාවයෙන් හා මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත ද, කපටිගති ඇත්තේ ද, ඔහු වසලයෙකැයි දත්තේ ය.

මෙසේ නොයෙක් අයුරින් ද්වේෂයෙහි ආදීනව සලකා, මේ පාපධර්මය මගේ සිතෙන් අස්කර ගැනීමට හැක්කේ එකම මෛත්‍රී ධර්මයෙන් බව සැළකිය යුතු. ක්‍රෝධය අස් වූ තැන ඇත්තේ මෛත්‍රිය යි. එහෙයින් ක්‍රෝධය අස්කරන්ම මෛත්‍රිය ඝටගනී. මෛත්‍රියේ ඇත්තා වූ යහපත ඉතා විශාලය. මෛත්‍රිය ලඟාවෙත්ම මිනිසා බ්‍රහ්මයෙක් වෙයි. තවද මෛත්‍රියෙහි මෙසේ මෙසේ ආනිසංස පවත්නේය යි, මෛත්‍රී ආනිසංස වශයෙන් දේශනා කළ ධර්ම සිහිකළ යුතුය.

**මෛත්‍රියෙහි ආනිසංස:-**

"කොධං ඣත්වා සුඛං සෙති - කොධං ඣත්වා න සොචති
කොධස්ස විසමූලස්ස - මධුරග්ගස්ස දෙවතෙ
වධං අරියා පසංසන්ති - තං හි ඣත්වා න සොචති"

ක්‍රොධය දවා - විනාශකොට - සැපසේ වෙසෙයි. සෝක නො කරයි. දෙවතාවියනි, විස මුලක් ඇති, එහෙත් අග මිහිරි ලෙස හැඟෙන, ක්‍රොධය නැසීම ආර්යයෝ ප්‍රසංසා කරත්. ඒ ක්‍රොධය දවා ශෝක නොකරයි.

“ඣායතීති ඣානං” දවාතුයි ධ්‍යාන නම්. මේ පද සාධන යේ අයුරින් මෛත්‍රියෙන් ලබාගත් ධ්‍යානයෙන් ක්‍රොධය දවන බව ප්‍රකාශිත යි. ජලය ඇති තැන ගින්න නො රඳන්නා සේ මෛත්‍රිය ඇති තැන ක්‍රොධය නො පවතියි. ක්‍රොධයෙන් පසු තැවීම්, සෝක කිරීම්, හටගනී. එය නසත්ම සිතෙහි සැනසුම ලඟා වෙයි. මනුෂ්‍ය, දිව්‍ය, ආදි සියලු සම්පත් ලඟාකර දෙන දානාදී හැම පුණ්‍ය ධර්මයන්ට ම වඩා, ඉතා ශ්‍රෙෂ්ඨ වනුයේ මෛත්‍රී සහගත සිතය. එහෙයින් වදාළහ:-

“යානි කානිචි භික්ඛවෙ ඔපධිකානි පුඤ්ඤකිරිය වත්ථූනි සබ්බානි තානි මෙත්තාය චෙතො විමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං, මෙත්තායෙව තානි චෙතො විමුත්ති අධිගග්හෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච සෙය්‍යථාපි භික්ඛවෙ යා කාචි තාරකරූපානං පභා සබ්බා තා චන්දියා පභාය කලං නාග්ඝන්ති සොළසිං, චන්දපභායෙව තා අධිගග්හෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච, එවං ඛො භික්ඛවෙ යානි කානිචි -පෙ- සෙය්‍යථාපි භික්ඛවෙ වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ආදිච්චො නභං අබ්භුස්සක්කමානො සබ්බං ආකාස ගතං තමගතං අභිවිහච්ච භාසතෙ ච තපතෙ ච විරොචති ච එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි -පෙ-, සෙය්‍යථාපි භික්ඛවෙ රත්තියා පච්චූස සමයං ඔසධී තාරකා භාසතෙ ච තපතෙ ච විරොචති ච, එව මෙව ඛො භික්ඛවෙ යානි කානිචි -පෙ-, මෙත්තායෙව තානි චෙතො විමුත්ති අධිගග්හෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච”- ඉ. වු පා. (තුන්වැනි වර්ගයේ 7 සූත්‍රය)

මහණෙනි, යම්කිසි භවගාමී පුණ්‍ය ක්‍රියා - දෙව් මිනිස් සැප ගෙන දෙන පින් - ඇද්ද, ඒ සියල්ල මෛත්‍රීචෙතො විමුක්තිය- මෛත්‍රී ධ්‍යානයෙන් ලබාගත් සිතේ සැනසීම -කෙරෙන් දසයෙන් කොටසක් නමුදු නො අගී. මෛත්‍රී චිත්ත විමුක්තිය ම ඒ හැම අභි භවා බබලයි. මහණෙනි, යම්තාක් තාරකාවන් ගේ ආලෝක ඇද්ද, ඒ හැම මැඩ පවත්වමින් චන්ද්‍රයාගේ ආලෝකය බබලන් නේ යම්සේ ද, සියලු භවගාමි පුණ්‍යධර්මයන් මැඩපවත්වමින්

මෛත්‍රී චිත්තවිමුක්තිය ද බබලන්නේ එසේමය. මහණෙනි, වර්ෂා සෘතුවේ අවසාන මාසය වූ සරත් සමයේ දී වලාකුල් අස්වීමෙන් පිරිසුදු වූ අහසෙහි සූර්යයා බබලන්නේ යම්සේද, මෛත්‍රී චිත්ත විමුක්තියත් සියලු භවගාමී පුණ්‍යධර්මයන් මැඩපවත්වමින් එසේම බබලන්නේ ය. මහණෙනි, යම්සේ රාත්‍රියේ අවසාන භාගයේ-අළුයම්-ඔසධී තාරකාව (දවහත්තරුව) බබලයිද, එසේ ම සියලු භවගාමී පුණ්‍යධර්මයන් අභිභවා මෛත්‍රී චිත්තවිමුක්තිය බබලන්නේය. මේ මෛත්‍රියෙහි ඇති ශ්‍රේෂ්ඨත්වයයි.

තවද ද්වේෂ නමැති එකම ධර්මය අස්කළහොත් අනාගාමී ආර්යයෙකු වීම සඳහා බුදුරජාණන් වහන්සේ ඇපවන බව දේශනා කළහ. "එකධම්මං භික්ඛවෙ පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතාය කතමං එකධම්මං? දොසං භික්ඛවෙ එකධම්මං පජහථ" මහණෙනි, එකධර්මයක් අස්කරන්න. අනාගාමී වීම සඳහා මම තොපට ඇපවෙමි. කවර නම් එකධර්මයක්ද? ද්වේෂයයි. ද්වේෂය අඩුවූ තැන මෛත්‍රිය ඇතිබව සැලකිය යුතු.

බුදුරජාණන් වහන්සේ බෝධිසත්ත්වකාලයේ දී අවුරුදු සතක් මෛත්‍රී භාවනා කිරීම නිසා ලබාගත් ආනිශංස මෙසේ දක්වූහ.

"අභිජානාමි ඛො පනාහං භික්ඛවෙ දීඝරත්තං කතානං පුඤ්ඤානං දීඝරත්තං ඉට්ඨං කන්තං පියං මනාපං විපාකං පච්චනුභූතං, සත්තවස්සානි මෙත්තං චිත්තං භාවෙත්වා සත්ත සංවට්ටවිවට්ටකප්පෙ නයිමං ලොකං පුනරාගමාසිං, සංවට්ටමානස්මිං සුදං භික්ඛවෙ කප්පෙ ආභස්සරූපගො හොමි, විවට්ටමානෙ කප්පෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජාමි. තත්‍ර සුදං භික්ඛවෙ බ්‍රහ්මා හොමි මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්ති. ඡත්තිංසක්ඛත්තුං ඛො පනාහං භික්ඛවෙ සක්කො අහොසිං දෙවානමින්දො, අනෙකසතක්ඛත්තුං රාජා අහොසිං චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතන සමන්නාගතො, කො පන වාදො පදෙසරජ්ජස්ස" - ධර්ම ප්‍රදීපිකා 175 පි.

මහණෙනි, බොහෝ කාලයක් කරන ලද පින් නිසා බොහෝ කාලයක් ඉතාමත් ප්‍රිය, කැමති, විපාකයක් වැළඳු මම අවුරුදු සතක් මෛත්‍රී සිත වඩා සංවට්ට, විවට්ට, කල්ප සතක් ම මෙම

ලෝකයට නාවෙමි" යන බව මම විශෙෂයෙන් දනිමි. මහණෙනි, සංවට්ට කල්පයෙහි ආභස්සර බ්‍රහ්මලෝකයෙහි වෙසෙමි. විවට්ට කල්පයෙහි ශූන්‍ය බ්‍රහ්මවිමානයක උපදිමි ඒ බ්‍රහ්මලෝකයේ දී මම සියල්ලන් ම මැඩපවත්වා, යටත් නො වී, දෙවැන්නෙක් ද නො වී ඉතා දක්ෂ වූ මහාබ්‍රහ්මයෙක් වූයෙමි. තවද සතිස් (36) වාරයක් සක්දෙව් රජ වීමි. නොයෙක් වාරයක් ධාර්මික සක්විති රාජ්‍ය සම්පත් විඳිනා චක්‍රවර්ති රජෙක් වීමි. මේ එහි කෙටි අදහසයි.

(සැලකිය යුතු: ලෝක විනාශ කරන මහා වර්ෂාවෙහි සිට ගින් නෙන් විනාශ වීම තෙක් සංවට්ට කල්ප නමි. සම්පත්තිකර මහා වර්ෂාවේ පටන් ඉර-හඳ පහළ වන තෙක් කාලසීමාව විවට්ටකල්ප නමි.)

මෛත්‍රී චිත්තය-මෙත්සිත- අසුරුසනක් පමණ සුළුකාලයක් නමුදු යම් භික්ෂුවක් පුරුදු කෙරෙයි නම් හේ නො සිස් වූ ධ්‍යාන යෙන් යුක්තව වෙසෙසි. ශාස්තෘ ශාසනය, උන් වහන්සේ ගේ අවවාදය, කළේ පිළිපැද්දේ වෙයි. දායකයනට මහත් ඵල මහානිශංස භාවය සැලසෙන නිසා නොසිස් වූ පිණ්ඩපාතය වළඳයි. බොහෝ කොට වඩත් නම් ආනිශංස කියනු කිම? "අච්ඡරා සඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු මෙත්තං චිත්තං ආසෙවති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසනකරො ඔවාදපතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති, කො පන වාදො යෙ නං බහුලීකරොන්ති" -අ. නි. එ. නි. (අදහස ඉහත සඳහණි)

තවද මෛත්‍රියෙහි ආනිශංස එකොළසක් "මෙත්තානිසංස" සූත්‍රයෙහිදී ඇතුළත් කළහ.

"මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, එකාදසානිසංසා පාටිකඞ්ඛා, කතමෙ එකාදස? සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛවණ්ණො විප්පසීදති, අසම්මූල්හො කාලං කරොති, උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති"

මහණෙනි, නැවත නැවත සිතීම් වශයෙන් ආසේවනය කරන ලද, වඩන ලද, බොහෝ සේ වඩන ලද, යානාවක් සේ කරන ලද, පිහිටීමට ආධාර වන වස්තුවක්සේ කරන ලද, අනුව සිතෙහි නැගී සිටි, හොඳට පුරුදු කළ, මනා සේ ඇරඹූ, මෛත්‍රී චිත්තවිමුක්ති යෙහි අනිශංස එකොළසක් කැමති විය යුතුය. ඒ කවරේද? සැප සේ නිදයි සැප සේ නින්දෙන් නැගිටියි. නිදා ගත් අතර නපුරු සිහින නොපෙනෙයි, මිනිසුන් ට ප්‍රිය වෙයි. අමනුෂ්‍යයනට ද ප්‍රිය වෙයි. දෙවියෝ රකිත්, ගිනි හෝ විස හෝ ආයුධ හෝ ඔහුට නො වදියි වහා සිත එකඟ වෙයි. මුහුණ පැහැපත් වේ. නො මුළාව කළුරිය කෙරෙයි. රහත් නො වූ යේ නම් බඹලොව උපදියි.

මෙසේ ප්‍රතිඵල එකොළසක් මෛත්‍රී චිත්තය දියුණු කිරීමෙන් ලඟාකරගත හැක. එසේ ම මෙත් සිත වඩන්නා බ්‍රහ්මවිහරණ යෙන් යුක්ත වූවෙකි.

"තිට්ඨං චරං නිසින්නො වා සයානො වා
යාවතස්ස විගතමිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු"

සිටියේ හෝ ඇවිදින්නේ හෝ හිඳියේ හෝ නිදාගන්නේ නිඳට යන තෙක් හෝ මේ මෙත් සිහිය ඉටාගන්නේ නම් එය බ්‍රහ්මවිහරණයකැයි කීහු.

මෙසේ නොයෙක් අයුරින් මෛත්‍රියෙහි ආනිශංස සිහි කොට, නැවත ද බෝධිසත්ත්වයන්ගේත් අනිකුත් මෙත් සිත දියුණු කළ තැනැත්තන් ගේ ත් මෛත්‍රිය නිසා සිදු වූ යහපත ගැන සැළ කිය යුතු.

අපේ බෝධිසත්ත්වයන් වහන්සේ ක්ෂාන්තිවාදී තාපසව වෙසෙද්දී "කලාබු" රජු විසින් අත් - පා සිඳ දැමූ නමුදු මෙත් සිත නො හැළේය. වඳුරු කුලයක ඉපදී පුරුෂයන් සියදෙනෙකුගේ ප්‍රමාණ (සතපොරිසෙ පපාතෙ) වලක වැටුණු පුරුෂයා ගොඩ නැංවූ කල ඔහු විසින් ගලකින් ගසා හිස තුවාලවූ නමුදු ඒ අසත් පුරුෂයාට මෙත් සිත යොදවා ගමන් මාර්ගය පෙන්වූයේ ය. සංඛපාල නා රජව වෙසෙන සමයේ නා ලොවින් මෙලොවට අවුත් විවේකස්ථානයක සිට සිල් රකිද්දී භෝජපුත්‍රයන් සොළොස් දෙනා දඩයමෙහි ගොස් මොහු දැක, "අද අපට මස්ලැබුනේය" යි සතුටුව

කටුසහිත වැලකින් බැඳගෙන, කරතබා ගෙන යද්දී, හිස පහතට එල්ලී ම නිසා නැවත ද නැගෙන විඳ, වද දිදී ඇරගෙන ගිය නමුදු මෙත් සිත විනා කෝප මාත්‍රයකුදු නො කෙළේය. ඡද්දන්ත හස්ති රාජව උපන් සමයේ දී තමාගේ දළ කපා ගැනීමට ආ දුෂ්ටයාට දළ කපා ගැනීමට අවකාශ දුන් පසු ඔහු කපෝලයෙන් ලේ වැගිරෙන සේ දළ මුලින්ම කපන අවස්ථාවේ නමුදු මෙත්සිත විනා කෝප මාත්‍රයකුදු නො කෙළේය. තවද ධර්මපාලව උපන් දවස, තම පියා වූ මහාප්‍රතාප රජතුමා රජගෙට එන කල පුතු ඇකයෙහි හොවා ගෙන නො නැගී සිටින බිසවු දැක, "කොල මෑ පුතෙකු ලදිමි"යි මාන්නයෙන් ඉදිමී මා එන කලද නො නැගිටියි" කියා මැගේ මාන්නයට හේතු වූ දරුවා පෙති ගසමියි කුපිතව වධකයාට අණ කළ පසු, මල් දමක් බඳු මොලකැටි සත්මැසි දරුවා ඇරගෙන අත්-පා සිඳිද්දී, හේ තම පියා කෙරෙහිත්, මෑණියන් වූ චන්ද්‍රා දේවින් කෙරෙහිත් අත්-පා සිඳින වධකයා කෙරෙහිත් සමමෙත් සිත ම වැඩුයේය. මෙසේ නොයෙක් ජාතීන්හි දී බෝධිසත්ත්වයෝ මෛත්‍රිය පුරුදු කළහ.

## මෛත්‍රී භාවනා ක්‍රම:

ද්වේෂයෙහි ආදීනව සහ මෛත්‍රියෙහි ආනිශංස නොයෙක් අයුරින් විමසා බැලූ තැනැත්තහු විසින් මෛත්‍රී භාවනාව ආරම්භ කළයුතු පිළිවෙල දතයුතුය. පළමුකොට මෛත්‍රිය නොවැඩිය යුතු පුද්ගලයන් සතර දෙනෙකි. එනම්: අප්‍රිය පුද්ගලයා ඉතා ප්‍රියනු මැදහත් පුද්ගලයා, සතුරා යනුයි. එසේම ලිඞ්ග විසභාග ඇතියවුන් කෙරෙහි සීමා කොට මෛත්‍රිය නො වැඩිය යුතු. කළුරිය කළවූන් කෙරෙහි ද, මෛත්‍රී නො වැඩිය යුතු. මොවුන් කෙරෙහි පළමුකොට නො වැඩිය යුත්තේ මක්නිසාද? අප්‍රියයා කෙරෙහි පළමුවෙන් මෛත්‍රී කිරීමට ගියහොත් ස්නෙහ ගතිය නූපදී. ඉතා ප්‍රියනු නිසා ඔහු කෙරෙහි වඩයි නම් ස්නෙහ ගතිය වැඩි වී ඔහුට සුළු කරදරයක් නමුදු සිදුවූ විට ඇසීමට පවා සිදුවෙයි. මැදහතා කෙරෙහි වඩයි නම් ගරු තැන හෝ ප්‍රිය තැන හෝ තබා සිහි කිරීමට අපහසු වෙයි. වෛරී පුද්ගලයා කෙරෙහි වැඩීමට ගියහොත් ක්‍රොධය තව-තවත් මතුවෙයි. ලිඞ්ගවිසභාගයා කෙරෙහි රාගය උපදියි. මළ තැනැත්තා කෙරෙහි කොතෙක් මෛත්‍රී වැඩුවත් විශෙෂයක් නූපදී.

පළමුවෙන් මෛත්‍රිය කළ යුත්තේ තමා කෙරෙහිය. තමාට වඩා ප්‍රිය පුද්ගලයෙකු තවත් නො මැති හෙයිනි. සැප කැමත්තේ ද, දුක්-කරදර-පීඩාදිය නො කැමැත්තේ ද, තමා කෙරෙහි

මය. සෙසු අය කෙරෙහි ඒ අදහස පවත්නේ දෙවනුවය. ඉක්බිති ගරු තැන තැබිය හැකි ආචාර්ය, උපාධ්‍යාය, මව්-පිය, යන උතුමන් කෙරෙහි මෛත්‍රී වැඩිය යුතු. මොවුන් කෙරෙහි මෛත්‍රී වැඩී මෙත් ඉතා ඉක්මනට අර්පණා ඉපදවිය හැක. මෙසේ මෛත්‍රිය ආරම්භ කළයුතු අයුරු දතයුතුය.

ශාසනයෙහි මෛත්‍රී භාවනා ක්‍රම කීපයෙකි. එයින් ඇතැම් ක්‍රම පටිසම්භිදායෙහිද තවත් කොටස් කරණීය සූත්‍රයෙහි ද, ඛන්ධ සූත්‍රයෙහි ද; මේ ආදී වශයෙන් සඳහන්ව ඇත. තවද සාමණේර බණ දහම් පොතෙහි එන ක්‍රමයකුදු ඇත. පළමුකොට දක්වනුයේ එයයි.

## සාමණේර බණ දහම් පොතෙහි වූ මෛත්‍රී භාවනාව.

"අහං අවෙරො හොමි, අව්‍යාපජ්ජො හොමි, අනීඝො හොමි, සුඛී අත්තානං පරිහරාමි" මම වෛර නැත්තෙක් වෙම්වා, කෝප නැත්තෙක් වෙම්වා, දුක් නැත්තෙක් වෙම්වා, සුවසේ ජීවිතය පරිහරණය කෙරෙම්වා.

"අහං විය මය්හං ආචරියුපජ්ඣායා මාතාපිතරො හිතසත්තා මජ්ඣත්තිකා සත්තා වෙරීසත්තා අවෙරා හොන්තු අව්‍යාපජ්ජා හොන්තු, අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු, දුක්ඛාමුච්චන්තු, යථාලද්ධසම්පත්තිතො මාවිගච්ඡන්තු කම්මස්සකා" මම මෙන් මාගේ ගුරුවර, උපාධ්‍යාය, මව්-පියෝ, හිත සත්වයෝ, මැදහත් සත්වයෝ, වෛරී සත්වයෝ, වෛර නැත්තෝ වෙත්වා, කෝප නැත්තෝ වෙත්වා, දුක් නැත්තෝ වෙත්වා, සුවසේ ජීවිතය පරිහරණය කෙරෙත්වා, දුකින් මිදෙත්වා, ලබාගත් සැපතින් අස් නොවෙත්වා, කර්ම ස්වකීය කොට ඇත්තෝ වෙත්වා;

"ඉමස්මිං විහාරෙ, ඉමස්මිං ගොචරගාමෙ, ඉමස්මිං නගරෙ, ඉමස්මිං ලඞ්කාදීපෙ, ඉමස්මිං ජම්බුදීපෙ, ඉමස්මිං චක්කවාළෙ ඉස්සරජනා සීමට්ඨක දෙවතා සබ්බෙ සත්තා අවෙරා හොන්තු -පෙ -" මේ විහාරයෙහි මේ ගොදුරු ගමෙහි, මේ නගරයෙහි, මේ ලංකාද්වීපයෙහි මේ ජම්බුද්වීපයෙහි මේ සක්වළෙහි, ප්‍රධාන ජනයෝ, සීමා වැසි දෙවියෝ, වෛර නැත්තෝ වෙත්වා! -පෙරමෙනි.

"පුරත්ථිමාය දිසාය, දක්ඛිණාය දිසාය, පච්ඡිමාය දිසාය, උත්තරාය දිසාය, පුරත්ථිමාය අනුදිසාය, දක්ඛිණාය අනුදිසාය, පච්ඡිමාය අනුදිසාය, උත්තරාය අනුදිසාය, හෙට්ඨිමාය දිසාය, උපරිමාය දිසාය; සබ්බෙ සත්තා, සබ්බෙ පාණා, සබ්බෙ භූතා, සබ්බෙ පුග්ගලා, සබ්බෙ අත්තභාවපරියාපන්නා, සබ්බා ඉත්ථියො සබ්බෙ පුරිසා, සබ්බෙ අරියා, සබ්බෙ අනරියා, සබ්බෙ දෙවා, සබ්බෙ මනුස්සා, සබ්බෙ අමනුස්සා, සබ්බෙ විනිපාතිකා, අවෙරා හොන්තු -පෙ- මාවිගච්ඡන්තු කම්මස්සකා," නැගෙනහිර දිසාවෙහි, දකුණු දිසාවෙහි, බටහිර දිසාවෙහි, උතුරු දිසාවෙහි, ගිනිකොණ දිසාවෙහි, නිරිත දිසාවෙහි, වයඹ දිසාවෙහි, ඊසාන දිසාවෙහි, (නැතහොත් නැගෙනහිර අනුදිසාවෙහි ආදී වශයෙන් ගතයුතු) යටදිසාවෙහි, උඩදිසාවෙහි, සියලු සත්වයෝ සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ, සියලු පුද්ගලයෝ, සියලු ආත්මභාවයන්ට අයත්වූවෝ, සියලු ස්ත්‍රීහු, සියලු පුරුෂයෝ, සියලු ආර්‍ය්‍යයෝ, සියලු ආර්‍ය්‍ය නොවූ පෘථග්ජනයෝ, සියලු දෙවියෝ, සියලු මනුෂ්‍යයෝ, සියලු අමනුෂ්‍යයෝ විවසව පතිත වන සියලු සත්වයෝ, (සිව් අපා වැසියෝ) වෛර නැත්තෝ වෙත්වා, -පෙර මෙනි- ලද සැපතින් අස් නො වෙත්වා, කර්මය ස්වකීය කොට ඇත්තෝ වෙත්වා,

මේ මෛත්‍රී භාවනා ක්‍රමයෙන් සතර බ්‍රහ්මවිහාර ම දියුණු වන හෙයින් පලවු කොට දක්වීමි. ඒ කෙසේද? අවෙරා හොන්තු, අව්‍යාපජ්ජා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු, යන මේ සතර මෛත්‍රී භාවනාවයි. දුක්ඛා මුච්චන්තු, මේ කරුණා භාවනාවයි. යථා ලද්ධසම්පත්තිතො මාවිගච්ඡන්තු, මෙ වැකිය මුදිතා භාවනාවයි. (සැපතෙහි තුටුවීම) කම්මස්සකා, යන්න උපෙක්ෂා භාවනාවයි. කර්මය ගැන සිතා දුක- සැප දෙකෙහි මැදහත් වීම)

**පටිසම්භිදායෙහි මෛත්‍රී භාවනා ක්‍රම:**

"සීමා රහිතව පතුරුවන මෛත්‍රී චිත්තවිමුක්තියක් ඇත. සීමා සහිතව පතුරුවන මෛත්‍රී චිත්තවිමුක්තියක් ඇත. දිසාවන්හි පතුරුවන මෛත්‍රීචිත්තවිමුක්තියක් ඇත." - ප. ම. සිං. ප.

මෙහි ක්‍රම තුනෙකි. එනම් අනොධිසො ඵරණ, ඔධිසො ඵරණ, දිසා ඵරණ, යනුයි. මෙහි "ඔධි" යනු සීමා යන්නට නමකි. එහෙයින් සීමා දක්වා, අසවල් සීමාවතෙක්; යනාදී වශ

යෙන් පැතිරවීම ඔධිසො ඵරණය යි. එසේ සීමා නො මැතිව පැතිර වීම අනොධිසො ඵරණ නමි. දස දිසාවෙහි ම පැතිරවීම දිසා ඵරණ ක්‍රමයයි.

අනොධිසො ඵරණය පඤ්චවිධය: සබ්බෙ සත්තා අවෙරා හොන්තු -පෙ-, සබ්බෙ පාණා අවෙරා හොන්තු -පෙ-, සබ්බෙ භූතා අවෙරා හොන්තු -පෙ-, සබ්බෙ පුග්ගලා අවෙරා හොන්තු -පෙ-, සබ්බෙ අත්තභාවපරියාපන්නා අවෙරා හොන්තු -පෙ-, යනුයි.

ඔධිසො ඵරණය අෂ්ටවිධය: සබ්බා ඉත්ථියො- සබ්බෙ පුරිසා -සබ්බෙ අරියා- සබ්බෙ අනරියා-සබ්බෙ දෙවා - සබ්බෙ මනුස්සා- සබ්බෙ අමනුස්සා-සබ්බෙ විනිපාතිකා අවෙරා හොන්තු -පෙ- යනුයි.

දිසා ඵරණය දසවිධය: පුරත්ථිමාය දිසාය සබ්බෙ සත්තා -පෙ- මෙසේ පෙර දක්වූ දසදිසා ක්‍රමය ගතයුතු. ඉක්බිති සබ්බෙ පාණා, සබ්බෙ භූතා, යනාදී පද යොදමින් වෙන වෙන ම වාක්‍ය තනාගත යුතු'

මෙහි තේරුම් ගත යුතු කරුණු:-

සත්තා: සත්වයෝය. "රූපෙ ඛො රාධ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තත්‍ර සත්තො තත්‍ර විසත්තො තස්මා සත්තොති වුච්චති. වෙදනාය සඤ්ඤාය සංඛාරෙසු විඤ්ඤාණෙ -පෙ-"–ප. ම. අ. 40 පි.

රාධය, රූපස්කන්ධයෙහි යම් කැමැත්තක් යම් ඇල්මක්, යම් සතුටක්, යම් ආසාවක් ඇද්ද, එහි ඇලුනේ එහි පටලැවුනේ, එහෙයින් සත්වයායි කියනු ලැබේ. වේදනාස්කන්ධයෙහි, සඤ්ඤාස්කන්ධයෙහි, සංස්කාරස්කන්ධයෙහි, විඤ්ඤාණස්කන්ධයෙහි, එසේ ම ඇලුනේ, පටලැවුනේ, සත්වයාය යි කියනු ලැබේ. මේ දේශනා පාඨයේ අයුරින් සත්වයා නම් පඤ්චස්කන්ධයෙහි කෙලෙස් වශයෙන් ඇලුණු, පටලැවුණු තැනැත්තා බව දත යුතුය. හුණ පතුරින් කළ විජිනිපතට ද තල්වැට යන්න ව්‍යවහාර වන්නා සේ කෙලෙසුන් ගෙන් නිදහස් ආයඣීයතට ද සත්ව නාමය යෙදේ.

පාණා : ප්‍රාණීහු. මෙහි පාණ යනු ආශ්වාස ප්‍රශ්වාස යනට නමකි. එහෙයින් "පාණතාය පාණා" ඒ ආශ්වාස ප්‍රශ්වාස ඇස නිසා ප්‍රාණීහු යනු අටුවා යි.

**භූතා :** භූතයෝ. "භූතත්තා භූතා අභිනිබ්බත්තාති අත්ථො" උපදනා නිසා භූත නම්. සත්වයෝ උපදනා අය වෙත්. ඔවුන් ගේ උප්පත්ති-ඉපදීම්-ක්‍රම සතරෙකි. අණ්ඩජ: බිජු වලින් ඉපදුනාහු, ජලාබුජ: දලඹුව නම් වූ මව්කුසෙහි වූ සිව්යෙහි ඉපදුනාහු, සංසේදජ: තෙත් තැන්හි ඉපදුනාහු. ඕපපාතික: සම්පූර්ණ අවයව සහිතව පහලවූවහු, යනුයි.

**පුග්ගලා :** පුද්ගලයෝ. "පුං වුච්චති නිරයො, තස්මිං ගලන්ති ගච්ඡන්තීති පුග්ගලා" පුං යනු නිරයට නමකි. ඒ නිරයට යත්නුයි පුද්ගල නම්, මිනිස්, දෙව්, බඹ, යන කෙබඳු ජීවිතයක් ගතකළත් ඔහු ගේ ස්වභාවය නිරය දෙසට ගමන් කිරීමයි. එහෙයින් ආර්‍යභූමියට පත් නොවූ සියල්ලෝ ම පුද්ගලයෝය. යටත් පිරිසෙයින් සෝවාන් වූවහු පවා සිවු අපායට නොයයි,

**අත්තභාවපරියාපන්නා:** මෙහි ආත්මභාව යනු පඤ්චස්කන්ධයයි. එයට ඇතුලත්වූවෝ ආත්මභාවපර්‍යාපන්නයෝ යි.

**විනිපාතිකා :** දුගතියෙහි වැටෙන්නෝ, වැටුණහු, යන දෙපක්ෂයයි. තමා නො කැමැත්තෙන් වුවද, සතර අපායෙහි නපුරු ලෙසට වැටෙන- උපදින-නිසා විනිපාතික නම ලැබිණ.

පටිසම්භිදාමග්ගයෙහි මෙසේ මෛත්‍රී භාවනා ක්‍රම දක්වූයේ ලබාගත් අර්පණා-ධ්‍යාන-ඇත්තවුන් සඳහා ය. මූලික කර්මස්ථාන වශයෙන් නොවේ. එහෙයින් පෙර සඳහන් පරිදි පළමු කොට තමා කෙරෙහි මෙත් වඩා දෙවනුව ගරු කළයුතු ආචාර්‍යාදීන් කෙරෙහි මෙත් වැඩිය යුතු. එසේ වැඩීමෙන් සිතෙහි සැහැල්ලු ගතිය, සතුට අතිවූ කල්හි ඉතා ප්‍රිය පුද්ගලයා කෙරෙහි ද ඊට පසු මැදහත් පුද්ගලයා කෙරෙහිද, අවශානයේ වෛරී පුද්ගලයා කෙරෙහිද, වැඩිය යුතු. වෛරීපුද්ගලයා කෙරෙහි මෙත් සිත හරවත් ම ක්‍රොධය නැඟ එයි නම් පෙර කී පරිදි බෝධිසත්ව චරිතය, මෛත්‍රී ආනිශංස, ක්‍රොධයෙහි ආදීනව, සිහි කොට නැවත නැවත මෙත් සිත හැරවිය යුතුය එසේ වූවද ක්‍රොධය නො සන්සිඳේනම් කකචූපම සූත්‍රය, සියලු සත්වයන් ම පෙර ආත්මවලදී මාපියාදීන් වූ බැව් දක්වෙන සූත්‍රාදිය ද, ධාතු වශයෙන් සැලකීම ද, මේ ආදිය සිහි කරමින් ක්‍රොධය නිවාගත යුතුය. ඒවා සිහිකරමින් මෙත්

සිත හැරවිය යුතුය. සිගක් වර, දහස් වර, හරවා බලන්නහුට විශෙෂයකට පැමිණිය හැක. තමා, හිතවතා, මැදහත්‍ා, සතුරා, යන සතර දෙනා කෙරෙහි එක සමාන මෛත්‍රියක් පිහිටීමෙන් සීමා බිඳ දමා, සිත උපචාර සමාධි බවට පත්වේ. සීමා ඇති තෙක් උපචාරයට නොපැමිණේ. සීමා නම් "මා මෛත්‍රී කරන්නේ අසවලාටය" මේ වශයෙන් වෙන්කර ගැනීමයි. උපචාර බවට පත්වූ පසු නැවත නැවත ඒ අරමුණ වඩත් ම අර්පණා උපදී. (ධ්‍යානයි)

අර්පණා ලබාගත්තහු විසින් පටිසම්භිදාමග්ගයෙහි දක්වූ ක්‍රමයට මෙත් සිත පැතිරවිය යුතුය. එවිට අර්පණා රාශියක් ඉපදවිය හැක.

## පටිසම්භිදාක්‍රමයෙන් උපදින අර්පණා.

1. අනොධිසො මෙත්තා ඵරණයේදී අර්පණා විස්සෙකි. සබ්බෙ සත්තා" යනා දී ක්‍රම පහ, අවෙරා හොන්තු, යනාදී ක්‍රම සතරෙන් ගුණ කරන්න. (5 × 4 = 20)

2. ඔධිසො මෙත්තා ඵරණයේදී අර්පණ අට විස්සෙකි. සබ්බා ඉත්ථියො" යනා දී ක්‍රම සත, අවෙරා හොන්තු, යනාදී සතරෙන් ගුණ කරන්න. (7 × 4 = 28)

3. දිසා මෙත්තා ඵරණයේදී අනොධිසො වශයෙන් දෙසීයකි. අනොධිසො අර්පණා විස්ස දසයෙන් ගුණ කරන්න. (20 × 10 = 200)

4. ඔධිසො වශයෙන් දස දිසායෙහි දී වශයෙන් අර්පණා දෙසිය අසූවෙකි. ඔධිසො අර්පණා අටවිස්ස දසයෙන් ගුණ කරන්න. (28 × 10 = 280)

මේ දෙක ම එකතු කළ කල්හි සාරසිය අසූවෙකි. (200 + 280 = 480) දස දිසා අත් හැර, ඒ දෙක එකතු කළ කල්හි අටසාළිසෙකි. (20 + 28 = 48) ඉක්බිති මේ දෙක එකතු කළ විට පන්සිය අටවිස්සක් ලැබේ, (480 + 48 = 528)

## මෙත්තා චෙතො විමුක්තියෙන් දියුණු වන ධර්ම:-

අර්පණා උපදවා ගත් තැනැත්තහුගේ කාමච්ඡන්ද දී නීවරණ ධර්මයන් කෙරෙන් මිදුනා වූ ඒ සැනසිලි සහගත සිත "මෛත්‍රී චිත්ත විමුක්ති" නම්. ඒ චිත්ත විමුක්තිය නිසා, ශ්‍රද්ධා, වීර්‍ය්‍යය,

සමෘති, සමාධි, ප්‍රඥා, යන ඉන්ද්‍රිය ධර්ම පහ සහ බලධර්ම පහ දියුණු වෙයි. ඒ මෙසේය. සත්වයා කෙරෙහි පැහැදීමෙන් ශ්‍රද්ධාව දියුණු වෙයි. පැහැදීම නිසා නැවත නැවත පැතිර වීමට උත්සාහ ගන්නා හෙයින් වීර්යය දියුණු වෙයි. සත්වයා කෙරෙහි ම සිහිය පිහිටුවන සතිය ද, ඒ පිහිටුවීම නිසා සිතෙහි එකඟකම ඇතිවීමෙන් සමාධිය ද, සත්වයාගේ සැපවත් ගතිය මෙනෙහි කිරීමෙන් හෝ දුක් සහිත ගතිය මෙනෙහි කිරීමෙන් හෝ සිතෙහි විසුරුණු ගතියක් ඇති වීමට නොදී රැක ගන්නා හෙයින් ප්‍රඥාව ද, දියුණු වෙයි. (උද්ධච්චය, මෝහමූලික ධර්මයකි.

තවද මෛත්‍රී චිත්තවිමුක්තියෙන් සත්තබොජ්ඣඞ්ග ධර්ම ද, දියුණු වෙයි. ඉහත කී සිහිය සිවුසස් අවබෝධයට උපකාර වන හෙයින් සතිසම්බොජ්ඣඞ්ගය දියුණු වෙයි. ඒ ඒ සත්වකොට්ඨාසයන් විමසීම නිසා ධම්මවිචය, කුසීතකම මැඩපැවැත්වීමෙන් විරිය, සත්වයන් කෙරෙහි පැහැදීම - තම සිතෙහි කෝපය නැති වීම මේ කරුණු සිතීමෙන් පීති, ක්‍රොධ ගතිය නැතිවීමෙන් සිතෙහි සැහැල්ලුබවක් ඒම නිසා, පස්සද්ධිය, සිත එකඟවීමෙන් සමාධිය, මූලාවකට පත්වීමට නොදී සිත මැදහත්බවට පත්කිරීමෙන් උපෙක්ඛා, මෙසේ බොජ්ඣඞ්ගයෝ දියුණු වෙත්. එසේම බොජ්ඣඞ්ග ධර්මයන් නිසා මෛත්‍රී චිත්තවිමුක්තිය ද ආසෙවිත, භාවිත, බහුලීකෘත, යානීකෘත, වස්තුකෘත, අනුස්ඨිත, පරිචිත, සුසමාරද්ධ, වෙයි. (මෙහි අදහස් ඉහත දී දැක්විණ.)

ආර්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගය ද මෛත්‍රී චිත්තවිමුක්තිය නිසා දියුණු වෙයි සත්වයා කෙරෙහි මෙත් සහගත සිතින් බැලීම, රාග - ශෝක දෙක නූපදවා ඒ මැදින් සිත ගමන් කරවීම, යහපත් දැකීමයි. "සම්මා දිට්ඨි" රාගයට නොවැටීමෙන් නෙක්ඛම්ම, ශෝකයට නොවැටීම නිසා තරහ ගතිය දුරුවීමෙන් අව්‍යාපාද, (ශෝකය ක්‍රොධයෙහි අංශයෙකි) සැපයම කැමති වන හෙයින් හිංසා මාත්‍රයකුදු නො කැමති නිසා අවිහිංසාව, යන ත්‍රිවිධ සංකල්පනයන් දියුණු වීම "සම්මාසඞ්කප්ප" යි. මෙත් සිත නිසා ම සිවු වැදෑරුම් වාග් දුශ්චරිතයෙන් ද, තෙවැදෑරුම් කාදුසිරිතින් ද, වැරදි ජීවිකාවෙන් ද, වැලකෙන හෙයින් "සම්මාවාචා කම්මන්ත ආජීව යන මාර්ගාඞ්ග ත්‍රය දියුණු වෙයි නූපන් ක්‍රොධය නූපදවන හෙයින් ද, උපන් ක්‍රෝධය දුරු කරන හෙයින් ද, නූපන් අව්‍යාපාදාදී කුසල් සිත් උපදවන හෙයින් ද, උපන් කුසල් සිත් දියුණු කරන හෙයින්ද, මෛත්‍රී චිත්තවිමුක්තිය "සම්මාවායාම" මාර්ගාඞ්ගය දියුණු කරයි.

සති, සමාධි, පෙර මෙනි. මෙසේ මෛත්‍රී චිත්තවිමුක්තිය නිසා මාර්ගාඞ්ග දියුණු වන අතර, මාර්ගාඞ්ග නිසා මෛත්‍රී චිත්ත විමුක්තිය ද, ආශසවිතාදී දියුණු තත්වයට පැමිණේ.

මෛත්‍රී චිත්තවිමුක්තිය සමාධි භාවනාව කි. එයින් දියුණු කර ගත් ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ගඞ්ග, ධර්ම ප්‍රඥ භාවනා යි. මෛත්‍රී භාවනා නිසා මෙසේ සමථයත් විදර්ශනාවත් වැඩීමෙන් සෝවාන් ආදී ලෝකෝත්තර මාර්ග ඵල ලඟා වෙයි.

මේ පටිසම්භිදාමග්ගයෙහි දැක්වෙන මෛත්‍රී භාවනා ක්‍රමය යි.

## කරණීය සූත්‍රයෙහි දැක්වෙන මෛත්‍රී භාවනා ක්‍රමය:

“සුඛිනො වා ඛෙමිනො වා හොන්තු සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා, යෙ කෙචි පාණභූතත්ථි තසා වා ථාවරා වා අනවසෙසා, දීඝා වා යෙ මහන්තා වා මජ්ඣිමා රස්ස කාණු කථූලා දිට්ඨා වා යෙව අද්දිට්ඨා, යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ භූතා වා සම්භවෙසී වා, සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා, න පරො පරං නිකුබ්බෙථ නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි බ්‍යාරොසනා පටිඝසඤ්ඤා නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය”

මෙහි කොටස් තුනකි. කෙටියෙන් මෙත් වැඩීම, සත්ව කොට්ඨාස වශයෙන් මෙත් වැඩීම, නිරුද්දිය, හා දුක් නොවේවායි බලාපොරොත්තු වීම් වශයෙන් පැතීම් හෙවත් ආශිර්වාද, යනුයි.

## 1. කෙටියෙන් මෙත් වැඩීම තුන් අයුරුයි.

i. සබ්බෙ සත්තා සුඛිනොවා හොන්තු.

සියලු සත්වයෝ කායික වූ සැපයෙනුදු සුව ඇත්තෝ වෙත්වා.

ii සබ්බෙ සත්තා ඛෙමිනො වා හොන්තු.

සියලු සත්වයෝ පස්විසි මහ බියෙන් හා උවදුරු වලින් නිදහස් වූවෝ වෙත්වා.

iii සබ්බෙ සත්තා සුඛිතත්තා භවන්තු.

සියලු සත්වයෝ සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා.

## 2. සත්ව කොට්ඨාස වශයෙන් මෙත් වැඩීම සත්වැදෑරුම්ය.

i **තසා වා ථාවරා වා යෙ කෙචි පාණභූතා අත්ථි, අනවසෙසා තෙ සබ්බෙ සත්තා සුඛිතත්තා භවන්තු.**

බිය වූ හෝ නොබිය වූවෝ හෝ යම්කිසි ප්‍රාණීහු ඇද්ද, ඉතිරි වක් නැතිව ඒ සියලු සත්වයෝ සුවපත්වූ සිත් ඇත්තෝ වෙත්වා

ii **දීඝා වා මජ්ඣිමා වා රස්සකා වා යෙකෙචි පාණභූතා අත්ථි -පෙ- සුඛිතත්තා භවන්තු.** දිග් වූ හෝ මැදුම් වූ හෝ කොටි වූ හෝ යම්කිසි - පෙර මෙති අදහස -

iii **මහන්තා වා මජ්ඣිමා වා අනුකා වා -පෙ-**
මහත් වූ හෝ මැදුම් වූ හෝ කුඩා වූ හෝ - පෙර මෙති -

iv **ථූලා වා මජ්ඣිමා වා අනුකා වා -පෙ** වට වූ හෝ මැදුම් වූ හෝ කුඩා වූ හෝ (වටකුරු සතුන්) - පෙර මෙති -

v **දිට්ඨා වා අද්දිට්ඨා - පෙ -** පෙනෙන්නා වූ හෝ නොපෙනෙන්නා වූ හෝ යම්කිසි ප්‍රාණීහු ඇද්ද = පෙර මෙති =

vi **යෙච දූරෙ වසන්ති යෙච අවිදූරෙ වසන්ති - පෙ -**

යම් සත්වයෙක් දුර වසත් ද, යම් සත්වයෙක් ළඟ වසත් ද - පෙර මෙති -

vii **භූතා වා සම්භවෙසී වා යෙ කෙචි පාණභූතා අත්ථි, අනවසෙසා තෙ සබ්බෙ සත්තා සුඛිතත්තා භවන්තු.**

වූ හෝ වෙන්නා වූ හෝ කෙවත් ඉපදුන හෝ ඉපදෙමින් සිටින හෝ යම්කිසි පණ ඇතියහු ඇද්ද, ඉතිරිවක් නැතිව ඒ සියලු සත්වයෝ සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා.

## 3. ආශීර්වාද වශයෙන් මෙත් වැඩීම, තුන් වැදෑරුම් ය.

i **කත්ථචි පරො පරං න නිකුබ්බෙථ.**

කිසි තැනෙක්හිදු අනෙකෙක් අනිකෙකු නො රවටා වා.

ii **කත්ථචි නං කඤ්චි න අතිමඤ්ඤෙථ.**

කිසි තැනෙක්හිදු ඒ කිසිවෙකු අවමත් නොකෙරේවා.

iii බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා නාඤ්ඤ මඤ්ඤස්ස දුක්ඛ මිච්ඡෙය්‍ය.

කිපුණා වූ කය - වචනයෙන්, ක්‍රෝධ හැඟීමෙන් ඔවුනොවුන්ට දුකක් නො කැමති වේවා.

## මෛත්‍රී චිත්තය වැඩිය යුතු අයුරු දක්වෙන උපමාව.

"මාතා යථා නියං පුත්තං - ආයුසා ඒකපුත්තමනුරක්ඛෙ
එවම්පි සබ්බ භූතෙසු - මානසංභාවයෙ අපරිමාණං

එකම පුතෙකු ඇති මෑණි කෙනෙක් ඒ පුතු ආයුෂයෙන් රක්නේ නැතහොත් ආයුෂය පුදා රක්නේ යම්සේ ද එසේම සියලු සත්වයන් කෙරෙහි ප්‍රමාණයක් නොමැති මෙත් සිත වඩනේය.

## මෙත් සිත පැතිරවිය යුතු අයුරු:

"මෙත්තඤ්චසබ්බලොකස්මිං - මානසංභාවයෙ අපරිමාණං
උද්ධං අධො ච තිරියඤ්ච - අසම්බාධං අවෙරං අසපත්තං"

සියලු ලෝකයෙහි උඩ, යට, සරස, යන සෑම තන්හි ම කිසිදු තැනක අවහිරයක් නැති, වෛරයක් නැති, සතුරන් නො මැති, අප්‍රමාණ වූ මෛත්‍රී චිත්තය වඩන්නේය.

## සෑම ඉරියව්වකදීම මෙත් වැඩිය යුතු අයුරු:

"තිට්ඨං චරං නිසින්නො වා - සයානො වා
යාවතස්ස විගතමිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය - බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු"

සිටින්නේ හෝ ඇවිදින්නේ හෝ හුන්නේ හෝ නිදගන්නේ නමුදු නින්දට යන තෙක් හෝ ඒ මෙත් සිහිය ඉටන්නේ ය. එය බ්‍රහ්මවිහරණයෙකැයි මේ ශාසනයෙහි කීහු.

## විදසුන් වඩා මාර්ග-ඵල අවබෝධ කරගන්නා අයුරු:

"දිට්ඨිං ච අනුපගම්ම - සීලවා දස්සනෙන සම්පන්නො
කාමෙසු විනෙය්‍ය ගෙධං - නහිජාතුගබ්භසෙය්‍යං
පුනරෙතීති."

මමය, මාගේය, සත්වයාය, යන වැරදි හැඟීමකට ද නො පැමිණ, සිල්වත් වූයේ (ලෝකෝත්තර ශීලය) පළමුවැනි සෝවාන්

මාර්ග දර්ශනයෙන් යුක්තව, කාමයන්හි තද ආශාව දුරු කොට, නැවත කිසි කලෙක්හි මව් කුස නිදීමකට - ඉපදීමට - නො එයි

මෙසේ කරණීය සූත්‍රයේදී මාර්ග - ඵල අවබෝධය තෙක් මෛත්‍රී භාවනා ක්‍රමය දේශනා කළ සේක. සූත්‍රයෙහි ප්‍රථමයෙන් දක්වූයේ නිවන් දක්නට කැමතියහු විසින් පිළිපැදිය යුතු ගුණ ධර්ම මාලාවකි. ඒවා මෙහි ලා විස්තර කිරීම ප්‍රපඤ්චයට - ප්‍රමාදයට - කරුණකි.

ඉහත දැක්වූ භාවනා ක්‍රමයන්හි දැනගත යුතු කරුණු:

තසා: බිය වූවෝ ය. තෘෂ්ණාව සිත තුළ ඇති සියල්ලෝම මෙයට ගැනෙති. අර්හත් ඵලයෙන් මෙහා සියලු ශෛක්ෂයෝ ද ඇතුළත්යහ. ඒ සියල්ලෝ ම තැතිගන්නෝ වෙත්.

ථාවරා: බිය නො වූවෝ ය. ස්ථාවර - නො සෙල්වෙන - අයයි. එනම් රහත්, පසේබුදු, ලොව්තුරා බුදු, උතුමෝ ය.

දීඝා: දිග් සත්වයෝ. නයි, පොළොං, පිඹුරු, ආදීන්. දිග් මාළුවෝ යනාදීහුයි.

මහන්තා: මහත් සත්වයෝ. ඇතුන්, තල්මසුන්, ආදීහුයි.

රස්සකා: අනුකා; කොට, කුඩා සත්වයෝ. දිගින් ඉතා අඩු පත්තෑ, කන්වෑ ආදීහු හා කුහුඹු, දිමි, කඩි, ආදීහු ද, වටකුරු සතුන් වූ මකුණෝ, උකුණෝ, බිංකුත්තෝ ආදීහු ද යන මොහුයි.

මජ්ඣිමා: දිග් - මහත - වටකුරු මහත, මේ වශයෙනුත් ඉතා කුඩා ද නො වූත් සත්වයෝ ය. මිනිස්, ගව, අස්, බලු, බළල්, ආදී ගොඩ වසන සත්හු ද, මෝරු, කටුවල්ලෝ, තෝරු ආදී දිය වසන සත්හු ද ගැනෙති.

භූතා: ඉපදුන සත්වයෝ ය. මෙයින් සසර ලොවෙක හෝ ඉපදුන සත්වයා ද, නැවත ඉපදීමක් නො මැති රහත්හු ද ගැනෙති.

සම්භවෙසී: ඉපදෙමින් සිටින සත්වයෝ ය. එනම් මව්කුස, බිජුවට, වෙසෙන සත්වයෝ සහ සියලු පෘථග්ජන, ශෛක්ෂයෝ ය, මේ දෙපක්ෂය ම නැවත ඉපදීමක් බලාපොරොත්තු වෙති. එසෙයිති,

නික්‍ඛෙබාථ: වඤ්චා නො කෙරේවා. වඤ්චා කිරීම නම් රැවටීමයි. එක් කපටි මිනිසෙක් මුවෙකු හා මුව පැටවෙකු ඇර ගෙන යන මිනිසෙකු දැක, මිලදී ගන්නා අදහසින් විමසීය. එවිට ඒ මිනිසා මුවා කහවණු දෙකක් ද, පැටවා එක් කහවණුවක් ද මිලයයි කීය. "මා අත ඇත්තේ කහවනුවකි. එහෙයින් එය ඇරගෙන මුව පැටවා දෙන්න යැ"යි මුව පැටවා ඇරගෙන, මඳ දුරක් ගොස් නැවත ආපසු හැරී, "මට පැටවා ගෙන් වැඩක් නැත. එහෙයින් පැටවා ගෙන මුවා දෙන්නයැ"යි කීය. මුවා දීමට කහවණු දෙකක් දෙන්න යැයි කියන්ම, හේ "හොඳයි පළමුවෙන් කහවණු වක් දී ඇත. අනෙක් කහවණුව වෙනුවට කහවණුවක් වටිනා මුව පැටවා ගන්නයැ"යි කීය. මිනිසා රැවටී පැටවා රැගෙන මුවා දුනි, මෙබඳු දෑ වඤ්චා නම්. තමා පමණක් නොව කිසිදු කෙනෙක් එබඳු වඤ්චා නො කෙරේවා'යි බලාපොරොත්තු වීමයි.

අතිමඤ්ඤථ: ඉක්මවා නො සිතාවා. ඉක්මවා සිතීම නම් පහත් කොට හෝ උසස් කොට හෝ සමාන කොට හෝ සැලකීම යි. මෙය නවවිධ මානයයි.

සෙය්‍යස්ස සෙය්‍යොහමස්මීති' සෙය්‍යස්ස සදිසො හමස්මි සෙය්‍යස්ස හීනොහමස්මි, සදිසස්ස සෙය්‍යොහමස්මි, සදිසස්ස සදිසො හමස්මි, සදිසස්ස හීනොහමස්මි හීනස්ස සෙය්‍යොහමස්මි හීනස්ස සදිසො හමස්මි, හීනස්ස හීනොහමස්මි"–වි. ප. ඛුද්දක වත්‍ථු. උසස් තැනැත්තාට උසස් වෙමි. සමාන වෙමි. පහත් වෙමි. සමාන තැනැත්තාට උසස් වෙමි සමාන වෙමි. පහත් වෙමි. පහත් තැනැත්තාට උසස් වෙමි. සමාන වෙමි. පහත් වෙමි. මේ ඒ නව වැදෑරුම් මානය යි. මේ අයුරින් කිසිවෙක් කිසිවෙකු ඉක්මවා නො සිතාවා යි සත්වයන් ගැන බලාපොරොත්තුවීම ද මෛත්‍රියකි.

ඛ්‍යාරෝසනා: කිපීම නිසා ඇතිවන කායික ක්‍රියා, වාචසික ක්‍රියා. එනම් දබර කිරීම්, වෙඩි තැබීම්, ඇණීම්, කෙටීම්, ආදිය හා පරුෂ වචන කියා බැන දෙඩීමයි.

පටිඝසඤ්ඤා: තරහ ගතිය සිතෙහි තබා ගැනීම. 'අසවලා මට මෙසේ කළා, කීවා, මම කවදා හෝ ඔහුගෙන් පළිගනිමි" යන හැඟීම පටිඝසඤ්ඤා යි. මෙය ද නවවිධ ය. "අනත්‍ථං මෙ අචරි, චරති, චරිස්සති. පියස්ස මෙ මනාපස්ස අනත්‍ථං අචරි, චරති,

චරිස්සති, අප්පියස්ස මෙ අමනාපස්ස අකාසිං අචරි, චරති, චරිස්සති - වි. ප. බුද්ධක වත්‍ථු (දසවලා) මට අවැඩක් කලේය - කරයි - කරන්නේය, මගේ යහළුවාට අවැඩක් කලේය - කරයි - කරන්නේය, මගේ සතුරාට වැඩක් කලේය - කරයි - කරන්නේය, යනුයි. තුන් දෙනා සම්බන්ධයෙන් කාල තුනක් දක්වෙන හෙයින් නව අයුරු වෙයි. කමද, කණු, කටු, ගල් ආදියෙහි හැප්පීම නිසා කරන ලදදියි. ඒ අස්ථාන වෛරයයි. එයත් ඇතුළත් කොට දස වැදෑරුම් ලෙස පටිසම්භිදායෙහි දක්වේ.

“අඤ්ඤමඤ්ඤස්ස දුක්ඛං න ඉච්ඡෙය්‍ය” : ඔවුනොවුන්ට දුකක් නො කැමති වේවා. පෙර දක්වූ පරිදි තමා ගේ කිපීම නිසා හෝ අනුන් ගේ කිපීම නිසා හෝ ඒ කිසිදු දෙයකින් ඔවුනොවුනට අයහපතක්, නපුරක්, සිත් තැවුලක්, වේදනාවක් නො වේවායි බලාපොරොත්තු වීම වශයෙන් සිතීමයි. එද මෛත්‍රියකි.

“අසම්බාධං අවෙරං අසපත්තං අපරිමාණං මෙත්තං මානසං”: අවහිරයක්, වෛරයක්, සතුරෙක්, ප්‍රමාණයක් නැත්තා වූ මෙත් සිත යනු අදහසයි. මෙයින් මෙත් සිතෙහි අයුරු දක්වූ සේක. හුදු මෙත් සිත අතර තුරදී කමුදු පැමිණෙන තරහ ගතියකින් හෝ දූෂිත නො වෙයි. ඒ නිසාම නො හැකිලෙයි. පිපුණු මලක් හා සමානය. නිදිකුම්බා මැලවී යම්ක් වැදුනොත් හැකිලේ. පෙලවෙන මෙත් සිත ද එමෙනි. හුදු මෙත් සිත, කොපමණ රිදීම්, සිත් වේදනා පැමිණියත් එසේ නො හැකිලෙයි. එසේ ම සඳුන් රුක පොරවෙන් කපන වාරයක් පාසා පොරොව සුවඳවත් වන්නා සේ, මෙත් සිතින් යුත් තැනැත්තෝ ද කොපමණ තැලුම්, කැපුම් ආදිය ලැබුවත් මෙත්ම පතුරුවයි. (කුඩා ධම්පාල කුමරු මෙනි) තමද ඔහු කෙරෙහි වෛර මාත්‍රයක් නැත. නො කිපෙන හෙයින් සතුරෙකු ද නැත. සතුරන් ඇති වනුයේ තමා ද කිපීමෙනි. හුදු මෙත් සිත ඒ හැම දෙයක් ම ඉවසන හෙයින් සතුරන් නො මැකිමෙනි. “මගේ මෙත් සිත අසවලාටය, අසවල් දිසාවට පමණි” මෙසේ වෙන් කිරීමක් හුදු මෙත් සිතෙහි නැති. එය ප්‍රමාණයක් නො මැති සත්වයා උදෙසා, හැම දිසාවක් කෙරෙහිම පවතින්නකි. එහෙයින් අප්‍රමාණයි. මෙසේ සිවුගුණයට සැම දෙයක් ම ඇතුළත් වන සේ මෛත්‍රී චිත්තය - මෙත්තං මානසං - වර්ණනා කොට දක්වූ සේක.

“දිට්ඨිං ච අනුපගම්ම” වැරදි දැකීමට ද නො පැමිණ. මෙහි වැරදි දැකීම යනු සක්කාය දිට්ඨියයි, “සක්කායෙ දිට්ඨි සක්කාය දිට්ඨි” තම සිරුර ගැන වැරදි දැකීම, සක්කාය දිට්ඨියයි. ඒ වැරදි

දැකීම ම සත්වයා වෙත හරවා "සත්ත්වයෙක පුද්ගලයෙක" යනාදි වශයෙන් ගැනීම ද මෙයට ඇතුළත් ය. මේ දෙකට නො පැමිණ යන්න ඉහත කී පදයෙන් අදහස් කෙරේ. මෙයින් මෙත් සිත විදර්ශනාවට නංවන අයුරු දක්විණ:

මෙත් සිත නිසා උපදවා ගත් ධ්‍යානයෙන් නැගී ඒ ධ්‍යාන යන්හි එකට යෙදී පවත්නා චිත්ත-චෛතසිකයන් ද, ඒ ඇසුරු කොට පවත්නා හෘදය වස්තුරූපය හා ඊට සම්බන්ධ සියලු සම්මර්ශන රූප ද, (සම්මර්ශන රූප 18 කි) විමසා බැලීමෙන් දිට්ඨි විසුද්ධිය ලබා, ඉක්බිති ඒවාට හේතු සොයා ගැනීමෙන් සැක ද දුරුකොට, තමා ගැන සිතාගත් කල්හි සක්කාය දිට්ඨිය තුනී වේ. ඒ අයුරින් ම මෙත් සිතට අරමුණු වූ සත්වයා ගැන සිතත් ම ඔවුන් ද ප්‍රත්‍යය - ප්‍රත්‍යයසමුත්පන්න ධර්ම සමූහයකැයි හැඟේ. මෙසේ ආධ්‍යාත්මික, බාහිර, (තමා පිළිබඳ අනුන් පිළිබඳ) ධර්ම සමූහ, අනිත්‍යාදී ලක්ෂණත්‍රයට නගා විදර්ශනා කිරීමෙන් වැරදි දැකීමකට නො පැමිණ, නිදහස් විය හැක. මෙසේ විදර්ශනාවට නංවන අයුරු දේශනා කළහ.

"සීලවා": සිල්වත් වූයේ. ලෝකෝත්තර ගුණයක් ඉපද වීමට සමත් සිවුපිරිසුදු සීලයත්; ලෝකෝත්තර මාර්ගයන්හි යෙදුනු විරති චෛතසිකයන් මෙයට ඇතුලත් වේ. මෙත් සිත නිසා ලෞකික හැම සීලයකින්ම යුක්ත විය හැක. එසේ ම ලෝකෝත්තර සීලයටත්, උපනිශ්‍රය කරගත හැක. ලෝකෝත් තර ශීලය ස්වභාවයෙන් ම අව්‍යාපාද, අවිහිංසා, දෙකින් යුක්තය. (මාර්ගාංග සම්බන්ධතාවය නිසාය)

"දස්සනෙන සම්පන්නො" දර්ශන සම්පත්තියෙන් යුක්ත වූයේ. එනම් සෝවාන් මාර්ග ඥානයට අනුව චතුරාර්ය සත්‍ය ධර්මයන් දැකීමෙන් ද, නිර්වාණය දැකීමෙන් ද, යුක්ත වූයේ යනුයි. සෝවාන් මාර්ගයේදී සිවුසස්, නිවණ; දක්නා හෙයින් එය දර්ශන සම්පත්තියයි කියනු ලැබේ.

"කාමෙසු විනෙය්‍ය ගෙධං": කාමයන් කෙරෙහි ආශාව දුරු කොට මෙයින් අනාගාමී, රහත්, යන මාර්ග-ඵල අවබෝධය දක්වෙයි. සෝවාන්වූ නමුදු කාමරාගය දුරු නොවේ. එහෙයින් නැවත නැවත විදර්ශනා වඩා, සකෘදාගාමී වීමෙන් කාමරාගයෙහි ඖදාරික බව අඩුකළ යුතුය. ඉක්බිති අනාගාමී මාර්ගයේදී කාමරාගය සම්පූර්ණ යෙන් දුරුවෙයි. එහෙත් රූපරාග, අරූපරාග - රූපාරූපලෝක යන්හි ඇල්ම - දුරු නො වෙයි. ඒ දෙක දුරුවනුයේ රහත් මාර්ග

යති. මෙසේ රහත් මාර්ගය තෙක් මෛත්‍රී ධ්‍යාන පාදක විදර්ශනාව වැඩිය යුතුය. රහත් නොවූයේ නම් බඹලොව උපදියි. "ගබ්භසෙය්‍යං න පුනරෙති" යන්නෙන් රහත් බව හෝ අනාගාමී බව දක්වෙයි. අනාගාමී වූවහොත් ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකයෙහි උපදිනු මිසා නැවත කාමලෝකයෙහි මව්ගැබක පිළිසිඳ ගැනීමට නො එයි.

මේ කරණීය සූත්‍රයෙහි ආ මෛත්‍රී භාවනා ක්‍රමය යි

## ඛන්ධ සූත්‍රයෙහි මෛත්‍රී භාවනා ක්‍රමය:

"විරූපක්ඛෙහි මෙ මෙත්තං - මෙත්තං ඒරාපථෙහි මෙ
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං මෙත්තං කණ්හාගොතමකෙහි ච
අපාදකෙහි මෙ මෙත්තං - මෙත්තං දිපාදකෙහි මෙ
චතුප්පදෙහි මෙ මෙත්තං - මෙත්තං බහුප්පදෙහි මෙ
මා මං අපාදකො හිංසි - මා මං හිංසි දිපාදකො
මා මං චතුප්පදො හිංසි - මා මං හිංසි බහුප්පදො
සබ්බෙ සත්තා සබ්බෙ පාණා - සබ්බෙ භූතා ච කෙවලා
සබ්බෙ භද්‍රානි පස්සන්තු - මා කඤ්චි පාපමාගමා"

මගේ මෛත්‍රිය විරූපාක්ෂ නාගකුලයත් සමගය. නැතහොත් විරූපාක්ෂ නාගකුලයත් මගේ මෛත්‍රියට ඇතුලත් වේවා. ඒරාපථ, ඡබ්‍යාපුත්ත, කණ්හාගොතමක, එම නාගකුලයන් සමග ද එසේම ය. මගේ මෛත්‍රිය පා නැති, දෙපා - සිවුපා - බොහෝ පා ඇති සතුන් සමගය. නැතහොත් මගේ මෛත්‍රියට එකී සතුන් ඇතුලත් වේවා. එසේම ඒ සියලු සත්වයෝ මට හිංසා නො කෙරෙත්වා. සියලු සත්වයෝ - ප්‍රාණීහු - භූතයෝ හැමදෙනා ම යහපතම දකිත්වා. කිසිවෙකු කෙරෙහි දුකක් ඇති නො වේවා, යනු කෙටි අදහසයි.

## 2. කරුණා භාවනාව.

දුකට පත් වූ සත්වයකු දුටු කල්හි යහපත් මිනිසුන් ගේ සිතෙහි ඇතිවන "කම්පන" ස්වභාවය, අහෝ! මේ කුමක් දැයි වශයෙන් සෙලවීම, කරුණා නම්. "පරදුක්ඛෙ සති සාධූනං හදය කම්පනං කරොතීති කරුණා" අනුන් ගේ දුක ඇති කල්හි සාධූන් ගේ හෘදය කම්පනය කෙරේනුයි කරුණායි. ජීව වූවා හෝ වේවා නොවූවා හෝ වේවා දුක දුටු කල්හි ඇතිවන

දයා ගතිය, හිත උණුවන ගතිය, "කෙසේ හෝ මොහු මෙයින් ගැලවේ නම් ඉතා හොඳයයි සිතන ගතිය, කාරුණා ගුණය බව වැඩිදුරටත් තේරුම් ගත යුතුය. කරුණාවෙහි ලක්ෂණය –හැටි– දුකට පත්වූවන් ගේ දුක් දුරු කරන ආකාරයෙන් පැවැත්මයි. එයින් කෙරෙන වැඩය – කෘත්‍යරසය – දුක් නො ඉවසීමය. වැටහෙන ආකාරය අවිහිංසාවයි. අසරණ බව දැකීම ආසන්න කාරණයයි. කරුණාවෙහි සම්පත්තිය – සැපත – විහිංසා, පීඩා කිරීම් දුරුකිරීමයි. විපත්තිය නම් ශෝක හටගැනීමයි. ශෝකය කරන ගතියේ එක් අංගයෙකි.

**කරුණා භාවනා ක්‍රමය:**

කරුණාව වඩනු කැමැත්තහු විසින් අකරුණාවෙහි ද, විහිංසාවෙහි ද, දොස් විමසිය යුතු. කරුණාවෙහි ආනිශංස සැලකිය යුතු. දුඃඛිත සත්වයෙකු දුටු විට "මෙබඳු දුක් මටත් පැමිණියොත් මා කෙසේ දරා ගනිම්ද" යනාදී වශයෙන් තමා කෙරෙහි හරවා බලා, මා සේ ම ඔහුත් එයින් නිදහස් වීමට කැමති යයි කල්පනා කළ යුතු. එසේ මෙනෙහි කරත් ම කරුණා ගුණයෙහි වටිනාකම තමාටම වැටහෙයි. හැඟෙයි. ඉක්බිති ඒ දුඃඛිත සත්වයා කෙරෙහි දක්වූ කරුණාව; මෛත්‍රී භාවනාවට දක්වූ සියලු ක්‍රමයන්ට හරවා, මුළු ලොව සියලු සතුන් වෙත පැතිර විය යුතු. එහෙයින් වදාළහ:

"කථඤ්ච භික්ඛවෙ භික්ඛු කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති? සෙය්‍යථාපි නාම එකං පුග්ගලං දුග්ගතං දුරුපෙතං දිස්වා කරුණායෙය්‍ය, එවමෙව සබ්බෙ සත්තෙ කරුණාය ඵරති"– වි. පී,

මහණෙනි, භික්ෂු තෙමේ කරුණා සහගත සිතින් එක් දිසා වක් පතුරුවා වාසය කරන්නේ කෙසේ ද? යම්සේ වනාහි රෝග යකින් හෝ පහත් කුලාදියකින් හෝ දුගීත - දුකට පත් වූ, සතුන් මැරීම් ආදී ලාමක පැවතුම් නිසා යහ ගති වලින් සුන්, (දුරුපෙත) එක් පුද්ගලයෙකු දැක කරුණා කරයි ද, එසේම සියලු සත්වයන් කෙරෙහි කරුණාවෙන් පතුරුවයි.

කරුණා භාවනාව සඳහා කමටහන මූලික වශයෙන් ගැනීමට දුකට පත්වූවෙකු අරමුණු කළ යුතුය. ඉක්බිති සෙසු සත්ව සමූහයා කෙරෙහි පවත්නා දුඃඛිත ස්වභාවය හෝ සතුන් මැරීම් ආදී පාපකම් නිසා සතර අපා දුකට භාජනවන ස්වභාවය

හෝ එසේත් නැතිනම් "මේ සියලු සත්වයෝ ජාති, ජරා, මරණාදි භයානක සසර දුකට පත්වූහ"යි දුකට පත්වූ ස්වභාවය හෝ හැකිනම් ඒ සියල්ල හෝ මෙනෙහි කර, සියලු සත්වසමූහයා අරමුණු කළයුතු. මෙසේ දුකට පත්වූවහු කෙරෙහි කරුණා සිත දියුණු කිරීමෙන්, අර්පණා – ධ්‍යාන – උපදවා, ඉක්බිති එක් දිශාවක් දෙදිශාවක් ආදී වශයෙන් මෛත්‍රී භාවනාව මෙන්, මුළු ලොව සියලු සතුන් කෙරෙහි පැතිරවීමෙන් කරුණා භාවනාව නිසා බොහෝ අර්පණා ඉපදවිය හැකි බව දතයුතු.

එසේ ම කරණීය සූත්‍රයේ දැක්වූ අයුරින් "සත්වයාය යන වැරදි හැඟීමකට පත් නොවී සංස්කාර ධර්ම සමූහයකැයි සලකා, ක්‍රමානුකූලව විදර්ශනා වඩමින් දිට්ඨිවිසුද්ධි ආදී සප්තවිසුද්ධි අනුසාරයෙන් ලෝකෝත්තර මාර්ග ඵල උපදවා නිර්වාණ සුඛාස්වාදනය කළ හැකිය, (වැඩි විස්තර මෛත්‍රී භාවනා ක්‍රමයෙන් දතයුතු.)

කරුණා භාවනාව නිමි.

## 3. මුදිතා භාවනාව.

සතුටු බව මුදිතාවයි. තමාගේ බලාපොරොත්තු ඉටුවීම වශයෙන් හෝ පස්කම් සැප විඳීම් වශයෙන් හෝ අනුන්ට – සතුරාට – අයහපතක් වූ බව දැකීම් වශයෙන් හෝ සිතෙහි උපදින සතුටු බව – මුදිතාව – මෙහිදී නො ගන්නා බව පළමු වෙන්ම දතයුතුය. එසේ නම් කොබඳු මුදිතාවක්ද? සැපතට පත් තම ඉතා ම යහළුවකු දුටු විට ඇතිවන පුබුදු ගතියෙන් යුත් මුදිතා – සතුටුබව යි. ඒ සතුට ඇති වනුයේ මෙත් සිතත් සමඟම ය. එහි ස්වභාවය මෙසේය. "මොදන්ති තාය තං සමඞ්ගිනො, සයං මොදති මොදනමත්තමෙවවා මුදිතා;" යම් ධර්මයක් – ස්වභාවයක් – නිසා එයින් යුක්තවූවෝ සතුටු වෙත්ද, තෙමේ හෝ සතුටු වෙයිද, සතුටුවීම් මාත්‍රයක් ම හෝ වෙයිද, ඒ මුදිතා නමි. මුදිතාවෙන් යුක්තවූවහු සතුටු වෙති. සතුටු වීම ඔහුගේ ස්වභාවයයි යනු අදහසයි.

මුදිතාවෙහි ලක්ෂණය අනුන්ගේ සැපතෙහි සතුටු වීමයි. රසය හෙවත් කෘත්‍යය – වැඩය – ඊර්ෂ්‍යා නො කිරීමයි. අනුන්ගේ සම්පතෙහි, පින්කමිහි, නො ඇලෙන ගතියක් ඇද්ද, එය දුරු කිරීම වැටහෙන කාරණයයි. අනුන්ගේ සම්පතෙහි නො ඇලෙන

ගතිය දුරු කිරීම යනු ඒවා තමාට පවරා ගැනීමට ආශා කිරීම නොව, තමාට ලැබුණු සම්පතක් අයුරින් ඉවසන ගතියයි. ආසන්න කාරණය, අනුන් ගේ සම්පත් දැකීම. මුදිතාවේ යහපත’ සම්පත්තිය - නම් නො ඇලීම, නො ඉවසීම, සංසිඳවීමයි. විපත- විපත්ති- රාගයට අනුව ගිය ප්‍රේම වශයෙන් සිනහ හටගැනීමයි.

### මුදිතා භාවනා ක්‍රමය:

මෙය ද කරුණා භාවනාව පරිදියි. වෙනස. මෙහිදී පළමු කොට සැපතට පත්වූ ඉතා යහළුවා අරමුණු කිරීමයි. මෙසේ ආරම්භ කොට, නැවත නැවත මුදිතා වශයෙන් මෙනෙහි කරමින් අර්පණා උපදවිය යුතු. ඉක්බිති මෛත්‍රී භාවනාවේ සේ ක්‍රමානුකූලව සියලු සත්වයන් අරමුණු කරමින් පැතිරවිය යුතු. එසේ අරමුණු කරද්දී සත්වයා ගේ දුඃඛිත ස්වභාවය සිහි නො කොට, යාළුවා සේ මොවුන් ද සැපතට පත් වුවහොත් ඉතා යහපතැයි අනාගත වශයෙන් සිත තබා සිහිකට යුතුය. සතුරා කෙරෙහි මුදිතාව කරවද්දී කෝපය, ඊර්ෂ්‍යාව නැග එයි නම් නැවත මෛත්‍රී වඩා සිත දියුණු කළ යුතුය, මෛත්‍රී භාවනාව සේ මිතුරා, මැදහත්තා, සතුරා, ඉතා යහළුවා, යන සතර දෙනා කෙරෙහි ම වෙනසක් නො මැතිවූ විටය. අර්පණා උපදිනුයේ. සියලු සත්වයන් කෙරෙහි පැතිර විය යුත්තේ ඊට පසුව ය,

මෙසේ වඩත් ම අර්පණා මෛත්‍රී භාවනාවේ පරිදිම උපදී. ඒ මත පිහිටා, ධ්‍යාන සිත් හා එහි යෙදුනු චෛතසිකයන්ද මෙනෙහි කොට; ඒ සමඟ රූපධර්මයන් ද රැගෙන විදර්ශනා වැඩූ කල්හි පෙර කී සේ ලෝකෝත්තර මාර්ග-ඵල ලබා නිර්වාණ සුඛය වින්දනය කළ හැක.

## 4. උපෙක්ඛා භාවනාව.

උපෙක්ඛා යනු මැදහත් වීමයි. උපෙක්ඛා රාශියකි. ඒවා පිළිබඳ විස්තර පසුවට තබා, බ්‍රහ්මවිහාර භාවනාවන්හිදී කියැවෙන උපෙක්ඛාව හඳුන්වනු ලැබේ. බ්‍රහ්මවිහාර භාවනාවන්හිදී ගනු ලබන උපෙක්ඛාව නම් සතුන් වෙත හිතවත් භාවය පැතිර වීමෙන් ද, කරුණා ගුණය, මුදිතා ගුණය, පැතිර වීමෙන් ද, අත් වී ඒ සෑම තන්හි ම මැදහත් වීමයි. එහි ක්‍රමය පසුවට එයි. ‘අවෙර හොන්තූති ආදිව්‍යාපාරප්පහානෙන මජ්ඣත්තභාවූපගමනෙන ච උපෙක්ඛතීති උපෙක්ඛා’’ මෙවර කැත්තෝ

මෙත්තා ආදී වශයෙන් වැයම් කිරීම දුරු කිරීමෙන් ද, මැදහත් බවට පත්වීමෙන් ද, මැදහත්වේනුයි උපෙක්ඛායි. මේ අටුවා පාඨයේ අයුරින් සලකා ගත යුත්තේ මෛත්‍රී, කරුණා, මුදිතා, භාවනා තුනෙහිදී ගත් උත්සාහය දුරුකොට මැද්හත්වීම උපෙක්ඛා නම්, යන්නයි. මෙහි ලක්ෂණය නම් සත්වයන් කෙරෙහි මැදහත් වශයෙන් පැවැත්මයි. රසය සියලු සත්වයන් වෙනසක් නොමැතිව සමසේ දකීමයි. වෛරය හා මිත්‍රකම සංසිඳවීම වැටහෙන කාරණයයි. ආසන්න කාරණය සත්වයාගේ කර්ම අයිතිවාසිකම දකීමය. උපෙක්ඛාවේ සම්පත්තිය ප්‍රතිඝය-වෛරය; අනුනය - මිත්‍රකම, සංසිඳවීමයි. විපත්තිය මෝහය අනුව ගිය උපෙක්ෂාවයි.

## උපෙක්ඛා භාවනා ක්‍රමය:

මෙය වැඩිය යුත්තේ මෛත්‍රාදී බ්‍රහ්මවිහාර තුනෙන් උපදවා ගත් තුන් වැනි ධ්‍යානය ඇත්තහු විසින් ය. උපෙක්ඛාව මූලික කම්ස්ථානයක් නො වන බව මේලාසනින් ම සඳහන් කොට ඇත. තෘතීය ධ්‍යානය ලබාගත් යෝගියා පළමු කොට මෙසේ සැලකිය යුතු මෛත්‍රිය නිසා මමත්වය ඇතිවෙයි. එහෙයින් සිතෙහි තද ගැත්මක් උපදී. කරුණාව දෞර්මනසට ආසන්නය. මුදිතාව සෞමනස දියුණු කරන්නකි. එහෙයින් ඒ භාවනා තුනම ගොරෝසුය - ඖලාරිකය - උපෙක්ඛාව ශාන්තය. ප්‍රණීතය. ඉක්බිති ස්වභාවයෙන් මධ්‍යස්ථ පුද්ගලයා වෙත උපෙක්ඛා වැඩිය යුතු. ඒ බැවි බුදුරජාණන් වහන්සේ මෙසේ දක්වූහ. "කථඤ්ච භික්ඛවෙ භික්ඛු උපෙක්ඛා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති? සෙය්‍යථාපි නාම එකං පුග්ගලං නෙව මනාපං න අමනාපං දිස්වා උපෙක්ඛකො අස්ස එවමෙව සබ්බ සත්තෙ උපෙක්ඛාය ඵරති" - වි. ප. මෙහි තේරුම පහසුය.

එසේ මධ්‍යස්ථයා කෙරෙහි උපෙක්ඛාව පුරුදුකොට පසුව සෙසු බ්‍රහ්මවිහාර සේ සීමා බිඳිය යුතුය. යම් විටෙක අතිප්‍රියයා, ප්‍රියයා, මධ්‍යස්ථයා, සතුරා, යන සිවුදෙනා කෙරෙහි ම සමබවක් උපදියිද, එවිට සීමා බිඳෙයි, එය ම නැවත නැවත සේවනය කිරීමෙන් චතුර්ථ ධ්‍යාන වශයෙන් අර්පණා උපදී. ඊට පසු සියලු සත්වයන් කෙරෙහි උපෙක්ඛාව හරවා පැතිරවිය යුතු. මෙසේ ලබාගත් ධ්‍යාන මත පිහිටා පෙර සේ විදර්ශනා කිරීමෙන් ලෝකෝත්තර මාර්ග-ඵල උපදී. මූලින් සඳහන් කළ ආනිශංස ද හිමි වෙයි.

## සතර බ්‍රහ්මවිහාරයන් පිළිබඳ දතයුතු කරුණු:

"විසුද්ධිමග්ගාදිවසා චතස්සො හිතාදිආකාරවසා පනාසං
කමොපවත්තන්තිච අප්පමාණෙ - සා ගොචරෙ
යෙන තදප්පමඤ්ඤා

පිරිසිදු වීමේ ක්‍රම වශයෙන් හා හිතවත්කම් ආදී වශයෙන් සතරක් විය. යම් හෙයකින් ඒවා ප්‍රමාණයක් නැති සත්ත්වසමූහයක් කෙරෙහි පවතිද්ද, එහෙයින් ''අප්පමඤ්ඤා'' නම්.

මෛත්‍රිය, ව්‍යාපාද - ක්‍රොධ - ගයි බොහෝ සෙයින් පවත්නහුට පිරිසුදු වීමේ මාර්ගයයි. - විශුද්ධි මාර්ගයයි. විහිංසා - හිංසා කිරීම - ඇත්තහුට කරුණාව, ඊර්ෂ්‍යාව නිසා නො ඇලෙන (අරති) බොහෝ කොට ඇත්තාට මුදිතාව, රාගය බහුල කොට ඇත්තාට උපෙක්ෂාව, මේ වශයෙන් විසුද්ධි මාර්ග වෙයි. තවද, මෑණියෝ තම පුතු කෙරෙහි ළදරු අවස්ථාවේදී දියුණුව කැමතිවීම වශයෙන් මෙත් සිත යොදත්. රෝගී වූ විට කරුණාව ද, තරුණ කාලයේදී තම පුතුගේ දියුණුව දැක, ඊට සතුටුවීම් වශයෙන් මුදිතාව ද, ඉක්බිති ඔහුට තම ශක්තියේ අයුරින් ජීවත් වීමට අවකාශ දීම් වශයෙන් උපෙක්ෂාව ද යොදත්, එසේ ම බ්‍රහ්ම විහාර වඩන්නහු විසින් ද එබඳු පැවතුම් සතරක් සත්වයන් කෙරෙහි යෙදවිය යුතුය. ප්‍රථමයෙන් සියලු සතුන් ගේ දියුණුව ද, දෙවනුව දුකට පත්වූවන් ගේ නැසීම ද, සැපතට පත්වූවන් කෙරෙහි ඒ සැපත එසේ ම පවතීවා වශයෙන් සපිර කිරීම ද අවසාන වශයෙන් ඒ සැම කැකක් ම මැදහත් බවෙන් යුතුව සිතීම ද, යෙදවිය යුතු. මෙසේ විශුද්ධිමාර්ගාදී වශයෙන් බ්‍රහ්ම විහාර සතරක් ම වේ,

ප්‍රවෘත්ති පිළිවෙල:- යෝගියා පළමුකොට තමා උපමා කර සියලු සත්වයන් කෙරෙහි හිතවත්කම දක්වයි. එක ම දරුවෙකු සිටින මෑණියෙක මෙනි. එවිට තමා හා සත්වයා අතර වෙනසක් නො පෙනෙයි. මා ද සත්වයෝ ද සැම දෙන සුවසේ විසිය යුත්තෝ වෙත් යයි හැඟේ. මෙසේ හිතවත් අයුරින් බලන කල්හි දුකට පත් වූ බොහෝ සත්වයන් දැක, ''අහෝ! මොවුන් කෙසේ හෝ දුකින් නිදහස් කළහොත් යහෙකැ''යි කරුණාව උපදියි. ඉක්බිති සැපයට පැමිණියවුන් දැක, ඒ සැපය එසේම පවතීවා යි මුදිතා ගුණය දක්වයි. මෛත්‍රී ගුණය නිසා සත්වයා දෙස එසේ බැලූ නමුදු දුඃඛිතයන් සියල්ල සුවපත් කිරීම ද නො හැකි දෙයකි. සුවපත් වූවන් ද පසුව ඒ සැපයෙන් පිරිහෙන නිසා එය ද සපිර කිරීමට නොහැකි දෙයකි. එසේ ම ඒ අයුරින් සිත යෙදවූවකොත්

මමත්වය, ශෝකය, අධික ප්‍රීතිය දියුණු වෙයි. මමත්වය දියුණු වීමෙන් සුළු දුකෙහිදී පවා ශෝක ඇතිවේ. ශෝක යනු ක්‍රෝධ මැයි. සතුට වැඩිවීම රාගයට හේතුයි. මේ වශයෙන් සිතා බලා මැදහත් ගුණය උපදවයි. සතර බ්‍රහ්මවිහරණයන්ගේ පිළිවෙල මෙපරිදියි.

අප්පමඤ්ඤා: සත්ව සමූහයාගේ ප්‍රමාණයක් නැත. ඒ අප්‍රමාණ සත්ව සමූහයන් කෙරෙහි මේ සතර යොදවන හෙයින් අප්පමඤ්ඤා නම් වෙයි.

මෙසේ විසුද්ධිමාර්ගී, හිතවත්කම ආදිය, ක්‍රමය, යන මේ කරුණු නිසා බ්‍රහ්මවිහාර සතරක්ම විය. අඩු වැඩි නැත. ධර්මයෙහි එන ''ස්වාක්ඛාත'' ගුණය ගැන ද සිතන්න. ''මේ ධර්ම මෙපමණකැයි බුදුරජාණන් වහන්සේ දෙසූයේ නම එපමණ ම වෙයි. ඒ ධර්මය මනා කොට දේශිත බැවිනි.

බ්‍රහ්මවිහාර භාවනා නිමි.

## සතර ආරූප්‍ය භාවනා

ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන, යන සතර ආරූප්‍ය භාවනායි. භාවනා ක්‍රමය ද, ඒවායින් ලබාගත් ධ්‍යාන ද, ධ්‍යාන නිසා උපදින ලෝක ද, යන මේ සියල්ල මේ නාමයන්ගෙන්ම ව්‍යවහාර වෙයි. ආරූප්‍ය යන්නෙහි අදහස රූපයක් නැත යනුයි. රූප හැඟීම, රූප ධ්‍යාන, රූප සරීර, මේ කිසිවක් එහි නැත. අරූපාවචර යනුදු නමකි.

චතුරාරූප්‍ය භාවනා වැඩීමට ආකාසකසිණ භාවනාව හැර, ඉතිරි කසිණ භාවනා දියුණු කොට සතරවැනි ධ්‍යානය ලබාගත යුතුය, එසේ චතුර්ථධ්‍යානය ලැබූ පසු ඒ ධ්‍යානය පඤ්ච වසිතා වෙන් වශී කොට, නැවත නැවත වශී කරගත යුතුය. (පඤ්ච වසිතා පසුව විස්තර වේ) පුරුදු කරගත් වශීභාවයක් - වසඟ, අවනත, කර ගැනීමක් - ඇති කල්හි ක්‍රමානුකූලව ආරූප්‍ය භාවනා ආරම්භ කළ යුතු.

### 1. ආකාසානඤ්චායතන භාවනාව.

''චතුසු ආරුප්පෙසු ආකාසානඤ්චායතනං තාව භාවෙතු කාමො'' දිස්සන්තෙ ඛො පන රූපාධිකරණං දණ්ඩාදාන

සත්ථාදාන කලහ විග්ගහ විවාද, නත්ථි ඛො පනෙතං සබ්බසො ආරුප්පෙති" සො ඉති පටිසඞ්ඛාය රූපානංයෙව නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොතීති" වචනතො එතෙසං දණ්ඩාදානාදීනඤ්චෙව චක්ඛුසොතරොගාදීනඤ්ච ආබාධසහස්සානං වසෙන කරජරූපෙ ආදීනවං දිස්වා, තස්ස සමතික්කමාය ඨපෙත්වා පරිච්ඡින්නාකාසකසිණං නවසු පඨවිකසිණාදීසු අඤ්ඤතරස්මිං චතුත්ථජ්ඣානං උප්පාදෙති. තස්ස කිඤ්චාපි රූපාවචර චතුත්ථජ්ඣාන වසෙන කරජ රූපං අතික්කන්තං හොති. අථ ඛො කසිණරූපම්පි යස්මා තප්පටිභාගමෙව තස්මා තම්පි සමතික්කමිතුකාමො හොති' වි. ම. 248 පි.

චතුරාරූප්‍ය අතුරෙන් ආකාසානඤ්චායතනය වඩනු කැමැත්තහු පළමු කොට මෙසේ සැලකිය යුතුය. "රූපය නිසා දඬු ආයුධ ගැනීම්, කෝලාහල - බැණ දෙඩීම්, ආදිය පෙනෙයි. මේ ආරූප්‍ය යන්හි හැම අයුරින්ම ඒවා නොමැත. එසේම හේ මෙසේ සලකා රූපයන්ගේ කලකිරීම - නො ඇලීම - නැති කිරීම පිණිස පිළිපන්නේ වෙයි." කියායි. තවද ඒ රූපයන් නිසා දඬු ගැනීම් ආදිය පමණක් නොව ඇස් රෝග, කණේ රෝගාදි දහස් ගණන් ආබාධයන් වශයෙන් ද ශරීරයෙහි දොස් දකියි. එබඳු කරදරයන්ගෙන් නිදහස්වීම සඳහා, දොස් දුටුවා වූ ඒ යෝගියා ආකාස කසිණය හැර ඉතිරි කසිණ නවය අතුරෙන් යම්කිසි කසිණයකින් චතුර්ථ ධ්‍යානය උපදවයි. ඒ ධ්‍යානය ලබන්නේම හේ හුදෙක් රූප ශරීරය ඉක්මවූයේ නම් වෙයි. ඉක්බිති "යම්හෙයකින් කසිණ රූපයද - ධ්‍යානයට අරමුණ වූ කසිණ රූපය - ඒ රූප ශරීරය හා සමාන රූපයකි. (ඒ කසිණ අරමුණ ද, රූපයක්ය යනු අදහසයි) එහෙයින් ඒ කසිණ අරමුණ වූ රූපය ඉක්මවනු කැමති වෙයි.

මෙසේ විශුද්ධි මාර්ගයේ දක්වෙන පරිදි ආකාසානඤ්චායතන භාවනාව කිරීමට කසිණයකින් ලබාගත් චතුර්ථ ධ්‍යානය පඤ්චවශිතාවෙන් වශී කොට, ධ්‍යානයට අරමුණු වූ කසිණාරම්මණය ඉක්මවීම සඳහා පළමු කොට යෝග කටයුතුය. ඒ යෝග කිරීමේදී රූපයන්ගේ ආදීනවයද, ආකාසානඤ්චායතනයේ ආනිශංස ද සැලකිය යුතුය.

### ආකාසානඤ්චායතනය උපදවන අයුරු:

ධ්‍යාන වශීකර ගත් යෝගාවචරයා ආකාසානඤ්චායතනය ශාන්ත වශයෙන් මෙනෙහි කොට කැමති යම්තාක් ඇද්ද,

එතෙක් කසිණාරම්මණය - ප්‍රතිභාග නිමිත්තයි - පතුරුවා ඒ කසිණ අරමුණෙන් හැප්පුණා වූ අවකාශය - අහස, හිස් පෙදෙස - "අනන්තො ආකාසො අනන්තො ආකාසො, - අහස කෙළවරක් නොමැත, යනාදී වශයෙන් භාවනා කළයුතු. එසේ අහස වශයෙන් සිත තැබූ අතර, පෙරදී අරමුණු වූ කසිණය මෙනෙහි නොකිරීමෙන් කසිණාරම්මණය යන හැඟීම අත්හැරී අහස යයි හැඟීම පහළ වේ. ඒ හැඟීමට අරමුණු වූ අහස කසිණයෙන් ("කසිණුග්ඝාටිමාකාස" උගුළුවා ගත් හෙයින්) නම්. එය තාච්චියකින් ආප්පයක් ගන්නා සේ කසිණයෙන් උගුළු වන්නේ නැති. හුදෙක් මෙනෙහි නො කිරීම පමණි. මෙනෙහි නොකරත්ම කසිණාරම්මණය අභෝසි වී අහස යැයි අරමුණු වේ. ඒ අහස කෙළවරක් නොමැති නිසා "අනන්ත ආකාස" යි අනන්ත ආකාසය අරමුණු වූ හෙයින් ආකාසානඤ්චායතන නම් වෙයි. ඉක්බිති ඒ ආකාසානඤ්චායතන අරමුණ කෙරෙහිම සිත යොදමින් නැවත නැවත භාවනා කරන කල්හි උපෙක්ඛා, ඒකග්ගතා, යන චෛතසික දෙකින් යුත් අභිඥා නම් වූ අරූපාවචර චතුර්ථ ධ්‍යානය එනම් ආකාසානඤ්චායතනය උපදියි. එහෙයින් වදාළහ.

"පුනචපරං ගහපති භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති" - ම. නි. (ම. ප. අට්ඨකනාගර සූත්‍රය)

ගෘහපතිය, (ගැහැවිය) නැවත ද භික්ෂු තෙමේ හැම අයුරින් ම රූප හැඟීම් ඉක්මවා, හැප්පීම් සහිත හැඟීම් දුරුකොට, නොයෙක් හැඟීම් ද මෙනෙහි නො කොට, අහස කෙළවරක් නැත යයි සලකමින් ආකාසානඤ්චායතනයට සමවැදීම් වශයෙන් පැමිණ වාසය කරයි. මේ ආකාසානඤ්චායතන ධ්‍යානයෙහි අයුරුයි. විස්තර මෙසේය:-

ආකාසානඤ්චායතන ධ්‍යානය, පෙර පැවති කසිණාරම්මණ දීය ද, ප්‍රථම ධ්‍යානාදී අරූපාවචර ධ්‍යාන ද ඉක්ම වූවකි. "රූපසඤ්ඤානං සමතික්කමා" දේශනා කළේ එහෙයිනි. රූපසඤ්ඤා යනු රූප හැඟීමයි. කසිණ රූප, රූපාවචර ධ්‍යාන, යන මොවුනට නමකි. කසිණ රූප යයි කිවයුතු තැන මුල් පදය ලොප් - අස් - කිරීමෙන් "රූප" යනුවෙන් සැදිණ. රූප ධ්‍යානයයි කිවයුතු තැන අග පදය ලොප් කොට "රූප" යයි සැදිණ. ඉක්මවීම යන්නෙන් ආරම්මණ සමතික්කමණය - අරමුණ ඉක්මවීම - ගත යුතුය.

රූපාවචර ධ්‍යාන යේ අඞ්ග සමතික්‍රමණය මෙහිදී නොවේ. තවද විභඞ්ගයෙහි වදාළ අයුරින් නම් "රූප සඤ්ඤා" යනු රූපාවචර ධ්‍යානයන්ට සමවැදුනහුගේ පස් වැදෑරුම් රූපාවචර කුසල සඤ්ඤා ද, බ්‍රහම ලෝකයන්හි ඉපදුනහුගේ පස් වැදෑරුම් විපාක සඤ්ඤා ද, මෙලොව සැප විහරණ වශයෙන් සමවැදුන රහතන් වහන්සේලාගේ පස්වැදෑරුම් ක්‍රියා සඤ්ඤා ද, යන මේවායි.

"තත්ථ කතමා රූපසඤ්ඤා? රූපාවචර සමාපත්තිං සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා සඤ්ඤා, සඤ්ජානනා සඤ්ජානිතත්තං ඉමා වුච්චන්ති රූප සඤ්ඤායො" වි. ප. තේරුම පෙර සඳහන් විය.

ආකාසානඤ්චායතන ධ්‍යානයෙහි දෙවැනි ලක්ෂණය පටිඝ සඤ්ඤාවන්ගේ නොපෙනීයාමයි. එහි පටිඝසඤ්ඤා යනු ඇස්, කන්, නාසාදී ඉඳුරන් පස්දෙනා කෙරෙහි අවුත් වදින, හැප්පෙන රූපාදි අරමුණු පසයි.

"තත්ථ කතමා පටිඝසඤ්ඤා? රූපසඤ්ඤා, සද්ද සඤ්ඤා, ගන්ධ සඤ්ඤා, රස සඤ්ඤා, ඵොට්ඨබ්බ සඤ්ඤා, ඉමා වුච්චන්ති පටිඝසඤ්ඤායො" වි. ප. තේරුම පහසුය.

මෙසේ රූපාදී අරමුණු ගැටීම ආකාසානඤ්චායතන ධ්‍යානයේදී සිදු නොමේ. ඒ අරමුණු නොපෙනී, නොදැනී, යන හෙයිනි. එසේම අරමුණු ගැටීම නිසා උපදින සිත් පරම්පරාව ද අහෝසි වෙයි. "පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා" යි වදාළේ මේ කරුණු නිසාය.

මේ ධ්‍යානයෙහි තුන්වැනි ගුණය නොයෙක් හැඟීම් මෙනෙහි නොකිරීමය. "තත්ථ කතමා නානත්තසඤ්ඤා? අසමාපන්නස්ස මනොධාතු සමඞ්ගිස්ස වා මනොවිඤ්ඤාණධාතු සමඞ්ගිස්ස වා සඤ්ඤා, සඤ්ජානනා සඤ්ජානිතත්තං ඉමා වුච්චන්ති නානත්ත සඤ්ඤායො"

නානත්තසඤ්ඤා - නොයෙක් හැඟීම් - නම් ඒ ධ්‍යානයට සම නොවැදුනහුගේ මනොධාතු නම් වූ පඤ්චද්වාරාවර්ජන, (ඇස්, කන්, ආදී පස් දොරින් එන අරමුණු විමසන සිත) සිතින් හෝ මනෝවිඥ්ඥාණ ධාතු නම් වූ මනොද්වාරාවර්ජන - වොත්ථපන - (සිතෙන් ගත් අරමුණු විමසන සිත) සිතින් හෝ යුක්ත වූවහුගේ හැඟීම, හැඟෙන බව, හැඟුනු බව, මොවුහු නානත්තසඤ්ඤා යැයි කියනු ලැබේ. නොයෙක් හැඟීම් වලට මේ සිත් දෙක පමු

ණක් දක්වූයේ ආකාසානඤ්චායතන ධ්‍යානයට නො සමවැදුනහුගේ තත්වය රූපාවචර චතුර්ථ ධ්‍යානය යි. එහෙයින් ඒ ධ්‍යාන සිතෙහි ක්‍රියා කරනුයේ පඤ්චද්වාරාවර්ජනානුසාරයෙන් ගත් කසිණාරම්මණය හා මනොද්වාරයෙන් ගත් උපෙක්ඛා, ඒකග්ගතා, යන චෛතසිකයන් පමණි. පඤ්චද්වාරාවර්ජන, මනොද්වාරාවර්ජන, සිත් දෙකට අරමුණු වන යම්තාක් කුසල්, අකුසල්, විපාක, ක්‍රියා, සඤ්ඤාවෝ වෙත් ද ඒවා නොයෙක් අයුරින් පවත්නා හෙයින් නානත්තසඤ්ඤා යැයි දක්වූ සේක. කුසල සඤ්ඤා තෙළෙසකි. අකුසල සඤ්ඤා දොළොසෙකි. විපාක සඤ්ඤා අටළොසෙකි. ක්‍රියා සඤ්ඤා සොළොසෙකි. ආකාසානඤ්චායතන ධ්‍යානය මේ සඤ්ඤාවන් මෙනෙහි නො කිරීමෙන් අත්වූවක් නිසා නානත්ත සඤ්ඤානං අමනසිකාරා''යි දක්වූ සේක.

ධ්‍යාන සිතෙන් අරමුණු කරගත් අහස, ප්‍රකෘති ආකාශය නොව කසිණාරම්මණයෙන් උගුළුවා ගත් අහස යැ. කසිණය යම්තාක් පැතිරවීද එතෙක්ම ඒ අහසත් පැතිරී පවතී. එහි කෙළවරක් නොමැති හෙයින් "අනන්තො ආකාසො" යි දක්වූ සේක. ඒ වැකියම පද පෙරළීමෙන් ආකාසානන්ත වී. "ණ්‍යත්තතා භාවෙතු" යන සච්චසංඛිත සූත්‍රයේ නියමය පරිදි "ණ්‍ය" ප්‍රත්‍ය වූ කල්හි ආකාසානන්තායම ආකාසානන්ත්‍ය වී. "ඉක්බිති "යවතං තලනාදකාරානං ... ව්‍යඤ්ජනානි චලඤ්ජකාරත්තං" යන සූත්‍රයේ නියමය පරිදි යමත් වූ "ත්" යන්නට "ඒ" වී, "න" යන්නට "වග්ගන්තං වා වග්ගෙ" යන සූත්‍රයෙන් "ඤ" කාරය වීමෙන් "ආකාසානඤ්ච" සෑදිණ. දෙවියන්ට වාසස්ථාන වූ දෙව්ලොව දෙවායතනය මෙන්නාසේ අනන්ත වූ අහස අරමුණු කොට උපදවා ගත් ධ්‍යානය පවතින බැවින් 'ආකාසානඤ්චායතන'' විය. ඒ ධ්‍යානයට සමවැදීම් වශයෙන් පැමිණ වාසය කිරීම දක්වීම සඳහා "උපසම්පජ්ජ විහරති" යි දෙසූහ.

ආකාසානඤ්චායතන භාවනාව නිමි.

## 2 විඤ්ඤාණඤ්චායතන භාවනාව:

"සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති" හැම අයුරින්ම ආකාසානඤ්චායතන අරමුණු ඉක්මවා කෙළවරක් නැති සිතයැයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි. භාවනා කරන අයුරුත් එයින් ලබාගත් ධ්‍යානයත් දෙකම මෙසේ කෙටියෙන් දක්වූ සේක.

## භාවනා කරන අයුරු:

ප්‍රථම ආරූප්‍ය භාවනාවට දක්වූ පරිදිම තමන් ලබාගත් ඒ ප්‍රථම ආරූප්‍ය ධ්‍යානය වශී කොට, එයට අරමුණුවූ අනන්ත අහස පිළිබඳ දොස්ද. ප්‍රථම ආරූප්‍ය ධ්‍යානයෙහි චතුර්ථ ධ්‍යානයහෝ පඤ්චමධ්‍යානය විරුද්ධ ධර්ම වශයෙන් ආසන්න ලඟ-ව සිටින බැවින් එහි දොස් ද, විඤ්ඤාණඤ්චායතනය ශාන්ත වශයෙන් දකීමෙන් එහි ආනිශංස ද, මෙනෙහි කළ යුතුය. ඉක්බිති ඒ ආරම්මණය හා ධ්‍යානය ඉක්මවනු කැමැත්තෙන් සිත පැවතුන ඒ ආනන්ත වූ ආකාසාරම්මණය මෙනෙහි නොකිරීම් වශයෙන් අතහැර, සිත පමණක් මෙනෙහි කොට, “අනන්තං විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං” යනුවෙන් සිත තැබිය යුතු. ඒ අනන්ත වූ විඤ්ඤාණයම අරමුණු කරමින් නැවත නැවත මෙනෙහි කළ යුතුය. එසේ මෙනෙහි කරන්ම අහස යන ප්‍රඥප්තිය අතහැර, විඤ්ඤාණයැයි සිත පිහිටීමෙන් උපෙක්ඛා, එකග්ගතා, යන අංග ද්වය කින් යුත් විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය අර්පණා වශයෙන් උපදියි. එවිට කසිණුග්ඝාටිමාකාසාරම්මණය ද, ආකාසානඤ්චායතන ධ්‍යානය ද, යන දෙකම ඉක්ම වූයේ නම් වෙයි. දක් අරමුණ අහස් පෙදෙසෙහි පැවති සිත පමණි. ධ්‍යානය විඤ්ඤාණඤ්චායතනයයි. මේ විඤ්ඤාණඤ්චායතන භාවනා ක්‍රමයයි.

3 ආකිඤ්චඤ්ඤායතන භාවනාව.

යම්කිසි මිනිසෙක් කිසියම් කරුණක් සඳහා යනුයේ ලමයින් ගෙන් පිරුණු පාඨශාලාවක් දකියි. හේ එතැනින් ගොස් ඒ කරුණ නිමවා ආපසු එන්ම ඒ පාඨශාලාවෙහි එක ලමයෙකුදු නොමැතිව හිස් පාඨශාලාවම පෙනෙයි. එවිට හේ “මෙතෙක් ලමෝ අසවල් ගමට ගියහ., මෙතෙක් ලමෝ ක්‍රීඩා පිණිස ගියහ.. යනාදී වශයෙන් මෙනෙහි නොකර, හුදෙක් හිස් පාඨශාලාව දෙසම බලයි.

එමෙන් අනන්ත වූ ආකාශය හැර, එහි පැවැති සිත කෙරෙහි සිත පැවැත්වූවාවූ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානලාභියා නැවත නැවත සිතන විට එහි කිසිවක් නොපෙනේ. කිසිවක් නැති බවම ශාන්ත වශයෙන් සලකා, ඉක්බිති “නත්ථි කිඤ්චි නත්ථි කිඤ්චි” යනුවෙන් පරිකර්ම භාවනා කරයි. එසේ පරිකර්ම නිමිත්ත නැවත නැවත සේවනය කරන කල්හි උපචාර සමාධියද, තවත් දියුණු කිරීමෙන් උපෙක්ඛා, එකග්ගතා, යන අංග ද්වයකින් යුත් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය අර්පණා වශයෙන් උපදියි. “සබ්බසො

විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති" යනුවෙන් දේශනා කර වදාළේ මේ ධ්‍යානය සඳහාය. විස්තර පෙර සේයි.

ආකිඤ්චඤ්ඤායතන භාවනාව නිමි.

## 4 නෙවසඤ්ඤානාසඤ්ඤායතන භාවනාව.

ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය වශීකරණත් යෝගියා එහි ආදීනව දකියි. "මේ ධ්‍යානයට විඤ්ඤාණඤ්චායතන නමැති සතුරෙක් ඇත්තේය. එසේම හුදෙක් හැඟීම් මාත්‍රයෙකි. [මෙහි හැඟීම් නම් ඒ අනන්ත වූ ආකාශ ප්‍රදේශයෙහි යොමු කළ සිත් මාත්‍රයයි.) ඒ හැඟීම් නම් වූ සිත, "සඤ්ඤා රොගො, සඤ්ඤා ගණ්ඩො, සඤ්ඤා සල්ලො" යි දක්වෙන පරිදි රෝගයකි. ගඩුවෙකි. හුලෙකි. එහෙයින් ඒ හැඟීම් මාත්‍රය ද අත්හැර ගනු කැමති වෙයි. එසේම එය අත් කිරීමෙන් ලැබෙන ධ්‍යානය ද ශාන්ත වශයෙන් පෙනෙයි. ඉක්බිති හේ කිසිවක් නැතැයි සිතමින් සිටි සිත මෙනෙහි නොකොට, "සන්තමෙතං පණීතමෙතං" මෙය ශාන්තය, මෙය ප්‍රණීත යැ" යි යනුවෙන් භාවනා කරයි. එවිට ඔහුගේ සිත ක්‍රමානුකූව උපචාර ධ්‍යානය හා ඉතා සියුම් වෙදනා සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, යන නාම ධර්මයන් සතර දෙනා සාමූහික වීමෙන් අර්පණා නම් වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට පත්වෙයි. මෙහි විඤ්ඤාණ නම් වූ නාමස්කන්ධය ද සඤ්ඤානාමයෙන් ගැණිනි.

"නෙවසඤ්ඤානාසඤ්ඤායතන" යන පදයෙහි අදහස මෙසේයː-

ඔළාරිකාය සඤ්ඤාය අභාවතො සුඛුමාය ච භාවතො නෙවස්ස සසම්පයුත්තධම්මස්ස ඣානස්ස සඤ්ඤානාසඤ්ඤාති නෙවසඤ්ඤානාසඤ්ඤං නෙවසඤ්ඤානාසඤ්ඤඤ්ච තං මනායතන ධම්මායතන පරියාපන්නත්තා ආයතනඤ්චාති නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, අථ වා යායමෙත්ථ සඤ්ඤා සා පන සඤ්ඤාකිච්චං කාතුං අසමත්ථතාය නෙවසඤ්ඤා, සංඛාරාවසෙස සුඛුමභාවෙන විජ්ජමානත්තා නාසඤ්ඤාති නෙවසඤ්ඤානාසඤ්ඤා ච සා සෙස ධම්මානං අධිට්ඨානට්ඨෙන ආයතනඤ්චාති නෙවසඤ්ඤානාසඤ්ඤායතනං " - ප. ම. අ. 62 පි.

එක්ව යෙදුනු ධර්මයන් සහිත ධ්‍යානයට ඔළාරික - ගොරෝසු - සඤ්ඤා නැති නිසා ද, සියුම් ලෙස ඇති නිසා ද, සඤ්ඤා නැත්

ත්තේනුයි ද, නැත්තේද නැතිනුයි නෙවසඤ්ඤානාසඤ්ඤා නම්. මෙය උපමාවකින් වටහා ගත යුතුය. එක් භික්ෂුවක් සාමණේර කෙනෙකුට පාත්‍රය ගෙනෙන්නැයි කීය. එවිට හේ ස්වාමීනි, පාත්‍රයේ තෙල්ය; කී එසෙ නම් මගේ තෙල් ගුලාවට දමන්නැයි කියක්ම, ස්වාමීනි, තෙල් නැතැ''යි සාමණේර තෙමේ පිළිතුරු දුනි. එසේ කීයේ ගුලාවට දැමිය යුතු තරම් තෙල් නැති බවයි. ඇතැයි කියේ පාත්‍රයේ තෙල් තැවී තිබුණු හෙයිනි. මේ සතර වැනි ආරූප්‍ය ධ්‍යානය ද එමෙනි. එහි සඤ්ඤා ඇතැයි ද කියනු නොහැකිය. නැතැයි ද කියනු නොහැකිය. එතකුදු වුවත්, මනායතන, ධර්මායතනයන්ට සූළු වශයෙන් හෝ මේවා ඇතුලත් වන බැවින් ආයතන වන්නේනුයි නෙවසඤ්ඤානාසඤ්ඤායතන නම්. (මනායතන සිත් පරපුරයි. ධර්මායතන : දෙපණස් චෛතසික, සොළොස් සූක්ෂම රූප, නිර්වාණ, යන එකුන්සැත්තෑවයි (69)

තවද තේරුමකි. මේ ධ්‍යානයෙහි යම් සඤ්ඤාවක් ඇද්ද, එය සඤ්ඤාවෙන් කළයුතු දෑ කිරීමට අසමත් හෙයින් නෙව සඤ්ඤා නම්) සංස්කාර වූ චිත්ත චෛතසිකයන් අතිශයින්ම සියුම් බවට පත්වූ නමුදු එහි ඒ සංස්කාරයන් පෙනෙන බැවින් නාසඤ්ඤායි පද දෙක ගැලපීමෙන් නෙවසඤ්ඤානාසඤ්ඤා ය. එයම ඉතිරි ධර්මයන්ට උපකාර බැවින් ආයතන වෙනුයි නෙව සඤ්ඤානාසඤ්ඤායතන නම් වෙයි. එසේම මෙහි සඤ්ඤාව පමණක් නොව, වේදනා – චිත්ත – ඵස්සා දිය යන මේවා ද ඉතා සියුම් ලෙසම පවතියි. එසේ නමුදු සඤ්ඤා නාමය මූලික කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන යැයි දෙසූ සේක.

මෙතෙකින් ඒ යෝගාවචර තෙමේ "සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති" දේශනා කළ පරිදි හැම අයුරින්ම ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ද අරමුණ ද ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට සමවත්නේ නම් වෙයි.

## ආරූප්‍ය භාවනා සතරක් වීමට හේතු:-

ආරම්මණ ඉක්මවීම වශයෙන් සිවු වැදෑරුම් විය. රූපාවචර ධ්‍යානයන්ගේ ඇත්තේ විතර්කාදිඅඞ්ග ඉක්මවීමයි. මෙහි එසේ අඞ්ග ඉක්මවීමක් නැත. චතුර්ථ ධ්‍යානයෙහි පැවති උපෙක්ඛා, එකග්ගතා, ඒ සමග යෙදුනු සිත, වේදනා, සඤ්ඤා, යන සතර නාමස්කන්ධයම මේ ආරූප්‍යයන්හිද පවතී. එහෙත් ආරම්මණ

යත් ඉක්මවීම නිසා ඒ නාමස්කන්ධ ඉතා සියුම් වෙමින් ගමන් කරයි. මහ සමුදුර මැදවෙන නැවක් පටන් ගනිද්දී මෙරළ සමීපයේ රළ සහිත දියෙහි බොහෝ සේ සෙලවෙමින් ගමන් කරයි. ක්‍රමයෙන් රළ සහිත දිය ඉක්මවත්ම සෙලවීමක් නැති දියමතට පැමිණෙයි. මහසමුදුර මැදට යත්ම නැව පාවේ ද? නොවේද යන තරමට ම නො දැනෙයි. එහෙත් නැව යත්තේම ය. නැවද සමුද්‍රයෙහිය. සමුද්‍රය ඉක්මවීමක් නොවෙයි. මේ චතුරාරූපයන්ද එසේමය. චතුර්ථ ධ්‍යානයෙන් නැගී, උගුළුවා ගත් කසිණාරම්මණය මතම ඒ සිවු වැදෑරුම් සිත පවතී. එහෙත් එහි ඇති ගොරෝසු ගතිය ක්‍රමයෙන් තුනී කරයි. මෙසේ ආරම්මණ සමතික්‍රමණය නිසා සතරක්ම විණි.

සැලකිය යුතු : සතර ආරූප්‍යයෝ විදර්ශනාවට පාදක නො වෙති. සඤ්ඤා වෙදයිත නිරොධ සමාපත්තියට පාදක වෙති.

එකොළොස්වන පරිච්ඡේදය නිමි.

## 12 වැනි පරිච්ඡෙදය.

# සමථ භාවනාවට නුසුදුසු විහාර.

ඉහත විස්තර කළ සමථ භාවනා ක්‍රම සතළිස අතුරෙන් තමා ගේ චරිතයට සුදුසු භාවනාවක් කම්සථාන දායක කල්‍යාණ මිත්‍රයෙකු වෙතින් ඉගෙන දස පළිබෝධයන් ගෙන් දුරු වී, ඒ භාවනාවෙන් විශෙෂයක් ලබා ගැනුමට නුසුදුසු විහාර හැර, සුදුසු විහාර යෙක විසිය යුතුය. සමථ භාවනාවට හැම අයුරින් ම විවේක, නිශ්ශබ්ද, කරදර නොමැති තමා ගේ සිරුරට ගැලපෙන දේශ ගුණයක් ඇති විහාරයක් - වාසය කරන තැනක් - අවශ්‍යය. නුසුදුසු විහාර අටළොසක් විශුද්ධි මාර්ගයෙහි සඳහන් වේ.

> “මහාවාසං නවාවාසං - ජරාවාසඤ්ච පන්ථනිං
> සොණ්ඩිං පණ්ණඤ්ච පුප්ඵං ච - ඵලං පත්ථිතමෙව ච
> ii නගරං දාරුණා ඛෙත්තං - විසභාගෙන පට්ටනං
> පච්චන්තසීමං සප්පායං - යත්ථ මිත්තො නලබ්භති
> iii අට්ඨාරසෙතානි ඨානානි - ඉති විඤ්ඤාය පණ්ඩිතො
> ආරකා පරිවජ්ජෙය්‍ය - මග්ගං පටිභයං යථා”

විශාල විහාරය, අළුත් විහාරය, පරණ විහාරය, මාර්ගී අසල විහාර, පැන් පොකුණු ඇති විහාරය, කොල-මල් ගෙඩි ඇති විහාරය, බොහෝ දෙනා බලාපොරොත්තුවන විහාරය, නගර සමීපයෙහි ඇති විහාරය, දර බොහෝ සෙයින් ඇති විහාරය, කුඹුරු සමීපයෙහි ඇති විහාරය, නො ගැලපෙන භික්ෂූන් ඇති විහාරය, තොටු පොළ වල් හෝ මාර්ගයන්හි නැවතුම් පොළවල් හෝ සමීප විහාරය, තුනු රුවන්ට ගරු නො කරන ප්‍රදේශයන්හි ඇති විහාරය, රාජ්‍ය සීමායෙහි පිහිටි විහාරය, අසප්පාය විහාරය, කල්‍යාණ මිත්‍රයන් නො මැති විහාරය,

මේ අටළොස් ස්ථාන නුසුදුසුයැයි දැනගත් සමථ භාවනාවෙහි දක්ෂයා බිය සහිත මග අත හරින්නා සේ දුරින් ම දුරු කරන්නේ ය.

මෙවා හි ඇති දෝෂ-වරද-කෙටියෙන් මෙසේ දත යුතුය. මහා විහාරයෙහි වත්-පිළිවෙත් අධිකය, බොහෝ භික්ෂූහු රැස් වෙත්. මහජනයා ගේ ගැවසීම ද පවතී. ඉමගණ ගන්නා කුඩා සාමණේරයන් ගේ හඩ තැළුම් ද වෙයි. අළුත් විහාරයෙහි නව කර්මාන්ත බොහෝය දිරාපත් විහාරයෙහි ද එසේමය. ඇතැම් විට තැලෑ සැපීමටද වෙයි. මාර්ගී අසල විහාරයෙහි පිටතින් පැමිණෙන භික්ෂූහු අධික වෙත්. මාර්ගයෙහි ගමන් කරන දුගී - මගීහුද පැමිණෙති. පැන් පොකුණු-කොළ-මල් ගෙඩි ඇති විහාර ද, මහජනයාගේ කරදර පවතියි. බොහෝ දෙනා බලාපොරොත්තු වන ප්‍රසිද්ධ පූජනීය විහාර ද එසේ ම ය. නගර සමීපයෙහි ස්ත්‍රීන්ගේ හැසිරීම අධිකය. දර ඇති විහාරයෙහි නම් දර රැස්කිරීමට පැමිණෙන ස්ත්‍රීහු වෙති. ඔවුහු මූණ ගැසීමෙන් සිත චඤ්චල වේ. කුඹුරු සමීපයේ ගොවීන්ගේ කරදරය. නො ගැලපෙන භික්ෂූහු සිටින් නම් එබඳු විහාරයෙහි විසීම කරදරය. සිල්වතාට ගුණවතාට එතැන විසුම කළ නො හැකිය.

තොටුපලවල්, මාර්ගයෙහි නැවතුම් පොළවල්, අසල විහාරයන්හි ද මහජනයා ගේ ගැවසීම පවතී. ප්‍රත්‍යන්තදේශයෙහි- තුනුරුවන්ට ගරු නොකරන ප්‍රදේශයෙහි - ඇති විහාරයෙහි විසීමෙන් ඇතැම් විට දානය ද නො ලැබෙන්නට පුළුවන. රාජ්‍ය සීමාවෙහි විසීමෙන් පක්ෂයක් ගැනීමට සිදුවෙයි. සප්පාය නො මැති විහාරය නම් අමනුෂ්‍යයන් අධිගෘහීත ස්ථානයයි. නැතහොත් ස්ත්‍රී - පුරුෂාදීන් ගේ නිතර ගැවසීම් ඇති විහාරයයි. විශාල කරදරය වනුයේ කල්‍යාණ මිත්‍රයෙකු නො මැති විහාරයයි.

### සුදුසු විහාරය;

මේ විහාර අටළොස හැර, සුතමය ඤාණ විස්තරයේ දී සඳහන් කළ ගුණ පසකින් සමන්විත වූ නිදහස් විහාරය යි. එසේම ඉතාමත් සුදුසු විහාර නවයක් දේශනාවෙහි පවතී. එනම් "සො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං" - ම. නි. (හඥලී සූත්‍රය) ගමෙහි සිට දුනු පන්සියයකින් එහා ආරණ්‍යය, රුක්ඛමූලධූතාඞ්ගයේ දී දක් වූ සුදුසු වෘක්ෂමූලය, පර්වත, දිය රැලි ඇද හැලෙන පර්වත හෝ නිදහස් සමභූමි, ගලෙන් ම සෑදුනු ගුහා, සොහොන, ඈත ම පිහිටි ආරණ්‍යය- (ප්‍රාන්ත සේනාසනය) එළිමහන් හිස් භූමි, කොළ-පිදුරු ආදියෙන් සෙවිලි කළ පැල්පත්, යන නවය යි. මෙවා සමථ භාවනාවට යෝග්‍ය තැන්ය.

## කුඩා පළිබෝධ:

සුදුසු විහාරයක් සොයාගත් යෝගියා විසින් ඉක්බිති කුඩා කරදර අස්කර ගතයුතුය. හිස-රැවුල් දිග්ලෙස වැවී තිබීම, නිය වැවී තිබීම, දිරාපත් වූ සිවුරු කිළුටු සිවුරු, පාත්‍රය මළ බැඳීම, ඇඳ-පුටු ආදිය අපිරිසිදු වී තිබීම, මේවා කුඩා කරදර නම්. ඒ සියල්ල වේලාසනම අස් කර ගතයුතුය. එනම් පිරිසුදු කරගත යුතුය. සැලකිය යුත්තක් ඇත. නැති ගුණ රුවා දක්වීමට මාන බලන ඇතැම් යෝගීහු කිළිටි සිවුරු, මළ බැඳුනු පාත්‍රා දිරාපත් වූ ඇඳ-පුටු පරිහරණය කරත්. එසේ ම වැඩි අල්පේච්ඡකම් දක්වීමට ඇඳ-පුටු පරිහරණය අස්කර, නිසණ්ඨයන් මෙන් බිම වාඩිවෙත්. හිඳිත්. ඒ නොමැනවි. මේ පිළිබඳව තවත් අදහසක් ඉදිරියට එන අභිඤ්ඤා කෞශල්‍යයේ දී දත හැකිය.

## සප්පාය-අසප්පාය කරුණු:

කුඩා පළිබෝධ දුරු කළ පසු, තමා ඉගෙණ ගත් කම්ඨානය වඩා-භාවනා කොට-උග්ගහ නිමිත්ත ලැබ, එය ද ඉතා හොඳින් රැකගෙන, නැවත නැවත සේවනය කිරීමෙන් කාලයක දී ප්‍රතිභාග නිමිත්ත උපදවා ගැනීමට පුළුවන. ප්‍රතිභාග නිමිත්ත ලත් පසු, එතැනදී ම අභිඤ්ඤා උපදවා ගැනීමට සමර්ථ නම් යෙහෙකි. අසමත් නම් ඔහු විසින් ඒ ප්‍රතිභාග නිමිත්ත සක්විති ගැබක් මෙන් අප්‍රමාදව රැකිය යුතු. (සක්විති දරුවා මවුකුස විසීම - සක් විති ගැබයි.) ඒ සඳහා නුසුදුසු දෑ අතහැර සුදුසු දෑ සේවනය කළ යුතුය.

ඒ දෙයාකාරය ම සත් අයුරින් පවතියි.

"ආවාසො ගොචරො භස්සං - පුගගලං භොජනං උතුං
ඉරියාපථොති සත්තෙතෙ - අසප්පායෙ විවජ්ජයෙ
සප්පායෙ සතත සෙවෙථ - එවං හි පටිපජ්ජතො
නචිරෙනෙව කාලෙන - හොති කස්සචි අප්පණා"

1. ආවාස : යම් ආවාසයක වසන්නහුට නූපන් නිමිත්ත නූපදියි ද, උපන් නිමිත්ත හෝ නැතිව යයි ද ඒ ආවාස අසප්පාය නම්. එයින් විදස් වූයේ සප්පායයි. එනම් සුදුසු එකයි. ආවාසය සප්පාය - අසප්පාය බව දැන ගැනීමට එක් ආවාසයක දින තුනක් විසිය යුතුය. සප්පාය නම් එහි වෙසෙමින් ලත් නිමිත්ත හෝ රැකගනිමින් විසීම මැනවි. බුදුරජාණන් වහන්සේ ගෙන් කමට

හත් ගත් මෙසිය හිමි "කිම්කාලා" නම් ගං ඉවුර සමීපයෙහිවූ රමනීය අඹවනයට ගොස් භාවනා කරත්ම කාමාදි ලාමක විතර්ක පහල වීමෙන් පෙරලා ආපසු පැමිණියහ. එසේ සිදුවූයේ ඒ අඹ වනය අසප්පාය හෙයිනි. "සාමණෙරොපි සචාහං ඉධෙව වසිස්සාමි ඤාතකා මෙ අනුබන්ධිත්වා පක්කොසිස්සන්තීති තෙසං භික්ඛූනං සන්තිකෙ යාව අරහත්තා කම්මට්ඨානං උග්ගහෙත්වා පත්තචීවරමාදාය චාරිකං චරමානො තතො තිංසයොජනෙ ඨානෙ ඛදිරවනං ගන්ත්වා අන්තොවස්සෙ යෙව තෙමාසබ්භන්තරෙ සහපටිසම්භිදාහි අරහත්තං පාපුණි" –ධ. අ. 381 පි.

ආවාහ මඞ්ගල්‍යයේදී රථයෙන් බැස, පලාගොස් පැවිදි වූ රේවත සාමණේරයන් වහන්සේ (සැරියුත් හිමි ගේ බාල සොහොයුරා) මෙහි විසුව හොත් නෑයෝ ලුහුබැඳ අවුත් මා කැඳවති යි සිතා පැවිද්ද ලබාගත් භික්ෂූන් වෙතින් ම අර්හත් මාර්ගය තෙක් කම්සථානය ඉගෙණ, පා-සිවුරු ගෙන හැසිරෙනුයේ එතැන් සිට යොදුන් තිහක් ඈතින් පිහිටි කිහිරි වනයට ගොස් වස් තුන් මාසය ඇතුලතදී ම සිවුපිළිසිඹියාපත් මහරහත් බවට පැමිණියේ ය. උන් වහන්සේට මෙසේ හැකිවූයේ සප්පාය සෙනසුනක් ලද නිසා ය.

2. ගෝචර: තමා වසන තැන සිට උතුරු දිගට හෝ දකුණු දිගට හෝ පහසුවෙන් පිණ්ඩපාතය ලැබෙන ගම් ඇත් නම් ඒ සප්පාය ගෝචර නම්. වෙනත් වූයේ අසප්පායයි. උතුරු දිග-දකුණු දිග වශයෙන් දක්වූයේ හිරුගේ ගමන් බලා යැ. මුහුණට හිරු රැස් වැටීම කමටහනට බාධාවකි.

3. භස්ස: නොයෙක් අයුරින් කථාවට ම ලොල් වූ වන් ඇසුරු කිරීම අස්පාය නම්. තමා කථා නො කළත් ඔවුන්ගේ කථාවනට කණ් යොමුකළ යුතුය. දස කථාවන්ට අනුව ගිය කථා පමණක් කරන්නවුන් ඇසුරු කිරීම සප්පාය යි. (අප්පිච්ඡ-සන්තුට්ඨි- පවිවේක-විරියාරම්භ- අසංසග්ග- සීල-සමාධි-පඤ්ඤා-විමුත්ති - විමුත්තිඤාණදස්සන- දසකථායි.)

4. පුග්ගල: කලබලගති ඇති, දරදඬු, පුද්ගලයන් ඇසුරු කිරීම අසප්පායයි. ශාන්ත පැවතුම් ඇතියවුන් ඇසුරු කිරීම සප්පාය යි.

5. භොජන: දිරවීමට පහසු, තමා ද සතුටු, ආහාර සප්පායයි. නැති නම් අසප්පාය යි.

6. උතු : දෙශ ගුණය යි. එය ද තමා ගේ සිරුරෙහි පවත් නා උෂ්ණත්වය අනුව තීරණය කරගත යුතු.

7. ඉරියාපථ : සයනය හැර ඉතිරි ඉරියව් තුන. දින තුනක් විමසීමෙන් පසු තෝරා ගත යුතුය.

මෙසේ සප්පාය-අසප්පාය දැන, සප්පාය සෙවුනාහට නොබෝ කලකින් ම කිසියම් අභිඥාවක් උපදියි. එසේත් නූපදියි නම් ඔහු විසින් "දසවිධ අප්පණාකොසල්ල" සම්පාදනය කළ යුතුය.

## දශවිධ අභිඥා කෞශල්‍යය.

### 1. වත්ථුවිසද කිරියතා:

සිරුර හා අවට දෑ පිරිසුදු කර ගැනීම යි. ඉදින් සිරුරෙහි කෙස්, රැවුල, නිය වැවී ඇත්නම්. දහඩිය දමා සිරුර කිළුටු නම් ශරීරය අපිරිසුදු ය. සිවුරු, පාත්‍රා, කුටිය, ඇඳ - පුටු ආදිය අපිරිසුදු නම් අවට අපිරිසුදු නම්. මෙසේ අපිරිසුදු සිරුර හා අපිරිසුදු පරිසරයක් ඇතිව සමාධි භාවනා කළේ නමුදු ලැබගත් නිමිත්ත රැක ගැනුමට හෝ නො ලැබූ නිමිත්ත උපදවා ගැනීමට හෝ නො හැකි වෙයි. අපවිත්‍ර පහන් තැටියක, කුණු සහිත තෙල් දමා, අපවිත්‍ර වැටි දමා දැල්වූයේ නම් පහන් ආලෝකයද නො බැබලෙයි. එමෙන් අපවිත්‍ර පරිසරයක් හා සිරුරක් ඇතිව නුවණ දියුණු කිරීමට උත්සාහ ගත්තේ වී නමුත් නොහැකිය. ඒ ආධ්‍යාත්මික-බාහිර වස්තූන් දෙදෙනා ම පිරිසුදුව තබා ගැනීමෙන් දියුණුවක් ලබත හැක. පිරිසුදු තැටියක පිරිසුදු තෙල් හා වැටි දමා දැල්වූ විට ආලෝකය දීප්තිමත් වන්නාක් මෙනි. මෙසේ සිරුර හා පරිසරය පිරිසුදුව තබා ගැනීම වත්ථුවිසදකිරියතා නම්.

### 2. ඉන්ද්‍රියසමත්තපටිපාදනතා.

ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් ගේ සමපැවතුම සකස් කිරීම යි. ඒ ඒ දෙයෙහි ප්‍රධාන - අධිපති-වනුයේ ඉන්ද්‍රිය නම්. සමාධි භාවනාවක දී එසේ ප්‍රධාන ලෙස ඉදිරිපත් වෙන ධර්ම පසෙකි. ශ්‍රද්ධා-පැහැදීම, විරිය-උත්සාහය; සති-සිහිය, සමාධි-එකඟතම, ප්‍රඥා-නුවණ, යනුයි. මේ එක් එක් ධර්මයක් සෙසු ධර්මයනට වඩා වැඩිවුව හොත් අහිත ප්‍රතිඵල පවතී. එහෙත් සතිය එසේ නොවේ. එය කොපමණ

වැඩි වුවත් නිවරද විනා වරදක් නො වේ. සෙසු ධර්මයන් ගේ අඩු වැඩි බව විමසනුයේ සතියෙනි. සෙසු ධර්ම සතර යුගල–දෙක දෙක– වශයෙන් ගෙන අඩු වැඩි වීමේ වරද දත යුතුය. ශ්‍රද්ධා–ප්‍රඥ දෙකින් ශ්‍රද්ධාව වැඩිවී ප්‍රඥව අඩු වුවහොත් නො පැහැදිය යුතු තැන පැහැදීමෙන් මුලාවෙයි. අනැමෙක් ලාභයක්, නම්බුවක් ආදී දෑයක් බලාපොරොත්තුවෙන් පැහැදෙත්, ඒ නො මැනවි. ශ්‍රද්ධාව අඩුවී ප්‍රඥව වැඩිවුවහොත් කපටියෙක් වෙයි. එය ඖෂධය නිසා ඇති වූ රෝගයක් මෙන් පිළියම් කිරීමට අපහසුය. එබඳු කපටියා කියමනෙන් පමණක් පින් කරන්නෙකි. මෙසේ සමාධි භාවනාව සඳහා ශ්‍රද්ධා – ප්‍රඥ දෙක සමතාවයෙන් තබාගත යුතුය. දෙවැනි යුගලය විරිය සමාධි යි. සමාධිය අඩු වී විය්‍යීය වැඩි වුව හොත් නොසන් සුන් ගතිය - උද්ධච්චය– දියුණු වෙයි විය්‍යීය අඩු වුවහොත් කම්මැලිගතිය-කොසජ්ජ–දියුණු වෙයි එහෙයින් විරිය-සමාධි දෙක සමතාවයෙන් තබා ගත යුතුය. මෙයයි ඉන්ද්‍රිය සමතාපටිපාදනතා.

## 3. නිමිත්තකොසල්ල:

ලබා ගත් කසිණාදී නිමිත්ත රැකගැනීමේ දක්‍ෂකමයි. කසිණ ය සෑදීම, පරිකර්ම කිරීම, යන මේවාහි දක්‍ෂකමද නිමිත්ත කෞශල්‍යයට අයත් වුවත් මෙහිදී ඒවා නො ගැනේ. මක් නිසාද? මේ සඳහන් කරනුයේ ලැබගත් නිමිත්ත, (උග්ගහ, ප්‍රතිභාග, නිමිති) රැකගැනීමේ දක්‍ෂකම පමණක් හෙයිනි. ඒ දක්‍ෂකම ඇතිකර ගැනීමට අරමුණ නැවත නැවත මෙනෙහි කරමින් තක්‍රීහත-විතක්‍රීහත කළ යුතුය.

## 4. යස්මිං සමයෙ චිත්තං පග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං පග්ගණ්හනතා:

සිතට රුකුල් දියයුතු කාලයෙහි රුකුල් දීම. සිතට රුකුල් දිය යුත්තේ සිත නිතර ම සමාධියට ම නැඹුරු වී පවතින කාල යේ දී ය. සමාධියට ම නැඹුරු වීමෙන් කුසීතකම ඇති වේ. එවිට නිමිත්ත ආසේවනය කිරීම ප්‍රමාද යි. එහෙයිනි. ඉන්ද්‍රිය සමානත්වය සකස් කරගැනීමේදී ද මෙය දැක්විණ. දෙවැණි වර දැක්වූයේ බොජ්ඣඞ්ග ධර්ම වශයෙනි. (සූතමය ඤාණ විස්තරයෙහි බොජ්ඣ ඞ්ග භාවනා බලන්න.) සිතට රුකුල් දීම සඳහා ධම්මවිචය, විරිය, පීති, යන බොජ්ඣඞ්ග ත්‍රය වැඩිය යුත්තේය.

## 5. යස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං නිග්ගණ්හනං:

සිතට නිඥු කළයුතු - වේගය අඩුකළයුතු- වේලාවට නිග්‍රහ කිරීම යි. අධික වීර්‍ය්‍යා දී ධර්ම නිසා සිතෙහි වේගය වැඩි වේ. එවිට සිත විසිරීම සඳහා පවතී.- උද්ධච්චාය සංවත්තති- අරමුණෙහි මනාලෙස නො මෙහෙයවෙයි. එහෙයින් ඒ වේලාවේදී වේගය අඩු කිරීම සඳහා සමාධි පාක්ෂික ධර්ම වැඩිය යුතුය. විරිය - සමාධි යන ඉන්ද්‍රිය ධර්ම දෙදෙනා සමව පවත්වා ගතයුතුය යි. සඳහන් කළේ එහෙයිනි. පස්සද්ධි, සමාධි, උපෙක්ඛා, බොජ්ඣඞ්ග වැඩීමෙන් උද්ධච්චය අස්කරගත හැක.

## 6. යස්මිං සමයෙ චිත්තං සම්පහංසිතබ්බං තස්මිං සමයෙ චිත්තං සම්පහංසනං:

සිත සතුටු කළයුතු වේලාවේදී සතුටු කිරීම. නුවණ මඳ නිසා හෝ සංසිඳීමේ සුවය නො ලැබීම නිසා හෝ සිත ආශ්වාද රහිත නම්-කැමැත්ත අඩු වී නම් - එවිට කලකිරීම උපදවන ධර්ම අට සිහිකළ යුතුය -අට්ඨසංවෙගවත්ථු-. ඔව්හු නම් භවයක් පාසා ඉප දීම, උපන් ජීවිත ජරාවට පත්වීම, ලෙඩවීම, මරණය, නරක-තිරිසන්-ප්‍රේත-අසුර යන සතර අපා දුක, අතීත සංසාර මූලක දුක, අනාගත සංසාර මූලක දුක, වර්තමානයෙහි ආහාර සෙවීමේ දුක, යනුයි (ජාතිජරා ව්‍යාධිමරණානි චත්තාරි, අපාය දුක්ඛං පඤ්චමං, අතීතෙ වට්ටමූලකං දුක්ඛං, අනාගතෙ වට්ටමූලකං දුක්ඛං, පච්චුප්පන්නෙ ආහාරපරියෙට්ඨිමූලකං දුක්ඛං,) අෂ්ට සංවේග වස්තු සිහිකිරීම නිසා ඤාණය සුවිසද වේ. තියුණු වේ. කැමැත්ත අඩුවීම-නිරස්සාද-නැතිකර ගැනුමට බුද්ධානුස්සති ආදී අනුස්සති වැඩිය යුතු. මෙසේ යෙදීමෙන් සිතෙහි නුවණ පැහැදීම ඇතිකර ගත හැකිය. ඉන්ද්‍රිය ධර්ම විස්තරයේදී දක්වූ ශ්‍රද්ධා - ප්‍රඥ දෙක ගැන සිහිකරගත යුතුය. මේ දෙක සමසේ තිබීම අවශ්‍යය ම බව දත් වැටහේ.

## 7. යස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛිතබ්බං තස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛනං:

සිත මැදහත් වියයුතු වේලාවට මැදහත් වීම. මෙයින් අදහස් කරනුයේ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයෙහි පැවැත්මය. සිතට රුකුල් දීමක් හෝ නිග්‍රහ කිරීමක් හෝ සතුටු කිරීමක් හෝ දීම අවශ්‍ය

නොවිය යි හැඟේ නම් එවිට මධ්‍යස්ථ විය යුතුය. අසුන් සමසේ ගමන් කරද්දී මැදහත් වන රියැදුරෙකු මෙනි. එහෙයින් සිත සමථ නිමිත්ත ඔස්සේ ගමන් කරයි නම් මැදහත් විය යුතු.

## 8, 9, අසමාහිත පුග්ගල පරිවජ්ජනතා සමාහිත පුග්ගල සෙවනතා:

අසංවර, කායදඬු, පුද්ගලයන් දුරුකිරීමත්, සංවර-විනීත පුද්ගලයන් ඇසුරු කිරීමත්, මේ දෙකෙහි අදහස් කෙරේ. මෙය ද මුල දී විස්තර කර ඇත. 10. තදධිමුත්තතා: සමථ විපියට ම සිත නැඹුරු වීමයි. අන් අතක සිත නොයොදවා නැවත නැවත සමථ භාවනාවට ම හැරවිය යුතුය.

මෙසේ දශවිධ අර්පණාකෞශල්‍යයන් සේවනය කිරීම නිසා ලත් ප්‍රතිභාග නිමිත්ත ආරක්ෂා වනවා පමණක් නොව උපචාරාදී සමාධි ඉපදවීමට ද සමත් වේ. එසේත් අසමත් වේ නම් ඔහු විසින් භාවනාව අතහැර නො දමා, තව-තවත් වීර්ය්‍යය, සමාධිය යොදමින් ක්‍රියා කළ යුතු. එසේ කරත් ම තමන් ලත් ප්‍රතිභාග නිමිත්ත අනුව, පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍ර භූ, යන ජවන් සිත් උපදී, ඉක්බිති පස්වැනිව ධ්‍යානාඞ්ග සාමූහික-එක මුහු-වීමෙන් අර්පණා ජවනය උපදියි. විස්තර මතු යම්බන්ධයි.

## පඤ්චනීවරණ.

සමාධි භාවනාව දියුණු කිරීමේ දී ඊට බාධා කරන, අවහිර කරන, විරුද්ධ වශයෙන් පවතින ධර්ම පසක්, පඤ්චනීවරණයන් වශයෙන් හැඳින් වෙයි. එහෙයින් ඒ නීවරණයන් පිළිබඳ දැනුම, අස්සරගන්නා අයුරු, සමථ භාවනා යෝගියා විසින් අවබෝධ කටයුතුම ය. මේ නීවරණයන් පවතින තෙක් උපචාරාදි ධ්‍යාන නූපදී. වැහිවලාකුල් නිසා සඳඑළිය නැතිවාක් මෙනි. (සඳඑළිය උපමා කළේ සමාධියේ ඇති ශාන්ත භාවය දක්වීම සඳහා ය. හිරු එළිය උපමා කළ යුත්තේ ප්‍රඥාව දක්විය යුතු තැනදීය.) උග්ගහ නිමිතත වඩන යෝගියාට මේ නීවරණයන් බොහෝ සේ කරදර පිණිස පවතී ප්‍රතිපදා ක්‍රම සතර දක්වූ තැන "දුකඛාපටිපදා" යන්නෙන් සඳහන් වූයේ පඤ්චනීවරණයන් ගේ කලබලය නිසා භාවනා පිළිවෙත දුක්වීම යි. කරුණු මෙසේ හෙයින් පඤ්චනීවරයන් පිළිබඳ විස්තරයක් මෙතැන් සිට දැක්වෙයි.

නීවරණ : නූපන් කුශල ධර්මයන් උපදින්නට හෝ උපන් කුශල ධර්මයන් දියුණු වීමට හෝ අවකාශ නොදී ආවරණය-වැලකීම-කරනුයේ නීවරණ නම්. නැත හොත් ප්‍රඥ චෛතසිකයට අවකාශ නොදී ක්‍රියා කරනුයේ නීවරණයි. "කුසල ධම්මෙ, ආවරන්ති නිවාරෙන්තීති නීවරණානි" කුශල ධර්මයන් වළක්වනුයි නීවරණ නම් යනුවෙන් විභඞ්ග අටුවාවෙහි සඳහන් වෙයි. සුතමය ඤාණයෙහි සඳහන් වූ ප්‍රහාතව්‍ය ධර්ම-අත්හළයුතු ධර්ම-කාණ්ඩයන් අතුරෙන් නීවරණ ද එක් කොටසෙකි. සතිපට්ඨාන සූත්‍රයේ ධම්මානුපස්සනා කාණ්ඩයන් අතුරෙන් ප්‍රථම කාණ්ඩය නීවරණ යි. ධම්මසඞ්ගණී මාතිකා කාණ්ඩ අතුරෙන් අටවැනි ගොච්ඡකය-පොදිය-වශයෙන් එනුයේ ද නීවරණ ගොච්ඡකය යි. මජ්ඣිම නිකායේ සූත්‍රකීපයකදී ම ධ්‍යාන දක්වීමට මත්තෙන් දක්වූයේ නීවරණ යැ. සූත්‍රාභිධර්ම ග්‍රන්ථයන්හි බොහෝ තැනක නීවරණ සඳහන් වෙයි. එයින් සූත්‍රධර්මයෙහි එනුයේ නීවරණ පසෙකි. අභිධර්මයෙහි සයක් දක්වෙයි. සමාධි භාවනාමය ඤාණවිස්තරයේ දී මුල්තැන දියයුත්තේ සූත්‍රදේශනාවන්ට ය. එහෙයින් මෙහිලා නීවරණ පස දක්වෙයි.

"සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො අභිජ්ඣා ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති, අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති, සබ්බපාණභූතහිතානුකම්පී, බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති, ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති, ආලොකසඤ්ඤී සතො සම්පජානො, ථීනමිද්ධා චිත්තං පරිසොධෙති, උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති, අජ්ඣත්තං වූපසන්තචිත්තො, උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති, අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති. සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ" -ම. නි. (ම. ප. ගණකමොග්ගල්ලාන සූත්‍රය)

ඒ යෝගාවචර භික්ෂු තෙමේ පසුබත පිණ්ඩපාතයෙන් වැළකී, එනම් දිවා වැළඳීමෙන් පසු, කය කෙළින් තබා; සිහිය භාවනා අරමුණ වෙත එළවා-පමුණුවා-බද්ධාසනයෙන් - පළඟ බැඳ - හිඳියි. හේ ආධ්‍යාත්මික ලෝකය නම් වූ තම ජීවිතයෙහි ඔබ-මොබ ගමන් කරන විෂම ලෝභය දුරුකොට, ලෝභ අදහසින් තොරව

2019 10 05 Paññápárami Na Uyana Free Distribution

වෙසෙසි. විෂම ලෝභයෙන් සිත පිරිසුදු කරයි. ක්‍රෝධය දුරු කොට, සියලු සතුන් වෙත හිතානුකම්පා ඇතිව, මෛත්‍රී සිතින් යුතුව වෙසෙයි. ක්‍රොධයෙන් සිත පිරිසුදු කරයි. ථිනමිද්ධය දුරු කොට, ආලෝක හැඟීම, සිහිය, නුවණ, සහිත වූයේ පහවූ ථිනමිද්ධ ඇතිව වෙසෙයි. ථිනමිද්ධයෙන් සිත පිරිසුදු කරයි. උද්ධච්ච කුක්කුච්චය දුරුකොට, ඇතුලෙහි සංසිඳුනු සිතකින් යුක්ත වූයේ අනුද්ධතව වෙසෙයි. උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසුදු කරයි. විචිකිච්ඡාව දුරුකොට, කුසලධර්මයන්හි සැක නැතිව වෙසෙයි. විචිකිච්ඡාවෙන් සිත පිරිසුදු කරයි. හේ සිත කිළුටු කරන්නා වූ ප්‍රඥාව දුර්වල කරන්නා වූ මේ පඤ්චනීවරණයන් දුරුකොට" (මතු සම්බන්ධයි.)

මේ සූත්‍රපාඨයෙහි පඤ්චනීවරණයන් දක්වෙයි. ඔවුහු නම් "අභිජ්ඣා" නාමයෙන් ආ කාමච්ඡන්ද නීවරණය, ව්‍යාපාද නීවරණය; ථිනමිද්ධ නීවරණය, උද්ධච්චකුක්කුච්ච නීවරණය, විචිකිච්ඡා නීවරණය යනුයි. මේ පඤ්ච නීවරණයන් දුරුකිරීමෙන් පසු මතු වට ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන උපදනා බැව් ඉතිරි දේශනායෙන් පෙනේ.

## 1. කාමච්ඡන්ද නීවරණය:

"කාමියතීති කාමං" කැමතිවෙතු ලැබේනුයි කාම නම්. කුමක් කැමතිවේ ද? "පඤ්චකාම ගුණා" රූපාදී පඤ්චකාම ගුණයෝයි. "කාමෙසු ඡන්දො, කාමච්ඡන්දො" කාම වස්තූන් කෙරෙහි කැමැත්ත, ඇලීම, කාමච්ඡන්ද නම්. "න කත්තුකාමතා ඡන්දො, න ධම්මච්ඡන්දො" යමක් කරනු කැමැත්ත නො වෙයි. ධර්මය පිළිබඳ කැමැත්ත නො වෙයි. "කාමච්ඡන්දො එව නීවරණං කාමච්ඡන්ද නීවරණං" කාමච්ඡන්දය ම කුශල ධර්මයන් හා ප්‍රඥාව ආවරණය කරන බැවින් කාමච්ඡන්ද නීවරණයයි. එහි කාමවස්තු නම් කැමති, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, යන පසයි. මේවා සුවසේ ලබා ගැනීමට උපකාරී වන ධනය, ගේ-දොර ඉඩ-කඩම්, කුඹුරු, මේ ආදිය ද කාමවස්තූන් වශයෙන් එයි. ඒ සියලු දේ කෙරෙහි සිතක පවතින ආශාව, වෙනස් වීමේදී ඇති වන ක්‍රෝධය, වැඩිය ලැබීමේදී ඇතිවන මානය, ආදී පාපධර්ම ක්ලේශකාම නම්. මෙසේ කාමවස්තු වශයෙන් වස්තුකාම, ක්ලේශකාම, දෙක ම ඇතුලත් වෙයි. වස්තුකාමයන් කෙරෙහි තද ඇල්ම කාමච්ඡන්ද නීවරණය යි.

"තත්ථ කතමං කාමච්ඡන්ද නීවරණං? යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං ඉදං වුච්චති කාමච්ඡන්ද නීවරණං"- ධ. සං. ප. 188 පි

එහි කාමච්ඡන්ද නීවරණය නම් කවරේ ද? කාමයන් කෙරෙහි යම් කැමැත්තක්, ඇලීමක්, සතුටක්, ආශාවක්, ආදරයක්, දැවිලි ගතියක්, මූලාවීමක්, බැසගැනීමක්, ඇද්ද, මෙය කාමච්ඡන්ද නීවරණයැයි කියනු ලැබේ. යනු එහි අදහසයි. විශේෂණ පද සතකින් යුක්තව කාමච්ඡන්ද නීවරණය මෙසේ දේශනා කළහ. එහි කාමයන් කෙරෙහි කැමැත්ත කාමච්ඡන්ද නීවරණය යි. ඇලීම ද කාමච්ඡන්ද නීවරණය යි. සියලු පදයන් හි මෙසේ තේරුම ගත යුතුය.

ගිහි-පැවිදි දෙපක්ෂයට ම කාමච්ඡන්ද නීවරණය බලපායි. එහි නුදු බොහෝ සෙයින් ගිහීහු කාමවස්තූන් හි ම ඇලෙමින් වෙසෙත්. පැවිද්දන් අතර ද බොහෝ සෙයින් පවතියි. එතකුදු වුවත් සමාධි භාවනා ක්‍රම දක්විය යුතු තැන කාමච්ඡන්ද නීවරණය විස්තර කරනුයේ යෝගාවචර භික්ෂුව මුල්කරගෙන ය. ගිහි කෙනෙකු වුවද යෝගාවචර නම් ඔහුට ද ඒ විස්තරය අවශ්‍යමැයි.

තමා වෙසෙන ආරාමය, සෙනසුන, හැද-පොරෝනා සිවුරු වළඳන පාත්‍රය, මේ ආදී පැවිදි ජීවිතයකට අවශ්‍ය දෑ කෙරෙහි තද ඇල්ම, වැඩියක් රැස්කර ගැනීමේ කැමැත්ත, අනුනට නො දෙව්වා යි බලාපොරොත්තුව, තමා ඒවා හැම දෙයක් ම පාලනය කළ යුතුයැයි හැඟීම, සියලු දායකයන් තමාට ම සැලකිය යුතුයැයි යන හැඟීම, මේ ආදී දෑ කාමච්ඡන්ද නීවරණයයි. එසේ ම ඇස කණ, නැහැය, දිව, සිරුර, යන ඉඳුරන් පස්දෙනාට හමුවන අර මුණු සුභ- ලක්ෂණ, වශයෙන් ගැනීම තම සිරුර අනුනට සුභ වශයෙන් වැටහෙන පරිදි එසේ වැටහේවා යි යන හැඟීම් ඇතිව සිරුර සැරසීම, එනම් නිතර නිතර හිස-රැවුළු බෑම, නිය මට්ටම් කිරීම, ලස්සන සිවුරු-පාත්‍රා පරිහරණය, ලස්සන කුඩ-සෙරෙප්පු පරිහරණය, ඉතා සුවසේ විසිය හැකි කුටි - කාමර - ප්‍රාසාදයන්හි විසීම, වෙසෙන තැන මනා ලෙස ඔපදමා මල්බඳුන්-සිතුවම් ඇතබා, අවට ලස්සන මල්-ගස්-වැල් රෝපනය කර තබා ගැනීම, මේ ආදිය ද කාමච්ඡන්ද නීවරණයයි. මෙසේ ජීවිතයත් අවට පරිසරයත් වටා කාමච්ඡන්ද නීවරණය ක්‍රියා කරන අයුරු යෝගාවචරයා විසින් දත යුතුය.

## කාමච්ඡන්ද නීවරණය ඉපදීමට හේතු.

"අත්ථි භික්ඛවෙ සුභනිමිත්තං තත්ථ අයොනිසොමනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස උප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස භියොභාවාය වෙපුල්ලාය" මහණෙනි, සුභ නිමිත්තක් ඇත. ඒ සුභ නිමිත්තෙහි බොහෝ සෙයින් නුනුවණින් මෙනෙහි කිරීම නූපන් කාමච්ඡන්දය ඉපදීමටත් උපන් කාමච්ඡන්දය දියුණු වීමටත් හේතුයි.

මෙහි සුභ නිමිත්ත යනුවෙන් දේශනා කළේ පෙර සඳහන් වස්තුකාමයට යි ඒ වස්තුකාමයන් අතර පුරුෂයාට ස්ත්‍රිය ගේ රූපාදී පඤ්චකාමවස්තු, ස්ත්‍රියට පුරුෂයා ගේ රූපාදී පඤ්චකාම වස්තු, ප්‍රධානයි. එයිනුත් ස්පර්ශය - මෛථුනය - මූලික කරුණයි. එහෙයින් ඒ ස්ත්‍රී-පුරුෂ ශරීර සුභ-යහපත් වශයෙන් පවතී යැයි යන හැඟීම නිසා සුභනිමිත්ත නම්. එහි සිහි-නුවණ දෙක නො යොදවා බැලීමෙන් කාමච්ඡන්ද නීවරණය ඉපදීමටත්, දියුණුවටත් හේතු වෙයි.

නිදර්ශන කථාවකි. බුදුරජාණන් වහන්සේ වැඩ සිටිනා කල්හි රජගහ නුවර "සිරිමා" නම් ගණිකාවක් - වෙසඟනක් - විසී ඕ දිනක් රෝගීව වසන්නී දසියන් ලවා භික්ෂූන්ට දන් දෙවා, තුමූ වැඳීම සඳහා භික්ෂූන් වෙත යත් ම, එක් භික්ෂුවක් රෝගී වූ ඇගේ සිරුර දැක, මෙසේ සිතී. "රෝගී වූ නමුදු මැගේ මෙපමණ ලස්සන නම් නිරෝගීව ඇඳුම්, ආබරණ, පැළඳ ගෙන සිටින කල්හි කොපමණ ලස්සන වේද" කියායි ඉක්බිති හේ පිණ්ඩපාතය ද නො වළඳා ඈ ගැන සිතමින් ම දුක් විය. මේ කරුණ මුල්කොට බුදුරජාණන් වහන්සේ සිරිමාව ගේ මළ සිරුර රජතුමා ලවා වෙන්දේසියෙහි යෙදවූ සේක. එක් රැයකට කහවණු දහසක් දී ලබා ගතයුතු ඈ දුන් නොමිලේ නමුත් ඇරගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවූයෙන් සිරුරෙහි ඇති අසුභ පිළිකුල්-ගතිය වටහා දෙමින් ධර්ම දේශනා කළහ.

## කාමච්ඡන්ද නීවරණය අස්කරගන්නා අයුරු:

"අත්ථි භික්ඛවෙ අසුභ නිමිත්තං තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස පහාණාය"

2019 10 05 Paññápárami Na Uyana Free Distribution

මිකණෙන්, අශුභ නිමිත්තක් ඇත එහි නුවණින් මෙනෙහි කිරීම බහුලවශයෙන් පැවතීම නූපන් කාමච්ඡන්දය නූපදීමටත් උපන් කාමච්ඡන්දය අස්වීම - ප්‍රහාණය-පිණිස, ආහාරයයි. එනම් හේතුවයි.

කාමච්ඡන්ද නීවරණය ප්‍රහාණය කිරීමට අශුභ නිමිත්ත නිතර නිතර මෙනෙහි කිරීම උපකාර පිණිස පවතී යයි බුදුරජාණන් වහන්සේ මේ පාඨයෙන් පැහැදිලි කළහ. එහි අශුභ නිමිත්ත යනු දස අසුභ භාවනා ක්‍රමයේ දී දක්වූ පිළිකුල් බවට පැමිණි මළසිරුරයි. පළමු කොට එය බලා “අයම්පි ඛො කායො එවං ධම්මො එවම්භාවී එතං අනතීතො” (තමාගේ සිරුර ගැන සිතා) මේ සිරුර ද මෙවැනි මරණයකට, මෙබඳු පිළිකුල් බවකට පැමිණේ. මේ සවභාවය (මවිසින්) නො ඉක්මවූයේය”යි ඒ පිළිකුල් සවභාවය තම සිරුරට ද පැමිණේය යනුවෙන් තමා වෙත හරවා මෙනෙහි කළයුතු. ඒ අශුභ නිමිත්ත “ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති” යන සතිපට්ඨාන ක්‍රමයට අනුව තමාගේ සිරුර හා අනුන්ගේ සිරුර වශයෙන් බැලීමෙන් කාමච්ඡන්ද නීවරණය ප්‍රහාණය වෙයි.

මේ මූලික අශුභ නිමිත්තයි. දෙවැන්න ද්වත්තිංසාකාර භාවනා ක්‍රමයේදී දක්වූ කුණප තිස්දෙකකින් යුත් තම සිරුරම අශුභ නිමිත්තයි. ඒ අශුභ නිමිත්ත අනුව බාහිර සිරුර ද මෙනෙහි කිරීමෙන් කාමච්ඡන්ද නීවරණය ප්‍රහාණය වෙයි. කොපමණ ලස්සන ස්ත්‍රී - පුරුෂයන් දුටුවත් කිසිදු ඇලීමක් නැතිව අවුරුදු ගණන් පල්වූ අසූචි වලවල් සේ වැටහෙයි. තුන්වැන්න තමා පරිහරණය කරන සිවුරු, ඇඳ - පුටු, සෙනසුන්, ආදී බාහිර - පිටතින් පවතින - වස්තු පිළිකුල් සහගත සිරුරින් ස්පර්ශ වීම නිසා අපිරිසුදු වීමෙන් ඒවාද අශුභ නිමිත්තට පෙරළෙයි. “සබ්බානි පන ඉමානි චීවරානි අජිගුච්ඡනීයානි ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයානි ජායන්ති” මේ සිවුරු වනාහි පිළිකුල් සහගතය. මේ කුණු සිරුරට පත්වූ පසු වැඩියක් ම පිළිකුල් වේ. මේ ක්‍රමය සිරුරට පමණක් නොව ආහාර, සෙනසුන්, බෙහෙත්, තවත් පරිහරණය කරන දෑ වෙත් නම් ඒ සියල්ලට ද සාධාරණය. එහෙයින් ඒ සියල්ල අශුභ නිමිත්තිය. මෙසේ ද මෙනෙහි කිරීමෙන් කාමච්ඡන්ද නීවරණය ප්‍රහාණය වෙයි. සිවුවැන්න තමා පරිහරණය කරන ඒ වස්තු පමණක් නොව සෙසු කුණු සිරුරු ස්පර්ශ කරන යම්තාක් දේ වෙද්ද ඒ සියල්ල ද අශුභ නිමිත්තිය.

නිදර්ශනයක්:- ඉතා ලස්සන උයනෙකි. මාර්ගයෙහි ගමන් කරන "අභිගුණ්ඨික" නම් පහත් මිනිසුන් සමූහයක් අවුත් එහි පැල්පත් සාදා පදිංචි වෙත්. මොවුහු දින හතක් පමණ වැස, අවට ද මල-මූ පැහැරීමෙන් අපවිත්‍ර කර යත්. එවිට උයනෙහි පලමු තුබූ ලස්සන ගතිය. මල් සුවඳ, හොඳ වාතාශ්‍රය, ඇද්දූයි සිහිකර බලන්න, ඒ අපවිත්‍රකම පලමුවෙන් ම තුබූ දෙයක් ද? නැත. අභිගුණ්ඨිකයන් ගේ කුණු සිරුරු ස්පර්ශ වීම නිසා අපවිත්‍ර විය.

මෙසේ කොපමණ ලස්සන දෙයක් තුමූදු පරිකරණය කිරීමට පටන් ගනිත් ම ඉතා අපිරිසුදු බවට පත්වෙයි. තවද පරිහරණය නො කළද කලක් පැවති පසු ඒ හැම දෙයක් ම දිරාපත් වී යාම නිසා පිළිකුල් බවට පැමිණෙයි. ඉදුනු එල ඇති මී අඹ ගසක් ගැන සිතන්න. කලින් ඉතා මිහිරි සුවඳක් හමයි. දින කීපයක් ඉක්මුණු පසුඒ ගස අසලින් තමූදු යාමට නො හැකිය මෙසේ හැම දෙයක්ම පිළිකුල් වස්තූහුය. එහෙයින් අශුභ නිමිත්ත වශයෙන් සලකා ගැනීම නිසා ඒවා කෙරෙහි පවතින තද ඇල්ම - කාමච්ඡන්දය - ප්‍රහාණය වෙයි.

"අපි ච ඡධම්මා කාමච්ඡන්දස්ස පහානාය සංවත්තන්ති අසුභනිමිත්තස්ස උග්ගහො, අසුභ භාවනානුයොගො, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා, භොජනෙ මත්තඤ්ඤුතා, කල්‍යාණ මිත්තතා, සප්පාය කථා" ති- ම. නි. අ. (පපඤ්ච සූදනී)

තවද කාමච්ඡන්දය ප්‍රහාණය පිණිස ධර්ම සතක් පවතිත් දස අසුභයන් අතුරෙන් එකක් හෝ ද්වත්තිංසාකාර භාවනා අරමුණ හෝ ඉගෙණීම, (පෙර විස්තර කර ඇත) ඊට අනුව භාවනාවෙහි යෙදීම, ඉන්ද්‍රිය සංවරය, ආහාරයෙහි පමණ දන්නා බව, අසුභ භාවනාවේ යෙදෙන කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීම, අසුභ භාවනාවට ම සුදුසු කථා, යන සයයි. විස්තර නො කළ කරුණු:- ජීවිතය යැපීම පිණිස ගනු ලබන ආහාර, පානවර්ග, බෙහෙත්, යන මේවායෙහි සිරුරට අවශ්‍ය ප්‍රමාණය දැනගෙන ගැනීමෙන් කාමච්ඡන්දය ප්‍රහාණය වෙයි ආහාරය උවමනා වනුයේ කුසගිනි පවතින කල්හිය. ආහාරය ගතයුත්තේ ද කුසගිනි නිවීමට පමණි. වැඩියක් අනුභව කළහොත් සිරුරෙහි ධාතු ශක්තීන් වැඩිවීම නිසා කුල්මත් ගතියක් ඇතිවෙයි. එනම් රාගය පැන නගියි. එහෙයින් ප්‍රමාණයට ගතයුතුය. බුදුරජාණන් වහන්සේ භික්ෂුවට රාත්‍රි ආහාරය තහනම් කළේ මේ කරුණ ද ඇතුලත් කොටය. පානවර්ග ද මීට අනුව සලකා ගත හැකිය. ඒවා ද

ප්‍රමාණයට වඩා ගැනීමෙන් නිවරණ පමණක් නොව මධුමේහ - දියවැඩියාව - ආදී රෝගයන් පැන නැගීමට ද හේතු වෙයි. රෝගය සංසිඳවීමට පමණක් බෙහෙත් ගත යුතුය. එය ඉක්මවා ගතහොත් එයිනුදු ඇතැම්විට නොවැලඳුන රෝග, නැති නම් ධාතු ශක්තීන් මැඩිවීම, මේ ආදී දේ මතුවේ. අද බොහෝ දෙනා ශරීරය දුර්වලයැයි කියමින් ධාතු ශක්තිය දියුණු කරන බෙහෙත් වගී පාවිච්චි කරති. විටැමින් සූක, ආසව, ආදියයි ඔවුන් දුර්වලත්වය ප්‍රකාශ කළත් සිතෙහි පවතිනුයේ ධාතු ශක්තිය දියුණු කරගැනීමයි. දියුණු වූ පසු ක්‍රියාවේ යෙදවීමට යාමෙන් ඇතැම්විට පාරාජිකා වීමෙන් ම සසුනෙන් බැහැර වෙයි. නැතහොත් නොයෙක් නින්දිත ක්‍රියාවන්හි යෙදීමෙන් චරිත දූෂණය කර ගනිති. එබඳු අයට කාමච්ඡන්ද නීවරණය පිටත්හි ද මැගිරෙන ලෙස බලපවත්වයි. එහෙයින් හිත-මිත භෝජනාදිය (සුදුසු එයත් පමණට ගැනීම, හිත-මිත නම්) ගැනීම කාමච්ඡන්ද නීවරණය අත්කර ගැනීමට උපකාර වන කරුණකි.

තවද අශුභ භාවනාවන්හි යෙදෙන යෝගාවචරයන් ඇසුරු කිරීම, ඔවුන් ගේ දහම් දෙසුම් වලට කණ් යොමු කිරීම, අශුභ කථා, පැවැත්වීම නිසා ද කාමච්ඡන්ද නීවරණය ප්‍රහාණය වෙයි එහෙත් ඇතැමෙක් ඇසුරු කරනුයේ ඉහත සඳහන් කළ පරිදි චරිත දූෂණයකට මග පාදදෙන පුද්ගලයන්ය. රුස්වූ සැම කල්හිම කථාකරනුයේද කාමච්ඡන්ද නීවරණය දියුණුවන පරිදි මය. බොහෝ සෙයින් ඉතා ඕනෑකමින් බලනුයේද කාමච්ඡන්ද නීවරණය දියුණු කරන පත-පොත ය. අද සමාජයේ එබඳු නවකතා පොත් බහුලය. ඇතැම් පුවත්පත් කියවීමෙන් කෙසේ වෙතත් දුටු පමණින්ම නීවරණ ඇවිස්සෙයි. කාගේ හෝ නළඟනක ගේ අඩ නිරුවත් රුවක් මුල් පිටුවේම පලවන හෙයිනි. එහෙයින් එබඳු පත-පොත දුරින් ම දුරු කර දහම් පත-පොත කියැවීමෙන් කාමච්ඡන්ද නීවරණය තුනී කරගත හැකිය. බුදු සරණ, සිංහල බෞද්ධයා, බුදුසසුන, දහම් එළිය, අවිහිංසා, ආදී දහමට නැඹුරු වූ පුවත් පත් අද පලවෙයි.

මෙසේ කාමච්ඡන්ද නීවරණය ක්‍රමානුකූලව ප්‍රහාණය කර ගැනීමෙන් සමාධි භාවනාව දියුණු කරගත හැකිය. සමථ භාවනාවක් සඳහා අරමුණු ගැනීමටත්, ගත් අරමුණ නිතර සේවනය කිරීමෙන් ප්‍රතිභාගාදී නිමිති පහළකර ගැනුමටත්, ඒ නිමිති අනුසාරයෙන් උපන් උපචාරාදී ධ්‍යාන තහවුරු කරගැනුමටත්

කාමච්ඡන්ද නීවරණය අප්විය සුතුම ය. කාමච්ඡන්ද නීවරණය නිසා අපේ බෝධිසත්වයන් වහන්සේ ලබාගත් චතුර්ථ ධ්‍යානයෙන් පවා පිරිහුණහ. එක් සමයෙක්හි බෝධිසත්වයෝ "හරිතතච" නමින් තාපසව වනයේ වෙසෙත්. උන් වහන්සේ දිනපතා පිණ්ඩපාතය සඳහා වඩිනුයේ රජගෙදරකට ය. දිනක් රජතුමා පසල් ගමක් සංසිඳවීම සඳහා යද්දී තාපසතුමාට දන් දෙන ලෙස බිසවුනට නියෝග කළේ ය. පසු දින බිසවු දානය සූදානම් කර, තාපසතුමා වඩින තෙක් සියුම් සළුවක් පොරවා ගෙන ජනෙල් කවුළුවක් අසල ඇඳෙක වැතිර සිටියේය. බෝධිසත්වයෝ ද අහසින් වඩිනුයේ, තවුස්තුමා එනු දුටු බිසවු හදිසියෙන් නැගිටීම නිසා සළුව ඉවත් වීමෙන් නිරුවත් සිරුර දක රාගය පැන නැගී, ධ්‍යානයෙන් ද පිරිහී රජගෙදරට අවුත් බිසවුන් සමග කම්සැප වින්දහ. කරුණු මෙසේ හෙයින් සමාධි භාවනාවට කාමච්ඡන්ද නීවරණය බලවත් සතුරෙකි.

## 2. ව්‍යාපාද නීවරණය.

සිතෙහි පවතින ක්‍රොධය, වෛරය, පලිගැනීම, ආදී ධර්ම ව්‍යාපාද නීවරණයයි. මෛත්‍රී කර්මස්ථාන විස්තරයෙහි ආ ද්වෙෂයෙහි ආදීනව මෙහිලා සැලකිය යුතු. ද්වෙෂ යනු ද මීට ම නමකි. තමාගේ සිතට නො ගැලපෙන සුළු දේ නමුත් ඇසීමෙන්, දැකීමෙන්, සිතීමෙන් ව්‍යාපාද නීවරණය හටගනියි. එහිලා විස්තර මෙසේය, "බ්‍යාපජ්ජති තෙන චිත්තං පූතිභාවං ගච්ඡතීති බ්‍යාපාදො" නපුරු සේ සිතයි. ඒ නිසා සිත කිළුටු බවට යේනුයි ව්‍යාපාද නම් නැතහොත් "බ්‍යාපාදයතිති වා විනයාචාරරූපසම්පත්ති හිතසුඛානීති බ්‍යාපාදො" යහපත් හික්මීම, සිරුරෙහි ලස්සන ගතිය, සිත් සැනසුම, යන මේවා බාධා කරනු ලැබේනුයි- ඒවා ඇතිවීම නො ඉවසානුයි-ව්‍යාපාද නම. "දොසස්සෙතං නාමං" ද්වෙෂයට මේ නමකි, ව්‍යාපාද නම් වූ ද්වෙෂය නිසා සිත දූෂිත – කිළුටු-වෙයි. පැහැදීම, සතුට, සැනසීම, විනාශ වෙයි. එළකිරි ලස්සන මිහිරි දෙයකි. එහෙත් ගොම ස්වල්පයක් වැටුනොත් කිසිදු ප්‍රයෝජනයක් නැතිවෙයි. එමෙන් සිත පැහැදිලි එකකි. එහෙත් පිටතින් පැමිණෙන පාප ධර්ම නිසා හාත්පසින් ම කිළුටු වෙයි. "පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං) තවද ද්වේෂයෙහි පවත්නා ගතියක් ඇත. අනුන්ගේ ශීලාචාරකම්, ගුණවත්කම්, ලස්සන සිරුරු, සැනසිලි ලෙස ජීවත්වීම්, යන මේවා දුටු විට නො ඉවසීම යි එබඳු අයගේ නැති වරද හෝ

දැකීම කෙනෙකු ගුණ ඇත ද නො පිළිගැනීම, ඒ ගුණ ලාමක ලෙස සිතීම, මේ ආදීහු ද ද්වේෂයෙහි ම ලක්ෂණයෝ ය.

"තත්ථ කතමං ව්‍යාපාද නීවරණං? අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතො ජායති, පියස්ස මෙ මනාපස්ස -පෙ- අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අට්ඨානෙ වා පන ආඝාතො ජායති, යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං විරොධො පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති මනොපදොසො කොධො කොධනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස ඉදං වුච්චති ව්‍යාපාද නීවරණං" - ධ. සං. ප.

ව්‍යාපාද නීවරණය නම් කුමක්ද? මට අවැඩක් කළේ යයි ක්‍රොධය හටගනී යි. මට අවැඩක් කරයි යනුවෙන් ක්‍රොධය හට ගනී යි. මට අවැඩක් කරන්නේ යයි ක්‍රොධය හටගනීයි. මෙසේ තම මිතුරාට ද අවැඩක් කළේය' යනාදි වශයෙන් කාල තුන අනුව ක්‍රොධය හටගනීයි. තම සතුරාට වැඩක් - දියුණුවක් කළේය යනාදී වශයෙන් කාල තුන අනුව ක්‍රොධය හටගනීයි. කණු - කටු ආදියෙහි හැප්පීමෙහිදී හෝ තමා බලාපොරොත්තු නැති අවස්ථාවන්හි වැසීම, සුළඟ-හිරු රශ්මිය ආදී දෑ පැමිණීමේදී හෝ මේ ආදී සිත් නැති වස්තූන් නිසා අස්ථාන ක්‍රොධය හටගනීයි. යම් මෙබඳු සිතෙහි ක්‍රොධයක්, ද්වේෂයක්, හාත්පසින් උපදින ද්වේෂයක්, මේ ආදී ක්‍රොධය යෙදූ යම් නාමයකින් යමක් හට ගනී යි ද, එසේ ම ඒ කරුණු නිසා සිතෙහි කිළුටු ගතියක්, කිළුටු බවක් වේ යි ද, ඒ සැම දෙයක් ම ක්‍රොධයෙහි ස්වභාවයෝ ය. මෙය ව්‍යාපාද නීවරණ යැයි කියනු ලැබේ. (මෙහි සමාන පද බහුල නිසා සාමාන්‍ය අදහස් යෙදීමි.)

මෙහි දැක්වූ නවවිධ ආඝාතය ගැන විස්තරයක් මෛත්‍රී කම්ස්ථානයේදී වීය. සෙසු පදයන් ගැන කිවයුත්තේ "අප්පමත්තකෙනපි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිට්ඨීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති" යනුවෙන් දේශනාවේ සඳහන් පරිදි සුළු දෙයක් නමුදු කිවහොත් කිපී, එය ම සිතෙහි තබා ගනිමින් කෝපය, ද්වේෂය, නොසතුට පළකරයි ද ඒ ස්වභාවය ව්‍යාපාද නීවරණය යනුයි.

## ව්‍යාපාද නීවරණය ඉපදීමට හෙතු:-

"අත්ථි භික්ඛවෙ පටිඝ නිමිත්තං තත්ථ අයොනිසොමනසි-කාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා බ්‍යාපාදස්ස උප්පාදාය උප්පන්නස්ස වා බ්‍යාපාදස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය"

මහණෙනි, පටිඝ නිමිත්තක් ඇත. එහි නුනුවණින් මෙනෙහි කිරීම වැඩිවීමෙන් නූපන් ක්‍රෝධය ඉපදීමටත්, උපන් ක්‍රෝධය දියුණුවීමටත් හේතු වෙයි. මෙහි පටිඝ නිමිත්ත යනු ක්‍රෝධය හා ක්‍රෝධයට හේතුවූ අරමුණුයි. ක්‍රෝධයත් පටිඝ නිමිත්තකි. ඊට හේතුවූ සතුරාගේ අරමුණ ද පටිඝ නිමිත්තකි. මේ දෙක කෙරෙහි සිහි - නුවණින් තොරව නිතර මෙනෙහි කිරීම වැඩි වුවහොත් ව්‍යාපාද නීවරණය උපදියි. එසේ ම දියුණුවෙයි. නුවණින් තොරව සිහිකිරීම නම් තමා යනු කවරෙක් ද? තමා ගේ ස්වභාවය කෙසේ ද? තත්වය කුමක්ද? මා ක්‍රෝධ කරන සතුරා කවරෙක් ද? ඔහුගේ තත්වය කුමක්ද? ස්වභාවය කුමක් ද? ක්‍රෝධ කිරීම නිසා ඇතිවන අයහපත කුමක් ද? මේ ආදී වශයෙන් නොසිතීමයි. එසේ සිතා ඊට පිළිතුරු ධර්මානුකූලව සපයා ගත් කල්හි ක්‍රෝධය හටගැනීමට කරුණක් නොමැති බව වැටහෙයි. තමා යනු ධාතු සමූහයකි. එසේ ම සසරදී කළ පින් - පව් දෙක නිසා ආ සතෙකි. තමා ගේ ස්වභාවය ජාති, ජරා, මරණ වලට ගොදුරුවීමයි. තත්වය සෙසු සත්වයාට වඩා සිතීමට හැකි මනසකින් යුත් මිනිසෙකු වීමය. මෙහිලා දැනට සිටිනා, ඉගෙණීමෙන් හෝ රැකියාවෙන් හෝ ලබාගත් තත්වය ද සිහි කිරීම මැනවි. එසේම ක්‍රෝධ කිරීම නිසා සිතෙහි කිළුටක් ඇති වෙයි. ඒ නිසා ම සිත අසුරු කරන ලෙය දූෂිත වී සිරුර සෑම තන්හි පැතිරීමෙන් කුෂ්ට රෝගාදිය හටගනියි. ශරීරය දිරාගිය ගසක් සේ අබලන් වෙයි. මේ අනුව සතුරා ගැන ද සිතත් ම ක්‍රෝධය තුනීවී යයි. මෙසේ නොසිතා පළිගැනීමේ අදහසම ක්‍රියා කරත්නම් එය නුනුවණින් මෙනෙහි කිරීමකි. නූපන් ක්‍රෝධය නමුදු ඒ නිසා උපදියි. උපන් ක්‍රෝධය අශුචි වලක් සේ අවුරුදු ගණන් පල්වෙයි.

## ව්‍යාපාද නීවරණය විනාශයට හේතු:

"අත්ථි භික්ඛවෙ මෙත්තාචෙතොවිමුත්ති, තත්ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්සවා බ්‍යාපාදස්ස අනුප්පාදාය, උප්පන්නස්සවා බ්‍යාපාදස්ස පහානාය"

මහණෙනි, මෛත්‍රී චිත්තවිමුක්තියක් ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම වැඩිවූ තරමට නූපන් ක්‍රෝධය නූපදීම පිණිසත්, උපන් ක්‍රෝධය විනාශය පිණිසත් ආහාර-හේතු-වෙයි. මෛත්‍රී චිත්තවිමුක්තිය ඉහතදී විස්තර කෙරිණ.

තවද ක්‍රෝධය විනාශවීම සඳහා කරුණු සයක් පවතින බව සඳහන් වෙයි. “අපි ච ඡ ධම්මා බ්‍යාපාදස්ස පහානාය සංවත්තන්ති, මෙත්තා නිමිත්තස්ස උග්ගහෝ, මෙත්තාභාව නානුයෝගෝ, කම්මස්සකතා පච්චවෙක්ඛනා පටිසංඛාන බහුලතා, කල්‍යාණමිත්තතා, සප්පායකථා” මෛත්‍රී නිමිත්ත ඉගෙණීම, මෛත්‍රී භාවනාවෙහි යෙදීම, කර්මය ගැන සිහිකිරීම, නුවණින් සිහිකිරීම් වැඩිවීම, කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීම, ක්‍රෝධය සංසිඳෙන කතා ඇසීම හා කීම යනුයි. මෙහි පළමු වැනි, දෙවැනි කරුණු ඉහතදී දක්විණි. තුන්වැන්න:- කර්මය ගැන සිහිකිරීම නම් “මොහු තමාගේ දනාදී කුශල ධර්මයන් නිසා සැපසේ ජීවත්වෙයි. නැතහොත් මොහු දුකට පත් වූයේ පෙර ආත්මයන්හිදී පාපධර්මයන් රැස්කරගත් හෙයිනි. මා ඔහු කෙරෙහි කිපීමෙන් ඔහුගේ සම්පත හෝ විපත හෝ නැති කිරීමටවත් තහවුරු කිරීමටවත් නොහැකිය. එසේම මාගේ කිපීම නිසා ඔහුගේ යහපත් පැවතුමෙන්-ශීලයෙන්-හෙලිමක්ද නො සිදුවෙයි. මේ ආදී වශයෙන් සිතීමයි. එසිතුදු ව්‍යාපාද නීවරණය විනාශභාවයට යෙයි. අනුන් ගැන ද තමා ගැන ද නුවණින් මෙනෙහි කිරීම “පටිසංඛාන” නම්. එයින්ද ව්‍යාපාද නීවරණය අස්වෙයි. මෛත්‍රියෙන් යුත් යහපත් මිතුරන් ඇසුරු කිරීමෙන් ද ඔවුන් සමග සමගිය, සහයෝගය, මිත්‍රකම, හිතවත්කම කවරෙකු නමුදු ජීවත්විය යුතු බව, කාටත් මේ ලෝකය සාධාරණ බව යුක්තිය ඉටු කිරීමේ අගය, පොදු හැඟීම් මේ ආදී කරුණු ඇතුළත් කතා බෙහෝ සෙයින් කීම, ඇසීම නිසා ද ව්‍යාපාද නීවරණය ජලය දුටු ගින්නක් සේ සංසිඳෙන බව දතයුතු.

සමාධි භාවනාවට විරුද්ධ වූ ව්‍යාපාද නීවරණය මෙසේ දැන අස්කරගතයුතු.

## 3. ථිනමිද්ධ නීවරණය:

ථිනමිද්ධ පද දෙකකි එකක් ථින. අනෙක මිද්ධ. එහි ථින යනු සිතෙහි හැකුළුනු ගතියයි “චිත්තස්ස අනුස්සාහෝථිනං” සිතෙහි උත්සාහ නොමැතිවීම ථින නම්. උත්සාහ නොමැත්තේ හැකුළුනු හෙයිනි. චෛතසිකයන් ගේ

ක්‍රියාවෙහි යෙදවීමට නොහැකි ගතිය මිද්ධයි. "චෙතසිකානං අකම්මඤ්ඤතා මිද්ධං" යනු විග්‍රහයයි. අකර්මණ්‍ය නම් වැඩක යෙදවීමට නොහැකි බවයි. "ථිනඤ්ච මිද්ධඤ්ච ථිනමිද්ධං", ථිනයද මිද්ධයද ථිනමිද්ධයි. ද්වන්ද්ව සමාසයි. සිතෙහි හැකුළුනු ගතිය නිසා යමක් කිරීමේදී ඊට අවශ්‍ය සිතුවිලි - චෛතසික- ඉදිරියට නො එයි. එහෙයින් සිතත් සිතුවිලිත් මැලවීම් බවට යෑම ථිනමිද්ධ බව දතයුතු. අපේ ව්‍යවහාරයෙන් නම් කම්මැලිකමයි. සමථ භාවනාවකට අනුව සිත සන්සුන් කර ගැනීමේදීද ජීවිතය පිළිබඳ නුවණ යොදවා බලන විදර්ශනා භාවනා, වේදීද බොහෝසෙයින් පැනනගින ක්ලේශකර ධර්මයෙකි. ථින මිද්ධය. එයම නූපන් කුශලධර්ම ඉපදීමට ද උපන් කුශලධර්ම දියුණු වීමට ද, නුවණ දියුණුවීමටද අවකාශ නොදී අවහිර කරන හෙයින් නීවරණයෙකි. එයින් කීහ. ධම්මසඞ්ගණියෙහි:

"තත්ථ කතමං ථිනමිද්ධ නීවරණං? අත්ථි ථිනං අත්ථිමිද්ධං, තත්ථ කතමං ථිනං? යා චිත්තස්ස අකල්ලතා අකම්මඤ්ඤතා ඔලීයනා සල්ලීයනා ලීනං ලීයනා ලීයිතත්තං ථිනං ථියනා ථියිතත්තං චිත්තස්ස ඉදං වුච්චති ථිනං, තත්ථ කතමං මිද්ධං? යා කායස්ස අකල්ලතා අකම්මඤ්ඤතා ඔනාහො පරියොනාහො අන්තොසමොරොධො මිද්ධං සොප්පං පචලායිකා සුපනා සුපිතත්තං ඉදං වුච්චති මිද්ධං, ඉති ඉදං ච ථිනං ඉදං ච මිද්ධං ඉදං වුච්චති ථිනමිද්ධං නීවරණං."

ථිනමිද්ධ නීවරණය නම් කවරේද [ථිනයක් ඇත. මිද්ධයක් ඇත. ථිනය නම් කවරේද? සිතෙහි යම් ගිලන් බවක් වේද, වැඩකට යොදවන්ට නොහැකි බවක් පසුබට ගතියක් වේද එය ථින නම්. (සමානාර්ථ පද සංක්ෂේප කෙරිණ.) මිද්ධය නම් කවරේද? චෛතසිකයන්ගේ යම් ගිලන් බවක් වේද, වැඩකට යොදවන්ට නොහැකි ගතියක්, අහස වැහි වලාකුළින් වසාගන්නාක් මෙන් වෙලාගැනීමක්, හැම අයුරින්ම වෙලාගැනීමක් ඇතුලත වලක්වා ගැනීමක් වේද, එසේම චෛතසිකයන් ගේ මැලිකම, නිදන ගතිය, නිදිවැටීම, නිදාගැනීම, නිදන බව, මිද්ධ නම්. මෙසේ ථින යද මිද්ධයද ථිනමිද්ධයි. මෙය ථිනමිද්ධ නීවරණයැයි කියනු ලැබේ.

ශරීරයෙහි පවතින ගිලන්කමක් නිසා හෝ දුර්වලකමක් නිසා හෝ ඇතිවීමෙන් නින්දට වැටීම ථිනමිද්ධ නීවරණය වශයෙන් එනුයේ ශරීරයෙහි ශක්තිය, නිරෝගිකම, තිබියදීත්

ඇලි මැලි ගතිය ඇතිකර ගැනීමයි. ඊට හේතු සයකි. "ඡ බො මෙ ගහපති පුත්ත ආදීනවා ආලස්සානුයොගෙ, අති සීතන්ති කම්මං න කරොති, අතිඋණ්හන්ති කම්මං න කරොති, අතිසායන්ති කම්මං න කරොති අතිපාතොති කම්මං න කරොති අති ඡාතොස්මි කම්මං න කරොති, අතිධාතොස්මි කම්මං න කරොති"- දී. නි.

(සිගාලෝවාද සූත්‍රය)

ගෘහපති පුත්‍රය, කම්මැලිකමෙහි යෙදීමෙහි වරද සයෙකි. ඉතා ශීතයැයි කියා කර්මාන්ත නොකරයි. ඉතා උෂ්ණයැයි-ඉතා සවසයැයි-ඉතා අළුයමැයි-ඉතා කුසගිනි ඇත්තෙමියි ඉතා කුස පිරුණු කෙනෙක්මියි කර්මාන්ත නො කරයි.

මේ ධර්මය ගෘහපතියෙකුට දේශනා කළත් යෝගාවචරයාටත් එහි ඉගෙනීමක් ඇත. එනම් මේ කරුණු සය මුල්කොට සමථ භාවනාව කල් දමන්ට සිදුවෙයි. මැලි ගතිය ඔහු යටකොට සිටියි. "ඔලිගනා" පසුබට වීම උදාවෙයි. එහෙයින් මේ කරුණු සය ථීන මිද්ධ නීවරණය ඇතිවීමට හේතුහු වෙත්. තවද "මම පෙරදින ගිලන්ව සිටියෙමි"යි අතීතය ගැන සිතා කම්මැලිගතිය උපදවාගනියි. නැතහොත් "මෙසේ දීවා රෑ භාවනා කළහොත් මම ගිලන්වෙමි"යි අනාගතය ගැන සිතා පසුබටවෙයි. මේ අයුරු කින් හෝ අන් කරුණක් නිසා හෝ ශරීරයෙහි රෝගී බවක් නොමැතිව මැලි ගතියක් දක්වයි නම් ඒ ථීනමිද්ධ නීවරණය බව දතයුතු.

යෝගාවචර භික්ෂුවට ථීනමිද්ධ නීවරණය තදින් බල පවත් වයි. ඊට හේතු කීපයකි. ශරීරයට අවශ්‍ය නියමිත ව්‍යායාමයක් නො මැතිකම, මිහිරි පෝෂ්‍යදායී ආහාර ගැනීම, චේතනයක් - පඬියක්-නො මැතිකම, (මුදලට කවුරුත් ප්‍රිය වෙත් මක්නිසාද? මුදලින් කැමතිවන මූලික දේ පත්කම් සුවයයි එහෙයිනි) අන්‍ය යන්ගේ දෙස් දැකීම, (අන්‍යයන්ගේ දෙස් දක්නේ අත්තුක්කංසන පරවම්භන දෙක නිසාය. එනම් තමා මුල්තැන තබාගැනීම, අනුන් පහත් තැන තබාගැනීමයි. මෙයද යෝගාවචරයාට බල පවත්වන්නකි.) "අසවලා මෙසේ කරයිනම් මා විසින්ද එසේ කළාට කිනම් වරදක්ද"යි අදහස්වීම, මේ ආදියයි. තවද කම්සථා නය නියම අයුරින් නො ඉගෙණගත් බවෙන් ද මේ නීවරණය එයි. යම් යම් තැනකදී කම්සථානයට අනුව සිත යෙදවීමට නො හැකි වූ විට පසුබට ගතියක් ඇතිවෙයි.

## ථීනමිද්ධ නීවරණය ඇතිවීමට හේතු:

අත්ථි භික්ඛවෙ අරති තන්දි විජම්භිකා භත්තසම්මදො චෙතසො ලීනත්තං තත්‍ථ අයොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා ථිනමිද්ධස්ස උප්පාදාය උප්පන්නස්ස වා ථිනමිද්ධස්ස භියොභාවාය වෙපුල්ලාය'

මහණෙනි, අරති, තන්දි, විජම්භිකා, භත්තසම්මද, සිතෙහි හැකුළුනු බව මෙනෙහි කිරීම නූපන් ථිනමිද්ධය ඉපදීමටත්, උපන් ථිනමිද්ධය දියුණුවීමටත් හේතුය. එහි "අරති" යනු කලකිරුණු බවයි. කුශල ධර්මයන්හි නොයෙදීම් ගතියක් වෙයි නම් ඒ අරතී බව දතයුතු. ඒ නොයෙදෙන්නේ කලකිරීම නිසාය. කම්මැලිකම තන්දි නම්. ඒ නිසාම ඇඟමැලි කැඩීම, ඇඳෙහි වැතිරී ඒ මේ අතට හැරීම, විජම්භිකායි. වැඩියක් අනුභව කිරීම නිසා ඇති වන නිදිමත ගතිය භත්තසම්මද නම්. අනෙක සිතෙහි හැකුළුනු සවභාවයයි. මේ කරුණු කෙරෙහි නිතර සිහි-නුවණින් තොරව පැවතීම නිසා ථිනමිද්ධ නීවරණය උපදියි. ඒ කරුණු යහපත්ය කියා හැඟීම සිහි නුවණින් තොරව පැවතීමයි. ඒවාහි දෙස් නොදැකීම ද මීට ඇතුලති,

## ථිනමිද්ධ නීවරණය අස්වීමට හේතු:

"අත්ථි භික්ඛවෙ ආරම්භධාතු නික්ඛමධාතු පරක්කම ධාතු, තත්‍ථ යොනිසොමනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා ථිනමිද්ධස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා ථිනමිද්ධස්ස පහානාය" මහණෙනි, ආරම්භධාතු, නික්ඛම ධාතු පරක්කම ධාතු, වශයෙන් පවතින වීර්‍ය්‍යයක් ඇත. එහි සිහි-නුවණ යොදවා බහුල වශයෙන් මෙනෙහි කිරීම නූපන් ථින මිද්ධය නූපදීමටත් උපන් ථිනමිද්ධය දුරුවීමටත් හේතු වෙයි.

යම් දෙයක් සිදුකිරීම සඳහා පටන්ගැනීමේදී ඇති උත්සාහය ආරම්භධාතු වීර්‍ය්‍යයයි. ඒ උත්සාහයේ පරිදි එහි යෙදීම, කම්මැලිකම් දුරලීම, නික්ඛම ධාතු වීර්‍ය්‍යයි. කිනම් කරුණක් නමුදු පැමිණ අවහිර වුවත් එය නොතකා දැඩි උත්සාහයෙන් යුක්ත වීම පරක්කමධාතු වීර්‍ය්‍යයයි. මේ තෙවැදෑරුම් උත්සාහය නිසා ඒවායින් යුක්තවූවෝ ද ත්‍රිවිධය. ශූර, වීර, ධීර යනුයි. ශූරයාගේ සවභාවය ආරම්භකිරීමයි ආරම්භ කළා සේම පසුබට නො වී දිගටම කරගෙන යෑම වීරයාගේ ගතියයි. කවර කරුණක් නමුත් බාධා පීඩිස පැමිණිය ද එය සුළුකොට නො නවත්වාම කරනු

යේ ධීරයායි. සූරභාවයේදී සිහිය මූලික වෙයි, වීරභාවයේදී වීර්‍යය මූලික වෙයි. ධීර භාවයේදී ඥානය ප්‍රධානයි. සිහිය, උත්සාහය, නුවණ, යන කරුණු තුනම ක්‍රියාවේ යෙදවුවහොත් ක්‍රියාව සාර්ථකය, ප්‍රශංසාහීය:- පැසසීමට සුදුසුය-මෙසේ නොවැදූරුම් වීර්‍යය පිළිබඳ සිහි - නුවණ යෙදවීමෙන් ථිනමිද්ධ නීවරණය ප්‍රහාණය වෙයි.

“අපි ච ඡ ධම්මා ථිනමිද්ධස්ස පහානාය සංවත්තන්ති, අතිභොජනෙ නිමිත්තග්ගාහො, ඉරියාපථ සම්පරිවත්තනා, ආලොකසඤ්ඤා මනසිකාරො, අබ්භොකාසවාසො කල්‍යාණමිත්තතා, සප්පාය කථා” ති තවද ථිනමිද්ධ නීවරණය ප්‍රහාණය පිණිස ධර්ම කරුණු සයක් පවතියි. වැඩිය වැළඳීමෙහි දොස් දැකීම, ඉරියවු වෙනස්කිරීම එළිය යන හැඟීම එළිමහනෙහි විසීම, කල්‍යාණ මිත්‍රයන් ගේ ඇසුර, සුදුසු කථා යනුයි.

ආහාර හැකිතාක් වැළඳීමෙන් නිදිබරගතිය උපදියි. එහෙයින් ප්‍රමාණවත් ආහාරයක් ගතයුතුය. පෙර විස්තර කළ ආහාරහත්ථකාදී පස්වැදෑරුම් බ්‍රාහ්මණයන් සේ වැළඳීමේ දොස් දැක, තමාට පහසුවෙන් දිරවිය හැකි, හිත-මිත භෝජනය ගැනීමේ ආනිශංස දැක, සතර-පස් පිඬකට ඉඩ තබා වැළඳීමෙන් ථිනමිද්ධ නීවරණය දුරුවෙයි. එසේ ම වරින්වර ඉරියවු-හිඳිම්, සක්මන් කිරීම්, ආදිය-වෙනස් කළ යුතුය. එකම ඉරියවුවකින් ගතකිරීමෙන් ථිනමිද්ධය එයි. තවද ආලෝක සඤ්ඤාව-එළිය යන හැඟීම-සිහි කළ යුතුය. එය ආකාශ කසිණයෙන් හෝ බොහෝ වේලාවක් පහන් ආලෝකයක් දෙස බලා සිටීමෙන් හෝ ගත හැකිය. කසිණයෙන් ගතහොත් එය වඩාත් මැනවි. කෙසේ හෝ වේවා අන්ධකාරය ගැන සිතන්නේ නැතිව ආලෝකය ගැන ම සිතීමෙන් ථිනමිද්ධ නීවරණය දුරුවෙයි. හැකිතාක් වේලා එළිමහනෙක විසීමෙන් ද නිදිමතගතිය තුරන්වෙයි. ථිනමිද්ධය දුරුකොට වෙසෙන යහපත් මිතුරන් ඇසුරු කිරීම, කම්මැලි, කම්මැලිකම ම රුවා දක්වන, වචනයෙන් පමණක් හැම දෙයක් ම සිදු කරන, කුසීත පුද්ගලයන් දුරු කිරීම, ථිනමිද්ධ නීවරණය ප්‍රහාණය කිරීමට හේතුයි. එසේ ම උත්සාහය පිළිබඳ කථා ද උපකාර පිණිස පවතී.

මෙසේ ථිනමිද්ධ නීවරණය ගැන අවබෝධයක් ලබා එය තම ජීවිතයෙන් අත්කරගතහොත් සමාධි භාවනාවකින් ලැබිය හැකි උපචාරාදී සමාධි ගුණ හමුවෙයි. ථිනමිද්ධ නීවරණය සමාධියට සතුරෙකි.

## 4. උද්ධච්ච කුක්කුච්ච නීවරණය:

"උද්ධච්ච කුක්කුච්ච" මෙස පද දෙකකි. සිතෙහි පවත්නා-නොසන්සුන් ගතිය උද්ධච්ච නම්. පසුතැවීම් ස්වභාවය කුක්කුච්චයි. ද්වන්ද්ව සමාසවීමෙන් උද්ධච්චකුක්කුච්චයැයි සැදිණ. (උද්ධච්චඤ්ච කුක්කුච්චඤ්ච-උද්ධච්චකුක්කුච්චං) එය ම පෙර කී හෙයින් සමාධි භාවනාවට හා විදර්ශනා භාවනාවට අවහිර කරන හෙයින් නීවරණයකි. මේ ධර්ම දෙකෙහි ස්වභාවය-හැටි-මෙසේ දතයුතු.

"උද්ධතස්ස භාවො උද්ධච්චං, අවූපසමොති අත්ථො, වික්ඛෙපපච්චුපට්ඨානං" නොසන්සුන් බව උද්ධච්චයි. නොසන් සිඳිම යන තේරුමයි. එය අන් වචනයකින් කිවහොත් විසුරුණු ගතියට නමකි. අළු රැසකට ගල් කැටයක් ගැසූ කල්හි විසිරෙන්නේ යම්සේ ද එසේ සිතෙහි පවත්නා විසුරුණු ගතිය උද්ධච්චයයි. තවද එක් අරමුණක නො පිහිටීම, දියෙන් ගොඩ ගත් මාළුවෙකු සේ සුළං හමන තැනක එල්ලූ කොඩියක් සේ ලෙලදීම, මුහුදේ රළ මෙන් නැගී-නැගී ඒම, යන මේ ලක්ෂණද උද්ධච්චයටම ඇතුළත්. "කුක්කුච්ච" කුච්ඡිතං කතං කුකතං, කුකතස්ස භාවො කුක්කුච්චං; ගරහිත කිරිය භාවොති අත්ථො පච්ඡානුතාපපච්චුපට්ඨානං" පිළිකුල් කටයුතු නින්දාසහගත දේ කළ බව "කුකත" නම්. ඒ කුකතයාගේ ස්වභාවය කුක්කුච්චයි. කළාට පසු ඊට අනුව පසුතැවීමට මේ නමකි. සතුන් මැරීම් ආදී පාපකර්මයක් සිත-කය-වචනය යන තුන් දොරින් සිදුකළ පුද්ගලයාගේ පසුතැවීම් ස්වභාවය කුක්කුච්චය බව තේරුම් ගතයුතු.

සමාධි භාවනාවට බැසගත් යෝගාවචරයාගේ සිත, කුශල ධර්මයන්හි යොදවන අවස්ථාවේදී එයින් ලැබෙන සැනසුම් ගතිය දැනෙන්ම, "මෙවැනි සැනසුම් සුවයක් මීට පෙර ලබා ගැනීමට නොහැකිවූයේ මා විසින් පාපකර්මයන්හි යෙදීම නිසායැ"යි තමා කළ පව්කම් ගැන සිතෙයි. එවිට ලැබගෙන යන සිතෙහි එකඟකම නැති වී නොසන්සුන් ගතියක් උදාවෙයි. මෙසේ කුක්කුච්චය නිසා උද්ධච්චය පහලවන බව දතයුතුය. සිත නොසන්සුන් බවට පත්වන කල්හි "මා මෙසේ උත්සාහ කරද්දීත් සිත තැන්පත් නො වනුයේ කුමක් නිසාදැ"යි මෙනෙහි කරන විට," මා විසින් පෙරදී කළාවූ පාපධර්මයන් නිසා වෙන්නට ඇතැයි ද. නැතහොත් මෙවැනි කුශල භාවනාවක් පුරුදු නොකළ නිසා වන්නට හැකි

යයි ද සිතෙයි. කළාවූ පාපධර්ම හා නො කළාවූ කුශලධර්ම එසේ මෙනෙහි වීමෙන් කුක්කුච්චය හටගනියි. මේ උද්ධච්චය නිසා කුක්කුච්චය උපදින අයුරුයි. මෙනයින් අන්‍යෝන්‍ය සම්බන්ධකම් ඇතිව උපදින උද්ධච්චකුක්කුච්චය සමාධි භාවනාවේදී කුශල ධර්මයන් වසා දමන හෙයින් නීවරණයෙකි.

"තත්‍ථ කතමං උද්ධච්ච කුක්කුච්ච නීවරණං? අත්‍ථි උද්-ධච්චං, අත්‍ථි කුක්කුච්චං, තත්‍ථ කතමං උද්ධච්චං? යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො ඛිකෙඛපො භන්තත්තං චිත්තස්ස, තත්‍ථ කතමං කුක්කුච්චං? අකප්පියෙ කප්පිය සඤ්ඤිතා, කප්පියෙ අකප්පිය සඤ්ඤිතා, අවජ්ජෙ වජ්ජ සඤ්ඤිතා, වජ්ජෙ අවජ්ජ සඤ්ඤිතා, යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො ඉදං වුච්චති උද්ධච්ච කුක්කුච්ච නීවරණං"

මේ දේශනා පාඨයෙන් උද්ධච්චකුක්කුච්ච නීවරණය තව දුරටත් පැහැදිලිවෙයි. මෙහි කෙටි අදහස මෙසේය පෙර සඳහන් පරිදි සිතෙහි වික්ෂේපය - නොසන්සුන් ගතිය - භ්‍රාන්ත ගතිය, එනම් යමකට බියවූ මුවෙකු ගේ යම් විලාශයක් ඇද්ද එබඳු ස්වභාවය, උද්ධච්ච නම්. අකැප දෙයෙහි කැපයැයි ද, කැප දෙයෙහි අකැපයයි ද නිවරදෙහි වරදයැයි ද, වරදෙහි නිවරදයැයි ද මෙබඳු සිතෙහි පවත්නා සැකය, සැකවීම, සැකවූ බව, විපිළිසරය, ලෝහ බඳුනක් ඉදිකටුවකින් සීරෙන්නාක් මෙන් සිත සීරීගෙන-පෑරීගෙන එන ස්වභාවයක්වේ ද එය කුක්කුච්ච නම්:

මෙහි අකැප දෙයෙහි කැපය යන හැඟීම නම් බුදුරජාණන් වහන්සේ තහනම් කර වදාළ දෑ කැපයයි කියා සිතා ගැනීමයි. වලස් මස්, කොටි මස් ආදී තහනම් මස් වර්ග හුරුමස්ය, මුව මස්ය යන හැඟීම ඇතිව වළඳයි. කාලය ඉක්මගිය පසු ද වළඳා කාලයෙහි වැළඳීයයි සිතයි. මෙසේ පවතින හැඟීම එයින් කියවේ. මේ අදහස්ම අනෙක් අතට හරවාගෙන බැලීමෙන් කැප දෙයෙහි අකැපයයි යන හැඟීම් තේරුම් ගත හැක. මෙසේ මනා ලෙස පිහිටුවා ගත් සිහියක්, නුවණක් නො මැතිවීමෙන් හා ධර්මය නො හැදෑරීමෙන් කුක්කුච්චය උපදියි.

## උද්ධච්ච කුක්කුච්ච නීවරණය ප්‍රහාණයට හේතු:

මෙහිලා ප්‍රධාන කරුණ වනුයේ සිතෙහි සන්සුන් බව ඇති කරගැනීම හා සිහි-නුවණ දෙක යෙදවීමය. ආනන්තරිය කර්ම හැර කෙතෙක් පාපකර්ම කළේවී නමුත් පැවිදිවූ තැන් සිට, නැත

හොත් විවේක ජීවිතයකට පත් වූ දින සිට, එබඳු ලාමක පැවතුමකට පත්නුනෙමි'යි සලකා ගැනීම නිසා සිත සන්සුන් කර ගත හැක, සැක ද දුරු කළ හැකිය. "අනේ සාධු! මම එබඳු පව් කම් වලින් වැලකුනෙමි"යි යනුවෙන් දූත් ඇති තත්‍වය ගැන සිතා හෝ සතුට උපදවාගෙන ද සන්සුන් කරගත හැකිය. මෙසේ සිහිනුවණ යොදවා සිතා බැලීමේදී උද්ධච්චකුක්කුච්ච නීවරණය ප්‍රහාණය කළ හැකිසි. අංගුලිමාල, සංකිච්ච රහතන් වහන්සේ ගේ ශිෂ්‍ය පිරිස වූ පන්සියයක් සොරු, සිරිමා නම් ගණිකා, මේ ආදීහු එසේ ක්‍රියා කිරීමෙන් මාර්‍ග-ඵල ලැබුවෝ වෙත්.

"අපි ච ඡබ්බම්මා උද්ධච්චකුක්කුච්චස්ස පහානාය සංවත්තන්ති, බහුස්සුතතා, පරිපුච්ඡකතා විනයෙ පකතඤ්ඤුතා, වුද්ධසෙවිතා, කල්‍යාණමිත්තතා, සප්පාය කථා"ති

තවද උද්ධච්ච කුක්කුච්ච නීවරණය ප්‍රහාණය පිණිස ධර්‍ම කරුණු සයක් ඇත. ත්‍රිපිටක ධර්‍මය හැකිතාක් දුරට අර්‍ථ වශයෙන් ඉගෙණ ගත් බව,-බහුස්සුතතා-සැක තැන් දුරලීමට නිතර ප්‍රශ්න කිරීම, විනය පිළිබඳ පලපුරුද්ද, වැඩි මහළු අය ඇසුරු කිරීම, ධර්‍ම ධරයන් වූ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, ධර්‍මානුකූලව කෙරෙන කථා යනුයි.

මේ කරුණු සයෙන් ගතයුතු කෙටි අදහස, උද්ධච්චකුක්කුච්ච නීවරණය ප්‍රහාණය කිරීමට හැක්කේ ධර්‍මය උගත් යෝගාවචර යන්ට ය යනුයි. ධර්‍මය ඉගෙණීමක් නොමැතිව ඇසූ-දුටු පමණින් භාවනා කිරීමට ගියහොත් ඔහු යට කර ගෙන මේ නීවරණය පැන නගියි. ඇතැම් යෝගාවචරයන් ගේ පටු හැඟීමක් පවතී. "ධර්‍මය නොයෙක් ඉගෙණ ගත් නමුදු පිළිපදින්නේ නැති නම් ඉන් ඇති අර්‍ථය කුමක්ද? අපි නම් දන්නා තරමට පිළිපදින්නෙමු. එහෙයින් අපි ම නියම අයුරින් ශාසනය රකින්නෝ වෙමු"යි කියයි. මෙබඳු හැඟීමට ම මුල් තැනදී ධර්‍මය නො ඉගෙණ භාවනා කරගෙන යන්ම බොහෝ තැන්වලදී ඔහුට උද්ධච්චක්කුකුච්ච නීවරණය විරුද්ධ කම් කරයි. ඇතැම් විට උම්මත්තකයෙකු-පිස්සෙකු- කරයි.එබඳු පිස්සන් කතීාට ගමුවී ඇත. එබන්දන් ගෙන් සියයට අනූවක්ම විදර්‍ශකයෝය. භාවනාව සඳහා බැසගත්තැන් සිට ම නාම-රූප අවබෝධ වී, ඇතැම් විට "චූලසොතාපන්න" තත්‍වය දඉක්මවා පවතින තත්‍වයක් ඔව්හු පෙන්වත්. විමසා බලත් ම "පඨවි" යන රූපධර්‍මය වත් නො දනි. සෙසු දෑ ගැන කියනු කිම? තවද එබඳු අය ධර්‍මය හදරමින් කල්ගත කරන පුද්ගල

යන්ද හෙළා දකින්. ධර්මය ඉගෙණීම නිසා ලබාගන්නා නුවණ මේ ආත්මයේදී ම නො හැකි වුවහොත් ඉදිරි භවයකදී හෝ සමථ-විදර්ශනා දෙක දියුණු කර ගැනීමට උපකාර වන බව, ආසේවන ශක්තිය ලැබෙන බව ඔව්හු නො දන්නා සේ ය. අහෝ මූලාවීමක මහත! කරුණු මෙසේ හෙයින් ඒ හැම දෙනාත් අපත් ධර්මය කුමක් ද කියා තේරුම් ගෙන නියම මාර්ගයේ ගමන් කිරීමෙන් උද්ධච්චකුක්කුච්ච නිවරණය ප්‍රහාණය කිරීමට පුළුවන.

## 5· විචිකිච්ඡා නීවරණය.

විචිකිච්ඡා යනු සැකයට නමකි. ප්‍රතිකාර-පිළියම්-කිරීමෙන් සුවයක් ගැනීමට නො හැකි හෙයින් අස් වූ නුවණට මෙය ව්‍යවහාර කෙරේ. නුවණ තම සිතෙහි නො යෙදීම නිසා සැක උපදී. එහෙයින් සැක ඉපදීමට මූලික හේතුව වනුයේ නුවණ නැති කමයි. ඒ ස්වභාවය හැඳින ගැනීම සඳහා ''විචිකිච්ඡා'' යන්න යෙදිණ. කුශල ධර්මයන් ඉපදීමෙහිදී ඊට ආවරණය-වැළැක්ම වශයෙන් පවතින නීවරණයකි. බුද්ධාදී ධර්ම කරුණු අටක් ගැන සැකය පැවතීම විචිකිච්ඡා නීවරණය වශයෙන් ධර්මයෙහි එයි.

විස්තර: ''විගතා චිකිච්ඡා විචිකිච්ඡා, විගතා පඤ්ඤාති අත්ථො, සභාවං වා විචිනන්තො එතාය කිච්ඡති කිලමතීති විචිකිච්ඡා, බුද්ධාදීසු සංසයස්සෙතං නාමං'' පහ වූ - අස් වූ-පිළියම් ඇත්තේ විචිකිච්ඡා යි. නුවණ නැත යනු තේරුම ය. නැතහොත් ඇති හැටි හෝ විමසනුයේ මේ කරුණ විචිකිච්ඡාව-නිසා වෙහෙසේනුයි විචිකිච්ඡා නම්. බුද්ධාදීන් කෙරෙහි පවතින සැකයට මේ නමකි.

''තත්ථ කතමං විචිකිච්ඡා නීවරණං? සත්ථරි කඞ්ඛති, විචිකිච්ඡති, ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති, සඞ්ඝෙ - සික්ඛාය - පුබ්බන්තෙ - අපරන්තෙ - පුබ්බන්තාපරන්තෙ - ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති විචිකිච්ඡති, යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසග්ගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහණා ඡම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො ඉදං වුච්චති විචිකිච්ඡා නීවරණං''

විචිකිච්ඡා නීවරණය යනු කවරේද? ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කරයි. ධර්මය = සඞ්ඝයා ශික්ෂා-පෙර ආත්ම - අනාගත ආත්ම-ඒ දෙක -පරිච්චසමුප්පාදය කෙරෙහි සැක කරයි.

මෙබඳු යම් සැකයක්, සැකකිරීමක්, සැක කරන බවක්, එසේම සැකය, දෙමංසන්ධියෙක සිටින්නාක් බඳු ගතිය, නොයෙක් අංශයන් ගෙන් ගැනීම, ඔබිනොබ (සිතෙහි) දඟලන ගතිය, යන මේ අයුරින් පවතිනුයේ විචිකිච්ඡා නීවරණය යි. බුද්ධාදී අටතැන සැකය නම් මෙසේ ය.

i ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සර්වඥතාඥානය, දෙතිස් මහා පුරුෂ ලක්ෂණ, මේ ආදීන් පිළිබඳ සැක කරයි.

ii ධර්මය නෛර්යාණික ද, සතර මාර්ගයන් ගෙන් සියලු කෙලෙස් ප්‍රහාණය වෙයිද, නිර්වාණය කියා දෙයක් ඇද්ද, මේ ආදීන් සැක කරයි.

iii සඞ්ඝරත්නය සුප්‍රතිපන්න ද, මාර්ග ඵලයනට පත්වූවෝ සිටිත් ද, උන් වහන්සේට දුන් දේ මහත්ඵල පිණිස පවතී ද, මේ ආදී වශයෙන් සැක කරයි.

iv ත්‍රිවිධ ශික්ෂා යනුවෙන් දෙයක් ඇද්ද, එහි හික්මීමෙන් ඇති විශෙෂය කුමක් ද?, මෙසේ සැක කරයි.

v අතීතයෙහි මම කියා කෙනෙක් සිටියේද, ඔහු කවරෙක්ද, කෙබඳු කෙනෙක්ද, ඔහුගේ තත්වය කුමක් ද මෙසේ තමා ගැන අතීත වශයෙන් සැක කරයි.

vi අපරාන්ත විචිකිච්ඡාව අනාගතය පිළිබඳවයි. අනාගතයේ මම සිටින්නෙම් ද; ආදී වශයෙන් සැක කරයි.

vii අතීත, අනාගත, කාලදෙක ගැන සැක කරයි.

viii පටිච්චසමුප්පන්න ධර්මයන් පිළිබඳ සැකය නම් හේතු නිසා ඵලයක් හටගනියි ද, නැවත ඵලය නිසා හේතුව උපදී ද. එසේ කරකැවෙන දේකුත් ඇද්ද, යනාදී වශයෙන් සිතීමයි. හේතු-ඵල ධර්මයන් ගේ සවභාවය වටහා ගැනීමට නුවණ නො මැති නිසා විමති ඇතිවෙයි. (ධම්මට්ඨිති ඤාණය බලනු)

මේය බුද්ධාදී අටතැන සැකය.

විචිකිච්ඡා නීවරණය හැඳින ගැනීම සඳහා දේසනා කළ සෙසු පද බොහෝ සෙයින් සමානය. "ආසප්පනා, පරිසප්පනා" මේ

පද දෙකෙන් දැක්වූයේ සිතෙහි පවතින දඟලන ගතිය යි. විචිකිච්ඡාව දෙමංසන්ධියකට පත්වූවෙකුමෙන් කොබඳු දෙයක් ගත යුතු ද යන්න තීරණය කර ගැනුමකට බැස ගැනීමට නො හැකි බැවින් "ද්වෙධාපථො"යි යෙදුණ.

## විචිකිච්ඡා නීවරණය ඉපදීමට හේතු:

"අත්ථි භික්ඛවෙ විචිකිච්ඡාට්ඨානීයා ධම්මා තත්ථ අයොනිසොමනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය උප්පාදාය උප්පන්නාය වා විචිකිච්ඡාය භීයොභාවාය වෙපුල්ලාය" ඉහතින් දැක්වූ සැක ඇතිවීමට හේතු වන ධර්ම-බුද්ධාදී කරුණු ඇත. ඒවා නුනුවණින් සිතා බැලීම නිසා විචිකිච්ඡා නීවරණය ඉපදීමටත් දියුණුවීමටත් හේතු වන බව මේ දේශනාවෙන් පැහැදිලි වෙයි.

යෝගාවචරයාට ධර්මඥානය නො මැති කමෙන් භාවනා කර ගෙන යද්දී එයින් යම් විශෙෂයක් උපදවා ගැනීමට නො හැකි වූ විට මේ විචිකිච්ඡා නීවරණය හටගනියි. එබඳු තැන සලකායැ බුදුරජාණන් වහන්සේ මෙසේ දෙසූයේ. සමාන්‍ය ජනයා අතර පවතින සැකය මිථ්‍යාදෘෂ්ටියෙහි අංශයෙකි. යෝගාවචරයා ද විමසා ගැනීමේ නුවණ මදකමින් මිථ්‍යාදෘෂ්ටියට බැසගැනීමට පුළුවන. එහෙත් සිහි-නුවණ නැවත නැවත යෙදවීමෙන්, නැතහොත් භාවනාව නවත්වා දක්නා කෙනෙකු වෙතින් ඒ සැක ඇති තැන් අසා තේරුම් ගැනීමෙන් එය අත්කර ගැනීමට පුළුවන. ජනයා අතර පවතින සැකය එසේ නොව අවුරුදු ගණන්, ඇතැම්විට ආත්මගණනාවක් ම රඳා සිටියි. එහෙයින් එය බලවත් ය. මෙසේ විචිකිච්ඡා නිවරණව බුද්ධාදී ගැඹුරු ධර්ම කෙරෙහි නියම අවබෝධයක් නො මැතිකමෙන් හටගන්නා බව දත යුතුය.

## විචිකිච්ඡා නීවරණය ප්‍රහාණයට හේතු:

"අත්ථි භික්ඛවෙ කුසලාකුසලධම්මා සාවජ්ජානවජ්ජා ධම්මා සෙවිතබ්බාසෙවිතබ්බා ධම්මා හීනපණීතා ධම්මා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා, තත්ථ යොනිසොමනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය අනුප්පාදාය, උප්පන්නාය වා විචිකිච්ඡාය පහානාය"

මහණෙනි, කුසල්, අකුසල් ධර්‍ම ඇත. වරද සහිත, නිවරද ධර්‍ම ඇත. සේවනය කළයුතු, සේවනය නො කළයුතු ධර්‍ම ඇත ලාමක, උසස්, ධර්‍ම ඇත. එකිනෙකට විරුද්ධ අයහපත් යහපත් ධර්‍ම ඇත. මේ ධර්‍මයන් කෙරෙහි නුවණින් මෙනෙහි කිරීම බහුල -වැඩි- වූ තරමට නූපන් විචිකිච්ඡාව නූපදීමටත් උපන් විචිකිච්ඡාව ප්‍රහාණයටත් හේතුයි.

“අපි ච ඡ ධම්මා විචිකිච්ඡාය පහාණාය සංවත්තන්ති බහුස්සුතතා, පරිපුච්ඡකතා, විනයෙ පකතඤ්ඤුතා, අධිමොක්ඛබහුලතා, කල්‍යාණමිත්තතා, සප්පායකථා”ති. තවද ධර්‍මය බොහෝ සේ ඉගෙණගත් බව, නිතර සැක නැති විමසන බව, විනයෙහි දක්ෂ බව, නොසෙල්වෙන ශ්‍රද්ධාවක් ඇති බව. එබඳු ශ්‍රද්ධාවෙන් යුතු උතුමන් ඇසුරු කිරීම, ශ්‍රද්ධාව උපදින බුද්ධාදී රත්නත්‍රයෙහි ගුණ ඇතුළත් කථා, යන කරුණු සයක් විචිකිච්ඡාව ප්‍රහාණය සඳහා පවතිත්. මේ කරුණු අතුරෙන් ඇතැම් ඒවා ඉහතදී විස්තර කෙරිණ. විචිකිච්ඡා නීවරණය අස්වීමට බොහෝ සෙයින් උපකාර වනුයේ නුවණ අනුව යොදවන ශ්‍රද්ධාවයි. ඉන්ද්‍රිය ධර්‍මයන් සමබවට පමුණුවා ගන්නා අයුරු දක්වූ තැන මෙය විස්තර කර ඇත. එහෙයින් නුවණ නැති ශ්‍රද්ධාවත් ශ්‍රද්ධාව නැති නුවණත්, යන මේ දෙක ම ගුණධර්‍ම දියුණුවට අහිතකර පිණිස පවතින බව දතයුතු.

එසේම සමාන ශ්‍රද්ධා-ප්‍රඥා ඇති ගුණවතුන් ආශ්‍රය කිරීමද විචිකිච්ඡා නීවරණ ප්‍රහාණයට හේතුවන්නකි. අද සමාජයේ භික්ෂූන් අතර සමාන ශ්‍රද්ධා - ප්‍රඥා ඇත්තන් සොයා ගැනීම ඉතා අපහසුය. උසස් අධ්‍යාපනයක් ලබන නැතහොත් ලැබූ බොහෝ භික්ෂූන් කෙරෙහි බැසගත් ශ්‍රද්ධාවක් නො මැත. කෙටියෙන් දක්වත් නම් ඔව්හු බුදුන් නො වඳිත් මල් නො පුදත්. වත-පිළිවෙත නො කරත්. බුද්ධපූජාව පවා අස් නො කරත්. (සතියක් හෝ දෙකක් හෝ බුද්ධපූජාව ආසන මත ම තිබෙනවා මා දැක ඇත.) ශ්‍රද්ධා-ප්‍රඥා දෙකෙන් අගතැන්පත් බුදුපියාණන් ඇසුරු කරන්නේ මේ අයුරින් නම් විචිකිච්ඡාව ප්‍රහාණය කරගැනීම සඳහා එබඳු භික්ෂූන් වෙතට යෑම සිතක උපදවන කරුණකි. කරුණු මෙසේ හෙයින් බුද්ධාදී රත්නත්‍රයෙහි සැක ඇති වූ කල්හි ආශ්‍රය කළ යුත්තේ ශ්‍රද්ධා ප්‍රඥා සමාන වන අයුරින් දියුණු කරගෙන යන, තුන් වේලේ තුනුරුවන් වඳින, තුනුරුවන් කෙරෙහි ගරු සැලකිලි දක්වන, ධර්‍මඥානයෙන් යුත් ගිහි-පැවිදි දෙපිරිසය. තවද තුනුරුවන් ගේ ගුණ විමසා දැන ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම

යුත්තේ ද එබඳු උතුමන් සම්භාගය. ළඟත්කම පමණක් සලකා සාකච්ඡාවට යාමෙන් තුබූ ශ්‍රද්ධාව පවා හීන විය හැක.

සමාධි භාවනාමය ඤාණයෙන් අගතැන්පත් බුදුරජාණන් වහන්සේ සමාධි භාවනාවට හාත්පසින් ම විරුද්ධකම් දක්වන කාමච්ඡන්දාදි පඤ්චනීවරණයන් හැම අයුරින් ම අවබෝධ කොට, ලෝකයාටත් පැහැදිලි කළ සේක. එහෙයින් සමාධි භාවනාව ආරම්භ කරන, දියුණු කරන, සැදැහැවතුන්ට පඤ්චනීවරණයන් හැඳින ගැනීම ඉතා අවශ්‍යය. විදර්ශකයිනට ද එසේම ය. ඒ දෙපක්ෂය ම භාවනාවෙන් දියුණුව ලබන්නට නම් නිවරණයන් ප්‍රහාණය කළ යුතුය.

## පඤ්ච නීවරණයන් විමසීමේ සතිපට්ඨාන භාවනාව.

බුදුරජාණන් වහන්සේ සමථ - විදර්ශනා භාවනා ක්‍රම දෙකම එක් තැනෙක්හලා දේශනා කළ සූත්‍රයෙකි දීඝනිකායට ඇතුලත් මහාසතිපට්ඨාන සූත්‍රය. එහි මූලික සතිපට්ඨාන භාවනා සතරෙකි. කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා, යනුයි. විස්තර වශයෙන් කම්සථාන එක් විස්සෙකි. එනම් කායානුපස්සනා වෙහි තුදුස් කම්සථානයක් ඇත. (14) වේදනා-චිත්ත අනුපස්සනා දෙක කම්සථාන දෙකෙකි. ධම්මානුපස්සනාවෙහි කම්සථාන පසෙකි. මේ කම්සථාන එක් විස්සම විදර්ශනා භාවනාවට පාදක-පදනම-වෙත්. ධම්මානුපස්සනා කම්සථාන පස අතුරෙන් පළමුවැන්න නීවරණධම්මානුපස්සනාවයි.

“කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසු නීවරණෙසු?

මහණෙනි, යෝගාවචර භික්ෂු තෙමේ පඤ්චනීවරණ ධර්මයන් කෙරෙහි ධම්මානුපස්සනාවෙන් යුතුව වාසය කරන්නේ කෙසේ ද? නැතහොත් කෙසේ වාසය කරයි ද?

“ඉධ භික්ඛවෙ භික්ඛු සන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං අත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති අසන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං නත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති, යථා ච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදො හොති තඤ්ච පජානාති, යථා ච උප්පන්නස්ස කාමච්ඡන්දස්ස

පහානං හොති තඤ්ච පජානාති, යථා ච පහීනස්ස කාමච්ඡන්දස්ස ආයතිං අනුප්පාදෙ හොති තඤ්ච පජානාති, සන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං -පෙ- ථිනමිද්ධං – පෙ – උද්ධච්චකුක්කුච්චං –පෙ– විචිකිච්ඡං–පෙ යථා ච පහීණාය විචිකිච්ඡාය ආයතිං අනුප්පාදෙ හොති තඤ්ච පජානාති''

මහණෙනි මේ ශාසනයෙහි යෝගාවචර භික්ෂු තෙමේ තම (සිත) තුල පවත්නා වූ කාමච්ඡන්දය, ''මගේ සිතෙහි කාමච්ඡන්දය ඇතැ'යි දනියි. තමා තුල නැත්තා වූ කාමච්ඡන්දය, ''මගේ සිතෙහි කාමච්ඡන්දය නැතැ''යි දනියි නූපන්නා වූ කාමච්ඡන්දයා ගේ ඉපදීම යම්සේ වෙයි ද, එය ද දනියි. උපන්නා වූ කාමච්ඡන්දයා ගේ අස්වීමක් වෙයිද එයද දනියි අස්වූනා වූ කාමච්ඡන්දයා ගේ නැවත නූපදීම යම් සේ වෙයි ද එයද දනියි. ව්‍යාපාදාදී නීවරණයන් ගේ ද මෙසේ ම දනියි.

තුදුස් වැදෑරුම් කායානුපස්සනා අතුරෙන් එකකට අනුව භාවනා කරන්නා වූ යෝගාවචරයා, තමා ගේ සිත තැන්පත්වන අවස්ථාවේදී සිතට දැනෙන වේදනා කුමක් දැයි විමසිය යුතුය. එසේ විමසා, ''සැපවෙදනාවක් විඳිනුයේ සැප වේදනාවක් විඳිමියි දනියි.'' යනාදී ක්‍රමයෙන් වේදනානුපස්සනාව දියුණු කළයුතු වෙයි. ඉක්බිති සිතෙහි ගමන් කරන සිත් පරපුර ගැන ද, ''සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති'' ලෝභ සහගත සිත ලෝභ සහගත සිතයැයි දනියි'' යනාදි වශයෙන් මෙනෙහි කරමින් චිත්තානුපස්සනාව දියුණු කළ යුතුය. ඊට පසු සිතෙහි පවතින්නා වූ සිතින් විමසිය යුතු වූ සිතුවිලි පරපුර ගැන ද විමසමින් ධම්මානුපස්සනාව දියුණු කළ යුතුවෙයි. මෙ සතිපට්ඨාන භාවනා ක්‍රමය කෙටියෙන් හැඳින්වීමකි. මෙහිලා සැලකිය යුත්තේ ඉහත සඳහන් නීවරණ ධර්ම භාවනා හැනකි. එය පස් වැදෑරුම්ය.

i නීවරණයන් සිත තුල පවතින බව දැනීම,

ii නීවරණයන් සිත තුල නැති බව දැනීම.

iii නූපන් නීවරණ උපදින අයුරු දැනීම.

iv උපන් නීවරණ අස්කරන අයුරු දැනීම.

v අස්කළ නීවරණ නැවත නූපදින බව දැනීම.

මේ භාවනා ක්‍රමය ගැන අවබෝධයක් ඇතිකර ගැනුමට පළමුවෙන් කළ යුත්තේ නීවරණයන් ප්‍රහාණය කරන අයුරු වටහා ගැනීමයි.

නීවරණ යන නාමයෙන් ආයේ කෙලෙස් කොටසෙකි. ඒ කෙලෙස් ප්‍රහාණය වන අවස්ථා තුනකි. තදඞ්ග, විෂ්කම්භන, සමුච්ඡේද, යනුයි. මොහොතක් පාසා යටපත් කිරීම තදඞ්ග ක්‍රමයයි. බොහෝ කාලයකට ඉපදීමට නොදී යටපත් කිරීම විෂ්කම්භන ක්‍රමයයි සමුච්ඡේද ක්‍රමය නම් සම්පූර්ණයෙන්ම සිතෙන් අස් කිරීමයි. පරිකර්ම භාවනාවේ සිට උපචාරය තෙක්, (තෙක්'' යන්න යෙදූවිට උපචාරයත් අයත්ය) ඇති වනුයේ තදඞ්ග ප්‍රහාණය යි. ධ්‍යානාඞ්ග පහළවීමේ පටන් ලෝකෝත්තර මාර්ග සිතට මෙහා උපදින ගොත්‍රභූ සිත තෙක් විෂ්කම්භන ප්‍රහාණයයි. සෝවාන් මාර්ග සිත පටන් අර්හත් ඵල සිත දක්වා සමුච්ඡේද ප්‍රහාණයයි. තදඞ්ග ප්‍රහාණය කාමාවචරයි. විෂ්කම්භන ප්‍රහාණය, රූපාවචර -අරූපාවචර දෙකයි. සමුච්ඡේද ප්‍රහාණය ලෝකෝත්තර යි.

දැන් නීවරණ භාවනා ක්‍රමය සලකා බලමු. ඉහත දක්වූ ක්‍රම පහෙත් පළමු කොට යෝගාවචරයා කළ යුත්තේ තමා තුළ නීවරණ ඇතයැයි මෙනෙහි කිරීමයි. ඉක්බිති සිවුවන ක්‍රමය ලෙස ඒ නීවරණ ප්‍රහාණය කරන අයුරු විමසීමට බැසිය යුතුය. එහිදී සලකාගත යුත්තේ හැම නීවරණ විස්තරයකදීම දක්වූ ප්‍රහාණ ක්‍රමයන් අතුරෙන් මූලික ලෙස සඳහන් යෝනිසෝමනසිකාරය, නීවරණයන් ප්‍රහාණය කිරීමට උපකාර වන ප්‍රධාන කාරණ බවයි එහෙයින් නීවරණයන්ගේ වසඟවර්තික ක්‍රියාවන්ට නො රැවටී, ''මා තුළ තවම නීවරණ ඇතය''යි නැවත නැවත සිහි-නුවණ යොදවා බලමින් ඒවා ප්‍රහාණය කිරීමට උපකාර වන, ඊලඟට දක්වූ එක් එක් ධර්ම සේවනය කළ යුතුයි. එසේ සේවනය කරද්දී නීවරණයන් යටපත් වෙයි ඉක්බිති යටපත් වූ නීවරණ නැවත උපදී නම් ඒ බව ද දැන, ඒ ඉපදීමට හේතු විමසිය යුතු තෙවැනි ක්‍රමය දේශනා කළේ ඒ විමසිය යුතු බව දැක්වීමට ය. නීවරණ ඉපදීමට හේතු සොයා ඒවායින් අස් වූ විට නැවතත් සිත තැන්පත් වෙයි. පරිකර්මාදී භාවනා දියුණු වෙයි. එතැන් සිට ඉහත දක් වූ ප්‍රහාණක්‍රමයන් අනුව නැවත සලකා බලමින් ක්‍රමයෙන් උපචාර, අර්පණා ඉපදවීමෙන් විෂ්කම්භන වශයෙන් ප්‍රහාණය වෙයි. එපමණකින් ම නීවරණ අස් නො වූ බව දැන, එතැන් සිට විදර්ශනා වඩා සමුච්ඡේද වශයෙන් නීවරණයන් ප්‍රහාණය කරමින් ලෝකෝත්තර මාර්ග ඵල ඉපදවිය යුතු මේ සිවු වැනිව ඒ නීවරණයන් ප්‍රහාණය කරන අයුරු දැන ගැනීමයි.

ඒලඟට දෙවැනි, පස්වැනි, ක්‍රම දෙක සිහියට නඟාගත යුතු. තම සිතෙහි නැති නීවරණ ගැන මෙනෙහි කරත් ම, ඒ සමග ම මෙනෙහි කළ යුත්තේ මේ නීවරණ නැවත නො එයි ද යන්නය. සිත මුලාවකට පත්වීමෙන් නීවරණ නැතය යි වැටහීමක් ඇතිවූවා නම් ඒ වරදකි. එවිට නැවත නැවත සිහි-නුවණ යොදවා විමසිය යුතු. එසේ බලත් ම ඇත්නම් අසුවෙයි. නැත්නම් නැතයයි වැටහෙයි සතිපට්ඨාන භාවනා ක්‍රමය සම්පූර්ණයෙන් ම කෙලෙස් ප්‍රහාණය කිරීමක් නිසා විෂ්කම්භන වශයෙන් යටපත්වූවාට ප්‍රමාණවත් නො වෙයි. සමුච්ඡේද වශයෙන් ම අත්විය යුතුය එහෙයින් එසේ බලමින් නැවත සිහි-නුවණ යොදවා නීවරණයන් සමුච්ඡේද වශයෙන් ම ප්‍රහාණය කළ යුතුය. ඒ බව සලකා ගැනීමේ නුවණ ප්‍රත්‍යවේක්ෂා ඥානය යි. ඒ ඥානයෙන් බලත් ම නැතය යි වැටහේ නම් පස්වැනි ක්‍රමය සම්පූර්ණ වූවා නම් වෙයි. මෙසේ නීවරණ භාවනා ක්‍රමය සමථ-විදර්ශනා දෙක ම පෙන්නුම් කරමින් දේශනා කළ නිර්වාණ මාර්ගයකි.

## විදර්ශනාවට නංවන අයුරු:

"ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති, බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති, සමුදය ධම්මානුපස්සීවා ධම්මෙසු විහරති, වය ධම්මානුපස්සී වා ධම්මෙසු විහරති, සමුදයවයධම්මානු පස්සී වා ධම්මෙසු විහරති. අත්ථිධම්මාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පටිස්සතිමත්තාය අනිස්සිතො ච විහරති න ච කිඤ්චි ලොකෙ උපාදියති එවං ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසු නීවරණෙසු"

තම සිතෙහි ඇති නිවරණ ධර්ම ආධ්‍යාත්මිකයි. තමා පිළිබඳ වයි තම සිතෙහි නැති නිවරණ ධර්ම බාහිරයි. මෙසේ ආධ්‍යාත්මික, බාහිර, යන දෙයාකාරයෙන් පවතින නිවරණ ධර්මයන් අනුව බලමින් වාසය කරයි. වරක් තමා කෙරෙහි පවතින නිවරණ ධර්මයන් ගැන බලයි. වරක් බාහිර වශයෙන් පවතින නිවරණ ධර්මයන් ගැන බලයි. තවත් වරක් ඒ දෙයාකාරය ම සමූහ කොට බලයි ඉක්බිති නිවරණ ධර්මයන් උපදින අයුරු බලයි.

නැවත විනාශ වන අයුරු බලයි. ඒ සමග ම ඒ දෙයාකාරයෙන් ම පලයි. එසේ බලන කල්හි ඉපදීමත්, විනාශයත් දැකීමෙන් නම් මහා විදර්ශනා ඥානයන් අතුරෙන් "උදයබ්බය ඥානය" පහළ වෙයි (මෙහි විස්තර ඉදිරියට ඇත.) එවිට "මගේය, මාගේය" යන සක්කාය දිට්ඨියෙන් තොර වූ විදර්ශනා ඥානය නිසා "මේ පවත්නේ ධර්ම සමූහයක් පමණී." යනුවෙන් ඒ විදර්ශකයාට සිහිය එළඹෙයි. හුදෙක් ඒ සිහිය මතුමට උපදවා ගතයුතු විදර්ශනා ඥාන හා ඊට අනුව ගිය දියුණු සිහිය ලබාගැනීම පිණිස ය. නැතහොත් සක්කාය දිට්ඨියෙන් තොර වූ සිහිය නිසා මතු විදර්ශනා ඥාන උපදවා ගැනීමට උපකාර පිණිස ය. මෙසේ "සත්වයා" යන හැඟීමෙන් තොරව ප්‍රත්‍යය - ප්‍රත්‍යයසමුත්පන්න ධර්ම සමූහය කැයි මෙනෙහි වීම නිසා නවමහා විදර්ශනා ඥානයන් උපදවමින් සමුච්ඡේද වශයෙන් ම නීවරණයන් සහ ඊට අනුව ගිය සියලු ම කෙලෙස් ප්‍රහාණය කර මාර්ග - ඵල උපදවයි. මේ අයුරින් විදර්ශනා ඥාන අනුව සිහි නුවණ යොදවන නිසා තෘෂ්ණා දෘෂ්ටි දෙකින් මිශ්‍රවන්නේ නැතිව - අනිස්සිතො - වෙසෙසි. කිසිදු නාමස්කන්ධයක් - චිත්ත, චෛතසික මගේය මාගේය යනාදී වශයෙන් අල්ලා නො ගනියි. මහණෙනි, භික්ෂු තෙමේ නීවරණ ධර්මයන් කෙරෙහි ධම්මානුපස්සනාවේ යෙදෙමින් වෙසෙනුයේ මෙසේ ය. නැතහොත් මෙසේ ධම්මානුපස්සීව වෙසෙසි.

පඤ්චනීවරණයන්ට අනුව භාවනා ක්‍රමයයි මේ.

## ධ්‍යාන.

සමාධි භාවනාවන්හිදී පඤ්චනීවරණයන් වික්ඛම්භන වශයෙන් යටපත් වූ පසු උපදිනුයේ ධ්‍යානාඞ්ග යි. ඒවා පසෙකි. විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා, යනුයි. මේ පස ම ඉපදුන විට ඊට ප්‍රථම ධ්‍යානයයි කියනු ලැබේ. ඉක්බිති නැවත භාවනා කිරීමෙන් ඒ ධ්‍යානාඞ්ග ද ඉක්මවීමෙන් ද්විතීය ධ්‍යානාදී ධ්‍යාන උපදී. එක් අයුරකින් ධ්‍යාන සතරෙකි එක් අයුරකින් පසෙකි. මෙසේ චතුෂ්ක පඤ්චක, වශයෙන් ධ්‍යාන ක්‍රම දෙකකි.

එහි "ධ්‍යාන" යනු අරමුණ කෙරෙහි නිතර බැලීමයි. "ආරම්මණං උපනිජ්ඣායතීති ඣානං" යනු විග්‍රහයයි. තවත් තේරුමක් ඇත. "පච්චනීක කිලෙසෙ ඣාපෙතීති ඣානං"

විරුද්ධ කෙලෙස් දවාලනුයි ධ්‍යාන නමි. මෙසේ ධ්‍යානයෙන් ක්‍රියා දෙකක් සිදුවේ. එකක් අරමුණ බැලීම, දෙවැන්න විරුද්ධ කෙලෙස් දැවීම, යනුයි.

ධ්‍යාන දෙවැදෑරුම් වෙත්. ආරම්මණූපනිජ්ඣාන, ලක්ඛණූපනිජ්ඣාන, යනුයි. පඨවි කසිණාදි අරමුණම බලන රූපාවචර, අරූපාවචර, සමාපත්ති ආරම්මණූපනිජ්ඣාන නමි. ඒ අටකි. ලක්ඛණූපනිජ්ඣාන යනු නාමරූප ධර්මයන් ගේ අනිත්‍යාදි ලක්ෂණ බලන විදර්ශනා, මාර්ග, ඵල, යන මොහුයි. මෙයින් මෙහිදී විස්තර වනුයේ ආරම්මණූපනිජ්ඣාන යි. තවද "ධ්‍යාන" යනු විතර්කාදි අඞ්ග පසට නමකි. "ඣානන්ති විතක්කො විචාරො පීති සුඛං චිත්තස්සෙකග්ගතා" පෝෂ්, දැවි, ආදී ද්‍රව්‍ය සමූහයක් එක් වූ විට රෝදයයි කියන්නාක් මෙන් විතර්කාදි පස එක් වූ විට ධ්‍යාන යැයි කියනු ලැබේ,

## 1. ප්‍රථම ධ්‍යානය.

"සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති"

ඒ යෝගාවචර භික්ෂු තෙමේ ඉහත විස්තර කළ ආගන්තුක වශයෙන් අවුත් සිත කිළුටු කරන, සමථ විදර්ශනා ඥාන දුර්වල කරන්නාවූ පඤ්ච නීවරණයන් යටපත් කිරීම් වශයෙන් දුරු කොට, කාමයන් ගෙන් හා අකුශල ධර්මයන් ගෙන් වෙන්ව විතර්ක, විචාර සහිත චිත්තවිවේකයෙන් නිපන් ප්‍රීතියෙන්, සුඛයෙන්, ඇති ප්‍රථම ධ්‍යානයට සමවැදීම් වශයෙන් පැමිණ වෙසෙයි යනු එහි අදහසයි. බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධ්‍යානය හැඳින්වූ අයුරැයි මේ.

ප්‍රථම ධ්‍යානය පඤ්ච නීවරණයන් ගෙන් වෙන් වූවකි. ඒ බව පැහැදිලි වීම සඳහා පඤ්චනීවරණයන් දුරු කොට යැයි දේශනා කොට; නැවතත් කාමයන් ගෙන් හා අකුශල ධර්මයන් ගෙන් වෙන්ව යැයි දේශනා කළහ. දෙවරක් දැක්වීමෙන් කරුණ තවත් පැහැදිලි වෙයි.

ඇතැමෙකුට වරක් කීමෙන් අවබෝධ වෙයි. ඒ උද්ඝටිතඥ පුද්ගලයායි. දෙවරක් කීමෙන් අවබෝධ වන්නා විපඤ්චිතඥ නමි. බොහෝ වරක් කීමෙන් අවබෝධ වන්නා ඥෙයයයි. යටිකුරු

කොට තැබූ කලයට ජලය නො පිරෙන්නා සේ කොතෙක් කීවත් අවබෝධ නො වන්නා පදපරමයායි. මේ පුද්ගලයන් අතුරෙන් බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා කරනුයේ පදපරමයා හැර ඉතිරි තුන්දෙනා සඳහාය. එහෙයින් ප්‍රථම ධ්‍යානය හැඳින්වීමේදී නීවරණයන් දුරුකිරීම දෙවරක් සඳහන් කළහ.

“විවිච්චෙව කාමෙහි” කාමයන් ගෙන් වෙන්වම, යන මෙයින් කාම වස්තූන් ගෙන් හා ඊට අනුව පවතින ක්ලේශ කාම යෙන් දුරු වූ බව හැඟවූ සේක. කාමවස්තු හා ක්ලේශකාම ප්‍රථම ධ්‍යානයට විරුද්ධ ධර්මයි. එසේම කාමවස්තූන් ගෙන් ලැබෙන සැපය තිඤු සහගතයි කෙලෙස් ඉපදීමට ම හේතුයි. නොයෙක් වාද-විවාදයනට, කලහ-කෝලාහලයන්ට, හිංසා පීඩා වනට නැඹුරු වෙයි. එහෙයින් කාමවස්තූන් ගෙන් ලැබෙන සැපය තමාට ම අහිත පිණිස, දුක් පිණිස ම පවතියි ඒ බව බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළහ.

“සුඛ විනිච්ඡයං ජඤ්ඤා, සුඛ විනිච්ඡයං ඤත්වා අජ්ඣත්තං සුඛමනුයුඤ්ජෙය්‍යාති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං? පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා. කතමෙ පඤ්ච? චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝාණවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චකාම ගුණා, යං ඛො භික්ඛවෙ ඉමෙ පඤ්චකාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං ඉදං වුච්චති කාමසුඛං මීළ්හසුඛං පුථුජ්ජනසුඛං අනරියසුඛං න ආසෙවිතබ්බං න භාවෙතබ්බං න බහුලීකාතබ්බං භායිතබ්බං එතස්ස සුඛස්සාති වදාමි, ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි -පෙ- ම. නි. (උ. ප. අරණවිභඞ්ග සූත්‍රය)

(මහණෙනි,) සැප විනිශ්චය - නිර්ණය - දතයුතුයි. සැප විනිශ්චය දැන, සිත තුළ වූ සැපයෙහි යෙදිය යුතුය. මේ කාරණ කියන ලද්දේද, ඒ කුමක් සඳහා යන ලද්දක්ද? මහණෙනි, මේ කාමගුණයෝ පස් දෙනෙකි. කවර නම් පසක්ද? ඇසින් දතයුතු. (ඇසට පෙනෙන) හොඳ යැයි වැටහෙන, සිත් ඇදගන්නා සුළු, ප්‍රිය වඩන, ක්ලේශ කාමයෙන් යුත්, නැතහොත් ක්ලේශ කාමය උපදවන සුළු, ඇලිය යුතු රූපයෝ වෙත්. එබඳු කාමගුණයන් ගෙන් යුත් කණින් දතයුතු ශබ්ද, නැහැයෙන්

දතයුතු සුවඳ, දිවෙන් දතයුතු රස, කයින් දතයුතු පහස් ඇත. මහණෙනි, මේ පඤ්චකාම ගුණයෝයි. මහණෙනි, මේ පඤ්ච කාමගුණයන් නිසා උපදිනා යම් සැපයක් වේද, සතුටක් වේද, එය කාමසැපයකි. අපවිත්‍ර සැපයකි. අනාර්‍ය්‍යවූ පෘථග්ජනයන් ගේ සැපයකි. නැවත නැවත ඇසුරු නො කළ යුතුයි. දියුණු නො කළ යුතුයි. බොහෝ කොට ද දියුණු නො කළ යුතුයි. ඒ සැපයට බියවිය යුතු යැයි කියමි. මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ ඉතා සඳහන් අයුරින් ගුණසමුදායකින් යුතු ප්‍රථම ධ්‍යානය ලබා වෙසෙයි නම් ඒ සැපය කාමයන් ගෙන් නික්මුණු නෛෂ්ක්‍රම්‍ය සැපයකි. විවේක සැපයකි. සන්සිඳුනු සැපයකි. නිවන් අවබෝධ කිරීමට උපකාර වන සැපයකි. ඒ සැපය සේවනයකළයුතු වැඩිය යුතු බොහෝ කොට වැඩිය යුතු අතර, ඒ සැපයට බිය නොවිය යුතු යැයි ද කියමි. කරුණු මෙසේ හෙයින් සැප පිළිබඳ විනිශ්චය තේරුම් ගතයුතු යැයි දෙසූහ.

ප්‍රථම ධ්‍යානය මෙසේ පඤ්චකාම ගුණයන් ගෙන් ම නිදහස් වූ එකක් හෙයින් "විවිච්චෙව කාමෙහි" යනුවෙන් බහුවචනයෙන් දෙසූහ. කාමයන් ගෙන් වෙන්ව යන්නෙන් කායවිවේකය කියැවේ.

විවිච්ච අකුසලෙහි ධම්මෙහි" යන දෙවැනි පදයෙන් පඤ්ච කාමගුණය අනුව ගියාවූ ක්ලේශ කාමය හා ව්‍යාපාදාදී සෙසු කෙලෙස් වලින් ද ප්‍රථම ධ්‍යානය නිදහස් වූවක් බව දෙසූහ. ඒ එසේම ය. විතර්කාදී ධ්‍යානාඞ්ගයෝ ඒ කෙලෙස් සමූහය දමාලත්. විතර්කයෙන් ථිනමිද්ධය ද; විචාරයෙන් විචිකිච්ඡාව ද, ප්‍රීතියෙන් ව්‍යාපාදය ද, සුඛයෙන් උද්ධච්චකුක්කුච්චය ද, එකග්ගතා - සමාධියෙන් කාමච්ඡන්දය ද යි මෙසේ ඒ ඒ ධ්‍යානාඞ්ගයෝ ඊට විරුද්ධ වූ කෙලෙස් ක්‍රමයෙන් දමාලත්. (යටපත් කරත්) මෙහිදී "පච්චනීක කිලෙසෙ ඣාපෙතීති ඣානං"යි කියූ අදහස සිහිකළ යුතු. මෙසේ දෙවැනි පදයෙන් ප්‍රථම ධ්‍යානය පඤ්ච නීවරණයන් ගෙන් නිදහස් වූ බව පැහැදිලි වේ,

ප්‍රථම ධ්‍යානයෙහි ඈ ගුණ අතුරෙන් මෙසේ විස්තර කළ ගුණ දෙක, පිරිසුදු බව දක්වීම සඳහාය දේශනා කළේ. ඉක්බිති එහි ඇති විශේෂ ගුණ ඉතිරි පදයන් ගෙන් දක්වූහ. ගුණ පසෙකි. විතර්ක, විචාර, ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා, යනුයි. "විවේකජං" යන්න මේ ගුණ පසට ම දක්වූ විශේෂණ පදයෙකි, රූපාදි වස්තුකාම යන් ගෙන් වෙන් වූ නිසා කායවිවේකයෙන් ද, කාමච්ඡන්දාදි

කෙලෙසුන් ගෙන් වෙන් වූ නිසා චිත්ත විවේකයෙන් ද; යන දෙවැදෑරුම් විවේකයෙහි ධ්‍යානාඞ්ග පහළවූයේ. විවේකය නො මැති නම් ධ්‍යානාඞ්ග කිසිම නැති,

විතර්ක: "විතක්කනං විතක්කො" විතර්කනය විතර්කයයි. විතර්කණය නම් ඌහනයයි. එනම් සෙවීමයි. කල්පනා කිරීමට මේ නමකි. යම් සිතුවිලි පරපුරක් සිතට නැංවීමට, යමක් උපකාර වේද, ඒ උපකාර වන්නා විතර්කයයි. විතර්කයෙහි ස්වභාවය-හැටි අරමුණු සිතට නැංවීමයි. රාජපුරුෂයෙක් වැන්නා. රාජපුරුෂයා, රජමැදුරට නො ගිය පිටිසර මිනිසෙකු පැමිණි විට ඔහු රජමැදුර වෙත පමුණුවන්නේ යම්සේද, එසේ විතර්කය ද රජමැදුර බඳු අරමුණ වෙත සිත නමැති පිටිසර මිනිසා පමුණුවයි. එහෙයිනි. විතර්කය නො මැති නම් අරමුණු ගැනීමක් නො වෙයි. ධම්ම සඞ්ගණියෙහි විතර්කය විස්තර කරනුයේ මෙසේය.

"කතමො තස්මිං සමයෙ විතක්කො හොති යො තස්මිං සමයෙ තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා සම්මාසඞ්කප්පො අයං තස්මිං සමයෙ විතක්කො හොති" ධ. සං. ප.

ඒ කුශල් කරන අවස්ථාවේදී විතර්කය නම් කවරේද? ඒ වේලාවෙහි යම් තර්කණය - සිතා බැලීමක් - නොයෙක් අයුරින් සිතා බැලීමක්, මනා අයුරින් සිතා බැලීමක්, අරමුණට නැංවීමක්, විශේෂයෙන් ම නැංවීමක්, අරමුණෙහි සිත පිහිටුවීමක්, නැත හොත් සිතෙහි අරමුණ පිහිටුවීමක්, සම්‍යක් සංකල්පනයක්-මනා සේ සිතීමක් වේද ඒ විතර්කය නම්. අකුශල පක්ෂයෙහි මිච්ඡාසංකප්පයක් ඇති හෙයින් මෙහිදී "සම්මාසඞ්කප්ප" යනුවෙන් වෙන්කොට දෙසූහ. විතර්ක චෛතසිකය ප්‍රකීර්ණකය. එනම් කුශල්, අකුශල්, දෙපක්ෂයෙහිම යෙදේ, බමරා පළමුවෙන් මලට නැගීම, ප්‍රථමයෙන් ඝණ්ටාවකට ගැසීම, නගුල්, ගවයන්, රැගෙන ගොවියා කුඹුරට බැසීම, මේ ආදී උපමාවන් ගෙන විතර්කය හඳුනාගත යුතු.

විචාර: "ආරම්මණෙ තෙන චිත්තං විචරතීති විචාරො" අරමුණෙහි ඒ නිසා සිත හැසිරේනුයි විචාර නම්. අරමුණෙහි හැසිරීම කරනුයේ යමක්නද එය විචාරය බව මෙයින් දැක්වේ. නැතහොත් අරමුණෙහි ඔබිනොබ හැසිරෙනුයේ විචාරයි. "විචරනන්ති විචාරො" විචරණය නම් අනුසඤ්චරණයයි ඔබිනොබ හැසිරීමයි. රජමැදුරට ගිය පිටිසර මිනිසා රජු සොයා ගැනීම සඳහා රජමැදුර සැමතන්හි ම හැසිරෙන්නේ යම්සේද එසේම විචාරයත් අරමුණ සැම තැන්හිම හැසිරෙයි.

,"කතමො තස්මිං සමයෙ විචාරො හොති? යො තස්මිං සමයෙ චාරො විචාරො අනුවිචාරො උපවිචාරො චිත්තස්ස අනුසන්ධනතා අනුපෙක්ඛණතා අයං තස්මිං සමයෙ විචාරො හොති" - ධ. සං. ප.

හැසිරීම, හැසිරීමේ ස්වභාවය, අනුව හැසිරීම, පැමිණ හැසිරීම, සිතෙහි අරමුණට අනුව ගලපන බව, බලන බව යන මේ ස්වභාවයන් යමකින් ඇතිවේද එය විචාර නම්. මේ එහි සාමාන්‍ය අදහසයි. විචාරය ද ප්‍රකීර්ණ චෛතසිකයෙකි. මෙහි ආයේ කුශල් වශයෙනි: මලට නැගුණු බමරා ගේ මලෙහි හැසිරීම, ඝණ්ඨාවට ගැසීමෙන් නැගුණු රාවය, ඝණ්ඨාව වටා හැසිරීම, කුඹුරට බට ගොවියාගේ සී සෑම, මේ ආදී උපමාවන් ගෙන් විචාරය තේරුම්ගත යුතුය.

පීති: "පීනයතීති පීති" පිනවනුයේ ප්‍රීතියි. යම් සිතුවිල්ලක් නිසා කයත් සිතත් කුල්මත් වීම් වශයෙන් ප්‍රීතියට පත් කරයිද ඒ සිතුවිල්ල ප්‍රීති නම්. එහි ස්වභාවය කය - සිත දෙක ම පිනවන බවයි. පිටිසර මිනිසා රජමැදුරේ සෑම තන්හි ම හැසිරෙන කල්හි යම් විටෙක රජතුමා දකීද, එතෙක් මෙහෙසට පත්වූ ඔහුට රජතුමා දැකීමෙන් සිරුර පුරා පැතිරෙන, ලොමු දැහැගැනීම් ඇතිව උපදින යම් සතුටක් වෙයිද, එවැනි ගතියක් ප්‍රීති චෛතසිකයෙන් සිදුකෙරේ.

"කතමො තස්මිං සමයෙ පීති හොති? යා තස්මිං සමයෙ පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස අයං තස්මිං සමයෙ පීති හොති"

ප්‍රීතිය, ප්‍රමෝදය = සතුට - සතුටුවන ස්වභාවය; ප්‍රමොදවන ස්වභාවය, සිනාහ, වඩාත් සිනාහ, තුටු, පහටු සතුට නමැති ධනය, පැන පැන සිනහවීමේ ගතිය, (ඖදග්‍යය) සිතේ සතුට, යන සතුට සඳහා දේශනා කළ සමාන වචන සමූහයෙන් සිත පිනායන ගතිය ප්‍රීතිය බව අදහස් කෙරේ.

කාන්තාරයක ගමන් කරන මඟියෙකුට පිරිසුදු ජලය පිරුණු පොකුණක් හමුවීම, දුගියෙකුට මනා නිදන් කලයක් - නිධිකුම්භියක් = ලැබීම, කුස ගින්නෙන් පෙලෙන අයෙකුට මිහිරි අහරක් ලැබීම, මෙ ආදී අවස්ථාවන්හිදී යම් සතුටු ස්වභාවයක් ඔවුනට ඇතිවේද, එබඳු සිත පිනායන ස්වභාවය ප්‍රීති නම්. ප්‍රීතිය පස් වැදෑරුම්ය. ඛුද්දක, ඛණික, ඔක්කන්තික, උබ්බෙග, ඵරණ, යනුයි. විස්තර සූත්‍රමඟ ඥාණය බලන්න.

සුඛ. "සුඛයතීති සුඛං" සැපවත් කරනුයේ සුඛයි. යම් ධර්මස්වභාවයක් නිසා සුවපත් වේද ඒ සුඛ නමි. එනම් සැපයයි. තවද තේරුමකි. "සුට්ඨු වා ඛාදති ඛණති කායචිත්තාබාධන්ති සුඛං" ශරීරයෙහි හා සිතෙහි අසනීප මනාකොට විනාශ කරයි. හාරා දමයි නුයි හෙයි සුඛ නමි. ශරීරාබාධ, මානසිකාබාධ, නැති තැන සැපයයි එහෙයිනි. ධ්‍යානයන් ගෙන් ලැබෙන සැපය මානසික ආබාධ විනාශයෙනි. සුඛය වේදනා භේදයට අයත් එකකි සියලු වේදනා පසකි. දුක්ඛ, දොමනස්ස, සුඛ, සොමනස්ස, උපෙක්ඛා, යනුයි. දුක්ඛ, දොම්නස්ස, වේදනා දෙක දුක්ඛ වෙදනායි. ඉතිරි වේදනා තුනම සැප වේදනායි. උපෙක්ඛාව ශාන්ත නිසා සැප වේදනාවටම ඇතුලත් වෙයි. පෙර සඳහන් ප්‍රීතිය සංස්කාරස්කන්ධයට අයත් එකකි. එහෙයින් ප්‍රීතිය ඇති තැන සුඛය ඇතත් සුඛය ඇති තැන ප්‍රීතිය නැති බව තේරුම් ගතයුතු. තෘතීය ධ්‍යානයෙහි සුඛය ඇත. එහෙත් ප්‍රීතිය නැත. මේ උදාහරණයි.

එකග්ගතා: "එකග්ග භාවො එකග්ගතා" එකඟවීමේ ස්වභාවය එකග්ගතායි. මෙය සමාධිය සඳහා යෙදුනු නාමයකි. එහෙයින් "සමාධි" යන් පාවිච්චිකල තැන බලන්න. ධ්‍යානාංගයට අයත් චිත්ත - චෛතසිකයන්ගේ විසිරීමට නොදී සමූහ කරනුයේ සිත කසිණාදි නිමිත්තයෙහි නොසෙල්වනසේ පිහිටුවනු, එකග්ගතා චෛතසිකයෙනි.

"කතමා තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති. යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහට මානසතා සමථො සමාධින්ද්‍රිය සමාධි බලං සම්මාසමාධි, අයං තස්මිං සමයෙ චිත්තස්සෙකග්ගතා හොති.

සිතෙහි යම් පිහිටීමක්, මනාලෙස පිහිටීමක්, බැස ගත්තාසේ පිහිටීමක්, නොපැතිරී සිටීමක්, නොවිසිරී සිටීමක් ඇද්ද එසේම ඔබිනොබ සංචරණය නොවන ගතිය, සන්සිඳුනු බව, සමාධීන්ද්‍රිය, සමාධි බලය, යහපත් සමාධිය, මේ සිතෙහි එකග්ගතාවයි.

කුශල් සිතෙහි චෛතසික සතරක් බැස ගත්තාක් මෙන් මනාසේ පිහිටයි. ඕකප්පන සද්ධා, අපිලාපන සති, අවට්ඨිති සමාධි = එකග්ගතා, පරියොගාහණ පඤ්ඤා, යනුයි. නො සෙල්

වෙන ශ්‍රද්ධාව ඔකප්පන නම්. ඉල්පී නොයන සිහිය අපිලාපන සතියයි. බැසගත් එකග්‍රතාවය අවට්ඨිතියි. හාත්පසින්ම බැසගත් නුවණ පරියෝගාහණ පඤ්ඤා නම්. ශ්‍රද්ධාදී චෛතසික හඳුන්වන තැන්හි දී මේවායේ සෙසු ප්‍රභේද දත හැක. අවශ්‍ය කරුණු පමණක් මෙතැනට දක්විණි.

අකුශල් සිතෙහි ද බැස ගන්නාක් මෙන් පිහිටන චෛතසික තුනක් ඇත. එනම් තණ්හා, දිට්ඨි, අවිජ්ජා යි.

ප්‍රථම ධ්‍යානය, මෙසේ විස්තර කළ විතර්කාදි ගුණ පඤ්චක යෙන් හා, ඒ පස ද දෙවැදෑරුම් විවේකයෙන්ම හටගත් ගුණයද ප්‍රහාණාඞ්ග වූ කාමච්ඡන්ද දී නීවරණයන්ගෙන් හා ඊට අනුව ගිය කෙලෙසුන්ගෙන් දුරු වූ ගුණය ද, යන මෙතෙක් ගුණ වලින් සමන්විතය. තවද විශුද්ධි මාර්ගයෙහි දක්වෙන ගුණ සමූහයක් ද ඇත. ඒවා ද මෙහිලා දැක්වීම උචිත සුදුසු - යැ "එවමනෙන පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගතං තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නං පඨමජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං" වි. ම. එසේම මෙයින් අඞ්ග පහක් ප්‍රහාණය වූ අඞ්ග පසකින් යුක්ත වූ තුන් තැනක යහපත් බවක් ඇති ලක්ෂණ - හැපි දශයකින් යුත් පඨවි කසිණ ප්‍රථම ධ්‍යානය ලබා ගත්තේ නම් වෙයි.

## ත්‍රිවිධ කල්‍යාණත්වය හා දශ ලක්ෂණය.

ප්‍රථම ධ්‍යානය, ආදි කල්‍යාණය, මධ්‍ය කල්‍යාණය, පරියො සාන කල්‍යාණයයි ත්‍රිවිධ කල්‍යාණත්වයකින් යුක්තය. මුල යහපත් බව, මැද යහපත් බව, අග යහපත් බව යනු එහි අදහසයි. මේ ත්‍රිවිධ කල්‍යාණයන් අතරෙහි ලක්ෂණ දශයක් ඇත. "පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි, උපෙක්ඛානුබ්‍රෑහණා මජ්ඣෙ, සම්පහංසනා පරියොසානං"

ප්‍රථම ධ්‍යානයේ ප්‍රතිපදා විශුද්ධිය ආදි කල්‍යාණයයි. උපෙක්ෂාව දියුණු කිරීම මධ්‍ය කල්‍යාණයි සතුටුවීම - සම්පහංසනය - පරියොසාන කල්‍යාණයයි පරිකර්ම භාවනාවේ පටන් නුසුදුසු විහාර අත්හැරීම, අසප්පාය දුරු කිරීම, පඤ්ච නීවරණයන්ගෙන් අස්වීම, ආදී සියලු විරුද්ධ ධර්මයන්ගෙන් මෙන්වී අවුත් ගොත්‍රභූ සිත තෙක් ඇති ප්‍රතිපදාව ශුද්ධ කර ගැනීම, උපද්‍රවයන්ගෙන් විලක්වා ගැනීම, ප්‍රතිපදා විශුද්ධියයි. ප්‍රථම ධ්‍යානය උපන් පසු ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන් සමාන බවකට පත්වීම් වශයෙන් මැදහත්වීම උපෙක්ඛානුබ්‍රෑහනයයි. ප්‍රථම ධ්‍යානය උපන්නේයයි, එහි අව සානය බලා සතුටු වීම සම්පහංසනතාවයයි. මේ ත්‍රිවිධ කල්‍යාණ ත්වයයි.

දශ ලක්ෂණය : ආදි කල්‍යාණය ලක්ෂණ ත්‍රයකින් සමන්විතය. මධ්‍ය කල්‍යාණත්වය ද ලක්ෂණ ත්‍රයකින් සමන්විතය. පරියොසාන කල්‍යාණයෙහි ලක්ෂණ චතුෂ්කයෙකි - සතරෙකි, - සියල්ල දසයයි.

## ආදි කල්‍යාණ ත්‍රයः-

පඨමස්ස ඣානස්ස පටිපදා විසුද්ධි ආදි, ආදිස්ස කති ලක්ඛණානි? ආදිස්ස තීනි ලක්ඛණානි යො තස්ස පරිපන්ථො තතො චිත්තං විසුජ්ඣති, විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථ නිමිත්තං පටිපජ්ජති' පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති යඤ්ච පරිපන්ථතො චිත්තං විසුජ්ඣති, යඤ්ච විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථ නිමිත්තං පටිපජ්ජති, යඤ්ච පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති, පඨමස්ස ඣානස්ස පටිපදා විසුද්ධි ආදි, ආදිස්ස ඉමානි තීනි ලක්ඛණානි, තෙන වුච්චති පඨමජ්ඣානං ආදි කල්‍යාණඤ්චෙව හොති තිලක්ඛණ සම්පන්නඤ්ච"

මෙහි කෙටි අදහස මෙසේය. ප්‍රථම ධ්‍යානයෙහි ආදි කල්‍යාණය ප්‍රතිපදා විශුද්ධියයි. එහි ලක්ෂණ ත්‍රයෙකි. නීවරණ සංඛ්‍යාත උවදුරු වලින් වැලැක්වීම, මධ්‍යම සමථ නිමිත්ත වූ ධ්‍යානාඞ්ගයන් ගෙන් යුත් අර්පණාව දෙසට හැරීම, ඒ අර්පණාවෙහිම සිත නොසෙල්වෙනසේ බැස ගත්තාක් මෙන් පිහිටුවීම, යනුයි. මෙසේ ප්‍රථම ධ්‍යානය ආදියෙහි කල්‍යාණත්වයෙන් හා ත්‍රිවිධ ලක්ෂණයෙන් සමන්විතය.

## මධ්‍ය කල්‍යාණත්‍රය :

පිරිසිදු වූ සිත නැවත පිරිසිදු කර ගැනුම සඳහා උත්සාහ නොවිය යුතුය. හෙයින් මැදහත්වීම, සමාධියට පත්වූ සිත නැවත සමාධියට පත්කර ගැනුම සඳහා උත්සාහ නොවිය යුතු හෙයින් මැදහත්වීම, ධ්‍යානාඞ්ගයන්ගේ සාමූහික - එකට යෙදීම- බවට පත්වූ සිත නැවත එකඟ කර ගැනුම සඳහා උත්සාහ නොවිය යුතු හෙයින් මැදහත්වීම, යන ලක්ෂණ ත්‍රයයි. මෙ දක්වූයේ "විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, සමථ පටිපන්නං අජ්ඣුපෙක්ඛති, එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති" යන තිලක්ඛණයයි.

## පරියොසාන කල්‍යාණ චතුෂ්කය

ප්‍රථම ධ්‍යානයාගේ පරියොසාන කල්‍යාණය චතුගේ සම්පහංසනයයි, - සතුටුවීමයි, - එහි ලක්ෂණ සතරෙකි. "ඤාණෙන,

ධම්මානං අනතිවත්තනත්ථෙන සම්පහංසනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සම්පහංසනා තදුපග වීරියවාහනට්ඨෙන සම්පහංසනා, ආසෙවනට්ඨෙන සම්පහංසනා" ධ්‍යානයට අනුව උපන්නා වූ යුගනද්ධ ධර්ම - යුගල වශයෙන් යෙදිය යුතු ධර්ම - වශයෙන් පවත්නා සමාධි - ප්‍රඥා දෙක නොඉක්මවීම පැවතීම නිසා සතුටුවීම, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන්ගේ එක රසය වූ කෙලෙසුන් ගෙන් මිදුනු විමුක්ති රසය පවතින නිසා සතුටුවීම, සමාධි - ප්‍රඥා ධර්ම ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ඔවුනට සුදුසු වැඩෙහි යෙදවීමට අවශ්‍ය වීර්යයක් උපුලන නිසා සතුටුවීම නැවත නැවත ඇසුරු කිරීම් වශයෙන් සතුටුවීම, යන ලක්ෂණ සතරයි.

මෙසේ ප්‍රථම ධ්‍යානය ත්‍රිවිධ කල්‍යාණත්වයකින් හා දශ ලක්ෂණයන්ගෙන් සමන්විත යැ.

## ප්‍රථම ධ්‍යානය ආරක්ෂා කළ යුතු අයුරු.

ප්‍රථම ධ්‍යානය ලද පමණින් ම සතුටු වී සමාධි භාවනාව නතර කළහොත් ඉතා ඉක්මනින් ධ්‍යානයෙන් පිරිහෙයි. එසේ ප්‍රථම ධ්‍යානය ලත් කෙණෙහිම ද්විතීය ධ්‍යානය සඳහා යෝග කළහොත් එවිට ද ලත් ධ්‍යානයෙන් පිරිහෙයි. එහෙයින් එය ආරක්ෂාකර ගැනීම සඳහා කළ යුත්තේ එයට සමවැදීම වැඩිකර ගැනීමයි, සමවැදීම් වැඩිවූ තරමටම ධ්‍යානය මනාසේ පුහුණු වෙයි. පිටිසර වැසි මිනිසෙක් නගරයට ගිය මුල් වාරයේ නගරයෙහි මාර්ග සොයාගෙන ඇවිදීමට අපොහොසත් වෙයි. නගරයට පැමිණීම පමණක් සිදුවෙයි ඉදින් ඒ මිනිසා නගරයට පැමිණි විගසම නගරය පිළිබඳ දැනුම සම්පූර්ණයයි සිතයි නම් ඒ මුළාවකි. ඔහුට සිදුවනුයේ යම් මාර්ගයකින් නගරයට පැමිණියා නම් ඒ මාර්ගයෙන්ම ආපසු ඒමය. එසේම නැවත ඉදිරියට ගොස් අසවල් මාර්ගයෙහි ගියහොත් අසවල් දේ හමුවෙයි ආදී වශයෙන් ඒ ඒ ස්ථානයන්ට යාම සඳහා කල්පනා කරයි නම්, එයද මුළාවකි. මක්නිසාද? මාර්ග රාශියක් ඇති නගරයක, තමාට අවශ්‍ය මාර්ගය සොයා ගැනීම අපහසු හෙයිනි. එහෙයින් ඒ මිනිසා කරනුයේ ආපසු ඒමය. ප්‍රථම ධ්‍යානය ලත් පමණකින් සතුටුවීමත්, දෙවැනි ධ්‍යානය ලබා ගැනීමට කල්පනා කිරීමත්, න දෙකම ඒ පිටිසර මිනිසාගේ නගරයට පැමිණීම බඳුය.

ඒ මිනිසා බොහෝ වාරයක් නගරයෙහි සංචාරය කොට පුරුදු වූවහොත් ඒ නගරයෙහිම සෑම මාර්ගයක්ම සෑම දෙයක්ම සොයා ගැනීම එතරම් අපහසු කාරණක් නොවෙයි. කිසිදු විමසීමක් නොමැතිව නියම තැනට ගේ වනු ඇයි. එමෙන් ප්‍රථම

ධ්‍යානය ලද්දා වූ යෝගියා ද එයට නිතර සමවදිමින් පුරුදු පුහුණු කරයි නම් හේ ප්‍රථම ධ්‍යානයෙහි දක්‍ෂකමක් ලබනවත් සමඟම දෙවැනි ධ්‍යානය ලැබීමට ද සුදුස්සෙක් වෙයි. ප්‍රථම ධ්‍යානයට සමවැදීම සඳහා ඔහු විසින්ම ප්‍රථමධ්‍යානය වශී කර ගත යුතුය. වශී ක්‍රම පසෙකි.

## පඤ්ච විධ වසී.

ආවජ්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, වුට්ඨාන, පච්චවෙක්ඛණ මේ ආදී පඤ්ච විධ වසීහුය.

කැමති තැනක, කැමති ධ්‍යානාඞ්ගයක්, කැමතිතාක් කල් මෙනෙහි කිරීමේ දක්‍ෂකම, පසුබට නොවන ගතිය, වහා සිහි කිරීමට හැකි බව, ආවජ්ජන වසී නම් ආවර්ජනය තමාට වසඟ කර ගැනීමයි. අධිෂ්ඨාන වසී යනු පෙර කී අයුරින් ඉටා ගැනීමේ දක්‍ෂකමයි. කැමති වෙලාවක, කැමති තැනකදී, කැමති ධ්‍යානාඞ්ගයකින් නැඟී සිටීමෙහි දක්‍ෂකම වුට්ඨාන වසීයි. පච්චවෙක්ඛණ වසී නම් ඒ අයුරින්ම සිහිකර බැලීමට හැකි බවයි.

ප්‍රථම ධ්‍යානය පඤ්චවසිතායෙන් වශී කරගත් කල්හි සථිර බවට පත් වෙයි. ද්විතීය ධ්‍යානය ලැබීමට සුදුස්සෙක් වෙයි. එබඳු අවස්ථාවේදී ඔහුට ප්‍රථම ධ්‍යානයෙහි දොස් හා ද්විතීය ධ්‍යානයෙහි ආනිශංස පෙනෙයි. "මේ ධ්‍යානයෙහි පඤ්ච නීවරණ නමැති සතුරෝ ළඟම සැරිසරත්. ඔව්හු කොබඳු වේලාවක අවුත් පහර දෙත්දැයි කිව නොහැකිය. ඒ නිසාම ප්‍රථම ධ්‍යානය ලාමකය එහි ඇත්තා වූ විතර්ක, විචාර, ද ඖදාරිකය. ගොරෝසුය" මේ ද්විය ධ්‍යානයෙහි එබඳු ගොරෝසු ධ්‍යානාඞ්ග නැත නීවරණ සතුරෝ ද ඉතා දුරස්ථයහ එහෙයින් ශාන්තය" කියායි.

ඉක්බිති හේ ද්විතීය ධ්‍යානය ලබා ගැනීම සඳහා නැවතත් ඒ කසිණාදි නිමිත්ත මෙනෙහි කරමින් භාවනා කරයි. එසේ භාවනා කරද්දී ඔහුට උපචාර සමාධියෙන් පසු විතර්ක, විචාර, රහිත (නැති) ද්විතීය ධ්‍යානම උපදියි. එයද ත්‍රිවිධ කල්‍යාණත්වයකින් හා දශ ලක්‍ෂණයකින් සමන්විතය.

## ද්විතීය ධ්‍යානය.

"විතක්ක විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීති සුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති"

විතර්ක, විචාරයන්ගේ සංසිඳීමෙන් සිතෙහි උපන් සතුටු සවභාවයෙන් යුත්, විතර්ක විචාර නොමැතිවීමෙන් සිතෙහි හුදකලාව හටගත්, විතර්ක නැති, විචාර නැති, සමාධිමය ප්‍රීතියත් සුඛයත් ඇති ද්විතීය ධ්‍යානයට සමවැදීම වශයෙන් පැමිණ වාසය කරයි.

ද්විතීයජ්ඣානයෙහි ඇත්තේ අඞ්ග තුනෙකි. එනම් පීති, සුඛ එකග්ගතා යනුයි. මේ අඞ්ග ප්‍රථම ධ්‍යානයෙහිද තුබූ නමුත් මෙහිදී ඒවා වඩා වෙනස් වූයේය. ඒ වෙනස නම් සමාධියෙන් ඉපදීමයි. ඒ නිසාම ප්‍රථම ධ්‍යානයෙහි පීති, සුඛ, දෙදෙනාට වඩා ද්විතීය ධ්‍යානයෙහි පීති, සුඛ දෙදෙනා සියුම්යහ. එසේම ඔඵදරික වූ විතර්ක, විචාර, දෙදෙනාද මෙහි නොමැත. එහෙයින් ශාන්තය. ඉති අයං ච විතක්කො අයං ච විචාරො සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තිකතා තෙන වුච්චති අවිතක්කං අවිචාරං'' වි. ප. මෙසේ මේ විතර්කය ද, මේ විචාරය ද, ශාන්තය. අස්තඞ්ගාය - නොපෙනී ගොස්ය. භාවනා බලයෙන් සංසිඳීමකට පත් කළේය. විශේෂයෙන් අස්තඞ්ගතය. විනාශයට පමුණුවන ලද්දේය. විශෙෂයෙන් විනාශයට පමුණුවන ලද්දේය. වියලවන ලදී. විශෙෂයෙන් වියලවන ලදී. කෙලවර කරන ලදී. ඒ නිසා අවිතර්කයි. අවිචාරයි.

මෙසේ ද්විතීය ධ්‍යානය විතර්ක, විචාර, දෙදෙනා සංසිඳීමෙන් හුදකලාව ඉපදුන විතර්ක, විචාර, නැති සමාධිමය වූ ශාන්ත වූ පීති, සුඛ, ඇතියකි. එසේම ත්‍රිවිධ කල්‍යාණත්වයක් හා දශ ලක්ෂණයන් ද ඇත්තේය.

## තෘතීය ධ්‍යානය:

ද්විතීය ධ්‍යානය පෙරසේ ම පඤ්චවසිතාවයෙන් මනාසේ වශී කොට, ඉතා ප්‍රගුණ වූ පසු ඒ යෝගියා එහි ඇත්තා වූ ප්‍රීතියෙහි දෙස් දකියි. ''මේ ධ්‍යානයට විතර්ක, විචාර. නමැති සතුරෙක් ලඟම වසයි. එසේම කය - සිත දෙකම ලොමුදැහැ ගත්තා ප්‍රීතියක්ද ඇත.'' කියායි. මෙසේ දෙස් දැක, තෘතීය ධ්‍යානයෙහි එබඳු දෙස් නොමැති, එය ඉතා ශාන්තයැයි එහි ආනිසංස දකියි. ඉක්බිති නැවතත් පෙරසේම පරිකර්ම භාවනා කර, ප්‍රීතිය අස් වූ තෘතීය ධ්‍යානය උපදවයි.

"පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති" උපෙක්ඛකො සතිමා සුඛවිහාරී"ති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති"

ඉක්මවීම වශයෙන් ප්‍රීතියෙන් ද අස්වී, සිහි ඇත්තේ නුවණ ඇත්තේ, උපෙක්ෂාවෙන් යුතුව ද වාසය කරයි. ශරීරයෙන් සැපය ද විඳියි යම් ධ්‍යානලාභියෙකු "උපෙක්ෂායෙන් යුක්ත වූ සිහි ඇති සැප විහරණයක් ඇත්තෙකුය"යි ආචාර්යයෝ ප්‍රශංසා මුඛයෙන් කියත් ද ඒ ධ්‍යානය වූ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි.

තෘතීය ධ්‍යානයෙහි ප්‍රීති නැති. ඇත්තේ සුඛ, ඒකාග්‍රතා, යන අඞ්ග දෙක පමණි. ප්‍රීතියෙන් අස්වීම නිසා උපෙක්ෂාව කීය විණි. සුඛය නිසා ප්‍රීතිය නො ඉපදීමට, නැතහොත් ද්විතීය ධ්‍යාන තත්වයට නො පැමිණීම සඳහා සිහියෙන් හා නුවණින් ද යුක්තවූයේ වෙයි ප්‍රීතියෙන් තොරව සුඛයක් විඳින හෙයින් ඒ ධ්‍යානය ආචාර්යයෝ ප්‍රශංසා කරත්. මෙසේ තෘතීය ධ්‍යානය එක් අඞ්ගයකින් තොරවූ අඞ්ග දෙකකින් යුක්තවූ ආචාර්යයන් විසින් ප්‍රශංසාර්හ උපෙක්ෂා ගුණයකින් යුක්තවූයේ වෙයි.

තවද "පීතියා ච විරාගා" ප්‍රීතිය ඉක්මවීමෙන්, මෙසේ කියූ කල්හි ඉක්ම වූයේ ප්‍රීතිය පමණක් නොවන බව දක්වෙයි "ච" යන නිපාතය ද එවැනි අදහසක් උපදින පරිද්දෙන් දේශනා කළහ. එහෙයින් ශබ්ද ශාස්ත්‍රඥයෝ 'ච" නිපාතය සම්පිණ්ඩ නාර්ථයෙහි ද කැමති වෙත්. සම්පිණ්ඩනාර්ථ නම් කැටිකිරීම යන තේරුමයි. එක්කාසු කිරීම, පොදි ගැසීම, යනු ද එයි. මෙහි ප්‍රීති යත් සමග කැටිගැසුනෝ, එක්කාසුවූයේ, විතර්ක, විචාර දෙදෙනායි. ඒ බව දක්වීමටය, "පීතියාච" යනුවෙන් දෙසූයේ, තෘතීය ධ්‍යානය ද විතර්ක, විචාර, දෙකින් තොරය, එහෙත් ද්විතීය ධ්‍යානයෙහිත් ඒවා නොමැති නිසා නැවත මෙහි දක්වීම නුසුදුසුය. එහෙයින් "ච" නිපාතය යොදා ඒ දෙදෙනාගේ ඉක්මවීම ද නැති නම් නැති බව ද හඟවූහ, තෘතීය ධ්‍යානය විතර්ක, විචාර පමණක් නොව ප්‍රීතිය ද ඉක්මවීමෙන් ලැබෙන්නකි. තවද ද්විතීය ධ්‍යානය නො ලබා තෘතීය ධ්‍යානය නො ලැබිය හැකිය.

"උපෙක්ඛකො ච විහරති" උපෙක්‍ෂා වූයේ ද වෙසෙයි. මෙයින් තෘතීය ධ්‍යානයෙහි ඇති උපෙක්‍ෂාව කියැවිණ. එසේ නමුදු ධ්‍යානාඞ්ග වශයෙන් නො එයි මක්නිසාද? උපෙක්‍ෂාව සමඟ ම දක්වූ සිහිය-නුවණ යන දෙකද තෘතීය ධ්‍යානයෙහි පිරිවර වශයෙන් යෙදුනු හෙයිනි. උපෙක්‍ෂාවත් එහි පිරිවර ගුණයකි. තවද ප්‍රීතිය ව්‍යාප සමනය කළ හෙයින් ධ්‍යානය පක්‍ෂපාතීත්වයෙන් තොරව, සමාන ලෙස බලන හෙයින් උපෙක්‍ෂා වූයේයයි යෙදිණ. උපෙක්ඛා යනු ඉපදීම් වශයෙන් බැලීමයි 'උපපත්තිතො ඉක්ඛතීති උපෙක්ඛා" යනු පද සාධනයයි, උපෙක්ඛාව දස වැදෑරුම්ය. ඡළඞ්ගුපෙක්ඛා, බ්‍රහ්මවිහාරුපෙක්ඛා බොජ්ඣඞ්ගුපෙක්ඛා, විරියුපෙක්ඛා, සංඛාරුපෙක්ඛා, වෙදනුපෙක්ඛා, විපස්සනුපෙක්ඛා, තත්‍රමජ්ඣත්තුපෙක්ඛා, ඣානුපෙක්ඛා, පරිසුද්ධුපෙක්ඛා යනුයි.

1. ඡළංගුපෙක්ඛා: අඞ්ග සයකින් යුත් මධ්‍යස්ථවීමයි. රහතන් වහන්සේ චක්ඛු ආදී ඉන්ද්‍රිය සයදොරට ගොදුරුවන රූපාදී අරමුණු සය හමුවීමේදී, කෙලෙසුන් නො මෑතී නිසා හොඳ, නරක නො විමසා මධ්‍යස්ථ වෙත්. ඒ මධ්‍යස්ථවීම අරමුණු සයෙහි දීම උපදවන හෙයින් ඡළංගුපෙක්ඛා නම්. "ඉධං ඛීණාසවො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො උපෙක්ඛකො විහරති සතො සම්පජානො" මේ ශාසනයෙහි ක්‍ෂීණාශ්‍රව භික්‍ෂු තෙමේ ඇසින් රූපයක් දැක සතුටු ද නො වෙයි. අසතුටු ද නො වෙයි. එහි සිහිනුවණින් යුක්ත වූයේ මධ්‍යස්ථව වෙසෙයි" යනුවෙන් වදාළහ.

බ්‍රහ්මවිහාරුපෙක්ඛා; සියලු සත්වයන් වෙත පළමුකොට මෛත්‍රී කරුණා, මුදිතා, යන බ්‍රහ්මයන්ට සමාන පැවතුම් ඇති ගුණ පතුරුවා ඉක්බිති සත්වයන් ගේ කර්මය ස්වකීය බව - කර්මය තමාට අයත් බව - සලකා ඒ හැම සත්වයන් කෙරෙහි මධ්‍යස්ථ වීම, බ්‍රහ්මවිහාරුපෙක්ඛාවයි. මෙය තෘතීය ධ්‍යානයෙන් පසුව උපදවාගත යුත්තකි.

3 බොජ්ඣඞ්ගුපෙක්ඛා. ධම්ම විචය, විරිය, පීති, පස්සද්ධි සමාධි යන බොජ්ඣඞ්ග ධර්මයන් සමතත්වයෙන් තබාගැනීම සඳහා යොදන මධ්‍යස්ථවීම, හෙවත් ලීන; උද්ධච්ච, ධර්ම දෙකට පත් වන්ට නොදී සිත මධ්‍යස්ථ කරගැනීම සඳහා යොදන උපෙක්ඛාව බොජ්ඣඞ්ගුපෙක්ඛා නමි.

**4. විරියුපෙක්ඛා:** භාවනා අරමුණෙහි සිත සමසේ යෙදෙන වේලාවේදී අධික වීර්‍යයකට හෝ ලිහිල්වූ වීර්‍යයකට හෝ පත් වීමට අවකාශ නොදී ආරක්‍ෂා කරගැනීම විරියුපෙක්ඛායි. බමරාගේ රොන් ගැනීමේ උපමාව සැලකියයුතු.

**5. සංඛාරුපෙක්ඛා:** ප්‍රථම ධ්‍යානය ලබාගැනීම සඳහා සිහි-නුවණ යොදවා පසුව නීවරණයන් කෙරෙහි උපෙක්‍ෂාවීම ආදී වශයෙන් දක්වෙන රූපාවචර, අරූපාවචර, ධ්‍යානයන් අට පිළිබඳව යෙදෙන ඒ ඒ විතර්කාදී සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථවීම් අට ද විදර්ශනා වශයෙන් යෙදෙන සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථ වීම් දසය ද සංඛාරුපෙක්ඛා නම්.

'පඨමජ්ඣානං පටිලාභත්ථාය නීවරණෙ පටිසංඛා සන්තිට්ඨනා පඤ්ඤා, සංඛාරුපෙක්ඛාසු ඤාණං, දුතියජ්ඣානං පටිලාභත්ථාය විතක්ක විචාරෙ, තතියජ්ඣානං පටිලාභත්ථාය පීතිං, චතුත්ථජ්ඣානං පටිලාභත්ථාය සුඛ දුක්ඛෙ, ආකාසානඤ්චායතන සමාපත්ති පටිලාභත්ථාය රූප සඤ්ඤා පටිඝසඤ්ඤා, නානත්තසඤ්ඤා, විඤ්ඤාණඤ්චායතන සමාපත්ති පටිලාභත්ථාය ආකාසානඤ්චායතන සඤ්ඤං, ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති පටිලාභත්ථාය විඤ්ඤාණඤ්චායතන සඤ්ඤං නෙව , සඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති පටිලාභත්ථාය ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤං පටිසංඛා සන්තිට්ඨනා පඤ්ඤා, සංඛාරුපෙක්ඛාසු ඤාණං, ඉමා අට්ඨ සංඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති"

i ප්‍රථම ධ්‍යානය උපදවාගැනීම සඳහා නීවරණයන් කෙරෙහි නුවණින් තීරණය කරන්නාවූ සංඛාරුපෙක්ඛා ඤාණය.

ii ද්විතීය ධ්‍යානය උපදවාගැනීම සඳහා විතර්ක විචාර දෙදෙනා කෙරෙහි නුවණින් තීරණය නුවණ ද සංඛාරු-පෙක්ඛාවය.

iii තෘතීය ධ්‍යානය උපදවා ගැනීම සඳහා ප්‍රීතිය කෙරෙහි-පෙරමෙනි.

iv චතුර්ථ ධ්‍යානය උපදවා ගැනීම සඳහා සුඛ, දුක්ඛ කෙරෙහි - පෙ.

v ආකාසානඤ්චායතන සමාපත්තිය ලබාගැනීම සඳහා රූප සඤ්ඤා, පටිඝසඤ්ඤා, නානත්තසඤ්ඤා, කෙරෙහි-පෙ.

vi විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ලබාගැනීම සඳහා ආකාසානඤ්චායතන සඤ්ඤාව කෙරෙහි =පෙ=

vii ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ලබා ගැනීම සඳහා විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාව කෙරෙහි -

viii නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය ලබාගැනීම සඳහා ආකිඤ්චායතන සඤ්ඤාව කෙරෙහි නුවණින් තීරණය කරන්නාවූ නුවණ ද යන මේ අට සංඛාරුපෙක්ඛා වේයි.

**විදර්ශනා වශයෙන් යෙදෙන සංඛාරුපෙක්ඛා ඤාණ දසය.**

සෝවාන් මාර්ගය ලබාගැනීම සඳහා ඉපදීම, පැවතීම, සංස්කාර නිමිති, රැස්කිරීම, පිළිසිඳගැනීම, ගතිය, හටගැනීම, පහලවීම, ජාති, ජරා, මරණ ලෙඩවීම, ශෝකය, විලාප කීම, දුඃඛ සිත් තැවුල යන මේ ස්වභාවයන් කෙරෙහි නුවණින් තීරණය කරන්නාවූ නුවණ සංඛාරුපෙක්ඛා ඤාණයයි. එසේ ම සෝවාන් ඵලය, සකෘදාගාමී මාර්ග - ඵල අනාගාමී මාර්ග - ඵල, අර්හත් මාර්ග-ඵල සුඤ්ඤත විහාර සමාපත්තිය, අනිමිත්තවිහාර සමාපත්තිය යන මේ අවස්ථා ලබාගැනීම සඳහා ඉහත කී ඉපදීම් ආදී ස්වභාව ධර්මයන් කෙරෙහි නුවණින් තීරණය කරන්නාවූ නුවණ සංඛාරුපෙක්ඛා ඤාණයෝයි.

**මෙසේ සමථ-විපස්සනා වශයෙන් අටළොස් ආකාරය.**

6. වේදනූපෙක්ඛා: කාමාවචර කුශල් උපදින අවස්ථාවේදී සතුට නො මැති වුවහොත් උපදිනුයේ අදුක්ඛමසුඛ වේදනාවයි. එය උපෙක්ඛා නම්. මේ වේදනූපෙක්ඛායි.

"යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛා සහගතං" යනු නිදර්ශනයි.

7. විපස්සනූපෙක්ඛා: සංස්කාර ධර්මයන් අනිත්‍යාදී ත්‍රිලක්ෂණයට අනුව නුවණින් විමසද්දී උපදින මධ්‍යස්ථභාවය විදර්ශනෝපෙක්ෂායි.

8. තත්‍රමජ්ඣත්තුපෙක්ඛා: කුශල චෛතසික දක්වෙන තැනදී "තත්‍රමජ්ඣත්තතා" චෛතසිකයයි.

**9.** ඣානුපෙක්ඛා: විතක්කාදි ධ්‍යානාඞ්ගයන් සියුම් කරමින් ගොස් අවසානයේදී උපදින මධ්‍යස්ථභාවය ඣානුපෙක්ඛා නම්. මෙය තෘතීය ධ්‍යානයේදී උපදියි.

**10,** පාරිසුද්ධුපෙක්ඛා: නිවරණ, විතක්කාදි ධ්‍යානාඞ්ග යන මේ ප්‍රතිපක්ෂ, නුසුදුසු ධර්ම, සංසිඳීමෙන් හා ඒවා සන්සිඳවීමෙහි නැවත උත්සාහ නො ගතයුතු බැවින් උපන් මධ්‍යස්ථභාවය පාරිසුද්ධි උපෙක්ඛායි. චතුර්ථ ධ්‍යානයෙහි හා අරූපී ධ්‍යානයන්හිද මෙය යෙදේ.

මෙසේ දැක්වෙන දස වැදෑරුම් උපෙක්ඛා අතුරෙන් තතිය-ජ්ඣානයෙහි උපදින උපෙක්ඛා 'උපෙක්ඛකො ච විහරති' යන්නෙන් ගතයුතුය.

''සතො ච සම්පජානො'' සිහියෙන් යුක්තවූයේ, නුවණින් යුක්තවූයේ යන අදහසයි. තෘතීය ධ්‍යානයේදී පමණක් මෙසේ යෙදුනේ මක්නිසාද? ඉහත කී ධ්‍යානයන්හි ඒවා නොමැති ද? සිහි-නුවණ නොමැත්තාට අර්පණා කෙසේ වේවා උපචාර සමාධි නමුදු උපදී ද? යන මෙතෙක් ප්‍රශ්න මෙහිලා ඉපදීමට අවකාශ ඇත. ඊට පිළිතුරු: සෙසු ධ්‍යානයන්හිදී සිහි නුවණ නැත්තේ නො වෙයි. එහෙත් ඒ සිහිනුවණ දෙක විතක්කාදී ගොරෝසු ධ්‍යානාඞ්ග කෙරෙහි පැවතියේය. මේ තෘතීය ධ්‍යානයේදී ආසන්නවම ප්‍රීතිය ඇති හෙයින් එයට නො පැමිණ සුඛය පමණක් රැක ගැනීමට පෙරට වඩා අධික සිහියක් නුවණක් තිබිය යුතුය. සුඛය ළඟම ඇත්තේ ප්‍රීතියයි. සුඛය විඳිමින් ප්‍රීතියට පත් නොවීම කෙතරම් අපහසු දෙයක් ද? දෙන ගෙන් අස් කළ ගව පැටවා වලක්වාගැනීමට අපහසු වන්නාසේ සුඛයත් ප්‍රීතියට නොගොස් වලක්වා ගැනීම අපහසුය. එහෙයින් එතැනදී බලවත්වූ සිහියක් නුවණක් යෙදිය යුතු හෙයින් තෘතීය ධ්‍යානයේදී සිහි නුවණ දෙක විශේෂකොට දේශනා කළහ.

තවද, තෘතීය ධ්‍යානයෙන් යුක්තවූවනු ''කායෙන්ද සැප විඳියි'' යනුවෙන් සඳහන් වෙයි. මෙහි ''කාය'' යනු නාමකාය යි. රූප කාය නො වේ. එහෙත් ''මම සුව විඳිමි'' යි ඔහුට කල්පනාවෙක් නැති මුත් ඒ ලබාගත් ධ්‍යානය නිසා නාමකාය සුවපත් බවට පත් වෙයි. ඒ සමඟ ම රූප කාය ද සුවපත් නූයේ නො වේ. වෙයි. එහෙයින් ''සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති''යි වදාළහ.

එසේ ම "තෘතීය ධ්‍යානයෙන් යමෙක් යුක්ත වී නම් ඔහුට ආර්‍යයෝ ප්‍රශංසා කරත්" යනුවෙන් තෘතීය ධ්‍යානයෙහි වෙන සක් දැක්වූහ. ඒ කුමක් නිසාද? තෘතීය ධ්‍යානය ලබාගත් යෝගියා ඒ ධ්‍යානය කෙරෙහි ද මධ්‍යස්ථය. මැදහත්ය. ප්‍රීතියත් නූපද වයි. සුඛයත් අත් නො හරියි. ඒ මැදට වී සිටියි ඒ මධ්‍යස්ථ ස්ව භාවයට ආර්‍යයෝ කැමතියහ. මක්නිසාද? සංස්කාර ධර්මයන් කෙරෙහි මෙවැනි පිළිපැදීමක් අවශ්‍ය හෙයින්ය, සංස්කාර ධර්මයන් හොඳයැයි යහපත්ය යනාදී වශයෙන් ද අනිත්‍යාදී ලක්ෂණයන් ඉක්මවීම් වශයෙන් ද නො පැවතිය යුතුය. එහෙයින් ඒ සංස්කාර ධර්මයන් කෙරෙහි මධ්‍යස්ථ විය යුතුය. එමෙන් තෘතීය ධ්‍යාන ලාභියා ද, තමන් ලත් ධ්‍යානයෙහිදී මධ්‍යස්ථ වෙයි. මේ කාරණ නිසා ආර්‍යයෝ ප්‍රශංසා කරත්.

මෙසේ තෘතීය ධ්‍යානය, ප්‍රීතිය නම් එක් අඞ්ගයක් අස්වූ සුඛ ඒකාග්‍රතා යන අඞ්ග දෙකින් යුත් උපේක්‍ෂාවත් ආශ්‍රය කරන ආර්‍යයන්ගේ ප්‍රශංසාවට පවා ලක්වූවකි.

## චතුර්ථ ධ්‍යානය:

තෘතීය ධ්‍යානය පඤ්චවශිතාවෙන් වශී කරගත් යෝගියා එහි ඇත්තාවූ දොස් දකියි චතුර්ථ ධ්‍යානයෙහි ආනිශංස දකියි මේ තෘතීය ධ්‍යානයෙහි ප්‍රීති නමැති සතුරෙක් ලඟ ම ඇත්තේ ය. එසේ ම ප්‍රීතියෙන් තොර වූ සුඛය ද ප්‍රීතියට නො වැටී රැක ගැනුමද දුෂ්කරය. චතුර්ථ ධ්‍යානය එසේ නොවෙයි, එය ශාන්තය. ප්‍රණීතය' කියායි. මෙසේ මෙනෙහි කර නැවතත් පරිකර්ම භාවනාවට බැස, සුඛයෙන් තොරවූ උපෙක්ඛා, ඒකාග්‍රතා යන අඞ්ග දීවයෙන් යුත් චතුර්ථ ධ්‍යානය උපදවයි,

"සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති"

සැපයත් දුකත් ප්‍රහාණය කිරීමෙන් හා පෙරදී ම සතුට ද නො සතුට ද අස් කිරීමෙන් දුක සැප දෙකම නැත්තාවූ උපෙක්ෂාවෙන් හටගත් පිරිසුදු භාවයක් ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. මේ චතුර්ථ ධ්‍යානයෙහි ස්වභාව ලක්ෂණයයි.

වේදනා පසෙකි. සුඛ, දුක්ඛ, සොමනස්ස, දොමනස්ස, උපෙක්ඛා යනුයි. මේ වේදනා පස අතුරෙන් චතුර්ථ ධ්‍යානයේ ඇත්තේ උපෙක්ෂා වේදනාව පමණි. උපෙක්ෂා වේදනාම ශාන්ත වූ සැපයකින් යුක්ත බව අවබෝධය සඳහා 'සුඛස්ස ච පහාණා'' ආදී වශයෙන් ඒ සුඛ වේදනාදිය මේ ධ්‍යානයේදී නො යෙදීම දැක්වූහ. ආහාරයෙහි මිහිරි බව හැඟවීම සඳහා අමිහිරි ආහාරයෙහි අඩග වූ තිත්ත, ඇඹුල්, පැණි, කසට යනාදිය එහි නැති බව දක්වන්නාක් මෙනි. තිත්තාදිය නැතිනම් ආහාරය මිහිරිය කියා නොකීවත් මිහිරි බව අවබෝධවෙයි. එමෙන් අස් වූ අඩග දැක් වූ කල්හි ඇත්තාවූ අංගයෙහි ශාන්ත බව, සැප බව, වැටහෙයි. එහෙයිනි චතුර්ථ ධ්‍යානයේ ගුණ දැක්වීමට ප්‍රහාණාඩග දෙසූයේ.

දුක්ඛ, දොමනස්ස, සුඛ, සොමනස්ස යන වේදනා ක්‍රමයෙන් ප්‍රථම ධ්‍යානාදී ධ්‍යානයන්ගේ උපචාර අවස්ථාවන්හිදීම ප්‍රහීණ වෙත්. එහෙයින් චතුර්ථ ධ්‍යාන උපචාර අවස්ථාවේදී සොමනස්ස වේදනාවත් ප්‍රහීණ වූ බව දැක්වීමෙන් අදුක්ඛමසුඛ, එනම් උපෙක්ඛාවේදනාව චතුර්ථ ධ්‍යානක්ෂණයෙහිදී උපදී. ඒ උපෙක්ෂා වෙන් ම පිරිසුදු වූ සිහියක් චතුර්ථ ධ්‍යානයෙහි ඇත්තේය. මෙසේ සුඛය යන එක් අංගයක් අස් වූ උපෙක්ඛා එකග්ගතා යන අංග දෙකකින් යුත් චතුර්ථධ්‍යානය පඤ්චනීවරණයන්ගෙන් හා ඕලාරික ධ්‍යානාංගයන්ගෙන් ද අස්වූ ඉතා පිරිසිදු වූවකි.

## පංචම ධ්‍යානය

ප්‍රථම ධ්‍යානයෙහි ඇති විතර්ක විචාර දෙකින් එකක් එක් වර කදී ද අනෙක අනික් වාරයේදී ද අස් කරමින් ධ්‍යාන ඉපද වූ විට පඤ්චම ධ්‍යානයක් ලැබේ මේ පඤ්චක ක්‍රමයෙන් ධ්‍යාන උපදවන යෝගියා ලබාගත් ප්‍රථම ධ්‍යානය පෙර කී නයින් වශී කොට; එහි ඇති විතර්කයෙහි දොස් දැක, එය අස්කර ගැනුම සඳහා යෝග කරද්දී ඔහුට විතර්ක නැති විචාර, පීති, සුඛ, එකග්ගතා යන අංග සතරකින් යුත් ද්විතීය ධ්‍යානය ලැබෙන්නේය. ඉක්බිති ක්‍රමයෙන් අංග ඉක්මවීමෙන් සෙසු ධ්‍යාන උපදවයි පඤ්චම ධ්‍යානය චතුර්ථ ධ්‍යානයෙහි අංගවූ උපෙක්ඛා, එකග්ගතා දෙකින් යුක්තය.

පෙර කී දෙවැනි ධ්‍යානය මෙහිදී තුන්වැන්න වෙයි. මෙ ක්‍රමයෙන් සෙසු ධ්‍යාන සලකාගතයුතු.

## ධ්‍යාන සතරෙහි ඇති සම්පූර්ණ ශාන්ත භාවය දක්වීම සඳහා දේශනා කළ උපමා සතරක්.

"පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථා පටිපන්නා මෙ සාවකා චත්තාරි ඣානානි භාවෙන්ති. ඉධුදායි භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීති සුඛෙන අප්ඵුතං හොති. සෙය්‍යථාපි උදායි, දක්ඛො නහාපකො වා නහාපකන්තෙවාසී වා කංසථාලෙ නහානීය චුණ්ණානි ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං සන්නෙය්‍ය; සාස්ස නහානීය පිණ්ඩි ස්නෙහානුගතා ස්නෙහපරෙතා සන්තරබාහිරා ඵුටා ස්නෙහෙන ච පග්ඝරති. එවමෙව ඛො උදායි භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීති සුඛෙන අප්ඵුතං හොති,

පුන ච පරං උදායි, භික්ඛු විතක්කවිචාරානං -පෙ- දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීති සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීති සුඛෙන අප්ඵුතං හොති. සෙය්‍යථාපි උදායි උදකරහදො උබ්භිදොදකො. තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්සායමුඛං න පච්ඡිමාය දිසාය උදකස්සායමුඛං න උත්තරාය දිසාය උදකස්සායමුඛං න දක්ඛිණාය දිසාය උදකස්සාය මුඛං, දෙවො ච කාලෙන කාලං න සම්මාධාරං අනුප්පවෙච්ඡෙය්‍ය; අථ ඛො තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුතං අස්ස, එවමෙව ඛො උදායි භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීති සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීති සුඛෙන අප්ඵුතං හොති.

පුන ච පරං උදායි, භික්ඛු පීතියා ච විරාගා -පෙ- තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුතං හොති, සෙය්‍යථාපි උදායි, උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා

පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තො නිමුග්ගපොසීනි තානි යාව චග්ගා යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි පරිප්ඵුතානි, න තෙසං කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුතං අස්ස. එවමෙව ඛො උදායි භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුතං හොති

පුන ච පරං උදායි, භික්ඛු සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුතං හොති. සෙය්‍යථාපි උදායි, පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුතං අස්ස, එවමෙව ඛො උදායි, භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුතං හොති.

තත්‍ර ච පන මෙ සාවකා බහු අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති" – ම. නි. (ම. ප. මහාසකුළුදායි සුත්‍රය)

උදායිය; නැවත ද යම් ප්‍රතිපදාවෙක්හි පිළිපන්නා වූ මාගේ ශ්‍රාවකයෝ ධ්‍යාන සතර වඩත් ද, (එබඳු) ප්‍රතිපදාවක් මා විසින් ශ්‍රාවකයනට දේශනා කරන ලදී. උදායිය, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ කාමයන් ගෙන් – පෙර කී සේ – ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මේ ශරීරයම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ගලා බස්වයි. – ගලා බසින ලෙස සලස්වයි. හාත්පසින් ගලාබස්වයි. හාත්පසින් පුරවයි. හාත්පසින් පතුරුවයි. (ප්‍රීතියත් සුඛයත් ශරීරය සැම තැනම පැතිරේය යන අදහසයි.) සියලු ශරීරයේ විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො වූ තැනක් නො මැත්තේය. උදායිය, යම්සේ දක්ෂ වූ නහවන්නෙක් හෝ ඔහුගේ අතවැසියෙක් හෝ ලෝහ තලියෙක නහන සුණු දමා ජලය ඉස ඉස වැගිරෙන තෙක් දිය කරයි. එවිට ඒ නහන සුණු සමූහය මනා සේ සකස් වීමෙන් ජලය කලවම් වී හොඳට වැගිරෙයි. උදායිය එසේම ඒ භික්ෂු තෙමේ ද මේ ශරීරයම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ගලා බස්වයි. හාත්පසින් ගලාබස්වයි. හාත්පසින් ම පුරවයි. හාත්පසින් ම පතුරුවයි.

මුළු ශරීරයේ විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො වූ කිසිදු තැනක් නො මැත - සැම තැන ම ප්‍රීති සුඛය පැතිරී තියේය යන තේරුමයි.

(මේ ප්‍රථම ධ්‍යානයට දක්වූ උපමාවයි)

උදායිය, නැවත ද භික්ෂු තෙමේ විතර්ක විචාර = පෙර මෙනි.- ද්විතීය ධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මේ ශරීරය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් - පෙර මෙනි - උදායිය යම්සේ සිවු දිගින් ම ජලය ගලාගෙන එන උල්පත් නො මැති, වර්ෂා ජලයක් නො වැටෙන, උල්පතකින් ගලාගෙන එන ජලයක් ඇති ජලාශයක් වේද, ඒ ජලාශයෙන් ම උඩම නැඟුනා වූ සීතල ජලයෙන් මුළු ජලාශය ම සීතල ජලයෙන් ගලාබසින්නේ නම් හාත්පසින් ම ගලාබසින්නේ නම් හාත්පසින් ම පිරෙන්නේ නම් හාත්පසින් ම ශීතල ජලය පැතුරුණේ නම්, ඒ මුළු ජලාශයේ ශීතල ජලයෙන් ස්පර්ශ නො වූ තැනක් නම් නැත්තේය. (උල්පතින් නැඟුනු ශීතල ජලය මුළු ජලාශය ම පැතිරී පවතී යනු අදහසයි. වර්ෂාව නො පවතින කාලයක එක් උල්පතකින් අවුත් පිරෙන ජලාශයක් ගැනය මෙහිදී කියවෙනුයේ) උදායිය, එසේම ද්විතීය ධ්‍යානයෙන් යුත් භික්ෂු තෙමේ මේ ශරීරය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ගලාබස්වයි. හාත්පසින් ගලාබස්වයි. හාත්පසින් ම පුරවයි. හාත්පසින් ම පතුරුවයි.

(මේ ද්විතීය ධ්‍යානයට දක්වූ උපමාවයි)

උදායිය, නැවත ද භික්ෂු තෙමේ ප්‍රීතියෙන් ද අත් වූ - පෙර මෙනි - තෘතීය ධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මේ ශරීරය ම ප්‍රීතියක් නැති සුඛයෙන් ගලාබස්වයි - පෙර මෙනි - මුළු ශරීරයෙහි ප්‍රීතියක් නැති සුඛයෙන් ස්පර්ශ නො වූ තැනක් නැත. උදායිය, යම්සේ මානෙල් විලෙක හෝ නෙළුම් විලෙක හෝ සුදු නෙළුම් විලෙක හෝ හටගත්තාවූ මානෙල් මල් හෝ නෙළුම් මල් හෝ සුදු නෙළුම් මල් හෝ අතුරෙන් ඇතැම් මල් ජලයෙන් මතුවට නො නැඟී, ජලය ඇතුලෙහි ම වැඩෙයි ද, ඒ සියලු මල් මුල සිට අග තෙක් සැම තැන ම සීතල ජලයෙන් ගලාබසියි. හාත්පසින් වැගිරෙයි. හාත්පසින් ශීතල ජලය පිරී පැතිරී ඇත. එසේම උදායිය, භික්ෂු තෙමේ මේ ශරීරය ම ප්‍රීතියක් නැති සුඛ

යෙන් ගලාබස්වයි. හාත්පසින් ගලාබස්වයි. පුරවයි. පතුරුවයි. ප්‍රීතියක් නැති සුඛයෙන් ශරීරයෙහි ස්පර්ශ නො වූ තැනක් නො මැත.

(මේ තෘතීය ධ්‍යානයට දක්වූ උපමාවයි)

උදායිය, නැවත ද භික්ෂු තෙමේ සුඛය ද හැර - පෙර මෙන්- චතුර්ථ ධ්‍යානයට සමවැද වෙසෙයි. හේ මේ ශරීරය ම පිරිසුදු වූ පිරිසිදු කළ සිතින් පතුරුවා හුන්නේ වෙයි. පිරිසුදු වූ පිරිසුදු කළ සිතෙන් ශරීරයෙහි ස්පර්ශ නො වූ තැනක් නො මැත. උදායිය, යම්සේ පුරුෂයෙක් සුදු වස්ත්‍රයකින් හිස සිට පෙරවා ගෙන හුන්නේ වෙයිද, ඔහුගේ සිරුරේ සුදු වස්ත්‍රයෙන් නො වැසුණු තැනක් නොමැත්තේ වෙයිද, එසේම භික්ෂු තෙමේද, පිරිසුදු වූ පිරිසුදු කළ සිතින් මුළු ශරීරය ම පතුරුවා හුන්නේ වෙයි. ශරීරයේ පිරිසුදු වූ පිරිසිදු කළ සිතින් ස්පර්ශ නො වූ තැනක් නොමැත.

(මේ චතුර්ථ ධ්‍යානයට දක්වූ උපමාවයි)

මේ ධ්‍යාන සතර වනාහි මගේ ශ්‍රාවකයෝ බොහෝ දෙනෙක් දක්‍ෂ කෙළවරට පැමිණ වාසය කරත්.

# 13 වැනි පරිච්ඡේදය.

පටිසම්භිදා මග්ගයෙහි දක්වෙන, සමාධිභාවනාමය ඥාණයම අයත් විස්තර:

"කෙසේ නම් සංවර වී සිත එකග කිරීමේ ප්‍රඥාව සමාධි භාවනාමය ඥාණය නම් වේද? එක් සමාධියකි. සමාධි දෙකකි. ලෞකික ලෝකෝත්තර සමාධි -පෙ-"

මෙසේ සමාධිය පිළිබඳ එකකාදී ක්‍රමයෙන් සමාධි පස් පණසක් පටිසම්භිදාමග්ගයෙහි දක්වෙයි. එසේම සමාධියෙහි අට - තේරුම් - පස් විස්සක් ද එහි ඇත. ප්‍රභෙද අතුරෙන් ප්‍රථම යෙන් නො දක්වූ ප්‍රභෙද පමණක් මෙහිලා දක්වේ.

සමාධිය සත් වැදෑරුම්ය.

සමාධියෙහි දක්‍ෂ බව, සමාධියට සමවැදීමේ දක්‍ෂ බව, සමාධිය පැවැත්මෙහි දක්‍ෂබව, සමාධියෙන් නැගිටීමේ දක්‍ෂබව, සමාධියගේ යහපත් බවෙහි දක්‍ෂබව, සමාධියේ ආරම්මණයන්හි දක්‍ෂබව, සමාධිය එළවීමෙහි දක්‍ෂබව, යනුයි.

නොයෙක් බෙදුම් ඇති සමාධියෙහි "මේ සමාධිය මේබඳුය මේ සමාධිය මේබඳුය," යනාදී වශයෙන් ඒ ඒ සමාධියෙහි අයුරු දැනගැනීමේ දක්‍ෂබව සමාධියෙහි දක්‍ෂ බවයි. සමාධියට සමවැදීමේ දක්‍ෂ බව නම් උපදවාගත් සමාධියට සමවැදීමේ දක්‍ෂභාවයයි. එනම් ආවජ්ජනවසිතාවයයි. සමවැදුනු කල්හි කැමතිතාක් කල් පවත්වා ඉක්බිති සිතාගත් වේලාවට නැගිටීමේ දක්‍ෂබව, එනම් වුට්ඨානවසීතා, සමාධියෙන් නැගිටීමේ දක්‍ෂ බව නම්.

සමාධියෙහි යහපත් බවෙහි දක්‍ෂකම: "සමාධිස්ස කල්ලතා කුසලතා" මෙහි කල්ලතා යනු නො ගිලන් බවයි. "අරොග භාවො කල්ලතා" යනයෙහි අකල්ලයැයි ඇයේ ගිලනා සඳහායි. "නාහං භන්තෙ අකල්ලකො," ස්වාමීනි, මම ගිලනෙක් නො වෙමි. යනු උදාහරණයි. සමාධියෙහි නො ගිලන් බව නම් කෙලෙස් නො මැතිකමයි. කෙලෙස් සහිත පුද්ගලයා රාගයෙන් ගිලන් වෙයි. ද්වෙෂ, මෝහාදියෙන් ගිලන් වෙයි, සමවැදීම වශයෙන් සමාධිය පුරුදු කරගත් කල්හි කෙලෙස් ඉතා ඈත්වෙ

එහෙයින් කෙලෙස් වලින් ගිලන් කමක් හට නොගනියි. අනිකුදු තේරුමක් ඇත. "කල්ලතානි කම්මඤ්ඤතා" කල්ල බව යනු කර්මණ්‍ය - වැඩට සුදුසු - භාවයයි එහෙයින් සමාධිය කර්මණ්‍ය කර හැකීමේ දක්‍ෂකම ද සමාධියේ ප්‍රභේදයකි. එය තුදුස් (14) ආකාරයකින් පවතී.

1. කසිණානුලෝමතො: ආකාස, ආලෝක, කසිණ දෙක හැර ඉතිරි කසිණ අටෙහි ම අෂ්ටසමාපත්ති උපදවා, ඉක්බිති පඨවි කසිණයේ සිට ඕදාත කසිණය තෙක් පිළිවෙලින් ධ්‍යාන යන්ට සමවැදීම් වශයෙන් කර්මණ්‍ය කරගැනීම.

2. කසිණපටිලෝමතො: ඕදාත කසිණයේ සිට පඨවි කසිණය තෙක් පිළිවෙලින් ආපසු ධ්‍යානයන්ට සමවැදීම් වශයෙන් කර්මණ්‍ය කරගැනීම.

3. කසිණානුලෝම පටිලෝමතො: ඒ දෙයුරින්ම කර්මණ්‍ය කරගැනීම.

4. ඣානානුලෝමතො: ප්‍රථම ධ්‍යානයේ සිට නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය තෙක් පිළිවෙලින් සමවැදීමෙන් කර්මණ්‍ය කර ගැනීම.

5. ඣානපටිලෝමතො: නෙවසඤ්ඤානාසඤ්ඤායතනයේ සිට ප්‍රථම ධ්‍යානය තෙක් පිළිවෙලින් ආපසු සමවැදීමෙන් කර්මණ්‍ය කරගැනීම.

6. ඣානානුලෝම පටිලෝමතො; ඒ දෙයුරින්ම-

7. ඣානුක්කන්තිකතො: පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යාන-ය ද, තෘතීය ධ්‍යානය ද, ඉක්බිති පඨවි කසිණාලෝකයම උගුළුවා ආකාසානඤ්චායතනය ද, ආකිඤ්චඤ්ඤායතනය ද, මෙසේ කසිණය නො ඉක්ම ධ්‍යාන ඉක්මවීම් වශයෙන් සමවැදීමෙන් කර්මණ්‍ය කර ගැනීම.

8. කසිණුක්කන්තිකතො: පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යාන යට සමවැද, ආපො කසිණය හැර, තෙජො කසිණයෙන් ද ප්‍රථම ධ්‍යානයට සමවැද, මේ ක්‍රමයෙන් කසිණ එකක් හැර එකකට සමවැදීම් වශයෙන් කර්මණ්‍ය කර ගැනීම.

9. ඣානකසිණුක්කන්තිකතො: පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට සමවැද, ආපො කසිණය හැර තෙජො කසිණයෙන්

ද්විතීය ධ්‍යානය හැර තෘතීය ධ්‍යානයට සමවැද, මෙසේ කසිණ ධ්‍යාන දෙකම ඉක්මවීම් වශයෙන් සමවැදීමෙන් කර්මණ්‍ය කර ගැනීම.

10. අඞ්ගසඞ්කන්තිකතො: එක කසිණයකින් ප්‍රථම ධ්‍යානාදි ධ්‍යානයන්ට සමවැදීමෙන් අඞ්ග ඉක්මවීම් වශයෙන් කර්මණ්‍ය කර ගැනීම.

11. ආරම්මණ සඞ්කන්තිකතො: එක කසිණයකින් ප්‍රථම ධ්‍යානයට සමවැද, අනික් කසිණයකිනුදු ප්‍රථම ධ්‍යානයට සම වැදීම් වශයෙන් එකම ධ්‍යානය අරමුණු ඉක්මවා සමවැදීමෙන් කර්මණ්‍ය කර ගැනීම.

12. අඞ්ග, ආරම්මණ සඞ්කන්තිකතො: පෙර කී දෙය පුරින්ම.

13. අඞ්ගවවත්ථානතො: ඒ ඒ ධ්‍යානයට මේ මේ අඞ්ග පවතීයයි ව්‍යවස්ථාපනය -නිර්ණය- කිරීම් වශයෙන් පැවතීමෙන් කර්මණ්‍ය කර ගැනීම.

14. ආරම්මණවවත්ථාපනතො: පඨවි කසිණය, අපො කසිණය ආදී වශයෙන් අරමුණු ව්‍යවස්ථාපනය කිරීමෙන් කර් මණ්‍ය කර ගැනීම.

මෙසේ තුදුස් ක්‍රමයෙන් ධ්‍යාන කර්මණ්‍ය කරගත් කල්හි එම සමාධිය "කල්ලතා කුසලතා" නීරෝගී බවෙහි දක්ෂකම නමි.

සමාධියට ගෝචර වූ කසිණාදි ආරම්මණයන් කෙරෙහි ඒ ඒ ධ්‍යානයට සමවැදීම කැමති ඇති බැවින් කැමති ආරම්මණයක් ආවර්ජනා කිරීමෙහි දක්ෂ බව; සමාධියෙහි ආරම්මණයන් කෙරෙහි දක්ෂ බව නමි.

යට යට සමාධි මතු මතු සමාධීන් කෙරෙහි එලවීමට ඒ සඳහා නැඹුරු කිරීමට දක්ෂකම, එසේම විදර්ශනා - අභිඥාදියට පවා හැරවීමට දක්ෂකම්, සමාධිය එලවීමෙහි දක්ෂකම නමි. මෙසේ සමාධිය සත් වැදෑරුම්ය.

**සමාධිය නව වැදෑරුම්ය.**

රූපාවචර වූ හීන, මධ්‍යම, ප්‍රණීත, සමාධි; අරූපාවචර වූ හීන, මධ්‍යම, ප්‍රණීත, සමාධි; සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත, සමාධි යනුයි.

ඡන්ද, චිත්ත විරිය, මීමංස, සෘඬිපාද - සෘද්ධිය ලැබීමට හේතුවන කරුණු - සතරෙකි. මේ ධර්ම සතරෙහි ලාමක පැවැත්ම අඩුවෙන් පැවතීම - නිසා හීන සමාධි වෙයි. සමාන පැවතුම නිසා මධ්‍යම සමාධි වෙයි. උසස්ව පැවතුම නිසා ප්‍රණීත සමාධි වෙයි. රූපාරූප වශයෙන් සයයි

vii සුඤ්ඤත සමාධි: සියලු සංස්කාර ධර්ම අනිත්‍යා දුඃඛ අනාත්ම, වශයෙන් විදර්ශනා කරන්නහුගේ අනාත්ම දර්ශනයෙන් මාර්ගය උපන් කල්හි එහි යෙදුනා වූ සමාධිය ආත්ම සංඥාවෙන් වෙන් වූ සංස්කාර ධර්මයන් කෙරෙහි ශූන්‍ය - හිස් - වශයෙන් පවතින හෙයින් සුඤ්ඤත නම්. මේ සුඤ්ඤත සමාධියයි.

viii අනිමිත්ත සමාධි: අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරන කල්හි අනිත්‍ය ලක්ෂණයට අනුව මාර්ගය ඉපදීමෙන් එහි යෙදුනාවූ සමාධිය අනිමිත්ත සමාධි නම්.

ix අප්පණිහිත සමාධි: දුඃඛ ලක්ෂණයෙන් මාර්ගය ඉපදීමෙන් එහි යෙදුනා වූ සමාධිය අප්පණිහිත සමාධියි. දුක්ය යන හැඟීම නිසා පැතීමක් නැත. එහෙයින් අප්පණිහිතය. ප්‍රාර්ථනා නොමැතිය.

මෙසේ සමාධිය නව වැදෑරුම් වෙයි.

**සමාධිය පිළිබඳ අර්ථ - තේරුම් - ෂඩ්විස්සෙකි.**

සමාධිය යම් ස්වභාවයන් ගෙන් යුක්ත ද, ඒ ස්වභාවයන්හි පිහිටීම අර්ථ නම්. එවැනි ස්වභාවයන් විසි පහක් සමාධිය සඳහා යෙදේ.

1 පරිග්ගහට්ඨෙන පරිවාරට්ඨෙන සමාධි:

සමාධි වූ එකග්ගතා චෛතසිකය ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, සමෘති, සමාධි, ප්‍රඥා, මන ඉන්ද්‍රිය ධර්මයන්ගෙන් වටකොට, පිරිවරා, සිටින - ඇති - තේරුමින් සමාධි නම්. ඒ ඉන්ද්‍රිය ධර්ම ද ඔවුනොවුන් පිරිවර කොට පවතියි.

2 පරිපූරට්ඨෙන සමාධි: හැම අයුරින්ම ඒ ඉන්ද්‍රිය ධර්ම දියුණු වී පිරුණු බැවින් සමාධියි.

3 එකග්ගට්ඨෙන සමාධි: එකම අරමුණෙක් පවත්නා බැවින් සමාධි නම්,

4 අවික්ඛෙපට්ඨෙන සමාධි: නො විසිරී ඇති බැවින් සමාධියි.

5 අවිසාරට්ඨෙන සමාධි: නොපැතිරී, කැටිව ඇති බැවින් සමාධියි.

6 අනාවිලට්ඨෙන සමාධි: කෙලෙස් වලින් නො කැලඹුණු -

7 අනිඤ්ජනට්ඨෙන සමාධි: නොසෙල්වීම් අර්ථයෙන් සමාධිය.

8 විමුත්තට්ඨෙන සමාධි: කෙලෙසුන්ගෙන් මිදීම් අර්ථයෙන්-

9 එකත්තුපට්ඨාන වසෙන චිත්තස්ස ඨිතත්තා සමාධි: එක් අරමුණක බොහෝ සෙයින් සිත පිහිටීම් අර්ථයෙන් සමාධි නම්.

10 සමං එසතීති සමාධි: සමං බවට පැමිණි අර්පණාව සොයා නුයි සමාධිය අර්පණාවට සමාධියි කියනුයේ විරුද්ධ කෙලෙස් වලින් නිදහස්ව සමතත්වයට පත්වන හෙයිනි.

11 විසමං නෙසතීති සමාධි: අර්පණාවට විසම වූ විරුඬ ධම් යන් නො සොයානුයි සමාධි නම්.

12 සමං එසිතත්තා සමාධි: අර්පණා සෙවූ බැවින් සමාධිය.

13 විසමං නෙසිතත්තා සමාධි: විරුද්ධ ධම්යන් නොසෙවූ බැවින්

14 සමං ආදියතීති සමාධි: අර්පණාව ගනීනුයි සමාධියි.

15 විසමං නාදියතීති සමාධි: විරුද්ධ ධම්යන් නොගනීනුයි.-

16 සමං ආදිතත්තා, 17 විසමං අනාදිතත්තා, 18 සමං පටිපජ්ජති, විසමං න පටිපජ්ජති, 20 සමං පටිපන්නත්තා,

21 විසමං න පටිපන්නත්තා, සමාධි.

අර්පණා - විරුද්ධ ධම්යන් ගත් බැවින්, නොගත් බැවින්, පිළිපදියි, නොපිළිපදියි. පිළිපන් බැවින්, නොපිළිපන් බැවින් සමාධි නම්.

22 සමං ඣායතීති සමාධි: සමව දවානුයි සමාධියි.

23 විසමං ඣාපෙතීති සමාධි: විරුද්ධ ධම්යන් දවා හරීනුයි-

24 සමං ඣාපිතත්තා සමාධි: සමව දූවූ බැවින් සමාධියි.

25 විසමං ඣාපිතත්තා සමාධි: විරුද්ධ ධම්යන් දවා හැරි බැවින් සමාධි නම්.

''මෙසේ සමාධියගේ අර්ථයෝ පස් විස්සකි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් සංවරවී සමාධි වැඩීමේ ප්‍රඥාව සමාධි භාවනාමය ඥාණ යයි. කියනු ලැබේ.'' - ප. සිං. ප.

## සමාධි භාවනා සූත්‍රය.

අ. නි. (ච. නි. රොහිතස්ස වග්ග)

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච;-

චතස්සො ඉමා භික්ඛවෙ සමාධි භාවනා, කතමා චතස්සො? අත්ථි භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති. අත්ථි භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා ඤාණදස්සන පටිලාභාය සංවත්තති. අත්ථි භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා සතිසම්පජඤ්ඤාය සංවත්තති, අත්ථි භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති.

### සමාධි භාවනා සතර

1 දිට්ඨධම්මසුඛ විහරණය පිණිස පවතින සමාධි භාවනා

2 ඤාණදස්සන පටිලාභය පිණිස පවතින සමාධි භාවනා

3 සතිසම්පජඤ්ඤය පිණිස පවතින සමාධි භාවනා

4 ආසවක්ඛය පිණිස පවතින සමාධි භාවනා

"කතමා ච භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති"

ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන සතරට පැමිණ වාසය කිරීම., දිට්ඨධම්මසුඛවිහරණය – මෙලොව සැපසේ විසීම – සඳහා පවතින සමාධි භාවනා නම්.

කතමා ච භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා ඤාණදස්සනපටිලාභාය සංවත්තති? ඉධ භික්ඛවෙ භික්ඛු ආලොකසඤ්ඤං මනසිකරොති, දිවා සඤ්ඤං අධිට්ඨාති, යථා දිවා තථා රත්තිං, යථා රත්තිං තථා දිවා, : ඉති විවටෙන, චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං

භාවෙති. අයං භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා ඤාණදස්සන පටිලාභාය සංවත්තති.

ධ්‍යාන උපදවා ගත් භික්ෂු තෙමේ ධ්‍යානයෙන් නැගිට ආලෝක සඤ්ඥාව - ආලෝක කසිණයෙන් උපදවා ගත් පැහැදිලි ගතිය - මෙනෙහි කරයි. මධ්‍යාහ්න - ඉර මුදුන් - වේලාවය යන හැඟීම ඉටයි. දිවා රෑ දෙකම එකසේ වැටහෙන පරිද්දෙන් මෙනෙහි කරයි. මෙසේ විවෘත වූ නො වෙලන ලද - සම්පූර්ණ පිරිසිදු වූ - සිතින් ආලෝක සහිත සිත වඩයි. මේ ඥාන දර්ශන ප්‍රතිලාභය පිණිස පවතින සමාධි භාවනායි.

ඥාන දර්ශන යනු දුඃඛාදී ආර්‍ය සත්‍යයන් දොළොස් ආකාරයෙන් දක්නා වූ නුවණයි (ධම්මචක්කප්පවත්තන සූත්‍රය බලන්න) කසිණ භාවනාවන්ගේ ඇති ශ්‍රේෂ්ඨ භාවය වැටහෙන්නේ මෙවැනි තැන් දක්නා කල්හිය.

“කතමා ච භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා සතිසම්පජඤ්ඤාය සංවත්තති? ඉධ භික්ඛවෙ භික්ඛුනො විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති, විදිතා විතක්කා උප්පජ්ජන්ති විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති; අයං භික්ඛවෙ සමාධි භාවිතා බහුලීකතා සතිසම්පජඤ්ඤාය සංවත්තති”

ධ්‍යාන ලැබූ යෝගී භික්ෂුවට (ධ්‍යානයෙන් නැගී බලන්නම) සිතෙහි පවත්නා වූ වේදනාවෝ ප්‍රකටව - හොඳට දැන ගෙනම - උපදිත්. ප්‍රකටවම වැටහෙත්. ප්‍රකටවම විනාශයට යත්. සංඥාවෝද විතර්කයෝ ද එසේම උපදිත්. වැටහෙත්. විනාශයට යත්. මේ සිහි නුවණ සඳහා පවතින සමාධි භාවනාවයි.

ධ්‍යානයෙන් නැගිට බලන නිසා වේදනා, සංඥා හා විතර්ක, යන නාමයන්ගෙන් ආ සංඛාර, මේ තෙවැදෑරුම් නාමස්කන්ධ සඳහන් විය. එසේ නමුදු ඒ භික්ෂුවට පවතින්නා වූ විඥාන නාමස්කන්ධය ද නො වැටහෙන්නේ නොවේ. එසේම රූපස්කන්ධයාගේ ඉපදීම, පැවතීම, විනාශය, යන අවස්ථා තුනද වැටහෙයි. ප්‍රකට යන්නෙන් පැවතීම කියැවේ.

“කතමා ච භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති? ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චුපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති ඉති රූපං ඉති

රූපස්ස සමුදයො ඉති රූපස්ස අත්ථඞ්ගමො. ඉති වෙදනා ඉති වෙදනාය සමුදයො ඉති වෙදනාය අත්ථඞ්ගමො, ඉති සඤ්ඤා, ඉති සඤ්ඤාය සමුදයො ඉති සඤ්ඤාය අත්ථඞ්ගමො ඉති සංඛාරා ඉති සංඛාරානං සමුදයො ඉති සංඛාරානං අත්ථඞ්ගමො, ඉති විඤ්ඤාණං ඉති විඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමො අයං භික්ඛවෙ සමාධි භාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති”

ධ්‍යානලාභී භික්ෂු තෙමේ රූපාදී උපාදානස්කන්ධ පඤ්චකයෙහි - පස් කඳෙහි - උදය - වය අනුව බලමින් වෙසෙයි. (ඉපදීම - විනාශය) කෙසේ ද? (සත්මර්ශන රූප සියල්ල පරිග්‍රහ කොට - විදසුන් නුවණට අසුවන රූප සොයා) මේ රූපයයි. (කර්ම චිත්තාදී ප්‍රත්‍යයන් සොයා ගෙන) මේ රූපයාගේ ඉපදීමයි. (ඒ හේතූන්ගේ විනාශය සොයා ගෙන) මේ රූපයාගේ විනාශයයි. මේ වේදනාවයි. මේ වේදනාවගේ ඉපදීමයි. මේ වේදනාවගේ විනාශයයි. මෙසේ සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, මේවා ද බලයි. මේ ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස පවත්නා සමාධි භාවනාවයි.

මෙසේ සමාධි භාවනා සතරෙකි.

අවසානය

“ඉදඤ්ච පන මෙතං භික්ඛවෙ සන්ධාය භාසිතං පාරායනෙ පුණ්ණක පඤ්හෙ:=

“සංඛාය ලොකස්මිං පරෝවරානි
යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ
සන්තො විධූමො අනීඝො නිරාසො
අතාරි සො ජාති ජරං බ්‍රූමීති”

මහණෙනි, මා විසින් මේ සමාධි භාවනාව සඳහා පාරායනයෙහි පුණ්ණක ප්‍රශ්නයෙහි මෙය දේශනා කරන ලදී. ආධ්‍යාත්මික ලෝක නම් වූ ජීවිතයෙහි උස්-පහත් ධර්ම නුවණින් දැන, යමෙකුට ඒ ලෝකයෙහි කිසිදු තැනක කෙලෙස් වලින් අල්ලා ගැනීම් වශයෙන් සෙලවීමක් නැද්ද? එවැනි ශාන්ත වූ, කෙලෙස් දුම් පටල විනාශ කළ, දුක් නැති, ආශාව ද නැති, තැනැත්තේ ජාති ජරා ඉක්ම සිටියේයයි (මම) කියමි.

මේ සූත්‍රය වටහා ගැනීමට පහසුවීම සඳහා කොටසින් කොටස දක්වීමි. කැමැත්තෝ සංග්‍රහ - ගොනු කර ගනිත්වා !

සමාධි භාවනාමය ඥානය තේරුම් ගැනීමට මෙම සූත්‍රය අතිශයින්ම උපකාරී වේ. එසේම භාවනා කර, දියුණුවක් නොලබා අතර මං වී සිටින විදර්ශනා යෝගීන්ට ද මහගු අනුශාසනයකි. සමථය නොමැතිව හුදු විදර්ශනාවම වඩා මාර්ග - ඵල ඉපදවීමට උත්සාහ ගන්නා වූ අත්තනෝමතික යෝගීහු මේ තථාගත දේශනය ගැන විමසා බැලීම සුදුසුය.

## විදර්ශනා යෝගීන් සඳහා සූත්‍රයක්.

"චත්තාරො මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ චත්තාරො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී හොති, අජ්ඣත්තං චෙතො සමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය, ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභී හොති අධිපඤ්ඤාධම්මවිපස්සනාය, න ලාභී අජ්ඣත්තං චෙතො සමථස්ස. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො නෙවලාභීහොති අජ්ඣත්තං චෙතො සමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය; ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ලාභීචෙව හොති අජ්ඣත්තං චෙතො සමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය"- අ. නි. (ච. නි. අසුර වග්ග)

මහණෙනි, ලෝකයෙහි මේ පුද්ගලයෝ සතර දෙනෙක් විද්‍යමාන වෙත්. දක්නට සිටිත්. කවර නම් සතර දෙනෙක් ද? මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් (යෝගියෙක්) චිත්ත සමාධිය - සමථ භාවනාවෙන් උපදවා ගත් අර්පණාව - තම සිතෙහි උපදවා ගැනීම් වශයෙන් ලාභියෙක් වෙයි. අධිප්‍රඥා විදර්ශනා ලාභියෙක් නොවෙයි. ඇතැම් පුද්ගලයෙක් අධි ප්‍රඥා ධර්ම විදර්ශනාලාභියෙක් වෙයි. ඇතැම් පුද්ගලයෙක් ඒ දෙකම ලාභියෙක් නොවෙයි. ඇතැම් පුද්ගලයෙක් චිත්ත සමාධි, අධිප්‍රඥා ධර්ම විදර්ශනා, දෙකම ලාභියෙක් වෙයි.

මෙහි "අධිපඤ්ඤාධම්මවිපස්සනා" යනු සංස්කාර ධර්මයන්ගේ භඞ්ගය දක්නාවූ ඥානයයි. ජීවිතයක පවත්නා රූපාදී ඒ ඒ කොටස් විනාශ වන අයුරු බලන නුවණට මේ නමකි. "සංඛාරානං භඞ්ගං පස්සිත්වා පස්සිත්වා අනිච්චාදිතො විපස්සන්තස්ස සංඛාරාව භිජ්ජන්ති සංඛාරානං මරණං න අඤ්ඤං කොචි අත්ථීති භඞ්ගවසෙන සුඤ්ඤතං ගහෙත්වා පවත්තා විපස්සනා, සාව අධිපඤ්ඤා ධම්මෙසු ච විපස්සනාති කත්වා අධිපඤ්ඤා ධම්මවිපස්සනාති වුච්චති" - ප. ම. අ. සංස්කාරයන්ගේ විනාශය බලමින් අනිත්‍යාදි වශයෙන්

විදර්ශනා කරන්නහුගේ "සංස්කාරයෝම බිඳෙත්. සංස්කාරයන්ගේ මරණය. අනික් කිසිවක් නැතැ" යි විනාශ වශයෙන් ශූන්‍ය සිස් - බව ගෙන පවත්නා වූ විදර්ශනාව අධිපඤ්ඤා නම්. ඒ නුවණම ධර්මයන් කෙරෙහි විදර්ශනා කෙරේයයි ගෙන "අධිපඤ්ඤාධම්මවිපස්සනා" යයි කියනු ලැබේ.

## අධිපඤ්ඤා ධම්මවිපස්සනා නොමැත්තහු විසින් පිළිපැදිය යුතු අයුරු.

"තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො ලාභී හොති අජ්ඣත්තං චෙතො සමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය. තෙන භික්ඛවෙ පුග්ගලෙන අජ්ඣත්තං චෙතො සමථෙ පතිට්ඨාය අධිපඤ්ඤාධම්මවිපස්සනාය යොගො කරණීයො, සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතො සමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය"

මහණෙනි ඒ පුද්ගලයන් කෙරෙහි යම් පුද්ගලයෙක් තම සිතෙහි චිත්ත සමාධිය ලබන්නෙක් වූයේ අධිපඤ්ඤාධම්මවිපස්සනා නොලබන්නෙක් වූයේ වේසිද ඒ පුද්ගලයා විසින් චිත්ත සමාධියෙහි පිහිටා, අධිපඤ්ඤා ධම්මවිපස්සනාව සඳහා භාවනා කළ යුතුයි හේ පසු කලෙක චිත්ත සමාධිය, අධිපඤ්ඤාධම්ම විපස්සනා, දෙකම ලාභියෙක් වෙයි.

## චිත්ත සමාධිය නොමැත්තහු විසින් පිළිපැදියයුතු අයුරු:

"තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො ලාභී අධිපඤ්ඤාධම්ම විපස්සනාය, න ලාභී අජ්ඣත්තං චෙතො සමථස්ස තෙන භික්ඛවෙ පුග්ගලෙන අධිපඤ්ඤාධම්මවිපස්සනාය පතිට්ඨාය, අජ්ඣත්තං චෙතො සමථෙ යොගො කරණීයො සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අධිපඤ්ඤාධම්මවිපස්සනාය, ලාභී ච අජ්ඣත්තං චෙතො සමථස්ස"

මහණෙනි, ඒ පුද්ගලයන් අතුරෙහි යම් පුද්ගලයෙක් අධිපඤ්ඤාධම්මවිපස්සනා ලාභියෙක් වූයේ චිත්ත සමාධි ලාභියෙක් නො වූයේ ද, ඔහු විසින් අධිපඤ්ඤාධම්මවිපස්සනාවෙහි පිහිටා, චිත්ත සමාධිය පිණිස භාවනා කළ යුතුයි. හේ පසු කලෙක අධිපඤ්ඤාධම්මවිපස්සනා, චිත්ත සමාධි, භාවනා ලාභියෙක් වෙයි.

## චිත්තසමාධියත් අධිපඤ්ඤාධම්මවිපස්සනාවත් දෙකම නොමැත්තහු විසින් පිළිපැදිය යුතු අයුරු:

“තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො නෙව ලාභී අජ්ඣත්තං චෙතො සමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්ම විපස්සනාය, තෙන භික්ඛවෙ පුග්ගලෙන තෙසං යෙව කුසලානං ධම්මානං පටිලාභාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං. සෙය්‍යථාපි භික්ඛවෙ ආදිත්ත චෙලොවා ආදිත්තසීසො වා තස්ස තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ තෙන පුග්ගලෙන -පෙ- කරණීයං. සො අපරෙන සමයෙන ලාභීචෙව හොති අජ්ඣත්තං චෙතො සමථස්ස, ලාභී ච අධිපඤ්ඤා ධම්මවිපස්සනාය”

මහණෙනි, ඒ පුද්ගලයන් අතුරෙන් යම් පුද්ගලයෙක් චිත්ත සමාධියත් අධිපඤ්ඤාධම්මවිපස්සනාවත් ලාභියෙක් නො වූයේද, ඔහු විසින් ඒ කුශල ධර්මයන්ගේම ලැබීම පිණිස අධික වූ ඡන්දයක් - කැමැත්ත - ව්‍යායාමයක් ද, මහන්සියක් ද උත්සාහයක් ද අධික උත්සාහයක් ද නොනවතින්නාවූ වීර්‍ය්‍යයක් ද, සිහියක් ද, නුවණක් ද, යෙදිය යුතුය. මහණෙනි, දැවෙන හැඳි වස්ත්‍ර ඇතියෙක් හෝ දැවෙන හිස ඇතියෙක් හෝ ඒ වස්ත්‍රය හෝ ඒ හිස හෝ නිවා ගැනීම පිණිස අධික වූ - ඉතාමත් - ඡන්දයද, ව්‍යායාමයද, උත්සාහයද' අධික උත්සාහයද, නොපසු බට වීර්‍ය්‍යය ද, සිහිය ද, නුවණ ද, යොදවන්නේ යම්සේ ද, එසේම චිත්ත සමාධියත් අධිපඤ්ඤාධම්මවිපස්සනාවත් නො මැත්තහු විසින් කුශල ධර්මයන්ගේ ලැබුම සඳහා අධික ඡන්දය - පෙරමෙනි - නුවණ යෙදිය යුතුය.

## චිත්ත සමාධි අධිපඤ්ඤාධම්මවිපස්සනා, දෙකම ඇතියහු විසින් පිළිපැදිය යුතු අයුරු:

“තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො ලාභීචෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය. තෙන භික්ඛවෙ පුග්ගලෙන තෙසු යෙව කුසලෙසු ධම්මෙසු පතිට්ඨාය උත්තරිං ආසවානං ඛයාය යොගො කරණීයො”

මහණෙනි, ඒ පුද්ගලයන් අතුරෙන් යම් පුද්ගලයෙක් චිත්ත සමාධියද අධිප්‍රඥාධම්මවිපස්සනාව ද ලාභියෙක් වූයේ වෙයිද, ඔහු විසින් ඒ කුශල ධර්මයන්හිම පිහිටා මත්තෙහි ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස = රහත්වීමට - භාවනා කළ යුතුයි.

"ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං" මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් (ශාසනයෙහි) ලෝකයෙහි විද්‍යමාන වෙත්.

මේ සූත්‍රය සමථ යානිකයාට ද, විපස්සනා යානිකයාට ද භාවනා නොකරන්නහුට ද, සමථ = විපස්සනා දෙකම පුරුදු කරන්නහුට ද, යන සතර දෙනාටම මහගු අනුශාසනයකි. බුදුරජාණන් වහන්සේ තමන් සමීපයෙහි වැඩ සිටිමින් තමාගේ සවභාවය බලමින් අනුශාසනා කරන්නාක් මෙනි. කම්ස්ථාන ඉගැන්වීමෙහි ලා බුදුරජාණන් වහන්සේට වඩා උතුමෙක් තුන් ලෝකයෙහි නම් නොමැත. එහෙයින් සියලු යෝගාවචර භික්ෂූහු කම්ස්ථාන ඉගැන්වීමෙහිදීද, දියුණු කිරීමෙහිදී ද, මේ 'සමාධි සූත්‍රය,, මුල් ගුරුවරයා ලෙස සලකත්වා!

චිත්ත සමාධිය, අධිප්‍රඥාධම්මපස්සනාව, මෙයින් එකක් හෝ දෙකම හෝ එකක් නමුදු නොමැති හෝ කෙනෙකු විසින් පිළිපැදිය යුතු උපදෙස්:-

"තෙන භික්ඛවෙ පුග්ගලෙන ය්වායං පුග්ගලො ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය. සො උපසංකමිත්වා එවමස්ස වචනීයො, "කථන්නු ඛො ආවුසො සඞ්ඛාරා දට්ඨබ්බා කථං සංඛාරා සම්මසිතබ්බා, කථං සංඛාරා විපස්සිතබ්බා"ති තස්ස සො යථාදිට්ඨං යථා විදිතං ව්‍යාකරොති එවං ඛො ආවුසො සංඛාරා දට්ඨබ්බා, එවං සංඛාරා සම්මසිතබ්බා එවං සංඛාරා විපස්සිතබ්බා"ති සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතො සමථස්ස ලාභී ච අධිපඤ්ඤාධම්ම විපස්සනාය"

මහණෙනි, ඒ චිත්ත සමාධිලාභී පුද්ගලයා විසින් අධිප්‍රඥාධම්මවිපස්සනා ලාභියෙක් වෙත එළඹ, මෙසේ කිවයුතු වන්නේ ය "ඇවැත්නි, සංස්කාරයන් දත යුත්තේ කෙසේ ද? සංස්කාරයන් සන්මර්ශනය කළ යුත්තේ කෙසේ ද? සංස්කාරයන් විදර්ශනා කළ යුත්තේ කෙසේ ද?" කියායි ඒ අධිප්‍රඥාධම්ම විපස්සනා ලාභියා දුටු පරිද්දෙන් ප්‍රකට වූ පරිද්දෙන් ඔහුට පව

සයි. "ඇවැත්නි, සංස්කාරයෝ මෙසේ දත යුත්තාහ. මෙසේ සන්මර්ශනය කළ යුත්තාහ. මෙසේ විදර්ශනා කළ යුත්තාහ." කියායි. ඉක්බිති හේ පසු කලෙක චිත්තසමාධිලාභියෙක් ද අධිපඤ්ඤාධම්මවිපස්සනා ලාභියෙක් ද වෙයි.

"තෙන භික්ඛවෙ පුග්ගලෙන ය්වායං පුග්ගලො ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස, සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො, "කථන්නු ඛො ආවුසො චිත්තං සණ්ඨපෙතබ්බං? කථං චිත්තං සන්නිසාදෙතබ්බං? කථං චිත්තං එකොදි කාතබ්බං? කථං චිත්තං සමාදහෙතබ්බන්ති" තස්ස සො යථා දිට්ඨං යථා විදිතං ව්‍යාකරොති." එවං ඛො ආවුසො චිත්තං සණ්ඨපෙතබ්බං, එවං චිත්තං සන්නිසාදෙතබ්බං, එවං චිත්තං එකොදිකාතබ්බං, එවං චිත්තං සමාදහාතබ්බං" ති සො අපරෙන සමයෙන ලාභීචෙව හොති අධිපඤ්ඤා ධම්මවිපස්සනාය, ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස"

"මහණෙනි, ඒ අධිපඤ්ඤාධම්මවිපස්සනා ලාභියා විසින් චිත්ත සමාධි ලාභියෙක් වෙත එළඹ, මෙසේ කිව යුතුයි. "ඇවැත්නි, සිත මනාලෙස (සමාධියෙහි) තැබිය යුත්තේ කෙසේ ද! සිත සංසිඳුවා ලිය යුත්තේ කෙසේද? සිත එක අරමුණක එකඟ කළ යුත්තේ කෙසේ ද? සිත එක අරමුණක නගාලිය යුත්තේ කෙසේ ද? කියායි. (එවිට) ඒ චිත්ත සමාධිලාභියා දුටු පරිද්දෙත් ප්‍රකට වූ පරිද්දෙත් ඔහුට මෙසේ පවසයි. "ඇවැත්නි මෙසේ සිත මනාලෙස තැබිය යුතු. මෙසේ සංසිඳුවා ලිය යුතු. මෙසේ එකඟ කළයුතු. මෙසේ අරමුණෙහි නගාලිය යුතු" කියායි. ඉක්බිති හේ පසු කලෙක අධිපඤ්ඤාධම්මවිපස්සනා ලාභියෙක් ද, චිත්ත සමාධිල-භියෙක්ද වන්නේය.

තවද, සමථ - විපස්සනා දෙකම නැත්තහු විසින් ඒ දෙකම ලාභියෙක් වෙත ගොස් ඉහත සඳහන් පරිද්දෙන් ඒ භාවනා දෙක ගැනම අසාගත යුතුය. සමථ විපස්සනා දෙකම ලාභියා විසින් නම් මතු - මාර්ග ඵල ඉපදවීම සඳහා යෝග කටයුතුය. එවිට ඒ දෙදෙනාටම සමථ - විපපස්සනා දෙකෙන්ම යුක්ත විය හැකියයි මේ සූත්‍රයෙහි සඳහන් වෙයි.

මේ සමාධි සූත්‍ර ද්වයෙන්ම කියවෙනුයේ සමථ - විදර්ශනා දෙකම ලාභියෙකු විය යුතු බවය. ඒ සඳහාම බුදුරජාණන් වහන්සේ මේ සූත්‍ර දෙක වදාළහ. සමථලාභීත්වයෙන් පමණක් සෑහීමකට පත්වීම ද, විදර්ශනා ලාභීත්වයෙන් පමණක් සෑහීමකට පත්වීම ද, යන අදහස් දෙකම අඩු සහිත බව මෙයින් වටහා ගත යුතුය.

අද විදර්ශනා යෝගීන්ගේ අදහස, තමා දියුණු කරන විදර්ශනාව පමණක් සෑහේය යන්නයි. ඒ සඳහා තර්ක ද කරත්. සමථය වඩන්නවුන් හෙළා දකිත්. සමාධිය ගැන වචනයක් නමුත් කියනවාට ඔවුහු සතුටු නැත. එවැනි උද්දච්ච පුද්ගලයෝ මේ තථාගත දෙශනය දෙස සිත් යොමු කරත්වා !

තවද, බාහියදරු චීරිය රහතන් වහන්සේ වැනි උපඝටිතඥ - ධර්මය වහා අවබෝධ කර ගන්නා-උතුමන් සඳහා කළ දේශනා රූමා දක්වමින් විදර්ශනාවෙන් පමණක් මාර්ග ඵල ඉපදවිය හැකි යයිද ඇතැමෙක් පවසත්. එබඳු අය මෙසේ සැලකිය යුතු. එසේ වහා ධර්මාවබෝධය.උන් වහන්සේලාට ආකස්මිකව - ඉබේ-පහල වූ දෙයක් ද? නැතහොත් ශීල, සමාධි, ප්‍රඥා, යන ත්‍රිවිධ ශික්ෂාවන් අතුරෙන් ශීල - ප්‍රඥා හෝ ප්‍රඥා හෝ පමණක් මර්ග-ඵල ලාභීත්වය නො සෑහේද? ත්‍රිවිධ ශික්ෂාම දෙසූයේ මක්නිසාද? අදත් ඒ වහා ධර්මාවබෝධය තුසුදුසුද? එසේ ලබාගන්නොත් සිටිද්ද? කියායි. ඒ ප්‍රශ්න සඳහා අටතිගාමී නොවී පිළිතුරු සැපයූ වහොත් මෙසේ ප්‍රකාශයට පත්වෙයි, වහාධර්මාවබෝධය සඳහා කල්ප ගනනාවක්ම දානාදී දශ පාරමී, ශීල, සමාධි, ප්‍රඥා, දියුණු වක් කොට තිබිය යුතුය. බුදුරජාණන් වහන්සේ ගේ ශාසනය අනුපූර්ව ප්‍රතිපදා, අනුපූර්ව ශික්ෂාවක්, ඇතියකි. මැඩියෙකුගේ උත්පතනය - පැනීම - මෙන් නොවේ. අනුපිළිවෙලින් ක්‍රමානුකූලව ප්‍රතිපත්ති පුරා පැමිණිය යුක්තකි, ශීලය නොමැතිව සමාධිය නො පිහිටයි. සමාධිය නොමැතිව ප්‍රඥාව නොපිහිටයි එසේම සමාධිමත් පුද්ගලයා නියම සිල්වතා සමාධිමත් පුද්ගලයාය නියම නැණවතා. ඤාණය සුදුසු පරිද්දෙන් යෙදූ පුද්ගලයාය සමාධිමත් සිල්වත් උතුමා. තවද ශීලයෙන් තොරවූ සමාධියක් හෝ ප්‍රඥාවක් හෝ උතුම් නොවෙයි. ප්‍රඥාවෙන් තොර වූ ශීලයක් හෝ සමාධියක් හෝ උතුම් නොවෙයි. මෙසේ ශීල, සමාධි, ප්‍රඥා, යන ධර්මත්‍රය ඔවුනොවුන් නිසාම බැබලෙන බව වටහා ගත යුතු.

"තත්‍රාපි සුදං භගවා භණ්ඩගාමෙ විහරන්තො එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති. ඉති සීලං ,ඉති සමාධි, ඉති පඤ්ඤා, සීලපරිභාවිතො, සමාධි මහප්ඵලො හොති මහානිසංසො, සමාධි පරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා, පඤ්ඤා පරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති. සෙය්‍යථිදං? කාමාසවා භවාසවා දිට්ඨාසවා අවිජ්ජාසවා" ති = දී. නි. (පරිනිබ්බාණ සූත්‍රය)

එකල්හි භාග්‍යවතුන් වහන්සේ භණ්ඩ නම් ගමෙහි වැඩ වෙසෙනුයේ භික්ෂූන්ට මේ ධර්ම කතාව බහුලව කරන සේක. කුමක් ද? ශීලය මෙසේය. සමාධිය මෙසේය. ප්‍රඥාව මෙසේය ශීලයෙන් පරිභාවිත වූ - භාත්පසින්ම වඩන ලද්දා වූ - සමාධිය මහත් ඵලයි මහානිශංසයි. සමාධියෙන් පරිභාවිත වූ ප්‍රඥාව මහත් ඵලයි. මහානිශංසයි. ප්‍රඥාවෙන් පරිභාවිත වූ සිත මනාලෙසම ආශ්‍රවයන්ගෙන් මිදෙයි. ඒ කවරේ ද? කාමාශ්‍රව, භවාශ්‍රව, දෘෂ්ට්‍යාශ්‍රව, අවිද්‍යාශ්‍රව, යනුයි.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට ලංව වැඩ වෙසෙද්දීද තමන් වහන්සේ දෙසූ ශාසන මාර්ගය ශීල, සමාධි, ප්‍රඥා' යන ධර්ම තුනෙන් යුක්ත බවත්, ඒ ධර්ම තුන ඔවුනොවුන් නිසා එක් එක් ධර්මය බැබලෙන බවත් මේ පාඨයෙන් පැහැදිලි කළ සේක. කරුණු මෙසේ හෙයින් යමෙක් ධර්මත්‍රය අතුරෙන් එකකින් හෝ අස්වී නිවන් ලැබීමට බලාපොරොත්තු වෙයි නම් ඔහු ශාසනයෙන් ද බැහැර වූවෙකු බවවටහා ගත යුතුය. මාර්ග ඵල ගැන කුමනකථාද?

මෙතෙකින් ශාන්ති නායක බුදුපියාණන් වහන්සේගේ සමාධි භාවනාමය ඥාණය විස්තර කර අවශානයි.

"නත්ථි ඣානං අපඤ්ඤස්ස - පඤ්ඤා නත්ථි අජ්ඣායතො
යම්හි ඣානඤ්ච පඤ්ඤඤ්ච - සවෙ නිබ්බාණං සන්තිකෙ"

සමාධිය නොමැත්තාට ප්‍රඥාව නැත. ප්‍රඥාව නො මැත්තාට සමාධිය නැත. යමෙකු කෙරෙහි සමාධි, ප්‍රඥා; දෙකම ඇත්නම් හේ නිවණ ලඟය. නැතහොත් නිවණ වහා අවබෝධ කෙරේ.

සමාධි භාවනාමය ඥාණය නිමි.

# 14 වැනි පරිච්ඡේදය

## 4. ධම්මට්ඨිති ඤාණය

“අවිජ්ජා පච්චයා, සංඛාරා පච්චය සමුප්පන්නා උභො පෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චය පරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං” මෙ ධම්මට්ඨිති ඤාණයත්තෙහි විග්‍රහ වාක්‍යය යි ධම්මට්ඨිති ඤාණය යනු කුමක්ද? යනු මේ වැකියෙන් කියැවේ. අවිද්‍යාව ප්‍රත්‍යයයි. සංස්කාරයෝ ප්‍රත්‍ය සමුත්පන්න යෝයි. මේ ධර්ම දෙක ම ප්‍රත්‍ය සමුත්පන්නයෝයයි, මෙසේ ප්‍රත්‍ය පරිග්‍රහ කිරීමේ ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණය යි. ලිහිල් අදහස: නො දැනීම, මෝඩකම, හේතුවයි. (හේතු නාමා) සකස්වූ දේ හේතුන් ගෙන් හටගත් ඒවාය. මේ කරුණු දෙකම හේතුන්ගෙන් හට ගත්තෝය යි, මෙසේ හේතු විමසා බැලීමේ නුවණ ධම්මට්ඨිති ඤාණය නම්. සත්වයා යනු කවරෙක් ද? ඔහු හටගත්තේ කෙසේ ද? මේ ප්‍රශ්න දෙකට නියම පිළිතුර සපයා ගැනීමට උපකාර වන නුවණට මේ නමකි.

### ධම්මට්ඨිති:

ප්‍රත්‍ය-සමුත්‍යසමුත්පන්න ධර්ම විමසීමේ නුවණට ධම්මට්ඨිති යැයි යෙදුනේ කවරක් නිසා ද?

පිළිතුර: මෙහි “ධම්ම” ශබ්දය නෛරුක්තිකයෝ-පද සෑදුනු අයුරු දන්නෝ - අර්ථ - තේරුම් - කීපයෙක්හිලා දක්වත්. “එත්ථ ධම්ම සද්දො තාව සභාව පඤ්ඤා, පුඤ්ඤපඤ්ඤත්ති ආපත්ති පරියත්ති නිස්සත්තතා විකාරගුණ පච්චය පච්චයුප්පන්නාදීසු දිස්සති” මෙහි “ධම්ම” ශබ්දය පළමුකොට සවභාව, ප්‍රඥා, පුණ්‍ය, ප්‍රඥප්ති, ආපත්ති, පර්‍ය්‍යාප්ති, නිස්සත්තතා, විකාර, ගුණ, ප්‍රත්‍ය, ප්‍රත්‍යසමුත්පන්න යනාදියෙහි පෙනේ.

ස්වභාවයෙහි ධම්ම ශබ්දය: "කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා" යනාදී තන්හි දිස්වේ.

ප්‍රඥයෙහි;

'යස්සෙතෙ චතුරො ධම්මා = සද්ධස්ස ඝරමෙසිනො
සච්චං ධම්මො ධිතීචාගො - සවෙ පෙච්ච න සොචති"

සත්‍යය, ප්‍රඥය, ධෛර්‍ය්‍යය, ත්‍යාගය යන මේ ධර්ම සතර ගිහිගෙයි වසන, ශ්‍රද්ධාවත් යමෙකුට ඇත්නම් හේ ඒකාන්තයෙන් පරලොව ශෝක නො කරයි. ඒ ධර්ම සතර නම් ඇත්ත, නුවණ, උත්සාහය, දීම යනුයි. මෙහි ධම්ම ශබ්දය ප්‍රඥයෙහි ආයේය

'නහි ධම්මො අධම්මො ච - උභො, සම විපාකිනො
අධම්මො නිරයං නෙති - ධම්මො පාපෙති සුගතිං"

පින් කළ තැනැත්තා, පව් කළ තැනැත්තා: යන දෙදෙනා සම විපාක විඳින්නෝ නො වෙත්. පව් කළ තැනැත්තා නරකයට පමුණුවයි. පින් කළ තැනැත්තා සුගතියට පැමිණෙයි. මෙහි ධම්ම ශබ්දය පුණ්‍යයෙහි-පින්හි-ආයේය.

"පඤ්ඤත්ති ධම්මා නිරුත්ති ධම්මා අධිවචනා ධම්මා මේ ආදියෙහිය. "පාරාජිකා ධම්මා, සඞ්ඝාදිසෙසා ධම්මා" මේ ආදිය ආපත්තියෙහි දිස්වේ. භික්ඛවෙ" ඉධ භික්ඛු ධම්මං ජානාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං" මෙහි ධම්ම ශබ්ද පර්‍ය්‍යාප්තියෙහි යෙදින. (නවාඞ්ග ශාස්තෘ ශාසනය මෙහි ඇතුලත්වේ.)

"ධම්මෙසු ධම්මානුපස්සී විහරති" ධර්මයන් කෙරෙහි ධර්මයන්ට අනුව බලමින් වෙසෙයි. මේ නිස්සත්තතා - ආත්මවිරහිත භාවයෙහිය.

'ජාති ධම්මා ජරා ධම්මා මරණ ධම්මා" මෙහි ධම්ම ශබ්දය ආයේ විකාරයෙහිය, එනම් වෙනස් වීමෙහිය. "ඡන්නං බුද්ධ ධම්මානං" සවැනි බුදුගුණයේ මෙහි ගුණයෙහි යෙදිණ. "හෙතුම්හි ඤාණං ධම්මපටිසම්භිදා" හේතුව පිළිබඳ නුවණ ධම්ම පටිසම්භිදා නම්. මෙහි ධම්ම ශබ්දය ප්‍රත්‍යයෙහිය.

ඨිතා ව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා" පැවතියා වූ ඒ නාම-රූපධර්ම, ධර්මයන් ගේ පිහිටි බවයි. ධර්මයන්ගේ පිළිවෙලයි. මෙහි ආ ධම්ම ශබ්දය ප්‍රත්‍යයන්ගෙන් හටගත් දේ කෙරෙහි යෙදිණ. "ධම්මට්ඨිති" යන පදයෙහි ද ධම්ම ශබ්දය ප්‍රත්‍යයන්ගෙන් හටගත් දේ කෙරෙහි යෙදුනු බව සැලකිය යුතු.

## ධම්ම යන වචනයෙහි අදහස

"අත්තනො සභාවං ධාරෙන්තීති වා පච්චයෙහි ධාරීයන්තීති වා අත්තනො ඵලං ධාරෙන්තීති වා අත්තනො පරිපූරකං අපායෙසු අපතමානං ධාරෙන්තීති වා සලක්ඛණෙ වා ධාරෙන්තීති වා චිත්තෙන ආධාරීයන්තීති වා යථායොගං ධම්මාති වුච්චන්ති" - ප ම අ.

මෙහි අදහස් සයෙකි.

1. අත්තනො සභාවං ධාරෙන්තීති ධම්මා;
තමා ගේ සවභාවය - හැටි - දරත්නුයි ධර්ම නම්.

2 පච්චයෙහි ධාරීයන්තීති ධම්මා;
ප්‍රත්‍යයන් විසින් දරනු ලැබෙත්නුයි ධර්ම නම්.

3. අත්තනො ඵලං ධාරෙන්තීති ධම්මා
තමා ගේ ප්‍රයෝජනය දරත්නුයි ධර්මයි.

4. අත්තනො පරිපූරකං අපායෙසු අපතමානං ධාරෙන්තීති ධම්මා!
තමා (ධර්මය) පුරවන්නාවූ තැනැත්තහු සිවු අපායෙහි වැටෙන්නට නොදී දරත්නුයි ධර්ම නම්.

5. සලක්ඛණෙ ධාරෙන්තීති ධම්මා;
ඒ ඒ සවකීය සවභාවයන් දරත්නුයි ධර්ම යි.

6. චිත්තෙන ආධාරීයන්තීති ධම්මා:
සිතෙන් පිහිට ලැබෙත්නුයි ධර්ම නම්.

මෙසේ ධම්ම යන්නට තේරුම් සයක් ඇති අතර ධම්මට්ඨිති යන මෙහි ප්‍රත්‍යයන් විසින් දරන ලැබෙත්නුයි යන දෙවැනි තේරුම ගතයුතුය. මෙහිදී ප්‍රත්‍යය හුදකලාව=තනියම නො යෙදේ. මක් නිසාද? ඒ ප්‍රත්‍යය ද ප්‍රත්‍ය සමුත්පන්නයක් හෙයිනි. එහෙයින්

ප්‍රත්‍යයත් ප්‍රත්‍යසමුත්පන්නත් යන දෙකම එකක් හැටියට සලකා තේරුම් ගත යුතුයි. මතු විස්තරයේදී මෙය මැනවින් අවබෝධ වෙයි.

ධම්මට්ඨිති: “පච්චය සමුප්පන්නා ධම්මා තිට්ඨන්ති උප්පජ්ජන්ති චෙව පවත්තන්ති ච එතායාති ධම්මට්ඨිති” ප්‍රත්‍යසමුප්පන්න ධර්මයෝ මේ නිසා සිටිත්, උපදිත්, පවතිත්නුයි ධම්මට්ඨිති නමි. කවරක් නිසා ද? ප්‍රත්‍ය ධර්මයි. “පච්චය ධම්මානං මෙතං අධිවචනං” ධම්මට්ඨිති යනු ප්‍රත්‍ය ධර්මයන්ට නමකි, මේ අටුවායි.

තවද, ප්‍රත්‍යයන්ට පමණක් නොව ප්‍රත්‍යසමුත්පන්නයන්ට ද මේ නාමය යෙදෙන බව ‘ධම්මට්ඨිතිඤාණ” පදයට දක්වූ තේරුමින් හැඟෙයි. “උභොපෙතෙ පච්චය සමුප්පන්නා” ඒ ප්‍රත්‍යය, ප්‍රත්‍යසමුත්පන්න දෙක ම ප්‍රත්‍යසමුත්පන්නයෝයි. එහෙයින් ඉහත කී විග්‍රහයෙහිලා ද ගතයුත්තේ එකශෙෂ කොට යැ. එකක්ලා සැලකීමෙනි. එවිට ධම්මට්ඨිති යන පදය ප්‍රත්‍යසමුත්පන්නයන්ට යෙදුන නාමයක් බව වැටහේ, ඒ අනුව ම ප්‍රත්‍යය සඳහාත් තේරුම් ගත හැකිය.

ධම්මට්ඨිති ශබ්දය ස්ත්‍රීලිඞ්ගික වචනයක් හෙයින් “තස්සං ධම්මට්ඨිතියං ඤාණං ධම්මට්ඨිතිඤාණං.’ ඒ ධම්මට්ඨිතිය කෙරෙහි යෙදුනු නුවණ, ධම්මට්ඨිතිඤාණයැයි අටුවාව තෝරයි. ප්‍රත්‍යය, ප්‍රත්‍යසමුත්පන්න ධර්මයන් කෙරෙහි පවත්නාවූ නුවණ ධම්මට්ඨිති ඤාණයයි. මෙම ඤාණයට පච්චයපරිග්ගහ ඤාණය යථාභූත ඤාණය, කඞ්ඛාවිතරණ විසුද්ධිය යන නම් ද කියනු ලැබේ,

සමාධිභාවනාමය ඤාණය ලඟට දක්විය යුත්තේ නාමරූප පරිග්‍රහ ඥානයයි. මක්නිසාද? ප්‍රත්‍යය, ප්‍රත්‍යසමුත්පන්න ධර්මයන් සෙවිය යුත්තේ ප්‍රත්‍යුත්පන්න ධර්ම වූ නාමරූපයන් සොයා ගෙනය. එහෙත් තෙසැත්තෑ ඤාණවිස්තරයේදී සමාධිභාවනාමය ඤාණය ලඟට දක්වෙනුයේ ධම්මට්ඨිති ඤාණයයි. ඊට හේතු වශයෙන් අටුවාචාරීන් දක්වනුයේ “පච්චය පරිග්ගහෙනෙව පච්චයසමුප්පන්න පරිග්ගහස්ස සිද්ධත්තා, පච්චය සමුප්පන්නෙහි අපරිග්ගහිතෙ පච්චය පරිග්ගහො න සක්කා හොති කාතුං, තස්මා ධම්මට්ඨිති ඤාණං ගහණෙනෙව තස්ස හෙතුභූතං පුබ්බෙසිද්ධං නාමරූප වවත්ථාන ඤාණං වුත්තමෙව හොතීති වෙදිතබ්බං” ප්‍රත්‍ය විමසීමෙන්ම

ප්‍රත්‍යය සමුත්පන්න ධර්ම විමසීම සිදුවන බැවිනි. ප්‍රත්‍යසමුත්පන්න ධර්ම නො විමසූ කල්හි ප්‍රත්‍යය විමසීම නො කළ හැකිය. එහෙයින් ධම්මට්ඨිති ඥාණය හැනීමෙත්ම ඒ ධම්මට්ඨිති ඥාණයට හේතුවූ, පෙරදීම සිදු කළ යුතුනාම රූප ව්‍යවස්ථා පන විමසන-ඥානය කියන ලදමැයි දතයුතු යනුයි

කරුණු මෙසේ හෙයින් ධම්මට්ඨි ඥාණය විස්තර කිරීමට මත්තෙන් නාමරූප ව්‍යවස්ථාපන ඥාණය කිවයුතුය. තවද සත්ත විසුද්ධි ක්‍රමයේ අනුපිළිවෙළ එනුයේ සමාධි භාවනාව වූ චිත්ත විසුද්ධිය ලඟට නාමරූප ව්‍යවස්ථාපනයවූ දිට්ඨි විසුද්ධියයි. දිට්ඨි විසුද්ධිය නො මැතිව කඞ්ඛාවිතරණ විසුද්ධියවූ ධම්මට්ඨිතිඥාණය සැප සිය නො හැකිය. සමාධිභාවනාව පහකරනවාත් සමග ම එනුයේ විපස්සනා භාවනායි ඒ විදර්ශනා භාවනාවේ ආරම්භය-පටන් ගැන්ම නාමරූප ව්‍යවස්ථාපනය කිරීමයි.නාමරූප ව්‍යවස්ථා-පනය මනාසේ සිදුකළ හුට ධම්මට්ඨිති ඥාණය උපදියි.

"ඉදං හි සමාධිභාවනාමය ඤාණෙ වුත්ත සමාධිනා සමාහිතෙන චිත්තෙන යථාභූත ඤාණදස්සනත්ථාය යොග මාරභිත්වා වවත්ථාපිතනාමරූපස්ස තෙසං නාමරූපානං පච්චය පරිග්ගහ පරියායං ධම්මට්ඨිති ඤාණං උප්පජ්ජති" මේ ධම්මට්ඨිති ඥාණය වනාහි සමාධිභාවනාමය ඥාණයේදී කියන ලද සමාධියෙන් සිත සමාහිත වූවහු විසින් යථාභූතඥාණදස්සනය - පච්චය පරිග්ගහයය- සඳහා භාවනා ආරම්භකොට,විමසන ලද නාමරූප ඇත්තාට ඒ නාමරූපයන් ගේ ප්‍රත්‍යය විමසන්නා වූ ධම්මට්ඨිති ඥාණය උපදියි.

## සත්තවිසුද්ධි ක්‍රමය:

මන්තාණි පුත්‍ර පුණ්ණ හිමියන් ගේ ගුණ කථනය ඇසූ සාරිපුත්ත මහරහතන් වහන්සේ, දිනක් පුණ්ණ හිමියන් අඩවනයට වඩිනු දැක, පසු පසින් වැඩමකර හමු වූ කල්හි මෙවැනි සාකච්ඡාවක් ඇති විය.

සැරියුත් හිමි:- ඇවැත්නි, ඔබ වහන්සේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි මහණදම් පුරනුයේ සීල විසුද්ධිය සඳහා ද?

පුණ්ණ හිමි:- නැත සවාමීනි,

එසේ නම් චිත්තවිසුද්ධිය සඳහා ද? නැත ස්වාමීනි, දිට්ඨි විසුද්ධිය සඳහා ද? නැත ස්වාමීනි කඞ්ඛා විතරණ විසුද්ධිය සඳහා ද? නැත ස්වාමීනි, මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය සඳහා ද? නැත ස්වාමීනි, පටිපදාඤාණදස්සන විසුද්ධිය සඳහා ද? නැත ස්වාමීනි ඤාණදස්සන විසුද්ධිය සඳහා ද? නැත ස්වාමීනි එසේ නම් මේ කුමක් සඳහා ද? ස්වාමීනි, අනුපාද පරිනිබ්බාණය සඳහායි.

සැරියුත් හිමි:- ඇවැත්නි සීල විසුද්ධිය අනුපාදපරිනිබ්බාණය ද?

පුණ්ණ හිමි:-නැත ස්වාමීනී

(මෙසේ සතතවිසුද්ධිත්ම ඇසූහ)

ඉක්බිති සැරියුත් හිමි:- එසේ නම් ඇවැත්නි, ඒ කථාවේ තේරුම කුමක් ද?

පුණ්ණ හිමි:- ස්වාමීනි, සීලවිසුද්ධිය අනුපාද පරිනිබ්බාණ යැයි බුදුරජාණන් වහන්සේ පැණවූසේක් නම් ඒ උපාදාන සහිත එම පැණවූවක් විය යුතුය. (මෙසේ සතතවිසුද්ධීන් ගැනම ප්‍රකාශ කළහ.)

සැරියුත් හිමි:- ඇවැත්නි, මේ ධර්මවලින් අන්‍යවූවක් ද අනුපාද පරිනිබ්බාණය? එසේ නම් පෘථග්ජනයෝ ද අනුපාද පරිනිබ්බා-ණයට පැමිණෙන්නෝ නො වේ ද?

පුණ්ණ හිමි:- ස්වාමීනි, පෘථග්ජනයෝ මේ ධර්මයන්ගෙන් අන්‍යවූවෝය. ස්වාමීන් වහන්සේට අවබෝධවීම සඳහා මම උපමාවක් කියන්නෙමි, නුවණැති ඇතැම්හු උපමා නිසා තේරුම් ගනිත්.

උපමාව- ස්වාමීනි, සැවැත්නුවර වෙසෙන කොසොල් රජුට සාකේත නගරයෙහි ඉතා අවශ්‍ය කටයුත්තක් සෙදුණේය. ඒ රජුට සැවැත්නුවරටත් සාකේත නගරයටත් අතර, හික්ම වූ අසුන් යෙදූ රථ සතක් පිළියෙල කළාහුය. ඉදින් මේ රජතුමා සැවැත්නුවරින් නික්ම පළමුවැනි රථයට නැගියි. එයින් මඳ දුරක් ගොස් දෙවැනි රථයට නැගියි. මෙසේ ක්‍රමයෙන් රථ සතෙන් ම ගොස් සත්වැනි රථයෙන් සාකේත නගරයට පිවිසෙයි.

ස්වාමීනි, මේ රජුගේ නෑයෙක් හෝ මිත්‍රයෙක් හෝ ඔහු ගෙන් ඇසුවොත් "රජතුමනි, ඔබ කෙසේ ද? මේ රථයෙන් සාකේත නගරයට පැමිණියේ" යනුවෙන් එවිට රජතුමා කෙසේ පිළිතුරු දෙයිද?

සැරියුත් හිමි: ඇවැත්නි, ඒ රජතුමා මෙසේ කියේ නම් මනා ලෙස කියේ වෙයි "මට සාකේත නුවර අවශ්‍ය කටයුත්තක් නිසා (ඇමතියෝ) හික්මවූ අශ්වයන් යෙදූ රථ සතක් සූදානම් කළහ. ඒ රථ සතෙන් එකෙකින් එකකට ගොඩනැගී සත්වැනි රථයෙන් සාකේත නුවරට පැමිණියෙමි'' කියායි.

පුණ්ණ හිමි:- ස්වාමීනි, ඒ අයුරින් ම මේ ධර්මය සඳහාත් කිවයුතුය. ස්වාමීනි, සීල විසුද්ධිය හුදෙක් චිත්ත විසුද්ධිය සඳහායි. (ඉන් ඔබ්බට නො වේ. චිත්ත විසුද්ධිය සීලවිසුද්ධිය නො මැතිව නොලැබේය යනු අදහසයි. සෙසු තන්හිත් මෙසේමැයි) චිත්ත විසුද්ධිය දිට්ඨි විසුද්ධිය සඳහායි.-මෙසේ අවුත් - ඤාණදස්සන විසුද්ධිය අනුපාද පරිනිබ්බාණය සඳහායි. ස්වාමීනි, මේ අනුපාද පරිනිබ්බාණය සඳහායි මම මහණදම් පුරනුයේ.

(අනුපාද පරිනිබ්බාණය නම් රහතන් වහන්සේගේ ස්කන්ධ-ජීවිතය-පිරිනිවීමයි.-රහත්හුගේ මරණයයි-)

මේ රථ විනීත සූත්‍රයෙහි දැක්වෙන සප්ත විසුද්ධි ක්‍රමය සි චිත්ත විසුද්ධි නම් වූ සමාධි භාවනා සම්පූර්ණත්වය හුදෙක් දිට්ඨි විසුද්ධිය නම් වූ නාමරූප පරිග්ගහඤාණය සඳහා බව මේ සූත්‍ර යෙන් අවබෝධ වෙයි. සප්ත විසුද්ධි ක්‍රමය ඉක්ම වූවහොත් විදර්ශනා ඥානය නො පිහිටයි. නිර්වාණාවබෝධය ද නො වෙයි. කොසොල් රජුගේ සාකේත ගමන මෙනි. ක්‍රමානුකූලව එකින් එකට පත්විය යුතු බව ඒ උපමාවෙන් දතයුතු. සමාධි භාවනාමය ඤාණ විස්තරයේ අග කොටසෙහි දැක්වූ ශීල, සමාධි, ප්‍රඥා යන තුනද සිහිකළ යුතුය.

සාරාංශ මෙසේ හෙයින් චිත්ත විසුද්ධිය ළඟට දතයුත්තේ දිට්ඨි විසුද්ධි සංඛ්‍යාත නාමරූප පරිග්‍රහඥානයයි මෙතැන් සිට එය දැක්වෙයි.

## දිට්ඨි විසුද්ධිය

''නාමරූපානං යථාව දස්සනං දිට්ඨි විසුද්ධි නාම''= රථ විනීතසූත්‍රය - නාමරූපයන් ගේ ඇති සැටි දැකීම දිට්ඨි විසුද්ධියයි. ''ලක්ඛණ රසපච්චුපට්ඨාන පදට්ඨාන වසෙන නාමරූප පරිග්ගහො දිට්ඨි විසුද්ධි නාම'' අ. ධ. සං.

ලක්ෂණ, රස, ප්‍රත්‍යුපස්ථාන පදට්ඨානය වශයෙන් නාම රූප පරිග්‍රහය = විමසීම-දිට්ඨි විසුද්ධි නමි.

මේ පදනාමයන්ට අනුව සලකා ගතයුත්තේ දිට්ඨි විසුද්ධිය සම්පාදනය සඳහා, ප්‍රථමයෙන් නාමරූප හැඳිනීම ද දෙවැනිව ඒවායේ එකක් පාසා ලක්ෂණාදී වශයෙන් විමසීමද කටයුතු බවයි. නාමරූප හැඳිනීම සඳහා ගතයුතු පිළිවෙළ කීපයක් විදර්ශකයෝ අනුගමනය කරත්. පඤ්චස්කන්ධ ක්‍රමය, ආයතන ක්‍රමය; ධාතු ක්‍රමය, ඉන්ද්‍රිය ක්‍රමය, චතුරාර්‍ය්‍ය සත්‍යය ක්‍රමය, යනුයි. මෙයින් චතුරාර්‍ය්‍ය සත්‍යය, මතු දුක්ඛ ඤාණය ආදී ඤාණ විස්තර යේදී දැක්වීමට අවකාශ තබා, සෙසු ධර්ම කොටස්හි කෙටි හැඳින් වීමක් දක්වමි.

## පඤ්චස්කන්ධය

බුදුරජාණන් වහන්සේ ගේ ධර්මදේශනා ක්‍රම දෙකකි. සම්මුති දේශනා, පරමාර්ථ දේශනා යනුයි. ලෝක ව්‍යවහාරයෙහි පිහිටා, පුද්ගල-ද්‍රව්‍ය පරාමර්ශනය කොට කළ දේශනා සම්මුති නමි. විනය, සූත්‍ර, පිටක දෙකම සම්මුති දේශනායි. පරමාර්ථ දේශනා යනු ලෝක ව්‍යවහාරය ඉක්මවා, පුද්ගල-ද්‍රව්‍ය පරාමර්ශනය නො කොට, ධාතු-ස්කන්ධාදී වශයෙන් කළ දේශනායි. අභිධර්ම පිටකය මෙයට අයත්ය.

විනය ප්‍රඥප්ති-පැණවීම-, එක් එක් පුද්ගලයෙකු අරමුණු කොට ධර්ම මාර්ගයක් පැහැදිලි කිරීම, ආදී දෑ පරමාර්ථ ක්‍රම යෙන් දෙසුයේ නම් ඒ නො මැනවි. අවබෝධය ද දුෂ්කරය. මුලාවට ම පත්විය හැකිය. එහෙයින් ඒ දෙකෙහිදී බුදුරජාණන් වහන්සේ ලෝක සම්මුතියෙහි පිහිටා දේශනා කළහ. තවද අට කාරණයක් නිසා සම්මුතිය දේශනා කළහ. හිරි - ඔතප් දැක්වීම සඳහා, කර්මය තමාට අයත් බව දැක්වීම සඳහා, එක් එක් පුද්ගලයා දැක්වීම සඳහා, ආනන්තරිය කර්ම දැක්වීම සඳහා බ්‍රහ්මවිහර

දක්වීම සඳහා, පූර්වේනිවාස දක්වීම සඳහා, දක්ෂිණා විසුද්ධි දක්වීම සඳහා, ලෝක සම්මුතිය නො වැලැක්වීම සඳහා, යන කරුණු අටය. මෙබඳු තන්හිදී පරමාර්ථ වශයෙන් දෙසුවේ නම් මුලාවට ම පත් වෙයි, එහෙයින් බුදුරජාණන් වහන්සේ විනය සූත්‍ර දෙක සම්මුති වශයෙන් දෙසූහ. ඉහත දැක්වූ සීලමය, සමාධි භාවනාමය, ඥාණ දෙකම සම්මුති දේශනායි ජීවිතයෙහි ඇති සැටි අවබෝධවීම සඳහා ද, විදර්ශනාඥානයෙහි බහා බැලීම සඳහා ද, මෙතැන් සිට පරමාර්ථ දේශනා එයි. එනම් ස්කන්ධ, ධාතු, ආයතනාදී දේශනා ක්‍රමයයි. මිනිසාය, දෙවියාය, තිරිසනාය, යනාදී වශයෙන් සම්මුති වශයෙන් පණවාගත් එක් එක් සත්ව ජීවිත පරමාර්ථ වශයෙන් බලත්හොත් එක ම පඤ්චස්කන්ධයකි. විදර්ශනා යෝගියා විසින් තම ජීවිතය ද ''මම'' යන සම්මුති නාමය අස්කොට, පරමාර්ථ වශයෙන් බැලීම සඳහා පංචස්කන්ධ විභාගයට බැසිය යුතුය. ''පඤ්චක්ඛන්ධා, රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො''-වි.ප. පඤ්චස්කන්ධය යනු රූපස්කන්ධය, වෙදනාස්කන්ධය සඤ්ඤාස්කන්ධය, සංස්කාරස්කන්ධය විඤ්ඤාණස්කන්ධයයනුයි. ලිහිල් අදහස: රාශි සමූහ-පස, රූප රාශිය, වෙදනා රාශිය, හැඟීම් රාශිය, රැස්කිරීම් රාශිය, සිත් රාශිය යනුයි. මේ පඤ්චස්කන්ධයයි ''මම'' ය යන සත්ව ජීවිතයෙහි පරමාර්ථ දර්ශනයයි. මෙහි ''ඛන්ධ'' යනු රාශියයි මහා සමුද්‍රයෙහි ඇත්තාවූ විශාල ජල රාශියට උදක ස්කන්ධයැයි කියන්නාසේ අතීත අනාගත, වර්තමාන යන කාලත්‍රයට අයත්වූ දූර සන්තිකාදී වශයෙන් බෙදී ගිය රූපාදී පංචකය, පංචස්කන්ධයැයි කියනු ලැබේ, එහෙයින් රූප රාශි යනී වෙදනා රාශියකි ආදී වශයෙන් තේරුම් ගතයුතුය.

## 1. රූපස්කන්ධය හෙවත් රූප රාශිය

''රූප'' යනු විරුද්ධ දෙයක් පැමිණි කල්හි වෙනස්වන දෙයට කියන නාමකි. ''රුප්පතීති රූපං'' වෙනස්වනුයේ රූප නම්. ''සීතෙන රුප්පති, උණ්හෙනපි රුප්පති, ජිඝච්ඡායපි රුප්පති, පිපාසායපි රුප්පති, ඩංස-මකස-වාතාතප-සිරිංසප-සම්ඵස්සෙනපි රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති'' ඛන්ධ සංයුත්තකය ශීතල නිසා වෙනස්වෙයි උෂ්ණය-කුසගිනි-පිපාසය-මැසි මදුරු අව් සුළං ආදිය-දීඝ ජාතික නයි පොළොං ආදී සතුන් මේ ආදීන් ගේ ස්පර්ශය නිසා වෙනස් වෙයි මහණෙනි, මේ නිසා රූපයැයි කියනු ලැබේ මෙසේ වෙනස්වනද රූපනම්.

සම්මුති වශයෙන් ශරීරයැයි කියනු ලබන රූප රාශිය ඉහතින් සඳහන් යම්කිසි කරුණක් නිසා ඉදිරිපත්වූවිට වෙනස් බවට පැමිණේ. තද ශීත නිසා සමෙහි ඉදිමුණු ගතියක් පෙනෙනුයේ රූපය වෙනස්වූ හෙයිනි. එසේම ස්නානය කළ කල්හි "සනීපයි" යන හැඟීම ඇති වූයේ ද වෙනස්වූ හෙයිනි. ප්‍රකටව දැන ගැනීමට නම් තද ශීතල ඇති ලෝකාන්තරික නිරය ගැන සිතිය යුතුය. සක්වල තුනක් අතරලෝකාන්තරික නරකයෙක් ඇත. එය යොදුන් අටදහසක් පමණ විශාලය. එහි හිරු. සඳ, ගිනි ආදී කිසිදු ආලෝකයක් නො මැත. සැමදා ඝණාන්ධකාරය. උඩින් විශාල පර්වතයකින් වාසී ඇත. යට තද ශීතල ජලාශයකි. පොළොව වශයෙන් පවත්නේ ජලයයි. මෙහි උපන් නිරිසත්හු වවුලන් මෙන් මතු පර්වතයෙහි හිස පහතට වැටෙනසේ පා වලින් එල්බී වෙසෙත්. යම් විටෙක ලඟසිටියෙකු අසුවුවහොත් ආහාරයක් ලැබුණේයයි සිතා අල්ලාගැනීමට තැත් කරත්ම පා ගැලවී ජලාශයට වැටෙත් අධික ශීතල ජලයට වැටුණු ඒ සතා රත්වූ තෙලකට දැමූ දෙයක් සේ පිපිරි පිපිරී පැසෙයි. මෙසේ ශීත නිසා රූපය වෙනස් වන අයුරු පෙනෙයි. තවද අධික ශීත දේශගුණය ඇති, හිම වැටෙන රටවල්හිද රූපය වෙනස්වන අයුරු ප්‍රකටයා.

උෂ්ණයෙන් ද රූපය වෙනස් වෙයි. ගින්නකින් සිරුර දැවුණුවිට එය දැනේ. තුබූ සහපත් ගතිය වෙනස්වී බුබුළු මතු වෙයි. නැතහොත් සම ගැලවේ. එසේම තද හිරුරැස් ඇති කල්හි එළිමහනෙක සිටියහොත් රත්වූ ගලක් මත දැමූ ලා දළු පතක් සේ හැකිලෙයි. ඒ වෙනස්වූ හෙයිනි. තවද සම්කලාපීය ප්‍රදේශයන්හි වෙසෙන මනුෂ්‍යයන් ගේ ශරීර තද කළු පැහැය ඇතිවන්නේ ද මේ නිසාය. උෂ්ණයෙන් රූපය වෙනස්වන අයුරු ප්‍රකට ලෙස දැනෙනුයේ අවීචිමහ නිරයෙහිය. අවීචි නිරය සිවුරැස්ය. වර්තමාන කාලයේ තේකොළ අසුරනු ලබන රට-අඹලෑලි පෙට්ටියකට සමානය, උඩ යට, සිවු දිසාය යන සය පැත්තෙන්ම ඝණ යපොළවය; ලෝහ බිත්තියය පියන් පත ද ලෝහමය. සත්වයාගේ කර්මවේගය නිසාම පැණනැගුණාවූ මහාඅග්නිස්කන්ධය-ගිනිගොඩ සය පැත්තේ ඇති ලෝහ බිත්තිවලින් එහා යොදුන් සියයක් ඈතට විහිදේ. මෙහි උපන්නාවූ සත්වයා උපන් කෙණෙහිම ගින්නට අසුවී ඇඹරි ඇඹරී සුණු-විසුණුවී යයි. කර්මය නිසාම නැවතද එහි උපදියි. මෙසේ උෂ්ණය නිසා රූපය වෙනස්වෙයි.

කුසගින්න නිසාද රූපය වෙනස්වෙයි. දින දෙකක් හෝ තුනක් හෝ කුසගින්නේ සිටියිනම් තුබූ යහපත් සිරුර නැති වෙයි. මලානික ගතියක් උදාවෙයි. ඒ කුසගින්න නිසා රූපය වෙනස්වූ හෙයිනි. මෙය ප්‍රකට ලෙස පෙනෙනුයේ ප්‍රේත විෂයෙහිය. ප්‍රේතයෝ ඇතැම්විට බුද්ධාන්තර කාල සීමාවකිනුදු ආහාර නො ලබත්. (බුදුවරයෙක් පිරිනිවන්පෑ පසු නැවත බුදුවරයෙක් උපදින තෙක් ඇති කාල සීමාව බුද්ධාන්තරයයි) බිම්බිසාර රජුගේ ඥාති ප්‍රේතයෝ එබන්දෝය. තවද මනුෂ්‍ය ලෝකයෙහි දුර්භික්ෂ කාලසීමාවන්හි ද මෙය ප්‍රකටව පෙනේ. මේ ලක්දිව ම පෙර දවස දොළොස් අවුරුද්දක් පැවතුනු බැමිණිතියාසාය ඊට නිදසුනෙකි.

පිපාසායෙන් රූපය වෙනස්වෙයි. පිපාසාව ඇතිවූ කල්හි දිව, උගුර, ආමාශය, වියලී යාමේ නිසා ශරීරයේ මලානික ගතියක් ඇතිවෙයි. එය රූපය වෙනස්වූ හෙයිනි. මෙය ද ප්‍රේතලෝකයෙහි ප්‍රකටය. එසේම විශාල කාන්තාරවල ගමන්කරන කල්හිද, උෂ්ණාධික ප්‍රදේශයන්හි වාසයකරන කල්හි ද ප්‍රකටම පෙනේ. මැසි මදුරුවන් ආදී ඒ ඒ සතුන් දෂ්ට කිරීම නිසා රූපය වෙනස්වන අයුරු කාටත් මනාලෙසම අවබෝධවෙයි මෙසේ ඒ ඒ කරුණු නිසා තුබූ ගතිය වෙනස්වන හෙයින් රූප යැයි කියනු ලැබේ.

තත්ථකතමං සබ්බං රූපං? චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං ඉදං වුච්චති සබ්බං රූපං"–ධ. සං. ප. එහි සියලු රූපය යනු කවරේද? මහාභූත සතර හා ඒ මහාභූතයන් නිසාපවත්නාවූ උපාදාය රූපත්ය. මේ සියලු රූපයැයි කියනු ලැබේ. මෙසේ බුදුරජාණන් වහන්සේ සියලු රූපය ප්‍රධාන වශයෙන් දෙකොටසකට බෙදා දක්වූහ. එහි මහාභූත සතරෙකි. උපාදාය රූප සුවිස්සෙකි. සියල්ල අටවිස්සෙකි

"භූතප්පසාද විසයා = භාවො හදය මිච්චපි
ජීවිතාහාරරූපෙහි - අට්ඨාරස විධං තථා
පරිච්ඡෙදඤ්ච විඤ්ඤත්ති – විකාරො ලක්ඛණානි ච
අනිප්ඵන්නා දසචෙති = අට්ඨවීසවිධංභවෙ"– අ. ධ. සං.

මේ ගාථා දෙකෙන් පැහැදිලිවන අටවිසිරූප දෙපරිදිය. නිෂ්පන්නරූප, අනිෂ්පන්න රූප යනුය. පෙර සඳහන් පරිදි ශීත උෂ්ණාදියෙන් වෙනස්වන රූප නිෂ්පන්න රූපයි. ඒවාටම

අයත්වූ එබඳු ලක්ෂණ නොමැති රූප මාත්‍රයක් වූ රූප අනිෂ්පන්න නම්. නිෂ්පන්නරූප, රූපයැයි ද, අනිෂ්පන්න රූප, අරූප රූපයැයි ද කියනුලැබේ. මෙසේ රූපය දෙවැදෑරූමය.

## රූප පිළිවෙල මෙසේය.

1. භූතරූප සතරෙකි.
2. පසාදරූප පසෙකි.
3. විෂයරූප සතරෙකි.
4. භාවරූප දෙකකි.
5' හදයරූපය.
6. ජීවිතින්ද්‍රිය රූපය
7. ආහාර රූපය
8. පරිච්ඡේද රූපය.
9. විඤ්ඤත්ති රූප දෙකකි
10. විකාර රූප තුනෙකි (විඤ්ඤත්ති සමඟ පහයි)
11. ලක්ඛණ රූප සතරෙකි. (සියල්ල අවිස්සෙකි)

## භූතරූප සතර

පඨවි, ආපෝ, තෙජෝ, වායෝ යනුයි.

මේවා සසම්භාර, ආරම්මණ, සම්මති, ලක්ඛණ යන සතරාකාර යෙන් තේරුම් ගතයුතුයි.

සසම්භාර ක්‍රමයෙන් භූතරූප : මහපොළොව, පර්වතාදිය පඨවියි. ගංගා, සමුද්‍රයන්හි ජලය ආපෝයි. ගින්න, සූර්‍ය රශ්මිය ආදිය තේජෝය. හමන්නා වූ සුළඟ, ආශ්වාසප්‍රශ්වාස වාතය වායෝ ධාතුයි.

ආරම්මණ ක්‍රමයෙන් : පඨවි කසිණය, ආපෝකසිණය, තෙජෝ කසිණය, වායෝ කසිණය, යන සිවුකසිණ මඬුල්ලයි. සම්මති ක්‍රමයෙන්: ඒ සිවු කසිණ වඩා ධ්‍යාන ලබා බඹලොව උපන් බ්‍රහ්මයෝ ව්‍යවහාරයන

**ලක්ඛණ ක්‍රමයෙන් :** ඒ ඒ භූතරූපයන්හි පවත්නා ස්වාභාවික ගතියි. එනම් හැටියි. පඨවි ධාතුව කැකුළු ගතියෙන් යුක්තය. ආපෝ ධාතුව බැඳීම්, වැගිරීම්, ගතියෙන් යුක්තය. පැසවන, උණුසුම්, ගති තෙජෝ ධාතුයි. සැලෙන, පිම්බෙන, ගති වායෝ ධාතුයි. (විස්තර පසුවටයෑ)

මෙසේ සතර මහාභූතරූපයෝ ක්‍රම සතරකින් තේරුම් ගත යුතු අතර, විදර්ශනාවට අවශ්‍ය වනුයේ යටකී ලක්‍ෂණ ක්‍රමය යි. එයිනුදු ආධ්‍යාත්මික-තමා පිළිබඳ-භූතරූප කොටසය.

1. පඨවි රූපය : “කක්ඛළ ලක්ඛණා පඨවි” ශරීරයෙහි පවත්නා කැකුළු ගතිය පඨවි රූපයයි. කැකුළු ගතිය නම් තද, ගොරෝසු, බවයි. සිරුර සැම තැන්හි ම මේ පඨවි රූපය පවතියි මේ අයුරින් තේරුම් ගැනීමට නො හැකි නම් කෙස්, ලොම්, ආදී ඒ ඒ කොටස් වශයෙන් සැලකිය යුතු. ධාතුකම්ස්ථානයේදී එය දක්වීණ. සෙසු භූතරූපත් එසේ ම ය.

2. ආපොරූපය: ශරීරයෙහි පවත්නා බැඳෙන ගතිය ආපෝ රූපය යි. අළු රැසකට දිය බිඳක් දමූ කල්හි කැටිගැසෙන්නේ යම්සේද, එසේ සිරුරෙහි කැටිගැසීම් ස්වභාවය කෙරෙනුයේ ආපෝ රූපයෙනි. එසේම කැටිගැසීම් ගතිය නැති කල්හි සිදුවන වැගිරෙන ගතිය ද ආපෝ රූපය යි. පඨවි රූපය මඳ වූ විට වැගිරේ. එහෙයිනි. ආබන්ධන ලක්ඛණා ආපෝ” බැඳීම් ලක්‍ෂණය ආපෝය යි කියේ ඉහත කී අදහස දක්වීම සඳහාය. සෙම්, සොටු, ආදී කොටස් ආපෝ රූපයට ගැනේ.

3. තෙජෝ රූපය : ශරීරයෙහි උෂ්ණ ගතිය, මෝරණ ගතිය තෙජෝ රූපයයි. තෙජෝ රූපය මඳ වූ කල්හි කුණුවීම් ස්වභාවයට පැමිණේ. වැඩි වූ කල්හි දහ ගතිය ඇතිවේ. සාමාන්‍යයෙන් මඳ වූ විට ශීතල ගතිය දැනේ. ශීත යනුද තෙජෝ රූපයෙහි එක් අයුරකි. “තෙජෝ එවහි සීතං” තෙජෝ රූපයම ශීත නම්. බාල, තරුණ, මහළු, යන ශරීරයෙහි අවස්ථාවනට ද, කෙස්, ලොම්, නිය, වැඩීම් බවට ද මේ ආදී මෝරණ ස්වභාවයට පමුණුවනුයේ තෙජෝ රූපය නිසාය.

4. වායො රූපය : ශරීරයෙහි සැලෙන ගතිය, විත්ථම්භන-පිම්බෙන-ගතිය, වායො රූපයයි. ලේ ගමනය, අත්-පා ආදිය සෙලවීම, මල-මූ පහකිරීම, සෙම්-සොටු වැගිරීම, ඩහදිය ගැලීම, යනාදී සිදුවනුයේ වායො රූපයෙනි.

මේ මහාභූත රූප සතර පවතිනුයේ එකටමය, වෙන වෙනම නො වේ. පඨවි රූපය ඇති තැන සෙසු භූතරූප තුන ද ඇත. ආපො රූපය ඇති තැන සෙසු භූතරූප ද ඇත. මෙපරිද්දෙන් වෙන් කොට ගැනීමට නො හැකි පරිද්දෙන් පවතී. ප්‍රකට ව වැට හෙනුයේ එකක් සෙසු ඒවාට වඩා වැඩි වූ විටය. එහෙයින් මුළු සිරුරෙහි සැම තන්හි ම භූතරූප සතර පිහිටා ඇති බව, විදර්ශක යා තේරුම් ගතයුතුය. වහා වැටහෙන නුවණක් ඇති-ඛිප්පාභිඥ- විදර්ශකයාට භූතරූප සොයා ගැනීමට මේකී අයුරු ප්‍රමාණවත් ය. නුවණ මඳ තැනැත්තාට (දන්ධාභිඥ) ධාතු කම්මට්ඨානයෙහි කී පරිද්දෙන් ඒ ඒ භූතරූප අධික වූ කොටස් ගෙන විමසිය යුතුය. කෙසාදී කොටස් විස්සෙහි පඨවි රූපය අධිකය. පිත්තාදී කොටස් දොළොසෙහි ආපො රූපය අධිකය. ශරීරගත සන්තාපනාදී කොටස් සතරට බෙදී ගිය තෙජො රූපය, උද්ධඞ්ගමාදී කොටස් සයකට බෙදීගිය වායො රූපය, යනුයි.

තවද, විෂය රූප වූ ඒ ඒ භූතරූපයන් ගේ සමූහයෙහි ඇති පැහැය, ගන්ධය, රසය, හා ආහාරයෙන් හටගත් ඕජා රූපය, යන සිවු රූප ද, භූතරූප සමඟ එකට යෙදී ඇත. මේ සතර භූතයන් නිසාම පවතින ඒවාය. භූතරූපයන්ට ම අයිතිය. එහෙයින් වෙන් කරනු නො හැකිය. මෙසේ භූතරූප සතර හා ඒවාහි පවත්නා විෂය රූප තුන ද, ඕජා රූපය ද යන අට වෙන් කොට ගත නො හැකි හෙයින් අවිනිර්භොගරූප නම්. අවිනිර්භොග රූප ද භූතරූප විමසන විදර්ශකයා විසින් දත තිබිය යුතුය. එහෙයිනි මෙතැනට දක්වීමට හේතුවූයේ.

(මෙයින් කෙරෙනුයේ මුළු අභිධර්ම විස්තරයක් ම නො වේ. හුදෙක් විදර්ශනා ඥානයට ගෝචර විය යුතු තම ශරීරයෙහි පවත් නා භූතරූප හැඳින්වීමකි.)

## උපාදාය රූප සුවිස්ස (24)

රූප පිළිවෙළ දැක්වූ තන්හි ප්‍රථමයෙන් හැඳින්වූ භූතරූප සතර හැර, ඉතිරි සියල්ල සුවිස්සකි. එ උපාදාය රූපයි. භූතරූප නිසා පවතින රූප යනු අදහසයි. සිතෙහි පවත්නා අදහස් චෛතසික යනුවෙන් ද, ද්‍රව්‍යයක් ඇසුරු කොට පවත්නා දුට ගුණ යනුවෙන් ද, කිවා සේ මහාභූතරූප ඇසුරු කොට පවත්නා රූපයනට උපාදාය රූපයැයි කියනු ලැබේ. භූතරූපයන් ගෙන් වෙන් වූ උපාදාය රූපයක් නැත.

එකී ප්‍රශාද රූප පසෙකි. චක්ඛුප්‍රශාද, ශ්‍රොත්‍ර ප්‍රශාද, ඝ්‍රාණ ප්‍රශාද, ජිහ්වා ප්‍රශාද, කාය ප්‍රශාද, යනුයි. ප්‍රශාද යනු පැහැයයි· චක්ඛුව-ඇස-ම ප්‍රශාදය වූයේ චක්ඛු ප්‍රශාද යි. මේ වශයෙන් තේරුම් ගත යුතු.

1. චක්ඛු ප්‍රශාද රූපය : ඇසය යි කියනු ලබන මස් ගුලියෙහි ඇති කළු ඉංගිරියාව මැද පිහිටි පටල සතක විසිරී සිය පැහැය චක්ඛු ප්‍රශාද රූපය යි. පුළුන් පටල සතක ඉසි තෙලක් සේ පටල සතෙහි දුවවී ඇති බැබලෙන ගතිය, රූප සෙවනැල්ල වැටෙන තැන, චක්ඛු ප්‍රශාද නම්. ප්‍රමාණයෙන් උකුණු හිසක් පමණය. පඨවි රූපයෙන් දැරීම ද, තෙජො රූපයෙන් මේරීම ද, ආපො රූපයෙන් බැඳීම ද, වායො රූපයෙන් සැලීම ද, සිදු කෙරෙමින් පවතී. අවටින් පැමිණෙන සියුම් දූලි පිස දැමීම නිතර සිදු කෙරෙනුයේ ඇස් පියන් පතෙනි. (ඇසිපිල්ලන් ගැසීමයි.) ඒ පිසදැමීමත් සමඟම ආපො අධික කඳුළෙන් සේදීම සිදුවෙයි. නැවත පැහැය මතුවෙයි. ඒ පැහැය පවත්නා තෙක්, ඇසි පියන් පත නො වසනතුරු එහි යම්කිසි රූප සටහනක් රැඳී ඇත.

2. ශ්‍රොත්‍ර ප්‍රශාදය රූපය : කණ් බිල ඇතුලේ ඇඟිලි මුදු වක් බඳු සටහන් ඇති තඹපාට රෝමයක් ඇත. එහි ශබ්ද ඇද ගැනීමේ ශක්තියක් ඇති, නැතහොත් ශබ්ද රූපය හැප්පෙන සවභාවයක් ඇති පැහැය ශ්‍රොත්‍ර ප්‍රශාද රූපයයි. ඒ පැහැයට ශබ්ද වදිනු විනා අන් දෙයක් නො වදී. මෙය ද පඨවි ආදී භූතරූපයන් නිසා ම පවතින්නකි. පැවතීම, බැඳීම, මේරීම, සැලීම, යන වැඩ සතර ඒ භූතරූපයන් ගෙන් සිදුවෙයි. පැහැයට අනතුරක් නො වන පරිදි කණ් බිල වටා ලෝම පිහිටා ඇත.

3. ඝ්‍රාණ ප්‍රශාද රූපය : නැහැය ඇතුලේ එළුකුරයක බඳු සටහනක් ඇති එහි පවත්නා ගඳ සුවඳ වැදීමේ ශක්තිය ඇති පැහැය ඝ්‍රාණ ප්‍රශාද රූපයයි. මෙහි ද ගඳ-සුවඳ වදිනු විනා අන් දෙයක් සිදු නොවේ ඒ පැහැයේ පැවතීම, බැඳීම, මේරීම, සැලීම, සිදුවනුයේ භූතරූපයන් ගෙනි. ආරක්ෂාව සඳහා නැහැයේ කුහර වටේ ලෝම පිහිටා ඇත. සොටු පිරුණු කල්හි ගඳ-සුවඳ නො දැනෙනුයේ පැහැය වැසීම නිසාය.

4. ජිහ්වා ප්‍රශාද රූපය : දිව මැද උපුල් පෙත්තක බඳු සටහනක් ඇත. එහි පවත්නා රස ඇඳගැනීමේ ශක්තිය ඇති පැහැය ජිහ්වා ප්‍රශාද රූපයයි. මෙහි ද පැවතීම, බැඳීම, මේරීම, සැලීම,

සිදුවනුයේ භූතරූපයන්ගෙනි. ඇඹිහිරි දෙයක් අසු වූ විට ඉබේට ම දිව ඇතුලට ඇදෙනුයේ ආරක්ෂාව සඳහාය. එසේ ම ආමාශයෙහි උෂ්ණය වැඩීම, තිසා මල බැඳීමෙන් හෝ සෙම් පටල අවුත් වැසීමෙන් හෝ එහි පවත්නා රස දැනීමේ පැහැය වැසීයයි. පිරිසිදු කරන්ම නැවත මතුවෙයි.

**5.** කාය ප්‍රසාද රූපය : ආහාර පැසවන තේජස ජඨරාග්නිය, නිය, කෙස්, ලොම් අග, විය‍ලිසම්, යන මේවා හැර අන් සෑම තන්හි ම කපු පුළුන්හි ඉසි තෙලක් සේ පැතිරී පවත්නා ස්පර්ශය-හැප්පීම-වැදීමේ ශක්තිය ඇති පැහැය කාය ප්‍රසාද රූපයයි. ජීවිතෙන්ද්‍රිය - මැරීමට නො දී රැකගන්නා රූපය-ඇති සෑම තන්හිම කාය ප්‍රසාද රූපය පවතී. සම්, මස්, නහර, ඇට මිදුළු ආදී සෑම කොටසකම මේ රූපය පැතිරී ඇති බව තේරුම් ගත යුතුය. මෙහි ද පැවතනම, බැඳීම, මේරීම, හැලීම, (පිම්බීම) භූතරූපයන් ගෙන් සිදුවෙයි.

එක් එක් ප්‍රසාද රූප, අවිනිර්භෝග රූප අට හා ජීවිතින්ද්‍රියන් සමඟ ම පවතී. එහෙයින් එක් ප්‍රසාද රූපයෙක්හි රූප දශයෙක් ඇත. එනම් අවිනිර්භෝග - රූප අට, ජීවිතින්ද්‍රිය රූපය හා ප්‍රසාද රූපයයි මෙ වැනි රූප සමූහයට කලාප නැතහොත් දසකයැයි කියනු ලැබේ. ඉදිරියෙහි දක්වෙන කලාප සන්මශීන යෙහිලා මෙසේ දැන තිබීම උපකාර පිණිස පවතී.

විෂය රූප : රූප, ශබ්ද, ගන්ධ, රස, මේ රූප සතර විෂය රූපයි. ගෝචර රූප යනුද නමකි. චක්‍ෂුප්‍රසාදාදී සතරට මේ රූප ගොදුරුවෙයි. අරමුණු වෙයි. කිවයුත්තෙක් ඇත. කාය ප්‍රසාදයට ගෝචර වන ඵොට්ඨබ්බ රූපය මෙහි සඳහන් වී නැත. මන් නිසාද? ඵොට්ඨබ්බරූපය යි හැඳින් විය යුතු රූපයක් නො මැත. ආපො රූපය හැර ඉතිරි භූත රූප තුන ඵොට්ඨබ්බ රූපය ලෙස දෙසූහ. තවද ධම්මසඞ්ගණියෙහි ඵොට්ඨබ්බ රූපය නො උපාදාන රූපයක් ලෙස වෙන්කොට ඇත. සෙසු විෂය රූප සතර සුදුසු පරිද්දෙන් ප්‍රසාද රූපයන්ට ගෝචර වෙමින් පවතී.

**1.** රූප රූපය : සතර මහාභූතයන් ගෙන් සෑදුනු ඒ ඒ ද්‍රව්‍ය, සත්වයන්, මේ වශයෙන් පවතින අවිසදෘශණක - සවිසදෘශණක වස්තූන් කෙරෙහි ඇත්තා වූ ඇසට පෙනෙන ගතිය -වර්ණ රූපය- රූප රූපය යි. "රූපයති වණ්ණවිසෙසං ආපජ්ජිත්වා හදයඞ්ගතභාවං පකාසෙතීතිරූපං" ප්‍රකාශ කෙරෙයි, වර්ණ

විශෙෂණයකට පැමිණ හෘදය වස්තුවෙහි ඇතුලත් වූ සවභාවය ප්‍රකාශ කෙරේනුයි රූප නම්. ප්‍රසාදයට රූප නො පෙනෙයි. සිතට ද රූප නො පෙනෙයි. එහෙත් මේ දෙක හමු වූ විට රූප පෙනෙයි. ඒ බව පැහැදිලි වීම සඳහා මේ විග්‍රහය දක්විණ. චක්ෂු ප්‍රසාදයට වැටුණු රූපය ප්‍රකාශ කරනුයේ, දැනගනුයේ හෘදය වස්තුවෙහි ඇතුලේ වූ සවභාවය වන සිතෙනි. වර්ණ රූපය වර්ණ වශයෙන් නීල, පීත, ලෝහිත, ඔදාත, මඤ්ජෙට්ඨ, ආදී ප්‍රභේද පවතී. ආකාර වශයෙන් ප්‍රභේද රාශියකි. ඒ ඒ සත්ව කොට්ඨාස, ද්‍රව්‍ය සමූහ, ආදී වශයෙනි. කොටසක් ධම්මසඞ්ගණියෙහි රූපකාණ්ඩයේ දක්වෙයි.

2. ශබ්ද රූපය : ශ්‍රොත්‍ර ප්‍රසාදයට අසුවන ඒ ඒ ශබ්ද, ශබ්ද රූපය යි. මෙය ද නොයෙක් ආකාරයි. කෙටියෙන් සැලකිය යුත්තේ කණට ඇසෙන යම්කිසි ශබ්දයක් වෙයි නම් ඒ ශබ්ද රූපය යනුයි. බෙර ශබ්ද, මුතිඞ්ග ශබ්ද, දවුල් ශබ්ද, ආදී ශබ්ද සමූහයක් ධම්මසඞ්ගණියෙහි දක්වේ.

3. ගන්ධ රූපය : නැහැයට දැනෙන යම් යම් ගඳ-සුවඳ ගන්ධ රූපයයි. මෙහි ද ප්‍රභේද රාශියකි.

4. රස රූපය : දිවට දැනෙන යම් යම් රස රස රූපයයි. තිත්ත, පැණි, ඇඹුල්, ආදී වශයෙන් ප්‍රභේදගතයි. මේ විෂය රූප අවිනිර්භොගයන්ට අයත්ය. කලාප සම්මර්ශනයේදී වඩාත් පැහැදිලි වෙයි.

භාවරූප ; ස්ත්‍රීභාව රූපය, පුරුෂභාව රූපය, යන දෙකයි. යම් රූපයක් නිසා මේ ස්ත්‍රිය, මේ පුරුෂයා ය යි හැඟීමක් එයිද ඒ රූපය භාවරූපය බව තේරුම් ගතයුතුය. භාවරූපය නිසා ම ස්ත්‍රී-පුරුෂ භේදය පවතී. මුළු සිරුරෙහි ම භාවරූප ඇතත් ප්‍රකටව පෙනෙනුයේ ඇතැම් කොටස්වල පමණි. දිගු ඇස් මෘදු මුහුණ හා අත්-පා, ලිඟු, පයෝධර යන මේවා ස්ත්‍රීභාව රූපය ප්‍රකටව පෙනෙන ස්ථානය පුරුෂයාගේ නම් දැලි-රැවුළ, ගොරෝසු අත්-පා, ලිඟු ආදිය යි භාවරූපයෙහි රූප කොටස් දහයක් ඇත. අවිනිර්භෝගරූප අට හා ජීවිතින්ද්‍රිය, භාවරූපය, යන දහය යි. "භාවදසක" යනු ද නමකි.

හෘදය රූපය : චිත්ත-චෛතසිකයන්ට ආශ්‍රය වූ ස්ථානය, ඒවා ඉපදීමටත්, පැවතීමටත්, විනාශ වීමටත්, හේතුවන තැන හෘදය රූපය යි. වත්ථුරූප යනු ද නමකි. චිත්ත-චෛතසිකයන්ට වාසස්ථාන වූ හෙයින් වත්ථු නාමය යෙදිණ. යහපත, අයහපත, යන දෙක ම හඳුරණ, පූරන, නිසා "හදය" යන්න යෙදිණ. මේ

රූපය නිසා ම සත්වයෝ යහපත, අයහපත, පුරත්, හඳුරත්, පපුව මැද හෘදය වස්තු වෙහි අඹ පතක් පමණ ලේ වල ඇති, නාමධර්ම පැවතීමේ ශක්තිය වස්තුරූපය බව තේරුම් ගතයුතුය. ඇතැම්හු වස්තු රූපයයි කියා හෘදය වස්තුවෙහි වූ ලේ ඇසුරු ඇසුරු කොට පවතින නාමධර්ම ගනිත්. ඒ නො මැනවි. නාම ධර්ම අනිකෙකි. රූපධර්මය අනිකෙකි. එහෙයින් මෙහිදී සිහි-නුවණ මනාකොට යොදවා වස්තු රූපය හැඳින ගතයුතුය. හෘදය රූපයෙහි රූප කොටස් දහයකි. අවිනිර්භෝග රූප අට ජීවිතින්ද්‍රිය හා වස්තුරූපය යන දහය යි.

ජීවිතින්ද්‍රිය රූපය : රූප ධර්මයන් මැරෙන්නට නොදී පාලනය කෙරෙන යම් ශක්ති විශේෂයක් වේ ද, ඒ ජීවිතින්ද්‍රිය රූපයයි. රූප ධර්මයන්ට අධිපති භාවය-ප්‍රධානකම-දරන නිසා ''ඉන්ද්‍රිය'' යන පදයෙන් විශේෂණ විය. ජීවිතින්ද්‍රිය රූපය නැතහොත් සෙසු රූපධර්ම ද නො පවතී. මේ රූපය බලපවත්නේ කර්මයෙන් හටගත් රූප කෙරෙහිය. ජීවිතින්ද්‍රිය රූපයෙහි රූප කොටස් නවයක් පවතී. අවිනිර්භෝග අට හා ජීවිතින්ද්‍රියත් ය.

ආහාර රූපය : රූපයනට ජලය හා පොහොර දැමීම සිදුවනුයේ ආහාර රූපයෙනි. ගස් වැල්, බීජ බීජ, අග්ගබීජ, ආදී මූලබීජයෙන් හටගත් නමුදු ජලය හා පොහොර නො මැති වුවහොත් ඒවා මැරීයයි. එමෙන් කර්මාදීයෙන් හටගත් රූප ද ආහාර රූපය නැති වුවහොත් මැරී යයි. නො පවතියි. ආහාර රූපය කොටස් දෙකකි වස්තු, ඕජා, යනුයි. ඕජා ආහාර රූපය කර්මාදීයෙන් ද හටගනී. වස්තුවෙන් ද උපදවයි. වස්තු ආහාර රූපයෙන් කෙරෙනුයේ ඕජ ආහාර රූපය ඉපදවීම පමණි. එයට රූප පාලනය කිරීමේ ශක්තියක් නැත. මේ ආහාර රූප දෙක මැනවින් තේරුම් ගතයුතුය.

“කතමං තං රූපං කබළීකාරො ආහාරො? ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං ඛීරං දධි සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං යං වා පනඤ්ඤම්පි අත්ථිරූපං යම්හි යම්හි ජනපදෙ තෙසං තෙසං සත්තානං මුඛාසියං දන්තවිඛාදනං ගලජ්ඣොහරණීයං කුච්ඡිවිත්ථම්භනං යාය ඔජාය සත්තා යාපෙන්ති ඉදං තං රූපං කබළීකාරො ආහාරො”- ධ. සං. ප.

බුදුරජාණන් වහන්සේ ආහාර රූපය දෙසූ අයුරුයි මේ. පිඬු කොට ගනු ලබන ආහාර රූපය නම් කවරේද? බත්, පිට්ටු, අත් සුණු, මාළු, මස්, කිරි, දීකිරි, ගිතෙල්, වෙඬරු, තෙල්, මීපැණි, පැණි, යම් යම් ජනපදයන්හි ඒ ඒ සත්ත්වයන්ගේ මුඛයෙන් කෑයුතු, දතින් විකිය යුතු, ගලනාලයෙන් ගතයුතු, කුස පිරෙන අනිකුදු යම් (ආහාර) රූපයක් ඇද්ද, යම් ඔජාවක් නිසා සත්ත්වයෝ යැපෙත් ද, ඒ රූපය ආහාර රූපයයි. මෙහි ප්‍රධාන ආහාර වශී දෙමළා ඇකි. ගිතෙල් ආදී ද්‍රව-වැගිරෙන-ආහාර පිඬුකොට නො ගත හැකි වුවත් ඔජා රූපය උපදවන හෙයින් කබලීකාර ආහාරයැයි හැඳින්වූහ. මෙසේ ආහාර රූපය වස්තු ඔජා වශයෙන් දෙවැදෑරුම් ය. ආහාර රූපය අවිනිර්භෝග රූපයන්ට අයත් එකකි.

## පරිච්ඡේදරූපය:

රූප ධර්මයන් අතර ඇති අවකාශ = ඉඩ - ගතිය පරිච්ඡේද රූපයයි. මෙය නො මැති නම් රූප මේ මේයයි තේරුම් නො ගත හැකිය. එසේම කලාප-මිරි-වශයෙන් ද වෙන්කරගත නො හැකිය. ආකාස ධාතු නම් වූ පරිච්ඡේද රූපය සෙසු රූපවලින් වෙන්වූවකි. එසේම අසවල් රූපයයි කියාගතයුතු රූපයක් නොමැත. එය රූප මාත්‍රයකි "කතමං තං රූපං ආකාස ධාතු? යො ආකාසො ආකාසගතං අඝං අඝගතං විවරො විවරගතං අසම්ඵුට්ඨං චතූහි මහාභූතෙහි ඉදං තං රූපං ආකාස ධාතු" ආකාස රූපය හැඳින්වූ අයුරුයි මේ. ආකාස රූපය නම් කවරේද? යම් අහසක්, අහස් බවට ගිය බවක්, හිස්, හිස් බවට ගිය, විවරයක්, විවර බවට ගිය, මහාභූත සතරෙන් ස්පර්ශ නොවූ දෙයක් ඇද්ද ඒ ආකාස රූපය නම්. මෙසේ ආකාශ රූපය යනු රූප වෙන්කිරීම් මාත්‍රයකි.

## විඥප්තිරූප:

විඥප්ති රූප දෙකකි, කාය-විඥප්ති. වචී විඥප්ති යනුයි. මෙහි විඥප්ති නම් හැඟවීමයි. සිතින් පහළවූ අදහසක් හැඟවීමට දෙතැනක් උපකාරවෙයි එනම් සිරුර හා වචනයයි. එහෙයින් ඒ දෙතැනින් හැඟවීම විඥප්ති දෙකෙක් කියැවේ. මේ රූප දෙක ම සිතින් හටගන්නේය. මේ රූප දෙක නිසා අන්‍යයෝ තම අදහස තේරුම් ගනිත්.

"කතමං තං රූපං කායවිඤ්ඤත්ති? කුසලචිත්තස්ස වා අකුසලචිත්තස්ස වා අව්‍යාකතචිත්තස්ස වා අභික්කමන්තස්ස වා පටික්කමන්තස්ස වා ආලොකෙන්තස්ස වා විලොකෙන්තස්ස වා සම්මිඤ්ජෙන්තස්ස වා පසාරෙන්තස්ස වා කායස්ස ථම්භනා සන්ථම්භනා සන්ථම්භිතත්තං විඤ්ඤත්ති විඤ්ඤාපනා විඤ්ඤාපිතත්තං ඉදං තං රූපං කායවිඤ්ඤත්ති"

කායවිඤ්ඤත්තිරූපය නම් කවරේද? කුසල - අකුසල - අව්‍යාකෘත සිත් ඇත්තහුගේ හෝ ඉදිරියට යෑම - පෙරලා ඒම - ඉදිරි බැලීම් - අවට බැලීම - අත් - පා හැකිලීම - දිගහැරීම ඇත්තහුගේ ශරීරයේ පිම්බීම පිම්බෙන ගතිය, පිම්බුනු බව, හැගවම. හැගවීම් ගතිය, හැගවූ බව යන මේ ආදියක් ඇද්ද. ඒ කායවිඤ්ඤත්ති රූපයයි. කයින් කරනු ලබන සියලු ක්‍රියා කායවිඤ්ඤත්ති බව තේරුම් ගතයුතුය. එසේම වචනයෙන් කියනු ලබන සියලුද වචීවිඤ්ඤත්තියි. මෙසේ විඤ්ඤත්ති රූප දෙකකි-

## විකාරරූප:

විකාර රූප තුනකි. ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යනුයි. මෙහි විකාර යනු විශෙෂ ආකාරයයි. වෙනස් වශයෙන් පෙනෙන අයුරුයි. රූපයන්ගේ සැහැල්ලුබව, බර අඩු ගතිය, ලහුතා රූපයයි මොලොක් ගතිය මුදුතා නම්. වැඩෙහි යෙදවීමට හැකි ගතිය, නො මැලවුනු සවභාවය කම්මඤ්ඤතා රූපයයි.

## ලක්ඛණරූප:

මේ රූප සතරෙකි. උපචය, සන්තති, ජරතා, අනිච්චතා යනුයි. රූපයන් ගේ හැටි දක්වන රූප ලකඛණ රූප නම්, රූපයන්ගේ ඉපදෙන ගතිය උපචය රූපයයි පවතින ගතිය සන්තති රූපයි.දිරා පත්වීම ජරතා රූපයයි. විනාශවීම අනිච්චතා රූපයයි මෙසේ ඉපදීම, පැවතීම, දිරායෑම විනාශය යන ලක්ෂණ සතර රූපයන් කෙරෙහි පවතින හෙයින් රූප සතරක්ලෙස හැඳින්වූහ. පරිච්ඡේද රූපයේ සිට දක්වූ දස රූපයෝ අනිෂ්පන්න රූපයෝ එසේම අරූපරූපයෝයි.

මෙසේ ජීවිතෂෂ්ඨි කියා පෙනෙනුයේ මහාභූත සතර හා උපාදය රූප සූවිස්ස යන අටවිසි රූපයෝයි අටවිසි. රූපයන්ගෙන් වෙන්ව පෙනෙන්නාවූ සත්වයෙක් නො මැත. මේ සියලු රූප

අතීතාදී කාල තුන වශයෙන් ගත් කල හා තමා පිළිබඳ අනුත් පිළිබඳ වශයෙන් ගත් කල ද රාශියකි. එහෙයින් රූපස්කන්ධයැයි දේශනා කළහ.

“තත්ථ කතමො රූපක්ඛන්ධො? යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා තදෙකජ්ඣං අභිසඤ්ඤුහිත්වා අභිසංඛිපිත්වා අයං වුච්චති රූපක්ඛන්ධො” – වි. ප.

එහි රූපස්කන්ධය නම් කවරේද? තමා පිළිබඳ හෝ අනුන් පිළිබඳ හෝ ගොරෝසු හෝ සියුම් හෝ ලාමක වූ හෝ ප්‍රණීත වූ හෝ දුර හෝ ළංවූ හෝ අතීත අනාගත, වර්තමාන යන කාලත්‍රයට අයත් යම්කිසි රූපයක් ඇද්ද, ඒ සියල්ල එකතුකොට රූපස්කන්ධයැයි කියනු ලැබේ. මෙසේ බෙදීම් බවට ගිය රූප රාශිය රූපක්ඛන්ධ නමි.

## 2. වේදනාස්කන්ධය

“වෙදයිතීති වෙදනා” විඳිනු ලැබේනුයි වේදනා නම්. කර්ම කාරක ක්‍රියාවෙන් සෑදුනු ශබ්දයක් නිසා මෙහිලා සලකනුයේ විඳීම ම වෙදනා යනු කියයි. මිනිසා විසින් කනු ලබන ආහාරයට “භොජන” නාමය යෙදීම මෙනි. (භුඤ්ජියතීති භොජනං – අනුභව කරනු ලැබේනුයි භෝජන නමි. කවරෙක්ද? ආහාරයයි. කවරෙකු විසින් ද? මිනිසා විසින්ය) විඳිනු ලබන්නේ කුමක්ද? වේදනායි. මෙහි විඳින පුද්ගලයා ප්‍රකාශ නො වෙයි. විඳින දෙයම ප්‍රකාශවෙයි. කර්මකාරක ක්‍රියාවන්ගේ අයුරැයි ඒ එහෙයින් කව රෙකු විසින් හෝ විඳි ලබන දෙය වෙදනා නමි.

පඤ්චස්කන්ධය විමසන විදර්ශකයාට අවශ්‍ය වනුයේ තමා විඳින වේදනා සමූහයයි මෙය නාමස්කන්ධයට අයත් හෙයින් අරූපිය නො පෙනේ. එහෙත් දැනේ. වෙදනාව ගැන අවබෝධ යක් ඇතිවීමට සිත ගැන දැනුමක් අවශ්‍යය ඒ සිතවූ විඤ්ඤාණස්කන්ධය මතුවට විස්තර වෙයි.

වෙදනාව විඳීම් අර්ථයෙන් එකක් වුව ද ආකාර වශයෙන් බෙදීම් බවට යෙයි ප්‍රධාන වශයෙන් වෙදනාව දෙ වැදෑරුමය. දුක්ඛවෙදනා සුඛවෙදනා යනුයි. නපුරු ලෙස වැටහෙනුයේ දුක්ඛ වෙදනායි. යහපත් ලෙස වැටහෙනුයේ සුඛවෙදනායි. කයෙහි

හෝ සිතෙහි හෝ මේ වේදනාව උපදින නිසා කායික, මානසික, වශයෙන් ද දෙවැදෑරුම්ය. ශරීරය නිසා උපදින දුක්ඛ වෙදනාව නිරයෙහි ප්‍රකටය. සුඛ වෙදනාව දෙව්ලොව ප්‍රකටය. අනිෂ්ටාරම්මණය-නමා කැමති නැති අරමුණ-හමුවීමෙහිදී සිතෙහි උපදින දුක්ඛ වෙදනාව දනෙයි. ඉෂ්ටාරම්මණ හමුවීමෙහිදී සුඛ වෙදනාව ප්‍රකට වෙයි. සෙසු අවස්ථා මේ අනුසාරයෙන් සිතාගත යුතු. මෙසේ සුඛ, දුක්ඛ වශයෙන් වෙදනාව දෙවැදෑරුම්ය.

සුඛ, දුක්ඛ, උපෙක්ඛා වශයෙන් තෙවැදෑරුම්ය. මෙහි සුඛ, දුක්ඛ, වෙදනා දෙකට මැදිවූයේ උපෙක්ඛා වෙදනායි මෙය ද කායික මානසික වශයෙන් දෙවැදෑම්ය. තවද කුසල, අකුසල අව්‍යාකත වශයෙන් වෙදනාව තෙවැදෑරුම්ය. කුසල් සිත්හි, යෙදුනු වෙදනාව කුසල වෙදනාවයි. අකුසල් සිත්හි යෙදුනේ අකුසල වෙදනාවයි. විපාක, ක්‍රියා සිත්හි වූ වේදනාව අව්‍යාකත වෙනදනාවයි.

සුඛ, දුක්ඛ, සොමනස්ස, දෙමනස්ස, අදුක්ඛම සුඛ වශයෙන් වේදනාව පඤ්චවිධය. මෙහි අදුක්ඛමසුඛ යනු උපෙක්ඛා වෙදනාවමැයි. සිතෙහි උපදින, මානසික වශයෙන් පවතින සුඛ වෙදනාව සොමනස්ස නාමය ලබයි. එහි ම දුක්ඛ වෙදනාව දෙමනස්ස නම්, ඒය වෙනස.

වෙදනාව, චෛතසික සංග්‍රහයේදී සෑම සිතකම උපදින චෛතසිකයක් වශයෙන් ගත් හෙයින් එකුන් අනූ (89) වැදෑරුම් වෙයි. (වෙදනාව සබ්බචිත්ත සාධාරණ චෛතසිකයෙකි.) අසූ නව වැදෑරුම් වෙදනා ඉහතකී පඤ්චවිධ වෙදනාවන්ට සංග්‍රහ වෙයි-ගොණු වෙයි. අහේතුක සිත් අතර අකුසල විපාක වූ දුක්ඛ සහගත කාය විඤ්ඤාණය දුක්ඛ වෙදනායි. එහිම වූ කුසල විපාක සුඛ සහගත කාය විඤ්ඤාණය සුඛ වෙදනායි. පටිඝ සම්පයුක්ත සිත් දෙකෙහිවූ වෙදනාව දෙමනස්ස වෙදනාවයි,

සොමනස්ස වෙදනාව: ලෝභ මූලික අකුසල් සිත් සතර, කාමාවචර ශොභන සිත් දොළොස, සුඛ සන්තීරණ, හසන, පඤ්චම ධ්‍යානය හැර, ලෝකෝත්තර ධ්‍යානත් සමග සිත් සූසාලිස. (44) යන සිත් දෙසැටෙහි (62) පවතී. මෙහිදී සිත් ගිනූයේ එක්සියවිසි වැදෑරුම් ක්‍රමයට ය. එවිට ලෝකෝත්තර සිත් සතලිසෙකි. ඒ ධ්‍යාන ක්‍රමයෙනි. එහින් පඤ්චම ධ්‍යාන සිත් විසිතුන හැරග,

උපෙක්ඛා වේදනාව: ඉතිරි සිත් පස් පණස ම්ට ඇතුළත්ය. එනම් අකුසල් සිත් සය, (ලෝභ මූලික 4, මෝහ මූලික 2 යි) අහේතුක සිත් තුදුස (14), කාමාවචර සිත් (ශෝභන) දොළොස පඤ්චමධ්‍යාන සිත් විසිතුන, (අරූපාවචර 12 ක් සමග) යන පස් පණසයි,

“සුඛමෙකත්ථ දුක්ඛඤ්ච - දොමනස්සං ද්වයෙ ඨිතං
ද්වාසට්ඨිසු සොමනස්සං - පඤ්චපඤ්ඤාසකෙතරා”-අ. සං.

සුඛ වේදනා එකෙකි. දුක්ඛ වේදනාවත් එසේමය. දොම්නස්ස වේදනාව සිත් දෙකකි. සිත් හැටදෙකෙහි සොම්ණස්ස වේදනාවේ සිත් දෙකකි. සිත් හැටදෙකෙහි සොමනස්ස වේදනාවා ඉතිරි පස් පණස උපෙක්ඛා වේදනාය යනු එහි අදහසයි.

මේ සියලු වේදනා අතීතාදී වශයෙන් ගත් කල රාශියකි. එහෙයින් වේදනාස්කන්ධයැයි කියනු ලැබේ. වේදනාස්කන්ධය නාමස්කන්ධයට අයත් බව සිහිකටයුතු.

## 3. සඥාස්කන්ධය

සඥා යනු හැඟීමයි. හැඟීම් රාශියක් සිතක පවතින හෙයින් ඒ සියල්ල සමූහ කොට සඥාස්කන්ධයැයි කියනු ලැබේ. මේ හැඟීම් රාශිය ප්‍රධාන වශයෙන් ත්‍රිවිධය. කුශල, අකුශල, අව්‍යාකෘත යනුයි. වේදනා රාශිය සේ සියලු සිත් මේ තෙවැදෑරුම් හැඟීම්වලට ඇතුළත්ය. තවද, සඥා ඉපැදෙන ද්වාරයන්ට ගෝචරවන, අරමුණු වශයෙන් සය වැදෑරුම්ය. රූපසඤ්ඤා, සද්දසඤ්ඤා, ගන්ධසඤ්ඤා රසසඤ්ඤා, ෆොට්ඨබ්බසඤ්ඤා, ධම්මසඤ්ඤා යනුයි. සියලු වර්ණ රූපය රූපසඤ්ඤායි. ශබ්දාදීය ද එසේමය. ඉතිරි හැඟී සියල්ල ධම්මසඤ්ඤායි.

මේ සඤ්ඤාස්ඛන්ධයයි.

## 4. සංස්කාර ස්කන්ධය

රැස් කිරීම සංස්කාරයි. “සඞ්ඛතමභිසංඛරොන්තීති ඛො භික්ඛවෙ තස්මා සංඛාරාති වුච්චන්ති” මහණෙනි, රැස් කරණ හෙයින් සංඛාර යැයි කියනු ලැබේ නාමධර්මයන් අතුරෙන් විඤ්ඤාණය වූ සිත හා එහි යෙදුණු වේදනා, සඤ්ඤා; හැර ඉතිරි සියලු චෛතසික ධර්ම සංස්කාරයන්ට අයත් ය. සියල්ල

සම පණසෙකි. (50) මොවුහු අතීතාදි එකොළොස් වැදෑරුම් බවට පත්ව මෙන් පිඬුකොට සංස්කාරස්කන්ධයැයි කියනු ලැබේ,

සම්පණස් චෛතසික: සබ්බචිත්ත සාධාරණ පස, (වේදනා, සඤ්ඤා, හැර) ප්‍රකීර්ණක සය, යන එකොළොස අන්‍යසමාන චෛතසිකයි. අකුසල චෛතසික තුදුසෙකි. කුසල චෛතසික පස්විස්සෙකි. එයින් එකුන් විස්සක් සෝභන සාධාරණයි. තුනක් විරතියි. දෙකක් අප්පමඤ්ඤායි. ප්‍රඥා චෛතසිකයත් සමග සියල්ල සංස්කාරස්කන්ධයි

**සබ්බචිත්ත සාධාරණ පස:**

1. **ඵස්ස:** ස්පර්ශ - හැප්පීම - යි "ඵුසතීති ඵස්සො" හැප්පෙනුයේ ඵස්ස නමි. හැප්පීම ඉතා ම සියුම්ය. රූපකාණ්ඩයෙහි දක්වූ ඵොට්ඨබ්බ රූපය වශයෙන් එන පඨවි, තේජෝ, වායෝ, යන භූත රූප තුන හැප්පෙන්නා සේ ගොරෝසු නොවේ. බිත්තියක අවුත් වැදෙන සූර්ය රශ්මිය මෙන් ඉතා සියුම් ය. මෙය ඇස, කණ, දිව, නැහැය, සිරුර, සිත, යන දොරටු ඇසුරෙන් උපදින සිත් වශයෙන් ගත්කල සය වැදෑරුම්ය, චක්ඛු සම්ඵස්සය, සෝත-ඝාණ-ජිව්හා-කාය - මනෝසම්ඵස්සය, යනුයි. ඇසට රූපයක් හමු වූ විට ඒ හමුවූ බව සිත දැන ගනියි. සිත ඇස කරා නැඹුරු කරන් ම ඒ කරුණු තුන එක්වීම නිසා ඵස්සය හටගනී "චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො" ඇස හා රූපය නිසා චක්ඛු විඤ්ඤාණය (ඇසෙහි උපදින සිත) උපදියි. ඇස, රූපය. සිත, යන තුන ම එක් වූ විට ඵස්සයයි

2- චේතනා: පිළියෙල කිරීමයි. කුසලාදි වශයෙන් උපදිනු ලබන සිතකට මේ මේ චෛතසිකයන් අවශ්‍යයයි ඊට අවශ්‍ය චෛතසික (සම්ප්‍රයුක්ත ධර්ම) පිළියෙල කරනුයේ චේතනා චෛතසිකයයි. සමූහයක් වැඩ කරන කුඹුරක කුඹුරු හිමියා මෙනි. කුඹුරු හිමියා තමා ද එහි යෙදෙමින් උදව්කරුවන් ද යොදවයි. එමෙන් චේතනා චෛතසිකය ද තමාත් යෙදෙමින් ඊට අවශ්‍ය සෙසු චෛතසිකයන් යොදවයි. ඉදිරියට විපාක දෙන "කර්ම" වශයෙන් එනුයේ මේ චෛතසිකය යි. කුශල් සිත්හි යෙදුණොත් කුසල කර්ම, අකුසල් සිත්හි යෙදුණොත් අකුසල කර්ම, ඒවාට අවශ්‍ය ශ්‍රද්ධාදිය හෝ ලෝභාදිය පිළියෙල කරයි. "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි" මහණෙනි, චේතනාව කර්මයැයි මම කියමි." යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාළ එහෙයිනි. චේතනාව නොයෙදුනහොත් කර්මය නොවෙයි.

3. ඒකග්ගතා: එකඟකම යි සිතත් චෛතසිකත් ගත් අරමුණෙහි ම යෙදනුයේ මෙම චෛතසිකය නිසාය. කුශල අකුශල, දෙකෙහි ම මෙය යෙදේ. කාමාවචර කුසලයෙහිදී සාමාන්‍ය වශයෙන් ද, රූපාවචර, අරූපාවචර කුසලයන්හිදී ධ්‍යානාඞ්ගයක් වශයෙන් ද, ලෝකෝත්තර කුසලයන්හි දී මාර්ගාඞ්ගයක් වශයෙන් ද ඉදිරිපත් වෙයි. අකුසල් සිත්හි යෙදෙනුයේ ද සාමාන්‍ය වශයෙනි. වැඩිවේලාවක් නො වේ.

4. ජීවිතින්ද්‍රිය: අරූප ධර්මයන් මැරෙන්නට නො දී පාලනය කෙරෙනුයේ ජීවිතින්ද්‍රියෙනි. රූපධර්මයන් පාලනය කෙරෙණුයේ රූපජීවිතින්ද්‍රියෙනි මෙය චෛතසිකයක් නිසා අරූපි ධර්මයකි,

5. මනසිකාරය: මෙනෙහි කිරීමයි. නැවත නැවත අරමුණු කරාම සිත හා සිතුවිලි මෙහෙය වනුයේ මෙම චෛතසිකයෙනි. මනසිකාරය සාරථියෙකු මෙනි. කුශලයෙහිදී එය යෙදිය යුත්තේ යෝනිසෝ මනසිකාර වශයෙනි. දුර්වලවීම නිසා අයෝනිසෝ මනසිකාර වශයෙන් යෙදේ. කුශල් කරද්දී එය ම අකුසලයට හැරෙනුයේ එහෙයිනි. ඒ නිසා මෙහිදී පරිස්සම් විය යුතු මනසිකාරය සමඟ ම නුවණක් යෙදූ විට යෝනිසෝ මනසිකාරයයි. මෝඩකම යෙදුනු විට අයෝනිසෝ මනසිකාරය යි.

මෙසේ සබ්බචිත්ත සාධාරණ චෛතසික පසෙකි.
ප්‍රකීර්ණක චෛතසික සය

විතර්ක, විචාර, අධිමෝක්‍ෂ, වීර්‍ය, ප්‍රීති, ඡන්ද, යන සය යි. මෙයින් විතක්ක, විචාර, පීති, විරිය, සතර ධ්‍යාන විස්තරයේදී දැක්විණ. (සමාධිභාවනාමය ඤාණය බලන්න.)

අධිමොක්ඛ: සිත හා සිතුවිලි එක් අරමුණක සෙලවීමට නොදී ස්ථිර ලෙස පිහිටවනුයේ අධිමොක්ඛය යි. ඒකග්ගතා නො වේ. මෙහි ඇත්තේ නො සෙල්වෙන ගතිය පමණි. මෙය දෙපස් විඤ්ඤාණයන්හි හා විචිකිච්ඡා, යන සිත් එකොළොසෙහි යෙදේ. (දෙපස් විඤ්ඤාණ; අහේතුක සිත්හි වූ කුශල විපාක වූද අකුසල විපාක වූ ද උපෙක්ඛා සහගත චක්ඛු - සෝත - ඝාණ - කාය, යන සිත් දසය යි.)

ඡන්ද: කැමැත්තයි, යමක් ඇල්ලීමට අත දිගුකරන්නාක් මෙන් පවතින සිතුවිල්ල ඡන්ද නමි. ලෝභය නො වේ, කරනු කැමති බව පමණි. මෙය මෝහ මූලික සිත් දෙක හා අහේතුක අටළොස යන සිත් විස්ස හැර ඉතිරි සිත් එකුන් සැත්තෑවෙහි (69) ම යෙදේ.

කුසලාකුසල දෙකෙහිම යෙදෙන හෙයින් ප්‍රකීර්ණක නම්.

## අකුශල චෛතසික තුදුසෙකි. (14)

**මෝහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච, ලෝභ, දිට්ඨි, මාන, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, ථීන, මිද්ධ, විචිකිච්ඡා යනුයි.**

1. මෝහය මෝඩකම යි. අරමුණෙහි ඇති නියම අයුරු වටහා ගැනීමට අවහිර කරනුයේ මෝහයෙකි. අභිධර්මයෙහි එන සය වැදෑරුම් නීවරණ අතුරෙන් සය වැනි නීවරණය අවිජ්ජා නම් වූ මෝහය යි. කුශල්, ධ්‍යාන, මාර්ග, අනුරා වසා ගෙන ඇති බැවින් නීවරණ යි. මෙය සියලු අකුශල් සිත්හිම යෙදෙත්තේ ය. සසර මූලික ධර්මයෙකි.

2. අහිරිකය: හිරියනු ලජ්ජාවට නමකි. ලජ්ජා නැත්තේ අහිරික යි. පවට ලැජ්ජා නැති ගතිය මෙයින් කියැවේ. අශූචි යෙහි ඌරා මෙනි. දොළොස් අකුසලයන්හි ම යෙදේ.

3. අනොත්තප්පය: ඔත්තප්ප නම් බිය ගතියයි. බිය නැතියේ අනොත්තප්ප යි. මේ නිසා පවට බිය නො වෙයි. ගින්නෙහි පළ ගැටියා මෙනි. සියලු අකුසල් සිත්හි යෙදේ.

4. උද්ධච්චය: සිතෙහි විසුරුණු ගතිය යි. නීවරණ දක්වූ තැන විස්තර කෙරිණි. සියලු අකුසල් සිත්හි යෙදේ.

5 ලෝභය: ඇලීම යි. ආශාව, තණ්හාව, යනාදී නාමයන්ගෙන් කියැවෙනුයේ ද මේ ලෝභ චෛතසිකය යි. සමුදය සත්‍යයත් මෙයමැයි සසර මූලික ධර්මයෙකි. සත්වයා භවයක් පාසා ගමන් කරවනුයේ ලෝභයත් මෝහයත් දෙදෙනා විසිනි. මෙය ලෝභ මූලික අකුශල් සිත්හි යෙදේ.

6. දිට්ඨිය: වරදවා දැකීම, අරමුණ වරදවා දක්වනුයේ දිට්ඨි යෙකි. මිරිඟුව ජලය සේ දැකීම මෙනි. මෙය අහේතුකාදී නියත මිථ්‍යාදෘෂ්ටියකට අසුවූවහොත් ඉතා දරුණු වෙයි. දිට්ඨියට හාත් පසින් ම විරුද්ධ වූ සම්මාදිට්ඨිය ශෝභන චෛතසිකයන්හි පඤ්ඤා නාමයෙන් එයි. අකුසල් සිත්හි දිට්ඨිසම්පයුත්ත සිත්හි පමණක් යෙදේ.

7. මානය: මාන ගැනීම යි. තමා උසස් හෝ පහත් හෝ කවර අයුරකින් හමුත් මැනගනියි නම් ඒ කරනුයේ මේ මාන චෛතසිකයෙකි. මෙය නව වැදෑරුම්ය. දිට්ඨිවිප්පයුත්ත අකුසල් සිත්හි මානය ඇති විටෙක පමණක් යෙදේ

8. දෝසය: කිපෙන ගතිය යි. සපිතෙකුට දණ්ඩකින් ගැසුමක් මෙනි. මෙය මෛත්‍රී කම්ස්ථානයේදී විස්තර කෙරිණ. ද්වේෂ මූලික අකුසල් සිත්හි යෙදේ.

9. ඉස්සා: අනුන් ගේ සම්පත් නො ඉවසන, කැමති නො වන ගතිය ඉස්සා නම්. ඊර්ෂ්‍යාවයි මේ.

10. මච්ඡරිය: තමා ගේ සම්පත් සඟවන ස්වභාවය යි, ලෝභයා නොවේ තමා ගේ සම්පත් අනුනට නො පෙනෙන නො දැනෙන සේ සඟවා තැබීමේ සිතුවිල්ලයි. ත්‍යාගයට නැත් පසිත්ම සතුරැකම දක්වනුයේ මේ චෛතසිකය යි.

11. කුක්කුච්චය: විප්‍රසාරය යි. කළ පව් ගැන ද, නො කළ පින් ගැන ද, සිතා පසු තැවීම සිදු කරනුයේ මෙයිනි. ඉස්සා මච්ඡරිය, කුක්කුච්ච, මේ චෛතසිකත්‍රය දෙෂසහගත සිත් දෙකෙහි පමණක් ඒවා ඇතිවිටකදී යෙදේ. අනියත යෝගී වෙති.

12, 13, ථින මිද්ධ: මේ චෛතසික දෙක නීවරණ දැක් වූ තැන විස්තර කෙරිණ. සිතෙහි මැලිගතිය ථිනය යි චෛතසික යන් ගේ පසු බැසීම මිද්ධය යි. මොව්හු සසංඛාරික සිත්හි යෙදෙත්.

14. විචිකිච්ඡා: මෙය ද නීවරණයෙක් සි බුද්ධාදීන් කෙරෙහි සැක කිරීමයි. මෝහ මූලික විචිකිච්ඡා සම්පයුත්ත සිතෙහි පම ණක් යෙදේ.

මෙසේ අකුසල චෛතසික තුදුසෙකි.

කුශල චෛතසික අතුරෙන් ශෝභන සාධාරණ චෛතසික, එකුන් විස්සකි. (19)

සද්ධා, සති, හිරි, ඔත්තප්ප, අලෝභ අදෝස, තත්‍රමජ්ඣත්තතා, කායපස්සද්ධි, චිත්තපස්සද්ධි; කායලහුතා, චිත්තලහුතා. කාය මුදුතා, චිත්තමුදුතා, කායකම්මඤ්ඤතා, චිත්තකම්මඤ්ඤතා, කායපාගුඤ්ඤතා, චිත්තපාගුඤ්ඤතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා, යනුයි

1. සද්ධා: පැහැදීමයි. බුද්ධාදි රත්නත්‍රය ගුණ දැන, සිතා, ඊට පැහැදීම යි. ශ්‍රද්ධා නමි. එහි ස්වභාවය එක්ව යෙදුනු සෙසු චෛතසික පහදවන; ගත් අරමුණෙහි ම යොදවන, එයම උපන් ලෙස සැලකීමයි. ඒ සමඟ ම සිත පිරිසුදු කරයි. සක් විති රජු ගේ උදක ප්‍රසාදක මාණික්‍ය රත්නය මෙනි. ඒ මැණික

බොර වූ ජලයෙහි බහාලූ කල පිරිසුදු ජලය බවට පත් වෙයි ශ්‍රද්ධාව ද, සිතක යෙදුනු කල ද්වේෂාදී පාපධර්ම අස්කර, පිරිසුදු කරයි. එසේ ම සියලු පාපධර්මයන් යටපත් කරමින් ඉදිරියට යන ගතියක් ද ශ්‍රද්ධායෙහි ඇත. ඒ සම්පක්ඛන්ඛන ලක්‍ෂණය යි. දුනිමෝරු, කිඹුලුන් වැනි නපුරු සතුන් සිටින ජලාශයකින් මිනිසුන් එතෙර කරවන, කඩුගත් වීර පුරුෂයෙකු මෙනි. ශ්‍රද්ධාව ඉන්ද්‍රිය, බල, නාමයෙන් ද එයි.

2 සති: සිහි කිරීම යි. අකුශල් මේ ය, කුශල් මේ ය, මේ වශයෙන් සිහි කරවන ගතිය යි. එසේ ම කුශල් අකුශල් සිහි කොට, අකුශල් දුරුකරමින් සිත කුශල් කරා එලවනුයේ ද, පමුණුවනුයේ ද සිහියෙනි. මෙසේ වැඩ දෙකක් සතිචෛතසික යෙන් සිදු කෙරේ. අපිලාපන, උපගණ්හන, යන ලක්‍ෂණ දෙකයි ඒ. සතිපට්ඨාන, සතින්ද්‍රිය, සතිසම්බොජ්ඣඞ්ගය, සම්මා සති, යනුවෙන් දක්වනුයේ ද සතිය මැයි.

3, හිරි: පාපයට ලජ්ජා ගතිය, කුලකතක් මෙනි.

4. ඔත්තප්ප; පාපයට බිය ගතිය යි. තමාගේ වරද අනුවේය යන හැඟීම. වෙසඟනක් මෙනි. ලොව පාලනය කෙරෙනුයේ මේ හිරි ඔතප් දෙකෙනි. දෙවධර්ම යනුද නමකි.

5. අලෝභ, නො ඇලීමයි. අරමුණෙහි නොලැගෙන, සවභාවය යි. පරිත්‍යාගය, නෛෂ්ක්‍රම්‍ය, කුශල මූල, මේ වශ යෙන් සඳහන් කරනුයේ ආලෝභ චෛතසිකයයි.

6. අදෙස: නො කිපෙන ගතිය යි. අරමුණෙහි නො නැප්පීම, නොගැටීම, ලක්‍ෂණයි. මෛත්‍රී යනු ද නමකි.

7. තත්‍රමජ්ඣත්තතා: මැදහත් බවයි. අරමුණෙහි සිත මධ්‍යස්ථ කරනුයේ මේ චෛතසිකයෙනි. උපෙක්ඛා යනු ද නමකි. වෙදනා කියූ තැන උපෙක්ඛාව මෙය නො වේ. අනිකකි. ධ්‍යානඞ්ග, බොජ්ඣඞ්ග, වශයෙන් ද එයි.

8; 9, කාය – චිත්ත පස්සද්ධි; මෙහි 'කාය' යනු චෛතසිකයි. චිත්ත යනු සිත යි. සංසිඳීම, නො විසිරීම, පස්සද්ධි යි, චෛතසිකයන්ගේ සංසිඳීම, නො වපුරුණු ගතිය, කායපස්සද්ධි නම්, සිතෙහි සන්සිඳීම චිත්තපස්සද්ධි නම්.

10. 11, කාය-චිත්ත ලහුතා: කාය, චිත්ත, පෙර පරිදිය, බර අඩු බව, සැහැල්ලු ගතිය, ලහුතා නම්.

12, 13, කාය=චිත්ත මුදුතා: මොළොක් බව මුදුතා නම්.

14, 15, කාය - චිත්ත කම්මඤ්ඤතා: වැඩෙහි යෙදවිය හැකි බව කම්මඤ්ඤතා යි. නො මැලවුණු ගතිය, ප්‍රාණවත් බවයි.

16, 17, කාය = චිත්ත පාගුඤ්ඤතා: පුහුණු - ප්‍රගුණ බව යි.
18, 19, කාය - චිත්තුජ්ජුකතා; ඇද නැති බව, සෘජු ගතිය උජ්ජුකතා යි. අවඞ්ක නාමයෙන් එනුයේ මේදෙකයි.

මේ ශෝභන සාධාරණ එකුන් විසි චෛතසිකයෝයි.
විරති ත්‍රය: සම්මා, වාචා, - කම්මන්ත - ආජීව තුනයි.

1- සම්මාවාචා: යහපත් වචනය, සත්‍යය යනුද නමකි. වැරදි වචන වූ බොරුව, කේලම, නපුරු වචන, හිස්වචන, යන සතරින් ම අස්වීමේ අදහස, ඒ පිළිබඳ සිතුවිල්ල. මේ චෛතසිකයෙන් කියැවේ.

2. සම්මා කම්මන්ත; යහපත් වැඩ කුසල ක්‍රියා යනුද නමකි. සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, මේ ප්‍රධාන වැරදි තුන ඇතුළත් සෙසු සියලු කායික වරදින් අස්වීමේ අදහස, කුසල් කිරීමේ අදහස, ඒ පිළිබඳ සිතුවිල්ල සම්මාකම්මන්ත නම්.

3. සම්මා ආජීව: යහපත් දිවි පැවැත්ම යි. ඉහත කී කාය- වචන දෙකෙහි වැරදි ලෙස උපැයූ දෑයෙන් හෝ වංචනික, කපටි, මායා, ක්‍රියාවලින් උපැයූ දැයින් හෝ ජීවත් වීමට නො සිතීම, එයින් අස්වීමේ අදහස, දැහැමි ලෙස උපැයූ දෑයෙන් ජීවත් වීමේ අදහස, ඒ පිළිබඳ සිතුවිල්ල, සම්මා ආජීවයයි. මෙය බොරු කීමෙන් වැලකීම ආදී වශයෙන් සත්වැදෑරුම්ය. ගිහියෙකුට නම් ඒවා සහ පස් වැදෑරුම් වැරදි වෙළඳාම, තුලා කූට - මානකූට - කංසකූටාදී වශයෙන් කෙරෙන වැරදි වෙළඳාම් වලින් ද වැලකීමේ අදහස් මෙයට ඇතුළත් වේ. පැවිද්දෙකුට නම් ඉහත කී සත හා ආජීවය සඳහා පණවා වදාළ සවැදෑරුම් සිකපද නොකැඩීම වශයෙන් ද, කුහනා ලපනාදී වැරදි ක්‍රියා - වල් නැගෙන් වෙන්වීම් වශයෙන් ද පැවතිය යුතු අදහස් ඇතුළත් වේ.

මේ විරතීහු තුන් වැදෑරුම්ය. සම්පත්ත විරති, සමාදාන විරති, සමුච්ඡේද විරති, යනුයි. පාපයක් කිරීමට අදහස් වූ අවස්ථාවේදී තමාගේ වයස, තත්වය, ජාතිය, ස්වභාවය, සලකා ''මා වැන්නකු මෙවැනි දෑ කිරීම වැරදිය'' යනුවෙක් සිතා ඒව

සිත් වැලකීමේ අදහස් පහල වූ විට ඒ සම්පත්ත විරතියි. ශික්ෂා සමාදානයෙන් කෙරෙන වැලකීම සමාදාන විරතියි. සෝවාන් ආදී ලෝකෝත්තර මාර්ග - ඵල අවස්ථාවකට පත් වූ පසු සිදුවන සම්පූර්ණ වැලැක්ම සමුච්ඡේද විරති නම්. මේ තන්හිදී චෛතසික ත්‍රයම යෙදේ. සෙසු ලෞකික අවස්ථාවන්හිදී යෙදෙනුයේ වෙන වෙනමය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයේ මාර්ගාඞ්ග ත්‍රයක්ම සම්පූර්ණ වනුයේ මේ චෛතසික නිසාය.

අප්පමඤ්ඤා ද්වය:- කරුණා, මුදිතා, දෙකයි.

ප්‍රමාණයක්, සීමාවක්, නොමැති සත්වයන් වෙත දැක්විය යුතු හෙයින් ''අප්පමඤ්ඤා'' යන්නෙන් මේ චෛතසික දෙක විශේෂණ විය. මේ විශේෂණයෙන්ම කිවයුතු අන්‍ය චෛතසික දෙකකුදු ඇත. එනම් අද්වේෂ නාමයෙන් ආ මෙත්තා, තත්‍රමජ්ඣත්තතා නාමයෙන් ආ උපෙක්ඛා, යන දෙකයි. මේ දෙක ඉහත දී දැක් වූ නිසා අප්පමඤ්ඤා දෙකයැයි සඳහන් විය. කරුණා, මුදිතා, දෙක වෙන් කොට දැක්වෙනුයේ එකට නොයෙදෙන හෙයිනි. මක්නිසාද? කරුණාවට ලක්වනුයේ දුඃඛිතයන්ය මුදිතාවට ලක්වනුයේ සුඛිතයන්ය. එහෙයිනි.

1 කරුණා: අනුකම්පාවයි. දුකට පත්වූවෙකු දුටුවිට සිතෙහි ඇතිවන කම්පනයයි. මෙය බ්‍රහ්ම විහාර භාවනා දැක්වූ තැන විස්තර කෙරිණ. (සමාධි භාවනාමය ඥාණය බලනු.)

2 මුදිතා: මෝදන - සතුටු වන ස්වභාවයයි. සැපවත් කෙනෙකු දුටු විට සිතෙහි උපදින සැනසෙන ගතියයි. මෙය ද බ්‍රහ්ම විහාරයෙකි. ඊර්ෂ්‍යාවට හාත්පසින්ම විරුද්ධය.

පඤ්ඤා: මෙය බලවත් කුශල මූලයක් නිසා වෙන් කොටම දැක්වෙයි. අරමුණෙහි මුලා නොවන ගතිය, ඇති සැටි වටහා ගැන්ම, හාත්පසින්ම අරමුණ දැන ගැනීම සිදුවනුයේ ප්‍රඥායෙනි. සම්මාදිට්ඨි නාමයෙන් එනුයේ මේ චෛතසිකයයි. එසේම සෘද්ධිපාද, ඉන්ද්‍රිය, බල බොජ්ඣඞ්ග, (ධම්මවිචය,) යන ධර්මයන්ට ද ඇතුලත්ය. ප්‍රඥා චෛතසිකය ඥාණසම්පයුත්ත සිත් දොළොස, මහග්ගත ලෝකෝත්තර සිත් පන්තිස (35) යන සත්සාළිස් (47) සිත්හිම යෙදේ.

මෙතෙක් දැක්වූ චෛතසික සම්පර්ශ අනිත්‍යාදී එකොළොස් වැදෑරුම බවට පත්වීම නිසා රාශියක් වේ. එහෙයින් ඒ සැම එක් තැනෙක්හි ලා සැලකීමෙන් සංස්කාරස්කන්ධයැයි කියනු ලැබේ.

# 5. විඤ්ඤාණස්කන්ධය,

සිත් රාශියට නමකි විඥානස්කන්ධය. එහි විඤ්ඤාණ යනු සිතය. "විජානාතීති විඤ්ඤාණං" දැන ගනුයේ විඤ්ඤාණ නමි. කුමක් දැනගනුයේ ද? "ආරම්මණං" අරමුණයි. චක්ෂුරාදි ඉන්ද්‍රිය සයදෙනාට හමුවන අරමුණු මේ මේයයි දැනගනුයේ විඤ්ඤාණ යෙනි. විඥානයෙහි ආරම්භය සංඥාවයි. මධ්‍යය විඥානයි. අවසානය අඥානය හෝ ප්‍රඥාවයි. මූලා වූවහොත් අඤ්ඤාණ නොදැනීමයි. ඇති සැටි දතහොත් පඤ්ඤා - මනා දැනීම-යි. ළදරුවෙකුට රන් කාසියක් ලැබුනොත් හේ "මේ ලස්සන දෙයකැ, යි හැඟීම පමණක් ඉපදවීමට සමර්ථ වෙයි. වටිනා දෙයක් බව නොවැටහෙයි. අරමුණු වලදී සඤ්ඤාව වැඩ කරනුයේ ළදරුවා රන් කාසිය විමසීම මෙනි. ඒ රන් කාසිය ගැමියෙකු දුටුහොත් හේ මේ වටිනා දෙයැකැයි සිත තබයි. එහෙත් "මෙය මෙපමණ වටීය, මෙහි තත්වය මෙබඳුය, මෙය සකස් වූයේ මෙසේය', යනාදි වශයෙන් කීමට සමර්ථ නොවෙයි. අරමුණු වලදී විඤ්ඤාණය වැඩ කරනුයේ එමෙනි. අරමුණු වලදී මේ රූපයක්, මේ ශබ්දයක්, ආදී වශයෙන් දැන ගනීයි, එහෙත් ඇති තතු නොතේරේ. රන්කරුවෙකුට ඒ රන් කාසිය අතට අසුවූ විට හේ එහි සියලු ආකාර දැන ගනියි. "මෙය මෙපමණ වටී, උපන්නේ අසවල් ප්‍රදේශයේ, දුවිලි ආදියෙන් අමිශ්‍රය," මේ ආදී වශයෙන් අවබෝධ කර ගනියි. පඤ්ඤාව කරනුයේ ද එපරිදිමය. මේ අයුරින් සඤ්ඤා, විඤ්ඤාණ, පඤ්ඤා, තේරුම් ගත යුතුය.

විඤ්ඤාණය අතීතාදි එකොළොස් වැදෑරුම් බවට බෙදීයාමෙන් රාශියක් වෙයි. එහෙයින් ස්කන්ධයෙකි. ගොඩකි. වේදනා, සඤ්ඤා, සංඛාර, යන ස්කන්ධත්‍රයම විඤ්ඤාණස්කන්ධයෙහි ඇතුලත් වූවෝය. සිත නැතිව චෛතසික නූපදී එහෙයිනි. ඒ සියලු ස්කන්ධ සිත වූ විඤ්ඤාණය සමගම උපදී. විනාශ වේ. එකම අරමුණෙක පවතී. එක වස්තුවෙක හට ගනී. විඤ්ඤාණයෙහිම යෙදුනෝය කාකාරාගත් කෂායෙහි ජලය මෙනි සිත බෙහෙත් ද්‍රව්‍ය මෙනි චෛතසික.

අරමුණු දැන ගැනීම් වශයෙන් විඤ්ඤාණය එකක් වුවද ජාති, භූමි, ආදී වශයෙන් බෙදීම් බවට යෙයි. ඒ සියල්ල එක්වූ විට එකුන් අනූවක් (89) හෝ එක්සිය විස්සෙක් හෝ (121) වෙයි.

විඤ්ඤාණය ජාති වශයෙන් ත්‍රිවිධ ය. තුන් වැදෑරුම් ය.

"කුසලා ධම්මා, අකුසලා ධම්මා, අව්‍යාකතා ධම්මා"

කුශල, අකුශල, අව්‍යාකෘත, යනුයි. බුදුරජාණන් වහන්සේ අභිධර්ම දේශනා කරද්දී ප්‍රථමයෙන් දක්වූයේ කුශල චිත්තයාණ යයි. මෙම ග්‍රන්ථය උන්වහන්සේගේම ඥාණ විස්තරයක් නිසා දේශනා ක්‍රමයට මුල් තැන දිය යුතුය. එහෙයින් මෙහිදී පළමු කොට කුසල් සිත් දක්වේ.

කුසල් සිත් සියල්ල පස් විස්සෙකි. නැතහොත් සත් තිසෙකි. (ලෝකෝත්තර කුසල් සිත් ධ්‍යාන ක්‍රමයෙන් ගිනූ කල 20 යි. එහෙයිනි සත් තිස වූයේ.

භූමි භේදයෙන් චතුර්විධය. කාමාවචර, රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර, යනුයි. කාම ලෝකයෙහි බොහෝ සෙයින් හැසිරෙන සිත් කාමාවචරයි. රූපාරූප සිත් ද ඒ ඒ ලෝකයන්හි බොහෝ සෙයින් හැසිරෙන නිසා ඒ නාම ලබයි. සියලු ලෝකවලින් එතර වූ, ලෝකයට අයත් නැති, සිත් ලෝකෝත්තර නම්. කාමාවචර සිත් අටෙකි. රූපාවචර පසෙකි. අරූපාවචර සතරෙකි. ලෝකෝත්තර සතරෙකි. සියල්ල එක් විස්සයි. ලෝකෝත්තර සතර ධ්‍යාන පහෙන් ගුණ කළ විට විස්සෙකි. එවිට සියල්ල සත්තිසයි. (37)

## කාමාවචර කුසල් සිත් අට:

මෙවා වේදනා භේදයෙන් දෙවැදෑරුම්ය. එසේම ඥාණ, සඞ්ඛාර, භේදයෙන් ද දෙවැදෑරුම් දෙවැදෑරුම් වෙයි. වේදනා දෙකකි. සොමනස්ස, උපෙක්ඛා, යනුයි. ඥාණ භේද දෙකකි. ඥාණ සම්පයුත්ත, ඥාණවිප්පයුත්ත, යනුයි. සංඛාර භෙද දෙකකි. අසංඛාර සසංඛාර යනුයි. එයින් සතුටු සහිත සිත් සොමනස්ස සහගතයි. සතුටක් නැති අසතුටක් නැති මැදහත් සිත් උපෙක්ඛා සහගතයි. නුවණ යෙදුනේ ඥාණ සම්පයුත්තයි. නුවණ නොයෙදුනේ ඥාණ විප්පයුත්තයි. අනුන්ගේ මෙහෙයීමක් නොමැති, තමාම සිතා බලා ඉපද වූ කුසල් සිත් අසංඛාර නම්. මෙහෙයීමක් ඇතිව ඉපද වූයේ සසංඛාරයි. මෙසේ වේදනා, ඥාණ, සංඛාර, භේදයෙන් කුසල් සිත් අටකි. එ මෙසේ ය.

1 සොමනස්සසහගත ඥාණ සම්පයුත්ත අසංඛාරික සිත.
2 ,, ,, සසංඛාරික සිත.

3 ,, ඥාණ විප්පයුත්ත අසංඛාරික සිත.
4 ,, ,, සසංඛාරික සිත.
5 උපෙක්ඛා සහගත ඥාණ සම්පයුත්ත අසංඛාරික සිත.
6 ,, ,, සසංඛාරික සිත.
7 ,, ඥාණ විප්පයුත්ත අසංඛාරික සිත.
8 ,, ,, සසංඛාරික සිත.

මෙහි සතුටු සිත් ඇතිවීමට හේතු වූයේ ශ්‍රද්ධා , දෙය්‍ය ධර්ම, ප්‍රතිග්‍රාහක, යන වස්තු තුන හමුවීමෙනි. ගුණයට පැහැදීම ශ්‍රද්ධා වෙයි. දිය යුතු, දීමට සූදානම් කරගත් දේ දෙය්‍ය ධර්ම නම්. සුදුසු පුද්ගලයෝ ප්‍රතිග්‍රාහකයෝ – පිළිගන්නෝ – යි. මේ කරුණු තුන අතුරෙන් එකක් නමුදු දුර්වල වුවහොත් මැදහත් බව – උපෙක්ඛා– ඇති වෙයි. කුසල් සිත් ඥාණ සම්පයුත්ත වනුයේ පෙර ආත්ම යන්හි නුවණ දියුණු වනසේ පින්කර ඇති බව බ්‍රහ්ම ලෝක යෙහි ඉපද සිටීම, ශ්‍රද්ධා, සති, ආදී ඉන්ද්‍රිය ධර්ම පස්දෙනා දියුණු කර තිබීම, කෙලෙස් වලින් බොහෝ රදුව දුරුවී සිටිය බව, යන කරුණු නිසාය. පින් කිරීමේ පුරුද්ද, එයටම සිත නැඹුරුවීම, අසංඛාරික වීමට හේතුයි. මේ කරුණු දුර්වල වූ බව, හා අලසකම ඥාණවිප්පයුත්ත, සසංඛාරික වීමට හේතුයි. මෙසේ කාමාවචර කුසල් සිත් අටෙකි.

## රූපාවචර කුසල් සිත් පසෙකි.

අඞ්ග ඉක්මවීම් වශයෙන් පසෙක් වෙයි. අඞ්ග නම් විතර්කාදී හුයි. නිම්වලල්ල, දැවි, ආදිය එක්වූ කල්හි "රෝදය" යි කියන් නාසේ විතර්කාදී අඞ්ග එක් වූ විට ධ්‍යානයැයි කියනු ලැබේ. ධ්‍යාන යනු රූපාවචර කුසල සිත්වලට නමකි. සියලු අඞ්ග පසෙකි. විතක්කාවිචාර, පීති, සුඛ, එකග්ගතා, යනුයි. මෙයින් එක, එක, ඉක්මවා, එකින් එකට උසස් කුසල් සිත් ඉපදවීමෙන් පසෙක් වේ. (සමාධි භාවනාමය ඥාණයෙහිදී ධ්‍යාන හා අඞ්ග විස්තර කැරිණ.) ඒ කුසල් සිත් පස මෙසේය.

1 විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිත පඨමජ්ඣාන කුසල සිත.

2 විචාර පීති සුඛෙකග්ගතා සහිත දුතියජ්ඣාන කුසල සිත.

3 පීති සුඛෙකග්ගතා සහිත තතියජ්ඣාන කුසල සිත.

4 සුඛෙකග්ගතා සහිත චතුත්ථජ්ඣාන කුසල සිත.

5 උපෙක්ඛෙකග්ගතා සහිත පඤ්චමජ්ඣාන කුසල සිත.

## අරූපාවචර කුශල සිත් සතරෙකි.

අරමුණු ඉක්මවීම් වශයෙන් සතරක් වෙයි. අඞ්ග වශයෙන් නම් මේ සතරෙහිම ඇත්තේ පඤ්චමධ්‍යානයෙහි ඇති උපෙක්ඛා, එකග්ගතා, යන අඞ්ග දෙක පමණි. එහෙත් ධ්‍යාන ඉපදවීමට උපකාර කරගත් කසිණ නිමිති, කසිණ අරමුණු නිසා ධ්‍යාන බලයෙන්ම ඒවායේ ගොරෝසුසේ වැටහීම් ගතිය අස් කොට, නැත හොත් ඉක්මවා - කසිණාරම්මණය උගුළුවා – උපද්දුවා - ගත් සියුම් අරමුණු පිළිවෙලින් ඉක්මවීමෙන් ලබාගන්නා අවස්ථා සලකා ගෙන සිත් සතරකට බෙදී ගියේය. එහි පළමු වැනි අවස්ථාව, කසිණයෙන් උගුළුවා ගත් ආලෝකය කැමති තාක් පතුරුවා ඒ සැම තන්හිම කසිණ නාමය අත්හැර අහස යන හැඟීම තබා ගැනීමයි. ඒ අහස අරමුණු කොට උපදවා ගත් කුසල චිත්තය ආකාසානඤ්චායතන නම්. (විස්තර සමාධි භාවනාමය ඥාණයෙහිය.)

දෙවැනි අවස්ථාව, ඒ අහස යන හැඟීම අත්හැර විඤ්ඤාණ යන හැඟීම ඇතිකර ගැනීමයි. එයින් උපදවා ගත් සිත විඤ්ඤාණඤ්චායතන නම්. තුන්වැනි අවස්ථාව, ඒ විඤ්ඤාණා යන හැඟීම අත්හැර, කිසිවක් නැතය යන හැඟීම ඇතිකර ගැනීමයි. ඒ හැඟීම නිසා උපදවන සිත ආකිඤ්චඤ්ඤායතන නම්. සිව්වැනි අවස්ථාව කිසිවක් නැතැය යන හැඟීම් අත්හැර, සැනසුම් ගතිය ගැන සිත තබා ගැනීමයි. (සන්තමෙතං පණීතමෙතං)එයින් උපදවන සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතන නම් එක්වූ විට සියල්ල සතරෙකි.

1 ආකාසානඤ්චායතන කුසල සිත.

2 විඤ්ඤාණඤ්චායතන කුසල සිත.

3 ආකිඤ්චඤ්ඤායතන කුසල සිත.

4 නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත.

## ලෝකෝත්තර කුසල් සිත් සතරෙකි.

මෙවා අවස්ථා භේදයෙන් සතරෙක් වෙයි. ඒ අවස්ථා, කෙලෙස් විනාශ කරමින් නිර්වාණය දක්නා අවස්ථාවයි. ලෝකෝත්තර කුසල් සිත් උපදිනුයේ එක් වරකි. නැවත ඒ කුසල් නූපදී, මක්නිසාද? ඒ සමඟම විපාක සිත උපදින හෙයිනි. අකාලික යන දහම් ගුණය මෙහි ලා සිහිපත් කළ යුතු. තවද හේතුවකි. එක් කුසල් සහකින් විනාශ කළ කෙලෙස් නැවත නූපදින

හෙයිනි. ඉතිරි කෙලෙස්, මුල් කුසල් සිතට විනාශ කිරීමට නො හැකිය. ඒවා විනාශ කරනුයේ ඊළඟ, ඊළඟ, කුසල් සිත් වලිනි. එහෙයින් එක් වරක් පමණක් උපදී. බොහෝ කාලයක සිට පල් වෙමින් පැවත ගෙන එන කෙලෙස් සමූහය එක් වරකින්ම විනාශ කිරීමට නො හැකිය. එහෙයින් අවස්ථා සතරක් විය. කෙලෙස් බල වේගය අවස්ථා සතරින් අහෝසි වෙයි. පහක් හෝ ඊට වැඩිය හෝ නොමැත. මෙයද "සවාක්ඛාත" ගුණයයි.

එහි පළමු වැනි අවස්ථාව සෝවාන් මාර්ග නම්. 'සොතාපත්ති' යනු පාළි වචනයයි. මෙහි "සොත" යනු සැඩ වතුර පහරට නමකි. මෙහිදී එය යෙදුනේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයටයි. සැඩ වතුර පහරට යමක් අසුවුවහොත් එය නවතිනුයේ මහා සමුද්‍රයෙහිය. එසේම යමෙක් සම්පූර්ණ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට අසුවුව හොත්(පත්වූවහොත්) හේ නවතිනුයේ නිර්වාණයෙහිමය. එහෙයින් සැඩ වතුර පහරට බඳු නිසා ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට "සොත" යන්න යෙදිණ. "ආපත්ති" යනු පැමිණීමයි. මේ වචන දෙක එක් වූ විට සොතාපත්ති යි. අදහස. ප්‍රථම වරට ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට පැමිණීම යනුයි. (ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගය සුතමය ඤාණයෙහිදී විස්තර විණි.)

සෝවාන් මාර්ගය උපදනුයේ සක්කාය දිට්ඨිය, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, යන සසර බැඳ තබන, සංයෝජන ධර්ම විනාශ කරමිනි. මාර්ග සිත සමගම නිර්වාණය ද දකියි. කෙලෙස් ඉතිරිව ඇති නිසා ඒ දැකීම පැහැදිලි නැත. එහෙත් සපිරය. ලෞකික කුසල් සිත් මෙන් නොපිරිහෙයි. (විස්තර මතුවටණෑ)

දෙවැනි අවස්ථාව, "සකදාගාමී" නම්. මෙහි අදහස: වරක් හැරී එනුයේ යනුයි. සකිං ආගාමි = සකදාගාමි. මෙහිදී නැවත වරක් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට පැමිණීම සිදුවේ. එවිට කාමරාග, පටිඝ, දෙක්ම තද ගතිය ප්‍රහීණ වේ. දෙවැනි වරටත් නිර්වාණය අරමුණු වේ, පෙරට වඩා පැහැදිලිව පෙනෙයි. ඊළඟට තුන්වැනි අවස්ථාව අනාගාමී මාර්ගයයි. අනාගාමී යන්නෙහි අදහස උප්පත්ති වශයෙන් කාමලෝකයට නැවත නො එයි යනුයි. න + ආගාමි = අනාගාමි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට තුන්වැනි වරටත් පැමිණේ. එවිට කාමරාග, පටිඝ, දෙක සම්පූර්ණයෙන්ම ප්‍රහීණ වී, වඩාත් පැහැදිලි ලෙස නිර්වාණය දකියි. සිව් වැනි අවස්ථාව අර්හත් මාර්ගයයි. අර්හත් යනු සුදුසුය යන තේරුමයි: කුමකට ද? පරලොව සුවපතා ගෙන දීමටය. දක්ෂිණාය නාමය ද මේ සඳහා යෙදේ? තවද තේරුමකි, කෙලෙසුන්

කෙරෙන් දුරු වූ බැවින් ද අර්හත් ය. සිව්වැනි වරටත් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට පැමිණීම සිදුවේ. එවිට රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා, යන සංයෝජන ධර්ම පහම සහමුලින්ම විනාශ වේ. මධ්‍යාහ්නයෙහි සූර්ය රශ්මියෙන් යමෙක් මනාසේ පෙණෙනත්තාක් මෙන් නිර්වාණය ඉතාමත් පැහැදිලි ලෙස දකියි. නැවත උප්පත්තිය ද අවසානය. (මාර්ග විස්තර මතුවට එයි)

**මාර්ග සිත් වූ ලෝකෝත්තර කුසල් සිත් සතරෙකි.**

1 සෝතාපත්ති මග්ග සිත,
2 සකදාගාමි මග්ග සිත.
3 අනාගාමි මග්ග සිත.
4 අරහත්ත මග්ග සිත.

## ලෝකෝත්තර කුසල් සිත් විස්සක් වීම.

ධ්‍යාන ලැබූ කෙනෙක් තමන් ලද ධ්‍යානයට සම වැද එයින් නැගී සංස්කාර ධර්ම සත්මර්ශනය - මෙනෙහි - කර සෝවාන් මාර්ගය ඉපදවී නම් ඒ සෝවාන් මාර්ගයට ලබාගත් ධ්‍යාන නාමය ද යොදා ව්‍යවහාර වේ. මේ එක් ක්‍රමයකි. අනෙක් ක්‍රමය තමන් ලත් ධ්‍යානයට සමවැදීමක් නො කොට ඒ ධ්‍යානයෙහි ඇති අඞ්ග අනිත්‍යාදී වශයෙන් සත්මර්ශනය කර මාර්ග උපදවයි. එවිට ද ඒ මාර්ග ධ්‍යාන නාමය යොදා ව්‍යවහාර වෙයි. තුන්වැනි ක්‍රමය, තමන් ලත් ධ්‍යානයට සමවැදී එයින් නැගිට ලැබගත් ධ්‍යානය පරිදී මාර්ග ලබමියි සිතූයේ නම් හෝ නැතහොත් ඉදිරියට සත් මර්ශනය කරනු ලබන අඞ්ග ඇති ධ්‍යාන පරිදි මාර්ග ලබමියි සිතූයේ නම් හෝ ඒ සිතූ පරිද්දෙන් ධ්‍යාන අනුව මාර්ග උපදියි. එවිට ඒ මාර්ග ද ධ්‍යාන නාමය සමග ව්‍යවහාර වෙයි. මෙසේ ධ්‍යානයට අනුව මාර්ග සිත් ඉපදවීමේ ක්‍රම තුනක් ඇත. මේවාට පිළිවෙළින් කියනු ලබන නම්, පාදකජ්ඣානය, සම්මසිතජ්ඣානය, පුග්ගලජ්ඣාසයජ්ඣානය, යනුයි. ධ්‍යාන පහක් නිසා මාර්ග සිත් විස්සෙකි. එහි පිළිවෙළ: විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිත පඨමජ්ඣාන සෝතාපත්ති මග්ග චිත්තය, යනාදි වශයෙනි.

සියලු කුසල් සිත් 21 යි. ධ්‍යාන ක්‍රමයෙන් 37 යි. “කුසලා ධම්මා” යන්න මෙතෙකින් අවසානය.

## අකුසල් සිත් දොළොසෙකි.

අකුසල් සිත් භූමි වශයෙන් නො බෙදේ. සියල්ල කාමාවචර බැවිනි. බෙදෙනුයේ මූල වශයෙනි. මූල යනු මුල්වීමයි නැතහොත් ප්‍රධාන හේතුවය. මූල තුනෙකි. ලෝභ, ද්වේෂ, මෝහ, යනුයි. මේවායේ අනුරූ සංඛ්

කාර ස්කන්ධයෙහි දක්විණ. සියලු අකුසල් සිත් මේ මූල තුනට බෙදී ගිය කල්හි දොළොසෙක් වෙයි ලෝභ මූලික අටෙකි' දෙස මූලික දෙකකි. මෝහ මූලික දෙකෙකි. නැවත ලෝභ මූලික අකුසල් වේදනා භේදයෙන් දෙවැදෑරුම්ය. දිට්ඨි, සංඛාර, භෙදයෙන් ද එමෙනි. මිශ්‍ර වූ විට අට සම්පූර්ණ වේ. වේදනා, සංඛාර, විස්තර පෙර පරිදිය. දිට්ඨි යනු වැරදි දැකීමයි. අරමුණෙහි වැරදි දැකීමක් ඇති අතර, "මෙයට විපාක නොලැබේය" යන කම් ඵල අවිශ්වාසය ද දිට්ඨියෙහි ඇත. සිත් අට මෙසේය`

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | සොමනස්ස | සහගත | දිට්ඨිගත | සම්පයුත්ත | අසංඛාරික සිත. |
| 2 | ,, | ,, | ,, | ,, | සසංඛාරික සිත. |
| 3 | ,, | | දිට්ඨි ගත | විප්පයුත්ත | අසංඛාරික සිත. |
| 4 | ,, | ,, | ,, | ,, | සසංඛාරික සිත. |
| 5 | උපෙක්ඛා | සහගත | දිට්ඨිගත | සම්පයුත්ත | අසංඛාරික සිත. |
| 6 | ,, | ,, | ,, | ,, | සසංඛාරික සිත. |
| 7 | ,, | ,, | දිට්ඨිගත | විප්පයුත්ත | අසංඛාරික සිත. |
| 8 | ,, | ,, | ,, | ,, | සසංඛාරික සිත. |

ලෝභය අධිකව යෙදීම නිසා "සොමනස්ස" වේදනාව ද, මඳව යෙදීම නිසා "උපෙක්ඛා" වේදනාව ද, යෙදීණ. "මෙසිත් මට මතු විපාක නොලැබේ, කියා හෝ මෙවැනි දේ මිනිසා විසින් කිරීම වැරදි නැත, කියා හෝ" වැරදි දැකීමෙන් යුක්ත වීමෙන් දිට්ඨිගත සම්පයුත්ත වෙයි. එවැනි මුලාවක් නො යෙදීම දිට්ඨිගතවිප්පයුත්ත වීමට හේතුයි. සංඛාර විස්තරය පෙර මෙනි. මේ සිත් උපදිනුයේ සොරකම, කාමමිථ්‍යාචාරය, ආදි ආසාවෙන් කරන පව්කම් වලදීය

## දෙස මූලික සිත් දෙකකි.

දෙසය - කිපීම - මේ සිත් වලදී එනුයේ පටිඝ නාමයෙනි. එහි ස්වභාවය - හැටි = අනුන්ගේ වරද දුටු විට හැප්පීමයි. ඒ නිසාම සිත දූෂිත - කිළුටු - වේ. ඉක්බිති කයෙන් හෝ වචනයෙන් හෝ ක්‍රියාවේ යෙදවේ. ද්වේෂය හටගනිත්ම සිතෙහි නො සතුටු ගතියක් ඇතිවීම ස්වාභාවිකය, එහෙයින් සිත් දෙකම දොමනස්ස වේදනාවම වෙයි, සංඛාර භේදය පෙර මෙනි· අනුන්ගේ මෙහෙයීමක් නැති විට අසංඛාර වෙයි. මෙහෙයීමක් ඇති විට සසංඛාරිකයි. ඒ සිත්:

1 දොමනස්ස සහගත පටිඝසම්පයුත්ත අසංඛාරික සිත.
2 ,, ,, ,, සසංඛාරික සිත.

යන දෙකයැ. සතුන් මැරීම, හිංසා කිරීම, පළිගැනීමේ අදහසින් කෙරෙන කාමමිථ්‍යාචාරය, සොරකම, ආදී ද මේ සිත් දෙකෙන් සිදු කෙරේ.

## මෝහ මූලික සිත් දෙකකි.

මෙහි වේදනා භේදයක් හෝ සංඛාර භේදයක් හෝ නො වෙයි. ඊට හේතු, සිතෙහි දිගටම පවතින තද ගැත්මක් නො මැතිකමයි. සිත් දෙකම ස්වාභාවික වශයෙන් චංචලය සෙලවේ. එසේම ක්‍රියාවක් නොමැති නිසා සිතින්ම පහලවී එහිම කර කැවෙයි මෝහය නිසා ස්ථිර නිගමනයකට බැස ගැනීමට ද අසමර්ථය. කෙලෙස් ගති දෙකක් නිසා සිත් දෙකක් විය. එකක් විචිකිච්ඡා, අනෙක උද්ධච්ච, මේවායේ හැටි නීවරණ දක්වූ තැන ප්‍රකාශ විය. ඒ සිත් දෙක මෙසේය.

1 උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත සිත.
2 ,, ,, උද්ධච්ච සම්පයුත්ත සිත යනුයි

මෙසේ අකුසල් සිත් දොළොසෙකි.

"අකුසලා ධම්මා" මෙතෙකින් අවසානය.

## "අබ්‍යාකතා ධම්මා",

අව්‍යාකෘත ධර්ම නම් කුශල් අකුශල් වශයෙන් නො කියූ ඒ දෙකෙන් අන්‍ය වූ විපාක, ක්‍රියා චෛතසික, රූප, නිර්වාණ, යන මෙතෙක් ධර්මයි ධම්මසඞ්ගණියෙහි අව්‍යාකෘත ධර්ම මෙසේ සංග්‍රහ වෙයි;-

කතමෙ ධම්මා අබ්‍යාකතා? කුසලා කුසලානං ධම්මානං විපාකා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා වෙදනාක්ඛන්ධො සඤ්ඤක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො - යෙ ච ධම්මා කිරියා නෙව කුසලා නා කුසලා න ච කම්මවිපාකා, සබ්බඤ්ච රූපං අසඞ්ඛතා ච ධාතු ඉමෙ ධම්මා අබ්‍යාකතා"

අව්‍යාකෘත ධර්ම කවරේ ද? කාමාවචරාදි ප්‍රභෙද ගත, කුසල් -අකුසල්හි වූ සියලු විපාක, ඒ විපාක සිත්හි වූ වෙදනා, සඤ්ඤා, සංඛාර, හා කුශල - අකුසල - කර්ම විපාක නොවූ ක්‍රියා ද, සියලු රූප ද, නිර්වාණය ද මේ ධර්මයෝ අව්‍යාකෘතයෝ ය.

මෙයින් මෙහිදී විස්තර කරනුයේ පලමු කොට විපාක සිත්ය. දෙවනුව පෙර නොදක්වූ ක්‍රියා හා නිර්වාණය දක්වේ. සෙසු ධර්ම කොටස් ඉහත දී විස්තර කෙරිණ.

සියලු විපාක සිත් සතිසෙකි (36)
නැතහොත් දෙපණසෙකි. (52)

සියලු විපාක සිත් ලෞකික, ලෝකෝත්තර, වශයෙන් දෙවැදෑරුම් ය, එයින් ලෞකික - කාමාදී ලෝකයන්ට අයත් - විපාක සිත් දෙතිසෙකි. (32) ලෝකෝත්තර සතරෙකි. නැතහොත් විස්සෙකි.

ලෞකික විපාක පවතින අවස්ථා ප්‍රධාන වශයෙන් දෙකෙකි. ප්‍රතිසන්ධි විපාක, ප්‍රවෘත්ති විපාක, යනුයි. ප්‍රවෘත්ති විපාක, අවස්ථා තුනකි. භවඞ්ග තදාරම්මණ, චුති, යනුයි' එකී ප්‍රතිසන්ධි යනු අන් භවයෙක පිළිසිඳ ගැනීමයි පිළිසිඳ ගත් පසු ජීවත්වීම ප්‍රවෘත්ති නම්. ජීවත්වීම නම් වූ සත්වයාගේ පැවතීම අවස්ථාවේදී ඇස ආදී ඉදුරන් ගෙන් නව අරමුණක් සිතෙහි නැති කල්හි පවතින සිත භවඞ්ග නම්. (පෙර භවයට අඞ්ග - කාරණ - වූයේ භවඞ්ගයි) නව අරමුණෙහි රස විඳින අවස්ථාව තදාරම්මණයි. ඒ භවයෙන් ගිලිහීමේ අවස්ථාව වූ මරණයෙහි දී පවතින සිත චුති නම්. (මේවා තේරුම් ගැනීමට චිත්ත වීථි ඉගෙණ ගත යුතුය.) මෙසේ ලෞකික විපාක පවතින අවස්ථා සියල්ල සතරකි. එනම් ප්‍රතිසන්ධි, භවඞ්ග, තදාරම්මණ, චුති, යනුයි.

ප්‍රභේද වශයෙන් ලෞකික විපාක සිව්වැදෑරුම් ය. කාමාවචර, රූපාවචර, අරූපාවචර, අකුසල යනුයි. අකුසල විපාක කාමාවචරම බැවින් ත්‍රිවිධ වෙයි.

කාමාවචර කුසල විපාක සහේතුක, අහේතුක වශයෙන් දෙවැදෑරුම් ය. සහේතුක විපාක සිත් අටෙකි. අහේතුක අටෙකි. සියල්ල සොළසයි.

**සහේතුක කාමාවචර කුසල විපාක සිත් අට:**

1 සොමනස්ස සහගත ඥාණ සම්පයුත්ත අසංඛාරික සිත. මෙ වශයෙන් කුශලයට දක්වූ පරිද්දෙන් එයි. වෙනස; මේවා උපදිනුයේ ඉහත කී සතර අවස්ථාවන්හි[පමණි.

## අහේතුක කාමාවචර කුසල විපාක සිත් අට:

1 උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය. 2. එම සෝත විඤ්ඤාණය, 3 එම ඝාණ විඤ්ඤාණය, 4 එම ජිව්හා විඤ්ඤාණය, 5 සුඛ සහගත කාය විඤ්ඤාණය, 6 උපෙක්ඛා සහගත සම්පටිච්ඡනය, 7 උපෙක්ඛා සහගත සන්තීරණය, 8 සෝමනස්ස සහගත සන්තීරණය යනුයි

ඇස නිසා හටගත් සිත "චක්ඛු විඤ්ඤාණය" නමි. සෙසු විඤ්ඤාණ ද මේ අනුසාරයෙන් තේරුම් ගත යුතු. අරමුණෙහි පවත්නා මධ්‍යස්ථ – මැදහත් – භාවය නිසා "උපෙක්ඛා" වේදනා විය. කාය විඤ්ඤාණය සුඛ සහගත වූයේ හැප්පීමේ බලවත්කම නිසායැ. ඇස ආදියට රූපාදිය අවුත් හැප්පෙන්නාසේ සියුම් නොවේ. එසේම කුශල විපාක හෙයින් ඒ හැප්පීම සැප උපදවයි. එහෙයින් සුඛ සහගත විය. අරමුණ පිළිගැනීම "සම්පටිච්ඡන" නමි. එයම තීරණ කිරීම "සන්තීරණ" යි. මේ සිත් උපෙක්ඛා සහගත වූයේ ඉෂ්ට මධ්‍යස්ථාරම්මණය – යහපත් භාවයෙහි සාමාන්‍ය ගතියක් ඇති අරමුණ – නිසායැ. උසස් ගතිය නිසා ඉතිරි සන්තීරණ සිත සෝමනස්ස සහගත විය.

ඇසට රූපාරම්මණයක් හමු වූ විට, පළමුවෙන් භවඞ්ග චලන, භවඞ්ගුපච්ඡේද, සිත් උපදියි. මෙවා භවඞ්ග සිතටම අයත්ය ඉක්බිති දෙරටු විමසීමේ සිත වූ පඤ්චද්වාරාවර්ජන ක්‍රියා සිත උපදියි. මෙය ක්‍රියා සිත් විස්තරයේ දී හමුවෙයි මේ සිත නිසා අරමුණ හමුවන, ගැටෙන ද්වාරය සොයා ගනියි. ඊට පසු චක්ඛු විඤ්ඤාණය උපදියි. මේ අවස්ථාවේදී වැඩි ගැන්මක් සිතට නැති නිසා මැදහත් වේදනාවම උපදියි. ගැන්ම ලෝභයෙන් හෝ ද්වේශයෙන් හෝ ගැනීමයි. ඉක්බිති ඒ අරමුණ පිළිගන්නා වූ සම්පටිච්ඡන සිත ද, අනතුරුව සන්තීරණ සිත ද උපදියි

මේ සිත් අතුරෙන් ප්‍රතිසන්ධි, භවඞ්ග, චුති, යන විපාක අවස්ථා ඇත්තේ උපෙක්ඛා සහගත සන්තීරණ සිතට පමණි. සෝමනස්ස සහගත සන්තීරණ සිත තදාරම්මණ අවස්ථාවේදී ද උපදියි. සෙසු විපාක සිත් ප්‍රවෘත්ති අවස්ථාවේ පමණක් ලැබේ.

මේ සිත් අහේතුකයැයි කීයේ, ලෝභ, දෝස, මෝහ, අලෝභ, අදෝස, අමෝහ, යන හේතු සයෙන් එකක් නමුදු නො යෙදෙන හෙයිනි. මෙහි මුල් තුන අකුසල හේතුයි. සෙසු තුන කුසල හේතුයි.

## රූපාවචර කුසල විපාක සිත් අටෙකි. (පහෙකි)

කුසල සිත්හි යෙදුනු අඞ්ගයන්ම විපාක සිත්හි ද යෙදේ. එහෙයින් අඩු - වැඩි නොවී පසක්ම වෙයි. වෙනස විපාක වශයෙන් ඉපදීම පමණි. මේවා ප්‍රතිසන්ධි, භවඞ්ග චුති, යන අවස්ථා තුනෙහි දී ඇතිවේ. මරණින් පසු බ්‍රහ්ම ලෝකයෙහි ඉපදීම වශයෙන් ප්‍රතිසන්ධි විපාකද, ඉපදුන පසු අරමුණු නොගෙන සිටින අවස්ථාවන්හි භවඞ්ග වශයෙන්ද, එහි යම්තාක් කල් වැස මරණයට පත්වන අවස්ථාවේදී චුති වශයෙන් ද, යන දෙවැදෑරුම් ප්‍රවෘත්ති විපාක ද සුදුසු පරිදි ලත් ධ්‍යානයට ,අනුව උපදී. මෙසේ රූපාවචර විපාක පස ප්‍රතිසන්ධි, භවඞ්ග,චුති, යන අවස්ථා තුනෙහි දී ලැබේ. "විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන විපාක චිත්තං" යනාදී වශයෙන් ඒ සිත් පස යොදා ගත යුතුය.

## අරූපාවචර විපාක සිත් සතරෙකි:

මේවාද උපදවා ගත් කුසල් සිත හා සමානය. වෙනස විපාක වශයෙන් ඉපදීමයි. ඒ උපදිනුයේ ද ප්‍රතිසන්ධි, භවඞ්ග, චුතියන අවස්ථා තුනෙහිදී ය. අසඤ්ඤ සත්තයෙහි - සිත නැති සිරුර පමණක් පවතින භූමියෙහි චුති, ප්‍රතිසන්ධි, පමණක් ලැබේ භවඞ්ග අවස්ථාව නො ලැබේ. මක්නිසාද? සිතෙහි පවතින හරක ගතිය ගැන කලකිරී, සිත නැතිකර ගැනීමට භාවනා කළ හෙයිනී. එහෙත් එහි සිත නැත්තේ ද නොවේ. සිත නැත්තේ නිර්වාණයෙහි පමණි. මෙම අසඤ්ඤ සත්තයෙහි නිරුද්ධ කළ සිතක් ඇත. ඒ සිතෙහි ක්‍රියාකාරීත්වය ඇති බව දැන ගනුයේ සිරුර පවතින නිසාය. සිතක් නොමැති නම් සිරුර ද නො නොපවතී· එහෙයිනි, මේ නිසා ඔවුනට ජීවිත නවකය පමණක් සිරුර වශයෙන් උපදී. ජීවිත නවකය යනු අවිනිර්භෝග රූප අට හා ජීවිතින්ද්‍රියත් සහ නවයයි.

අරූපාවචර විපාක සිත්, ආකාසානඤ්චායතන විපාක සිත, මේ ආදී වශයෙන් යෙදී පවතී. සියල්ල සතරකි.

## ලෝකෝත්තර විපාක සිත් සතරෙකි:

"ඵල" යනු මේවාට කියන නාමයයි. කුශල් මාර්ග යන්නෙන් හැඳින් වූ අතර, විපාක ඵල නාමයෙන් හැඳින් වූහ. මොවුනු ලෞකික විපාකයේ විපාක දීමට කල් නොයත්. ඒ මොහො

නෝදීම ලැබේ. අකාලික ගුණය දක්වනුයේ එහෙයිනි. විපාක දෙන අවස්ථා ප්‍රධාන වශයෙන් දෙකකි. ප්‍රථමයෙන් ඵලසිත් උපන් අවස්ථාව, දෙවනුව ඵල සමාපත්තියට පැමුණුන අවස්ථාව, යනුයි. අර්හත් ඵලය මේ දෙකත් සමඟ, පිරිනිවෙන් - මරණින් - පසු අවස්ථාව වූ නිර්වාණයට පිවිසීමත් යන අවස්ථා තුනකි. ඵල සිත් මලින් චුති - ප්‍රතිසන්ධි නො ලැබේ. සෝවාන් ආදී ඵලයකට පත් වූ ශෛක්‍ෂයෙක් (අර්හත් ඵලයට පත්වූවනු හැර ඉතිරි සත්දෙනා ශෛක්‍ෂයෝය.) මරණ අවස්ථාවේදී හා උපපත්ති අවස්ථාවේදී උපදමනුයේ කාමාවචර ඥාන සම්ප්‍රයුක්ත විපාක සිතක් හෝ තමින් ලත් ධ්‍යානයකට අනුව රූපාවචර විපාක සිතක් හෝ මේ දෙකෙන් එකකි. (ආයඹියෝ අරූප ලෝකයෙහි නූපදීත්.)

## අකුසල විපාක සිත් සතෙකි.

උපෙක්ඛා, සහගත චක්ඛු විඤ්ඤාණය, එම සෝත - ඝාණ ජිව්හා විඤ්ඤාණය, දුක්ඛ සහගත කාය විඤ්ඤාණය' උපෙක්ඛා සහගත සම්පටිච්ඡනය, උපෙක්ඛා සහගත සන්තීරණය, යන සතයි. මොවුහු අහේතුකයෝ ය. ලෝභාදී හේතු නොයෙදෙයි. රූප, ශබ්ද, ගන්ධ, රස, යන අරමුණු සතර, චක්ඛු ආදීයෙහි ගැටීම ඉතා සියුම් නිසා ඒ සිත් මැදහත් - උපෙක්ඛා - වෙදනා විය. ගැටීමේ තද ගතිය නිසාත්, අකුසල විපාක නිසාත් කාය විඤ්ඤාණය දුක්ඛ වෙදනා විය. මෙය ප්‍රකටව වැටහෙනුයේ නිරයෙහි ය. හැම සත්වයකුටම ස්පර්ශීය දුක් වනුයේ මේ සිතෙනි. සම්පටිච්ඡන, සන්තීරණ, පෙර පරිදියි.

ප්‍රතිසන්ධි, භවඞ්ග, චුති, යන අවස්ථාවන්හිදී උපදිනුයේ උපෙක්ඛා සහගත සන්තීරණ සිත පමණි. එහිනුත් ප්‍රතිසන්ධි සිත ලැබෙනුයේ නරක, තිරිසන්, ප්‍රේත, අසුර යන සිවු අපායෙහිය. සෙසු සිත් සුදුසු පරිද්දෙන් ප්‍රවෘත්ති විපාක වශයෙන් උපදී.

(විපාක සිත්හි විස්තරය දීර්ඝ හෙයින් සංක්‍ෂේප කෙරිණි.) මෙසේ සියලු විපාක සිත් සතිසෙකි. නැතහොත් දෙපණසෙකි. කාමාවචර විපාක සොළසෙකි. රූපාවචර පසෙකි. අරූපාවචර සතරෙකි. ලෝකෝත්තර සතරෙකි. එයම ධ්‍යාන ක්‍රමයෙන් විස්සෙකි. මේ අව්‍යාකෘත ධර්මයන්ට අයත් විපාක සිත්ය.

## සියලු ක්‍රියා සිත් විස්සෙකි

මොව්හු ප්‍රධාන වශයෙන් සහේතුක, අහේතුක, වශයෙන් දෙපරිදි වෙත්. එයින් අහේතුක ක්‍රියා සිත් තුනෙකි. ඉතිරි සත ළොස (17) සහේතුකය. සහේතුක සිත් භූමි වශයෙන් තෙවැදෑරුම්ය. කාමාවචර, රූපාවචර, අරූපාවචර යනුයි. සියලු ක්‍රියා සිත් ලෞකිකය, එහෙත් පෘථග්ජනයන්ට හා ශෛක්‍ෂයන්ට උපදිනුයේ ක්‍රියා සිත් දෙකකි. එනම් අහේතුක වූ පඤ්චද්වාරාවර්ජනය හා මනොද්වාරාවර්ජනයයි. ඉතිරි සිත් අර්හත් ඵලය ලැබූ රහතන් වහන්සේලාට පමණක් උපදී. මොව්හු කුශල හෝ අකුශල හෝ විපාක හෝ නොවන හෙයින් ක්‍රියා සිත්යැයි දක්වූහ. සිදුවීමක් පමණි.

## අහෙතුක ක්‍රියා සිත් තුණ

උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවර්ජනය, උපෙක්ඛා සහගත මනොද්වාරාවර්ජනය, සොමනස්ස සහගත හසිතුප්පාදය යනුයි.

චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, යන ද්වාර පස අතුරෙන් යම් ද්වාරයකට රූපාදී ආරම්මණයක් හමුවූවිට "මේ අරමුණ කවර ද්වාරයකින් ආවේදැ"යි විමසන සිත පඤ්චද්වාරාවර්ජන නම්. මෙ සිත උපදිනුයේ භවාඞ්ග උපච්ඡේද චිත්තුප්පාදය ලග වය. සිතට අරමුණක් ලැබුණු කල්හි විමසන සිත, මනොද්වාරාවර්ජන නම්. වොට්ඨපන යනුද නමකි. මේ සිත උපදිනුයේ සන්තීරණ සිත ලගටය. මේ සිත් දෙකම උපෙක්ඛා සහගත වූයේ අරමුණෙහි ඇති මධ්‍යස්ථභාවය නිසාය.

හසිතුප්පාදය; හසිත යනු සුළු සිනහවකි. සිනාසීම් මාත්‍රයෙකි. උප්පාද නම් ඉපදවීමයි. පහලකිරීමයි. මඳ සිනහ පහල කිරීම හසිතුප්පාද නම්. මේ සිත උපදිනුයේ රහතන් වහන්සේට පමණි. සෙසු පෘථග්ජන; ශෛක්‍ෂ, පුද්ගලයන්ට නූපදී. මොව්හු සිනහ උපදවනුයේ අකුසල් හෝ කුශල් හෝ සිතකිනි. සිනහ වියයුතු කරුණකදී රහතන් වහන්සේලා මඳසිනහ පහළ කෙරේ. "අථ ඛො භගවා සිතං පාත්වාකාසි" ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සිනාපහළ කළ සේක. මෙසේ දක්වෙන හෙයින් උන් වහන්සේලා ඇයුම් තන්හිදී සිනහ පහල කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේ සූකර පෝතිකාව - ඊරි - පැවිය දුටු අවස්ථාව එක් තැනකි. විස්තර ධම්මපදට්ඨකථාවේ ඇත. සිනහ පහල කිරීම ඥාන සම්ප්‍රයුක්තව කරන හෙයින් සොමනස්ස සහගත විය.

සෙසු ක්‍රියා සිත් ගැන කිවයුත්තේ මෙයයි. රහතන් වහන්සේ පශ්චිම ජනතාවට ආදර්ශය පෙන්වීම සඳහාත් පුරුද්ද නිසාත් කාමාවචරාදී ලෞකික කුශලයක් කළහොත් එය ක්‍රියා සිතක් බවට පත්වෙයි. රහත්වූවිට කුශල්, අකුශල්, දෙක ම ප්‍රහාණය කළ හෙයින් ඒවා නැවත නූපදින්. එහෙයින් ක්‍රියා සිත් පමණි රහතන් වහන්සේට උපදිනුයේ. මේ ක්‍රියා සිත් කුසල සිත් පරිදිමය. සෞමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාරික ක්‍රියා සිත, මේ වශයෙන් සිත් යොදගත යුතු. මෙයින් කාමාවචර අටෙකි. රූපාවචර පසෙකි. අරූපාවචර සතරෙකි. අහේතුක ක්‍රියා තුනත් සමග සියල්ල විස්සයි.

අව්‍යාකෘතවූ ක්‍රියා සිත් මෙතෙකින් සමාප්තය.

“ද්වාදසා කුසලානෙවං - කුසලානෙකවීසති
ඡත්තිංසෙව විපාකානි = ක්‍රියා චිත්තානි වීසති”

මෙසේ අකුසල් සිත් දොළොසෙකි. කුසල් සිත් එක් විස්සෙකි. විපාක සිත් සතිසෙකි. ක්‍රියා සිත් විස්සෙකි. (12 + 21 + 36 + 20=89) ලෝකෝත්තර කුසල, විපාක සිත් ධ්‍යාන ක්‍රමයෙන් ගිනූ කල සතළිසෙකි. එවිට සියලු සිත් එක්සිය විස්සෙකි (12 + 17 + 32 + 20 + 40=121)

මේ සිත් සමූහය අතීතාදී එකොළොස් වැදෑරුම් බවට පත්වීමෙන් රාශියක් වේ විඥානස්කන්ධය යනු මේ සිත් රාශියයි, මෙසේ රූපස්කන්ධය, වේදනාස්කන්ධය, සඥා ස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඤ්ඤාණස්කන්ධයැයි ස්කන්ධ පසෙකි.

තවද, පඤ්චස්කන්ධය ඇතැම් තැනෙක පඤ්චුපාදානස්කන්ධ හැටියට එයි. එවිට මෙසේ දක්වේ.

රූපූපාදානක්ඛන්ධය, වේදනූපාදානක්ඛන්ධය, සඤ්ඤූපාදානක්ඛන්ධය, සංඛාරූපාදානක්ඛන්ධය විඤ්ඤාණූපාදානක්ඛන්ධය යනුයි

## උපාදානක්ඛන්ධ වශයෙන් දෙසීමට හේතුව:

“ඉමෙ පන භන්තෙ පඤ්චුපාදානක්ඛන්ධා කිං මූලකා? ඉමෙ ඛො භික්ඛු පඤ්චුපාදානක්ඛන්ධා ඡන්දමූලකා ති. තං යෙව නුඛො භන්තෙ උපාදානං තෙ පඤ්චුපාදානක්ඛන්ධා උදාහු

අඤ්ඤත්‍ර පඤ්චුපාදානක්ඛන්ධෙහි උපාදානං, යො ඛො භික්ඛු පඤ්චුපාදානක්ඛන්ධෙසු ඡන්දරාගො, තං තත්ථ උපාදානන්ති"

-ම. නි. උ. (මහා පුණ්ණමාස සූත්‍රය)

බුදුරජාණන් වහන්සේ පූර්වාරාමයේ වැඩ වෙසෙත්දී එක් භික්ෂූන් වහන්සේ නමක් ඇසූ ප්‍රශ්න හා ඊට දෙසූ පිළිතුරාය. මෙහි සඳහන්වනුයේ. "ස්වාමීනි. මේ උපාදානස්කන්ධ පස කවරක් මුල්වී පවතීද? භික්ෂුව, මේ උපාදානස්කන්ධ පස ඡන්දය මුල් කොට පවතී. ස්වාමීනි, ඒ උපාදානස්කන්ධ පසම්ද උපාදානයැයි කියනුයේ? නැතහොත් උපාදානස්කන්ධයන්ගෙන් හැර, උපාදානවේද? භික්ෂුව ඒ උපාදානස්කන්ධ පසම උපාදාන නොවේ පඤ්චුපාදානස්කන්ධයන්ගෙන් වෙන්වූ උපාදානයක් ද නැත. භික්ෂුව, පඤ්චුපාදානස්කන්ධයන් කෙරෙහි යම් ඡන්දරාගයක් වේ ද, ඒ එහි උපාදානයි"

පඤ්චස්කන්ධය කෙරෙහි පවත්වන ඡන්දරාගය = බලවත් කැමැත්ත- නිසා ඒ පඤ්චස්කන්ධයම පඤ්චුපාදාන ස්කන්ධය වශයෙන් දේශනා කළ බව මේ සංවාදයෙන් පෙනේ. සත්වයා පඤ්චස්කන්ධය, මමය, මාගේය, යනුවෙන් මමත්වය ඇතිකොට, ආත්මය, වශයෙන් දැඩිකොට ගනී. ඡන්දරාගයවූ තෘෂ්ණාවෙන් අල්ලාගතියි.

පඤ්චුපාදානස්කන්ධය වනුයේ මේ අයුරිනි.

මෙසේ පඤ්චස්කන්ධය පිළිබඳ අවබෝධයක් ඇතිවූ පසු, පරිග්‍රහ ඥානය දියුණුවීම සඳහා පඤ්චස්කන්ධයෙහි එන සෑම කොටසකම ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන වශයෙන් වෙනම නුවණ මෙහෙයවා අවබෝධ කටයුතු. නාමරූප පරිග්‍රහය සම්පූර්ණ වනුයේ එවිටය.

එහි "ලක්ඛණ" යනු ස්වභාවයයි; එනම් හැඩියි. කෙරෙන වැඩය "රස" නම්. කෘත්‍යය නමින් ද ව්‍යවහාරයි. පච්චුපට්ඨානය නම් වැටහෙන කාරණයයි. ආසන්න-ලඟම ඇති - කාරණය "පදට්ඨාන" නම්. මෙසේ මේ පදයන් ගේ අදහස පළමුවෙන් ම ඉගෙනගත් කල්හි ඉදිරියට පහසු වෙයි. මෙතැන් සිට දක්වනුයේ කෙටි නාමය පමණි.

## රූපස්කන්ධයෙහි ලක්ඛණාදිය

පඨවි රූපය. "කක්ඛළ ලක්ඛණා පඨවි" කැකුළු ගතිය ලක්ඛණය යි" එනම් ගොරෝසු බවයි. එක්ව යෙදෙන රූපයන්ට

පිහිටවීම රසයයි. ඒ පිහිටවීම් බව පච්චුපට්ඨානයි. සෙසු භූත රූප තුන පදට්ඨානයි. (පදට්ඨාන ඉන්ද්‍රියවත් මේ අයුරින් ම සිතාගත යුතු.)

ආපෝ රූපය: “ආබන්ධන ලක්ඛණා ආපෝ” බැඳීම් ගතිය ලක්ෂණයයි. අළු රැසකට දිය බිඳුවක් දැම්මොත් මෙනි. පඨවි ධාතුවේ මද ගතිය නිසා වැගිරීම් ගතිය ද පවතී. පැතිරීම කෘත්‍යයයි වස්ත්‍රයකට දිය බිඳුවක් වූවිට ඒ බව පැහැදිලි වෙයි. එක්ව යෙදුනු රූපධර්ම පිඩුකිරීම් බව පච්චුපට්ඨානයි.

තේජෝ රූපය: “පරිපාචන ලක්ඛණා තේජෝ” පැසවන ගතිය ලක්ෂණයයි පිටතට දැනෙනුයේ උණුසුම් ගතියයි. එක්ව උපදනා සෙසු මිහිකිරීම=මේරවීම - කරනුයේ මේ රූපයෙනි. එහෙයින් කෘත්‍යය මිහිකිරීමයි. සෙසු රූප මොළොක් කිරීම, පච්චුපට්ඨානයයි

වායෝ රූපය: “විත්ථම්භන ලක්ඛණා වායෝ” පිම්බීම ගතිය ලක්ඛණයයි සැලෙන ගතිය ද ගතයුතු. සෙලවීම රසයයි. බීජයෙන් අංකුරයේ භූත සමූහය පිහිටි තැනින් අතික් තැනක ඉපදීමට හේතු වශයෙන් සැලීම පච්චුපට්ඨානයයි.

චක්ඛු: මෙහි ලක්ෂණ දෙකකි. රූපයන් අවුත් ගැටීමට සුදුසේ භූතරූපයන්ගේ පැහැදිලි ගතිය, රූපච්ඡායාව වැටීමට සුදුසු පරිදි දිලිසීම එක් ලක්ඛණයකි. දකිනු කැමැත්ත මුල් වූ කර්මයෙන් හටගත් භූතරූපයන්ගේ පැහැය දෙවැනි ලක්ෂණයයි. සෙසු පසාද රූපත් මෙසේමය. රූපයන් කෙරෙහි පුද්ගලයා හෝ සිත හෝ ඇදගැනීම රසයයි. ඇසෙහි උපදින සිතට රැකුල් දෙන බව පච්චුපට්ඨාන යි. පදට්ඨානය නම් දකිනු කැමැත්ත මුල් වූ කර්මයෙන් හටගත් භූතරූපය.

සෝත: ශබ්ද අවුත් ගැටීමට සුදුසුසේ භූතරූපයන්ගේ පැහැදිලි ගතිය හා අසනු කැමැත්ත මුල්වූ කර්මජ භූතරූපයන්ගේ පැහැය ලක්ඛණයයි ශබ්දයන් කෙරෙහි පුද්ගලයා හෝ සිත හෝ ඇදගැනීම රසයයි. කණෙහි උපදින සිතට රැකුල් දෙන බව පච්චුපට්ඨානයි: අසනු කැමැත්ත මුල් වූ කර්මජ භූතරූප පදට්ඨානයි.

ඝාණ: සුවඳ අවුත් ගැටීමට සුදුසු සේ භූතරූපයන්ගේ පැහැදිලි ගතිය හා ආඝ්‍රාණය කරනු කැමැත්ත මුල්වූ කර්මජ භූත රූප

යන්ගේ පැහැය, ලක්ෂණය. ගන්ධයන් කෙරෙහි පුද්ගලයා හෝ සිත හෝ ඇදගැනීම රසයයි. ඝ්‍රාණ ප්‍රසාදයෙහි උපදින සිතට රුකුල් දෙන බව පච්චුපට්ඨානයයි. පදට්ඨානය; ආඝ්‍රාණය කරනු කැමැත්ත මුල්වූ කර්මජ භූතරූපයි.

ජිව්හා: රස අවුත් ගැටීමට සුදුසුසේ භූතරූපයන්ගේ පැහැදිලි ගතිය හා රස විඳිනු කැමැත්ත මුල්වූ කර්මජ භූතරූපයන්ගේ පැහැය ලකබණයයි. රසයන්හි පුද්ගලයා හෝ සිත හෝ ඇදගැනීම කෘත්‍යයයි ජිව්හා විඥානයට රුකුල් දෙන බව පච්චුපට්ඨානයි. රස විඳිනු කැමැත්ත මුල්වූ කර්මජ භූතරූපපදට්ඨානයි.

කාය: ස්පර්ශ අවුත් ගැටීමට සුදුසු සේ භූත රූපයන් ගේ පැහැදිලි ගතිය හා ස්පර්ශ කරනු කැමැත්ත මුල්වූ කර්මජ භූතරූපයන් ගේ පැහැය ලකබණය යි. ස්පර්ශයන් කෙරෙහි පුද්ගලයා හෝ සිත හෝ ඇදගැනීම රසයයි. කාය විඥ්ඥානයට රුකුල් දෙන බව පච්චුපට්ඨානයි. පදට්ඨානය නම් ස්පර්ශය කරනු කැමැත්ත මුල්වූ කර්මජ භූතරූපයයි,

රූප, ශබ්ද, ගන්ධ රස, ස්පර්ශ යන විෂය රූපයන් ගේ ලක්ෂණ නම් චක්ඛු ආදී නම තමන් අවුත් වැදෙනා ප්‍රසාද රූපයන්හි ගැටීමයි. ඒ ඒ විඥානයට ගොදුරු වීම-විෂය වීම - කෘත්‍යයයි. ඒ ගෝචර වන බව පච්චුපට්ඨානයි. සතර මහාභූත පදට්ඨානයි.

ඉත්ථින්ද්‍රිය: "මෝ ස්ත්‍රිය යි දැනීමට හේතුවීම ලක්ෂණය යි ඒ බැව් ම ප්‍රකාශවීම රසයයි. ලිඞ්ග, නිමිති, කෘත්‍ය, ආකල්ප යන මේවා ඇතිවීමට හේතු වන බව පච්චුපට්ඨානයි. සතරමහාභූත පදට්ඨානයි (සෙසු රූපයන්ගේ පදට්ඨාන ද සතර මහාභූත බව තේරුම් ගතයුතු)

පුරිසින්ද්‍රිය: "මේ පුරුෂයා"යි දැනීමට හේතුවීම ලක්ෂණය යි. ඒ බැව්ම ප්‍රකාශවීම කෘත්‍යයයි. ලිඞ්ගාදීය ඇතිවීමට හේතුවන බව පච්චුපට්ඨානයි.

ජීවිතින්ද්‍රිය: එක්ව උපන් රූපයන් අනුපාලනය කිරීම ගතිය ලක්ෂණයි. ඔවුන්ගේ ම පැවැත්ම රසයයි පවතින බැව් පච්චුපට්ඨාන යි. පදට්ඨාන නාමයෙන් යැපිය යුතු භූතරූපයි.

හදයවත්ථු: මනොධාතු, මනොවිඤ්ඤාණධාතුන්ට නිඃශ්‍රයවීම - ඇසුරුවීම - ලක්ඛණයයි. පඤ්චද්වාරාවර්ජන, සම්පටිච්ඡන යුගලය (2) යන සිත් තුන මනොධාතු නම්. දෙපස් විඤ්ඤාණය, මනොධාතුත්‍රිකය, යන සිත් තෙළෙස (13) හැර ඉතිරි සිත් සැත්තෑව (76) මනොවිඤ්ඤාණ ධාතුයි. මේ සිත්වලට ආධාරවීම කෘත්‍යයය. ඒ මනොධාතු, මනො විඤ්ඤාණ ධාතු දෙදෙන උසුලනසේ වැට හීම පච්චුපට්ඨානයි. පදට්ඨානය භූතරූපයි.

කායවිඤ්ඤත්ති: ශරීරයෙන් කෙරෙන යෑම්, ඊම්, අත්-පා දිග්කිරීම්, ආදී ඒ ඒ කෘත්‍යය සඳහා පවතින සිතින් හටගත් වායො ධාතුව, සරීරයෙහි තැති ගැනීම්, දැරීම්, සෙලවීම් ආදියට ප්‍රත්‍යවීම් ලක්ඛණයයි. අදහස ප්‍රකාශයට-දැනගැනීමට පත්කිරීම රසයයි. කායවිඤ්ඤත්තියට-සෙලවීමට-හේතුවීම් බව පච්චුපට්ඨානයි. සිතින් හටගත් වායො ධාතුව පදට්ඨානයි.

වචීවිඤ්ඤත්ති: තේරුම් ගැනීමට සුදුසු පරිදි, බෙදීම් සහිත වචන පැවැත්වීමට උපකාර වන සිතින් හටගත් පඨවි ධාතුවේ, අකුරු ඉපදවීමට සුදුසු භූතරූපයන් ඇති තැනට එනම මුඛයට-ප්‍රත්‍යවීම් ගතිය ලක්ඛණයයි. අදහස ප්‍රකාශ කිරීම රසයයි. වචනයෙන් පිටවන ශබ්දයට හේතුවන බව පච්චුපට්ඨානයයි. පදට්ඨානය සිතින් හටගත් පඨවි ධාතුයි.

පරිච්ඡේද රූපය: රූපයන් වෙන්කිරීම ලක්ඛණයයි. රූපයන්ගේ කෙළවර ප්‍රකාශයට පත්කිරීම රසයයි. රූපයන්ගේ සීමාව - අසවල් තැනින් කෙළවරවේය යන්න-පච්චුපට්ඨානයි පදට්ඨාන සීමාවූ රූපමැයි.

ලහුතා; බර නැති ගතිය ලක්ඛණයයි. බර ගතිය දුරුකිරීම රසයයි. සැහැල්ලු බවට පෙරළුන බව පච්චුපට්ඨානයි සැහැල්ලු රූපම පදට්ඨානයි.

මුදුතා: තද නැති ගතිය ලක්ඛණයයි රූපයන්ගේ තද ගතිය දුරුකිරීම රසයයි. සියලු ක්‍රියාවන්හි විරුද්ධකමක් නැති බව පච්චුපට්ඨානයි. මුදුතා රූපම පදට්ඨානයි.

කම්මඤ්ඤතා: ශරීරයෙන් කෙරෙන වැඩවලට සුදුසු ගතිය ලක්ඛණයයි. දුබලකම් විනාශ කිරීම රසයයි. දුබල නොමැති බව පච්චුපට්ඨානයි පදට්ඨානය මේ රූපමැයි.

උපචය: නිෂ්පන්න රූපයන් ගේ පළමුවැනි ඉපදීම ගතිය ලක්ෂණයයි. පෙර කෙලවරින් රූප මතුකිරීම රසයයි. ඒ රූප ඉපදී සම්පූර්ණත්වය පච්චුපට්ඨානයයි.

සන්තති: නිෂ්පන්න රූපයන් ගේ පැවැත්ම ලක්ෂණයයි. රූප පරපුර නො සිඳ පැවැත්ම රසයයි. ඒ බව පච්චුපට්ඨානයයි. සන්තතිරූපයම පදට්ඨානයයි.

ජරතා: රූපධර්මයන් ගේ මේරීම් ගතිය ලක්ෂණයයි. විනාශය කරා පැමිණවීම කෘත්‍යයයි. ගොරෝසු පැවතුම් දැසින් සමාන වුව ද, ඉපදීම් ආදිය අස්ව යන බව පච්චුපට්ඨානයි.

අනිච්චතා: නිෂ්පන්න රූපයන් ගේ විනාශවීම් ගතිය ලක්ෂණයයි. රූපධර්මයන් යටපත් කිරීම කෘත්‍යයයි. රූප ධර්මයන්ගේ බිඳීම ස්වභාවයෙන් ගෙවීයෑම් බව පච්චුපට්ඨානයි.

ආහාරරූපය: ඕජාගතිය ලක්ෂණයයි, රූපයන් ඉපදවීම කෘත්‍යයයි: රූපයන්ගේ පැවැත්මට රුකුල් දෙන බව පච්චුපට්ඨානයයි. පදට්ඨානය පිඩු කොට ගනු ලබන ආහාරයයි.

රූපස්කන්ධයෙහි ලක්ෂණාදිය නිමි.

## වේදනාස්කන්ධයෙහි ලක්ෂණාදිය.

සුඛවේදනාව: තමන් කැමති ස්පර්ශ-ඉෂ්ටාරමමණ ස්පර්ශ-විඳගැනීම් ලක්ෂණයයි, එක්ව යෙදුනු - සම්ප්‍රයුක්ත-ධර්ම දියුණු කිරීම, තව තවත්, වැඩිකිරීම රසයයි. ශරීරයෙන් ගනු ලබන ආශ්වාදය පච්චුපට්ඨානයයි. කාය ප්‍රසාදය, කායින්ද්‍රිය, පදට්ඨානයි.

දුකඛ: තමන් අකමැති පහස් විඳගැනීම ලක්ෂණයයි. එක්ව යෙදුනු ධර්ම මලානික කිරීම රසයයිශරීර ආබාධ පච්චුපට්ඨානයි. පදට්ඨානය පෙර මෙනි.

සොමනස්ස: තමන් කැමති රූපාදී අරමුණු විඳිම් ලක්ෂණයයි. කෙසේ හෝ කැමති පරිද්දෙන් අරමුණු රස විඳිම කෘත්‍යයයි. චෛතසික ආශ්වාදය-අදහස් මිහිරි බව විඳිම පච්චුපට්ඨානයි. පදට්ඨානය සංසිඳීමයි.

දෞමනස්ස: තමන් නොකැමැති අරමුණු විඳීම ලක්ෂණයයි. එසේ හෝ නොකැමැති පරිද්දෙන් අරමුණු විඳීම රසය යි අදහස් ලෙඩවීම පච්චුපට්ඨානයි. පදට්ඨානය හෘදය වස්තුවයි.

උපෙක්ඛා: මැදහත් ලෙස විඳීම ලක්ෂණයයි. එක්ව යෙදුනු ධර්ම දියුණුත් නො කර, මලානිකත් නො වීම රසයයි පච්චු පට්ඨානය සංසුන් බවයි. ප්‍රීතියෙන් තොරවූ සිත පදට්ඨානයි.

## සඤ්ඤාස්කන්ධයෙහි ලක්ෂණාදිය

හැඟීමක් ඇතිව දැනීම ලක්ෂණයයි. නැවත හැඳින ගැනීමට ප්‍රත්‍යවන - හේතුවන - කරුණක් ඇති කිරීම රසයයි. ප්‍රතිමාවක් දුටුවිට, එහි ආකාරය හැඟීම් වශයෙන් සිතෙහි සටහනී. නැවත කෙබඳු දිනක හෝ ප්‍රතිමාවක් දුටහොත් "මෙය ප්‍රතිමාවක්ය"යි දැනගනියි. ඒ දැකීමට උපකාරවූයේ ප්‍රථම ප්‍රතිමා දර්ශනයයි. මෙසේ සඤ්ඤාවේ ලක්ෂණය හා රසය තේරුම් ගතයුතු. සෑම හැඟීමද මෙබඳුය. වඩුවෙකු දිනක් දුටු ලී වර්ගයක්, නැවත දුටුවිට හඳුනාගැනීම්, වෙළෙන්දෙකු දිනක් දුටු වෙළඳ බඩුවක් නැවත දුටුවිට හඳුනා ගැනීම, මේ ආදී වශයෙන් ඒ ඒ හැඟීම දතයුතු "මෙය මෙබඳුය"යි තීරණයකට බැසගන්නා බව පච්චු පට්ඨානයි. එනම් පළමු ගත්තා ලද අරමුණම දැකීසේ ගැනීමෙන් තීරණයකට බැසගන්නා බවයි. තමන්ට වැටහුණ පරිද්දෙන් අර මුණ ගැනීම පදට්ඨානයි. අන්ධයන් සමූහයක් ඇතා හඳුනා ගත්තාක් මෙනි. (අන්ධයන් සමූහයක් ඇතෙකු ළඟට පැමිණ, ඇතා හැඳිනගැනීම සඳහා ඒ ඒ අවයව අල්ලමින් පිරික්සූහ. එකෙක් හොඬවැල අල්ලා බලා - කල්පනාකර - ඇතා කෙසෙල් කඳක් බඳු යයි කීය. තවෙකෙක් පාදයක් අල්ලා ඇතා වංගෙඩි යක් බඳුයයි කීය. එකෙක් කණ අල්ලා, ඇතා කුල්ලක් බඳුයයි කීය. අනෙකා වලිගය අල්ලා බලා ඇතා මුස්නක් බඳුයැයි කීය. මේ ඔව්හු ඇතා හඳුනාගත් අයුරුයි)

සඤ්ඤා රාශියක් වුව ද ලක්ෂණ වශයෙන් එකක් බව තේරුම් ගතයුතු)

# සංස්කාර ස්කන්ධයෙහි ලක්ෂණාදිය.

**ඵස්ස** : "ඵුසන ලක්ඛණො ඵස්සො" අරමුණ ස්පර්ශ කිරීම් ලක්ෂණය ඵස්ස නම්. නැතහොත් අරමුණට වැදගැනීම් ලක්ෂණය යි අරමුණ හා සිත ගැටීම කෘත්‍යයයි චක්ෂුරාදි ද්වාර-අරමුණු-සිත යන මේ ධර්ම තුන්දෙනාගේ හමුවීම් බව පච්චුපට්ඨානයයි. පදට්ඨානය හමු වූ අරමුණමැයි.

**චේතනා** : පිළියෙල කිරීම ඒ සඳහා උත්සාහවත් බව ලක්ෂණයයි "චෙතයතීති චෙතනා" පිළියෙල කරනුයේ චේතනා යි කියේ එහෙයිනි. සම්ප්‍රයුක්ත-එක්ව යෙදුනු-ධර්ම තම තමාට අයත් කටයුත්තෙහි යෙදවීම රසයයි. ශ්‍රමදන මූලිකයා මෙනි. හේ තමත් ද වැඩෙහි යෙදී අනුන් ද එහි යොදවයි. ශිෂ්‍යගුරු ආදීහු ද මෙබඳුය. රසය රැස් කිරීමයි. මසුරා මෙනි. සංවිධානය-නියම කිරීම-පච්චුපට්ඨානයි.

ඒ ඒ සිතට අවශ්‍ය වූ සිතුවිලි-සම්ප්‍රයුක්ත ධර්ම-පදට්ඨානයි විතර්ක, විචාර, ප්‍රීති, මේවායේ ලක්ෂණාදිය පඨමජ්ඣාන විස්තරයේ දී දැක්විණ. සමාධිභාවනාමය ඤාණය බලන්න.

**විරිය** : උත්සාහය ලක්ෂණයයි සම්ප්‍රයුක්ත ධර්මයන්ට රුකුල්දීම රසයයි නො පසු බැසීම් බව පච්චුපට්ඨානයි. පදට්ඨානය සංවේගයයි නැතහොත් උත්සාහ කළ යුතු ක්‍රියාවයි. (සංවේගය නම් කලකිරීමයි 'අහෝ! මා මෙතෙක් මෙවැන්න නො කෙළෙම්" යි යනුවෙන් ඇතිවන පසු තැවීමයි)

**ජීවිතින්ද්‍රිය** : රූප ජීවිතින්ද්‍රිය මෙනි. රූපස්කන්ධය බලනු.

**සමාධි**: සමාධි භාවනාමය ඤාණයෙහි දක්වා ඇත

**සද්ධා** : ඇදහීම, විශ්වාසය ලක්ෂණයයි. එසේ ම අරමුණෙහි බැද සිටින්නාක් මෙන් පැවතීමද ලක්ෂණයෙකි. 'ඔක්කප්පන" යනු ඒයැ. පැහැදවීම රසයයි. නො පසුබැස ඉදිරියට යාමද කෘත්‍යෙකි. නො කැලඹුණු බව පච්චුපට්ඨානයි. ඇදහිය යුතු වස්තුව පදට්ඨානයි.

**සති** : අරමුණෙහි නො ඉල්පීම ලක්ෂණයයි. මුළා නො වීම කෘත්‍යයයි. සිත රැක ගැනීම පච්චුපට්ඨානයි. පදට්ඨානය ස්ථිර හැඟීමයි.

**හිරි** : පවට පිළිකුල් කිරීය ලක්ෂණයයි. පව් නො කිරීම කෘත්‍ය යයි. පාපයෙහි හැකිලෙන බව පච්චුපට්ඨානයයි. මූළු ගැහෙන, අදිමදි කරන ගතිය මෙයින් කියැවේ. කුලකාන්තාවක් මෙනි. පදට්ඨානය තම් ගෞරවය යි.

**ඔත්තප්ප** : බියවීම් ගතිය ලක්ෂණයයි "උත්තාස ලක්ඛණං ඔත්තප්පං" මෙහි උත්තාස යනු උත්‍රාසය යි. ලොමු දැහැ ගැනීම් මගයෙන් පවතින බියයි. බිය නිසා පව් නො කිරීම කෘත්‍යයයි. හැකිලෙන බව පච්චුපට්ඨානයි. පදට්ඨානය අනුන් පිළිබඳ ගෞරවයයි.

**අලෝභ** : අරමුණෙහි සිතේ ආසා නැතිකම ලක්ෂණයයි. නැත හොත් සිත නොලැහෙන, නො බැඳෙන ගතිය යි. නෙළුම් කොළයෙහි දියබිඳු මෙනි. රසය අපරිග්‍රහයයි. එනම් නො සෙවීමයි. "මුත්තාභික්ඛුවිය" රහත් භික්ෂුව මෙනි. පච්චුපට්ඨානය නො ඇලෙන බවයි. අශුචියෙහි වැටුණු පුරුෂයෙකු මෙනි.

**අදෝස** : නො සැඩ බව හෝ විරුද්ධකමක් නැති බව ලක්ෂණයයි) තමා ගේ පැවැත්මට බඳු මිත්‍රයෙකු මෙනි. තව වැදූරුම්. ආඝාත දුරුකිරීම හෝ දහ දැවිලි සන්සිඳවීම කෘත්‍යයයි. (නවවිධ ආඝාත, මෛත්‍රී කම්ස්ථානයේදී විස්තර කෙරිණ. සෞම්‍යබව-මිහිරි ගතිය- පච්චුපට්ඨානයයි.

**අමෝහ** : ඒ ඒ දේ පිළිබඳ විශෙෂ ලක්ෂණ දැන ගැනීම, අනිත්‍යාදි සාමාන්‍ය ලක්ෂණ දැන ගැනීම ලක්ෂණයයි. පහනෙහි ආලෝකය මෙන් සිතට හමුවූ අරමුණු ප්‍රකට බවට පත්කිරීම රස යයි, වනයෙහි හැසුරුණු පලපුරුදු මග පෙන්වන්නා සේ මුළා නොවන බව පච්චුපට්ඨානයි.

**කායපස්සද්ධි, චිත්තපස්සද්ධි**: වේදනා සඤ්ඤා, සංඛාර, යන ධම්වූ කායයෙහි හා සිතෙහි දරථ දරදඬුබව-සංසිඳවීම ලක්ෂණය යි. කාය-චිත්තයන් පෙළන්නා වූ උද්ධච්චාදීහු මැඩීම-යට පත් කිරීම-කෘත්‍යයයි. කාය-චිත්තයන් [illegible] විඩා සංසිඳුවා, සිසිල් බවට පත් කරන බව පච්චුපට්ඨානයි. පදට්ඨානය කාය-චිත්ත මැයි.

**කායලහුතා, චිත්තලහුතා** : චෛතසිකයන් ගේ හා සිතේ බර ගතිය සංසිඳවීම ලක්ෂණයයි. ඒවාම වැඩීම කෘත්‍යයයි. අදක්ෂකම නොමැති බැව් පච්චුපට්ඨානයි. බරගතිය ම අදක්ෂකම-දක්ඛතා-යන්නෙන් හැඳින් වූ අතර එසේ බර නැති ගතිය යි තේරුම් ගතයුතුය. කාය-චිත්ත දෙක පදට්ඨානයි.

**කාය මුදුතා, චිත්ත මුදුතා** : "කාය චිත්ත ථම්භවූපසමලක්ඛණා" චිත්ත චෛතසිකයන් ගේ දැඩි ගතිය, සංසිඳවීම ලක්ෂණය යි, ථද්ධ භාවෝ ථම්භො තදබව් ථම්භයි. ඒ තද ගතිය මැඩීම කෘත්‍යයයි. පදට්ඨාන පෙරසේයි.

**කායකම්මඤ්ඤතා, චිත්තකම්මඤ්ඤතා** : චිත්ත-චෛතසිකයන් ගේ අකර්මණ්‍ය භාවය-වැඩෙහි නො යෙදිය හැකි ගතිය-සංසිඳවීම් ලක්ෂණයයි. රසය ඒ අකර්මණ්‍ය භාවය මැඩීමයි. කර්මණ්‍ය නිසාම චිත්ත-චෛතසිකයන් ගේ අරමුණු ගැනීම ප්‍රයෝජනය බව පච්චුපට්ඨාන යි.

**කාය පාගුඤ්ඤතා, චිත්ත පාගුඤ්ඤතා** : චිත්ත-චෛතසිකයන් ගේ නොගිලන් බව ලක්ෂණයයි ගිලන්කම මැඩීම කෘත්‍ය යයි. වැරදි නැතිබව පච්චුපට්ඨානයි

**කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා** : චිත්ත-චෛතසිකයන් ගේ ඇද නැති බව-අජ්ජව-ලක්ෂණයයි. වඞ්ක - ඇද-බව මැඩීම රසයයි. සෘජුබැව් පච්චුපට්ඨානයි.

**ඡන්ද** : "කත්තුකම්‍යතා ලක්ඛණො ඡන්දො" කරනු කැමති බව ලක්ෂණයයි. අරමුණු සෙවීම රසයයි අරමුණෙන් ඇති වන බැව්-අත්ථිකතා-සම්පූර්ණ වීම, මදි නොවීම, පච්චුපට්ඨාන යි.

**අධිමොක්ඛ** : "සන්නිට්ඨාන ලක්ඛණො" සනිටුහන් කිරීම ලක්ෂණය යි. හැකිලීමක් නැතුව එළඹීම රසයයි. නිශ්චය පච්චුපට්ඨානයි. පදට්ඨානය සනිටුහන් කළයුතු ධර්මයි.

**මනසිකාර** : සිහිකරවීම් ලක්ෂණයයි. එක්ව යෙදුනු ධර්මයන් ගේ ගැලපීම රසය යි, අරමුණට අභිමුඛ බව පච්චුපට්ඨාන යි. මනසිකාරය තුන් වැදෑරුම්ය. වීථිපටිපාදක, ආරම්මණ පටිපාදක, ජවන පටිපාදක, යනුයි ප්‍රතිපාදක යනු පිළිවෙල

කරන්නා, සම්පාදකයා යන තේරුමයි. විත්තවීථි සිත් පරපුර-පිළිවෙල කරන මනසිකාරය වීථිප්‍රතිපාදක නම්. එය පඤ්චද්වාරාවර්ජන සිතට නමෙකි. ජවන පටිපාදක යනු කුසල, අකුශල ජවන් සිත් පිළිවෙල කරන මනොද්වාරාවර්ජන සිතට නමෙකි. ආරම්මණ පටිපාදක නම් චෛතසික යන්ට ඇතුලත් මනසිකාරයයි මෙය මෙතැනට එනුයේ.

**තත්‍රමජ්ඣත්තතා** : චිත්ත චෛතසිකයන් ගේ සමාන ඉසිලීම, සමානව ඒ ඒ වැඩෙහි පවත්වන ගතිය ලක්ෂණයයි. අඩු-වැඩිබව වැලැක්වීම රසයයි නැතහොත් පක්ෂපාතකම විනාශ කිරීම රසය යි. එක පක්ෂයකට නැඹුරු වීම පක්ෂපාතිත්වය යි. එවැන්නක් මෙයින් නො කෙරෙන බැවි උපවු පට්ඨානයි.

**කරුණා, මුදිතා,** දෙක බ්‍රහ්මවිහාර විස්තර කෙහි ඇත.

**විරති** (සම්මාවාචා-සම්මාකම්මන්ත-ආජීව) කාය දුශ්චරිතාදිය වීතික්‍රමණය නො කිරීම-නො කිරීම-ලක්ෂණයයි. කාය දුශ්චරිතාදියෙන් මෙත්වීම කෘත්‍යයයි. කායදුශ්චරිතාදිය නො කරන බැව් පච්චුපට්ඨානයි. පදට්ඨානය සද්ධා, හිරිඔත්තප්ප, අප්පිච්ඡතාදී ගුණයෝයි.

**අහිරික** : දුශ්චරිතයට ලජ්ජා නො වීම් ලක්ෂණයයි.

**අනොත්තප්ප** : පවට බිය නොවීම් ලක්ෂණයයි. මේ දෙකෙහි රසාදිය හිරි ඔත්තප්ප දෙකට දක් වූ ක්‍රමයෙහි විරුද්ධ පැත්ත සැලකීම් වශයෙන් දතයුතු.

**ලොභ** : අරමුණ දැඩිසේ ගැනීම් ලක්ෂණයයි. මඳුරා ලාටුවෙහි ඇලීම මෙනි. අරමුණෙහි සිත ඇලවීම රසයයි. අත් නො හැරීම පච්චුපට්ඨාන යි. කෙලෙස් උපදවන දෑ කෙරෙහි මිහිරි බව දැකීම පදට්ඨානයයි.

**මොහ** : නො දක්නා ගතිය ලක්ෂණයයි. අන්ධයෙකු මෙනි. එසේ ම නො දන්නා ගතිය ද ලක්ෂණයෙකි. රස දෙකකි. කරුණෙහි අනුරූ අවබෝධ නො කිරීම හා අරමුණෙහි හැටි වසා තැබීමයි. නො මනා පිළිවෙත හෝ [illegible]දුරු කිරීම හෝ පච්චුපට්ඨානය යි. අයොනිසො [illegible]සිකාරය පදට්ඨාන යි.

**දිට්ඨි :** නුනුවණින් බැස ගැනීම ලක්ෂණයයි. දැඩිසේ ගැන්ම කෘත්‍යයි. වැරදි ලෙස බැස ගැනීම- අරමුණට පිවිසීම-පච්චුපට්ඨානයයි. පදට්ඨානය ආර්‍යයන් නොදකිනු කැමැත්තයි.

**උද්ධච්ච:** නො සන්සුන් ගතිය ලක්ෂණයයි. සෙල වෙන සවභාවය රසයයි. අළුරැසකට ගලක් ගැසූ පරිදි විසිරෙන්නා සේ නැති ගැනීම් බව පච්චුපට්ඨානයයි. පදට්ඨානය අයෝනිසෝ මනසිකාරයයි.

**ථීන :** උත්සාහ නැති ගතිය ලක්ෂණයයි. වීර්‍යය දුරුකිරීම කෘත්‍යයයි. හීලෑබැසීම, එනම් පසුබැසීම පච්චුපට්ඨානයයි පදට්ඨානය අයෝනිසෝ මනසිකාරය යි.

**මිද්ධ :** අකර්මණ්‍ය බව-වැඩට සුදුසු නැති ගතිය ලක්ෂණයයි. මූවහ කිරීම කෘත්‍යය යි. හැකිළීම හෝ නිදාවැටීම පච්චුපට්ඨානයයි.

**මාන :** උඩඟු බව ලක්ෂණය යි. නො නැමීමට මනාසේ රැකුල් දීම රසයයි, උසස් කන්ගි තබා පෙන්වන ගතිය පච්චුපට්ඨානයි. පදට්ඨානය ලෝභයයි.

**දෝස :** සැඩ පරුෂ ගතිය ලක්ෂණය යි. දණ්ඩකින් පහර ලත් සර්පයෙකු මෙනි. සර්ප විෂ නගින්නාක් මෙන් පැතිරියෑම හෝ ලැව්ගින්නක් මෙන් ආශ්‍රය වූ හෘදය වස්තුව ම දැවීම හෝ රසයයි දූෂ්‍යභාවය-සිත කිළුටු කරන බව පච්චුපට්ඨානයි. පදට්ඨානය කිපිය යුතු වස්තුවයි.

**ඉස්සා :** අනුන් ගේ සම්පත් නො ඉවසන ගතිය ලක්ෂණයයි. එහි නො ඇල්ම රසයයි. පරසම්පත් නො ඉවසන නිසා ම මුහුණ හකුලා ගන්නා බව පච්චුපට්ඨාන යි. පරසම්පත් පදට්ඨානය යි.

**මච්ඡරිය :** තමා ගේ සම්පත් සඟවන ගතිය ලක්ෂණයයි. තමා ගේ සම්පත් අනුන් ගේ සම්පත් හා සාධාරණ බව ඉවසීම කෘත්‍යය යි පච්චුපට්ඨානය හැකිලෙන බැව් ය. පදට්ඨානය තමා ගේ සම්පත් ය.

**කුක්කුච්ච :** පිළිකුල් කටයුතු පාපක්‍රියා කොට පසුතැවිලිවීම් ලක්ෂණයයි. කළ දුශ්චරිතය හා නො කළ සුචරිතය ගැන සිතා

2019 10 05 Paññápárami Na Uyana Free Distribution

කණගාටුවීම කෘත්‍යයයි. විපිළිසර බව පච්චුපට්ඨානයි. පදට්ඨානය කළ නො කළ දේයි.

විචිකිච්ඡා : බුද්ධාදීන් කෙරෙහි සැක කිරීම් ලක්‍ෂණයයි. කම්පාවීම -නැතිගැනීම-රසයයි. නිශ්චය නො වීම හෝ ඒකාන්ත වශයෙන් නො ගැනීම හෝ පච්චුපට්ඨානයයි. අයොනිසො මනසිකාරය පදට්ඨානයි.

මේ සංස්කාර ස්කන්ධයෙහි ලක්‍ෂණාදියයි. මේ දක්වූයේ කොටියෙන් බැව් සැලකිය යුතු.

## විඥාන ස්කන්ධයෙහි ලක්‍ෂණාදිය.

විඥාන-විඤ්ඤාණ-රාශියක්යැයි දක්වූවද අර්ථ වශයෙන් එකකි. එහි ලක්‍ෂණය ආරම්මණ විජානනයයි. එනම් අරමුණු දැන ගැනීමයි. “ආරම්මණං විජානාතීති විඤ්ඤාණං” යනු විග්‍රහයයි ඒ ඒ රූපාදී අරමුණු හඳුන්වා දීම රසයයි. ඒ අරමුණු අවුත් වැදෙන බැව් පච්චුපට්ඨානයි. පදට්ඨානය රූපාදී අරමුණු මැයි.

මෙසේ පඤ්චස්කන්ධයෙහි ලක්‍ෂණාදිය විදර්ශකයා විසින් අව බෝධ කටයුතු හෙයින් වෙන ම දක්විණි.

## පඤ්චස්කන්ධය පිළිබඳ උපමා.

රූපස්කන්ධය පෙණ පිඬුවක් බඳුය. වේදනා ස්කන්ධය දිය බුබුලක් වැනිය. සඤ්ඤාස්කන්ධය මිරිඟුවක් වැනිය. සංස්කාර ස්කන්ධය කෙසෙල් කඳක් බඳුය. විඥාන-ස්කන්ධය මායාවක් බඳුය.

මඩ කළ කුඹුරක රැඳි ජලය, මුදුහරින් ම ඒ ජලයෙහි ඇති බොරගතියත්, පණුවත්, තණ සැබලි ආදියත්, පළමු ජලපහර වැටෙන තැන පිඬුවක් සේ එක්වෙයි. ඒ පෙණ පිඩයි. එහි ඇත්තේ අපිරිසුහු දේ හා කුඩා සතුනුත්ය. ඇතැම්විට දියනයි, දියබරි, ආදී සතුන් ද ඇත. ඒ පෙණ පිඩ අතින් ගතහොත් කුණු තැවරේ. මෙසේ පිළිකුල් ගතිය හා පණුකැලත් වෙසෙන බ[illegible] එහි සවභාවයයි. රූපස්කන්ධයත් එමෙනි. එහි කුණප රාශියක් ඇත. නව දොරින් අපිරිසිදු දෑ ගලයි. එසේ ම දුර්ගන්ධය, අසූකුලය[illegible] පණුවන් වෙසෙන තැනකි. මෙසේ රූපස්කන්ධය පෙණ පිඩකට හා සමානය

දියබුබුල ඈත සිට බලන්නෙකුට මිහිරියේ වැටහෙයි. එහෙත් එය මොහොතකින් අවශානය. වේදනාවත් එසේ ම මිහිරියේ වැට හුණේ සමුදු වහා විනාශ වෙයි. මිරිඟුව යනු දැඩි හිරු රැස් ඇති කාලයක්හි පොළොවෙන් නගින ගිනි දැල්ලේ අවශානය මෙන් පෙනෙන පොපියන සැලෙන-ගතියයි. එය දුර සිට බලන්නෙකුට ගලාබස්නා ජලයක් සේ වැටහෙයි. බොහෝවිට මෙයට මුලා වනුයේ මුව ආදී සත්හුය. එමෙන් සඤ්ඤාවෝ ද හරයක් නොමැති නිසාත්, හරයක් ඇති සේ වැටහී රැවටෙන නිසාත් මිරිඟුව හා සමානය.

සංස්කාරස්කන්ධය කෙලෙස් කඳකට උපමා කළේ, කෙසෙල් කඳ පතුරු ගලවා වෙන් කළ කල්හි කෙසෙල් කඳක් දක්නට නැත. එහි ඇත්තේ පතුරු රැසකි. සංස්කාරස්කන්ධයද ඵස්ස වේදනා දී ධර්ම වෙන් කළ විට දක්නට ඇති සත්වයෙක් පුද්ගලයෙක් නැත. මෙසේ සණසඤ්ඤව වලක්වනු සඳහාය. විඥානස්කන්ධය උපමා කළේ මායාවකටය. මක්නිසාද? වංචාකරන බැවිනි. මායාකාරයෝ මැණික් නොවූ ගල්කැට මැණික් සේ පෙන්වත්. වැලි සීනි කර පෙන්වත්. එමෙන් පරිත්‍යාග-දීම-ගතිය පෙන්වා ඇතුළතින් ලෝභය උපදවයි. කරුණා ගතිය පෙන්වා යමක් පැහැර ගෙන යයි. පිළිකුල් දෑ පිළිකුල් නැති සේ දකියි, අසාර දෑ සාර-සරු-සේ වශයෙන් පෙනේ. මෙසේ මුලා කරණ හෙයින් විඥානස්කන්ධය මායාවකට බඳුයි.

පඤ්චස්කන්ධ විභාගය අවශානය.

## ආයතන විභාගය.

“ද්වාදසායතනානි, චක්ඛායතනං රූපායතනං සොතායතනං සද්දායතනං ඝාණායතනං ගන්ධායතනං ජිව්හායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං මනායතනං ධම්මායතනං”ති -වි. ප.

ආයතන දොළොසෙකි චක්ඛු, රූප, සෝත, සද්ද, ඝාණ, ගන්ධ, ජිව්හා, රස, කාය, ඵොට්ඨබ්බ, මන, ධම්ම, යනුයි. මෙයින් සයක් ආධ්‍යාත්මිකය එනම් තමා කෙරෙහි පවතින ඒවාය. සයක් බාහිරය. පිට[illegible] පවතින ඒවාය. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන, [illegible] සය ආධ්‍යාත්මිකයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම, සය බාහිරය.

## ආයතන යන්නෙහි අදහස.

. "ආයතනො ආයතනං" තමාට අයත් කොටසෙහි නැතහොත් වැඩෙහි සීමා වශයෙන් උත්සාහ කරන බැවින් ආය තන නම්. ඇස, ඇසට අයත් වැඩය වූ (කෘත්‍යය) රූපාරම්මණය ලැබුණායයි සිතට දැනුම් දීම සඳහා උත්සාහ කරයි. රූපය, ඇසට ලක්වීම සඳහා, එතෙක්ම උත්සාහ කරයි. සිත, තමා ගේ කෘත්‍යය වූ ඒ රූපාරම්මණය ගැනීම සඳහා උත්සාහ කරයි සෙසු ආයතන යෝ ද මෙසේමය. එහෙයින් තමාට අයත් කෘත්‍යයන්හි උත්සාහ කරන බැවින් ආයතන නම්.

2. "ආයානං තනනතො ආයතනං" මෙහි ආය යනු චිත්ත- චෛතසිකයන්ය. ඒ චිත්ත-චෛතසිකයෝ අවුත් පතුරු වන හෙයින් නැතහොත් විස්තර බවට පත් කරන හෙයින් ආය තන නම්. 'තං තං ආරම්මණෙසු ආයනති ආගච්ඡනති පවත් තනතීති ආයා" යන නිර්වචන හෙයින් ඒ ඒ ද්වාර, ආරම්මණ, කෙරෙහි එත් පවතිත්, තුයි ආය නම්.

"ආයතස්ස ච නයනතො ආයතනං" මෙහි ආයත යනු දිග් වූ සසරට නමකි. එයට පමුණුවන බැවින් ආයතන නම්. ඇස, රූපය, සිත, යන කරුණු තුන එක්වූ විට ස්පර්ශය උපදී. ස්පර් ශය නිසා වේදනාව - වේදනාව නිසා ආසාව - මේ ආදී වශයෙන් දිග් වූ සසරට ම මේ ආයතනයෝ හේතු වෙත්.

තවද තේරුම් කිපයක්. වාසස්ථාන, ආකර, සමොසරණ, සඤ්ජාති, කාරණ, මේ අර්ථ ද ආයතන ශබ්දයෙන් ප්‍රකාශ වෙයි.

වාසස්ථාන යනු වසන තැනයි. දෙවියන් වෙසෙන තැන හඳුන්වනුයේ "දේවායතන" නාමයෙනි. එමෙන් චිත්ත-චෛත සිකයන් මෙහි වසන බැවින් චක්ඛාදිය ආයතන නම්. ආයතන නො මැතිනම් චිත්ත - චෛතසිකයන් නො පවතී. ආකර යනු ලෝහ , මිණිරන්, ආදී දෑ උපදින ස්ථානයට ව්‍යවහාර කරන නමකි. බොහෝ රත්රන් උපදින තැන "සුවණ්ණායතනය" කිවාක් මෙනි. එමෙන්ම චිත්ත -චෛතසිකයන් උපදින බැවින්ද පවත්නා බැවින්ද චක්ඛාදීහු ආයතන නම් වෙත්. සමොසරණ නම් එකා මෙකා හැසිරීමයි. "මනොරමෙ ආයතනෙ සෙවනති නං විහඞ්ගමා" මහරහතන් වහන්සේලා නමැති පක්ෂීහු ඉතාමත් මනහර වූ සර්වඥ සාසනයෙහි ඔබිනොබ හැසිරෙත්. සේවනය කෙරෙත්. මෙපරිද්දෙන්ම චිත්ත - චෛතසිකයෝ ඔබිනොබ

2019 10 05 Paññápárami Na Uyana Free Distribution

හැසිරෙමින් ඇසුරු කරන නිසා ද චක්ඛාදීහු ආයතන නම් වෙත්. උපත් තැන "සඤ්ජාති" නම්. "දක්ඛිණා පථො ගුන්නං ආයතනං" දක්ෂිණා පථය ගවයන් උපදින ප්‍රදේශයකි. මෙසේ උපදින ස්ථානයටද ආයතන නාමය ව්‍යවහාර කෙරේ. චිත්ත - චෛතසිකයන් ද උපදින බැවින් චක්ඛාදීහු ආයතනයෝයි. තවද, චිත්ත-චෛතසිකයන්ට චක්ෂුරාදීහු කරුණු වන බැවින් ද ආයතන නම් වෙත්.

මෙසේ ආයතන ශබ්දයට තේරුම් කීපයකි. ඒ හැම පොදු නාමයි.

## ආයතනයන් ගේ විශෙෂ තේරුම්.

1. චක්ඛු : "චක්ඛතීති චක්ඛු" ආශ්වාදනය - රස විඳීම- කෙරේ නුයි චක්ඛු නම්. ඇස රූපාරම්මණයෙහි රස විඳියි. එසේම රූපයෙහි ඇති සම - විෂම- හොඳ - නරක දෙක ප්‍රකාශයට පත් කරනුයේ ද ඇසෙනි. එහෙයින් සම-විසම බව ප්‍රකාශ කෙරේනුයි චක්ඛු නම්.

2. රූප: "රූපයතීති රූපං" සිතට දැනුනු පසු "මේ කළුය, මේ සුදුය" යනාදී වශයෙන් රූපයන් ගේ ඒ ඒ වෙනස් අයුරු ප්‍රකාශ කෙරේනුයි රූප නම්. රූපයන් ගේ ඇති ඒ ඒ ආකාර-හැටි ලොවට දැනුම් දෙනුයේ සිතෙනි. මේ රූපය කළුයි. මේ රූපය සුදුයි. මේ රූපය මහතයි. මේ වශයෙන් ඒ ඒ අයුරු සිත නිසාම හැඳින ගනී. ඒ සිතෙන් හැඳිනීමට හේතුවන දෑ රූපය යි කී අයුරුයි මුල් විග්‍රහයෙන් දැක්වූයේ.

3. සොත : "සුණාතීති සොතං" අසනුයි සොතනම්. යමකින් අසනු ලැබේද, ඒ දෙය, සොත-කණ-සොතයි.

4. සද්ද : සද්දතීති සද්දො" ඒ ඒ හඬ නගිනු ලැබෙනුයි ශබ්ද නම්. හේතු රැස් වූ විට ශබ්ද පැතිරේ. ශබ්දය නැගේ. එය සොතවිඤ්ඤාණයෙන් දතයුතු බවට හගවනු ලැබෙනුයි ශබ්දයැයි කියනු ලැබේ.

5. ඝාණ : "ඝායතීති ඝාණං" ආඝ්‍රාණය - ඉඹීම- කෙරෙනුයේ ඝාණ නම්. ගඳ සුවඳ-දැනගන්නා ස්ථානය මෙයින් කියැවේ.

6. ගන්ධ : “ගන්ධයතීති ගන්ධො” තමාට අයත් ද කියයි නුයි ගන්ධ නම්. මේ දුගඳය, මේ සුගඳය, මේ වශයෙන් තමාගේ -ඒ සුවඳෙහි- හැටි දැනුම් දීම එයින් ම ප්‍රකාශයට යෙයි. මෙයද සිතෙහි විකෘතියකි.

7. ජිව්හා : “ජීවිතමව්හයතීති ජිව්හා” ජීවිතය කැඳ වයි නුයි ජිව්හා නම්. ආහාරයෙහි ඇති ඕජාව හිතකර යැයි දැනුම් දීම නිසා දිව කරනුයේ ජීවිතයලබා දීමකි. කැඳවීමකි. එහෙයින් ජීවිතය කැඳවීම කරනුයේ ජිව්හා-දිව-යි.

8. රස : “රසන්ති තං සත්තා ති රසො” සත්වයෝ එය ආශ්වාදනය-රසවිඳීම - කෙරෙනුයි රස නම්. රස විඳීමට උපකාර වන ආහාරයෙහි ඇති ශක්ති විශේෂය මෙයින් කියැවේ.

9. කාය : “කුච්ඡිතානං සාසව ධම්මානං ආයොති කායො” පිළිකුල් කටයුතු පාපධර්මයන් - කාමාදී ආශ්‍රවයන් හෙන් යුත් ධර්මයන්-ගේ උප්පත්තිය ඇති වන ස්ථාන වේනුයි කාය නම්. එනම් ශරීරය යි.

10. ඵොට්ඨබ්බ ; “ඵුසතීති ඵොට්ඨබ්බො” ස්පර්ශ කෙරේ නුයි ඵොට්ඨබ්බ නම්.

11. මන : “මුනාතීති මනො” දැනගනී නුයි මන නම්. ඒ දැන ගන්නේ අරමුණයි චිත්ත විග්‍රහය ද සැලකිය යුතු.

12. ධම්ම : අත්තනො ලක්ඛණං ධාරයන්තීති ධම්මා” තමා ගේ හැටි - සවභාවය-දරත්නුයි ධර්ම නම්. ධම්ම ශබ්දයේ විග්‍රහ ද ධම්මට්ඨිති ඤාණ විස්තරයේ මුලදීම දක්වා ඇත.

ආයතනයන් ගේ ලක්ෂණාදිය පඤ්චස්කන්ධ විභාගයෙහි දක්වූ පරිද්දෙන් සලකා ගතයුතු. ආයතන ද නාමරූප වශයෙන් දෙපරිදිම වෙයි. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, යන දසය හා ධර්මායතනයෙන් අඩක් ද රූප ධර්ම යි. මනායතනය හා ධර්මායතනයෙන් අඩක් ද නාම ධර්මයි.

ධර්මායතනයෙන් රූපධර්මයන්ට අයත් අඩ -එකදේශය නම සොළොස් සූක්ෂම රූපයෝයි. (ආපෝ, භාවරූප, හ[illegible], ජීවිතින්ද්‍රිය, ආහාර, ආකාශ, විඤ්ඤත්ති, විකාරරූප, ලක්ඛණ [illegible]ප, යන දසයයි) නාම ධර්මයන්ට අයත් එකදේශය චෛතසික [illegible] දෙපණසයි. නිර්වාණය ද ධර්මායතනයට අයත්ය. එහෙත් අවබෝධ නො කළ හෙයින් නාම රූප විනිශ්චයේ දී එය ගනු නොලැබේ.

තවද, අට්ඨාරස ධාතු, දෙවිසි ඉන්ද්‍රිය, යන මෙතෙක් ධර්ම ද දිට්ඨිවිසුද්ධියට අවශ්‍යය. ඒවා සුතමය ඥාණයෙහි විස්තර කර ඇත. චතුරාර්ය සත්‍යය ද මීට ඇතුළත් වූ නමුදු ඉදිරි ඥාණවිස්තරයේ දී සඳහන් වන බැවින් මෙහිලා දුක් වීම ප්‍රපඤ්ච වීමට කරුණකි. මෙතැන් සිට දක්වනුයේ දිට්ඨි විසුද්ධිය සම්පාදනය කරන අයුරුයි.

ස්කන්ධාදි විස්තරය මෙතෙකින් නිමි.

## දිට්ඨි විසුද්ධිය

"තං සම්පාදෙතුකාමෙන සමථයානිකෙන තාව ඨපෙත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං අවසෙස රූපාරූපාවචරඣානානං අඤ්ඤතරතො වුට්ඨාය විතක්කාදීනි ඣානඞ්ගානි තං සම්පයුත්තා ච ධම්මා ලක්ඛණරසාදි වසෙන පරිග්ගහෙතබ්බා"-වි. ම.

ඒ දිට්ඨිවිසුද්ධිය සම්පාදනය කරනු කැමති සමථයානිකයා විසින්. පළමුකොට, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය හැර ඉතිරි රූප, අරූප. ධ්‍යාන අතුරෙන් එකකින් නැගිට, ඒ ධ්‍යාන යෙහි ඇති ධ්‍යානාඞ්ග හා ඒ හා යෙදුනු ධර්ම ද ලක්ෂණ රසාදි වශ යෙන් පිරිසිඳිය යුතුය.

මෙසේ ආ බැවින් සමථයානික යෝගියා විසින් පළමුකොට නාමධර්ම පරිග්‍රහ කළ යුතු - පිරිසිඳිය යුතු ඉක්බිති සර්පයෙකු දුටු පුරුෂයෙක් ඔහු පසුපස එළවා ගොස් ඒ සර්පයා වෙසෙන තුඹස දක්නාසේ ඒ යෝගියා ද නාම ධර්ම විමසූ පසු ඒ පවත්නේ කව රක් අසුරුකරදැයි විමසනුයේ පළමුකොට හෘදයවස්තුරූපය දකී, ඉක්බිති ඒ හෘදයවත්තුවට නිශ්‍රය වූ සතර මහා භූතරූප ද සෙසු උපාදාය රූප සූවිස්සදැයි මෙසේ අටවිසි රූපම විමසා, ඒ සියල්ල වෙනස්වීම් බවට පත්වේයයි කෙටියෙන් රූපධර්ම පරිග්‍රහ කෙරේ. මෙසේ ඇතැම් යෝගියෙක් සංක්ෂෙපයෙන් නාම-රූප ව[illegible]ස්ථා කෙරෙමින් දිට්ඨි විසුද්ධිය සම්පාදනය කෙරේ. මේ කෙටි ක්‍ර[illegible]යි.

විස්තර ක්‍රමයෙන් බලතහොත් සමථයානිකයා හෝ විදර් ශනායානිකයා හෝ ක්‍රම කීපයකින්ම නාම - රූප පරිග්‍රහයම

බැසගන්නා බව පෙනේ. පෙර පඤ්චස්කන්ධාදී ධර්ම සමූහයක් විස්තර කළේ ඒ ක්‍රමයන්ට උපකාර කරගැනීම සඳහාය. මෙහිලා ක්‍රම කීපයක් දැක්වේ

## ධාතුකර්මස්ථාන ක්‍රමයෙන් නාමරූප පරිග්‍රහය

මීට අනුව නාමරූප පරිග්‍රහයට දිට්ඨිවිසුද්ධිය සම්පාදන කරන යෝගාවචරයා ප්‍රථමයෙන් රූප පරිග්‍රහයට බසියි. ඒ මෙසේය. කේශයෙහි කායදසක, භාව දසක, යන රූප විස්ස (20) පළමුකොට දකී. කාය, දසක රූපයෝ නම් පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය. කායප්‍රසාදය යන දහයයි. භාව දසකය නම් කායප්‍රසාදය වෙනුවට භාවරූපය බහාලූකල එන රූප දසයි. ඉක්බිති කර්ම චිත්ත, සෘතු, ආහාර යන සතරින් හටගත් අවිනිර්භෝග රූප අට; අට, ගෙන රූප සූවිස්සක් දකියි. එවිට සියල්ල රූප සුසාළීසකි. (44) ඊට පසු ඉතිරි දෙතිස් කුණප අතුරෙන් සුසාළිස් රූපයක් ඇති කුණප කොටස් සූවිස්ස (24) කොයයි. ඒවා කේසා, ලෝමා නඛා, දන්තා, තචෝ' මංසං, නහාරු, අට්ඨි, අට්ඨිමිඤ්ජා, වක්කං, හදයං, යකනං, කිලෝමකං, පිහකං, පප්ඵාසං, අන්තං, අන්තගුණං, මත්ථලුඞ්ගං, පිත්තං, සෙම්හං, මෙදෙ, වසා, ලෝහිතං, ලසිකා යනුයි. මේ කොටස් විසි හතරෙහි සුසාළිස බැගින් රූපයෝ වෙත්. එවිට සියල්ල 44×24 ගුණ කළවිට එක්දහස් සපණසක් රූපයෝ හමුවෙත්. ඉක්බිති ඍතු-චිත්ත දෙකින් හටගන්නාවූ සෙදෙ, අස්සු, ඛෙලෝ, සිඞ්ඝානිකා යන කොටස් සතරෙහි එකක අවිනිර්භෝග රූප අට බැගින් සොළසක් හමුවෙයි. (ඍතු-අටයි. චිත්ත-අටයි) සතරෙහි ම සූසැටෙකි (16×4=64) ඒ සමග ම සෘතුවෙන් හටගත් උදරිය, කරීස, පුබ්බ; මුත්ත, කොටස් සතරෙහි අට බැගින් දෙතිසක් හමුවෙයි. (8×4=32) සියල්ල සයානූවෙකි. (64 + 32 = 96) මෙසේ දෙතිස් කුණපයන්හි සියලු රූප එක්දහස් එක්සිය දෙපණසෙකි. (1056+96=1152)

ඉක්බිති තේජෝ ධාතුවට අයත් රූප පරිග්‍රහ කෙරේ. කනු ලබන ආහාර පැසවන තේජෝ ධාතු කොටසෙහි අවිනිර්භෝග රූප හා ජීවිතින්ද්‍රිය යන රූප නවයක් ඇත. සෙසු තේජෝ ධාතු කොටස් තු[illegible]හි අවිනිර් භෝග රූප අට බැගින් සූවිස්සෙක් වෙයි. සියල්ල [illegible]තිස් තෙතිස් රූපයකි. (33) වායෝ ධාතුව අතුරෙන් ආශ්වාසය ප්‍ර[illegible]ශ්වාස වායු වෙහි අවිනිර්භෝග රූප අට හා ශබ්දයත් සමග චිත්තජරූප නවයක් ඇත. ඉතිරි වායෝ කොටස් පසෙහි කර්ම, චිත්ත, සෘතු:

රූපයෝ සතලිහ බැගින් එක්සියවිස්සෙක් වෙත්. සියල්ල එක්සිය විසිනවයකි. මේ තෙජෝ, වායෝ, රූප කොටස් කැටිකර බලත හොත් සියලු රූප දෙසිය අසූදෙකකි. (282) ඒ මෙසේය.

තෙජෝ, වායෝ, ධාතු දෙකට අයත් කොටස් දසයෙකි. එයින් තෙජෝ ධාතුවට පරිපාචකාදී සතරයි. වායෝ ධාතුවට උද්ධඞ්ගමාදී සයයි. මෙයින් තෙජෝ ධාතුවට අයත් සතර අතුරෙන් පරිපාචක තෙජෝ ධාතුවෙහි ඇත්තේ රූප කොටස් නවයෙකි. අවිනිර්භොග අට හා ජීවිතින්ද්‍රියත්ය. වායෝ ධාතුවට අයත් සය අතුරෙන් ආශ්වාස ප්‍රශ්වාස කොටසෙහි රූප නවයෙකි. අවිනිර්භොග අට හා ශබ්ද රූපත්ය. මේ දෙකෙහි රූප අටළොසකි. (18) ඉතිරි කොටස් අටෙහි එක එක කොටසක් පාසා රූප තෙතිස බැගින් ඇත. [සමුට්ඨාන තුනට අනුව රූප 24 යි. පෙර කී ජීවත නවකයත් සමග 33 යි) සියල්ල දෙසිය අසූදෙකකි. (33 × 8=264 + 18=282) මෙය කලාප සන්මර්ශනයේදී විස්තර කෙරේ.

මෙසේ පඨවිධාතු රූප කොටස් විස්ස ආපෝ ධාතු රූප කොටස් දොළොස, තෙජෝ ධාතු රූප කොටස් සතර, වායෝ ධාතු රූප කොටස් සය යන දෙසාළිස් කොටස්හි රූප ප්‍රකට වෙයි.(පඨවි–ආපෝ=1152 යි. තෙජෝ, වායෝ–282 යි) ඉක්බිති මේ රූප කොටස් මනාසේ ප්‍රකටවූ පසු ද්වාරානුසාරයෙන් නාමධර්ම විමසයි. ප්‍රධාන වශයෙන් චක්ෂුද්වාරයෙහි නාමධර්ම දෙකකි. අකුසල විපාක වූ උපෙක්ඛාසහගත චක්ඛුවිඤ්ඤාණය, කුසල විපාකවූ උපෙක්ඛා සහගත චක්ඛුවිඤ්ඤාණය, යන දෙකයි. සොතද්වාර, ඝාණද්වාර, ජිව්හා ද්වාර, කායද්වාර සතරෙහි ද, එසේම සිත් දෙක බැවින් සියල්ල සිත් දසයෙකි. මේ දසයට දෙපස් විඤ්ඤාණ යනු නමකි. මනොද්වාරයෙහි සිත්. එක්සැත්තෑවකි (71) මනොධාතුවූ සම්පටිච්ඡන සිත් දෙක හා පඤ්චද්වාරාවර්ජන සිත, යන සිත් තුන ද, මනොවිඤ්ඤාණ ධාතුවූ ඉතිරි සිත් අටසැටද යනුයි. මෙසේ ලෞකික සිත් එක් අසූවක් පරිග්‍රහ කරයි. ඒ සිත්හි පවත්නාවූ ඵස්සාදී චෛතසික දෙපණස ද පරිග්‍රහ කර, සියල්ල නමන ලක්ෂණ වශයෙන් නාමයයි සිත තබයි.

විස්තර වශයෙන් බලතහොත් චක්ෂුද්වාරයෙහි පමණක් සිත් සතළිස් සයක් උපදියි. සොතද්වාරයෙහිත් එසේමය. මනොද්වාරයෙහි සිත් සත්සැටක් (67) උපදියි. ඒ මෙසේය. "තත්ථ පඤ්චද්වාරාවජ්ජන චක්ඛුවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන කාමාවචර ජවන තදාලම්බන වසෙන ඡ චත්තාලීස චිත්තානි චක්ඛුද්වාරෙ යථාරහං උප්පජ්ජන්ති"

— අ. සං.

පඤ්චද්වාරාවර්ජනය, චක්ෂුර්විඥාන සිත් දෙක, සම්පටිච්ඡන සිත් දෙක, සන්තීරණ සිත් තුන, වොට්ඨපනය, කාමාවචර ජවන් එකුන්තිස, තදාලම්බන අට, යන සිත් සතළිස් සයයි. (විස්තර අභිධර්මාර්ථ සංග්‍රහයෙන් බලන්න.)

## මනෝද්වාරයෙහි උපදිනා සිත් සත්සැට (67)

ලෝකෝත්තර සිත්ද ධ්‍යාන ක්‍රමයෙන් ගෙන ජවන් පස්පණසෙකි (55) තදාලම්බන එකොළොසෙකි. මනෝද්වාරාවර්ජනයත් සමග සත්සැටයි. ලෝකෝත්තර සිත් නාම ධර්ම වශයෙන් අධිගත - අවබෝධ - නො කළ හෙයින් නාම පරිග්‍රහයට නොගැනේ. එහෙයින් ක්‍රියා ජවන් හා ලෝකෝත්තර කුශල් ජවන් නොගැනේ. එවිට ද්වාරයන්හි කාමාවචර ජවන් විස්සෙකි. නවයක් අත්හැරේ. හසිතුප්පාදය හා ක්‍රියා සිත් අටයි. මනෝද්වාරයෙහි ජවන් නවයයි. එනම් රූප අරූපයි. මෙසේ ද්වාර වශයෙන් නාම ධර්ම පරිග්‍රහකොට මෙතෙක් රූප ධර්මයෝය. මෙතෙක් නාම ධර්මයෝයයි පිරිසිඳියි. මේ ධාතු කම්මට්ඨාන වශයෙන් නාමරූප පරිග්‍රහ කරන අයුරුයි.

## ඇතැම් යෝගාවචරයෙක් අටලොස් ධාතු ක්‍රමයෙන් නාම-රූප පරිග්‍රහ කෙරේ.

(අටළොස් ධාතු විස්තරය සුතමය ඤාණයෙහි ඇත.)

චක්ඛු ධාතු, රූපධාතු, චක්ඛුවිඤ්ඤාණධාතු, සෝත-සද්ද-සෝතවිඤ්ඤාණ ධාතු, ඝාණ-ගන්ධ-ඝාණ විඤ්ඤාණධාතු, ජිව්හා-රස-ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය - ඵොට්ඨබ්බ - කාය විඤ්ඤාණ ධාතු? මනොධාතු, ධම්මධාතු, මනොවිඤ්ඤාණධාතු මෙය අටලොස් ධාතු.

මෙයින් චක්ඛුධාතු ආදිපඤ්චද්වාරය ද රූපාදි ආරම්මණ පසද, ධම්මධාතුයෙහි අඩක්ද, (සූක්ෂමරූප සොළස) රූප ධර්මයි, සෙසු ධාතු නාමධර්මයි. මේ සංක්ෂෙප ක්‍රමයයි.

විස්තර වශයෙන් පරිග්‍රහ කරණ යෝගාවචරයා ප්‍රථමයෙන් චක්ෂු ධාතුයෙහි රූපධර්ම සොයයි. එවිට මෙසේ දකියි. චක්ඛු ධාතු නම් කළු, ඉතා කළු, මඩුල්ලකින් සැරසුණු දිග-පළල ඇති. ඇස් වලෙහි පිහිටි මස්ගුලිය නො වෙයි, එසේ සලකනුයේ අන්ධ බාලනායි. මෙහි චක්ඛු ධාතු යනු චක්ෂුප්‍රසාදයයි. එහි රූප ධර්ම තෙපණසක් ඇතැයි ව්‍යවස්ථා කෙරේ. ඒ තෙපණස (53) නම

කර්මජ රූප එකුන්තිසයි. (29) සෙසු සමුට්ඨාන රූප සූවිස්සයි. (24) - 29 + 24=53-මේ කොට්ඨාසයනි. (ගණිනු ලබන ක්‍රමය දැක්වීමට ගිය හොත් ප්‍රපඤ්ච වෙයි. මෙවැනි ධර්ම තෝරාගැනීමට අභිධර්ම දැනුම් අවශ්‍යය ) සෝත, ඝාණ, ජිව්හා යන ධාතුත් මෙසේමය. (53 × 4=212) ඒවාට ගෝචරවූ රූපාදී පස හා පඤ්චප්‍රසාද, දස ධාතු නම්. කාය ධා වෙහි අන්තර්ගත් කර්මජ රූප නවයයි, කාය දශකය, සෙසු ත්‍රිජරූප සූවිස්ස යන තෙසාළිස් රූපයන්ම. (9+10+24=43) ධම්මධාතුවට අයත් සොළොස් සූක්ෂම රූප ද, රූපධර්මයන්ට ම අයත්ය. මෙසේ ගත්කල සියලු රූප දෙසිය අසූඑකකි. (212+43+10+16 = 281)

නාමධර්ම නම් චක්ඛුවිඤ්ඤාණාදී සප්තවිඤ්ඤාණ ධාතු හා ධම්මධාතුවට අයත් චෛතසික දෙපණසයි. (සප්තවිඤ්ඤාණ ධාතු: චක්ඛාදී පඤ්චකය හා මනෝධාතු, මනෝවිඤ්ඤාණධාතු යන සතයි.)

මෙසේ අට්ඨාරස ධාතු වශයෙන් නාමරූප පරිග්‍රහ කෙරේ.

ආයතන ක්‍රමය ද මෙපරිද්දෙන් සලකාගත හැකිය. ඇතැම් යෝගාවචරයෙක් ස්කන්ධ ක්‍රමයෙන් විමසයි.

කර්මජාදී චතුජ-කර්මාදී කරුණු සතරින් හටගත් පඨවි, ආපෝ, තෙජෝ, වායෝ යන සතර භූතයෝද ඒවා නිඃශ්‍රිතකොට ඇති වර්ණ, ගන්ධ, රස, ඕජා යන සතර රූපයෝ ද ප්‍රසාද රූප පස හෘදයවස්තු රූපය, භාවරූපය, ජීවිතින්ද්‍රිය යන දොළොස් රූප, හා චිත්ත-ඍතු යන ද්විජ වූ ශබ්ද රූපය ද, යන සතළොස් රූප අනිත්‍යාදි වශයෙන් බැලීමට සුදුසු "සම්මසන" රූප යැයි දත ඒ සියලු රූපරූප්පන ස්වභාවයෙන් රූපයැයි පරිග්‍රහකෙරේ. ඉතිරි රූපදසය-අනිෂ්පන්න දසය-කර්මාදී කිසිවකිනුත් හට නොගත් ආකාර විකාර මාත්‍රයක් හා පරිසිඳීමක් පමණයැයි සලකයි විඤ්ඤත්ති ද්වය හා උපචයාදී ලක්ඛණරූප චතුෂ්කය ද ආකාර රූපයි. ලහුතාදී ත්‍රයවිකාර රූපයි. පරිච්ඡින්න රූපය ආකාශ ධාතුවයි.

මෙසේ රූප පරිග්‍රහකොට, ඉක්බිති නාමධර්ම විමසනුයේ ලෞකික සිත් එක් අසූව හා වේදනා ස්කන්ධය, ඒ හා යෙදුනු සඤ්ඤාස්කන්ධය, ඒ සිත්හිම වූ ඵස්සාදී සමපණස් (50) චෛතසික වූ සංස්කාරස්කන්ධය, සිත විඤ්ඤාණස්කන්ධය යන සතර ස්කන්ධයෝ නාමධර්මයෝයැයි පරිග්‍රහ කරයි.

මෙතෙක් දැක්වූ ක්‍රම අතුරෙන් එක්තරා එකකින් නාම රූප පරිග්‍රහ කරන යෝගාවචරයාට නාමරූප පරම්පරාව හැර මමය, කියා හෝ සත්වයෙක්ය කියා හෝ නො පෙනෙයි. හුදෙක් එකින් එකට සම්බන්ධවූ රූප සමූහයකි. නාම සමූහයකි. මෙහි සත්වයෙක් නො මැති නිම්වලලු, රෝද, හරාදි ආදී අවයව සමූහයක් එක්වූවිට රථයැයි කියන්නාගේ නාමරූප සමූහයට "සත්වයා" යන යන නාමය යෙදීණැයි මෙසේ ජීවිතය පිළිබඳ යථාස්වභාවය-ඇතිසැටි-අවබෝධ කරයි.

"යථාහි අඞ්ගසම්භාරා - හොති සද්දො රථො ඉති
එවං ඛන්ධෙසු සන්තෙසු - හොති සත්තොති සම්මුති"

අවයව එක්වූ රථය යන ශබ්දය පවත්නාසේ ස්කන්ධයන් ඇති කල්හි සත්වයාය යන සම්මුතිය-පැණවීමවෙයි යනු එහි අදහසයි.

"යථා හි නාවං නිස්සාය - මනුස්සා යන්ති අණ්ණවෙ
එවමෙව රූපං නිස්සාය - නාමකායො පවත්තති.
යථාච මනුස්සෙ නිස්සාය - නාවා ගච්ඡති අණ්ණවෙ
එවමෙව නාමං නිස්සාය - රූපකායො පවත්තති
උභො නිස්සාය ගච්ඡන්ති - මනුස්සා නාවා ච අණ්ණවෙ
එවං නාමඤ්ච රූපඤ්ච - උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා"

යම්සේ නැව නිසා මනුෂ්‍යයෝ මුහුදෙහි යෙත්ද, එසේම රූපය නිසා නාම ශරීරය පවතියි, යම්සේ මනුෂ්‍යයන් නිසා නැව මුහුදෙහි යෙයිද එසේම නාමය නිසා රූප ශරීරය පවතියි. මනුෂ්‍යයෝද නැව ද, යන දෙකම නිසා මුහුදෙහි යෙත්ද, එසේම නාමය ද රූපයද ඔවුනොවුන්ට සම්බන්ධය.

යෝගාවචරයා යම් වේලාවක මෙසේ නාමරූප ධර්ම වෙන වෙන ම පිරිසිද දකියි ද, එ කල්හි "දිට්ඨිවිසුද්ධිය" සම්පූර්ණ කළාහු යයි කියයුත්තෙක් ඇත. උපචාර සමාධි මාත්‍රයකින් රූපධර්ම විමසන ශුෂ්කවිදර්ශකයා රූපධර්ම මනාසේ වැටහෙනතෙක්, නාමධර්ම සෙවීමට උත්සුක නොවිය යුතුය ප්‍රථම ධ්‍යානය වශී නො කරනත් කල්හි ද්විතීය ධ්‍යානය ලබාගැනීමට නො හැකිවාසේ මෙහිද රූපධර්ම මනාසේ විමසා අවසානයකට පත්වන තෙක් නාමධර්ම සෙවීම දුෂ්කරය. පිරිහීම සඳහා මදහා ම පවතියි: පර්වත වාසී අව්‍යක්ත ධෙනුවකගේ උපමාවැයි සැලකියයුතු, එසේම ධ්‍යාන ලබාගත් සමථ යානිකයා ද නාමධර්ම මනාසේ අවබෝධ වන තෙක් රූපධර්ම සෙවීමට උත්සුක නොවියයුතුය. මෙසේ. නාම රූප ධර්ම විමසීම ඉතා සිරුවෙන්-පරිස්සමින්-කළ යුත්තකි.

ප්‍රත්‍යසමුත්පන්න පරිග්‍රහයවූ දිට්ඨිවිසුද්ධිය මෙතකින් නිමි.

## 15 වැනි පරිච්ඡේදය.

ධම්මට්ඨිති ඥාණය වූ ප්‍රත්‍යපරිග්‍රහ ඥානය මෙතැන් සිට විස්තර කෙරේ. මේ ධර්මය ගැඹුරුය. මහා සමුද්‍රය හා සමානය. එහෙයින් ශක්ති වූ පරිද්දෙන් යම්තම් විස්තරයක් දක්වමු.

## පටිච්ච සමුප්පාදය

“පටිච්ච ඵලං සමුප්පජ්ජති එතස්මාති පටිච්ච සමුප්පාදො” යම් හේතුධර්මයක් නිසා ඵලධර්මයක් උපදී ද, ඒ හේතුව පටිච්ච සමුප්පාදය යි. ඒ හේතුව පටිච්චසමුප්පාදය වූවා සේම ඵලය පටිච්ච සමුප්පන්න වන බව දතයුතුය. මෙසේ පටිච්ච සමුප්පාද, පටිච්ච සමුප්පන්න - හේතු, ඵල - ධර්ම පටිච්ච සමුප්පාදය නම්. හේතුයෙන් ඵලයක් හටගනී. නැවත ඵලයෙන් හේතුවක් හටගනී. එසේ හේතු ඵලවීමත්, ඵල හේතුවීමත්, පටිච්ච සමුප්පාද ක්‍රමයයි. උදාහරණයක්:- බීජයෙන් ගසක් හට ගනී. ගසෙන් බීජයක් හටගනී. බීජ වර්ග කීපයකි. මූල බීජ, ඛන්ධබීජ, අග්ගබීජ, ඵලුබීජ, බීජබීජ යන පසයි. දෙල් පේර ආදී මුලින් පැලවෙනුයේ මූලබීජයි. උක්, උණ, මඤ්ඤොක්කා ආදී කඳින් පැලවෙන වර්ග ඛන්ධබීජ නම්. මුලන්, බතල ආදී අගින් පැලවෙනුයේ අග්ගබීජයි. වී, පොල්, පුවක් ආදී ගෙඩියෙන් පැලවෙන වර්ග ඵලුබීජ නම්. මුං, මෑ, බෝන්චි ආදී කරල් වල ඇතුලේ ඇති ඇටයෙන් පැලවෙනුයේ බීජබීජයි. මෙසේ වෘක්ෂ-ලතාදිය බීජයෙන් ගසක් වීමත්, ගසෙන් ඵලය වීමත් න්‍යාම ධර්මයෙකි. (බීජනියාමය) පටිච්ච සමුප්පාදය ද එමෙනි. පෙර හේතුවූ ද පසුව ඵලය වෙයි. ඵලයවූ ද හේතුව වෙයි.

තවද හේතුව හෙවත් ප්‍රත්‍යය ක්‍රම දෙකකින් පවතී. බීජයෙන් ගස හටගත් නමුදු ජලය, පොහොර, සෘතුගුණය මේ ආදී නො මැතිව නො වැඩේ. බීජයෙන් කරනුයේ උප්පාදක ශක්තිය දීම පමණි. එහෙයින් ගස නම් වූ ඵලයට ජලය ආදී දෑ ද හේතු වෙයි. මෙසේ ගත් කල ඉපදීමට හෝ පැවතීමට හෝ හේතු හේතු [illegible]යි අවබෝධ වෙයි. එමෙන් ප්‍රත්‍ය සමුත්පන්නයන්ට ද ඉපදීමට හා පැවතීමට යන දෙයාකාරයෙන් ම ප්‍රත්‍යය වෙයි.

බීජය හසට ප්‍රත්‍යවනුයේ ඉපදීමටය. පැවතීමට නොවේ. ජලය පොහොර ආදිය ප්‍රත්‍යවනුයේ ඉපදීමට නොව පැවතීමටය. මේ නිසා පැවතීමට හෝ ඉපදීමට හෝ හේතුවනුයේ ප්‍රත්‍ය නමැයි සැලකිය යුතු.

බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුපාදය ක්‍රම දෙකකින් වදාළහ. පටිච්ච සමුප්පාද ක්‍රමය, පට්ඨාන ක්‍රමය යනුයි. "අවිජ්ජා පච්චයා සංඛාරා" යනාදී වශයෙන් ඇත්තේ පටිච්ච සමුප්පාද ක්‍රමයයි. හේතු ප්‍රත්‍යාදී සූවිසි ප්‍රත්‍යයන් වශයෙන් එනුයේ පට්ඨාන ක්‍රමයයි. මෙයින් පටිච්ච සමුප්පාද ක්‍රමය යනු හේතුවක් ඇති කල්හි ඵලධර්මයක් වේයයි දක්වෙන ආකාර මාත්‍රයෙකි. "තබ්භාව භාවී භාවාකාර මත්තොපලක්ඛිතො පටිච්ච සමුප්පාද නයො" - අ. සං. ප්‍රත්‍යසමුත්පන්න ධර්ම ඇතිවීම් මාත්‍රයකින් උප ලක්ෂිත -යුක්ත- වූයේ පටිච්ච සමුප්පාදනයයි ක්‍රමයයි ඒ එසේමය. අවිද්‍යාව සංස්කාරයන් ඇතිවීමට හේතු වෙයි දේශනා කළා මිස, කවර තැනකදී කෙබඳු අයුරකින්, කෙබඳු ක්‍රමයකින් ප්‍රත්‍යය වේද යන්න නො දක්විණි "ඉමස්මිං සති ඉදං හොති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති" මේ ඇති කල්හි මෙය වෙයි. මොහුගේ ඉපදීමෙන් මෙය උපදියි. මේ වශයෙන් ඉපදීම මාත්‍රය පමණක් පටිච්ච සමුප්පාද ක්‍රමයේදී දේශනා කළහ.

පට්ඨාන ක්‍රමය: "පට්ඨාන නයො පන ආහච්චපච්චයට්ඨිතිමාරබ්භ පවුච්චති" පට්ඨාන ක්‍රමය වනාහි විශෙෂ ප්‍රත්‍යයන් ගේ පැවැත්ම අරභයා කියනු ලැබේ. මේ ප්‍රත්‍යය, ප්‍රත්‍ය සමුප්පන්නයට මේ මේ අයුරින් ප්‍රත්‍යවේයයි නොයෙක් අයුරින් දේශනා කිරීම පට්ඨාන ක්‍රමය යි. පට්ඨාන යනු නොයෙක් ප්‍රත්‍යයන් ඇති තැනයි. "නානප්පකාරානි ඨානානි පච්චයා එත්ථාති පට්ඨානං" නොයෙක් අයුරින් දක්වෙන ප්‍රත්‍යයෝ යම් තැනක ඇද්ද, ඒ පට්ඨාන නමි. හේත්වාදී සූවිසි ප්‍රත්‍යයෝ එහි මූලික ධර්මයෝ ය.

පටිච්ච සමුප්පාද දේශනා ක්‍රම සතරකි.

බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද ක්‍රමය සතර ආකාරයකින් දේශනා කළහ. මුල සිට අගතෙක්, අග සිට මුල තෙක්, මැද සිට මුල තෙක්, මැද සිට අග තෙක් යනුයි. යම්කිසි කාරණක් සඳහා වැල් ඇදීමට ගිය පුරුෂයෙක් ඇතැම් විට වැලෙහි මුලසොයා, මුල පටන් ඇදගෙන වැඩෙහි යොදයි ඇතැම් විට

අග දක, ඒ මාර්ගයෙන් මුල සොයා ඇදගෙන වැඩෙහි යොදවයි. ඇතැම් විට මැදින් කපා එතැන් සිට අග තෙක් කපා වැඩෙහි යොදවයි. ඇතැම් විට මැදින් කපා මුල තෙක් ඇද වැඩෙහි යොදවයි. මේ වැල් ආදීත්තාගේ ක්‍රමය යි. එමෙන් බුදුරජාණන් වහන්සේ ද පෙරකී ලෙස සතර ආකාරයෙන් පටිච්ච සමුප්පාදය දේශනා කළහ.

### 1. මුල සිට අග තෙක් පටිච්ච සමුප්පාදය:

“පටිච්ච සමුප්පාදං වො භික්ඛවෙ දෙසිස්සාමි. තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච”

කතමො ච භික්ඛවෙ පටිච්ච සමුප්පාදො? අවිජ්ජා පච්චයා භික්ඛවෙ සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන, පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං, සොක පරිදෙව දුක්ඛ දොමනස්සු පායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති, අයං වුච්චති භික්ඛවෙ පටිච්ච සමුප්පාදො” - සං.නි. නිදාන වග්ගයි.

මහණෙනි, (මම) තොපට පටිච්ච සමුප්පාදය දේශනා කරන්නෙමි. එය මනාසේ මෙනෙහි කරවු, කියන්නෙමි. ස්වාමීනි, එසේය යි - ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දෙසූහ.

“මහණෙනි, අවිද්‍යාව නිසා සංස්කාර වේ. සංස්කාර නිසා විඤ්ඤාණ, විඤ්ඤාණ නිසා නාමරූප, නාමරූප නිසා සළායතන, සළායතන නිසා ඵස්ස ඵස්ස නිසා වේදනා, වේදනාව නිසා තණ්හා, තණ්හාව නිසා උපාදාන, උපාදාන නිසා භව, භව නිසා ජාති, ජාතිය නිසා ජරා මරණ, සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ හටගනිත්. හුදෙක් මේ දුක් සමූහයේ ඉපදීම වෙයි මහණෙනි, මෙය පටිච්ච සමුප්පාද යැ යි කියනු ලැබේ.

### 2. අග සිට මුල දක්වා පටිච්ච සමුප්පාදය:

‘ඉමං භික්ඛවෙ භික්ඛු පරිවීමංසමානො පරිවීමංසති. යං ඛො ඉදං අනෙකවිධං නානප්පකාරං දුක්ඛං ලොකෙ උප්පජ්ජති ජරාමරණං ඉදං නු ඛො දුක්ඛං කිං නිදානං කිං සමුදයං කිං

ජාතිකං කිංපභවං, කිස්මිං සති ජරාමරණං හොති, කිස්මිං අසති ජරාමරණං න හොති. සො පරිවීමංසමානො එවං පජානාති. යං ඛො -පෙ- ඉදං ඛො දුක්ඛං ජාතිනිදානං ජාතිසමුදයං ජාතිජාතිකං ජාතිප්පභවං ජාතියා සති ජරාමරණං හොති. ජාතියා අසති ජරාමරණං න හොතීති, සො ජරාමරණඤ්ච පජානාති, ජරාමරණසමුදයඤ්ච පජානාති, ජරාමරණනිරොධඤ්ච පජානාති, යා ච ජරාමරණනිරොධසාරුප්පගාමිනී පටිපදා තඤ්ච පජානාති, තථා පටිපන්නොච හොති අනුධම්මචාරී අයං වුච්චති භික්ඛවෙ භික්ඛු සබ්බසො සම්මා දුක්ඛක්ඛයාය පටිපන්නො හොති ජරාමරණනිරොධාය.

අථාපරං පරිවීමංසමානො පරිවීමංසති, ජාති පනායං කිංනිදානා -පෙ- (භව, උපාදාන, ආදී හේතු සංග්‍රහ වෙයි) අවිජ්ජාගතොයං භික්ඛවෙ පුරිස පුග්ගලො පුඤ්ඤං චෙ සංඛාරං අභිසංඛරොති පුඤ්ඤූපගං හොති විඤ්ඤාණං අපුඤ්ඤං චෙ සංඛාරං අභිසංඛරොති අපුඤ්ඤූපගං හොති විඤ්ඤාණං, ආනෙඤ්ජං චෙ සංඛාරං අභිසංඛරොති ආනෙඤ්ජූපගං හොති විඤ්ඤාණං" - සං. නි. නිදාන වග්ග.

මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ විමසනුයේ ලෝකයේ නොයෙක් විධි වූ නොයෙක් ආකාර වූ යම් මේ ජරා මරණ දුකක් උපදියි ද, මේ දුකට හේතුව කුමක් ද? හටගත්තේ කිනම් දෙයකින් ද? ඉපදුනේ කිනම් දෙයකින් ද? පහළ වූයේ කිනම් දෙයකින් ද? කිනම් දෙයක් ඇති කල්හි ජරා මරණ වෙයි ද? කුමක් නැති කල්හි ජරාමරණ නො වෙයි දැ යි විමසයි.

හේ විමසනුයේ මෙසේ දැන ගනියි. "ලෝකයේ නොයෙක් විධි වූ නොයෙක් ආකාර වූ යම් මේ ජරා මරණ දුකක් උපදියි ද, යම් දුකක් වනායි -පෙ- ඉපදීම හේතුකොට ඇත්තෙකි. ජාතියෙන් හටගත්තකි. ජාතියෙන් ඉපදුනේය. ජාතියෙන් පහළ වූයේය. ජාතිය ඇති කල්හි ජරා මරණ වෙයි ජාතිය නැති කල්හි ජරා මරණ නොවෙයි කියා යි (මෙසේ) හේ ජරා මරණ ද දනියි. ජරා මරණ ඉපදීමට හේතුව ද දනියි, ජරා මරණ නිරෝධය - නැතිවීම - ද දනියි. ජරා මරණ නිරෝධයට හේතුවන සුදුසු වූ යම් ප්‍රතිපදාවක් ඇද්ද එය ද දනියි. එසේ පිළිපන් හේ ඊට අනුව හැසිරෙන්නෙක් ද වෙයි. මහණෙනි; මේ භික්ෂු, ජරා මරණ නිරෝධය පිණිස, හැම අයුරින්ම මැනවි[illegible]

දුක් ගෙවීම පිණිස, පිළිපන්නේ වෙයි යයි කියනු ලැබේ. නැවත ද විමසනුයේ (මෙතැන් සිට සියලු අඛණ්ඩ ක්‍රමයෙන් පෙර පරිදිම විස්තර වේ) - පෙ -

මහණෙනි, අවිද්‍යාවෙන් යුක්තවූ මේ පුද්ගලයා ඉදින් කුශල සංස්කාරයක් රැස්කෙරෙයි ද, (ඔහුගේ) සිතද කුශල සහගතම වෙයි. ඉදින් අකුශල සංස්කාරයක් රැස්කෙරෙයි ද, සිත ද අකුසල සහගතම වෙයි. ඉදින් ආනෙඤ්ජ නම්වූ අරූපාවචර කුශල සංස්කාරයක් රැස්කෙරෙයි ද, සිතද ආනෙඤ්ජ සහගතම වෙයි,

මේ සූත්‍රය අග සිට මුල තෙක් පටිච්ච සමුප්පාද ක්‍රමය දක්වෙන්නකි.

## 3: මැද සිට මුලතෙක් පටිච්ච සමුප්පාදය:

"චත්තාරෝ භික්ඛවෙ ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය. කතමෙ චත්තාරො කබලීකාරෝ ආහාරෝ ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියො, විඤ්ඤාණං චතුත්ථං ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය."

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරෝ ආහාරා කිං නිදානා කිං සමුදයා කිං ජාතිකා කිං පභවා ඉමෙ චත්තාරෝ ආහාරා තණ්හා නිදානා, තණ්හා සමුදයා, තණ්හා ජාතිකා, තණ්හා පභවා, තණ්හා ච.යං භික්ඛවෙ කිං නිදානා කිං සමුදයා කිං ජාතිකා කිං පභවා? තණ්හා වෙදනා නිදානා වෙදනා සමුදයා වෙදනා ජාතිකා වෙදනා පභවා - පෙ - (ඵස්ස, සළායතන නාම, රූප, විඤ්ඤාණ, සංඛාර, අවිජ්ජා, යන ධර්මත් මෙසේ මය) සං. නි. නිදාන වග්ගය.

මහණෙනි, උපන් සත්වයන් ගේ පැවැත්ම පිණිසත්, උපදින්නාවූ සත්වයන් ගේ ආධාරය පිණිසත්, - අනුග්‍රහය පිණිසත් - මේ ආහාර සතරෙකි කවර නම් සතරක්ද? ගොරෝසු හෝ සියුම් හෝ පිඩුකරනු ලබන ආහාරය, දෙවැනි වූ ස්පර්ශය, තුන් වැනි මනෝසඤ්චේතනාව - සංස්කාර -, සතර වැනි විඥානය යනුයි. - මහණෙනි, උපන් සත්වයන් ගේ පැවැත්ම පිණිසත්, උපදින්නාවූ සත්වයන් ගේ අනුග්‍රහය පිණිසත්, මේ ආහාර

සතරෙකි. මහණෙනි, මේ සිව් ආහාර කුමක් හේතුකොට, කුමකින් හටගත්, කුමකින් උපන්, කුමකින් පහළ වූ දෙයක් ද? මහණෙනි, මේ සතර ආහාරය ම තෘෂ්ණාව හේතුකොට පවතී - සමාන වචන ඉහතකී පරිදියි - මහණෙනි, තෘෂ්ණාව කුමක් හේතු කොට, - සමාන වචන කෙටිකෙරිණ - වේදනාවෙන් පහළ වූවකි. සෙසු ධර්මත් මෙසේම ය.

4. මැද සිට අගකෙක් පටිච්ච සමුප්පාදය:

"උපාදානියෙසු භික්ඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක -පෙ- සමුදයො හොති" සං. නි. නිදාන වග්ගය.

මහණෙනි, උපාදානයන්ට - දැඩි සේ ගනු ලබන ධර්මයන්ට අයත් වූ ධර්ම කෙරෙහි - රූපාදී ෂඩාරම්මණයෙහි - මිහිරිය යි රසය විඳගනු කැමැත්ත අනුව බලමින් වෙසෙන්නහුට තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණාව නිසා උපාදානයි. උපාදාන නිසා භවය යි. භවය නිසා ජාතිය යි. ජාතිය නිසා ජරා මරණාදිය වෙයි. මෙසේ සියලු දුක් සමූහයෙහි පහළවීම වෙයි.

මේ පටිච්ච සමුප්පාදය මැද සිට අගට දෙසූ අයුරුයි.

පටිච්ච සමුප්පාද ධර්මය ත්‍රෛකාලිකය (කාල තුනකට අයත්ය)

"කතමො ච භික්ඛවෙ පටිච්ච සමුප්පාදො, ජාති පච්චයා භික්ඛවෙ ජරා මරණං උප්පාදා වා තථාගතානං අනුප්පාදා වා තථාගතානං ඨිතා ව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා තං තථාගතො අභිසම්බුජ්ඣති, අභිසමෙති; අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති පස්සථාති චාහ, ජාති පච්චයා භික්ඛවෙ මරණං"

මහණෙනි, පටිච්ච සමුප්පාදය කවරේද? මහණෙනි, ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ වෙයි. මේ ප්‍රත්‍යය - ප්‍රත්‍යසමුප්පන්න ධර්මස්වභාවය, ධර්ම නියාම ස්වභාවය, ප්‍රත්‍යස්වභාවය, තථාගත යන් වහන්සේලාගේ ඉපදීම සිදුවූවා හෝ නූවූවා හෝ ඒ ස්වභාවය පවතීමය. ඒ පටිච්ච සමුප්පාදය තථාගතයන් වහන්සේ අවබෝධ කරයි. අවබෝධ කර, "මහණෙනි, ජාති ප්‍රත්‍ය

ජරා මරණ වෙයි යන මෙය බලවූය” යි දේශනා කරයි. පණවයි. අවශාන කොට දේශනා කරයි. විවරණය කරයි. බෙදා දක්වයි. ප්‍රකට කරයි.

ජාති ප්‍රත්‍යය පමණක් නොව සියලු ප්‍රත්‍යයන් මෙසේ සැම ද පවත්නා ධර්ම නියාමයක් බව, මේ සූත්‍රයෙන් පැහැදිලි කළ සේක. ඒ ඒ ප්‍රත්‍යයන් ගෙන් ප්‍රත්‍යසමුප්පන්නයෝ හටගන්නෝ සදා කාලිකය. තවද ජාතිය ජරා මරණයට ප්‍රත්‍යය වීම පවත්නාම දෙයක් බව හැඟවීම සඳහා “ඨිතාව සා ධාතු” යැ යි දෙසූහ. කිසි දිනක ජරා මරණ ජාතිය හැර අන් ප්‍රත්‍යයකින් හට නොගනීය යන අදහස එයින් ස්ඵුට කෙරේ. එය බුදුරජාණන් වහන්සේගේ පැනවීමක් නොවේ. ධර්ම සවභාවය යි. ඒ ප්‍රත්‍යයගේ [illegible]. උන්වහන්සේලා කරනුයේ එය ඇති සැටියෙන් අවබෝධ කොට ලෝකයාට දේශනා කිරීමයි.

“ධම්මට්ඨිතතා” යනාදී පදයන්ගෙන් දක්වූයේ ද ඒ ප්‍රත්‍ය ධර්ම, සවභාවධර්ම බවයි. අමුතුවෙන් පණවා ගත් දෙයක් නොවන බව ඒ පදයන් ගෙන් පැහැදිලි කළහ. මෙසේ ප්‍රත්‍ය ප්‍රත්‍යස මුත්පන්න ධර්ම සවභාව ධර්මයෝය. ත්‍රෛකාලිකයෝය.

## පටිච්ච සමුප්පාදයෙහි අඞග දොළොසකි:

අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරාමරණ යනුයි.

කාල තුනකි: අවිද්‍යා, සංස්කාර මේ අඞග දෙක අතීත කාලිකය. විඤ්ඤාණ, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වේදනා, තෘෂ්ණා, උපාදාන, භව යන අඞග අට වර්තමාන කාලිකය. ජාති, ජරාමරණ දෙක අනාගත කාලිකය. මෙසේ කාල තුනකි.

ආකාර විස්සෙකි: අතීත හේතු පසෙකි. වර්තමාන ඵල පසෙකි. වර්තමාන හේතු පසෙකි. අනාගත ඵල පසෙකි. සියල්ල විස්සයි. ඒ මෙසේය, අවිජ්ජා, සංඛාර දෙකට තණ්හා උපාදාන භව, අයත්ය. එහෙයින් අතීතයට හේතු පසෙකි. වර්තමානයෙහි ඵල පස නම් විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යනුයි. වර්තමාන හේතු පස: තණ්හා, උපාදාන, භව, අවිජ්ජා, සංඛාර යනුයි. තණ්හාදී ත්‍රිකය ගැනුන් ම අවිජ්ජාදී ද්විකය ගැනේමය. එහෙයිනි අනාගත ඵල ජරාමරණයි මෙහි ඇත්තේ විඤ්ඤාණාදී ඵල පඤ්චකය මැයි. ජරා මරණ ඒවායේ [illegible]ලයි. මෙසේ ආකාර විස්සෙකි. (විස්තර මතුවටයි)

සන්ධි තුනෙකි: හේතු ඵල සන්ධිය, ඵල හේතු සන්ධිය, හේතු ඵල සන්ධිය යනුයි. අතීත වූ සංඛාර හා වර්තමාන ඵල වූ විඤ්ඤාණ අතර ඇත්තේ හේතු ඵල සන්ධියි. වර්තමාන වූ වේදනා හා තණ්හා අතර ඇත්තේ ඵල හේතු සන්ධිය යි වර්තමාන භව හා අනාගත වූ ජාති අතර ඇත්තේ හේතු ඵල සන්ධිය යි. මෙසේ සන්ධි තුනෙකි.

වට්ට තුනෙකි: කම්ම, විපාක, කිලෙස යනුයි. භව ප්‍රත්‍යයෙන් අඞ්ග ද එනම් කර්ම වූ භව ද, සංඛාර ද කම්මවට්ට නම් විඤ්ඤාණාදී සෙසු අඞ්ග (තණ්හා, අවිජ්ජා, උපාදාන හැරයි) ද විපාක වට්ටයි. අවිජ්ජා, තණ්හා උපාදාන, කිලෙස වට්ටයි.

මුල් දෙකකි: අවිජ්ජා, තණ්හා දෙකයි (විස්තර මතුවට)

## අවිජ්ජාදි ඒ ඒ අඞ්ගයන් ගේ තේරුම්:

**1** අවිජ්ජා: "පූරෙතුං අයුත්තටෙඨන කායදුච්චරිතාදි අවින්දියං නාම, තං අවින්දියං වින්දතීති අවිජ්ජා. තබ්බිපරීතතො කායසුචරිතාදි වින්දියං නාම, තං වින්දියං න වින්දතීති අවිජ්ජා ඛන්ධානං රාසට්ඨං ආයතනානං ආයතනට්ඨං ධාතූනං සුඤ්ඤතට්ඨං සච්චානං තථට්ඨං ඉන්ද්‍රියානං ආධිපතෙය්‍යට්ඨං අවිදිතං කරොතීති අවිජ්ජා. දුක්ඛාදීනං පීළනාදි වසෙන වුත්තං චතුබ්බිධං චතුබ්බිධං අත්ථං අවිදිතං කරොතීති අවිජ්ජා. අනන්තවිරහිතෙ සංසාරෙ සබ්බයොනිගති භව විඤ්ඤාණට්ඨිති සත්තාවාසෙසු සත්තෙ ජවාපෙතීති අවිජ්ජා. පරමත්ථතො අවිජ්ජමානෙසු ඉත්ථිපුරිසාදිසු ජවති විජ්ජමානෙසුපි ඛන්ධාදිසු න ජවතීති අවිජ්ජා. අපි ච චක්ඛුවිඤ්ඤාණාදීනං වත්ථාරම්මණානං පටිච්චසමුප්පාද පටිච්චසමුප්පන්නානඤ්ච ධම්මානං ඡාදනතොපි අවිජ්ජා" - වි. ප. අ. (සම්මොහ විනොදනී)

අවිජ්ජා, යන්නට තේරුම් ගතයුතු මේ අටුවා පාඨයෙන් දැක්වෙයි.

i පුරන්නට - රැස්කිරීමට - නුසුදුසු නිසා කාය දුශ්චරිතාදී ත්‍රිවිධ දුශ්චරිත - සතුන් මැරීම ආදී දස අකුසල් - අවින්දිය නම්. නොවිඳිය යුතු යනු අදහසයි. ඒ නොවිඳිය යුතු දෑ විඳිනුයේ අවිජ්ජා නම්. මෙහි විඳීම නම් සිදුකිරීමයි. සිදුකරනවාත් සමඟ ම ඒවා මැනවැයි සිතින් පිළිගැනීමක් ඇතිවෙයි. ඒ පිළිගැනීම විඳීමයි.

ii එයට හාත්පසින් විරුද්ධ වූ රැස්කිරීමට සුදුසු නිසා කාය සුචරිතාදිය "වින්දිය" නම්. ඒ නොවිඳිනුයේ අවිජ්ජා යි. සුචරිතය නොවිඳිනුයේ නැතහොත් සිදු නො කරනුයේ අවිජ්ජා යැ යි කී අයුරැයි මේ.

iii රූපාදි පඤ්චස්කන්ධයෙහි ඇති රාශ්‍යර්ථය - ගොඩගැසීමේ තේරුම -, ආයතනයන් ගේ ආයතනාර්ථය - ඔබිනොබ සැරිසැරීමේ තේරුම, ධාතූන් ගේ ශූන්‍යාර්ථය - හිස්ය යන තේරුම, සත්‍යයන් ගේ තථාර්ථය - ඒ වූ පරිදිම ඇති තේරුම (විද්‍යමාන) ඉන්ද්‍රියන් ගේ ආධිපත්‍යාර්ථය - ඉසුරු බව යන තේරුම, යන මේවා නො හෙළි කෙරේනුයි. අවිජ්ජා නම්.

iv දුක්ඛාදී ආර්‍ය්‍ය සත්‍යයන් ගේ ඇත්තා වූ පීලනාදී සතර බැගින් එක එක සත්‍යයට බෙදී ගිය, සතර වැදෑරුම් තේරුම නො හෙළිකෙරේනුයි අවිජ්ජා නම්. (විස්තර ආර්‍ය්‍ය සත්‍යයෙහි එයි)

v යෝනි, ගති, භව, විඤ්ඤාණස්ථිති, සත්වාවාස යන කෙළවරක් නොමැති සසර සියලු තන්හි දුවවානුයි අවිජ්ජා නම්] "අන්තවිරහිතෙ සංසාරෙ ජවාපෙතීති" කෙළවරක් නො මැති සසර දුවවන නිසා අවිජ්ජා යි කී අයුරැයි.

vi පරමාර්ථ වශයෙන් නො මැති ස්ත්‍රී-පුරුෂාදීන් කෙරෙහි දුවයි. එහෙත් ඇත්තා වූ ස්කන්ධ ධාතු ආදීන් කෙරෙහි නු දුවානුයි අවිජ්ජායි. දිවීම නම් සිත මෙහෙයවීමයි. ඒ පිළිබඳ මෙනෙහි කිරීමයි.

vii චක්ෂුර් විඥානාදි ප්‍රසාද රූපයන්ගේ ද, රූපාරම්මණාදී විෂය රූපයන් ගේ ද, ප්‍රත්‍යයන් ගේ ද, ප්‍රත්‍යසමුප්පන්නයන්ගේ ද, යන මෙතෙක් ධර්මයන් ගේ ඇත්තා වූ ස්වභාවයන් = ඒ ඒ හැටි අයුරු මුවහ කරන - වසන - හෙයින් අවිජ්ජායි.

මෙසේ තේරුම් සතක් දක්වා ඇත ද, අවිජ්ජා යන්නෙහි පොදු තේරුම "මෝඩකම" යනුයි. එනම් මෝහයයි.

2. සංඛාර: "සංඛත මභිසංඛරොන්තීති සංඛාරා" රැස් වූ දෑයට ඒ අයුරින්ම රැස්කරත්නුයි සංඛාර නම්. මෙහි රැස් වූ දෑය ප්‍රත්‍යසමුප්පන්නයි. රැස්කිරීම ප්‍රත්‍යය යි. මෙසේ ප්‍රත්‍ය සමුත්පන්න වූ ඵලයට සුදුසු පරිදි ප්‍රත්‍ය සම්පාදනය කිරීම

සංස්කාර බව තේරුම් ගත යුතු. සංඛාර යනු කුශලාකුශල යන්ට යෙදූ පොදු නාමයකි. එයිනුත් කුශලාකුශල සිත්හි යෙදෙන “චේතනා” මුල්කොට ඇති චෛතසික ගතයුතු. මුල් වූ චේතනාව කර්ම වශයෙන් ආ බව මුලදී දක්වා ඇත. මෙසේ සංඛාර යන්නට ගතයුතු කෙටි තේරුම චේතනා - කර්ම යනු යි. චේතනාව නිසා රැස් වූ විඤ්ඤාණාදී ඵල නො මැති නම් ඒ හා සමාන ඵල ඉපදවීම සඳහා චේතනාවකුදු අනවශ්‍යය. ඵල ඇති හෙයින් ම චේතනා ද අවශ්‍යය. එහෙයින් ඵලධර්ම ඇති කල්හි ඊට සුදුසු සේ සකස් කෙරෙන චේතනාව සංඛාර යැයි දක්වන;

සංඛාර ශබ්දයෙන් කියැවෙන සංස්කාරයෝ සතරාකාර වෙත්. අභිසංඛත සංඛාර, සංඛත සංඛාර, අභිසංඛරණ සංඛාර පයොග සංඛාර, යනුයි. කුශලාකුශල කර්මයන් ගෙන් නිපත් කාම, රූප, අරූප, යන භවත්‍රයට අයත් සියලු ධර්ම අභිසංඛත සංඛාර නම්. “අනිච්චා වත සංඛාරා” යනාදී තන්හි කියැවෙන සියලු සංස්කාරයෝ සංඛත සංඛාර යි. මෙයට ප්‍රත්‍යයධර්ම විභාග කල ආකාරයන් ගේ ප්‍රත්‍යය බලයෙන් හටගත් රූපාදී ස්කන්ධ භාරය ද - ජීවිතය ද අයත් වේ. රූපාදී භවත්‍රයට අයත් කුසලාකුසල චේතනා අභිසංඛරණ සංඛාරයි. “අවිජ්ජාගතොයං පුරිසපුග්ගලො පුඤ්ඤං චෙව අභිසංඛාරං අභිසංඛරොති” මහණෙනි, මෝඩකමට පැමිණි මේ පුද්ගලයා පුණ්‍යාභිසංස්කාර ද රැස්කරයි යන දේශනා ඊට නිදර්ශනයි. මෙහි සඳහන් වූයේ අභිසංඛරණ සංඛරයි. කායිකවූ ද චෛතසිකවූ ද වීර්‍යය පයොග සංඛාර නම්. “යාවතිකා අභිසංඛාරස්ස ගති තාවතිකං ගන්ත්වා අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසි” යම්තාක් වීර්‍යයෙහි යෙදීමක් සිදුවිද, එතෙක් ගොස් අකුරෙහි - කඩඇණයෙහි - පිහිටියාක් මෙන් සිටියේය. වීර්‍ය යොදා රෝදය පෙරලා හැරි නිසා ඒ යෙදූ වීර්‍යයේ ප්‍රමාණය ට කරකැවී ගිය බව මෙයින් දක් වේ. මේ ආදී තන්හි ආයේ කායික - චෛතසික වීර්‍යය වූ ප්‍රයොගාභි සංස්කාර යි.

තවද, සංඛාර ශබ්දයට කරුණු තුනක් ඇතුලත් වේ- කාය සංඛාර, වචීසංඛාර, මනොසංඛාර, යනුයි. ශරීරය පිළිබඳ වූ චේතනාව හෝ වීර්‍යය හෝ කායසංඛාර යි. සෙස්ස ද මෙසේ ම ය. “සඤ්ඤාවෙදයිත නිරොධං සමාපජ්ජන්තස්ස බො ආවුසො විසාඛ භික්ඛුනො පඨමං නිරුජ්ඣති වචීසංඛාරො, තතො කායසංඛාරො, තතො චිත්තසංඛාරො,” = නිරොධ සමාපත්තියට සමවැදෙන භික්ෂුව ගේ පළමුකොට, වාග්භේද

මූලික වූ විතර්ක, විචාර, යන දෙදෙනා නිරුද්ධවීමෙන් වචීසංඛාර ද, ඉක්බිති ආශ්වාස-ප්‍රශ්වාස වූ කායසංඛාර ද, ඊට පසු සඤ්ඤා, වේදනා නම් වූ චිත්ත මනො-සංඛාර ද නිරුද්ධ වෙයි. මෙහි ඒ සංස්කාර ද නිරුද්ධ වෙයි. මෙහි ඒ ත්‍රිවිධ සංස්කාරම ඇතුලත් විය.

විඤ්ඤාණාදිය ස්කන්ධ විස්තරයෙහි ආ පරිද්දෙන් දතයුතු.

8. තණ්හා: "පරිතස්සතීති තණ්හා" ආශාවෙන් පීඩිතවේනු යි තණ්හා නම්.

9. උපාදාන: "උපාදියතීති උපාදානං" ඇදගනු ලැබෙනුයි උපාදාන නම්. ගැරඩියෙක් මැඩියෙකු අල්ලා ගන්නාක් මෙනි.

10. භව: වැඩෙයි, වැඩෙනු ලැබේනුයි භව නම්. කුශලා කුශල චේතනා නිසා කර්ම භවය වැඩේ. කර්ම භවය නිසා උපපත්ති භවය වැඩේ.

11. ජාති: "ජනනං ජාති" ඉපදීම ජාතියයි.

12. ජරා මරණං: දිරාපත් වීම ජරා නම් එක් භවයෙක ජීවිතින්ද්‍රිය විනාශ වීම මරණය යි.

සෝක: ශෝචනය - ශෝක කිරීම-යි. හැඬීම, වැලපීම, පරිදෙවය යි ශරීරයේ පෙළීම නිසා පීඩා ඉපදීම, දුක්ඛ නම්] සිතෙහි ඇතිවන පෙළීම වේදනාව දෞමනස්ස යි. උපායාස යනු දැඩිසේ ඇතිවන සිත් රිදුමයි. චිත්ත පීඩාව යි.

මෙසේ අවිජ්ජා ආදී සියලු අඞ්ගයන් ගේ වෙන්වෙන් වූ අර්ථ තේරුම් - දතයුතුය.

## අවිජ්ජාදීන් ගේ ලක්ෂණාදිය:

අවිජ්ජා: "අඤ්ඤාණ ලක්ඛණං" අවිජ්ජා සම්මොහන රසා ඡාදනපච්චුපට්ඨානා ආසව පදට්ඨානා," අවිද්‍යාවෙහි ලක්ෂණය නො දැනීම යි. රසය හෙවත් කෘත්‍යය මුලාකිරීමය, වැටහෙන කාරණය නියම අයුරු වැසීමයි. ආසන්න කාරණය ආශ්‍රවයෝ යි.

සංඛාර: රැස්කිරීම ලක්ෂණය යි. රැස්කිරීම රසය යි. [illegible]ාව පච්චුපට්ඨාන යි. පදට්ඨානය අවිද්‍යාවයි.

විඤ්ඤාණාදිය ඉහත දී දක්වා ඇත. (ස්කන්ධ විස්තරයෙහි)

තණ්හා: හේතුවීම් ලක්ෂණය යි. වඩාත් සතුටුවීම රසයයි. තෘප්තියක් - ඇතිවීමක් - නො මැති බව පච්චුපට්ඨාන යි. පදට්ඨානය වේදනාව යි.

උපාදාන: ගැනීම් ලක්ෂණය යි. නො විදීම, අත් නො හැරීම රසය යි තෘෂ්ණාවේ දෘඪභාවය - දැඩි බව - ආත්ම දෘෂ්ටිය, පච්චුපට්ඨානයි. පදට්ඨානය තණ්හාව ම යි.

භව: කර්මය හා කර්මඵලය ලක්ෂණය යි. භවගැත්වීම, භව ගැනීම රසයයි. කුශල - අකුශල අව්‍යාකෘත පච්චුපට්ඨාන යි. පදට්ඨානය උපාදාන යි.

සෙසු අඞ්ගයන් ගේ ලක්ෂණාදිය මතුවට විස්තර වෙයි.

ප්‍රත්‍යය සමුත්පාදයෙහි අවිද්‍යාව මූලික වශයෙන් දක්වූව ද එය සංසාරයේ ආදිය යි - මූලයැ යි - නො ගතයුතු. මේ ප්‍රත්‍යසමුත්පාද ධර්මය පරිවර්තනය වන්නකි. එහෙයින් චක්‍රයකට හා සමාන ය. චක්‍රය - රෝදය - අසවල් තැන මූලය, අසවල් තැන අගයැ යි ගතහැකි තැනක් නැත. හැම තන්හි ම සමානය. ඒ චක්‍රය පිළිබඳ හැඳින්වීමක් කිරීමට ආරම්භ කළහොත් පළමුවෙන් ගනු යේ නෙමි - නිම්වලල්ල - හෝ නාභි - බොස්ගෙඩිය - හෝ ය. එහෙත් නෙමිය හෝ නාභිය හෝ චක්‍රයේ ආදිය නො වෙයි. එක් ප්‍රධාන තැනකි. එමෙන් පටිච්ච සමුප්පාද නමැති භව චක්‍රයෙහි ද අවිද්‍යාව හෝ තෘෂ්ණාව හෝ ප්‍රධාන හෙයින් එයින් එකක් මුල් කොට විස්තරයට බසිනු ලැබේ. තෘෂ්ණාවට ද ප්‍රධාන කරුණු වූයේ අවිද්‍යාව නිසා පටිච්ච සමුප්පාද දේශනායෙහි දී එය ම මූලික වශයෙන් දක්වූ සේක. එසේ නො මැතිව අවිද්‍යාව භව චක්‍රයේ - සංසාරයේ - මූලයැ යි නො ගතයුතු.

තවද අවිද්‍යාව නො මැති නම් සංස්කාරාදී කිසිදු ධර්මයක් නූපදී, නො පවතී. අවිද්‍යාව ඇති නිසා ම ඒ හැම ධර්මයක් ම පැවැත්ම ද වේ. නිපැත්ම ද වේ. රෝදයේ නිම්වලල්ල හෝ නාබ හෝ නො මැති නම් එතැන රෝදයක් නැත. මේත් එමෙනි. අවිද්‍යාව මුල් කොට ඇති ඒ සියලු ධර්ම, ආදි අන්ත විරහිත මුල අග නැති - සංසාරයෙහි භ්‍රමණය වේ. කරකැවේ. "අනමතග්ගායං භික්ඛවෙ සංසාරො පුබ්බාකොටි න පඤ්ඤායති" මහණෙනි, මේ සසර දීගය, මූලක් හෝ කෙළවරක් හෝ නො පෙනේ යැයි ද දේශිත වූයේ එහෙයිනි.

# අවිජ්ජා පච්චයා සංඛාරා

## අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වත්නේය.

මෙහි පළමුකොට දතයුත්තේ අවිද්‍යාව යනු කුමක්ද? යන්නයි.

"තත්ථ කතමා අවිජ්ජා? යං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසඞ්ගාහණා අපරියොගාහණා. අසමපෙක්ඛණා අපච්චවෙක්ඛණා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජා යොගො අවිජ්ජානුසයො අවිජ්ජා පරියුට්ඨානං අවිජ්ජා ලඞ්ගී මොහො අකුසලමූලං අයං වුච්චති අවිජ්ජා." වි. ප.

පටිච්ච සමුප්පාදයෙහිලා අවිද්‍යා යනු කවරේ ද? යනුවෙන් නැගූ ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේ ම දෙසූ පිළිතුරකි මේ. මෙහි දක්වෙන එක් එක් පදයක් පාසා අවිද්‍යා යන්නට තේරුම් විමසිය යුතුය. කෙටි අදහස දක්වුවහොත් තේරුම් ගැනීම දුෂ්කරය. පළමුකොට මේය ලිහිල්වීම සඳහා "යං අඤ්ඤාණං තං අවිජ්ජා" යනුවෙන් සියලු පද යොදාගත යුතුය.

අඤ්ඤාණ ඤාණ යනු ප්‍රඥාව යි. සියලු අර්ථ, අනර්ථ, චතුරාර්‍ය සත්‍යාදී ධර්ම එයින් ප්‍රකට කෙරෙයි. එහෙත් ප්‍රඥාවට හාත්පසින් ම විරුද්ධ වූ මෝහය ඒ සෑම ධර්මයක් කෙරෙහි ම මූලාකරව යි. එහෙයින් මෝහය ඤාණයට විරුද්ධ වූ හෙයින් අඤ්ඤාණ නම්. මෙබඳු අඤ්ඤාණයක් වෙයි ද ඒ අවිජ්ජා යි.

අදස්සනං: මෙහි 'දස්සන' යනුද ප්‍රඥාවයි. පෙර කී ධර්ම නුවණින් දක්නා නිසා ප්‍රඥාව දස්සන - දර්ශන - නම්. ඒ දර්ශන සංඛ්‍යාත ප්‍රඥාව නැත්තේ අදස්සන යි. එනම් අවිජ්ජා යි.

අනභිසමයො: අභිසමය යනුද ප්‍රඥාවට නමකි. ප්‍රඥාවෙන් දුක්ඛාදී ආර්‍ය සත්‍යධර්මයන්, අර්ථානර්ථ, අවබෝධ කරවයි. එහෙයින් ප්‍රඥාව අභිසමය නම්. ඒ නො මැත්තේ අනභිසමයයි. අනනුබොධො, අප්පටිවෙධො අසම්බොධො යන පදයන් ද මේ ලෙස ම තේරුම් ගත යුතුය. සමාන වචනයි. අවිජ්ජා යනුයි.

අසඞ්ගාහණා: සඞ්ගාහණා යනු ද ප්‍රඥාවයි. ප්‍රඥාව ඒ ඒ ධර්ම මනාසේ ගෙන, ස්පර්ශ කොට, නුවණින් හප්පා, අවබෝධ කර දෙයි. එසේ කිරීමට අවහිර කරන නිසා අවිද්‍යාව අසඞ්ගාහණා නම්.

අපරියොගාහණා: ඒ ඒ ධර්ම කරුණුවලට බැස පිවිස, ගන්නා හෙයින් ප්‍රඥාව පරියොගාහණා නම් ඒ ගතිය නැත්තේ අපරියොගාහණා යි. එනම් අවිද්‍යාව යි.

අසමපෙක්ඛණා: මුලාවීමකට හෝ අන්‍යායකට හෝ නො ගොස් සමලෙස බැලීම, නුවණින් දැකීම, නැත්තේ යමකට ද ඒ අසමපෙක්ඛණා යි. එනම් අවිජ්ජා යි. අවිද්‍යාව ඇතැම් විට මුලාකරව යි. ඇතැම් විට අන්‍යායකට ගෙනයයි. ඇති සැටි බැලීමක් නො කෙරේ.

අපච්චවෙක්ඛණා: ප්‍රත්‍යවේක්ෂා - නුවණින් සලකා බැලීම නො කරනුයේ අපච්චවෙක්ඛණා යි. එනම් අවිජ්ජා යි. මේ නිසා නුනුවණින් ම මෙනෙහි කරයි.

අපච්චක්ඛකම්මං: ප්‍රත්‍යවේක්ෂා නො කළ කම් ඇත්තේ අවිජ්ජා යි.

දුම්මෙජ්ඣං: මේධා යනු ප්‍රඥාව යි. ඒ නො මැති බව යි.

බාල්‍යං: "බාලස්ස භාවො බාල්‍යං" යන නිර්වච හෙයින් බාල - පහත් - හෙයින් අවිද්‍යාව බාල්‍ය නම්. විද්‍යාව නම් වූ ප්‍රඥාව උසස්ය.

අසම්පජඤ්ඤං: සිව්සස්, අත්, අනත්, මනාසේ දැකීම සම්ප්‍රජන්‍යය යි. එසේ නො මැත්තේ අසම්ප්‍රජන්‍ය නම්.

මොහ, ප්‍රමොහ, අවිජ්ජා: මොවුහු නම් මුලාවීම, වඩාත් මුලාවීම, නො දැනීම, යන සමාන තේරුම් ඇති පදයෝය.

අවිජ්ජොඝො: කාම, රූප, අරූප, යන භවත්‍රයෙහි ගිල්වන හෙයින් අවිද්‍යාව ඔඝයෙකි. සැඩ ජල පහරෙකි. ගංගා ආදියෙහි ඇත්තා වූ වේගයෙන් ගලා බස්නා ජල පහරකට යමක් අසුවුවහොත් කරකැවෙමින් යටට ම ගිලෙයි. එමෙන් අවිද්‍යාවට අසු වූ සත්වයා ද සසර කරකැවෙමින් එහි ම ගිලෙයි. එහෙයින් සැඩ ජල පහරට යෙදුනා වූ ඔඝ නාමය අවිද්‍යාවට ද සුදුසු ම ය.

අවිජ්ජා යොගො: "යොග" යනු යෙදීමයි. අවිද්‍යාවෙන් යුත් සත්ත්වයා සංසාරයෙහි ම යෙදෙන හෙයින්, නැතහොත් අවිද්‍යාව සත්ත්වයාම සංසාරයෙහි ම යොදන හෙයින් යෝගයෙකි. ඔඝ, යොග, යන නම් කාම, භව, දිට්ඨි, යන ධර්මවලට ද යෙදේ.

අවිජ්ජානුසයො: "අනුසය" යනු සිත ඇතුළේ නිදාගන්නා සේ සැඟවී ඇති කෙලෙස්වලට නමකි. අවිද්‍යාව ද ඉන් එකකි. අනුසය සතෙකි. (සුතමය ඤාණය බලන්න)

අවිජ්ජා පරියුට්ඨානං: "පරියුට්ඨාන" යනු නැඟී සිටීමයි. සොරු මාර්ගයෙහි දී නැඟී සිට, මාර්ගයෙහි ගමන් කරන්නවුන් ගේ භාණ්ඩාදිය පැහැර ගන්නා සේ අවිද්‍යාව ද සිතෙහි සැඟවී සිට කුශල චිත්තයන් පැහැර ගනියි. කලබල කරයි. අමනාප කර ගනියි. තමා ගේ වශයෙහි තබයි. මේ නිසා පරියුට්ඨානයෙකි.

අවිජ්ජාලඞ්ගී: දොර, ජනෙල්, ආදිය වැසීමට උපයෝගී කරගන්නා අගුලට නමකි ලඞ්ගී. අවිද්‍යාව ද අගුලක් හා සමානය. යම් සේ නගරයට ඇතුල්වීම සඳහා ඇති ද්වාරය වැසුවහොත් මිනිසුන්ගේ ගමනාගමනය නවතී ද එමෙන් සත්ත්වයා ගේ සිතෙහි අවිද්‍යාව පිහිටීමෙන් නිර්වාණට යෑම නවතී. අවහිර වේ. එහෙයින් අගුලකි.

මොහො අකුසල මූලං: "අකුසලානං තං මූලං චාති අකුසල මූලං, කිං? මොහො" අකුශල් වූයේද මුල් වූයේ ද එමනුයි අකුශල මූල නම්. කුමක් ද? මෝහය යි, මෝඩකම යි, නැතහොත් "අකුසලානං මූලං අකුසල මූලං" අකුසලයන්ට මුල් වූයේ අකුසල මූල නම්. "අයං වුච්චති අවිජ්ජා" මේ අවිද්‍යාව යි කියනු ලැබේ.

පද සමූහයකින් මෙතෙක් දක්වූයේ අවිද්‍යාවේ ලක්ෂණ යි. ඉක්බිති එය කවර කවර ධර්මයන් කෙරෙහි බලපවත්නේ ද යනු විමසිය යුතු. මීට පිළිතුරු වශයෙන් ක්‍රම දෙකකින් දක්විය හැකිය. තථාගත දේශනාවෙහි අභිධර්ම, සූත්‍ර යන ක්‍රම දෙකට ම අවිද්‍යාව තේරුම් කර ඇත. එහෙයින් සූත්‍ර ක්‍රමයෙහි ධර්ම සතරක් දක්වෙන අතර, අභිධර්ම ක්‍රමයෙහි ඒ සතරත් සමග ධර්ම අටක් දක්වේ. අභිධර්ම ක්‍රමය මෙහිලා දැනීමෙන් ඒ දෙකම සම්පූර්ණ වෙයි.

"තත්ථ කතමා අවිජ්ජා? දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිණිපටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං අයං වුච්චති අවිජ්ජා" - වි. ප.

දුක, දුකට හේතුව, නිවණ, අරිඅටගි මග, පෙර අත්බැව්, පසු අත්බැව්, ඒ දෙක ම, පිළිසමුපා දහම්හි, යන මේ තැන් අට කෙරෙහි නො දැනීම අවිදු - අවිජ්ජා නම්.

මෙයින් ආර්‍ය සත්‍යයන්ගේ විස්තරය මතු ඤාණයන්හි දී දක්වෙන අතර, පූර්වාන්තාදි ධර්මයන්ගේ විස්තර මෙහි අවසාන කොටසෙහි දී දක්වමු.

මෙම අවිද්‍යාව; අර්හත් මාර්ගයෙන් කෙලෙස් ප්‍රහාණය කළා වූ ආර්‍යයන්ට හැර අන් සියලු ම දෙනාට ඇත්තේ ය. ඒ තිබීම ද නා නා අයුරු ය. සෝවාන් ආදි ආර්‍යයන් ගේ සිත් තුළ ප්‍රහාණය නො කළ කෙලෙස් මුවහ කරන අවිද්‍යාව ඇත. එහෙත් සතර අපායෙහි හෙළීමට තරම් අවිද්‍යාව නො මැත. යටත්පිරිසෙයින් සෝවාන් වූ ආර්‍යයා මව් මැරීම් ආදි පව් සයකින් හා සතර අපාගාමී ශක්තියෙන් ද අත්වූයෙකි. ශීල, සමාධි, ප්‍රඥා, දියුණු කෙරෙමින් වෙසෙන පෘථග්ජනයන් කෙරෙහි පවත්නා අවිද්‍යාව ඊට වඩා බලවත් ය. නිර්වාණය පිළිබඳ නියම අවබෝධයක් නො මැතිව දිව්‍යලෝකාදි සම්පත් බලාපොරොත්තුවෙන් කුශල ධර්මයන් සිදුකරන්නවුන්ට, පුණ්‍යධර්මයන් සිදුකරන කල්හි නො සැදුනත් අනුශය වශයෙන් සිත්තුළ පවතී. සෙසු අන්ධබාල, පාපකාරී පුද්ගලයන්ට ගනණාව - බහුලව-ම අවිද්‍යාව ඇත්තේය. වර්‍ෂාව පවතින, අමාවක් දිනක, මධ්‍යම රාත්‍රියෙහි, වනාන්තරයකට පිවිසියාක් මෙනි. (සතර අඟින් යුත් කළුවර මෙයින් දක්විණ)

කවද, අවිද්‍යාව අන්ධයෙකු හා සමාන ය. අන්ධයා ගමනක්යයි නම් හේ කවර තැනක වැටේ ද, කවර තැනක හැපේ ද, කියනු නො හැකිය. ඇතැම් විට ගැඹුරු ලිංවල පවා වැටෙන්නට පුළුවන. එමෙන් අවිද්‍යාවෙන් යුක්ත සත්වයා ද; සසරෙහි ගමන් කරනුයේ පව් මේය, පින් මේය, කුසල් නම් මේහු ය, අකුසල් මොහු ය, මේ දේ කළ යුතු ය, මේ දේ නො කළ යුතු ය, මෙය කළහොත් දුක් විපාක ලැබේ, මෙය කළහොත් සැප විපාක

ලැබේ, මේවා තීක්ෂ්ණ සහගත ය. මේවා ප්‍රශංසා සහගත ය, යනාදි වශයෙන් කිසිදු හැඟීමක්, දැනීමක්, අවබෝධයක්, නොමැතිව, ඇතැම් විට කල්ප ගණකිනු දු ගොඩ ඒමට නො හැකි නිරයෙහි ම වැටෙයි, ඇතැම් විට තිරිසන් අපායට වැටෙයි, ඇතැම් විට බුද්ධාන්තර කාල සීමාවකිනුදු පැන් සවල්පයක්, ආහාර සවල්ප යක් නො ලැබෙන, ප්‍රේත ලෝකයෙහි උපදී යි. එහෙයින් අවිද්‍යාව අන්ධයෙකු මෙනි.

"අවිජ්ජා" යන්නෙහි විස්තරය යි මේ .

**සංස්කාර:** සංස්කාර යනු චේතනා යි. කර්ම යනුද නමකි. එහි සවභාවය පිළියෙල කිරීම යි.

"සංඛරීයනතීති සංඛාරා" පිළියෙල කරනු ලැබෙත්නු යි සංස්කාර නම්. චේතනා චෛතසික විස්තරය බලන්න.

"තත්ථ කතමෙ අවිජ්ජා පච්චයා සංඛාරා? පුඤ්ඤාභි සංඛාරො අපුඤ්ඤාභිසංඛාරො ආනෙඤ්ජාභිසංඛාරො කාය සංඛාරො වචීසංඛාරො (මනොසංඛාරො) චිත්තසංඛාරො" ඒ ප්‍රත්‍යයසමුත්පාදයෙහි අවිද්‍යා ප්‍රත්‍යයෙන් සිදුවන සංස්කාර යෝ කවරෙහු ද? පුණ්‍යාභිසංස්කාර - පින් අදහස්, අපුණ්‍යාභි සංස්කාර - පව් අදහස්, ආනෙඤ්ජාභිසංස්කාර - කෙලෙසුන් හෙන් නොසෙල්වෙන අදහස්, කාය - වාග් - චිත්ත සංස්කාර, යනුයි. ශරීරය මෙහෙයවා පිළියෙල කළ දේ කාය සංස්කාර යි. සෙස්ස ද මෙසේම ය.

"තත්ථ කතමො පුඤ්ඤාභිසංඛාරො? කුසලා චෙතනා කාමාවචරා රූපාවචරා දානමයා සීලමයා භාවනාමයා අය වුච්චති පුඤ්ඤාභිසංඛාරො"

එහි පුණ්‍යාභිසංස්කාර යනු කවරේ ද? කාමාවචර වූ රූපා වචර වූ දානමය, ශීලමය, භාවනාමය, කුශල චේතනාවෝ යි. දානමය, සීලමය, කුශල චේතනා කාමාවචරය. භාවනාමය කුශල චේතනා අභිඥා උපදින තෙක් කාමාවචරයි. අභිඥා උපන් පසු රූපාවචරයි. මෙසේ ගත් කල කාමාවචර කුසල චේතනා නම් "සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකං එකං යනාදී වශයෙන් ආ කාමශෝභන කුසල් සිත් අටය. රූපාවචර කුසල චේතනා ධ්‍යාන වශයෙන් පස්වැදෑරුම්ය. මේ තෙළෙස් [illegible]ැරුම (18) කුසල චේතනා පුණ්‍යාභිසංස්කාර නම්.

"අකුසලා චේතනා කාමාවචරා" කාමාවචර වූ අකුසල චේතනා අපුණ්‍යාභිසංස්කාර නම්. ඒවා දෙලොව් වැදෑරුම ය.

"කුසලා චේතනා අරූපාවචරා, අයං වුච්චති ආනෙඤ්ජාභිසංඛාරො" අරූපාවචර වූ කුසල චේතනා අනෙඤ්ජාභිසංස්කාර යි. මෙය සිව් වැදෑරුම් ය. (මේවා ස්කන්ධ විස්තරයෙහි ඇත.)

කායසංඛාර යනු කායද්වාරයට අනුව සකස් වූ චේතනා යි. 'කායං විඤ්ඤත්ති සමුට්ඨාපෙත්වා කායද්වාරෙ පවත්තා අට්ඨ කාමාවචර කුසල චේතනා ද්වාදස අකුසල චේතනාති සමවීසති චේතනා කාය සංඛාරො නාම" කාය විඥප්තිය උපදවා කායද්වාරයෙහි පැවති කාමාවචර කුසල් සිත් අට හා දොළොස් අකුසල් සිත් යන සමවිස්සක් වූ චේතනා කායසංඛාරයි. මෙසේ කයෙන් ඉපද වූ කුසලාකුසල අදහස් කායසංස්කාර බව දතයුතු මේ චේතනාවන් ම වාග්විඥප්තිය උපදවා, වාග් ද්වාරයෙහි පවත්වා ගතහොත් ඒ වචීසංඛාර යි. මනොද්වාරයෙහි උපදවා ගත් එකුන්තිස් (29) කුසලාකුසල චේතනා චිත්තසංඛාර නම්

දානමය කුසල සංස්කාර: "දානං ආරබ්භ දානාධිකිච්ච යා උප්පජ්ජති චේතනා සංචේතනා චෙතයිතත්තං අයං වුච්චති දානමයො පුඤ්ඤාභි සංඛාරො" දීම අරමුණු කොට යම් අදහසක්, සිතුවිල්ලක්, උපදීයි ද, ඒ දානමය පුණ්‍යාභිසංස්කාර නම්. යම්කිසි දානවස්තුවක් පරිත්‍යාග කිරීමට පෙරදී ද, පරිත්‍යාග කරන අවස්ථාවේදී ද, පරිත්‍යාගයෙන් පසු ද, යන අවස්ථාත්‍රයේදී අලෝභ, අද්වේෂ, අමෝහ, යන හේතු තුන යොදවා ශ්‍රද්ධා - ප්‍රඥා හෝ කරුණා - ප්‍රඥා හෝ පෙරදැරි කරගෙන, ඒ දීමනාව සම්පූර්ණ කරයි ද, එය දානමය කුසල සංස්කාරයි, මෙසේ දානමය කුසල කර්මය සිදුකරන, පුද්ගලයාගේ යම් සිතුවිලි සමූහයක් වෙයි ද, යම් කායික ක්‍රියා සමූහයක් වෙයි ද, යම් වාග් සමූහයක් - වාග් මාලාවක් - වෙයි ද ඒ සියල්ල කාය - වචී චිත්ත සංඛාර බව දතයුතුය.

ශීලමය කුශල සංස්කාර: 'සීලං ආරබ්භ සීල මධිකිච්ච යා උප්පජ්ජති චේතනා සංචේතනා චෙතයිතත්තං අයං වුච්චති සීලමයො පුඤ්ඤාභිසංඛාරො" චාරිත්‍ර හෝ වාරිත්‍ර හෝ ශීලයක් අරමුණුකොට යම් චේතනාවක් වෙයි ද, මනා සේ යෙදුනු චේතනාවක් වෙයි ද, සිතීම් බවක් වෙයි ද, ඒ ශීලමය පුණ්‍යාභි සංස්කාර නම්. සතුන් මැරීම ආදී පාප කර්මයන් ගෙන් [illegible]

කෙත්නහු ගේ හෝ වත්පිළිවෙත් පුරන්නහු ගේ හෝ යම් සිතුවිල්ලක්, වාග්මාලාවක්, ක්‍රියාවක්, වේයි ද ඒ සියල්ල කාය- වචී - චිත්ත සංඛාර නමි.

භාවනාමය කුශල සංස්කාර: "භාවනං ආරබ්භ යනාදී වශයෙන් දක්වෙන පරිදි, කුසල අරමුණක් සිත තබාගෙන ඒ පිළිබඳ නැවත නැවත සිතුවිලි පහල කිරීමක් වෙයි ද ඒ භාවනාමය කුශල සංස්කාර යි. සමථ, විදර්ශනා වශයෙන් එය දෙවැදෑරුම් ය. කාමාවචර, රූපාවචර, වශයෙන් දෙවැදෑරුම් ය. සමසතළිස් කමටහන් අතුරෙන් යම් කමටහනක් ගෙන භාවනා කරද්දී අර්පනා උපදින තෙක් ඇතිවන පුණ්‍යචේතනා සමථ වශයෙන් උපන් කාමාවචර කුසල සංස්කාරයෝ ය. විදර්ශනා භාවනාවේදීද ගොත්‍රභූඥානය තෙක් උපදින පුණ්‍යචේතනා කාමාවචර යි. සමථ වශයෙන් අර්පනා උපන් පසු පඤ්චමධ්‍යානය තෙක් ඇති පුණ්‍ය චේතනා රූපාවචර කුශල සංස්කාරයෝ යි. විදර්ශනා වශයෙන් මොව්හු නූපදිති. භාවනාමය කුශල සංස්කාර සියල්ල චිත්ත සංඛාරයෝ යි.

අකුශල සංස්කාර: සතුන් මැරීම ආදී දශ වැදෑරුම් වූ අකුසල්වල දී හෝ ඊට අනුව ගිය පාපකර්මයන්හි දී හෝ යම් සිතුවිල්ලක්, වචනයක්, ක්‍රියාවක්, සිදුකෙරේ ද ඒ අකුසල සංස්කාර නමි. සිතුවිල්ල අකුසල චිත්තසංස්කාර යි. වචනය අකුසල වචීසංස්කාර යි. ක්‍රියාව අකුසල කාය සංස්කාර යි. දශ වැදෑරුම් අකුසල කර්ම කායාදී ද්වාරත්‍රයට බෙදී යන බැව් සැලකිය යුතු. සතුන් මැරීම, සොරකම, කාමමිථ්‍යාචාරය, කාය කර්ම යි. කායද්වාරයෙන් හටගනී. එහෙයින් ඒ කායසංස්කාර නමි. බොරු කීම, කේලාම් කීම, පරුෂ වචනය, හිස්වචනය - සම්ඵප්පලාපය - මේ සතර වාග්කර්මයි. වාග්ද්වාරයෙන් හට ගනී. එහෙයින් වචීසංස්කාරයි. අභිජ්ඣා - විෂම ලෝභය, ව්‍යාපාද - ක්‍රෝධය, මිථ්‍යාදිට්ඨි - වැරදි දැකීම, යන මොව්හු මනඃකර්මයි. මනොද්වාරයෙන් හටගනී. එහෙයින් චිත්තසංස්කාර යි. මේ අකුශලයන්ට අනුව ගිය යම්තාක් පාපකර්මයන් වේ ද ඒ හැම අකුසල සංස්කාර යි.

ආනෙඤ්ජාභි සංස්කාර; "ආනෙඤ්ජ" යනු නොසෙල් වෙන යන අදහසයි. නීවරණ ධර්මයන් ගෙන් නොසෙල්වෙන කුශල සංස්කාර ආනෙඤ්ජාභි සංස්කාර නමි. එනම් අරූපාවචර ක[illegible]යෝය. චතුර්ථධ්‍යානයට පත්වීමෙන් පසු උපදින භාවනා

කුශල චේතනා අරූපාවචර නම්. විතර්කාදී ඖදාරික අඞ්ග එහි නොමැති හෙයින් නීවරණයන් ගෙන් කම්පා නොවෙයි. එහෙයින් ආනෙඤ්ජය නොසෙල් වේ. ආනෙඤ්ජාභි කුශල සංස්කාර සතර වැදෑරුම්ය. (ආරූප්‍ය භාවනා බලන්න.)

මෙසේ කාය, වචී, චිත්ත, යන ත්‍රිවිධ සංස්කාරයන්ට බෙදීගිය කාමාවචර, රූපාවචර, අරූපාවචර, සියලු කුශල සංස්කාරයන් සතළොසකි. අකුශල සංස්කාරයන් දොළොසෙකි. එක්වූ විට එකුන්තිසෙකි. (29) මෙයින් අකුශල වූ උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත සිත හැර, සෙසු සෑම සංස්කාරයකින්ම දෙවන භවයෙහි ප්‍රතිසන්ධිය ගෙන දේ.

**අවිද්‍යා ප්‍රත්‍යය නිසා සංස්කාරවන අයුරු**

පැවැත්මට හෝ නිපැත්මට හෝ උපකාරවන ධර්ම ප්‍රත්‍ය නමැයි ඉහත දී සඳහන් කෙරිණ. අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වන්නේ නිපැත්මට නොවේ. පැවැත්මටය. අවිද්‍යාවෙන් සංකාර උපදී යනුවෙන් තේරුම් නොගත යුතු. අවිද්‍යාව පැවතීම නිසාම සංස්කාර වෙයි. අවිද්‍යාව නොමැති නම් සංස්කාර ද නොවේ. රහතන් වහන්සේලා අවිද්‍යාව ප්‍රහීණ කළ හෙයින් උන්වහන්සේලා කරනු ලබන යහපත් දේ ක්‍රියා මාත්‍ර බවට පැමිණෙනුයේ එහෙයිනි. අවිද්‍යාව ඇතිතෙක්ම කරනු ලබන සෑම දෙයක්ම කුශල් හෝ අකුශල් හෝ බවට පත්වීම ස්වභාව ධර්මයකි. ජලය ඇති නිසාම වෘක්ෂලතාවෝ වැඩෙත්. එසේත් ජලයෙන් වෘක්ෂලතාදිය නූපදී. පැවැතීමටම උපකාර වේ. ප්‍රත්‍යය වේ. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වේය යනු ද මේ ක්‍රමය මැයි කිවයුත්තෙක් ඇත අවිද්‍යාවෙන් අකුශල සංස්කාර වේය යනු පිළිගැනීමට පහසුය. එහෙත් අවිද්‍යාවෙන් කුශල සංස්කාර වේයැයි කීමෙන් විමතියක් උපදී. එය නිරාකරණය කරගනුයේ කෙසේද? හේතුවට සමාන වූ ඵලයක්ම උපදීය යන නීතිය අසාධාරණය. මක්නිසාද? ඊට හාත්පසින්ම විරුද්ධ වූ ඵල ද උපදින හෙයිනි ගෝ ලෝමයෙන් කුසතණ හටගනී. කරදියෙහි උපන් මාළුවාට ලුණු දැමිය යුතු. මෙන් මෙබඳුය. මාළුවා ලුණුදිය වූ කරදියෙහිම උපන්නත් ඔහුගේ මස් ලුණු රසයෙන් අඩුය. එහෙයින් අඹුතුවෙන් ලුණු දැමිය යුතුය. මෙසේ අවිද්‍යාව ඇතත් උපදවනු ලබන යහපත් චේතනා කුශල සංස්කාරකයෝය. අවිද්‍යාව පවතීයයි සිතා කුශල් ද අකුශල් ගණයට නො ගැනේ.

තවද, ඇතැමෙක් දිව්‍යාඞ්ගනාවන්, දිව්‍ය ප්‍රාසාදිය මනෝහර යැයි සිතා ඒවා කෙරෙහි ආශාවෙන් කාමාවචර කුශල සංස්කාර රැස්කරත්. දිව්‍ය ලෝකයෙහි දු ඇත්තා වූ ම දුක්ඛාදී ස්වභාව ධර්මයන් ගේ නොදනියි. අවිද්‍යාවෙන් ඒවා මුවාවෙයි. එහෙයින් හේ දිව්‍ය සම්පත් ලබනු කැමැත්තෙන්, ඒවා කෙරෙහි මුලාවී පුණ්‍යාභි සංස්කාර රැස් කරයි. "දෙවච්ඡරාකාමකො විය මරුප්පපාතං" දිව්‍යප්සරාවක් කැමැතියෙක් මරු ප්‍රපාතයට පතින්නාක් මෙනි. එසේ ම දිලිසෙන්නා වූ පහන් සිල, ආහාර යකැයි සිතා පැන විනාශමන පලගැටියා මෙනි. ඇතැමෙක් නිත්‍ය සුඛ - සඳ සැප - ඇතැයි සිතා ආනෙඤ්ජාභිසංස්කාර රැස්කරත් විශාල පර්වතයක් මත පිහිටියා වූ පැන්පොකුණක් බලාපොරොත්තු වෙන් නැගීමට උත්සාහ ගන්නා පිපාසිතයෙකු මෙනි. ඒ පැන් පොකුණ කවදා හෝ වියලී යන බව හේ නොසිතයි. එයට ළඟාවූවහොත් සැමදා පැන් ලබන හැකියයි ද හේ සිතයි. එහෙත් එහි ස්වභාවය වියලී යැමය. උත්සාහ ගෙන එයට ළං වූ පසු මඳ කලක් යත්ම ආපසු ඒමට සිදුවේ. එමෙන් සඳ සැප විඳීමට බලාපොරොත්තුවෙන් අනිත්‍ය වූ ම අරූප ලෝක පතා ආනෙඤ්ජාභිසංස්කාර රැස්කරති. මෙසේ ඇති සැටි නොදන්නා වූ අවිද්‍යාව නිසාම සත්වයෝ ඇතැම් කලෙක පව් කරත්. ඇතැම් කලෙක පින් කරත්. මග පෙන්වන්නෙකු නොමැති ජාත්‍යන්ධයා උපන්දා සිට ඇස් නොපෙන්නාමෙනි. එහෙයින් කීහ.

"යථා පි නාම ජච්චන්ධො - නරො අපරිනායකො
එකදා යාති මග්ගෙන - කුම්මග්ගෙනාපි එකදා
සංසාරෙ සංසරං බාලො - තථා අපරිනායකො
කරොති එකදා පුඤ්ඤං - අපුඤ්ඤම්පි ච එකදා
යදා ඤත්වා ච සො ධම්මං - සච්චානි අභිසමෙස්සති
තදා අවිජ්ජූපසමා - උපසන්තො චරිස්සති"

මග පෙන්වන්නෙකු නොමැති, උත්පත්තියෙන්ම අන්ධ වූ මිනිසා ඇතැම් විට නියම මාර්ගයෙන් යයි ඇතැම්විට නොමගින් ද යයි. එමෙන් සසරෙහි හැසිරෙන්නා වූ අවිද්‍යාවෙන් මුලා වූ මෝඩයා ඇතැම් කලෙක පින් කරයි. ඇතැම් කලෙක පව් කරයි. ඉදින් යම් කලෙක හේ චතුරාර්‍ය සත්‍ය ධර්මයන්, අර්‍ථානර්‍ථ ධර්මයන්, මැනවින් අවබෝධ කරයි ද, එකල අවිද්‍යාවෙන් අත්මි, සන්සුන් බවට පත්වූයේ වෙයි. අවිද්‍යාවෙන් සංස්කාර වෙයි. යන්න විස්තරයයි මේ.

## 2. සංඛාර පච්චයා විඤ්ඤාණං

සංස්කාර ප්‍රත්‍යයෙන් විඥාන වන්නේය.

මේ ධර්මය අවබෝධ කර ගැනීමට දුෂ්කරය. චුතූපපාත ඥානය නූපදවා ගත් කෙනෙකුට වුවද පැහැදිලි කිරීමට අපහසු කරුණකි. ධර්මයෙහි ඇත්තා වූ ගම්භීරත්වය මෙවැනි අවස්ථා වන්හිදී මනා ලෙස ස්ඵුට වෙයි. බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් වැනි ධර්මභාණ්ඩාගාරික උතුමන්ට ද දෙසූයේ පටිච්ච සමුප්පාද ධර්මය ගැඹුරුය කියායි. "ගම්භීරොචායං ආනන්ද පටිච්ච සමුප්පාදො ගම්භීරාවභාසො" ආනන්දය මේ පටිච්ච සමුප්පාදය ගැඹුරුය, ගැඹුරු ලෙස වැටහේ යනු එසේ දෙසූ තැනකි. සුවිසද ඥානයක් ඇති එවැනි උතුමන්ටත් මේ ධර්මය ගැඹුරු නම් උකුණු හිසක ප්‍රමාණයවත් අඩු නුවණක් ඇති අප වැන්නවුන් කෙසේ පැහැදිලි කරනු ලැබේද? නොහැක්කේ මය. එහෙත් ඒ සඳහා ගන්නා උත්සාහය නිරර්ථක නොවෙයි. කවදා හෝ අනාගතයේදී එය ඥානය මුහුකුරා යෑමට උපකාරී වෙයි. එහෙයින් අටුවා පාඨයන්හි එල්බෙමින් සුදුසු තැන දේශනා පාඨ ද ඇතුලත් කරමින් කෙටි හැඳින්වීමක් මෙහිලා බහාලමි. නුවණැත්තෝ ආධුනිකයාට අනුකම්පා කෙරෙත්වා!

මෙහි සංඛාර යන්න ඉහත දී විස්තර කෙරිණි. දැන් දත යුත්තේ විඤ්ඤාණ යන පදයයි.

"තත්ථ කතමං සංඛාර පච්චයා විඤ්ඤාණං? යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණ ධාතු ඉදං වුච්චති සංඛාර පච්චයා විඤ්ඤාණං" – වි. ප.

එහි සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ යනු කවරේද ? යන ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් දෙසූයේ විඥානයාගේ ස්වභාව ලක්ෂණයි. එහෙයින් "අවිජ්ජා" පදයට ගත් තේරුම් සේ මෙහිදීද "යං චිත්තං තං විඤ්ඤාණං" මේ වශයෙන් පද වෙන්කර ගත යුතුය.

"යං චිත්තං තං විඤ්ඤාණං" යමක් විසිතුරු ද ඒ විඥාන නම්. එනම් සිතයි. සිත විසිතුරුය. නොයෙක් අයුරින් සිතුවිලි පරම්පරා පවතී. එසේම ඉතා වේගයෙන් ගමන් කරයි – දූරඞ්ගමං එක් තැනක, එක් අරමුණක, වැඩි වේලාවක

පිහිටමි. ගොඩට ගත් මාළුවකුගේ සැම කල්හි සෙල වේ. මෙතෙක් කරුණු නිසා සිත විසිතුරු බව දත යුතුය. සිතෙහි විසිතුරු ගතිය ඇතත් එහි සාමාන්‍ය ලක්ෂණය අරමුණු සිතීමයි. "ආරම්මණං චින්තෙතීති චිත්තං" අරමුණු සිතානුයි සිත නම්. එහෙත් "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන තැනදී ගත යුත්තේ විසිතුරු බවමයි. ප්‍රතිසන්ධි විඥානය නානාප්‍රකාර හෙයිනි.

"යං මනො තං විඤ්ඤාණං" යමක් අරමුණු මනින්නාක් මෙන් දැනගන්නා සවභාවයක් වේද, ඒ විඥාන නම්. විඥානය තුලාවෙන් - තරාදියෙන් - කිරන්නා සේ අරමුණ කිරා බලයි· මනියි. එනම් හොඳ ගතිය නැඹුරුකම, මේ ආදිය සිතා බලයි, එහෙයින් මන නම්. මානස යනුද ඒ තේරුම මයි. සිත හෘදය වස්තුවෙහි පවත්නා හෙයින් "හදය" නම් ආශ්‍රය කරනු ලබන ස්ථානය සලකා ඒ නම යෙදිණ. අරමුණු නොගත් සිත පිරිසිදු හෙයින් ඒ අවස්ථාව සලකා "පණ්ඩර" යයි දෙසූ "පභස්සර මිදං භික්ඛවෙ චිත්තං තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කි ලෙසෙහි උපක්කි ලිට්ඨං" මහණෙනි, මේ සිත පැහැදිලිය. එතකුදු වුවත් පිටතින් පැමිණෙන කෙලෙසුන් ගෙන් කිලිටි විය. යනු දේශනායි. මනං, මනායතනං; මේ පද මනායතනය සඳහාම යෙදිණ. මෙය ආයතන විස්තරයෙහි දක්විණ. ඉන්ද්‍රියයත් එසේමය. විඥානයම රාශිවීම් වශයෙන් විඤ්ඤාණක්ඛන්ධ නම්. "තජ්ජා මනොවිඤ්ඤාණ ධාතු" ඒ සිතෙන් හටගත් සියලු කුශලාකුශල සිත් පරම්පරාව ලක්ෂණ වශයෙන් එකක්ම වූ හෙයින් මනොවිඤ්ඤාණ ධාතු නම්. එනම් සිතයි මෙහේ විඤ්ඤාණය හැඳින්වීම සඳහා පද රාශියක්ම දෙසූහ. ඉක්බිති සංස්කාර ප්‍රත්‍යයෙන් කෙතෙක් විඥාන වන්නේද යනු දත යුතුය.

"තත්ථ කතමං සංඛාර පච්චයා විඤ්ඤාණං? චක්ඛු විඤ්ඤාණං සොත විඤ්ඤාණං ඝාණ විඤ්ඤාණං ජිව්හා විඤ්ඤාණං කාය විඤ්ඤාණං මනොවිඤ්ඤාණං, ඉදං වුච්චති සංඛාර පච්චයා විඤ්ඤාණං"

සංස්කාර ප්‍රත්‍යයෙන් විඥාන යනු කවරේද? චක්ඛුසොතාදී සය වැදෑරුම් විඥාන, ඒ ප්‍රශ්නයට පිළිතුරු විය. මේ විඥාන සය ලෞකික කුශලාකුශල කර්මයන්ගේ විපාක සිත්ය. ලෝකෝත්තර විපාක සංසාර කථාවට නො ගැනේ. මෙහි චක්ඛුවිඤ්ඤාණය [illegible]රුම්ය. අකුසල විපාකවූ චක්ඛුවිඤ්ඤාණය කුසල විපාක වූ

චක්ඛුවිඤ්ඤාණය, යනුයි. අහේතුක සිත් දක්වූ තැන මේ දෙක හඳුන්වා ඇත. සෙසු සොතවිඤ්ඤාණාදී සතරත් මෙසේම දෙවැදෑරුම් වශයෙන් බෙදෙයි. දෙපණස් (52) විඤ්ඤාණ යනු මේ සිත් දසයට නාමයකි. මනොවිඤ්ඤාණය දෙවිසි වැදෑරුම්ය. (22) කුසලාකුසල විපාක වූ මනොධාතු ද්වයය - සම්පටිච්ඡන දෙක- අහෙතුක මනොවිඤ්ඤාණ ධාතුත්‍රය - සන්තිරණතුන - සහෙතුක කාමාවචර විපාක සිත් අට, රූපාවචර විපාක සිත් පස, අරූපාවචර විපාක සිත් සතර, යනුයි.

මෙසේ ලෞකික වූ සියලු විපාක සිත් විඥාන සයට සංග්‍රහ වෙයි. ඉක්බිති කවර කවර සංස්කාරයන් නිසා කවර කවර විඥාන වේද යනු දතයුතුය. මෙහිලා මූලික වශයෙන් සැලකිය යුත්තේ මේ විඥාන කැලම - රාශිය ම = සංස්කාරයන් නො මැති නම් නූපදින බවය. සංස්කාරයන් පවතින නිසාම විඥාන ද උපදියි.

කාමාවචර පුණ්‍යාභිසංස්කාරයන් නිසා කුශල විපාක වූ පඤ්චවිඤ්ඤාණ හා විඤ්ඤාණය වූ එක් මනොධාතුවක් ද, මනොවිඤ්ඤාණධාතු දෙකක් ද, කාමාවචර සහෙතුක විපාක අටක්ද, යන සොළොස් සිත් ලැබේ. ඒ මෙසේය:= "කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං චක්ඛුවිඤ්ඤාණං හොති තථා සොත - ඝාණ - ජිව්හා - කායවිඤ්ඤාණං උප්පන්නං හොති, විපාකමනොධාතු උප්පන්නා හොති, මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති, -පෙ- උපෙක්ඛා සහගතෙන ඤාණවිප්පයුත්තා සසංඛාරෙනා"ති. කාමාවචර කුශලයන් කළ බැවින්, රැස්කළ බැවින්, ඒවාහි විපාක වූ චක්ඛු ආදී පඤ්ච විඤ්ඤාණ වෙයි. එසේම සම්පටිච්ඡන, සන්තීරණ ද්වය වෙයි. සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාරිකාදී සහෙතුක කාමාවචර විපාක සිත් අට වෙයි. මෙසේ සිත් සොළොසකි.

රූපාවචර කුශල කර්මයන් කළ බැවින්. රැස් කළ බැවින් විතර්කාදී අංගයන් ගෙන් යුත් විපාක සිත් පස උපදී. අරූපාවචර කුශල කර්මයන් කළ බැවින්, රැස් කළ බැවින්, ඒ හා සමාන නමින් යුත් ආකාසානඤ්චායතනාදී විපාක සිත් සතර උපදී. අකුශල කර්මයන් රැස්කළ බැවින් අකුශල විපාක වූ චක්ඛුවිඤ්ඤාණාදී පඤ්චකය, මනොධාතුවූ සම්පටිච්ඡනයද, මනොවිඤ්ඤාණධාතුවූ සන්තීරණයද, යන සත් වැදෑරුම් සිත් උපදී.

සියලු විපාක සිත් දෙපරිද්දෙකින් පවතී. ප්‍රතිසන්ධි වශයෙන් හා ප්‍රවෘත්ති වශයෙන්ය, මනොවිඤ්ඤාණධාතු වූ සියලු සි

දෙයාකාරයෙන් ම පවතියි. දෙපස් විඤ්ඤාණ හා මනොධාතු යුගලය පමණක් ප්‍රවෘත්ති වශයෙන් පමණි. මනොවිඤ්ඤාණ ධාතු අතුරෙන් අකුසල විපාක වූ උපෙක්ඛා සහගත සන්තීරණ සිත, සතර අපායෙහි ප්‍රතිසන්ධිය ගෙන දෙයි. කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් මනුෂ්‍යලෝකයෙහි ජාත්‍යන්ධ - උපතින් ම අඳ - ජාතිබධිර, ජාතිමූගාදී වශයෙන් ද, දිව්‍යලෝකයෙහි භූම්‍යස්ථ දෙවියන්ගේ හා දෙව අසුරයන්ගේ ද ප්‍රතිසන්ධි ගෙන දෙයි. එසේ ම ද්විහෙතුක ඔමක - ඉතා පහත් ප්‍රශල කර්මයන්ගේ විපාකයන් ගෙන් ලැබෙනුයේ ද සන්තීරණ ප්‍රතිසන්ධියකි.

සෙසු කාමාවචර කුශල විපාකයන් අතුරෙන් ත්‍රිහෙතුක ඔමක කුශල කර්මයන් ගෙන් හා ද්විහෙතුක උත්කෘෂ්ට කුශල කර්මයන් ගෙන්, විපාක වූ ඤාණවිප්පයුත්ත සිත් සතර ප්‍රතිසන්ධිය වශයෙන් ලැබේ. ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශල කර්මයන් නිසා ඤාණසම්පයුත්ත වූ විපාක සිත් සතරින් මනුෂ්‍යලෝකයෙහි පුණ්‍යවන්තයින් ගේ හා දෙවියන් ගේ ද ප්‍රතිසන්ධිය ලැබේ.

රූපාවචර විපාක සිත් පස, ප්‍රතිසන්ධි, ප්‍රවෘත්ති, යන දෙපරිද්දෙන් ම පවතියි. බ්‍රහ්මලෝකයෙහි ඉපදීම වශයෙන් ප්‍රතිසන්ධිය ද, ඉපදුනු පසු භවාඞ්ග, චුති, වශයෙන් ප්‍රවෘත්ති විපාක ද ලැබේ. තවද බ්‍රහ්මයනට චක්ඛු, සොත, යන ප්‍රසාදද්වය ඇති හෙයින් ප්‍රවෘත්ති විපාක වශයෙන් චක්ඛුවිඤ්ඤාණ, සොතවිඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ, සිත් උපදියි. ඒ කාමාවචර කුශල විපාක වශයෙනි. අරූපාවචර සිත් සතර, ප්‍රතිසන්ධි, ප්‍රවෘත්ති, යන දෙයාකාරයෙන් ම පවතියි. චුති චිත්තයෙන් පසු සිත සියුම් බවට පත්කළ උපෙක්ඛා, ඒකග්ගතා, යන චෛතසික ද්වයට පත්වීමෙන් ප්‍රතිසන්ධිය ද එහි විපාක කාලසීමාව තෙක් භවඞ්ග වශයෙන් පැවති එසිත් ගිලිහෙන අවස්ථාවේදී ද, එබඳු සිතක් චුති වශයෙන් පවතියි. අරූපාවචර ලෝක යනු චුති චිත්තයෙන් පසු සිත තැන්පත් බවට පත්වීම පමණි. මෙසේ ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සෙකි (19) ප්‍රවෘත්ති විපාක සිත් දෙතිසකි (32)

තවද ප්‍රතිසන්ධි විස්සෙකි. ප්‍රතිසන්ධියට ආරම්මණත්‍රයකි. විස්තර වශයෙන් සූවිස්සකි.

ප්‍රතිසන්ධි විස්ස නම්: "අසඤ්ඤසත්ත" නාමය නැති රූපය පමණක් ඇති බ්‍රහ්මලෝකයෙහි ප්‍රතිසන්ධියක් සමග ඉහත දක්වූ එ[illegible]විසි ප්‍රතිසන්ධි, යන විස්සයි. ආරම්මණත්‍රය නම් කම්, කම්

2019 10 05 Paññápárami Na Uyana Free Distribution

නිමිති, ගතිනිමිති යනුයි. "තත්‍ථ කම්මං නාම ආයූහිතා කුසලාකුසල චෙතනා" එහි කර්ම යනු රැස් කරන ලද කුශලාකුශල චේතනාවෝයි. "කම්ම නිමිත්තං නාම යං වත්ථුං ආරම්මණං කත්වා කම්මං ආයූහති" කර්ම නිමිත්ත යනු කර්මය කිරීමට අරමුණු වූ වස්තුවය. නැතහොත් කර්මය රැස්කිරීමට උපකාර වූ වස්තූන් අරමුණු වීමය. "ගතිනිමිත්තං නාම නිබ්බත්තනක ඔකාසෙ එකො වණ්ණො උපට්ඨාති" ගති නිමිත්ත යනු උපදිනු ලබන තැනක එක් පැහැයක් එළඹෙයි. එයයි. මෙවුන් අතුරෙන් කර්ම, කර්මනිමිති, දෙක අතීතයේ කොපමණ කල් කළාවූයේ නමුදු ඒ වේලාවෙහි එනම් චුති අවස්ථාවේදී මේ දෙක එළඹ සිටියි. "පරම්මුඛං ගච්ඡන්තස්සපි පච්ඡතො තිඛිණෙන අසිනා සීසං ඡින්දන්ති, නිපජ්ජිත්වා නිද්දායන්තස්සාපි තිඛිණෙන අසිනා සීසං ඡින්දන්ති, උදකෙ ඔසීදාපෙත්වා මාරෙන්ති, එවරූපෙපි කාලෙ අඤ්ඤතරං කම්මං වා කම්මනිමිත්තං වා උපට්ඨාති" ඉදිරි බලා යන්නෙකුගේ පිටුපසින් හොඳ තියුණු - මුවහත් - කඩුවකින් හිස සිඳිත්ද, නිදා සිටින්නහුගේ ද තියුණු කඩුවකින් හිස සිඳිත්ද, ජලයෙහි ගිල්වා මරත්ද, එවැනි කාලයක වුවද කර්ම, කර්මනිමිති, අතුරෙන් එකක් එළඹ සිටියි, යනු එහි අදහසයි. වහා මරණයකදී වුවද ඒ දෙක එළඹෙන බව මෙයින් දක්විණි. ඊටත් වඩා වේගවත් මරණයක් ඇත. ලෝකුරු තෙමේ කිණිහිර මත යකඩයක් තබා කුලකින් ගසද්දී, මැස්සෙකු එයට අසුවී සුණු විසුණු වී ඇඹරී යයිද, ඒ වේලාවෙහි නමුදු ඒ මැස්සාට කර්ම, කර්ම නිමිති, අතුරෙන් එකක් එළඹ සිටියි. මෙබඳු හදිසි මරණයක් තවත් නොමැත. දූත් සිතෙහි විසිතුරු බව සිතන්න.

කාමාවචර කුශල කර්ම කළාහුට යම් ගරුකර්මයක් ඇද්ද එය මරණ අවස්ථාවේදී එළඹ සිටියි. දුටුගැමුණු මහරජතුමාට රුවන්මැලි සෑය පෙන්වූයේ නමුදු සිහිවූයේ චූලඞ්ගණී යුද්ධයෙන් පැරද පලාගිය අවස්ථාවේදී සිදුකළ දානමය පුණ්‍යකර්මයයි. ගරු කර්මයක් නැතහොත් ආචිණ්ණාදී සෙසු කර්මයක් ඉදිරිපත් වෙයි. විස්තර කිරීමට ආරම්භ කළහොත් ප්‍රබන්ධව වේ. ගති නිමිත්ත වශයෙන් ඔහුට එළඹ සිටිනුයේ, මනුෂ්‍යලෝකයේ නම් මෑණියන්ගේ ගර්භයෙහි වර්ණයයි. එය රතුපාට කම්බිලියක් සේයයි අටුවාව කියයි. දිව්‍යලෝකයෙහි නම් කල්පවෘක්ෂ, උද්‍යාන, විමාන, ආදියයි. ධම්මික උපාසක තුමාට දිව්‍යරථ පෙණිනු. තවද කුශල කර්මයන්ගේ කර්ම නිමිති යනු දානයකදී නම් ප්‍රතිග්‍රාහකයන්, දානවස්තු ආදියයි. බුද්ධපූජාවකදී නම් මල් පහන් ආදියයි. මව්-පිය උපස්ථානයකදී නම් ඔවුන්ගේ වස්ත්‍ර බෙහෙත් ආදිය

අකුශල කර්මයන්ගේ කර්ම නිමිති නම් සතුන් මැරීම් ආදී පාප කර්මයක් සිදුකිරීමට උපකාර කරගත් ආයුධාදියයි. ගතිනිමිති වශයෙන් නිරයෙහි ගිනිදැල්, ලෝදිය භාජන, යමපල්ලන්, ආදියද, ප්‍රේතලෝකයෙහි නම් ඝණාන්ධකාරාදියද; තිරශ්චීන ලෝකයෙහි නම් වනාන්තරාදියද එළඹෙයි. මෙසේ අරමුණු තුනෙකි.

අනික් ක්‍රමයකිනුදු ආරම්මණ තුනකි. අතීත, වර්තමාන, නවත්තව්‍යාරම්මණ, යනුයි. ප්‍රතිසන්ධි විඤ්ඤ අතුරෙන් අසඤ්ඤ භවයෙහි ප්‍රතිසන්ධිය අනාරම්මණයි. විඤ්ඤාණඤ්චායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන, ප්‍රතිසන්ධිද්වය අතීතාරම්මණයි. කාමාවචර දස ප්‍රතිසන්ධිහු අතීතාරම්මණ හෝ වර්තමානාරම්මණ හෝ වෙත්. සෙසු රූපාවචර ප්‍රතිසන්ධි හා ආකාසානඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, යන සප්තවිධ ප්‍රතිසන්ධිහු නවත්තව්‍යාරම්මණ වෙත්. (කියයුතු අරමුණක් නො මැත්තේ නවත්තබ්බාලම්බන නමි.)

කීවයුත්තෙක් ඇත. ප්‍රතිසන්ධිය, මේ අරමුණු තුනට අනුම පැවතියේ නමුදු චුතිය පවත්තේ අරමුණු දෙකකට අනුව පමණි. වර්තමාන අරමුණක් චුතියට නොමැත. එහෙයිනි සෙසු අරමුණු දෙක අතුරෙන් එක් අරමුණක් අනුව චුති සිත උපන් පසු, අතර අවකාශයක් නො තබා ප්‍රතිසන්ධි ආරම්මණත්‍රය අතුරෙන් එකකට අනුව ප්‍රතිසන්ධි සිත උපදී.

ඉක්බිති අසඤ්ඤි ප්‍රතිසන්ධිය හැර, ඉතිරි එකුන් විසි ප්‍රතිසන්ධි, විස්තරයක් මේ ආරම්මණත්‍රයට අනුව දතයුතු.

## 1. සුගතියෙන් දුගීති ප්‍රතිසන්ධි පවතින අයුරු.

කාමාවචර සුගතියෙහි මරණාසන්නව සිටි පාපී පුද්ගලයාට "තානි චස්ස තස්මිං සමයෙ ඔලම්බන්ති ඔහුට ඒ වේලාවෙහි ඒ පාපකර්ම එළඹ සිටින්" යනු දේශනා හෙයින් රැස් කළාවූ පාපකර්මයක් හෝ එයට උපකාරවූ ආයුධාදී කර්ම නිමිත්තක් හෝ මනොද්වාර චිත්තවීථියට එයි, එය අරමුණු කොට උපන්නාවූ තදාරම්මණ කෙළවර කොට ඇති හෝ නැති හෝ ජවන වීථියට අනතුරුව භවාඞ්ග වීෂය වූ අරමුණක් ඇතිව චුති සිත උපදියි. ඒ චුති සිත නිරුද්ධවූ කල්හි ඒ චිත්තවීථියටම පැමිණියාවූ කර්ම හෝ කර්ම නිමිත්තක් හෝ අරමුණු කොට, නො සිඳින ලද කෙලෙස් බලවේගයෙන් නැමුණු, දුගීතියට අයත් ප්‍රතිසන්ධි සිතක් උපදියි. මේ අතීතාරම්මණ චුතියට අනතුරුව අතීතාරම්මණ ප්‍රතිසන්ධියයි

කාමසුගතියෙහි සිටි, ඇතැම් පාපී පුද්ගලයෙකුට මරණාසන්න මොහොතේදි නිරයෙහි ගිනිදැල් ආදී දුර්ගති නිමිත්තක් මනො ද්වාර චිත්තවීථියට එයි. එවිට දෙවරක් භවඞ්ගය ඉපදී නිරුද්ධ වූ පසු, එය අරමුණු කොට එක් ආවර්ජනයක් ද, දුර්බල චිත්තවීථියක් නිසා ජවන් පසක්ද තදාරම්මණ දෙකක්දැයි, ආවර්ජන, ජවන, තදාරම්මණ, යන වීථි සිත් තුන උපදී. ඉක්බිති භවඞ්ග විෂය අරමුණු කොට එක් චුති සිතක් උපදී. මෙසේ එකොළොස් චිත්ත ක්ෂණයක් ඉකුත් වීමෙන්, ඉතිරි චිත්තක්ෂණ පසක් ආයු ඇති කල්හි ඒ අරමුණෙහිම ප්‍රතිසන්ධි සිත උපදියි. මේ අතීතාරම්මණ චුතියට අනතුරුව වර්තමානාරම්මණ (ගතිනිමිත්ත) ප්‍රතිසන්ධියයි.

ඇතැමෙකුට මරණාසන්න මොහොතේදී චක්ෂුරාදී පඤ්ච ද්වාරයන් අතුරෙන් එක් ද්වාරයෙක්හි රාගාදී කෙලෙස් ඉපදීමට හේතු වූ හීනාරම්මණයක් චිත්තවීථියට පැමිණෙයි ඉක්බිති ඔහුට ක්‍රමයෙන් උපන්නාවූ වොත්ථපන චිත්තක්ෂණයට පසු ජවන් පසක්ද, තදාරම්මණ දෙකක්ද, ඉපිද භවඞ්ග විෂය ආරම්මණයකට අනුව එක් චුති සිතක් උපදියි. මෙපමණකින් භවඞ්ග දෙක, ආවර්ජන, දස්සන, සම්පටිච්ඡන, සන්තීරණ, වොත්ථපන, පඤ්ච ජවන, තදාලම්බන ද්වය, එක් චුති සිතකැයි පසළොස් චිත්ත ක්ෂණයක් උපන් පසු, ඊට අනතුරුව එක් චිත්තක්ෂණයක් ආයු. ඇති ඒ චිත්තවීථියේ ම අවසාන ඛණයෙන් ප්‍රතිසන්ධි සිත උපදී. මෙය ද අතීතාරම්මණ චුති සිතට අනතුරුව වර්තමානාරම්මණ වූ ප්‍රතිසන්ධියකි.

## 2. දුර්ගතියෙන් සුගති ප්‍රතිසන්ධි පවතින අයුරු ද

මේ දැක්වූ අයුරින් ම සැලකිය යුතු. වෙනස: නිරවද්‍ය වූ, කම්, කම්නිමිති පමණි, සෙස්ස පෙරසේයි.

## 3. සුගතියෙන් සුගති ප්‍රතිසන්ධි පවතින අයුරු.

සුගතියෙහි සිටි, නිවැරදි කර්ම ඇත්තහුට මරණාසන්න මොහොතේදී රැස් කළාවූ කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ අරමුණු වෙයි. එහෙත් මහග්ගත - රූපාවචර - කුශල කර්ම ඇත්තහුට අරමුණු වන්නේ කර්ම නිමිත්ත පමණි. එය අරමුණු කොට තදාරම්මණ ඇතිව හෝ නැතිව හෝ ජවන වීථියට අනතුරුව භවඞ්ග විෂය වූ අරමුණක් අනුව චුති සිතක් උපදී. එය නිරුද්ධ වූ කල්හි කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ ඒ චිත්ත වීථියට පැමිණ, නො සිඳින ලද කෙලෙස් බලවේගයෙන් නැමුණු වූ

සුගතියට අයත් ප්‍රතිසන්ධි සිතක් උපදියි. මෙය අතීතාරම්මණ චුතියට අනතුරුව අතීතාරම්මණ හෝ න වත්තබ්බාලම්බන හෝ ප්‍රතිසන්ධියයි, ඇතැමෙකුට සුගති වශයෙන් ගතිනිමිති ආරමුණු වීමෙන් පෙර පරිදි චිත්තවීථි ඉපිද සුගති ප්‍රතිසන්ධිය වේ. මේ අතීතාරම්මණ චුතියට අනතුරුව වර්තමානාරම්මණ ප්‍රතිසන්ධියයි.

ඇතැමෙකුට මරණාසන්න මොහොතේදී ඔවුන් ගේ ඥාති මිත්‍රාදීහු රැස්ව, ඔහු සඳහා බුද්ධපූජා; පරිෂ්කාර පූජා ආදී යම් පිනක් කිරීමට ආරම්භ කොට, ඒ පූජා වස්තූන් හෝ දක්වත්, ඇසෙන සේ කියත්. සිරුරෙහි හෝ ස්පර්ශ කරත්. නැතහොත් ඇසෙන සේ ධර්මදේශනා කරවත්, ඇතැම් විට සුවඳ ද්‍රව්‍යයන් ආඝ්‍රාණය කිරීමට සලස්වත්. මෙබඳු රූපාදී පඤ්චාරම්මණයන් අතුරෙන් එකක් අරමුණු කොට පෙර සේම වීථි සිත් ඉපිද අවසාන වශයෙන් එකචිත්තක්ෂණිකායුෂ්ක කාලයෙහි එයම අරමුණු කොට ප්‍රතිසන්ධි සිත උපදියි. මෙය ද අතීතාරම්මණ චුතියට අනතුරුව වර්තමානාරම්මණ ප්‍රතිසන්ධියකි.

## 4. කාම හෝ රූප හෝ සුගතියෙන් එබඳුම සුගති ප්‍රතිසන්ධිය පවතින අයුරු.

පඨවි කසිණාදි කසිණ වඩා, ලැබුවා වූ ධ්‍යාන ඇති සුගතියෙහි සිටියහුට මරණාසන්න මොහොතේදී කාමාවචර කුශල කර්මයක් හෝ කර්මනිමිත්තක් හෝ ගතිනිමිත්තක් හෝ පඨවි කසිණාදි මහග්ගත නිමිත්තක් හෝ සිතක් හෝ මනොද්වාර වීථියට පැමිණේ. නැතහොත් කුසල් සිත් ඉපදීමට හේතුවූ රූපාදී ප්‍රණීත ආරම්මණයක් හෝ පැමිණේ. එවිට ක්‍රමානුකූලව වීථි සිත් පහළ වී, ජවන් පසක් දුවා ජවනාවසානයේ භවඞ්ග විෂය වූ අරමුණක් අනුව චුති සිත උපදියි. ඊට පසු කාමාවචර හෝ මහග්ගත වූ හෝ සුගතියට අයත්, එළඹ සිටි අරමුණට අනුව ප්‍රතිසන්ධි සිත උපදියි. මෙය නවත්තබ්බාලම්බන සුගතියට අනතුරුව අතීතවූ ද, වර්තමානවූ ද, න වත්තබ්බාලම්බන වූ ද ප්‍රතිසන්ධි අතුරෙන් එක් ප්‍රතිසන්ධියකි. මේ ක්‍රමයෙන් ම ආරූප්‍ය චුතියට අනතුරුව සිදුවන ප්‍රතිසන්ධිද දතයුතුය.

## 5. දුර්ගතියෙන් දුර්ගති ප්‍රතිසන්ධි පවත්නා අයුරු.

දුර්ගතියෙහි පාපකම් පුද්ගලයාට පෙර කී පරිද්දෙන්ම කර්ම, කර්මනිමිති, ගතිනිමිති අතුරෙන් එකක් මනොද්වාර චිත්ත වීථියට පැමිණේ. නැතහොත් චක්ඛාදී ද්වාර පසෙන් එකකින්

හෝ ආරම්මණයක් පැමිණේ, ඔහුට ද ක්‍රමානුකූලව ආවර්ජනාදි සිත් ඉපිද, තදාරම්මණ ඇතිව හෝ නැතිව හෝ අවසානයේ භවාංග විෂය වූ අරමුණක් අනුව චුති සිත ඉපදී අනතුරුව දුර්ගතියට අයත් ඉහතකී අරමුණකට අනුව ප්‍රතිසන්ධි සිත පහළ වෙයි. මේ අතීතාරම්මණ දුර්ගති චුති සිතට අනතුරුව අතීත, වර්තමාන, ආරම්මණ වූ ප්‍රතිසන්ධි පවත්නා අයුරුයි,

එකුන්විසි වැදෑරුම් වූ පටිසන්ධිවිඤ්ඤාණයන්ට අනුව ප්‍රතිසන්ධි පවත්නා අයුරු මෙතෙකින් අවසානය. (මෙය සකස්කළේ සම්මෝහවිනෝදනී නම් වූ විභඞ්ගප්පකරණ අට්ඨුවාවට අනුවය)

## ප්‍රවෘත්ති කාලයෙහි විපාක විඥාන ලැබෙන අයුරු.

ප්‍රසාද රූප ඇත්තාවූ කවර සත්වයෙකුට වුවද චක්ෂුරාදි ඉන්ද්‍රියන්ට තමන් කැමති නැති (අනිෂ්ට) අරමුණු ලැබීමෙන් අකුශල විපාක වූ චක්ඛුවිඤ්ඤාණාදී සය උපදියි. එසේ ම ඉෂ්ටාරම්මණයන් ලැබුණොත් කුශල විපාක වූ අහේතුක චක්ඛුවිඤ්ඤාණාදී සය උපදියි. ඉතාමත් කැමති (අතිඉෂ්ට) අරමුණු ලැබීමෙන් සහේතුක කාමාවචර විපාක විඤ්ඤාණ උපදියි. මේවා පවතිනුයේ භවාංග, තදාරම්මණ, චුති, වශයෙනි, ජවන් සිත් ඉපදීමට කලින් උපදිනුයේ වොත්ථපන, සන්තීරණ, සම්පටිච්ඡන, පඤ්චවිඤ්ඤාණ යන්ගෙන් එකක්, යන සිත් සතරයි. මේ සිත් අතුරෙන් වොත්ථපනය හැර සෙසු ඒවා කුශල විපාක වූ අහේතුක මනොවිඤ්ඤාණ හා පඤ්චවිඤ්ඤාණයෝය. සම්පටිච්ඡනය මනොධාතු වුවද අහේතුක ක්‍රියා සිතෙකි. විපාක නො වේ. ඊටත් ඉක්බිතිව (මුලින්) උපදින භවාංගුපච්ඡේද, භවාංගචලන, භවාංග, යන සිත් භවාංගයට ම අයත්ය. එහෙයින් ඒවා කාමාවචර කුශල වූ සහේතුක විපාකයි. ජවන් සිත් කුශල්ය. විපාක නොවේ. ඉන්පසු ලැබෙන තදාරම්මණ විපාක සිත්ය. මෙසේ කාමාවචර කුශල සහේතුක විපාක විඤ්ඤාණයෝ භවාංග, තදාරම්මණ චුති වශයෙන් ප්‍රවෘත්ති අවස්ථාවේදී පවතිත්.

අපායගත සත්වයනට ද, ඇතැම් අවස්ථාවන්හිදී කුශල විපාක අහේතුක විපාක විඤ්ඤාණ සිත් උපදියි. නිරයවාසීන් ''මුගලන් මහරහතන් වහන්සේ දැකීමෙහිදී ද, බුදුරජාණන් වහන්සේගේ ඉපදීම, බුදුවීම, පිරිනිවීම, යන අවස්ථාවන්හි දී ද ගිනිදැල් නිවීම බවට පත්වීමෙන් ද කුසල විපාක විඤ්ඤාණ උපදියි. ඇතැම් තිරිසනුන්ට හොඳ ආහාරයක්, රූපාදියක්,

ලැබීමෙන් එසේම කුසල විපාක විඤ්ඤාණ උපදියි. මෙසේ ප්‍රසාද රූප කවර සත්වයෙකුට වුවද කුශලා කුශල විපාක විඥාණ සිත් උපදින බව දතයුතුය.

රූපී බ්‍රහ්මයනට ප්‍රසාද රූප අතුරෙන් ඇත්තේ චක්ෂු ප්‍රසාද, ශ්‍රොත්‍ර ප්‍රසාද, රූප දෙක පමණි. එහෙයින් ඒ දෙක නිසා පවතින විපාක සිත් පමණක් කාමාවචර වශයෙන් උපදියි. අරූප ලෝකයේ ප්‍රසාද රූප නැති.

රූපී, අරූපි දෙපිරිසටම මහග්ගත විපාක විඤ්ඤාණයෝ භවඞ්ග, චුති වශයෙන් උපදිත්. තදාරම්මණ නොමැත. මක් නිසාද? තදාරම්මණ කාමාවචරයි. එහෙයිනි. ඔවුනට ප්‍රතිසන්ධි විඥානය ලැබුණාට පසු චුති සිත උපදින තෙක් කොපමණ කල් විසුවත් උපදනුයේ භවඞ්ග සිත්ය. එහෙත් චක්ඛු, සොත, යන පසාද රූප ඇති රූපීනට බුද්ධදර්ශනාදීන් නිසා පෙර කී පරිදි කාමාවචර විපාක විඤ්ඤාණ උපදියි. නැවත භවඞ්ගයට පත්වෙන්ම රූපාවචර විපාක විඤ්ඤාණ පවතියි. අරූපීනට කැලම භවඞ්ග සිත්ය.

මේ ප්‍රවෘත්ති කාලයෙහි විඥාන උපදින අයුරුයි.

## සංස්කාරයන් නිසා විඥාන වන අයුරු.

මෙය පහසුවෙන් තේරුම් ගත හැකියේ මනුෂ්‍ය චුති වශයෙනි. යම්කිසි මනුෂ්‍යයෙකුට මරණ මොහොත පැමිණි කල්හි රත්වූ ගලක් මත දැමූ වෙඩිඩයක් සේ ඔහුගේ චක්ෂුරාදි ඉන්ද්‍රියෝ වියලීමට පටන් ගනිත්. මෙසේ ක්‍රමයෙන් වියලී ගොස් චුති සිත ඉපදීමට ලංවත්ම කායින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, මනින්ද්‍රිය, යන ධර්ම තුන් දෙනා හෘදය වස්තුව ඇසුරටම පැමිණෙත්. සෙසු ශරීරයේ සියලු තන්හි ප්‍රසාද ශක්ති හා ජීවිතින්ද්‍රිය වියලී ගොස් ය. එවිට ඔහු විසින් කුශලා කුශල වශයෙන් කරගනු ලැබූ ගරු කර්මයක් හෝ ආචීර්ණ කර්මයක් හෝ ආසන්න කර්මයක් හෝ කෘත්වාත් කර්මයක් හෝ තමා වෙත එළඹෙයි. මේ සතරින් එකක් එහුට එළඹුනුයේ ඉහත දක්වූ පරිදි කර්ම, කර්ම නිමිති, වශයෙනි. ඇතැම් විට ගති නිමිති ද ඉපදිය හැක. ඉක්බිති ඒ අරමුණකට අනුව චුති සිත උපන් පසු අවිද්‍යා, තෘෂ්ණා, දෙකෙහි බලවේගයෙන් අන් භවයක් කෙරෙහි එහුගේ ප්‍රතිසන්ධි සිත නැමෙයි, ඒ සමගම චුති චිත්තයට ආසන්න ජවන් සිතෙහි පැවති චේතනාව හෝ එසාදි සහජාත චෛතසික හෝ කර්මාදී අරමුණක් කෙරෙහි

ඔහෝ සිටියාක් මෙන් පැමිණියි නැතහොත් උපදියි. මේ අවස්ථාව ගංගාවෙක්හි මෙතෙර ගසක රැහැනක් රැගෙන එතෙරට පනින පුරුෂයෙකු මෙනි. කිවයුත්තක් ඇත. චුති සිත අයත්වූවහු ම ප්‍රතිසන්ධියට නො පැමිණේ. අන් කෙනෙකු ප්‍රතිසන්ධිය ගත්තේද නොවේ "න ච සො න ච අඤ්ඤො" යනු දේශනා පාඨයි. රැස් කළා වූ කර්මවේගය නිසාම දෙවන භවයෙහි ප්‍රතිසන්ධියවිණි. රැස්කළා වූ කර්ම නොමැති නම් ප්‍රතිසන්ධියකුදු නොවේ. රහත් වූවන්ගේ සිත නිරුද්ධ වන්නේ එහෙයිනි. කර්ම වේගය ඇති සැම සත්වයෙක්ම චුති චිත්තයෙන් පසු එක් භවයෙක පිළිසිඳ ගනී.යි එහෙත් නොසිඳී එන ආත්මයක් නැත, මේ කරුණ උපමාවකින් තේරුම් ගත යුතුය.

"සියුං නිදස්සනා එත්ථ - පටිඝෝසාදිකා අථ
සන්තාන බන්ධ තො නත්ථි - එකතානාපි නානතා"

මෙහිලා ප්‍රතිඝෝෂාදීහු නිදර්ශනයෝ වෙත්. එසේම සන්තාන බන්ධන වශයෙන් එකත්වයක් නොමැත. නානත්වයකුදු නො මැත.' යනු අදහසයි. ප්‍රතිසන්ධියෙහි නිදර්ශනයෝ නම් ප්‍රතිඝෝෂය, ප්‍රදීපය, මුද්‍රාව, ප්‍රතිබිම්බය, යන මොහුයි. යම්කිසි ලෝහ භාණ්ඩයකට හෝ බෙර විශේෂයකට හෝ පහර දුන් කල්හි එයින් නැගෙන්නා වූ හඬ - ඝෝංකාරය - වෙන අා දෙයක් නොමැත. මේ ප්‍රතිඝෝෂයෙහි අයුරුයි. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥාන වේය යනු ද මේ අයුරු මැයි, එසේම පහනකින් තවත් පහනක් දල්වීමේදී ද, මුද්‍රාවකදී ද, ඡායාරූපයක් පිළිබඳව ද, උපමා මේ අනුසාරයෙන් සිතා බැලිය යුතු. භවයෙන් ගිලිහෙන සත්වයාගේ චුති සිත හා ප්‍රතිසන්ධි සිතෙහි ඒකාබද්ධ-එකට බැඳීම - තාවයක් නොමැත. එසේ වූවද නානාබද්ධතාවය-වෙන් වෙන්ව බැඳීම-කුදු නොමැත. චුති සිත අයත් පුද්ගලයා විසින් රැස් කළාවූ කර්ම නිසාම දෙවන භවයෙහි ප්‍රතිසන්ධිය ලැබෙන හෙයිනි. 'න ච සො න ච අඤ්ඤො" යනු සිහිකර බලන්න.

සංසකාර විඥානයට ප්‍රත්‍යය වනුයේ ඉපැත්මටය. පැවැත්මට නොවේ. මෙතැන, අතීත, වර්තමාන හේතු ඵලසන්ධියකි. එහෙයින් සංස්කාර නමැති බීජය නිසාම විඥාන නමැති ඵලය හටගනී.

මින්තෙකින් මේ ගැඹුරු කරුණ සාමාන්‍යයෙන් දක්වා අවසානය.

# 3. විඤ්ඤාණ පච්චයා නාමරූපං

## විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වන්නේය,

මෙහි විඤ්ඤාණ යනු විපාක විඤ්ඤාණමැයි, කිවයුත්තෙක් ඇත. ප්‍රතිසන්ධි විඥානයෙන් රූප නො උපදවයි, එට හේතු වස්තු දුර්වලභාවයයි. විශාල පර්වතයකින් වැටුණු කෙනෙක් අනික් කෙනෙකුට ඒ මොහොතේදී පිහිට වේය යනු නො සිදු වන කරුණකි. මෙත් එබඳුය. එහෙයින් ප්‍රතිසන්ධි සිතට පසු උපදින භවඞ්ග සිතෙහි පටන් රූප උපදවයි, මේ කරුණ ප්‍රධාන මගයෙන් සිත තබාගත යුතු හෙයින්ම මුලින්ම දැක්විණ. සෙසු විපාක විඥානයන්ගෙන් සුදුසු පරිදි නාමරූප උපදින්නේය. එහි ලා විස්තර මෙසේය.

"තත්ථ කතමා විඤ්ඤාණ පච්චයා නාමරූපං? අත්ථි නාමං අත්ථි රූපං. තත්ථ කතමං නාමං? වේදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සංඛාරක්ඛන්ධො ඉදං වුච්චති නාමං, තත්ථ කතමං රූපං? චත්තාරො ච මහාභූතා, චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං, ඉදං වුච්චති රූපං, ඉති ඉදඤ්ච නාමං ඉදංච රූපං, ඉදං වුච්චති විඤ්ඤාණපච්චයා නාමරූපං"

මෙහි සාමාන්‍ය අදහස: විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වන නාමරූප කවරේද? නාමයක් ඇත. රූපයක් ඇත. වේදනා - සඤ්ඤා - සංඛාර නාමයි. සතර මහා භූත හා උපාදාය රූප රූපයි. මෙසේ නාමරූප වෙයි යනුයි.

මෙහි ආ වේදනාදි සකන්ධ පෙරදී විස්තර විණි. රූප ද එසේමය. දැන් දතයුත්තේ විපාක විඤ්ඤාණ නිසා නාමරූප උපදින ආකාරයයි. මෙය පැහැදිලිවීම සඳහා කොටස් කරගත යුතුය. විඥාන ප්‍රත්‍යයෙන් නාම වන්නේය. විඥාන ප්‍රත්‍යයෙන් රූප වන්නේය. විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වන්නේය. කියාමි.

විඥාන ප්‍රත්‍යයෙන් නාම වනුයේ අරූපී භවයෙහිය. විඥාන ප්‍රත්‍යයෙන් රූප වනුයේ අසඤ්ඤි භවයෙහිය. සෙසු සෑම භවය කම සුදුසු පරිද්දෙන් නාම රූප දෙකම වන්නේය. තවද සතර මැදුරුම ප්‍රතිසන්ධි ක්‍රම, ත්‍රිවිධ භව, පඤ්ච ගති, සත්තවිඤ්ඤාණ [illegible] යනා මෙතෙක් කරුණු මෙහි ලා දත යුතුය.

**සතර වැදෑරුම් ප්‍රතිසන්ධි ක්‍රම:-** අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික, යනුයි. බිජුවටින් හටගත්තේ නැතහොත් බිජුවටෙක පිළිසිඳ ගත්තේ අණ්ඩජ නම්. කුකුල්, තාරා, ආදී පක්ෂිගණයා බොහෝ සෙයින් මෙය ඇතුලත් වෙයි. එසේම නයි, හූනු, කටුස්සු, ආදීහුද අයත් වෙත්. මව්කුසෙහි ඇති දලබුවක පිළිසිඳ ගත්තෝ ජලාබුජයෝ ය. මනුෂ්‍ය, ගව, මහිෂාදීහු මෙයට අයත්යහ. දිරාගිය පරණලා, රෙදි මැරලි ආදී තෙත් ද්‍රව්‍ය ඇති ස්ථානයන් ඇසුරු කොට උපදින සත්වයෝ සංසේදජ යෝයි. සම්පූර්ණ අවයව ඇතිව උපදින දිව්‍ය - බ්‍රහ්මාදීහු ඕපපාතික නම්. ඇතැම් විට මනුෂ්‍යයන් ද, වෛමානික ප්‍රේතයන් ද, ඕපපාතිකව උපදින බව පෙනේ. මේ සංක්ෂෙපයයි. විස්තර මෙසේය.

'චතස්සො ඉමා සාරිපුත්ත යොනියො, කතමා චතස්සො? අණ්ඩජා යොනි, ජලාබුජා යොනි, සංසෙදජා යොනි, ඔපපාතිකා යොනි; කතමා ච සාරිපුත්ත අණ්ඩජා යොනි? යෙ ඛො තෙ සාරිපුත්ත සත්තා අණ්ඩකොසං අභිනිබ්භිජ්ජ ජායන්ති, අයං වුච්චති සාරිපුත්ත අණ්ඩජා යොනි. කතමා ච සාරිපුත්ත ජලාබුජා යොනි? යෙ ඛො තෙ සාරිපුත්ත සත්තා වත්ථිකොසං අභිනිබ්භිජ්ජ ජායන්ති අයං වුච්චති සාරිපුත්ත ජලාබුජා යොනි. කතමා ච සාරිපුත්ත සංසෙදජා යොනි? යෙ ඛො තෙ සාරිපුත්ත සත්තා පූතිමච්ඡෙ වා ජායන්ති පූතිකුණපෙ වා පූතිකුම්මාසෙ වා චන්දනිකාය වා ඔලිගල්ලෙ වා ජායන්ති: අයං වුච්චති සාරිපුත්ත සංසෙදජා යොනි. කතමා ච සාරිපුත්ත ඔපපාතිකා යොනි? දෙවා නෙරයිකා එකච්චෙ ච මනුස්සා එකච්චෙ ච විනිපාතිකා, අයං වුච්චති සාරිපුත්ත ඔපපාතිකා යොනි ඉමා ඛො සාරිපුත්ත චතස්සො යොනියො" ම නි; මූ. ප. (මහාසීහනාද සූත්‍රය)

මෙහි කෙටි අදහස: ශාරිපුත්‍රය, යෝනි සතරෙකි, අණ්ඩජ- ජලාබුජ - සංසේදජ - ඕපපාතික යෝනි කියායි. එහි අණ්ඩජ යෝනි යනු අණ්ඩකොෂය-බිත්තරය-පලාඑන සත්වයෝය. ජලාබුජ යෝනි නම් වස්තිකෝෂය - මව්කුසෙහි දරුවා වටවී ඇති සිවිය - පලා එන සත්වයෝය. කුණු මස්, කුණු මිනී, කුණු ආහාර, ගමරවල, මේ ආදී තත්හි උපදින සත්වයෝ සංසේදජ යෝනීහුය. ඕපපාතික යෝනි නම් දෙවියෝ නෙරයිකයෝ = නිරයවාසීහු = ඇතැම් මනුෂ්‍යයෝ ඇතැම් විනිපාතිකයෝ

විශේෂ: දෙවියන් අතුරෙන් චාතුර්මහාරාජිකයන්ගේ සිට මතු මතු දෙවිවරුන්ගේ උත්පත්ති ක්‍රමය ඕපපාතික වශයෙන්මය. භුම්‍යස්ථ දෙවියෝ චතුර්යෝනිකයහ. 'භුම්මා දේවා චතුයෝනිකා" යනු අටුවාසි (විමසිය යුතු) මනුෂ්‍යයන් අතුරෙන් බහුල වශයෙන් පවත්තේ ජලාබුජ යෝනියි. එහෙත් ඇතැම් විට, අණ්ඩජ, සංසේදජ, ඕපපාතික, යෝනි වලින් ද උපදිත්. කෝනාතපුත්‍ර වූ සොහොයුරු භික්ෂූන් දෙනම අණ්ඩජයෝයයි අටුවාව කියයි. පොක්ඛරසාති බ්‍රාහමණයා, පදුමවතී දේවිය. සංසේදජයෝය. මල්හි උපන් හෙයිනි. අම්බපාලී ගණිකාව ඕපපාතිකයි- විනිපාතිකයන් අතුරෙන් නිජ්ඣාමතණ්හික ප්‍රේත යෝ ඕපපාතිකයෝය. සෙසු අය චතුයෝනිකයහ. මේ විශේෂ උප්පත්ති ක්‍රමයයි.

ත්‍රිවිධ භවය: කාම භවය, රූප භවය, අරූප භවය මේ ත්‍රිවිධ භවයයි. නිරය, අසුර, ප්‍රේත, තිරශ්චීන, මනුෂ්‍ය, චාතුර් මහාරාජික, තාවතිංස, යාම, තුසිත, නිර්මාණරති, පරනිර්මිතවශ වර්ති, යන භූමි එකොළොස කාමභවයයි. රූප භවය සොළොස් වැදෑරුම්ය. බ්‍රහ්මපාරිසජ්ජ, බ්‍රහ්මපුරෝහිත, මහාබ්‍රහ්ම, පරිත්තාභ; අප්පමාණාභ, ආභස්සර, පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්ණක, වෙහප්ඵල, අසඤ්ඤසත්ත, අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨක, යනුයි ආකාසානඤ්චායතනාදි සතර අරූප භවයයි. මේ පිළිබඳ විස්තර දීර්ඝය. මේ සංක්ෂේපයෙනි.

නිරය: මේය ප්‍රධාන වශයෙන් අටවැදෑරුම්ය විස්තීර්ණ ක්‍රමයෙන් එක්සිය සතිස් වැදෑරුම්ය. සඤ්ජීව' කාලසූත්‍ර, සංඝාත, රෞරව, මහාරෞරව, තාප, ප්‍රතාප, අවීචි, මේ ප්‍රධාන අටයි. මේවාහි එකක් පාසා ඔසුපත් නිරය සොළොස බැගින් ඇත. සියල්ල එක්සිය විසි අටෙකි. (8x16=128) මහ නිරය අටත් සමග එක්සිය සතිසයි. (136)

අසුර ලෝකය: මේය පස් වැදෑරුම්ය. දේවාසුර, විනිපාතිකාසුර, වෙමානිකාසුර, ලෝකාන්තරිකාසුර, ප්‍රේතාසුර, යනුයි. වේපචිත්ති, පහාරාදීහු දේවාසුරයෝය පියඞ්කරමාතා, පුනබ්බසුකමාතා, ආදීහු විනිපාතිකා සුරයෝයි. වෙමානිකයෝ නම යමරජු ආදීහුයි. සක්වල තුනකට අතර ඇති ලෝකාන්තරික යෙහි වූවෝ ලෝකාන්තරිකාසුරයෝයි. කාලකඤ්ජාදීහු ප්‍රේත යෝයි

**ප්‍රේතලෝකය :** ප්‍රේත ලෝකයට තැනක් නොමැත. ප්‍රේතයෝ කොහි විසුවත් එතැන ප්‍රේත ලෝකයයි, මොවුහු සතර වැදෑරුම්ය. උතූපජීවි, ඛුප්පිපාසික, නිජ්ඣාමතණ්හික, පරදත්තූපජීවි, යනුයි.

**තිරශ්චීන ලෝකය:** මෙයට ද ස්ථානයක් නැත. කවර තැනක හමුත් තිරශ්චීනයෝ - තිරිසත්තු - වෙසෙත් ඒ තිරශ්චීන ලෝකයයි. මොවුහු සතර වැදෑරුම් යහ. අපාද, ද්විපාද, චතුප්පාද, බහුප්පාද, යනුයි. පා නැත්තෝ අපාද නම්. සෙසු පද ද මෙසේ සලකා ගත යුතු.

**මනුෂ්‍ය ලෝකය:** මෙය සතර වැදෑරුම්ය. ජම්බුද්වීපය, පූර්වවිදෙහය, අපරගෝයානය, උතුරුකුරු දිවයින, යනුයි. ප්‍රධාන වශයෙන් ගනු ලබන්නේ ජම්බුද්වීපයයි. එහි වෙසෙන මනුෂ්‍යයාගේ සමෘති, සූර, බ්‍රහ්මචරියා, ශ්‍රේෂ්ඨ හෙයිනි.

**චාතුර්මහාරාජිකය:** ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ, යන සතර වරම් රජවරුන්ගේ අධිපති භාවය ඇති, ගාන්ධර්ව; කුම්භාණ්ඩ, නාග, යක්ෂ, යන චතුර්විධ සේනා වාසය කරන ස්ථානයයි. මෙය ස්ථාන නියමයක් නැත. යම් තැනෙක ඔව්හු වෙසෙත් ද එතැන චාතුර්මහාරාජිකයයි. මොවුන් පිළිබඳ විස්තර "ආටානාටිය" සූත්‍රයෙහි බලන්න.

සෙසු තාවතිංසාදි කාමාවචර දිව්‍යලෝක හා බ්‍රහ්මලෝක පිළිබඳ විස්තර දැක්වීමට සියකොත් දීර්ඝවේ. දැනු කැමැත්තෝ "අභිධම්මත්ථදීපිකා" ග්‍රන්ථයෙහි පස්වැනි වීථිමුත්තපාදය බලත්වා!

**පඤ්ච ගතිය:**

"පඤ්ච ඛො ඉමා සාරිපුත්ත ගතියො, කතමා පඤ්ච? නිරයො තිරච්ඡානයොනි පෙත්තිවිසයො දෙවාමනුස්සා," මහාසීහනාද සූත්‍රය.

සාරිපුත්‍රය, මේ ගති පසෙකි. කවර පසක්ද? නිරය, තිරශ්චීන යෝනිය, ප්‍රේතවිෂය, දිව්‍ය, මනුෂ්‍ය, කියායි.' මෙහි "ගති" යනු තමා කළාවූ කුශලාකුශල කර්ම අනුව යා යුතුය යන අදහස ඇතිව සිදුවන උප්පත්ති ක්‍රමයයි. ඒ අනුව සියලු සත්වයන්ගේම ගති පසෙකි. ඉහත සඳහන් නිරය ආදි ඒ ඒ ලෝකයන් මේ ගති පඤ්චකයට ඇතුළත් වේ. රූපි, අරූපි, බ්‍රහ්මයන් දිව්‍ය ගතියටම ඇතුලත් වන බව දත යුතු.

තවද සත්තවිඤ්ඤාණට්ඨිති, නවසත්තාවාස, ආදිය "සුතමය ඥානයෙහිදී" විස්තර විණි. මේ සියලු ද නාමරූප ප්‍රත්‍යයෝත්පන්න ධර්මයට ඇතුළත් හෙයින්ය. පළමු කොට පැහැදිලි කළේ.

## විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වන අයුරු:

සංස්කාර විඥානයට ප්‍රත්‍ය වූයේ ඉපැත්මටය. පැවැත්මට නොවේ. එහෙත් විඥාන නාමරූපයනට ප්‍රත්‍යය වනුයේ පැවැත්මටය. නිපැත්මට නොවේ. මේ කරුණ සිත තබාගත යුතුය. නාමය දක්වූ තැනේදී වේදනා, සඤ්ඤා, සංඛාර, පමණක් දක්විණ. එවිට විඤ්ඤාණය නාමයට අයත් නැද්ද යනු ප්‍රශ්නයෙකි. වේදනාදී ස්කන්ධත්‍රයටම මුල්වනුයේ විඥානයයි. එය ප්‍රත්‍ය වශයෙන් දක්වෙන හෙයින් දෙවනුව නොදක්විණි යනු පිළිතුරයි. ප්‍රත්‍යයත් මෙහිදී ප්‍රත්‍යයෝත්පන්න වූ බැව් සලකන්න. විඥානය නොමැති නම් වේදනාදී ස්කන්ධ කොහි පවතීද? "මනො පුබ්බඞ්ගමා ධම්මා" මෙය ද සිහිකර බලන්න. විඥාන වූ ප්‍රතිසන්ධි සිත, නාම වූ ඒ හා යෙදෙන චෛතසික රූප වූ ඒ සමගම උපදින කර්මජරූප, යන ධර්ම තුන්දෙනාම පෙර පසු නොවී ඒ මොහොතේදීම උපදිත්. තවත් පැහැදිලි වීමට නාම රූප ධර්ම උපදින ක්‍රම සතර දත යුතුය.

## රූප සමුට්ඨාන ක්‍රම සතරෙකි.

කර්ම, චිත්ත, ඍතු, ආහාර, යන සතරයි. සියලු රූප උපදිනුයේ මේ සතරින්. කර්මයෙන් හටගත් රූප කර්මජයි. සෙසු රූපනාම ද මෙසේ සැලකිය යුතු. මෙහි "කර්ම" යනු මොහොතක් උපදිනු ලබන කුශලාකුශල චේතනාවෝයි. නානාක්ෂණික කර්මයි. මේ නානාක්ෂණික කර්ම, කර්මජ රූපයන්ට ද, විපාකස්කන්ධයන්ට ද ප්‍රත්‍යය වේ. "නානාක්ඛණිකා කුසලා කුසල චේතනා විපාකානං ඛන්ධානං කටත්තා ච රූපානං කම්මපච්චයෙන පච්චයො" නානාක්ෂණික කුශලාකුශල චේතනා විපාක ස්කන්ධයන්ට හා කෘත්වාත් කර්මජ රූපයන්ට ද කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේය යනු පට්ඨාන දේශනායි. රූප උපදවන කර්ම නම් අකුසල් සිත් දොළොස, කාමාවචර ශොභන සිත් අට, රූපාවචර කුසල සිත් පස යන පස්විස්සයි. මොවුහු සිත්හි වූ උප්පාද, ඨිති, භඞ්ග, යන අවස්ථා ත්‍රයට අනුව රූප නිපදවති. කර්මජ රූප සියල්ල අටළොසෙකි. කර්මජම වූ හෘදය රූපය, ප්‍රසාද රූප පස, ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, යන භාවය හා චතුජ රූප වූ අවිනිර්භෝග රූප හෝ ආකාශ රූපයත් යන අට [illegible].

චිත්තජ රූප චිත්ත යනු: චෛතසිකයන් යෙදුනු සිත්ය. කර්ම යන්නෙන් ද සිත් ගන්නේ නමුදු එහි ඇති චේතනා චෛතසිකයම ගතයුතු බව සලකන්න. ඒ චේතනා චෛතසිකයෙහි රූප නිපදවනුයේ. මෙහි චෛතසිකයන් යෙදුනු සිත් කියැවේ· "සසම්ප්‍රයුක්ත සිත්ය". රූප උපදවන සිත් නම් දෙපස් විඤ්ඤාණ හා අරූප විපාක සිත් හැර ඉතිරි සියලු සිත්ය. ප්‍රතිසන්ධියට පසුව උපදින ප්‍රථම භවඞ්ග සිතෙහි පටන් චිත්තය පිළිතුද උප්පාද අවස්ථාවන්හි පමණක් රූප උපදවයි. ඨිති, භඞ්ග, අවස්ථාවන්හි රූප උපදතේ නොමෙයි. දෙපස් විඤ්ඤාණ රූප නූපදවනුයේ ධ්‍යානඞ්ග නොමැති බැවිනි. රූප ඉපදවීමෙහි ලා ධ්‍යානඞ්ග ප්‍රධාන හේතු වෙයි. කිවයුත්තෙක් ඇත. ප්‍රතිසන්ධි චිත්තය රූප නූපදවයි. ඊට හේතු එල්බ සිටින ස්ථානයෙහි ඇති දුර්වල කමයි. වස්තු දුර්වලබවයයි. රහතන් වහන්සේගේ චුති සිත ද රූප නූපදවයි.

චිත්තජ රූපයෝ පසළොසකි. චතුජ වූ අවිනිර්භෝග හා ආකාශ යන නවය, චිත්තජම වූ විඥප්ති ද්වය හා ශබ්දය, ත්‍රිජ වූ ලහුතාදි ත්‍රය, යන පසළොසයි. (ලහුතාදි රූප තුන සෘතු, චිත්ත, ආහාර යන තුනෙන්ම හටගනිති එහෙයින් ත්‍රිජයි)

සෘතුජ රූප: ශීත උෂ්ණාදී වශයෙන් බෙදී ගිය තේජෝ ධාතුව සෘතු නම්. මහා චිත්තක්ෂණයක පවතිනා උප්පාද, ඨිති, භඞ්ග, යන අවස්ථා තුනෙන් ඨිති අවස්ථාවේදීම සෘතුවෙන් රූප උපදවයි, සෘතු රූප තෙළෙසකි. (13) ලහුතාදී ත්‍රිජ රූප තුන, අවිනිර්භෝග රූප අට හා ආකාශ ධාතු ශබ්දය, යන තෙළෙසය.

ආහාරජ රූප: ආහාර යනු ඕජායි. ගනු ලබන ආහාරයෙහි ඇති ඕජාව ආහාර රූපයයි ද කියැවේ. මේත් එ[illegible]මැයි. ආහාර ගත් පසු එය තැන්පත් වෙත්ම රූප උපදවයි. ආහාරජ රූප දෙළොසෙකි. ලහුතාදී තුන, අවිනිර්භෝග අට හා ආකාශ යනුයි.

මෙසේ කම්ජ රූප අටළොසෙකි. චිත්තජ රූප පසළොසෙකි සෘතුජ ර,ප තෙළෙසකි. ආහාරජ රූප දොළොසෙකි.

## යෝනි වශයෙන්, විඥන ප්‍රත්‍යයෙන් රූප උපදවන අයුරු:

අණ්ඩජ, ජලාබුජ, සත්වයෝ ප්‍රධාන වශයෙන් දෙවැදෑරුම් ය. අභාවක, සභාවක, යනුයි භාවරූප නැත්තෝ අභාවකයි. භාවරූප ඇත්තෝ සභාවකයි. මෙයින් අභාවක වූ අණ්ඩජ ජලා

බූජ, සත්වයන්ගේ ප්‍රතිසන්ධියේදී රූප ධර්ම විස්සක් පවතී. එනම් කායදසක, වත්‍ථුදසක, යනුයි පඨවි, ආපො, තෙජෝ, වායො, වණ්ණ, ගන්ධ, රස, ඔජා, යන අවිනිර්භොග රූප අට හා ජීවිතින්ද්‍රිය, කායප්‍රසාදය, යන දසය කාය දසක නම්. අවිනිර්භොග අට හා හදය, ජීවිතින්ද්‍රිය, යන දසය වත්‍ථු දසකයි. මේ රූප කොටස් විස්ස අභාවක සත්වයනට ප්‍රතිසන්ධියෙහිදී උපදියි. නාමධර්ම වශයෙන් වේදනා, සඤ්ඤා, සංඛාර, ධර්ම තුන උපදියි. මෙසේ අභාවක සත්වයන්ට විඤ්ඤාන ප්‍රත්‍යයෙන් නාමරූප ධර්ම විසිතුනක් (23) ප්‍රතිසන්ධියෙහිදී ලැබෙන බව දත යුතු. ඔව්හු සභාවකව උපදිත් නම් භාවදසකයත් සමග නාමරූප ධර්ම තිස්තුනක් (33) වෙත්. අවිනිර්භොග අට, ජීවිතින්ද්‍රිය භාවරූප දෙකෙන් එකක් භාව දසක නම්.) තිවයුත්තෙක් ඇත. උභතො ව්‍යඤ්ජනකයාට - ස්ත්‍රී භාව, පුංභාව දෙකම ඇත්තාට - එක් භාවරූපයක්ම ප්‍රකට වෙයි.

ඕපපාතිකයන් අතුරෙන් රූපී බ්‍රහ්මයන්ගේ ප්‍රතිසන්ධි විඤ්ඤාණයෙන් උපදිනුයේ නාමරූප ධර්ම දෙසාලිසෙකි. (42) එනම් රූප ධර්ම වශයෙන් චක්ඛු - සොත - වත්‍ථු යන දසක තුන, ජීවිත නවකය, යන එකුන්සතලිසයි. (39 ඔවුනට කාය ප්‍රසාදය නොමැති හෙයින් එය හැර ජීවිත නවකයයි කීහු. [ජීවිතින්ද්‍රිය නව වැනි කොට ඇත්තේ ජීවිතනවකයි. එනම් අවිනිර්භොග අට, ජීවිතින්ද්‍රිය) සංසේදජයන්ගේ ද, කාමභවයෙහි උපදින සභාවක පරිපූර්ණ ආයතන ඇති ඕපපාතිකයන්ගේ ද, ප්‍රතිසන්ධි විඤ්ඤාණයෙන් නාමරූප ධර්ම තෙසැත්තෑවක් (73) උපදියි එයින් නාමධර්ම පෙරකී පරිදි වේදනා, සඤ්ඤා, සංඛාර, තුනයැ. රූප ධර්ම සම සැත්තෑවකි. (70) චක්ඛු; - සොත - ඝාණ ජිව්හා - කාය - භාව - වත්‍ථු යන දසක සතයි. (10 x 7 = 70) නාමරූප හෝ ප්‍රසාද රූප හෝ පිරිහුණ හොත් ඒ දසකය හැර ඉතිරි රූප ගත යුතුයි.

දැන් ඉතිරි වූයේ අරූපීන් සහ අසඤ්ඤිභවිකයන්ය. ඔවුන් අතුරෙන් අරූපීන්ට ප්‍රතිසන්ධි විඤ්ඤාණයෙන් වනුයේ වේදනා, සඤ්ඤා, සංඛාර, යන නාමධර්ම තුනයි. අසඤ්ඤීනට ජීවිත නවකය පමණි.

විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වන අයුරු මෙසේ ආ හෙයින් විඤ්ඤාණයෙන් නාම පමණක් වනුයේ අරූපීනට බව වැටහෙයි. විඤ්ඤාණයෙන් රූප පමණක් වනුයේ අසඤ්ඤීනටය. සෙසු අණ්ඩජාදි සියලු යෝනීනට විඤ්ඤාණයෙන් නාමරූප දෙකම වෙයි. මෙ ප්‍රතිසන්ධියෙහිදී උපදින අයුරුයි.

## ප්‍රවෘත්ති සමයේදී විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වන අයුරු:

පවත්තෙ පන සබ්බෙසම්පි රූපපවත්තිදෙසෙ පටිසන්ධි චිත්තස්ස ඨිතික්ඛණෙ පටිසන්ධි චිත්තෙන සහපවත්තා උතුතො උතුසමුට්ඨානං සුද්ධට්ඨකං පාතුභවති. -සම්මොහ විනොදනී -

මෙසේ දක්වෙන බැවින් රූප පවත්නා වූ සෑම භවයකම ප්‍රතිසන්ධි සිත ඉපදීමෙන් පසු පවතින මොහොතේදී - උත්පාද, ස්ථිති, භඞ්ග, යන තුනෙන් ස්ථිති අවස්ථාවේදී - ඒ ප්‍රතිසන්ධි සිතත් සමග පැවතුන ඍතුවෙන් ඍතුජ වූ ශුද්ධාෂ්ටකය පහල වෙයි. ශුද්ධාෂ්ටකය යනු අවිනිර්භෝග අටමැයි. ඉක්බිති ඒ ප්‍රතිසන්ධි සිත භංගයට පත්වූ කල්හි ඒ භවඞ්ග චිත්තයෙන් චිත්තසමුට්ඨාන වූ සද්දනවකය උපදියි. ගබ්භසෙය්‍යක - ජලාබුජ - සත්වයනට මව් වැළඳූ ආහාරය නිසා ඔජායෙන් ආහාරජ රූප වූ ශුද්ධාෂ්ටකය උපදියි.

"යඤ්චස්ස භුඤ්ජති මාතා - අන්නං පානං ච භොජනං
තෙන සො තත්ථ යාපෙති - මාතුකුච්ඡිගතො නරො"

ආහාර, පාන වූ යමක් මෑණියෝ අනුභව කරද්ද මව් කුසෙහි වූ දරුවා ඒ අහාරයෙන් එහිදී යැපෙයි. යනු නිදර්ශනයි.

මෙසේ ගිණූ කල සියලු රූප සවිස්සක් (26) වෙයි. ශබ්ද නවක දෙකක් මූලයේ ඍතු, චිත්ත, දෙක නිසාය. පෙර දක් වූ දසක සත මෙයට එක්වූ කල සයානූවකි. (96) නාම ධර්ම තුනත් සමග එකූන් සියයකි. (99) ශබ්දය අනියත නිසා ඍතු, චිත්ත, ශබ්ද රූප දෙක හැර සියලු නාම රූප අනූ සතකි. (97) මෙනයින් සියලු සත්වයින්ගේ විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වන අයුරු සලකා ගත යුතු. සත්වයා ජීවත් වන තෙක් ප්‍රවෘත්ති වශයෙන් නාමරූප ධර්ම උපදියි. පවතියි. විනාශවෙයි. ඒ පැවතීමෙ දී විඥානයෙන් පමණක් නොව ඍතු ආදී ක්‍රම සතරින්ම රූප ධර්ම උපදින බව දත යුතු. මෙසේ සත්වයා යනු නාමරූප ධර්ම පරම්පරාවකි. ගතයුතු සත්වයෙක් නොමැති

විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වන අයුරු මෙතෙකින් නිමි.

## 4. නාමරූප පච්චයා සළායතනං

"තත්ථ කතමං නාමරූප පච්චයා සළායතනං? චක්ඛායතනං සොතායතනං ඝාණායතනං ජිව්හායතනං කායායතනං මනායතනං, ඉදං වුච්චති නාමරූප පච්චයා සළායතනං" මෙහි තේරුම සුගමැයි.

නාමරූප පෙර දක්වූ පරිදියි. සළායතන යනු චක්ඛ්වාදි ආයතනයන් සයදෙනාය. අරූප ලෝකයෙහි ඇත්තේ මනායතන පමණි. එහෙයින් ඡට්ඨායතන ද සළායතන ද, ද සළායතනයයි එකසේශ කළයුතු. ඡට්ඨායතන නම් මනායතනය මැයි. සයවැනි කොට ඇති බැවින් ඒ නම පවතී. ආයතන පිළිබඳ විස්තර ඉහත දී දක්වා ඇත. දැන් දතයුත්තේ නාමරූප නිසා සළායතන වන අයුරුයි.

මෙහි ද පැවැත්මට උපකාර වනුයේ ප්‍රත්‍යය නමැයි දතයුතු. නාමරූප ඇති නිසා ම සළායතන වෙයි. රූප දැක්වූ තැන ප්‍රසාද රූප පස ද, දෙපස් විඤ්ඤාණ - මනොධාතු - මනොවිඤ්ඤාණ ධාතු වශයෙන් බෙදී ගිය චිත්තය ද, යන මේ සය ආයතන වශයෙන් ගැණිනි. ඒ සය තන්හි චිත්ත - චෛතසිකයන් ගේ සමෝසරණය ඔබිනොබ හැසිරීම නිසා ආයතන නම් විය. නාමරූපයන් ම වූ මේ සයදෙනා චිත්ත-චෛතසිකයන් ඉපදවීමෙහි ලා මූලික වන හෙයින් ෂඩායතන වශයෙන් වෙන් කර දෙසූහ. නාම රූපයන් ගෙන් තොර ෂඩායතනයක් නො මැත. ෂඩායතනයන් තොර නාමරූපයක් ද නැත. මෙසේ ඔවුනොවුන් අන්‍යොන්‍ය සම්බන්ධයක් ඇතිධර්මයෝය.

එහෙත් ඉපදීමෙහිලා විශේෂ ඇත්තේය. සංසේදජ, ඕපපාතික සත්ත්වයන්ට නො පිරිහුණු චක්ෂුරාදිය වෙත් නම් ඔවුනට නාමරූප වන කල්හි ම ෂඩායතන වේ. බ්‍රහ්මයනට ඇත්තේ චක්ඛු, සොත, මන, මේ ආයතනතුන පමණි. ශරීරය ඇතත් කාය ප්‍රසාදය නො මැති හෙයින් කායායතනය නො ගැනේ. එහි ඇත්තේ ජීවිතනවකය යි. ගර්භසෙය්‍යක සත්ත්වයනට ප්‍රතිසන්ධියෙන් දින එකුන් පණසක් යන්නම චක්ඛායතනය ද, ඊට සතියකට පසු සොතායතනය ද, ඊට සතියකට පසු ඝාණායතනය ද, ඊට සතියකට පසු ජිව්හායතනය ද උපදින බව දැක්වේ. කාය, මන, දෙක ප්‍රතිසන්ධියත් සමග ම පවතී. අරූපීනට නාමයෙන් මනායතන වන බව සැලකියයුතු. "නාමපච්චයා ඡට්ඨායතනං" නාම ප්‍රත්‍යයෙන් ෂෂ්ඨායතන-මන-වන්නේය යනු දේශනාපාඨයි.

තවද මේ සළායතන නිසා ද නාමරූප වනබව දතයුතු. "නාම පච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතන පච්චයාපි නාමං" නාම ප්‍රත්‍යයෙන් මනායතන වන්නේය. මේ අරූපී බ්‍රහ්මයන් විශේෂයෙනි. සෙස්සනට "නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයාපි රූපං" නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතනවෙයි. ෂඩායතන

ප්‍රත්‍යයෙන් ද නාමරූප වෙයි. යනුවෙන් ගතයුතු. මේ ප්‍රත්‍යයන්ගේ "අඤ්ඤමඤ්ඤ" ක්‍රමයයි. සෙසු ප්‍රත්‍යය, ප්‍රත්‍යෝත්පන්නයන් කෙරෙහි ද මෙතැයින් සලකා ගතයුතු. විශේෂ විභාග පච්චයාකාරයේදී දැක්වෙයි.

මේ නාමරූප ප්‍රත්‍යයෙන් සළායතන වන අයුරුයි.

## 5. සළායතන පච්චයා ඵස්සො.

සළායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ වන්නේය.

"තත්ථ කතමො සළායතන පච්චයා ඵස්සො? චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝාණසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනොසම්ඵස්සො අයං වුච්චති සළායතන පච්චයා ඵස්සො"

එහි සළායතන ප්‍රත්‍යයෙන් ඵස්සය යනු කවරේද? චක්ඛුසම්ඵස්සය ආදී සවැදෑරුම් ඵස්සයෝය. මේ දේශනාපාඨයේ කෙටි අදහසයි. සළායතන පෙර කී පරිදියි. ස්පර්ශ යනු නාමධර්ම වශයෙන් ඵස්ස චෛතසිකය යි රූපධර්ම වශයෙන් ගැටීම යි. විෂය රූප අතුරෙන් ස්පර්ශය ප්‍රධානයි. සෙසු විෂය රූපයන්ගේ ගැටීම හිරුරැස් බිත්ති ආදියෙහි වැටෙන්නාක් මෙන් ඉතා සියුම් බව ඉහතදී කියන ලදී. ස්පර්ශය විෂය භාවයෙන් තයක් වුවද, ඒ සෑම ස්පර්ශයන්හිම ඇත්තේ ගැටීම් මාත්‍රයක් නිසා එකක් සේ සැලකේ. ස්පර්ශ චෛතසිකය ගැටීම් ලක්ෂණයෙන් එකක් වුවද; ඒ හා පවත්නා චිත්තපරම්පරා වශයෙන් දෙතිස් වැදෑරුම් වෙයි. දෙපස් විඤ්ඤාණ, මනොධාතුද්වය, මනොවිඤ්ඤාණධාතු වූ සන්තීරණත්‍රය හා කාමාවචර සහේතුක = රූපාවචර, අරූපාවචර යන විපාක සතළොස, යන දෙතිස් විඤ්ඤාණයන් සමග යෙදීමෙන් දෙතිස් වැදෑරුම් බව දතයුතු.

මෙය ද "සළායතන පච්චයා ඵස්සො, ඡට්ඨායතන පච්චයා ඵස්සො" යනුවෙන් එකශේෂ කළයුතු. අරූපී භවය හැර අන් සියලු තන්හි සුදුසු පරිද්දෙන් ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ වේ. අරූපී භවයෙහි වනුයේ මනායතන වූ ඡට්ඨායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශයයි.

සළායතන නිසා ඵස්ස වන අයුරු.

මෙහි ද පැවැත්මට උපකාර වන්නේ ප්‍රත්‍යයයි දතයුතු. ඒ එසේමය. සළායතන ඇති නිසා ම ඵස්සය සිදුවේ. සළායතන නො මැති කල්හි ඵස්සය සිදු නො වේ. ඵස්සය ඇති වීමට කරුණු තුනක් හේතු විය යුතුය. චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො” ප්‍රසාදය, රූපාදි විෂය රූප අතුරෙන් එකක්, විඤ්ඤාණය, යන තුනයි. ධර්මයනට මනායතන යි. යනත්‍රය, ක්‍රියාකාරිත්වය, මධ්‍යස්ථානයෙන් කල විකාශනය, යන කරුණු තුන එක් වීමෙන් හුවන් විදුලි ශබ්දය නැගෙන්නා සේ මේ ධර්මතුන් දෙනා එක්වීමෙන් ඵස්සය හටගනී.

මේ ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ වන අයුරුයි.

## 6. ඵස්ස පච්චයා වේදනා.

ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා වන්නේය.

“තත්ථ කතමා ඵස්ස පච්චයා වේදනා? චක්ඛුසම්ඵස්සජා වේදනා සොතසම්ඵස්සජා වේදනා ඝානසම්ඵස්සජා වේදනා ජිව්හාසම්ඵස්සජා වේදනා කායසම්ඵස්සජා වේදනා මනො සම්ඵස්සජා වේදනා, අයං වුච්චති ඵස්ස පච්චයා වේදනා”

එහි ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා යනු කවරේද? චක්ෂු ප්‍රසාදය, රූපය, චක්ෂුර්විඥානය, මේ ධර්ම තුන්දෙනා එක්වීමෙන් වූ ස්පර්ශය නිසා හටගත් වේදනාව; ශ්‍රොත්‍ර ප්‍රසාදය, ශබ්දය, ශ්‍රොත්‍ර විඥානය, එක්වීමෙන් ඇති වූ ස්පර්ශයෙන් හටගත් වේදනාව; ඝ්‍රාණ ප්‍රසාදය, ගන්ධය, ඝ්‍රාණ විඥානය, එක්වීමෙන් ඇති වූ ස්පර්ශයෙන් හටගත් වේදනාව; ජිහ්වා ප්‍රසාදය, රසය, ජිහ්වා විඥානය, එක්වීමෙන් වූ ස්පර්ශයෙන් හටගත් වේදනාව; කාය ප්‍රසාදය, ස්පර්ශය වූ භූතරූප ත්‍රය, කාය විඥානය, එක්වීමෙන් වූ ස්පර්ශයෙන් හටගත් වේදනාව, මනායතනය, ධර්ම, මනොවිඥානය, එක්වීමෙන් ඇති වූ ස්පර්ශය නිසා හටගත් වේදනාව; මේය ස්පර්ශයෙන් වන වේදනාය යි කියනු ලැබේ.

ස්පර්ශ ඉහත දක්වූ පරිදියි. වේදනා නම් වේදනා චෛතසිකයයි. රූපාදි ආරම්මණයක් ලැබුණු විට එහි රස විඳිනුයේ මේ චෛතසිකයෙනි. එහෙයින් චක්ෂුරාදි ආයතන විසින් සංවෘ[illegible]රුම් විය. විස්තර වශයෙන් එකුන් අනූවැදෑරුම්ය යි

කිවයුතු. මක්නිසාද? හැම සිතකම වේදනා චෛතසිකය යෙදෙන හෙයිනි. එහෙත් ප්‍රත්‍යසමුත්පාද ධර්මයෙහි ලා ගතයුත්තේ විපාක සිත්හි යෙදුනු වේදනාව පමණි. එවිට දෙතිස් (32) වැදෑරුම් වෙයි. ලෞකික විපාක සිත් දෙතිසක් හෙයිනි. ලෝකෝත්තර ධර්ම වෘත්තකථාවට නො එයි.

ස්පර්ශය වේදනාවට ප්‍රත්‍යය වනුයේ පැවැත්මට ය. ස්පර්ශය පවතිනා නිසා ම වේදනා වන හෙයිනි. මෙතෙක් දක්වූ විඥ්ඥාණ නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, යන පස වර්තමාන ඵලපඤ්චකය යි. විපාක වට්ටයට මේවා ඇතුලත් ය. වේදනාව ත්‍රිවිධ බැව් වේදනා ස්කන්ධයෙහිදී දක්විණි.

මේ ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා වන අයුරුයි.

## 7. වේදනා පච්චයා තණ්හා.

වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණා වන්නේය.

“තත්ථ කතමා වේදනා පච්චයා තණ්හා? රූප තණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බ තණ්හා ධම්මතණ්හා, අයං වුච්චති වේදනා පච්චයා තණ්හා” මෙහි අදහස සුගමැයි. වේදනා ඉහත දක්වූ පරිදියි. එහෙත් මෙහිදී විශේෂයක් ඇත. එනම් තෘෂ්ණාව නිසා උපදින වේදනාව නම් සුඛවේදනා බවයි එහෙයින් විපාක වූ සුඛවේදනාව ගතයුතු මෙය මෙසේ වතුදු විපර්‍ය්‍යාස වශයෙන් සෙසු වේදනා ද ගත හැක. මෙය බලන්න:—

‘ දුක්ඛී සුඛං පත්ථයති - සුඛී භියොපි ඉච්ඡති
උපෙක්ඛා පන සන්තත්තා - සුඛ මිච්චෙව භාසිතා”-වි. ම.

දුක් වේදනා ඇත්තා සැප පතයි. සැප ඇත්තා වැඩියක් පතයි. මැදහත් වේදනාව සන්සුන් බැවින් සැපයයි කියන ලදී. මෙසේ ගත්කල සියලු වේදනාවන් ගෙන් ම තෘෂ්ණාව උපදිනබව වැටහේ.

තෘෂ්ණා යනු ලෝභ චෛතසිකයයි අරමුණෙහි ඇලීම එහි ලක්ෂණය යි ලෝභ මූලික සිත්හි පමණක් සම්ප්‍රයුක්තව යෙදේ. සිත්හි පැවැත්ම ඉතා වේගවත්ව කෙරෙන්නකි· එහෙයින් රූපාදි අරමුණක් හමුවූ විට ලෝභ මූලික ජවන් සිත් නමා නො දුටුවත්

වම වාගේ දුවා අවසන් වෙයි. මේ නිසා ෂඩ්විධ ආරම්මණයන්ට තෘෂ්ණාව බෙදීගිය බැව් දතයුතු. තෘෂ්ණාවට ආරම්මණයෙහි නාමය යෙදූයේ හඳුනා ගැනීමට පහසු වීම සඳහා ය. "සෙට්ඨි පුත්තො බ්‍රාහ්මණ පුත්තොති පිතිතො නාම වසෙන පුත්තො විය ඉමං රූප තණ්හා - පෙ - ධම්මතණ්හාති ආරම්මණතො නාම වසෙන ඡතණ්හා දීපිතා" සිටුපුතා, බමුණුපුතායැයි පියාගේ නාමය වශයෙන් පුතු හැඳින්වූවාක් මෙන් මේ රූප තෘෂ්ණාදිහු ආරම්මණයන්ගේ නාම වශයෙන් තෘෂ්ණා සයක් දක්වන ලදී යනු අටුවායි. එවිට ගතයුතු තේරුම, "රූපෙ තණ්හා රූපතණ්හා" රූපයෙහි තෘෂ්ණාව රූප තෘෂ්ණාව ආදී වශයෙනි.

තවද තෘෂ්ණාව පවතින ආකාර වශයෙන් ත්‍රිවිධය. කාම තණ්හා, භවතණ්හා, විභවතණ්හා, යනුයි. ආධ්‍යාත්මික බාහිර වශයෙන් දෙලොස් වැදෑරුම්ය. රූපතණ්හාදිය බාහිර යි. චක්ඛාදී ආයතන කෙරෙහි පවත්නේ ආධ්‍යාත්මික යි. නැවත අතීත, වර්තමාන, අනාගත, වශයෙන් කාලත්‍රයට බෙදී යයි. සියලු තෘෂ්ණාව එක්සිය අට වැදෑරුම්ය. ආධ්‍යාත්මික, බාහිර, දෙලොස කාමාදී යෙන් ගුණ කළවිට සතිසෙකි (12 × 3=36) ඒ සතිස කාලත්‍රයෙන් ගුණ කළ විට එක්සිය අටෙකි. (36 × 3=108)

බෙදී යන අයුරු මෙසේය රූපාදී අරමුණක් ෂඩ්ද්වාර යන්ට හමුවූ විට කාමාශ්වාද වශයෙන් ආශ්වාදනය කරමින් පවතියිද, ඒ ආරම්මණයන් නිසා කාමතෘෂ්ණාව උපදින අයුරුයි. ඒ ආරම්මණයන් ම යම්කලෙක සපිරයයි. සදාකාලිකයැයි වශයෙන් ශාස්වත දෘෂ්ටියත් සමඟ පවතියි ද එවිට භවතෘෂ්ණායි. එනම් උච්ඡේදයට විනාශයට පැමිණේයයි උච්ඡේද දෘෂ්ටියත් සමඟ පවතියි ද ඒ විභව තෘෂ්ණාවයි. රූපාදී තෘෂ්ණා ප්‍රකට මැයි. රූපාදී ආරම්මණයන් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් චක්ෂුරාදී ආයතනයන් රැක ගැනීම සඳහා තෘෂ්ණාවක් උපදවයි ද, ඒ වශයෙන් ආධ්‍යාත්මික ආයතන සය නිසා තෘෂ්ණාව උපදී. මෙසේ තෘෂ්ණාව ඉපදවීම අතීතයේ දී ද, වර්තමානයේදී ද, අනාගතයේදී ද, එකසේ ම පවතියි. එහෙයින් කාල ත්‍රයටත් බෙදීයයි.

වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණා වනුයේ ද පැවැත්ම වශයෙනි. වේදනාව ඇතිනිසා ම තෘෂ්ණා වන හෙයිනි. මනුෂ්‍යයෝ තම පුත්‍රයා කෙරෙහි ඇති ආදරය නිසා කිරිමෑණිවරුන්ට ද සත්කාර කරත්.

එමෙන් වේදනාව ආශ්වාදනය කිරීමෙන් ගිජු වූ සත්ත්වයා ආරම්මණයන් සමුකර දෙන චිත්‍රකාරාදීන් කෙරෙහි ද සත්කාර කරයි. රසය විඳිනු කැමැත්තෙන් රජතුමා අරක්කැමියාට මහත් සත්කාර කෙරෙයි. මෙත් එබඳුය.

මේ වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණා වන අයුරුයි

## 8. තණ්හා පච්චයා උපදානං.

තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වන්නේය.

තත්ථ කතමං තණ්හා පච්චයා උපාදානං? කාමූපදානං දිට්ඨුපාදානං සීලබ්බතුපාදානං අත්තවාදුපාදානං ඉදං වුච්චති තණ්හා පච්චයා උපාදානං”

එහි තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන යනු කවරේ ද? කාමූපාදානය, දිට්ඨූපාදානය, සීලබ්බතූපාදානය, අත්තවාදූපාදානය, මෙය තෘෂ්ණා, ප්‍රත්‍යයෙන් උපාදානයයි කියනු ලැබේ.

මෙහි තෘෂ්ණාව පෙර කී පරිදියි. උපාදාන යනු දැඩි සේ ගැණීමයි, ගැරඩියෙක් මැඩියෙකු අල්ලා ගත්තාක් මෙනි. “උපාදියතීති උපාදානං” දැඩි සේ ගනු ලැබේනුයි උපාදාන නම්. මෙය කාමාදි වශයෙන් සිව්වැදෑරුම් ය.

1. කාමූපාදානය : කාම නම් කැමැත්තයි. ආශාවයි එය ම දැඩි සේ ගනුයේ කාමූපාදාන නම්. “වත්ථුසංඛාතං කාමං උපාදියතීති කාමූපාදානං, කාමො ච සො උපාදානඤ්චාතිපි කාමූපාදානං, උපාදානන්ති දළ්හග්ගහණං” රූපාදී වස්තූන් ගේ කැමැත්ත දැඩි සේ ගනු ලැබේනුයි කාමූපාදාන නම්. නැතහොත් කාමය-ආශාව-ම උපාදාන වූයේ කාමූපාදානයි. උපාදාන නම් දැඩි ගැන්මයි. මෙයින් කාමූපාදාන යනු කවරේද යන්න පැහැදිලි වෙයි. කාමවස්තූන් තදින් අල්ලා ගන්නා ස්වභාවය කාමූපාදානයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන කාමවස්තූන් පඤ්චකය ම එක් තැනක පිහිටියාවූ ස්ත්‍රී පුරුෂ දෙදෙනා ඔවුනොවුන්ට ප්‍රධාන කාමවස්තුහුය. කාමලෝකයෙහි සෙසු සත්ත්වයන් ගේ කාමූපාදානයේ ප්‍රධාන අවස්ථා මේ අයුරින්ම සලකාගත හැකිය. රූපී, අරූපී, බ්‍රහ්මයනට උපාදාන අනුශය වශයෙන් පවතී. නීවරණ යටපත් කළ හෙයිනි.

"තත්ථ කතමං කාමුපාදානං? යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං ඉදං වුච්චති කාමුපාදානං"

එහි කාමුපාදානය නම් කවරේද? කාමයන් කෙරෙහි පවත්නා යම් ඇලීමක්, සතුටක්, ආශාවක්, ආදරගතියක්, දැඟගතියක්, මූර්ඡාවක්, ගිල ගැනීමක්, වේයි ද මේය කාමුපාදානයැයි කියනු ලැබේ. මේ දේශනා පාඨයෙන් තවදුරටත් එය පැහැදිලි වෙයි.

2. දිට්ඨුපාදානය : දිට්ඨි යනු වරදවා දැකීමයි. එය දැඩිලෙස ගැනීම දිට්ඨුපාදානයි. 'දිට්ඨි ච සා උපාදානඤ්චාති දිට්ඨුපාදානං" වරදවා දැකීම ම දැඩි සේ ගැනීම දිට්ඨුපාදාන බව මෙයින් පැහැදිලි වෙයි. නැතහොත් "දිට්ඨිං උපාදියතීති වා දිට්ඨුපාදානං" දිට්ඨිය දැඩි ලෙස ගනු ලැබේනුයි දිට්ඨුපාදානයි. කිනම් දිට්ඨියක්ද? "සස්සතො අත්තා ච ලොකො චාති ආදිසු හි පුරිම දිට්ඨිං උත්තර දිට්ඨිං උපාදියන්ති" ආත්මයද ලෝකයද ශාස්වතය-සදාකාලිකය-යනාදි වශයෙන් මුලින් ඇතිවූ වැරදි දැකීම පසු පසු දැකීම් ගනු ලැබේ" මෙපරිද්දෙන් ආ ශාස්වත, උච්ඡේද, දෘෂ්ටිය යි. මේ දෙක දැඩි ලෙස ගැන්ම දිට්ඨුපාදානය. දිට්ඨුපාදානය වස්තු වශයෙන් දස වැදෑරුම් ය.

"තත්ථ කතමං දිට්ඨුපාදානං? නත්ථි දින්නං නත්ථි යිට්ඨං නත්ථි හුතං නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො නත්ථි අයං ලොකො නත්ථි පරො ලොකො නත්ථි මාතා නත්ථි පිතා නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො ඉදං වුච්චති දිට්ඨුපාදානං, ඨපෙත්වා සීලබ්බතුපාදානඤ්ච අත්තවාදුපාදානඤ්ච සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨුපාදානං" - ධ. ස. (නික්ඛෙපකාණ්ඩය)

එහි දිට්ඨුපාදානය නම් කවරේද? දීමෙහි, මහායාගයෙහි පූජා හා පඩුරු යැවීම් වශයෙන් කෙරෙන පූජායෙහි, විපාක නැත. යහපත් දෙයෙහි හෝ අයහපත් දෙයෙහි හෝ විපාක නැත.

මෙලොවක් නැත, පරලොවක් නැත. මවට කළ උපස්ථානයෙන් විපාක නැත. පියාට කළ උපස්ථානයෙන් විපාක නැත. උපදින මැරෙන සත්ත්වයෙක් නැත. යමෙක් මෙලොව පරලොව, තෙමේම විශේෂ ඥානයෙන් අවබෝධ කොට ප්‍රකාශ කෙරෙද්ද, එවැනි මනා පිළිවෙතකට පිළිපත් ශ්‍රමණ බ්‍රාහ්මණයෙක් නැත. මේ දසය හෝ මෙවැනි ම හෝ යම් දිට්ඨියකට ඇතුළත් වීමක්, දිට්ඨි බහුල වීමක්, දිට්ඨි විනිවිද යාමක්, හෝ විරුද්ධ වීමක්, සෙලවීමක්, ගැලපීමක්, ගැනීමක්, පිහිටීමක්, පිවිසීමක්, දිට්ඨිපරාමසනයක් වේද; එසේ ම ඒ දිට්ඨිය වැරදි මඟකි. වැරදි බවකි. තීර්ථායතනයකි. විපර්‍යාසයෙන් ගැනීමකි. මේය දිට්ඨි උපාදානයැයි කියනු ලැබේ. සීලබ්බතුපාදානය, අත්තවාදුපාදානය, හැර ඉතිරි සියලු මිථ්‍යාදෘෂ්ටි දිට්ඨුපාදානයි.

3. සීලබ්බතුපාදානය : සීල + වත, මේ පද දෙක සන්ධි වීමෙන් සීලබ්බතයැයි සෑදිණ. සීලයනු වැරදි සිල්ය. අජසීල, ගෝසීල, කුක්කුරසීලාදි වශයෙන් නානා විධය. එළුවකුගේ හැසිරීම අජසීලයි. සෙසු පද ද මෙසේය. වත යනු වැරදි පැවැත්ම -ව්‍රත- යි. මෙය ද අජව්‍රතාදි වශයෙන් එයි මේ දෙකෙන් ශුද්ධියක් ලැබේයයි දැඩි සේ ගැනීම සීලබ්බතුපාදානයි. "ඉතො බහිද්ධා සමණ බ්‍රාහ්මණානං සීලෙන සුද්ධි වතෙන සුද්ධි සීලබ්බතෙන සුද්ධි යා එවරූපා දිට්ඨි -පෙ- විපරියෙසග්ගාහො ඉදං වුච්චති සීලබ්බතුපාදානං" මේ ශාසනයෙන් බාහිර වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ සීලයෙන් ශුද්ධිය වෙයි. - පිරිසුදුවෙයි. - ව්‍රතයෙන් ශුද්ධිය වෙයි. ඒ දෙකෙන් ම වෙයි යනුවෙන් ගනුලබන යම් දෘෂ්ටියක් වේද, මෙය සීලබ්බතුපාදානයැයි කියනු ලැබේ. මෙසේ සීලබ්බතුපාදානය ද දිට්ඨි චෛතසිකය මැයි. එය දැඩි සේ ගැනීමෙන් උපාදාන විය.

4. අත්තවාදුපාදානය : යම් කරුණක් මුල්කොට එසේ කියයි ද ඒ වාද නම්. මෙහිලා ඒ කරුණ නම් ආත්ම යන්නයි. ආත්මය පිළිබඳ වැරදිලෙස කිය මින් එයම පිළිගනී යි. නම් එය අත්තවාදුපාදානයයි. විසිවැදෑරුම් සක්කාය දිට්ඨිය මෙයින් කියැවේ.

"ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මෙ අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මෙ අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි

වා රූපං, රූපස්මිං වා අත්තානං වේදනං - සඤ්ඤං - සංඛාරෙ - විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං වා එවරූපා දිට්ඨි -පෙ- විපරියෙසග්ගාහො, ඉදං වුච්චති අත්තවාදුපාදානං.”

මේ ලෝකයෙහි ආර්යයන් ගේ හෝ සත්පුරුෂයන්ගේ හෝ දැක්මක් නො මැති, ආර්ය සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ වූ, එහි ම හික්මීමක් නැති, නූගත් පෘථග්ජනයෝ රූපය ආත්මය වශයෙන් දකිත්. රූපවත් වූ හෝ ආත්මයැයි ද, ආත්මය කෙරෙහි රූපයැයි ද, රූපය කෙරෙහි ආත්මයැයි ද, එසේ ම වේදනා, සඤ්ඥා, සංස්කාර, විඥාන, යන මොවුන් ද ඒ සිවු අයුරින් දකිත්. එබඳු යම් දෘෂ්ටියක්, දෘෂ්ටියට බැස ගැනීමක් (දිට්ඨුපාදානයට සේ පද යෙදේ.) වේ ද, එය අත්තවාදුපාදාන නම්. රූපයෙහි සිව් අයුරැයි. වේදනාදියත් එසේමය. මෙසේ ස්කන්ධ පඤ්චකයෙහි ලා සතරාකාර වශයෙන් ගත්කල විසිවැදෑරුම් වෙයි. මේ විසිවැදෑරුම් සක්කාය දිට්ඨිය තමා පිළිබඳ වැරදි දැකීම අත්තවාදුපාදාන යි. මෙය ද දිට්ඨි චෛතසිකය මැයි.

තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වනුයේ ද පැවැත්මට ය. රූපාදීන් කෙරෙහි හෝ චක්ෂුරාදීන් කෙරෙහි හෝ නැතහොත් ඒ දෙකම කෙරෙහි හෝ පවත්නා තෘෂ්ණාව නිසා ඒවා දැඩි සේ ගැනීමට පෙළඹෙත්. දැඩි සේ ගතහොත් අතහැරීමට ද දුෂ්කරය. ඒ නිසා එබඳු තදලෙස ගැන්ම උපාදාන යි උපාදාන කිලෙසවට්ට යයි.

මේ තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වන අයුරැයි.

## 9. උපාදාන පච්චයා භවො

උපාදාන ප්‍රත්‍යයෙන් භව වන්නේය.

“තත්ථ කතමො උපාදාන පච්චයා භවො? භවො දුවිධෙන අත්ථි කම්මභවො, අත්ථි උපපත්තිභවො, තත්ථ කතමො කම්මභවො? පුඤ්ඤාභිසංඛාරො අපුඤ්ඤාභිසංඛාරො ආනෙඤ්ජාභිසංඛාරො, අයං වුච්චති කම්මභවො සබ්බම්පි භවගාමිකම්මං කම්මභවො, තත්ථ කතමො උපපත්තිභවො? කාමභවො රූපභවො අරූපභවො සඤ්ඤාභවො අසඤ්ඤාභවො

නෙවසඤ්ඤානාසඤ්ඤාභවො, එකවොකාරභවො, චතුවොකාරභවො, පඤ්චවොකාරභවො, අයං වුච්චති උපපත්තිභවො. අයං වුච්චති උපාදාන පච්චයා භවො”

එහි උපාදාන ප්‍රත්‍යයෙන් භව යනු කවරේද? භවය දෙවැදෑරුම්ය. කර්මභවයක් ඇත. උපපත්තිභවයක් ඇත. එහි කර්ම භවය යනු කවරේද? පුණ්‍යාභිසංස්කාර, අපුණ්‍යාභිසංස්කාර, ආනෙඤ්ජාභිසංස්කාර, මේ කර්මභවයැයි කියනු ලැබේ. සියලු භවගාමී කර්ම, කර්මභවයයි. එහි උපපත්ති භව යනු කවරේද. කාම-රූප-අරූප භව, සඤ්ඤ අසඤ්ඤ-නෙවසඤ්ඤානාසඤ්ඤභව, එකවොකාර-චතුවොකාර පඤ්චවොකාර භව, මෙය උපපත්ති භව යැයි කියනු ලැබේ. මේ උපාදාන ප්‍රත්‍යයෙන් භවයැයි කියනු ලැබේ

මෙහි භව යනු වැඩීමයි. එය වීමක් නිසා ‘භවතීති භවො’ යයි විග්‍රහ දක්වේ. ඒ වීම නැතහොත් වැඩීම දෙයාකාර යි. කර්ම වශයෙන්, උපපත්ති වශයෙන්, යනුයි. කර්ම නම් සංස්කාර ප්‍රත්‍යයට කීයු පරිදි කුශලාකුශල කර්මයි. ඒ එකුන් තිස් වැදෑරුම්ය. විස්තර ඉහත දී කියන ලදී. කර්ම භවය වර්තමාන හේතු පඤ්චකයට අයත් ය.

උපපත්ති නම් ඉපදෙන තැනයි. නැතහොත් ඒ තැනට අයත්වීමයි. යම් කර්මයක් කළ පසු එහි විපාක යම් භවයෙක්හි වේද, ඒ වශයෙන් භව නාමය ගැනේ. උපපත්ති භව ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම්ය. කාමභව, රූපභව, අරූපභව, යනුයි. මේවා ද ඉහතදී විස්තර කර ඇත. එහි සඤ්ඤා භව නම් අසඤ්ඤ, නෙවසඤ්ඤානාසඤ්ඤ, යන භූමි දෙක හැර ඉතිරි සියලු භවයයි. හැඟීම ඇති හෙයින් සඤ්ඤාභව නමි. අසඤ්ඤ භවය නම් රූපය පමණක් ඇති අසඤ්ඤසත්තයයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, එනම් භවයයි. මෙසේ බෙදූයේ අසඤ්ඤිභවය ගැනීම සඳහාය. තවද භව තුනෙකි. එකවොකාර, චතුවොකාර, පඤ්චවොකාර, යනුයි. වොකාර යනු ස්කන්ධයට නමකි. ස්කන්ධ එකක් ඇත්තේ එකවොකාර නම් මෙය අසඤ්ඤසත්තය සඳහා යෙදේ. වේදනාදී නාම ස්කන්ධ සතරක් ඇති අරූපභූමි චතුවොකාර භවයි. කාම, රූප, භූමි ස්කන්ධ පඤ්චකයක් ඇති හෙයින් පඤ්චවොකාර භව නමි. මෙසේ උපපත්ති භවය නව වැදෑරුම් වෙයි.

## උපාදාන ප්‍රත්‍යයෙන් භව වන අයුරු.

මෙයද පැවැත්මට උපකාර වනුයේ ප්‍රත්‍යයයැයි ගතයුතු. උපාදානයන් පවතින නිසාම කර්ම-උප්පත්ති භව සිදුවන හෙයිනි. තෘෂ්ණාව නිසා තද ගැන්මක් ඇති වේ. ඒ දෘඪග්‍රාහය නිසා කුශල්, අකුශල්, විමසීමක් නො මැතිව සත්වයා සතුන් මැරීම ආදී පාපකර්ම කරයි. එහෙයින් ඒ පාපකර්ම කරන වාරයක් පාසා ඔහුට කර්ම රැස්වෙයි. ඒ කර්මභව නම්. ඊට අනුරූප විපාක අනුව මරණින් පසු යම්කිසි භවයක උප්පත්තිය සිදුවෙයි. ඒ උප්පත්තිභව නම්.

ඇතැමෙක් ඇසීමෙන් හෝ කරනු දැකීමෙන් හෝ "මේ කාමයෝ මනුෂ්‍යලෝකයෙහි ක්ෂත්‍රිය මහා සාරාදී කුලයන්හි ද, සවැදෑරුම් දිව්‍යලෝකයෙහිද, සමෘද්ධයහ"යි සිතා ඒවා ලබා ගැනීම පිණිස අසද්ධර්ම ශ්‍රවණයෙන් වංචාවූයේ "මේ කර්මයෙන් කාමයෝ ලැබෙත්ය"යි හැඟීම් ඇතිව කාමූපාදාන වශයෙන් දුශ්චරිත කරත්. ඒ නිසා ඔව්හු ඊට අනුරූප විපාක වශයෙන් සතර අපායෙහි තැනක උප්පත්ති භවය ලබාගනිත්, ඇතැමෙක් "උපන් මිනිසා විසින් කාමයෝ අනුභව කළ යුත්තාහ ම ය"යි වැරදි; මතයන්හි පිහිටා, දුශ්චරිත සිදුකරත් ඔව්හුද පෙර සේම භව රැස්කර ගනිත්. මෙය ද කාමූපාදානයයි වැරදි මතයන්හි පිහිටීම නිසා දිට්ඨුපාදාන ද වෙයි. මෙසේ සෙසු උපාදානයන් සඳහා ද සුදුසු පරිද්දෙන් භව සිදුවන අයුරු අවබෝධ කටයුතු

මේ උපාදාන ප්‍රත්‍යයෙන් භව වන අයුරුයි

## 10. භව පච්චයා ජාති.

### භව ප්‍රත්‍යයෙන් ජාති වන්නේය.

මෙහි භව යනු කර්ම භවයයි උප්පත්ති භවය නොවේ. උප්පත්ති භවය සත්වයා ඒ ඒ ස්ථානයන්ට පමුණුවීම, නැඹුරු කිරීම පමණක් සිදු කෙරේ. ජාතියක් ගෙනදීමට ඒ අසමර්ථය. ජාතිය ගෙනදෙනුයේ කර්මභවයෙනි. ජාති නම් විඥාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, යන ඵල පඤ්චකයයි. "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන්නට දක්වූ විස්තරය මීට ඇතුලත්වේ. වෙනස: සංස්කාර අතීත හේතුයි. කර්ම වර්තමාන හේතුයි සත්වයන් ගේ ඒ ඒ භේද ඇති වනුයේ කර්ම

නානාත්වයෙහි. "කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතාය" කර්මය සත්ත්වයා උස් පහත් වශයෙන් බෙදයි. යන දේශනා පාඨයෙන් එය මනාසේ පැහැදිලි වෙයි. එකම මා පිය දෙදෙනාගේ ශුක්‍ර ශ්‍රෝණිත හා සමාන ආහාර, ඍතු, ආදිය ඇතිව උපදින නිඹුල් දරුවන් ගේ වුව ද වෙනස ඇති වන්නේ කර්මය නිසා බව දතයුතු. කර්මය ප්‍රත්‍යය වනුයේ ඉපදීමට ය. පැවැත්මට නොවේ. "සංඛාර පච්චයා විඤ්ඤාණං" යනුයේ යි.

## 11. ජාති පච්චයා ජරාමරණං.

### ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වන්නේය.

මෙය පැහැදිලි කරුණකි. උපත් සත්වයා ක්‍රමයෙන් ජරාවට පත්වේ මය. කෙළවර මරණය යි. කෙනෙකුගේ මරණය නිසා ශෝක කිරීම්, හැඬීම්, වැලපීම්, ආදිය උපදී මය. තමාගේ ජරා-මරණ ඇසීමෙන් හා දැකීමෙන් ද ශෝකාදිය හටගනී. එසේ ම උපත් නිසාම මෙලොව යම් යම් කම්කටොළුවලට භාජනවීම්, දඟ ගෙයි දුක් විඳීම්, ආදී නොයෙක් අයුරු දුක්, වේදනා, සිත් තැවුල්, ඇති වනුයේ. මෙසේ ජාති ප්‍රත්‍යය නිසා ජරාමරණ පමණක් නොව සෝක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස, උපායාස ද වන්නේය. ජරා-මරණාදිය පිළිබඳ විස්තර 'දුක්ඛසත්‍යයෙහි'' එයි.

"එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති" මෙසේ ඒ සියලු දුක්රැසෙහි පහළ වීම වෙයි. පටිච්ච සමුප්පාදය භව චක්‍රයක් බව ඉහතදී දක්විණි. ඒ භව චක්‍රයේ මූලික ධර්ම වූ අවිද්‍යා තෘෂ්ණා, දෙක නිසා අතීතයෙන් වර්තමානයටත්, වර්තමානයෙන් අනාගතයටත්, මේ භව චක්‍රය පෙරළෙමින් පවතින බව දතයුතු. තවද භව චක්‍රයෙහි ඇති දොළොස් අඞ්ග පිළිබඳ විමර්ශනයක් මෙතැන් සිට දැක්වේ.

භව චක්‍රයෙහි මූල දෙකකි එනම් අවිජ්ජා, තණ්හා යනුයි. "පුබ්බන්තාහරණතො අවිජ්ජා මූලං" පූර්වාන්තයෙන් අතීත කාල වශයෙන්-එළවන, පමුණුවන, බැවින් අවිද්‍යාව මූල නම්. "අපරන්ත සන්තානනතො තණ්හා මූලං" අනාගත කාල වශයෙන් ගලපන බැවින් තෘෂ්ණා මූලයයි. මෙසේ අවිද්‍යාවෙන් වර්තමාන භවයත්, තෘෂ්ණාවෙන් අනාගත භවයත් සම්බන්ධ කරන හෙයින් ඒ දෙක භව චක්‍රයාගේ මූලධර්මයෝයි. මෙහිදී අවිද්‍යාම අතීත ධර්මයක් වශයෙන් ගත් නිසා, එය අතීතයට ම පමණක්

යැයි නො සැලකිය යුතු. එය කාල තුනෙහි ම භව චක්‍රය පවතින තෙක් ඇත. අවිද්‍යාවෙන් සංස්කාර වන්නා සේම විඥාන ද නාම රූපාදිය ද වෙයි. ඒ සෑම තැනකට ම අවිද්‍යාව සම්බන්ධය. අවසාන යේ සොකපරිදෙවාදියත් ඇතිවනුයේ අවිද්‍යාව නිසා ම ය. සසර නියම අයුරු දනිත් නම් හැඬීම් වැලපීම්, කෙසේ වෙයි ද?

තෘෂ්ණාවත් එසේ ම ය. එය අනාගතයට පමණක් දීවෙන ධර්මයක් නොව කාල තුනට ම යෙදෙන්නකි. අවිද්‍යාවෙන් නියම ස්වභාවය ඡාදන කරන-වහන-හෙයින් යහපතැයි සිතා තෘෂ්ණාවෙන් අල්ලා ගනියි. මේ කරුණු දෙක භව චක්‍රයේ සෑම තැනකට ම බලපාන හෙයින් මූලධර්මයැයි දක්විණ. තවද සත්වයාගේ ප්‍රධාන චරිත දෙකකි. දෘෂ්ටි චරිත, තෘෂ්ණා චරිත, යනුයි. දෘෂ්ටි චරිත යන්ට අවිද්‍යාව ද, තෘෂ්ණා චරිතයන්ට තෘෂ්ණාවද, සසර පැවතීම කරයි. එසේ ම ලොව පවත්නා උච්ඡේදදිට්ඨිය විනාශ කිරීම සඳහා අවිද්‍යාව ද, සස්සතදිට්ඨිය විනාශ කිරීම සඳහා තෘෂ්ණාව ද, මූල ධර්මයැයි දක්විණි. අණ්ඩජ, ජලාබුජ, සත්වයන් ගේ ඉපදීම පිළිවෙලින් වන හෙයින් අවිද්‍යාව මූලධර්ම වෙයි. සංසෙදජ, ඕපපාතික, සත්වයන්ගේ සම්පූර්ණ කාය, එක් අවස්ථාවකදීම පහලවන හෙයින් තෘෂ්ණාව මූලධර්මයි. කාලත්‍රය, අඞ්ග දොළොස ,ඉහත දක්වා ඇත.

**ආකාර විස්සෙකි:-**

අතීත හේතු, වර්තමාන හේතු, යනුවෙන් හේතුවර්ග දෙකකි. වර්තමාන ඵල, අනාගත ඵල; යනුවෙන් ඵල දෙකකි. මෙසේ එවර්ග දෙකකට අයත් සතරෙහි පස බැගින් විස්සෙකි. (4 × 5=20)

“අතීතෙ හෙතවො පඤ්ච - ඉදානි ඵල පඤ්චකං
ඉදානි හෙතවො පඤ්ච - ආයතිං ඵල පඤ්චකං”

අතීතයෙහි හෙතු පසෙකි. වර්තමාන ඵල පසෙකි. වර්තමාන හෙතු පසෙකි අනාගත ඵල පසෙකි යනු එහි අදහසයි.

අතීත හෙතු පස: භව චක්‍රයෙහි ආයේ අතීත වශයෙන් අඞ්ග දෙකකි. එහෙත් යම් තැනක අවිද්‍යා, සංස්කාර ඇද්ද, එතැන තෘෂ්ණා, උපාදාන, භවද ඇත්තේමය. එහෙයින් අවිජ්ජා සංඛාර, තෘෂ්ණා උපාදාන, භව, යන පස අතීත හෙතු පසයි. එහෙයින් වදාළහ. “පුරිමකම්මභවස්මිං මොහො අවිජ්ජා ආයූහනා සං ඛාරා නිකන්ති තණ්හා උපගමනං උපාදානං චෙතනා භවො

ති ඉමෙ පඤ්ච ධම්මා පුරිමකම්ම භවස්මිං ඉධ පටිසන්ධියා පච්චයා” - ප. ම. පෙර කර්ම භවයෙහි - කර්ම කරන කල්හි- මූලාවීම අවිද්‍යාවයි. මූලා වීමෙන් කුශලාකුශල රැස්කිරීම සංස්කාරයි. ඒ කෙරෙහි ඇල්ම තෘෂ්ණාවයි. අරමුණු දැඩි සේ ගැනීම උපාදානය යි. කුශලාකුශල චේතනා භවයි. මේ ධර්මයෝ පස්දෙන පෙර කර්ම භවයෙහි මෙලොව ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙත්. මෙසේ අතීතයේ හේතු පසෙකි.

වර්තමාන ඵලපස : “ඉධ පටිසන්ධිවිඤ්ඤාණං, ඔක්කන්ති නාමරූපං, පසාදො ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනා, ඉති ඉමෙ පඤ්චධම්මා ඉධුපපත්ති භවස්මිං පුරෙකතස්ස කම්මස්ස පච්චයා” මෙලොව පිළිසඳ ගන්නා සිත විඤ්ඤාණයයි. ඒ නිසා රූපාරූප ධර්මයන් පිවිසෙන්නාක් මෙන් ඒ සිත හා සමඟ එකට ම පහළ වූයේ නාමරූප නම්. නාමරූප ශරීරයේ පස් තැනක ඇති වන, රූපාදී අරමුණු වැදීමට සමත් පැහැය ආයතනයි (සිත කියූ බැවින් පසක් ගැණින) ප්‍රසාදයන්හි ආරම්මණයන් හැපීම ඵස්සායි. විඳිනුලැබුම වේදනායි. මෙසේ මේ ධර්ම පස මෙලොව ඉපැත්ම පිණිස පෙර කරන ලද කර්මයාගේ වශයෙන් ප්‍රත්‍යය වෙත්. මේ වර්තමාන ඵල පඤ්චකයයි.

වර්තමාන හේතු පස : “ඉධ පරිපක්කත්තා ආයතනානී මොහො අවිජ්ජා, ආයූහනා සංඛාරා, නිකන්ති තණ්හා, උපගමනං උපාදානං චෙතනා භවොති ඉති ඉමෙ පඤ්ච ධම්මා ඉධකම්මභවස්මිං ආයතිං පටිසන්ධියා පච්චයා” මෙලොව සම්පූර්ණ වූ ආයතන ඇති බැවින් අරමුණු ගැන්මෙහි මූලාවීම අවිද්‍යායි. සෙසු ධර්ම පෙර පරිදියි. මෙසේ අවිද්‍යා, සංස්කාර, තෘෂ්ණා, උපාදාන, භව, මේ භවයෙහි අනාගත ප්‍රතිසන්ධියට ප්‍රත්‍යයයෝ වෙත්, මෙයින් පෙළෙහි ආයේ තෘෂ්ණා, උපාදාන, භව, පමණි. අවිද්‍යා. සංස්කාර, මීටම ඇතුලත් වෙයි.

අනාගත ඵල පස: “ආයතිං පටිසන්ධි විඤ්ඤාණං ඔක්කන්ති නාමරූපං, පසාදො ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනාති ඉමෙ පඤ්චධම්මා ආයතිං උපපත්ති භවස්මිං ඉධ කම්මස්ස කතස්ස පච්චයා” වර්තමාන ඵල පසට කී පරිද්දෙන් විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන පඤ්චකය, අනාගත උප්පත්ති වශයෙන් පැමිණෙන භවයට මෙලොව කරන ලද කර්මයාගේ ප්‍රත්‍යයෙන් වෙයි. මෙසේ අනාගත ඵල පසෙකි. මෙයින් පෙළෙහි ආයේ ජරාමරණ පමණි. ඒ නිසාද ඵල වශයෙනි· මේ විසි ආකාර ක්‍රමය යි.

ප්‍රත්‍යසමුත්පාදයෙහි, අතීතයෙහි පසක් කර්මසම්භාර යි. වර්තමානයෙහි පසක් විපාක ධර්ම යි. වර්තමානයෙහි පසක් කර්ම සම්භාරයි. අනාගතයෙහි පසක් විපාක ධර්මයි. මෙසේ දසයක් කර්මසම්භාර නමි. දසයක් විපාක ධර්ම නමි. එහෙයින් සංක්ෂේප දෙකකි. කර්ම, විපාක යනු යි. එසේ ම භවචක්‍රය එකක් කර්ම වෘත්ත යි – කම්මවට්ට – අනෙක විපාක වෘත්තය යි වෘත්ත දෙකකින් සමන්විත ය. කම්මභව, විපාක භව ද එසේම ය. තවද, අනෙක් ක්‍රමයකින් වෘත්ත – රවුම් – තුනෙකි. කර්ම ක්ලෙශ, විපාක, යනු යි. එයින් සංඛාර හා භවෙකදේශය – භව, ප්‍රත්‍යයෙන් අඩක් ද (කර්මභව) කර්මවෘත්ත යි. අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන, ක්ලෙශ වෘත්ත යි. සෙසු පඤ්චකය, (උප්පත්ති භවයත් සමග) විපාක වෘත්ත යි. ජරාමරණාදිය මීට ම ඇතුලත්ය.

තවද, මේ පටිච්ච සමුප්පාදය සත්‍යප්‍රභව, කෘත්‍ය, වාරණ, උපමා, ගම්භීර, නයභෙද, යන ෂඩ්විධ ක්‍රමයෙන් ද දතයුතුය. එයින් කීහ.

"සච්චප්පභවතො කිච්චා – වාරණා උපමාහි ච

ගම්භීර නය භෙදා ච – විඤ්ඤාතබ්බො යථාරහං"

සත්‍යප්‍රභව: අවිජ්ජා, සංඛාර, සමුදය සත්‍යය යි. එහෙයින් සංඛාර, ද්විතීය සත්‍යයෙන් ප්‍රභව වූ හටගත් – ද්විතීය සත්‍යය යි. විඤ්ඤාණ දෙවැනි සත්‍යයෙන් නිපන් පළමුවැනි සත්‍යය යි නාමරූප, සළායතන, ඵස්ස, වේදනා මොව්හු පළමු වැනි සත්‍යයෙන් නිපන් පළමුවැනි සත්‍යය යි. තණ්හා පළමු වැනි සත්‍යයෙන් නිපන් දෙවැනි සත්‍යය යි. උපාදාන ද්විතීය සත්‍යය ප්‍රභවකොට ඇති ද්විතීය සත්‍යය යි. භව ද්විතීය සත්‍යය ප්‍රභව කොට ඇති ප්‍රථම, ද්විතීය, සත්‍යද්වය යි. ජාති ද්විතීය සත්‍යය ප්‍රභව වූ ප්‍රථම සත්‍යය යි. ජරාමරණ ප්‍රථම සත්‍යයෙන් ප්‍රභව වූ ප්‍රථම සත්‍යය යි, මේය සත්‍යය ප්‍රභව.

කෘත්‍ය: අවිද්‍යාදී සැම අඞ්ගයකින් ම කෘත්‍යය දෙක බැගින් සිදුවේ. අවිද්‍යාව රූපාදී අරමුණු කෙරෙහි සත්වයා මුළාකරවයි සංස්කාරයන්ට ද ප්‍රත්‍යය වේ. සංස්කාර එක්ව උපදනා සංස්කාරයන් ද රැස්කෙරේ. විඥානයට ද ප්‍රත්‍යය වේ. විඥානය අරමුණු ද දැනගනියි. නාමරූපයන්ට ද ප්‍රත්‍යය වේ. නාමරූප ඔවුනොවුන්ට රැකුල් දෙයි. ආයතනයන්ට ද ප්‍රත්‍යය වේ. ආයතන තම තමන්ට විෂය වූ අරමුණු කෙරෙහි ද පවතී. ස්පර්ශී

සට ද ප්‍රත්‍යය වේ. ස්පර්ශය අරමුණ ස්පර්ශ ද කරයි. වේදනාවට ද ප්‍රත්‍යය වේ. වේදනාව අරමුණු රසය විඳින අතර තෘෂ්ණාවට ද ප්‍රත්‍යය වේ. තෘෂ්ණාව ලැගිය යුතු දෑ මෙයයි ලැගෙන අතර උපාදානයට ද ප්‍රත්‍යය වේ. උපාදාන දැඩි සේ ගැනීම ද කෙරේ. භවයට ද ප්‍රත්‍යය වේ. භව නොයෙක් ගති කෙරෙහි විසිරීම–වික්ෂේපය – කෙරේ. ජාතියට ප්‍රත්‍යය වේ. ජාති ස්කන්ධයන් උපදවන අතර ජරාමරණයටම ද ප්‍රත්‍යය වේ. මෙසේ අංගයන්ගෙන් කෘත්‍යය දෙක බැගින් සිදුවේ.

වාරණ: මෙහි "වාරණ" යනු වැලැක්ම යි. කුමක් වැලැක්ම ද? සත්වයා කෙරෙහි පවත්නා නානා මත, දෘෂ්ටි, වැලැක්ම යි. ඇතැමෙකු ගේ අදහස, සත්වයා ආදිකල්පික බ්‍රහ්මයා විසින් මැවූවෙක්ය යි කියා යි. ඇතැමෙක් ඊශ්වරාදී අනෙකෙකු ඉදිරිපත් කරත්. මෙසේ කාරක – කරවන්නා – දර්ශනාදිය, මේ පටිච්ච සමුප්පාදය හරිහැටි තේරුම් ගැනීම නිසා වලකී. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වේ යන මෙය කාරක දර්ශනය වලක්වන්නකි. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය ආත්ම සංක්‍රමණය – භවයෙන් භවයට මාරුවීම – වලක්වයි, විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප "ආත්මයැ" යි පරිකල්පිත වස්තු බෙදීමට යැමෙන් ඝනසඤ්ඤාව වලක්වයි. ආත්මයක් නොමැත, සත්වයා යනු නාමරූප පරම්පරාවකි· යනු පෙනේ. ආත්මය දකියි, අසයි, යනාදිය ද, ස්පර්ශ කරයි, විඳියි, මේ ආදී ආත්මීය හැඟීම් වලක්වන්නකි. නාමරූප ප්‍රත්‍යයෙන් සළායතනාදිය, මෙසේ කාරක දර්ශනය, ආත්ම දර්ශනය, ආදී මිථ්‍යාදෘෂ්ටි, පටිච්ච සමුප්පාදය තේරුම් ගැනීම නිසා වලකී. මෙය වාරණ ක්‍රමය.

උපමා: "යථා පනෙත්ථ සලක්ඛණ සාමඤ්ඤලක්ඛණ වසෙන ධම්මානං අදස්සනතො අන්ධො විය අවිජ්ජා අන්ධස්ස උපක්ඛලනං විය අවිජ්ජා පච්චයා සංඛාරා, උපක්ඛලිතස්ස පතනං විය සංඛාර පච්චයා විඤ්ඤාණං පතිතස්ස ගණ්ඩපාතුභාවො විය විඤ්ඤාණ පච්චයා නාමරූපං; ගණ්ඩභෙද පිළකා විය නාමරූප පච්චයා සළායතනං, ගණ්ඩපිළකා ඝට්ටනං විය සළායතන පච්චයා ඵස්සො, ඝට්ටන දුක්ඛං විය ඵස්ස පච්චයා වෙදනා දුක්ඛස්ස පටිකාරාභිලාසො විය වෙදනා පච්චයා තණ්හා, පටිකාරාභිලාසෙන අසප්පාය ගහණං විය තණ්හා පච්චයා උපාදාන උපාදින්න අසප්පාය ලෙපනං විය උපාදාන පච්චයා භවො, අසප්පාය ලෙපනෙන ගණ්ඩ විකාර පාතුභාවො විය භව පච්චයා ජාති, ගණ්ඩවි කාරතො ගණ්ඩභෙදො විය ජාති පච්චයා මරණං."

මේ ප්‍රත්‍යයසමුත්පාදයෙහි, ඒ ඒ ධර්මයන් කෙරෙහි පවත්නා තමතමාට අයත් සවභාවය හා පොදුවේ පවත්නා සවභාවය ද නො දක්නා හෙයින් අවිද්‍යාව අන්ධයෙකු හා සමානය. අන්ධයෙකු වැනිය. අන්ධයාගේ පැකිලීම මෙනි අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර. පැකිළුණහුගේ වැටීම මෙනි සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානං. වැටුණහුගේ ගෙඩි යක්-ගඩු වක්-හටගත්තාක් මෙනි විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප. ඒ ගෙඩියේ බිබිලි සයක් ඇතිවූවාක් මෙනි, නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන. බිබිලි යම් කිසිවක ගැටීමක් මෙනි, ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ. ගැටීමෙන් හටගත් වේදනාවක් මෙනි ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා. හටගත් වේදනා නිසා ප්‍රතිකාරයක් ගැනීමේ කැමැත්ත මෙනි, වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණා. ප්‍රතිකාර කැමැත්තෙන් අසප්‍රාය - නුසුදුසු - බෙහෙතක් ගැනීම මෙනි, තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන ඒ නුසුදුසු බෙහෙත ගැල්වීම මෙනි උපාදාන ප්‍රත්‍යයෙන් භව. එය ගැල්වීම නිසා ගඩුවේ පැසවීම් බවට පත්වීම මෙනි භව ප්‍රත්‍යයෙන් ජාති. පැසවූ ගෙඩිය පුපුරා යාම මෙනි, ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණාදිය.

මෙසේ අන්ධයා හා ඔහුගේ ක්‍රියාපටිපාටිය අවිද්‍යාදී ඒ අංග යන්ට උපමා වශයෙන් දක්වෙයි. තව ද අටුවාවෙහි අනෙකුදු උපමා දක්වා ඇතත් එකකට එකක් ගැලපෙන උපමා නැත. එහෙයින් අන්ධයාගේ උපමාව හැමලසින් පැහැදිලිය.

ගම්භීර: පටිච්ච සමුප්පාදය ක්‍රම සතරකින් ගැඹුරු බව දක්වෙයි. අර්ථ, ධර්ම, දේශනා, ප්‍රතිවේධ, යනුයි. එහි අර්ථ ත්‍රයකී තේරුම් තුනකි. අවිතථාර්ථය, අනන්‍යථාර්ථය, තථාර්ථය යනු යි. නො වෙනස් තේරුම, අන් දෙයක් නො වේය යන තේරුම, ඒ වූ දෑම යන තේරුම, මේ ඒ නොවේය යන තේරුම, මේ ඒ ත්‍රිවිධාර්ථ ක්‍රමයයි. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ නො වත්තේ නොවේ (වත්තේය) යන මෙය අවිතථාර්ථ යි. ජරාමරණ අනිකෙකින් නො වත්තේය යනු අනන්‍යථාර්ථ යි. ජාති ප්‍රත්‍යයෙන් වත්තේම යනු තථාර්ථ යි. මේ අර්ථ ගම්භීරත්වය යි. ධර්ම වශයෙන් ගම්භීරතාවය මෙසේය. අවිද්‍යාවෙන් සංස්කාර වේය යනුවෙන් ඇසේ නමුදු ඒ අවිද්‍යාවෙන් සංස්කාර කෙබඳු අවස්ථාවක දී කෙබඳු ආකාරයකින් වේද යනු දැනගැනීම දුෂ්කරය. දුරවබෝධය සෙසු ධර්මත් මෙසේමැ යි. මෙසේ ධර්ම වශයෙන් ගැඹුරු ය. දේශනා වශයෙන් ගම්භීරත්වය, මේ ප්‍රත්‍යයසමුත්පාදය අසන්නා වූ ජනයාගේ සිව්සස් අවබෝධය සඳහා දේශනාකිරීම, සර්ව-ඥතාඥානය ලබාගත් උතුමෙකුට හැර සෙස්සනට ඉතා දුෂ්කර

කරුණෙකි. බුදුරජාණන් වහන්සේලා කිසියම් තැනෙකදී මුල සිට අගටත්, අගසිට මුලටත්, මැද සිට අගටත්, මැද සිට මුලටත් මෙ ආදී නා නා ක්‍රමයන්ට අනුව දේශනා කරත්. එය අන් කෙනෙකුට නො හැකි දෙයකි. එහෙයින් දේශනා වශයෙන් ගම්භීර ය.

ප්‍රතිවෙධ: භව චක්‍රයෙහි ඇති අවිද්‍යා දී ධර්මයන් ගේ ඒ ඒ සවභාවයන් අවබෝධ කර ගැනීම් සඳහා අන්‍යයන් විසින් නො බැස්ස හැකි බැවින් ප්‍රතිවෙධය-අවබෝධකර ගැනුම-ගැඹුරු ය, එසේ ම දුෂ්කරය. "සො දුප්පරියෝ ගාහතතා ගම්භීරො" ඒ ප්‍රත්‍යසමුත්පාදය බැස ගැනීමට දුෂ්කර හෙයින් ගම්භීර ය යනු අටුවා යි. ඒ එසේමැ යි.

"අවිජ්ජාය අඤ්ඤාණ දස්සන සච්චා සම්පටිවෙධට්ඨො ගම්භීරො" අවිද්‍යාවේ ඇත්තා වූ නො දැනීම, නො දැකීම, සත්‍ය ය අවබෝධ නො වීම - සිවුසස් වටහා නො ගැනුම - , යන තේරුම ගැඹුරු ය.

"සංඛාරානං අභිසංඛරණායූහන සරාග විරාගට්ඨො ගම්භීරො" සංස්කාරයන් ගේ පිළියෙල කිරීම, රැස්කිරීම, රාගයට නැඹුරු වීම, විරාගයට - කුශලයට - නැඹුරු වීම, යන තේරුම ද එසේ ම ගැඹුරු ය.

"විඤ්ඤාණස්ස සුඤ්ඤත අබ්‍යාපාර අසඞ්කන්ති පටිසන්ධි පාතුභාවට්ඨො ගම්භීරො" විඥානයා ගේ ආත්මය වශයෙන් ශූන්‍යභාවය - හිස් බව - , උත්සාහ නො මැතිකම, සංක්‍රමණ - යක් පෙරළීයැමක් නැති බව, ප්‍රතිසන්ධිය පහළවීම, යන මේ තේරුම ගැඹුරුය.

"නාමරූපස්ස එකුප්පාද විනිබ්භොගාවිනිබ්භොගාට්ඨ නමන රූපනට්ඨො ගම්භීරො" නාමරූපයන් ගේ එක්ව ඉපදීම, වෙන්ව පැවැත්ම, නො වෙන්ව පැවැත්ම, නැමෙන ගතිය, වෙනස්වන ගතිය, යන තේරුම් ගැඹුරුය.

"සළායතනස්ස අධිපති ලොකද්වාර ඛෙත්තවිසය විසයී භාවට්ඨො ගම්භීරො" ආයතන සයෙහි ප්‍රධාන බව, ලෝක බව, ද්වාර බව, ක්ෂේත්‍ර = කුඹුර - බව, ගොදුරු බව, ගොදුරු වන බව, යන මේ තේරුම ගැඹුරුය.

"ඵස්සස්ස ඵුසනසංඝට්ටන සඞ්ගතිසන්නිපාතට්ඨො ගම්භීරෝ" ස්පර්ශයා ගේ ස්පර්ශ කිරීම බව, හැප්පීම, එක්වීම, රැස්වීම යන තේරුම් ගැඹුරුය.

"වෙදනාය ආරම්මණරසානුභවන මජ්ඣත්තභාව නිජ්ජීව වෙදයිතට්ඨො ගම්භීරො" වෙදනායෙහි අරමුණු රසය විඳින බව සැප - දුක් දෙකෙහි මැදහත් බව, සත්වයෙකු නො මැති බව විඳිනු ලබන බව, මේ තේරුම් ගැඹුරුය.

"තණ්හාය අභිනන්දිතජ්ඣොසාන සරිතාලතානදී තණ්හාසමුද්ද දුප්පූරණට්ඨො ගම්භීරො" තෘෂ්ණාවෙහි, අරමුණෙහි දී සතුටුවන බව, ගිලගත්තාක් මෙන් අරමුණට පිවිසීම, අරමුණ කරා දිවෙන බව, පැටලෙන ගතිය, ගඟක් මෙන් නො කඩවා දිගටම පැවැත්ම, තෘෂ්ණා නැමති සමුද්‍රයෙහි නොපිරෙන ගතිය, මේ තේරුම් ගැඹුරුය.

'උපාදානස්ස ආදානග්ගහණාභිනිවෙස පරාමාස දුරතික්කමට්ඨො ගම්භීරො" උපාදානයා ගේ දැඩිලෙස ගන්නා බව කැමති වශයෙන් ගන්නා බව, පිවිසීම් වශයෙන් ගන්නා බව, ඇල්ලීම් වශයෙන් ගන්නා බව, ඉක්මවීමට නො හැකිවීම් වශයෙන් ගන්නා බව, මේ තේරුම් ගැඹුරුය.

"භවස්ස ආයූහනාභිසංඛරණ යොනිගති ඨිති නිවාසෙසු ඛිපනට්ඨො ගම්භීරෙ" භවයා ගේ රැස්කිරීම් බව; පිළිසෙල කිරීම් බව, යොනි-ගති ස්ථිති-නිවාස යන තත්හි දමාගසන බව, (වැටෙන ගතිය) මේ තේරුම් ගැඹුරුය.

"ජාතියා ජාතිසඤ්ජාති, ඔක්කන්ති නිබ්බත්ති පාතුභාවට්ඨො ගම්භීරො" ජාතියේ, සම්පූර්ණ නො වූ ආයතනයන් ගේ ඉපදීම් බව, සම්පූර්ණ ආයතනයන් ගේ ඉපදීම් බව, මව්කුසට වැදගත්තාක් මෙන් පිවිසෙන බව, ස්කන්ධයන් ගේ ඉපදීම් බව' ස්කන්ධයන් ගේ පහලවීම් බව, මේ තේරුම් ගැඹුරුය.

"ජරාමරණස්ස ඛයවයභෙද විපරිනාමට්ඨො ගම්භීරො" ජරාමරණයා ගේ ගෙවීම් බව, විනාශය, බිඳීම, වෙනස් වීම, මේ තේරුම් ගැඹුරුය.

මේ ප්‍රතිවේධ වශයෙන් ගම්භීර භාවය යි.

නයභේද: පටිච්ච සමුප්පාදයෙහි නය - ක්‍රම - සතරෙකි. ඒකත්ත නය, නානත්ත නය, අබ්‍යාපාර නය, එවං ධම්මතා නය යනු යි. අවිද්‍යාදි අඞ්ගයන් ගේ පරම්පරා ක්‍රමය ඒකත්ත නය යි. ඔවුන් ගේ වෙන් වූ ලක්‍ෂණ ක්‍රමය නානත්ත නය යි. උත්සාහ නො මැති ගතිය අව්‍යාපාර ක්‍රමය යි: ස්වභාවධර්ම වශයෙන් පවත්නා ක්‍රමය එවං ධම්මතා නය නමි.

අවිද්‍යාවෙන් සංස්කාර වේ. සංස්කාරයන් හෙත් විඥාන වේ. මේ ආදි එක් එක් අඞ්ගයන් හෙත් ඒ ඒ විඥානාදි ඵල උපපත්ති ක්‍රමය ඒකත්ත නය බව දතයුතු. අවිද්‍යාදි අඞ්ගයන් ගේ නො දැනීම අර්ථය, රැස්කිරීම් අර්ථය, ආදී ඒ ඒ ලක්‍ෂණ පැවැත්ම නානත්ත නය නමි. අවිද්‍යාවට කම් රැස්කළ යුතුයැ යි උත්සාහයක් නො මැත. මේ ආදී ගති අබ්‍යාපාර නය යි. සංස්කාරයන් පහළවනුයේ අවිද්‍යාව නිසායැ. අනික් කාරණකින් නො වේ. මෙසේ පවත්නා ගතිය එවං ධම්මතා නය බව දතයුතු. මේ විස්තරය යි.

මෙතෙකින් පටිච්ච සමුප්පාදයෙහි අද්ධ, අඞ්ග, ආකාර, සන්ධි සංඛෙප, වට්ට; මූල, අච්චප්පහාව, කිච්ච; කාරණ, උපමා, ගම්භීර, නය, යන තෙළෙස් කාරණු සමාප්තය.

පටිච්ච සමුප්පාද විස්තරය නිමි.

# 16 වැනි පරිච්ඡේදය

# පට්ඨාන ක්‍රමය

"පට්ඨාන නයො පන ආහච්ච පච්චයට්ඨිතිමාරබ්භ පවුච්චති" යනුවෙන් පට්ඨාන ක්‍රමය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි දක්වෙනුයේ විශේෂ ප්‍රත්‍යයන්ගේ පැවැත්ම දක්වෙන ක්‍රමය බවයි. ආහච්ච පච්චයට්ඨිති යනු ඒ ඒ කොණෙහි නැගී සිට අවුත් හැප්පී සිටිනා පරිද්දෙන් ඒ ඒ විශේෂ ප්‍රත්‍ය ධර්මයන් අවිද්‍යාදීන් කෙරෙහි පවත්නා බවයි. මනුෂ්‍යයාගේ ප්‍රධාන ආහාරය බත් වුවද එය අනුභව කිරීමට මාළු, මස්, පලාවගී, ආදී බොහෝ දෑයක් අවශ්‍යය. එමෙන් අවිද්‍යාවෙන් සංස්කාර වේයයි දක්වුවද, සංස්කාරයන්ට අවිද්‍යාව කවර කවර විශේෂ ප්‍රත්‍යයන්ගේ බලයෙන් ප්‍රත්‍යය වේද යනු දක්වීම පට්ඨාන ක්‍රමය බව පිටතින් පෙනෙන තේරුම වශයෙන් දතයුතුය.

පට්ඨාන ක්‍රමය තරම් ගැඹුරු ධර්මයක් දේශනාවෙහි අන් කැනක නොමැත. එය උගෙනීමටත්, ධාරණයටත්, අවබෝධයටත් ඉතා දුෂ්කරය. ග්‍රන්ථයක් වශයෙන් සකස් කිරීමට අපගේ දැනුම දුබලය. එසේම දීර්ඝ විස්තරයක් ද නොකළ හැකිය. ඒ සඳහාත් අපගේ දැනුම සීමාය. විස්තර බලා ගැනීමට, ආචාර්ය රේරුකානේ චන්දවිමල ස්වාමිපාදයන් වහන්සේ ලියූ "සමන්ත මහාපට්ඨානප්පකරණ සන්නය" පරිශීලනය කළ යුතු. තවද, මෑවේ ආභිධම්මිකාචාර්ය යූ බී, රාජකරුණා මහතා ලියූ "සූවිසි ප්‍රත්‍ය ධර්ම" නමැති ග්‍රන්ථය ද, අභිධර්ම විශාරද යාගොඩ ධර්මප්‍රභ ස්වාමීන් වහන්සේ විසින් කරණ ලද "පට්ඨාන දේශනා සාරය" ද ඉතා ප්‍රයෝජනවත් බව දක්විය යුතු. තවත් කෙටි විස්තරයක් මාතර ධර්මවංශ ස්වාමීන් විසින් පාඩම් මාලාවක් වශයෙන් ලියන ලද "අභිධර්ම චන්ද්‍රිකා" නමැති පොත් පෙළෙහි අටවැනි පාඩමෙහි ඇත. මේ ග්‍රන්ථයන් පරිශීලනය කිරීමෙන් පට්ඨාන ක්‍රමය පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලබාගත හැක.

ධම්මට්ඨිති ඤාණ විස්තරයෙහිදී දක්වනුයේ ඉතාමත් කෙටි යම්තම් තේරුම් මාත්‍රයෙකි.

පට්ඨාන: මෙය උපසර්ගයක් සහිත වූ පදයෙකි. උපසර්ගය නම් "ප" යනුයි. අනික "ඨාන" යන ස්ථානවාචීපදයයි.

"ප + ඨාන" යන්න සන්ධි වූ විට පට්ඨාන යනුවෙන් සිටියි. "ප" යන උපසර්ග පදයෙහි අදහස නොයෙක් ආකාර යනුයි. ඨාන නම් ප්‍රත්‍යයයි. ඒකාර්ථයෙහි ලා ගත්විට නොයෙක් ආකාර ප්‍රත්‍යය පට්ඨානයැයි එයි. "නානාප්පකාරානි ඨානානි එත්ථාති පට්ඨානං" නොයෙක් ආකාර ප්‍රත්‍යයෝ යම් තැනෙක්හි වෙද්ද එය පට්ඨාන නම් යනු විග්‍රහයෙන් වඩාත් අර්ථය එයි. තවද තේරුමකි. 'පට්ඨාන" යනු බෙදීමයි. කුශලාදී ධර්ම හේතු ආදී වශයෙන් බෙදන්නේ පට්ඨාන නම් යනුවෙන් එවිට තේරුම එයි. ගමනාර්ථයෙහි ද පට්ඨාන ශබ්දය යෙදේ. බුදුරජාණන් වහන්සේගේ ඥානය නොපැකිල ගමන් කළේ පට්ඨාන ධර්මයෙහිය. ඒ නිසා ද පට්ඨාන නම් අවට විසිරී ගිය ගව සමූහයක් යම් විටෙක එක් ගාලකට රැස්වේ ද, එමෙන් අවබෝධ නොවීම වශයෙන් විසිරී තිබූ ප්‍රත්‍ය ධර්ම සමූහයක් අවුත් බුදුරජාණන් වහන්සේගේ ඥානයට ලක්වීද, එයට හසුවීද රැස්වීම වශයෙන් පැමිණියාහු ද, ඒ තේරුම නිසා ද පට්ඨාන නම්. මෙසේ තේරුම් කීපයක් අටුවාවන්හි දක්වේ.

## ප්‍රත්‍ය ධර්ම සූවිස්සෙකි. (24)

"හෙතු පච්චයො ආරම්මණපච්චයො අධිපතිපච්චයො අනන්තර පච්චයො සමනන්තර පච්චයො සහජාතපච්චයො අඤ්ඤමඤ්ඤපච්චයො නිස්සය පච්චයො උපනිස්සය පච්චයො පුරෙජාතපච්චයො පච්ඡාජාතපච්චයො ආසෙවන පච්චයො කම්මපච්චයො විපාකපච්චයො ආහාරපච්චයො ඉන්ද්‍රිය පච්චයො ඣානපච්චයො මග්ගපච්චයො සම්පයුත්ත පච්චයො විප්පයුත්තපච්චයො අත්ථිපච්චයො නත්ථි පච්චයො විගත පච්චයො අවිගතපච්චයොති අයමෙත්ථ පට්ඨාන නයො" – අ. ධ. සං.

### 1. හේතු ප්‍රත්‍යය:

හේතු භාවයෙන් උපකාරවීමයි. ප්‍රත්‍යය යනු පෙරදී විස්තර කළ පරිදිමයි. පැවැත්මට හෝ නිපැත්මට හෝ උපකාරවීම ප්‍රත්‍යය නම්.

හේතු යනු ස්ථිරභාවය ඇති කිරීමයි. ගසක් ස්ථිර භාවයෙන් පිහිටීමට මුල් උපකාර වන්නාසේ එකට යෙදුනු ධර්මයන්ගේ පිහිටීමට උපකාර වන ධර්මය හේතු බව දත යුතුය. "හිනොති පතිට්ඨාති එත්ථාති හෙතු" මෙහි හිනොති, පති

ටඨාති, යන පද දෙකම සමාන තේරුම් ඇත්තෝය. එනම් පිහිටානුයි නම්. ප්‍රත්‍යොත්පන්න ධර්මයන්ගේ පිහිටීමට ආධාර වීම, මෙයින් අදහස් කෙරේ. ඒ හේතු ධර්ම සයෙකි ලෝභ, දෝස, මෝහ, අලෝභ, අදෝස, අමෝහ, යනුයි. මේ ධර්මයන්හි තේරුම, සවභාවාදිය ස්කන්ධ විස්තරයෙහි දක්විණ. මෙයින් ලෝභාදි ධර්මත්‍රය අකුසල හේතූයි. අලෝභාදීහු කුශල හේතූහුය.

විඥානස්කන්ධයෙහි දක් වූ සිත් අතුරෙන් අහේතුක සිත් අටළොස (18) හැර ඉතිරි සිත් එක්සැත්තෑව (71) මේ හේතු ධර්මයන්ගෙන් යුක්ත වූ හෙයින් සහේතුකයෝය. මෝහ මූල සිත් දෙකෙහි ඇති මෝහය හැර ඉතිරි චෛතසික ද, සහේතුක චිත්තජ රූපයෝ ද සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ද, එසේම ප්‍රත්‍යොත්පන්නයෝය. මෙසේ කෙටියෙන් ලෝභාදි ධර්ම සය ප්‍රත්‍යය නම්. සහේතුක චිත්ත - චෛතසික හා ඒ සිත් මලින් හට ගන්නා රූප, ප්‍රත්‍යොත්පන්න නම්. ඒ ප්‍රත්‍යොත්පන්න ධර්මයන්ට ලෝභාදී හේතූහු, හෙතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. පැවැත්මට උපකාර වෙත් යනු තේරුමයි.

විස්තරය: දෙපරිද්දෙකින් මෙහිලා ප්‍රත්‍යයන් විස්තර කෙරේ. නිද්දෙස වාරය හා විභඞ්ග වාරයෙහි ප්‍රථමයෙන් දක්වෙන තික පට්ඨානයේ සතර මැදුරුම් ක්‍රමයෙහි පච්චයානුලෝම වාරයේ එන විභඞ්ග වාරයයි. නිද්දෙස වාරය පැහැදිලිවීම සඳහාය දෙවැනි ක්‍රමය දක්වනුයේ. මේ විස්තරය ද කරනුයේ පෙර සඳහන් කළ ධර්මපුස්තකයන් ඇසුරු කරමිනි. නො පැහැදිලි තැන් අභිධර්ම විශාරද ගිහි - පැවිදි උතුමන්ගෙන් විමසා ගනු මැනවි,

නිද්දෙස වාරය: "හෙතු හෙතුසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයො" හේතූහු හේතුසම්පයුක්ත වූ - එකට යෙදුනු - ධර්මයන්ට ද එයින් හටගන්නාවූ රූපයන්ට ද හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. (මින් පසු පෙලට තේරුම නො දක්වේ.)

මෙහි තේරුම් ගතයුතු කරුණු තුනකි. හේතු, හේතු සම්ප්‍රයුක්ත ධර්ම, තත්සමුට්ඨාන රූප, යනුයි. හේතු පෙරකී ලෝභාදී සයයි. හේතුසම්ප්‍රයුක්ත ධර්මයෝ නම් සහේතුක සිත් එක්සැත්තෑව හා මෝහ මූල සිතෙහි යෙදුනු මෝහය හැර සෙසු ඒ හා යෙදුනු චෛතසික දෙපණසයි. අහේතුක සිත් අටළොස හැර, අකුසල සිත් 12, කාමාවචර කුසල විපාක ක්‍රියා 24, රූපාරූප

27, ලෝකෝත්තර 8, මේ සහේතුක සිත් 71 යි. තත්සමුට්ඨාන රූප දෙවැදෑරුම්ය. චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ, යනුයි. චිත්තජ රූප පසළොසෙකි. ප්‍රතිසන්ධිකර්මජ රූප අටළොසෙකි. විස්තර ස්කන්ධ කොටසෙහි දක්වා ඇත. (මූලික අභිධර්ම දැනුමක් නොමැත්තහුට මේ විස්තරයෙන් ප්‍රයෝජනය නො ගත හැකි බව සැලකිය යුතු.

විභඞ්ග වාරය: මෙය දෙවැදෑරුම්ය. වීපිය, අනුවාදය, යනුයි. තවද කුශල, අකුශල, අව්‍යාකෘත, වශයෙන් තුන් වැදෑරුම්ය. එවිට කුශල වීපි, කුශල අනුවාද, වශයෙන් බෙදී යයි. ඒවා ද මෙහිලා විස්තර කරනුයේ සාමාන්‍ය ක්‍රමයෙනි. සියලු පාලි පාඨ යොදමින් කළහොත් ග්‍රන්ථය දීඝ වෙයි. එහෙයින් පාඨකයාට අවබෝධවීමෙහි රුකුලක් දීම පමණක් මෙයින් සිදු කෙරේ. මතුවට ද විභඞ්ග වාරය දැක්වෙනුයේ මෙම ක්‍රමයෙන් බව සිහිකට යුතු.

වීපිය: කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස හෙතු පච්චයෙන පච්චයො''

අනුවාදය; කුසලා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං' චිත්තසමුට්ඨානානඤ්ච රූපානං හෙතු පච්චයෙන පච්චයො.'

මෙහි කුසල ධර්ම යනු අලෝභ, අද්වේෂ, අමෝහ, යන හේතූන් තුනදෙනාය, ප්‍රත්‍යයෝත්පන්න කුශල ධර්මයෝ නම් සහේතුක වූ කුශල චිත්තයෝ සහ ඒ හා යෙදෙන චෛතසිකයෝ යැ. කාමාවචර ශෝභන සිත් අට, රූපාවචර පස, අරූපාවචර සතර ලෝකෝත්තර සතර මේ සිත් 21 හා ඒ හා යෙදෙන චෛතසික කුශල ධර්මයි. ප්‍රත්‍යයෝත්පන්න අව්‍යාකෘත ධර්මයෝ නම් සහේතුක කාමාවචර විපාක, ක්‍රියා සහ මහග්ගත විපාක, ක්‍රියා, ලෝකෝත්තර විපාක, චිත්තජ රූප යන මෙතෙක් ධර්මයෝය.

මෙසයින් ගත් කල කුශල ධර්මයක් සිදුකිරීමේ දී අලෝභාදී හේතූහු ඒ කුශල ධර්මයන්ට හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන බව පැහැදිලි වෙයි. එසේම ඒ සිත්වලින් හට ගන්නා වූ විපාක යන්ට හා රූපයන්ට ද ප්‍රත්‍යය වෙත්. අලෝභාදී හේතූන් ඇති කල්හිම සෙසු ධර්ම පවත්නා බව මෙයින් අදහස් කෙරේ. පැවැත්මට උපකාර වනුයේ ප්‍රත්‍යය නමැයි ඉහත කී තේරුම සිහිකට යුතු. මත්තටත් මෙසේම සලකමින් විමසා ගතයුතු.

ii "අකුසලො ධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස හෙතු පච්චයෙන පච්චයො; අකුසලා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානං ච රූපානං හෙතුපච්චයෙන පච්චයො"

අකුශල ධර්ම. ලෝභ, ද්වේෂ, මෝහ, තුනයි. මේ ප්‍රත්‍යය වශයෙනි. ප්‍රත්‍යයෝත්පන්න අකුශල ධර්ම නම් අකුසල් සිත් දොළොස හා ඒ සිත් සමග යෙදුනු චෛතසික සත්විස්ස (27) ස්කන්ධ වශයෙන් ගතහොත් ඒ චිත්ත - චෛතසිකයන් වූ වේදනා, සඤ්ඤා, සංස්කාර, විඥාන, යන නාමස්කන්ධ සතරයි. චිත්තජ රූප අව්‍යාකෘත ධර්මයි. මෙසේ ලෝභාදි ප්‍රත්‍යයන් නිසා අකුශල ප්‍රත්‍යයෝත්පන්න වූ චිත්ත චෛතසික, රූප, යන මේ තෙක් ධර්ම හට ගනිත්. එහෙයින් චිත්ත - චෛතසික, රූප යන්ට ලෝභාදි ධර්ම හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

iii "අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතු පච්චයෙන පච්චයො, විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානං ච රූපානං හෙතුපච්චයෙන පච්චයො පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං කටත්තා ච රූපානං හෙතුපච්චයෙන පච්චයො"

අබ්‍යාකත යනු කුශල්, අකුශල්, වශයෙන් දෙසූ ධර්ම හැර, ඉතිරි විපාක, ක්‍රියා, සිත් හා රූප, නිර්වාණ, යන මේ තෙක් ධර්මයෝයි. නිර්වාණය හැර ඉතිරි ධර්ම මෙහිලා ගිණිය යුතු. වීථියෙහි අව්‍යාකෘත වශයෙන් එතුමෝ විපාක, ක්‍රියා, සිත් හි යෙදුනු අලෝභ, අද්වේෂ, අමෝහ, යන ධර්ම තුන්දෙනායි. මේ අව්‍යාකෘත වූ හේතු ධර්මයෝ විපාක, ක්‍රියා, රූප, යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ට හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. ඒ මෙසේය. ප්‍රතිසන්ධි, ප්‍රවෘත්ති, යනුවෙන් විපාක දෙවගෙකි. අව්‍යාකෘත හේතු ප්‍රත්‍යයේ දී මේ දෙකම ගනු ලැබේ. ප්‍රවෘත්ති සමයේදී විපාක, ක්‍රියා, හේතූහු ඒ හා යෙදුනු සතර නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. ප්‍රතිසන්ධි සමයේදී විපාක හේතූහු ඒ හා යෙදුනු ස්කන්ධයන්ටත් කර්මජරූපයන්ටත් හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. "කටත්තා" යනු කර්මයනට දුන් නමකි මෙහි ප්‍රවෘත්ති අව්‍යාකෘත සිත් මුළුල්ල අටතිසකි (38) චෛතසික ද අටතිසෙකි. (සහේතුක කාමාවචර විපාක, ක්‍රියා 16,, මහග්ගත 18; ලෝ. 4 = (38) චිත්තජරූපයෝ නම් අවිනිර්භෝග 8, විඥප්ති 2, ශබ්දය,

ආකාශය, ලහුතාදී 3, = 15 යි. ප්‍රතිසන්ධි අව්‍යාකෘත සිත් සත ළොසෙකි. කාමාවචර 8, රූපාරූප 9, යන සහේතුක ප්‍රතිසන්ධි සිත් දහතය, චෛතසික පන්තිසෙකි. කර්මජ රූප අටළොසෙකි. (අවිනිර්භොග 8, ආකාශ, ඉන්ද්‍රිය රූප 8, හදය වත්‍ථු) මොවුහු අව්‍යාකෘත ප්‍රත්‍යයොත්පන්නයෝ ය. එයිනුදු ප්‍රතිසන්ධියේදී ය.

මෙසේ අව්‍යාකෘත හේතු වූ අලොභාදී ඒ හා යෙදුනු චිත්ත චෛතසිකයන්ට හා චිත්තජ - කර්මජ රූපයන්ට ද ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි, අවස්ථා දෙක්හි හෙතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

ප්‍රතීත්‍යසමුත්පාදයෙහි ආ අවිජ්ජා යන්න මෝහ හෙතුවයි. එහෙයින් ත්‍රිවිධ සංස්කාර අතුරෙන් අපුණ්‍යාභිසංස්කාරයන්ට මෝහය හෙතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි. එසේම තෘෂ්ණාව උපාදානයන්ට ද, උපාදාන භවයට ද හෙතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. තෘෂ්ණා යනු ලොභ චෛතසිකයයි. උපාදාන යනු ලෝභය හා දිට්ඨි නාමයෙන් එන මෝහය, යන චෛතසික දෙදෙනායි.

මේ හෙතු ප්‍රත්‍යය විස්තරයයි.

## 2 ආරම්මණ ප්‍රත්‍යය

අරමුණු වශයෙන් උපකාර වීමයි. අරමුණු නම් චක්‍ෂුරාදී ද්වාර සයට ගොදුරු වන රූපාදී ෂඩ්විධ ධර්මයෝයි. ඒ රූපාදීන් කෙරෙහි චිත්ත - චෛතසිකයන් ඇලෙන, රමණය, කරන හෙයින් ඒවා ආරම්මණයැයි කියනු ලැබේ. "චිත්තචෙතසිකා ආගන්ත්වා රමන්ති එත්‍ථාති ආරම්මණං යනු විග්‍රහයයි අරමුණක් නොමැතිව චිත්ත චෛතසිකයෝ නැගී නොසිටිත් දුර්වල පුරුෂයෙකු මෙනි. මෙසේ හෙයින් චිත්ත - චෛතසිකයන්ට අරමුණු වීම් වශයෙන් උපකාරවීම ආරම්මණ ප්‍රත්‍යය බව දතයුතු.

නිද්දෙස වාරය: "ආරම්මණ පච්චයොති රූපායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො. සද්දායතනං සොතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො, ගන්ධායතනං ඝාණ විඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො, රසායතනං ජිව්හා විඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො, ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො, රූපායතනං,

සද්දායතනං, ගන්ධායතනං, රසායතනං, ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො, සබ්බෙ ධම්මා මනොවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො; යං යං ධම්මං ආරබ්භ යෙ යෙ ධම්මා ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො

චක්ඛුවිඤ්ඤාණ සිත් දෙකකි. කුසල විපාක චක්ඛුවිඤ්ඤාණය. අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණය, යනුයි. සොතවිඤ්ඤාණාදීහුත් එසේ ම ය. ඒ පඤ්ච විඤ්ඤාණයන් සමග යෙදෙනුයේ සර්වචිත්ත සාධාරණ චෛතසික සත පමණි. මනොධාතු යනු සම්පටිච්ඡන සිත් දෙක හා පඤ්චද්වාරාවර්ජනය, යන සිත් තුනයැ. ඒ හා යෙදෙනුයේ ඡන්ද, ප්‍රීති, වීර්ය, හැර ඉතිරි අන්‍යසමාන චෛතසික දසයයි. මනොවිඤ්ඤාණ ධාතු නම් ඉහතින් කී සිත් හැර, ඉතිරි සසැත්තෑ (76) සිත් ය. ඒ හා සියලු චෛතසික සුදුසු පරිද්දෙන් යෙදේ.

රූපායතනාදීහු චක්ඛුවිඤ්ඤාණාදීන්ට හා ඒ සමග යෙදෙන චෛතසිකයන්ට සුදුසු පරිද්දෙන් ආරම්මණ ප්‍රත්‍යය වෙත්. පඤ්චායතනයෝ ම මනොධාතුවට හා ඒ සමග යෙදෙන චෛතසිකයන්ට ආරම්මණ ප්‍රත්‍යය වෙත්.

සබ්බෙ ධම්මා: සියලු ධර්ම, මේ වශයෙන් දක්වූ ප්‍රත්‍යයෝ සංක්ෂෙපයෙන් මෙසේය. අතීතාදී කාලත්‍රයට අයත් සිත් එකුන් අනූව (89) චෛතසික දෙපණස (52) අටවිසි (28) රූප. කාල මුක්ත නිර්වාණය, ප්‍රඥප්ති, යන මෙතෙක් ධර්මයි.

මොව්හු සුදුසු පරිද්දෙන් මනොවිඤ්ඤාණධාතුවට හා ඒ සමග යෙදෙන චෛතසිකයන්ට ආරම්මණ ප්‍රත්‍යය වෙත්. "යං යං ධම්මං ආරබ්භ" යනාදී වශයෙන් දේශනා කළ ප්‍රත්‍යය, ප්‍රත්‍යොත්පන්න ධර්ම විභඞ්ගවාරයේදී පැහැදිලි වෙයි. ඒ මිශ්‍රදේශනාවකි.

## ෂඩාරම්මණ වූ ප්‍රත්‍ය - ප්‍රත්‍යොත්පන්න විස්තරː-

වර්තමාන වූ රූපාදී පඤ්චාරම්මණයෝ චක්ෂුර්විඥානාදී ද්විපඤ්චවිඤ්ඤාණයන්ට හා ඒ සමග යෙදෙන චෛතසිකයන්ට ආරම්මණ ප්‍රත්‍යය වෙත්. ඒ පඤ්චාරම්මණයෝ ම මනොධාතු ත්‍රිකයට හා ඒ සමග යෙදෙන චෛතසිකයන්ට ආරම්මණ ප්‍රත්‍යය වෙත්. කාලත්‍රයට අයත් ධර්ම වූ සිත් එකුන් අනූව, චෛතසික

දෙපණස, අටවිසි රූප, නිර්වාණ, ප්‍රඥප්ති, මොව්හු මනොවිඤ්ඤාණ ධාතුවට හා සමග යෙදෙන චෛතසිකයන්ට ආරම්මණ ප්‍රත්‍යය වෙත්.

මේ ආරම්මණ වශයෙනි.

ද්වාර වශයෙන් කොටස් තුනකට බෙදේ. පඤ්ච ද්වාරික, මනොද්වාරික, ද්වාරවිමුක්ත, යනුයි.

පඤ්චද්වාරයන් අතුරෙන් චක්‍ෂුර්ද්වාරයෙහි සිත් සසාළිසෙක් (46) උපදියි. චක්ඛුවිඤ්ඤාණ සිත් 2, පඤ්චද්වාරාවර්ජනය, සන්තීරණ 3, වොත්ථපනය, කාමාවචර ජවන් එකුන්තිස (29), තදාලම්බන 8, = සියල්ල 46 යි. සෙසු ද්වාරයන්හිත් මෙසේ මය. වෙනස: චක්ඛුවිඤ්ඤාණ සිත් දෙක සොතවිඤ්ඤාණාදී වශයෙන් පෙරලීම යි. මේ සසාළිස් සිත් පඤ්චාරම්මණයන් අරමුණු කරයි,

මනොද්වාරික සිත් සත්සැටකි. (67) එනම් ජවන් පස්පණස. මනොද්වාරාවර්ජනය, තදාලම්බන එකොළොස, යනුයි (කා. 16, රූ. 10, අරූ. 8, ලෝකෝ 8, හසිතුප්පාදය, අකු 12, = මේ ජවන් 55 යැ.) තදාලම්බන එකොළොස නම් කාමශෝභන විපාක සිත් අට හා සන්තීරණ ත්‍රිකයයි. මේ සිත් සත් සැට කාලත්‍රයට අයත් වූ ද නොවූ ද, සියලු ධර්මයන් අරමුණු කරයි.

ද්වාරවිමුක්ත සිත් එකුන් විස්සෙකි. ඔව්හු නම් ප්‍රතිසන්ධි, භවඞ්ග, චුති, මෙ ත්‍රිවිධ කෘත්‍ය සිදුකරන්නාවූ උපෙක්ඛාසහගත සන්තීරණ ද්වය, මහාවිපාක අට, මහග්ගතවිපාක නවය, යනුයි මොව්හු අතීත භවයෙහි මරණාසන්න කාලයේදී වැටහුණු කර්ම, කර්ම නිමිති, ගතිනිමිති, අතුරෙන් එකක් අරමුණු කරත්

මේ ද්වාර වශයෙනි.

අකුසල් සිත් දොළොසට ලෝකෝත්තර ධර්ම හැර ඉතිරි සියල්ල අරමුණු වේ. කාමාවචර කුසල් සිත් අතුරෙන් ඥාන විප්‍රයුක්ත සිත් සතරට ද එසේම ය.

අහෙතුක සිත් අටළොස අතුරෙන් දෙපස් විඤ්ඤාණයන්ට වර්තමාන රූප දීනු අරමුණු වෙයි මනොධාතු ත්‍රිකයට වර්තමාන පඤ්චාරම්මණයන්ය. මනොද්වාරවර්ජනයට ත්‍රෛභූමික වූ සියල්ල අරමුණු වෙයි.

මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට අර්හත් මාර්ග, ඵල, හැර සියල්ල ද, මහාවිපාක සිත් අටට කාමාවචර ධර්ම ද ඥාන

සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතරට ලෞකික-ලෝකෝත්තර ධර්ම සියල්ල ද, ඥාන විප්‍රයුක්ත සිත් සතරට ලෞකික ධර්මද අරමුණු වෙයි.

රූපාවචර ප්‍රථමධ්‍යානත්‍රයට (3) දස කසිණ, දස අසුභ, කෙසාදි කොට්ඨාස, කරුණාමුදිතාවන්ට ප්‍රත්‍යය වන සත්ව ප්‍රඥප්තිය, යන ප්‍රඥප්ති පන්විස්ස, ද්විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යාන සිත් නවයට දස අසුභ කෙසාදි කොට්ඨාස හැර ඉතිරි තුදුසද, පඤ්චමධ්‍යාන සිත් තුනට දසකසිණ, ආශ්වාස - ප්‍රශ්වාස, උපෙක්ෂා බ්‍රහ්මවිහාරයට අරමුණු වන සත්වප්‍රඥප්තිය යන ප්‍රඥප්ති දොළොස ද, පඤ්චමධ්‍යාන අභිඥා චිත්තයට අර්හත් මාර්ග-ඵල හැර සියලු ධර්මයන් ද, එම ක්‍රියාභිඥා සිතට සියල්ල ද, ක්‍රමානුකූලව අරමුණු වේ.

රූපාවචර සිත් අතුරෙන් ආකාසානඤ්චායතන සිත් තුනට කසිණුග්ඝාටිමාකාස යන සත්ව ප්‍රඥප්තිය ද, මෙසේ සුදුසු පරිච්ඡේදයෙන් ඒ ඒ සිත්වලට ඒ ඒ ධර්මයන් අරමුණු වේ. (දීර්ඝ නිසා සංක්ෂෙප කෙරිණ.)

මේ සිත් වශයෙනි.

මෙසේ දක්වූ සෑමතන්හි ම සුදුසු පරිච්ඡේදයෙන් ඒ ඒ ධර්ම, ඒ ඒ ධර්මයනට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන බව කෙටියෙන් වටහාගතයුතු. මේ නිද්දෙසවාරයයි.

විභඞ්ග වාරය: ආරම්මණ ප්‍රත්‍යය වාර තුනෙකි කුසල පද, අකුසල පද, අව්‍යාකෘත පද, යනුයි. මොව්හු ද මිශ්‍රවීමෙන් වාර නවයක් වෙත්. එයිනුදු එක් වාරයක් විපි, අනුවාද, වශයෙන් දෙපරිදි වෙයි. මෙවැනි ඇති ප්‍රත්‍ය ප්‍රත්‍යෝත්පන්න ධර්මයන් නිද්දෙසවාරයට අනුව සලකාගත යුතු. මෙහි එනුයේ හැඟීම මාත්‍රයක් පමණි.

## 1. කුසල පදවාරයෙහි කුසල පදවාරය.

විපීය: "කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො" කුශල ධර්ම කුශල ධර්මයන්ට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. ඉක්බිති ඒ ආරම්මණ ප්‍රත්‍යය වන අයුරුත් ඒවැනි ඇත්තාවූ ප්‍රත්‍ය ප්‍රත්‍යෝත්පන්න ධර්මත් අනුවාද පාළියෙන් පැහැදිලි කෙරේ.

අනුවාදය: දන්දීම, සිල්රැකීම, පෙහෙවස් විසීම, මේ පුණ්‍යකර්ම කොට ඒවා නැවත නැවත ප්‍රත්‍යවේක්ෂා කරයි. මෙනෙහි කරයි. එවිට මෙනෙහි කරන වාරයක් පාසා කුසල් සිත් උපදියි මෙසේ, කළාවූ කුශලකර්මයෝ ප්‍රත්‍යයන් වෙත්. නැවත උපදින කුශලකර්මප්‍රත්‍යුත්පන්න වෙත්. මේ ආරම්මණ ප්‍රත්‍යය වන අයුරුයි. තවද "පෙර කළාවූ පුණ්‍යකර්මයන් ප්‍රත්‍යවේක්ෂා කරයි ධ්‍යානයෙන් නැගිට ධ්‍යානය ප්‍රත්‍යවේක්ෂා කරයි. ශෛක්ෂයෝ ගෝත්‍රභූ, වෝදාන, සිත් ප්‍රත්‍යවේක්ෂා කරත්. ශෛක්ෂයෝ මාර්ගයෙන් නැගීට මාර්ගය ප්‍රත්‍යවේක්ෂා කරත්. ශෛක්ෂයෝ හෝ පෘථග්ජනයෝ හෝ කුශලය අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරත්. චේතෝපරිය ඥාණයෙන් කුශල් සිත් අන්‍යයහුගේ සිත දැනගනිත්. මේ අවස්ථාවන්හි ද ආරම්මණ ප්‍රත්‍යය වෙයි. තවද, ආකාසානඤ්චායතන කුශලය විඤ්ඤාණඤ්චායතන කුශලයට ද, ආකිඤ්චඤ්ඤායතන කුශලය නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුශලයට ද, ආරම්මණ ප්‍රත්‍යය වෙයි. කුශලස්කන්ධ වූ චිත්ත චෛතසිකයෝ ඍද්ධිවිධඥානය- චේතෝපරියඥානය - පූර්වේනිවාසානුස්මෘතිඥානය - යථාකම්මූපග ඥානය- අනාගතාංශඥානය, යන මේ ඥානයන්ට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

(ගෝත්‍රභූ: පෘථග්ජන ගෝත්‍රය - පුහුදුන් ගතිය = මැඩපවත්වන සිතයි. මෙය සෝවාන් මාර්ග චිත්තවීථියෙහි අටවැනි හෝ සත්වැනි හෝ තැන උපදියි. වෝදාන: සෝවාන් වූ පසු සෙසු මාර්ග ඉපදවීමේදී ගෝත්‍රභූ සිත උපදින තැන ගෝත්‍රභූ වෙනුවට උපදින සිතයි. සෙසු ගැඹුරු වචන ඉදිරි ඥානවිස්තරයන්හි දක්වෙයි )

## 1. ii කුසල පදවාරයෙහි අකුසල පදවාරය.

වි. කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො" තේරුම් සුගමැයි.

අනුවාදය: දන් දී, සිල් රැක, පෙහෙවස් වැස. ඒ පින්කම් අරමුණු කොට ආශ්වාදනය කරයි - ඉපදවීම් වශයෙන් පිනවයි. විශේෂයෙන් සතුටුවෙයි. ඒ නිසා කුශලධර්ම අරමුණු කොට රාග, දිට්ඨි, විචිකිච්ඡා, උද්ධච්ච, දෝමනස්ස, යන අකුශල ධර්මයන් උපදියි. එසේම පෙර කළාවූ කුශලධර්ම සිහිකිරීමෙන් ද ඒ පාප පාපධර්ම උපදියි. ධ්‍යානලාභියාට ධ්‍යානයෙන් නැගිට ඒ ධ්‍යාන අරමුණු කොට රාග, දිට්ඨි, විචිකිච්ඡා, උද්ධච්ච, සහ ධ්‍යානය

පිරිහුණු කල්හි දොමනස්සයද උපදියි. මෙසේ කුශල ධර්මයන් නිසා අකුශල ධර්මයන් ආරම්මණ ප්‍රත්‍යය අනුව උපදින බව දතයුතු.

## 1. iii කුසල පදවාරයෙහි අබ්‍යාකත පදවාරය,

වි. 'කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො', මෙහි අව්‍යාකෘත යනු විපාක ක්‍රියා සිත්ය.

අනුවාදය: රහතන් වහන්සේ අර්හත් මාර්ගයෙන් නැගිට මාර්ග ප්‍රත්‍යවෙක්ෂා කරයි. පෙර කළ පින් සිහිකරයි. කුශලය අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරයි. චෛතොපරිය ඥානයෙන්- පරසිත් දන්නා නුවණින් - කුසල් සිත් ඇත්තහුගේ සිත දැන ගනියි මේ අවස්ථාවන්හිදී ඒ අරමුණු කරන කුශල ධර්මයෝ ප්‍රත්‍ය වෙත්. ප්‍රත්‍යවෙක්ෂාදී ජවන් සිත් හා ඒ සමග යෙදුනු චෛතසික ප්‍රත්‍යොත්පන්න ධර්මයෝ වෙත්. ඔව්හු ද කාමාවචර මහා ක්‍රියා සිත්හු ය. චෛතොපරිය ඥානය ක්‍රියාභිඥ සිතකි. චතුර්ථධ්‍යානිකයි.

ශෛක්ෂයෝ හා පෘථග්ජනයෝ හෝ කුශලය අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරත්. ඉක්බිති ඒ කුශලය නිරුද්ධ වූ පසු විපාක වශයෙන් තදාරම්මණ උපදියි. තදාරම්මණයෝ අව්‍යාකෘත යහ. කුශලය තෘෂ්ණා වශයෙන් ආශ්වාදනය කිරීමෙන් ඒ අරමුණු කොට පෙර කී පරිද්දෙන් රාගාදී කෙලෙස් උපදියි ඒ අවසානයේ එහි විපාක වශයෙන් තදාරම්මණ උපදියි. මෙසේ කුසල් හෝ අකුසල් හෝ තදාරම්මණ උපන් කල්හි කුශල ධර්මයන් නිසා, ඒ අරමුණු කොට අව්‍යාකෘත සිත් ඉපදීමෙන් ආරම්මණ ප්‍රත්‍යය ක්‍රියාත්මක වූ බව දතයුතු.

තවද ආකාසානඤ්චායතන කුසලය, ආකිඤ්චඤ්ඤායතන කුසලය, පිළිවෙලින් විඤ්ඤාණඤ්චායතන හා නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක, ක්‍රියා, සිත්වලට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. කුශලස්කන්ධ වූ චිත්ත-චෛතසිකයෝ චෛතොපරියඥානාදී පෙර කී ඥානයන්[ආවර්ජනය කිරීමෙහිලා ආරම්මණ ප්‍රත්‍යය වෙයි. ආවර්ජනා සිත අව්‍යාකෘතයෙකි. මෙසේ කුශල ධර්ම අරමුණු කොට අව්‍යාකෘත වූ විපාක ක්‍රියා සිත් උපදින අයුරු දතයුතු.

## 2. අකුසල පද වාරය.

### i අකුසල පදවාරයෙහි අකුසල පදවාරය.

විපිය: "අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො"

අනුවාදය: රාගය ආශ්වාදනය කරයි. සතුටු වෙයි. එය අරමුණු කොට රාග, දිට්ඨි, විචිකිච්ඡා, උද්ධච්ච, දෞමනස්ස උපදිත්. එසේ ම දිට්ඨිය ආශ්වාදනය කරයි. සතුටු වෙයි. එය අරමුණු කොට රාගාදිය උපදිත්. විචිකිච්ඡාව අරමුණු කොට විචිකිච්ඡා, දිට්ඨි, උද්ධච්ච, දෞමනස්ස උපදියි. දෞමනස්ස අරමුණු කොට දෞමනස්ස, දිට්ඨි, විචිකිච්ඡා, උද්ධච්ච උපදියි. මෙසේ අකුශල ධර්මයන් අරමුණු කොට අකුශල ධර්මයන් ගේ ඉපැත්ම වෙයි.

### 2. ii අකුසල පදවාරයෙහි කුසල පදවාරය.

වි: අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.

අනුවාදය; ශෛක්ෂයෝ ප්‍රහීණ ක්ලේශ ප්‍රත්‍යවේක්ෂා කරත්. එනම් මාර්ග ඥානයන් ඉපදවීම නිසා, ඒ මාර්ගඥාන අවසාවේදී අස්කළ කෙලෙස් මේවායි සිතා බැලීමයි. ඒ සිතා බැලීමේදී අරමුණු වන කෙලෙස් ප්‍රත්‍ය නම්. ප්‍රත්‍යවේක්ෂා ඥාන චිත්ත පරම්පරාව ප්‍රත්‍යයෝත්පන්න ධර්ම නම්. එසේ ම උත්තමයන්ගේ විෂ්කම්භන - සවපත් - කළ කෙලෙස් ප්‍රත්‍යවේක්ෂා කරත්. පෙර බොහෝ සේ බලපැවැත්වූවාවූ කෙලෙස් නුවණින් දනිත්. ශෛක්ෂයෝ හෝ පෘථග්ජනයෝ අකුශලය අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරත්. පරචිත්තවිජානනඥානයෙන් අකුසල සිත් ඇතියහු ගේ සිත දැනගනිත්. අකුශල ස්කන්ධ වූ චිත්තචෛතසිකයෝ චේතෝපරිය - පුබ්බේනිවාසානුස්සති - යථාකම්මූපග - අනාගතාංශ ඥානයන්ට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. මෙසේ දැක්වූ අවස්ථාවන්හිදී ප්‍රත්‍ය වශයෙන් අකුශල ධර්ම පමිති. ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් කාමාවචර කුශල ජවන් සිත් හා අභිඥා සිත් පවතී.

### 2. iii අකුසල පදවාරයෙහි අබ්‍යාකත පදවාරය.

වි. "අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො"

අනුවාදය: රහතන් වහන්සේ ප්‍රහීණ වූ කෙලෙස්, පෙර බොහෝ සේ පැවැති කෙලෙස්, ප්‍රත්‍යවේක්ෂා කරත්. අකුශලය අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරත්. මේ අවස්ථාවන්හි අකුශල ධර්ම ප්‍රත්‍යයයි. කාමාවචර ක්‍රියා සිත්, චෛතසික, ප්‍රත්‍යොත්පන්නයි. උන්වහන්සේ චේතොපරිය ඥානයෙන් අකුශල සිත් ඇතියහු ගේ සිත දැනගනිත් එවිට ප්‍රත්‍යොත්පන්න වනුයේ අභිඥා සිත හා චෛතසිකයි. ශෛක්ෂයෝ හෝ පෘථග්ජනයෝ හෝ අකුශලය අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරත්. ඒ අවසානයේ එහි විපාක වශයෙන් තදාරම්මණ උපදියි. එසේ ම ඒ අකුශලය අනුව රාගාදී කෙලෙස් උපදවා ගැනීම වශයෙන් හරවා ගනිත් අකුශල චිත්තවීථි අවසානයේ එහි විපාක වූ තදාරම්මණ උපදියි. තදාරම්මණ අව්‍යාකෘතයි. ප්‍රත්‍යොත්පන්නයි. අකුශල ස්කන්ධ, පරචිත්තවිජානනඥානාදී ඥානයන් ගේ ආවර්ජනා පිණිස ආරම්මණ ප්‍රත්‍යය වෙයි. මෙසේ අකුශල ධර්ම නිසා අව්‍යාකෘත ධර්ම උපදී.

## 3. අබ්‍යාකත පදවාරය.

### i අබ්‍යාකතපදවාරයෙහි අබ්‍යාකත පදවාරය.

විපීය' අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො"

අනුවාදය: රහතන් වහන්සේ අර්හත් ඵලය, නිර්වාණය ප්‍රත්‍යවේක්ෂා කරත්. එවිට නිර්වාණය අර්හත් ඵලයට හා ආවර්ජනා සිතට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ උන්වහන්සේ පඤ්චප්‍රසාද, විෂයරූප, හෘදයවස්තුව, විපාක - ක්‍රියා වූ චිත්ත-- චෛතසික, මෙතෙක් ධර්ම අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරත්. එවිට ප්‍රසාදාදීහු අව්‍යාකෘත ප්‍රත්‍යධර්මයි. විදර්ශනා කරන්නාවූ මහා ක්‍රියා චිත්ත චෛතසික ප්‍රත්‍යොත්පන්න ධර්මයි. දිව්‍යචක්ෂුරාභි ඥානයෙන් - දිව ඇසින් - රූප දකිත්. දිව්‍යශ්‍රොත ඥානයෙන් ශබ්ද අසත්. පරචිත්තවිජානන ඥානයෙන් විපාක - ක්‍රියා සිත් ඇතියහු ගේ සිත බලත්. මේ අවස්ථාවන්හි රූප, ශබ්ද, පරසිත්හි පවතින විපාක, ක්‍රියා සිත්, මෙතෙක් ධර්ම ප්‍රත්‍යය වෙයි ඒ අරමුණු කරන අභිඥා චිත්ත චෛතසික ප්‍රත්‍යොත්පන්න ධර්මයෝයි. ආකාසානඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන මේ ක්‍රියා සිත් දෙක හා ඒ සමග යෙදෙන චෛතසික පිළිවෙලින් විඤ්ඤාණඤ්චායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන, ක්‍රියා චිත්ත-චෛතසිකයන්ට

ආරම්මණ ප්‍රත්‍යය වෙයි. රූපාදි බාහිරායතනයෝ චක්ඛුර්විඥනාදි පඤ්චවිඥනයන්ට ද, එසේම ආරම්මණ ප්‍රත්‍යය වෙත්. අව්‍යාකෘත ස්කන්ධ වූ චිත්ත-චෛතසික, සෘද්ධිවිධාදි ඥනයන්ගේ ආවර්ජනාදි සිත්වලට හා චෛතසිකයනට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි. චක්ෂුර්විඥනාදිය අව්‍යාකෘත බව සිහිකට යුතු.

## 3. ii අබ්‍යාකත පදවාරයෙහි කුසල පදවාරය.

වි. "අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො"

අනුවාදය: ශෛක්ෂයෝ සෝවාන් ආදි ඵල ප්‍රත්‍යවේක්ෂා කරත්. නිර්වාණය ප්‍රත්‍යවේක්ෂා කරත් මෙ නිසා ප්‍රත්‍යධර්ම වශයෙන් අව්‍යාකෘත වූ ඵල, නිර්වාණය. අරමුණු වෙයි. ඒවා අරමුණු කොට උපදවන්නාවූ ප්‍රත්‍යවේක්ෂා ජවන් චිත්ත-චෛතසික කුශල වශයෙන් ප්‍රත්‍යුත්පන්න ධර්මයි. එසේම කාමාවචර මහාකුසල සිත්හුයි. මාර්ගචිත්තවීථින්හි උපදින ගොත්‍රභූ, වොදාන, මාර්ග, යන ජවන් සිත්වලට අරමුණු වනුයේ නිර්වාණයයි. නිර්වාණය අව්‍යාකෘතයි. ඒ නිසා උපදින ගොත්‍රභූ ආදිය කුශල ප්‍රත්‍යුත්පන්නයි.

ශෛක්ෂයෝ හෝ පෘථග්ජනයෝ හෝ චක්ෂුරාදි අව්‍යාකෘත ධර්මයන් අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කරත්. එවිට උපදින්නාවූ විදර්ශනා චිත්තවීථි කුශල වූ ප්‍රත්‍යුත්පන්න ධර්ම වෙත්. සෙස්ස පෙරසේම ය. අනුවාද පාලියේ අවසානයෙහි දක්වෙන අව්‍යාකෘත ස්කන්ධ, මෙහිදී චෙතොපර්යාදිඥනයන්ට අරමුණු වන බව දතයුතු. අව්‍යාකෘත වශයෙන් නම් ආවර්ජනා සිතටය අරමුණු වනුයේ. මේ ඒ වෙනසයි.

## 3. iii අබ්‍යාකත පදවාරයෙහි අකුසල පදවාරය.

වි. අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො"

අනුවාදය: චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, හදයවත්ථු. විපාක හා ක්‍රියා, යන මේ අව්‍යාකෘත ධර්ම අරමුණු කොට රාග, දිට්ඨි, විචිකිච්ඡා, උද්ධච්ච, දෞර්මනස්ස උපදියි· ඒ සෑම තන්හිම උපදින්නාවූ චිත්ත චෛතසික අකුශල ප්‍රත්‍යුත්පන්න ධර්මයි. චක්ෂුරාදිහු ප්‍රත්‍යයෝයි. එද අව්‍යාකෘතයෝයි.

ආරම්මණ ප්‍රත්‍යයේ විභඞ්ගවාරය අවසානයි.

පටිච්ච සමුප්පාදයෙහි අවිද්‍යාව සංස්කාරයන්ට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ. එහි ක්‍රමය මෙසේය. අවිද්‍යාව අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කරන කල්හි ඒ කුශල ජවනයන්ට ආරම්මණ ප්‍රත්‍යයවේ. ඒ කුශල ජවන් කාමාවචරයි. අභිඥා චිත්තයෙන් සමෝහ සිත් දැනගන්නා කල්හි රූපාවචර කුශල ජවනයන්ට ප්‍රත්‍යයවේ. අවිද්‍යාව නිසා රාගාදී කෙලෙස් ඉපද වීමේදී පහළවන අකුශල ජවන් සිත්වලට අපුණ්‍යාභිසංස්කාර වශයෙන් ප්‍රත්‍යයවේ මෙසේ අවිද්‍යාව පුණ්‍යාභිසංස්කාර, අපුණ්‍යාභි සංස්කාර, දෙකටම ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ. ස්පර්ශ ප්‍රත්‍යය හටගන්නා අවස්ථාවේදී රූපාදී බාහිරායතන, චක්ඛු සම්ඵස්සාදීන්ට ආරම්මණ ප්‍රත්‍යය වේ.

ආරම්මණ ප්‍රත්‍යය විස්තරය නිමි.

## 3. අධිපති ප්‍රත්‍යය

තමා සමඟ යෙදුනු නාමරූපයන්ට ප්‍රධාන වීම් වශයෙන් උපකාර වනුයේ අධිපති ප්‍රත්‍යය නම් "අධිනානං පති අධිපති" තමා යටතෙහි පවත්නවුන් කෙරෙහි ස්වාමියා, ප්‍රධානියා වේනුයි අධිපති නම්. සිවුරඟ සේනාවෙහි රජතුමා මෙනි අධිපති ප්‍රත්‍යය දෙවැදෑරුම්ය. සහජාතාධිපති, ආරම්මණාධිපති, යනුයි. එක්ව උපදනා ධර්මයන්ට අධිපති වීම සහජාතාධිපති නම් අරමුණු කිරීම් වශයෙන් අධිපති වීම ආරම්මණාධිපතියි. සහජාතාධිපති ධර්ම සතරෙකි. ඡන්ද, චිත්ත, විරිය, වීමංස, යනුයි. ඡන්ද ප්‍රකීර්ණක චෛතසිකයෙකි චිත්ත යනු සිතයි. විරිය ද ප්‍රකීර්ණක චෛතසිකයෙකි. ප්‍රඥා චෛතසිකය විමංසායි. චෛතසිකයන් අතුරෙන් චෛතසිකයන් සතරක් මෙසේ අධිපති ධර්ම වශයෙන් ඉදිරිපත් වූ බව දතයුතු මේ සහජාතාධිපති ක්‍රමයයි යම් යම් ධර්මයක් ගරු කොට චිත්ත-චෛතසිකයෝ පවතිත් නම් ඒ ඒ ධර්ම ආරම්මණාධිපති බව දතයුතුය. මේ ආරම්මණාධිපති ක්‍රමයයි.

නිද්දෙස වාරය: "අධිපති පච්චයොති ඡන්දාධිපති ඡන්ද සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං අධිපති පච්චයෙන පච්චයො, විරියාධිපති -පෙ- අධිපති පච්චයෙන පච්චයො, යං යං ධම්මං ගරුං කත්වා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං අධිපති පච්චයෙන පච්චයො"

මෙහි ඡන්දාදි අධිපති ධර්ම සම්ප්‍රයුක්ත - යෙදුනු - ධර්මයෝ නම් මෝහ මූල සිත් දෙක, හසිතුප්පාදය, ඒ හා යෙදෙන චෛතසික, මෙතෙක් ධර්ම හැර, ඉතිරි ජවන් සිත් දෙපණස හ, ඒ සමග යෙදෙන චෛතසික, මෙතෙක් ධර්මයි සාධිපති ජවන් සිත් වලින් හටගන්නාවූ රූපයෝ චිත්තජරූපයෝමය. මිශ්‍රක දේශනා පාලිය විභඞ්ග වාරයේදී විස්තරවෙයි.

සහජාතාධිපති ප්‍රත්‍යයධර්ම: ජවන් දෙපණසෙහි ඇති ඡන්ද, චිත්ත, විරිය, වීමංස, ධර්මසතරයි. ප්‍රත්‍යයෝත්පන්න ධර්ම; සාධිපති ජවන් දෙපණස, ඒ සමග යෙදෙන චෛතසික, සාධිපති චිත්තජ රූප යන මේවායි. මේ පොදු වශයෙනි.

විස්තර වශයෙන් මෙසේය: ඡන්දාධිපති ප්‍රත්‍යය ජවන් දෙපණසෙහි ඇති ඡන්දයයි. සාධිපති ජවන් දෙපණස, චෛතසික පණස, සාධිපති චිත්තජරූප පසළොස, මෙතෙක් ධර්ම ප්‍රත්‍යයෝත්පන්නයි. චිත්තාධිපති ප්‍රත්‍යය, ජවන් සිත් දෙපණසයි. සාධිපති ජවන් දෙපණස, චෛතසික එක් පණස, විචිකිච්ඡා හැරයි. සාධිපති චිත්තජරූප, ප්‍රත්‍යයෝත්පන්නයි. විරියාධිපති ප්‍රත්‍යය ජවන් දෙපණසෙහි අධිපති ශක්තියෙන් සිටිනා විරිය චෛතසිකයයි. සාධිපති ජවන් දෙපණස, චෛතසික පණස, (විරිය, විචිකිච්ඡා, හැරයි) සාධිපති චිත්තජරූප, ප්‍රත්‍යයෝත්පන්න ධර්මයි. වීමංසාධිපති ප්‍රත්‍යය ත්‍රිහේතුක ජවන් සූතිසෙහිවූ ප්‍රඥාවයි. සාධිපති ජවන් සූතිස, චෛතසික සත්තිස, සාධිපති චිත්තජරූප, ප්‍රත්‍යයෝත්පන්නයි.

ආරම්මණාධිපති ප්‍රත්‍යයධර්ම:- ගරු කළයුතුවූ කාලත්‍රයට අයත් ඉෂ්ටනිෂ්පන්න රූප අටළොස, ද්වේෂ-මෝමූල සිත්, දුක්ඛ සහගත කායවිඤ්ඤාණය, මේ සිත් පහ හැර ඉතිරි සිත් අසූහතර, දෝස-ඉස්සා-මච්ඡරිය-කුක්කුච්ච, විචිකිච්ඡා හැර ඉතිරි චෛතසික සතළිස්සත, නිර්වාණය යන මෙතෙක් ධර්මයි.

ප්‍රත්‍යයෝත්පන්නධර්ම:- ලෝභමූලික සිත් අට, මහා කුශල අට, ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සතර, ලෝකෝත්තර සිත් අට, චෛතසික සතළිස් පහ, මෙතෙක් ධර්මයි (දෝස. ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා. කරුණා, මුදිතා; හැරයි) ආරම්මණාධිප්‍රත්‍යය වනුයේ ඒ ඒ ධර්ම ගරුකොට සැලකීමෙන් පමණි. මෙනෙහිකිරීමේදී වනුයේ ආරම්මණ ප්‍රත්‍යයමයි.

## විභඞ්ගවාරය:

1. විපිය; “කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො ආරම්මණාධිපති සහජාතාධිපති” මෙහි කුශල ධම් යනු ඉහත සඳහන් ඡන්දාදී අධිපති ධම් හා ගරුකොට අරමුණු කරණ ධර්ම සමූහයයි. මේ ප්‍රත්‍යය වශයෙනි. ප්‍රත්‍යොත්පන්න කුශල ධම් ඉහත සඳහන් ධම්මලින් ගතයුතු. විපී පාලියෙහි අදහස: කුශල ධර්මයනට දෙවැදෑරුම් අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි යනුයි.

අනුවාදය: ආරම්මණාධිපති වශයෙන්:- දන් දී, සිල් රැක, පෙහෙවස් වැස, ඒ කුශලකර්ම ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරයි. පෙර කළ පින් ප්‍රත්‍යවේක්ෂා කරයි. ධ්‍යානයෙන් නැගිට ධ්‍යානය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරයි. ශෛක්ෂයෝ ගොත්‍රභූ, වොදාන, සිත් ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරත්. මාර්ගයෙන් නැගී මාර්ගය ගරු කොට ප්‍රත්‍යවේක්ෂා කරත්. මෙහිදී කාමාවචර කුශල් අධිපති ප්‍රත්‍යයවී කාමාවචර කුශල්ම උපදියි. ගොත්‍රභූ, වොදාන සිත් අධිපති ප්‍රත්‍යය වී උපදිනුයේ කාමාවචර කුශල්ය. මාර්ග සිත් ලෝකෝත්තර වුවද, ප්‍රත්‍යයවී උපදිනුයේද කාමාවචර කුශල්ය. මක්නිසාද? ප්‍රත්‍යවේක්ෂා ජවන් සිත් කාමාවචර බැවිනි. (රහතන් වහන්සේගේ ප්‍රත්‍යවේක්ෂා ජවන් සිත කාමාවචර ක්‍රියාය.) ධ්‍යාන සිත් ස්වභාවයෙන්ම ගරු බැවින් අනෙක් ධර්මයක් ප්‍රත්‍යොත්පන්න වශයෙන් නොසිටියි. මෙසේ කුශල ධර්ම නිසා කුශල ධර්ම අධිපති ප්‍රත්‍යයෙන් උපදී.

සහජාතාධිපති වශයෙන්:- කුශලාධිපතිවූ ඡන්දාදිධර්ම, ඒ හා යෙදෙන්නාවූ චිත්ත-චෛතසිකයනට ප්‍රත්‍යයවෙත්. (ධම්ම යනු චිත්ත-චෛතසිකයෝයි) ඡන්දාදී ධර්ම අධිපති වන අවස්ථාවේදී එකක් පමණක් අධිපති වන බව දතයුතු. ඒ ධර්ම සතරම එක්වූ නොවුන් අධිපතිකම් නො කෙරේ. සමව පවතින හෙයිනි.

2, විපීය: “කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො, ආරම්මණාධිපති” කුශල ධර්ම අධිපති වීම නිසා අකුශල ධර්ම උපදී. ආරම්මණාධිපති පමණි.

අනුවාදය:- දන් දී, සිල් සමාදන්වී, පෙහෙවස් වැස, ඒවා ගරු කොට ආශ්වාදනය කරයි. වඩ වඩාත් සතුටුවෙයි. එසේම පෙර කළ පින් ගරු කොට ආශ්වාදය කරයි. සතුටුවෙයි. ධ්‍යානයෙන් නැගිට ධ්‍යානය ගරුකොට ආශ්වාදනය කරයි සතුටු වෙයි.

එම අවස්ථාවන්හි ඒ කුශල් ගරු වශයෙන් අරමුණු කිරීම නිසා රාගය උපදියි. දිට්ඨිය උපදියි. ඒ කෙලෙස් ය. මෙසේ කුශල් අධිපති කොට අකුශල් උපදියි. එහෙත් ආරම්මණාධිපති පමණි. මෙහි රාග, දිට්ඨි දෙක කියූ බැවින් ලෝභ මූලික අකුසල් සිත් අට හා ඒ සමග යෙදෙන චෛතසික ප්‍රත්‍යයොත්පන්න ධර්මයි. ප්‍රත්‍යය වූයේ කාමාවචර කුශල් හා ධ්‍යාන කුශල්, ඒ සමග යෙදෙන චෛතසික මෙතෙක් ධර්මයි

3\. විපිය: "කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො ආරම්මණාධිපති, සහජාතා-ධිපති"

අනුවාදය: ආරම්මණාධිපති:- රහතන් වහන්සේ අර්හත් මාර්ගයෙන් නැගිට මාර්ගය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරත්. මෙහි අර්හත් මාර්ග සිත කුශල්ය. ඒ අරමුණුකොට උපදිනුයේ ඤාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත්ය. ඒවා අව්‍යාකෘතයි. ක්‍රියා සිත් ප්‍රත්‍යවේක්ෂා ජවන් සිත් වශයෙන් උපදින බව දතයුතු. මෙසේ අර්හත් මාර්ග සිත හා ඒ සමග යෙදෙන චෛතසික ප්‍රත්‍ය ධර්මයි. ඤාණ සම්ප්‍රයුක්ත ක්‍රියා සිත් සතර හා ඒ සමග යෙදෙන චෛතසික ප්‍රත්‍යයොත්පන්න ධර්මයි.

සහජාතාධිපති: කුසලාධිපතිවූ ඡන්දාදී සතරදෙන එම කුසල් සිත් හා උපදින චිත්තජ රූපයනට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. චිත්තජ රූප ප්‍රත්‍යයොත්පන්නයි.

4\. විපිය; කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො, සහජාතාධිපති"

අනුවාදය: කුශලාධිපතීහු ඒ සමග යෙදෙන නාමස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ඡන්දාදී අධිපති ධර්මයක් යෙදුනු චිත්තවීථියක් හටගත්තේ නම් එහි ඇත්තාවූ අධිපති ධර්මය ඒ සිතට හා චෛතසික යනටද ඒ සිතින් උපදින රූපයනටද ප්‍රත්‍යවූ බව දතයුතු. සිත හා චෛතසික කුශලයි. චිත්තජ රූප අව්‍යාකෘතයි. මෙසේ කුශලධර්ම අධිපතිව කුශලධර්ම හා අව්‍යාකෘත ධර්ම උපදියි.

5\. විපිය: අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො, ආරම්මණාධිපති සහජාතාධිපති"

අනුවාදය:- ආරම්මණාධිපති; රාගය, දිට්ඨිය, ගරු කොට ආශ්වාදනය කරයි. ඒ නිසා රාගය දිට්ඨිය, උපදියි. මෙසේ ලෝභමූලික අකුශල් සිත් අට ගරු කොට සැලකීමෙන් නැවත ඒ සිත් අට උපදී. සහජාතාධිපති:- අකුශලාධිපති ධර්මයෝ ඒ හා යෙදෙන නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වේ. ඡන්ද, චිත්ත, විරිය, අකුශලාධිපතිහුයි.

6. විභංග: ''අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො, සහජාතාධිපති''

අනුවාදය: අකුශලාධිපතීහු ඒ සමග යෙදෙන සිතෙන් හට ගන්නා රූපයනට අධිපති ප්‍රත්‍ය වේ. චිත්තජරූප අව්‍යාකෘතය.

7. විභංග: අකුසලො ධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො, සහජාතාධිපති''

අනුවාදය: අකුශලාධිපතීහු ඒ සමග යෙදෙන නාමස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්වත් අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. මේ අකුශලධම් අධිපතිවීමෙන් අකුශලධර්ම හා චිත්තජ රූපවූ අව්‍යාකෘතධම් ඉපදීමය.

8. විභංග: ''අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො ආරම්මණාධිපති සහජාතාධිපති'' මෙහි අව්‍යාකෘත ධම් නම් කාමාවචර ක්‍රියා සිත්හි යෙදෙන ඡන්දාදීහු රූප උපදවන විපාක, ක්‍රියා සිත්හි ඇත්තාවූ අධිපතීහු, යන මොහුයි.

අනුවාදය. ආරම්මණාධිපති:- රහතන් වහන්සේ ඵලසිත, නිර්වාණය, ගරු කොට ප්‍රත්‍යවේක්ෂා කරත්. නිර්වාණය ඵල සිතට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ: මෙතැන්හි සෝවාන් ආදී ඵල සිත් සතර හා නිර්වාණය ප්‍රත්‍ය ධම්යි ප්‍රත්‍යවේක්ෂා ජවන්වූ කාමාවචර ක්‍රියා සිත්, ඵල සිත් සතර මෙතෙක් ධම් ප්‍රත්‍යයෝත්පන්නයි. (සිත් ගන්නාවිට චෛතසික ද ගතයුතු බව අභිධර්මය දන්නහුට අමුතුවෙන් කිවයුතු නොවේ.)

සහජාතාධිපති:- විපාක, ක්‍රියා සිත්හි යෙදෙන අධිපතීහු ඒ සමග යෙදෙන නාමස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වෙත්. ඤාන විප්‍රයුක්ත සිත්හි විමංසාධිපති නොයෙදේ.

9. වීජිය:- අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො, ආරම්මණාධිපති”

අනුවාදය: ආරම්මණාධිපති-: ශෛක්ෂයෝ ඵල සිත හා නිර්වාණය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරත්. නිර්වාණය ගොත්‍රභූ වොදාන, මග, මොවුනට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ. මෙහි ප්‍රත්‍යධම් නම් ඵල සිත්, තුන හා නිර්වාණයයි ප්‍රත්‍යවේක්ෂා ජවන් වූ කාමාවචර කුසලසිත්, මග්ග වොදාන. ගොත්‍රභූ මෙතෙක් ධම් ප්‍රත්‍යයෝත්පන්නයි.

10. වීජිය: අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො, ආරම්මණාධිපති”

අනුවාදය:- ආරම්මණාධිපති;- චක්ෂුරාදී ආධ්‍යාත්මික ආයතන පස, රූපාදී බාහිරායතන පස, හෘදයවස්තුව, විපාක ක්‍රියා වූ නාමස්කන්ධ, මේ ධම් ගරුකොට ආශ්වාදනය කරයි. සතුටු වෙයි. ඒනිසා රාග, දිට්ඨි උපදියි. මෙහි ගරුකොට සලකන ධම් ප්‍රත්‍යයි. ඒ අනුව උපදින ලෝභමූලික අකුසල් සිත් ප්‍රත්‍යයෝත්පන්නයි.

මේ අධිපති ප්‍රත්‍ය විභඞ්ගයයි.

පටිච්චසමුප්පාදයෙහි අවිද්‍යාව සංස්කාරයන්ට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ. එහෙත් ගරුකොට සැලකුවහොත් පමණි. එද ආරම්මණාධිපති වශයෙනි.

5. අනන්තර ප්‍රත්‍යය.

චිත්තක්ෂණ ඉපදීමේදී එක් චිත්තක්ෂණයක් ඊළඟ චිත්තක්ෂණය හා අතරක් නො තබා ඉපදීම සඳහා උපකාරවීමේ ශක්තිය අනන්තර ප්‍රත්‍ය නම්. චිත්ත පරම්පරාව නොසිඳී පැවැත්මට උප කාරවනුයේ මේ ප්‍රත්‍යයයි. රහතන් වහන්සේගේ චුති චිත්තය හැර අන් සෑම සිතක්ම නිරුද්ධවත්ම ඊළඟ සිතක් ඉපදීම සිත් ඉපදීමේ පිළිවෙලයි. එහිදී පූර්ව පූර්ව චිත්තක්ෂණ, පශ්චිම පශ්චිම චිත්තක්ෂණයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ. චිත්තක්ෂණ පහලවීමේ ක්‍රමය මෙසේය. භවඞ්ගයට පත්වූ සිත අරමුණක් හමු වූවිට ප්‍රථමයෙන් භවඞ්ග සිත නිරුද්ධවී භවඞ්ග චලන, චිත්තක්ෂණය උපදී. එය නිරුද්ධවත්ම භවඞ්ගුපච්ඡේද, මෙසේ පිළිවෙලින් පඤ්චද්වාරාවජ්ජන, චක්ඛුවිඤ්ඤාණ සම්පටිච්ඡන, සන්තීරණ වොත්ථපන, ජවන්, තදාරම්මණ, භවඞ්ග උපදීත්. මේ එක් එක් සිතට අතරක් නො තබා උපකාරවීමේ ශක්තිය අනන්තර ශක්තිය අනන්තර ප්‍රත්‍යය බව සැලකිය යුතු.

නිද්දෙසවාරය: "අනන්තර පච්චයොති චක්ඛුවිඤ්ඤාණ ධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො, මනො ධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනො විඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො, (සොත ඝාණ ජිව්හා - කාය - පෙ - පෙරසේම යොදගත්ත) පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො පුරිමා පෙ - අකුසලානං -පෙ- පුරිමා -පෙ -, අබ්‍යාකතානං - පෙ පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො, පුරිමා - පෙ - අබ්‍යාකතානං ධම්මානං -පෙ පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො, පුරිමා -පෙ- කුසලානං ධම්මානං =, පුරිමා පෙ-අකුසලානං, ධම්මානං =පෙ යෙසං යෙසං ධම්මානං අනන්තරා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො"

චක්ෂුර්විඥානය හා ඒ සමග යෙදෙන චෛතසික, සම්පටිච්ඡන සිතට හා ඒ සමග යෙදෙන චෛතසිකයනට අනන්තර ප්‍රත්‍යය වේ. සෙසු ඒවාද මෙසේම තේරුම් සපයාගතයුතු චක්ෂුර්විඥාන ආදී.

ප්‍රත්‍යධර්ම: රහතන් වහන්සේගේ චුති සිත හැර පූර්ව පූර්වවූ එකුන් අනූ චිත්තය හා චෛතසික දෙපණසකි.

ප්‍රත්‍යොත්පන්න ධර්ම: රහතන් වහන්සේගේ චුති සිත සමග එකුන් අනූ චිත්තය හා චෛතසික දෙපණසකි. මෙය විභඞ්ග වාරයේදී පැහැදිලි වෙයි.

විභඞ්ගවාරය:

1. පිළිය: "කුසලො ධම්මො -කුසලස්ස ධම්මස්ස අනන්තර පච්චයෙන පච්චයො"

අනුවාදය: පූර්ව පූර්වවූ කුශලස්කන්ධ, පශ්චිම, පශ්චිමවූ කුශලස්කන්ධයන්ටද. අනුලෝම සිත ගෝත්‍රභූ සිතටද, අනුලෝම සිත වෝදාන සිතටද, ගෝත්‍රභූ-වෝදාන සිත් මාර්ග සිතටද, අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවේ. (වෝදානාදී පද පසුවට විස්තරවෙයි)

2. කුශලධර්ම අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වීම.

අනුවාදය: කුශලයෙන් නැගිටින්නහුට, මාර්ගය ඵලයට අනුලෝමය ශෛක්ෂයන් ගේ ඵල සමාපත්තියට. නිරෝධ සමාපත්තියෙන් නැගිටින අවස්ථාවේදී නෛවසඤ්ඤානාසඤ්ඤායතන කුසලය ඵලසමාපත්තියට, මෙතෙක් අවස්ථාවන්හිදී අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවේ.

“කුසලංවුට්ඨානස්ස” සතලොස් ලෞකික කුශල් සිත් අනුව උපදිනා ජවන්හි අන්තිම ජවනය “කුසලං” යනුවෙන් ගතයුතු. ඊට පසුව උපදින තදාරම්මණ හෝ භවඞ්ගය හෝ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයි. ප්‍රත්‍යය සතලොස් ලෞකික කුශලයන්ගේ අන්තිම ජවන් 17 ප්‍රත්‍යයෝත්පන්න; තදාරම්මණ 11 ය හෝ භවඞ්ග 19 හෝය.

“මග්ගාඵලස්ස” සෝවාන් ආදී මාර්ග සිත්වලට අනතුරුව එම ඵල සිත් උපදී ශෛක්ෂයෝ තමන් ලබාගත් ඵලයකට සමවදින අවස්ථාවේදී අනුලෝම සිතෙන් පසු උපදිනුයේ එම ඵල සිත්ය. ගොත්‍රභූ, වොදාන ද අනුලෝම වශයෙන් ගත් බව සැලකිය යුතු. නිරෝධසමාපත්තියෙන් නැගිටිනවිට නෛවසඤ්ඤානාසඤ්ඤා කුසලයට අනතුරුව උපදිනුයේ ඵලසමාපත්ති සිතකි. මෙ අනාගාමි පුද්ගලයාගේ වශයෙනි. (විස්තර පසුවට එයි)

3. කුශලධර්ම අකුශලධර්මයට අනන්තර ප්‍රත්‍යයෙන් ශක්තියෙන් උපකාරවීම. අනුවාදය: පූර්ව පූර්ව කුශලස්කන්ධ, පශ්චිම පශ්චිම වූ කුශලස්කන්ධයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ. ප්‍රථම ජවනය දෙවැන්නට මේ අයුරින් උපකාරවේ.

4. දෙලොස් අකුශලයන්ගේම අන්තිම ජවනයෝ පසුව උපදිනා අව්‍යාකෘතවූ සන්තීරණ, මහා විපාක, මහග්ගත විපාක සිත්වලට අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවෙත්. මේ අකුශලය අව්‍යාකෘතයකට ප්‍රත්‍යවීමයි,

5. අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට-

අනුවාදය: පූර්ව පූර්වවූ විපාක, ක්‍රියා, නාමස්කන්ධයෝ පශ්චිමවූ විපාක ක්‍රියා නාමස්කන්ධයන්ට අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවේ. භවඞ්ගය ආවර්ජනයටද, ක්‍රියා සිත එයින් නැගිටින්නහුට ද, රහතන් වහන්සේට අනුලෝමය ඵල සමාපත්

තියටද, නිරෝධ සමාපත්තියෙන් නැගිටින්නහුට නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ක්‍රියා සිත ඵලසිතට ද, අනන්තර ප්‍රත්‍ය ශක්තිය ලැබේ.

භවඞ්ගය, භඞ්ගුපච්ඡේදයයි. ක්‍රියා සිත, ආවර්ජනා සිත් දෙක හැර ඉතිරි ක්‍රියා අටළොසෙහි ඇති අන්තිම ජවනයයි. රහතන් වහන්සේගේ අනුලෝමය, ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතරින් එකකි.

6 අව්‍යාකෘත ධර්මය කුශල ධර්මයට-

මනොද්වාරාවර්ජනය කුශලස්කන්ධයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. 7. එසේම එම සිත අකුශලස්කන්ධයන්ටද අනන්තර ප්‍රත්‍යයෙන් උපකාර වේ.

ප්‍රත්‍යසමුත්පාදයෙහි අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාරයන්ට ජවන් අවස්ථාවන්හිදී අනන්තර ප්‍රත්‍ය වේ.

## 5. සමනන්තර ප්‍රත්‍යය:

මෙය අනන්තර ප්‍රත්‍යය මෙනි. වෙනස අනන්තරභාවය මනාවේ ඇතිවීම පමණි.

## 6. සහජාත ප්‍රත්‍යය:

එක්ව ඉපදීම් වශයෙන් උපකාරවීමේ ශක්ති විශේෂය සහ ජාත ප්‍රත්‍ය නම්. ''පච්චුප්පන්නෙන සහජායතීති සහජාතො'' ප්‍රත්‍යොත්පන්න ධර්මන් සමග එක්ව උපදිනුයේ සහජාතයි. සූර්‍ය උදාවීම, ආලෝකය පැතිරීම යන කෘත්‍ය දෙකම එකට සිදුවන්නා සේ ප්‍රත්‍ය ධර්මය උපදින්ම ප්‍රත්‍යොත්පන්න ධර්ම ඉපදීම මෙහි ස්වභාවයයි.

නිද්දේසවාරය: ''සහජාත පච්චයොති චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයෙන පච්චයො, චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයෙන පච්චයො, ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයෙන පච්චයො, චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං සහජාත පච්චයෙන පච්චයො, රූපිනො ධම්මා අරූපීනං ධම්මානං කිඤ්චිකාලෙ සහජාත පච්චයෙන පච්චයො, කිඤ්චිකාලෙ න සහජාත පච්චයෙන පච්චයො''

සතර නාමස්කන්ධ ඔවුනොවුනට ද, සතරමහාභූත ඔවුනො වුනටද, ප්‍රතිසන්ධියෙහිදී නාමරූප ඔවුනොවුනටද, චිත්ත-චෛත සිකයෝ චිත්තජරූපයනටද, සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමධර්මයනට සහජාත ප්‍රත්‍ය ශක් තියෙන් උපකාරයේ. ප්‍රවෘත්තියෙහිදී නො වෙයි.

මෙහි ප්‍රත්‍යධර්මයෝ නම් ඔවුනොවුන්ට හා චිත්තජ රූපය යනටද, ප්‍රතිසන්ධි කර්මජරූපයනටද, ප්‍රත්‍යය වන එකුන් අනූ චිත්තය හා චෛතසික දෙපණස යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස් කන්ධයෝය. සියලු උපාදාරූපයන්ට හා ඔවුනොවුන්ට උපකාර වන සතර මහා භූතයෝය පඤ්චවොකාර භවයෙහි ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට උපකාර වන හෘදයවස්තු රූපය, හෘදයවස්තුරූපයට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධිනාමස්කන්ධ-යෝය. යන මෙතෙක් ධර්මයි.

ප්‍රත්‍යයෝත්පන්න ධර්ම : එකුන් අනූ චිත්තය හා චෛතසික දෙපණස, චිත්තජ -ප්‍රතිසන්ධිකර්මජ රූප, මහා භූත, උපාදාය රූප හෘදය වස්තුරූපයෙන් ප්‍රත්‍යය ලබන ප්‍රතිසන්ධි නාමස්කන්ධ, පඤ්ච වොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හෘදය වස්තුරූපය, යන මෙතෙක් ධර්මයෝය.

## විභඞ්ග වාරය:

මේ සහජාත ප්‍රත්‍ය විභඞ්ගයෙහි විපි නවයෙකි. එය සංක්ෂෙප යෙන් මෙසේය.

1. කුශල වූ එක් නාමස්කන්ධයක් අනෙක් කුශල නාම ස්කන්ධත්‍රයට ද, තුනක් එකකටද, දෙකක් දෙකකටද, සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ. මේ කුශල ධර්මය කුශල ධර්මය කට සහජාත ප්‍රත්‍යයෙන් උපකාර වන අයුරුයි. සෙසු ස්ථාන ද ඒ ඒ නාමයන් ගෙන් ම හඳුනා ගතයුතු.

2. කුශල වූ නාමස්කන්ධ ඒ සමග උපදින චිත්තජ රූපයන්ටද;

3. කුශල වූ එක් නාමස්කන්ධයක්, කුශල වූ සෙසු නාමස්කන්ධ තුනට හා ඒ සමග උපදින චිත්තජ -රූපයනට ද නාමස්කන්ධයක් එක් නාමස්කන්ධයකට හා ඒ සමග උපදින චිත්තජ රූපයකට ද; නාමස්කන්ධ දෙකක් නාමස්කන්ධ දෙකකට හා ඒ සමග උපදින චිත්තජ රූපයනට ද, සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ, (රූප අව්‍යාකෘතයි.)

4, 5, 6. මේ ත්‍රිකය අකුශල පද වාරයි. ඉහත සඳහන් අනු රින් මේවා ද සලකා ගත හැකිය.

7. අව්‍යාකෘත වාරයෙහි අව්‍යාකෘතවාරය.

"විපාකාබ්‍යාකතො කිරියාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං සහජාත පච්චයෙන පච්චයො" යනාදී වශයෙන් මේ වාරය විස්තර වෙයි. එහි සාමාන්‍ය පිළිවෙල පමණක් මෙහි සඳහන් කෙරේ.

විපාක, ක්‍රියා වූ එක් නාමස්කන්ධයක් විපාක, ක්‍රියාම වූ සෙසු නාමස්කන්ධ තුනට හා ඒ සමඟ උපදින චිත්තජ රූපයනට ද සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ. තුනක් එකකට ද, දෙකක් දෙකකට ද, මෙසේම සලකා ගන්න. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විපාක වූ එක් නාමස්කන්ධයක්. සෙසු නාමස්කන්ධ තුනට හා ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද, යනාදි ක්‍රමයෙන් උපකාර වේ.

ප්‍රතිසන්ධි විපාක වූ නාමස්කන්ධ හෘදය වස්තුරූපයට ද, හෘදය වස්තු රූපය ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමස්කන්ධයන්ට ද උපකාර වේ. සතර මහාභූත ඔවුනොවුන්ට හා චිත්තජ-කර්මජ-උපාදා රූපයන්ටද, සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ. බාහිර වූ සතර මහා භූත ඔවුනොවුන්ට ද, ආහාරජ, ඍතුජ, සතර මහාභූත ඔවුනොවුන්ට ද, අසඤ්ඤසත්ත්වයින් කෙරෙහි පවත්නා සතර මහාභූත ඔවුනොවුන්ට ද, කර්මජ රූපයනට හා උපාදාරූපයනට ද සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ. මේ සංක්ෂේපයයි.

8. කුශල වූද අව්‍යාකෘතවූ ද ධර්ම අව්‍යාකෘත ධර්මයකට සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වීමේ ක්‍රමය:- කුශල නාමස්කන්ධ හා මහා භූතයෝ චිත්තසමුට්ඨාන රූපයන්ට ප්‍රත්‍ය ශක්තිය ඇති වීමයි.

9. අකුශල වූ ද අව්‍යාකෘත වූ ධර්ම අව්‍යාකෘත වූ චිත්තජ රූපයන්ට ද මේ ක්‍රමයෙන් ප්‍රත්‍යය වන බව දතයුතු

පටිච්ච සමුප්පාදයෙහි අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාරයන්ට සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මොහය සර්වාකුශල සාධාරණ හෙයිනි ප්‍රතිසන්ධි විඥානය නාමරූපයනට ද, නාමරූප සළායතනයට ද, මනායතනය ඵස්සයට ද ඵස්සය වේදනාවටද, තණ්හාව

උපාදානයටද, උපාදාන කර්මභවයට ද, සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. විශේෂ විමසීමෙන් සැලකිය යුතු.

සහජාත ප්‍රත්‍යය විස්තරය නිමි.

## 7. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය.

"අඤ්ඤමඤ්ඤන්ති අඤ්ඤෝ අඤ්ඤං" අඤ්ඤමඤ්ඤ යනු අනිකෙක් අනිකෙකුට. මේ විග්‍රහයේ අයුරින් අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය දතයුත්තේ එකක් අනෙකට උපකාර වීමේ ශක්තිය බවයි. ත්‍රිදණ්ඩයේ ලී කැබලි තුන, එකක් අනෙක් දෙකට ද දෙකක් එකකට ද ඔවුනොවුන් උපකාර වන්නාසේය.

නිද්දේස වාරය : "චත්තාරෝ ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො, චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො, ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො"

අරූපී වූ සතර නාමස්කන්ධ ඔවුනොවුන්ට ද, සතරමහාභූත ඔවුනොවුන්ට ද, ප්‍රතිසන්ධි ක්ෂණයෙහි නාමරූප ඔවුනොවුන්ට ද, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ. මෙහි ප්‍රත්‍යය, ප්‍රත්‍යයොත්පන්න ධර්ම සෙවීම පහසුය.

විභඞ්ග වාරය:= 1. "කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො" යනාදි වශයෙන් කුසල ස්කන්ධ එකක් දෙකකට ද, තුනක් එකකට ද, දෙකක් එකකට ද, මේ වශයෙන් උපකාර වේ.

2. අකුසල පද වාරයෙහි වෙනස, අකුසල වූ නාමස්කන්ධ වීම පමණි.

3. "විපාකාබ්‍යාකතො කිරියාබ්‍යාකතො එකො ඛන්ධො" යනාදී වශයෙන් අව්‍යාකෘත පද වාරයෙහි දී විපාක, ක්‍රියා වූ නාමස්කන්ධ බහා යොදා ගත යුතුය. විශේෂ ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විපාකවූ නාමස්කන්ධයක් නාමස්කන්ධ තුනකට හා වස්තු රූපයට යනාදී වශයෙන් වස්තුරූපය බහා ඉහත සඳහන් ක්‍රමයට අනුව යෙදේ. ප්‍රතිසන්ධි විපාකස්කන්ධ හෘදය වස්තුරූපයටද හෘදය වස්තුරූපය නාමස්කන්ධයන්ට ද, සතර මහාභූත ඔවුනොවුන්වද; අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ. බාහිර වූ ආහාරජ;

සෘතුජ රූපයන් ගේ හා අසංඥ සත්වයන්ගේ සතර මහා භූත පිළිවෙලින් ඔවුනොවුනට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

පටිච්ච සමුප්පාදයෙහි අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාර යන්ට ද, විඥානය නාමරූපයන්ට ද, නාමරූප සළායතන යට ද; මනායතනය ඵස්සයට ද, ඵස්සය වේදනාවට ද, තණ්හාව උපාදානයන්ට ද, උපාදාන කම්භවයට ද, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

## 8. නිඃශ්‍රය ප්‍රත්‍යය.

ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් සමඟ ආශ්‍රය කිරීම වශයෙන් උපකාර වීමේ ශක්ති විශේෂය නිඃශ්‍රය ප්‍රත්‍යය නම්. “පච්චයුප්පන්නෙන නිස්සීයතෙති නිස්සයො” මේ විග්‍රහයයි.

නිර්දේශ වාරය : ‘නිස්සය පච්චයොති චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං නිස්සය පච්චයෙන පච්චයො, චත්තාරො මහාභූතා -පෙ-, ඔක්කන්තික්ඛණෙ නාමරූපං -පෙ- චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං -පෙ- මහාභූතා උපාදාය රූපානං -පෙ- චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං -පෙ- සොතායතනං -පෙ- ඝාණායතනං -පෙ- ජිව්හායතනං -පෙ- කායායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයෙන පච්චයො, යං යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති තං රූපං මනොධාතුයා ච මනොවිඤ්ඤාණධාතුයා ච තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයෙන පච්චයො’’

අරූපස්කන්ධ සතර ඔවුනොවුන්ට ද, මහාභූත ඔවුනොවුන්ට ද; ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමරූප ඔවුනොවුන්ට ද, චිත්ත චෛතසික ධර්ම චිත්තසමුට්ඨාන රූපයන්ට ද, මහාභූත උපාදාය රූපයන්ටද පඤ්චායතනයෝ චක්ඛු විඤ්ඤාණාදී එක් විඤ්ඤාණ යට හා ඒ සමඟ යෙදෙන චෛතසිකයන්ට ද, හෘදය වස්තු රූපය මනොධාතු වූ සම්පටිච්ඡන යුගලයට හා මනොවිඤ්ඤාණ ධාතුවට ද, ඒ සමඟ යෙදෙන යෙදෙන චෛතසිකයනට ද, නිඃශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

නිඃශ්‍රය ප්‍රත්‍යය, සහජාත පුරේජාත වශයෙන් දෙපරිදිය. සහජාත නිඃශ්‍රය සහජාත ප්‍රත්‍යය මෙනි, පුරේජාත නිඃශ්‍රය පුරේජාත ප්‍රත්‍යයෙහිදී විස්තර වේ.

විභඞ්ගවාරය: "කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො" යනාදී විශයෙන් විස්තර වේයි. මෙය බොහෝ සෙයින් සහජාත ප්‍රත්‍ය විභඞ්ගයට සමාන ය. වෙනස් වූ තැන් මෙහිලා දක්වේ.

අව්‍යාකෘතපද වාරයේ අව්‍යාකෘතපදවාරයෙහි:-

"චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණස්ස නිස්සය පච්චයෙන පච්චයො සොතායතනං ඝානායතනං ජිව්හායතනං කායායතනං සොතවිඤ්ඤාණස්ස ඝාණවිඤ්ඤාණස්ස ජිව්හාවිඤ්ඤාණස්ස කායවිඤ්ඤාණස්ස නිස්සය පච්චයෙන පච්චයො, වත්ථු විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො" දක්වෙන කොටස සහජාත ප්‍රත්‍යවිභඞ්ගයෙහි නොමැත. මෙහි අදහස පහසුයි.

වස්තුපුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යධර්ම: ප්‍රවෘත්ති කාලයෙහි ෂඩ්වස්තූහු ය. එනම් චක්ඛු, සොත, ඝාණ, ජිව්හා කාය, හදය, යනුයි. ප්‍රත්‍යොත්පන්න ධර්මයෝ නම් ප්‍රවෘත්ති කාලයෙහි පඤ්චවොකාර භවයෙහි උපදනාවූ අරූපවිපාක සතර හැර සප්තවිඥානධාතු හා දෙපණස් චෛතසිකයි. වත්ථාරම්මණ වශයෙන් මරණාසන්න කාලයෙහි චුතිචිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපදනා හෘදය වස්තුරූපය ප්‍රත්‍යධර්මයි. මරණාසන්න කාලයෙහි වූ මනොද්වාරාවර්ජනය, කාමජවන් එකුන් තිස, තදාරම්මණ එකොළොස, අභිඥා සිත් දෙක, ඉස්සා- මච්ඡරිය - කුක්කුච්ච - විරති - අප්පමඤ්ඤා හැර චෛතසික සූසාළිස, මෙතෙක් ධර්ම වත්ථාරම්මණ පුරෙජාත නිඃශ්‍රය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යොත්පන්න ධර්මයි.

පටිච්චසමුප්පාදයෙහි සහජාත ප්‍රත්‍යයට දක්වූවාසේ අවිද්‍යාව සංස්කාරයන්ට යනාදී වශයෙන් ප්‍රත්‍යය වේ.

## 9: උපනිස්සය ප්‍රත්‍යය.

ඉතා බලවත් ලෙස නිඃශ්‍රය වනුයේ උපනිඃශ්‍රය නම්. "භුසො නිස්සයො උපනිස්සයො" යනුවෙන් විග්‍රහ වූයේ ඒ අදහසයි. යම් ධර්මයක් යම් ධර්මයකට බොහෝ සේ ආශ්‍රය කිරීම් වශයෙන් උපකාර වේද, ඒ ධර්මය නොමැතිව නොපවතීද, එබඳු අතිශය උපකාරී භාවය උපනිඃශ්‍රය ප්‍රත්‍යය නම්. වෘක්ෂලතාදිය වැඩීම සඳහා ජලය, පොහොර ආදී දෑ උපකාර වුවත් අත්‍යන්තයෙන් උපකාර වනුයේ පෘථිවිය යි. පෘථිවිය නොමැතිව වෘක්ෂලතාදියක් නොපවතී. මෙත් එමෙනි.

උපනිඃශ්‍රය ප්‍රත්‍යය තෙවැදෑරුම්ය. ආරම්මණූපනිඃශ්‍රය, අනන්තරූපනිඃශ්‍රය, ප්‍රකෘතොපනිඃශ්‍රය, යනුයි.

1. ආරම්මණූපනිඃශ්‍රය: දන්දීම සිල් රැකීම ආදී පින්කම් කොට ඒවා ගරුකොට සැලකීම නිසා අරමුණු කිරීමෙන් නැවත කුශල් සිත් උපදී. එසේම ධ්‍යාන, මාර්ග, ගරුකොට සැලකීමෙන්ද කුශල් සිත් පහල වේ. මෙසේ කුශල් අරමුණු කොට කුශල් උපනිඃශ්‍රය වී කුශල් සිත් ඉපදීමට උපකාර වීම ආරම්මණූපනිඃශ්‍රය ප්‍රත්‍යය නමි. එසේම රාගය ගරුකොට සැලකීමෙන් රාගය උපදී' යනාදී ක්‍රමයෙන් අකුශල් උපදින අයුරුද මෙනයින් සලකාගත හැක.

2. අනන්තරූපනිඃශ්‍රය: අතරක් නැතිව බලවත් ලෙස උපකාර වන ධර්මයු අනන්තරූපනිඃශ්‍රය නමි. මෙය අනන්තර ප්‍රත්‍යය හා සමානය.

3. ප්‍රකෘතොපනිඃශ්‍රය: ඒ ඒ සත්ත්වසන්තානයන්හි ඉපදීම්, සේවනය කිරීම්, වශයෙන් පවතින ශ්‍රද්ධාදී කුශල ධර්ම, රාගාදී ක්ලේශධර්ම, හා බාහිර වශයෙන් බලවත් ලෙස ගැනෙන ඍතු භෝජනාදිය බොහෝ සෙයින්ම උපකාර වීමේ ශක්ති විශේෂය ප්‍රකෘතොපනිඃශ්‍රය නමි. ශ්‍රද්ධාව නිසා දන්දීම් ආදිය ද සිදුකෙරෙයි. රාගාදී කෙලෙස් ද උපදවයි. එවිට ශ්‍රද්ධාව කුශල ධර්මයටත් අකුසල ධර්මයටත් උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මෙවැනි අවස්ථා ප්‍රකෘතොපනිඃශ්‍රය බව දතයුතු.

නිද්දෙසපාඨය: "උපනිස්සය පච්චයොති පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො, පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං කෙසඤ්චි -පෙ- අබ්‍යාකතානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො, පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං -පෙ-, කුසලානං ධම්මානං කෙසඤ්චි -පෙ- අබ්‍යාකතානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො, පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං -පෙ- කුසලානං ධම්මානං අකුසලානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො, උතුභොජනම්පි -පුග්ගලොපි- සෙනාසනම්පි උපනිස්සය පච්චයෙන පච්චයො"

විභඞ්ගවාරය: උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙහි ආරම්මණ, අනන්තර, ප්‍රත්‍යවිභඞ්ග දෙක පෙර දක්වූ පරිච්ඡේදෙන් සලකාගතයුතුය. මෙහි දී දක්වනුයේ ප්‍රකෘතෝපනිඃශ්‍රය පමණි.

1. පාළිය : කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො -පකතූපනිස්සයො”

අනුවාදය : ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා, මේ ධර්ම උප නිඃශ්‍රය කොට දන් දෙයි. සිල් සමාදන් වෙයි. පෙහෙවස් වෙසෙයි. ධ්‍යාන උපදවයි විදර්ශනා උපදවයි. මාර්ග - අභිඥා සමාපත්ති උපදවයි. මේ ශ්‍රද්ධාදී කුසල ධර්මයෝ ශීලාදී කුසල ධර්මයන්ට උපනිඃශ්‍රය ප්‍රත්‍යශක්තියෙන් උපකාර වේ. ප්‍රථම ධ්‍යානයාගේ පරිකර්මය ප්‍රථම ධ්‍යානයට උපනිඃශ්‍රය ප්‍රත්‍යශක්තියෙන් උපකාර වන්නා සේ ධ්‍යාන අට පිළිබඳ පරිකර්ම ඒ ඒ ධ්‍යානයටද, නැවත එක් එක් ධ්‍යාන ඊලඟ ධ්‍යානයට ද, උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. දිව්‍ය චක්ෂුරභිඥානය උපදවා ගැනීමට කරනු ලබන පරිකර්ම භාවනාව ඒ ඥානයට ප්‍රත්‍ය වන්නා සේ දිව්‍ය ශ්‍රොත්‍ර ඍද්ධිවිධ, පරචිත්තවිජානන, පූර්වේනිවාසානුස්මෘති, යථාකම්මූපග, අනාගතාංශ, යන ඥානයන්ගේ පරිකර්ම, ඒ ඒ ඥානයන්ට ද, උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. නැවතත් ඒ ඒ ඥානය අතික් අතික් ඥානයකටද උපනිඃශ්‍රය ප්‍රත්‍යවේ.

එසේ ම මාර්ග ඥානයන්ගේ පරිකර්ම ද, මාර්ගද පිළිවෙලින් ඒ ඒ මාර්ගයට හා ඊලඟ ඊලඟ මාර්ගයට උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. තවද ශෛක්‍ෂයන් වහන්සේ මාර්ග ඥානය නිසා, ඒ අසුරු කොට නූපන් ප්‍රථම ධ්‍යානාදී සමාපත්ති උපදවත්. උපද වූ සමාපත්තීන්ට සමවදිත්. සංස්කාර ධර්ම අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරත්. මෙසේ මාර්ග ඥාන කුසල ධර්ම ඉපදවීමට උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. ශෛක්‍ෂයන්ගේ මාර්ග ඥාන චතුපටිසම්භිදාවන්ගේ ප්‍රතිලාභය පිණිසද, ස්ථාන අස්ථාන දැන ගන්නා ඥානය පිණිස ද, උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ.

2. පාළිය : “කුසලො ධම්මො අකුසලස්සධම්මස්ස උප නිස්සය පච්චයෙන පච්චයො = පකතූපනිස්සයො”

අනුවාදය : ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා, මේ පඤ්චධර්ම උපනිඃශ්‍රය කොට මානය මතුවෙයි. - උපදවයි - දිට්ඨිය ගනියි.

එවිට ශ්‍රද්ධාදී කුශලධර්ම රාග, දෝස, මෝහ, මාන, දිට්ඨි, පත්ථනා, කෙලෙස්වලට උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. මේ කුසල ධර්ම උපනිඃශ්‍රය වී අකුසල ධර්ම ඉපදීමයි

3. විපිය: "කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උප නිස්සය පච්චයෙන පච්චයො - පකතූපනිස්සයො"

අනුවාදය : ශ්‍රද්ධාදී පඤ්චධර්ම උපනිඃශ්‍රය කොට තමා තවයි. කාය්පසින්ම තවයි. (පින් කිරීමට ඇති ලැදියාව නිසා වෙහෙස නොබලා කටයුතු කිරීමයි.) ධ්‍යානාදිය සෙවීමට දුක් විඳියි. මේ නිසා ශ්‍රද්ධාදී කුශල ධර්මයෝ කායිකවූ සැපයට, දුකට, ඵලසමාපත්තියට, උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. කුශල කර්මය එහි විපාකයට උප නිඃශ්‍රය ප්‍රත්‍යය වේ. රහතන් වහන්සේ මාර්ගය උපනිඃශ්‍රය කොට නූපන් ධ්‍යාන ක්‍රියා සමාපත්ති උපදවයි. සමවදියි. සංස්කාරයන් විදර්ශනා කරයි. එවිට අර්හත් මාර්ග සමාපත්ති ආදීනට උපනිඃශ්‍රය ප්‍රත්‍ය වේ එසේ ම අර්හත් මාර්ග රහතන් වහන්සේට චතු පටිසම්භිදා ඉපදවීමට හා ස්ථාන අස්ථාන ඥානය පිණිස ද, ඵල සමාපත්ති පිණිස ද, උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. මෙහි චතුපටිසම්භිදා ඤාණ කාමාවචර මහා ක්‍රියා සතරට අනුව පවතින බව දතයුතු.

4. විපිය "අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස උප නිස්සය පච්චයෙන පච්චයො"

අනුවාදය : "රාගං උපනිස්සාය පාණං හනති, අදින්නං ආදියති" ආදී වශයෙන් අකුශල ධර්ම ඇසුරු කොට කරන්නා වූ පාපධර්ම මාලාවක්ම මෙහිලා ඇතුලත්වේ. එහි සාරාංශය මෙසේය. සතුන් මැරීම ආදී පාපකර්මද, මව් මැරීම ආදී ගරුපාප පඤ්චකයද සිදුකරනුයේ රාග, දෝස, මෝහ, මාන, දිට්ඨි, පත්ථනා, යන පාප ධර්ම නිසාය. එහෙයින් ඒ පාපධර්ම ඒ පාපධර්මයනට ම උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. එසේම සතුන් මැරීම ආදී පාපධර්ම පිළිවෙලින් නැවත නැවත සිදුකරන පාපකර්මයනට උපනිඃශ්‍රය ප්‍රත්‍ය ශක්තිය ලැබේ. එක් සතෙකු මැරූ පසු ඒ මිනිසාට අනික් සතා මැරීම පහසු දෙයකි. ඒ පහසුව ලැබුනේ උපනිඃශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන්ය. සෙසු පාපකර්ම ද මෙසේ සැලකිය යුතු. විශේෂයෙන් ආනන්තරිය පාපකර්ම පසට නියත මිථ්‍යාදෘෂ්ටිය බලවත් උපකාරයකි.

5. විපිය: "අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස් සය පච්චයෙන පච්චයො - පකතූපනිස්සයො" (ආරම්මණ, අනන්තර, දෙක නොලැබේ.)

අනුවාදය "රාගං උපනිස්සාය දානං දෙති" යනාදී වශයෙන් දක්වෙන පරිදි රාග, දොස, මොහ, මාන, දිට්ඨි, පත්‍ථනා, යන අකුශල ධර්මයන් ඇසුරු කොට දානාදී පින් කරයි. ධ්‍යාන උපදවයි. මාර්ග - අභිඥා - සමාපත්ති උපදවයි. ඒ පින්කම්හි ඇත්තේ ශ්‍රද්ධා, ශීල ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා, යන පඤ්චධර්මයෝයි. එහෙයින් රාගාදීහු ශ්‍රද්ධාදීන්ට උපනිඃශ්‍රය ප්‍රත්‍යය ශක්තිය දෙත් තවද සතුන් මැරීම ආදී පාපකර්ම කොට, (ආනන්තරිය හැරයි) ඒවා වැලැක්වීම පිණිස දානාදී පින් කරයි. ධ්‍යාන - මාර්ග අභිඥා - සමාපත්ති උපදවයි මේ අවස්ථාවන්හි ද ඒ ප්‍රත්‍ය ශක්තිය ලැබේ. ආනන්තරිය පාපකර්ම කොට ඒවායේ විපාකයන් ගෙන් ගැලවීමට දන් දෙයි සිල් රකියි. පෙහෙවස් වෙසෙයි. මේ අවස්ථාවන්හි ආනන්තරිය කර්ම දානාදීනට උපනිඃශ්‍රය ප්‍රත්‍ය ශක්තිය ලැබේ. සැලකිය යුතු - ආනන්තරිය පාපකර්ම කළහුට ධ්‍යානාදී උසස් ගුණ නූපදවිය හැකි. කර්මාවරණ හෙයිනි එහෙයින් දාන, ශීල, උපොසථ පමණක් දේශනා කරන ලදී.

6 විධිය : "අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො - පකතූපනිස්සයො"

අනුවාදය : භූතන කී රාගාදීන් ඇසුරු කොට තමා තවයි. තාත්පසින් තවයි. සෙවීම් මුල්කොට ඇති දුක අනුභව කරයි. මෙසේ රාගාදීහු කායික වූ සැපයට හා දුකට, එසේම ඵලසමාපත්තියට උපනිඃශ්‍රය ප්‍රත්‍යයවේ.

7 විධිය. "අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො - පකතූපනිස්සයො"

අනුවාදය : 'කායිකං සුඛං කායිකස්ස සුඛස්ස කායිකස්ස දුක්ඛස්ස ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො" යනුවෙන් සඳහන් වූ පරිදි කායික වූ සැප, දුක්, හා සේනාසන, ඍතු භොජන, මේවා කායිකවූම සැප - දුක් වලට හා ඵලසමාපත්තියට උපනිඃශ්‍රය ප්‍රත්‍යය ශක්තිය ලැබේ. රහතන් වහන්සේ කායික වූ සැපය නිසා විදර්ශනා සමාපත්ති උපදවත්. එසේම කායික වූ දුක් නිසා, ඍතු භොජන, සේනාසන නිසා ද පෙරකී අව්‍යාකෘත ධර්ම උපදවත්. එවිට ඒ ඒ අව්‍යාකෘත ධර්ම අව්‍යාකෘත වූ ධර්මයනටම උපනිඃශ්‍රය ප්‍රත්‍ය ශක්තිය ලැබේ.

8. විග්‍රහය: අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො - පකතූපනිස්සයො"

අනුවාදය: පෙර සඳහන් වූ කායික වූ සැප- දුක්, හා සේනාසන, සෘතු, භොජනාදිය, නිසා ශීලාදී කුශල ධර්ම උපදවයි. එවිට ඒ අව්‍යාකෘත ධර්ම ශ්‍රද්ධාදී කුශල පඤ්චකයට උපනිඃශ්‍රය ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

9. "අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො - පකතූපනිස්සයො.

කෙටි අනුවාදය: අව්‍යාකෘත ධර්ම නිසා ඉහත සඳහන් සතුන් මැරීම ආදී පාපකර්ම කරයි. එවිට කායික වූ සැප ආදී ද පාප ධර්මයනට උපනිඃශ්‍රය ප්‍රත්‍ය ශක්තිය ලැබේ.

විභඞ්ග වාරය නිමි.

පටිච්ච සමුප්පාදයෙහි අවිද්‍යාව සංස්කාරයන්ට ද, සංස්කාර විඥානයටද, ඵස්ස වෙදනාවට ද, වෙදනාව තෘෂ්ණාවට ද, තෘෂ්ණාව උපාදානයටනද උපාදාන භවයට ද, භව ජාතියට ද ජාති ජරාමරණයට ද උපනිඃශ්‍රය ප්‍රත්‍යය වෙයි.

## 10 පුරෙජාත ප්‍රත්‍යය.

ප්‍රත්‍යොත්පන්නයට පළමු ඉපදීම් වශයෙන් උපකාර වන ප්‍රත්‍ය ශක්තිය පුරොජාත නම්. "පච්චුප්පන්නතො පුබ්බෙජාතො පුරෙජාතො" ප්‍රත්‍යොත්පන්නයට සඳහා පූර්වයෙන් හටගත්තේ පුරෙජාතයැයි විග්‍රහ වේ. ඵල හටගැනීම සඳහා ඊට පෙර හට ගත්තාවූ මල්රාශිය මෙනි. චක්ඛායතනාදී ආයතන ධර්ම, හෘදය වස්තුව, මෙහිප්‍රත්‍යය ධර්ම වශයෙන් පවතී.

නිද්දෙස වාරය: "පුරෙජාත පච්චයොති චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො, සොතායතනං -පෙ- කායායතනං -පෙ- රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො, සද්දායතනං -පෙ- පුරෙජාත පච්චයෙන පච්චයො, රූප - සද්ද - ගන්ධ-රස- ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො, යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණ ධාතුච

වත්තන්ති තං රූපං (හදයවත්ථු) මනොධාතුයා ච, සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො, මනොවිඤ්ඤාණධාතුයා ච සම්පයුත්තකානඤ්ච ධම්මානං කිඤ්චි කාලෙ පුරෙජාත පච්චයෙන පච්චයො, කිඤ්චි කාලෙන පුරෙජාත පච්චයෙන පච්චයො''

චක්ඛු ආදී ආයතන පස්දෙනා, තම තමාට අයත් විඤ්ඤාණයන්ට හා ඒ සමඟ යෙදෙන චෛතසිකයනටද පුරෙජාත ප්‍රත්‍යය වේ. රූපායතනාදී බාහිරායතන පස්දෙනාද එසේ මය ඒ බාහිරායතන පස්දෙනා මනො ධාතුවට හා ඒ සමග උපදින චෛතසිකයනට ද පුරෙජාත ප්‍රත්‍යය වේ. හෘදය වස්තු රූපය මනො ධාතුවට හා ඒ සමග යෙදෙන චෛතසිකයනට පුරෙජාත ප්‍රත්‍යය වන අතර මනොවිඤ්ඤාණ ධාතුවට හා ඒ සමග යෙදෙන චෛතසිකනට ප්‍රත්‍යය වනුයේ ඇතැම් කාලයක පමණි. ප්‍රවෘත්ති කාලය සඳහා කියවිණි.

විභඞ්ග වාරය: පුරෙජාත ප්‍රත්‍යය දෙවැදෑරුම්ය. ආරම්මණ පුරෙජාත, වස්තු පුරෙජාත, යනුයි. ආරම්මණ පුරෙජාත ප්‍රත්‍යය විධිය ආරම්මණ ප්‍රත්‍යයෙහි දක් වූ අව්‍යාකෘත ධර්ම අව්‍යාකෘත ධර්මයනට උපකාර වන අයුරු වශයෙන් දත යුතුය. වස්තු පුරෙජාත ප්‍රත්‍යය මෙසේය.

විධිය ''අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස -පෙ- කුසලස්ස ධම්මස්ස -පෙ- අකුසලස්ස ධම්මස්ස පුරෙජාත පච්චයෙන පච්චයො''

අනුවාදය අධ්‍යාත්මික ආයතන පස්දෙනා, බාහිරායතන පස්දෙනා, දෙපස් විඤ්ඤාණයන්ට පිළිවෙළින් පුරෙජාත ප්‍රත්‍යය ලැබේ. හෘදය වස්තුව විපාක ක්‍රියාවූ නාමස්කන්ධයන්ට පුරෙජාත ප්‍රත්‍ය ශක්තිය ලැබේ. හෘදය වස්තු රූපය කුශල ස්කන්ධ වූ ද අකුශල ස්කන්ධවූ ද නාමස්කන්ධයන්ට පුරෙජාත ප්‍රත්‍ය ශක්තිය ලැබේ.

පටිච්ච සමුප්පාදයෙහි නාමරූප අතුරෙන් චක්ඛායතනනාදී පස්දෙනා හා හදයවත්ථු රූපය මනායතනයටද, සළායතන ඵස්සයට ද, පුරෙජාත ප්‍රත්‍යය වෙයි.

## 11 පච්ඡාජාත ප්‍රත්‍යය

පසුව උපදින්නා වූ චිත්ත - චෛතසිකයන් පෙර උපන් රූප කයට ප්‍රත්‍යයවීම පච්ඡාජාත ප්‍රත්‍යය නම්. ගිජුලිහිණි පැටවුන්ගේ ආහාර ආශාව නිසා ආහාර ගැනීමට පෙරදි වැඩීමට උපකාර වන්නා සේය.

නිද්දෙස වාරය: "පච්ඡාජාත පච්චයොති පච්ඡාජාතා චිත්ත චෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත පච්චයෙන පච්චයො"

අනුවාදය: (විභඞ්ග වාරය) මෙහි ප්‍රත්‍යයොත්පන්න ධර්ම අව්‍යාකෘත හෙයින් කුශල, අකුශල, අව්‍යාකෘත වූ විපාක ක්‍රියා නාමස්කන්ධයන් පෙර උපදින්නා වූ මේ ශරීරයට පච්ඡාජාත ප්‍රත්‍ය ශක්තිය ලැබෙන බව දත යුතු. මේ වනාහි උපස්ථම්භක ප්‍රත්‍යයෙකි. පැවැත්මට පමණක් උපකාර වේ. පටිච්ච සමුප්පාද යෙහි පෙර උපන්නාවූ චක්ඛායතනාදී රූපධර්මයන්ට පසුව උපදින්නාවූ චක්ඛුවිඤ්ඤාණාදී නාම ධර්ම ප්‍රත්‍යය වන බව දතයුතු.

## 12 ආසෙවන ප්‍රත්‍යය.

"ආ පුනප්පුනං සෙවතීති ආසෙවනා" පැමිණ නැවත නැවත සේවනය කෙරේනුයි ආසෙවන නම්. නැතහොත් නැවත නැවත පැමිණ සේවනය කළ යුත්තේනුයි ආසේවනයයි. යම් ධර්ම විශෙෂයක් යම්කිසි ධර්ම විශේෂයකට පැමිණීමෙන් නැවත නැවත උපකාරවීමෙන් ප්‍රත්‍ය ශක්තිය ඇති කෙරෙයි ද ඒ ධර්ම ශක්තිය ආසෙවන ප්‍රත්‍ය නම්. සුවඳ දුමින් යම් තැනක් සුවඳවත් කළ පසු නැවත නැවත සුවඳ දුම් ඇල්ලුවහොත් වඩාත් සුවඳවත් වේ. එමෙන් පළමු පළමු ජවනයන්ගේ ආසේවනය ලැබීමෙන් පසු පසු ජවන් සිත් වඩාත් බලවත් භාවයට පත්වෙයි. ආසේවනය ශක්තිය ලැබෙනුයේ සමාන ජාති ඇති ධර්මයන්ට පමණි.

නිද්දෙස වාරය: "ආසෙවන පච්චයොති පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො, පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො, පුරිමා පුරිමා කිරියාබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කිරියාබ්‍යාකතානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො"

මෙහිදී විපාක වූ නාමස්කන්ධ නොලැබෙන බව දතයුතු. එසේම රූප ධර්මයනුදු නො ගැනේ. චිත්ත පරම්පරාවේ අන්තිම ජවන ද අත හැරේ. ඉතිරි කුශල, අකුශල, ක්‍රියා සිත් හා චෛතසික ධර්ම ප්‍රත්‍යය වන අතර, ප්‍රථම ජවනය හා විපාක ස්කන්ධ හැර ඉතිරි නාමස්කන්ධ ප්‍රත්‍යයොත්පන්න ධර්ම වෙයි.

විභඞ්ග වාරය: පූර්ව පූර්ව වූ කුශලස්කන්ධ පශ්චිම පශ්චිම වූ කුශලස්කන්ධයන්ට ද, අනුලෝමය ගෝත්‍රභූ සිතට හා වොදාන

සිතට ද, ගෝත්‍රභූ සිත මාර්ගයට ද, වෝදාන සිත මාර්ගයට ද, ආසේවන ප්‍රත්‍ය ශක්තිය ලැබේ. පූර්ව පූර්ව වූ අකුශල ස්කන්ධ පසු පසු අකුශල ස්කන්ධයන්ට ද, පූර්ව පූර්ව වූ ක්‍රියාස්කන්ධ පසු පසු ක්‍රියාස්කන්ධයන්ට ද, ආසේවන ප්‍රත්‍ය ශක්තිය ලැබේ.

පටිච්චසමුප්පාදයෙහි අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාරයන්ට දෙවැනි තුන්වැනි ජවනයන්හි දී ආසේවන ප්‍රත්‍ය වේ.

## 13 කම්ම ප්‍රත්‍යය:

චිත්ත චෛතසිකයන් පිළිවෙළ කිරීම් වශයෙන් නාම ධර්මයන්හි යෙදෙන ශක්ති විශේෂය "චේතනා" නමැයි පෙරදීම කියැවිණ. ඒ චේතනා ධර්මය සෙසු එක්ව උපදින නාමස්කන්ධයන්ට ද, චිත්තජ රූපයන්ට ද, මතු විපාක වශයෙන් උපදනා නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ද, උපකාර වීම කර්ම ප්‍රත්‍ය නම්. සහජාත; නානාක්ෂණික, යනුවෙන් කර්ම ප්‍රත්‍ය දෙවැදෑරුම්ය. එක්ව උපදනා නාමස්කන්ධයන්ට ප්‍රත්‍ය ශක්තිය ලැබීම සහජාත කර්ම ප්‍රත්‍යය නම්. මතු විපාක හා කර්මජ රූප මේවාට ප්‍රත්‍ය ශක්තිය ලැබීම නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයයි.

නිද්දෙස පාඨය: 'කම්මපච්චයොති කුසලාකුසලකම්මං විපාකානං ඛන්ධානං කටත්තා ච රූපානං කම්මපච්චයෙන පච්චයො, චේතනා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං කම්මපච්චයෙන පච්චයො"

කුශල වූද අකුසල වූ ද කර්ම, එයට අනුරූප වූ විපාකයන්ට හා නාමස්කන්ධයන්ට ද, කර්මජ රූපයන්ට ද කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මේ නානාක්ෂණික කර්මයි. චේතනාව එක්ව යෙදුනු නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ද කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ, මේ සහජාත කර්මයි.

සහජාත කර්ම ප්‍රත්‍යය හා ප්‍රත්‍යයොත්පන්නයෝ:- සිත් අසූනවයෙහි ඇති "චේතනා" චෛතසිකය ප්‍රත්‍යයයි සිත් අසූනවය හා චිත්තජ රූප, චෛතසික අටතිස, ප්‍රතිසන්ධි කර්මජ රූප, ප්‍රත්‍යයොත්පන්නයෝයි.

නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය නම් අතීත වූ කුශලාකුශල චේතනා තෙතිස (33) යි. ප්‍රත්‍යයොත්පන්නයෝ නම් විපාක සිත් සතිස, චෛතසික අටතිස' ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කර්මජ රූප, අසඤ්ඤසත්ත කර්මජ රූප, යන මොහුයි.

## විභඞ්ග වාරය:

1. පාළිය: කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො. අනුවාදය: කුශල වූ චේතනාව ඒ හා යෙදෙන නාමස්කන්ධයන්ට කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ.

2. පාළිය: කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො, සහජාතා නානාක්ඛණිකා’’

කුශලචේතනා චිත්තසමුට්ඨාන රූපයන්ට කර්ම ප්‍රත්‍යය වේ. මේ සහජාතයි. නානාක්ෂණික කුශලචේතනා එක්ව යෙදුනු නාමස්කන්ධයන්ට ද කම්මජ රූපයන්ටද කර්ම ප්‍රත්‍යයවේ.

3. පාළිය: ‘‘කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස කම්මපච්චයෙන පච්චයෙන පච්චයො’’

අනුවාදය: කුශලචේතනා ඒ හා යෙදුනු නාමස්කන්ධයන්ටද චිත්තජරූපයන්ටද ප්‍රත්‍ය වේ.

අකුශලපක්ෂය මේ අයුරින් සිතාගැනීමට පුළුවන.

7. පාළිය: අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස-

අනුවාදය: විපාක, ක්‍රියා වූ චේතනා එක්ව යෙදුනු නාමස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ටද, ප්‍රතිසන්ධි ක්ෂණයෙහි ලැබෙන විපාකචේතනා එක්ව යෙදුනු නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ටද, හෘදයවස්තු රූපයටද, කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

පටිච්ච සමුප්පාදයෙහි සංස්කාර විඤ්ඤාණයටද, කර්මභවය ජාතියටද කර්ම ප්‍රත්‍යය ලැබේ.

## 14. විපාක ප්‍රත්‍යය:

කළාවූ කුශලාකුශල කර්ම පැසීමට පත්වීම විපාක නම්. එනම් මේරීමට පත්වීමයි. එසේ මේරීම වශයෙන් ඉදිරිපත්වන ප්‍රත්‍ය ශක්තිය විපාක ප්‍රත්‍යය නම්. බීජයෙන් නැගෙන අංකුරය විශාල වෘක්ෂයක් වන්නාක් මෙනි. සත්වයා විසින් කරනු ලබන කුශලාකුශලකර්ම පැසීම් බවට පත්වූ පසු ලැබෙන විපාක ශක්තිය උපකාරවන අයුරු මෙයින් පැහැදිලිකෙරේ.

නිද්දෙසවාරය: විපාකපච්චයොති විපාකා චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං විපාක පච්චයෙන පච්චයො’’

විභඞ්ගවාරය; අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස විපාක පච්චයෙන පච්චයො”

අනුවාදය: විපාකවූ එක් නාමස්කන්ධයක් නාමස්කන්ධ ත්‍රයට හා චිත්තජරූපයන්ටද නාමස්කන්ධ තුනක් එක් නාමස්කන්ධයකට හා චිත්තජ රූපයන්ට, නාමස්කන්ධ දෙකක් නාමස්කන්ධ දෙකකට හා චිත්තජ රූපයන්ටද, විපාක ශක්තියෙන් උපකාරමේ. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විපාකවූ නාමස්කන්ධයක් නාමස්කන්ධ තුනකට හා චිත්තජ රූපයන්ටද යනාදී වශයෙන් විස්තරවෙයි· විපාකවූ නාමස්කන්ධ හෘදය වස්තුවටද විපාක ප්‍රත්‍ය ශක්තිය ලැබේ.

පටිච්චසමුප්පාදයෙහි විඥානය නාමරූපයටද, නාමරූප සළායතනයටද සළායතන ඵස්සයට ද, ඵස්සවේදනාවටද විපාක ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවේ.

## 15. ආහාර ප්‍රත්‍යය:

“ඔජට්ඨමකරූපාදයො ආහරන්ති ති ආහාරො” අටවැනි ඕජාරූපය ඇතුළු රූපාදීහු එළවාතුයි - පැමිණේ යන තේරුමය. ආහාරනම්. ආහාරය දෙවැදෑරුම්ය රූපාහාරය; නාමාහාරය යනුයි. ඔජට්ඨමක ආහාරය රූපාහාරයි නාමාහාරය තෙවැදෑරුම්ය ඵස්ස, මනොසඤ්චෙතනා, විඤ්ඤාණ යනුයි. ඵස්සාහාරය නම් ඵස්ස චෛතසිකයයි චෙතනා චෛතසිකය චෙතනාහාරයි සිත විඤ්ඤාණාහාර නම්.

නිද්දෙසවාරය: “ආහාර පච්චයොති කබලිඞ්කාරො ආහාරො ඉමස්ස කායස්ස ආහාර පච්චයෙන පච්චයො, අරූපිනො ආහාරා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ආහාරපච්චයෙන පච්චයො” කබලිඞ්කාර ආහාරයවූ ඔජට්ඨමක රූපය මේ කයට ආහාර ප්‍රත්‍යය වේ. අරූපීවූ ඵස්සාදීහු ඒ සමඟ යෙදෙන නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද ආහාර ප්‍රත්‍යය වෙත්.

විභඞ්ග වාරයෙහිදී ප්‍රත්‍යය විස්තරය, කුශල් අකුශල් අව්‍යාකෘතවූ විපාක යන ධර්මයන්ට අනුව ඒ සමග යෙදෙන නාමස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ටද, විශෙෂයෙන් ප්‍රතිසන්ධි ක්ෂණයෙහිදී කර්මජ රූපයන්ට ද, කබලිංකාරාහාරය මේ ශරීරයට ද ප්‍රත්‍යය වන අයුරු පැහැදිලි කෙරේ.

පටිච්චසමුප්පාදයෙහි විඤ්ඤාණය නාමරූපයට ද, නාමරූප සළායතනයටද, සළායතන ඵස්සයට ද, ආහාර ප්‍රත්‍යය වන්නේය

## 16. ඉන්ද්‍රිය ප්‍රත්‍යය:-

ඉන්ද්‍රියභාවයෙන් උපකාරවනුයේ ඉන්ද්‍රිය ප්‍රත්‍යය නම් ඉන්ද්‍රිය පෙරදී විස්තර කර ඇත. එහි දක්වූ දෙවිසි ඉන්ද්‍රියන් අතුරෙන් ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය දෙක හැර ඉතිරි විස්ස මේ ප්‍රත්‍යයට අයුවේ.

නිද්දෙසවාරය: ඉන්ද්‍රිය පච්චයෝති චක්ඛුන්ද්‍රියං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො, සොතින්ද්‍රිය-පෙ ඝාණින්ද්‍රියං -පෙ- ජිව්හින්ද්‍රියං - පෙ - කායින්ද්‍රියං - පෙ-; රූපජීවිතින්ද්‍රියං කටත්තාච රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො, අරූපිනො ඉන්ද්‍රියා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො'' අවසනමැයි.

විභඞ්ගවාරය: කුශල අකුශල ඉන්ද්‍රිය ධර්මයෝ ඒ ඒ නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ද, ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තිය දෙත්. කුශල ඉන්ද්‍රියයන් අකුශල ඉන්ද්‍රියකට හෝ එවැනි නාමස්කන්ධයකට හෝ ප්‍රත්‍යය නොවන බව සලකත්න.

විපාක' ක්‍රියා, වූ අව්‍යාකෘත ඉන්ද්‍රියයෝ ඒ සමග යෙදෙන නාමස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ටද, ප්‍රතිසන්ධික්ෂණයෙහි විපාක ඉන්ද්‍රිය ධර්ම ඒ සමඟ යෙදෙන නාමස්කන්ධයන්ට හා කර්මජරූපයන්ටද, චක්ඛුන්ද්‍රියාදී ඉන්ද්‍රිය පඤ්චකය ඒ ඒ විඤ්ඤාණයන්ට හා චෛතසිකයන්ට හා චෛතසිකයන්ටද, රූපජීවිතින්ද්‍රිය කර්මජ රූපයන්ටද, ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවේ.

පටිච්චසමුප්පාදයෙහි විඤ්ඤාණ නාමරූපයනටද, නාමරූප සළායතනයටද, සළායතන ඵස්සයට ද ඉන්ද්‍රිය ප්‍රත්‍යයවේ.

## 17. ධ්‍යාන ප්‍රත්‍යය:

ධ්‍යාන පිළිබඳ විස්තරයක් ඉහතදී දක්වා ඇත. ප්‍රත්‍යය වශයෙන් උපකාරවන ධ්‍යානාඞ්ග සතකි. විතර්ක, විචාර, ප්‍රීති, ඒකාග්‍රතා, සෝමනස්ස, දොම්නස්ස, උපෙක්ෂා යනුයි. මේ ධ්‍යානාඞ්ග,

සත් සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා තත් සමුත්ථාන රූපයන්ටද, ප්‍රත්‍යයවේ. විපාකවූ අහේතුක සිත්හි ඇති සුඛ සහගත කාය විඤ්ඤාණය, දුක්ඛ සහගත කායවිඤ්ඤාණය, දෙක්හිවූ සුඛ, දුක්ඛ, ධ්‍යානාඞ්ගයන් නොවන බව දතයුතු.

නිද්දෙසවාරය: ඣානපච්චයොති ඣානඞ්ගානි ඣාන සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ඣාන පච්චයෙන පච්චයො”

විභඞ්ගවාරය: (සංක්ෂෙපයෙනි)

‘කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස ඣානපච්චයෙන පච්චයො, අකුසලො ධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස ඣානපච්චයෙන පච්චයො, අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ඣාන පච්චයෙන පච්චයො”

අනුවාදය: කුශලවූ ධ්‍යානාඞ්ගයෝ ඒ සමග යෙදෙන නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ද, අකුශලවූ ධ්‍යානාඞ්ගයෝ ඒ සමග යෙදෙන නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද විපාකවූද ක්‍රියාවූද ධ්‍යානාංගයෝ ඒ සමග යෙදෙන නාමස්කන්ධයන්ට හා ප්‍රතතජ රූපයන්ට ද, ප්‍රතිසන්ධික්ෂණයෙහිදී විපාකය ධ්‍යානාංගයෝ ඒ සමග යෙදෙන නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ටද, ධ්‍යාන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙත්.

## 18. මග්ග ප්‍රත්‍යය:

“සුගතියංවා දුගතියංවා නිබ්බාණස්සවා අභිමුඛං මග්ගන්ති පාපෙන්තීති මග්ගා” සුගතියට හෝ දුර්ගතියට හෝ නිර්වාණයට හෝ අභිමුඛකොට පමුණුවාලුයි මාර්ග නම්. මෙසේ හෙයින් ඒ තත්වයට පත්කිරීම් වශයෙන් ප්‍රත්‍යය වන්නේ මාර්ග ප්‍රත්‍යය නමැයි දතයුතු. ඊට මාර්ගාංග දොළොසක් අයත්වේ. සම්මාදිට්ඨි, සම්මා සඞ්කප්ප, සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සුගතිගාමී හෝ නිර්වාණගාමී අට හා මිච්ඡාදිට්ඨි, මිච්ඡාසඞ්කප්ප මිච්ඡාවායාම, මිච්ඡා සමාධි යන දුර්ගතිගාමී සතරත්ය. මොව්හු තමා සමග යෙදෙන නාමස්කන්ධයන්ටත්, චිත්තජරූපයන්ටත් මාර්ග ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවේ.

නිද්දෙසවාරය; “මග්ගපච්චයොති මග්ගඞ්ගානි මග්ග සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං මග්ගපච්චයෙන පච්චයො”

විභඞ්ගවාරය: කුසලො ධම්මො කුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස මග්ගපච්චයෙන පච්චයො'' යනාදී වශයෙන් ධ්‍යාන ප්‍රත්‍යය විභඞ්ගවාරය මෙන් දක්වෙයි. වෙනස: ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි ප්‍රත්‍ය වන අයුරු මෙහි නො යෙදීම පමණි,

## 19. සම්පයුත්ත ප්‍රත්‍යය:

එක්ව යෙදීම් වශයෙන් උපකාරවීමේ ශක්ති විශෙෂය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය නමි. එක්ව යෙදෙනුයේ නාම ධර්ම පමණි.

නිද්දෙස වාරය: සම්පයුත්තපච්චයොති චත්තාරොඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සම්පයුත්තපච්චයෙන පච්චයො''

විභඞ්ගවාරය: කුශල්, අකුශල්; අව්‍යාකෘත. ධර්ම වෙතමවෙතම ඒ සමග යෙදෙන සෙසු නාමස්කන්ධයන්ට සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය යෙන් ප්‍රත්‍යයවේ. කුශල්වූ එක් නාමස්කන්ධයක් සෙසු කුශල්වූ නාමස්කන්ධ තුනකට යනාදී ක්‍රමයෙන් ප්‍රත්‍ය පිළිවෙල යෙදේ.

පටිච්ච සමුප්පාදයෙහි අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාරයන්වද, විඥානය නාමයටද, නාමය ෂඩායතනයටද මනායතනය මනො සම්ඵස්සයටද, ඵස්සය වෙදනාවටද, තණ්හාව දිට්ඨුප්පාදනාදීන් යටද, උපාදාන භවයට ද සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ.

## 20. විප්පයුත්තප්‍රත්‍යය

එක්ව නොයෙදීම් වශයෙන් උපකාරවන ශක්ති විශෙෂය විප්පයුක්ත ප්‍රත්‍යය නමි. මෙය රූපීධර්ම හා අරූපීධර්ම අතරත්' අරූපීධර්ම හා රූපීධර්ම අතරත් පවත්නා වෙන්ව පවතින ස්වභාවයකි විප්‍රයුක්ත ප්‍රත්‍යය තෙවැදෑරුමිය, සහජාත පුරෙ ජාත, පච්ඡාජාත යනුයි. විභංගයේදී පැහැදිලිවෙයි.

නිද්දෙසවාරය: විප්පයුත්ත පච්චයොති රූපිනො ධම්මා අරූපිනං ධම්මානං විප්පයුත්ත පච්චයෙන පච්චයො අරූපි නො ධම්මා රූපීනං ධම්මානං විප්පයුත්ත පච්චයෙන පච්චයො''

විභඞ්ගවාරය: ''කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො, සහජාතං පච්ඡාජාතං''

අනුවාදය: කුශලවූ නාමස්කන්ධ, ඒ නාමස්කන්ධයන්ගෙන් හටගත්තාවූ චිත්තජරූපයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තිය ලැබේ. මේ සහජාත වශයෙනි. කුසල වූ නාමස්කන්ධ පෙර හටගත්තා වූ මේ ශරීරයට විප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මේ පච්ඡාජාත වශයෙනි.

අකුශල පද වාරයද මේ අනුව සිතාගන්න.

"අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො සහජාතං පුරෙජාතං පච්ඡාජාතං"

අනුවාදය: සහජාතවූ විපාක, ක්‍රියා, නාමස්කන්ධ ඒවායින් හටගත්තාවූ චිත්තජ රූපයන්ටද ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විපාකවූ නාමස්කන්ධ කම්ජ රූපයන්ටද හෘදයවස්තුව නාමස්කන්ධයන්ටද, විප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තිය ලැබේ. පුරෙජාතවූ චක්ඛායතනාදී ආයතන පස්දෙන, ඒ ඒ විඤ්ඤාණයන්ටද, වස්තුරූපය විපාක, ක්‍රියා නාමස්කන්ධයන්ටද, විප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තිය ලැබේ. පච්ඡාජාතවූ විපාක, ක්‍රියා, නාමස්කන්ධ, පුරෙජාතවූ ශරීරයට විප්‍රයුක්ත ප්‍රත්‍යය ලැබේ.

"අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො පුරෙජාතං"

අනුවාදය: වස්තුරූපය කුශලවූ නාමස්කන්ධයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය ලැබේ. එමෙන් අකුශලවූ නාමස්කන්ධයන්ටද හෘදයවස්තුව විප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තිය ලැබේ.

පටිච්චසමුප්පාදයෙහි විඤ්ඤාණය රූපයටද, රූපය මනායතනයටද, නාමය සළායතනයටද, සළායතනය, ඵස්ස ඵස්සයටද. විප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවේ.

## 21. අත්ථි ප්‍රත්‍යය:

විද්‍යමානභාවයෙන් නාමරූපධර්මයන්ට උපකාරවනුයේ අත්ථි ප්‍රත්‍යය නමි. නාමරූප ධර්ම පැවතීමම ප්‍රත්‍යය ශක්තියෙකි-

නිද්දෙස වාරය: "අත්ථි පච්චයොති චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං අත්ථි පච්චයෙන පච්චයො, චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං අත්ථි පච්චයෙන පච්චයො, ඔක්කන

ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං අත්ථි පච්චයෙන පච්චයො, චිත්ත චෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං -පෙ- මහාභූතා උපාදාය රූපානං -පෙ- චක්ඛායතනං -පෙ-

(මෙතැන්සිට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය මෙනි.)

විභඞ්ගවාරය: වීථිය: කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො'' (සංක්ෂේපයෙනි)

අනුවාදය: කුශලවූ එක් නාමස්කන්ධයක් නාමස්කන්ධ තුනකට හා චිත්තජරූපයන්ටද, නාමස්කන්ධ තුනක් එකකට හා චිත්තජ රූපයන්ටද, දෙකක් දෙකකට හා චිත්තජ රූපයන්ට ද, අස්ති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. (පශ්චාජ්ජාතවූ කුශලස්කන්ධ, පුරෙජාතවූ මේ ශරීරයට අස්ති ප්‍රත්‍යවීම කුශල අව්‍යාකෘත වශයෙන් බව දතයුතු.)

අකුශල පද වාරය මේ අනුව සලකාගත හැකිය.

3. වීථිය: අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො, සහජාතං පුරෙජාතං, පච්ඡාජාතං, ආහාරං, ඉන්ද්‍රියං.

අනුවාදය: i සහජාත ක්‍රමයට;- සහජාතවූ විපාක, ක්‍රියා එක් නාමස්කන්ධයක් නාමස්කන්ධ තුනකට හා චිත්තජ රූපයන්ටද, තුනක් එකකට - පෙර මෙනි - දෙකක් දෙකකට - පෙ - අස්ති ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි විපාකවූ නාමස්කන්ධ ඔවුනොවුනට හා කර්මජරූපයන්ටද ඉහතකී අයුරින් ප්‍රත්‍ය ශක්තිය ලැබේ. විපාකස්කන්ධ වස්තුරූපයටද වස්තු රූපය විපාකස්කන්ධයටද, මහාභූත එකක් තුනකටද ආදී වශයෙන්ද, මහාභූත චිත්තජ-කර්මජ උපාදාය රූපයන්ටද බාහිරවූ ආහාර, ඍතු සමුට්ඨාන, අසඤ්ඤ සත්වයන්ගේ එක් මහාභූතයක් මහාභූත තුනකටද, ආදී වශයෙන්ද, මහාභූත සතරම කර්මජ-උපාදාය රූපයන්ටද, අස්ති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ii පුරෙජාත ක්‍රමයට: ආරම්මණ පුරෙජාත ක්‍රමයමෙනි.

iii පශ්චාජ්ජාත ක්‍රමයට: පසුව හටගත් විපාක පෙර මේ ශරීරයට අස්ති ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

iv ආහාර ක්‍රමයට: කබලීකාහාරය මේ ශරීරයට-

v ඉන්ද්‍රිය ක්‍රමයට: රූපජීවිතින්ද්‍රිය කර්මජ රූපයන්ට අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවේ.

සෙසු ක්‍රම පුරෙජාත පච්ඡාජාතාදීන්ට අනුව දතයුතු. පටිච්ච සමුප්පාදයෙහි අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාරයන්ටද, විඥානය නාම රූපයටද, නාමරූප සළායතනයටද සළායතන ඵස්සයටද, ඵස්සය වෙදනාවටද, තෘෂ්ණාව දිට්ඨුපාදානාදී තුනටද, උපාදාන කර්ම භව යටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ.

## 22. නත්ථි ප්‍රත්‍යය

අවිද්‍යමාන භාවයෙන් උපකාරවීම නාස්ති ප්‍රත්‍යයයි, තමාට පසුව උපදින චිත්ත චෛතසික ධර්මයන්ට අවකාශදීම මෙහි ආකාරයි. සූර්යයාගේ බැස යාම අඳුරේ පැතිරීමට හේතු වන්නාක් මෙනි.

නිද්දෙසය: නත්ථි පච්චයොති සමනන්තර නිරුද්ධා චිත්ත චෙතසිකා ධම්මා පච්චුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං නත්ථිපච්චයෙන පච්චයො.

විභඞ්ගවාරය: අනන්තර ප්‍රත්‍යමෙනි. ප්‍රත්‍යසමුත්පාදයෙහි අවිද්‍යාව දෙවන ජවනාදියෙහිලා අපුණ්‍යාභිසංස්කාරයන්ට නත්ථි වෙයි.

23. විගත ප්‍රත්‍යය: උපන්නාවූ අරූපීධර්ම පසුව උපදින්නාවූ අරූපීධර්මයන්ගේ ඉපදීමට අවකාශ දෙමින් පහව යාම් වශයෙන් උපකාරවීමයි. විස්තර නාස්ති ප්‍රත්‍යය මෙනි.

නිද්දෙසවාරය: විගතපච්චයොති සමනන්තරවිගතා චිත්තචෙතසිකධම්මා පච්චුප්පන්නානං -පෙ -

24. අවිගත ප්‍රත්‍යය: පහව නොයෑම වශයෙන් උපකාර වීමයි. මෙය නාස්ති ප්‍රත්‍ය මෙනි.

පට්ඨාන විස්තරය අවසානය.

# පටිසම්භිදාමග්ගයෙහි දැක්වෙන ධම්මට්ඨිතිඤාණ විස්තරය.

"කෙසේ නම් ප්‍රත්‍යය - ප්‍රත්‍යොත්පන්න ධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණය වේද? අවිද්‍යාව සංස්කාරයන්ගේ ඉපදීමට හේතුවද පැවැත්මට හේතුවද, නිමිත්තනම්වූ හේතුවද, ව්‍යාපාර හේතුවද, සම්බන්ධකිරීමේ හේතුවද, බැඳීමේ හේතුවද, පළිබෝධ හේතුවද, මූලහේතුවද, උපස්ථම්භක හේතුවද, වෙයි. මේ නවාකාරයෙන් අවිද්‍යාව ප්‍රත්‍යය වෙයි. සංස්කාර ප්‍රත්‍යයෙන් උපන් ධර්මයෝයි මේ ධර්ම දෙක ප්‍රත්‍ය - සමුත්පන්න ධර්මයෝයයි පිරිසිඳ දැනගන්නාවූ ප්‍රඥාව ධර්මස්ථිති ඥානයයි." ප. ම. සිං. ප.

ධම්මට්ඨිති ඤාණය, අවිද්‍යාදී අඞ්ගයන් කෙරෙහි පවත්නාවූ නවවැදෑරුම් ශක්ති විශෙෂය දැනගන්නාවූ ප්‍රඥාව අතීත, වර්තමාන, අනාගත කාලත්‍රයටම ඇතුලත්වේ. නව වැදෑරුම් හේතු ශක්තිය පිළිබඳ විස්තර මෙසේය.

"උප්පාදට්ඨිති සංස්කාරයන්ගේ ඉපදීමට හේතු යන තේරුමයි. "තිට්ඨන්ති එතායාති ඨිති, කා සා? අවිජ්ජා, සාහි සංඛාරානං උප්පාදාය නිබ්බත්තියා ඨිති කාරණන්ති උප්පාදට්ඨිති" මේකරුණෙන් එය වඩාත් පැහැදිලි වේ. එහි අදහස: ඒ කරුණ නිසා සංස්කාරයෝ සිටිත්නුයි ඨිති නම්. ඒ කරුණ කුමක්ද? අවිද්‍යාවයි. ඒය සංස්කාරයන්ගේ ඉපදීම පිණිස කරුණ වූයේනුයි උප්පාදට්ඨිති නම්.

"පවත්තට්ඨිති" උපන් ප්‍රත්‍යයොත්පන්න ධර්මයාගේ පැවැතිමට කරුණයි. එද අවිද්‍යාවමයි. සෙසු තන්හිද මෙසේමය.

."නිමිත්තට්ඨිති" නිමිත්තට කරුණුයි මෙහි නිමිත්ත යනු කරුණ යන තේරුමයි. දෙවරක් දැක්වූයේ ස්ථිරත්වය සඳහාය.

"ආයූහනට්ඨිති" රැස්කිරීමේ හේතුවයි. ව්‍යාපාර යනුවෙන් කීයේ මෙයමය.

"සංයොගට්ඨිති" ගැටීමට කාරණායි. සංස්කාරයන් ඉපදෙමින් ඉපදුනු සංස්කාරයන් සමඟ ගැටෙයි. ඒ ගැටීම සිදුවනුයේද අවිද්‍යාවෙන්.

"පලිබොධට්ඨිති" බැඳීමට හේතුවයි. අවිද්‍යාව සංස්කාර යන් උපදවමින් ඉපදුන සංස්කාරයන් සමග බඳියි.

"සමුදයට්ඨිති" ඉපදීමට මූලික කාරුණ යනුයි.
"හෙතුට්ඨිති" පැවැත්මට උපසථම්භක වන කාරුණයි.
"පච්චයට්ඨිති" පැවැත්මට ප්‍රත්‍යය වන කාරුණයි.

මෙසේ අවිද්‍යාවත්ට සංස්කාරයන්ට නවාකාරයකින් ප්‍රත්‍යය වේ. සෙසු අඞ්ගයෝ ද ප්‍රත්‍යෝත්පන්නධර්මයනට නවාකාර නවාකාරයෙන්ම ප්‍රත්‍යය වෙත්. මෙතැන් සිය පටිසම්භිදාමග්ගයෙහි එනුයේ පෙරදී විස්තර කල විසත්‍යාකාරාදීහු යැ.

මෙතෙක් දක්වූ ප්‍රත්‍ය = ප්‍රත්‍යෝත්පන්න ධර්මයන් පිළිබඳ පවත්නා පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණය බව දත යුතු. ධම්මට්ඨිති ඤාණය සම්පූර්ණවත්ම සතතවිසුද්ධි අතුරෙන් "කඞ්ඛාවිතරණ විසුද්ධිය" සම්පූර්ණ වේ ඒ පිළිබඳ විස්තරය මෙතැන් සිට දැක්වේ.

## කඞ්ඛාවිතරණ විසුද්ධිය:

නාමරූප පරිග්‍රහය වූ දිට්ඨි විසුද්ධිය අවසන් වූ පසු, ඒ නාමරූපයන්ගේම ප්‍රත්‍ය පරිග්‍රහ කොට - පිරිසිඳ - අතීතාදී කාලත්‍රයෙහි පැවති තමා පිළිබඳ සැකයන් දුරුකරන්නා වූ ඥානය කාංඛාවිතරණ විසුද්ධි බව කලින්ම සඳහන් කර ඇත. ධම්මට්ඨිති ඤාණය ද මෙයමැයි. එය සම්පාදනය කිරීමෙහි ලා යෝගාවචර යෝ ක්‍රම කීපයක් අනුගමනය කරත්.

ඇතැම් යෝගියෙක් "මේ නාමරූප ධර්ම සියලු කල්හි සැම දෙනාටම, සැම තන්හිම නො ලැබේ. එහෙයින් ඒවා අහේතුකව නුපදී. කෙනෙකු විසින් මවන ලද්දේ ද නොවේ. අංකසම්කව - ඉබේ - පහල වූයේ ද නොවේ එයට හේතු පැවතිය යුතුයැයි නාමරූප ධර්මයන්ගේ ප්‍රත්‍යය සෙවීමෙහි ලා උත්සුක වෙයි. හේ ප්‍රථමයෙන් මෙසේ සලකයි. "මගේ ශරීරය මලක හටගත්තේ ද නොවේ. රන් ආදී ආකරයක හටගත්තේ ද නොවෙයි. වැලි කුමක කුමක හට ගත්තේ ද? මෑණියන්ගේ කුසෙහි වූ ආමාශය වත් පක්වාසයටත් අතර ඇති, හැම අයුරින්ම අවහිරකම් ඇති, පිළිකුල් සහගත තැනක, පිටකටුවට මුහුණ ලා අශුචි වලෙක පණුවෙකුලුපදින්නාසේ උපදියි. මෑණියන් යම් වයස් සීමාවක පිහිටියා නම් එපමණ කාලයක් පිරිසුදු නො කල අශුචි වලක් සේ ඒ මාතෘකුක්ෂිය= මව් ගැබ දුර්ගන්ධය වහනය වන සුළුය. කිසිදු

ආලෝකයක් නොවැත්තේ ලෝකාන්තරික නිරය බඳුය. ඉඳීමට සිටීමට, සක්මන් කිරීමට අවකාශයක් නොමැත්තේ පර්වත කුහරයකට අසු වූ ප්‍රාණියෙකු සේ අතිශයින්ම සම්බාධ සහිතව හැකිළී වෙසෙති". කියායි. මෙසේ සලකන්නම ඒ යෝගියාට තමාගේ ශරීරය පිළිබඳ හේතු සතරක් අවබෝධ වෙයි. එනම් අවිද්‍යා තෘෂ්ණා, උපාදාන, කර්ම, යනුයි. මේ සතරින් ඉපදුන සත්වයාගේ පැවැත්ම ඇතිවනුයේ ඔජට්ඨමක ආහාරය නිසාය. එහෙයින් ඒ ආහාරය ප්‍රත්‍යයැයි වැටහේ. මෙයින් අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන, යන හේතු තුන ළදරුවෙකුට මෑණියන් මෙන් උපනිඃශ්‍රය වේ. කර්මය ජනක වේ. (ජනක යනු පියායි.) ආහාරය කිරිමව් මෙනි. මෙසේ සැකෙවින් හේතු ප්‍රත්‍යය සලකා, ඉක්බිති නාමයකට හේතු ප්‍රත්‍යය සෙවීම චක්ෂුරාදී ද්වාර ක්‍රමයෙන් සිදු කෙරේ.

"චක්ඛුඤ්චංපටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං" ඇසත් රූපයක් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. මෙසේ සෙසු ද්වාරයන් ද නුවණින් සලකමින්ම සියලු නාමකය වැටහේ. නාම-රූප දෙදෙනා හේතු ප්‍රත්‍යය නිසාම පවතින්. අතීතයෙහි ද, අනාගතයෙහි ද, එසේමය. එහෙයින් සත්වයාය යන නාම රූප ධර්ම සන්තතිය මවන්නෙක් නැත. ඉබේටම පහළ වූයේ ද නොවේ. මේ අයුරින් නුවණින් සැලකීම නිසා තමා පිළිබඳ ඒතෙක් පැවැති සොළොස් වැදෑරුම් සැකය දුරුවෙයි. කඞ්ඛාවිතරණ විසුද්ධියෙන් විශුද්ධිමත් වෙයි.

ඒ සොළොස් ආකාර සැකය අතීත වශයෙන් පස් වැදෑරුම්ය. වර්තමාන වශයෙන් සවැදෑරුම්ය. අනාගත වශයෙන් පස් වැදෑරුම්ය.

"මම අතීත කාලයෙහි සිටියෙම්ද? නොසිටියෙම්ද? කවරෙක්ව සිටියෙම් ද? කෙබන්දෙක්ව සිටියෙම් ද? කවරෙක්ව සිට කවරෙක් වූයෙම් ද? මේ පස් ආකාරය අතීතයි. මම වෙම් ද? නොවෙම් ද? කවරෙක් වෙම් ද? කෙසේ වෙම්ද? මේ සත්වයා කොහි සිට මෙහි ආවේ ද? මෙතැනින් කොහි යන්නේ ද? මේ සය වර්තමානයි. අනාගතයේ පස් ආකාරය නම් මම වන්නෙම් ද? නොවන්නෙම් ද? කවරෙක් වන්නෙම් ද? කෙබන්දෙක් වන්නෙම් ද? කවරෙක්ව කවරෙක් වන්නෙම් ද? යනුවෙන් සිතීම් පසයි.

මේ සොළොස් ආකාර සැකය දුරු කොට සිටි ඥානය කඞ්ඛාවිතරණ නම්. මේ එක් ක්‍රමයකි.

2. ඇතැම් යෝගියෙක් පළමු කොට නාමකයට සාධාරණ, අසාධාරණ, වශයෙන් ප්‍රත්‍යය පිරිසිඳ ඉක්බිති රූපකයට පවතින සිවු අයුරු හේතු පිරිසිඳියි පරිග්‍රහ කරයි. ඒ මෙසේය.

“මේ නාමකායට සාධාරණ ප්‍රත්‍යය වනුයේ චක්ෂුරාදි ද්වාර සත් සසදෙනා හා රූපාදි ෂඩාරම්මණයන්ය. මොවුහු කුශලා කුශල ක්‍රියා වශයෙන් බෙදී ගිය සියලු නාම ශරීරයට ප්‍රත්‍යයෝ වෙත්. එහෙයිනි, අසාධාරණ ප්‍රත්‍යය නම් කුශල වශයෙන් යොනිසොමනසිකාර, සද්ධර්මශ්‍රවණ, සත්පුරුෂ සංසේවන ධර්මානුධර්ම ප්‍රතිපත්ති, යන මෙවාසි මෙවා අකුශලයන්ට ප්‍රත්‍යය නොවන හෙයින් කුසලයටම සාධාරණ වූයේ වෙයි අයොනිසො මනසිකාර, අසත් පුරුෂ සංසේවනාදීහු අකුශලයට ප්‍රත්‍යයෝ වෙත්. විපාක වශයෙන් නම් කර්ම, අවිද්‍යාදිය අසාධාරණ නම්. භවඞ්ග, සන්තීරණ, වොත්පන ආදීහු ක්‍රියා චිත්තයට අසාධාරණ ප්‍රත්‍යයෝ වෙත්. මෙසේ සාධාරණ අසාධාරණ, ක්‍රම දෙකොට්ම සලකත්ම සියලු නාමකායට ප්‍රත්‍යය වන ධර්ම අරමුණු වෙයි.

රූප කාය ගැන සලකා සතර වැදෑරුම් ප්‍රත්‍යයන් පිරිසිඳියි. එවුහු නම් කර්ම, චිත්ත, ඍතු, ආහාර, යනුයි. එයින් අතීත වූ කර්මයම කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වේ. කර්මජ රූප පෙරදී විස්තර කැරිණ. ඒ ප්‍රත්‍යය වනුයේ ප්‍රතිසන්ධික්ෂණයෙහි පමණි. ඍතු ආහාර, දෙදෙනා සමිති අවස්ථාවේදී ඇතිවන ඍතුජ, ආහාරජ, රූපයනට ප්‍රත්‍යය වෙත්. ප්‍රථම භවඞ්ගයේ පටන් චිත්තය, චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වෙයි. මෙසේ නාමරූපයන්ගේ ප්‍රත්‍යයන් පිරිසිඳි කල්හි පෙරකී සොළොස් ආකාර සැකය දුරුවී කඞ්ඛාවිතරණ විසුද්ධිය සම්පාදනය වෙයි.

3 ඇතැම් යෝගියෙක් ජරා මරණ පිළිබඳ සිතිකොට “හුදෙක් මේ ජරා මරණ පැමිණෙනුයේ ඉපදීම නිසායැ’ ඉපදීම ඇතිවනුයේ කර්මභව නිසායැ. ප්‍රත්‍යසමුත්පාදය ප්‍රතිලෝම - අග සිට මුල තෙක් - බලායනාදී වශයෙන් ප්‍රත්‍යය පරිග්‍රහ කෙරේ. ඇතැමෙක් ප්‍රත්‍යසමුත්පාදය අනුලෝම වශයෙන් බලමින් ප්‍රත්‍ය පරිග්‍රහ කෙරේ. මෙසේ ඔවුනට ද කඞ්ඛාවිතරණ විසුද්ධිම සම්පාදනය වේ. ඇතැමෙක් “ප්‍රථම ජාතියෙහි පැවති මෝහය අවිද්‍යා. කර්ම රැස් කිරීම සංස්කාරය, සාර මුණෙහි ඇලීම තෘෂ්ණාය. එයම දෘෂ්ටි වශයෙන් ගැන්ම උපාදානයැ. අභිසංස්කරණය කිරීම කර්ම භවයැයි මෙසේ අතීත වශයෙන් හේතු පඤ්චකය බලයි. ඉක්බිති වර්තමාන වශයෙන් පවතින ඵල

පඤ්චකය වූ ප්‍රතිසන්ධිය විඥානයි. එම්කුසට බැස ගැන්ම නාම රූපයි. (ඔක්කන්තිනාමරූපං) ප්‍රසාද වස්තූහු ආයතන නම්, ඒවාහි රූපාදී ආරම්මණ හැපීම ඵස්සය, විඳීම වෙදනායි, යන මේ පස බලයි. වර්තමානයෙහි වූ මොහය, අවිද්‍යාවයි යනාදී වශයෙන් අවිද්‍යා සංස්කාර තෘෂ්ණා, උපාදාන, කර්ම භව, යන හේතු පඤ්චකය බලයි. එසේම මේ හේතු පඤ්චකය නිසා අනාගතයෙහි නැවතත් ප්‍රතිසන්ධි විඥානාදී ඵල පඤ්චකය නිපදෙයි. මෙසේ ප්‍රත්‍යසමුත්පාදයෙහි ඇත්තා වූ සංක්ෂෙප ක්‍රමයෙන් නාමරූපයට ප්‍රත්‍ය පරිග්‍රහ කොට කඞ්ඛාවිතරණ විසුද්ධිය සම්පාදනය කෙරේ.

මෙසේ ප්‍රත්‍යය පරිග්‍රහ කිරීමෙන් පසු, හේ සත්වයා පිළිබඳ නියම අවබෝධයක් ලබා ගනියි. හේතු ඵල ධර්මයන්ගේ පැවැත්ම විනා, සත්වයා යැ, මමයැ යනාදී වශයෙන් ආත්මයට ඇතුලත් කෙනෙකු මෙහි නොමැති යයි වටහා ගනියි. එසේම කර්ම කරන්නෙකු හෝ විඳින්නෙකු හෝ නොදක, හුදෙක් මේ පවත්නේ ශුද්ධ ධර්ම මාත්‍රයෙකැයි තීරණයකට බසියි. එහෙයින් ආත්ම දෘෂ්ටි ආදී මිථ්‍යා දෘෂ්ටි එතැනින්ම බිඳ වැටෙයි. සම්‍යක් දර්ශනය පහළ වෙයි එයින් කිහ.

“කම්මස්ස කාරකො නත්ථි – විපාකස්ස ච වෙදකො
සුද්ධම්මා පවත්තන්ති – එවෙතං සම්මදස්සනං”

කර්මයාගේ කරවන්නෙක් නැත. විපාකයාගේ විඳින්නෙක් නැත. ශුද්ධ ධර්මයෝම – හේතු ඵල ධර්මයි. – පවතිත්. මෙය සම්‍යක් දර්ශන නමි.

ධම්මට්ඨිති ඤාණය නිමි.

# 17 වැනි පරිච්ඡේදය.

## 5. සම්මසන ඤාණය

:‘අතීතානාගතපච්චුප්පන්නානං ධම්මානං සංඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං’’ - ප. ම.

අතීත, අනාගත, වර්තමාන වූ ධර්මයන් හකුළුවා අනිත්‍යාදී වශයෙන් ව්‍යවස්ථාපන කිරීමෙහි ප්‍රඥාව සම්මසන ඤාණ නම්. සම්මසන ඤාණය බුදුරජාණන් වහන්සේ හැඳින්වූ අයුරැයි මේ. ධම්මට්ඨිති ඤාණයට අනතුරුව එනුයේ සම්මසන ඤාණයයි. මෙය තෙසැත්තෑ ඤාණයන් අතුරෙන් පස්වැන්නයි. ධම්මට්ඨිති ඤාණයෙහි ප්‍රථමයෙන් දක්වූ නාමරූප ව්‍යවස්ථාපනය - බෙදීම - හොඳින් සිත තබා ඒ එක් එක් ධර්මයක් අනිත්‍යය, දුඃඛය, අනාත්මය, වශයෙන් ත්‍රිලක්ෂණයට අනුව සටහන් තබා ගැනීම සම්මසන ඤාණය නම්. කලාප සත්මර්ශනය යනු ද මෙයට ම නමකි. කලාප නම් මිටියි, පොදියි, නාමරූප ධර්මයන් පොදි පොදි වශයෙන් ගෙන අනිත්‍යාදී ලක්ෂණයන්ට නැංවීම කලාප සත්මර්ශනයයි. තවද “නයවිදර්ශනා’’ යනු ද නමකි. මේ සම්මසන ඤාණය පිළිබඳ කෙටි හැඳින්වීම යි.

### ත්‍රිවිධ පරිඥාවෝ:

විදර්ශනාවට බැසගත් යෝගාවචරයාගේ පරිඥාවෝ තුන් දෙනෙකි. ඤාතපරිඤ්ඤා, තීරණපරිඤ්ඤා, පහාණපරිඤ්ඤා යනුයි. මෙහි පරිඤ්ඤා යනු පිරිසිඳ දැන ගන්නා නුවණට නමකි. මේ ත්‍රිවිධ පරිඥාවන් ම මෙසේ සඳහන් වේ. ‘අභිඤ්ඤා පඤ්ඤා ඤාතට්ඨෙන ඤාණං පරිඤ්ඤා පඤ්ඤා තීරණට්ඨෙන ඤාණං පහාණ පරිඤ්ඤා පරිච්චාගට්ඨෙන ඤාණං’ අභිඤ්ඤා පඤ්ඤාව දැන ගැනීම් තේරුමින් ඤාණ නමි. පරිඤ්ඤා පඤ්ඤාව තීරණය කිරීම් තේරුමින් ඤාණයි. පහාණ පරිඤ්ඤා අත්හැරීම් තේරුමින් ඤාණ නමි. මෙහි අභිඤ්ඤා පඤ්ඤා යනුවෙන් ඤාතපරිඤ්ඤාව ද, පරිඤ්ඤා පඤ්ඤා යනුවෙන් තීරණ පරිඤ්ඤාව ද, කියැවිණි, සියලු විදර්ශනා විධි මේ ත්‍රිවිධ ඥානයට ඇතුළත් වෙයි.

නාමරූප පරිග්‍රහයේ සිට ප්‍රත්‍යය පරිග්‍රහය තෙක් පවතින ප්‍රඥාව ඤාතපරිඤ්ඤායි. කලාප සම්මර්ශයේ සිට උදයව්‍යානු

දර්ශනය තෙක් පවතින ප්‍රඥාව තීරණපරිඥාවයි. භඞ්ගානු දර්ශනයේ සිට ඉදිරියට පවතිනුයේ ප්‍රහාණ පරිඥා නම් වූ ප්‍රඥාවයි. සම්මසන ඤාණය තීරණ පරිඥාවගේ ආරම්භයයි.

## මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය.

ඔභාසාදී උපක්ලේශ දසයෙන් මිදී, ආර්යමාර්ග සම්පාදනය සඳහා විදර්ශනා වීථියට බැසගත් ප්‍රඥාව මාර්ගයැයි ද, දස උපක්ලේශයන්ට බැසගත් මාර්ගය, අමාර්ගයැයි ද, මෙසේ මාර්ග = අමාර්ග දෙක පිරිසිඳ පවත්නා ප්‍රඥාව මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි නමි. ප්‍රත්‍යධර්ම පරිග්‍රහයෙන් කඞ්ඛාවිතරණ විසුද්ධිය සම්පාදනය වූ පසු, ඒ යෝගාවචරයා විසින් මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය ලබා ගැනීම සඳහා දිට්ඨිවිසුද්ධියේදී පරිග්‍රහ කළ නාමරූප ධර්ම අනිත්‍යාදී වශයෙන් කලාපවලට බෙදා බැලිය යුතුය. ඉක්බිති එක් එක් කලාපයක් පාසා අනිත්‍යාදී ලක්ෂණත්‍රයෙන් පිරිසිඳ බලන්ම සම්මසන ඤාණය සම්පූර්ණ වේ. මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය සම්පාදනය වනුයේ එතැන් සිට උදයව්‍යානුදර්ශනාවට අනුව විදර්ශනා කරමින් සිටි කල්හිය. එහෙයින් මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය කලාප සම්මර්ශනයත් උදයව්‍යානුඥාන දර්ශනයෙහි ආරම්භයත් යන ධර්ම දෙකම සම්බන්ධ කොට ඇතියකි. මේ නිසා මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය සම්පාදනය කිරීමට ප්‍රථමයෙන් කළයුත්තේ කලාප සම්මසනයයි. එහෙයින් වදාළහ:– "යස්මා තීරණපරිඤ්ඤාය වත්තමානාය මග්ගාමග්ග ඤාණං උප්පජ්ජති, තීරණ පරිඤ්ඤා ච ඤාතපරිඤ්ඤානන්තරං, තස්මාපි තං මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිං සම්පාදෙතු කාමෙන කලාපසම්මසනෙ තාව යොගො කාතබ්බො" යම් හෙයකින් තීරණ පරිඥාව පවත්නා කල්හි මග්ගාමග්ගඤාණය උපදියි ද, තීරණ පරිඥාව ද ඥාතපරිඥාවට අනතුරුවය. එහෙයින් ඒ මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය සම්පාදනය කරනු කැමැත්තහු විසින් කලාපසම්මසනයෙහි යෙදිය යුතුය යනුයි.

## සම්මසනඤාණයට ඇතුළත් වියයුතු ධර්ම රාශිය.

සුත්තමය ඤාණ විස්තරයෙහි අභිඥෙය්‍ය කොටසට ඇතුළත් වූ ධර්මරාශිය මෙයට අයත්වේ. විස්තර දැනගැනීමට එය බැලිය යුතුය. මෙහිදී දක්වනුයේ එහි සාරාංශයයි.

ස්කන්ධ පඤ්චකය, ද්වාර සය, ආලම්බන සය, විඤ්ඤාණ සය, ස්පර්ශ සය, වේදනා සය, සංඥා සය, චේතනා සය, තෘෂ්ණා සය, විතර්ක සය, විචාර සය, ධාතු සය, කසිණ දසය, කුණප දෙතිස,

2019 10 05 Paññápárami Na Uyana Free Distribution

ආයතන දොළොස, ධාතු අටළොස, ඉන්ද්‍රිය දෙවිස්ස, ධාතුත්‍රය, භව නවය, ධ්‍යාන සතර, අප්පමඤ්ඤා සතර, සමාපත්ති සතර, පටිච්චසමුප්පාද අඞ්ග දොළොස, මෙතෙක් ධර්මයි

සැලකිය යුතු: ඉන්ද්‍රිය දෙවිස්ස අතුරෙන් ලෝකෝත්තර ඉන්ද්‍රිය වූ අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය, යන ත්‍රිතය සම්මසනයට නො ගැනේ.

මේ ධර්ම රාශිය අතුරෙන් පඤ්චස්කන්ධ සම්මසනක්‍රමය පමණක් මෙහිලා විස්තර කරනුයේ. සෙසු ක්‍රම ඒ අනුසාරයෙන් සලකා ගැනීමට අවකාශ තබමි.

## පඤ්චස්කන්ධයෙහි එකොළොස් ආකාරය.

“යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං තං රූපං අනිච්චතො වවත්ථපෙති එකං සම්මසනං, දුක්ඛතො වවත්ථපෙති එකං සම්මසනං අනත්තතො වවත්ථපෙති එකං සම්මසනං”– ප. ම.

අතීත, අනාගත, වර්තමාන, ආධ්‍යාත්මික, බාහිර, ඖදාරික, සූක්ෂම, හීන, ප්‍රණීත, දූර, සන්තික, යන මේ එකොළොස් වැදෑරුම්ව බෙදෙන අයුරැයි. වෙදනාදී සෙසු ස්කන්ධයෝ ද මේ එකොළොස් ආකාරයට බෙදී යත්. “අතීත වූ සියලු රූප අනිත්‍යය වශයෙන් ව්‍යවස්ථාපනය කරයි ද, එවිට එක් සම්මර්ශන යකි” යනාදී වශයෙන් සම්මසන ඥානය විස්තර කරන ලදී.

## රූපස්කන්ධය පිළිබඳ අතීතාදීය.

ඉපදී ඉකුත් වූ රූප සමූහය අතීත රූප නමි. මෙහි අතීත භාවය ක්‍රම සතරකින් සිදුවේ. “තත්ථ රූපං තාව අද්ධාසන්තති සමයඛණ වසෙන චතුධා අතීතං නාම හොති” එහි පඤ්චස්කන්ධයෙහි – පළමුකොට රූපය අද්ධා, සන්තති, සමය, ඛණ, වශයෙන් අතීතය සිවුවැදෑරුම් වෙයි. මේ අටුවායි. අනාගත; වර්තමාන කාලද මෙසේය. එක් භවයෙක්හි ප්‍රතිසන්ධියෙන් පෙර පැවති රූප අද්ධා වශයෙන් එන අතිත රූපයි. එහි ම චුතියෙන් පසු පවතින රූප අනාගත නමි. ප්‍රතිසන්ධි චුති අතර පවතින රූප වර්තමානයි. සභාග වූ ඍතු, ආහාර, දෙකින් හටගත් රූප වර්තමාන නමි. ඉන් පෙර විෂභාග ඍතු, ආහාර, දෙකෙන් හටගත් රූප අතීත නමි. පසුවූයේ අනාගත නමි. චිත්තජ රූප

වශයෙන් නම් එක් වීථියෙක එක් ජවනයකින් හෝ එක් සමාපත්ති ජවනයකින් හෝ හටගත් රූප වර්තමානයි පෙර පසු වූයේ අතීත අනාගතයි කර්මජ රූපයන්ගේ සන්තති වශයෙන් එන අතීතාදියක් නොමැත. මේ සන්තති වශයෙන් අතීතාදී භේදයි.

සමය: මොහොත; පෙරවරු, පස්වරු, රාත්‍රි, ආදී වශයෙන් පැනෙන කාලයන් අතුරෙන් ඒ ඒ මොහොතාදියට පත්වූ රූප වර්තමානයි. ඉකුත් වූයේ අතීතයි. පසුවූයේ අනාගතයි. මේ සමය වශයෙනි.

ඛණ: උප්පාද, ඨිති, භඞ්ග, යනුවෙන් රූපයන්ගේ පවතින කාලය තෙවැදෑරුම්ය. ඒ තෙවැදෑරුම් කාලයට පත් වූ රූප වර්තමානයි උප්පාදයෙන් පෙර අතීතයි භඞ්ගයෙන් පසු අනාගතයි. (මෙහි උප්පාද යනු ඉපදීමයි. ඨිති පැවැත්මයි. භඞ්ග විනාශයයි. රූපයන් ගේ මේ ත්‍රිවිධ අවස්ථාවට චිත්තක්ෂණ සතළොසක පමණ කාලයක් අයත්වේ) මෙසේ අතීත, අනාගත, වර්තමාන, කාලත්‍රය අද්ධාදී වශයෙන් සිවුවැදෑරුම් වෙයි.

අජ්ඣත්තික රූප: තමා පිළිබඳ වූ රූපයෝයි. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, යන පසාද රූප පස මෙයට ගැනේ. තෘෂ්ණාව අධික ලෙස පවත්නා හෙයින් අජ්ඣත්තික රූපයැයි පැවසේ. රූපාදී විෂය රූප බාහිරයි

ඔළාරික රූප: තද ලෙස හැප්පීම් වශයෙන් ගැනෙන රූපයෝ ඖදාරික - ගොරෝසු - නම් වෙත්. "ඝට්ටන වසෙන ගහෙතබ්බතො ඔළාරිකං" ගැටීම් වශයෙන් ගතයුතු බැවින් ඔළාරික නමැයි අටුවාව කියයි. ඖදාරික රූප දොළොසෙකි. පඤ්චප්පසාද, විෂයරූප සතර හා ඵොට්ඨබ්බ රූපය වූ පඨවි. තෙජො, වායො, යන භූතත්‍රය, යනුයි.

සුඛුම රූප: "ඝට්ටන වසෙන අගහෙතබ්බතො සුඛුමං", ගැටීම් වශයෙන් නොගත යුතු හෙයින් සූක්ෂ්ම - සියුම් - රූප නම්. සුඛුම රූප සොළොසෙකි ආපොධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, හදයවත්‍ථු, ඔජා, ආකාශධාතු, කායවිඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති, ලහුතාදීත්‍රය, ලක්ෂණ රූප සතර යනුයි.

දූර-සන්තික රූප: ඔළාරික වශයෙන් දැක්වූ රූප අවබෝධ කිරීමට පහසු බැවින් සන්තික - ළඟ - රූප නම්. අවබෝධ කිරීමට දුෂ්කර බැවින් සුඛුම රූප, දූර - ඈත රූප නම්. "දුප්පටි විජ්ඣ සභාවත්තා දූරෙ" යනු අටුවායි.

මෙසේ රූපස්කන්ධය අතීතාදී වශයෙන් එකොළොස් ආකාරයට බෙදා, සිතා ගතයුතුය. වේදනාදිය ද මෙසේමය.

## අනිත්‍යාදී ලක්ෂණත්‍රය.

එකොළොස් වැදෑරුම් බවට පත් වූ සියලු ස්කන්ධයන් ගේ ලක්ෂණත්‍රයකි. අනිත්‍ය, දුඃඛ, අනාත්ම, යනුයි. ලෞකික වූ සියලු ධර්ම කෙරෙහි මේ ලක්ෂණත්‍රය බලපවත්වයි. එහි අනිත්‍යය යනු ස්ථිර පැවැත්මක් නොමැති ගතියයි. ස්ථිර පැවැත්මක් නො මැති නම් විනාශය, ගෙවීම, අතුරුදහන්වීම, යනාදී ස්වභාවයන්ට පැමිණේ. එය අනිත්‍යය. බුදුරජාණන් වහන්සේ අනිත්‍යය ලක්ෂණය දෙසූ තැනදී දක්වූයේ ගෙවීම් අර්ථයයි. "අනිච්චං ඛයට්ඨේන" ක්ෂයාර්ථයෙන් අනිත්‍යය නම්. ක්ෂයාර්ථය නම් ගෙවීම් අර්ථයි. විනාශවීම, නැතිවීම' අතුරුදහන්වීම, යන මේ ස්වභාවයන්ට වඩා වෙනසක් "ගෙවීම්" යන්නෙහි ඇත. එහි වෙනස පෙනෙනුයේ විදර්ශනා ඥානයටය.

දිය බුබුල දෙස බලත් ම පෙනෙනුයේ එය එක වරට ම විනාශ වන බවයි. එහෙත් එසේ සිදු නොවේ. එහි විනාශය සිදු වනුයේ ක්‍රමයෙන් කුඩා වීමෙනි. ඒ කුඩා වීම ගෙවීම් ස්වභාවයයි. ඉඟිනි ඇටයක් ගල ගෑමේදී එය ක්‍රමයෙන් ගෙවීයන ගතිය පෙනේ. එය කාටත් පැහැදිලිය. එහෙත් දිය බුබුලෙහි ගෙවීම සියුම් හෙයින් නො පෙනේ. නාමරූපයන් ගේ ද ගෙවීම් ගතිය ඉතාමත් සියුම් ය. සමථ භාවනාවෙන් පිරිසිදු කරගත් සිත් ඇතියකුට හැර අන් කෙනෙකුට නො පෙනේ. විනාශ වීම් ආදි ඉහත දක්වූ ස්වභාවයන් අනිත්‍ය ලක්ෂණය කෙරෙහි බලපැවැත් වුවත් නාමරූපයන් කෙරෙහි පවත්නා අනිත්‍ය ලක්ෂණය ක්ෂයාර්ථය මැයි. එහෙයින් ක්ෂයාර්ථ පමණක් අනිත්‍ය ලක්ෂණයැයි දෙසූයේ. සෑම රූප ධර්මයක්ම ඉපදී, චිත්තක්ෂණ පසළොසක කාලයක් පැවති විනාශ වෙයි. ඉපදීම, විනාශවීම, යන චිත්තක්ෂණ දෙකත් සමග මුළු කාලසීමාව චිත්තක්ෂණ සතළොසකි. (17) එද මහාචිත්තක්ෂණ වශයෙනි. සතළොස් වැනි චිත්තක්ෂණයෙහි ස්ථිති අවස්ථාවෙන් පසු රූපධර්මයා ගේ ගෙවීම සිදුවෙයි. නාමධර්ම සෑම චිත්තක්ෂණයක ම ඇති ස්ථිති අවස්ථාවෙන් පසු ගෙවීම සිදුවේ.

## දුක්ඛලක්ෂණය.

සිතට සැනසීමක් නො මැති ස්වභාවය, බලාපොරොත්තු වූ අයුරින් නො සිදුවීම නිසා ඇතිවන ව්‍යර්ථක භාවය – වැඩක් නැති

බව නොහොත් බලාපොරොත්තු සුන්වීම - දුඃඛලක්ෂණයයි. බොහෝ කාලයක සිට සුව වශයෙන් ගත් දෑයෙහි, ස්ථිර වශයෙන් ගත් දෑයෙහි, ගෙවීම් - විනාශවීම් ස්වභාවය දකින්ම සිතට සැනසුමක් නො ඊම ආකස්මිකව - ඉබේට - සිදුවෙයි ඒ සැනසුම් නො එනුයේ "අහෝ! මෙතෙක් ස්ථිරයැයි සිතූ දෑ විනාශ වන්නේය" යනුවෙන් විනාශ වන නාමරූප ධර්ම දක බියක් ඇති වීම, හටගැනීම නිසාය. බුදුරජාණන් වහන්සේ දුඃඛලක්ෂණය දෙසූයේ බියවීම් තේරුම මත සිටය. "දුක්ඛං භයට්ඨෙන" භයාර්ථයෙන් දුඃඛ නම් යනු ඒ දේශනායි.

## අනාත්ම ලක්ෂණය.

අයිතිවාසිකමක්, තමා වෙත පවරා ගැන්මක්, තමා කෙරෙහි නැමෙන ගතියක්, යනාදී දෑ තමා කෙරෙහි නොපවත්නා බව අනාත්ම ලක්ෂණයයි. කාරක, වේදක, මාපකාදීන් කිසිවෙකු නො මැති බව වැටහීම එහි ස්වභාවයයි. කාරක යනු කරවන්නාය. වේදක විඳින්නායි. මාපක මනින්නායි. එසේ දක්විය හැක්කෙකු නාමරූප ධර්මයන් කෙරෙහි නො මැත. එහෙයින් අනාත්මය. තමා කෙරෙහි වසඟකර ගැනීම් ස්වභාවය වූ ඉතිරිවන ගතිය - හරයක් නො මැති හෙයින් අනාත්මයැයි බුදුරජාණන් වහන්සේ මෙය පැහැදිලි කළහ. "අනත්තා අසාරට්ඨෙන" හරයක් නො මැත යන තේරුමින් අනාත්ම නමි. තවද, යම්කිසිවක් අනිත්‍ය නම් ඒ දුඃඛයි යමක් දුක් නම් ඒ අනාත්මයි, යනුවෙන් දේශනා කළ "යදනිච්චං තං දුක්ඛං යං දුක්ඛං තදනත්තා" යන ධර්මයෙහි ඇතුළත් වූයේ දුඃඛස්වභාවය ඇති දෑ අනාත්ම හැටියට ය. ගෙවීම් විනාශවීම් ස්වභාවය දක්නාහට ඉතිරිවක් නැති බව වැටහීම අනාත්ම ලක්ෂණයයි. ඇතැම් තැනක අනාත්ම ලක්ෂණය දේශනා කර ඇත්තේ "මේ මගේය, මේ මම වෙමි, මේ මගේ ආත්මයැ"යි වශයෙන් ගතයුතු හරයක් නාමරූප ධර්ම පරම්පරාව වූ ජීවිතය කෙරෙහි නො මැති බව දක්වීම් වශයෙනි. රාහුල ස්වාමීන්ට කළ දේශනාව එබඳු තැනකි. "තං කිං මඤ්ඤසි රාහුල චක්ඛු නිච්චං වා අනිච්චං වා ති, අනිච්චං භන්තෙ යං පනානිච්චං දුක්ඛං වා සුඛං වා ති? දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිනාම ධම්මං කල්ලන්නුතං සමනුපස්සිතුං "එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ,"- සං. නි. රාහුලසංයුත්ත, රාහුලය, ඒ කිමැයි හඟිහිද? ඇස නිත්‍යය ද නැතහොත් අනිත්‍යය ද? ස්වාමීනි, අනිත්‍යයයි. යමක් අනිත්‍යය නම් ඒ දුක ද නැතහොත් සැපද? ස්වාමීනී දුකයි යමක් අනිත්‍යය නම් දුක් නම් පෙරළෙන ස්වභාව

යෙන් යුක්ත නම් එය "මෙය මාගේය, මේ මමය, මේ මාගේ ආත්මයැයි දක්නට සුදුසුද? ස්වාමීනි, නුසුදුසු ම ය යනු එහි අදහසයි.

මෙසේ අනිත්‍යාදී ලක්ෂණත්‍රය පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ආරම්භක විදර්ශකයාට අවශ්‍යය.

**සංක්ෂේප විදර්ශනා.**

ඉහත විස්තර කළ කරුණු සම්මර්ශන ඥානයට පරිවාරයි. ඒ ධර්ම පිළිබඳ අවබෝධයක් ලත් විදර්ශකයා කලාප සම්මර්ශන යෙහි යෝග කටයුතු. ඔහු විසින් ප්‍රථමයෙන් කළයුත්තේ කෙටියෙන් දක්වෙන විදර්ශනා ක්‍රමය පුහුණු කිරීමය. ඉදින් පෙර පුරුදු කරන ලද කලාප සම්මර්ශන ඥානයක් ඔහු තුළ පැවතී නම් "සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා" යන ප්‍රණීත අයුරින් විදර්ශනා චිත්තවීථි මනා සේ පැවත කෙලෙස් ප්‍රහාණය වී සෝවාන් ආදී ආර්ය මාර්ග උපදී. කලාප සම්මර්ශන ඥානය පුහුණු වී ඇත ද, ඔහු කෙරෙහි නීවරණ ධර්ම බලපායි නම් ප්‍රතිපදාව දුක් සහිත වී "දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා" ක්‍රමයට අනුව මාර්ග උපදී. සමථ භාවනාව පුහුණු කළ චිත්තවිසුද්ධි සම්පාදනයෙහි සමත් යෝගාවචරයනට "සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා" ක්‍රමයට අනුව මාර්ග පවතී. ඔහුගේ සම්මර්ශන ඥානය ලැසිව - සෙමෙන් - පවතියි. එහෙයින් -විශේෂ නුවණ - අඩු වෙයි. "දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා මේ සිව්වැනි ක්‍රමය මේ අනුව සලකා ගත හැක. මේ සිවු පිළිවෙත් සමාධිභාවනාමය ඥානයෙහි විස්තර විණි.

කරුණු මෙසේ හෙයින් මෙතැන් සිට විදර්ශනා ක්‍රම පිළිවෙළින් දක්වෙයි. පළමුකොට දක්වෙනුයේ කෙටි ක්‍රමයයි. එය ආරම්භ කරන්නහු විසින් එකොළොස් මැදුරුම් වූ සියලු රූප, පිඬු කොට ඒ සියලු රූපයෝ ගෙවීම් අර්ථයෙන් අනිත්‍යයයැයි පිරිසිඳිය යුතු. වේදනාදිය ද මෙසේ ම ය. එහි සත්මර්ශ ක්‍රම පහකි.

"යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා -පෙ- සබ්බං තං රූපං අනිච්චතො ववත්ථපෙති එකං සම්මසනං" වේදනාදීහු ද මෙසේමය. ඉක්බිති ඒ සියලු රූපයෝ "භයාර්ථයෙන් දුඃඛයහ"යි ව්‍යවස්ථාපනය කරයි ද - පිරිසිඳියි ද, ඒ අනෙක් ක්‍රමයයි. නැවත ඒ සියලු රූපයෝ "අසාරයෙන් අනාත්මයැ"යි පිරිසිඳියි ද ඒ තුන්වැනි ක්‍රමයයි. මෙසේ සංක්ෂේප විදර්ශනා ක්‍රමය පසළොස් ආකාරය.

අනිත්‍යාදි ලක්‍ෂණත්‍රයෙන් එකකින් නමුදු විදර්ශනා කර, මාර්ග උපදවිය හැකිය. ලක්‍ෂණත්‍රයක්ම දේශනා කළේ සංඥා බහුලත්වය නිසාය. සත්වයා කෙරෙහි තම ජීවිතය ගැන "නිත්‍ය, සුභ, සුඛ, ආත්ම," යන වැරදි හැඟීම් සතරක් පවතී. එයින් ඇතැමෙකුට නිත්‍ය සංඥා බලපායි. හේ "ලෝකය සදා කාලිකය, වෙනස් නො වේ" යනාදී වශයෙන් සිතා ශාස්වත දෘෂ්ටිය ගනියි. ඇතැමෙකුට සුභ, සුඛ, සංඥා බලපායි. ඔව්හු "පස්කම් විඳීම ම ජීවිතයේ පරමාර්ථය"යි වැරදි හැඟීම් ගනිත්. ඇතැම්හු "ජීවිතය තුළ ආත්මයක් ඇත" යනාදී වශයෙන් වැරදි හැඟීම් ගනිත්. මෙසේ නිත්‍යාදි මිථ්‍යා දර්ශන නිසා ලක්ෂණත්‍රයක් දේශනා කරන ලදී. එයින් අනිත්‍ය ලක්‍ෂණයෙන් නිත්‍යසංඥා දුරුවෙයි. ඒ සඳහාම දේශනා කරන ලදී දුඃඛ ලක්ෂණයෙන් සුභ, සුඛ, සංඥා දුරු වෙයි. අනාත්ම ලක්ෂණයෙන් ආත්ම සංඥාව දුරුවෙයි.

## නය විදර්ශනා ක්‍රම.

### 1. සතලිස් ආකාර විදර්ශනා ක්‍රමය.

"කතමෙහි චත්තාලීසාය ආකාරෙහි අනුලොමඛන්තිං පටිලභති, කතමෙහි චත්තාලීසාය ආකාරෙහි සම්මත්ත නියාමං ඔක්කමති"

කවර නම් සතලිස් ආකාර ක්‍රමයකින් අනුලෝම ක්‍ෂාන්තිය ලබා ද? කවර නම් සතලිස් ක්‍රමයකින් සම්මත්තනියාම වූ ආර්ය මාර්ගයට බසී ද?" යනාදී වශයෙන් සතලිස් ආකාර විදර්ශනා ක්‍රමය දේශනා කිරීම සඳහා ප්‍රශ්න තැබූයේක. මෙහි අනුලෝම ක්‍ෂාන්තිය යනු අනුලෝම ඥාණයයි. ආර්ය මාර්ගයට බැසගත් චිත්තවීථියේදී සක්කාය දිට්ඨි ආදී ප්‍රහාණය කළයුතු කෙලෙස් ප්‍රහාණය වනුයේ ඒ ඒ මාර්ග චිත්තවීථියේ අනුලෝම ජවන් සිත උපන් පසුය. අනුලෝම ජවනයට මුලින් ඉපදෙන උපචාර, පරිකර්ම, ජවන් දෙක ද අනුලෝම ඥාණයට ම ඇතුලත් වෙයි. එහෙයින් ඒ අවස්ථා තුනේ ම තදඞ්ග වශයෙන් කෙලෙස් ප්‍රහාණය වන නිසා ඒ ජවන් සිත් තුනටම, අනුලෝම ක්‍ෂාන්තියැයි නම තැබූයේක. (සමුච්ඡේද වශයෙන් කෙලෙස් ප්‍රහාණය වනුයේ මාර්ග සිතෙහි.) නිර්වාණය අරමුණ වන්නේ ඊළඟට උපදින ගොත්‍රභූ, වොදාන, මාර්ග, ඵල, සිත්වලට ය. අනුලෝම ඥාණයට නිර්වාණය අරමුණු නොවේ,

"අනුලොමිකාය ඛන්තියාති එත්ථ විපස්සනා ඤාණමෙව ලොකුත්තර මග්ගං අනුලොමෙතීති අනුලොමිකං, තදෙව ඛන්තිමපෙක්ඛිත්වා අනුලොමිකා සබ්බසංඛාරානං තස්ස අනිච්චතො දුක්ඛතො අනත්තතො ඛමන්ති රුච්චන්තීති ඛන්තීති" - ප. ම. අ. මේ පාඨයෙන් අනුලෝම ක්‍ෂාන්තිය විස්තර කැරිණි. විදර්ශනා ඥානයම ලෝකෝත්තර මාර්ගයට අනුලොම වන හෙයින් අනුලෝම නම්. එයම ක්‍ෂාන්ති අපෙක්‍ෂා කොට, නැතහොත් විදර්ශනා ඥානයට රුචිවන පරිද්දෙන් ඒ ඥානයට අනුලෝම - නැමුණා වූ සියලු සංස්කාර අනිත්‍යාදී ලක්‍ෂණත්‍රයට නැංවෙන විදර්ශනා ඥානය අනුලෝම ක්‍ෂාන්තිය බව කෙටියෙන් වටහා ගත යුතුය.

සම්මත්ත නියාමය; මෙය ලෝකෝත්තර මාර්ගයට නමකි. ප්‍රථමයෙන් බැස ගන්නා සෝවාන් මාර්ගයම විශෙෂයෙන් අදහස් කර ගන්නා ලදී.

"සම්මත්ත නියාමන්ති එත්ථ හිතසුඛාවහො මෙ භවිස්සතීති එවං ආසිංසතො තථෙව සම්භවතො අසුභාදීසු ච අසුභන්ති ආදි අවිපරීතප්පවත්තිතො සභාවතො ච සම්මා සභාවොති සම්මත්තං, අනන්තර ඵලදානාය අරහත්තුපත්තියා ච නියාමභූතත්තා නියාමො; නිච්ඡයොති අත්ථො, සම්මත්තඤ්ච සො නියාමො චාති සම්මත්ත නියාමො; කො සො? ලොකුත්තර මග්ගො. විසෙසතො පන සොතාපත්ති මග්ගො, තෙනාහ මග්ග නියාමෙන නියතත්තා නියාමො" – ප. ම. අ.

මෙහි සාමාන්‍ය අදහස; සම්මත්ත යනු යහපත් ස්වභාවයයි. ඒ යහපත් වනුයේ කරුණු දෙකක් නිසා ය. හිතට සැනසීමක් ඒම එක් කරුණකි. ඒ සැනසීමම තමාට ආශීර්වාදයකි. අනෙක අශුභ අනිත්‍යාදී සංස්කාරයන්හි පවත්නා ස්වභාවයන් පිළිබඳ, ඒ අයුරින්ම සිත සුභාදියකට නොපෙරළී පැවැත්මයි මේ කරුණු දෙකම ලෝකෝත්තර මාර්ගයේදී සැලසෙන හෙයින් ලෝකෝත්තර මාර්ගය සම්මත්ත - යහපත් ස්වභාවය නම්. මාර්ගයට අනතුරුව ඵලය ලැබෙන නිසාද, අර්හත් භාවය ලැබෙන නිසා ද යන මේ කරුණු නියම වශයෙන්ම පවත්නා බැවින් "නියාම" නම්. සැකයක් නොමැතිව තීරණයකට බැසගන්ට හැකි බව එයින් කියනලදී. නිච්ඡය යනු තීරණයයි. මෙසේ යහපත් ස්වභාවයට නියම වශයෙන්ම පැමිණෙනුයේ කවර ධර්මයක් නිසාද? පිළිතුර: ලෝකෝත්තර මාර්ගයයි. මාර්ග නියමයට අනුව ප්‍රකාශකරන්නම් ගතයුත්තේ සෝවාන් මාර්ගයයි.

## සතළිස් ආකාරය:

"පඤ්චක්ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපස්සග්ගතො චලතො පභඞ්ගුතො අද්ධුවතො අතාණතො අලෙණතො අසරණතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො ආදීනවතො විපරිණාමධම්මතො අසාරකතො අඝමූලතො වධකතො විභවතො සාසවතො සඞ්ඛතතො මාරාමිසතො ජාතිධම්මතො ජරාධම්මතො ව්‍යාධිධම්මතො මරණධම්මතො සොකධම්ම පරිදෙවධම්මතො උපායාසධම්මතො සංකිලෙසධම්මතොති චත්තාලීසාය ආකාරෙහි පඤ්චක්ඛන්ධෙ අනිච්චතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො නිච්චං නිබ්බානන්ති පස්සන්තො සම්මත්ත නියාමං ඔක්කමති" වි. ම. 464 පි,

ඉහතදී අනිත්‍යාදී වශයෙන් එකොළොස් ආකාරයට බෙදූ පඤ්චස්කන්ධය, එකක් පාසා මේ සතළිස් ආකාර විදර්ශනාද ක්‍රමයට නැංවිය යුතුය. සියලු රූප කලාප වශයෙන් ගෙන මේ මේ කරුණු නිසා අනිත්‍ය, දුඃඛය, රෝගයට කරුණුය, යනාදී වශයෙන් නය විදර්ශනාවට බසින අයුරු මෙතැන්සිට දැක්වේ. මෙහි එකක් පාසා විස්තර මෙසේය.

1 අනිච්චතො: ගෙවීම් ස්වභාවය පෙනෙන හෙයින්ද, අනිත්‍යය අන්ත-කෙළවර-කොට ඇති හෙයින්ද, මුල අග පෙනෙන බැවින්ද, පඤ්චස්කන්ධය අනිත්‍යයැයි අනිත්‍යය වශයෙන් බැලීම.

2. දුක්ඛතො: ඉපදීම, විනාශවීම දෙකින් නිතර නිතර පෙළෙන හෙයින්ද, සංසාර දුඃඛයට හසුවන හෙයින්ද පඤ්චස් කන්ධය දුක් වශයෙන් බැලීම.

3. රොගතො: හැම රෝගයකටම මූල්වන බැවින් රෝග වශයෙන්,

4. ගණ්ඩතො ගඩුවෙහි සවභාවය ඉදීම්ම, පැසවීම, පුපුරා යැම යන අවස්ථා තුනට පැමිණීමයි. එමෙන් පඤ්චස්කන්ධයද ජාති, ජරා මරණ නැතහොත් උත්පාද; ස්ථිති, භඞ්ග, අවස්ථා තුනකට පත්වෙයි, මෙසේ ගඩුවක්-සැරව පිරුණු ගෙඩියක් - වශයෙන් -

5. සල්ලතො: සල්ල යනු උලට නමකි. උලක් සිරුරෙහි ඇනුනුවිට දුක් වේදනාවක් ඇතිවේ. ඉවත දැමීමද අපහසුය. ඇතැම්විට එහි කුඩා කැබලි හැරීමට බෙහෙත් පවා බැඳිය යුතුය. පඤ්චස්කන්ධයද පවතින කල්හි දුක් පීඩා උපදියි (ජරා ව්‍යාධිත්වට පත්වීමෙනි) එසේම එයින් නිදහස්වීමට ආර්‍ය්‍ය මාර්ගයෙන්මුත් අනෙක් ක්‍රමයකින් නුපුළුවන. ඒ අතරතුර අස්මිමානාදී සියුම්දු ඉවත් කිරීමට කල්‍යාණමිත්‍ර සේවනයද යෙදිය යුතු. මෙසේ උලක් වශයෙන්

6. අඝතො: අඝ නම් පාපයයි. එහි ස්වභාවය ගර්භාලැබීම වැඩ එළවීම යනාදියයි. පඤ්චස්කන්ධයද එබඳු ස්වභාව ඇතියකි. එහෙයින් පාපයක් වශයෙන්-

7. ආබාධතො: ශේවරී භාවයක් - හුදකලාව වැඩ කිරීමේ ශක්තියක් - නූපදවන නිසාද රෝගයට කරුණු වන නිසාද ආබාධ වශයෙන්-

8. පරතො: තමාගේ වසඟයෙහි-තමා වෙත නැමීමෙහි නොපවත්නා නිසාද; විධානයෙහි - නියම කිරීමෙහි-ලා නොපිහි වන නිසාද, පඤ්චස්කන්ධය අනුන්ට අයිති දෙයක් හා සමානය. ඒ නිසා පර වශයෙන්-

9. පලොකතො: පඤ්චස්කන්ධය, ලෙඩවීම්, දිරාපත්වීම ආදියෙන් පලුදු-කැලැල් -වේ. ඒ නිසා කැලලක් වශයෙන්-

10. ඊතිතො: ඊති යනු කරදරයයි. පඤ්චස්කන්ධය නොයෙක් කරදරයනට ලක්වන හෙයින් ඊති වශයෙන්-

11. උපද්දවතො: කල්පනා නො කළාවූ, නො සිතා ගත්තාවූ නොයෙක් අවැඩ පැමිණෙන නිසා උපද්‍රව වශයෙන්-

12. භයතො: දණ්ඩභය, දුර්ගතිභය ආදී සියලු භයට උප්පත්තිස්ථාන හෙයින්ද නිර්භය සංඛ්‍යාත නිර්වාණයට ප්‍රතිපක්ෂ හෙයින්ද, භය වශයෙන්-

13. උපසග්ගතො: නොයෙක් අවැඩ ලුහුබඳින හෙයින්ද, රාග ද්වේෂාදී දෝෂයන් අවුත් හැපෙන හෙයින්ද, ඉවසීමට නුසුදුසු හෙයින්ද මේ හේතූන් නිසා පඤ්චස්කන්ධය විපතක් හා සමානය. එසේ විපත් වශයෙන්-

14. චලතො: ලෙඩවීම දිරාපත්වීම, ආදියෙන්ද, ලාභ අලාභාදී අටලෝ දහම් මලින්ද, සෙලවෙන සවභාවය ඇති නිසා චල වශයෙන්-

15. පභඞ්ගුතො: සවරසයවූ පඤ්චස්කන්ධයාගේම ලක්ෂණය නිසා හෝ උපක්‍රම නිසා හෝ විනාශවන සුළුවූයේනුයි පභඞ්ගු නම්. එසේ පභඞ්ගු වශයෙන්-

16, අද්ධුවතො; සෑම අවස්ථාවකදීම වැටෙන - විනාශවීමේ ස්වභාවය නිසාද, ස්ථිර වශයෙන් නො පවත්නා නිසා ද, අද්ධුව- අනිත්‍යය- වශයෙන්-

17. අතාණතො: ආරක්ෂා නො කරණ සවභාවය නිසා ද සැනසීම් නොලැබීම් ගතිය නිසාද, අතාණ වශයෙන්-
(තාණ යනු ආරක්ෂාවයි)

18. අලෙණතො: ඇලීමට නුසුදුසු නිසාද, ඇලුනහුට ආරක්ෂා කරණයක්-රැකෙන බවක්-නොමැති නිසාද අලෙණ වශයෙන්-

19 අසරණතො: ඇසුරලැබූ දුයෙහි හෝ අයිතියහුගේ හෝ ජාත්‍යාදී භය නොනසන නිසා පිහිට නැති වශයෙන්-

20 රිත්තතො: සිතාගත්තාලද නිත්‍ය, සුභ සුඛාදියක් නොමැති නිසා හිස් වශයෙන්-

21. තුච්ඡතො: ලාමක නිසාද සවල්ප නිසාද හිස්-

22 සුඤ්ඤතො: අයිති කෙනෙකු හෝ වෙසෙන, සාදන, විඳින කෙනෙකු හෝ නොමැති නිසා ශූන්‍ය වශයෙන්-

23. අනත්තතො: අයිතිකරුවෙකු නොමැති වශයෙන්-

24. ආදීනවතො: පැවැත්ම දුක් නිසාද, දුකෙහිද දොස් ඇති නිසාද, ආදීනව වශයෙන්-නැතහොත් දිළිඳු මිනිසෙකුගේ බැගෑපත් බවට පත්වීම් වශයෙන්-

25. විපරිණාමධම්මතො: ජරා මරණ දෙකින් වෙනස්වන නිසා විපරිණාම-පෙරළෙන- සවභාව වශයෙන්-

26 අසාරකතො: දුර්වල නිසාද, එළය සේ පහසුවෙන් බිඳිය හැකි නිසාද, අසාර වශයෙන්-

(එළය යනු ගසෙහි අරටුව නැති කොටසයි)

27 අසමූලතො: පාපයට–වැරැද්දට–මුල වශයෙන්-

28 වධකතො: නිත්‍යය, සුභය යනාදී වශයෙන් මිත්‍රයෙකු සේ අවුත් මුලාකරන සතුරෙකි නිසාද, නිත්‍යාදී වශයෙන් විශ්වාසය තැබූ ගතිය විනාශකරන නිසාද වධකයෙකු වශයෙන්-

29. විභවතො: ජරා මරණයට පත්වීමෙන් වැඩීම් සවභාවය පහවන නිසාද, විභව තෘෂ්ණාවෙන් යුක්ත නිසාද, විභව වශයෙන්-

30. සාසවතො; කාමාදී ආශ්‍රවයන්ට හෝ හව වශයෙන් පල්වීමට හෝ කරුණු නිසා ආශ්‍රව සහිත වශයෙන්

31. සංඛතතො: හේතු ප්‍රත්‍යයෙන් සකස්කළ වශයෙන් -

32. මාරාමිසතො මරණයට කෙලෙස් වලට, අසුවන නිසා මාරාමිෂ වශයෙන්

33–39 ජාති ජරා මරණ–ව්‍යාධි – සොකදපරිදෙව = උපායාස වශයෙන්-

40 සංකිලෙසධම්මතො: තෘෂ්ණා, දෘෂ්ටි, දුශ්චරිත යන ධර්ම තුන සංකිලෙසක නම්. ඔවුන්ගේ ස්වභාව වශයෙන් පඤ්චස්කන්ධය බැලීම.

මෙසේ සතළිස්ආකාරයෙන් පඤ්චසකන්ධය අනිත්‍යයවශයෙන් බලනුවේ අනුලෝම ඥානිය ලබයි. පඤ්චස්කන්ධයන්ගේ නිරුද්ධවීම වූ නිර්වාණය නිත්‍යය වශයෙන් බලනුවේ සම්මත්ත නියාමවූ ආර්ය මාර්ගයට බැසගනියි.

## සතළිස් ආකාර විදර්ශනා ක්‍රමය දෙසිය ආකාර බවට බෙදීම:-

අනිත්‍යාදී ලක්ෂණත්‍රය, එකක් පාසා ගත් කල අනුපස්සනා තුනකි. අනිත්‍යානුපස්සනා, දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනා යනුයි. එයින් අනිත්‍යානුපස්සනාවට අයත් ක්‍රම පණසෙකි අනත්තානුපස්සනාවට පස්විස්සෙකි. ඉතිරි එක්සිය පස්විස්ස(125) දුක්ඛානුපස්සනාවට අයත්ය. ඒ ක්‍රමය මෙසේය. සතළිස් ආකාරයන් අතුරෙන් අනිච්ච, පලොක, චල, පභඞ්ගු, අද්ධුව විපරිනාමධම්ම, අසාරක, විභව, සංඛත, මරණධම්ම යන දස අයුරු, එක් එක්

ස්කන්ධයක් කෙරෙහි බහා බැලූ කල්හි පඤ්චස්කන්ධයෙහි පණස් ආකාරයෙකි. මේ පණස අනිත්‍යානුදර්ශනයට අයත්ය. පර, රිත්ත, තුච්ඡ; සුඤ්ඤ, අනත්ත, මේ පස් අයුරු ස්කන්ධයන් පස කෙරෙහි විමෙන් විසිපස් ආකාර වෙයි. මෙවා අනත්තානුපස්සනාවට අයත්ය. ඉතිරි පස්විසි අයුරු, ස්කන්ධ පස කෙරෙහි· විමෙන් දුක්ඛානුපස්සනාව එක්සිය විසිපස් ආකාරවෙයි. මෙසේ සියල්ල දෙසිය ආකාරයි - 50 + 25 + 125=200.

## එක්සිය හැටපස් ආකාර විදර්ශනා ක්‍රමය

“සබ්බං තං රූපං අනිච්චතො වවත්ථපෙති එකං සම්මසනං. දුක්ඛතො වවත්ථපෙති එකං සම්මසනං, අනත්තතො වවත්ථපෙති එකං සම්මසනං.” යනාදී වශයෙන් පඤ්චස්කන්ධය කොටස්වලට බෙදා විදර්ශනා කරන අයුරු විස්තරවෙයි.

සියලු රූපයද, අතීත, අනාගත, වර්තමාන, ආධ්‍යාත්මික බාහිර, ඖදාරික, සූක්ෂම, හීන, ප්‍රණීත, දූර, සන්තික වශයෙන් එකොළොස් ආකාරයි මෙහි එකක් පාසා සම්මසන ක්‍රම පවතී. ඒ මෙසේය. අතීතවූ සියලු රූප වර්තමානයට නො පැමිණ එහි ම ගෙවී යයි. එහෙයින් අනිත්‍යය. සෙසු රූපත් මෙසේමය. දුඃඛ, අනාත්ම, ලක්ෂණයන්ටද බෙදී ගිය කල්හි රූපස්කන්ධය පිළිබඳ සම්මසන තෙතිසක් වෙයි. වේදනාදී සෙසු ස්කන්ධයන් කෙරෙහිද බෙදී ගිය කල්හි එක්සිය හැටපස් ආකාර වෙයි. (33 × 5=165) අටුවාවෙහි සඳහන් වනුයේ ‘අනිත්‍යය වශයෙන් පඤ්චස්කන්ධය කෙරෙහි පස්පණස් අයුරුයි. දුක්ඛ වශයෙන් ද පස්පණස් අයුරුය. අනාත්ම වශයෙන් පස්පණස් අයුරුය’ සියල්ල එක්සිය හැටපස් ආකාරයි. (55X3=165) යනුයි. මේ දෙවිධියම සමානයි.

තවද සන්මර්ශනයට යෝග්‍යවූ ද්වදසායතනාදී ධර්ම රාශි බෙද කොටස් කිරීමෙන් විදර්ශනා ක්‍රම රාශියක් හමුවෙයි. මේ කරුණු නිසා “නයවිදර්ශනා”යි කියනු ලැබේ.

සංක්ෂේප විදර්ශනාවෙන් අනිත්‍යාදී ලක්ෂණත්‍රය නොවැටහේනම් ඔහු විසින් නය විදර්ශනාවට බැසිය යුතුය. නය විදර්ශනාවෙහි යෝග කොට එයිනුදු අනිත්‍යාදීන් නො වැටහේනම් ඉක්බිති ශ්‍රද්ධාවාදී ඉන්ද්‍රිය ධර්ම දියුණු කළ යුතුය. එසේම සමථ ක්‍රමයෙහි දැක්වූවාසේ සප්පාය=අසප්පාය දැන සප්පාය ද සේවනය කළ යුතුය.

බොජ්ඣඞ්ග ධර්මයන් වැඩිය යුතුය. කෙසේ හෝ ජීවිතය ගැනද නොතකා නැවත නැවත යෝග කළ යුතුය. මෙසේ කරන්නහු විසින් ඇතැම් කලෙක රූප ධර්මයන්ද, ඇතැම් කලෙක නාම ධර්මයන්ද සන්මර්ශනය කළ යුතුය. එහිලා සන්මර්ශනය කරන අයුරු මෙතැන්සිට දක්වෙයි.

රූප සන්මර්ශනය කරන්නහු විසින් රූපයාගේ උප්පත්ති ක්‍රමය දතයුතුය ඒ කෙසේද? මේ රූපය කර්මාදී කරුණු සතරකින් හටගන්නේය එයිනුදු ප්‍රථමයෙන් හටගැනෙනුයේ කර්මයෙනි. එනම් ප්‍රතිසන්ධික්ෂණයෙහි, මව් ගැබක උපදින සත්වයාගේ පළමුකොට කර්මජරූප තිසක් උපදියි. එනම් වස්තු දසක, කාය දසක භාවදසක යනුයි. පඨවි, ආපෝ, තෙජෝ, වායෝ, වණ්ණ ගන්ධ, රස, ඕජා යන අවිනිර්භොග අට හා ජීවිතින්ද්‍රිය, හෘදය වස්තුව යන රූප දසක වස්තු දසක නම්. සෙසු ක්‍රමද මේ අනුසාරයෙන් සිතාගත යුතු. සෑම රූපයක්ම උප්පාද, ඨිති, භඞ්ග යන අවස්ථා තුනකින් යුක්තයි උප්පාද, භඞ්ග දෙක සමාන කාලයි. ඨිති අවස්ථාව චිත්තක්ෂණ සොළසක කාලයක්ම පවතී ඊට හේතුව රූපධර්ම ගරුපරිනාමයි. පෙරලීමට බොහෝ වේලාවක් ගතවිය යුතු අදහසයි. සිත එසේ නොව ලහුපරිනාමයි. උප්පාද, ඨිති භඞ්ග, අවස්ථා තුනම සමාන කාල ඇතියකි කරුණු මෙසේ හෙයින් ප්‍රතිසන්ධික්ෂණයෙහි කර්මජරූප උපදී. ඒවා නැවත චිත්තජරූප උපදින තෙක් එනම් චිත්තක්ෂණ සොළසක පමණ කාලයක් පවතී. චිත්තජ රූපයෝ හෘදයවස්තුව පුරෙජාත කොට, ප්‍රතිසන්ධි චිත්තයෙන් සතළොස් වැනි වාරයේදී ප්‍රථම භවඞ්ග සිතෙහි පටන් උපදින් ප්‍රතිසන්ධි ක්ෂණයෙහි ඉපදුනු කර්මජරූප ප්‍රතිසන්ධි චිත්තයෙන් මතු සොළොස්වැනි චිත්තක්ෂණයත් සමග නිරුද්ධවෙයි. ඨිති අවස්ථාවෙහි පැවති රූප සතළොස්වැනි චිත්තක්ෂණයත් සමග නිරුද්ධවෙයි. භඞ්ග අවස්ථාවෙහි වූ රූප සතළොස්වැනි චිත්තක්ෂණය සම්ප්‍රාප්තියට පත් වීම නිරුද්ධවෙයි. (සැලකියයුතු:- කර්මජරූපයන්හි ඇති ඕජා රූපය, තවත් ඕජාරූපයක් උපදවයි. එය තවත් ඕජා රූපයක් උපදවයි. මේ ක්‍රමයන්ගෙන් රූප උපදන අයුරු මේ සමගම සිතිය යුතු )

"කුසලා චෙතනා විපාකානං ඛන්ධානං කටත්තා ච රූපානං කම්මපච්චයෙන පච්චයො" යනාදී වශයෙන් පට්ඨාන යෙහි දේශිත බැවින් කුශලාකුශල චෙතනා සංඛ්‍යාත කර්මයෝ ප්‍රවෘත්ති අවස්ථාවේදී කර්මජ රූප නිපදවත් රූප නිපදවන කර්ම

පස්විස්සෙකි. අකුසල සිත් දොළොස, කාමාවචර කුශල් සිත් අට, අරූපාවචර කුසල් සිත් පස, යනුයි මෙසේ කර්මජ රූපයන් ගේ ඉපදීම ප්‍රතිසන්ධි, ප්‍රවෘත්ති, අවස්ථා දෙකෙහිම සිදුවේ.

චිත්තජ රූපයෝ ප්‍රතිසන්ධියට අනතුරුව ලැබෙන භවඞ්ග සිතෙහි පටන් එක් එක් චිත්තක්ෂණයෙහි ඇති උප්පාද අවස්ථාවන්හි පමණක් උපදිත්. ඨිති භඞ්ග අවස්ථා දෙකෙහිදී නූපදිත්. රූප උපදවනුයේ අරූප විපාක, දෙපස් විඤ්ඤාණ යන සිත් තුදුස හැර (ප්‍රතිසන්ධි චිත්තය හා අරහන්ත චුති චිත්තය සමග සොළසයි. ඉතිරි පන්සැත්තෑ සිත්වලිනි. චිත්තජ රූප ඉහතදී විස්තර කැරිණි. තේජෝ ධාතුව වූ සෘතුවෙන්ද රූප උපදී. සෘතුජ උපදිනුයේ ස්ථිති අවස්ථාවේදීය. ඕජා රූපයවූ ආහාරයෙන්ද රූප උපදී. අධ්‍යාත්මික බාහිර වශයෙන් ආහාරය දෙවැදෑරුම්ය. චතුසමුට්ඨානයන්හි ඇති ඕජාව ආධ්‍යාත්මික ආහාරයයි. කෑම්, බීම් ආදියෙන් ගනු ලබන ඕජාව බාහිර ආහාරයයි. බාහිර ආහාරය කුසෙහි තැන්පත්වූයේ රූප උපදවයි. අධ්‍යාත්මික ඕජාව මොහොතක් පාසාම රූප උපදවයි.

මෙසේ රූපයන්ගේ උත්පත්තිය බලන්නේම විනාශයත් දක්නා හෙයින් රූප සන්මර්ශනය සම්පූර්ණවේ. උදය-වය දෙක දෙක පෙනේ. අරූප සමර්ශන කරන්නහු විසින් නාම ධර්මයන්ගේ උප්පාද ක්‍රමය දැකිය යුතුය. ඒ පිළිබඳ විස්තර ප්‍රත්‍යසමුත්පාද යෙහි දක්විණ. මෙනයින් කලෙක රූපද, කලෙක නාමද, සන්මර්ශනය කිරීමෙන් පෙරකී පරිදි අනිත්‍යාදී ලක්ෂණත්‍රය මැනවින් අවබෝධවෙයි මෙහිනුදු කායී සිද්ධිය නුවූයේනම් රූප සප්තක, අරූපසප්තක ක්‍රමයන්ට අනුව නාම රූප සන්මර්ශනය කළ යුතුය. ඒ මෙසේය.

## රූපසප්තක ක්‍රමය:

"ආදානනික්ඛෙපතො - වයො වුද්ධත්ථ ගාමිතො
ආහාරතො ච උතුතොච - කම්මතො චාපි චිත්තතො
ධම්මතා රූපතො සත්ත - විත්ථාරෙන විපස්සති"-ව. ම.

ආදාන නික්ඛෙපන - වයොවුද්ධත්ථගාමී - ආහාරරූප=උතුරූප කම්මජරූප චිත්තජ ධම්මතා රූප වශයෙන් යන සත් ආකාර ක්‍රමයයි.

## 1. ආදාන නික්ඛෙපන වශයෙන් විදර්ශනාවට නැංවීම.

මෙහි "ආදාන" යනු ප්‍රතිසන්ධියි. නික්ඛෙපන නම් චුතියයිද යෝගාවචර තෙමේ මේ ප්‍රතිසන්ධි - චුති අතර ඇති අවුරුදු සියයක කාල සීමාව පිරිසිඳ, රූප ධර්මයන් ත්‍රිලක්ෂණයට නඟයි. ඒ ඒ මෙසේය. ප්‍රතිසන්ධි-චුති අතර ඇති රූපධර්ම ඉපදීම් විනාශවීම්, නිසාද, ජරා මරණ දෙකෙන් පෙරළෙන නිසාද, බොහෝ වේලා පවතින හෙයින් ක්ෂණික නිසාද, නිත්‍ය ස්වභාවයට විරුද්ධ නිසාද යන මෙතෙක් කාරණයන් නිසා අනිත්‍යයයි ව්‍යවස්ථා කෙරේ. එසේම මේ රූපධර්ම ස්ථිතියට පැමිණේ. ස්ථිතියට පත්වූයේ දිරාපත්වෙත්. අවශානයේ බිඳී යයි. මෙසේ නිතර ඉපදීම්, දිරාපත්වීම්, ලඳීම්, වලින් පෙළෙන හෙයින්ද, දුකටම වස්තුවූ හෙයින්ද, දුඃඛයි, උපන් රූපධර්ම-උප්පාද අවස්ථාවේවූ රූප ධර්ම ස්ථිතියට නො පැමිණෙත්වා"යිද, ස්ථිතියට පත්වූ රූපධර්ම දිරීමට නොපැමිණෙත්වායිද දිරීම් බවට පත්වූ රූපධර්ම" විනාශයට නොයෙත්වා'යිද යන මෙතෙක් තන්හිදී තමාගේ වශඟත්වයට නො එන හෙයින්ද, ඒ නිසාම අස්වාමක-භිම්යෙකු නැති-බවෙන්ද, එසේම කාරක වේදකාවින් නො මැති ති නිසා හිස් බවෙන්ද, ශුන්‍ය හෙයින් අනාත්මය, මෙසේ ආදාන නික්ඛෙපන වශයෙන් ත්‍රිලක්ෂණයට නංවා විදර්ශනා කෙරෙයි.

## වයෝ වුද්ධත්ථගාමී වශයෙන්.

වයස් සීමාව වශයෙන් වැඩුනා වූ රූපධර්මයන්ගේ විනාශවන ක්‍රමය බලා ත්‍රිලක්ෂණයට නැංවීම මෙයින් අදහස් කෙරේ. ඒ මෙසේය. විදර්ශකයා, සම්පූර්ණ වයස් සීමාව වූ අවුරුදු සියය, ප්‍රථම - මධ්‍යම - පශ්චිම වශයෙන් තුනකට කොටස් කරයි. ප්‍රථමයට අවුරුදු තෙතිසකි. මධ්‍යමයට අවුරුදු සූතිසෙකි. පශ්චිමයට තෙතිසෙකි, මෙසේ කොටස් කර, ප්‍රථම වයසෙහි වූ රූපධර්ම මධ්‍යම වයසට නො පැමිණ නිරුද්ධ වන හෙයින් අනිත්‍යය, යනාදී වශයෙන් අනිත්‍ය ලක්ෂණය පිරිසිඳියි. යමක් අනිත්‍යය ද එය දුකයැයිද, යමක් දුකද එය අනාත්මයැයි ද සෙසු ලක්ෂණ දෙකක් ඒ ම ක්‍රමයෙන් පිරිසිඳියි.

ඉක්බිති මන්ද, ක්‍රීඩා, වර්ණ, බල, ප්‍රඥා, හායන, ප්‍රාග්භාර, ප්‍රවඞ්ක, මොමූහ, ශයන, යන දස අවස්ථාවන්ට අනුව අවුරුදු දසය බැගින් පිරිසිඳියි. ඉපදීමේ සිට අවුරුදු දහය තෙක් ඇති ප්‍රථම කාල සීමාව මන්ද දසකය නම්. එතැන් සිට ක්‍රීඩා බහුල භාවය ඇති

දස අවුරුදු කාල සීමාව ක්‍රීඩා දසක නම් ඉන්ද්‍රියයන්ගේ හා ජීවියෙහි වර්ණවත් භාවයට පැමිණෙන දස අවුරුදු කාල සීමාම වර්ණ දශකයි. එතැන් සිට කායික ශක්තිය දනවන අවුරුදු දහය බල දසක නම් ප්‍රඥාව නැගී සිටින දස අවුරුදු සමය ප්‍රඥා දශකයි. එතැන් සිට ක්‍රමයෙන් ප්‍රඥාවේද ශක්තියෙහි ද, වර්ණයෙහි ද, වේගය අඩුවන දස අවුරුදු සමය හායන දසක නම්. ශරීරය මදක් ඉදිරියට නැමීමෙන් පෙන්නුම් කරන දුර්වල කාල සීමාව ප්‍රාග්භාර දසක නම්. හොඳට ම නැමී, දුර්වල භාවයට පත් සමය ප්‍රවඞක දසකයි. කිසිදු කරුණක් වටහා ගැන්මට ශක්තියක් නොමැති සිහිය මද - අඩු - කාල සීමාව මෝමූහ දසක නම්. බොහෝ සෙයින්ම වැතිර නිදන අවසාන දස අවුරුද්ද ශයන දශකයයි. මේ දශකයන්ට අනුව, ඒ දශක අවස්ථාවන්හි වූ රූප ධර්ම, ඊළඟ දශකයට නො පැමිණ විනාශ වෙයි. යනාදී වශයෙන් අනිත්‍යය බලයි. දුඃඛ, අනාත්ම, ද මෙසේ සලකයි. මෙසේ දශක දශකයන්ට අනුව ත්‍රිලක්ෂණය ආරෝපනය කරයි.

ඉක්බිති අවුරුදු පහ බැගින් සීමා කොට අනිත්‍යාදීන්ට නංවයි. නැවත අවුරුදු සතර බැගින් කොටස් පස්විස්සකට ද, එසේ ම අවුරුදු තුන, දෙක, එක; බැගින් ද කොටස් කර බලයි. නැවත එක් අවුරුද්දක් සෘතු තුනකට ද, නැවත සය සෘතුවට ද, බෙදයි. නිකිණි, බිනර, දෙමස වස්සාන සෘතුවයි. වප්, ඉල්, සරද සෘතුවයි. උඳුවප්, දුරුතු හෙමන්තයි. නවම්, මැදින්, සිසිරයි. බක්, වෙසක්, වසන්තයි. පොසොන්, ඇසළ, දෙමාසය ගිම්හාන සෘතුවයි. මේ එක් එක් සෘතුවෙහි වූ රූප ධර්ම, ඊළඟ සෘතුවට නොපැමිණ විනාශයට යේ, එහෙයින් අනිත්‍යය.

ඉක්බිති කළුවර පක්ෂය, ශුක්ල පක්ෂය, - අවපස, පුර පස - වශයෙන් බෙදා බලයි. නැවත ඒක් දිනක් දිවා, රැ වශයෙන් කොටස් කරයි. දිවා කාලය පූර්වාහ්න, මධ්‍යාහ්න, සායන්හ, වශයෙන් කොටස් තුනකට ද, රාත්‍රි කාලය පූර්ව යාමය, මධ්‍යම යාමය, පශ්චිම යාමය, වශයෙන් තුනකට ද, කොටස් කෙරේ. අද පවත්නා කාල සීමාවේ අයුරින් නම් අළුයම හයේ සිට උදේ දහය තෙක් ඇති පැ සතරේ කාල සීමාව පූර්වාහ්නයි. උදේ දහයේ සිට දවල් දෙක තෙක් ඇත්තේ මධ්‍යාහ්නයයි. පැ හතරයි. දවල් දෙකේ සිට සවස හය තෙක් සායන්හ සමයයි. පැ හතරයි. සවස හයේ සිට රාත්‍රි දහය තෙක් ඇති පැ සතර පූර්වයාමයයි. රාත්‍රි දහයේ සිට දෙක තෙක් ඇති පැ සතර මධ්‍යම යාමයයි.

එතැන් සිට උදේ හය තෙක් ඇති පැ සතර පශ්චිම යාමයයි. මෙසේ කොටස් කර, එක් එක් සිවු පැයේ වූ රූපධර්ම, ඊලඟ සිවු පැයට නොපැමිණ විනාශ වේයයි අනිත්‍යය බලයි.

ඉක්බිති ඉදිරියට යාමය, ආපසු ඒමය, ඉදිරි බැලීම, අවට බැලීම, අත් පා හැකිලීම හා දිග හැරීම, යන අවස්ථා සයට බෙද ඒ එක් එක් අවස්ථාවේ පැවති රූප ඊලඟ අවස්ථාවට නො පැමිණ නිරුද්ධ වෙයි. යනුවෙන් අනිත්‍යය බලයි නැවත එක් පද වාරයක් කොටස් සයකට බෙදයි. උද්ධරණ, අතිහරණ, වීතිහරණ, වොස්සජ්ජන, සන්නික්ඛෙපන, සන්නිරුම්භන, යනුයි. පාදය භූමියෙන් එසවීම උද්ධරණයි ඉදිරියට යැවීම අතිහරණ නම්. කණු, කටු, ආදී දෙයක් දැක, පා තැබීම සඳහා එහා මෙහා පය යැවීම වීතිහරණයි පය භූමිය වෙත තැඹුරු කිරීම වොස්සජ්ජන නම්. සන්නික්ඛෙපන යනු පොළොවෙහි තැබීමයි. තැබූ පය නැවත එසවීම සඳහා භූමියෙන් එසවීමක් සමග උඩට ගැනීම සන්නිරුම්භන නම්. මේ එක් එක් අවස්ථාවෙක්හි වූ රූප ධර්ම, ඊලඟ අවස්ථාවට නොපැමිණම නිරුද්ධ වෙයි යනුවෙන් අනිත්‍යය බලයි. එසේම දුඃඛය, අනාත්මය ද, බලමින් ව්‍යවස්ථා කෙරේ. වශෝ වුඩ්ඨානගාමී විදර්ශනා යනු මේ ක්‍රමයයි.

## 3 ආහාරමය රූප වශයෙන්.

ආහාරයම රූප කුසගිනි ඇති කල්හි ද, කුස පිරුණු කල්හි ද ප්‍රකට වෙයි. - ඡාත, සුහිත, කාල දෙකයි මේ - කුසගිනි ඇති කාලයෙහි උපදින රූප වියලුනු ගතියෙන් යුක්තය. එසේම දුර්වර්ණය. කුස පිරුණු කල්හි උපදින රූප, පිම්බීම් ගතියෙන් යුක්තය. එසේම ප්‍රසන්නභාවයක් පවතී. මෘදුයි. යහපත් පහස් උපදවයි. විදර්ශකයා මේ කාල දෙක වශයෙන් රූප පරිග්‍රහ කර ඡාත කාලයෙහි පැවති රූප, සුහිත කාලයට නො පැමිණම නිරුද්ධ වෙයි මේ ආදී වශයෙන් අනිත්‍යය බලයි

## 4 සෘතුමය රූප වශයෙන්.

මේ රූප ප්‍රකට වනුයේ ශීත, උෂ්ණ, කාල වශයෙනි. ශීත කාලයෙහි උපන් රූප මෘදුයි. ප්‍රණීතයි පිරුණු ගතියෙන් යුක්තයි. උෂ්ණ කාලයෙහි පැවති රූප වියලුනු ගතියෙන් යුක්තයි. එසේම දුර්වර්ණයි. දුබයි. මේ රූපද පෙර පරිද්දෙන් විදර්ශනාවට නංවා බලයි.

## 5 කම්ජ රූප වශයෙන්.

කම්ජ රූප වැටහෙනුයේ ද්වාර වශයෙනි. චක්ෂුර් ද්වාරයෙහි කර්මජ රූප තිසෙකි. එනම් චක්ඛු - කාය - භාවදසක ත්‍රයයි. ඊට අනුව ගිය සෘතු ජාදී ත්‍රිජ රූප සූවිස්සෙකි. අවිනිර්භොග ත්‍රයයි. ඒ (8x3=24) ශ්‍රොත්‍රාදී සෙසු ද්වාරයන්හිද මෙසේම ය. මනොද්වාරයෙහි රූප සිවු පණසෙකි (54). (මෙහි මනොද්වාර යනු ආවර්ජන සහිත වූ භවඞ්ග සිත ආශ්‍රය කොට ඇති හෘදය වස්තු රූපයයි.) හදය වත්‍ථු, කාය භාව, දශක ත්‍රය හා ත්‍රිජරූපවූ සූවිස්සයි. (30 + 24=54) මෙසේ පිරිසිඳ චක්ෂුර් ද්වාරයෙහි පැවති රූප එහිම නිරුද්ධ වෙයි. ශ්‍රොත්‍රද්වාරාදියකට නො පැමිණේ. යනාදි වශයෙන් ත්‍රිලක්‍ෂණයට ආරෝපනය කෙරේ.

## 6. චිත්තජ රූප වශයෙන්.

මේ රූප සොමනස්ස, දොම්නස්ස, කාලයන්ට අනුව ප්‍රකට වේ. සොමනස්ස කාලයෙ උපන් රූප සුහිත කාලයෙහි උපන් රූප මෙන් පිරුණේ වෙයි. මෘදුයි. මේ ආදී වශයෙන් පරිග්‍රහ කර අනිත්‍යාදී වශයෙන් බලයි.

## 7 ධර්මතා රූප වශයෙන්:

ශරීරයට අයත් නොවූ බාහිර වශයෙන් පවත්නා යකඩ, ලෝහ, සුදුර්යම්; කළුර්යම්, රත්රන්, රිදී මැණික්, මුතු වෙරළු මිණි, සක්, කළුගල්, පබළු, පියුම්රාමිණි - පද්මරාගමාණික්‍යය-මසාරගල්ල, පොළොව, ගල්, පර්වත, තෘණ, වෘක්ෂ, ලතා, ආදීහු රූප ධර්මතා රූප නම්. මොවුන්ගේ විනාශය බැලීම ද එක් විදර්ශනා ක්‍රමයකි. බොහෝ සෙයින් විදර්ශකයාට මේවායේ විනාශය වැටහෙනුයේ අශෝක අඩකුරාදීන්ගේ වශයෙනි- අශෝක අඩකුරය මුලදී, තුනී රත් පැහැයයි. දින දෙකක් - තුනක් ඉක්ම යත්ම තද රත් පැහැය ඇතිවෙයි. නැවත දින දෙක තුනක් යත්ම මද රත් පැහැය ගනියි ඉක්බිති දළු පැහැය, මේරූ කොළ පැහැය, ආදී වශයෙන් පන්වී අවුරුද්දක් පමණ ගිය තැන නටුවෙන් ගිලිහී බිම වැටෙයි මෙසේ මෙනෙහි කරද්දී මුලදී තුබූ පැහැය ඊළඟ අවස්ථාවට නො පැමිණ විනාසයට ගියේය. යනාදි වශයෙන් රූප ධර්මයන්ගේ විනාශය පෙනී යයි. ඉක්බිති ඒ ධර්මතා රූපද අනිත්‍යාදියට නංවා බලයි. මෙසේ රූප සප්තක ක්‍රමයෙන් ත්‍රිලක්‍ෂණයට ආරෝපනය කොට සංස්කාර ධර්මයන් සම්මර්ශනය කරයි.

2019 10 05 Paññápárami Na Uyana Free Distribution

## අරූප සප්තක ක්‍රමය.

'යං පන වුත්තං අරූප සත්තක වසෙනා' ති තත්‍ථ අයං මාතිකා - කලාපතො යමකතො ඛණිකතො පටිපාටිතො දිට්ඨි උග්ඝාටනතො මාන උග්ඝාටනතො නිකන්ති පරියාදාන තො'ති'' - වි. ම.

1. කලාප වශයෙන් නාම ධර්ම විදර්ශනාවට නැංවීම.

මෙහි ''කලාප'' යනු ඵස්සපඤ්චමක වූ ධර්ම සමූහයයි. එනම් චිත්ත, චේතනා, සඤ්ඤා, වේදනා, ඵස්ස, යනුයි. එක් රූප ධර්මයක් යම් සිතකින් විදර්ශනා කරයි නම් ඒ සිත සමග ඉපදුනු මේ පඤ්ච ධර්මයෝ අනික් රූප ධර්මයක් විදර්ශනා කරද්දී නිරුද්ධ වෙත්. අන්‍ය වූ පඤ්ච ධර්මයක් උපදී. මේ වශයෙන් සෑම සිතක් පාසාම ඒ ඒ ඵස්සපඤ්චමක වූ නාම ධර්මයෝ බිඳී බිඳී යෙත්යයි සිහියට නංවා අනිත්‍යාදී වශයෙන් ත්‍රිලක්ෂණයට ආරෝපනය කෙරේ.

## 2 යමක වශයෙන්

යමක යනු යුගලයි. දෙකයි. රූප ධර්මයන් සම්මර්ශනය කරද්දී යම් සිතකින් රූප ධර්ම අදූනතිකෙබපනාදී වශයෙන් සම්මර්ශනය කෙළේ දී, ඒ සම්මර්ශනය කළා වූ සිත ද අනෙක් සිතකින් සම්මර්ශනය කිරීම යමක නම් ඒ සම්මර්ශනය සිතට අරමුණු වූ රූප ධර්ම අනිත්‍යාදී භාවයෙන් දක්නාසේ සම්මර්ශන සිත ද අනිත්‍යාදි භාවයෙන් දැකීම මෙයින් අදහස් කෙරේ. ඒ රූප ධර්මයි. මේ නාම ධර්මයි.

## 3 ඛණික වශයෙන්.

එක් රූප ධර්මයක් අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කොට ඒ පළමුවැනි සිත දෙවැනි සිතෙන් ද, දෙවැනි සිත තුන්වැනි සිතෙන් ද, මේ ආදී ක්‍රමයෙන් මොහොතක් පාසා නාමධර්ම සම්මර්ශනය කිරීම ඛණික වශයෙන් විදර්ශනා කිරීමයි, සතර සිත් පමණක් විදර්ශනා කෙරේයයි විශුද්ධි මාර්ගයෙහි සඳහන් වෙයි.

## 4. පටිපාටි වශයෙන්.

ඛණික වශයෙන් ආ ක්‍රමය සතර සිත් වලින් නොපමිත්වා පිළිවෙලින් සිත් එකොළොස දක්වා ගොස් එකොළොස්වැනි සිතෙන් දහවැනි සිතද ත්‍රිලක්ෂණයට නංවන ක්‍රමය පටිපාටි වශ

යෙන් විදර්ශනා කිරීමයි. ඒ විදර්ශකයා ආදානනික්ඛෙපනාදි වශයෙන් රූපධර්ම විදර්ශනා කොට, නැවත ඒ විදර්ශනා කළ සිත ද දෙවැනි සිතෙන් අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කරයි. මෙසේ. පිළිවෙළින් විදර්ශනා කර දසවැනි සිතට පත්වූ පසු එකොළොස් වැනි සිතෙන් දසවැනි සිත ද විදර්ශනා කරයි. මේ නාම ධර්ම පටිපාටි වශයෙන් විදර්ශනා කිරීමයි,

## 5, 6, 7, දිට්ඨි උග්ඝාටනාදී සෙසු ක්‍රම තුන.

මෙහි කිවයුතු වෙනම විදර්ශනා ක්‍රම නොමැත. ඉහත දැක් වූ නාමරූප ධර්මයන්ගේ අනිත්‍යාදිය බලත්ම විදර්ශකයාට "මමය" යන ඇති සඤ්ඤාව දුරුවෙයි. එහෙයින් පෙර පැවති සක්කාය දිට්ඨිය උද්ඝාටනය වේ. ඉදිරී යයි. ආත්මීය හැඟීම් දුරු වන හෙයින් මානය උද්ඝාටනය වෙයි. එසේම බිඳි බිඳී යන නාම රූප ධර්මයන් දකිත්ම ඒ පිළිබඳ ඇලුම් තෘෂ්ණාව ද පහව යේ. නිකන්ති යනු තෘෂ්ණාවයි· එය හාත්පසින්ම ගැනීම පරියාදානයි. මෙසේ අරූප සප්තක ක්‍රමයෙන් සංස්කාර ධර්ම ත්‍රිලක්ෂණයට ආරෝපණය කරයි.

මෙහෙයින් රූපකර්මස්ථානය ද, අරූප කර්මස්ථානය ද ප්‍රගුණ වූ කල්හි ඒ විදර්ශකයා අටළොස් මහා විදර්ශනාවට බසියි.

## අට්ඨාරස මහා විදර්ශනා ක්‍රමය:

අනිච්ච, දුක්ඛ, අනත්ත, නිබ්බිදා විරාග, නිරොධ, පටිනිස්සග්ග ඛය, වය, විපරිණාම, අනිමිත්ත, අප්පණිහිත, සුඤ්ඤත, යන අනුපස්සනා තෙළෙස (13) හා අධිපඤ්ඤා ධම්මවිපස්සනා, යථාභූතඤාණ දස්සන, යන පසළොස ද ආදීනව පටිසංඛා - විවට්ටානුපස්සනා ත්‍රයද, අට්ඨාරස මහා විපස්සනා යි

1. සියලු සංස්කාර අනිත්‍යයට අනුව බැලීමෙන් නිත්‍ය සඤ්ඤාව දුරුවේ.
2. දුඃඛයට අනුව බැලීමෙන් සුඛ සඤ්ඤාව ද,
3. අනාත්ම වශයෙන් බැලීමෙන් ආත්ම සඤ්ඤාව ද,
4. නිර්වේද - කලකිරීම - අනුව බැලීමෙන් නන්දිය ද,
5. විරාග - නො ඇලීම - අනුව බැලීමෙන් රාගය ද,
6. නිරෝධයට අනුව බැලීමෙන් සමුදය ද,

7, ප්‍රතිසංඛ්‍යානය - අනහැරීමට - අනුව බැලීමෙන් ආදාන - ගැනීම - ද,

8. ක්‍ෂය - ගෙවීම - අනුව බැලීමෙන් ඝන සඤ්ඤා - පොදි හැඟුණු ගතිය - ද,

9 ව්‍යය - විනාශය - අනුව බැලූමෙන් ආයූහන - රැස්කිරීම ද,

10. විපරිණාම - පෙරලෙන ගතිය - අනුව බැලූමෙන් ධ්‍රුව - නිත්‍ය - හැඟීම් ද.

11. අනිමිත්ත - නිත්‍ය නිමිති නැතිබව - අනුව බැලීමෙන් නිත්‍ය යද;

12. අප්‍රණිහිත - සුඛ හෝ රාග හෝ ප්‍රාර්ථනා නොමැති බව - අනුව බැලීමෙන් ප්‍රණිධිය - පැතීම - ද,

13. සුඤ්ඤත - හිස් බව - අනුව බැලීමෙන් අභිනිවෙස - ආත්ම වශයෙන් බැස ගැන්ම -ද,

14. අධිපඤ්ඤාධම්මවිපස්සනා - සංස්කාර අනිත්‍යාදි වශයෙන් බලන ඥානය - යන විදර්ශනාව වඩන්නේ තෘෂ්ණා දෘෂ්ටි දෙකින් දැඩි ලෙස ගැන්ම ද,

15. යථාභූතඤාණදස්සන - හෙතු ප්‍රත්‍ය සහිත නාමරූප දක්නා නුවණ - වඩන්නේ මූලාවෙන් බැස ගැනීම් ද,

16. ආදීනව - දොස් සහිත බව - අනුව බැලීමෙන් තෘෂ්ණාවෙන් බැස ගැනීම ද,

17. පටිසංඛා - සංස්කාරයන්ගෙන් මිදීමේ උපාය ඥානය - අනුව බැලීමෙන් අවිඥාව ද,

18. විවට්ට - පෙරලීම, එනම් සංස්කාරොපෙක්‍ෂා ඥානයෙන් හා අනුලෝමඥානයෙන් සියලු සංස්කාරයන් කෙරෙන් සිත පෙරලීමයි. මේ ඥානද්වය උපදින්නම ඒ පෙරලීම සිදුවේ යනු තේරුමයි. ඊට අනුව බැලීමෙන් කාම සංයොගාදී සංයෝග - යෙදීම් - ද දුරු කෙරේ.

මෙසේ සංස්කාර ධර්ම ත්‍රිලක්ෂණයට නගා විදර්ශනා කිරීමෙන් සම්මසන ඥානය මස්තකප්‍රාප්ත වේ. පටිසම්භිදාමග්ගයෙහිද "ජාතිය නිසා ජරා මරණ වෙයි. ජාතිය නැති කල්හි ජරා මරණ නැතැයි සංක්ෂෙප කොට මෙසෙහි කිරීමේ ප්‍රඥාව සන්මර්ශන ඥානයැ''යි යනාදී වශයෙන් ප්‍රත්‍ය ධර්ම දෙලොස පිළිබඳවද විදර්ශනා ක්‍රමය දක්වේ. "එහෙයින් අතීතානාගත වර්තමාන ධර්ම

ගත් සංක්ෂෙප කොට මෙනෙහි කිරීමේ ප්‍රඥාව සම්මර්ශන ඥාන යැයි කියනු ලැබේ" යනුවෙන් සම්මසන ඤාණ විස්තරය අවසන් කෙරේ.

"අතීතානාගතපච්චුප්පන්නානං ධම්මානං සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං"

සම්මසන ඤාණය නිමි.

## 6. උදබ්බය ඤාණය.

"පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං" - ප. ම.

ප්‍රත්‍යුත්පන්න=වර්තමාන= ධර්මයන් ගේ විපරිනාමය දැකීමෙහි ප්‍රඥාව උදයව්‍යයානුදර්ශනයෙහි ඥානයයි එවේලෙහි පවතින නාමරූප ධර්මයන්ගේ පෙරළෙන ගතියට අනුව බලන නුවණ උදයබ්බය ඤාණයැයි දෙසූ පරිදියි ඒ. මෙහි නාම රූප ධර්මයන්ගේ විපරිනාමය පමණක් ගෙන උදයබ්බය ඤාණ යැයි දෙසූයේ විපරිනාමය දකින්ම උදය-ඉපදීම-ද දක්නා හෙයිනි. ගසකින් වැටෙන්නෙකු දුටුවිට "මොහු, වැටෙන්නේ නැග ගත් නිසා නොවේ ද"යි ගැටෙන්නා සේ විපරිනාමය දකින්ම උදයත් දුටුයා හා සමානය. එහෙයින් පහසුවෙන් තේරුම් ගැනීමට හැකිවන පරිද්දෙන් උදයබ්බය ඤාණය විපරිනාමය දක්නා නුවණයැයි දෙසී, "වර්තමාන නාමරූපයන්ගේ ඉපදීමත් විනාශයත් බලන නුවණ උදයබ්බය ඤාණනාමි. යනුවෙන් අර්ථ අවබෝධ කට යුතු.

"උදයබ්බය" යන්නෙහි පද දෙකකි. උදය, වය, යනුයි. මෙහි උදය යනු ඉපදීමයි වය නම් විනාශයයි. ඒ විනාශයද අතුරු දහන් වූවාසේ නොව ගෙවීම් ස්වභාවයට පත්වීමයයි දතයුතු. වය යන්නෙහි, හැඟෙන තේරුම ගෙවීමයි අනිත්‍ය ලක්ෂණය විස්තර කරද්දී දැක්වූ "ඛයට්ඨෙන අනිච්චං" ක්ෂයාර්ථයෙන් අනිත්‍යයිද සිහි කටයුතු. මෙසේ ඉපදීම්, ගෙවීම්. දෙක උදයබ්බය නමි.

මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය සම්පාදනයෙහිලා ආරම්භක විදර්ශකයා සංස්කාර ධර්මයන් ගේ අනිත්‍යාදී ලක්ෂණ ත්‍රය පිරිසිඳ, නිත්‍යාදී වැරදි හැඟීම් දුරුකොට, නැවත හැරෙනුයේ ඒ අනිත්‍යාදී ලක්ෂණ ත්‍රයට අනුව ව්‍යවස්ථාපනය කළ සංස්කාර ධර්මයන්ගේ

ඉපදීම හා විනාශවීම බැලීමටය. ඒ දෙදන නුවණ උදයබ්බය ඥාණය යි. ආරම්භ කිරීමේදී පිළිපදිනුයේ සංක්ෂේප - කෙටි - ක්‍රමයකි. ඒ මෙසේය.

## සංක්ෂේප උදයව්‍යයානු දර්ශනය.

"කථං පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං? ජාතං රූපං පච්චුප්පන්නං, තස්ස නිබ්බත්ති ලක්ඛණං උදයො, විපරිණාමලක්ඛණං වයො, අනුපස්සනා ඤාණං - පෙ-"

වර්තමාන ධර්මයන් ගේ විපරිණාමයට අනුව දක්නා වූ නුවණ උදයබ්බයානුපස්සනාවෙහි ඥානය වනුයේ කෙසේද? උපන් රූපය වර්තමාන නමි. එහි ඉපදීම ස්වභාවය උදය යි. පෙරළෙන ගතිය වය යි. ඊට අනුව දැකීම නුවණයි." යනාදී වශයෙන් වර්තමාන වූ රූපාදී පඤ්චස්කන්ධය ආදී ධර්ම සමූහය පිළිබඳ ඉපදීම ලක්ෂණයත්, විනාශ වීම් ලක්ෂණයත්, බැලීමට ආරම්භ කරමි හේ මෙසේ දකියි "මේ ඉපදුනා වූ සංස්කාර ධර්මයෝ පෙර රාශිභූතව ද නොතිබුනාහ. විනාශයෙන් පසු රාශිවශයෙන් යන තැනකුදු නොමැත. ඉපදුනු සංස්කාර ධර්මයන් ගේ රැස්වීම වශයෙන් ඒමක් ද නොමැත" කියායි. මෙසේ සංස්කාර ධර්මයන් වෙන් වෙන් වශයෙන් ම දැක, ඒවායේ ඉපදීම, විනාශය, දකිමින් වාසය කෙරෙයි. මේ කෙටි ක්‍රමයයි.

## සමපණස් ආකාර උදයබ්බය ක්‍රමය.

ඉක්බිති ඒ විදර්ශකයා පඤ්චස්කන්ධයේ ඉපදීමට හේතු විමසා බලයි. "අවිජ්ජා සමුදයා රූප සමුදයො" ආදී දේශනා ක්‍රමයට අනුව බලන්නම රූපස්කන්ධයා ගේ ඉපදීමට හේතු වී පවත්නා ධර්ම සතරක් දකී. එනම් අවිද්‍යා, තෘෂ්ණා, කර්ම, ආහාර, යනුයි. නැවත නිබ්බත්ති ලක්ඛණය ද ගෙන රූපස්කන්ධය කෙරෙහි ලක්ෂණ පඤ්චකයක් දකියි. වේදනා නාමස්කන්ධයන් කෙරෙහි ද ආහාර ලක්ෂණය නම් අරූපීවූ ඵස්සාහාරාදීහුයි. (ඵස්ස, මනෝ සඤ්චේතනා, විඤ්ඤාණ, යන ත්‍රිවිධ ආහාර යි.) මෙසේ පඤ්චස්කන්ධය කෙරෙහි පස්විසි ආකාරයක් වෙයි.

"අවිජ්ජා සමුදයා රූපසමුදයො, තණ්හා සමුදයා රූප සමුදයො, කම්මසමුදයා රූපසමුදයො, ආහාර සමුදයා රූප

සමුදයො’ ති පච්චය සමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති. නිබ්බත්තිලක්ඛණං පස්සන්තො රූපක්ඛන්ධස්ස උදයං පස්සති, රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්චලක්ඛණානි පස්සති -පෙ” වේදනාස්කන්ධාදියෙහි ද මෙසේමය. තේරුම සුගමැයි.

ඉක්බිති “ව්‍යය” බලනුයේ පඤ්චස්කන්ධය කෙරෙහි පස්විසි ආකාරයක් දකියි. “අවිජ්ජා නිරොධා රූපනිරොධො” ආදී වශයෙන් රූපස්කන්ධයෙහි ලක්‍ෂණ පසකි. එයින් සතරක් නිරෝධ ධර්මයි. අනිත්‍ය විපරිනාම ලක්‍ෂණයයි. අවිද්‍යා නිරෝධයෙන් රූප නිරෝධය වෙයි. තෘෂ්ණා නිරෝධයෙන් රූප නිරෝධය වෙයි. කර්ම නිරෝධයෙන් රූප නිරෝධය වෙයි. ආහාර නිරෝධයෙන් රූප නිරෝධය වෙයි. මෙසේ ප්‍රත්‍ය නිරෝධාර්ථයෙන් රූපස්කන්ධයාගේ ව්‍යය දකියි. එසේ ම විපරිනාම ලක්‍ෂණය දකිනුයේ රූපස්කන්ධයාගේ ව්‍යය දකියි. මෙනයින් රූපස්කන්ධය කෙරෙහි ලක්ෂණ පසකි. වේදනාදී සෙසු ස්කන්ධ කෙරෙහිත් බහා බැලූ විට පස්විසි ආකාර වයලක්ඛණ වෙයි. මෙසේ උදය-ව්‍යය දෙක ම සමපණස් ආකාරයි.

## උදයබ්බය ඤාණයෙන් ප්‍රකට වන ධර්ම.

සංස්කාර ධර්මයන් ගේ නිබ්බත්ති ලක්‍ෂණය, ඉපදෙන අවස්ථා වේදීම දක්නා හෙයින් ද විපරිනාම ලක්‍ෂණය, විනාශ වන අවස්ථා වේදීම දක්නා හෙයින්ද, ප්‍රත්‍යය ක්ෂණය යන දෙපරිද්දෙන් ම උදය ව්‍යය ප්‍රකට වේ එහි උදය දැකීමෙන් අවිද්‍යා දී ප්‍රත්‍යධර්ම අවබෝධ වන නිසා සමුදය සත්‍යය ප්‍රකට වේ. ක්ෂණ-මොහොත-වශයෙන් උදය දැකීම නිසා ජාති දුක අවබෝධ වන හෙයින් දුඃඛ සත්‍යය අවබෝධ වෙයි. ප්‍රත්‍යධර්මයන් ගේත් ප්‍රත්‍යුත්පන්න ධර්මයන් ගේත් නිරෝධය- විපරිනාමය දක්නා හෙයින් නිරෝධ සත්‍යය ද ප්‍රකට වේ. ක්ෂණ වශයෙන් ව්‍යය දැකීම නිසා මරණ දුක අවබෝධයෙන් දුඃඛ සත්‍යය හෙළිවේ. ඒ විදර්ශකයා ගේ යම් උදය-ව්‍යය දර්ශනයක් වෙයි ද, එය සම්‍යග් දර්ශනයට ඇතුලත් වන හෙයින් ලෞකික වශයෙන් මාර්ග සත්‍යය හෙළිවූයේ වෙයි. හේතු ධර්මයන් ගේ ද, ඵල ධර්මයන් ගේ ද උදය-ව්‍යය දක්නා හෙයින් අනුලෝම ප්‍රතිලෝම ප්‍රත්‍යසමුත්පාදධර්ම ප්‍රකට වෙයි ක්ෂණ වශයෙන් දක්නා හෙයින් ප්‍රත්‍ය සමුත්පන්න ධර්මද අවබෝධ වෙයි. හේතු ඵල සම්බන්ධය නිසා සන්තානයා ගේ නො සිඳී පැවැත්ම අවබෝධවන හෙයින් ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයාගේ එක

ත්තනය ප්‍රකට වේ. ඒ නිසා උච්ඡේද දෘෂ්ටිය ද දුරුකෙරේ. ක්ෂණ වශයෙන් උදය ව්‍යය දැකීමෙන් නානත්තනය ප්‍රකට වෙයි ඒ නිසා ශාශ්වත දෘෂ්ටිය දුරු කෙරේ. මේ ආදී වශයෙන් උදයබ්බය ඤාණයෙන් චතුරාර්‍ය්‍ය සත්‍යය, ප්‍රත්‍යසමුත්පාදය, ප්‍රකට වන අතර නිත්‍ය-සුභ- සුඛ ආත්ම යන වැරදි හැඟීම් ද ශාස්වතාදී මිථ්‍යා දෘෂ්ටි ද දුරුකෙරේ.

## තරුණ විදර්ශනා.

"එත්තාවතා වයධම්මමෙව උප්පජ්ජති උප්පන්නඤ්ච වයං උපෙතීති ඉමිනා ආකාරෙන සමපඤ්ඤාස ලක්ඛණානි පටිවිජ්ඣිත්වා ඨිතං උදයබ්බයානුපස්සනං නාම පඨමං තරුණවිපස්සනාඤාණං අධිගතං හොති. යස්සාධිගමෙන ආරද්ධවිපස්සකොති සංඛංගච්ඡති"- ප. ම. අ.

මෙපමණකින් - ඉහත කී උදය ව්‍යය ක්‍රමය සම්පූර්ණ වීමෙන්- විනාශ වන ධර්මයෝම උපදිත්. උපන් ධර්මයෝ ද විනාශයට පැමිණෙත්, යනාදී වශයෙන් සමපණස් ආකාර ලක්ෂණයන් අවබෝධ කොට සිටියාවූ උදයව්‍යානු දර්ශනය පළමු වැනි තරුණ විදර්ශනා ඥානය නම්. ඒ ඥානය අවබෝධ වත්ම ආරබ්ධ විදර්ශකයා යන සංඛ්‍යාවට-ගණයට-වැටේ. මේ අටුවා පාඨයෙන් උදය වය ඥානය අවසන් කොට සිටී විදර්ශනාව තරුණ විදර්ශනා නාමය ලබන බව පැහැදිලි කෙරේ. කලාප සම්මර්ශන අවස්ථාවෙහි වූ ඥානය, විදර්ශනා ඥානය නො වන බව ප්‍රකාශිතයි. එය විදර්ශනාවට අනුකූලව සිටි ඥානයක් හෙයිනි. නිෂ්පර්‍යායයෙන් එක හෙළාම-විදර්ශනා ඥානය ලබනුයේ උදය-ව්‍යය ඥානදර්ශනයයි.

## විදර්ශනා දශ උපක්ලෙශයෝ.

"ඉමස්මිං ඤාණෙ ඨිතස්ස ඔභාසාදයො දස විපස්සනුපක්කිලෙසා උප්පජ්ජන්ති" මේ උදයව්‍යය ඥානයෙහි පිහිටියාවූ යෝගාවචරයාට ඕභාසාදී දසවිධ විදර්ශනා උපක්ලෙශයෝ උපදිත්. තරුණ විදර්ශකයා ගේ සිත; ඉපදෙමින්, විනාශවෙමින්, පවත්නා වූ සංස්කාර ධර්ම කෙරෙහි පවතින්ම නිත්‍යාදී වැරදි හැඟීම් දුරු වී සිතෙහි පිරිසුදු භාවයක් ඇති වෙයි. ඒ නිසා විදර්ශනා මාර්ගය අවහිර කරන්නා වූ උප ක්ලේශයෝ දස දෙනෙක් පහල වෙත්. ඔවුහු නම් ඕභාස, ඤාණ, පීති, පස්සද්ධි, සුඛ, අධිමොක්ඛ, විරිය, සති, උපෙක්ඛා, නිකන්ති, යනුයි. එයින් නිහ-

"ඔභාසෝ පීති පස්සද්ධි - අධිමොක්ඛො ච පග්ගහෝ
සුඛං ඤාණ මුපට්ඨාන - මුපෙක්ඛා ච නිකන්ති ච"

මේ දශ උපක්ලේශයන් විදර්ශකයාගේ සිතෙහි උපන් කල්හි නොසන්සුන් ස්වභාවයක් ඇතිවෙයි ඒ නොසන්සුන් ගති යෙන් විදර්ශනාවට විරුද්ධ වූ සිත් උපදී. ඒ බව බුදුරජාණන් වහන්සේ මෙසේ පැහැදිලි කළහ:-

"කථං ධම්මුද්ධච්ච විග්ගහිත මානසං හොති? අනිච්චතො මනසිකරොතො ඔභාසො උප්පජ්ජති, ඔභාසො ධම්මොති ඔභාසං ආවජ්ජති, තතො වික්ඛෙපො උද්ධච්චං, තෙන විග්ගහිතමානසො අනිච්චතො උපට්ඨානං යථාභූතං නප්පජානාති. දුක්ඛතො -පෙ- තථා අනිච්චතො මනසිකරොතො ඤාණං -පෙ- පීති - පස්සද්ධි-සුඛං-අධිමොක්ඛං - පග්ගහො - උපට්ඨානං - උපෙක්ඛා - නිකන්ති උප්පජ්ජති, නිකන්ති ධම්මොති නිකන්තිං ආවජ්ජති, තතො වික්ඛෙපො උද්ධච්චං තෙන උද්ධච්චෙන විග්ගහිතමානසො අනිච්චතො උපට්ඨානං යථාභූතං නප්පජානාති -පෙ- අනත්තතො උපට්ඨානං යථාභූතං නප්පජානාති"

විදර්ශනා දස උප ක්ලෙශයන් නිසා විසුරුණු, ඒ නිසාම විදර්ශනා භාගයට විරුද්ධවීමක් ඇති සිතක් වනුයේ කෙසේ ද? (සංස්කාර ධර්ම) අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාට ආලෝකයක් උපදී. ඒ ආලෝකය විදර්ශනා මාර්ග ධර්මයැයි සිතා එය මාර්ගය හෝ ඵලය හෝ නිර්වාණය හෝ සිතා ආවර්ජනා කරයි. ඒ නිසා උපදින වික්ෂේපය - විසුරුණු ගතිය - උද්ධච්චයයි. ඒ නිසා විරුද්ධ වූ සිතෙන් අනිත්‍යයැයි වැටහීම තත් වූ පරිද්දෙන් නො දැනීම නම්. දුඃඛ, අනාත්ම, ගැන ද මෙසේමය. ආලෝකය මෙන් සෙසු ප්‍රීත්‍යාදී ධර්ම ද අනිත්‍යාදී වශයෙන් මෙනෙහි කරන්නාට උපදින ක්ලෙශයන් බව දත යුතු. ඒවා උපන් පසු, විදර්ශනා මාර්ගයැයි සිතා මාර්ග - ඵල - නිර්වාණයයැයි සිතා හෝ ආවර්ජනා කරයි. එයින් නොසන්සුන් ගතියක් උපදී. නොසන්සුන් ගතිය නිසා විරුද්ධ භාවයට පත් සිත් ඇත්තාට අනිත්‍යාදී වශයෙන් වැටහීම තත් වූ පරිද්දෙන් නො දැනීම නමි'' යනු දේශනා පාඨයෙහි සාමාන්‍ය භාවයයි.

ඒ දශවිදර්ශනොපක්ලෙශයන් අතුරෙන් ඔභාස යනු විදර්ශනා චිත්තයෙන්ම හටගත් ආලෝකයයි. සංස්කාර ධර්මයන් විදර්ශනා කරද්දී මේ ආලෝකය හටගත් කල්හි යෝගාවචරය

"මෙය මාර්ගාදි ලෝකෝත්තර ධර්මයැ" යි කියා හැඟීමක් ඇති කර ගනියි. එහෙත් ඒ ආලෝකය ලෝකෝත්තර ධර්මයක් නො වෙයි. විදර්ශනා උපක්ලේශයකි. එහෙයින් ඒ උපක්ලේශය ඉප දුනු පසු යෝගාවචරයා මාර්ගය නුවූවක්ම මාර්ග යැයි කියා සල කයි. ඵලය නුවූවක්ම ඵලයැයි කියා සලකයි. මෙසේ අමාර්ගයම මාර්ග වශයෙන් හැඟීම ඇතිවේ. මේ විදර්ශනා ආලෝකය ඇතැමෙකුට උපදිනුයේ පර්යංක සීමාව තෙක් පමණි. ඇතැමෙකුට තම කුටිය තෙක් ද, ඇතැමෙකුට ඉන් එහා ද, යනාදි වශයෙන් අකනිට්ඨා බ්‍රහ්මලොව තෙක් උපදින බව සඳහන් වෙයි. බුදුරජාණන්වහන්සේට දශසහශ්‍රී ලෝක ධාතු තෙක් ඉපදුණේය.

2. ඤාණ: විදර්ශනා ඥානයයි. මෙය නාම රූප ධර්ම මනාසේ විමසන්නා වූ අනිත්‍යාදි වශයෙන් තීරණය කරන්නා වූ විදර්ශකයාට ඉතා සියුම් වේගයෙන් ගමන් කෙරෙන, දක්ෂ ඥානයක් ලෙස උපදියි. (එ ඥානය ද අනිත්‍යාදි වශයෙන් සලකා ගැනීමට කල්පනා නොවීම නිසා එය උපක්ලේශයක් බවට පත් වෙයි.)

3. පීති: විදර්ශනා කරද්දී උපදින්නා වූ පස් වණක් ප්‍රීතියයි.

4. පස්සද්ධි: සිතෙහි ද සිරුරෙහි ද ඇතිවන සැහැල්ලු ගතියයි.

5. සුඛ: සියලු ශරීරය තෙමෙමින් උපදින්නා වූ ඉතා ප්‍රණීත සැපයයි.

6. අධිමොක්ඛ: විදර්ශනාවත් සමඟ යෙදුනා වූ චිත්ත චෛතසිකයන්ගේ ප්‍රසන්න භාවය - පැහැදිලි ගතිය - වූ ඉතා බලවත් ශ්‍රද්ධාවයි.

7. පග්ගහ: එනම් වීර්යයි. මෙයද සිථිල නොවී අච්චාරද්ධත් නොවී මධ්‍යම භාවයෙන් පවතී. ලිහිල් ද නොවී වැඩිපුර ද නැතිව යන තේරුමයි.

8. උපට්ඨාන: විදර්ශනා සමඟ යෙදුනු බලවත් සිහියයි.

9. උපෙක්ඛා: මෙය දෙවැදෑරුම්ය. විදර්ශනෝපේක්ෂා, ආවර්ජනෝපේක්ෂා යනුයි. සියලු සංස්කාර ධර්මයන් කෙරෙහි උපදින බලවත් මැදහත් ගතිය විදර්ශනා උපේක්ෂාවයි. මනොද්වාරයෙහි උපදින ආවර්ජනා සිත තියුණු ගතියට පත්වීම ආවර්ජනා උපේක්ෂායි.

10. නිකන්ති: සියුම් ආශාවයි. ආලෝකාදිය පහළ වූ විට, ඒවා කෙරෙහි පවතින ආශාව මෙයින් කියවේ. මේ ක්ලේශයක් කියා සලකා ගැනීමට ඒ අවස්ථාවේදී නො හැකිවෙයි.

මේ දශ උපක්ලේශයෝ තෘෂ්ණා, දෘෂ්ටි, මාන, යන දෘඪව ගැනීම් තුනෙන් ගුණ කල විට තිසක් වෙත්. යමෙක් "මට ආලෝකයක් උපන්නේය,'යි ආත්මීය හැඟීම් ඇතිකර ගතහොත් දෘෂ්ටි වශයෙන් ඒ ඕභාසය අල්ලා ගත්තේ වෙයි. මාගේ ඕභාසය ඉතා ප්‍රණීතයි. යනාදී වශයෙන් ගතහොත් ඒ මානයෙන් අල්ලා ගත්තේ වෙයි. ආලෝකය පිළිබඳ සියුම් ආශාවක් උපදවා දෘඪියේ ගතහොත් තෘෂ්ණාවෙන් අල්ලා ගත්තේ වෙයි. සෙසු ධර්මත් මෙ නයිනි. මෙසේ තිස් වැදෑරුම් බවට පත් වෙත්.

ඥානසම්පන්න දක්ෂ විදර්ශකයා, උපන්නා වූ උපක්ලේශයන් ද අනිත්‍යාදීන්ට නගා විදර්ශනා කරයි. එවිට ඔහුගේ විදර්ශනා චිත්ත වීථිය මාර්ගයටම බැස ගනියි. මෙසේ ඕභාසාදී දශ උපක්ලේශයෝ අමාර්ගය නම් වෙත්. එයින් මිදුනා වූ වීථිප්‍රතිපන්න ඥානය මාර්ගය නම් වෙයි මෙනයින් අමාර්ගය මාර්ගයන් දැන සිටියා වූ ඥානය මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි නම්. "මග්ගඤ්ච අමග්ගඤ්ච ඤත්වා ඨිතං ඤාණං මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිනාම" ප. ම. අ

## චතුරාර්‍ය සත්‍යයාගේ ව්‍යවස්ථාපනය සම්පූර්ණවීම.

එත්තාවතා ච තෙන චතුන්නං සච්චානං වවත්ථානං කතං හොති. කථං? නාමරූප පරිග්ගහෙ සති පච්චය පරිග්ගහ සම්භවතො ධම්මට්ඨිති ඤාණ වචනෙනෙව වුත්තෙන දිට්ඨිවිසුද්ධි සංඛාතෙන නාමරූප වවත්ථාපනෙන දුක්ඛසච්චස්ස වවත්ථානං කතං හොති, කඞ්ඛාවිතරණ විසුද්ධි සංඛාතෙන පච්චය පරිග්ගහනෙන සමුදය සච්චස්ස වවත්ථානං, උදයබ්බයානුපස්සනෙන ච ඛණතො උදයබ්බය දස්සනෙන දුක්ඛ සච්චස්ස වවත්ථානං කතං, පච්චයතො උදයදස්සනෙන සමුදය සච්චස්ස වවත්ථානං, පච්චයතො වයදස්සනෙන නිරොධ සච්චස්ස වවත්ථානං, යඤ්චස්ස උදයබ්බය දස්සනං මග්ගොවායං ලොකියොති තස්ස සම්මොහ විඝාතතො ඉමිස්සඤ්චස්ස මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධියං විපස්සතො සම්මා මග්ගස්ස අවධාරණෙන මග්ග සච්චස්ස වවත්ථානං කතං, එවං ලොකියෙන තාව ඤාණෙන චතුන්නං සච්චානං වවත්ථානං කතං හොති" -ප. ම. අ.

නාමරූප පරිග්‍රහයේ සිට මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධිය තෙක් ඇති විදර්ශනා ක්‍රමය නිසා, යෝගාවචරයා ලෞකික වූ ඥානයෙන්ම චතුරාර්ය සත්‍ය ධර්මයන් ව්‍යවස්ථාන කළේ නම් වෙයි. ඒ කෙසේද? නාමරූප පරිග්‍රහය ඇති කල්හි ප්‍රත්‍ය ධර්ම පරිග්‍රහය ලැබෙන හෙයින් "ධම්මට්ඨිති ඤාණ", යනුවෙන් කියූ දිට්ඨිවිසුද්ධි සංඛාත නාමරූප ව්‍යවස්ථාපනයෙන් දුඃඛ සත්‍යයාගේ ව්‍යවස්ථාන කළේ නම් වෙයි. කඞ්ඛාවිතරණ විසුද්ධි සංඛ්‍යාත ප්‍රත්‍යය පරිග්‍රහය නිසා සමුදය සත්‍යයාගේ ව්‍යවස්ථාපනය ද, උදයබ්බය පස්සනාවෙහි වූ ඛණ වශයෙන් උදයව්‍යය දර්ශනයෙන් දුඃඛසත්‍යයාගේ ව්‍යස්ථාපනය ද, ප්‍රත්‍ය වශයෙන් උදය දර්ශනයෙන් සමුදය සත්‍යයාගේ ව්‍යවස්ථාපනය ද, ප්‍රත්‍යය වශයෙන් ව්‍යය දර්ශනය නිසා නිරෝධ සත්‍යයාගේ ව්‍යවස්ථාපනයද, යම් උදය - ව්‍යය දර්ශනයක් "මේ ලෞකික වූ මාර්ගයැ" යි දැන එහි ලා මූලාවීම දුරු කොට ඇති මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධිය විදර්ශනා කිරීමෙන් යහපත් මාර්ගය වැටහේ ද, ඒ වැටහීම නිසා මාර්ග සත්‍යයාගේ ව්‍යවස්ථාපනය ද, කළේ නම් වෙයි මෙසේ පළමු කොට ලෞකික වූ ඥානයෙන්ම චතුරාර්ය සත්‍ය ධර්මයන්ගේ ව්‍යවස්ථාපනය කිරීම සිදුවෙයි. යනු එහි සාමාන්‍ය අදහසයි.

මේ අනුපිරින් උදයබ්බය ඤාණය, ඔභාසාදී විදර්ශනා උපක්ලේශයන් ගෙන් මිදී, මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය අවසන් වන තෙක් ඇති, නාමරූප ධර්මයන්ගේ ඉපදීම, විනාශය යන ලක්ෂණ දෙක දකිමින් ගමන් කෙරෙන විදර්ශනා ඥානය බව තේරුම් ගතයුතු.

උදයබ්බය ඤාණය නිමි

## 7. භඞ්ග ඤාණය

"ආරම්මණං පටිසඞ්ඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා, විපස්සනෙ ඤාණං" ඉපදෙමින් විනාශවෙමින් පවත්නා වූ රූපාදී ධර්ම සමූහය පිළිබඳ අරමුණ, අනිත්‍යාදී වශයෙන් නුවණින් දැන, ඉපදීම හැර විනාශය - භඞ්ගය - ට අනුව බැලීමෙහි නුවණ විදර්ශනා ඥාන නම්." යනුවෙන් බුදුරජාණන් වහන්සේ භඞ්ග ඤාණය හැඳින් වූහ.

පෙර උදයබ්බානුපස්සනා ඤාණය උපදවා ගත්තා වූ යෝගාවචරයා දස වැදෑරුම් විදර්ශනෝපක්ලේශයන්ගෙන් දුරුවී, නැවත විදර්ශනා මාර්ගයට බැසගත් කල්හි මග්ගාමග්ගඤාණදස්සන

විසුද්ධිය සම්පූර්ණ වේ. ඉක්බිති පටිපදාඤාණදස්සන විසුද්ධිය ලබාගනු සඳහා නැවත උදයබ්බයානුපස්සනා ඤාණය උපදවයි. පටිපදාඤාණදස්සන විසුද්ධිය යනු නවමහාවිදර්ශනා ඥානයට නමකි. "අට්ඨන්නං පන ඤාණානං වසෙන සිඛාප්පත්තා විපස්සනා නවමඤ්ච සච්චානුලොමිකඤාණන්ති අයං පටිපදාඤාණදස්සන විසුද්ධි නාම" යි ම. අටවැදෑරුම් ඥානයන්ගේ වශයෙන් මුදුන් පැමිණියා වූ විදර්ශනාව හා නවවැනි වූ සත්‍යානුලෝමික ඥානය ද යන මෙය ප්‍රතිපදාඥානදර්ශන විශුද්ධි නමි. ඒ අටවැදෑරුම් ඥාන නම් උපක්ලේශයන්ගෙන් මිදුනා වූ, විදර්ශනා වීථියට බැසගත් උදයබ්බයානුපස්සනා ඤාණය, භඞ්ගානුපස්සනා ඤාණය, භයතුපට්ඨාන ඤාණය, ආදීනවානුපස්සනා ඤාණය, නිබ්බිදානුපස්සනා ඤාණය, මුඤ්චිතුකම්‍යතා ඤාණය, පටිසංඛානුපස්සනා ඤාණය, සඞ්ඛාරුපෙක්ඛා ඤාණය, යනුයි. නවවැනි සච්චානුලෝමික ඤාණය යනු අනුලෝම ඤාණයයි.

ඒ යෝගාවචරයාට නැවත උදයබ්බයානුපස්සනා ඤාණයක් කුමකට ද? අනිත්‍යාදි වශයෙන් ලකුණු සලකා ගැනීමටය. දශ උපක්ලේශයන් නිසා වැසුණා වූ ඒ ලකුණු නැවත සලකා ගැනීමට උදයබ්බයානුපස්සනාව මතු කරගත යුතුය. උදය ව්‍යය මෙනෙහි නොකිරීමෙන් අනිත්‍යය ලක්ෂණය සන්තති - සමූහ - වශයෙන් වැසී ඇති බැවින් ද, නියම අයුරින් නො සැලකේ. එසේම නිතර පෙරළෙන අයුරු මෙනෙහි නොකිරීමෙන් ද ඉරියවු මාරුකිරීම නිසා වැසීමෙන් ද දුඃඛලක්ෂණය නො වැටහේ. ඒ ඒ ධාතු වෙන්කොට බැලීම වූ නානාධාතුවිනිර්භෝගය මෙනෙහි නොකිරීමෙන් ද ඝණයෙන් වැසී ඇති බැවින් ද අනාත්ම ලක්ෂණය නො වැටහේ.

මෙහි අනිත්‍යයම අනිත්‍ය ලක්ෂණයයි, සෙසු ලක්ෂණ ද එසේමය. සකන්ධ පඤ්චකය අනිත්‍ය නමි. මක්නිසා ද? "උප්පාද වයඤ්ඤථත්තභාවා" ඉපදීම, විනාශවීම, තිබී වෙනස්වීම. යන ස්වභාවයන් නිසායි. නැතහොත් පැවතී නැතිව යන හෙයින් අනිත්‍යය. මෙසේ ඉපදීම් ආදිය නිසා හෝ පැවතී නැතිව යන නිසා හෝ ඒ ඒ වෙනස්වීම ගතිය අනිත්‍යය නම්. "යදනිච්චං තං දුක්ඛං', යමක් අනිත්‍යය ද ඒම දුක්ය. මේ දේශනා ක්‍රමය නිසා ඒ අනිත්‍යය වූ පඤ්චස්කන්ධයම දුඃඛයි. මක්නිසා ද? නිතර නිතර පෙළෙන ආකාරයක් පවතින හෙයින්. ඒ පෙළෙන ආකාර දුඃඛ ලක්ෂණ නම්. "යං දුක්ඛං තදනත්තා" යමක් දුක් ද එයම අනාත්මය" යනු දේශනා පාඨ හෙයින් දුඃඛ වූ පඤ්චස්කන්ධයම

අනාත්ම නම්, මක්නිසාද? තමා වසඟයට නොපැමිණෙන හෙයිනි. වසඟ නොවන ගතිය - අවසවත්තනාකාරො - අනාත්ම ලක්ෂණයයි.

මෙසේ අනිත්‍යාදි ලක්ෂණ ත්‍රයට අනුව, උපක්ලේශයන්ගෙන් මිදුනා වූ විදර්ශනා වීථියට බැසගත් උදයව්‍යයානු දර්ශන ඥානයෙන් සංස්කාර ධර්ම සලකා බලන්නම, ඒ සංස්කාර ධර්මයන් ගේම ස්වභාව ලක්ෂණ මනාසේ වැටහේ. හේ නැවත නැවත ඒ අයුරින්ම සලකා බලමින් රූපාරූප ධර්ම අනිත්‍යාදි වශයෙන් තීරණය කෙරෙයි. සංසන්දනය කෙරෙයි එවිට ඔහුගේ ඥානය තියුණු වී පවතියි. සංස්කාරයෝ සැහැල්ලුව වැටහෙත්. මෙසේ ඇති කල්හි ඒ යෝගාවචරයාට සංස්කාර ධර්මයන්ගේ ඉපදීම, පැවතීම, තිබීම, නොපෙනී ගෙවීම්, විනාශවීම් ස්වභාවයම පෙනෙයි. සිහියත් නුවණත් ඒ සඳහාම යෙදවේ. වේගයෙන් ගමන් කෙරෙන දුම්රියක් දෙස බලාසිටින්නෙකුට එක් එක් දුම්රිය මැදිරි තමාගේ දර්ශනපථයෙන් - දෑසින් - ඉවත්ව යන්නා පෙනෙන්නාක් මෙනි. වහ වහා ඉපදෙමින් පැවතෙමින් විනාශ වෙමින් පවතින්නා වූ සංස්කාර ධර්ම දෙස සිහි-නුවණින් බලා සිටීන්ම පසුව පෙනෙනුයේ විනාශය පමණි. ඒ විනාශය දක්නා විදර්ශනා ඥානය භඞ්ගානුපස්සනා නම්.

"කථං ආරම්මණං පටිසංඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං? රූපාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති, තං ආරම්මණං පටිසංඛා, තස්ස චිත්තස්ස භඞ්ගං අනුපස්සති. අනුපස්සතීති කථං අනුපස්සති? අනිච්චතො අනුපස්සති නො නිච්චතො, දුක්ඛතො අනුපස්සති නො සුඛතො අනත්තතො අනුපස්සති නො අත්තතො, නිබ්බින්දති නො නන්දති, විරජ්ජති නො රජ්ජති, නිරොධෙති නො සමුදෙති, පටිනිස්සජ්ජති නො ආදියති, අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං, නිබ්බින්දන්තො නන්දිං විරජ්ජන්තො රාගං, නිරොධෙන්තො සමුදයං, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති වෙදනාරම්මණතා -පෙ- සඤ්ඤාරම්මණතා -පෙ- සඞ්ඛාරාරම්මණතා -පෙ- විඤ්ඤාණාරම්මණතා -පෙ- චක්ඛාරම්මණතා -පෙ- ජරාමරණාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති -පෙ- ආදානං පජහති,

"වත්ථු සඞ්කමනා චෙව - පඤ්ඤාය ච විවට්ටනා
ආවජ්ජනා බලඤ්චෙව - පටිසංඛා විපස්සනා.

2. ආරම්මණන්වයෙනාපි - උභො එක වවත්ථනං
නිරොධෙ අධිමුත්තතා - වයලක්ඛණ විපස්සනා

3. ආරම්මණඤ්ච පටිසංඛා - භඞ්ගඤ්ච අනුපස්සති
සුඤ්ඤතො ච උපට්ඨානං - අධිපඤ්ඤා විපස්සනා

4. කුසලො තීසු අනුපස්සනාසු
චතස්සො ච විපස්සනාසු
තයො ච උපට්ඨානෙ කුසලතා
නානාදිට්ඨීසු න කම්පතී,ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති ආරම්මණ පටිසඞ්ඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා, විපස්සනෙ ඤාණං"-ප. ම.

සංස්කාරයන් පිළිබඳ අරමුණු ක්ෂය, ව්‍යය, වශයෙන් නුවණින් දැන, භඞ්ගයට අනුව බැලීමෙහි ප්‍රඥාව විදර්ශනා ඥානය නම් වනුයේ කෙසේ ද? යනුවෙන් නැගූ ප්‍රශ්නයට අනුව භඞ්ග ඥානය මෙසේ පැහැදිලි වෙයි.

කලාප සම්මර්ශනය සඳහා කොටස් කරගත් රූප සමූහය අතුරෙන් පළමු කොට එක් රූපයක් අරමුණු කිරීම වශයෙන් ඉපිද බිඳී යයි. ඒ අරමුණු ගෙවීම වශයෙන් නුවණින් දැන, ඒ දැනගත්තා වූ සිතෙහි ද විනාශවීමට අනුව බලයි. මෙසේ ඒ යෝගාවචරයා පළමු කොට රූපාරම්මණය ද, රූපාරම්මණයාගේ ක්ෂය, ව්‍යය, දක්නා සිත ද, යන දෙකෙහිම භඞ්ගය බලයි. එම නිසා පුරාණ ශ්‍රීදර්ශකයෝ මෙසේ කීහු.:- ඤාතඤ්ච ඤාණඤ්ච උභො විපස්සති" ක්ෂය, ව්‍යය, වශයෙන්. දැන ගත්තා වූ සංස්කාර ධර්මද. ඒ දැන ගැනීමට උපකාරීවූ, ඥානය ද, යන ධර්ම දෙකම විදර්ශනා කරයි" කියායි.

ඉක්බිති භඞ්ගයට අනුව බලන්නේ නිත්‍ය, සුඛ, ආත්ම, වශයෙන් නොබලා අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශයෙන් බලයි. මෙසේ බැලූ සංස්කාර ධර්මකෙරෙහි හේ කලකිරෙයි, සතුටු නොවෙයි. නො ඇලෙයි. ඒ නිසාම ලෞකිකවූ ඥානයෙන් හේ රාගය නිරුද්ධ කරයි. යටපත් කරයි යන තේරුමයි. උපදවා ගැනීම් වශයෙන් නො ගනියි. එසේ නොගෙන අතහරියි. අනිත්‍ය වශයෙන් බැලීම නිත්‍යය සංඥාවද, දුඃඛ වශයෙන් බැලීම නිසා සුඛ සඥාවද, ආත්ම වශයෙන් බැලීම නිසා ආත්ම සඥාවද, කලකිරීම නිසා, සියුම් ආශාව-නන්දිය-දි නො ඇලීම නිසා රාගයද නිරුද්ධ කිරීම නිසා සමුදයද, අතහැරීම නිසා ගැනීමද, දුරුකරයි.

වේදනාදී ස්කන්ධ, ආයතන, ධාතු, ප්‍රත්‍යය සමුත්පාද ධර්ම මේ ආදී සත්මර්ශනාර්හ සියලු සංස්කාර ධර්ම කෙරෙහිද භඞ්ගයට අනුව බලා විදර්ශනා කිරීමද මෙසේමය. මෙතැනට පත් වෙත්ම ඒ යෝගීහුගේ රාගාදී ක්ලේශකර ධර්ම, ලෞකිවූ ඥානයෙන්ම ප්‍රහාණය වූයේ වෙයි. මේ විදර්ශනාමාර්ගය තවදුරටත් පැහැදිලි කිරීම සඳහා ගාථා ෂඩකතියක්ද යෙදිණ,

එහි විදර්ශනා ක්‍රම තුනෙකි. පටිසඞ්ඛාවිපස්සනා, වයලක්ඛණ විපස්සනා, අධිපඤ්ඤාවිපස්සනා; යනුයි.

1. පටිසංඛා විපස්සනාවෙහි අවස්ථා තුනෙකි. වත්ථුසඞ්කමන, පඤ්ඤාවිවට්ට, ආවජ්ජනාබල යනුයි. රූපාදී එක් එක් සංස්කාර ධර්මයක්හුගේ භඞ්ගවිනාශය දැක, යම් සිතකින් භඞ්ගය දුටුයේද නැවත ඒ සිතෙහිද භඞ්ගය දක්නේ; පෙර භඞ්ග වශයෙන් දුටු ආරම්මණ වස්තු කෙරෙන්, නැවත භඞ්ගය දක්නා සිතවූ අනිත් වස්තුවකට සංක්‍රමණය - පෙරලීම-සිදුවීම වත්ථුසඞ්කමන නම් උදය ලක්ඛණය අතහැර වයලක්ඛණයදැකීම පඤ්ඤාවිවට්ටයි. එනම් හැඟීම් පෙරලීමයි එක් සංස්කාර ධර්මයකගේ භඞ්ගය දැක, නැවත සංස්කාර ධර්මයක් මෙනෙහිකරත්ම උදය හැර භඞ්ගය පමණක් දැකීමට සමර්ථ බව, නැතහොත් වේගවත් ගතිය ආවජ්ජන බල නම්. මෙසේ පටිසංඛා විපස්සනා අනිත්‍යාදී වශයෙන් තීරණය කළ සංස්කාර ධර්මයන්ගේ ඉපදීම, විනාශය බලා නැවත විනාශය පමණක් දක්නාවූ භඞ්ග ඥාණය-ත්‍රිවිධාකාරය.

2. වයලක්ඛණ විපස්සනාව වනාහී ක්‍රම දෙකකි සම ව්‍යවස්ථාපනය, නිරෝධයෙහි අධිමුක්ත බව යනුයි. සම ව්‍යවස්ථාපනය නම් ප්‍රත්‍යක්ෂ වශයෙන් දුටුවාවූ සංස්කාර ධර්මයන්ගේ වර්තමාන භඞ්ගයට අනුව අතීත වූද අනාගතවූද සියලු සංස්කාර ධර්මයන්ගේ භඞ්ගය එක හා සමානව බෙදා සැලකීමයි "ආරම්මණන්වයෙන උභො එක වවත්ථනා" යන්නෙන් දැක්වූයේ එයයි. මේ නිසා පැරණියෝ:-

"සංවිජ්ජමානම්හි විසුද්ධදස්සනො
තදන්වයං නෙති අතීතනාගතෙ
සබ්බෙපි සංඛාරගතා පලොකිනො
උස්සාව බින්දූ සූරියෙව උග්ගතෙ"

භඞ්ග වශයෙන්ම දක්නා නිසා පිරිසුදු දැකීමක් ඇතියහුට, වර්තමාන ධර්මයන් කෙරෙහි භඞ්ගයට අනුව සිත පිහිටි කල්හි ගේ

ඒ අනුව අතීත, අනාගත, සංස්කාර ධර්මයන් කෙරෙහිද සිත පමුණුවයි (භඞ්ග වශයෙන් පැමිණවීමයි) සූර්‍ය්‍යය උදාවී කල්හි පිනි බිඳු විනාශවන්නාසේ සංස්කාර බවට පත් සියලු ධර්ම විනාශවන සුළුයැ''යි කීහු. මෙසේ වර්තමානයේම අතීත, අනාගත දෙකෙහිම භඞ්ග වශයෙන් ව්‍යවස්ථාපනය කොට සිටි කල්හි තම සිත ඒ භඞ්ග සංඛ්‍යාතවූ නිරෝධයටම නැඹුරුවෙයි. ඒ අතටම හැරෙයි. එහිම පිහිටයි. මේ නිරෝධයෙහි අධිමුක්තභාවයයි. ව්‍යය ලක්‍ෂණ විදර්ශනා නම ලබනුයේ මේ දෙවැදෑරුම් විදර්ශනා ක්‍රමයයි.

3. අධිපඤ්ඤාවිපස්සනා යනු පෙර රූපාදි අරමුණුද භඞ්ග වශයෙන් දැක භඞ්ග වශයෙන් අරමුණු කළ සිතෙහි භඞ්ගයද දැකීමෙන් ආත්මයෙන් තොරවූ ශූන්‍යතාවය - හිස්බව - නැතහොත් ආත්මයෙන් තොරවූ හුදු සංස්කාරයන්ම බව වටහාගැන්මයි. එවිට ''සංස්කාරයෝම බිඳෙත්, ඔවුන්ගේ විනාශය මරණ නම්. සංස්කාර ධර්ම හැර අන් කිසිවෙකු මෙහි නැතය''යි වැටහීම සමෘද්ධ වේ මේ අවස්ථාව සලකා පැරණියෝ මෙසේ කීහු:=

''ඛන්ධා නිරුජ්ඣන්ති න චත්ථි අඤ්ඤං
ඛන්ධාන භෙදො මරණන්ති වුච්චති
තෙසං ඛයං පස්සති අප්පමත්තො
මණිංව විජ්ඣං වජිරෙන යොනිසො''

රූපාදී ස්කන්ධයෝම නිරුද්ධවෙත්. ස්කන්ධයන් හැර අන් කිසිවෙක් මෙහි නොමැත. ස්කන්ධයන්ගේම බිඳීම මරණයැයි යැයි කියනු ලැබේ අප්‍රමාදීවූ විදර්ශකයා නුවණින් යුතුව වජ්‍රයෙන් මාණික්‍යය විදින්නාක් මෙන් ඒ ස්කන්ධයන්ගේම ක්‍ෂය බලයි. දක්‍ෂවූ මැණික් විදින්නා වජ්‍රය ගෙන මැණිකෙහි වණ, දිය ගැන නොබලා විදිය යුතු තැනම බලමින් විදින්නේ යම් සේද, එමෙන්ම භඞ්ග ඤාණයෙන් යුත් විදර්ශකයා ස්කන්ධයන්ගේ ජාති, ජරාදී අන් අන් අරමුණු නොබලා භඞ්ගයම දක්නේය යන අදහසයි. මේ අධිපඤ්ඤාවිපස්සනා ක්‍රමයයි.

සිවුවැනි ගාථාවෙහි අදහස: අනිත්‍යය, දුඃඛ, අනාත්ම යන තෙවැදෑරුම් අනුපස්සනාවන්හිද, නිබ්බිදා - විරාග - නිරෝධ - පටිනිස්සග්ග යන සතරවැදෑරුම් විදර්ශනාවන්හිද, ක්‍ෂය - ව්‍යය - ශූන්‍යතා යන තෙවැදෑරුම් වැටහීම්ද, දක්‍ෂතාවයක් ඇති විදර්ශක භික්‍ෂුතෙමේ ශාස්වත. උච්ඡේද, ආදී නොයෙක් මිථ්‍යාදෘෂ්ටි කෙරෙහි කම්පා නොවෙයි යනු තේරුමයි.

**නිගමනය:** මෙසේ භඞ්ග වශයෙන් දක්නාවූ ඤාණය දක්න ලද යන තේරුමින් ඤාණ නම්. භාත්පසින්ම දන්නා හෙයින් ප්‍රඥයි මේ නිසා “අරමුණු ඛය වය වශයෙන් නුවණින් දැන, භඞ්ගයට අනුව දැනීමේ ප්‍රඥාව විදර්ශනාවෙහි ඥානය”යි කියනු ලැබේ.

විදර්ශකයා “සියලු සංස්කාර ධර්මයෝ මෙසේ බිඳෙත්ය”යි නිතර නිතර සලකන්නම ඔහුට ඒ නිසා ආනිශංස අටකින් යුක්තවූ භඞ්ග ඤාණය බලවත් වෙයි. ඒ ආනිශංසයෝ නම්,- ශාශ්වත දෘෂ්ටිය විනාශවීම. ජීවිතය කෙරෙහි ඇල්ම අතහැරීම, හැම කල්හිම භාවනාවෙහි සිත යෙදවීම, පිරිසුදු ජීවිකාව, කල නොකල වැඩ කෙරෙහි උනන්දු ගතිය අතහැරීම, බිය නැති බව, ඛන්ති-සොරච්ච පටිලාභය (ඉවසීම හා විදර්ශනාවෙහි ඇලීම) අධිකුශල ධර්මවූ විදර්ශනා - මාර්ගාදීන් කෙරෙහි නො ඇල්මද, කාමගුණයෙහි ඇල්මද, ඉවසීම් වශයෙන් උසුලන ගතියද, (නො ඇල්ම ඉවසීම යනු නො ඇල්ම අතහැරීමයි) යන මොහුයි.

(අරතිරතිසහනතාති; අනිත්‍යතාව සුදෘෂ්ට බැවින් ප්‍රාන්ත ශයනාසනයෙහිදු අධිකුශලයෙහිදු අරතියද කාමගුණයෙහි රතියද මඩනා බවය - සහනයයි.)

භඞ්ග ඤාණය නිමි

## 8. ආදීනව ඤාණය

“භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං” භය වශයෙන් වැටහීමේ ප්‍රඥාව ආදීනව ඤාණ නම්. නව මහා විදර්ශනා ඥාන අතුරෙන් ඥාන තුනක් (3) ම මෙම ආදීනව ඤාණයට ඇතුලත් වේ. “යා ච භයතුපට්ඨානෙ පඤ්ඤා යඤ්ච ආදීනවෙ ඤාණං යා ච නිබ්බිදා ඉමෙ ධම්මා එකට්ඨා බ්‍යඤ්ජනමෙව නානන්ති? භය වශයෙන් වැටහීමේ යම් නුවණක් අද්ද, යම් ආදීනව ඤාණයක්වේද, යම් කලකිරීමක් වේද, මේ ධර්ම එකම අර්ථයි. පදයන්හි පමණක් වෙනසි” යනු හෙයින් භයතුපට්ඨාන ඤාණය, ආදීනව ඤාණය, නිබ්බිදා ඤාණය යන ඤාණ තුනම මෙහිලා ආදීනව ඤාණයටම ගැණුවේ. කරුණු මෙසේ හෙයින් ආදීනව ඤාණය විස්තර කරනුයේ භයතුපට්ඨාන ඤාණයේ සිටයි.

**භයතුපට්ඨාන ඤාණය.**

“තස්සෙවං සබ්බසඞ්ඛාරානං ඛයවයභෙද නිරොධා - රම්මණං භඞ්ගානුපස්සනං ආසෙවන්තස්ස භාවෙන්තස්ස බහුලී

ඛරොන්තස්ස සබ්බභවයොනිගතිඨිති සත්තාවාසෙසු පභෙ-දකා සඞ්ඛාරා, සුඛෙන ජීවිතුකාමස්ස භීරුක පුරිසස්ස සීහබ්‍යග්ඝ දීපි අච්ඡතරච්ඡ යක්ඛරක්ඛස චණ්ඩගොණ චණ්ඩකුක්කුර පභින්න මදචණ්ඩහත්ථි ඝොර ආසිවිස අසනිවිචක්ක සුසාන-රණභූමිජලිත අඞ්ගාරකාසු ආදයො විය මහාභයං හුත්වා උපට්ඨහන්ති තස්ස අතීතා සංඛාරා නිරුද්ධා, පච්චුප්පන්නා නිරුජ්ඣන්ති, අනාගතෙ නිබ්බත්තනකා සංඛාරාපි එවමෙව නිරුජ්ඣිස්සන්තීති පස්සතො එතස්මිං ඨානෙ භයතුපට්ඨාන ඤාණං නාම උප්පජ්ජති"-වි. ම.

භඞ්ග ඤාණයේදී කී අයුරින් සියලු සංස්කාරයන්ගේ ක්ෂය, ව්‍යය, භෙද සංඛ්‍යාත නිරෝධය අරමුණුකොට ඇති භඞ්ගානුදර්ශනය ආසේවනය කරන්නාවූ වඩන්නාවූ බොහෝකොට වඩන්නාවූ ඒ විදර්ශකයාට සියලු භව-යොනි-ගති-විඥාන-ස්ථිති-සත්වාවාසාදීන්හි වූ බෙදීම් බවට ගිය සංස්කාරයෝ, සැපයෙන් ජීවත්වනු කැමති ස්වභාවයෙන්ම බිය පුරුෂයෙකුට සිංහාදී දරුණු සතුන්, සොහොන්, යුද්ධභූමි දිලිසෙන අඟුරු වලවල්, මේ ආදිය සේ මහත් ලෙස බිය ඇතිවව වැටහෙත්. එසේ වැටහුණු විදර්ශකයාට "අතීත සංස්කාර නිරුද්ධවූයෝය. දැන් නිරුද්ධ වෙත්. මතු උපදින සංස්කාරයෝද මෙසේම නිරුද්ධ වන්නෝය"යි බැලීමෙන් මේ අවස්ථාවේදී භයතුපට්ඨාන ඤාණය උපදියි. පැහැදිලිවීම සඳහා උපමාවෙකි.

එක් ස්ත්‍රියකගේ පුතුන් තිදෙනෙක් රාජාපරාධිහුය. මොවුන්ට රජතුමා හිස ගසාදැමීමේ නීතිය පැනවීය. මොවුන් වධක ස්ථානයට පමුණුවද්දී ඕ ද ගියාය. වධකයා වැඩිමහල් පුතුගේ ගෙල සිඳ, මැදුම් පුතුගේ ගෙල සිඳීමට පටන් ගනිත්ම ඒ ස්ත්‍රිය "බාල පුතුටත් මෙසේම වන්නේය"යි සිතා බල පුතු කෙරෙහි ආශාව අතහැරියාය. මෙහි ස්ත්‍රිය විසින් වැඩිමහල් පුතුගේ ගෙල සිඳි බව දකීම මෙනි, යෝගාවචරයාගේ අතීත සංස්කාරයන් පිළිබඳ නිරෝධ දර්ශනය. මැදුම් පුතුගේ ගෙල සිඳීම දකීම මෙනි. වර්තමාන සංස්කාරයන්ගේ නිරෝධ දර්ශනය. බාල පුතු කෙරෙහි ආශාව අතහැරීම මෙනි. අනාගත සංස්කාරයන්ගේද නිරෝධය සලකාගැනීම.

මෙය භයතුපට්ඨාන ඤාණය හුදෙක් බිය වශයෙන් නිර්ණය කිරීම් මාත්‍රයෙකි. නගරද්වාරයෙහි දිලිසෙන අඟුරු වලවල් තුනක් දුටු පුරුෂයෙක් 'අහෝ මේවාට වැටුණහු මහත් දුකක්

විඳිය"යි තීරණය කිරීම පමණක් කෙරේ. බිය නොවෙයි. මෙත් එබඳුය. මෙසේ බියබව වැටහීම මාත්‍රයක් ඇති හෙයින් භය තුපට්ඨාන ඤාණයයි කියනු ලැබේ.

අනිත්‍ය වශයෙන් මෙනෙහිකිරීම නිසා සංස්කාර නිමිති භය වශයෙන් වැටහෙයි. දුඃඛ වශයෙන් මෙනෙහි කිරීම නිසා ඒවායේ පැවැත්ම භය වශයෙන් වැටහෙයි. අනාත්ම වශයෙන් මෙනෙහි කිරීම නිසා නිමිති පැවතීම් දෙකම භය වශයෙන් වැටහෙයි. මෙසේ භයතුපට්ඨාන ඤාණය සංස්කාර ධර්මයන්ගේම පවත්ත, නිමිත්ත යන අවස්ථා දෙක අරමුණු කොට පවතින්නකි. මෙහි නිමිත්ත යනු ඒ ඒ සංස්කාර ධර්මයන්ගේ නුවණට හසුවන අරමුණුයි. පවත්ත නම් ඒ ඒ භවයන් පිළිබඳ පැවැත්මයි. පවත්ත, නිමිත්ත දෙකම භඞ්ග වශයෙන් බලන්නාසේම ඒ බලන සිතද භඞ්ග වශයෙන් බැලීමෙන් භයතුපට්ඨාන ඤාණය සුවිසද වෙයි.

## ආදීනව ඤාණය

ඒ භයතුපට්ඨාන ඤාණය ආසේවනය කිරීමෙන්, වැඩීමෙන් බොහෝකොට වැඩීමෙන් සියලු භව, ගති ආදී නොයෙක් ආකාර සත්වාවාසයන්හි ආරක්ෂාවක් පිහිටක් හෝ විදර්ශකයාට නො පෙනෙයි. ඒ නිසාම භව ආදී දෙයක් ප්‍රාර්ථනා නොකෙරෙයි. කාම, රූප, අරූප, යන භව ත්‍රයම ගිනි ගෙන දිලිසෙන අඟුරු, වලවල් තුනක් සේද, සතරමහා භූතයන් දරුණු විෂ ඝෝර සර්පයන් සේද, පඤ්චස්කන්ධය, ඔසවන ලද කඩුගත් අත් ඇති වධක යකුසේද, සියලු අධ්‍යාත්මික ආයතන හිස්වූ ගම්සේද, බාහිරායතන ගම්පහරණ සොරුන්සේද, සත්ව විඥානස්ථිති නව සත්වාවාස රාගාදී එකොළොස් ගින්නෙන් දැවෙන්නාසේද වැටහෙයි. මෙසේ වැටහීම් ඇති කල්හි ඒ සියලු සංස්කාරයන් කෙරෙහිම ආශ්වාදජනක ගතියක් නොමැතිව මහත් කලකිරීමක් ඇතිවෙයි. ඒ කලකිරීම් වශයෙන් උපන් අදහස ආදීනව නම්. වනයකට පිවිසුණු පුරුෂයෙක් එහි වෙසෙන බියජනක වනසතුන් දැකීමෙන වනය පිළිබඳ කලකිරීම ඇතිවන්නේ යම් සේද, එමෙන් සංස්කාර ධර්මයන්ගේ ක්ෂය, ව්‍යය, භේද දැකීමෙන් ආදීනව ඤාණය උපදියි. බිය ඇති වූ පසු ආදීනව ඤාණය ඉපදීම ධර්ම නියාමයි.

පටිසම්භිදා මග්ගයෙහි ආදීනව ඤාණය මෙසේ දැක්වෙයි.

"කථං භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං? උප්පාදො භයන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, පවත්තං භයන්ති නිමිත්තං භයන්ති ආයූහනා භයන්ති පටිසන්ධි භයන්ති ගති භයන්ති නිබ්බත්ති භයන්ති උපපත්ති භයන්ති ජාති භයන්ති ජරාභයන්ති ව්‍යාධිභයන්ති මරණභයන්ති සොකභයන්ති පරිදෙවො භයන්ති උපායාසො භයන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, අනුප්පාදො ඛෙමන්ති සන්තිපදෙ ඤාණං, අප්පවත්තං -පෙ- අනුපායාසො ඛෙමන්ති සන්තිපදෙ ඤාණං, උප්පාදො භයං අනුප්පාදො ඛෙමන්ති සන්තිපදෙ ඤාණං පවත්තං භයං -පෙ- අනුපායාසො ඛෙමන්ති සන්තිපදෙ ඤාණං, උප්පාදො දුක්ඛන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, පවත්තං භයං -පෙ- උපායාසො දුක්ඛන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, අනුප්පාදො සුඛන්ති සන්තිපදෙ ඤාණං, අප්පවත්තං -අනුපායාසො සුඛන්ති සන්තිපදෙ ඤාණං, පවත්තං - පෙ = අනුපායාසො සුඛන්ති සන්තිපදෙ ඤාණං,

උප්පාදො සාමිසන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, පවත්තං = පෙ - උපායාසො සාමිසන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, අනුප්පාදො නිරාමිසන්ති සන්තිපදෙ ඤාණං, අප්පවත්තං - පෙ - අනුපායාසො නිරාමිසන්ති සන්තිපදෙ ඤාණං, උප්පාදො සාමිසං අනුප්පාදො නිරාමිසන්ති සන්තිපදෙ ඤාණං, - පෙ - අනුපායාසො නිරාමිසන්ති සන්තිපදෙ ඤාණං, උප්පාදො සංඛාරාති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, අනුප්පාදො නිබ්බානන්ති සන්තිපදෙ ඤාණං, අප්පවත්තං -පෙ- අනුපායාසො නිබ්බානන්ති සන්තිපදෙ ඤාණං, උප්පාදො සංඛාරා අනුප්පාදො නිබ්බානන්ති සන්තිපදෙ ඤාණං, පවත්තං -පෙ- අනුපායාසො නිබ්බානන්ති සන්තිපදෙ ඤාණං,

උප්පාදඤ්ච පවත්තඤ්ච - නිමිත්තං දුක්ඛන්ති පස්සති
ආයූහනං පටිසන්ධිං - ඤාණං ආදීනවෙ ඉදං

අනුප්පාදං අප්පවත්තං - අනිමිත්තං සුඛන්ති ච
ආයූහනා පටිසන්ධි - ඤාණං සන්තිපදෙ ඉදං

ආදීනවෙ ඤාණං - පඤ්චට්ඨානෙසු ජායති
පඤ්චට්ඨානෙ සන්තිපදෙ - දස ඤාණෙ පජානාති

ද්විත්තං ඤාණානං කුසලතා - නානාදිට්ඨිසු නකම්පති තං ඤාතට්ඨෙන ඤාණං පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං” - ප. ම.

මෙහි දතයුතු මූලික කරුණු අතුරෙන් ඉහතදී පැහැදිලි නොකළ පද කීපයක තේරුම දතයුතුය. එහි උප්පාද යනු හෙවත් පූර්ව කර්මප්‍රත්‍යයෙන් මෙලොව ඉපදීම කියැවේ. ආයූහන යනු අනාගත භවයෙහි උප්පත්තිය ගෙනදෙන වර්තමාන කර්මයි. පටිසන්ධි නම් මතු ඉපදීමයි. ගති නිරය ආදී යම් ගතියක ප්‍රතිසන්ධියක්වේ නම් එයයි. නිබ්බත්ති: ස්කන්ධයන්ගේ ඉපදීම. උප්පත්තිය: සමවැදුනහුගේ හෝ ප්‍රතිසන්ධිය ගනුලබන්නහුගේ හෝ විපාක පැවැත්ම සෙසු පද සුගමැයි.

ආදීනව ඤාණ විස්තරයේදී ප්‍රධාන වශයෙන් වාර දෙළොස්සක් දක්විණ. එනම් උප්පාද ආදී ආ පද දෙළසයි. එහි සොකාදිය මරණ පදයටම ඇතුළති. නැවත ජීර්ණ සංඛ්‍යාත ක්ෂාන්ති පදය බහා දෙළොස් වාරයක් වෙයි. භය-ක්ෂෙම පද දෙකම සම්බන්ධකොට දෙසූ වාරද දොළොසෙකි. මේ අයුරින් දුක්ඛ සුඛ, සාමිස, නිරාමිස, සංඛාර, නිබ්බාණ යන පදයන්ට අනුවද වාර බෙදී ඇත. ඒ හැම දෙසුමක්ම සංග්‍රහකොට ගාථාවන්ගෙන් දසවැදෑරුම් වශයෙන් නැවත දෙසූහ. එහි ආදීනව වශයෙන් ක්‍රම පසෙකි. ක්ෂාන්ති පදය වශයෙන් ක්‍රම පසෙකි. ගාථාවන්හී අදහස මෙසේය.

“උප්පාද, පවත්ත, නිමිත්ත, ආයූහන, පටිසන්ධි, මොවුනු දුක් වශයෙන් දැකීම ආදීනව ඤාණයයි. අනුප්පාද අප්පවත්ත, අනිමිත්ත, අනායූහන අප්පටිසන්ධි මොවුනු සුඛ වශයෙන් දැකීම ක්ෂාන්ති පදයෙහි ඤාණයයි. (මෙසේ) ආදීනව ඤාණය පස් තැනක උපදී. පස්තැනක ක්ෂාන්ති පදයට අනුව උපදී. මේ දස ඤාණයන් දන්නේ ආදීනව ක්ෂාන්ති පද යන ඤාණ දෙකෙහි දක්ෂභාවය නිසා නානා දෘෂ්ටීන්හි කම්පා නොවේ.

**නිබ්බිද ඤාණය.**

මෙසේ සියලු සංස්කාර ධර්ම කෙරෙහි ආදීනව දුටු විදර්ශක යෝගීතෙමේ ඒවායි කලකිරෙයි. තවද උප්පාදාදියට විරුද්ධ ක්ෂාන්ති පදයට අයත් අනුප්පාදාදිය දැකීම නිසා වඩාත් කල

කිරෙයි. දෙවන්නය ලබන්නම සිටියාවූ පහන් ජීවිතය ගැන කලකිරෙන්නාක් මෙනි. එසේම කිසිදු සංස්කාර ධර්මයක් නිත්‍ය, සුඛ ආත්ම, වශයෙන් නොගෙන අනිච්චානුපස්සනාදී අනුපස්සනා තුන කෙරෙහිම සිත මෙහෙයවයි නැවත නැවත මෙහෙයවීම නිසා වඩාත් කලකිරීම් ඇතිවූ කල්හි නිබ්බිද ඥානය උපදී. මෙනයින් භයතුපට්ඨාන, ආදීනව, නිබ්බිද මේ ඥාන තුනම විදර්ශනා ඥාන කථාවේදී ආදීනව ඥානයටම ඇතුලත්වෙයි.

ආදීනව ඥානය නිමි.

# 18 වැනි පරිච්ඡේදය

## 9. සංඛාරුපෙක්ඛා ඤාණය.

**"මුඤ්චිතුකම්‍යතා පටිසංඛා සන්තිට්ඨනා පඤ්ඤා, සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං" - ප. ම.**

සංසාර වෘත්තයෙන් මිදෙනු කැමති බව, ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීම, ඒ ත්‍රිලක්ෂණයෙහි මනාව පිහිටීම මේ ධර්මයන්හි පවත්නාවූ ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නම්. සාමාන්‍ය තේරුම නම් අනිත්‍යාදී ලක්ෂණත්‍රයට නැගූ සියලු සංස්කාර ධර්ම කෙරෙහි පවත්නාවූ මැදහත් ගතිය සමග යෙදුනු නුවණ යනුයි.

මෙම ඤාණය අටමහා විපස්සනා ඤාණ අතුරෙන් මුඤ්චිතුකම්‍යතා ඤාණය, පටිසංඛානුපස්සනා ඤාණය යන පිරිවර ඥාන ද්වයකින් සමන්විතය. එම නිසා ඥානත්‍රයටම සංඛාරුපෙක්ඛා ඤාණය යන නාමය ලබයි. "යාච මුඤ්චිතුකම්‍යතා, යාච පටිසංඛානුපස්සනා, යා ච සංඛාරුපෙක්ඛා, ඉමෙ ධම්මා එකට්ඨා බ්‍යඤ්ජනමෙව නානන්ති" යම් මිදෙනු කැමති බවක් වේද. යම් නුවණින් විමසා බැලීමක්වේද, යම් සංස්කාරයන් කෙරෙහි මැදහත් බවක් වේද, මේ ධර්ම එකම තේරුමයි. පද පමණක් වෙනසි. ඒ ඤාණ තුනම එකක් ලෙස දෙසූ පරිදියි. මේ කරුණු මෙසේ හෙයින් සංඛාරුපෙක්ඛා ඤාණ විස්තරයෙහි පළමුව දක්වනුයේ මුඤ්චිතු කම්‍යතා ඤාණයයි. මෙය අෂ්ටමහා විදර්ශනා ඥානයන් අතුරෙන් සයවැන්නයි.

### මුඤ්චිතුකම්‍යතා ඤාණය.

"ඉමිනා පන නිබ්බිදා ඤාණෙන ඉමස්ස කුලපුත්තස්ස නිබ්බින්දන්තස්ස උක්කණ්ඨන්තස්ස අනභිරමන්තස්ස සබ්බභව යොනිගතිවිඤ්ඤාණට්ඨිති සත්තාවාසගතෙසු සභෙදකෙසු සඞ්ඛාරෙසු එක සංඛාරෙපි චිත්තං න සජ්ජති, න ලග්ගති න බජ්ඣති, සබ්බසංඛාරගතා මුඤ්චිතුකාමං නිස්සරිතුකාමං හොති = වි. ම.

ආදීනව ඤාණයෙහි කියූ නිබ්බිදා ඤාණයෙන් යුක්ත වූ විදර්ශකයාට සියලු භව යෝනි ගති ආදී බෙදීම් බවට ගිය සංස්කාර ධර්ම අතුරෙන් එක් සංස්කාරයක් කෙරෙහි හමුදු සිත නො ඇලෙයි. නොලැගෙයි නො බැඳෙයි. සියලු සංස්කාරයන් කෙරෙන් මිදීමට කැමැත්තක් අතහැරීමට කැමැත්තක් ඇති ඇතිවෙයි.

ඒ කැමැත්ත අනුව ගිය ඤාණය මුඤ්චිතුකම්‍යතා ඤාණ නම්. මුඤ්චිතුං චජිතුං කාමෙති ඉච්ඡතීති මුඤ්චිතුකාමො, මුඤ්චිතුකාමස්ස භාවො මුඤ්චිතුකම්‍යතා'' මිදීමට අතහැරීමට කැමතිවීම මුඤ්චිතුකාම නම්. ඒ මුඤ්චිතුකාමයෙහි ස්වභාවය - ගතිය - මුඤ්චිතුකම්‍යතායි භාවසාධනයි. මිදෙනු කැමති නුවණ සඳහා උපමා කීපයක් අටුවාවේ සඳහන් වෙයි.

දැලකට හසු වූ මසුන් සේ, සර්පමුඛයට හසු වූ මැඩියෙකු සේ, කූඩුවකට හසු වූ වලි කුකුළෙකු සේ, දැඩි බැම්මකට හසුවූ මුවෙකු සේ, අහිතුණ්ඩිකයෙකුගේ අතට හසු වූ නයෙකු සේ, ගැඹුරු මඩවලක එරුණු ඇතෙකු සේ, ගුරුළු මුවට පත් නාගරාජයකු සේ, සතුරන් මැදට පත් පුරුෂයෙකු සේ, අනිත්‍යාදී වශයෙන් දෝෂ දර්ශනයට ලක්වූ සංස්කාරයන් කෙරෙන් ඒ යෝගියා මිදෙනු කැමති වෙයි. ඒ සඳහා යෙදුනු උපාය ඤාණය, මුඤ්චිතුකම්‍යතා ඤාණයයි.

## පටිසඞ්ඛානුපස්සනා ඤාණය.

''සො එවං සබ්බභවයොනිගතිවිඤ්ඤාණට්ඨිති සත්තාවාසගතෙ සභෙදකෙ සඞ්ඛාරෙ මුඤ්චිතුකාමො මුඤ්චනස්ස උපායසම්පාදනත්ථං පුන තෙ එව සඞ්ඛාරෙ පටිසඞ්ඛානුපස්සනා ඤාණෙන තිලක්ඛණං ආරොපෙත්වා විපස්සති එවං හි විපස්සතො චස්ස අනිච්චවසෙන නිමිත්තං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති. දුක්ඛවසෙන පවත්තං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති. අනත්තවසෙන නිමිත්තඤ්ච පවත්තඤ්ච පටිසඞ්ඛාඤාණං උප්පජ්ජති'' - ප. ම. අ.

මෙසේ සියලු භවයෝනි ආදී බෙදීම් බවට ගිය සංස්කාර ධර්මයන් කෙරෙන් මිදෙනු කැමති ඒ විදර්ශකයා, මිදීමට උපාය සොයනුයේ නැවත ඒ සංස්කාරයන් ප්‍රතිසංඛ්‍යානුදර්ශන ඥානයෙන් ත්‍රිලක්ෂණයට නඟා විදර්ශනා කරයි. එසේ විදර්ශනා

කරන ඔහුට අනිත්‍ය වශයෙන් නිමිත්ත - සංස්කාර නිමිති - කෙරෙහි පටිසඞ්ඛා ඤාණය උපදියි. එසේම දුඃඛ වශයෙන් පවත්ත - පැවතීම = කෙරෙහි පටිසඞ්ඛා ඤාණය උපදියි. අනාත්ම වශයෙන් ඒ නිමිත්ත, පවත්ත, දෙක කෙරෙහිම පටිසඞ්ඛා ඤාණය උපදියි'' යනු ඒ පාඨයෙහි අදහසයි. සංස්කාර ධර්ම නැවත ත්‍රිලක්ෂණයට නැගීම උදෙසා පටිසඞ්ඛා ඤාණය පවතින්නක් බව මෙයින් පෙනේ. ත්‍රිලක්ෂණයට නගන අයුරු මෙසේය.

ඒ විදර්ශකයා සියලු සංස්කාර, අනිත්‍යය කෙළවර කොට ඇති හෙයින් ද, තාවකාලික වශයෙන් ද, ඉපදීම - විනාශවීම දෙකට සීමා වූ හෙයින්ද, විනාශවන හෙයින් ද, බිඳීම් වශයෙන් සෙලවෙන බැවින් ද, බිඳෙන බැවින් ද, ස්ථිර පැවැත්මක් නොමැති බැවින් ද, පෙරළෙන ගති ඇති බැවින් ද, යනාදි කරුණු වශයෙන් සලකා ඒ සියලු සංස්කාර අනිත්‍යයයි දකියි. දුඃඛයයිද දකියි. එසේම අමනොඥ හෙයින් ද, දුර්ගන්ධ හෙයින් ද, පිළිකුල් කටයුතු හෙයින් ද, යනාදී කරුණු නිසා සියලු සංස්කාර අශුභ වශයෙන් දකියි (අශුභ දර්ශනය දුඃඛලක්ෂණයට අයත් ය.) පර - හිස් - සුළු යනාදී වශයෙන් සියලු සංස්කාර ධර්ම අනාත්මයැයි දකියි.

මෙසේ ත්‍රිලක්ෂණයත් දැකීම නිසා, ඒ සංස්කාර ධර්මයන්ගෙන් නිදහස් වීමට උපායක් සෙවීම හා සමානය. එක් පුරුෂයෙක් 'මාළුවෙකු ගනිමි'' යි සිතා කෙමණක් හෙන ජලයෙහි ඇටවීය. හේ එහි මුවින් අත දමා සර්පයකුගේ බෙල්ලෙන් අල්වා ගෙන 'විසාල මාළුවෙකු අල්ලුවෙමි', යි සතුටු වී ජලයෙන් මතුවට ගත්තේය. එවිට සර්පයාගේ සෝවැති තුන දැක, සර්පයෙකැයි බියවී දොස් දැක හැනිමෙන් කලකිරුණේ ඔහුගෙන් මිදෙනු කැමතිව, එයට උපායක් සොයනුයේ පළමු කොට නගුට පටන් ලෙහා අත ඔසවා, හිස වටා තුන් වටයක් කරකවා සර්පයා දුබල කොට ''යා පාපුරු සතාය''යි කියා ඈතට විසි කරයි. ඉක්බිති එහිදු නො සිට ගොඩට අවුත් ''මහා සර්පයෙකුගෙන් මිදුනෙමි'' යි සිතමින් ආ මඟ බලමින් සිටියි.

මෙහි උපමා උපමේය සම්බන්ධය මෙසේය. ඒ පුරුෂයා සර්පයාගේ බෙල්ලෙන් අල්වා, ''මාළුවෙකු අල්වා ගතිමි'' යි සතුටුවීම මෙනි. යෝගියා තම ආත්මභාවය නිත්‍ය - සුඛ ආදී වශයෙන් පළමු කොට සලකා සිටීම. සර්පයා ජලයෙන් මතුපිටට ගෙන සෝවැති තුන දුටුවා මෙනි සංස්කාර ධර්ම ත්‍රිලක්ෂණයට නගා බැලීම. සෝවැති තුන දකින්නම ය වූ කාලය මෙනි ත්‍රිලක්ෂණ වශයෙන්

දුටු සංස්කාර ධර්මයන් කෙරෙහි බියවීම. (භයතුපට්ඨාන ඤාණය) අල්ලා ගැනීමේ දෝෂ දර්ශනය මෙනි ආදීනවානුපස්සනා ඤාණ උපපත්ති කාලය. නිබ්බිදා ඤාණය, සපීයා අල්වා ගැනීමෙන් වූ කලකිරීම මෙනි. සපීයාගෙන් මිදෙනු කැමතිවීම මෙනි මුඤ්චිතුකම්‍යතා ඤාණය. මිදීමට උපාය සෙවීම මෙනි. පටිසඞ්ඛානුපස්සනා ඤාණය. එනම් නැවත සංස්කාර ධර්ම ත්‍රිලක්ෂණයට නැගීම. එසේ නගා සංස්කාරයන් කෙරෙහි තුබූ නිත්‍යාදි හැඟීම් දුර්වල කොට ඒ අදහස් වලින් මිදීම සපීයා දුර්වල කොට ඈතට විසිකොට මිදීම මෙනි. මෙසේ ඒ විදර්ශකයා නැවත සංස්කාර ධර්ම ත්‍රිලක්ෂණයට නගා බැලීම පටිසඞ්ඛානුපස්සනා නමි. ඒ කෙරෙහි වූ නුවණ පටිසඞ්ඛානුපස්සනා ඤාණයයි.

අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාට සංස්කාර නිමිති අනුව පටිසඞ්ඛා ඤාණය ද, දුඃඛ වශයෙන් මෙනෙහි කරන්නාට ඒ සංස්කාරයන්ගේ පැවැත්ම අනුව පටිසඞ්ඛා ඤාණය ද, පැවැත්ම - නිමිත්ත දෙකම අනුව පටිසඞ්ඛා ඤාණය ද, පැවැත්ම - නිමිත්ත අනුව අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාට පටිසඞ්ඛා ඤාණය ද, උපදින බව දේශනා පාඨයෙහි දක්වූයේ පටිසංඛා ඤාණය ත්‍රිලක්ෂණයන්ට අනුවම උපදින හෙයිනි.

මේ පටිසඞ්ඛාන ඤාණයයි.

## සඞ්ඛාරුපෙක්ඛා ඤාණය.

තියුණුවීම බවට පත් පටිසඞ්ඛා ඤාණය නිසා කිසිදු සංස්කාර ධර්මයක් ආත්මසාර වශයෙන් නොගෙන, ඒවා කෙරෙහි මැදහත් බවක් දක්වන නුවණ සඞ්ඛාරුපෙක්ඛා ඤාණයයි. මෙය උපදවන අයුරු විසුද්ධි මාර්ගගත කරුණු අනුව දක්වේ.

විදර්ශකයා පටිසඞ්ඛාන ඤාණයෙන් සියලු සංස්කාරයන් ශූන්‍ය වසයෙන් පරිග්‍රහ කොට - කොටස් වසයෙන් බලා - නැවත දෙකෙළවරක් ඇති ශූන්‍යතාවය - හිස් බව - බලයි. ‘‘සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා’’ මේ නාම රූප ශරීරය ආත්මයෙන් හෝ ආත්මයට අයත් බවෙන් හෝ ශූන්‍යය කියායි නාම රූප සඞ්ඛ්‍යාත සංස්කාර පුඤ්ජය - පොදිය - ආත්ම වශයෙන් ගතයුතු ධර්මයක් නොමැති බව වැටහෙනුයේ මෙසේ දියුණු කර ගත් විදර්ශනා ඥානය නිසාය. එසේම දෙවැනි කෙළවර වූ ආත්මීයතාවයකුදු නොපෙනේ. එනම් ආත්මය යන ව්‍යවහාරයට සම්බන්ධ වූ කිසිදු දෙයක් නොමැති බව පෙනීමයි. සඞ්ඛාරුපෙක්ඛා ඤාණය උපදවනු සඳහා මේ ප්‍රථම ශූන්‍යතාවය පරිග්‍රහ කළ යුතුය.

## සිවු කොළුවරක් ඇති ශූන්‍යතාවය.

ඉක්බිති හේ සියලු සංස්කාර ධර්ම කොළුවර සතරක් වශයෙන් ගෙන ශූන්‍යතාවය පරිග්‍රහ කෙරේ. “නාහං ක්වචිනි කස්සචි කිඤ්චනතස්මිං න ච මම ක්වචිනි කිස්මිංචි කිඤ්චනතත්ථි” තැනක ආත්මය මේ ඒ කොළුවර සතරයි.

i “නාහං ක්වචිනි” කිසි තැනක මම නොවෙමි. එනම් කිසිදු නොදකිමයි. මේ එක්කොළුවරකි.

ii න ච කස්සචි කිඤ්චන තස්මිං: කිසිදු කෙනෙකුට කරදර කරයි යනුවෙන් තමාගේ ආත්ම භාවය කරදරවීම් පිළිබඳව එළු විය යුත්තක් නොදකී. ආත්මය නොපෙනෙන හෙයින් තමා කිසිවෙකුට කරදර කරයි යනුවෙන් නොදකිමයි. (තමාත් සංස්කාර පුඤ්ජයකි. පරාත් එසේමය. දෙපක්ෂයම ආත්ම ශූන්‍යය යනුයි.)

iii න ච මම ක්වචිනි: මම ශබ්දය හැර කිසිදු තැනක අන්‍යයෙකු නොමැත යනුවෙන් බැලීමයි. අනුන්ගේ ආත්මය ද ආත්ම වශයෙන් නො පෙනීම මෙයින් කියැවේ.

iv න ච මම කිස්මිංචි කිඤ්චනතත්ථි: අනිකෙකුගේ ආත්මය මගේ කිසිදු තැනක පලිබෝධ වශයෙන් ඇතැයි නොදකියි. මෙසේ සිවු කොළුවරක් ඇති ශූන්‍යතාවය පරිග්‍රහ කෙරේ.

නැවත සයාකාරයකින් ශූන්‍යතාවය පරිග්‍රහ කෙරේ. ඒ මෙසේ ය.

ඇස, කණ, ආදී ආධ්‍යාත්මික ආයතනද, රූපාදී බාහිරායතන ද, චක්ෂුර් විඥානාදී ෂඩ් විඥාන ද, ස්පර්ශාදී ධර්ම ජරා මරණ දක්වාම එකක් පාසා වෙන වෙනම ක්‍රම සයකට අනුව පරිග්‍රහ කරයි. එනම් ආත්ම වශයෙන් හෝ ආත්මය පිළිබඳ දෙයින් හෝ නිත්‍ය බවෙන් හෝ ස්ථිරත්වයකින් හෝ ශාස්වතයෙන් හෝ අවිපරිනාම – නො පෙරළෙන - ධර්මයෙන් හෝ යන මේ ක්‍රම සයට අනුව ශූන්‍යභාවය බැලීමයි. නැවත අටාකාරයකින් ශූන්‍යතාවය බලයි. රූපාදී ධර්ම සමූහය එකක් පාසා නිත්‍යසාර, ධ්‍රැවසාර, සුඛසාර, ආත්මසාර, යන සතර සාරයෙන් හෝ නිත්‍ය, ධ්‍රැව; ශාස්වත, අවිපරිනාම, යන ධර්ම සතර වශයෙන් හෝ වෙන වෙනම ශූන්‍යතාවය බැලීමයි. උපමා වශයෙන් බට, එරඬු, දිඹුල්

ආදී සාරාපගත - හරයෙන් අස් වූ - ද්‍රව්‍ය කියැවේ. නැවත රික්ත, තුච්ඡ, ශූන්‍ය, අනාත්ම, අනීශ්වර, අකාමකාරී, අලබ්භනීය, අවශවර්තික, පර, විවිත්ත, යන ක්‍රම දසයට අනුව ශූන්‍යතාවය පරිග්‍රහ කරයි. (රික්ත - තුච්ඡ - ශූන්‍ය ; හිස්, අනීශ්වර: ප්‍රධාන නැති, අකාමකාරී: කැමැත්තට අනුව නොකිරීම, අලබ්භනීය; නොලැබිය යුතු, අවශවර්තික; නො නැමෙන ගතියා පර; තමාගෙන් තොර, විවිත්ත; වෙන් වූ,) ඉක්බිති සත්ව, ජීව, නර, මානවක, ස්ත්‍රිය, පුරුෂය, ආත්මය, ආත්මයට අයත්ය, යන ව්‍යවහාරවලින් තොරවූ වශයෙන්ද, මමනොවෙමි. මාගේ නොවේ, අනිකෙකුගේ නොවේ, කිසිවෙකුගේ නොවේ. යන දෙළොස් ක්‍රමයෙන් රූපාදි ධර්ම සමූහයෙහි ශූන්‍යතාවය පරිග්‍රහ කෙරේ. පෙරදී දක්වූ තීරණ පරිඥයෙහි ඇති සතළිස් ආකාරයට අනුව හා ඊව අසාරකම, නිස්සරණ, දෙකත් එක්ව සතළිස් දෙආකාරය අනුව ශූන්‍යතාවය පරිග්‍රහ කරයි.

මෙසේ ශූන්‍යතාවය බලන්නා වූ විදර්ශකයාගේ සිත, තුන් භවයෙහි ද, සිවු යෝනියෙහි ද පස් ගතියෙහි ද, සප්තවිඥාන ස්ථිතියෙහි ද, නවසත්වාවාසයෙහි ද, හැකිළෙයි. පැකිළෙයි. වැතිරෙයි. නොදුවයි. මැදහත් බව හෝ පිළිකුල් බව හෝ පිහිටයි. එසේ ඇති කල්හි සඞ්ඛාරුපෙක්ඛා ඤාණය උපන්නේ නම් වෙයි. මේ සඞ්ඛාරුපෙක්ඛා ඤාණය නිර්වාණය ශාන්ත වශයෙන් දකියි. එසේම සංස්කාර පිළිබඳ හැඟීම හැර නිර්වාණය කෙරෙහිම සිත පිහිටයි. යම් හෙයකින් නිර්වාණය වෙත සිත හැරවීම වශයෙන් ප්‍රගුණ - පුහුණු - භාවයක් නොමැති නිසා නිර්වාණය ශාන්ත වශයෙන් නොදකියි ද, එවිට නැවත නැවත අරමුණු කිරීම වශයෙන් සිත පිහිටනුයේ අනිත්‍යාදී වශයෙන් ත්‍රිලක්ෂණයට නැඟූ සංස්කාර ධර්ම කෙරෙහිය. මුහුදු ගමනෙහි යෙදුනු යාත්‍රාකරුවන් ගේ දිසා කපුටා මෙනි. මුහුදු යාත්‍රිකයෝ ගොඩබිම් විමසා ගැනීම සඳහා කපුටෙකු හැරගෙන යත්. යම් කරුණක් නිසා නැව මහ සමුදුර මැදට පැමිණියේ නම් ඔවුහු බිය වෙත්. එවිට ආසන්නයෙහි දිවයිනක් ඇද්දැයි සොයා ගැනීම සඳහා කපුටා මුදවත් - අතහරිත් -, කපුටා කුඹගසට නැගී එතැනින් පියාසර කරයි. සිවුදිසාවෙහිම පියාසර කර ගොඩ බිමක් නො දුටුවේ නම් නැවත කුඹගසෙහිම වසයි. සඞ්ඛාරුපෙක්ඛා ඤාණය ලත් විදර්ශකයාගේ සිත ද එමෙනි. නිර්වාණය නුදුටුව හොත් සංස්කාරයන් ම අරමුණු කරයි කීසේයි.

"කෙතෙක් ආකාරයකින් සංස්කාරෝපෙක්ෂා ඥානයෙන් අන් සිතකට යොමු කරයි ද අට ආකාරයකින් සංස්කාරෝපෙක්ෂා ඥානයෙන් අන් සිතකට යොමු කිරීම වෙයි" - ප. ම. (සිං. ප.)

සංඛාරුපෙක්ඛා ඤාණය කරුණු අටක් නිසා, නැතහොත් ක්‍රම අටකින් වෙනත් සිතකට යොමු වන බව මේ දේශනා පාඨයෙන් පෙනේ. ඒ අටාකාරය පෘථග්ජන, ශෛක්‍ෂ, අර්හත්, යන පුද්ගලයන් තුන්දෙනා උදෙසා පවතින්නකි. එයින් පෘථග්ජනයාට දෙයාකාරයකින් පවතී. ශෛක්‍ෂ, අර්හත්, දෙදෙනාට තුන් තුන් ආකාරයකින් පවතී. පෘථග්ජනයා ඒ සංඛාරුපෙක්ඛා ඤාණයට ඇතැම්විට ඇලීමක් ඇතිකරයි. ඇතැම්විට එය විදර්ශනා කරයි. මේ ඒ දෙයාකාරයයි. ශෛක්‍ෂයන් වහන්සේ ඇතැම්විට ඒ ඤාණයට ඇල්මක් ඇති කෙරේ. ඇතැම්විට විදර්ශනා කරත්. ඇතැම්විට ඵලසමාපත්තියට සමවදිත්. මේ ශෛක්‍ෂයා පිළිබඳ තුන් ආකාරයයි. රහත් තෙමේ ඒ ඤාණය විදර්ශනා කරන්නේ හෝ වෙයි. නැතහොත් ඵලසමාපත්තියට පැමිණෙන්නේ හෝ වෙයි. එසේත් නො මැති නම් ඒ ඤාණය මැදහත් ලෙස සිතමින් සුඤ්ඤතානුපස්සනා, අනිමිත්තානුපස්සනා, අප්පණිහිතානුපස්සනා යන ත්‍රිවිධ අනුපස්සනා විහරණයන් අතුරෙන් එක් විහරණයකට හෝ පැමිණ වෙසෙයි. මේ ඒ තුන් ආකාරයයි.

තවද සංඛාරුපෙක්ඛා ඤාණය ශමථ වශයෙන් අටාකාරයකට ද, විදර්ශනා වශයෙන් දශාකාරයකට ද, උපදියි.

ප්‍රථම ධ්‍යානය ලැබීම පිණිස නීවරණයන් මෙනෙහි කොට මැදහත් අයුරින් සිටින්නාවූ නුවණ සංඛාරුපෙක්ඛා ඤාණයයි. එසේ ම ද්විතීය ධ්‍යානය ලැබීම පිණිස විතර්ක, විචාර දෙක ද; තෘතීය ධ්‍යානය ලැබීම පිණිස ප්‍රීතිය ද, චතුර්ථ ධ්‍යානය ලැබීම පිණිස සුඛ, දුක්ඛ දෙක ද, ආකාසානඤ්චායතන සමාපත්තිය ලැබීම පිණිස රූපසඤ්ඤා - පටිඝසඤ්ඤා - නානත්තසඤ්ඤා ද, විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ලැබීම පිණිස ආකාසානඤ්චායතන සඤ්ඤාව ද ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ලැබීම පිණිස විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාව ද නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලැබීම පිණිස ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාව ද, මෙනෙහි කොට මැදහත් අයුරින් සිටින්නාවූ නුවණ සංඛාරුපෙක්ඛා ඤාණයයි. මේ සමථ වශයෙන් එන අට ආකාරයයි.

සෝවාන් මාර්ගයට පැමිණීම පිණිස සංස්කාර ධර්මයන් පිළිබඳ උප්පාද - පවත්ත - නිමිත්ත - ආයූහන - පටිසන්ධි - ගති-නිබ්බත්ති උප්පත්ති - ජාති - ජරා - ව්‍යාධි - මරණ - සොක - පරිදෙව - උපායාස - යන මේ ධර්ම මෙනෙහිකොට මැදහත් ආකාරයෙන් පවතින ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණයයි. මෙසේ ම සෝවාන්

ඵලය, සෙසු මාර්ග - ඵල ද, සුඤ්ඤතවිහාර - අනිමිත්තවිහාර යන දෙක ද, ලබාගැනීම පිණිස උප්පාදාදී ධර්ම මෙනෙහි කොට මැදහත් ආකාරයෙන් සිටින ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණ නම්. මේ දශය විදර්ශනා වශයෙනි.

## ත්‍රිවිධ විමොක්ෂ මුඛ.

### නිවණට පිවිසෙන දොරටු තුන.

“තීණි ඛො පනිමානි විමොක්ඛමුඛානි ලොකනිය්‍යානාය සංවත්තන්ති. සබ්බසංඛාරෙ පරිච්ඡෙද පරිවටුමතො සමනුපස්සනතාය අනිමිත්තාය ච ධාතුයා චිත්තසම්පක්ඛන්දනතාය; සබ්බසංඛාරෙසු මනොසමුත්තෙජනතාය, අප්පණිහිතාය ච ධාතුයා චිත්තසම්පක්ඛන්දනතාය; සබ්බධම්මෙ පරතො සමනුපස්සනතාය, සුඤ්ඤතාය ච ධාතුයා චිත්තසම්පක්ඛන්දනතාය; ඉමානි තීණි විමොක්ඛමුඛානි ලොකනිය්‍යානාය සංවත්තන්ති” = ප. ම.

මහණෙනි, මේ විමොක්ෂ මුඛ තුනෙක් ලෝකයෙන් එතරවීම පිණිස පවතිත්. සියලු සංස්කාරයන් ඉපදීම් බිඳීම් දෙකින් සීමා පිරිසිඳ පවත්තේයයි දක්නා ස්වභාවයෙන්ද අනිමිත්ත ධාතුවට සිත යවන සවභාවයෙන් ලෝකයෙන් එතර වෙයි. (මේ අනිමිත්ත විමොක්ෂ මුඛයි) සියලු සංස්කාරයන් කෙරෙහි සංවේගය ඇති කිරීම වශයෙන්ද, අප්පණිහිත ධාතුවට සිත යවන සවභාව යෙන් ද ලෝකයෙන් එතරවෙයි. (මේ අප්‍රණිහිත විමොක්ෂ මුඛයි) සියලු ධර්මයන් තමා නොවන ආකාරයෙන් දැකීම් වශ යෙන්ද, සුඤ්ඤත ධාතුවට සිත යවන සවභාවයෙන්ද ලෝක යෙන් එතෙරවෙයි. (මේ ශූන්‍යතා විමොක්ෂ මුඛයි) මේ විමොක්ෂ මුඛත්‍රය ලෝකයෙන් එතෙරවීම සඳහා පවතිත්.

අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා, යන ත්‍රිවිධ අනුපස්සනාවන් නිසා විමොක්ෂ මුඛ තුනක් වෙත්. එහි අනිච්චානුපස්සනාවෙන් අනිමිත්තවිමොක්ඛමුඛ වෙයි. දුක්ඛානුපස්සනාවෙන් අප්පණිහිත විමොක්ඛමුඛ වෙයි. අනත්තානුපස්සනාවෙන් සුඤ්ඤත විමොක්ඛමුඛ වෙයි. එහෙයින් වදාළහ:

“අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛ බහුලො අනිමිත්ත විමොක්ඛං පටිලභති දුක්ඛතො මනසිකරොතො

පස්සද්ධි බහුලො අප්පණිහිත විමොක්ඛං පටිලභති. අනත්තතො මනසිකාරොතො වෙදබහුලො සුඤ්ඤත විමොක්ඛං පටිලභති" - ප. ම.

මෙහි අධිමොක්ඛ නම් ශ්‍රද්ධාවයි. එය බහුල වනුයේ සංස්කාර ධර්මයන් අනිත්‍ය වශයෙන් බැලීමේදී ක්ෂණ භඞ්ගුර වශයෙන් සංස්කාරයන්ගේ බිඳීම දැක "අහෝ බුදුපියාණෝ සත්‍යයක්ම දෙසූහ"යි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බලවත් ශ්‍රද්ධාව ඉපදීමෙනි. නැතහොත් වර්තමාන සංස්කාර ධර්මයන්ගේ, අතීත-අනාගත සංස්කාර ධර්මද මෙසේම අනිත්‍යය වේත්‍යයි සලකාගැනීමෙන් ඒ සංස්කාරයන් කෙරෙහි තුබූ ඇලීම කෙරෙන් ඉවත්වීම් වශයෙන් සිත අධිමොක්ෂ බහුල වීමයි.

පස්සද්ධිබහුලභාවය: දුක්ඛානුපස්සනාව නිසා සිත කැලඹීම වශයෙන් තුබූ ප්‍රාර්ථනයාගේ - පණිධියගේ - අතහැරීම වශයෙන් පැවති, සිතෙහි ඇති දරදඬු ගතියෙන් නිදහස්වීම් වශයෙන් සිත සැහැල්ලු බවට පත්වීමයි. නැතහොත් දුක්ඛානුපස්සනාවෙන් සංවේගය ඉපිද, සංවේග වූයේ නුවණින් ප්‍රධන්වීර්යය වඩන නිසා සිතෙහි ඇති වික්ෂේපභාවය-විසුරුණු ගතිය= සැහැල්ලු බවට පත්වීමයි.

වෙදබහුලභාවය: අනත්තානුපස්සනාවෙන් ශාසනයෙන් බැහැරවූවන් විසින් නුදුටු ගැඹුරු අනාත්ම ලක්ෂණය දක්නේ සිතෙහි නුවණ බොහෝවෙයි. නැතහොත් දෙවියන් සහිත ලෝකයා විසින් නුදුටු අනාත්ම ලක්ෂණය දුටුයෙම්"යි සතුට බහුල වෙයි වැඩිවෙයියයි.

තවද අනිත්‍යයට අනුව දැකීමෙන් සංස්කාර නිමිති නොපෙනීම වශයෙන් නිර්වාණය දැක, එනම් සංස්කාරයෝ අනිත්‍යහ"යි දැකීමෙන්ම නිර්වාණයෙහි එවැනි සංස්කාර නිමිත්තක් නොමැතියයි දැක නිර්වාණය අරමුණුකොට පැවති ආර්ය මාර්ගය අනිමිත්ත විමොක්ඛ නාමය ලබයි. එසේම අප්‍රණිහිත - ප්‍රාර්ථනා නොමැති - වශයෙන් මෙනෙහිකොට දුක්ඛානුපස්සනාවට අනුව ආර්ය මාර්ගය ලැබීම අප්පණිහිත විමොක්ඛයි. ශුන්‍යතා - හිස් වශයෙන්- නිර්වාණය මෙනෙහිකොට අනත්තානුපස්සනාවට අනුව ආර්ය මාර්ගප්‍රතිලාභය සුඤ්ඤත විමොක්ඛ නමි. මේ පිළිබඳ විස්තර පටිසම්භිදාමග්ගයෙහි විමොක්ඛකථා වර්ණනාවෙහි ඇත. සංඛාරුපෙක්ඛා ඤාණයට විමොක්ඛ කථාද ප්‍රත්‍යය වෙයි

# ආර්ය පුද්ගලයන් සත්දෙනා

සද්ධානුසාරී, සද්ධාවිමුත්ත, කායසක්ඛි, උභතෝ භාග විමුත්ත, ධම්මානුසාරී, දිට්ඨිප්පත්ත, පඤ්ඤාවිමුත්ත යන සත් දෙනායි.

1. සද්ධානුසාරී; "සද්ධං අනුසරති අනුගච්ඡති සද්ධාය වා නිබ්බාණං අනුසරති අනුගච්ඡතීති සද්ධානුසාරී"

ශ්‍රද්ධාවට අනුව සිහිකරයි. ඒ අනුව ආර්ය මාර්ගයෙහි ගමන් කරයි. නැතහොත් ඇදහීමෙන් යුතුව නිර්වාණය සිහිකරයි. ඒ අනුව ආර්ය මාර්ගයෙහි යයි,තුයි සද්ධානුසාරී නම්. යමෙක් අනිත්‍යය වශයෙන් සංස්කාර ධර්ම මෙනෙහි කිරීමෙන් ශ්‍රද්ධාව බහුල කොට ඇත්තේ ශ්‍රද්ධෙන්ද්‍රිය ප්‍රතිලාභය-ශ්‍රද්ධා නමැති ඉන්ද්‍රිය ලැබීම = කෙරෙයි නම් හේ සෝවාන් මාර්ගක්ෂණයෙහි සද්ධා නුසාරී වෙයි,

2. සද්ධාවිමුත්ත: "සද්දහන්තො විමුච්චතීති සද්ධා විමුත්තො" ඇදහීමෙන් කෙලෙසුන්ගෙන් මිදෙයිනුයි සද්ධාවි මුත්ත නම්. ඒ ඇදහීම නම් අනිත්‍ය ලක්ෂණය හෝ නිර්වාණය හෝ විශ්වාස කිරීමයි. අනිත්‍ය ලක්ෂණය මෙනෙහි කොට සද්ධානුසාරී වශයෙන් සෝවාන් මාර්ගය ලැබූ පසු ඉතිරි ආර්ය මාර්ගද ඒ අනිත්‍යානු දර්ශනයට අනුව ලබන ආර්යයා සද්ධා විමුත්ත පුද්ගලයා නම් වෙයි.

3. කායසක්ඛි: "ඵුට්ඨන්තා සච්ඡිකතොති කායසක්ඛි" ස්පර්ශ කරන ලද බැවින් නිර්වාණය ක්ෂාත් ක්ෂාත් කළේනුයි කායසක්ඛි නම්. විශුද්ධිමාර්ගයෙහි "ඵුට්ඨන්තං සච්ඡිකතොති" ස්පර්ශය කෙළවරකොට නිර්වාණය අවබෝධ කළහු කායසක්ඛි යැයි දක්වේ. එද මෙහිලා ගැනේ. මෙහි ස්පර්ශ කිරීම නම් ශුෂ්ක විදර්ශකයා උපචාර මාත්‍රයෙන් ධ්‍යානය ස්පර්ශ කරයි. සෙසු සමථ යානිකයෝ තමන් ලත් ධ්‍යානයන්ට අනුව ස්පර්ශ කරත් යන ක්‍රම දෙකය. යමෙක් දුක්ඛානුපස්සනාවට අනුව සංස්කාර ධර්ම මෙනෙහිකිරීමෙන් පස්සද්ධිය බහුලකොට ඇත්තේ සමාධින්ද්‍රිය ලැබීම කෙරේද, හේ සෝවාන් මාර්ගාදි අවතන්හිම කාය-සක්ඛි නම ලබයි.

4. උභතොභාගවිමුත්ත: අරූප ධ්‍යානයට පැමිණ මාර්ග ඵල ලැබූ තැනැත්තායි. අරූප ධ්‍යානයෙන් ද ආර්යමාර්ගයෙන් අනුවද මිදීම නිසා මේ නම ලබයි යනු අටුවායි.

5. ධම්මානුසාරී: "පඤ්ඤාසංඛාතං ධම්මං අනුසරතී'ති වා ධම්මෙන නිබ්බානං අනුසරතී'ති ධම්මානුසාරී" ප්‍රඥා සංඛ්‍යාත ධර්මය සිහිකරයි. නැතහොත් ඒ ප්‍රඥා ධර්මයෙන් නිර්වාණය සිහිකරයිනුයි ධම්මානුසාරීයා. අනත්තානුපස්සනා වශයෙන් මෙනෙහිකොට වේද බහුලවූයේ සෝවාන් මාර්ගය ලබයිද, හේ ධම්මානුසාරී නම්.

6. දිට්ඨිපත්ත: "දිට්ඨත්තා පත්තෝ දිට්ඨිප්පත්තෝ" දක්නා ලද බැවින් ආර්ය මාර්ගීමට පැමිණියේ දිට්ඨිප්පත්තයි. සෝවාන් මාර්ගක්ෂණයෙහිදී එක්ව යෙදුනාවූ නුවණින් සෝවාන් ඵලයට පත් වීම් වශයෙන් නිර්වාණය දක්නා ලද බැවින් නැතහොත් ප්‍රඥා සංඛ්‍යාත දෘෂ්ටියෙන් නිර්වාණය දක්නා ලද බැවින් ධම්මානුසාරී ආර්යයාම සෙසු මාර්ග ඵල ක්ෂණයෙහිදී දිට්ඨිප්පත්ත නාමය ලබයි.

7. පඤ්ඤාවිමුත්ත: හේ ම අර්හත් ඵලයද ලබයිද, එවිට මේ නාමය ලබයි. මෙසේ අනත්තානුපස්සනාවට පුද්ගලයෝ තිදෙනෙකි. මෙතෙකින් පුද්ගල විභාගය නිමි.

මෙසේ මුඤ්චිතුකම්‍යතා, පටිසංඛා යන ඥානද්වයකින් සමත් වීනාවූ සංඛාරුපෙක්ඛා ඤාණය ලැබූ යෝගාවචරයාගේ විදර්ශනාව "වුට්ඨානගාමිනී" නම ලබයි. සිඛාප්පත්ත විපස්සනා යනුද නමකි. (මුදුන් පැමිණි විදසුනය)

සංඛාරුපෙක්ඛා ඤාණය නිමි.

## 10. ගොත්‍රභූ ඤාණය

විදර්ශනා චිත්තවීථියේ හමාර්කෙරෙන ජවන් සිත් වලට ගොත්‍රභූ ජවන් සිතද ඇතුලත්වන හෙයින් පලමුකොට දැක්විය යුත්තේ අනුලෝම ජවන් සිත සමග යෙදෙන ඤාණයත් මෙසද සංඛාරුපෙක්ඛා ඤාණයත් සමග සම්බන්ධ කල යුතු හෙයින් සංඛාරුපෙක්ඛා ඥානයෙහි අවසානවූ ව්‍යුත්ථාන - වුට්ඨාන - ගාමිනී. විදර්ශනාව පිළිබඳ විස්තරය ඊටත් මුලින් දැක්විය යුතුය. මේ නිසා පිළිවෙලින් වුට්ඨානගාමිනී විපස්සනා, අනුලෝම ඥානය ගොත්‍රභූඥානය යන ධර්ම විස්තර කෙරේ.

# වුට්ඨාන ගාමිනී විපස්සනා.

"වුට්ඨානං ගච්ඡතීති වුට්ඨානගාමිනී" නැගී සිටීමට යේ නුයි වුට්ඨාන ගාමිනී නම්. මෙහි නැගීසිටීම යනු බාහිර වශයෙන් විදර්ශනාවට අරමුණුවූ විදර්ශනා වශයෙන් පිවිසුණු පඤ්චස්කන්ධයෙන්ද, තමා කෙරෙහි පැවතියාවූ මිථ්‍යාදෘෂ්ටි මුල්කොට ඇති එයට නැමුණාවූ කෙලෙසුන් කෙරෙන්ද, නැගී සිටීම නම්වූ ආර්‍ය මාර්ගයයි. (සිත, නිර්වාණය අරමුණු කරන හෙයින් මෙතැනදී පඤ්චස්කන්ධ නිමිත්ත බාහිර යැයි දක්විණි.) ඒ ආර්‍ය මාර්ගය හා ගැටුණු විදර්ශනාව වුට්ඨානගාමිනී විපස්සනා නම්.

සංස්කාර ධර්මයන් විදර්ශනා කිරීම් සඳහා පිවිසීමත් ශිඛාප්‍රාප්ත විදර්ශනාව නිසා මාර්ගය සමග ගැටීමෙන් සිදුවන නැගී සිටීමත් යන ධර්ම දෙක පිළිබඳ විස්තර මෙසේ දතයුතුය.

"අජ්ඣත්තං අභිනිවිසිත්වා අජ්ඣත්තා වුට්ඨාති අජ්ඣත්තං අභිනිවිසිත්වා බහිද්ධා වුට්ඨාති, බහිද්ධා අභිනිවිසිත්වා බහිද්ධා වුට්ඨාති, බහිද්ධා අභිනිවිසිත්වා අජ්ඣත්තා වුට්ඨාති, රූපෙ අභිනිවිසිත්වා රූපා වුට්ඨාති, රූපෙ අභිනිවිසිත්වා අරූපා වුට්ඨාති, අරූපෙ අභිනිවිසිත්වා රූපා වුට්ඨාති, අරූපෙ අභිනිවිසිත්වා රූපා වුට්ඨාති එකප්පහාරෙන පඤ්චහි ඛන්ධෙහි වුට්ඨාති, අනිච්චතො අභිනිවිසිත්වා අනිච්චතො වුට්ඨාති, අනිච්චතො අභිනිවිසිත්වා දුක්ඛතො අනත්තතො වුට්ඨාති, දුක්ඛතො අභිනිවිසිත්වා දුක්ඛතො අනිච්චතො අනත්තතො වුට්ඨාති, අනත්තතො අභිනිවිසිත්වා අනත්තතො අනිච්චතො දුක්ඛතො වුට්ඨාති" - වි. ම.

මෙහි භාවාර්ථය, විස්තර කිරීමේදී පැහැදිලි වෙයි.

විස්තර: ඇතැම් විදර්ශකයෙක් පළමුකොට තමා පිළිබඳවූ සංස්කාර ධර්මයන්හි ත්‍රිලක්ෂණයට නැගීම් වශයෙන් පිවිස සංස්කාරයන් බලයි. එසේවී නමුත් මාර්ගය ලැබීම් වශයෙන් නැගීසිටීමක් නොවෙයි. මක්නිසාද? අනුන් පිළිබඳවූ සංස්කාර නොබැලූ හෙයිනි. මේ නිසා ඔහු විසින් ඒ සංස්කාර ධර්මයන් බැලිය යුතුමය. එසේම අනුපාදින්න අනින්ද්‍රිය බද්ධ සංස්කාරයනුදු බැලිය යුතු. හේ කලෙක තමා පිළිබඳ සංස්කාර ධර්ම අනිත්‍යාදී වශයෙන් බලයි. කලෙක බාහිර ධර්ම බලයි. මෙසේ බලමින් වෙසෙන කල්හි යම් විටෙක තමා පිළිබඳවූ සංස්කාර ධර්මයන් කෙරෙහි පිවිස එසින්ම නැගීසිටීම් වශයෙන් මාර්ගය හා ගැටුනේ නම් ඒ

ආධ්‍යාත්මයෙහි පිවිස ආධ්‍යාත්මයෙන් නැගී සිටියේ වෙයි. බාහිර ධර්මයන් මෙනෙහිකරන කල්හි නැගී සිටියේ නම් බාහිරයෙන් නැගීසිටියේ නම් වෙයි. මේ අයුරින් බාහිර වශයෙන් පිවිස බාහිර වශයෙන් නැගිටීම ආදී ක්‍රමයද දතයුතු.

ඇතැමෙක් පළමුකොට රූපයෙහි ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීම වශයෙන් පිවිසෙයි. (සෙසු තන්හිද මෙසේම අර්ථ ගතයුතු.) පිවිස භූත රූපයන් හා උපාදාය රූපයන්ද රාශියක් කොට බලයි. නමුත් හුදු රූප දැකීම පමණකින්ම නැගීම නොවෙයි. ඔහු විසින් අරූප ද දැකිය යුතු. ඒ නිසා ඒ රූප අරමුණුකොට උපන්නාවූ වේද නාදී නාමධර්මද සම්මර්ශනය කරයි. කලෙක රූපද කලෙක නාමද සම්මර්ශනය කරන කල්හි යම් විටෙක රූප සම්මර්ශන සමයේදී මාර්ග ව්‍යුත්ථානයවිණි නම ඒ රූපයෙහි පිවිස රූපයෙන් නැගී සිටියේ නම්වෙයි. අරූප සම්මර්ශන සමයේදී මාර්ග ව්‍යුත්ථානය විණි නම අරූපයෙන් නැගී සිටියේ වෙයි. සෙසු ක්‍රම ද මේ අනුව සලකා ගතයුතු.

“යං කිඤ්චි සමුදය ධම්මං සබ්බන්තං නිරෝධ ධම්මන්ති” යමකිසි උපදිනසුළු ධර්මයක් වෙයිද ඒ සියල්ල විනාශවන සුළු යයි මෙසේ උදය ව්‍යය වශයෙන් පිවිසි කල්හි මග්ගවුට්ඨානය විණිනම් එකවරම පඤ්චස්කන්ධයෙන් නැගී සිටියේ වෙයි. අනිච්චානුපස්සනාදියෙහි ක්‍රමය නම් ත්‍රිවිධ විදර්ශනායම මෙනෙහි කිරීම වශයෙන් පිවිසිය යුතුය. යමකින් මග්ගවුට්ඨානය විණි නම ඒ අනුසාරයෙන් නැගී සිටීම දතයුත්තය.

ඉහත දැක්වූ විදර්ශනා ඥානත් සමග මේ වුට්ඨාන ගාමිනී විපස්සනාව ප්‍රකටවීම සඳහා උපමා දොළොසක් දැක්වෙයි. එහි පළමුවැන්න වවුලීගේ උපමාවයි. ඒ මෙසේය. එක් වවුලියක් “මෙහි මලක් හෝ ගෙඩියක් හෝ ලබමි”යිසිතා අතු පසක් ඇති මී ගසෙක සැඟවී සිට, එක් එක් අත්තක මලක් හෝ ගෙඩියක් හෝ ඇද්දැ’යි විමසී. එහෙත් ඈට කිසිදු අත්තකින් මලක් හෝ ගෙඩියක් හෝ හමුවූයේ නැති. “අහෝ! මේ ගසෙහි ගෙඩි හෝ මල් හෝ නොමැතිය”යි සිතූ ඕ එහි ආශාව අතහැර, කෙළින් පිහිදි අත්තේ මුදුනට ගොස් අතු අතරින් අහස දෙස බලා ඉගිලී ගොස් වෙනත් ගෙඩි ඇති ගසෙක සැඟවූවාය. මෙහි වවුලී මෙනි. යෝගාවචරයා දතයුතු. අතු පසක් ඇති මීරුක මෙනි. පඤ්චස්කන්ධය. වවුලී අතු අතර සැඟවීම මෙනි. යෝගියා පඤ්චස්කන්ධයෙහි පිවිසීම, එක් එක් අත්තෙහි ගතයුතු දෙයක්

ආදීඩ නිමසුම මෙනි පිළිවෙලින් පඤ්චස්කන්ධය සම්මර්ශනය කිරීම. එනම් අනාත්ම නමුත් කිසිදු දෙයක් නොලැබීම නිසා එහි අපේක්ෂාව අත්හැරීමක් මෙනි යෝගියාගේ මුඤ්චිතුකම්‍යතාදී ඤාණ ත්‍රිකය. (මුඤ්චිතුකම්‍යතා, පටිසංඛාන, සංඛාරුපෙක්ඛා) වවුලාගේ, මුළු අත්හැර දැමීම මෙනි, යෝගියාගේ අනුලෝම ඤාණයට අනතුරුව, අහස දෙස බැලීම මෙනි ගෝත්‍රභූඤාණය. අහසට නැගීම මෙනි මාර්ගඤාණය වෙනත් ගසක වැසීම මෙනි ඵල ඤාණය.

## සෙසු උපමා

"වග්ගුලී කණ්හ සප්පොච - ඝරං ගොණ රක්ඛසො
ඛුදං පිපාසං සීතුණ්හං - අන්ධකාරං විසෙනචාති"

කෘෂ්ණ සර්පයා, ගේ, ගවයා, යක්ෂිනී, දරුවා, බඩගින්න පිපාසය, ශීත උෂ්ණය, අන්ධකාරය, විෂ යනුයි.

මේ උපමා දොළොස අතුරෙන් 'ඛුදං පිපාසං සීතුණ්හං අන්ධකාරං විසෙන'' යන සය වුට්ඨානගාමිනී විපස්සනායෙහි පිහිටියහුගේ ලෝකෝත්තර ධර්මයන්ට අභිමුඛකොට නැමීම සඳහා කියන ලද බව දතයුතුය ඒ එසේමය කුසගින්නෙන් පෙළුනු පුරුෂයා සෑම අවස්ථාවකදීම පතනුයේ ප්‍රණීතාහාරයකි. එසේම මේ යෝගියාද සංසාරවෘත්ත නමැති කුසගින්නෙන් පෙළෙන අමෘත රසය වූ කායගතාසතිය පතයි. සෙසු උපමාද මේ අනුව සලකා ගතයුතු.

මෙතෙකින් විස්තර කළ සංඛාරුපෙක්ඛා ඤාණය යෝගියාගේ පතිලීනචර භාවය නියමකොට, මත්තෙහි ආර්ය මාර්ගයාගේ ද බොජ්ඣඞ්ග මාර්ගාඞ්ග, ධ්‍යානාඞ්ග, පටිපදා, විමොක්ඛ විශෙෂ. නියම කරයි. මෙතෙකින් වුට්ඨානගාමිනී විපස්සනා කථා නිමි.

## අනුලෝම ඤාණය.

'තස්ස තං සංඛාරුපෙක්ඛාඤාණං ආසෙවන්තස්ස භාවෙන්තස්ස බහුලීකරොන්තස්ස අධිමොක්ඛසද්ධා බලවතරා හොති විරියං සුපග්ගහිතං, සති පච්චුපට්ඨිතා, චිත්තං සුසමාහිතං සඞ්ඛාරුපෙක්ඛාඤාණං තික්ඛතරං පවත්තති: තස්ස ඉදානි මග්ගො උප්පජ්ජිස්සතීති සංඛාරුපෙක්ඛාය සංඛාරෙ අනිච්චාති වා දුක්ඛාති වා සම්මසිත්වා භවඞ්ගං ඔතරති භවඞ්ගානන්තරං සංඛාරුපෙක්ඛාය කතනයෙනෙව සංඛාරෙ අනිච්චාති වා දුක්ඛා

තිමං අනත්තාති වා ආරම්මණං කුරුමානං උප්පජ්ජති, මනොද්වාරාවජ්ජනං තදනන්තරං තථෙව සංඛාරෙ ආරම්මණං කත්වාද්වෙ තීණි චත්තාරිවා ජවන චිත්තානි උප්පජ්ජන්ති තං සම්පයුත්තං ඤාණං අනුලොම ඤාණං"–ප. ම. අ. 17 පි.

ඒ සංස්කාරොපෙක්ෂා ඥානය ආසේවනය කළ බොහෝසේ වැඩූ යෝගාවචරයාගේ අධිමොක්ෂ ශ්‍රද්ධාව බලවත් වෙයි. (මෙය පෙර පැහැදිලි කෙරිණි,) වීර්‍ය්‍යය මනාසේ පරිග්‍රහ කරන ලද්දේ වෙයි. සිහිය මනාසේ එළඹ සිටියා වෙයි. සිත සමාහිතමය එසේම සංඛාරුපෙක්ඛා ඥානය තියුණු ලෙස පවතියි. එබඳු ඥානයක් ඇති යහුට "දැන් මාර්ගය උපදින්නේය"යි සංඛාරුපෙක්ඛා ඥාණයට අනුව සංස්කාරධර්ම අනිත්‍යාදී වශයෙන් සන්මර්ශනය කොට සිත භවඞ්ගයට බසියි. භවඞ්ගයට අනතුරුව සංඛාරුපෙක්ඛා ඥාණයට අනුව අනිත්‍යාදී වශයෙන් සන්මර්ශනය කළ ඒ සංස්කාර ධම්ම අරමුණු කරමින් මනොද්වාරාවර්ජනය උපදියි ඊට අනතුරුව එසේම සංස්කාරයන් අරමුණුකොට, දෙකක් හෝ තුනක් හෝ සතරක් හෝ ජවන් සිත් උපදියි. ඒ සමග යෙදුන නුවණ අනුලෝම ඥාන නම්.

ව්‍යුත්ථාන ගාමිනී විදර්ශනා සිත් ඉපිද, නැවත සිත භවඞ්ගයට පත්වූ පසු මාර්ග චිත්තවීථියේ පළමුකොට උපදින මනොද්වාරාවර්ජනය මෙහිලා ගතයුතුය. ඉක්බිති උපදින පරිකම්, උපචාර, අනුලෝම, යන ජවන් සිත් සමග යෙදුනු ඥානය අනුලෝම ඥානය බව මෙයින් කියවේ. සිත් සතරක්යැයි කීයේ ගොත්‍රභූ සිතත් රැගෙනය.

චිත්තවීථිය මෙසේය.

භ. භ. ම. ප. උ. අ. ගො. ම. ඵ. ඵ. භ.
ooo, ooo, ooo, ooo, ooo, oooo, ooo, ooo, ooo, ooo, ooo,

(සෙසු ඒවාද භවඞ්ගයි)

(බිංදු තුන චිත්තක්ෂණ දැක්වීම සඳහායි.)

"තං හි පුරිමානඤ්ච විපස්සනා ඤාණානං තථකිච්චතාය අනුලොමෙති, උපරි ච සච්චබ්බානං සත්තතිංසාය බොධිපක්ඛිය ධම්මානං අනුලොමෙති තස්මා අනුලොම ඤාණන්ති වුච්චති"

ඒ අනුලෝම ඥානය වනාහි පෙර විදර්ශනා ඥානයන්ට ඒ ඒ කෘත්‍යය සිදුකරන බැවින් අනුලෝමවේ. කෘත්‍යය නම් ලක්ෂණත්‍රය දැක්මයි. මතුයෙහිද පැවතිය යුතු සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ටද අනුලෝම වෙයි. (ධාර්මික රජෙකු මෙනි.) එහෙයින් අනුලෝම ඤාණයැයි කියනු ලැබේ. ධාර්මික රජෙක් නඩු අසන තැනක සිටියේ ව්‍යවහාරික මහාමාත්‍යයන් අටදෙනාගේ විනිසුරුම අසා, අගතිගමන හැර මැදහත්ව, මතුද පුරාණ රාජධර්මය දෙස බලා ඒ දෙතැනටම හැලපෙයි නම් "එසේ වියයුතුය"යි සිතමින් ඒ විනිශ්චයට අනුලෝම වෙයි. හැමෙයි සේයි. මෙහි විනිශ්චයකාර ඇමතියන් අටදෙනා මෙනි උදයව්‍යයාදී අෂ්ටමහාවිදර්ශනා ඥාන, පුරාණ රාජධර්මය මෙනි සත්තිස් බෝධිපාක්ෂික ධර්ම රජතුමා මෙනි අනුලෝමික ඤාණය නව මහා විදර්ශනා ඥානයන්හි අවශාන ඥානයවූ සච්චානුලෝමික ඤාණයද අනුලෝම ඤාණයමැයි.

අනුලෝමික ඤාණය වුට්ඨානගාමිනී විපස්සනාවේ අවසානයයි. හැම ලෙසින්ම විදර්ශනා ඥානයන්ගේ අවසානය ගෝත්‍රභූ ඤාණයයි කියුහුතු එහෙත් ගෝත්‍රභූ ඤාණය පටිපදාඤාණදස්සන විසුද්ධිය හෝ ඤාණදස්සන විසුද්ධිය හෝ භජනය නොකෙරෙයි. මක්නිසාද ආවර්ජන ස්ථානයෙහි සිටි බැවිනි. විදර්ශනාත් නොවේ මාර්ගත් නොවේ. එහෙත් ඒ දෙකට අතර සිටි නිසා විදර්ශනා සංඛ්‍යාවටම ඇතුලත්වෙයි. අනුලෝම ඥාණය තෙක් ආයේ ප්‍රතිපදා ඥානදර්ශන විශුද්ධියයි.

## ගෝත්‍රභූ ඤාණය

'බහිද්ධා වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභුඤාණං" බාහිර වූ සංස්කාර නිමිත්තෙන් නැගිටීමවූ පෙරළීමෙහි ප්‍රඥාව ගෝත්‍රභූඥාණ නම්. අසංඛත ධාතුව වූ නිර්වාණ ධර්මයෙන් පිටත පවතින හෙයින් සියලු සංස්කාර බාහිර නම්. පෙරලීම නම් ඒ සංස්කාර නිමිත්තෙන් සිත පෙරලීමයි නිර්වාණය කෙරෙහි නැමී පැවතීමය. මෙසේ සංස්කාර නිමිතිවලින් නැගිට නිර්වාණය වෙත නැමී පවතින ප්‍රඥාව ගෝත්‍රභූ ඥානයයි.

අනුලෝම ඥානය නැවත නැවත සේවනය කිරීමෙන් බොහෝ කොට වැඩීමෙන් ඒ විදර්ශකයාගේ සිත නිර්වාණ ධර්මය අරමුණු කරමින් පෘථග්ජන ගෝත්‍රයවූ පෘථග්ජන ගතිය මැඩ පවත්වා, ආර්‍ය ගෝත්‍රයවූ ආර්‍ය මාර්ගයට බැසගනිමින් පවතියි. එසේ

පවත්නාවූ සිත සමග යෙදුනු නුවණ ගොත්‍රභූ ඥානයයි. මෙම ඥානය ආර්‍ය්‍ය මාර්ගයට අනන්තර, සමනන්තර, ආසෙවන, උපනිස්සය, නත්ථි විගත, යන සයාකාර ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වෙයි (පට්ඨාන විස්තරය බලන්න.) මෙ විදර්ශනා වශයෙන් උපදිනා ගොත්‍රභූඥානයයි සමථ වශයෙන් උපදිනුයේ කාමාවචර ගොත්‍රය මැඩ පවත්වයි මහත්ගත ගොත්‍රය දියුණු කරයි නැත හොත් එයට බැසගනීයි. මේ වශයෙනී.

"කථං බහිද්ධා වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභූ ඤාණං? උප්පාදං අභිභුය්‍යතීති ගොත්‍රභූ - පෙ - උපායාසං අභිභුය්‍යතීති ගොත්‍රභූ බහිද්ධා සංඛාර නිමිත්තං අභිභුය්‍යතීති ගොත්‍රභූ, අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ අප්පවත්තං - පෙ - අනුපායාස නිරොධං නිබ්බාණං පක්ඛන්දතීති ගොත්‍රභූ උප්පාදං අභිභුය්‍යිත්වා අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූති සබ්බං විත්ථාරේතබ්බං."

බාහිරවූ සංස්කාර නිමිත්තෙන් නැගිටීමෙහි හා පෙරළීමෙහි නුවණ ගොත්‍රභූ ඥානය වන්නේ කෙසේද? ඉපදීම මැඩ පවත්වයි නුයි ගොත්‍රභූ නම්. මෙසේ විදර්ශනාවට අරමුණුවූ සියලු ධර්ම යොදා ඒ හැම මඩීනුයි ගොත්‍රභූ යනුවෙන් තේරුම් ගතයුතු. එසේම අනුප්පාද-නො ඉපදීම-සංඛ්‍යාත නිර්වාණයට වදීනුයි පිවිසේනුයි ගොත්‍රභූ නම්. නිර්වාණයට පර්‍ය්‍යාය නාමවූ අප්‍රවෘත්තාදී ධර්මද ගෙන ගොත්‍රභූ ඥානය තේරුම් ගතයුත්තූ.

මෙහි ආ "අභිභුය්‍යතී - මඩියි" යනු ඉහත දක්වූ "වුට්ඨාන-නැගිටීම" හා සම්බන්ධය. අනිත්‍යාදි වශයෙන් සංස්කාර ධර්මයන්ගේ ස්වභාවය දැක, ඒවාට කලකිරී, එයින් නික්මෙනු කැමතිව සිටි කල්හි බාහිර සංස්කාර නිමිත්තෙන් නැගිටීමා නම වෙයි. ඒ නැගිටීම නිසාම නිත්‍යාදි වශයෙන් ගත් පෘථග්ජන ගතිය මැඩ පවතිමින් සිටි කල්හි පෘථග්ජන ගොත්‍රය අභිභවනය කළා වෙයි. දෙවැනිව දක්වූ "පක්ඛන්දති - වදී, පිවිසේ" යනු විවට්ටනෙ - පෙරළීමෙහි' යන්න හා සම්බන්ධය. ඒ සංස්කාර නිමිති කෙරෙහි දුව වූ සිත එයින් මෑතට ගෙන අසංඛත ධාතුව කෙරෙහි යොමු කිරීම වශයෙන් පිවිසෙයි. ඒ නිසාම පෙරළීම සිදුවේ මේ අවස්ථාව පැහැදිලිවීම සඳහා උපමාවකි. විශාල ඇළක් හරහා පැන යාන් සිටිනු කැමති එක් පුරුෂයෙක් වේගයෙන් දුවවිත් ඇළේ මෙගොඩ ඇති ගසෙක ලනුවක් බැඳ. එය අතින් ගෙන එගොඩට නැමුණු සිරුර ඇතිවී, ඇළ හරහා පනියි. එසේ පැන ලනුව අත

හැර වෙවුලමින් සෙමෙන් පොළොවෙහි සිටියි. විදර්ශකයා ද භවයෝනිගති ආදියෙන් එතෙර වූ නිර්වාණය ලබනු පිණිස උදය ව්‍යයාදී අෂ්ටමහා විදර්ශනා ඥාන මස්සේ දුව අවුත් තම ආත්ම භාවයෙහි රැඳුනා වූ රූපාදී ස්කන්ධ පඤ්චකය නමැති රුහැන, අනිත්‍යාදී වශයෙන් පැවති අනුලෝම ඥාණ හස්තයෙන් ගෙන එය නොමුදමම අනුලෝම ඥාණයේ දෙවැනි අවස්ථාවට අනුව නිර්වාණයට නැඹුරුව තුන්වැනි අවස්ථාවෙන් පරතෙරට පැමිණියහු මෙන් "දැන් පැමිණියහු නිර්වාණයට ලංවිය" යි සැලකෙන අවස්ථාවට පැමිණි කල්හි, ඒ සිතෙහි නිරෝධයෙන් පසු සංස්කාරාරම්මණයන් හැර ගොත්‍ර භූ චිත්තයෙන් නිස්සඞ්ඛාර වූ නිර්වාණ නමැති පරතෙරට පනියි. ඉක්බිති එක් අරමුණෙක්හි ආසේවනය නො ලද බැවින් වෙවුලන්නා වූ පුරුෂයා මෙන් මනා පිහිටීමක් නැතිව ගොස් මාර්ග ඥානය උපදෙනවත් සමගම මනාවේ පිහිටියේ නම් වෙයි.

(සැලකිය යුතු.- අනුලෝම ඥාණයේ ප්‍රථම අවස්ථාව මාර්ග චිත්ත වීථියේ වූ පරිකර්මයි. දෙවැන්න උපචාරයි. තුන්වැන්න අනුලෝමයි. මේ සිත් තුනම අනුලෝම නම්)

සඞ්ඛාරුපෙක්ඛා ඥාණය සේ ම ගොත්‍ර භූ ඥාණය ද සමථ වශයෙන් අට අයුරකින්ද විදර්ශනා වශයෙන් දස අයුරකින්ද උප දියි. එහිදී මැදහත් වීම ඉදිරිපත් වන අතර මෙහිදී මැඩ පැවැත් වීම ඉදිරිපත් වෙයි. වෙනස මෙපමණෙකි. මෙසේ සමථ-විපස්සනා දෙයාකාරයටම පවත්නා වූ අටලොස් ආකාර ප්‍රඥව යමෙකු විසින් පුරුදු කරන ලද්දී ද, සංස්කාර ධර්මයන්ගෙන් නැගී සිටීමෙහින් නිවණට පෙරළීමෙහින් දක්ෂ වූ ඒ පුද්ගලයා නොයෙක් මිථ්‍යා දෘෂ්ටීන්ගෙන් කම්පා නොවෙයි. එ නිසා ගොත්‍රභූ ඥාණය දැනීම අර්ථයෙන් ඥාණ නම්. හාත්පසින් දැනීම අර්ථයෙන් ප්‍රඥයි.

ගොත්‍රභූ ඥාණය නිමි.

## 11. මග්ග ඥාණය

සප්තම වූ ඥානදර්ශන විශුද්ධිය යනු සෝවාන් ආදී සතර මාර්ගයන්හි යෙදුනු ඥානයයි. "සොතාපත්ති මග්ගො සකදාගාමි මග්ගො අනාගාමි මග්ගො අරහත්ත මග්ගොති ඉමෙසු චතුසු මග්ගෙසු ඤාණං ඤාණදස්සන විසුද්ධි නාම" මේ පාඨයෙන් එය පැහැදිලි වෙයි.

මාර්ග ඥානය සිවු වැදෑරුම්ය. සෝතාපත්ති මග්ග ඥානය, සකදාගාමිමග්ග ඥානය, අනාගාමි මග්ග ඥානය අරහත්ත මග්ග ඥානය යනුයි. ප්‍රථමයෙන් ගෝත්‍රභූ චිත්තය ලත් යෝගාවචරයාගේ එම චිත්ත වීථියෙහිම ඊළඟ චිත්තක්ෂණය සෝවාන් මාර්ගයයි. ඒ හා යෙදුනු ඥානය සෝතාපත්ති මග්ග ඥානය නම්. සෝතා + ආපත්ති = සෝතාපත්ති. මෙහි "සෝත" යනු සැඩ ජල පහරට නමකි. "ආපත්ති" නම් පැමිණීමයි. සැඩ ජල පහරට පැමිණීම යන තේරුම ඇතත් මෙහිලා සලකනුයේ එය උපමාවට තබා, උපමේය වශයෙන් එන තේරුමයි. එනම් සෝත යනු ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට නමකි. සැඩ ජල පහරට හසු වූ දෑ, මග නොරඳා මහසමුද්‍රටම ගසාගෙන යන්නේ යම්සේ ද, එමෙන් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට පැමිණි ආර්ය ශ්‍රාවකයා ද මාර්ග පරිහානියකට නොපැමිණ කෙළින්ම නිර්වාණය කරාම දිවෙයි. එහෙයින් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය සැඩ ජල පහරට සමානය. එයට ප්‍රථමයෙන් පැමිණීම සෝතාපත්ති නම්.

"තත්ථ පඨම මග්ගඤාණං තාව සම්පාදෙතුකාමෙන අඤ්ඤං කිඤ්චි කාතබ්බං නාම නත්ථි. යං හිනෙන කාතබ්බං සියා තං අනුලොමාවසානං විපස්සනං උප්පාදෙන්තෙන කතමෙව"

ඒ සතර මාර්ග අතුරෙන් පළමු කොට ප්‍රථම මාර්ග ඥානය සම්පාදනය කිරීමට කැමැත්තහු විසින් කළයුතු අනික් දෙයක් නොමැත. ඒ සියල්ල අනුලෝම ඥානය අවසානය කොට විදර්ශනාව උපදවන්නහු විසින් කළයුත්තමය. මෙසේ හෙයින් සෝවාන් මාර්ග ඥාන ප්‍රතිලාභය සඳහා දක්විය යුතු ප්‍රතිපදා මාර්ගය අනුලෝම ඥානය තෙක්ම කියවුණා.

දුඃඛාදි ආර්ය සත්‍ය ධර්ම ප්‍රතිච්ඡාදක - වසන - මෝහය මුල් කොට ඇති, ප්‍රථම මාර්ග ඥානයෙන් ප්‍රහාණය කළයුතු කෙලෙස් සමූහය අනුලෝම ඥානයෙහි දී තදඞ්ග වශයෙන් ප්‍රහාණය වෙයි. එහෙත් එම ඥානයට නිර්වාණ අරමුණු නො වේ. ගෝත්‍රභූ ඥානයෙන් නිර්වාණය අරමුණු කරත එහෙත් කෙලෙස් ප්‍රහාණය කිරීමට නොහැක. මග්ග ඥානය උපදින්නම සමුච්ඡේද වශයෙන්ම ප්‍රහාණය වෙයි. නිර්වාණය ද අරමුණු වෙයි.

සකෘදාගාමි මග්ග ඥානය.

"...පටිසන්ධි වසෙන සකිංදෙව ඉමං මනුස්ස ලොකං ආගච්ඡතීති සකදාගාමි, තස්ස මග්ගො සකදාගාමි මග්ගො" පිළිසිඳ ගැනීම් වශයෙන් එක් වරක් පමණක් මේ මිනිස් ලොවට එනුයේ

සකෘදාගාමී නම්. ඔහුගේ මාර්ග චිත්තය සකෘදාගාමි මග්ගයි. ඒ මාර්ග චිත්තය හා යෙදුනු නුවණ සකෘදාගාමි මග්ග ඥාණ නම්. මෙය දෙවෙනි ආර්‍ය්‍ය මාර්ග ඥාණයයි. එය උපදවනුයේ මෙසේය. සෝවාන් ඵලයට පත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා එම අසුනෙහි හිඳගෙනම හෝ අන් කලෙක හෝ කාමරාග, පටිඝ, සංයෝජන ධර්මයන් තුනී කරගනු කැමැත්තෙන් නැවතත් සංස්කාර ධර්ම අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරයි. ඉහත දක්වූ සේම ඒ පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ වෙනුවට වොදාන, යන මාර්ග චිත්තවීථියේ ගමන් කෙරෙන චිත්තක්ෂණයින්ට පැමිණ, කාමරාග, පටිඝ දෙක අනුලෝම ඥාණයෙන් තුනී වන හෙයින් දුඃඛාදි ආර්‍ය්‍ය සත්‍ය ධර්ම අවබෝධ කර ගනිමින් සම්මාදිට්ඨි අංගී මාර්ගාංගයන්ට එකවරටම පැමිණෙයි. එසේ පැමිණීම සකෘදාගාමි මග්ගයයි. මෙය ලබත්ම දෙවැනි වරට නිර්වාණය අවබෝධ කරගත්තේ වෙයි. ඒ හා යෙදුනු නුවණ සකෘදාගාමි මග්ග ඥාණ නම්.

## අනාගාමි මග්ග ඤාණය.

"පටිසන්ධි වසෙන කාමභවං න ආගච්ඡතීති අනාගාමි තස්ස මග්ගො අනාගාමි මග්ගො, තෙන සම්පයුත්තං ඤාණං අනාගාමි මග්ග ඤාණං"

ප්‍රතිසන්ධි වශයෙන් කාමභවයට නො එනුයේ අනාගාමී ඔහුගේ මාර්ග චිත්තය අනාගාමි මග්ගයි. ඒ හා යෙදුනු නුවණ අනාගාමි මග්ග ඥාණයයි. මෙයද උපදවනුයේ පෙර මෙනි. සකෘදාගාමි මාර්ගයෙන් තුනී කළ කාමරාග, පටිඝ, සංයෝජන දෙක මෙහිදී සම්පූර්ණයෙන් ප්‍රහාණය වේ.

## අරහත්ත මග්ග ඤාණය.

කිලෙසාරීනං හතත්තාදිනා අරහං අග්ගමග්ගට්ඨො, තස්සභාවො අරහත්තං, සො එව මග්ගො, තෙන සම්පයුත්තං ඤාණං අරහත්තමග්ග ඤාණං" කෙලෙස් සතුරන් නැසූ බැවින් පූජාදී ගුණයන්ගෙන් යුක්ත වූයේ අරහ නම්. එනම් අග්‍ර වූ මාර්ගයට පත් උතුමායි. ඔහුගේ ස්වභාවය අරහත්තයි. රහත් බවයි. ඒ අර්හත් භාවයම මාර්ගය වේනුයි අරහත්තමග්ග නම්. ඒ හා යෙදුනු නුවණ අරහත්තමග්ග ඥාණයයි. අනාගාමි ඵලය ලත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා තමා තුළ ඇති රූපරාගාදී සංයෝජන ධර්ම විනාශ කර හැරීම් පිණිස නැවත විදර්ශනා කරයි. ඉක්බිති පරිකර්මාදී චිත්තක්ෂණයන්ගෙන් පසු වොදාන චිත්තක්ෂණය

ලඟට අර්හත් මාර්ගය ඉපදීම් වශයෙන් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට පැමිණෙයි. එවිට රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා, යන සංයෝජන ධර්‍ම පසම ප්‍රහාණය වෙයි. මෙතෙකින් ආර්‍ය්‍ය සත්‍යාවබෝධය සම්පූර්‍ණ කළේ වෙයි. සියලු කෙලෙස් මුලින්ම බිඳ වැටේ. සසර ගමන අවසානයි.

මෙසේ අවසථා සතරකදී උපදින මාර්‍ග ඥාන කෘත්‍යය වශයෙන් ද, ජාති වශයෙන්ද, සලකා එක් ඥානයක් ලෙස විස්තර කෙරේ. මෙතැන් සිට පටිසම්භිදාමග්ගයෙහි දක්වෙන ක්‍රමයෙන් මග්ග ඤාණය දක්වනු ලැබේ.

## මග්ග ඤාණය.

"දුභතො වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා මග්ග ඤාණං" දෙයාකාරයකින් නැගී සිටීමෙහි හා පෙරලීමෙහි ප්‍රඥාව මග්ග ඤාණ නම්. කෙලෙස් සහමුලින්ම සිඳ දමන බැවින් ඒ කෙලෙස් වලින් හා ඒවාට නැමුණා වූ ස්කන්ධයන්ගෙන් ද, නිර්‍වාණය අරමුණු කරන බැවින් බාහිර වූ සියලු සංස්කාර නිමිති වලින් ද, යන මේ දෙයාකාරයෙන් නැගිට පෙරලෙයි. එහෙයින් ඒ දෙතැන යෙදුනු නුවණ "වුට්ඨාන විවට්ටන" ප්‍රඥා නම්. "චත්තාරි මග්ග ඤාණානි අනිමිත්තාරම්මණත්තා නිමිත්තතො වුට්ඨහන්ති, සමුදයස්ස සමුච්ඡින්දනතො පවත්තා වුට්ඨහන්තීති දුභතො වුට්ඨානි හොන්ති" යනු දේශනා පාඨයි. සතර මාර්‍ග ඥානයෝ අනිමිත්ත වූ නිර්‍වාණය අරමුණු කරන බැවින් සංස්කාර නිමිති වලින් නැගිටිත්. සමුදයාගේ සමුච්ඡේද ප්‍රහාණය කරන බැවින් පැවැත්මෙන් නැගිටිත්. මේ කරුණු දෙකෙන් නැගිටීම වෙයි. මෙයිනුදු පැහැදිලි කළේ ඒ දෙයාකාර නැගී සිටීම හා පෙරලීමයි. පෙරලීම ගොත්‍රභූ ඤාණයේදී විස්තර කෙරිණ· ඉක්බිති මග්ග ඤාණය පැහැදිලි කෙරේ. "මග්ගඤාණන්ති නිබ්බානං මග්ගති පෙක්ඛති නිබ්බානත්ථිකෙහි වා මග්ගියති අන්වෙසියති කිලෙසෙ වා මාරෙන්තො ගච්ඡති පවත්තතීති මග්ගො, තස්මිං මග්ගෙ ඤාණං" මාර්ගයෙහි ඤාණය යනු නිර්‍වාණය සොයයි. බලයි. නැතහොත් නිර්‍වාණය කැමැත්තහු විසින් සොයනු ලැබෙනුයි හෝ කෙලෙස් මරමින් යේනුයි හෝ මාර්ග නම්. එහි නුවණය. මෙයින් "මග්ග" යන්නට අදහස් දෙකක් පැවසිණි සෙවීම, මැරීම, යනුයි, සොයනුයේ නිර්‍වාණයයි. මරනුයේ ක්ලේශකර ධර්‍මයි. මේ දෙකම ආර්‍ය්‍ය මාර්ගයේදී සිදුවන බැවින් ඒ ආ යෙදුනු නුවණ මාර්ග ඥානය බව දතයුතු.

කෙසේ නම් දෙයාකාරයෙකින් නැගිටින්නාවූත් පෙරළෙන්නාවූත් ප්‍රඥව මාර්ග ඥාන නම් වේද? ශ්‍රොතාපත්ති මාර්ගක්‍ෂණයේදී දැකීම් අර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය, මිථ්‍යාදෘෂ්ටියෙන් නැගිටියි. ඒ මිථ්‍යාදෘෂ්ටියට අනුව පවත්නා වූ ක්ලේශයන්ගෙන් ද, ස්කන්ධයන්ගෙන් ද නැගිටියි. බාහිර වූ සියලු සංස්කාර නිමිති කෙරෙන් ද නැගිටියි, එහෙයින් දෙයාකාරයෙකින් නැගිටින්නාවූත් පෙරළෙන්නාවූත් ප්‍රඥව මාර්ග ඥාන නමි;'' ප. ම. (සිං. ප)

මෙ නයින් මාර්ග ඥානය පිළිබඳ විස්තරයක් පටිසම්භිදාමග්ගයෙහි දක්වේ. එහි සාරාංශය කෙටි අදහස - මෙසේ දැක්විය හැකිය. සතර මාර්ගක්‍ෂණයන්හිදී සම්මා දිට්ඨි ආදී මාර්ගාඞ්ග අට නිසා, ඊට විරුද්ධ ධම් වූ මිච්ඡාදිට්ඨි ආදී ධර්ම අට ද ඒ අටට අනුව පවත්නා වූ කෙලෙස් ද, ස්කන්ධයන් ද, යන මෙතෙක් ධම් යන්ගෙන් නැගිටීමත් පෙරළීමත් සිදුවේ. ඒ කෙලෙස් අමුනයෙහි ඒ ඒ මාර්ගයන්ගෙන් ප්‍රහාණය කටයුතු සක්කායදිට්ඨි ආදී සංයෝජනයෝ ද වෙත්. යනුයි.

මෙසේ දෙයාකාරයෙකින් නැගිටින්නාවූත් අවසථාවෙහි හෙදෙන ප්‍රඥාව මග්ග ඤාණයයි.

ඉක්බිති මාර්ග ඥානයෙහි ඇත්තා වූ මහානුභාව හතිය අවබෝධ කර ගැනීමට, මේ සමගම දතයුතු ධර්ම මෙහිලා විස්තර කෙරේ. බෝධිපාක්‍ෂික ධර්ම, ව්‍යුත්ථාන බල යොග, ක්ලෙශ ප්‍රහාණාදීහුය,

## බොධිපාක්‍ෂික ධර්ම

සතර සතිපට්ඨාන, සතර සම්‍යග් ප්‍රධාන, සතර සෘද්ධිපාද, පඤ්ච ඉන්ද්‍රිය, පඤ්ච බල, සත්ත බොජ්ඣඞ්ග, අට්ඨ මග්ගඞ්ග, යනුයි මොවුහු ආය්‍යී මාර්ගයට පාක්‍ෂික - අයත් - වූහෙයි නුයි බෝධිපාක්‍ෂික නම් වෙත්. සියල්ල තිස් හතෙකි. සූතමය ඥාණ විස්තරයේ දී මෙ ධර්ම පැහැදිලි කෙරිණි. කාය, වෙදනා, චිත්ත, ධම්ම, යන අනුපස්සනාවෝ සතිපට්ඨාන නම් වෙත්. නූපන් අකුසල් නූපදීම වශයෙන් යොදන වීය්‍යීය යනාදී වශයෙන් අවස්ථා සතරකදී වීය්‍යීය චෛතසිකය ඉදිරිපත් වීම නිසා සම්‍යක් ප්‍රධාන සතරක් විය. ප්‍රධානාර්ථයෙන් හා බලාර්ථයෙන් ශ්‍රද්ධාදී ධර්ම පඤ්චකයක් ඉන්ද්‍රිය, බල, විය, සතර මාර්ග ඥානයන්ට අවයවවීම් අර්ථයෙන් සත් ආදී ධර්ම සතක් බොජ්ඣඞ්ග නමි. ඒ මාර්ග ඥානයන්ටම අඞ්ග වූ සම්මා දිට්ඨි ආදීහු මාර්ගාඞ්ගයෝය. මෙසේ බෝධිපාක්‍ෂික ධර්ම සත්තිස මාර්ග ඥානයේ දී සම්පූර්ණ වේ,

## වුට්ඨාන බල සමායෝගය.

වුට්ඨාන ඉහතදී දැක්විණ. බල නම් සමථ බල හා විපස්සනා බලයයි. විදර්ශකයා සමථයානික වුවත් විදර්ශනායානික වුවත් ආර්ය මාර්ගක්ෂණයෙහිදී ඒ දෙක අන්‍යෝන්‍ය සම්බන්ධ ඇතිවම යෙදේ. එහෙයින් මාර්ග ඥානය බල සමායෝගයෙන්ද යුක්තය. "උද්ධච්ච සහගත කිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධ ගොචරො, අවිජ්ජා සහගත කිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨහතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධ ගොචරා, ඉති වුට්ඨානට්ඨෙන සමථ විපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තෙන වුච්චති වුට්ඨානට්ඨෙන සමථ විපස්සනං යුගනද්ධං භාවෙතීති" - ප. ම. (යුගනද්ධකථා) උද්ධච්චය මුල් කොට ඇති කෙලෙසුන්ගෙන්ද, ස්කන්ධයන්ගෙන්ද නැගිටින බැවින් සිතෙහි එකඟතාවූ නොවිසුරුණු සමාධිය නිරොධ සංඛ්‍යාත නිර්වාණය අරමුණු කරයි. අවිද්‍යාව මුල්කොට ඇති කෙලෙසුන් කෙරෙන්ද, ස්කන්ධයන්ගෙන්ද නැගිටින බැවින් අනුව බලන තේරුමින් යුත් විදර්ශනාව නිර්වාණය අරමුණු කරයි මෙසේ නැගිටීම යන තේරුමින් සමථ - විදසුන් දෙක එකම වැඩ-කෘත්‍ය ඇත්තෝ වෙත්. සමානව සිටිත්. ඔවුනොවුන් නො ඉක්මවත්. එහෙයින් නැගිටීම් අර්ථයෙන් සමථ - විදසුන් සමානයන් වඩයි යනුවෙන් කියනු ලැබේ. මෙසේ මාර්ග ඥානය වුට්ඨානබල සමායෝගයෙන් යුක්තය.

## ප්‍රහාණයවන කෙලෙස්සමුදය:

සංයෝජන, ක්ලේශ, මච්ඡරිය. විපල්ලාස, ග්‍රන්ථ අගති, ආසව, ඔඝ යොග. නීවරණ, පරාමාස, උපාදාන, අනුසය, මල, අකුසල, කර්මපථ, අකුසල චිත්තුප්පාද යන මොව්හු ඒ ඒ මාර්ග ඥානයන්හිදී යෙදෙන යෙදෙන පරිද්දෙන් ප්‍රහාණය කරනු ලැබෙත්.

සංයෝජන දසයෙකි. සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ, රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යනුයි. භවයෙන් භවය ඉපදීම් වශයෙන් යොදවන නිසා මොව්හු සංයෝජන නම් වෙත්. පඤ්චස්කන්ධය පිළිබඳ නිත්‍ය සුභ ආදී වශයෙන් ඉදිරිපත් වන වැරදි දැකීම සක්කාය දිට්ඨියයි. ශාසනයෙන් බැහැර, පාරිශුද්ධත්වය සඳහා වැරදි ශීල, ව්‍රත,

පිළිගැනීම් වශයෙන් අල්ලාගැනීම සීලබ්බතපරාමාස නම්. බුද්ධාදී අවතැන හැකය විචිකිච්ඡාවයි. කාමවස්තූන් කෙරෙහි හෝ එකොළොස් වැදෑරුම් කාමලෝකයන් කෙරෙහි හෝ ඇලීම කාමරාග නම්. අරමුණෙහි විරුද්ධභාවයෙන් ගැප්පීම නැතහොත් ඒ නොඉවසීම පටිඝයි රූපරාග යනු රූප ලෝක කෙරෙහි ඇල්මයි. අරූප ලෝකයන් කෙරෙහි ඇල්ම අරූපරාගයි. නැතහොත් රූපාරූපාධ්‍යානයන් කෙරෙහි ඇල්ම හෝ රූපරාගී, අරූපරාගයි කෙසේ හෝ තමා මැනගැනීම් වශයෙන් උපදින ගතිය මානයයි. උද්ධච්ච යනු විසුරුණු බවයි. දුඃඛාදී ආර්‍ය සත්‍යය වසා සිටි මෝහය අවිජ්ජා නම්.

ක්ලේශ දශයෙකි. ලෝභ, ද්වේෂ, මෝහ මාන, දිට්ඨි විචිකිච්ඡා, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යනුයි. මෙමේත් එක්ව යෙදුනු ධර්මත් කිළුටුකරන හෙයින් මොවුහු කෙලෙස් නම් වෙත්. මිච්ඡත්ත, සුත්තමය ඥාණයෙහි දක්වා ඇත. එද දස යෙකි. ලෝක ධර්ම අටෙකි. ලාභ, අලාභ, යස, අයස, ප්‍රසංසා නින්ද, සුඛ, දුක්ඛ යනුයි. මෙවා තේරුම ගැනීම පහසුයි.

මච්ඡරිය පසෙකි. ආවාස, කුල, ලාභ, ධම්ම, වණ්ණ යනුයි එහි ආවාස මච්ඡරිය යනු තමා සිටිනා ගෘහාදිය කෙරෙහි උපදින මසුරු ගතියයි. එනම් අනුන් හා සාධාරණවීම නොඉවසීමයි ධම්ම යනු කරුණා, මෛත්‍රී ආදී ගුණයෝයි. වණ්ණ පැහැයයි. සිරුරේ ඇති ඔප ගතියයි. මේවා අනුන් හා සමවීමට නොකැමති බව හැඟවීම් වශයෙන් උපදින සඟවන ගතිය මච්ඡරිය නම්.

විපල්ලාස තුනෙකි. සඤ්ඤා, චිත්ත, දිට්ඨි යනුයි. අනිත්‍ය දුඃඛ අනාත්ම, අශුභ වස්තූන් කෙරෙහි පවතින නිත්‍ය, සුඛ, ආත්ම, සුභ යන හැඟීම්, සිත්, දැකීම්, විපල්ලාස-පෙරළීම වශයෙන් එත්. ග්‍රන්ථ සතරෙකි. අභිජ්ඣා, ව්‍යාපාද, සීලබ්බත පරාමාස, ඉදං සච්චාභිනිවෙස යනුයි. මෙහි අභිජ්ඣා යනු විෂම ලෝභයයි තමා විසින් ඉදිරිපත් කරනදෑම සත්‍යයැයි ගැනීම වශයෙන් පවතින වැරදි සැලකීම ඉදං සච්චාභිනිවෙස නම්. මේ ධර්ම සතර දුක්වෙනුයේ කාය ග්‍රන්ථ නමිනි. කාය ශබ්දයෙන් යෙන් කියවෙන රූප කාය හා නාම කායද අතීතාදී කාලත්‍රයට අයත් කායද ගැටගසන හෙයින් මේ නාමය යෙදුණ. මරදෙහි හෝ නිවරදෙහි හෝ හොඳ නරක නොබලා, තමාගේ

ලාභය පිණිස හෝ කීර්ති ආදී දෙයක් පිණිස හෝ සලකා අන්‍යයකුට ගොස් කටයුතු කිරීමය යන අදහස් ඇති ධර්ම අගති නම්. ඔව්හු සතරෙකි. ඡන්ද, දෝස, මෝහ, භය යනුයි. ආර්යයන් විසින් නො යා යුතු හෙයින්ද අගති නම්

ආශ්‍රවයෝ සතර දෙනෙකි. කාම, භව, දිට්ඨි, අවිජ්ජායි. මොව්හු එක් චිත්තසන්තානයක බොහෝ කල් සිට පැවත එන හෙයින්ද චක්ෂුරාදී ද්වාරයන්ගෙන් වැගිරෙන හෙයින්ද, සසර දුක ගෙනදෙන හෙයින්ද, ගොත්‍රභූ චිත්තය තෙක් හා භවාග්‍රය තෙක්ද දුවන හෙයින් නැතහොත් ගලා යන හෙයින්ද,යන මෙතෙක් තේරුම් නිසා ආශ්‍රවයෝ නම් වෙත් මේ සතරදෙනම සැඩ ජල පහර කට උපමා ඇති හෙයින් ඕඝ නම් වෙත්. මොවුනට හසුවූවෝ සසර නමැති මුහුදටම ගසා යෙත්. සත්වයා භව යන්ත්‍රයෙහි යොදවන නිසා මොව්හුම යෝගනම් වෙත්. නිවරණයෝ සූත්‍ර පරියායෙහි පස් දෙනෙකි; අභිධම්ම පර්‍යායෙන් සදෙනෙකි. නිවණ, ධ්‍යාන, කුශල්, මේ ආදිය වසා දමන නිසා නීවරණ නමින් හැඳින්වෙත් ඔව්හු නම් කාමච්ඡන්ද, ව්‍යාපාද; ථිනමිද්ධ. විචිකිච්ඡා, උද්ධච්චකුක්කුච්ච යනුයි. පරාමාසයනු අනිත්‍යාදී ඇති සැටිය නොගෙන, නිත්‍යාදී නැති අයුරක්ම දැඩි ලෙස ගැනීමයි. පර ශබ්දයෙන් අනාවූ නිත්‍යාදිය කියවේ. ආමාස යනු ගැන්මයි. පරාමාස වශයෙන් එනුයේ මිථ්‍යාදෘෂ්ටියයි.

උපාදාන සතරෙකි. කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද යනුයි. විසි වැදෑරුම් සක්කාය දිට්ඨියම අත්තවාද නම්. අනුශය කියන ලදී. මල තුනෙකි. ලෝභ, දෝස, මෝහයි. කිළුටු කිරීම් අර්ථයෙන් මල නම් අකුශල කම්පථ දශයෙකි. පාණාතිපාත, අදින්නාදාන, කාමමිච්ඡාචාර, මුසාවාද; පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාපා අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡාදිට්ඨි යනුයි. මේ දසය සිතීම්, ප්‍රයෝග කිරීම් ආදිය නිසා කම්වේ. වරද සම්පූර්ණ වීමෙන් කම්පථ බවට පත්වේ. පථ නම් මාර්ගයයි. මෙය දුර්ගතියටම මාර්ග වෙයි.

අකුසල චිත්තුප්පාද දොළොසෙකි. එහි ලෝභ මූලික අටෙකි. දෝස මූලික දෙකකි. මෝහ මූලික දෙකකි පඤ්චස්කන්ධ විස්තරය බලන්න. මේ ඒ කෙලෙස් සමුදායයි.

## සෝවාන් මාර්ග ඥානයෙන් ප්‍රහාණය වන කෙලෙස්

සංයෝජන ධර්ම තුනෙකි. සක්කායදිට්ඨි, සීලබ්බතපරාමාස විචිකිච්ඡා,යි කිලෙස දෙකකි. දිට්ඨි, විචිකිච්ඡා, මිච්ඡත්ත සතු

රති. දිට්ඨි, මුසාවාද, මිච්ඡාකම්මන්ත, මිච්ඡා ආජීව යනුයි. චත්තාරිය විපර්‍යාස අතුරෙන් නිත්‍ය-ආත්ම වශයෙන්වූ සඤ්ඤා, චිත්ත, දිට්ඨිද, සුභ සුඛ වශයෙන් වූ දිට්ඨියද වෙයි. ග්‍රන්ථ අතුරෙන් සීලබ්බතපරාමාස, ඉදං සච්චාභිනිවෙස යන දෙකයි. සතර අගති දිට්ඨාසව විචිකිච්ඡා නීවරණය, මිච්ඡාදිට්ඨි පරාමාසය උපාදාන අතුරෙන් කාම හැර ඉතිරි තුන අනුසය අතුරෙන් දිට්ඨි, විචිකිච්ඡා, අකුශල කර්මපථ අතුරෙන් පාණාතිපාත, අදත්තාදාන, මිච්ඡාචාර, මුසාවාද මිච්ඡාදිට්ඨි යනුයි.

සකෘදාගාමි මාර්ගයෙන් ඖදාරිකවූ - ගොරෝසු - කාමරාග පටිඝ, සංයෝජන දෙක පමණි ප්‍රහාණය වනුයේ.

අනාගාමි මාර්ගයෙන් ප්‍රහාණය වන කෙලෙස්:- කාමරාග, පටිඝ දෙක. දොස මිච්ඡත්ත අතුරෙන් මිච්ඡාසංකප්ප, පිසුණා වාච යන තුනයි. විපර්‍යාස අතුරෙන් සුභ වශයෙන්වූ සඤ්ඤා චිත්ත දෙක ව්‍යාපාද කාය ග්‍රන්ථය. කාමාශ්‍රවය කාමච්ඡන්ද, ව්‍යාපාද=කුක්කුච්ච යන නීවරණ කාමරාග - පටිඝ යන අනුසය දෙක දොස මූලය. අකුශල කර්මපථ අතුරෙන් පිසුනාවාචා - ඵරුසාවාච ව්‍යාපාද යන මොව්හු පටිඝ සම්පයුත්ත සිත් දෙක යන මෙතෙක් ධර්මයි.

ඉතිරි සියලු කෙලෙස් අර්හත් මාර්ග ඥානයෙන් ප්‍රහාණය වෙයි. මෙසේ සතර මාර්ග ඥානයන්ගෙන් සියලු කෙලෙස් සමුදාය පුළුන් රුලකට ගිනි ගත්තාක් මෙන් විනාශ භාවයට යේ. තවද මාර්ගඥානයෙහි මහානුභාවය දැක්වීමට චතුරාර්‍ය්‍ය සත්‍යාවබෝධ කථාද කිව යුතුය. එය ඉදිරි ඥානකථාවන්ගෙන් ප්‍රකාශයට එයි.

මග්ග ඥාණය නිමි

## 12. ඵල ඥානය

“පයොගපටිප්පස්සද්ධි පඤ්ඤා ඵලෙ ඤාණං”

උත්සාහයාගේ සංසිඳීමෙහි නුවණ ඵලඥානයයි සංස්කාර ධර්මයන් ත්‍රිලක්‍ෂණයට නගමින් විදර්ශනාකොට, පිළිවෙලින් පරිකර්මාදි සිත් ඉපදීමෙන් පසු ඒ චිත්තවීථියේ අවශාන භාගය සිදුකරමින් උපදින විදර්ශනායෝගය සඳහා එතෙක් ගත් උත්සාහයේ ප්‍රතිඵලය වූ සිත හා යෙදුනු නුවණ ඵල ඥාන නමි, මෙහි “පයොග යනු උත්සාහයයි. එනම් ප්‍රයෝගයයි. “භූමා

යොගො පයොගො" බොහෝ සෙයින් යෙදීම ප්‍රයෝගයැයි කියැවේ. කවරක් සඳහාද "ඵලසච්ඡිකිරියාය මග්ගභාවනාය උභතො වුට්ඨාන පයොගො" ඵලය සාක්ෂාත් කිරීම සඳහා මාර්ග භාවනාවෙන් දෙයාකාරයෙන් නැගීමේ ප්‍රයෝගයයි දක්වෙන හෙයින් ඒ ප්‍රයෝගය ඵලයට පත්වීම සඳහාය. ප්‍රයෝගය සම්පූර්ණවූ පසු ඇතිවන සංසිඳුනු ගතිය "පටිප්පස්සද්ධි" නම්. එහි යෙදුනු නුවණ ඵල ඥාණය යයි දතයුතු. ඵල ඥානය ඉපදවීම සඳහා අමුතු උත්සාහයක් අනවශ්‍යය. මග්ග ඥානය උපදින්ම ඵල ඥානය ඒ සමගම අතරක් නොමැතිව උපදියි. සද්ධර්මයෙහි ගුණ අතුරෙන් "අකාලික" -කල් නොයවා විපාක දෙන ගුණය දක්වෙනුයේ මේ ඵල ඥානය සඳහායි. ඵල ඥාණයෙහි අරමුණ නිර්වාණයයි.

මග්ග ඥාණයෙහි දක්වූ සියලු කෙලෙසුන් කෙරෙන් නැගී ඊම ඵල ඥානයෙහි කෘත්‍යය-වැඩය-යි. විස්තර ඒ අයුරින්ම සැල කිය යුතු. ඵල ඥාණය ද සිව් වැදෑරුම්ය. සෝතාපත්ති ඵලය, සකෘදාගාමි ඵලය, අනාගාමි ඵලය අරහත්ත ඵලය යනුයි.

ඵල ඥානය නිමි.

## 13. විමුක්ති ඤාණය

"ඡින්නවිවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං" සිඳිනලද කෙලෙස් සමූහය දැකීමෙහි ප්‍රඥාව විමුක්ති ඤාණ නම්. ආර්‍ය්‍ය මාර්ගයට පත් යෝගාවචරයා "මේ මාර්ගයෙන් මේ මේ කෙලෙස් මා විසින් නසන ලදී. මේ මේ කෙලෙස් ඉතිරිවිය" යනුවෙන් සිහිකර බැලීමේදී ඇතිවන නුවණ විමුක්ති ඥානයයි. "විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති" මිදීමෙහිදී මිදුනේයයි නුවණ වෙයි, යනුවෙන් සඳහන් වන දේශනා පාඨයෙන් හෙළි වූයේ මෙම ඥානයමැයි. ආර්‍ය්‍ය ශ්‍රාවකයාට එසේ කෙලෙසුන්ගෙන් මිදීම පිළිබඳ අදහස් පහලවෙයි. ශෛක්ෂයෝ ප්‍රහාණය කළ කෙලෙස්ද, ඉතිරි කෙලෙස්ද සලකා බලත්. ක්ෂීණාශ්‍රවයෝ ඉතිරි කෙලෙස් නොමැති හෙයින් ප්‍රහීණවූ ක්ලේශයන්ම බලත්. ඉහතදී දක්වූ ඇල හරහා පැණීමේ උපමාවේ වෙව්ලමින් ගොස් පොළොවෙහි පිහිටා "මම පිහිටියෙමි, ඇලෙන් ගොඩ වූයෙමි" යනුවෙන් සිහිවන ඇල පිළිබඳ කල්පනාව මේ විමුක්ති ඥාන අවස්ථාව සඳහා ගැලපෙයි. රාක්ෂයෙකුගෙන් ගැලවුනු මිනිසාට ඒ ගැලවුණු අවස්ථාවේදී රාක්ෂයා ගැන සිහිවේ. ඔහු මැවී පෙනේ. මෙත් එබඳුය.

මෙහි 'ඡින්න විවට්ට'' යන්නෙන් සිඳින ලද කෙලෙස්වටය--කිලෙසවට්ට- දක්විණ. මෙය කර්ම වෘත්තාදී වෘත්තත්‍රයෙන් එකෙකි. සත්ත්වයා සංසාරයෙහි ගමන් කරවන බැවින් කෙලෙස් සමූහය වටයකි.වෘත්තයෙකි. ඒ ඒ මාර්ග ක්ෂණයන්හෙත් විනාශ වන කෙලෙස් මග්ග ඥාණයේදී දක්විණ.

විමුත්ති ඤාණය නිමි.

## 14. පච්චවෙක්ඛණ ඤාණය.

"තදා සමුදාගතෙ ධම්මෙ පස්සනෙ පඤ්ඤා පච්චවෙක්ඛණෙ ඤාණං'' ඒ ඒ මාර්ග ක්ෂණයන්හි රැස්වූවාවූ මාර්ග - ඵල - චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයන් දැකීමෙහි නුවණ පච්චවෙක්ඛණ ඥාන නම්. විමුත්ති ඥානයේදී ද සිදුවනුයේ එක් ප්‍රත්‍යවෙක්‍ෂාවකි. එහෙත් අසම්පූර්ණය. මක්නිසාද? කෙලෙසුන් පමණක් සිහිකරන හෙයිනි.මේ පච්චවෙක්ඛණ ඥානයේදී එයත් ඇතුලත්කොට සෙසු සිහිකළයුතු ධර්ම ඇද්ද ඒ සියල්ල ප්‍රත්‍යවෙක්‍ෂා කරයි. "තදා සමුදාගතෙ ධම්මෙ පස්සනෙ පඤ්ඤාති තදා මග්ගක්ඛණෙච ඵලක්ඛණෙච සමුදාගතෙ පටිලාභවසෙනච පටිවෙධවසෙනච සමාගතෙ සම්පත්තෙ සමංගිභූතෙ මග්ගඵලධම්මෙ චතුසච්චධම්මෙච පස්සනා පෙක්ඛණාපජානනා පඤ්ඤා'' ඒ රැස්වූවාවූ ධර්මයන් දැකීමෙහි ප්‍රඥාව යනු ඒ මාර්ගක්ෂණයෙහි ද ඵලක්ෂණයෙහිද - අවස්ථාවෙහි ප්‍රතිලාභ වශයෙන්ද ප්‍රතිවෙධ වශයෙන්ද පැමිණි, රැස්වුණු මාර්ග-ඵල ධර්මයන්ද, චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන්ද දැකීම, බැලීම, දැනගැනීම, ඒ සඳහා පවතින නුවණයි. මෙහිදී ප්‍රතිලාභ ලැබීම කරනුයේ මාර්ග ඵලයි. ප්‍රතිවෙධ-අවබෝධ කරනුයේ චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයි. පද දෙවයක් දක්වූයේ එහෙයිනි.

"පච්චවෙක්ඛණ ඤාණන්ති නිවත්තිත්වාභූසං පස්සනං පජානනං ඤාණං'' ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙහි ඥානය යනු නැවත බොහෝසේ දක්නා, නුවණයි. මෙහි "නිවත්තිත්වා'' යන්නෙන් දක්වූයේ මාර්ග ඵලයනට පත්වූ පසු සිත භවාඞ්ගයට වැටී නැවත ජවන් දුවද්දී දුවනුයේ විදර්ශනා ජවන් නොව, ආපසු හැරී බැලීම් වශයෙන් උපදින ප්‍රත්‍යවෙක්ෂා ජවන් බවයි. එහෙයින් ප්‍රත්‍යවෙක්ෂා ජවන් බවයි. එහෙයින් විදර්ශනා නොකර, එයින් නැවතී ආපසු බලයි නුවණින් සලකයි. ප්‍රත්‍යවෙක්ෂා ජවන් දිවූ පසු නැවත විදර්ශනා චිත්තවීථි හෝ සුදුසු පරිද්දෙන් ශෛලදන චිත්තවීථි හෝ දුවයි.

## එකූන්විසි ප්‍රත්‍යවේක්ෂා ඥාන

“සො ඉමිනාවතාහං මග්ගෙන ආගතොති මග්ගං පච්චවෙක්ඛ, තතො අයං මෙ ආනිසංසො ලද්ධොති ඵලං පච්චවෙක්ඛති තතො ඉමෙ නාම මෙ කිලෙසා පහීණාති පහීණකිලෙස පච්චවෙක්ඛති, තතො ඉමෙ නාම මෙ කිලෙසා අවසිට්ඨාති උපරිමග්ගවජ්ඣෙ කිලෙසෙ පච්චවෙක්ඛති, අවසානෙ අයමෙමධම්මො ආරම්මණතො පටිලද්ධොති අමතං නිබ්බානං පච්චවෙක්ඛති, ඉති සොතාපන්නස්ස අරියසාවකස්ස පඤ්ච පච්චවෙක්ඛණානි හොන්ති. යථාච සොතාපන්නස්ස එවං සකදාගාමිඅනාගාමීනම්පි අරහතො පන අවසිට්ඨකිලෙස පච්චවෙක්ඛණං නාම නත්ථි; එතතාදිශෙව පච්චවෙක්ඛණානි එව සබ්බානි එකූනවීසති පච්චවෙක්ඛණ ඤාණානි”- ප. ම. (අ.)

මෙහි සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, ආයර්යන්ට ප්‍රත්‍යවේක්ෂා ඥාන පස බැගින් දක්වෙයි. රහත්හුට සතරෙකි. සියල්ල දහනවයකි. සෝවාන්වූවහුට උපදින ප්‍රත්‍යවේක්ෂා ඥාන පස නම් :-

i “මම මේ මාර්ගයෙන් පැමිණියෙමි” මාර්ගය ප්‍රත්‍යවේක්ෂණය

ii මා විසින් මේ ආනිශංසය ලැබුයේය”යි ඵලය ප්‍රත්‍යවේක්ෂණය

iii ‘මා විසින් මේ කෙලෙස් ප්‍රහාණය කරන ලද”යි ප්‍රහීණ ක්ලේශයන් ප්‍රත්‍යවේක්ෂණය.

iv “මගේ මේ කෙලෙස් ඉතිරිවිය”යි මතු මාර්ගයන්ගෙන් නැසිය යුතු කෙලෙස් ප්‍රත්‍යවේක්ෂණය.

v අවසානයෙහි “මා විසින් මේ ධර්මය අරමුණු වශයෙන් ලබන ලද්දේය”යි අමෘතමහා නිර්වාණය ප්‍රත්‍යවේක්ෂණය යනුයි.

සකෘදාගාමි, අනාගාමි ආර්යයන්ටද මේ පසමැයි රහතන් වහන්සේට ඉතිරි කෙලෙස් ප්‍රත්‍යවේක්ෂණයක් නොමැති හෙයින් සතරෙකි. මෙසේ ප්‍රත්‍යවේක්ෂා ඥාන එකූන්විස්සෙකි. සැලකි

යුතු:- මේ ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රමය උසස් වශයෙන්ම දක්වෙන්නකි. එහෙයින් ඇතැම්විට ශෛක්‍ෂයන්ට ප්‍රහීණ, අවශේෂ ක්ලේශ ප්‍රත්‍යවේක්‍ෂණා නොවෙයි·

## මාර්ග-ඵලයන්හිදී රැස්වුණාවූ ධර්ම රාශිය ප්‍රත්‍යවේක්‍ෂා කිරීම.

“කෙසේ නම් ඒ මාර්ග-ඵලක්‍ෂණයන්හි ලැබීම් වශයෙන්ද, අවබෝධ කිරීම් වශයෙන්ද, එක්ව පහලවූ ධර්මයන් දක්මෙහි ප්‍රඥාව පච්චවෙක්ඛණ ඥාන නම්වේද? සෝවාන් මාර්ගක්‍ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක්දෘෂ්ටිය, ඒ මාර්ගක්‍ෂණයෙහි එක්ව පහල වූයේ වෙයි. අරමුණට නැංවීම් අර්ථයෙන් සම්‍යක් සංකල්පය එක්ව පහ වූයේ වෙයි. වැලඳගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය මනා පිහිටුවීම් අර්ථයෙන් සම්‍යක් කර්මාන්තය, පිරිසුදුවීම් අර්ථයෙන් සම්‍යක් ආජීවය, එසවීම් අර්ථයෙන් සම්‍යක් ව්‍යායාමය, එළඹ සිටීම් අර්ථයෙන් සම්‍යක් ස්මෘතිය' නොවිසිරියැම් අර්ථයෙන් සම්‍යක් සමාධිය එක්ව පහල වූයේ වෙයි” ප. ම සිං. ප.

මෙසේ ඒ මාර්ග, ඵල අවස්ථාවේදී පහලවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි ඇති ඒ ඒ අඞ්ග ඒවායින් සිදුකෙරෙන කෘත්‍යය ස්වභාවය. ප්‍රත්‍යවේක්‍ෂා කරයි. එද කරනුයේ ලැබීම් වශයෙන් අවබෝධ කිරීම් වශයෙන් යන ක්‍රම දෙකෙනි. මෙපමණක් නොව ඒ අවස්ථාවන්හි එක්ව උපදින බොජ්ඣඞ්ග ධර්ම, ඉන්ද්‍රිය ධර්ම, බලධර්ම, සතිපට්ඨාන ධර්ම, ඍද්ධිපාදධර්ම චතුරාර්ය සත්‍ය සමථ විදර්ශනා, දිට්ඨි විසුද්ධිය, විමොක්‍ෂය, විද්‍යාව, විමුක්තිය, ක්‍ෂය ඥානය; ඡන්ද-ඵස්ස මනසිකාර වේදනා, සමාධිය, ප්‍රඥාව ස්මෘතිය, මාර්ග විමුක්තිය, නිර්වාණය, යන මෙතෙක් ධර්ම ප්‍රත්‍යවේක්‍ෂා කරයි. මේවාද ප්‍රත්‍යවේක්‍ෂා කරනුයේ ඒ ඒ ධර්ම යන්ගෙන් කෙරෙන වැඩය මනාලෙස වටහාගැනීම ඇතිවමය, සෝවාන් මාර්ගයෙහි මෙන්ම සෙසු අවස්ථාවන්හිදීද, ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රමය මේ වශයෙනි.

සැලකියයුතු:-මාර්ගක්‍ෂණයෙහිදී බෝධිපාක්‍ෂික ධර්ම සත්තිසම යෙදෙන අතර ඵලක්‍ෂණයෙහිදී සතර සම්‍යක් ප්‍රධාන හැර යෙදෙයි අටුවාවෙහි දැක්වෙයි.

"වුත්තංහි මග්ගක්ඛණෙ සත්තතිංස බොධිපක්ඛිය ධම්මෙ උද්ධරන්තෙන පොරාණෙන, ඵලක්ඛණෙ ඨපෙත්වා චත්තාරො සම්මප්පධානෙ අවසෙසා තෙත්තිංස ධම්මා ලබ්භන්තීති" ඵලක්ෂණයේහිදී සතර සම්‍යක් ප්‍රධාන හැර ඉතිරි තෙතිස් ධර්ම ලැබෙත් යයි මාර්ගක්ෂණයෙහි බෝධිපාක්ෂික ධර්ම නගාසිටුවා දක්වන්නාවූ ස්ථවිරයන් විසින් කියනලදී. යනු එහි අදහසයි.

මෙසේ මාර්ගඵලක්ෂණයන්හි ලැබීම් වශයෙන්ද අවබෝධ කිරීම් වශයෙන්ද පහලවූ දැක්මෙහි ප්‍රඥාව පච්චවෙක්ඛණ ඥාන නමි.

පච්චවෙක්ඛණ ඥානය නිමි.

## 19 වැනි පරිච්ඡේදය

# 15 වත්ථුනානත්ත ඤාණය

සුතමය ඥානයේ සිට පච්චවෙක්ඛණ ඥානය තෙක් ඇති ඥාන තුදුස (14) ආශ්‍රයේ ශ්‍රැත, ශීල, සමාධි, ප්‍රඥා යන චතුර්විධ ධර්මයන්ගේ පිළිවෙල විග්‍රහයකි. එහි ධම්මට්ඨිති ඤාණයෙන් දක්වූයේ විදර්ශනාවට භූමි වූ නාමරූප ධර්මයි. සම්මසන ඤාණයේ සිට විමුත්ති ඤාණය තෙක් විදර්ශනා මාර්ගය දක්වේ. ඒ ඤාණ එකම චිත්තවීථියක උපදින පරිකම්, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ, මාර්ග, ඵල යන ජවන් සිත්ය. එයිනුදු සම්මසන, උදයබ්බය, භඞ්ග ඤාණයෝ පරිකර්ම ජවන් වශයෙන් එත්. මෙසේ නිර්වාණගාමිනී ප්‍රතිපදාව මේ ඥාණයන්ගෙන් ප්‍රකාශයට එයි. දැන් දක්වනුයේ ආයතනයන්ටම විෂය වන ධර්ම මුල්කොට ඇති ඥාන විශේෂයෝයි. එහි පළමුවැන්න වත්ථුනානත්තඥානයයි.

“අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථු නානත්තෙඤාණං” අධ්‍යාත්මික වූ-තමා පිළිබඳ නැතහොත් තමාට අයත් චක්ඛු ආදී ආයතනයන් ව්‍යවස්ථාපනය කිරීමෙහි පිරිසිඳ දැනීමෙහි - ප්‍රඥාව වත්ථුනානත්තඥාණයයි. මෙහි ‘වත්ථු” යනු සිත් ඉපදීමට භූමි වස්තු වූ චක්ඛාදී ආයතනයන්ට නමෙකි. මුදල් ධාන්‍යාදිය උපදින ඉඩම් කුඹුරු ආදියට වස්තු නාමය යෙදෙන්නාක් මෙනි. විනයෙහිද, ‘විහාරවත්ථු, කුටිවත්ථු’ ආදී නාමයක් සඳහන්වේ. පහසු විහරණය සඳහා උපකාරීවන සංඝාරාමාදිය විහාරවත්ථුයි. කාය-චිත්ත විවේකය සඳහා උපකාරීවන එක් අයෙකුට පමණක් සීමාවූ කුඩා කිලි කුටිවත්ථුයි මෙබඳුතන්හි යෙදෙනුයේ ස්ථානවාචී වය රූපාදී බාහිරාරම්මණයන් අමුත් නවතින නිසා චක්ඛාදීහුද නම්වත්ථුවෙන් මේ අයුරින් “වත්ථු ”යන්න තේරුම්ගතයුතුය. එබඳු සයකි. චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන යනුයි. මේවා වත්ථුපඤ්චස්කන්ධ විස්තරයෙහිදී පැහැදිලිකර ඇත. එය බලන්න. “නානත්ත” නොයෙක් ආකාරයයි නානත්වයයි. ඇසෙහි ආකාරය අනිකෙකි. කනෙහි ආකාරය අනිකෙකි. එහෙයින් ඇස කණ නොවෙයි. කණ ඇස නොවෙයි මෙසේ පවත්නා ඒ වස්තූන්ගේ නොයෙක් ආකාරය වත්ථුනානත්ත නම්. ඒවා පිළිබඳ පවතින පිරිසිඳ දැනීම (තත්‍වාකාරය) වත්ථුනානත්තන ඥානයයි.

ඉහත දැක්වූ අයුරින් වත්ථුනානත්ත ඥානය තේරුම්ගත්තේ ආධ්‍යාත්මික ව්‍යවස්ථාපනයෙහි ප්‍රඥාව හැටියටය. චක්ඛාදීහු තමා පිළිබඳවම – තමාට අයත් නිසාම = පවතින හෙයින් ආධ්‍යාත්මික යැයි දෙසූහ. මේ "අජ්ඣත්ත" ශබ්දය ධර්මයෙහි අර්ථ සතරෙක යෙදෙන බව දක්වේ. ගොචරජ්ඣත්ත නියකජ්ඣත්ත අජ්ඣත්තජ්ඣත්ත, විසයජ්ඣත්ත යනුයි "තෙන ආනන්ද භික්ඛුනා තස්මිංයෙව පුරිමස්මිං සමාධිනිමිත්තෙ අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙතබ්බං, අජ්ඣත්ත රතො සමාහිතො" ආදියෙහි ඒ භික්ෂුව විසින් ඒ පූර්වවූම සමාධි නිමිත්තයෙහි අධ්‍යාත්මිකවූ සිතම තැබිය යුතුය. නිර්වාණයෙහි ඇලුනේ සමාහිත වෙයි. මේ තන්හි දැක්වෙනුයේ ගොචරජ්ඣත්තයි. මෙහි සමාධි නිමිත්තට ගොචරවූ සිත ද නිර්වාණයද අධ්‍යාත්මිකයැයි දෙසූහ. ගොචරවූ හෙයිනි.

ii "අජ්ඣත්තං සම්පසාදනං, අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති" පැහැදුනාවූ සිත, තමාට අයත් ධර්මයන් කෙරෙහි ධම්මානුපස්සීව වෙසෙයි. මේ ආදී තන්හි නියකජ්ඣත්තය කියැවිණි. නියක නම් ස්වකීයභාවයයි. තමාට අයත් බවයි. පැහැදුනාවූ සිත යනු සමථය වඩා නීවරණයන් දුරුකොට තමා විසින්ම පිරිසුදු කරගත් සිතයි.

iii "ඡ අජ්ඣත්තිකානි ආයතනානි අජ්ඣත්තිකා ධම්මා" ආධ්‍යාත්මිකවූ ආයතන සයකි, ආධ්‍යාත්මිකවූ ධර්ම, මේ තන්හි වූයේ අජ්ඣත්තජ්ඣත්තයි. එනම් ආධ්‍යාත්මිකවූ දෑයෙහිම ඇති ආධ්‍යාත්මික භාවයයි.

iv අයං ඛො පනානන්ද විහාරො තථාගතෙන අභිසම්බුද්ධො, යදිදං සබ්බනිමිත්තානං අමනසිකාරා අජ්ඣත්තං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරති" ආදියෙහි, සියලු සංස්කාර නිමිති මෙනෙහි නොකිරීමෙන් ආධ්‍යාත්මිකවූ යම් ශූන්‍ය බවකට පැමිණ වෙසෙයි යන්නක් වෙයිද මෙම ඵලීම ස්ථානයත් විසින් විශේෂයෙන් අවබෝධ කරගන්නා ලදී. මේ තන්හි විසයජ්ඣත්තය කියැවේ "ඉස්සරියට්ඨානාති අත්ථො" විසයජ්ඣත්තය ඊශ්වරත්වයෙන් හැමට ප්‍රධාන යන තේරුමින් – යනු දක්වේ මෙසේ තේරුම් සතරක පවත්නා අජ්ඣත්ත ශබ්දය වත්ථුනානත්තයෙහි අජ්ඣත්තවිජ්ඣත්තයෙහි යෙදිණ. තවද ශබ්දශාස්ත්‍රඥයෝ අජ්ඣත්තශබ්දය අර්ථ තුනෙකලා දක්වති. "සසන්තානෙ ච විසයෙ - ගොචරජ්ඣත්ත මුච්චතෙ" තමාගේ සන්තානයෙහි – සිතෙහි, විෂයෙහි; ගොචරයෙහි යනුයි. මෙහි දක්වෙන විසයජ්ඣත්තය

නම චක්ෂුරාදීහුම නිසා වත්ථුනානත්තයේදී විසඞ්ඛතතාය යෙදේ මෙසේ ආධ්‍යාත්මිකවූ චක්ෂුරාදී වස්තූන් ව්‍යවස්ථාපනය කිරීමේ ප්‍රඥාව වත්ථුනානත්ත නමි.

## චක්ෂුරාදීන් ව්‍යවස්ථාපනය කරන අයුරු.

'කෙසේ නම් ආධ්‍යාත්මික ධර්මයන් මෙනෙහි කිරීමේ ප්‍රඥාව වත්ථුනානත්ව ඥාන නම්වේ? කෙසේ නම් ආධ්‍යාත්මික ධර්ම මෙනෙහි කරන්නේද? ආධ්‍යාත්මික. ඇස මෙනෙහි කරයි. ආධ්‍යාත්මික කණ - නැහැය දිව - සිරුර සිත මෙනෙහි කරයි. ආධ්‍යාත්මික ඇස කෙසේ මෙනෙහි කරයිද? ඇස අවිද්‍යාවෙන් හටගන්නේයයි මෙනෙහි කරයි. ඇස තණ්හාවෙන් හට ගන්නේ යයි මෙනෙහි කරයි. ඇස කර්මයෙන් හටගන්නේයයි මෙනෙහි කරයි: ඇස ආහාරයෙන් හටගන්නේයයි මෙනෙහි කරයි. ඇස සතර මහා භූතයන් නිසා පවත්නෙකැයි මෙනෙහි කරයි. ඇස ප්‍රත්‍යුත් පන්නයැයි-වර්තමානයයි මෙනෙහි කරයි ඇස හේතුවෙන් පහළවූයේයයි මෙනෙහිකරයි. ඇස නො පැවත පහළ වෙයි. ඇතිව විනාශ වන්නේයයි මෙනෙහි කරයි. ඇස කෙළවර, සහිත යැයි මෙනෙහි කරයි. ඇස අස්ථිරය, සදාකාලික නොවේ. වෙනස්වන සවභාවය ඇත්තේයයි මෙනෙහි කරයි. ඇස අනිත්‍යය, ප්‍රත්‍යය විසින් සකස් කරන ලදී. ප්‍රත්‍යයෙන් උපදින ලදී ක්ෂය වන ස්වභාව ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නිරුද්ධ වන සවභාව ඇත්තේයයි මෙනෙහි කරයි. ඇස අනිත්‍යය වශයෙන් මෙනෙහි කරයි. නිත්‍ය වශයෙන් නොමෙනෙහි කරයි දුක් වශයෙන් මෙනෙහි කරයි. සැප වශයෙන් මෙනෙහි නොකරයි. අනාත්ම වශයෙන් මෙනෙහිකරයි. ආත්ම වශයෙන් මෙනෙහි නො කරයි. කලකිරෙයි සතුටු නොවෙයි වෙත් නොවෙයි නො ඇලෙයි නිරුද්ධ කරයි නොඋපදවයි. අතහරියි. අල්වා නොගනියි අනිත්‍ය වශයෙන් මෙනෙහිකරමින් නිත්‍ය සඥව දුරුකරයි. දුක් වශයෙන් මෙනෙහි කරමින් සුඛ සඥව දුර කරයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරමින් ආත්ම සඥාව දුරුකරයි. කලකිරෙමින් ප්‍රීති සහගත ඇල්ම දුරුකරයි. නො ඇලෙමින් රාගය දුරුකරයි. නිරුද්ධ කරමින් ඉපදීම දුරුකරයි. අතහරිමින් අල්වා ගැනීම දුරුකරයි. මෙසේ ආධ්‍යාත්මික ඇස මෙනෙහි කරයි

පටි' ම. (සිං. ප.)

කණ, නැහැය, දිව, සිරුර, සිත යන සෙසු වස්තූන් පිළිබඳව ද ව්‍යවස්ථාපන මෙ අයුරුමැයි මේ ව්‍යවස්ථාපනය-පිරිසිඳ දැනීම-

දැනීම් අර්ථයෙන් ඥාත නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම් එහෙයින් ආධ්‍යාත්මික ධර්මයන් මෙනෙහි කිරීමේ ප්‍රඥාව වත්‍ථු නානත්ත ඤාණයයි.

මෙම විස්තරයෙන් දැක්වූයේ ආධ්‍යාත්මික වස්තූන් විදර්ශනා කරන ආකාරයයි ධම්මට්ඨිති ඥානයේදී දැක්වූ පරිදි ඒ ඒ වස්තූහු රූපධර්ම වශයෙන් හා නාමධර්ම වශයෙන් ගෙන ඒවායේ උප්පත්ති ක්‍රම බලා, වර්තමාන නාම රූපධර්මයන් කලාප වශයෙන් ගෙන, ඒවාහි ඇත්තාවූ කෙලවර එනම් උපන් නාමරූප ධර්මයන්ගේ විනාශ, දකිමින් උදය ව්‍යයාදී විදර්ශනා ක්‍රමයන්ට අනුව මෙනෙහි කිරීම වත්‍ථුනානත්ත ඥාණය නම්. වස්තු ධර්මයන්හි පවත්නා නාමරූප ධර්ම ඉහතදී ප්‍රකාශයට පත්වූහ.

වත්‍ථුනානත්ත ඥාණය නිමි.

## 16. ගෝචර නානත්ත ඤාණය

“බාහිර-පිටත්හි - වූ රූපායතනාදිය පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ගෝචර නානත්ත ඥාණය නම්.” ප ම (සි. ප.) අධ්‍යාත්මික දැයින් බැහැරවූ මෙතැ වූ දෑ බාහිර නම්. බාහිරායතන සදෙනෙකි. රූපායතන, සද්දායතන, ගන්ධායතන, රසායතන ඵොට්ඨබ්බායතන, ධම්මායතන යනුයි මෙවාද සකාඛ විස්තරයෙන් බලාගන්න. මේ බාහිරායතනයන් පිළිබඳ ව්‍යවස්ථාපනය ගෝචර නානත්ත ඥාණයයි.

බාහිරායතන ව්‍යවස්ථාපනය කරන අයුරු ආධ්‍යාත්මික ආයතනයන්ට දැක්වූවාක් මෙනි, මොවුනුද නාමරූප වශයෙන් ගෙන විදර්ශනා කළයුතු වෙත්.

## 17. චරියානානත්ත ඤාණය

“චරියා වවත්‍ථානෙ පඤ්ඤා චරියානානත්ත ඤාණං” චර්‍ය්‍යාවන් ව්‍යවස්ථාපනයෙහි ප්‍රඥාව චරියානානත්ත ඤාණයයි. එනම් අරමුණ පිළිබඳ කිනම් අයුරකින් පවතීදැයි විමසා බලන නුවණයි. “චරතීති චරියා” හැසිරේනුයි චරියා නම්. මෙහි ඒ හැසිරීම නම් අරමුණෙහි හැසිරීමයි එහෙයින් “චරියා” යන්නට අර්ථ ප්‍රකාශ කරන අට්ඨවාචාර්‍ය්‍යයෝ ‘ආරම්මණෙ චරතීති චරියා’

අරමුණෙහි හැසිරේනුයි චරියායි දක්වත්. අරමුණෙහි හැසිරීම ක්‍රම තුනකින් පවති. විඤ්ඤාණචරියා, අඤ්ඤාණචරියා ඥාන චරියා යනුයි.

“කෙසේනම් අරමුණෙහි හැසිරීම මෙනෙහි කිරීමේ ප්‍රඥාව චරියා නානාත්ත ඥානයා නම් වේද? විඤ්ඤාණ චරියා අඤ්ඤාණ චරියා ඥානචරියායි අරමුණෙහි හැසිරීම් තුනෙකි. විඤ්ඤාණ චරියාව කවරීද? දක්නා පිණිස ආවර්ජනය කරන්නාවූ අව්‍යාකෘත වූ ආවර්ජන සිත (පඤ්චද්වාරාවර්ජනයයි) රූපයන්හි විඤ්ඤාණ චරියා නම් දක්නා ස්වභාවය ඇති චක්ඛු විඤ්ඤාණ සිත රූපයන්හි විඤ්ඤාණ චරියා නම්. දක්නා ලද හෙයින් අරමුණට නගන්නාවූ විපාක මනො ධාතුව (සම්පටිච්ඡන සිත) රූපයන්හි විඤ්ඤාණ චරියා නම්. අරමුණට නඟින ලද හෙයින් විපාකමනො විඤ්ඤාණ ධාතුව (සන්තීරණ සිත) රූපයන්හි විඤ්ඤාණචරියා නම්” - ප. ම. (සිං. ප)

මේ ආදී වශයෙන් ඒ චරියා පටිසම්භිදාවෙහි විස්තර කෙරේ. එහි සාරාංශය මෙසේය.

රූපාදී පඤ්චාරම්මණයන් අතුරෙන් එකක් ඊට විෂයවූ ප්‍රසාද රූපයකට හමුවූ කල්හි අරමුණු නොගෙන පවත්නා භවඞ්ග සිත සිඳී පඤ්චද්වාරාවර්ජන සිත උපදී, ඒ සමඟම චක්ඛු විඤ්ඤාණාදී එකක්ද ඒ පිළිගන්නාවූ සම්පටිච්ඡන සිතද, තීරණය කරන සන්තීරණ සිතද උපදී මේ සිත් සමඟ පවත්නා හැසිරීම විඤ්ඤාණ චරියායි. ඉක්බිති ඒතැන්සිට රාග ද්වේෂ මොහාදී අකුශල ධර්මයන්ට අනුව ජවන් සිත් දිවේ නම් ඒ අඤ්ඤාණචරියා නමි. ජවන් අවස්ථාවේදී අනිත්‍යානුදර්ශනාදී අනුපස්සනාවන්ට අනුව ජවන් පැවත, විදර්ශනා වීථි අවසානයේ මාර්ග - ඵලයනට පැමිණේ නම් එතෙක් එනුයේ ඥාණචරියායයි.

විස්තර: විඤ්ඤාණ චරියා නම් වේද? රාග විරහිතව-නැතිව-හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. (ඒ එසේමය. ආවර්ජන දෙද පස් විඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ, වොත්ථපන යන සිත්හි රාගාදී පාපධර්මයන්ද, අලෝභාදී කුශල ධර්මයන්ද යන දෙපක්ෂ සම නොමැත. හුදෙක් ක්‍රියා, විපාක මාත්‍රයෝයි විපාක අතුරෙනුදු මොවුහු අහේතුකයෝය. එහෙයිනි.) මෙසේම දෙස, මොහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, උද්ධච්ච, මොවුන් විරහිතව හැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. අකුසය, අකුසල, කුසල, සාවද්‍ය, නිරවද්‍ය කෘෂ්ණකර්ම

ශුක්ලකර්ම,(පව්-පින්)සැප ඵලවන කර්ම, දුක් ඵලවන කර්ම සැප ගෙනදෙනවිපාක,දුක් ගෙනදෙන විපාක යන මොවුන් සමග නොයෙදීහැසිරේනුයි විඤ්ඤාණ චරියා නම්. විඤ්ඤාණයාගේ මෙබඳු හැසිරීමඇති හෙයින් විඤ්ඤාණ චරියායි. මෙසේ කියන ලද ආවර්ජනාදී සිත් රාගාදී කෙලෙසුන්ගෙන් කිළුටුවීමක් නැති නිසා ප්‍රකෘතියෙන්ම පිරිසිදුය. මේ නිසා අරමුණු දැනීම් මාත්‍රයම ඇති හෙයින් විඤ්ඤාණචරියාවෙයි.

අඤ්ඤාණචරියා යන තැන කිනම් අර්ථයකින් අඤ්ඤාණ චරියා නම් වේද? එහි රාග ද්වේෂ මෝහාදී පාප ධර්මයන් සහිතව හැසිරෙන නිසා අඤ්ඤාණ චරියායි. විඤ්ඤාණචරියාවෙහි දක්වූ කරුණු සුදුසු පරිද්දෙන් යොදා ඒ ධර්මයන් සහිතව හැසිරෙන නිසා අඤ්ඤාණචරියා යනුවෙන් තේරුම් ගත යුතුය. මෙහි අර්ථ සමාප්තිය නම් "නුවණින් නොදක්නා ලද අරමුණෙහි හැසිරීම අඤ්ඤාණචරියා නමි. නොදැනීම ගේ මෙබඳු හැසිරීම ඇත්තේනුයි අඤ්ඤාණචරියා නම්. මේ අඤ්ඤාණචරියා යයි කියනු ලැබේ" යනුයි.

ඤාණචරියා යන තැන කවර අර්ථයකින් ඤාණචරියා නම් වේද? යනුවෙන් ප්‍රශ්න නගා විසඳනුයේ රාගාදී පාප ධර්මයන් රහිතව-නැතිව-හැසිරෙන සිත ඤාණචරියා යනුවෙනි. එය නුවණින් දැනගන්නා ලද අරමුණෙහි හැසිරේනුයි ඥානචරියා නම්. ඥානයාගේ මෙබඳු හැසිරීම ඇති හෙයින් ඥානචරියා නම්. මේ ඥාණ චරියාවයි.

මෙසේ චරියාත්‍රයෙකි. තවද, විඤ්ඤාණ චරියාවෙහි කියූ සිත් ගණනට වොත්පන සිතද ගතයුතු බව අටුවාව සඳහන් කරයි. "සන්තීරණානන්තරං වොත්ථපනො අවුත්තොපි අට්ඨකථාචරියෙහි වුත්තත්තා ලබ්භතීති ගහෙතබ්බං" සන්තීරණයට අනතුරුව ව්‍යවස්ථාපන සිත නොකීමද, = පෙළෙහි නොආයේද = අටුවාචාරීන් විසින් කියන ලද බැවින් ලැබේයයි ගතයුතුය." එන කුදු වුවත් විදර්ශනා වීථියේ උපදින ගොත්‍රභූ සිත නිර්වාණාලම්බනයෙකැයි එන බැවින් මෙහිදීද ව්‍යවස්ථාපන සිත අකුසල ජවන් දිවේ නම් අකුසලයට නැඹුරුවීම නිසා අඤ්ඤාණ චරියා යයිද, කුසල ජවන් දිවේ නම් කුසලයනට නැඹුරුවීම නිසා ඤාණ චරියායයිද ගතහැක්කේ නොවේදැයි විමසන්න. ව්‍යවස්ථාපනය පෙළෙහි නො ආයේ මේ නිසායයි යනු අපගේ හැඟීමයි.

මෙනයින් දක්වූ චරියා පිළිබඳ නානාත්වය-වෙනස-විශේෂය දත් නුවණ චරියානානත්ත ඤාණ නම්. එය දැකීම් අර්ථයෙන් ඤාණයි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥායි. එහෙයින් චරියා පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව චරියානානත්ත ඤාණයයි

## 18. භූමිනානත්ත ඤාණය

“චතුධම්මවවත්ථානෙ පඤ්ඤා භූමිනානත්ත ඤාණං” සතර ධර්මයන් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව භූමිනානත්ත ඤාණ නම්. මෙහි “භූමි” යනු කොටසට නමකි. සීමා කිරීමෙහිද යෙදේ “භූමිතිභාගො පරිච්ඡෙදොවා” යනු අටුවාවයි. තේරුම කී පරිදියි. කාමාවචරාදී වශයෙන් සතර බැගින් ඇති භූමි තුදුස (14, පිළිබඳ නානා ආකාරය-වෙනස් අයුරු සැලකීමේ හෙවත් පිරිසිඳ දැනීමේ නුවණ භූමිනානත්ත ඤාණයයි.

“කෙසේ නම් සතර ධර්මයන් පිරිසිඳ දන්නා ඤාණය භූමිනානත්ත ඤාණය නම් වේද? කාමාවචර භූමි, රූපාවචර භූමි, අරූපාවචර භූමි, ලෝකෝත්තර භූමි යැයි භූමි සතරෙකි”-

-ප. ම. (සිං ප.)

මෙසේ භූමි සතර ප්‍රධාන වශයෙන් තබා සෙසු භූමි තෙළෙස ද විස්තර වශයෙන් දෙසූහ. සතර සතිපට්ඨාන, සතර සම්මප්පධාන සතර ඉද්ධිපාද, සතර ධ්‍යාන, සතර අප්‍රමාණ්‍ය සතර අරූප සමාපත්ති, සතර ප්‍රතිසම්භිදා, සතර ප්‍රතිපදා, සතර ආලම්බන, සතර ආර්යවංශ, සතර සංග්‍රහවස්තු, සතර චක්‍ර, සතර ධර්මපද යනු ඒ තෙළෙසයි. මේ තුදුසම භූමීහුය.

### කාමාවචරාදී භූමි සතර:

කාමාවචර, රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර වශයෙන් භූමි සතරෙකි. එහි කාමාවචර භූමි නම් යටින් අවීචි නිරය කෙළවර කොට, උඩින් පරනිර්මිත වසවර්ති දෙව්ලොව ඇතුළත් කොට, මේ අතරතුර පවත්නා, හැසිරෙන, මෙහි ඇතුළත්වූ යම් ස්කන්ධ, ධාතු, ආයතන, රූප-වේදනා-සඤ්ඤා - සංස්කාර-විඤ්ඤාණ, කෙනෙක් වෙද්ද ඒ සියල්ලයි. කාමාවචර භූමි සියල්ල එකොළොසකි සංක්ෂේපයෙන්:-සතර අපාය, මනුෂ්‍ය ලෝකය, දිව්‍යලෝක සය යනුයි. සතර අපාය යනු නිරය, තිරිසන්, ප්‍රේත, අසුර යන සතරයි. දිව්‍යලෝක සය නම් චාතුර්මහාරාජික, තාවතිංස, යාම, තුෂිත, නිම්මාණරති, පරනිර්මිත වසවර්ති යනුයි. “සුඛ සංඛාතො අයො එත්ථ නත්ථීති නිරයො” සුඛ සංඛ්‍යාත සැප

මෙහි නැත්තේනුයි නිරය නම්. නිරයෙහි ප්‍රභේද, ප්‍රධාන වශයෙන්
අටෙකි විස්තර වශයෙන් එක්සිය සතිසෙකි. සංජීවය, කාලසූත්‍රය
සඞ්ඝාතය, රෞරවය, මහා රෞරවය, තාපය, ප්‍රතාපය, අවීචිය
යන මේ අට ඒ ප්‍රධාන නිරයෝයි. මේ එකක් එකක් පාසා ඔසු
පත්නරක සොළොස බැගින් ඇති සියල්ල එක්වූවිට එක්සිය සති
සෙකි. (16X8=128+8=136) තිර්‍යග් - තිරිසන් - ලෝකය නම් පා
ඇති-නැති යනාදී වශයෙන් පැතිරී ගිය සත්ව සමූහයා වෙසෙන
ස්ථානයයි. තිරිසන් සත්වයෝ යම් තැනෙක වෙසෙත්ද ඒ තිරිසන්
ලෝකය නම්. ප්‍රේත කොට්ඨාස සතරෙකි. උතූපජීවි, ඛුප්පිපාසික
නිජ්ඣාම තණ්හික, පරදත්තූපජීවී යනුයි. මේ සතර වැදෑරුම්
ප්‍රේතයෝ යම් තැනෙක වෙසෙත්ද ඒ ප්‍රේතලෝක නම්. අසුරයෝ
පස්වැදෑරුම්යහ. දේවාසුර, විනිපාතාසුර, වෛමානිකාසුර ලෝකාන්
තරිකාසුර, ප්‍රේතාසුර යනුයි. මහමෙර පත්ලේ සිටින වෙපචිත්ති
ආදීහු දේවාසුරයෝයි. ප්‍රියංකරමාතා, උත්තරමාතා ආදීහු විනි
පාතිකාසුරයෝයි. යමරාජාදීහු වෛමානිකයෝය. සක්වල තුනකට
අතර ඇති ලෝකාන්තරික නිරයෙහි වෙසෙනුවෝ ලෝකාන්තරිකා
සුරයෝයි. කාලකඤ්ජාදීහු ප්‍රේතාසුරයෝය. මොව්හු "සුර නො
වූයේනුයි අසුර නම්" යන විග්‍රහයේ පරිද්දෙන් දේවසංඛ්‍යාවට
නොගැනෙන නිසා අසුරයෝයැයි කියනු ලැබේ. මොවුන් වෙසෙන
කොතැන වුවත් ඒ අසුර ලෝකය නම්. මේ සතර අපායයි.

මනුෂ්‍ය ලෝකය යනු ජම්බුද්වීපය, පූර්වවිදෙහය, අපරගෝ
යානය, උතුරුකුරු දිවයින යන සතර ස්ථානයයි. මන - සිත -
සති, සූර බව, බ්‍රහ්මචර්‍ය්‍යා යන මෙයින් උසස්වූවෝ මනුෂ්‍ය නම්,
යනුවෙන් කෙරෙන විග්‍රහයේ පරිදි සලකතොත් ගැනෙනුයේ
දඹදිව් වැස්සෝමය. එසේම ආදිකල්පික-මුලින්ම විසූ මනුගේ පර
පුරෙන් පැවත එන හෙයින්ද මනුෂ්‍ය නම්. මේ විග්‍රහයේ අයුරින්
ද සැලකීමට හැක්කේ ජම්බුද්වීපයවාසනුමය. එහෙත් පූර්වවිදෙ
හාදී සෙසු තන්හිද වෙසෙන්නෝ මිනිසාට සමාන හැඩරුවකින්
වෙසෙන හෙයින් ඔව්හුද මනුෂ්‍ය ගණයටලා සැලකෙත් මනුෂ්‍යයෝ
යම් තැනෙක වෙසෙත්ද ඒ මනුෂ්‍ය ලෝකය නම්.

ධතරට්ඨ, විරූළ්හක, විරූපක්ඛ, වෙස්සවණ යන සතරවරම්
රජවරු ප්‍රධානකොට වෙසෙන්නෝ චාතුර්මහාරාජිකයෝය. ඔව්හු
නම් ගන්ධබ්බ, කුම්භණ්ඩ, නාග, යක්ඛ යන කොට්ඨාස සතරකි.
ශක්‍රයා ප්‍රධානකොට ඇති තෙතිස් (33) දෙනා ප්‍රථමයෙන් උපන්
ස්ථානය තාවතිංස නම්. එනම් දෙව්ලොවයි. යාම දෙවියා ප්‍රධාන
කොට ඇති දෙව සමූහයා වෙසෙන භූමිය යාම නම්. බොහෝ

දිව්‍ය සම්පත්තියෙන් සනොතොෂවන ස්ථානය තුෂිතයි. කැමැත්ත වූ පරිදිම පහළවූ දෑයෙහි සිත් අලවා වෙසෙන දෙවියන් සිටින ලෝකය නිර්මාණරතිය නමාගේ කැමැත්තට අනුව අනුන් විසින් මැවූ දෑයෙහි සිත් අලවා වෙසෙන දෙවියන් සිටින භූමිය පරනිර්මිත වසවර්ති නම්. මෙසේ කාමාවචර භූමි එකොළොසකි. මේවායි පවත්නා ස්කන්ධ, ධාතු, ආයතනාදියද කාමාවචර භූමි වශයෙන් භූමිනානත්ත ඥානයේදී සැලකේ.

රූපාවචර භූමිය කවරේද? යටින් බ්‍රහ්මලෝකය කෙළවර කොට උඩින් අකනිට්ඨ දෙවියන් ඇතුලත්කොට, මේ අතරතුර ඇති, මෙහි හැසිරෙන්නාවූ මෙහි ඇතුලත්වූ ධ්‍යානයට සමවැදුන පුද්ගලයාගේ හෝ බඹලොව උපන්නහුගේ හෝ දිට්ඨධම්ම සුඛ විහාරී රහත්හුගේ හෝ යම් චිත්ත-චෛතසික ධර්ම කෙනෙක් වෙද්ද, ඒ රූපාවචර භූමි නම්. “රූපෙ අවචරන්ති රූපාවචරා” රූපයෙහි හැසිරේනුයි රූපාවචර නම්, යන න්‍යායෙහි රූප යනු රූප භවයට කියන නමකි. පයඞ්ගය වශයෙන් එයට ඇතුලත්වූ චිත්ත චෛතසිකයන්ටද “රූප” යන්න යෙදේ. ධ්‍යානයට සම වැදුනහුගේද, දිට්ඨධම්ම සුඛවිහාරී රහතන් වහන්සේගේද සිතෙහි වූයේ ඒ චිත්ත-චෛතසිකයෝනම් ඔව්හුද රූපාවචර භූමියටම ඇතුලත් වෙත්. මෙසේ රූපලෝකයෙහි හැසිරෙන, එසේම පෙර කී පරිදි ධ්‍යානයට සමවැදුනහුගේ හෝ දිට්ඨධම්මසුඛවිහාරී රහත් හුගේ හෝ සිතෙහි හැසිරෙන චිත්ත - චෛතසික රූපාවචර නම්. (දිට්ඨධම්ම සුඛවිහාරී: මෙලොව සැප විහරණය සඳහා ධ්‍යානයට සමවැදුන රහතන් වහන්සේ.) රූපාවචර ලෝක සොළොසකි. බ්‍රහ්මපාරිසජ්ජ, බ්‍රහ්මපුරෝහිත, මහාබ්‍රහ්ම, පරිත්තාභ, අප්පමාණාභ, ආභස්සර, පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්හක, වෙහප්ඵල, අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨක, අසඤ්ඤ සත්ත යනුයි. මෙයින් බ්‍රහ්මපාරිසජ්ජාදී ප්‍රථම ත්‍රිකය (පළමුවැනි තුන) ප්‍රථමජ්ඣාන භූමියි. පරිත්තාභාදී ද්විතීය ත්‍රිකය ද්විතීය ධ්‍යාන භූමියි. පරිත්තසුභාදී තෘතීය ත්‍රිකය තෘතීය ධ්‍යාන භූමියි. වෙහප්ඵල, පඤ්චසුද්ධාවාස, අසඤ්ඤසත්ත යන සත චතුර්ථ ධ්‍යාන භූමියි. මේ භූමින්හි හෝ ධ්‍යානයට සමවැදුනහුගේ හෝ දිට්ඨධම්ම සුඛවිහාරී රහතන් වහන්සේගේ හෝ වේදනාදී සතර නාමස්කන්ධ රූපාවචර භූමිනම්.

අරූපාවචර භූමි නම් කවරේද? යටින් ආකාසානඤ්චායතන දෙවියන් කෙළවරකොට, උඩින් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන දෙවියන් ඇතුලත්කොට, මේ අතරතුරවූ මෙහි හැසිරෙන, මෙහි

ඇතුලත් ධ්‍යානයට සමවැදුනහුගේ හෝ අරූපාවචර ධ්‍යාන වශයෙන් දිට්ඨධම්මසුඛවිහාරී රහත්හුගේ හෝ යම් චිත්ත-චෛතසික ධර්ම කොතෙක් වෙද්ද, මේ අරූපාවචර භූමි නම්. අරූපාවචර භූමි සතරෙකි. ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යනුයි විස්තර රූපාවචර භූමියට කී පරිදියි.

ලෝකෝත්තර භූමි කවරේද? ඉහතින් සඳහන් කළ ත්‍රිවිධ භූමි වලට ඇතුලත් නොවූ යම්, මාර්ග ඵල - අසංඛත ධාතුවූ නිර්වාණ යන ධර්ම කොතෙක් ඇද්ද ඒ ලෝකෝත්තර භූමි නම්. මෙසේ භූමි සතරක් ඇත. මෙහි ආ දිට්ඨධම්මසුඛවිහාරී යනු රහතන් වහන්සේට නමකි 'දිට්ඨෙව ධම්මෙ පච්චක්ඛෙ අත්තභාවෙ සුඛො විහාරො දිට්ඨධම්ම සුඛවිහාරො, සො අස්ස අත්ථීති දිට්ඨධම්මසුඛවිහාරී, අරහා'' ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නාලද ධර්ම ඇති ආත්ම භාවයෙහි ජීවිතයෙහි සැප විහරණය දිට්ඨධම්ම සුඛවිහාර නම්. එය ඔහුට ඇත්තේනුයි (හෝ) දිට්ඨධම්ම සුඛවිහාරීය. (එනම්) රහතන් වහන්සේය.

## 2. සතර සතිපට්ඨාන

කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා ධම්මානුපස්සනා, යනුයි. මේ අනුපස්සනා සතර, සිහිය පිහිටුව, ගැනීමට උපකාර වන හෙයින් සතිපට්ඨාන නම ලබයි. 'උපට්ඨාති ඔක්කන්තිත්වා පවත්තති පතිට්ඨාතීති පට්ඨානං, සතියෙව පට්ඨානං සතිපට්ඨානං." එළඹ සිටියි, බැස අවුත් පවතියි, පිහිටානුයි පට්ඨාන නම්. සිහියම පට්ඨාන වූයේනුයි සතිපට්ඨානයි. සිහිය පිහිටුවානුයි යන තේරුමයි. තවද තේරුමකි. "සරණට්ඨෙන සති, උපට්ඨානට්ඨෙන පට්ඨානං, සති ච සා පට්ඨානඤ්චාති සතිපට්ඨානං" සිහිකිරීම් අර්ථයෙන් සතියි එළඹ සිටීම් මැඩහිම් අර්ථයෙන් පට්ඨානයි. සිහිය වූයේත් පට්ඨාන වූයේත් එනුයි සතිපට්ඨාන නම්. සිහිය එළඹ සිටීම සතිපට්ඨානයයි කීජේයි.

මෙහි ආ කායානුපස්සනා සතිපට්ඨානය තුදුස් ආකාරයි. වේදනානුපස්සනා සතිපට්ඨානය නවාකාරයි. චිත්තානුපස්සනා සතිපට්ඨානය සොළොස් ආකාරයි, ධම්මානුපස්සනා සතිපට්ඨානය පස් ආකාරයි. ආනාපානසති, ඉරියාපථ මනසිකාර, චතුසම්පජඤ්ඤ, පටික්කූලසඤ්ඤා, ධාතු මනසිකාර, නවසීවථිකාය, මේ තුදුස කායානුපස්සනා සතිපට්ඨානයට අයත්ය. සුඛ, දුක්ඛ

අදුක්ඛමසුඛ. මේ ත්‍රිවිධ වේදනාවෝ සාමිස, නිරාමිස, භේදයෙන් නම වැදෑරුම් වෙත්. ඒ වේදනානුපස්සනා සතිපට්ඨාන භේදයි. සරාග, වීතරාග, සදෝස, වීතදෝස, සමෝහ, වීතමෝහ, සංඛිත්ත වික්ඛිත්ත, මහග්ගත, අමහග්ගත, සඋත්තර, අනුත්තර, සමාහිත, අසමාහිත, විමුත්ත, අවිමුත්ත, මෙසේ සොළොස් වැදෑරුම් සිත් වශයෙන් චිත්තානුපස්සනා සතිපට්ඨානය සොළොස් වැදෑරුම්ය. නීවරණ පර්වය, ස්කන්ධ පර්වය, ආයතන පර්වය, බොජ්ඣඞ්ග පර්වය, චතුසච්ච පර්වය යනු ධම්මානුපස්සනා සතිපට්ඨානයේ ප්‍රභේද පඤ්චකයයි. මෙහි පර්වය යනු කොටසයි.

## 3. සතර සම්‍යක් ප්‍රධාන

නූපන්නාවූ අකුශල ධර්මයන්ගේ නූපදීම පිණිස ගන්නා යහපත් වීර්‍ය්‍යය, උපන්නාවූ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස ගන්නා යහපත් වීර්‍ය්‍යය, නූපන්නාවූ කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස ගන්නා යහපත් වීර්‍ය්‍යය, උපන්නාවූ කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස ගන්නා යහපත් වීර්‍ය්‍යය, උපන්නාවූ කුශල ධර්මයන්ගේ පැවැත්ම පිණිස ගන්නා යහපත් වීර්‍ය්‍යය, මේ සතර සම්‍යක් ප්‍රධාන නමි.

4. සතර ඍද්ධිපාද: ඡන්දිද්ධිපාද, චිත්තිද්ධිපාද, විරියිද්ධිපාද, වීමංසිද්ධිපාද යනුයි. විස්තර ඉහතදීය.

5. සතරධ්‍යාන: ප්‍රථම-ද්විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යානයි.

6. සතර අප්‍රමාන්‍ය: මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ඛායි

7. සතර අරූප සමාපත්ති: ආකාසානඤ්චායතනාදීහුයි

8. සතර ප්‍රතිසම්භිදා: අර්ථප්‍රතිසම්භිදා, ධර්මප්‍රතිසම්භිදා, නෛරුක්ති ප්‍රතිසම්භිදා, ප්‍රතිභාන සම්භිදා යනුයි.

මේය ඉදිරියට විස්තරවෙයි

9. සතර ප්‍රතිපදා: දුක්ඛාපටිපදාදන්ධාභිඤ්ඤාදී සතරයි.

10. සතර ආරම්මණ: පරිත්තං පරිත්තාරම්මණං ආදීයෙන් ආ සතරයි. (මේවා සමාධි ලිපියෙහි ඇත.)

11. සතර ආර්‍ය්‍ය වංශ: අරියා වුච්චන්ති බුද්ධා ච පච්චෙක බුද්ධා ච තථාගත සාවකා ච, තෙසං අරියානං වංසා තන්තියො පවෙණියො ති අරියවංසා" බුදු පසේ බුදු රහත්

යන මුත්වගත්ථේරා ආර්යයෝයයි කියනු ලැබෙත්. ඒ ආර්යයන්ගේ වංශය, පෙළ, ප්‍රවේණිය, එනම් පරපුර ආර්යවංශ නම්. ආර්ය වංශ සතරෙකි. ලද සිවුරින් සතුටුවීම, ලද ආහාරයෙන් සතුටුවීම්, ලද සෙනසුනෙන් සතුටුවීම, සමථ - විපස්සනා භාවනා කෙරෙහි සිත් අලවා විසීම, යනුයි. (චීවර - පිණ්ඩපාත - සේනාසන - භාවනාරාමතා සතරයි.) සතුටුවීම ද දොළොස් ආකාරයි. යථාලාභ, යථාබල, යථා සාරුප්‍ය, මේ ත්‍රිවිධාකාර සන්තොෂය චීවරාදී ප්‍රත්‍යය සතරින් ගුණ කළ විට දොළොසක් වෙයි. ගිලාන ප්‍රත්‍යය - ගිලන් පස (බෙහෙත්) - පිණ්ඩපාත ප්‍රත්‍යයෙහිම සංග්‍රහ වෙයි. මේ සතර ආර්ය වංශයෝ ද සතර භූමිහු වෙත්.

12. සතර සංග්‍රහ වස්තු: "දානඤ්ච පෙය්‍යවජ්ජඤ්ච අත්ථචරියා ච සමානත්තතා ච" දන් දීම, ප්‍රිය වචනය, අර්ථ චර්‍ය්‍යා. සමානාත්මතාවය, යනුයි. සුදුසු පරිද්දෙන් කරන පරිත්‍යාගය දීම නම්. අනුන්ගේ සිත් සැනසෙන අයුරින් මොළොක් ලෙස කථා කිරීම ප්‍රිය වචනයයි. අර්ථචර්‍ය්‍යා නම් ඒ ඒ තැන්හි කළයුතු දේ කිරීම් වශයෙන් ද, කළයුතු - නොකළ යුතු දෑ පිළිබඳ අනුශාසනා කිරීම් වශයෙන් ද, දියුණුව කැමති වීමයි. සමානාත්මතාවය යනු "සහ මානෙන සමානො සපරිමානො සපරිගණොති අත්ථො, සමානො පරස්ස අත්තා එතෙනාති සමානත්තො, සමානත්තස්ස භාවො සමානත්තතා" මොහු මට වඩා පහත්ය, මොහු මා හා සමානය, මොහු මට වඩා උසස්ය, මේ වශයෙන් මැනීම සහිත වූයේ සමානයි. ප්‍රමාණ සහිත වූයේ ගිණුම් සහිත වූයේ, යන තේරුමයි. මෙයින් අනුනට සමාන ජීවිතයක් ඇත්තේනුයි සමානත්ත නම්. (තම ජීවිතය අනුන් හා සමාන කොට සැලකීමයි.) ඒ සමානත්තයාගේ ස්වභාවය සමානත්තතායි සුදුසු පරිද්දෙන් උපකාර කිරීම සමානත්තතාවය බව තේරුම් ගත යුතුය. ඇතැමෙක් "සමාන වූ සැප - දුක් ඇති බව" සමානාත්මතාවයයි කීහ. දානාදී වූ සඞ්ග්‍රහ වස්තු සතර ද භූමිහු වෙත්.

## 13. සතර චක්‍රයෝ.

මෙහි "චක්‍ර" ශබ්දයෙන් තේරුම් පහක් කියැවේ. දාරු චක්‍රය, රතන චක්‍රය, ධර්ම චක්‍රය, ඊර්‍ය්‍යාපථ චක්‍රය, සම්පත්ති චක්‍රය, යනුයි. "යං පනිදං දෙව චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි' දේවයිනි, රෑ හයක් අඩු මාස සයකින් නිම කරන ලද යම් මේ චක්‍රයක් වේ ද" - මෙහි ආයේ දාරු චක්‍රයයි. (ලී රෝදයයි) "චක්කං වත්තය තො පජිනෙබ්බං" යන තැන

රතන චක්‍රයයි. "මයා පවත්තිතං චක්කං" මේ ධර්ම චක්‍රයයි. "චතුචක්කං නවද්වාරං" මෙහි ඉරියාපථ චක්‍රය එයි. "චත්තාරිමානි භික්ඛවෙ චක්කානි යෙහි සමන්නාගතානං දෙවමනුස්සානං චතුචක්කං වත්තති, කතමානි චත්තාරි? පතිරූපදෙසවාසො, සප්පුරිසාපස්සයො, අත්තසම්මාපණිධි, පුබ්බෙ ච කතපුඤ්ඤතා"ති මෙහි ආයේ සම්පත්ති චක්‍රයයි. සතර භූමි විභාගයේදී එනුයේ මේ සම්පත්ති චක්‍රය මැයි. සම්පත්ති චක්‍ර සතරෙකි. සුදුසු ප්‍රදේශය, සත්පුරුෂාශ්‍රය, ආත්මයාගේ සම්‍යක් ප්‍රණිධිය, පූර්වයෙහි කෘතපුණ්‍යතාවය, යනුයි. එහි සුදුසු ප්‍රදේශය නම් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා, යන සිව්වණක් පිරිස වෙසෙන ස්ථානයි. ප්‍රදේශයි. බුද්ධාදී උතුමන් ආශ්‍රය කිරීම සත්පුරුෂාශ්‍රයයි. තමා මනාලෙස පිහිටීම එනම් තෙමේ ශ්‍රද්ධා ශීල, ත්‍යාගාදී ගුණයන්ගෙන් යුක්තවීම අත්තසම්මාපණිධි නම්. පෙර ආත්මභාවයන්හි රැස් කරන ලද පින් ඇති බව "පුබ්බෙකත පුඤ්ඤතා" මේ සම්පත්ති චක්‍රයෝ සතර භූමිහු වෙත්.

## 14. සතර ධර්ම පද:

"අනභිජ්ඣා ධම්මපදං, අබ්‍යාපාදො ධම්මපදං, සම්මාසති ධම්මපදං, සම්මාසමාධිධම්මපදං" අනභිධ්‍යාව - විෂම ලෝභය නොමැති බව -, අව්‍යාපාදය - මෛත්‍රිය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය, මේ සතර ධර්මපද නම්. මෙහි "පද" ශබ්දයෙන් කොටස කියැවේ. අලෝභාදී ධර්ම කොටස් සතර යන තේරුමයි. "අනභිජ්ඣා ධම්මපදං නාම අලොභො වා අනභිජ්ඣාවසෙන අධිගත ඣානවිපස්සනා මග්ගඵල නිබ්බානානි වා" අනභිධ්‍යා ධර්ම පදය යනු අලෝභය හෝ අනභිධ්‍යා වශයෙන් අවබෝධ කර ගත්, ධ්‍යාන, විදර්ශනා, මාර්ග, ඵල, නිර්වාණ, ධර්මයෝය. අනභිජ්ඣා යන්නෙන් මේ අදහස් දෙකම ගැනේ. අව්‍යාපාද ධර්ම පදය නම් නොකිපීමයි. නැතහොත් මෛත්‍රී ශීර්ෂයෙන් උපදවා ගත් ධ්‍යානාදීහුය. මනාලෙස පිහිටුවා ගත් සිහිය හෝ එසේ සිහියෙන් උපදවා ගත් ධ්‍යානාදිය හෝ සම්‍යක් ස්මෘති ධර්මපද නම්. අෂ්ටසමාපත්ති හෝ ඒ අනුසාරයෙන් උපදවා ගත් විදර්ශනාවට භූමි වූ ක්ෂණික සමාධිය හා උපචාර සමාධිය, මාර්ග, ඵල නිර්වාණ හෝ සම්‍යක් සමාධි ධර්මපදයි.

අතිකුදු විස්තරයෙකි. අනභිජ්ඣා ධම්මපද යනු දස අසුභ වශයෙන් උපදවා ගත් ධ්‍යානාදීහුය. අව්‍යාපාද ධම්මපද යනු සතර බ්‍රහ්මවිහාරයන්ගෙන් උපදවා ගත් ධ්‍යානාදීහුයි. දස අනුස්සති - ආහාරෙ පටික්කූල සඤ්ඤා වශයෙන් උපදවා ගත්

ධ්‍යානාදිය සම්මාසති ධම්මපදයි. දස කසිණ - ආනාපාන සති වශයෙන් උපදවා ගත් ධ්‍යානාදිය සම්මා සමාධි ධම්මපද නමි. මේ සතර ධර්මපදයෝ ද සතර භූමීහු වෙත්.

මෙසේ සතර බැගින් ආ ධර්මතුදුස (14) පිළිබඳ පිරිසිඳ දැනගන්නා නුවණ භූමිනානත්ත ඥාණ නමි.

භූමිනානත්ත ඥාණය නිමි

## 19. ධම්මනානත්ත ඥාණය.

“නවධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මනානත්ත ඤාණං” නවධර්මයන් ව්‍යවස්ථාපනයෙහි වූ ප්‍රඥාව ධම්මනානත්ත ඥාණ නමි. ඒ නව ධර්මයෝ කාමාවචර කුශලාදී වශයෙන් ද, ප්‍රමොද්‍ය මූලක වශයෙන් ද, යෝනිසෝමනසිකාර මූලක වශයෙන් ද, යන ක්‍රම තුනට අනුව නවය නවය බැගින් වෙත්. “නවධම්ම වවත්ථානෙති කාමාවචර කුසලාදි වසෙන පාමොජ්ජමූලක වසෙන යොනිසොමනසිකාර මූලකවසෙන ච නවන්නං නවන්නං ධම්මානං වවත්ථානෙ” යි එන අටුවා පාඨයෙන් එය පැහැදිලි වෙයි.

### 1. කාමාවචර කුශලාදී වශයෙන් එන ධර්ම නවය.

“කෙසේ නම් ධර්ම නවයක් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව ධම්මනානත්ත ඥාණය නම් වේද? කාමාවචර ධර්මයන් කුශල් වශයෙන් පිරිසිඳ දනියි. අකුසල් වශයෙන් පිරිසිඳ දනියි. අව්‍යාකෘත වශයෙන් පිරිසිඳ දනියි. රූපාවචර ධර්මයන් කුශල් වශයෙන් පිරිසිඳ දනියි. අව්‍යාකෘත වශයෙන් පිරිසිඳ දනියි. අරූපාවචර ධර්මයන් කුශල් වශයෙන් පිරිසිඳ දනියි. අව්‍යාකෘත වශයෙන් පිරිසිඳ දනියි. අපරියාපන්න - ලෝකෝත්තර ධර්මයන් කුශල් වශයෙන් පිරිසිඳ දනියි. අව්‍යාකෘත වශයෙන් පිරිසිඳ දනියි.” ප. ම. (සි. ප.)

මෙහි කාමාවචර ධර්මයන් කුසල, අකුසල, අව්‍යාකෘත වශයෙන් තෙවැදෑරුම්ව දක්වෙන අතර, සෙසු ධර්ම කුසල, අව්‍යාකෘත, වශයෙන් දෙවැදෑරුම්ව දක්වෙයි. එහෙයින් ප්‍රභේද නවයක් වේය. (3. 2x3 = 6, = 9.)

කාමාවචර ධර්මයන් කුශල් වශයෙන් පිරිසිඳ දැන ගැනීම නම් දශකුශල කර්මපථ වශයෙන් දැන ගැනීමයි. කාමාවචර කුශල් කුශල කර්ම, කුසල කර්මපථ, යන ක්‍රම දෙකකින් පවතී. මෙහිලා කර්ම; කර්මපථ, දෙක්හි වෙනස දතයුතුය.

“චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි” මහණෙනි, චෙතනාව කර්මයැයි මම කියමි. යනුවෙන් සඳහන් දේශනා පාඨයෙන් කර්මය පැහැදිලි වෙයි. මෙහි කර්මය යනුවෙන් හඳුන්වනුයේ සිතක පවත්නා වූ දෙපණස් චෛතසික අතුරෙන් චෙතනා චෛතසිකයයි. අදහසට සුදුසු වූ පරිද්දෙන් ඊට අවශ්‍ය සෙසු සිතුවිලි - චෛතසික - පිළියෙල කිරීම චෙතනාදියෙහි ලක්ෂණයයි. එහෙයින් කුසල් අදහසක් වුවහොත් සෙසු ශ්‍රද්ධාදීහු පිළියෙල කරයි. අකුසල් අදහසක් වූවහොත් රාගාදීහු පිළියෙල කරයි. මෙසේ පිළියෙල කරගනු ලබන සිතුවිලි පරපුර කර්ම නම්. කර්මයන්හි විපාක ප්‍රතිසන්ධි, ප්‍රවෘත්ති, වශයෙන් දෙයාකාරයි. එයින් ප්‍රතිසන්ධි විපාක දෙනුයේ, කර්මපථයනටය. ප්‍රවෘත්ති විපාක දෙනුයේ කර්මයනටය එහෙයින් ප්‍රවෘත්ති විපාක දෙන දුර්වලකම් කර්ම නම්. ප්‍රතිසන්ධි විපාක දෙන බලවත් කර්ම කර්මපථ නම්. මේ ප්‍රධාන වශයෙනි. අප්‍රධාන වශයෙන් ප්‍රතිසන්ධි විපාක දෙන කර්මපථ නූවහොත් ප්‍රවෘත්ති විපාක දෙන කර්මයන් කෙනෙත් ද ප්‍රතිසන්ධි විපාක දෙයි. කර්ම, කර්ම පථ; දෙක්හි වෙනස, පැහැදිලිවීමට උපමාවක් එනම්:-

වැද්දෙක් දඩයම් සඳහා දුනු ආදිය සූදානම් කරගෙන වන යට යෙයි. හේ වනයේ සෑම තන්හිම හැසිර දඩයමක් නො ලැබ ආපසු එයි. මෙහි ඒ වැද්දාට ප්‍රාණඝාත අකුශලය විනා අකුශල කර්ම පථයක් නොවිණ. මක්නිසා ද? සතෙකු නොමරූ හෙයිනි. මැරීමේ අදහස ඇතිව සිතූ සෑම සිතුවිල්ලක්ම කර්ම පමණක් විය. හේ එසේ හැසිර සතෙකු මැරූයේ නම් ඔහුට අකුසල කර්මපථ වෙයි. මක්නිසා ද? ප්‍රාණඝාත අකුසලයට අවශ්‍ය අඞ්ග සම්පූර්ණ වූ හෙයිනි. මෙසේ ක්‍රියාව කරන තෙක් බලපාන චෙතනා චෛතසිකය මුල්කොට ඇති සිතුවිලි කර්ම නම්. අඞ්ග සම්පූර්ණ වී එය සිදුකළ විට කර්ම පථ නම්.

## කුශල කර්ම පථ දශයෙකි.

“දස කුසල කම්මපථා නාම පාණාතිපාතා අදින්නාදානා කාමෙසු මිච්ඡාචාරා වෙරමණීති තීණි කායසුචරිතානි, මුසාවාදා පිසුණාවාචා ඵරුසාවාචා, සම්ඵප්පලාපා වෙරමණීති චත්තාරි වචී සුචරිතානි, අනභිජ්ඣා අව්‍යාපාදො සම්මාදිට්ඨීති තීණි මනොසුචරිතානි” - ප. ම. අ.

සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, මේ තුනෙන් වැළකීම කායසුචරිතයයි. බොරු කීම, කේලාම් කීම, නපුරු වචන කීම, හිස් වචන කීම, මේ සතරින් වැළකීම වචී සුචරිතයයි අන්සතු දේට ආශා නොකිරීම, මෛත්‍රිය, යහපත් දැකීම, මේ තුන මනො සුචරිතයයි මෙසේ කුශල කර්ම පථ දශයෙකි.(සීලමය ලක්ෂණය බලන්න. වෙරමණී සීලයෙහි විස්තර ඇත.

## අකුසල කර්ම පථ දශයෙකි.

"දස අකුසල කම්මපථා නාම පාණාතිපාතො අදින්නා දානං, කාමෙසු මිච්ඡාචාරොති තීනි කායදුච්චරිතානි, මුසා වාදො පිසුණාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපොති චත්තාරි වචීදුච්චරිතානි, අභිජ්ඣා ව්‍යාපාදො මිච්ඡාදිට්ඨීති තීනි මනො දුච්චරිතානි" – ප. ම. අ. තේරුම පහසුයි විස්තර මෙසේය.

1. ප්‍රාණඝාතය: "පාණස්ස අතිපාතො පාණාතිපාතො" ප්‍රාණයාගේ අතිපාතනය – සත්වයකුගේ ජීවිතය තොර කිරීම – ප්‍රාණාතිපාත නම්. ප්‍රාණවධ, ප්‍රාණඝාත, යනුදු කියනු ලැබේ. මෙහි "ප්‍රාණ" යනු සම්මුති වශයෙන් සත්වයාය. පරමාර්ථ වශයෙන් ජීවිතින්ද්‍රිය. ඒ සත්වයා නැතහොත් ජීවිතින්ද්‍රිය නියමිත කාල සීමාව තෙක් පැවතීමට අවකාශ නොදී අතරතුරදී හෙළීම, විනාශ කිරීම, ප්‍රාණඝාතයයි සමාන්‍ය ව්‍යවහාරය "මැරීම" යනුයි. අනුන් ලවාද කරවිය හැකි නිසා "මැරවීම" ද ගත හැක. එය සම්පූර්ණ වීමට අඞ්ග – කරුණු – පහක් අවශ්‍යය.

"පාණො හවෙ පාණසඤ්ඤී – වධකචිත්තමුපක්කමො
තෙන ජීවිත නාසො ච - අඞ්ගා පඤ්ච වධස්සව"

පණ ඇති සතෙකුවීම, පණ ඇති බැව් දැනීම, මැරීමේ අදහස, උපක්‍රමය, එයින් මරණයට පත්වීම, යන පසයි. අනුන් ලවා මැරවීමේදී අඞ්ග සතක් සම්පූර්ණ විය යුතුය. එනම් මුල් කරුණු සතර හා (එයින් මරණයට පත්වීම හැර) අනිකෙකුට නියෝග කිරීම, ඒ නියමය පිළිගැනීම, නියම ලෙස මැරීම, යන තුනයි. ප්‍රාණඝාතයේදී ශීලාදී ගුණ නැති තිරශ්චීනගත සත්වයන් අතුරෙන් කුඩා සත්වයන් මැරුවහොත් අල්ප සාවද්‍ය වේ. – වරද කුඩාය. ලොකු සත්වයන් පිළිබඳ මහාසාවද්‍යයි. මක්නිසා ද? ප්‍රයෝග – උත්සාහය – මහත් නිසාය. මේ ආදී වශයෙන් අල්ප සාවද්‍ය, මහා සාවද්‍යතාවයන් දතයුතුය. විස්තර කිරීමට ගියහොත් ප්‍රපඤ්ච – ප්‍රමාද වේ,

2. අදත්තාදානය අදින්නාදාන යනුද යෙදේ. මෙහි "අදින්න" යනු අනුන් විසින් නුදුන් දෙයයි. ආදාන නම් ගැනීමයි. (අදින්න + ආදාන අදින්නාදාන) නුදුන් දේ ගැනීම අදින්නාදාන නම් මෙහි අංග පසක් සම්පූර්ණ විය යුතුය "පරපරිග්ගහිතං පරපරිග්ගහිතසඤ්ඤිතා, ථෙය්‍යචිත්තං උපක්කමො, තෙන හරණං" අනුන් සතු දෙයක් වීම, ඒ බව් හැඟීම හොර සිත, උපක්‍රමය, එයින් ගැනීම, යන පසයි අදින්නාදානය විස්තර කරතොත් පස්විසි අවහාර කිවයුතුය

3. කාමමිථ්‍යාචාරය: ලාමක හැසිරීමයි. "කාමෙසු මිච්ඡාචාරොති එත්ථ පන කාමෙසූති මෙථුනසමාචාරෙසු මිච්ඡාචාරොති එකන්තනින්දිතො ලාමකාචාරො, ලක්ඛණතො පන අසද්ධම්මාධිප්පායෙන කායද්වාරප්පවත්තා අගමනීයට්ඨානවීතික්කමචෙතනා කාමෙසු මිච්ඡාචාරො" - අත්ථසාලිනී කාමයන්ගේ වරදවා හැසිරීම යන මෙහි කාමයන්හි යනු මෛථුන ධර්මයන්හි හැසිරීමයි. මිථ්‍යාචාරය නම් ඒකාන්තයෙන් නින්දිත ලාමක හැසිරීමයි, ලක්ෂණ වශයෙන්, වැරදි ලෙස හැසිරීමේ කැමැත්තෙන් කායද්වාරයෙහි පැවත නොයායුතු ස්ථාන කඩ කිරීමේ අදහස කාමමිථ්‍යාචාර යනුයි. ස්ත්‍රී - පුරුෂ දෙදෙනෙකු පිළිබඳ කෙරෙන ලාමක හැසිරීම මෛථුන සමාචාරයයි. මහජන නීතිය කඩකර ඒ හැසිරීම වැරදි ලෙස කළහොත් එය කාමමිථ්‍යාචාර නම් මෙහි පුරුෂයා විසින් නොයායුතු ස්ත්‍රීහු විසිදෙනෙකි. ඔවුන් කෙරෙහි ඒ ලාමක හැසිරීම කළහොත් පුරුෂයාට කාමමිථ්‍යාචාර අකුශලය සිදුවේ. ස්ත්‍රියට නම් නියමිත පුරුෂයා හැර අන් පුරුෂයන් කෙරෙහි හැසිරීමෙන් කාමමිථ්‍යාචාර අකුශලය සිදුවේ. - අඹුසැමියන් වීමේ බලාපොරොත්තුව ඇතිව කෙරෙන හැසිරීමෙන කාමමිථ්‍යාචාර අකුශලය නො සිදුවේ. කාමමිථ්‍යාචාරයට අංග සතරෙකි. 'අගමනීය වත්ථු තස්මිං සෙවන චිත්තං, සෙවන පයොගො, මග්ගෙනමග්ගපටිපත්ති, අධිවාසනං" නො යායුතු වස්තුවක්වීම හා එහි සෙවන සිත, සේවනය සඳහා කෙරෙන ප්‍රයොගය, මාර්ගයෙන් මාර්ගය, පිළිපැදීම - ප්‍රවේශය - ඉවසීම, යන සතරයි. මෙහි ප්‍රයොග එකකි. තමා විසින්ම උත්සාහ කිරීම පමණි. (ආණත්තියෙන් අකුසල් නැත.)

4 මුසාවාදය: මුසා යනු බොරුවයි. වාද නම් කීමයි. බොරු කීම මුසාවාද නම්. තවද තේරුමකි. "මුසාති විසංවාදනපුරෙක්ඛාරස්ස අත්ථභඤ්ජනකො වචීපයොගො කායපයොගො වා, විසංවාදනාධිප්පායෙන පරස්ස පරං විසංවාදකා

කායවචීපයොගසමුට්ඨාපිකා චෙතනා මුසාවාදො” මුළා කිරීමේ අදහස පෙරටු කොට ඇතියහුගේ, දියුණුව විනාශකරන වාග් ප්‍රයෝගය හෝ කාය ප්‍රයෝගය හෝ “මුසා” නම්. මුළා කිරීමේ අදහසින් අනුන් විසින් අනුන්ව මුළා කරන කායවාග් ප්‍රයෝගයන්ගෙන් ඔසවන ලද චෙතනාව මුසාවාද නම් මෙසින් ගතයුතු කෙටි තේරුම; අනුන් මුළා කිරීමේ අදහසින් වචනයෙන් හෝ කයින් හෝ නොසිදු වූ දෙයක් සිදුවූ හැටියට හෝ සිදුවෙන හැටියට හෝ හැඟවීම මුසාවාද නම්. යනුයි මුඛයෙන් පමණක් නොව කයින් ද මුසාවාද අකුශලය සිදුවන බව මේ විස්තරයෙන් පෙනේ. අනිකුදු තේරුමක් ඇත. “මුසාති අභූතං අතච්ඡං වත්ථු, වාදොති තස්ස භූතතො වා තච්ඡතො වා විඤ්ඤාපනං” මුසා යනු නොසිදු වූ, බොරු වූ දෙයයි. එය සිදු වූ සත්‍ය වූ දෙයක් හැටියට හැඟවීම වාදයි. නොසිදු වූ බොරු වූ දෑ ඒ අයුරින් කීම හෝ කයින් හැඟවීම හෝ මුසාවාද නම්. මුසාවාද අකුශලයට අඞ්ග සතරෙකි. ‘අතථං වත්ථු, විසංවාදන චිත්තං තජ්ජො වායාමො, පරස්ස තදත්ථ විජානනං” අසත්‍ය වස්තුව, බොරු කීමේ සිත. එයට ගන්නා උත්සාහය, අනුන් විසින් එය දැනීම යනුයි.

5. පිසුණාවාචා: ප්‍රිය භාවය විනාශ කරන වාග් සමූහය පිසුණාවාචායි. එනම් කේලාම් කීමයි. දෙදෙනෙකු අතර ඇති අන්‍යොන්‍ය මිත්‍රකම යම් වචනයකින් බිඳෙයි ද එබඳු වචන කීම කේලාම් කීම යනුවෙන් අදහස් කෙරේ “යාය වාචාය යස්ස තං වාචං භාසති තස්ස හදයෙ අත්තනො පියභාවං පරස්සච පියසුඤ්ඤභාවං කරොති සා පිසුණා වාචා” අත්ථසාලිනී. යම් වචනයක් කරණ කොට යමෙකුට ඒ වචනය කියයි ද ඔහුගේ සිතෙහි තුබූ තමාගේ ප්‍රියභාව ද අනෙකාගේ ප්‍රිය භාවය ද හිස් කරයි ද, එබඳු වචනය කේලාම් නම් යනු එහි අදහසයි. මේ විග්‍රහයෙන් කේලාම් වචනය පැහැදිලි වෙයි. කවුරුන් විසින් හෝ කියන ලද වචනයක් මිත්‍රවූ දෙදෙනාගේම ප්‍රිය භාවය සැමැත්ත-විනාශ වෙයි ද ඒ වචනය කේලම බව දත යුතුය. පිසුණ වචනයෙහි අඞ්ග සතරකි. බිඳියයුතු අන්‍යයෙක් වීම, ‘මෙසේ මේ වුහු බිඳෙන්නාහුය” යන බිඳීම අදහස පෙරටුවීම, හෝ “මෙසේ මම ප්‍රියයෙක් විශ්වාසයෙක් වෙමි” යි ප්‍රිය බව කැමතිවීම හෝ යන දෙකින් එකක්, බිඳුවීම සඳහා ගන්නා උත්සාහය, ඔහුගේ ඒ බිඳුවීම සඳහා කියන දෑයෙහි තේරුම දත හැකීම, යන සතරයි. ඇතැම් තැනක උත්සාහ අඞ්ගය නොකියැවේ.

6. ඵරුසා වාචා: නපුරු වචන කීමයි. "යාය පන අත්තානම්පි පරම්පි ඵරුසං කරොති, යා වාචා සයම්පි ඵරුසා නෙව කණ්ණසුඛා න හදයඞ්ගමා අයං ඵරුසා වාචා නාම" යම් වචනයක් නිසා තෙමේ ද අනුන් ද සැඩ - රළු - කරයි ද, යම් වචනයක් තෙමේම - ඒ වචනයම - සැඩ වූයේ ඇසීමට අමිහිරි ද, සිත්හි ලා දරීමට නොහැක්කේ ද, එය ඵරුස වචන නම්. මෙසේ කියන්නාත් අසන්නාත් කියනු ලබන වචනයත් යන තුන් පක්ෂයම සැඩ ඝෝරෝජු නපුරු ස්වභාවයන්ටම හැරේ නම් ඒ ඵරුස වචන බව දතයුතුය. මෙහි අඞ්ග තුනෙකි. බිණිය යුතු කෙනෙක් වීම, කිපුණා වූ සිත, බිණීම, යනුයි. (අක්කොසිතබ්බො පරො, කුපිත චිත්තං, අක්කොසනං)

7. සම්ඵප්පලාප: හිස් වචන කීමයි. "අනත්ථ විඤ්ඤාපිකා කායවචී පයොග සමුට්ඨාපිකා අකුසල චෙතනා සම්ඵප්පලාපො" නිරර්ථක - වැඩක් නැති - දෙයක් හැඟවීම් වශයෙන් කය - වචන දෙකින් ප්‍රයෝගයට උත්සාහ කරවන ලද අකුශල සිතුවිල්ල සම්ඵප්පලාප නම්. මෙහි ස්වභාවය තමාටත් අසන්නාටත් කිසිදු වැඩක් සලසා නොදෙන දෑයක් බිණීමයි. සම්ඵප්පලාපයට අඞ්ග දෙකකි. භාරත යුද්ධ - සීතාහරණාදී නිරර්ථකකථාවක් පෙරටුවීම, එබඳු දෑයක් කීම යනුයි.

8. අභිජ්ඣා: විෂම ලෝභයයි. "අභිජ්ඣායතීති අභිජ්ඣා පරභණ්ඩාභිමුඛී හුත්වා තන්නින්නතාය පවත්තතීති අත්ථො" දැඩි ලෙස ආශා කෙරේනුයි අභිජ්ඣා නම්. අනුන්ගේ බඩු දෙස නෙත් හෙලා ඒවා තමා වෙත නමා ගැනීම වශයෙන් පවතී යන තේරුමයි. මෙහි ලක්ෂණය "අහෝ මට මෙය ඒකාන්ත යෙන් ඇත්නම්" යනුවෙන් අනුන්ගේ දේ පිළිබඳ ආශා කිරීමයි, අඞ්ග දෙකකි. අන් සතු දෙයක් වීම, තමා වෙත පිරිනමා ගැනීමේ සිත, නුයිය.

9. ව්‍යාපාදය: ක්‍රෝධයයි. "හිතසුඛං ව්‍යාපාදයතීති ව්‍යාපාදො" හිත සැප විනාශ කෙරේනුයි ව්‍යාපාද නම්. අනුන් ගේ විනාශය පිණිස තම සිත කිපීම් වශයෙන් දූෂිත වීම ලක්ෂණයැයි. මෙහි අඞ්ග දෙකකි. අන් කෙනෙකු වීම, විනාශ කිරීමේ සිත යනුයි

10. මිථ්‍යා දෘෂ්ටිය: වැරදි දැක්මයි. මෙය සූත්‍රමය ඤාණ විස්තරයේ දී දක්වූ දසමිච්ඡත්තයන්හි දසවැන්නයි. එය බලන්න. මෙහි අඞ්ග දෙකකි. වස්තුහුගේ ගන්නා ආකාරයෙහි වෙනස් බව යම් ලෙසකින් එය ගණියි ද ලෙසින්ම වැටහීම, යනුයි. (වත්ථුනො ච ගහිතාකාරවිපරීතතා, යථා ච තං ගණ්හාති තථාභාවෙන තස්සුපට්ඨානං) මේ දශ අකුශල කම්පථයි

iii රූප ද, විපාක ද, ක්‍රියා ද, අව්‍යාකෘත වශයෙන් පිරිසිඳ දනියි. මේ කාමාවචර ධර්මයන් පිරිසිඳ දැකීමේ තුන් වැනි ක්‍රමයයි. මෙහි රූප නම් ඉහතදී විස්තර කළ අටවිසිරූප මැයි. විපාක යනු කාමාවචර කුශල විපාක සොළස හා අකුශල විපාක සත යන තෙවිසි විපාකයි. අහේතුක ක්‍රියා සිත් තුන සහේතුක ක්‍රියා අට යන එකොළස ක්‍රියා නම්.

"රූපාවචර ධර්මයන් කෙසේ කුසල් වශයෙන් පිරිසිඳ දනීසිද, අව්‍යාකෘත වශයෙන් පිරිසිඳ දනීසිද?"

iv මනුෂ්‍ය ලෝකයෙහි සිටි ධ්‍යානලාභී පුද්ගලයාගේ ප්‍රථම ධ්‍යානාදී සතර ධ්‍යානයන් හෝ පඤ්චම ධ්‍යානයන් හෝ කුශල යැයි පිරිසිඳ දනියි. ධම්මනානත්ත ඤාණ ලාභී පුද්ගලයා ය මෙසේ දනුයේ. සෙසු තත්හි ද මෙම කරුණ මතක තබා ගතයුතුය. ධ්‍යාන කුශල් මනුෂ්‍ය ලෝක වශයෙන් දේශනා කළේ නමුදු දිව්‍යලෝකයෙහි ද බ්‍රහ්මලෝකයෙහිද ඇත්තේය. "යෙභුය්‍යෙන මනුස්සලොකෙ ඣාන භාවනා සම්භාවතො මනුස්ස ලොකවසෙන වුත්තං, ඣානානි පන කදාචි කරහචි දෙවලොකෙපි ලබ්භන්ති, රූපී බ්‍රහ්මලොකෙපි තත්‍රූපපත්තික හෙට්ඨුප්පත්තික උපරූපපත්තිකානං වසෙන ලබ්භන්ති" බොහෝ සෙයින් මනුෂ්‍ය ලෝකයෙහි ධ්‍යාන භාවනා පවතින බැවින් මනුෂ්‍ය ලෝක වශයෙන් කියන ලදී. ධ්‍යාන වනාහී ඇතම්විට දිව්‍යලෝකයෙහිද ලැබෙයි. රූපී බ්‍රහ්ම ලෝකයෙහි ද එහි උපන්, යට ලෝකයන්හි උපන්, උඩ ලෝකයන්හි උපන්, අයගේ වශයෙන් ලැබෙයි යන මේ අටුවා පාඨයෙන් එය පැහැදිලි කෙරේ. දිව්‍යලෝකයේ පඤ්චකාමය අධිකව ඇතත් ඇතැම්විට ඇතැම් දෙවියෝ ඒවාහි නොඇලී ධ්‍යාන වඩත්. බ්‍රහ්මලෝකයන්හි ද යට බ්‍රහ්මලෝකයන්හි උපන් බ්‍රහ්මයෝ මතු ලෝකයන්හි ඉපදීම සඳහා ධ්‍යාන වඩත්. ඒවාට පත්වූවෝ ශුද්ධාවාසයන්හි ඉපදීම සඳහාද විදර්ශනා භාවනාවට උපයෝගී කරගැනීම සඳහා ද ධ්‍යාන වඩත්.

v. අබ්‍යාකත වශයෙන් පිරිසිඳ දැනීම යනු බ්‍රහ්ම ලෝකයෙහි ඉපදුනහුගේ ප්‍රතිසන්ධි, භවඞ්ග, චුති, වශයෙන් පවත්නා ධ්‍යාන විපාක සතර පිළිබඳ පිරිසිඳ දැනීමයි. සමාපත්ති වශයෙන් එන ක්‍රියා සිත් කුශලයට ම සංග්‍රහ වූ බැවි අටුවාව කියයි. "රූපාවචරජ්ඣාන සමාපත්තිසු කිරියා බ්‍යාකතානීන වුත්තානි. කිඤ්චාපින වුත්තානි, අථ ඛො කුසලෙහි සමාන

පවත්තිත්තා කුසලෙසු වුත්තෙසු වුත්තානෙව හොන්තීති වෙදිතබ්බානි යනුයි මෙසේ රූපාවචර ධර්මයන් කුශල් වශයෙන් පිරිසිඳ දනියි. අව්‍යාකෘත වශයෙන් පිරිසිඳ දනියි.

“අරූපාවචර ධර්මයන් කෙසේ කුශල් වශයෙන් පිරිසිඳ දනියි ද? අව්‍යාකෘත වශයෙන් පිරිසිඳ දනියි ද?

vi, vii මනුෂ්‍ය ලෝකයෙහි සිටි අරූපාවචර ධ්‍යානලාභී පුද්ගලයාගේ ධ්‍යාන සිත් සතර ද අරූපී බ්‍රහ්ම ලෝකයේ උපන්නහුගේ ප්‍රතිසන්ධි, භවඞ්ග, චුති, වශයෙන් පවත්නා විපාක සිත් සතර ද යන මේ වශයෙන් කුශල්, අව්‍යාකෘත පිරිසිඳ දනියි, සැලකිය යුතු:- එහි ප්‍රතිසන්ධිය හුදෙක් ජවනායතනය සිත පහලවීම පමණි.

“අපරියාපන්න – ලෝකෝත්තර – ධර්මයන් කෙසේ කුශල් වශයෙන් පිරිසිඳ දනියිද? අව්‍යාකෘත වශයෙන් පිරිසිඳ දනියිද?

viii. සතර ආර්‍ය මාර්ගයන් කුශල් වශයෙන්ද ix සතර ආර්‍ය ඵලයන් අව්‍යාකෘත වශයෙන්ද පිරිසිඳ දනියි.

කුශල් වූ මාර්ග සිත් නැවත ඉපදීමක් නො කළ හැකි බැවින් ක්‍රියා සිත් නොමැතිබව දතයුතු. මෙතෙකින් කාමාවචර කුශලාදී වශයෙන් ආ ධර්ම නවය අවසානයි.

## 2. ප්‍රමෝද්‍ය මූලක වශයෙන් එන ධර්ම නවය

‘ප්‍රමෝද්‍යට බලවත් නොවූ ප්‍රීතියට හේතු වූ ධර්ම නවයෙකි. අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට දුර්වල ප්‍රීතිය උපදියි. දුර්වල ප්‍රීතිය උපන්නහුට බලවත් ප්‍රීතිය උපදියි. ප්‍රීතියෙන්යුත් සිත් ඇත්තහුගේ නාමකාය සංසිඳෙයි. සංසිඳුනු නාමකාය ඇත්තේ මානසික සුවය ලබයි. සැපයෙන් යුක්ත වූවහුගේ. සිත සමාධියට පැමිණෙයි. සිත සමාධියට පැමිණි කල්හි තත්ත්වාකාරය ඇති සැටි දනියි. දකියි තත්ත්වාකාරය දන්නා දක්නා තැනැත්තේ කලකිරෙයි. කලකිරෙන්නේ (මාර්ගයට පැමිණීම වශයෙන්) නො ඇලෙයි. නො ඇලෙන්නේ (ඵලයට පැමිණීම වශයෙන්) මිදෙයි. දුක් වශයෙන්-පෙ-අනාත්ම වශයෙන්-පෙ-රූපය අනිත්‍ය වශයෙන්-පෙ- වේදනා -පෙ-ප. ම. (සිං. ප)

මෙහි හඳහන් වූයේ විදර්ශනා ක්‍රමයයි. එයට ඇතුලත් වූ කරුණු නවයක් දුර්වල ප්‍රීතිය මුල්කොට පවතින හෙයින් ප්‍රමෝද්‍ය මූලක වශයෙන් එන ධර්ම නවයකැයි කියැවේ. ඔව්හු නම්:-

පාමොජ්ජ, පීති, පස්සද්ධි, සුඛ, සමාධි, යථාභූත ඤාණය, නිබ්බිදා, විරාග, විමුත්ති යනුයි විස්තර වශයෙන් නාමරූප පරිග්‍රහයට ඇතුළත් වූ ධර්ම සමූහය පිළිබඳව ම අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කිරීම දක්වේ. එහි ගතයුතු සාරාංශය පමණි මෙහිලා සඳහන් කළේ.

## 3. යෝනි සෝමනසිකාර මූල ධර්ම නවය

“යෝනිසෝමනසිකාරය (නුවණින් මෙනෙහි කිරීම) මුල් කොට ඇති ධර්මයෝ නවදෙනෙක් වෙති. අනිත්‍ය වශයෙන් නුවණින් මෙනෙහි කරන්නාහට දුර්වල ප්‍රීතිය උපදියි. දුර්වල ප්‍රීතිය ඇතිවූවහට බලවත් ප්‍රීතිය උපදියි. බලවත් ප්‍රීතියෙන් යුක්ත වූවහුගේ කය සංසිඳෙයි. සංසිඳුනු කය ඇත්තේ සැපය ලබයි. සැප ඇත්තහුගේ සිත සමාධියට පැමිණෙයි. සමාධියට පැමිණි සිතින් “මේ දුකයැ”යි ඇති සැටියෙන් දනියි. මේ දුක් ඇතිවීමේ හේතුව යැයි ඇති සැටියෙන් දනියි. මේ දුක නැති කිරීමට යයි ඇති සැටියෙන් දනියි. මේ දුක් නැති කිරීම පැමිණෙන පිළිවෙත යැයි ඇති සැටියෙන් දනියි. දුක්ඛ වසයෙන්-පෙ ”

මෙහි ඇති ධර්ම නවය නම් පාමොජ්ජ, පීති, පස්සද්ධි. සුඛ, සමාධි, දුක්ඛ-සමුදය-නිරෝධ-මග්ග යන චතුරාර්ය සත්‍යයන් පිළිබඳව ම යෙදෙන යථාභූත ඤාණය යනුයි. යෝනි සෝමනසිකාරය නිසාම මේ ධර්ම ලැබෙන හෙයින් මූලකයැයි දක්වූහ.

මෙසේ කාමාවචර කුශලාදී වශයෙන් ද, ප්‍රමොද්‍ය මූලක වශයෙන් ද, යෝනිසෝමනසිකාර මූලක වශයෙන් ද නවය බැගින් නව ධර්ම කෙනෙක් වෙත්.

## නානත්ව නවය

“ධාතු නානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං යනාදී වශයෙන් ධම්මනානත්ත ඤාණයෙහි නානත්ත නවයක් දක්වේ. ඔව්හු නම්:- ධාතු-ඵස්ස-වේදනා-සඤ්ඤා-සංකප්ප ඡන්ද පරිළාහ-පරියේසන-ලාභනානත්වය යනුයි මෙහි නානත් වය යනු වෙනස් ආකාරයයි. එක් ආකාරයක් නොවන බවයි. ධාතු නම් චක්ඛුධාතු ආදී අටළොස් ධාතුයි. සුතමය ඤාණ විස්තරයෙහි මොවුන් දක්වා ඇත. මෙසේ ධාතු පිළිබඳ වෙනස්

ආකාරය ධාතුනානත්ත නම්. සෙසු තන්හි ද "නානත්ත" යන්නෙහි අදහස මේ කී පරිදිම ය. චක්ඛාදිධාතුනානත්වය නිසා ඵස්සනානත්වය උපදී. චක්ඛුසම්ඵස්ස, සෝතසම්ඵස්ස ආදී වශයෙනි. ඵස්ස නානත්වය නිසා වේදනා නානත්වය උපදී. චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝතසම්ඵස්සජා වේදනා, ආදී වශයෙනි. වේදනා නානත්වය නිසා සඤ්ඤානානත්වය උපදී. කාමසඤ්ඤා. පටිඝ සඤ්ඤා යනාදීහුයි. සඤ්ඤා නානත්වය නිසා සංකල්පනා නානත්වය උපදී. කාමසංකල්පනා; ව්‍යාපාද සංකල්පනා, යනාදියයි. සංකල්පනා නානත්වය නිසා ඡන්දනානත්වය උපදී. රූපච්ඡන්දය, ශබ්දච්ඡන්දය, ආදී වශයෙනි. ඡන්දනානත්වය නිසා පරිළාහ නානත්වය උපදී. රූප පරිළාහය, ශබ්දපරිළාහය, ආදියයි. පරිළාහ නානත්වය නිසා පරියෙසන නානත්වය උපදී. රූප පරියෙසන, සද්ද පරියෙසනාදියයි. පරියෙසන නානත්වය නිසා ලාභ නානත්වය උපදී. රූප ප්‍රතිලාභාදිය යි. මෙසේ මේ නව ධර්මයන්ගේ නානත්වය ධර්ම නානත්ත නම්. ඉහතින් කී නව ධර්මයන් ඇතුළත්කොට ඇති මේ නව ධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ධම්මනානත්ත ඤාණ ය යි.

## 20 වැනි පරිච්ඡේදය

## "ඤාතට්ඨ ඤාණාදි ඤාණ පඤ්චකය"

### 20. ඤාතට්ඨ ඤාණය

"අභිඤ්ඤා පඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං" විශෙෂ දැනීමෙහි ප්‍රඥාව ඤාතට්ඨ ඤාණ නම්. ඒ විශෙෂ දැනීම නම් "අභිඤ්ඤෙය්‍ය" නිර්දෙශයෙහි දක්වූ ධර්මයන් පිළිබඳ ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨානාදී වශයෙන් පිරිසිඳ දැනීමයි (සුතමය ඤාණයෙහි අභිඤ්ඤෙය්‍ය කොටස බලන්න) එහෙයින් ඒ ධර්මයන්ගේ ලක්ෂණරසාදිය පිළිබඳ වෙන වෙනම දැනගැනීමෙහිලා උපකාරී වන ප්‍රඥාව ඤාතට්ඨ ඤාණයයි. මෙයට "ඤාතපරිඤ්ඤා යන නමකි. එහිලා පරිඤ්ඤා තුනෙක් ඇත. "තිස්සො හි පරිඤ්ඤා ඤාත පරිඤ්ඤා තීරණ පරිඤ්ඤා පහාණ පරිඤ්ඤා ච" රූපය රුප්පන - වෙනස්වන - ලක්ෂණයි, වෙදනාව වෙදයිත ලක්ෂණයි යනාදී වශයෙන් ඒ ඒ ධර්මයන්ගේ වෙන වෙනම පවතින ලක්ෂණාදිය දැනීම් අයුරින් පවත්නා නුවණ ඤාත පරිඤ්ඤායි. රූපය අනිත්‍යය යි, දුඃඛය යි අනාත්මය යි යනාදී වශයෙන් ඒ ඒ ධර්මයන්ගේ සාමාන්‍ය පොදු ලක්ෂණය නාංවා පැවතියා වූ ත්‍රිලක්ෂණය අරමුණු කොට ඇති විදර්ශනා ප්‍රඥාව තීරණපරිඤ්ඤා නම්. ඒ ධර්මයන්ගේම නිත්‍ය, සුභ, සුඛාදී සඥාවන් දුරුකිරීමේ ප්‍රඥාව පහාණ පරිඤ්ඤා නම්. මෙසේ පරිඤ්ඤා තුනෙකි.

එහි සංස්කාර ධර්මයන් පිරිසිඳීමෙහි පටන් - දිට්ඨි විසුද්ධියයි - ප්‍රත්‍යය පරිග්‍රහය තෙක් ඤාණ පරිඤ්ඤාවට භූමියි. ඒ අතර තුර ඇති ධර්මයන්ගේ වෙන වෙනම ලක්ෂණ ප්‍රතිවේධ කිරීම සඳහා ඤාතපරිඤ්ඤා උපකාරයි. කලාප සම්මර්ශනයේ සිට උදයව්‍යය ඥානය තෙක් තීරණ පරිඤ්ඤාවට භූමියි. එහි ප්‍රඥාව ඒ ඒ ධර්මයන්ගේ පොදු ලක්ෂණය අවබෝධ කිරීමට උපකාර වෙයි. භඞ්ගානුදර්ශනයේ සිට මත්තට ඇති විදර්ශනා ක්‍රම පහාණපරිඤ්ඤාවට භූමියි. එහි වූ ප්‍රඥාව නිත්‍ය සඥාදිය දුරු කිරීමට උපකාර වෙයි. මේ පරිඤ්ඤා අතුරෙන් ඤාතපරිඤ්ඤා නම් වූ ධර්මයන්ගේ ලක්ෂණාදිය අවබෝධ කරගන්නා නුවණ සම්පූර්ණවීම් වශයෙන් ගෙන ඤාතට්ඨඤාණයැයි කියනු ලැබේ. ලෝකෝත්තර ධර්ම උපදවත්ම ඒ ඤාණ සම්පූර්ණ වේ.

“කෙසේ නම් විශේෂ ඥානයෙන් දන්නා වූ ප්‍රඥාව ඤාතට්ඨ ඤාණය නම් වේද? යම් ධර්ම කෙනෙක් විශේෂ ඥානයෙන් දන්නා ලද්දාහු ද, ඒ ඒ ධර්මයෝ දැනගන්නා ලද්දාහු නම් වෙත්. එය දැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් විශේෂයෙන් දැනගන්නා වූ ප්‍රඥාව ඤාතට්ඨ ඤාණයයි.” යන දේශනා පාඨයෙන් ඒ බැව් පැහැදිලි වේ. තවද දැනීම් සවභාව ඇති නුවණ ඤාතට්ඨ ඤාණයයි අටුවාවේ සඳහන් වෙයි. “ඤාතට්ඨෙ ඤාණන්ති ජානන සභාවං ඤාණං” මෙයිනුදු දැනීමේ සම්පූර්ණ බව හැඟවේ.

## 21. තීරණට්ඨ ඤාණය

“පරිඤ්ඤා පඤ්ඤා තීරණට්ඨෙ ඤාණං” පිරිසිඳ දැනීමෙහි නුවණ තීරණට්ඨ ඥාන නම්. මෙහි ‘පරිඤ්ඤා” යන්නෙන් තීරණ පරිඤ්ඤා ගැනේ. එහෙයින් අභිඤ්ඤෙය්‍ය ධර්ම විෂයෙහි වූ අනිත්‍යාදි ලක්ෂණයන් විශේෂයෙන් එන පරිච්ඡේද ඥානය තීරණට්ඨ ඤාණයයි. මාර්ග - ඵල ලාභිත්වයෙන් තීරණට්ඨ ඤාණය සම්පූර්ණ වේ. ඒ සම්පූර්ණ වූ ඥානය මෙහිලා ගැනේ. විස්තර පෙර කී සේයි.

## 22. පරිච්චාගට්ඨ ඤාණය.

“පහානෙ පඤ්ඤා පරිච්චාගට්ඨෙ ඤාණං” ප්‍රහාණයෙහි ප්‍රඥාව පරිච්චාගට්ඨ ඤාණ නම්. ප්‍රහාණය නම් ලක්ෂණාවබෝධය නිසා පෙර තුබූ නිත්‍ය සංඥාදිය අස්කිරීමයි. නිත්‍ය සංඥාදී වැරදි අදහස් අස්කර සිටි නුවණ පරිච්චාගට්ඨ ඤාණයයි, විස්තර සප්ත විශුද්ධීන්හි ඇත.

## 23 ඒකරසට්ඨ ඤාණය

“භාවනාපඤ්ඤා ඒකරසට්ඨෙ ඤාණං” වැඩීමෙහි නුවණ ඒකරසට්ඨ ඤාණ නම්. වැඩීම නම් විදර්ශනා වශයෙන් වැඩීමයි. එනම් විදර්ශනාභාවනාවයි. එහි ඇත්තාවූ චිත්ත සුඛය-හිතෙහි සැපය-කෘත්‍ය වශයෙන් එකක්මය. එනම් ඇලීම, ගැටීම ආදිය අතහැරීමයි. එහෙයින් විදර්ශනාව ඒකරසට්ඨ නම්. ඒ පිළිබඳ යෙදෙන්නාවූ නුවණ ඒකරසට්ඨ ඤාණයයි. තවද විදර්ශනා භාවනාවේ ඇත්තේ එකම රසයෙකි. එනම් විමුක්ති රසයයි. ඒ නිසා ද විදර්ශනා භාවනාව ඒකරසට්ඨ ඤාණයෙන් යුක්තය. තවද

භාවිතව්‍ය නිර්දේශයෙහි දක්වූ කායගතා සති ආදී ඒ ඒ භාවනා කොටස්හිද ඇත්තේ කෘත්‍ය වශයෙන් එකක්මය. එනම් ඒ ඒ ධර්මයන් වැඩීම නිසා සිත දියුණුවී, විදර්ශනා වීථියට බැස, අනිත්‍යාදී වශයෙන් ලක්ෂණ අවබෝධ කරදී ඇලීම, ගැටීම ආදිය අතහැරීමයි ඒ සමගම විමුක්ති රසයද ගෙනදේ. එහෙයින් භාවිතව්‍ය ධර්ම භාවනාවෙහිවූ ප්‍රඥාව ඒකරසට්ඨ ඥාණ නම්. ඒ ධර්ම, කායගතාසති-සමථ-විපස්සනා ආදී වශයෙන් සුතමය ඥාණයෙහි දක්විණ.

## 24. ඵුසනට්ඨ ඥාණය

“සච්ඡිකිරියා පඤ්ඤා ඵුසනට්ඨෙ ඤාණං” සාක්ෂාත් කිරීමෙහි ප්‍රඥාව ඵුසනට්ඨ ඥාණ නම්. “සච්ඡිකිරියා පඤ්ඤාති පටිවෙධ වසෙනපි පටිලාභවසෙනපි පච්චක්ඛකරණ පඤ්ඤා” සච්ඡිකිරියා පඤ්ඤා යනු ප්‍රතිවෙධ වශයෙන් හෝ ප්‍රතිලාභ වශයෙන් හෝ ප්‍රත්‍යක්ෂ කරන ප්‍රඥාවයි යනු අටුවා හෙයින් සාක්ෂාත් කිරීමේ ප්‍රඥාව දෙපරිද්දෙකින් පවතී. එහි නිර්වාණය අවබෝධ කරගැනීම පටිවෙධ සච්ඡිකිරියායි. සෝවාන් ආදී ඵලධම් ලබාගැනීම ප්‍රතිලාභ සච්ඡිකිරියා නම් ‘ඵුසනට්ඨ’ යනු ස්පර්ශ කිරීම වශයෙන් විඳීම් සවභාවයයි. ඒ පිළිබඳ නුවණ ඵුසනට්ඨ ඥාණයයි. ‘ඵුසනට්ඨෙ ඤාණන්ති තදුභය වසෙන වින්දන සභාව ඤාණං’ මෙ අර්ථකථායි. මෙසේ නිර්වාණය ප්‍රත්‍යක්ෂකරගැනීම් වශයෙන් හෝ ඵලලාභිත්ව වශයෙන් හෝ පවතින ඥානස්පර්ශය-නුවණින් හැප්පීම-ඵුසනට්ඨ ඥාණ නම්.

ඥාතට්ඨඥාණ ආදිවූ මේ ඥාණ පඤ්චකය පිළිවෙලින් විදර්ශනා චිත්තවීථියෙහි උපදී. එහෙයින් පඤ්චකයක් ලෙස ගොණු විය.

## පටිසම්භිදා ඥාණ නිද්දේසය

“චතස්සො පටිසම්භිදා. අත්ථපටිසම්භිදා ධම්මපටිසම්භිදා නිරුත්තිපටිසම්භිදා, පටිභාන පටිසම්භිදා” - වි. ප. (221 පි.)

ප්‍රතිසම්භිදා සතරෙකි. අර්ථ - ධර්ම - නිරුක්ති - ප්‍රතිභාන යනුයි. මෙහි ප්‍රතිසම්භිදා යනු ප්‍රභේදගත ඥානයට නමකි. බෙදීම සහිතවූ නුවණයි. ඒ නුවණ සතරාකාරයෙන් පවතින නිසා ‘චතුපටිසම්භිදා,’ යනුවෙන් කියැවේ. සෙසු තන්හි ප්‍රභෙද ඇතද

ඒවා ඥානයෙහිම ප්‍රභෙදයෝ නොවෙත් සතර, ඥානයෙහිම ප්‍රභෙදයෝයි 'න අඤ්ඤස්ස කස්සචි පභෙදා ඤාණස්සෙව පභෙදාති වෙදිතබ්බා" යනු අර්ථකථායි.

අත්ථපටිසම්භිදා: "අත්ථප්පභෙදස්ස සල්ලක්ඛණ විභාවන වවත්ථාන කරණ සමත්ථං අත්ථපභෙදගතං ඤාණං අත්ථපටිසම්භිදා" අර්ථ ප්‍රභේදයෙහි සංලක්ෂණ, විභාවන ව්‍යවස්ථාපන කරණයෙහි සමර්ථවූ අර්ථයෙහි ප්‍රභෙදගත ඥානය අර්ථ ප්‍රතිසම්භිදා නම්. එනම් හේතුඵල සලකා බැලීම්, බෙදීම් සනිටුහන් කිරීම, පිළිබඳ දක්ෂකම් ඇති හෙතුඵලයෙහි බෙදීම් බවට ගිය නුවණයි. එසේම හේතු ප්‍රත්‍යය සලකා බැලීම් ආදී වශයෙන් ආ දක්ෂකම් ඇති හේතු ප්‍රත්‍යයෙහි බෙදීම් බවට ගිය නුවණ ධම්මපටිසම්භිදායි ඒ හේතු ඵල දෙකට අයත්වූ වචන සමූහය සලකා බැලීම් ආදී වශයෙන් ආ දක්ෂකම් ඇති වචන සමූහයෙහි බෙදීම් බවට ගිය නුවණ නිරුත්ති පටිසම්භිදා නම්. මේ තුන් තැන නොපැකිල පවත්නා නුවණ පටිභාන පටිසම්භිදායි. මේ චතුපටිසම්භිදා පිළිබඳ සාමාන්‍ය හැඳින්වීමකි.

"චතස්සො පටිසම්භිදා, අත්ථපටිසම්භිදා ධම්මපටිසම්භිදා නිරුත්ති පටිසම්භිදා පටිභාන පටිසම්භිදා, අත්ථෙ ඤාණං අත්ථ පටිසම්භිදා, ධම්මෙ ඤාණං ධම්මපටිසම්භිදා, තත්‍ර ධම්ම නිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා ඤාණෙසු ඤාණං පටිභාන පටිසම්භිදා" -වි. ප.

මෙහි එන චතුපටිසම්භිදාවෝ නම් අර්ථයෙහි ඥානය අර්ථ ප්‍රතිසම්භිදායි. ධර්මයෙහි ඤාණය ධර්ම ප්‍රතිසම්භිදායි. ඒ අර්ථ - ධර්ම දෙකෙහි පද සිද්ධි ප්‍රකාශ කිරීමේ ඥානය නිරුක්ති ප්‍රතිසම්භිදායි. ඒ ත්‍රිවිධ ඤාණයෙහි ඥානය ප්‍රතිභාන ප්‍රතිසම්භිදායි යන මොහුයි

අත්ථපටිසම්භිදා: "තත්ථ අත්ථොති සංඛෙපතො හෙතුඵලං. තංහි යස්මා හෙතු අනුසාරෙන අරීයති අධිගම්මති පාපුණීයති තස්මා අත්ථොති වුච්චති පභෙදතො පන යං කිඤ්චි පච්චය සමුප්පන්නං නිබ්බාණං භාසිතත්ථො විපාකො කිරියාති ඉමෙ පඤ්ච ධම්මා අත්ථොති වෙදිතබ්බා" තං අත්ථං පච්චවෙක්ඛන්තස්ස තස්මිං අත්ථෙ පභෙදගතං ඤාණං අත්ථ පටිසම්භිදා"

-ප. ම. අ.

එහි අර්ථ යනු සංක්ෂෙපයෙන් හෙතුඵලයි. එය හෙතු අනුසාරයෙන් පමුණුවනු ලැබෙන හෙයින් අර්ථයැයි කියනු ලැබේ. විස්තර වශයෙන් නම් ප්‍රත්‍යසමුත්පන්න ධර්මඵලයි-, නිර්වාණය, භාෂිතාර්ථය-ව්‍යවහාර වචනයන්හි තේරුම-; විපාකය, ක්‍රියාය, යන පඤ්චධර්මයි. ඒ අර්ථය ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුට ඒ අර්ථය පිළිබඳ බෙදීම් බවට ගිය ඥානය අත්ථපටිසම්භිදා නමි.

ධම්මපටිසම්භිදා: ධම්මො ති සංඛෙපතො පච්චයො, සො හි යස්මා තං තං විදධාති පවත්තෙති චෙව පාපෙති ච තස්මා ධම්මො ති වුච්චති. පභෙදතො පන යො කොචි ඵල-නිබ්බත්තකො හෙතු අරියමග්ගො භාසිතං කුසලං අකුසලං ති ඉමෙ පඤ්චධම්මා ධම්මො ති වෙදිතබ්බා තං ධම්මං පච්චවෙක්ඛන්තස්ස තස්මිං ධම්මෙ පභෙදගතං ඤාණං ධම්මපටි-සම්භිදා"-ප. ම. අ.

ධර්ම යනු සංක්ෂෙපයෙන් ප්‍රත්‍යයයි. එය ඒ ඒ දෑ විධාන කෙරේද පවත්වාද පමුණුවාද එහෙයින් ධර්මයැයි කියනු ලැබේ. ප්‍රභේද වශයෙන් නම් යම්කිසි ඵලයක් නිපදවන හේතුව, ආර්‍ය මාර්ගය, භාෂිතය, කුශලය, අකුශලය යන ධර්ම පසයි. ඒ හේතු ධර්ම ප්‍රත්‍යවෙක්ෂා කරන්නාගේ ඒ ධර්මයන් පිළිබඳ ප්‍රභෙදගත ඥානය ධම්මපටිසම්භිදා නමි. මෙහි භාෂිතය යනු මාගධී භාෂාවයි. එය මූලභාෂාව හැටියට අටුවාව විස්තර කරයි. මෙසේ ධම්මපටිසම්භිදාව පඤ්චධර්මයකින් සමන්විතයි.

තවද මේ අත්ථපටිසම්භිදාව හා ධම්මපටිසම්භිදාව අභිධර්මයෙහි කීප ආකාරයකින්ම විස්තර කෙරේ ඒ මෙසේය.

"දුක්ඛෙ ඤාණං අත්ථපටිසම්භිදා දුක්ඛසමුදයෙ ඤාණං ධම්මපටිසම්භිදා දුක්ඛනිරොධෙ ඤාණං අත්ථපටිසම්භිදා දුක්ඛනිරොධගාමිනී පටිපදාය ඤාණං ධම්මපටිසම්භිදා; හෙතුම්හි ඤාණං ධම්මපටිසම්භිදා හෙතුඵලෙ ඤාණං අත්ථපටිසම්භිදා, යෙ ධම්මා භූතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා, යම්හා ධම්මා තෙ භූතා සඤ්ජාතා නිබ්බත්තා අනිබ්බත්තා ධම්මා පාතුභූතා තෙසු ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, ජරාමරණෙ ඤාණං අත්ථපටිසම්භිදා, ජරාමරණ මුදයෙ ඤාණං ධම්මපටිසම්භිදා, ජරාමරණ නිරොධ ඤාණං අත්ථපටිසම්භිදා, ජරාමරණ නිරොධගාමිනියා පටිපදාය

ඤාණං ධම්මපටිසම්භිදා, ජාතියා ඤාණං -පෙ- සංඛාරෙසු ඤාණං අත්ථපටිසම්භිදා, සංඛාර සමුදයෙ ඤාණං ධම්මපටිසම්භිදා, සංඛාර නිරොධෙ ඤාණං අත්ථපටිසම්භිදා සංඛාරනිරොධගාමිනියා පටිපදාය ඤාණං ධම්මපටිසම්භිදා, "ඉධ භික්ඛු ධම්මං ජානාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භූතධම්මං වෙදල්ලන්ති අයං වුච්චති ධම්මපටිසම්භිදා, සො තස්ස තස්සෙව භාසිතස්ස අත්ථං ජානාති අයං ඉමස්ස භාසිතස්ස අත්ථො අයං ඉමස්ස භාසිතස්ස අත්ථොති අයං වුච්චති අත්ථපටිසම්භිදා"

මෙහි සාමාන්‍ය අදහස: දුඃඛ සත්‍යය, නිරොධ හේතුඵලය, යම් ධර්ම සමූහයක් හටගත්තේද ඒ ධර්මසමූහය, ජරාමරණාදී ප්‍රත්‍ය සමුත්පාදයෙහි දක්වූ ඵලධර්ම, ඵලයන්ගේ විනාශය, නවඞ්ගසත්ථුශාසනය ප්‍රකාශකෙරෙන වචන සමූහයෙහි අර්ථ යන මෙතෙක් ධර්ම පිළිබඳ පවත්නාවූ ප්‍රඥාව අත්ථපටිසම්භිදා නම්. සමුදය සත්‍යය, මාර්ග සත්‍යය, හේතුධර්ම, යම් ධර්මයකින් හට ගත්තේ නම් ඒ හේතුධර්ම ජරාමරණ සමුදය ආදී ප්‍රත්‍ය සමුත්පාදයෙහි දක්වූ හේතු, හේතු විනාශකිරීමේ මාර්ගය නවඞ්ගසත්ථුශාසනය යන මෙතෙක් ධර්ම පිළිබඳ පවත්නාවූ ප්‍රඥාව ධම්මපටිසම්භිදා නම්. මේ සැම තන්හිම ආයේ හේතු ධර්මයන් කෙරෙහි පවත්නා ප්‍රභෙදගත-බෙදීම් බවට ගිය ප්‍රඥාව ධම්මපටිසම්භිදා බවත්, ඵලධර්මයන් කෙරෙහි පවත්නා ප්‍රභෙදගත ප්‍රඥාව අත්ථපටිසම්භිදා බවත්ය.

## නිරුක්ති පටිසම්භිදා

"අත්ථධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්ති පටිසම්භිදා පෙර කී අර්ථ, ධර්ම, දෙක්හි පවතින වචන සමූහයේ නිරුක්ති-පද සෑදුනු අයුරු-කිමෙහි නුවණ නිරුත්තිපටිසම්භිදා නම්. යම් වචනය් නුවාවූ පද සාධනයක් ව්‍යවහාර වේද, එය කිමෙහිදී ඇතිවන ශබ්ද අනුසාරයෙන් විමසන්නාහුට "මේ සවභාව නිරුක්තිය මේ ස්වභාව නිරුක්තිය නොවේය" යනුවෙන් මාගධී භාෂාව පිළිබඳ පවත්නා නිරුක්තික්‍රමය - පදසාධනය අවබෝධවීමෙහි ප්‍රඥාව නිරුත්ති පටිසම්භිදායැයි අටුවාව කියයි.

මාගධී භාෂාව සියලු සත්වයන්ගේ මූල භාෂාව හෙයින් පටිසම්භිදාලාභීනට ස්වභාවයෙන්ම ඒ භාෂාවේ ඇත්තාවූ පද පිළිබඳ නිරුක්තිය-සෑදුනු අයුරු වැටහේ. ඒ වැටහීම ඇතිවනුයේ කිමෙදී-ව්‍යවහාරයේදී = ඇතිවන ශබ්දය අනුවය. යමෙක් එසෝ යන මව්

නය "ඵස්සා" කියා හෝ "ඵස්සං" කියා හෝ කියත්නම් එය සවභාව නිරුක්තිය නොවේය යනු වැටහීම පටිසම්භිදාලාභියාට ඇතිවේ. ශබ්දානුසාරයෙන් වැටහේය යනුවෙන් කීයේ එහෙයිනි. මාගධී භාෂාව මූල භාෂාව ලෙස දක්වීම සඳහා අටුවාවෙහි විස්තරයක් ඇත. කැමැත්තෝ එය ද බලත්වා! (මෙහි නොදක්වූයේ වර්තමාන යෙහි එම කරුණු විවේචනයට ලක්වී ඇති හෙයිනි.) තවද පටි සම්භිදාලාභියාට නිරුක්තිය හැර සෙසු උපසර්ග, නාම, ආඛ්‍යාතාදිය අධ්‍යයන - ඉගෙණීම - නොකළහොත් නො වැටහේ.

## පටිභානපටිසම්භිදා

"ඤාණෙසු ඤාණං පටිභාන පටිසම්භිදා" අර්ථ, ධර්ම නිරුක්ති යන තුන් පක්ෂය කෙරෙහි යෙදුනු ඥානයන්හි ඥාන පටිභාන පටිසම්භිදා නම්. නැතහොත් ඒ ඤාණත්‍රයෙහි ගෝචර, කෘත්‍යාදී වශයෙන් විස්තරව පවත්නා ඥානය පටිභාන පටිසම්භිදායි. තවද තේරුමකි. "යෙන ඤාණෙන තානි ඤාණානි ජානාති, ඉමානි ඤාණානි ඉදමත්ථජෝතකානීති ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා" - වි. ප. යම් නුවණකින් "මේ ඥාන යෝ අර්ථය බබුලුවන්නෝය" යි ඒ අර්ථාදී ඥානත්‍රය දනියිද, ඒ ඥානයන්හි වූ ඤාණය පටිභාන පටිසම්භිදා නම්. මෙයින් පටිභාන පටිසම්භිදාව අන්ධකාරයෙහි තුබූ දෑයක් මධ්‍යාහ්න සූර්යයා බබ ලද්දී පෙනෙන්නාක් මෙන් ඒ අර්ථාදී තන්හිවූ සියල්ලද පෙනෙන නුවණක් ලෙස දක්වේ. එතරම්ම ප්‍රභාස්වරයි, බබලනසුළුයි.

## 25. අර්ථපටිසම්භිදා ඤාණය

අර්ථ නානත්වයෙහි හා ඵලනානත්වයෙහි පවත්නා ප්‍රඥාව අර්ථ පටිසම්භිදා ඤාණයයි. නානත්වය යනු වෙනස් ආකාරයයි. මාගධී භාෂාවේ පවත්නා පදයන්ගේ තේරුම අර්ථ නම්. හේතුවකින් හටගත් යම් දෙයක් වේයිද ඒ ඵලයි. මේ අර්ථ, ඵල දෙක්හි වෙන වෙනම පවත්නා නොයෙක් අයුරු දැනගන්නා නුවණ අර්ථපටි සම්භිදා බව දතයුතු.

පටිසම්භිදාමග්ගයෙහි මේ ඤාණ දක්වා ඇත්තේ සාමූහික වශයෙනි. පහසුවෙන් පැහැදිලි කරගැනීම සඳහා මෙහිලා වෙන වෙනම දක්වේ.

"කෙසේනම් අර්ථනානාත්වයෙහි පවත්නා ප්‍රඥාව අත්ථපටි-සම්භිදා ඤාණ නම් වේද? නිශ්චයට බැසගැනීම් සවභාවය අර්ථ නම් එසවීම් සවභාවය අර්ථ නම්. එලඹ සිටීම් සවභාවය අර්ථ නම්. නොවිසිරයෑම් ස්වභාවය අර්ථ නම්. දැකීම් ස්වභාවය අර්ථ නම්. නිශ්චයකිරීම් ස්වභාවයවූ අර්ථය අනිකෙකි-සෙසු පදද මෙසේය- යම් ඤාණයකින් මේ මෙත්වූ අර්ථයෝ දැනගන්නා ලද්දාහුද, එම ඤාණයෙන්ම මෙ මෙත්වූ අර්ථයෝ ප්‍රකටකොට දැනගන්නා ලද්දාහුයි. එහෙයින් මෙත්මෙත්වූ අර්ථයන් දැනගැනීමෙහි ප්‍රඥාව අත්ථපටිසම්භිදාඤාණයැයි කියනු ලැබේ"

- ප. ම. (සං. ප.)

මෙහි ආයේ සද්ධින්ද්‍රිය ආදී ඉන්ද්‍රිය ධර්ම පංචකයෙහි ඇති වෙන වෙනම තේරුම්ය. නිශ්චයකට බැසගැනීම් සවභාවය අර්ථ නම් යනුවෙන් දක්වූයේ සද්ධින්ද්‍රිය අර්ථයයි. (නිශ්චයකට බැස ගැනීම නම් තීරණයකට බැසගැනීමයි) මෙසේ පිළිවෙලින් විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රියයන්ගේ තේරුම් දක්විණි. දෙවනුව ඒ ඉන්ද්‍රිය ධර්මයන්ගේ ඇති වෙනස් ආකාරය දක්වේ. සද්ධින්ද්‍රිය අනිකෙකි. විරියින්ද්‍රිය අනිකෙකි. මේ වශයෙනි. එහෙසින් වෙත් මෙත්වූ අර්ථ දැනගන්නාවූ ඤාණය අත්ථපටිසම්භිදා ඤාණයැයි දතයුතු ඉක්බිති ශ්‍රද්ධාදී බලධර්ම පිළිබඳවද මෙසේම දක්වේ. මේ ධර්ම පංචකයෙහි ඇත්තාවූ ඊට විරුද්ධ ධර්මයන් ගෙන් කම්පා නොවීම් ස්වභාවයෙන්ද ගෙන ඒ පිළිබඳ අර්ථ දැනීමේ ප්‍රඥාව අත්ථපටිසම්භිදා ඤාණයැයි කියාවේ.

ඉක්බිති බොජ්ඣංග ධර්මයන්හි ඇත්තාවූ අර්ථ සඳහන් කෙරේ. එනම් එලඹ සිටීම, විමසීම, එසවීම, පැතිරීම, සංසිඳීම නොවිසිරයාම, මැදහත්ව බැලීම යන අර්ථ පිළිවෙලින් සතිධම්මවිචයාදී බොජ්ඣංග සත කෙරෙහි පවතී එලඹ සිටීම් අර්ථය අනිකෙකි. විමසීම අර්ථය අනිකෙකි. යනාදී වශයෙන් වෙන් වෙන් අර්ථ දැනගන්නාවූ ප්‍රඥාව අත්ථපටිසම්භිදා නම් යනුයි. නැවත සම්මාදිට්ඨි ආදී මාර්ගාංග අටෙහි ඇත්තාවූ දැකීම් ස්වභාවය, නැංවීම් ස්වභාවය, වැළඳගැනීම් ස්වභාවය. මනාකොට පිහිටුවීම් ස්වභාවය, පිරිසුදුවීම් ස්වභාවය, එසවීම ස්වභාවය, එලඹසිටීම් ස්වභාවය, නොවිසිරයාම් ස්වභාවය යන අට පිළිබඳ වෙනස් ආකාරය සලකන නුවණ අත්ථපටිසම්භිදාහැයි දක්වේ. මෙහි ආ අර්ථ පිළිවෙලින් ඒ ඒ අංගවලට යොදා බැලිය යුතු. මෙසේ යම් ඤාණය

කින් මේ මෙන් මෙන්වූ අර්ථයෝ -තේරුම්- දැනගන්නා ලද්දාහු, එම ඤාණයෙන්ම ඒ මෙන් මෙන්වූ අර්ථයෝ ප්‍රකට කොට දැන ගන්නා ලද්දාහුනුයි අත්ථපටිසම්භිදා ඤාණ නමි.

## 26, ධම්මපටිසම්භිදා ඤාණය

පෙල ධර්මයෙහි නානත්වය හා හේතු ධර්මයන්හි නානත්වය දන්නාවූ ප්‍රඥාව ධම්මපටිසම්භිදා ඤාණ නමි, පෙල ධර්ම යනු ත්‍රිපිටක දේශනාවයි. ඉහතදී !"භාෂිත" යන්නෙන් දක්වූයේද පෙල ධර්මයි. මෙහි ඇත්තාවූ ධර්ම පිළිබඳ නානත්වය - වෙනස = දැනීමේ ප්‍රඥාවද හේතු වශයෙන් දක්වූ ආර්‍ය මාර්ගය, කුශලය, අකුශලය හේතු යන පස්වැදෑරුම් හේතුන්ගේ නානත්වය දැනීමේ ප්‍රඥාවද, ධම්මපටිසම්භිදා ඤාණ බව දතයුතු විස්තරයේදී දක්වෙනුයේ ආර්‍ය මාර්ගයෙහි යෙදෙන ධර්මයන්කෙරෙහි පවතින නානත්වය පමණි. ඒ මෙසේය.

"කෙසේ නම් ධර්මනානත්වයෙහි පවත්නා ප්‍රඥාව ධම්මපටිසම්භිදා ඤාණ නම් වේද? සද්ධින්ද්‍රිය ධර්ම නමි. විරියින්ද්‍රිය ධර්ම නමි. සතින්ද්‍රිය ධර්ම නමි. සමාධින්ද්‍රිය ධර්ම නමි පඤ්ඤින්ද්‍රිය ධර්ම නමි. සද්ධින්ද්‍රිය අනිකෙකි. විරියින්ද්‍රිය අනිකෙකි. සතින්ද්‍රිය අනිකෙකි. සමාධින්ද්‍රිය අනිකෙකි. පඤ්ඤින්ද්‍රිය අනිකෙකි යම් ඤාණයකින් මෙන් මෙන්වූ ධර්මයෝ දැනගන්නා ලද්දාහුද එම ඤාණයෙන්ම මේ මෙන් මෙන්වූ ධර්මයෝ ප්‍රකට කොට දැනගන්නා ලද්දාහුනුයි ධම්මපටිසම්භිදා නමි. එහෙයින් ධර්මයන්ගේ වෙනස දන්නා ප්‍රඥාව ධම්මපටිසම්භිදා ඤාණ නමි" මේ අයුරින්ම බලධර්ම, බොජ්ඣඞ්ගධර්ම, ආර්‍ය අෂ්ටාංගික මාර්ග ධර්ම සඳහන්වෙයි. මෙසේ ආර්‍ය මාර්ගයවූ හේතු ධර්මයන්ගේ නානත්වය දන්නා ප්‍රඥාව ධම්මපටිසම්භිදා ඤාණය බව දතයුතු.

## 27. නිරුත්ති පටිසම්භිදා ඤාණය

වචන, වචනාර්ථයන්ගේ නානත්වය, දන්නාවූ ප්‍රඥාව නිරුත්ති පටිසම්භිදා ඥාන නමි. මාගධී භාෂාවේ ඇත්තාවූ වචන, වචනාර්ථ දැනීමේ ප්‍රඥාව නිරුත්ති පටිසම්භිදායැයි ආයේ නමුදු මෙහිලා දක්වෙනුයේ ආර්‍ය මාර්ගයෙහිදී යෙදෙන ධර්ම පිළිබඳ වචන, වචනාර්ථයන්ගේ නානත්වය දන්නාවූ ප්‍රඥාව පමණි. ඒ මෙසේය. "කෙසේ නම් නිරුත්තිනානත්වයෙහි පවත්නා ප්‍රඥාව

නිරුත්ති පටිසම්භිදා ඤාණය නම්වේද? ධම් පස දක්වීම පිණිස වචනයෙන් අර්ථයන් දක්වනු පිණිස වචන වේත්. ධර්මයන් දක්වන වචන අන්‍යයෝය අර්ථයන් දක්වන වචන අන්‍යයෝය යම් ඤාණයකින් මේ වෙන් වෙන්වූ වචන දැනගන්නා ලද්දාහුද ඒ ඤාණයෙන්ම මේ වෙන් වෙන්වූ වචන ප්‍රකටකොට දැනගන්නා ලද්දාහුනුයි නිරුත්ති පටිසම්භිදා නම්. එහෙයින් වෙන් වෙන්වූ වචන දැනීමෙහි ප්‍රඥාව නිරුත්ති පටිසම්භිදා ඤාණ නම්'' මෙහි දක්වූයේ ඉන්ද්‍රිය ධර්ම පහයැ මේ අයුරින්ම බලධර්ම, බොජ්ඣඞ්ග ධම්, මාර්ගාඞ්ගධම්, පිළිබඳ වචන වචනාර්ථයන්ද යොදාගත යුතුය

## 28. පටිභාන පටිසම්භිදා ඤාණය

පටිභාන නානත්වය දන්නාවූ ප්‍රඥාව පටිභාන පටිසම්භිදා ඤාණ නම්. පටිභාන නානත්වය නම් අර්ථ, ධර්ම, නිරුක්ති යන මොවුන් විෂයෙහිවූ වෙනස් අයුරුයි එය වැටහීමේ ප්‍රඥාව පටිභාන පටිසම්භිදා ඤාණයයි. මෙයද මෙහිලා දක්වෙනුයේ ආර්‍ය මාර්ගයෙහි යෙදෙන ධර්ම පිළිබඳ නානත්වය දැනගන්නාවූ ප්‍රඥාව පමණි ඒ මෙසේය. ධම් පසෙහි ඤාණ පසෙකි. අර්ථපසෙහි ඤාණ පසෙකි. වචන දසයෙහි ඤාණ දසයෙකි ධර්මයන්හි ඤාණ අන්‍යයෝය. අර්ථයන්හි ඤාණ අන්‍යයෝය. වචනයන්හි ඤාණ අන්‍යයෝය. යම් ඤාණයකින් මේ වෙන් වෙන්වූ ඤාණ දැනගන්නා ලද්දාහුද, එම ඤාණයෙන්ම මේ වෙන් වෙන්වූ ඤාණ ප්‍රකටකොට දැනගන්නා ලද්දාහුනුයි පටිභානපටිසම්භිදා ඥානයැයි කියනු ලැබේ. මෙහි ධම් පස නම් ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධම්යි. මේ අයුරින්ම බොජ්ඣඞ්ග ධර්ම, මාර්ගාඞ්ග ධම්, පිළිබඳ ඤාණද දතයුතුය. මෙසේ වෙන්වූ ඤාණ දැනගන්නාවූ ඤාණය පටිභාන පටිසම්භිදා ඤාණ නම්.

“ඤාණෙසු ඤාණං පටිභාන පටිසම්භිදෙ ඤාණං” යන්නද සිහිකළ යුතුය.

චතුපටිසම්භිදා ඤාණ නිමි.

## 29, 30, 31 විහාරට්ඨ-සමාපත්තට්ඨ විහාරසමාපත්තට්ඨ ඤාණ

මෙම ඤාණත්‍රය ලඟ ලඟම පවතින හෙයින් මිශ්‍ර වශයෙන් දක්වේ. එහෙයින් මෙහිලාද එලෙසම දක්වමි, තවද මේ ඤාණ

ත්‍රය අවබෝධ කරගැනීමට පහසුවනුයේ "ඵලසමාපත්ති" පිළිබඳ විස්තර දැනගැනීමෙනි. එහෙයින් ඥාන විස්තරයට මත්තෙන් ඵල සමාපත්ති විස්තරය දක්වමි.

## ඵලසමාපත්තිː

ඵලසමාපත්ති යනු සෝවාන් ආදි ආර්‍යඵල අනුසාරයෙන් සිත නිර්වාණයෙහි පිහිටුවීම් වශයෙන් ඵලසිත් උපදවා වාසය කිරීමයි. "අරියඵලස්ස නිරොධෙ අප්පණා" ආර්‍යඵලයාගේ නිරෝධයෙහි අර්පණාව ඵලසමාපත්තියැයි අටුවාවේ දැක්වේ. එහි අදහස, සෝවාන් ආදි ඵල සිත්හි පිහිටුවීම නැතහොත් ඵලසිත්වලට නැංවීම ඵල සමාපත්ති යනුයි. ආර්‍යඵල ලැබූහු තමා ලබාගත් ආර්‍යඵලයට පැමිණ වාසය කිරීමට කැමැත්තක් ඇතිව, නැවත විදර්ශනා කිරීමෙන් ලබාගත් ඵලයට අනුවම ඵල සිත් උපදවමින් විසීම ඵලසමාපත්ති බව කෙටියෙන් තේරුම් ගතයුතු. චිත්ත වීථි පිළිබඳ දැනීමක් ඇතියහුට මෙය පහසුවෙන් තේරුම් යයි. ඵලසමාපත්තිවලට සමවදින්නෝ ආර්‍යයෝමය. ඔව්හුද තමන් ලත් ආර්‍ය ඵලයට අනුව මිස අන් ඵලයකට අනුව සමවැදීමට නොහැක්කෝ වෙත්. අවබෝධ නොකළ හෙයිනි. කුමක් නිසා සමවදිත්ද? මෙලොව වශයෙන් නිවන් සුව විඳිමින් විසීම සඳහාය. රජකමට පත්වූ රජතුමා රජසැප විඳින්නා සේය. ඵල සමාපත්තියට සමවැදීම කරුණු දෙකකින් සිදුවේ. නිවණ හැර අන් අරමුණක් මෙනෙහි නොකිරීම, නිවණ මෙනෙහිකිරීම යනුයි. එහෙයින් වදාළහ.

"ද්වෙ ඛො ආවුසො පච්චයා අනිමිත්තාය ච චෙතො විමුත්තියා සමාපත්තියා, සබ්බනිමිත්තානඤ්ච අමනසිකාරො, අනිමිත්තායච ධාතුයා මනසිකාරො"-ම. නි. (මූ. ප.)

ඇවැත්නි, අනිමිත්තවූ චිත්තවිමුක්ති සමාපත්තිය පිණිස ප්‍රත්‍යය දෙකකි. සියලු නිමිති මෙනෙහි නොකිරීමද, අනිමිත්ත ධාතුව ගේ මෙනෙහි කිරීමද යනුයි. මෙහි "අනිමිත්ත" යනු නිර්වාණ ධර්මයයි. චිත්තවිමුක්තිය නම් ඵලධර්මයි. මෙසේ කරුණු දෙකක් ඵලසමවතට හේතු වෙයි. සමවැදුනු පසු පිහිටා සිටීම සඳහා කරුණු තුනක් හේතුවෙයි.

"තයො ඛො ආවුසො පච්චයා අනිමිත්තාය ච චෙතො විමුත්තියා ඨිතියා, සබ්බනිමිත්තානඤ්ච අමනසිකාරො අනිමිත්තායච ධාතුයා මනසිකාරො, පුබ්බෙච අභිසංඛාරො"
-ම. නි. (මූ. ප.)

සියලු නිමිති-අරමුණු මෙනෙහි නොකිරීම, නිවණ මෙනෙහි කිරීම පෙරදීම නැගිටින කාලය සීමාකර ගැනීම, යනුයි ඵලසමාපත්තියෙන් නැගිටීමටද කරුණු දෙකක් හේතු වෙයි. සියලු අරමුණු මෙනෙහිකිරීම, නිවණ මෙනෙහි නොකිරීම, යනුයි. මෙසේ සම වැදීම, සිටීම, නැගිටීම, දතයුතු. මේ ඵල සමාපත්ති විස්තරයයි

## ඤාණත්‍රය

"විහාරනානත්තෙ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං, සමාපත්තිනානත්තෙපඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං විහාරසමාපත්ති නානත්තෙ පඤ්ඤා විහාරසමාපත්තට්ඨෙ ඤාණං" වෙනස් වශයෙන් පවත්නා විහරණයන්හි-විමසීම්වල-ප්‍රඥාව විහාරට්ඨ ඤාණයයි වෙනස් වශයෙන් පවත්නා සමාපත්තීන්හි-සම වැදුම්හි-ප්‍රඥාව සමාපත්තට්ඨ ඤාණයයි වෙනස් වශයෙන් පවත්නා විහරණ සමාපත්තීන්හි ප්‍රඥාව විහාරසමාපත්තට්ඨ ඤාණයි.

මෙහි "විහාර" යනු අනිත්‍යාදර්ශනාදි ත්‍රිවිධ දර්ශනාවන්ට අනුව විදර්ශනා වශයෙන් කෙරෙන විහරණයයි විසීමයි විහරණ ත්‍රයකි. අනිත්‍යානුදර්ශනා විහරණය, දුඃඛානුදර්ශනා විහරණය අනාත්මානුදර්ශනා විහරණය යනුයි. එනම් සියලු සංස්කාරයන් අනිත්‍ය-දුඃඛ-අනාත්මයැයි සලකමින් විසීමයි. මේ විහරණයන්ට බැසගනුයේ විමොක්ෂමුඛ මගිනි. විමොක්ෂමුඛ ඉහතදී විස්තර කෙරිණි. එහි සාමාන්‍ය අදහස: අනිත්‍යයැයි විදර්ශනා කර මාර්ග චිත්ත වීථියට බැසගැනීම අනිමිත්ත විමොක්ෂමුඛ නම්. දුඃඛයැයි විදර්ශනාකොට මාර්ගචිත්තවීථියට බැසගැනීම අප්‍රණිහිත විමොක්ෂමුඛ නම්. අනාත්මයැයි විදර්ශනාකොට මාර්ග චිත්ත වීථියට බැසගැනීම ශූන්‍යතා විමොක්ෂමුඛනම්. යනුයි. මේ ත්‍රිවිධමොක්ෂ මුඛ අතුරෙන් ඇතැම්විට අනිමිත්ත විමොක්ෂමුඛ වශයෙන් වෙසෙයි ඇතැම්විට අප්‍රණිහිත විමොක්ෂමුඛ වශයෙන් වෙසෙයි. ඇතැම්විට ශූන්‍යතාවිමොක්ෂමුඛ වශයෙන් වෙසෙයි. එහෙයින් ඒ වෙන් වෙන්වූ විසීම්හි පවත්නා නුවණ "විහාරට්ඨ" ඤාණය නමි.

සමාපත්ති දක්විණ. ඒවාහිද ඇතැම්විට අනිත්‍ය දර්ශනය අනුව අනිමිත්ත විමොක්‍ෂමුඛ මගින් ඵලසමාපත්තියට සමවදියි ඇතැම්විට දුඃඛානුදර්ශනයට අනුව අප්‍රණිහිත විමොක්‍ෂමුඛ මගින් ඵලසමාපත්තියට සමවදියි. නැවත අනාත්මානුදර්ශනයට අනුව ශූන්‍යතා විමොක්‍ෂ මුඛ මගින් ඵලසමාපත්තියට සමවදියි. මෙසේ වෙනස් ආකාර වශයෙන් පවත්නා සමවැදීම්හි නුවණ සමාපත්තට්ඨ ඤාණයයි.

මේ විහාර, සමාපත්ති දෙකම ඇතුලත්කොට විසිමෙහි නුවණ විහාර සමාපත්තට්ඨ ඥානයයි,

“සංඛෙපෙන විහාරට්ඨෙ ඤාණං නාම ඵලසමාපත්තියා පුබ්බභාගෙ සංඛාරුපෙක්ඛා ඤාණෙ ඨිතස්ස විපස්සනා විහාර නානත්ත ඤාණං, සමාපත්තට්ඨෙ ඤාණං නාම ඵලසමාපත්ති නානත්තෙ ඤාණං, විහාරසමාපත්තට්ඨෙ ඤාණං නාම තදුභය නානත්තෙ ඤාණං” මේ වශයෙන් අටුවාවෙහි මේ ඥාන කෙටියෙන් දක්වේ. ඵල සමාපත්තියට පෙර සංඛාරුපෙක්ඛා ඤාණයෙහි සිටියහුගේ විදර්ශනා විහාර පිළිබඳ වෙනස් බැව්හි නුවණ විහාරට්ඨ ඤාණයයි. ඵලසමාපත්ති පිළිබඳ වෙනස් බැව්හි පවත්නා නුවණ ඵලසමාපත්තට්ඨ ඤාණයයි. ඒ දෙකම පිළිබඳ වෙනස්බැව්හි නුවණ විහාර සමාපත්තට්ඨ ඤාණයයි යනු එහි අදහසයි. මෙසේ ඥානත්‍රයක් වූයේ පුද්ගලයාගේ කැමැත්ත වශයෙනි. මෙම ඤාණයන්ගේ විස්තර සංඛාරුපෙක්ඛා ඤාණයෙහිදී විස්තර කෙරිණි. එහි නොදක්වූ ඵල සමාපත්ති විස්තර මෙහි මුලින්ම දක්විණ.

“සංස්කාර නිමිත්ත භය වශයෙන් දක්නේ අනිමිත්තයැයි කියන ලද නිර්වාණයෙහි නැමුණු සිත් ඇති හෙයින් සංස්කාර නිමිත්ත නුවණින් ස්පර්ශ කරමින් අනිත්‍යය බලයි. මෙය අනිමිත්ත විහාර නම්. තෘෂ්ණා ප්‍රණිධිය භය වශයෙන් දක්නේ අප්‍රණිහිතයැයි කියන ලද නිර්වාණයෙහි නැමුණු සිත් ඇති බැවින් සංස්කාර ධර්මය නුවණින් ස්පර්ශ කරමින් අනිත්‍ය බලයි මෙය අප්‍රණිහිත විහාර නම්. ආත්ම වශයෙන් ගැනීම භය වශයෙන් දක්නේ සුඤ්ඤතයැයි කියන ලද නිර්වාණයෙහි නැමුණු සිත් ඇති බැවින්. සංස්කාර ධර්ම නුවණින් ස්පර්ශ කෙරෙමින් අනිත්‍යය බලයි. මේ සුඤ්ඤත විහාර නම්. සංස්කාර නිමිත්ත භය වශයෙන් දක්නේ අනිමිත්ත සංඛ්‍යාත නිර්වාණයෙහි නැමුණු සිත් ඇති බැවින් පැවැත්මෙහි මැදහත්ව අනිමිත්ත වූ නිර්වාණය ආවර්ජනාකොට (ඵලයට) සමවදියිද මෙය අනි

මිත්ත සමාපත්ති නම්-සෙසු සමාපත්ති දෙකද මේ අයුරින් සලකාගතයුතු-සංස්කාර නිමිත්ත භය වශයෙන් දක්නේ අනිමිත්තයෙහි නැමුණු සිත් ඇති බැවින් සංස්කාරයන් නුවණින් ස්පර්ශකොට අනිත්‍යය බලයිද, පැවැත්මෙහි මැදහත්ව අනිමිත්ත වූ නිර්වාණය ආවර්ජනා කොට (ඵලයට) සමවදියිද, මෙය අනිමිත්ත විහාර සමාපත්ති නම්. මේ අයුරින් සෙසු ඒවාද සලකාගත යුතු-ප. ම. (සිං ප.)

මෙහි සංස්කාර නිමිත්ත යනු ඒ ඒ සංස්කාර ධර්මයන්ගේ අරමුණුයි. නිර්වාණයෙහි සංස්කාරාරම්මණයක් නොමැති හෙයින් අනිමිත්තයැයි කියනු ලැබේ. උදයබ්බානුපස්සනාදී පිළිවෙලින් අවුත් භඞ්ගානුපස්සනාවට පැමිණි කල්හි ඒ සංස්කාර නිමිති භය වශයෙන් දැක, නිර්වාණය=අනිමිත්තය - නිර්භය වශයෙන් බලා එයට සිත නැඹුරු කරයි. ඒ අවස්ථාවේදී වරෙක සංස්කාර නිමිති බලයි. වරෙක නිර්වාණය වෙත සිත හරවයි. එසේ සංස්කාර නිමිත්ත බැලීම, නුවණින් ස්පර්ශ කිරීම යැයි දක්විණ. අනිත්‍යානුදර්ශනයට අනුව ඒ සංස්කාර ධර්ම අනිත්‍යයැයි සනිටුහන් කරයි මෙසේ කෙරෙමින් විසීම අනිමිත්ත විහාර නම් සෙසු අනුදර්ශනා ද්වයම මෙයින්ම කියවිණැයි අටුවාව සඳහන් කරයි. "අනිච්චස්ස දුක්ඛත්තා සා දුක්ඛානුපස්සනා, දුක්ඛස්සා අනත්තත්තා සා අනත්තානුපස්සනාත්ති එවමෙතා තිස්සො අනුපස්සනා වුත්තා හොන්ති" යනුයි. මීටම රූපනිමිත්ත, වේදනා නිමිත්ත ආදී වශයෙන් පඤ්චස්කන්ධ ධර්ම, චක්ඛුනිමිත්ත, ආදී ආයතන ධර්ම, ප්‍රත්‍යසමුත්පාද ධර්ම, යන මෙතෙක් ධර්ම ඇතුලත් කොට විහාරට්ඨ ඤාණය දේශිතයි.

ඵල සමාපත්තිද ත්‍රිවිධයි. අනිමිත්ත - අප්‍රණිහිත - ශූන්‍යතා සමාපත්ති යනුයි. "පැවැත්මෙහි මැදහත්ව" යන්නෙන් සංඛාරෝපෙක්ඛාව කියවිණ. එයින් මධ්‍යස්ථභාවයක් ලැබූ පසු නිර්වාණය ආවර්ජනා කරයි. ඉක්බිති ඒ තුන් ආකාර අතුරෙන් එක්තරා ආකාරයකින් ඵලසමාපත්ති යට සමවදියි. සමාපත්තට්ඨ ඤාණය යනු ඒ පිළිබඳ පවත්නා නුවණයි විදර්ශනාවට ගෝචරවූ රූපාදී ස්කන්ධ ආයතනාදීහුද මේ සමාපත්තට්ඨ ඤාණයට ඇතුලත්ය. ඉක්බිති විහාර, සමාපත්ති, දෙකම එකවර පැවැත්වීම වශයෙන් පවත්නා නුවණ විහාරසමාපත්තට්ඨ ඤාණ නම්.

මෙසේ ඇත්තාවූ අනිමිත්ත විහාරය අනිකකි. අප්පණිහිත විහාරය අනිකකි. සුඤ්ඤත විහාරය අනිකකි. අනිමිත්ත සමා

පත්තිය අතික්කති. අප්පණිහිතසමාපත්තිං අතික්කති. සුඤ්ඤත සමාපත්තිං අතික්කති. අනිමිත්ත විහාර සමාපත්තිං අතික්කති. -පෙර මෙනි- එය දැනීම් අර්ථ යෙන් ඥාණයි ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥායි. එහෙයින් වෙන් වෙන්වූ විසුම්හි ප්‍රඥව විහාරට්ඨ ඥාණය නම්. වෙන් වෙන් වූ සමවැදුම්හි ප්‍රඥාව සමාපත්තට්ඨ ඥාණය නම්. වෙන් වෙන්වූ විසුම්හි හා සමවැදුම්හි ප්‍රඥව විහාරසමාපත්තට්ඨ ඥාණ නම්

ඥානත්‍රය විස්තර නිමි,

## 32. ආනන්තරික සමාධි ඥාණය

කාමච්ඡන්දාදී නීවරණ ධර්මයන් ප්‍රහාණය කිරීම නිසා හට ගත් වික්ෂෙපයෙන් තොරවූ සමාධියට අනතුරුව ආශ්‍රව ධර්මයන් ක්ෂය කිරීමෙහි ප්‍රඥාව ආනනන්තරික සමාධි ඥාණ නම්. සමථ භාවනාකර, විදර්ශනාවට බැසගත් සමථයානිකයාට නීවරණ ධර්ම ධ්‍යාන අවස්ථාවන්හිදී විෂ්කම්භන ප්‍රහාණයෙන් ප්‍රහාණය වූවත් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණයවනුයේ මාර්ගක්ෂණයෙහිදීයැ. එද ඒ ඒ මාර්ගක්ෂණයන්ගෙන් ප්‍රහාණය වන නීවරණ ධර්ම කොටස් පමණි. අවශානය අර්හත් මාර්ගක්ෂණයෙදීය. විදර්ශනායානිකයාට සංස්කාර ධර්ම අනිත්‍යාදී වශයෙන් බැලීම නිසා ක්ෂණික වශයෙන් හෝ උපචාර වශයෙන් හෝ නීවරණයන් විෂ්කම්භනය වී, මාර්ගක්ෂණයෙහිදී සමුච්ඡේද වශයෙන් ප්‍රහාණයවේ මේ දෙ දෙනාගේම සමුච්ඡේද ප්‍රහාණය සමානයි. එහෙයින් මාර්ග අවස්ථාවට පත්වෙත්ම ඒ දෙදෙනාම මග්ග සමාධියෙන් යුක්ත වූමෝ වෙත්. මේ මග්ග සමාධියට ආනන්තරික සමාධියැයි කියනු ලැබේ. මක්නිසාද? මාර්ගයට අනතුරුව, ඒ සමගම ඵල උපදින හෙයිනි. එයින් කීහ.

“ආනන්තරික සමාධිම්හි ඤාණන්ති අත්තනො පවත්ති සමනන්තරං නියමෙනෙව ඵලප්පදානතො ආනන්තරිකොති ලද්ධනාමො මග්ගසමාධි, තෙන ආනන්තරිකසමාධිනා සම්පයුත්තං ඤාණං” - ප. ම. අ.

ආනන්තරික සමාධියෙහි ඥාණය යනු තමාගේ (මාර්ගයාගේ) පැවත්මට අනතුරුව නියමයෙන්ම ඵල ලබා දෙන හෙයින් ආනන්තරිකයැයි ලද නම ඇති මග්ග සමාධිය, ඒ ආනන්තරික සමග යෙදුනාවූ නුවණ ආනන්තරක සමාධි ඥාණ නම්. යනු එහි අදහසයි.

මෙසේ මග්ග සමාධිය ආනන්තරික සමාධිය බව දතයුතු. මගග සමාධියෙන් නීවරණයන් පමණක් නොව ආශ්‍රව ධර්මයන්ද ප්‍රහාණය වෙයි. එසේම ඊට අනුව ගිය සංයෝජනාදී සෙසු ක්ලේශකර ධර්මයන්ද ප්‍රහාණය වන බව දතයුතු. විස්තර මග්ග ඤාණයේදී ප්‍රකාශයට පත්විය.

"කෙසේනම් සමාධියගේ පිරිසිදු බව හේතුකොටගෙන ආශ්‍රවයන් ක්ෂය කිරීමෙහි ප්‍රඥාව ආනන්තරික සමාධියෙහි ඤාණය වේද? කාමයන් කෙරෙන් නික්මීම වශයෙන් සිතේ එකඟකම, නොවිසිරයාම සමාධි නම්. ඒ සමාධීහුගේ වශයෙන් මාර්ග ඤාණය උපදියි. ඒ ඤාණයෙන් ආශ්‍රවයෝ ක්ෂය වෙත්. මෙසේ සමථය පළමුව උපදියි. ඤාණය පසුව උපදියි. ඒ ඤාණයෙන් ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වෙයි. එහෙයින් සමාධියගේ පිරිසුදු බව හේතුකොටගෙන ආශ්‍රවයන් ක්ෂය කිරීමෙහි ප්‍රඥාව ආනන්තරික සමාධියෙහි ඥානයයි කියනු ලැබේ. (සිං. ප.)

මේ වශයෙන් දේශනා වූ විස්තරයෙහි මග්ග සමාධිය සඳහා ධර්ම සතක් උපකාර වනබව ප්‍රමථයෙන් දක්වේ. එයින් ඉහත දක් වූ දේශනා පාළියේ ඇත්තේ එක් ධර්මයකි. එනම් නෙකඛමම - නික්මීම-යි. සෙසු ධර්ම මෙසේය. "නෙකඛමම අව්‍යාපාද ආලෝක සඤ්ඤා, අවික්ඛෙප ධම්ම වවත්ථාන ඤාණ පාමොජ්ජානි" යනු අටුවා හෙයින් අව්‍යාපාදය, ආලෝක සංඥාව, සමාධිය ධර්මව්‍යවස්ථාපනය වූ දිට්ඨි විසුද්ධිය, උදයව්‍යයාදී ඥාන, ප්‍රමෝද්‍ය, යන සතයි. මේ දක්වූයේ සමථයානික වශයෙනි. විදර්ශනා යානිකයාට මේ ධර්ම සත උපචාරයත් සමඟ එකචිත්තසම්ප්‍රයුක්තවම ලැබේ. එනම් විදර්ශනා චිත්තවීථියේදීම ලැබීමයි.

සමාධි ධර්මය ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන, දස කසිණ, දස අසුභ, දස අනුස්සති, වශයෙන් දක්වා, ඉක්බිති ආනාපාන සති කර්මස්ථානයෙහි වූ සොළසවිධ ක්‍රමය අනුසාරයෙන් දේශනා වෙයි. එසේ ලබාගත් සමාධියට පසු ධර්මව්‍යවස්ථාපනය වූ දිට්ඨිවිසුද්ධිය සම්පාදනය සඳහා ධම්මවවත්ථාන දක්විණ. ඒ හැම දෙයක්ම පෙරදීම විස්තර විණි. එහෙයින් සමාධිය ගේ පිරිසුදු බව නිසා ආශ්‍රවයන් ක්ෂය කිරීමෙහි ප්‍රඥාව ආනන්තරික සමාධි ඤාණයයි කියනු ලැබේ.

# 33. අරණ විහාර ඤාණය.

විදර්ශනා ඥානය අධිපති කොට ඇත්තාවූ ද, ශාන්තවූ විදර්ශනා විහාරයට පැමිණියා වූ ද, ප්‍රණීතයැයි මෙනෙහි කිරීම ඇත්තා වූද, ප්‍රඥාව අරණ විහාර ඤාණ නමි. මෙයින් අරණ විහාර ඤාණය තෙවැදෑරුම් බව දක්වේ. අනිත්‍යාදී ත්‍රිවිධ අනුදර්ශනායෙහි වූ දර්ශනය මෙහි පළමු වැනි අරණ විහාර ඤාණය යි. එය විදර්ශනා අවස්ථාවේදී අධිපති භාවය දරයි. දෙවැන්න සුඤ්ඤත විහාරාදී තෙවැදෑරුම් විහරණයට පැමිණීම නම් වූ අරණ විහාර ඤාණයයි. ප්‍රධාන වශයෙන් ඒ විහාර ත්‍රයට සිත නැවී පවත්නා වූ නුවණ තුන්වැනි අරණ විහාර ඤාණයයි. මෙසේ අරණ විහාර ඤාණ තුනෙකි. මෙහි අනුදර්ශනා ත්‍රය යනු අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා, යි. සංස්කාර ධර්ම අනිත්‍යය අනුව බැලීම අනිච්චානුපස්සනා නමි. සෙසු අනුපස්සනාද මේ අනුව සලකා ගතයුතු. මේ අනුපස්සනා තුනෙහිදීම අධිපති ප්‍රධාන-වනුයේ දර්ශනය නම් වූ දැකීමයි. නුවණින් පෙනීමයි ඒ අධිපති කොට ඇති දර්ශනය එක් අරණ විහාර ඤාණයෙකි. දෙවැන්නෙහි විහාර ත්‍රයකි. සුඤ්ඤත විහාර, අප්පණිහිත විහාර, අනිමිත්ත විහාර, යනුයි. මෙහි "විහාර" යනු විසීමයි. ඒ විසීම පෙර කී ත්‍රිලක්ෂණ යන් අතුරෙන් එක්තරා ලක්ෂණයකට අනුව පැවැත්වීමෙන් සුඤ්ඤතාදී ඒ ඒ නාමයන්ට අයත් වෙයි. සුඤ්ඤතාදිය ඉහත දී විස්තර කෙරිණ. මෙසේ ත්‍රිවිධ විහාර-විසීම්තුන-සඳහා යෙදෙන නුවණ එක් අරණ විහාර ඤාණයකි. තුන්වැන්නෙහි ආ ප්‍රණීත යැයි මෙනෙහි කිරීම ද තුන් වැදෑරුම්ය. එය ද අනිමිත්තාදී ත්‍රයට ම ඇතුලත්ව පවතී. වෙනස ඒ ත්‍රිවිධ විමොක්ෂමුඛයනට අනුව උපදවාගත් ඵලසමාපත්තියට සමවැදීම් වශයෙන් සිත නැමී පැවැත්මයි. ඊට පෙරටුව ගමන් කෙරෙන ප්‍රඥාව අනෙක් අරණ විහාර ඤාණයයි.

මෙහි අරණ විහාර යනු කෙලෙස් නො මැතිව විසීමයි. "අරණ විහාරෙති නික්කිලෙස විහාරෙ" යනු අටුවා විසඳීමයි. රාගාදී කෙලෙස් මලට "රණ"යැයි කියනු ලැබේ. මක්නිසාද? සත්වයන් වෙහෙසට පත්කරනුයේ කෙලෙස් මලින් නිසාය. එසේ ම ඒ කෙලෙස් නිසා සත්වයෝ හඬත්. වැලපෙත්. ඒ නිසා ද රාගාදීහු "රණ" නමි. පෙර කී අනිච්චානුපස්සනාදි තුන් වැදෑරුම විසීම, මේ රණ සංඛ්‍යාත කෙලෙස් මලින් වෙන් වී පවතින හෙයින් අරණ නමි. 'රාගාදයො හි රණනති සතෙත චුණෙණ

න්ති පීළෙන්තීති රණා, රණන්ති එතෙහි සත්තා කන්දන්ති පරිදෙවන්තීති වා රණා, බුතෙනා තිවිධො විහාරො, නත්ථි එතස්ස රණාති අරණො" යනු අටුවාකී.

තවද මීටම අරණ විභඞ්ග සූත්‍රයෙහි ආ ප්‍රතිපදා ක්‍රමය ද ඇතුළත් බව අටුවාවෙහි සඳහන් වෙයි. ඒ අරණ ප්‍රතිපදාව ද අරණ විහාරයක් හෙයිනි අරණ විභඞ්ග සූත්‍රය උද්දෙස, නිද්දෙස, වශයෙන් දෙපරිද්ද. එයින් මෙහිලා උද්දෙස පාළි පමණක් ඇතුළත් කොට කෙටි හැඳින්වීමක් කරමි.

(උද්දෙසය යනු මාතෘකා තැබීමයි. නිද්දෙස ඒ මාතෘකා විස්තර කිරීමයි.)

## අරණ විභඞ්ග සූත්‍රයේ උද්දෙසය.

"අරණවිභඞ්ගං වො භික්ඛවෙ දෙසිස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච. න කාමසුඛමනුයුඤ්ජෙය්‍ය හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං. න ච අත්තකිලමථානුයොගං අනුයුඤ්ජෙය්‍ය දුක්ඛං අනරියං අනත්ථසංහිතං. එතෙ ඛො උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. උස්සාදනඤ්ච ජඤ්ඤා, අපසාදනඤ්ච ජඤ්ඤා, උස්සාදනඤ්ච ඤත්වා අපසාදනඤ්ච ඤත්වා නෙවුස්සාදෙය්‍ය, නාපසාදෙය්‍ය, ධම්මමෙව දෙසෙය්‍ය, සුඛවිනිච්ඡයං ජඤ්ඤා, සුඛවිනිච්ඡයං ඤත්වා අජ්ඣත්තං සුඛමනුයුඤ්ජෙය්‍ය, රහොවාදං න භාසෙය්‍ය, සම්මුඛා න ඛීණං භණෙ, අතරමානො ච භාසෙය්‍ය නො තරමානො, ජනපදනිරුත්තිං නාභිනිවෙසෙය්‍ය, සමඤ්ඤං නාතිධාවෙය්‍යාති අයමුද්දෙසො අරණවිභඞ්ගස්ස" -ම. නි. (උ.ප.)

මහණෙනි, නුඹලාට අරණ විභඞ්ගය දේශනා කරමි. එය අසවු. මනාසේ මෙනෙහි කරවු. (මම) කියමි. ස්වාමීනි, එසේයැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දෙසූහ හීන=පහත්-වූ, ග්‍රාම්‍ය, පෘථග්ජනයන්ට ම අයත්, අනාර්‍ය්‍ය, අනර්ථය පිණිස පවතින, කාම සැපෙහි නො යෙදෙන්නේය. නො යෙදිය යුතුය. දුක් වූ, අනාර්‍ය්‍ය, අනර්ථය

පිණිස පවතින, අත්තකිලමථානුයෝගයෙහි-සැප බලාපොරොත්තුවෙන් පිළිපදින දැඩි දුක් ඇති වැරදි ශීලාදියෙහි - නොයෙදෙන්නේය. මේ අන්ත-කෙළවර-දෙක හැර, නුවණැස ලබාදෙන, නුවණ ලබාදෙන, ව්‍යුපසමනය පිණිස-විශිෂ්ට ඥානය පිණිස-අවබෝධය පිණිස - නිර්වාණය පිණිස පවතින මධ්‍යම ප්‍රතිපදාව තථාගතයන් විසින් අවබෝධ කරගන්නා ලදී. (ඒ මධ්‍යම ප්‍රතිපදාව නුවණැස ලබා දෙන්නකි. ඥාණය ලබාදෙන්නකි. ක්ලේශයන්ගේ ව්‍යුපසමනය-සංසිඳීම-ආර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කර දෙන විශිෂ්ට ඥාණය-ඔවුන්ගේ ම අවබෝධය-නිර්වාණය පිණිස පවතියි යනුයි)

උත්සාදනය දතයුතුය. අපසාදනය දතයුතුය. මේ දෙක දැන උත්සාදන-අපසාදන නො කරන්නේය. ධර්මය ම දේශනා කරන්නේය. සුඛ විනිශ්චය දතයුතුය. සුඛ විනිශ්චය දැන ආධ්‍යාත්මික වශයෙන් සැපයෙහි යෙදෙන්නේය. රහෝ වාදය නොකියන්නේය. ඉදිරියෙහි කිළුටු වචන නො කියන්නේය. ඉක්මන් නො වමින් නැවතීමක් ඇතිව කියන්නේය. ජනපද නිරුක්තියට නො බසින්නේය. ව්‍යවහාරය නො ඉක්ම වන්නේය. මේ අරණ විභඞ්ගයාගේ උද්දෙසයයි.

මෙහි, ආර්ය භාවය බලාපොරොත්තු වන්නහු විසින් නො යෙදිය යුතු අන්ත දෙකකි. කාමසුඛානුයෝගය, අත්තකිලමථානුයෝගය, යනුයි. රූපාදී පඤ්චකාමයන්හි ඇලී ගැලී වාසය කිරීම කාමසුඛානුයෝගියයි. ධම්මචක්ක සූත්‍රයේදී මෙය කාමසුඛල්ලිකානුයෝගයැයි දක්විණ. මෙහි දොස් පසෙකි. ශීලාචාර මනුෂ්‍ය විසින් ඉතා ලාමක-පහත්-දෙයක්යැයි සලකනු ලැබීම, සමාජයට නුසුදුසු ග්‍රාම්‍ය-පහත්-ධර්මයක් බව, කෙලෙස් ගහණ - වැඩි- පුද්ගලයන්ට ම අයත් එකක් බව, පහත් මිනිසුන්ට- අනාර්යයන්ට - අයත් බව, මෙලොව-පරලොව දියුණුවක් සලසා නො දෙන බව, යනුයි. (ර්) අත්තකිලමථානුයෝගය නම් සැප බලාපොරොත්තුවෙන් වැරදි සිල්,වත්, ආදියෙහි යෙදීම යි. ඒ නිසා ශරීරයට වෙහෙසක් ඇති වන හෙයින් අත්තකිලමථයැයි යෙයි. මෙහි දොස් තුනෙකි. දුක් සහගත බව, අනාර්යයන්ට අයත් බව, අවැඩ පිණිස පවතින බව, යනුයි.

මේ අන්ත දෙක හැරුණු විට ඇත්තේ මධ්‍යම ප්‍රතිපදාවයි. එහි ආනිශංස පෙර කී පරිදියි. ඉක්බිති සඳහන් වූයේ උත්සාදනය, අපසාදනය දෙක දැන, ඒ දෙකට නො බැස ධර්මය දේශනා කල

යුතුය යන්නයි. උස්සාදනය නම් ප්‍රශංසා කිරීම් වශයෙන් පුද්ගලයාව ඔසවා තැබීමයි. අපසාදනය යනු නින්‍දා කිරීම් වශයෙන් පහත් කොට සැලකීමයි. මේ දෙක කරනුයේ ධර්මදේශනයෙනි. ධර්මදේශනාවෙහි දී මේ උස්සාදන, අපසාදන, දෙක කළහොත් එය නියම ධර්මදේශනාවක් නොවේ. එහෙයින් එසේ නොකොට (ස්වභාවයෙන්) ඇතිසැටියෙන් ධර්මදේශනා කළයුතුය. ඒ මෙසේය. යමෙක් ප්‍රතිසන්ධියෙන් ම සැපයට පැමිණ කාමසුඛයට අනුව යෙදෙත් නම් හේ මිථ්‍යාමාර්ගයකට බැසගත්තෙක් වෙයි. යනාදී වශයෙන් නොකියා කාමසුඛයෙහි යෙදීම මිථ්‍යාමාර්ගය යැයි යනාදී වශයෙන් ධර්මයම කියයි. මෙසේ කෙනෙකුට පහර නො වදින ලෙස කිම ධර්මය කියන්නේ නම්, ඒ පිරිසුදු ධර්මදේශනා ක්‍රමයයි.

“සුඛවිනිශ්චය දැන” යනාදී වශයෙන් දැක්වෙනුයේ රූපාදී කාමවස්තූන් කෙලෙස් උපදවන සුළුය. එහෙයින් ඒවා නො සොයා ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන ලබාගෙන සිත්හි ඇතුළේ උපදවා ගත යුතු සැපයට පැමිණියයුතුය යන්නයි. එය නෛෂ්ක්‍රම්‍ය වූ ද, ප්‍රවිවේක-උත්කර්ශීවත්-වූ ද, චතුරාර්‍ය්‍ය සත්‍යධර්මය අවබෝධයට නමා ගත හැකි වූ ද සැපයක් හැටියට දැක්වෙයි. ඉක්බිති ධර්මදේශනාවෙහිදී වඩා ඉක්මන් නොවී, ශබ්දය තේරුම් ගත පරිද්දෙන් එම දේශනය කළයුතුයැයි දැක්වේ. ජනපද නිරුක්තියට-ඒ ඒ පෙදෙස්හි පවතින ව්‍යවහාර ක්‍රමයට නො බැස, පැණවීමද නො ඉක්මවා කථා ව්‍යවහාරය යොදාගත යුත්තේයයි ද සඳහනි.

මේ දැක් වූ ක්‍රම අතුරෙන් යමක් ආයතියට අහිත පිණිස පවතී නම් එය “සරණ” ධර්මයෙකි. අහිත පිණිස නො පවත්නේ නම් ඒ “අරණ” ධර්මයෙකි. යනුවෙන් දේශනා කොට, අරණ ධර්මයට අනුව පිළිපදනා හැටියට අවවාද කළ සේක. අවශානයේ “සුභූති” මහරහතන් වහන්සේ අරණ විහාරීන් අතුරෙන් අග්‍රයැයි ද දේශනා කරමින් සූත්‍රය හමාර කළහ. මේ අරණ විභඞ්ග සූත්‍රයේ කෙටි අදහසයි. විස්තර කැමැත්තෝ මජ්ඣිම නිකාය සහ එම අටුවාව බලත්වා!

“තත්‍ථ මජ්ඣිමං පටිපදං දස්සනාදි පතෙතයොගා න ච සඟෙතන හ විහාරාධිගමෙනච සඞ්ගහිතා, කාමසුඛං අත්තකිලමථං අනනුයොගො මජ්ඣිමා පටිපදා එව. අරහතො හි විපස්සනා පුබ්බභාග මජ්ඣිමා පටිපදා හොති අරහත්ත ඵලසමාපත්ති අපරභාගමග්ග වසෙන මජ්ඣිමා පටිපදා, අවසෙසා පන පණ්ණාසිමුත්තනතාය එව සඞ්ගහිතාති වෙදිතබ්බා” -ප. ම. අ.

ඒ අරණ විභඞ්ගයෙහි මධ්‍යම ප්‍රතිපදාව දැකීම මූලික කොට ගෙන ද, සැනසුම් විසීම ලැබුමෙත් ද ගොණු වී ඇත. කාම සැපය, අත්තකිලමථනය - ශරීරය වෙහෙස කරවීම-යන මේ දෙකෙහි නො යෙදීම ම මධ්‍යම ප්‍රතිපදා නමි රහතන් වහන්සේට වනාහි විදසුන් වැඩීම පිළිබඳ මූලික පිළිවෙත මධ්‍යම ප්‍රතිපදාව වෙයි. අර්හත් ඵලසමාපත්තිය ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග්‍ය වශයෙන් මධ්‍යම ප්‍රතිපදාවයි. සෙස්සන් ගේ ප්‍රතිපදාවත් ප්‍රණීතාධිමුක්ත භාවයෙන් ම සඞ්ග්‍රහ වූයේ යයි දතයුතු. (කෙලෙසුන් ගෙන් නිදහස් බවෙහි ඇලී විසීම ඵලයට නැමී පැවැත්ම ප්‍රණීතාධිමුක්ත භාවයයි. මෙය අනිච්චානුපස්සනාදියෙන් හැඳින් විණා මෙසේ හෙයින් විදර්ශනා ඥානය අධිපතිකොට ගෙන ද, ශාන්ත වූ විහරණයට පැමිණීම නිසා ද, ඵලසමාපත්තියට නැමී පවත්නා නිසා ද, ඒ සඳහා යෙදුනු නුවණ අරණ විහාර ඥාණය බව දතයුතු.

"අරණ විහාර යනු ප්‍රථම ධ්‍යානය අරණ විහාර නමි. ද්විතීය ධ්‍යානය අරණ විහාර නමි. ......" මේ ආදී වශයෙන් අරණ විහාරය දේශනා කළ බුදුරජාණන් වහන්සේ අෂ්ට සමාපත්තීහු ද අරණ විහාරයැයි සඳහන් කළහ. මෙසේ ත්‍රිවිධ අනුදර්ශනා, ත්‍රිවිධ විමොක්ෂ මුඛ, ත්‍රිවිධ ඵල සමාපත්ති, යන' මෙතෙක් ධම්යන් පිළිබඳ නුවණ මෙහෙයවා විසීම කෙලෙසුන් කෙරෙන් දුරුව වාසය කිරීම නිසා, එක් එක් අරණ විහාර නම් වෙයි. ඒ අවස්ථාවන්හි පවත්නා ඥානය, දැකීම් අර්ථයෙන් ඥාණ නමි. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නමි. එහෙයින් දැකීම් අධිපති කොට ඇති, ශාන්ත වූ විහාරයට පැමිණීම වූ ප්‍රණීත වූ ඵලයට නැමී පවත්නා ප්‍රඥාව අරණ විහාර ඥාණයැයි කියනු ලැබේ.

අරණ විහාර ඥාණය නිමි.

## 21 වැනි පරිච්ඡේදය

# 34. නිරෝධ සමාපත්ති ඤාණය

"දෙවැදෑරුම් වූ සමථ බල විපස්සනා බලයන්ගෙන් සම්පූර්ණවීම හේතු කොට ගෙන ද, කාය සංඛාර - වචී සංඛාර - චිත්ත සංඛාර යන ත්‍රිවිධ සංස්කාරයන්ගේ සංසිඳීම හේතු කොට ගෙන ද, සොළොස් වැදෑරුම් වූ ඤාණයන් ගෙන් යුක්තවීම හේතු කොට ගෙන ද, නවවැදෑරුම් සමාධින්ගෙන් යුක්තවීම හේතු කොට ගෙන ද, වශී බවට පැමිණියහුගේ බව යැයි කියන ලද ප්‍රඥාව නිරෝධ සමාපත්ති ඤාණ නම්."

මෙහි ඇත්තා වූ ධර්ම විස්තර කිරීමට ප්‍රථමයෙන් දතයුත්තේ නිරෝධ සමාපත්ති යනු කවරේ ද යන්නයි. එහෙයින් මෙහිලා ඒ පිළිබඳ හැඳින්වීමක් කෙරේ.

### නිරෝධ සමාපත්තිය.

ප්‍රථම ධ්‍යානාදියට සම වැදෙමින් පිළිවෙලින් චිත්ත - චෛතසිකයන්ගේ පැවැත්ම නැවැත්වීම නිරෝධ සමාපත්ති නම්. "කතමා නිරෝධ සමාපත්තීති? යා අනුපුබ්බනිරෝධ වසෙන චිත්ත චෙතසිකානං ධම්මානං අප්පවත්ති" එහි නිරෝධ සමාපත්තිය යනු කවරේ ද? අනු පූර්ව නිරුද්ධ කිරීම වශයෙන් චිත්ත චෛතසික ධර්මයන්ගේ යම් නො පැවැත්මක් වෙයි ද ඒ නිරෝධ සමාපත්ති යැයි අටුවාවෙහි සඳහන් වෙයි. අනුපූර්ව නිරෝධ නම් ඒ ඒ සමාපත්තීන්ගෙන් විරුද්ධ ධර්මයන් නිරුද්ධ කරමින් පිළිවෙලින් නිරෝධ සමාපත්තියට පැමිණීමයි. එහි පිළිවෙල මෙසේය. නිරෝධ සමාපත්තියට සම වදිනු කැමති අෂ්ට සමාපත්තිලාභී අනාගාමී ආර්යයා හෝ රහතන් වහන්සේ හෝ පළමුවෙන් ප්‍රථමධ්‍යානයට සමවැද එයින් නැගී සංස්කාර ධර්ම විදර්ශනා කරයි මේ විදර්ශනාව සංස්කාර ධර්ම පරිග්‍රාහක යැ. (පිරිසිඳීමයි.) ඵල සමාපත්තියැ, නිරෝධ සමාපත්තියැයි තුන් ආකාර වෙයි. එයින් සංස්කාර ධර්ම පරිග්‍රාහක විදර්ශනාව හෙමිහිට වූවත් වේගවත් වූවත් මාර්ගයට ආසන්න කාරණ වෙයි. ඵල සමාපත්ති විදර්ශනාව (සමවැදීම සඳහායි) මාර්ගභාවනාව හා

සමානයි. නිරෝධ සමාපත්ති විදර්ශනාව ඉතා මන්ද වූයේ ද නො මැතිව, ඉතා තීක්ෂණ වූයේ ද නොමැතිව, පැවැත්ම සුදුසුය. මෙසේ විදර්ශනා කර, නැවත ද්විතීය ධ්‍යානයට ආදී වශයෙන් පිළිවෙලින් සමවදිමින් විදර්ශනා කර, අවසානයේ දී ආකිඤ්චඤ්ඤායතනයට සම්වැද, එයින් නැගී සතර වැදෑරුම් පූර්ව කෘත්‍යය - පෙර කළයුතු දෑ - තදු කෙරේ. ඒවා නම් නානාබද්ධ අවිකොපනය, සඞ්ඝපතිමානය, සත්ථුපක්කොසනය, අද්ධානපරිච්ඡේදය, යනුයි.

1. නානාබද්ධ අවිකොපනය: නිරෝධයට සමවදින භික්ෂුව ගේ හැද පෙරවූ සිවුරු ආදිය ඒකාබද්ධයි. ඒවායින් අන්‍ය වූ පිරිකර, කුටි ආදී දෑ නානාබද්ධ නම්. ඒවා නො නැසෙන පරිද්දෙන් අධිෂ්ඨාන කිරීම නානාබද්ධ අවිකෝපනයයි. ඒකාබද්ධ පරිෂ්කාර සමාපත්තිය නිසාම රැකේ. අධිෂ්ඨානයක් අනවශ්‍යය. සෙසු පරිෂ්කාර අධිෂ්ඨාන කළ යුතුය. ඒ මෙසේය. "මේ සත් දින ඇතුලත දී මේ මේ දේ ගින්නෙන් හෝ ජලයෙන් හෝ අන් කිසිවකින් හෝ විනාශ නොවේවා"යි ඉටීමයි. මෙසේ නො ඉටූ යමක් ඇත්නම් ගිනි ආදියක් පැමිණි කල විනාශ වෙයි. මේ නානාබද්ධ අවිකොපන කෘත්‍යයයි.

2. සඞ්ඝපතිමානනය: භික්ෂූන්ගේ විනය කර්මාදිය සිදු කරන අවස්ථාවේදී තමා ගැන බලාපොරොත්තු ඇතිවීම සඞ්ඝ පතිමානනය නම්. පතිමානනය යන්නෙන් ගෞරවය, බලාපොරොත්තුව කියැවේ. නිරෝධ සමාපත්තියට සම වැදෙන්නහු විසින් "ඉදින් මා විසින් මේ සත් දින නිරෝධ සමවතට සම්වැදී සිටින කල්හි සඞ්ඝයාගේ අපලෝකන කර්මාදී යම්කිසි විනය කර්මයක් කරනු කැමතිව මා කැඳවීම සඳහා අන් භික්ෂුවක් පැමිණීමට ප්‍රථම නැගී සිටිය යුතුය." යි අධිෂ්ඨාන කළයුතු] එසේ කළවිට සුදුසු අවස්ථාවේදී නැගී සිටීම වෙයි. අධිෂ්ඨාන නො කොට සමවදියි නම් ඒ සම්වැදී සිටින කල්හි පෙර කී ලෙස සඞ්ඝ කර්මයක් එළඹුන හොත් "අසවල් භික්ෂු, සඞ්ඝයාගේ වචනයෙන් අඬගසා"යි භික්ෂූහු ඒ භික්ෂු වෙත පණිවුඩයක් යවත්. ඒ ගිය භික්ෂු ඇසෙන දුර සිට "ඇවැත්නි, සඞ්ඝයා ඔබව බලාපොරොත්තු වෙයිය" යි කියයි. එය ඇසුනු වහාම නැගිටීම සිදුවේ. මක්නිසාද? සඞ්ඝයාගේ අණවුම බලවත් හෙයිනි. එහෙයින් ඊට කලින් සඞ්ඝ පතිමානනය කළ යුතු.

3. සත්ථුපක්කොසනය: බුදුරජාණන් වහන්සේ යම්කිසි කරුණකදී මා කැඳවීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ අවස්ථාවේදී නැගී සිටිය යුතුයැ"යි අධිෂ්ඨාන කිරීම සත්ථුපක්කොසනය නම්. මෙය සඞ්ඝපතිමානනය හා සමානයි.

4. අද්ධාන පරිච්ඡේදය: ජීවිතය පවතින කාල සීමාව දැන ගැනීමයි. නිරොධ සමාපත්තියට සමවැදී සිටිද්දී ජීවිත කාලය අවසන් විණි නම් මරණය සිදුවේමය. එහෙයින් සමවැදීමට පළමු 'මගේ ජීවිතය මේ සත් දින තුළ පවතීද'' යි ආවර්ජනා කළ යුතුය.

මෙසේ සතර පූර්ව කෘත්‍යයන් සිද්ධ කොට නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට සමවදියි. ඉක්බිති සිත වරක් හෝ දෙවරක් හෝ ඉපද නිරුද්ධ වෙයි. සිත දෙවරකට වඩා නූපදිනුයේ සමථබල, විදර්ශනා බල, දෙකින් උත්සාහ දුන වූ හෙයිනි. මෙසේ පිළිවෙලින් නිරෝධ සමාපත්තියට සමවැදීම අනුපූර්ව නිරෝධ නමි. නිරෝධ සමාපත්තියට සමවැදුනහු විසින් ක්‍රම දෙකකින් නැගිටීම සිද්ධ කරනු ලැබේ. අනාගාමීහු නම් අනාගාමී -ඵල සමාපත්තියට සමවැදීමෙන් ද, රහතන් වහන්සේ අර්හත්තඵල සමාපත්තියට සමවැදීමෙන් ද, නැගිටියි ඒ නැගී සිටියහුගේ සිත නිර්වාණය වෙතම නැමී සිටියේ වෙයි එයින් ස්‍රීන විශාඛ සූත්‍රයෙහි: 'සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියා වුට්ඨිතස්ස ඛො ආවුසො විසාඛ භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරං'' ඇමැත් විශාඛයෙනි, සඤ්ඤාවෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගී සිටි භික්ෂුවගේ සිත උපධි විවේක නම් වූ නිර්වාණය වෙත නැමුණේ වෙයි. එයට හැරවුණේ වෙයි කියායි.

මැරුණහුගේ ද සමවැදුනහුගේ ද වෙනස:

''ය්වායං ඛො ආවුසො මතො කාලඞ්කතො තස්ස කාය සඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා, වචීසඞ්ඛාරා - චිත්තසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා; ආයු පරික්ඛීණො උස්මා වූපසන්තා, ඉන්ද්‍රියානි පරිභින්නානි ය්වායං භික්ඛු සඤ්ඤාවෙදයිත නිරොධං සමාපන්නො තස්සපි කායසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා වචීසඞ්ඛාරා - චිත්තසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා, ආයු අපරික්ඛීණො උස්මා අවූපසන්තා, ඉන්ද්‍රියානි අපරිභින්නානි'' මෙසින් මෙ දෙදෙනාගේ වෙනස දක්වූහ. මළ තැනැත්තාගේ කාය - වචී - චිත්ත යන සංස්කාරයන් නිරුද්ධ වන අතර ආයුෂය, උෂ්ණය, ඉන්ද්‍රියන්, යන මොවුන් ද විනාශ වෙයි නිරොධ සමාපත්තියට සමවැදුනහු ගේ කායාදි සංස්කාර නිරුද්ධ වුවත් ආයුෂය ඉතිරි වෙයි. උෂ්ණය පැතිරී පවතියි. ඉන්ද්‍රිය බිඳුනේ නොවෙයි. මේය වෙනස.

ඉක්බිති නිරොධ සමාපත්තියෙහි ඇත්තා වූ ගුණ විශෙෂය පැහැදිලි කරමි. නිරොධ සමාපත්තියෙහි ප්‍රධාන ගුණ පහක් ඉහත දක්වූ පාඨයෙන් සඳහන් වෙයි. එයින් පළමුවැන්න සමථ බල, විදර්ශනා බල දෙකින් යුක්තවීමයි. සමථ බලය උපචාර, අර්පණා වශයෙන් දෙවැදෑරුම්ය. කාමච්ඡන්දය යටපත් කිරීම් වශයෙන් උපදනා නෙක්ඛම්ම සංකප්පය නිසා සිත අවික්ෂෙපයට පත්වෙයි. ඒ එක් සමථ බලයෙකි. එසේම ව්‍යාපාදය යටපත් කරන අව්‍යාපාදය, ථිනමිද්ධය, යටපත් කරන ආලෝක සඤ්ඤාව, උද්ධච්චය, යටපත් කරන ඒකග්ගතාවය, මිථ්‍යාවිතර්ක - වැරදි කල්පනා - යටපත් කරන ආනාපාන සතියෙහි අවසාන ක්‍රමය වූ පටිනිස්සග්ගානුපස්සී ආශ්වාස ප්‍රශ්වාස සිත නිසා ඇති කරන සිතෙහි ඒකාග්‍රතාව, යන මෙතෙක් ධර්ම උපචාර වශයෙන් දක්වෙන සමථ බලයයි. ප්‍රථම ධ්‍යානාදී අෂ්ටසමාපත්තීන්ගෙන් ඇතිවන ඊට විරුද්ධ ධර්මයන් යටපත් කරන ඒකග්ගතාවෝ අර්පණා වශයෙන් දක්වෙන සමථ බලයෝයි. මෙසේ සමථ බල දෙවැදෑරුම් වෙයි.

විදර්ශනා බලය සත්වැදෑරුම් ය. අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා, නිබ්බිදානුපස්සනා, විරාගානුපස්සනා, නිරොධානුපස්සනා, පටිනිස්සග්ගානුපස්සනා, යන ක්‍රම සතට අනුව කෙලෙසුන් දුරු කිරීමයි, මේ සප්තානුදර්ශනායන්ගෙන් දුරු කෙරෙන ක්ලෙශ ධර්මයන් ඉහත දී දක්විණ මෙසේ පවත්නා බලවේගය විදර්ශනා බල නම්

ත්‍රිවිධ සංස්කාරයන් සංසිඳවීම දෙවැනි ගුණයයි. ඒ ත්‍රිවිධ සංස්කාරයෝ නම් කාය - වචී - චිත්ත සංස්කාරයෝය. මෙහි ‘සඞ්ඛාර” යනු ප්‍රයෝගයකට නමකි. කාය ප්‍රයෝගය කාය සංඛාරයි. සෙස්ස ද මෙසේයි. ප්‍රයෝග යනු උත්සාහ දැනවීමයි. නිරොධ සමාපත්තියට සමවැදුනහුගේ මේ තෙවැදෑරුම් ප්‍රයෝගයෝම නිරුද්ධ වෙත් එහි ද්විතීය ධ්‍යානයට සමවැදීමෙන් වචී සංඛාරයන්ට මූලික හේතු වූ විතර්ක විචාර දෙදෙනා සංසිඳීම නිසා වචී සංඛාරයෝ නිරුද්ධ වෙත්. චතුර්ථ ධ්‍යානයට සමවැදීම නිසා ඉතිරි වූ ආශ්වාස - ප්‍රශ්වාස කාය සංස්කාරයෝ නිරුද්ධ වෙත්. සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට සමවැදීමෙන් චිත්ත සංඛාර වූ සඤ්ඤා, වෙදනා, ඒ සමග යෙදුනු ධර්ම, මේ හැම සංසිඳෙයි. නිරුද්ධ වෙයි.

තුන්වැනි ගුණය සොළොස් වැදෑරුම් ඥාන චර්‍ය්‍යාවන්ගෙන් යුක්ත බවයි. සොළොස් වැදෑරුම් ඥාන චර්‍ය්‍යාවෝ නම් අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, නිබ්බිදානුපස්සනා; විරාගානුපස්සනා,

නිරොධානුපස්සනා, පටිසංඛානුපස්සනා, පටිනිස්සග්ගානුපස්සනා, විවට්ටානුපස්සනා, සෝතාපත්ති මග්ග, සෝතාපත්තිඵල සමාපත්ති, සකෘදාගාමී මග්ග, සකෘදාගාමි ඵල සමාපත්ති, අනාගාමි මග්ග, අනාගාමි ඵල සමාපත්ති, අර්හත්ත මග්ග, අරහත්ත ඵල සමාපත්ති, යන මොහුයි පටිසම්භිදාමග්ගයෙහි පටිසංඛානුපස්සනාව අස් කොට අනත්තානුපස්සනාව බහා සොළොසක් දක්වේ. අනුපස්සනා පිළිබඳ විස්තර ඉහතදී දක්විණි. මේ දසය වැදෑරුම් විසිම් ක්‍රම ඤාණ චර්යා නම් වෙයි. නිරෝධ සමාපත්තියට සම වැදෙන්නාහු පිළිවෙළින් මේ දසයෙහිම ගමන් කෙරෙත්.

නව වැදෑරුම් සමාධි චර්යාවන්ගෙන් යුක්තවීම සිවුවැනි ගුණයයි. අෂ්ටසමාපත්ති හා ඔවුන්ගේ උපචාර සමාධි, නවවැදෑරුම් සමාධි චර්යාවෝයි.

පස්වැනි ගුණය වශී භාවයට පැමිණීමයි. වශී පඤ්චවිධය. ආවජ්ජන වසී, සමාපජ්ජන වසී, අධිට්ඨාන වසී, වුට්ඨාන වසී, පච්චවෙක්ඛණ වසී, යනුයි.

ප්‍රථම ධ්‍යානයට, යම් තැනෙක කැමති ද, යම්කලෙක කැමති ද, යම්තාක් කැමති ද, ඒ වූ පරිදි ආවර්ජනා කරයි. ඒ ආවර්ජනා කිරීමෙහි කල්ගත වීමක් නැත්තේනුයි ආවජ්ජන වසී නම්. එසේම එයට සමවැදීමෙහි කල් පසුවීමක් නොමැති බව, සමර්ථතාව, සමාපජ්ජන වසීයි. ඒ අයුරින්ම අධිෂ්ඨාන කිරීමේ හැකියාව දක්ෂතාව අධිට්ඨාන, වසී නම්. කල් පසුවීමක් නොමැතිව නැගිටීමේ සමර්ථ භාවය වුට්ඨාන වසීයි. ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙහි - ප්‍රත්‍යවෙක්ෂා ජවනයන් කෙරෙත් නැවතී බැලීමෙහි - සමර්ථ භාවය පච්චවෙක්ඛණ වසී නම්. මෙසේ වසී පස්වැදෑරුමය.

ද්විතීය ධ්‍යානාදිය පිළිබඳව ද, මෙම ක්‍රමයයි. ආවර්ජන වශී භාවයට පැමිණෙන පිළිවෙළ මෙසේය. ප්‍රථම ධ්‍යානයෙන් නැගිට විතර්කය ආවර්ජනා කරන්නහුට භවඞ්ගය සිඳී පැවතියා වූ ආවර්ජනයට අනතුරුව විතර්කය අරමුණු කොටම සතර පස් ජවනයෝ දුවත්. ඊට පසු භවඞ්ග දෙකකි. එයින් නැවත විචාරය අරමුණු කොට ආවර්ජනය කරන්නහුට පෙරසේම ජවන් සිත් දුවයි, මෙසේ ධ්‍යානාඞ්ග පස කෙරෙහි නිරතුරුවම සිත යැවීමට හැකි වෙයි ද එවිට ඔහුගේ ආවර්ජන වශීභාවය සිද්ධවූයේ නම් වෙයි. මේ වසී භාවය හැම අයුරින්ම සම්පූර්ණ වූයේ බුදුරජාණන්වහන්සේගේ යමක මහා ප්‍රාතිහාර්ය්‍ය අවස්ථාවේදීය. මීට එහා වෙගා දීමෙන ආවර්ජනා වශියක් නොමැත. මුගලන්

හිමියන්ගේ නන්දෝපනන්ද නාගරාජ දමනයෙහි මෙන් වහ වහා සමාපත්තියට සමවැදීමේ දක්ෂකම සමාපජ්ජන වසීභාවයයි. මේ අයුරින් දක්වෙන පස් වැදෑරුම් වශී ක්‍රම නිරෝධ සමාපත්ති යෙහිලා ඇතුලත් වෙයි.

සමථ - විපස්සනා දෙවැදෑරුම් බලඅංගී පසළොස් මහා ගුණයන් ගෙන් හෙබියා වූ ප්‍රඥාව නිරෝධ සමාපත්ති ඤාණයැයි කියනු කියනු ලැබේ. අෂ්ටසමාපත්තිලාභී අනාගාමී, අර්හත්, ආර්යයන්ට පමණි මෙයට සමවැදීමට හැකියේ.

## 35. පරිනිබ්බාණ ඤාණය

“මනාව ප්‍රකාරයෙන් දත්තහුගේ ක්ලේශයන්ගේ ද ස්කන්ධයන්ගේ ද පැවැත්ම අවශාන කිරීමෙහි වූ ප්‍රඥාව පරිනිබ්බාණ ඤාණ නම්” මනාව ප්‍රකාරයෙන් දැනීම යනු හැම අයුරින් ම පඤ්චස්කන්ධය පිළිබඳ වටහා ගැනීමයි. මෙය නව මහා විදර්ශනා ඥාන හා සම්බන්ධය. ඊට මුලින් පවත්නා ධ්‍යාන සම්ප්‍රයුක්ත - ධ්‍යාන හා යෙදුනු - ඥානයද, කාමාවචර කුශල් කිරීමේදී උපදවා ගතයුතු ඥානය ද, මීට ම ඇතුලත් වන බව දතයුතුය. ඥානයෙහි දියුණුම අවස්ථාව මෙනයි පරිනිබ්බාණ ඥානයෙහිදී “සම්පජාන” මනාව ප්‍රකාරයෙන් දැනීම දක්වූයේ පැවැත්ම නම් කෙලෙසුන්ගේත් ස්කන්ධයන්ගේත් පැවැත්මයි. හැම අවස්ථාවේදීම හැසිරෙන හෙයින් පැවැත්ම යයි එයි. “පවත්තනං පවත්තං සමුදාචාරෝති අත්ථො” සමුදාචාර නම් බහුල වශයෙන් හැසිරීමයි. ක්ලේශයන්ගේ පැවැත්ම අවස්ථා ත්‍රයකදී අවශාන කෙරේ. තදඞ්ග, විෂ්කම්භන සමුච්ඡේද යනු ඒ අවස්ථාත්‍රයයි. කාමාවචර කුශල් කිරීමේදී ලෝභාදී අකුශල ධර්ම තදඞ්ග වශයෙන් අවශාන කෙරේ. තදඞ්ග වශයෙන් අවසාන කෙරේ. තදඞ්ග යනු ඒ වේලාවට පමණක් කෙලෙස් යටපත් කිරීමයි. ධ්‍යාන කුශලයන්හිදී විෂ්කම්භන වශයෙන් කෙලෙස් අවශාන කෙරේ. විෂ්කම්භන යනු බොහෝ වේලාවක් පවතින තෙක් කෙලෙස් යටපත් කොට ගැනුමයි. කෙලෙස් කම්පාකොට හරී යනුද කියනුයේ මේ අවස්ථාව ගෙනය. නැවත නූපදින අයුරින් කෙලෙස් අවසාන කිරීම සමුච්ඡේද අවස්ථාවයි. මහාසේසිඳදැමීම එයින් කියැවේ. මේය ලෝකෝත්තර කුශලයන්ගෙන් සිදුවන්නකි. මෙසේ කෙලෙසුන් කෙළවර කිරීම අවස්ථා තුනකදී ම සිදුවෙයි.

පරිනිබ්බාණ ඥාණය දෙවැදෑරුම්ය. ස්කන්ධ පරිනිර්වාණය, ක්ලේශ පරිනිර්වාණය යනුයි. සෝවාන් ආදී වශයෙන් දක්වූයේ ක්ලේශ පරිනිර්වාණය යි. කෙලෙස් ප්‍රහාණය කළ රහතන් වහන්සේගේ ජීවිත අවසානය - මරණය - ස්කන්ධ පරිනිර්වාණය යි. ක්ලේශ පරිනිර්වාණය සඋපාදිශේෂ පරිනිබ්බාණ ධාතු යනුද නමැති. පඤ්චස්කන්ධය ඉතිරිව කෙලෙස් පමණක් අත්කිරීම සඋපාදිශේෂ පරිනිබ්බාණ නම්. එහි "උපාදි" යනු මමය, මාගේය යනාදී වශයෙන් තදින් අල්ලා ගැනීමයි. මෙය පඤ්චස්කන්ධයට නමකි. පඤ්චස්කන්ධය ඉතිරිවූයේ උපාදිශේෂයයි. එයින් යුක්ත වූයේ සඋපාදිශේෂයයි. "උපාදීයතෙ අහං මමාති භුසං ගණ්හීයතීති උපාදි, ඛන්ධපඤ්චකස්සෙතං අධිවචනං. උපාදියෙව සෙසො අවසිට්ඨොති උපාදිසෙසො, සහ උපාදිසෙසෙන වත්තතීති සඋපාදිසෙසා" යනු අටුවායි. ස්කන්ධ පරිනිර්වාණය අනුපාදිශේෂ පරිනිබ්බාන ධාතු නම්. මෙසේ පරිනිබ්බාණ ඥාණය සෝවාන් ආදි වශයෙන් අවස්ථා තුනෙහිදීද, දෙවැදෑරුම් පරිනිර්වාණයන්හිදීද යෙදෙන බව දතයුතුය.

මේ ශාසනයෙහි මනා නුවණින් යුක්ත වූ තැනැත්තේ ධ්‍යානයෙන් කාමච්ඡන්දයාගේ පැවැත්ම කෙළවර කරයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ පැවැත්ම කෙළවර කරයි.' -- ප. ම. (සිං. ප.) මේ අයුරින් පරිනිබ්බාණ ඥානයෙන් ඒ ඒ ධ්‍යාන අවස්ථාවන්හිදී කාමච්ඡන්දාදි විරුද්ධ ධර්මයන්ගේ පැවැත්මද, මාර්ග අවස්ථාවන්හිදී නිත්‍ය, සුඛ, සුබාදී වශයෙන් සත්‍යා දෘෂ්ටිය මුල්කොට ඇති කෙලෙසුන්ගේ පැවැත්ම ද, කෙලවර කරයි. අවසානයෙහි ස්කන්ධ පරිනිර්වාණයෙන්-අනුපාදිශේෂ පරිනිබ්බාන ධාතුයෙන් පිරිනිවන් පෑම නිසා චක්ෂුරාදි ඉන්ද්‍රියධර්මයන්ගේද පැවැත්ම කෙලවර කරයි යනුවෙන් පරිනිබ්බාණ ඥාණය විස්තර වෙයි, පඤ්චස්කන්ධය මෙහි ඉන්ද්‍රිය ධර්ම වශයෙන් දක්වූහ. මෙසේ මනාව ප්‍රකාරයෙන් දන්නහුගේ ක්ලේශයන්ගේද ස්කන්ධයන්ගේද පැවැත්ම කෙළවර කිරීමෙහි ප්‍රඥාව පරිනිබ්බාණ ඥාණය නම්.

## 36. සමසීසට්ඨ ඥාණය

සබ්බ ධම්මානං සම්මා සමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං"

සියලු ධර්මයන් මනාලෙස සිඳීමෙහි ද, නිරුද්ධ කිරීමෙහිද නොඉපදවීමෙහි ද, නුවණ සමසීසට්ඨ ඤාණ නම්. කාමාවචරාදී ත්‍රිවිධ භූමින්ට ඇතුලත් වූ සියලු ධර්ම ''සබ්බධම්මානං'' යන පදයට ගනු ලැබේ ඒ ධර්ම මනාකොට සිඳිනුයේ ලෝකෝත්තර මාර්ගයන්හිදීය. මනාකොට සිඳීම නම් නැවත නූපදින පරිද්දෙන් අස් කිරීමයි. ඒ සිඳීමත් සමගම ඊළඟට දක්වූ නිරුද්ධ කිරීමත්, නොඉපදවීමත්, දෙකම සිදුවෙයි. මෙසේ ඒ ත්‍රෛභූමක ධර්මයන් නැවත නූපදනා ලෙස සිඳ දැමීමෙහි නුවණ සමසීසට්ඨ ඤාණයයි.

''සමසීසට්ඨෙ ඤාණන්ති නෙක්ඛම්මාදීනි සත්තතිංස සමානි, තණ්හාදීනි තෙරස සීසානි, පවත්තිකධම්මානං සමිතත්තා සමානි යථායොගං පධානත්තා උච්චතත්තා ච සීසානි එකස්මිං ඉරියාපථෙ වා එකස්මිං රොගෙ වා සමානං සන්තති වසෙන එකස්මිං ජීවිතින්ද්‍රියෙ වා නෙක්ඛම්මාදීනි සමානි ච සද්ධාදීනි ච අස්ස සන්තීති සමසීසී සමසීසස්ස අත්ථො සමසීසට්ඨො, තස්මිං සමසීසට්ඨෙ, සමසීසිභාවෙති අත්ථො'' ප. ම. අ.

සමශීර්ෂාර්ථයෙහි ඥානය යනු නෛෂ්ක්‍රම්‍යාදී සමධර්ම සත් තිසෙකි. තෘෂ්ණාදී ශීර්ෂධර්ම තෙළෙසකි. එහි සම යනු විරුද්ධ ධර්මයන්ගේ සංසිඳීමෙන් ඇතිවන සැනසුම් ගතියයි. ශීර්ෂ යනු සුදුසු පරිද්දෙන් මූල්වීම, කෙළවර යනු මෙයයි, එක් ඉරියව්වකදී හෝ එක් රෝගයකදී හෝ සමාන පැවතුම් වශයෙන් ඇති එක් ජීවිතින්ද්‍රියකදී හෝ නෛෂ්ක්‍රම්‍යාදී සම ධර්මද ශ්‍රද්ධාදීහුද මොහුට ඇත්තේනුයි සමසීසී නම්. සමසීර්ෂයාගේ, අර්ථය සමශීර්ෂාර්ථයි. සප්තම්‍යර්ථයෙහි යෙදූ කල සමශීර්ෂාර්ථයෙහි යනුවෙන් එයි. තේරුම සමසීසභාවය යනුයි.

විස්තර මෙසේය. එක් ඉරියව්වකදී හෝ එක් රෝගයකදී හෝ සමාන පැවතුම් වශයෙන් එක් ජීවිතින්ද්‍රියකදී හෝ විදර්ශනාව ආරම්භකොට ඒ ඉරියව්ව, රෝගය, ජීවිතය ඇතුලත දීම - ඒවා පවතිද්දීම - මාර්ගඵලයන්ට පැමිණ ඒ ඉරියාපථාදියෙහිම පරිනිර්වාණයට පත්වන්නාවූ රහතන් වහන්සේට සමසීස භාවයවෙයි. ඒ සමසීසි භාවයෙහි ඥානය සමසීසට්ඨ ඤාණය නම්. පුග්ගලපඤ්ඤත්තියෙහි එනම් ඇති අභිධර්ම ග්‍රන්ථයෙහි - හා එහි අටුවාවෙහි මෙසේ දක්වේ.

''කතමො ච පුග්ගලො සමසීසී? යස්ස පුග්ගලස්ස අපුබ්බං අචරිමං ආසව පරියාදානඤ්ච හොති ජීවිතපරියාදානඤ්ච

අයං වුච්චති පුග්ගලො සමසීසී" සමසීසී පුද්ගලයා කවරේද යම් පුද්ගලයෙකුට පෙර පසු නොවී ආශ්‍රවයන්ගේ අවසානයත් ජීවිතයේ අවසානයත් වේද ඒ පුද්ගලයා සමසීසී යැයි කියනු ලැබේ.

අටුවා:- සමසීසී නිද්දෙසෙ අපුබ්බං අචරිමන්ති අපුරෙ අපච්ඡා සන්තතිපච්චුප්පන්න වසෙන එකවාරං යෙව එක කාලං යෙවාති අත්ථො පරියාදානන්ති පරික්ඛයො අයංති අයං පුග්ගලො සමසීසී නාම වුච්චති' සමසීසී කොටසෙහි අපුබ්බං අචරිමං යනු පෙර නොවී, පසු නොවී එනම් සන්තතිපච්චුප්පන්න වශයෙන් එක් වරක්, එක් කාලයක් යන තේරුමයි. සන්තති පච්චුප්පන්න යනු ආහාර, සෘතු ආදී වශයෙන් සමාන රූප ධර්ම පවතින අවස්ථාවයි, රූපස්කන්ධයෙදී මෙය පැහැදිලි කෙරිණි. ඉතාමත් කෙටි කාලයක් දක්වීම සඳහා මෙසේ ප්‍රකාශ විණි. පරියාදානං යනු ගෙවීමයි. අයං යන්නෙන් සමසීසී පුද්ගලයා කියැවෙයි.

## සමසීසී පුද්ගලයෝ තිදෙනෙකි.

"සො පනෙසො තිවිධො හොති, ඉරියාපථසමසීසී, රොගසමසීසී, ජීවිත සමසීසීති, තත්ථ යො චඞ්කමන්තොව විපස්සනං ආරභිත්වා අරහත්තං පත්වා චඞ්කමන්තොව පරිනිබ්බාති යො ඨිතකොව විපස්සනං ආරභිත්වා අරහත්තං පත්වා ඨිතකොව පරිනිබ්බාති, යො නිසින්නොව විපස්සනං ආරභිත්වා අරහත්තං පත්වා නිසින්නොව පරිනිබ්බාති, යො නිපන්නොව විපස්සනං ආරභිත්වා අරහත්තං පත්වා නිපන්නොව පරිනිබ්බාති අයං ඉරියාපථ සමසීසීනාම යො පන එකං රොගං පත්වා අන්තො රොගෙයෙව විපස්සනං ආරභිත්වා අරහත්තං පත්වා තෙනෙව රොගෙන පරිනිබ්බාති අයං රොගසමසීසී නාම. කතරො ජීවිත සමසීසීනාම? සීසන්ති තෙරස සීසානි, තත්ථ කිලෙස සීසං අවිජ්ජං අරහත්ත මග්ගො පරියාදියති, පවත්තසීසං ජීවිතින්ද්‍රියං චුතිචිත්තං පරියාදියති, අවිජ්ජා පරියාදායකං චිත්තං ජීවිතින්ද්‍රිය පරියාදාතුං න සක්කොති ජීවිතින්ද්‍රිය පරියාදායකං චිත්තං අවිජ්ජං පරියාදාතුං න සක්කොති, අවිජ්ජා පරියාදායකං චිත්තං අඤ්ඤං, ජීවිතපරියාදායකං චිත්තං අඤ්ඤං, යස්ස චෙතං සීසද්වයං සමං පරියාදානං ගච්ඡතීති සො ජීවිතසමසීසී නාමං."

ඒ සමසීසි පුද්ගලයා තෙවැදෑරුම්ය. ඉරියාපථ සමසීසි, රෝග සමසීසි, ජීවිත සමසීසි යනුයි. යමෙක් සක්මන් කරනුයේ විදර්ශනා භාවනාව [illegible] කෙන, අර්හත්වයට පැමිණ සක්මන් කරද්දීම පිරිනිවීයේ ද හේ ඉරියාපථ සමසීසි නම්. සිටීම, හිඳීම, නිදීම, ඉරියව්වූ ද මෙසේමය. යමෙක් එක් රෝග අවස්ථාවකදී විදර්ශනා ආරම්භකොට අර්හත්වයට පැමිණ ඒ රෝගයෙන්ම පිරිනිව්යේද හේ රෝග සමසීසි නම්. කවරෙක් ජීවිත සමසීසි නම් වේද? එහි සීස යනු කෙලෙස් ශීර්ෂයෝයි. ප්‍රධාන කරුණු දහතුනය යන තේරුමයි. ඒ ශීර්ෂ අතුරෙන් කෙලෙසුන්ගේ ශීර්ෂයවූ අවිද්‍යාව අර්හත් මාර්ගය කෙලවර කරයි. (අර්හත් මාර්ගයෙන් අවිද්‍යාව අවශානවේ) පැවැත්මෙහි මූලික කරුණුවූ ජීවිතින්ද්‍රිය චුති සිත කෙලවර කරයි. අවිද්‍යාව කෙලවර කරන්නාවූ සිතට ජීවිතින්ද්‍රිය කෙලවර කල නොහැක. ජීවිතින්ද්‍රිය කෙලවර කරන්නාවූ සිතට අවිද්‍යාව කෙලවර කල නොහැක. ඒ සිත් දෙක වෙන වෙනම පවතින සිත්ය. යමෙකුගේ මේ ශීර්ෂ ද්වය - මූලික කරුණු දෙක - එකවිටම කෙලවර වූයේද හේ ජීවිත සමසීසි නම්. කෙලෙස් ප්‍රහාණයත් පරිනිර්වාණයත්, දෙකම එක් අවස්ථාවකදී සිදුවීම ජීවිත සමසීසි නම්. මෙසේ සමසීසි තිදෙනෙකි.

ක්ලේශ ශීර්ෂ, ජීවිත ශීර්ෂ දෙක එක් අවස්ථාවකදී කෙසේ සමබවට පැමිණේද? ප්‍රත්‍යවෙක්ෂා වාරයෙන් චුති වාරයට සමවූ බැවිනි. යම්කිසි අවස්ථාවකදී මාර්ගයෙන් නැගී සිටීම වෙයිද එහිලා ප්‍රත්‍යවෙක්ෂා එකුන් විස්සෙක් වෙයි. සෝවාන් ආදී මාර්ග ක්‍රමයෙහි පස බැගින් ප්‍රත්‍යවෙක්ෂා ඇති අතර අර්හත් මාර්ගයේදී සතරෙක් වෙයි. මේ පච්චවෙක්ඛණ ඥාණයන්හි පිහිටා, ඉක්බිති සිත භවඞ්ගයට බැස, පිරිනිවෙයිද එවිට මේ ශීර්ෂ ද්වය සමාන අවස්ථා බවට පත්වූයේ නම් වෙයි. අර්හත් මාර්ග චිත්ත වීථියෙන් පසු උපදිනුයේ ප්‍රත්‍යවෙක්ෂා ජවන් සිත්ය. ඒ සිත් ඉපදුනාට පසුයැ කෙලෙස් අවශානා වීයැයි දැනගනුයේ. එහෙයින් ඒ ජවන් සිත් ඉපිද අවශානයේදී සිත භවඞ්ගයට පත්වනවාත් සමඟම චුති සිත ඉපදීමෙන් ඉහත කී ශීර්ෂද්වය සමාන බවට පත්වෙයි යනු කෙටි අදහසයි. මේ සමසීසි පිළිබඳ අටුවාවෙහි ආ විස්තරයකි.

"කෙසේ නම් සියලු ධර්මයන් මනා කොට සිඳීමෙහිද, නිරුද්ධ කිරීමෙහිද, නැවත නොඉපිදවීමෙහිද, ප්‍රඥාව සමසීසට්ඨ ඥාණය නම් වේද? යනාදී වශයෙන් සමසීසට්ඨ ඥාණය මෙසේ විස්තර වෙයි.

එහි සියලු ධර්ම යන වචනයට පඤ්චස්කන්ධ, ද්වාදසායතන, අෂ්ටාදශධාතු, කුශලාකුශල අව්‍යාකෘත ධර්ම, කාමාවචරාදි චාතුර්භූමික ධර්ම, යන මෙතෙක් ධර්ම සංග්‍රහ වෙයි. එතකුදු වුවත් ලෝකෝත්තර ධර්ම මෙහි ගණයට නොගැනේ. "සබ්බධම්ම සද්දෙන සඞ්ගහිතාපි ලොකුත්තර ධම්මා සමුච්ඡෙද වසෙන සම්භවන්තා ඉධ න ගහෙතබ්බා හෙතු සමුච්ඡෙදාන සමුච්ඡින්දිතබ්බා එව තෙභූමක ධම්මා ගහෙතබ්බා" - ප.ම.අ. සියලු ධර්ම ශබ්දයෙන් ලෝකෝත්තර ධර්ම සංග්‍රහ වුවත් සමුච්ඡෙද වශයෙන් වචනය ලැබුණේ නමුදු මෙහිලා නොගතයුතුය. හේතු සමුච්ඡේදයෙන් විනාශ කළ යුතුවූම ත්‍රෛභූමික ධර්ම ගතයුතුය. යනු අදහසයි. සිඳිය යුත්තේ හේතුවයි. එහෙත් ලෝකෝත්තර ධර්මයන්හිවූ හේතුධර්ම වනාහි මාර්ග සිඳීමක් නොකෙරේ. එහෙයින් සිඳිය යුතු ධර්මයන්ට ලෝකෝත්තර ධර්ම සංග්‍රහ වුවද ඒ නොගතයුතු බව අටුවාව කී පරිදිති මේ. සෙසු ධර්ම ඉහත දැක්වූ ඤාණයන්හිදී විස්තර විණි.

"ධම්මා සමුච්ඡෙදෙ" මනාකොට සිඳීමෙහි යන පදයෙන් ඒ ඒ ධ්‍යාන, මාර්ග, අවස්ථාවන්හිදී සුදුසු පරිද්දෙන් ක්ලේශකර ධර්ම විනාශ කරන අයුරු පැහැදිලි වෙයි. මෙහිලා අමුතු වෙන් කිව යුත්තක් නොමැත. සියල්ල පෙර කී පරිද්දමැයි. ඉක්බිති සඳහන්වූ "නිරොධෙ" නිරෝධ කිරීමෙහි, යන පදයද ධ්‍යාන, මාර්ග, අනුසාරයෙන්ම දතයුතු. (නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය නිරුද්ධ කරයි ආදී වශයෙනි.) එසේම නෛෂ්ක්‍රම්‍ය ලැබූවහුට කාමච්ඡන්දය නූපදියි. අව්‍යාපාදය ලැබූවහුට ව්‍යාපාදය නූපදියි. ආදී ක්‍රමයෙන් 'අනුපට්ඨානතා" නොඉපදීම බවද විස්තර වෙයි. අර්හත් මාර්ගයෙන් සිඳීම, නිරෝධ කිරීම, නොඉපදීම, කෙළවර වෙයි.

ඉක්බිති දැක්වෙනුයේ "සමසීස" ධර්මයෝයි. එහි සම ධර්ම සත්තිසෙකි (37) ශීර්ෂ ධර්ම තෙළෙසකි. (13)

## සමධර්ම සත්තිස:

"තානි පන නෙක්ඛම්මාදීනි සත්ත, රූපාරූපජ්ඣානානි අට්ඨ, මහා විපස්සනා අට්ඨාරස, අරිය මග්ග චත්තාරොති සත්තතිංස හොන්ති" - ප. ම. අ. නෛෂ්ක්‍රම්‍යාදි ධර්ම සතකි, රූප - අරූප ධ්‍යාන අටකි. මහා විදර්ශනා අටළොසකි. ආර්ය මාර්ග සතරකැයි සත්තිසෙක් වෙයි. නෛෂ්ක්‍රම්‍යය, අව්‍යාපාදය ආලෝක සඤ්ඤාය, සමාධිය, පරිඥාය, ඥානය, ප්‍රීතිය, මේ නෛෂ්

ශූන්‍යාදී ධර්ම ද නැත. මෙසේ එක් එක් විරුද්ධ ධර්මයක් ප්‍රහාණය කරන නිසා සම්ධම් නම්. මහා විදර්ශනා අටළොස නම් අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා, නිබ්බිදානුපස්සනා, විරාගානුපස්සනා, නිරෝධානුපස්සනා, පටිනිස්සග්ගානුපස්සනා, ඛයානුපස්සනා, වයානුපස්සනා, විපරිණාමානුපස්සනා, අනිමිත්තානුපස්සනා, අප්පණිහිතානුපස්සනා, සුඤ්ඤතානුපස්සනා, අධිපඤ්ඤා ධම්මවිපස්සනා, යථාභූතඤාණදස්සනය ආදීනවානුපස්සනා, පටිසංඛානුපස්සනා, විවට්ටානුපස්සනා යනුයි. මෙවාහි විස්තර ඉහතදී දක්විණි. නෙක්ඛම්මාදී ධර්ම සත්තිසෙක්ම විරුද්ධ ධර්මයන් ප්‍රහාණය වන හෙයින් සම්ධම් නම්.

ශීර්ෂ ධර්ම තෙළෙස:

"පලිබොධ සීසඤ්ච තණ්හා විනිබන්ධන සීසඤ්ච මානො පරාමාස සීසඤ්ච දිට්ඨි, වික්ඛෙප සීසඤ්ච උද්ධච්චං, සංකිලෙස සීසඤ්ච අවිජ්ජා, අධිමොක්ඛ සීසඤ්ච සද්ධා පග්ගහ සීසඤ්ච වීරියං, උපට්ඨාන සීසඤ්ච සති, අවික්ඛෙප සීසඤ්ච සමාධි දස්සන සීසඤ්ච පඤ්ඤා, පවත්ත සීසඤ්ච ජීවිතින්ද්‍රියං ගොචර සීසඤ්ච විමොක්ඛො, සංඛාර සීසඤ්ච නිරොධො"

නිර්වාණ මාර්ගය අවහිර කිරීම් වශයෙන් තෘෂ්ණාව පලිබෝධයට ශීර්ෂයි. පලිබෝධ යනු අවහිර කිරීමයි. එහිලා තෘෂ්ණාව ප්‍රධාන කාරණය වන හෙයින් ශීර්ෂ යැයි කියැවේ. සෙසු තන්හිද. ශීර්ෂ යන්නෙහි තේරුම මෙසේමය. මානය උසස් ලෙස සිතීම් වශයෙන් සසර බැඳීමට ශීර්ෂය වෙයි. දිට්ඨිය වරදවා ගැනීමට ශීර්ෂය වෙයි. උද්ධච්චය සිතෙහි විසිර යාමට ශීර්ෂයි අවිද්‍යාව ක්ලේශයන්ට ශීර්ෂයි. ශ්‍රද්ධාව අධිමෝක්ෂයට - සපිරම සිටීමට - ශීර්ෂය. වීර්යය සිත එසවීමට - ප්‍රග්‍රහයට - ශීර්ෂය. සමාධිය අරමුණට එළඹ සිටීමට ශීර්ෂ වෙයි. සමාධිය සිත නොවිසිර යාමට ශීර්ෂය වෙයි. ප්‍රඥාව තත්වාකාරය - ඇතිසැටි - දැකීමට ශීර්ෂය වෙයි. ජීවිතින්ද්‍රිය උපදනස්කන්ධයන්ගේ පැවැත්මට ශීර්ෂය. විමෝක්ෂය - නිවණ - අරමුණට ශීර්ෂයි, (ගොචරෝති ආරම්මණං: ගොචර යනු අරමුණයි) අනුපාදිශේෂ නිර්වාණය වශයෙන් එන නිරෝධය සියලු සංස්කාර ධර්මයන්ගේ ශීර්ෂය වෙයි. මෙහි ශීර්ෂ යනු කෙළවර යන තේරුමයි. මෙසේ තණ්හා, මාන, දිට්ඨි, උද්ධච්ච, අවිජ්ජා, සද්ධා විරිය, සති, සමාධි, පඤ්ඤා, ජීවිතින්ද්‍රිය, විමොක්ඛ, නිරොධ, යන තෙළෙස ශීර්ෂ ධර්ම නම්.

කරුණු මෙසේ හෙයින් සමධර්මද, ශීර්ෂධර්මද, සම සීසධර්ම යැයි ද්වන්ද සමාස වශයෙන් සෑදේ. මෙසේ සියලු ධර්මයන් මනා කොට සිඳීමෙහිද, නිරුද්ධ කිරීමෙහිද, නො ඉපදීමෙහිද, ප්‍රඥාව සමසීස ඥාණයැයි කියනු ලැබේ.

සමසීසට්ඨ ඥාණය නිමි.

## 37. සල්ලෙඛට්ඨ ඥාණය.

ලෝකෝත්තර ධර්මයන් සමඟ මිශ්‍ර නොවූ නිසා පුථු නම් වූ ක්ලේශයන්ගේ ද, නොයෙක් ආකාර ඇති ධර්මයන්ගේ ද, තෙජ-ගිනි-යැයි කියන ලද දුශ්ශීල භාවය ආදී ධර්මයන්ගේ ද, ගෙවීමෙහි හා එක් අයුරු ඇත්තා වූ ධර්මයන් ගේ ප්‍රඥාව සල්ලෙඛට්ඨ ඥාණය නම්. "පුථුනානත්ත තෙජපරියාදානෙ පඤ්ඤා, සල්ලෙඛට්ඨෙ ඤාණං" යනු ඉහත කී තේරුම ඇති උද්දෙස පාලියයි, මෙහි "පුථු" යන පදයෙන් ලෝකෝත්තර ධර්ම සමඟ මිශ්‍ර නො වූ රාගාදීහු ගැනෙත්. "නානත්ත" යන්නෙන් කාමච්ඡන්දාදී නානා ස්වභාව ඇති ධර්ම ගැනෙත්. "තෙජ" යන්නෙන් දුශ්ශීලාදී ගිනි මෙන් පවත්නා ධර්ම ගැනෙත්. මේ ධර්ම ගෙවා දැමීම නිසා උපදින්නා වූ නෛෂ්ක්‍රම්‍යාදී ධර්ම, එකස්වභාව ධර්ම ලෙස එයි. සම ධර්ම සත්තිස එකස්වභාව ධර්මයි. ඒවා සතිස් වැනි ඥාණයෙහි දක්විණි.

"පුථුනානත්ත තෙජපරියාදානෙ පඤ්ඤාති ලොකුත්තරෙහි අසම්මිස්සත්තා පුථූනං-රාගාදීනඤ්ච; නානත්තානං නානාසභාවානං කාමච්ඡන්දාදීනඤ්ච, සන්තාපනට්ඨෙන තෙජානන්ති ලද්ධනාමානං දුස්සීල්‍යාදීනඤ්ච පරියාදානෙ ඛෙපනෙ පඤ්ඤා; නෙක්ඛම්මාදිම්හි සත්තතිංස පභෙදධම්මෙ පඤ්ඤාති වුත්තං හොති" යනු අටුවායි. තවද "අථවා පුථුභූතා නානත්තභූතා ච තෙජා එව, තෙසං පුථුභූතානං නානත්තභූතානං දුස්සීල්‍යාදීනං සන්තාපකානං තෙජානං පරියාදානෙ පඤ්ඤාති අත්ථො" නැතහොත් මෙන් වූ ද නොයෙක් අයුරු වූ ද ධර්ම ම "තෙජ" පදයෙන් ගැනේ. ඒ මෙන් වූ නොයෙක් අයුරු වූ දුශ්ශීල්‍යාදී තෙජධර්ම පඤ්චකය ගෙවීමෙහි ප්‍රඥාව යනු ද මෙහිලා ගත යුතුය. ඉහත කී ගෙවා දැමිය යුතු සියලු ධර්ම, තෙජධර්ම පසට සංග්‍රහ කර ඇත. "සල්ලෙඛට්ඨෙ ඤාණන්ති පච්චනීකධම්මෙ සල්ලිඛති සමුච්ඡින්දතීති සල්ලෙඛො, තස්මිං නෙක්ඛම්මාදිකෙ සත්තතිංස පභෙදෙ සල්ලෙඛසභාවෙ ඤාණං" සල්ලෙඛට්ඨ

ඥාණය යනු විරුද්ධ ධර්ම මනාසේ ලියයි - කපාදමයි - මනා සේ සිඳියි නුවණ සල්ලෙඛ නම්. ඒ සල්ලෙඛ ස්වභාව වූ නෛෂ්ක්‍රම්‍යාදී සත්තිස් ධර්ම කෙරෙහි පැවති ඥාණයයි. විරුද්ධ ධර්ම ලියාදමන නිසා නෙක්ඛම්මාදියට සල්ලෙඛ ධර්මය යි කියනු ලැබේ. එහෙයින් ඒ හා යෙදුනු නුවණ සල්ලෙඛ ඥාන නම්.

තවද, බුදුරජාණන් වහන්සේ සල්ලෙඛ සූත්‍රය දේශනා කරද්දී සල්ලෙඛ ධර්ම සිවුසාළිසක් (44) ඇතුළත් කළහ. ඒවා කෙරෙහි පවත්නා නුවණ ද මේ සල්ලෙඛ ඥාණයට ගතයුතු බව අටුවාව කියයි. "පරෙ විහිංසකා භවිස්සන්ති මයමෙත්ථ අවිහිංසකා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො"ති ආදිනා නයෙන භගවතා සල්ලෙඛ සුත්තන්තෙන වුත්තානං චතුචත්තාළීසාය පදෙහි සල්ලෙඛො ඉමිනා සඞ්ගහිතො යෙවාති වෙදිතබ්බො"-ප. ම අ

## සල්ලෙඛ සූත්‍රයෙහි ඇතුළත් වූ, සල්ලෙඛ ධර්ම සිවුසාළිස.

"ඉධ ඛො පන චුන්ද සල්ලෙඛො කරණීයො; 1. පරෙ විහිංසකා භවිස්සන්ති මයමෙත්ථ අවිහිංසකා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො. 2. පරෙ පාණාතිපාතී භවිස්සන්ති මයමෙත්ථ පාණාතිපාතා පටිවිරතා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො. 3. පරෙ අදින්නාදායී භවිස්සන්ති මයමෙත්ථ අදින්නාදානා පටිවිරතා භවිස්සාමාති-. 4. පරෙ අබ්‍රහ්මචාරී භවිස්සන්ති මයමෙත්ථ බ්‍රහ්මචාරී භවිස්සාමාති-. 5. පරෙ මුසාවාදී භවිස්සන්ති මයමෙත්ථ මුසාවාදා පටිවිරතා භවිස්සාමාති-. 6 පරෙ පිසුණාවාචා භවිස්සන්ති මයමෙත්ථ පිසුණාය වාචාය පටිවිරතා භවිස්සාමාති- 7- පරෙ ඵරුසාවාචා භවිස්සන්ති මයමෙත්ථ ඵරුසාය වාචාය පටිවිරතා- 8. පරෙ සම්ඵප්පලාපී භවිස්සන්ති මයමෙත්ථ සම්ඵප්පලාපා පටිවිරතා- 9. පරෙ අභිජ්ඣාලූ භවිස්සන්ති මයමෙත්ථ අනභිජ්ඣාලූ භවිස්සාමාති- 10 පරෙ බ්‍යාපන්නචිත්තා භවිස්සන්ති මයමෙත්ථ අබ්‍යාපන්නචිත්තා භවිස්සාමාති- 11 පරෙ මිච්ඡාදිට්ඨී භවිස්සන්ති මයමෙත්ථ සම්මාදිට්ඨී භවිස්සාමාති 12 පරෙ මිච්ඡාසඞ්කප්පා භවිස්සන්ති මයමෙත්ථ සම්මාසඞ්කප්පා භවිස්සාමාති- 13. පරෙ මිච්ඡාවාචා භවිස්සන්ති මයමෙත්ථ සම්මාවාචා භවිස්සාමාති- 14. පරෙ මිච්ඡාකම්මන්තා භවිස්සන්ති මයමෙත්ථ සම්මාකම්මන්තා භවිස්සාමාති- 15. පරෙ මිච්ඡාආජීවා භවිස්සන්ති මයමෙත්ථ සම්මාආජීවා භවිස්සාමාති- 16. පරෙ මිච්ඡාවායාමා භවිස්සන්ති මයමෙත්ථ සම්මාවායාමා භවිස්සාමාති- 17. පරෙ මිච්ඡාසති භවිස්සන්ති මයමෙත්ථ සම්මාසති භවිස්සාමාති-

18. පරෙ මිච්ඡා සමාධී භවිස්සන්ති මයමෙත්ථ සම්මාසමාධී භවිස්සාමාති- 19. පරෙ මිච්ඡා ඤාණී භවිස්සන්ති මයමෙත්ථ සම්මා ඤාණී භවිස්සාමාති- 20 පරෙ මිච්ඡා විමුත්තී භවිස්සන්ති මයමෙත්ථ සම්මාවිමුත්තී භවිස්සාමාති 21. පරෙ ථීනමිද්ධ පරියුට්ඨිතා භවිස්සන්ති මයමෙත්ථ විගතථීනමිද්ධා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො 22. පරෙ උද්ධතා භවිස්සන්ති මයමෙත්ථ අනුද්ධතා භවිස්සාමාති 23. පරෙ විචිකිච්ඡී භවිස්සන්ති මයමෙත්ථ තිණ්ණවිචිකිච්ඡා භවිස්සාමාති- 24 පරෙ කොධනා භවිස්සන්ති මයමෙත්ථ අක්කොධනා භවිස්සාමාති 25. පරෙ උපනාහී භවිස්සන්ති මයමෙත්ථ අනුපනාහී භවිස්සාමාති- 26. පරෙ මක්ඛී භවිස්සන්ති මයමෙත්ථ අමක්ඛී භවිස්සාමාති- 27. පරෙ පලාසී භවිස්සන්ති මයමෙත්ථ අපලාසී භවිස්සාමාති 28 පරෙ ඉස්සුකී භවිස්සන්ති මයමෙත්ථ අනුස්සුකී භවිස්සාමාති- 29. පරෙ මච්ඡරී භවිස්සන්ති මයමෙත්ථ අමච්ඡරී භවිස්සාමාති- 30 පරෙ සඨා භවිස්සන්ති මයමෙත්ථ අසඨා භවිස්සාමාති- 31. පරෙ මායාවී භවිස්සන්ති මයමෙත්ථ අමායාවී භවිස්සාමාති- 32. පරෙ ථද්ධා භවිස්සන්ති මයමෙත්ථ අත්ථද්ධා භවිස්සාමාති 33. පරෙ අතිමානී භවිස්සන්ති මයමෙත්ථ අනතිමානී භවිස්සාමාති- 34. පරෙ දුබ්බචා භවිස්සන්ති මයමෙත්ථ සුබ්බචා භවිස්සාමාති- 35. පරෙ පාපමිත්තා භවිස්සන්ති මයමෙත්ථ කල්‍යාණමිත්තා භවිස්සාමාති- 36. පරෙ පමත්තා භවිස්සන්ති මයමෙත්ථ අප්පමත්තා භවිස්සාමාති- 37. පරෙ අස්සද්ධා භවිස්සන්ති මයමෙත්ථ සද්ධා භවිස්සාමාති- 38. පරෙ අහිරිකා භවිස්සන්ති මයමෙත්ථ හිරිමනා භවිස්සාමාති- 39 පරෙ අනොත්තාපී භවිස්සන්ති මයමෙත්ථ ඔත්තාපී භවිස්සාමාති- 40. පරෙ අප්පස්සුතා භවිස්සන්ති මයමෙත්ථ බහුස්සුතා භවිස්සාමාති- 41. පරෙ කුසීතා භවිස්සන්ති මයමෙත්ථ ආරද්ධ විරියා භවිස්සාමාති- 42. පරෙ මුට්ඨස්සතී භවිස්සන්ති මයමෙත්ථ උපට්ඨිතස්සතී භවිස්සාමාති- 43. පරෙ දුප්පඤ්ඤා භවිස්සන්ති මයමෙත්ථ පඤ්ඤාසම්පන්නා භවිස්සාමාති- 44. පරෙ සන්දිට්ඨි පරාමාසී- ආධානගාහී- දුප්පටිනිස්සග්ගී මයමෙත්ථ අසන්දිට්ඨිපරාමාසී-අනාධානගාහී- සුප්පටිනිස්සග්ගී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො"-ම. නි. (මූ. ප. 8 සූ.)

චුන්දය, තොප විසින් මේ ශාසනයෙහි මෙසේ කෙලෙස් ලියා දැමීම කළ යුතුය. (ඒ කෙසේ ද?) අන්‍යයෝ හිංසාකාරී පුද්ගලයෝ වන්නාහුය. එහිලා අපි අවිහිංසාකාරී වන්නෙමුයි, සල්ලෙඛ කටයුතුය. මේ අයුරින් සෙසු පදද තේරුම් ගත යුතු. මෙසේ කෙලෙස් ලියා දමන ධර්ම සිවුසාලිසෙකි. ලිහිල් කරගත යුතු ධම් පද:-

"මිච්ඡා ඤාණී ති එත්ථ ච මිච්ඡා ඤාණන්ති පාපකිරියාසු උපාය චින්තාවසෙන පාපං කත්වා සුකතං මයාති පච්චවෙක්ඛණාකාරෙන උප්පන්නො මොහො වෙදිතබ්බො, තෙන සමන්නාගතො පුග්ගලො මිච්ඡා ඤාණී" මිච්ඡා ඤාණී යන මෙහි මිච්ඡාඥාණය නම් පාපකර්මයන් පිළිබඳ උපාය ක්‍රම සිතීම් වශයෙන් "පවක් කොට යහපතක්-පිනක් මා විසින් කළා යැ"යි ප්‍රත්‍යවෙක්ෂා කිරීම් ආකාරයෙන් උපන්නා වූ මෝහයයි දත යුතු. එයින් යුක්ත වූවා වූ පුද්ගලයෝ මිච්ඡාඤාණීහු යැ.

සම්මා ඤාණී: එකුන් විසි වැදෑරුම් පසවිකම් නුවණින් යුක්ත වූවෝයි. මිච්ඡාවිමුත්තී: කෙලෙසුන්ගෙන් මිදුණේ නැතිවම 'අපි මිදුනෙමු"යි හැඟීම් ඇත්තෝය. සම්මාවිමුත්ති: ලෝකෝත්තර ඵල ධර්මයන් සමඟ යෙදුනු මාර්ගාඞ්ග අට හැර, ඉතිරි මාර්ගාදී ධර්මයන් ගෙන් යුක්ත වූවෝයි (ඵලසම්පයුත්තානි පන සම්මාදිට්ඨි ආදීනි අට්ඨඞ්ගානි ඨපෙත්වා සෙස ධම්මා සම්මා විමුත්තීති වෙදිතබ්බා - ප සූ) සන්දිට්ඨිපරාමාසී: තමා යම් කිසි දෘෂ්ටියක් ගත්තේ නම් එය ම සත්‍යයැයි අල්ලා ගනීයි නම් එබන්දෝයැ. ආධානග්ගාහී: දැඩි සේ ගත්තෝය. දුප්පටිනිස්සග්ගී: තමා දැඩි ලෙස ගන්නා ලද දෘෂ්ටිය බොහෝ වෙහෙස වී නොයෙක් කරුණු කියූ නමුත් නොඅත්හරින පුද්ගලයෝ යි.

මේ සල්ලේඛ සූත්‍රයේ දක්වෙන විරුද්ධ ධර්මයන් කපා හරින සල්ලේඛ ධර්ම පිළිබඳ යෙදුනු නුවණ ද සල්ලේඛ ඥාණය යි. සල්ලේඛ ඥාණයෙහි උද්දෙස වශයෙන් තැබූ "පුථුනානත්ත තෙජ පරියාදනෙ පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං" යන පදයෙහි සාමාන්‍ය විස්තරය යි මෙතෙක් දක්වූයේ.

"කෙලෙස් නම් ලෝකෝත්තර ධර්මයන් හා මිශ්‍ර නොවූ පුථු නම් වූ ක්ලේශයන්ගේ ද, නොයෙක් ස්වභාව ඇති ධර්මයන්ගේ හා එකම ස්වභාව ඇති ධර්මයන්ගේ ද (නැවීම් අර්ථයෙන්) තෙජ (ගිනි) නම් වූ දුශ්ශීල්‍ය හා ආදීන්ගේ ද, ක්ෂය කිරීමෙහි ප්‍රඥාව සල්ලේඛ ඥාණය නම් වේද? පුථු යන මෙහි රාගය පුථු ධර්මයෙකි, ද්වේෂය පුථු ධර්මයෙකි......" -ප. ම. (සිං. ප.)

මේ ආදී වශයෙන් සල්ලේඛට්ඨ ඥාණය විස්තර මෙහි.

එහි පුථුධර්ම සංඛ්‍යාවෙකි. (17) රාගය, ද්වේෂය, මෝහය, ක්‍රෝධය, උපනාහය, මක්ඛය, පලාසය, ඉස්සාය, මච්ඡරිය, මායාය, සාඨෙය්‍යය, ථම්භය, සාරම්භය, මානය, අතිමානය, මදය, ප්‍රමාදය, යනුයි.

චක්ෂුරාදී ඉන්ද්‍රියන්ගෙන් ගනු ලබන රූපාදී ආරම්මණයන්හි ඇලීම රාගයයි. ඒවා පිළිබඳව ම නො සතුටු ස්වභාවයෙන් ඇති වන සිතෙහි කිළුට ද්වේෂයයි ආරම්මණයන්ගේ ඇති සතු නො දැනීම වශයෙන් සිත මුළා බවට පත් කිරීම මෝහයයි. කිපීම් ගතිය ක්‍රෝධයයි. ක්‍රෝධය සිත්හිලා දැඩි ලෙස තබා ගැනීම උපනාහ නම්. අනුන් ගේ ගුණ මකන - නැති කොට කථා කරන - ස්වභාවය මක්ඛ යයි. අනුන් ගේ ගුණ හා සමාන කිරීම වශයෙන් ගන්නා යුග ග්‍රාහය පලාස නම්. අනුන්ගේ සම්පත්, දියුණුව, නො ඉවසීම ඉස්සා ඊර්ෂ්‍යා -යි. තමා ගේ සම්පත්, දියුණුව, සැඟවීම මච්ඡරියයි. තමා කළ පාපකර්ම සැඟවීම් ස්වභාවය මායා නම්. තමා ගේ නැති ගුණ ප්‍රකාශ කිරීම් ස්වභාවය සාඨෙය්‍යයි. එනම් කපටිකමයි. එකට එක කිරීම් ගතිය සාරම්භයි. තමා උස්ව පෙනී සිටීමේ ගතිය මානය නම්. වඩාත් උසස් ලෙස පෙනී සිටීමේ ස්වභාවය අතිමානය. ජීවිත නිරෝගී, ආදී දැයින් මත් වූ ගතිය මද නම්. පස්කම් ගුණයන්හි ම සිත යැවීම ප්‍රමාදය යි.

ඉක්බිති සඞ්ග්‍රහ වශයෙන් සියලු කෙලෙස්, නරක සිරිත්, සියලු කර්ම හා භවගාමී කර්ම, යන මෙතෙක් ධර්ම ඇතුළත් වෙයි. මේ හැම පුදු වෙන්ව පවත්නා- ධර්ම නම්.

“නානාස්වභාව එකස්වභාව ඇති ධර්ම යනු කාමච්ඡන්දය නානත්ත නම්. නෛෂ්ක්‍රම්‍යය එකත්ත නම් ..” යනාදී වශයෙන් එකත්ත ධර්ම හා නානත්ත ධර්ම දැක්වේ. උද්දේසයෙහි ආයේ “නානත්ත” පමණි. නිද්දේසයෙහි “එකත්ත” ද සඞ්ග්‍රහ වෙයි. “නානත්තෙකත්තන්ති එත්ථ උද්දෙසෙ එකත්තසද්දස්ස අභාවෙපි නානත්තෙකත්තානං අඤ්ඤමඤ්ඤාපෙක්ඛත්තා එකත්තම්පි නිද්දිසිතු කාමෙන නානත්තෙකත්තානි උද්දෙසො කතො. නානත්ත සල්ලක්ඛණෙ එකත්තෙන දස්සිතෙ සල්ලක්ඛ ලක්ඛණං සුඛෙන දස්සියතීති”-ප. ම අ “නානත්තෙකත්තං” යන මෙහි උද්දේසයෙහි එකත්ත ශබ්දය නැත ද, නානත්ත-එකත්තයන් ඔවුනොවුන් බලාපොරොත්තු වන බැවින් එකත්තය ද දක්වනු කැමති නිසා (නිද්දේසයෙහි) නානත්තෙකත්තයැයි උදෙසීම කෙරිණි. මක්නිසාද? නානත්ත සල්ලක්ඛයෙහි එකත්තය දැක්වූ කල්හි සල්ලක්ඛ ලක්ෂණය මනාකොට දක්වනු ලැබේ, යන්න එහි හෙයිනි. කරුණු මෙසේ හෙයින් “නානත්ත” පදයට “එකත්ත” පදයත් සඞ්ග්‍රහ වෙයි.

## නානත්ත-නොයෙක් ආකාර ඇති - ධම්:

කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථිනමිද්ධය, උද්ධච්චය, විචිකිච්ඡාය, අවිද්‍යාය, අරතිය, නිවරණ, හා ඒ ඒ මාර්ගයන් ගෙන් නැසෙන දිට්ඨි ආදී ක්ලෙශකර ධර්මයි.

## එකත්ත - එක් ස්වභාවයක් ඇති - ධම්.

නෛෂ්ක්‍රම්‍යය, අව්‍යාපාදය, ආලෝක සංඥාය, සමාධිය, පරිඥාය, ඥානය, ප්‍රීතිය, ධ්‍යාන, මාර්ග, ඵල, මෙතෙක් ධර්මයි.

ඉක්බිති තෙජ ධම් දක්වේ. තෙජ ගිනි පසෙකි. චරණ, ගුණ ප්‍රඥා, පුණ්‍ය, ධම්, යනුයි. මෙහි චරණ යනු ශීලයයි. එහෙයින් චරණ යන්න නිසා දුශ්ශීල තෙජස කෙලවර වෙයි. ගුණ නම් සමාධියයි ගුණ ගින්න නිසා අගුණ ගින්න වූ ව්‍යාක්ෂෙපය - සිතෙහි විසිරී පැමැත්ම-කෙලවර වෙයි. ප්‍රඥා නම් විදර්ශනා ප්‍රඥායි. ප්‍රඥා තෙජසින් දුෂ්ප්‍රඥා තෙජස වූ අවිද්‍යාව කෙලවර වෙයි. පුණ්‍ය යනු මාර්ග කුශල්ය. එයින් අකුශල තෙජස කෙළෙවර වෙයි. ධම් යනු බුද්ධ වචනයයි. ධම් ගින්නෙන් නැවීම නිසා අධර්ම ගින්න (අන්‍ය ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම) කෙලවර වෙයි මෙසේ තෙජ ධම් යන් ගෙන් ඒව විරුද්ධ වූ සියල්ල විනාශ කිරීමෙන් දවාලීමෙන් කෙලවර වෙයි.

"සංලෙඛ" යන මෙහි කාමච්ඡන්දය අසංලෙඛ ධර්ම යකී යනාදී වශයෙන් අසංලෙඛ, සංලෙඛ, ධම් ඊලඟට විස්තර වෙයි. මෙයටද ඇතුලත් වනුයේ කාමච්ඡන්දාදීනු සහ නෛෂ්ක්‍රම්‍යාදීහු යි.

මෙසේ ලෝකෝත්තර ධම්යන් හා මිශ්‍ර නොවූ හෙයින් පුථු නම් වූ ක්ලෙශයන් ගේ ද, නොයෙක් ආකාර ඇති ධම්යන්ගේ ද, තෙජ-ගින්-යැයි කියන ලද දුශ්ශීල භාවය ආදී ධර්මයන් ගේද, ගෙවීමෙහි හා එක් අයුරු ඇත්තා වූ ධර්මයන් ගේ වැඩීමෙහි වූ ප්‍රඥාව සංලෙඛට්ඨ ඥාණයැයි කියනු ලැබේ.

සංලෙඛට්ඨ ඥාණය නිමි.

# 22 වැනි පරිච්ඡේදය

## 38. විරියාරම්භ ඤාණය.

"අසල්ලීනත්ත පහිතත්ත පග්ගහට්ඨෙ ඤාණං විරියාරම්භෙ ඤාණං" යන මැලිබව, කුශල ධර්මයන්හි පෙළඹීමෙහිලා කයෙහිත් ජීවිතයෙහිත් බලාපොරොත්තුවක් නොමැති බව, එක්ව යෙදුනු ධර්මයන් නගාසිටුවීම, යන මෙවැනි යෙදුණු නුවණ විරියාරම්භ ඤාණය යි. මෙහි විස්තර කළයුතු පද සතරකි. පළමු වැන්න, "අසල්ලීනත්ත" යි. සල්ලීන නම් හැකිළීමයි. මැලිකමට මේ නමකි. මැලි තැනැත්තහුගේ කයත් සිතත් දෙකම හැකුළුනේ වෙයි. ඒ මැලිකම නොමැතිවීම අසල්ලීන නමි. ප්‍රබෝධ ගතියට මේ නමකි. මෙයින් යුක්තවූවනු හැම විටම පිබිදුනේ වෙයි. ප්‍රබුද්ධභාවයෙකු මෙනි. අසල්ලීන වූ සත 'අසල්ලීනත්ත' නමි. මෙහි "අත්ත" ශබ්දය සිත දක්වන්නකි. "අත්තානං දමයන්ති පණ්ඩිතා" පණ්ඩිතයෝ තම සිත දමනය කරත්. යනාදී තන්හි මෙනි. ඒ අසල්ලීනවූ සිත සමග යෙදුනා වූ නුවණ විරියාරම්භ ඤාණයයි.

"කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛතාය පහිතො පෙසිතො විස්සට්ඨො අත්තා එතෙනාති පහිතත්තො" යනු පහිතත්ත පදයෙහි විග්‍රහයයි. කයෙහි ද ජීවිතයෙහිද බලාපොරොත්තුවක් නොමැති; මොහු විසින් හරනාලද ආත්මයක් - ජීවිතයක් - ඇත්තේ නුයි පහිතත්ත නමි. මේ එහි අදහසයි. ජීවිතය ගැන බලාපොරොත්තුවක් නොමැතිව කුශල ධර්මයන්හි යෙදුනහුටමේ නමකි. මෙහි ආ "අත්ත" ශබ්දයෙන් ජීවිතය කියැවේ "යා පන භික්ඛුනී අත්තානං වධිත්වා වධිත්වා රොදෙය්‍ය" ආදී තන්හි, මෙනි. (යම් භික්ෂුණියක් වනාහි තොමෝ ම පෙළමින් හඬන්නී) මෙසේ සඳහන් වූ වීර්‍යයත් සමග යෙදුණු නුවණ විරියාරම්භ ඤාණයයි තුන් පදය "පග්ගහ" යනුයි "සහජාත ධම්මෙ පග්ගණ්හාති උපත්ථම්භෙතීති පග්ගහො" එක්ව උපන්නා වූ ධර්මයන් උත්සාහ කරවීම් වශයෙන් ඔසවානුයි එසේ ම නොවැටෙන ලෙස රැකුලි දේනුයි පග්ගහ නමි. ඒ එසවීම් ගතිය පග්ගහට්ඨයි. මේ සඳහා යෙදුනු නුවණ ද විරියාරම්භ ඤාණයයි. මෙතෙක් දැක්වූ පද තුන ම සමාස ක්‍රමයෙන් එක් පදයෙක්හිලා "අසල්ලීනත්ත

පහිතතත පග්ගහට්ඨ" යැයි ද, සත්තම් විභත්තියට තංවා අසල්ලීනත්ත පහිතත්ත පග්ගහට්ඨෙ"යයි දේශනා කළහ, (අසල්ලීනත්තො ච සො පහිතත්තො චාති අසල්ලීන පහිතත්තො; අසල්ලීනත්ත පහිතත්තස්ස පග්ගහට්ඨො අසල්ලීනත්ත පහිතත්ත පග්ගහට්ඨො, තස්මිං අසල්ලීනත්ත පහිතත්ත පග්ගහට්ඨෙ.)

සිවුවැනි පදය විරියාරම්භ ඤාණය යනුයි. වීර්‍ය්‍යය පිළිබඳ ආරම්භය, පටන් ගැනීම විරියාරම්භයි. එහි වූ නුවණ විරියාරම්භයෙහි ඤාණ යි. විරිය පිළිබඳ විස්තර පඤ්චස්කන්ධ විභාගයේ සංඛාරක්ඛන්ධයෙහි දක්විණි. මෙසේ නො මැලි බව, නො පසුබට උත්සාහය රැකුල්දීම, උත්සාහය ඇරඹීම, යන මෙතෙක් ගති පිළිබඳ යෙදුනා වූ ප්‍රඥාව විරියාරම්භ ඤාණය නමි.

"කෙසේ නම් නො හැකුළුනු බව, කායජීවිත දෙක්හි දුරු කරන ලද අපෙක්ෂා ඇති බව, සිත එසවීම යන මෙහි පවත්නා ප්‍රඥාව විරියාරම්භ ඤාණය නම් වේද? නූපන් අකුශල ධර්මයන් ගේ නො ඉපදීම පිණිස වූ නො හැකුළුනු බවෙහි ද කායජීවිත දෙක්හි දුරු කරන ලද අපෙක්ෂා ඇති බවෙහි ද, සිත එසවීමෙහි ද පවත්නා වීර්‍ය්‍ය විරියාරම්භ ඤාණ නම් ......" ප ම (සිං. ප.) යනාදී වශයෙන් විරියාරම්භ ඤාණය විස්තර වෙයි. එහි ප්‍රධාන වශයෙන් දක්වෙනුයේ සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යය යි නූපන් අකුශල ධර්ම නූපදවීම පිණිස, උපන් අකුශල ධර්ම දුරු කිරීම පිණිස නූපන් කුශල ධර්ම ඉපදවීම පිණිස, උපන් කුශල ධර්ම දියුණු කිරීම පිණිස, යන සතර තැනෙක්හිලා යෙදෙනුයේ සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යය. ඒ සමඟ යෙදුනා වූ නුවණ විරියාරම්භ ඤාණය යි.

තවද නූපන් කාමච්ඡන්දයාගේ නො ඉපදීම පිණිස, උපන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය පිණිස, නූපන් නෙෂ්ක්‍රම්‍යයාගේ ඉපදීම පිණිස, නූපන් සියලු ක්ලෙශයන් ගේ නූපදීම පිණිස, උපන් සියලු ක්ලෙශයන් ගේ ප්‍රහාණය පිණිස, නූපන් අර්හත් මාර්ගය ඉපදීම පිණිස, උපන් අර්හත් මාර්ගයාගේ පැවැත්ම පිණිස, යන මෙතෙක් තන්හි යොදුගතු ලබන නො මැලි කාය ජීවිත බලාපොරොත්තු නො මැති, රැකුල් දීමක් ඇති, වීර්‍ය්‍ය සමඟ යෙදුනාවූ නුවණ විරියාරම්භ ඤාණයයි.

# 39. අත්ථ සංදස්සන ඤාණය.

'නානාධම්ම පකාසනතා පඤ්ඤා, අත්ථසංදස්සනෙ ඤාණං' නොයෙක් ධර්ම ප්‍රකාශ කිරීම් ස්වභාවයෙහි ප්‍රඥාව අත්ථසංදස්සන ඤාණය යි. නොයෙක් ධර්ම නම් පඤ්චස්කන්ධය, ද්වාදසායතන, අෂ්ටාදශධාතු, චතුරාර්‍ය්‍ය සත්‍යය, ආදී වූ විශේෂයෙන් අවබෝධ කරගතයුතු වූ ධර්ම සමූහය යි. ශ්‍රුතමය ඤාණයෙහි දක්වූ 'අභිඤ්ඤෙය්‍ය' ධර්ම රාශිය මීට ඇතුළත් වෙයි. ජාතකාදී සෙසු ධර්මයක් දේශනා කළත් ඒ අවසානයෙහි චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශ කරත්. එසේ හෙයින් මුළු ත්‍රිපිටකාන්තර්ගත තුන් පිටකයට ම ඇතුළත්-සියලු ධර්ම මෙහිලා සංග්‍රහ වෙයි. ඒ හැම බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ඥානයෙන්ම දේශනා කළ බැවිනි. ශ්‍රුතමය ඤාණයෙහි සිට දියුණු කළා වූ ඉහත කී ඥානයන් නිසා ධර්ම දේශනා කිරීමේ අසාධාරණ බල වේගයක් බුදුපියාණන් වහන්සේට ඇතිවිය. ශ්‍රාවකයන් දේශනා කළද එය බුද්ධ දේශිතයක් ම නිසා ධර්ම දේශනාවෙහි දී බුදුපියාණෝ ම මූලිකා වෙත්. එහෙයින් සෙසු අයට සාධාරණ නො වූ නිසා අසාධාරණ නමි. එයින් සිහ සච්චවිභඞ්ගයෙහි:-

"තථාගතෙන භික්ඛවෙ අරහතා සම්මා සම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං යදිදං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං ති" මහණෙනි,

අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් විසින් බරණැස මිගදාය නම් ලද ඉසිපතාරාමයෙහි දී ලෝකයෙහි ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ අන් කෙනෙකු විසින් හෝ නො පැවැත්විය හැක්කා වූ යම් මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් ගේ ප්‍රකාශ කිරීමය, දේශනා කිරීමය, පැණවීමය, තැබීමය, විස්තර කිරීමය, බෙදීමය, මනා ලෙස ප්‍රකට කිරීමය, යන ශ්‍රේෂ්ඨ ධර්ම චක්‍රය පවත්වන ලද්දේය.

මෙසේ ධර්ම දේශනා කිරීමෙහි වූ ඥාන විශේෂය අත්ථසන්දස්සන ඤාණය නමි. එහි ඇත්තා වූ ගුණ විශේෂය අත්ථසන්දස්සන පදයෙන් විස්තර වෙයි.

'අත්ථසන්දස්සනෙති නානා අත්ථානං පරෙසං සන්දස්සනෙ' අත්ථසන්දස්සනයෙහි යනු නොයෙක් තේරුම් අනුනට මනා ලෙස දක්වීමෙහි යි. ධර්ම පදයෙක වූ යම්තාක් තේරුම් ඇද්ද. සියල්ල අසාසිටියනට අවබෝධ වන ලෙස හැම අයුරින් ම දක්වීම අත්ථසංදස්සන නම්. ඉහත සඳහන් කළ සච්චවිභඞ්ග සූත්‍රපාඨයෙහි වූ "උත්තානි කම්මං" යන්නෙන් අදහස් කරනුයේ මේ අත්ථසංදස්සනයයි ඒ පාඨයෙහි ධර්මදේශනා ක්‍රමය ද ඇතුළත් වෙයි පළමු වෙන් කරනුයේ "ආචික්ඛණා, දෙසනා, පඤ්ඤාපනා, පට්ඨපනා" යන මාතෘකා පදය ප්‍රකාශ කිරීමයි. ඉක්බිති මාතෘකාව විස්තර කිරීම විවරණා නම්. එහි ප්‍රභෙද දක්වීම විභජනායි. ප්‍රභෙදගත සියලු පදයන්හි අර්ථය දක්වීම උත්තානිකම්ම යි. එහෙයින් ආචික්ඛණාදී පද සතට අනුව ධර්මදේශනා කිරීමෙහි පැවතියාවූ නුවණ අත්ථ සන්දස්සන ඥාණය යි. (සච්ච විභඞ්ග සූත්‍රය, බුදුරජාණන් වහන්සේ මාතෘකාව තැබූ පසු සැරියුත් හිමියෝ විස්තර කළහ.)

අර්ථසන්දර්ශනයෙහිලා නිදර්ශනයකි:- "කතමා ච ආවුසො ජාති? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චති ආවුසො ජාති" ඇවැත්නි, ජාතිය යනු කවරේද? ඒ ඒ සත්ව කොට්ඨාසයන්ට අයත් ඒ ඒ සත්වයන් ගේ යම් ඉපදීමක් වෙයිද, හටගැන්මක් වේද, බැස ගැන්මක් වේද, විශෙෂයෙන් ඉපදීමක් වේද, ස්කන්ධයන්ගේ පහළ වීමක් වේද, ආයතනයන් ගේ ලැබීමක් වේද, ඇවැත්නි, මෙය ජාතියයි කියනු ලැබේ. මෙහි ශබ්දය ප්‍රකට කිරීම සඳහා සම්මුති, පරමාර්ථ, දේශනා ක්‍රම දෙකෙන්ම දක්වූහ. ජාති, සඤ්ජාති, ඔක්කන්ති, අභිනිබ්බත්ති, මේ පද සතරක් දක්වූයේ සම්මුති දේශනා වශයෙනි. ඛන්ධානං පාතුභාවො, ආයතනානං පටිලාභො; මේ පද දෙක පරමාර්ථ දේශනා වශයෙනි. එය තවත් පැහැදිලිවීම සඳහා සඤ්ජාති-හටගැනීම, ඔක්කන්ති බැසගැනීම, අභිනිබ්බත්ති-හැම අයුරින් ම ඉපදීම, යනුවෙන් (අටුවාවෙහි) විස්තර වෙයි. තියුණු නුවණ ඇතියවුන් සඳහා පරමාර්ථ වශයෙන් ස්කන්ධයන් ගේ පහළ වීම, ආයතනයන්ගේ ලැබීම, යනුවෙන් පැහැදිලි කළහ. මෙසේ අර්ථය ප්‍රකට කිරීම අත්ථසන්දස්සනයයි. තවද ජාති පදය අටුවා වසින් විස්තර කිරීම අත්ථසන්දස්සනයෙහිලා සැලකේ. එවිට හැම ලෙසින්ම පැහැදිලි වන හෙයිනි.

**ජාති පදයට ඇතුළත් වූ අටුවා විස්තර මෙසේය.**

"තෙසං තෙසං සත්තානන්ති අයං සඞ්ඛෙපතො අනෙකෙසං සත්තානං සාධාරණනිද්දෙසො, සා දෙවදත්තස්ස ජාති සොමදත්තස්ස ජාති එවං හි දිවසම්පි කථියමානෙ නෙව සත්තා පරියාදානං ගච්ඡන්ති, න සබ්බං අපරත්ථදීපනං සිජ්ඣති, ඉමෙහි පන ද්වීහි පදෙහි න කොචි සත්තො අපරියාදින්නො හොති, න කිඤ්චි අපරත්ථදීපනං න සිජ්ඣති තෙන වුත්තං යා තෙසං තෙසං සත්තානන්ති. තම්හි තම්හීති අයං ජාතිගතිවසෙන අනෙකෙසං සත්තනිකායානං සාධාරණනිද්දෙසො, සත්තනිකායෙති සත්තානං නිකායෙ සත්තඝටායං සත්තසමූහෙති අත්ථො.

ජාතීති අයං ජාතිසද්දො අනෙකත්ථො, තථාහෙස: එකම්පි ජාතිං ද්වෙපි ජාතියොති එත්ථ භවෙ ආගතො; "අත්ථි විසාඛෙ නිගණ්ඨා නාම සමණජාතී"ති එත්ථ නිකායෙ, "තිරි නාම තිණජාති නාභියා උග්ගන්ත්වා නභං ආහච්ච ඨිතා අහොසී"ති එත්ථ පඤ්ඤත්තියං, "ජාති ද්වීහි ඛන්ධෙහි සඞ්ගහිතා"ති එත්ථ සඞ්ඛතලක්ඛණෙ; "යං භික්ඛවෙ මාතුකුච්ඡිම්හි පඨමං චිත්තං උප්පන්නං පඨමං විඤ්ඤාණං පාතුභූතං තදුපාදාය සාවස්ස ජාතී"ති එත්ථ පටිසන්ධියං, "සම්පති ජාතො ආනන්ද බොධිසත්තො"ති එත්ථ පසූතියං, "අනුපක්කුට්ඨො ජාතිවාදෙනා"ති එත්ථ කුලෙ, "යතොහං භගිනි අරියාය ජාතියා ජාතො"ති එත්ථ අරියසීලෙ, ඉධ පනායං සවිකාරෙසු පඨමාභිනිබ්බත්තක්ඛන්ධෙසු වත්තති. තස්මා ජායමානකවසෙන ජාතීති ඉදමෙත්ථ සභාවපච්චත්තං.

සඤ්ජායනවසෙන සඤ්ජාතීති උපසග්ගෙන මණ්ඩිතං ඔක්කමනවසෙන ඔක්කන්ති. ජායනට්ඨෙන ජාති, සා අපරිපුණ්ණායතනවසෙන වුත්තා. සඤ්ජායනට්ඨෙන සඤ්ජාති පරිපුණ්ණායතනවසෙන වුත්තා. ඔක්කමනට්ඨෙන ඔක්කන්ති, සා අණ්ඩජ ජලාබුජවසෙන වුත්තා. තෙ හි අණ්ඩකොසඤ්ච වත්ථිකොසඤ්ච ඔක්කමන්ති. ඔක්කමන්තාපි පවිසන්තා විය පටිසන්ධිං ගණ්හන්ති. අභිනිබ්බත්තනට්ඨෙන අභිනිබ්බත්ති, සා සංසෙදජ ඔපපාතිකවසෙන වුත්තා තෙහි පාකටායෙව හුත්වා නිබ්බත්තන්ති. අයං තාව සම්මුතිකථා. ඉදානි පරමත්ථකථා හොති ඛන්ධායෙව හි පරමත්ථතො පාතුභවන්ති න සත්තා. තත්ථ ඛන්ධානන්ති එකවොකාරභවෙ එකස්ස. චතුවොකාරභවෙ චතුන්නං, පඤ්චවොකාරභවෙ පඤ්චන්නං, ගහණං වෙදිතබ්බං. පාතුභාවොති උප්පත්ති. ආයතනානන්ති එත්ථ තත්‍ර තත්‍ර උප්පජ්ජමානායතනවසෙන සඞ්ග

හෝ වෙදිතබ්බො පටිලාභො ති සන්තතියං පාතුභාවොයෙව, පාතු භවන්තානෙව හි තානි පටිලද්ධානි නාම හොන්ති. අයං වුච්චති ජාතීති, අයං ජාති නාම කථීයති. සා පනෙසා තත්ථ තත්ථ භවෙ පඨමාභිනිබ්බත්ති ලක්ඛණා. නීය්‍යාතන රසා. අතීත භවතො ඉධ උම්මුජ්ජන පච්චුපට්ඨානා, ඵල වසෙන දුක්ඛ විචිත්තතා පච්චු පට්ඨානා වා. ඉදුති ජාතියා දුක්ඛට්ඨො වෙදිතබ්බො''ති- වි. ප. අ. (ස. වි. නි.)

''තෙසං තෙසං සත්තානං'' යන මෙය කෙටියෙන් නොයෙක් සත්වයන් කෙරෙහි පවතින සාමාන්‍ය විස්තරයෙකි. දේවදත්තයා ගේ ප්‍රතිසන්ධිය වූ යම් ජාතියක් වේද, සෝමදත්තයා ගේ ප්‍රතිසන්ධිය නම් වූ යම් ජාතියක් වේද, මේ වශයෙන් ගෙන දවසක් තියේ නමුදු සත්වයෝ ක්ෂයයට-ගෙවීමට-නො යත්. සියලු අන් අන් පුද්ගලයන් කෙරෙහි දක්වීම ද නො සිදුවෙයි මේ පද දෙකින් වනාහි කිසිදු සත්වයෙක් ක්ෂයට නො ගියේ නො වෙයි. කිසිදු අන් අන් පුද්ගලයන් කෙරෙහි දක්වීම නො ද නො සිදු වෙයි (හැම සත්වයෙකු පිළිබඳව ම දක්වූවා සමානය.) එහෙයින් ''යා තෙසං තෙසං සත්තානං''යි කියන ලදී. ''තම්හි තම්හි'' මෙය ජාති වශයෙන් නොයෙක් සත්වකොට්ඨාසයන් සඳහා ඇති සාමාන්‍ය විස්තරයෙකි. ''සත්තනිකායෙ'' යනු සත්වයන් ගේ කොට්ඨාශයෙහි යැ. සත්වසමූහයෙහි යන තේරුමයි ''ජාති'' මේ ජාති ශබ්දය නොයෙක් තේරුම් සඳහා යෙදෙන්නකි. ඒ එසේමැයි. ''එක් ජාතියක්, ජාති දෙකක්'' වශයෙන් ආ ජාති ශබ්දය භවයෙහි යැ. ''විශාඛා මෙනි, නිඝණ්ඨයෝ නම් වූ ශ්‍රමණ ජාතියක් ඇත'' යන මෙහි නිකායෙහි යැ. 'තිරි නම් වූ තෘණ-තණ විශේෂයක් ජාතියක් නාභියෙන් පැන නැගී අහස් කුස ප්‍රාං සිටියේ නම් වෙයි.'' යන මෙහි ප්‍රඥප්තියෙහි ය එනම් ව්‍යවහාරය යි ''ඉපැද්ම සකන්ධ දෙකෙහි (නාම, රූප) ගොණු විණි'' මෙහි ජාති ශබ්දය සංඛත ධර්මයන් ගේ ස්වභාවයෙහි යැ. ''මහණෙනි, මව් කුසෙහි යම් සිතක් පළමුවෙන් උපන්නේද, යම් විඤ්ඤාණයක් පළමුවෙන් පහල විණි ද, එතැන් පටන් ඔහු ගේ ඒ ජාතිය යි'' යන මෙහි ප්‍රතිසන්ධියෙහිය ''ආනන්දය, දූන් බෝධිසත්වයෝ ඉපදුනෝ'' මෙහි බිහිවීමෙහි ය. (ප්‍රසූතිය) ''ජාති වාදයෙන් නින්දිත නො වූයේ'' මෙහි කුලයෙහියැ. ''නැගණියනි, මම යම් කෙනෙකින් ආර්‍ය්‍ය වූ ජාතියෙන් උපන්නෙම් ද'' මෙහි ජාති ශබ්දය ශීලයෙහි ය. මෙහි වනාහි දුඃඛ සත්‍යයෙහි- නොයෙක් ආකාර ඉපදීම ලක්ෂණ සහිත වූ පළමුවෙන් හටගන්නා වූ සකන්ධයන්හි පවතියි. (ජාති, සඤ් ජාති, ආදී ආකාර කීපයක් ඇති හෙයින් ''සවිකාරෙසු'' යැයි

පැවමත්.) එහෙයින් උපදින්නා වූ වශයෙන් 'ජාති' යන පදය, මෙහි ශබ්ද ප්‍රකෘතිය වූ ප්‍රථමා විභක්ති ඒකවචන නාමය දක්වී මෙහිය.

සම්පූර්ණව ඉපදීම් වශයෙන් ''සඤ්ජාති යෑ''යි උපසර්ගයකින් වැඩි විය. බෑස ගැනීම් වශයෙන් ''ඔක්කන්ති'' නම්. නැතහොත් ඉපදීම් අර්ථයෙන් ජාතියි. එය අසම්පූර්ණ වූ ආයතන වශයෙන් කියන ලදී. මනා ලෙස ඉපදීම් අර්ථයෙන් සඤ්ජාති නම්. එය සම්පූර්ණ වූ ආයතන වශයෙන් කියන ලදී. බෑස ගැනීම් අර්ථයෙන් ඔක්කමන නම්. එය අණ්ඩජ (බිජුවටින් හටගන්නා සත්වයෝ) ජලාබුජ (වස්ති කෝෂයෙහි හටගන්නා සත්වයෝ) වශයෙන් කියන ලදී. ඔව්හු වනාහි අණ්ඩකෝෂයට ද, වස්ති කෝෂයට ද, බෑස ගනිත්. බෑසගන්නාහු පිළිසෙන්නවුන් මෙන් ප්‍රතිසන්ධිය ගනිත්. විශේෂයෙන් පහලවීම් අර්ථයෙන් අභිනිබ්බත්ත නම්. එය සංසේදජ, ඔපපාතික, වශයෙන් කියන ලදී. ඔව්හු ප්‍රකට වූවෝම පහල වෙත්. මේ පල මූ සම්මුති කථාවයි.

පරමාර්ථ වශයෙන් ස්කන්ධයෝ ම පහල වෙත්. සත්වයෝ නො වෙත්. එහිදු ''ඛන්ධානං'' යනු ඒකවොකාර භවයෙහි එක් ස්කන්ධයකගේ ද, චතුවොකාර භවයෙහි සතර ස්කන්ධයන්ගේ ද, පඤ්චවොකාර භවයෙහි ස්කන්ධ පඤ්චකයාගේ ද, ගැනීම දතයුතුයි. (වොකාර යනු ස්කන්ධයට නමකි.) පාතුභාව යනු ඉපැත්මයි. ආයතන යන මෙහි ඒ ඒ තැන උපදිනු ලබන්නා වූ ආයතනයන් ගේ වශයෙන් ගොණු කිරීම දතයුතුයි. පටිලාභ යනු පැවැත්මෙහි පහලවීම මය, පහල වන්නා වූ ඒ ආයතනයන් ම ලැබුවා නම් වෙයි. මේ ජාතියැයි කියනු ලැබේ. ඒ ජාතිය වනාහි ඒ ඒ භවයෙහි පලමුවෙන් ඉපදීම ලක්ෂණය යි. දුක් එලවන කෘත්‍යය ඇත්තීය. මෙලොව නැගී සිටීම වැටහෙන කාරණයයි. නැතහොත් ඵල වශයෙන් දුක් පිළිබඳ විසිතුරු ගතිය වැටහෙන කාරණයයි. දූන් ජාතියෙහි දුඃඛාර්ථය දත යුතුය. (මතුවට සම්බන්ධයා.)

''නාකං අත්ථානා පරෙසං සන්දස්සනෙ'' යනාදී වශයෙන් එන අත්ථසන්දස්සනය ඉහත විස්තර කළ ''ජාති'' පදයෙන් පැහැදිලි වෙයි. බුදුරජාණන් වහන්සේ ගේ ධර්ම දේශනා විලාශය ද මෙයින් පැහැදිලි වෙයි. මෙසේ නැම අයුරින් ම පදයන් ගේ අර්ථ දක්වීමේ නුවණ අත්ථසන්දස්සන ඤාණය යි.

‘‘කෙසේ නම් නොයෙක ධම්යන් ප්‍රකාශ කිරීමෙහි ප්‍රඥාව අත්ථසංදස්සන ඤාණය නම් වේද? නොයෙක් ධම් යනු පඤ්චක්ඛන්ධයෝය ..’’ යනාදී වශයෙන් අත්ථසංදස්සන ඥානය විස්තර කළ බුදුපියාණෝ නොයෙක් ධම් යන පදයට පඤ්චස්කන්ධ, ද්වාදසායතන, අටළොස්ධාතු, කුසලාකුසල අව්‍යාකෘත ධර්ම, කාමාවචරාදී චතුර්භූමික ධර්ම, යන මෙතෙක් ධර්ම ඇතුලත් කළහ. ‘‘ප්‍රකාශ කිරීම’’ යන පදයට රූපාදී එක් එක් ස්කන්ධයන් ද, චක්ෂුරාදී ආයතනයන් ද, ආදී වශයෙන් ඒ ධර්මයන් අනිත්‍ය, දුඃඛ, අනාත්ම ත්‍රිලක්ෂණයන්ට අනුව ප්‍රකාශ කරයි යනුවෙන් සඞ්ග්‍රහ කළහ. ‘‘කාමච්ඡන්දය පහකරවමින් නෙක්ඛම්‍යයාගේ අර්ථය දක්වයි’’ ආදී වශයෙන් අර්හත් මාර්ගය තෙක් ඒ ධර්මයන්හි අර්ථය දක්වීම අත්ථසන්දස්සන පදයට ඇතුලත් කළහ. මෙසේ නොයෙක් ධම් ප්‍රකාශ කිරීමෙහි ප්‍රඥාව අත්ථසන්දස්සන ඤාණය නම්.

## 40. දස්සන විසුද්ධි ඤාණය.

‘‘සබ්බ ධම්මානං එකසඞ්ගහතා නානත්තෙකත්ත පටිවෙධෙ පඤ්ඤා, දස්සන විසුද්ධි ඤාණං’’ සියලු ධර්මයන් එකත්වයෙන් ගෙන-එක් අයුරකින් ගෙන සඞ්ග්‍රහ කිරීම, නානා සවභාව ධර්මයන් හා එක සවභාව ධර්මයන් අවබෝධ කිරීමෙහි ප්‍රඥාව, දස්සන විසුද්ධි ඤාණයයි. මෙහි දී සියලු ධර්මයන් සංඛත වූ ද අසඞ්ඛත වූ ද ධම් ගැනේ. සංඛත ධර්ම නම් ලෞකික ධර්මයි. අසඞ්ඛත ධර්ම, ලෝකෝත්තර ධම්යි. කාමාවචරාදී චාතුර්භූමික වූ සියලු ධර්ම මීට ඇතුලත් වෙයි මේ ධර්ම එක් අර්ථයක්හලා-තේරුමෙහි-ගොණු කිරීම, කැටිකිරීම, එකත්වයෙන් ගෙන සඞ්ග්‍රහ කිරීම නම්. මතුවට එන විස්තරයෙහි වෙන වෙන ම දක්වෙන ක්‍රම දෙළොසකට අනුව සඞ්ග්‍රහ කර ඇත. එසේ සඞ්ග්‍රහ කිරීම එකසඞ්ගහතා යි.

පෙර ඥානයන්හි දක්වූ කාමච්ඡන්දාදී විරුද්ධ ධර්මයෝ නානා සවභාව ධම්යෝයි ඒවාහි කුශලපාක්ෂික නෛෂ්ක්‍රම්‍යාදීහු එක සවභාව ධම්යෝයි. අවබෝධ කිරීම යනු මාර්ග ඥානයෙන් හා ඵල ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කිරීමයි නානා සවභාව ධම් හා එකසවභාව ධම් මග්ගඵල ඥානයන්හිදී අවබෝධ වෙයි. එහෙයින් මග්ගඵල ඥාන ප්‍රතිවෙධ නම්. දස්සන විසුද්ධි යන්නෙන්ද කියැවෙනුයේ මග්ගඵල ඤාණ මැයි. ‘‘දස්සන විසුද්ධි ඤාණන්ති මග්ගඵල ඤාණං දස්සන මෙව විසුද්ධි, දස්සන විසුද්ධි, දස්සන විසුද්ධි එව ඤාණං

දස්සන විසුද්ධි ඤාණං, මග්ග ඤාණං විසුජ්ඣතීති විසුද්ධි, ඵල ඤාණං විසුද්ධත්තා විසුද්ධි" ඤාණදස්සන විසුද්ධි යනු මග්ගඵල ඤාණයි. දර්ශනයම පිරිසුදුවූයේනුයි දස්සන විසුද්ධි නම්. එයම ඤාණය වූයේ දස්සන විසුද්ධි ඤාණයයි. මාර්ග ඤාණය, පිරිසිදුවේනුයි විසුද්ධි නම්. (වර්තමානයි) ඵලඥානය, ඒ පිරිසුදුවූ බැවින් විසුද්ධි නම්. (අතීතයි) මෙසේ පවත්නාවූ නුවණ දස්සන විසුද්ධි ඤාණ නමි.

නිර්දේශ වාරයෙහිදී සියලු ධර්ම එකස්වභාව වශයෙන් සංග්‍රහ කරන ක්‍රමය දොළොස් ආකාරයකින් දක්වෙයි. ඒ මෙසේය.

තථට්ඨේන, අනත්තට්ඨේන, සච්චට්ඨේන, පටිවේධට්ඨේන, අභිජානනට්ඨේන, පරිජානනට්ඨේන, ධම්මට්ඨේන, ධාතුට්ඨේන, ඤාතට්ඨේන, සච්ඡිකිරියට්ඨේන, ඵුසනට්ඨේන, අභිසමයට්ඨේන යනුයි.

මෙහි තථට්ඨ යනු පෙනෙන ගතියයි. විද්‍යමානාර්ථයි 'තථට්ඨේනාති භූතට්ඨේන අත්තනෝ අත්තනෝ සභාව වසෙන විජ්ජමානට්ඨේනාති අත්ථෝ" මේ අටුවායි. ඒ ඒ ධර්මයන්ගේ ඇතිසැටියෙන්ම පෙනෙන්නාවූ ගතිය විද්‍යමානාර්ථ නමි. මේ තථාර්ථය හැම ධර්මයකම ඇති නිසා ඒ සියලු ධර්ම තථාර්ථයෙන් එක ස්වභාව - එක් අයුරු - ලෙස සංග්‍රහ කෙරිණි සෙසු අර්ථයන්ගෙන් සංග්‍රහ කිරීමද මේ ලෙසින්ම සලකාගතයුතු. කාරවත් නොක් විඳින්නෙක් යනාදී වශයෙන් දක්විය යුතු කෙනෙකු නොමැති නිසා හැම ධර්මම අනාත්මාර්ථයෙන් සංග්‍රහවෙයි. ඒ සියලු ධර්ම විද්‍යමාන නිසාම ඒවාහී සත්‍යාර්ථය පවතියි. ලෝකෝත්තර ධර්මයන්ට පැමිණීම නිසා ඇතිවන, ඉතා පැහැදිලි නුවණින් අවබෝධ කිරීම් ස්වභාවයක් පැවතීම ප්‍රතිවේධාර්ථයි. අරමුණු කිරීම් වශයෙන් ලෞකික ඥානයෙන්ද, නුමුලාවීම් වශයෙන් ලෝකෝත්තර ඥානයෙන්ද, ඒ ඒ ධර්මයන්ගේ ස්වභාවයන් විශේෂයෙන් දැනගන්නා ගතිය අභිඥානාර්ථයි. "සබ්බං භික්ඛවෙ අභිඤ්ඤෙය්‍යං"යි මේ නිසාම දේශනා කරන ලදී. ඒ විශේෂ ඥානයෙන් දැනගත්තාවූ ධර්ම, අනිත්‍යාදී වශයෙන්ද, දුඃඛ ස්වභාවයට පැමිණීම් වශයෙන්ද, පිරිසිඳ දතයුතු නිසා ඒ හැම පරිජානනාර්ථයට ඇතුලත් වෙයි. "ධම්මට්ඨ" යනු ඒ ඒ ධර්මයන් තුළ පවත්නා තම තමාගේ ස්ව ස්වභාවයන් දැරීම් ගතියයි. නිජ්ජීව - ජීවයක් නැති බව, නිස්සත්ත-සත්වයෙක් නොමැති බව,

ත්‍යාදි ස්වභාවයෙන් පවතින නිසා ඒ ධර්මයන්හි ධම්මාර්ථය පවතී. ලෞකික ලෝකෝත්තර ඥානයන්ගෙන් දතහැකි හෙයින් ඒ හැම කෙරෙහි ඥාතාර්ථය-ඥාතට්ඨය පවතී. සච්ඡිකිරියට්ඨ නම් ආරම්මණ වශයෙන්ම ප්‍රත්‍යක්ෂ කළ යුතු ගතිය ඇති බවයි. එමෙන්ම නැවත නැවත අරමුණු වශයෙන් ස්පර්ශ කළ යුතුය යන තේරුම ඵුසනට්ඨ නම්. අවබෝධයට යෝග්‍ය වශයෙන් ඇති තේරුම අභිසමයාර්ථයයි. මෙසේ සංඛතාසංඛතවූ සියලු ධර්ම දොළොස් ආකාරයකින් එක ස්වභාවයට පත්වන අයුරු දස්සන විසුද්ධි ඥාණයෙන් අවබෝධ වන බව බුදුපියාණෝ දෙසූහ.

ඉක්බිති දක්වෙන නානත්ත එකත්ත ධර්ම ඉහත ඥානයන්හි විස්තර කළ පරිදිමයි. කාමච්ඡන්දාදිහු නානත්ත ධර්මයි. නෙක්ඛම්මාදිහු එකත්ත ධර්මයි. ප්‍රතිවේධ කිරීමේ ප්‍රඥාව නම් දුඃඛ සත්‍යය අනිත්‍යාදි වශයෙන් පිරිසිඳ දැනීම, සමුදය සත්‍යය ප්‍රහාණය කිරීම් වශයෙන් අවබෝධය නිරෝධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීම වශයෙන් අවබෝධය, මාර්ග සත්‍යය භාවනා කිරීම වශයෙන් අවබෝධය, මේ සතර අවස්ථාවන්හිදී උපකාර වන ඥානයයි. සෝවාන් ආදී මාර්ග-ඵල අවස්ථාවන්හිදී සියලු ධර්ම ප්‍රතිවේධ කිරීම නිසා, මාර්ග පිරිසුදුවීම් වශයෙන් දස්සන විසුද්ධි නම් ඵල, පිරිසුදුවූ බැවින් දස්සන විසුද්ධි නම්. මේ අයුරින් පවත්නාවූ සියලු ධර්මයන් එකස්භාවයට සංග්‍රහ කිරීමෙහිද කාමච්ඡන්දාදී ධර්ම නානා ස්වභාව වශයෙන් හා නෙක්ඛම්මාදී ධර්ම එක ස්වභාව වශයෙන් අවබෝධ කිරීමෙහිද ප්‍රඥාව දස්සන විසුද්ධි ඥානය නම්.

## 41 ඛන්ති ඥාණය

“විදිතත්තා පඤ්ඤා ඛන්ති ඥාණං” ප්‍රකට ලෙස දැන ගන්නා ලද ප්‍රඥාව ඛන්ති ඥාන නම්. මෙය රූපාදි පඤ්චස්කන්ධ ධර්මයන් කලාප වශයෙන් ගෙන අනිත්‍යාදි වශයෙන් බැලීම පිළිගන්නාවූ තරුණ විදර්ශනා ඥානයකි. “ඛන්ති” යනු ඉවසීම සංඛ්‍යාත අධිවාසනාය නමුදු මෙහිලා ඒ අර්ථය නොගැනේ. “එතෙන අධිවාසන ඛන්තිං පටික්ඛිපති” ඉහතකී ඛන්ති ඥානයෙහි කියැවෙන ඛන්ති ශබ්දයෙන් අධිවාසන ඛන්තිය ප්‍රත්‍යක්ෂේප කරයි. යනු අටුවායි. එහෙයින් ඒ ඉවසීම වූ අද්වේෂය හැර, විදර්ශනා ඥානයෙන් දුටු අනිත්‍යාදී ලක්ෂණයන් පිළිගැනීම් වශයෙන් ඉදිරිපත්වන ඥානය ඛන්ති ඥාණය බව දතයුතු.

"ධතත්ථෙ ඤාණන්ති විදිතමෙව ධම්මන්ති ධතත්ථ, ධතත්ථ එව ඤාණං ධතත්ථෙ ඤාණං" මේ අටුවාගත පද සාධනයයි.

"කෙසේ නම් ප්‍රකට කොට දත්තා ප්‍රඥව ධතත්ථ ඥානය නම් වේද? රූපය අනිත්‍ය වශයෙන් ප්‍රකට කොට දැනගන්නා ලදී. දුක් වශයෙන් ප්‍රකටකොට දැනගන්නාලදී අනාත්ම වශයෙන් ප්‍රකට කොට දැනගන්නාලදී. යමක් යමක් ප්‍රකටකොට දැනගන්නා ලද්දේද එය දනීනුයි ප්‍රකට කිරීම් වශයෙන් පවත්නා ප්‍රඥාව ධතත්ථ ඤාණ නම්"- ප. ම. (සිං ප.) මෙසේ විදර්ශනාවට ලක්වූ සියලු ධර්ම අනිත්‍යාදී වශයෙන් ප්‍රකට ලෙස දැනගන්නා ලද ප්‍රඥාව ධතත්ථ ඥාණයැයි නිර්දෙශ වාරයෙහිදී විස්තරවෙයි. මේ ඥානයට දැක්වි යුතු විස්තරය සප්තවිශුද්ධීන්හි දැක්විණි.

## 42. පරියොගාහන ඤාණය

"ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ ඤාණං" ස්පර්ශ කිරීම් වශයෙන් පවත්නා ලද ප්‍රඥාව පරියොගාහන ඤාණයයි. ඒ ස්පර්ශ කිරීම නම් විදර්ශනා ඥානයෙන් අනිත්‍යාදී ත්‍රිලක්ෂණයන්ගෙන් ස්පර්ශ කිරීමයි. එය එක්තරා බැසගැනීමක් නිසා පරියොගාහන යනුවෙන් දේශනාවිණි. "පරියොගාහනෙ ඤාණන්ති ඵුට්ඨමෙව පරියොගාහති පවිසතීති පරියොගාහනං ඤාණං" යනු අටුවායි. මෙසේ අනිත්‍යාදී ලක්ෂණත්‍රයට අනුව සංස්කාර ධර්ම ස්පර්ශ කිරීමෙහි බැසගන්නා ලද ඥානය පරියොගාහන ඥාන නම් මෙම ඤාණයෙහි ඇති විස්තරය ධතත්ථ ඤාණයට සමානය. වෙනස 'ස්පර්ශ" වචනය පමණී මේ ඥාන ද්වයම සතළිස්වැනි දර්ශන විශුද්ධි ඤාණය සම්පාදනය කර දෙන්නාවූ විදර්ශනා ඤාණයෝමයැ. කිවයුතු හැම විස්තරයක්ම ප්‍රකාශ විණි.

## 43: පදෙසවිහාර ඤාණය

සමොදහනෙ පඤ්ඤා පදෙස විහාරෙ ඤාණං" එක්රැස් කිරීමෙහි, පිඩු කිරීමෙහි පවත්නාවූ ප්‍රඥාව පදෙස විහාර ඤාණයයි සකන්ධ, ධාතු, ආදී ප්‍රභෙද ගත ධර්ම රාශියෙහි ඇත්තාවූ වෙදනා ධර්මය එක දේසයක් හැටියට පිඩුකිරීම පිළිබඳ නුවණ මේ ඤාණයෙන් විස්තර වෙයි එක දේසය යනු එක් කොටසයි පෘථග්ජන ජනයා හා ශෛක්ෂයා විදර්ශනා කිරීමේදී ස්කන්ධාදී ප්‍රභෙදගත සියලු ධර්ම සම්මර්ශනය කරත්. ඔවුනට එක් කොටසක් පිඩු කිරීමේ නුවණ නොපිහිටුයි, එහෙයින් මේ පදෙස විහාරඤාණ

පිහිටනුයේ රහතන් වහන්සේටය. උන්වහන්සේට වේදනා ධර්මය පමණක් ගෙන, ස්කන්ධාදී ප්‍රභේදගත ධර්ම රාශියකිම පවත්නා වේදනා ධර්මය සමූහ කරගත හැක මේ නිසා එක් කොටසක් පිළිබඳව පවත්නාවූ නුවණ පදෙස විහාර ඤාණයයි කියනු ලැබේ, පදෙස විහාරෙ ඤාණන්ති ඛන්ධාදීනං පදෙසෙන එක පදෙසෙන අවයවෙන විහාරො පදෙස විහාරො, තස්මිං පදෙස විහාරෙ ඤාණං” යනු අටුවායි.

මෙහි ඇත්තාවූ පදෙසය ක්‍රම කිපයකින්ම දක්වේ. ‘තත්ථ පදෙසො නාම ඛන්ධ පදෙසො ආයතන ධාතු සච්චඉන්ද්‍රිය පච්චයාකාර සතිපට්ඨාන ඣාන නාමරූප ධම්මපදෙසොති නානාවිධො එව” එහි ප්‍රදේශය වනාහී ස්කන්ධ ප්‍රදේශය, ආයතන ප්‍රදේශය, ධාතු ප්‍රදේශය, සත්‍ය ප්‍රදේශය ඉන්ද්‍රිය ප්‍රදේශය ප්‍රත්‍යාකාර ප්‍රදේශය, ස්මෘතිප්‍රස්ථාන ප්‍රදේශය, ධ්‍යාන ප්‍රදේශය, නාමරූප ප්‍රදේශය, ධර්ම ප්‍රදේශය වශයෙන් නොයෙක් ආකාරයෑ. වේදනා ධර්මය මේ සෑම තන්හිම එක දෙසයක් වශයෙන් එයි. ඒ එසේමය. පඤ්චස්කන්ධයෙහි ඇත්තාවූ වේදනා ස්කන්ධය ඛන්ධකදෙස වේදනා ධර්මයි. සෙසු තන්හිද මෙ අයුරින් වේදනා ධර්මය මතුකරගත යුතුය, මෙසේ වේදනා ධර්මයම ස්කන්ධාදීන්ගේ ප්‍රදේශයකි. කොටසකි. ඒ වේදනාවම ප්‍රත්‍යවෙක්ෂා වශයෙන් පැවැත්ම පදෙස විහාරයයි. එහි පවත්නාවූ නුවණ පදෙස විහාර ඤාණ නම්.

“කෙසේ නම් එක් කොටසක් පිඩු කිරීම් වශයෙන් පවත්නා ප්‍රඥාව පදෙස විහාර ඥාණය නම් වේද? මිථ්‍යාදෘෂ්ටිය හේතුකොට ගෙනද වේදනාව උපදී. මිථ්‍යා දෘෂ්ටිය සංසිඳීම හේතුකොටගෙන ද වේදනාව උපදියි. සම්‍යක් දෘෂ්ටිය හේතුකොටගෙනද වේදනාව උපදියි සම්‍යක් දෘෂ්ටිය සංසිඳීම හේතුකොටගෙනද වේදනාව උපදියි ..” යනාදී වශයෙන් නිර්දෙශ වාරයෙහි පදෙස විහාර ඥාණය විස්තර වෙයි එහි වටහාගතයුතු කොටස් මෙසේය, මිථ්‍යාදෘෂ්ටිය, සම්‍යක් දෘෂ්ටිය, මේ ධර්ම දෙක නිසා වේදනාව උපදින්නාසේ මිථ්‍යා සංකල්පය, සම්‍යක් සංකල්පය ආදී විරුද්ධ, අවිරුද්ධ ධර්මයන් නිසාද, ඡන්දය. සඤ්ඥා, විතර්කය, මේ ධර්ම නිසාද වේදනාව උපදින බව දක්වෙයි. එහි පිළිවෙල මෙසේය.

### මිථ්‍යාදෘෂ්ටිය නිසා වේදනාව ඉපදීම:-

මිථ්‍යාදෘෂ්ටිකයෝ තමන්ගේ වැරදි දැකීම් මත පිහිටා පූරපක්ෂය, අවපක්ෂය, දිනපතා ආදී වශයෙන් ආහාර පානාදිය

දෙන්. අඳ-ගොළු බිහිරි ආදීනට උපකාර කරත්. මංසන්ධීන්හි මගීයන්ගේ පහසුව සඳහා ගිමන්හල් කරත්. එසේම වැව්, පොකුණු ආදිය තනත්. මාර්ග සාදත්. මෙසේ කිරීම නිසා අනුනට කුශල් වේදනා උපදියි. මිථ්‍යාදෘෂ්ටිය නිසා සම්‍යක් දෘෂ්ටික සත්ව බැණවැදීමෙන් නින්දා අපහාස කිරීමෙන් හිංසාකිරීමෙන් අකුශල වේදනා උපදියි. මේ කුශලාකුශලයන්ට විපාක වශයෙන් භවයෙහි සැප, දුක් වේදනා විපාක වේදනා වශයෙන් උපදියි. මෙසේ මිථ්‍යාදෘෂ්ටිය නිසා කුශල වේදනා, අකුශල වේදනා විපාක වේදනා යන වේදනා ත්‍රයම උපදියි. සම්‍යක්දෘෂ්ටික සත්ව වනාහි මිථ්‍යා දෘෂ්ටිය අරමුණු කොට විදර්ශනා වැඩීම නිසා කුශල වේදනා උපදියි. මිථ්‍යාදෘෂ්ටිය ගරුකොට සැලකීම නිසා අකුශල වේදනා උපදියි රහතන් වහන්සේ මිථ්‍යාදෘෂ්ටිය විදර්ශනා කිරීම් වශයෙන් අරමුණු කිරීම නිසා අව්‍යාකෘත වේදනා උපදියි. මෙසේ සම්‍යක් දෘෂ්ටිකයනට කුශලාකුශල අව්‍යාකෘත වේදනා උපදියි.

මේ අයුරින් සෙසු තන්හිද වේදනාව උපදින පිළිවෙල දත යුතු. මිථ්‍යාදෘෂ්ටිය ව්‍යුපශමනය-සංසිඳීම-යනු සම්‍යක් දෘෂ්ටියමැයි සම්‍යක්දෘෂ්ටිය ව්‍යුපශමනය යනු මිථ්‍යාදෘෂ්ටියයි. මිථ්‍යා සංකල්පනාදියත් මෙසේයි. එහෙයින් ඡන්දාදී ධර්මයන්ගෙන් කොටසක්-වේදනාව - එකක් - පිඩුකොට දැනීමෙහි ප්‍රඥාව සමුදය විහාර ඤාණයයි.

## 44. සඤ්ඤාවිවට්ට ඤාණය

“අධිපතත්තා පඤ්ඤා සඤ්ඤා විවට්ටෙ ඤාණං” අධිපති භාවයෙන් පවත්නාවූ ප්‍රඥාව සඤ්ඤාවිවට්ට ඤාණයයි. සමසීසට්ඨ ඤාණාදීන්හි දක්වූවාවූ නෛෂ්ක්‍රම්‍යාදී ධර්මයෝම මෙහි අධිපතිභාවයෙන් පවතිත් අධිපතිභාවය නිසා ඒවාට විරුද්ධවූ කාමච්ඡන්දාදීන් කෙරෙහි පැවතියාවූ සඥාවන්ගෙන් සිත පෙරළේ පරාවර්තනය වෙයි. එසේ අධිපති වීමෙන් පෙරළා සිටියාවූ නුවණ සඤ්ඤාවිවට්ට ඤාණය නම්. “සඤ්ඤාවිවට්ටොති සඤ්ඤාය විවට්ටනං පරාවත්තනං’ පරම්මුඛ භාවො තිඅත්ථො” යනු අටුවායි. සඥා පෙරළීමෙහි යනු සඥාවගේ පෙරළීම, ආපසු ඒම අනික් ධර්මයකට යොමුවීම යන තේරුමයි. නෛෂ්ක්‍රම්‍යාදී ධර්ම අධිපතිවූ ප්‍රඥාවෙන් සඥාව පෙරළෙන අයුරු මෙසේය. නෛෂ්ක්‍රම්‍යය අධිපතිවූ ප්‍රඥාව කාමච්ඡන්දයට හේතුවූ සඥාව පෙරළයි. අව්‍යාපාදය අධිපතිවූ ප්‍රඥා

වෙත් ව්‍යාපාදයට හේතුවූ සඥව පෙරලයි ආලෝක සඥව අධිපතියාවූ ප්‍රඥාවෙත් ථිනමිද්ධයට හේතුවූ සඥව පෙරලයි සමාධිය අධිපතිවූ ප්‍රඥාව උද්ධච්චයට හේතුවූ සඥව පෙරලයි. එසේම ධර්මයන් පිරිසිඳ දැනීම අධිපතිවූ ප්‍රඥාව විචිකිච්ඡාවට හේතුවූ සඥාව පෙරලයි. ආදී වශයෙන් අර්හත් මාර්ගය තෙක් ඇත්තාවූ ප්‍රථම ධ්‍යානාදී සමථ - විදර්ශනා අධිපතිවූ ප්‍රඥාවත් නිසා ඒවාට විරුද්ධ ධර්මයන් කෙරෙහි පැවතියාවූ සංඥාවන්ගෙන් පෙරලාදමයි. මෙසේ අධිපති භාවයෙන් පවතින්නාවූ ප්‍රඥාව සඤ්ඤා විවට්ට ඤාණයයි.

## 45. චෙතොවිවට්ට ඤාණය

“නානත්තෙ පඤ්ඤා චෙතො විවට්ටෙ ඤාණං” නානත්ත ධර්මයන්හි ප්‍රඥාව චෙතොවිවට්ට ඤාණයයි. නානත්ව ධර්ම නම් කාමච්ඡන්දාදීහුමැයි. මේ නානත්ත ශබ්දයෙන් එකත්තයද ගත යුතු. එකත්වධර්ම නම් නානත්ව ධර්මයන්ට විරුද්ධවූ නෛෂ්ක්‍රම්‍යාදිය මැයි නානත්ත, එකත්ත පද ඉහතදී තේරුම් කෙරිණි. නානත්ව ධර්මයන්හි ප්‍රඥාව යනු කාමච්ඡන්දාදීන්ගේ ආදීනවය දැකීම් වශයෙන් පවතින්නාවූ නුවණයි “කාමච්ඡන්දාදිකෙ ආදීනව දස්සනෙන පවත්තා පඤ්ඤා” යනු අටුවායි. තවද තේරුමකි. නානත්වය ප්‍රහාණය කිරීමද නානත්වය නම්. මේ නෛෂ්ක්‍රම්‍යාදී එකත්ව ධර්මයන්ට දුන්වූ විකල්ප නාමයකි. එහෙයින් නොයෙක් ස්වභාව ඇති කාමච්ඡන්දාදීන් ප්‍රහාණය කිරීමෙහි පවත්නාවූ ප්‍රඥාව නානත්ත පඤ්ඤා නම්. “නානත්ත පහාණ නිමිත්තං නානත්ත පහාණ හෙතු නෙක්ඛම්මාදීසු පඤ්ඤාති අධිප්පායො” නානත්ව ප්‍රහාණයට හේතුවූ නෛෂ්ක්‍රම්‍යාදියෙහි ප්‍රඥාව යනු අදහසයි ගඟට පැනීම සඳහා සූදානම්වූ තැනැත්තා ගොඩබිමත් ගඟත් දෙකම බලන්නාසේ එකත්ත නම්වූ නෛෂ්ක්‍රම්‍යාදීන් කෙරෙහි පවත්නාවූ නුවණ, නානත්ත නම්වූ කාමච්ඡන්දාදීන් කෙරෙහිද පවතී. ඒ නිසා නානත්ව ධර්මයන්හි ප්‍රඥාව යනුවෙන් උදෙසීම කළද ඒ ප්‍රඥාව යනුවෙන් උදෙසීම කළද ඒ ප්‍රඥාව එකත්ව ධර්මයන්හිද පවතින බව දතයුතු

චෙතොවිවට්ට ඤාණය යනු චෙත්නාව කාමච්ඡන්දාදී ධර්මයන් කෙරෙන් පෙරලා නෛෂ්ක්‍රම්‍යාදී ධර්මයන් කෙරෙහි යොමු කරණ නුවණයි. “චෙතො විවට්ට ඤාණන්ති චෙතසො කාමච්ඡන්දාදිතො විවට්ටනං නෙක්ඛම්මාදීසු ඤාණං?” මේ අටුවායි.

"කෙසේ නම් (ශාන්ත ස්වභාවයක් නැති හෙයින් එකම ස්වභාවයක් නැති) නානත්ත ධර්මයන්හි ප්‍රඥාව චේතෝ විවට්ට ඥානය නම් වේද? කාමච්ඡන්දය අශාන්ත හෙයින් නානත්ත නම්. නෛෂ්ක්‍රම්‍යය ශාන්ත හෙයින් එකත්ත නම් වෙයි. නෛෂ්ක්‍රම්‍යයෙහි එකත්වය පවත්වන්නාහට කාමච්ඡන්දයෙන් සිත වෙන් වේනුයි නානත්වයෙහි ප්‍රඥාව චේතෝ විවට්ට ඥාන නම්" යනාදී වශයෙන් නිර්දෙශ පාඨයෙහි මෙය තවදුරටත් විස්තර වෙයි. මෙයද සඤ්ඤා විවට්ට ඤාණයට සමාන ය. චේතෝ යනු සංඥාවය, මෙහි චේතනාවය. එපමණි. එහෙයින් චේතෝ විවට්ට ඥානයද අර්හත් මාර්ගය තෙක් ගමන් කරයි.

## 46. චිත්තවිවට්ට ඤාණය

"අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං" සිත පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්තවිවට්ට ඤාණයයි. මෙම ඥානයද ඉහත දක්වූ ඥාන හා සමානය. කාමච්ඡන්දාදී ධර්මයන්ගෙන් සිත මුදවා (අස්කොට) නෛෂ්ක්‍රම්‍යාදී ධර්මයන්හි පිහිටුවීම වශයෙන් පෙරළා පැමැත්ම චිත්ත විවට්ට ඤාණයෙන් සිදුකෙරේ. මෙපමණකි මෙතැනට දක්විය යුත්තේ.

## 47 ඤාණවිවට්ට ඤාණය

"සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං" ශුන්‍ය භාවයෙහි-හිස් බවෙහි - පවත්නාවූ ප්‍රඥාව ඤාණවිවට්ට ඤාණයයි. තමාය, තමා පිළිබඳය, යන දෙයාකාරයෙන් ගෙන පඤ්චස්කන්ධයෙහි ඇති ශුන්‍යතාවය බැලීම මෙයින් කියැවේ. එනම් අනත්තානුපස්සනා වූ අනාත්ම ලක්ෂණ දර්ශනයයි පෙර පැවතියාවූ "ආත්ම" සංඥාවෙන් පෙරළි ශුන්‍යතාවයෙහි පිවිසීම වශයෙන් පවතින නුවණ ඤාණවිවට්ට ඤාණයයි

"කෙසේ නම් ශුන්‍ය භාවයෙහි පවත්නා ප්‍රඥාව ඤාණ විවට්ට ඤාණය නම් වේද? ඇස තමාගෙන්ද තමා සතු බවෙන්ද, නිත්‍ය බවෙන්ද, ස්ථිර බවෙන්ද, සදාකාලික බවෙන්ද, වෙනස් නොවන බවෙන්ද, හිස් යයි තත්වාකාරයෙන් දන්නහුගේ "ඇස මම යයි" වරදවා ගැනීමෙන් ඤාණය වෙන්වේනුයි ශුන්‍යත්වය දක්නා ප්‍රඥාව ඤාණවිවට්ට ඤාණ නම්" මෙසේ ආයතනයන් සයදෙනා ගැනම විස්තර වෙයි. එහෙයින් ආත්ම දර්ශනයෙන් ඤාණය පෙරළි අනාත්ම දර්ශනයෙහි පිහිටන්නාවූ නුවණ මේ ඤාණ විවට්ට ඤාණයෙන් දේශනා කළහ.

## 48. විමොක්ඛවිවට්ට ඤාණය

"වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛ විවට්ටෙ ඤාණං" අත්හැරීමෙහි ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඤාණයයි. "වොස්සජ්ජතීති වොස්සග්ගො, කාමච්ඡන්දාදීනං වොස්සග්ගො නෙක්ඛම්මාදීහි පඤ්ඤා" අත්හරිනුයි වොස්සග්ග නම්. කාමච්ඡන්දාදීන්ගේ අත හැරීම නෛෂ්ක්‍රම්‍යාදියෙහි වූ ප්‍රඥාවයි. නානත්ත ශබ්දය මෙන් මේ වොස්සග්ග ශබ්දයද තේරුම් දෙකක් ඇතියකි. එකක් කාමච්ඡන්දාදිය අතහැරීමෙහිය අනෙක නෛෂ්ක්‍රම්‍ය දියෙහි පිහිටීමය. "විමොක්ඛ" යනු කාමච්ඡන්දාදීන්ගෙන් සිත නිදහස් වීමය. එසේ නිදහස්වීම් වශයෙන් සිත කාමච්ඡන්දාදීන්ගෙන් පෙරලී පවතින නුවණ විමොක්ඛ විවට්ට ඤාණයයි. මෙම ඤාණයෙහිද විස්තරය පෙර පරිද්දේමය. මෙතැන "අතහැරීම" පදය පමණි, නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය අතහැරීමෙහි ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඤාණය නම් යනුවෙන් යොදාගත යුතුය.

## 49 සච්චවිවට්ට ඤාණය

"තථට්ඨෙ පඤ්ඤා සච්ච විවට්ටෙ ඤාණං" තථාර්ථයෙහිවූ ප්‍රඥාව, වෙනස් නොවන තේරුමෙහිවූ නුවණ, සච්චවිවට්ට ඤාණයයි. මේ ප්‍රඥාව එක් එක් සත්‍යයක් කෙරෙහි සතර සතර ආකාරයෙන් පවතියි. "තථට්ඨෙ පඤ්ඤාති එකෙකස්ස සච්චස්ස චතුබ්බිධෙ චතුබ්බිධෙ අවිපරීත සභාවෙ කිච්චවසෙන අසම්මොහතො පඤ්ඤා" තථාර්ථයෙහි ප්‍රඥාව යනු එක්එක් සත්‍යයාගේ සතරාකාර සතරාකාරවූ නොපෙරළෙන ගතියෙහි කෘත්‍යය වශයෙන් නුමුළාවීමෙන් පවත්නාවූ ප්‍රඥාවයි. මෙහි විස්තරය ඉදිරියට කියැවෙන සත්‍ය ඤාණයන්හි එයි. සච්ච විවට්ට ඤාණය යනු චතුරාර්‍ය්‍ය සත්‍යයන් කෙරෙහි දෙපරිද්දෙකින් නැගී සිටීම් වශයෙන් පෙරලී පවත්නා නුවණයි මේ විස්තරය ඉහත දක්වූ මග්ග ඤාණයෙහි ආශේය. දෙපරිද්දෙකින් නැගී සිටීම නම් අනිමිත්තවූ නිර්වාණය අරමුණු කරන නිසා නිමිත්තෙන්ද, සමුදය නම්වූ හේතුව මුලින් උපුටා දමන නිසා කෙලෙසුන්ගෙන් හා ඒවාට නැමුණාවූ ස්කන්ධයන්ගෙන්ද යන දෙයාකාරයෙන් නැගී සිටීමයි. "චත්තාරි මග්ග ඤාණානි අනිමිත්තාරම්මණත්තා නිමිත්තතො වුට්ඨහන්ති, සමුදයස්ස සමුච්ඡින්දනතො පවත්තා වුට්ඨහන්තීති දුභතො වුට්ඨානානි හොන්ති" - ප. ම. මෙසේ තථාර්ථයෙහිවූ ප්‍රඥාව චතුරාර්‍ය්‍ය සත්‍ය

සත් කෙරෙහි සතරාකාර තේරුම් අවබෝධ කරදෙනවාත් සම ගම් දෙපරිද්දෙකින් නැගී සිටීමටද උපකාර කරයි. එහෙයින් ඒ දෙවැදෑරුම් කෘත්‍යයන් සිදුකරමින් පෙරළී පවතින්නාවූ නුවණ සච්චවිවට්ට ඤාණයයි.

'-කෙසේ නම් සත්‍යාර්ථයන් දක්නාවූ ප්‍රඥාව සච්ච විවට්ට ඤාණය නම් වේද? දුඃඛ සත්‍යයාගේ පීඩන ස්වභාවය, සකස් කළ යුතු ස්වභාවය, තැවීම් ස්වභාවය වෙනස්වීම් ස්වභාවය, පිරිසිඳ දැනගත්තේ වෙත්වේනුයි සත්‍යාර්ථය දක්නාවූ ප්‍රඥාව සච්චවිවට්ට ඤාණ නම්. සමුදය සත්‍යයාගේ රැස්කිරීම් ස්වභාවය, හේතුවීම් ස්වභාවය, බැඳීම් ස්වභාවය, බාධා ස්වභාවය, පහකරන්නේනුයි සත්‍යාර්ථය දක්නාවූ ප්‍රඥාව සච්චවිවට්ට ඤාණ නම්. නිරෝධ සත්‍යයාගේ මිදීම් ස්වභාවය, විවේක ස්වභාවය, සකස් නොකිරීම් ස්වභාවය, අමෘත ස්වභාවය, දක්නේ වෙත්වේනුයි සත්‍යාර්ථයන් දක්නා, ප්‍රඥාව සච්ච විවට්ට ඤාණ නම්. මාර්ග සත්‍යයාගේ එතර කිරීම් ස්වභාවය, හේතුවීම් ස්වභාවය, දැකීම් ස්වභාවය, අධිපති ස්වභාවය: වඩන්නේ වෙත්වේනුයි සත්‍යාර්ථය දක්නා ප්‍රඥාව සච්චවිවට්ට ඤාණ නම්" -ප. ම. (සං. ප.)

මෙහි ආර්‍ය්‍ය සත්‍යයන්ගේ තථාර්ථයෝ දක්වෙත් දුක්ඛ සත්‍යයෙහි තථාර්ථයෝ - නොපෙරළෙන තේරුම් සතර දෙනෙකි. පීළනට්ඨ, සඞ්ඛතට්ඨ, සන්තාපට්ඨ, විපරිණාමට්ඨ යනුයි. සමුදය සත්‍යයෙහි ආයූහනට්ඨ, නිදානට්ඨ, සංයෝගට්ඨ, පලිබොධට්ඨ සතරයි නිරොධ සත්‍යයෙහි නිස්සරණට්ඨ, විවේකට්ඨ, අසඞ්ඛතට්ඨ, අමතට්ඨ සතරයි. මාර්ග සත්‍යයෙහි නිය්‍යානට්ඨ, හෙතට්ඨ, දස්සනට්ඨ අධිපතෙය්‍යට්ඨ සතරයි. මෙසේ සතර සතර වශයෙන් ඇත්තාවූ තථාර්ථයන් දැන සිටියාවූ ප්‍රඥාව, ඉහත සඳහන් කළ පරිදි දෙපරිද්දෙකින් නැගී සිට පවතින නිසා පෙරළීමක් හා සමානවේනුයි සච්චවිවට්ට ඤාණ නම් ඉහත දක්වූ පීළනට්ඨයාදී සොළොස් වැදෑරුම් සත්‍යාර්ථයන් ඉදිරියට ඇත දුක්ඛ ඤාණාදි සත්‍යඥාන සතර දක්වීමෙහිදී පැහැදිලිවෙයි

## සඤ්ඤාවිවට්ට ඤාණාදී විවට්ට ඤාණ සය පිළිබඳ මිශ්‍රක කථා:-

“එකමෙව ඤාණං අධිපතිං කත්වා ධම්මවසෙන සඤ්ඤං විවට්ටෙන්ති, පජානිතබ්බ ධම්මවසෙන චෙතො විවට්ටෙන්ති, චිත්තාධිට්ඨාන වසෙන චිත්තං විවට්ටෙන්ති, පච්ච

ණීක පහාණ වසෙන විමොක්ඛ විවට්ටොති එවං චතුධාවුත්තං අනත්තානුපස්සනාව සුඤ්ඤතාකාරවසෙන ඤාණවිවට්ටෙ ඤාණන්ති වුත්තං, මග්ගඤාණමෙව හෙට්ඨාමග්ගඤාණානන්තිච ආනන්තරික සමාධිස්මිං ඤාණන්තිච ද්විධා වුත්තම්පි විවට්ට-නාකාර වසෙන සච්චවිවට්ට ඤාණන්ති වුත්තං" - ප. ම. අ.

එකක්මවූ ඥානය, ප්‍රධාන ලෙස තබා (නෛෂ්ක්‍රම්‍යාදී) ධර්ම වශයෙන් සඤ්ඤා විවට්ටයැයිද, අත්හළයුතු ධර්ම වශයෙන් චේතෝ විවට්ටයැයිද, සිත පිහිටුවීම් වශයෙන් චිත්ත විවට්ටයැයි ද, විරුද්ධ ධර්මයන් ප්‍රහාණය කිරීම් වශයෙන් විමොක්ඛ විවට්ට යැයිද, මෙසේ සිවු වැදෑරුමව දේශනා කරනලදී. අනාත්මානු දර්ශනයම අනාත්ම ලක්ෂණයට අනුව දැකීම - ශූන්‍යතාකාර වශයෙන් ඥාණ විවට්ට ඥාණයැයිද දේශනා කරන ලදී. සට මග්ග ඥාණය, ආනන්තරික සමාධියෙහි ඥාණයයි දෙපරිද්දෙකින් දක්වූ වාවූ මාර්ග ඥාණයම පෙරළීම් ස්වභාව වශයෙන් සච්චවිවට්ට ඥාණයැයි දේශනා කරන ලදී මාර්ගක්ෂණයෙහි පැවතියාවූ එකම ඥාණය ඒ ඒ කෘත්‍යය වශයෙන් ගෙන මෙසේ ඥාණ සයක් හැටියට දේශනා කළ බව මෙහි විස්තරයෙන් පැහැදිලිවෙයි. ඉදානි මග්ගක්ඛණෙ එව කිච්චවසෙන ආකාර නානත්තතො ඡබ්බිධ ඤාණානි දස්සෙතුං සඤ්ඤා විවට්ටොති ආදි මාතිකං ඨපෙත්වා" - ප. ම. අ. + ඡ විවධ

එහිලා වැඩ පිළිවෙල මෙසේය:

සඤ්ජානනතො විවට්ටතීති සඤ්ඤා විවට්ටො දැනගනිමින් වෙන්වේනුයි සඤ්ඤා විවට්ට නම්. විදර්ශනාවට බැසගත් යෝගාවචරයා පූර්වභාගයෙහිදී නෛෂ්ක්‍රම්‍යාදී ධර්ම ආයති මාර්ගයෙහි අධිපති ධර්ම වශයෙන් දැන, පසුව එනම් මාර්ග අවස්ථාවේදී නෛෂ්ක්‍රම්‍යාදී ධර්මයන්ගෙන් යුක්තවූ ඥානයෙන් සිත, කාමච්ඡන්දාදී විරුද්ධ ධර්මයන්ගෙන් පෙරලයි. ඒ හා යෙදුනු නුවණට නමකි සඤ්ඤාවිවට්ට 'චෙතයන්තො විවට්ටතීති චෙතො විවට්ටො" සිතමින් වෙන්වේනුයි චෙතෝ විවට්ට නම්. එනම් යෝගාවචරයා නානත්ත ධර්මවූ කාමච්ඡන්දාදිය හා එකත්ත ධර්මවූ නෛෂ්ක්‍රම්‍යාදිය සිතනුයේ එකත්වධර්ම සම්ප්‍රයුක්තවූ ඥානයෙන් කාමච්ඡන්දාදීන් කෙරෙන් සිත පෙරලයි. ඒ හා යෙදුනු නුවණට චෙතෝ විවට්ට නාමය යෙදිණි. විජානන්තො විවට්ටතීති චිත්ත විවට්ටො" දැනගනිමින් වෙන්වේනුයි චිත්ත විවට්ට නම්. ඒ යෝගී තෙමේ නෛෂ්ක්‍රම්‍යාදී

ධර්ම වශයෙන් සිත පිහිටුවා ගනිමින් ඒ සමග යෙදුනාවූ නුවණින්, කාමච්ඡන්දාදීන් කෙරෙන් සිත පෙරලයි. ඒ හා යෙදුනු නුවණට ඒකත්තවිවට්ට නම යෙදිණ.

"ඤාණං කරොන්තො විවට්ටතීති ඤාණ විවට්ටො" ශූන්‍යතා ඥානයෙන් ප්‍රකට කෙරෙමින් වෙන්වේනුයි ඤාණ විවට්ට නම්. එනම් යෝගාවචරයා තමා කෙරෙහිවූ ආයතනයන් සයදෙනා අනාත්මානුදර්ශන ඥානයෙන් ශූන්‍ය වශයෙන් ප්‍රකට කරනුයේ ඒ ඥානයෙන්ම "ආත්මය යන දෘෂ්ටියට බැස ගැනීමෙන් පෙරලයි. ඒ හා යෙදුනු ඤාණයට ඤාණවිවට්ට යනු නමකි. "වොස්සජ්ජන්තො විවට්ටතීති විමොක්ඛ විවට්ටො" අත්හරිමින් වෙන්වේනුයි විමොක්ඛ විවට්ට නම්. ඒ යෝගියා නෛෂ්ක්‍රම්‍යාදී ධර්මයන් නිසා කාමච්ඡන්දදී ධර්මයන් අත්හරිනුයේ ඒ සමග යෙදුනාවූ නුවණින් කාමච්ඡන්දදීන් කෙරෙන් සිත පෙරලයි. ඒ හා යෙදුනු නුවණ විමොක්ඛ විවට්ට නම් "තථවෙන විවට්ටතීති සච්ච විවට්ටො" සත්‍යාර්ථයන් ප්‍රකාශ කෙරෙමින් වෙන්වේනුයි සච්චවිවට්ට නම්. ඒ යෝගාවචරයා දෙපරිද්දෙකින් හැඟී සිටීමෙන් මාර්ග ඥානය උපදවද්දීම සතරවැදෑරුම් සත්‍යාර්ථයන් දකිමින් සත්‍යාර්ථයන් නොදක්නාවූ ස්වභාවයෙන් සිත පෙරලයි ඒ පෙරලාලීම සඳහා යෙදුනු නුවණට නමකි සච්චවිවට්ට යනු.

මෙසේ විදර්ශනා කිරීමේදී නෛෂ්ක්‍රම්‍යාදී ධර්ම ඒකත්ත ධම වශයෙන් තේරුම් ගත් තැන් පටන් මේ විවට්ට ඤාණයෝ ඉදිරිපත්වී යෝගාවචරයාගේ සිත කාමච්ඡන්දදී නානත්ත ධර්මයන් කෙරෙන් මුදවා ශාන්තවූ ඒකත්තස්වභාවයෙහි පිහිටුවීමෙන් චතුරාර්‍ය සත්‍ය ධර්මයන් අවබෝධ කරවමින් ආර්‍ය මාර්ග සම්පාදනය කර දෙත්. මේ විවට්ට ඤාණයන්ගේ වැඩ පිළිවෙලයි

මෙතෙකින් විවට්ට ඤාණ පිළිබඳ විස්තර අවසානයි.

(22 වන පරිච්ඡේදය නිමි.)

## 23 වැනි පරිච්ඡේදය

# 50. ඉද්ධිවිධ ඥාණය

"කායම්පි චිත්තම්පි එකවවත්ථානතා සුඛසඤ්ඤඤ්ච ලහු සඤ්ඤඤ්ච අධිට්ඨාන වසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං"

ශරීරය ද සිත ද සමාන කොට මෙනෙහි කිරීමෙන් සැපය යන හැඟීමත් සැහැල්ලුය යන හැඟීමත් ඉටාගැනීම් වශයෙන් සමෘද්ධකිරීමේ ස්වභාවයෙහි - අදහස ඉටුවීමෙහි - වූ ප්‍රඥාව ඍද්ධි විධ ඥානය නම්. මේ මූලික හැඳින්වීමයි. මෙහිලා විස්තර මෙසේ ය.

ඉද්ධි යනු සමෘද්ධවීමයි. එනම් අභිඥාලාභී යෝගාවචරයාගේ "එකෙක්ව බොහෝ කෙනෙක් වෙයි" ආදී යම් බලාපොරොත්තුවක් වෙයි ද ඒ හැම ඉටුවීමයි. ඒ ඉටුවීම නම් නිෂ්පාදන යයි හෙවත් ප්‍රතිලාභයයි. නිෂ්පාදන, ප්‍රතිලාභ, දෙකෙන්ම කියැවෙනුයේ ඉටුවීම මැයි "යං හි නිප්ඵජ්ජති පටිලබ්භති ච තං ඉජ්ඣතීති වුච්චති" යනු අටුවාව විසඳු අයුරැයි. 'ඉද්ධි' ශබ්දයෙන් තේරුම් තුනක් ලැබේ. "කාමං කාමයමානස්ස තස්ස චෙතං සමිජ්ඣති" 'පස්කම් කැමති වත්තාහට ඒවා ලැබීමෙන් අදහස ඉටුවෙයි' යන මෙහි 'ඉද්ධි' ශබ්දය සමෘද්ධියෙහි ආයේය. "නෙක්ඛම්මං ඉජ්ඣතීති ඉද්ධි" නෛෂ්ක්‍රම්‍යය පැමිණෙනු ලැබේනුයි ඉද්ධි නම්. මෙහි ලැබීම යන තේරුමෙහි ආයේය. "ඉජ්ඣතියැ" යි කර්තෘකාරකයෙන් ක්‍රියාපදය ආයේ නමුදු අර්ථය ගත යුත්තේ කර්මකාරක වශයෙනි. එහෙයින් "පාපුණීයති" පැමිණෙනු ලැබේ යනුවෙන් තේරුම දක්වණ. "අරහත්ත මග්ගො ඉජ්ඣතීති ඉද්ධි" අර්හත් මාර්ගය පැමිණෙනු ලැබේ" යන මෙහි ද ඉද්ධි ශබ්දය ලැබීමෙහි ආයේය. ඉහත කී නෛෂ්ක්‍රම්‍යය නම් පැවිදිවීමේ පටන් අභිඥාලාභීත්වය තෙක් ඇති ප්‍රතිපදාවයි. මේ නෛෂ්ක්‍රම්‍යය, අර්හත් මාර්ගය, යන දෙකම "ප්‍රාතිහාර්‍ය්‍ය" ධර්ම ලෙස අටුවාවෙහි සඳහන් වෙයි. මක්නිසාද? විරුද්ධ ධර්මයන් දුරුකරන හෙයිනි. "පටිපක්ඛං හරතීති පාටිහාරියං" යනුවෙන් ඒ බව එහි ම සඳහන් වෙයි.

තවද ඉද්ධි ශබ්දය උපාය සම්පත්හි ද යෙදේ. "අයං ඛො චිත්තො ගහපති සීලවා කල්‍යාණධම්මො, සචෙ පණිදහිස්සති අනාගතමද්ධානං රාජා අස්සං චක්කවත්තීති" මේ චිත්ත ගෘහපතියා සිල්වත්ය. යහපත් ගුණ ඇත්තෙක. ඉදින් ප්‍රාර්ථනා කරන්නේ නම් අනාගතයෙහි සක්විති රජ වන්නේය. යනු උදාහරණයි. මේ වැකියෙහි ගැබ්වූ වැසුනු අදහස: "ඉජ්ඣිස්සති සීලවතො චෙතොපණිධි විසුද්ධත්තා" සිල්වතාගේ සිතෙහි අදහස සම්පූර්ණ වන්නේය. හරියන්නේය. යනුයි. එහෙයින් මෙහි ඉද්ධි ශබ්දය උපාය සමපත්තියෙහි ආයේය. (ගහපත සඳහා යොදන වැඩපිළිවෙල උපාය සම්පත්තිය යි) "එතාය සත්තා ඉජ්ඣන්ති" මේ නිසා සත්වයෝ වැඩෙත්. මෙහි වැඩීමෙහි ආලේය. මෙසේ ඉද්ධි ශබ්දය තේරුම් කීපයක පවතී. ඉද්ධිවිධ ඤාණයෙහි ආලේ නිෂ්පාදන, ප්‍රතිලාභ, දෙකෙහි ය "ඉද්ධි එව විධං ඉද්ධිවිධං ඉද්ධි කොට්ඨාසො ඉද්ධිවිකප්පොති අත්ථො" යනුවෙන් සෘද්ධිය ම කොටස් වූයේ ඉද්ධිවිධයැ යි අර්ථ ගතයුතු (විකප්ප නම් එක් එක් ආකාරය යි) සෘද්ධීන් පිළිබඳ වූ ඥානය ඉද්ධිවිධ ඤාණය යි.

ඉක්බිති පටිසම්භිදාමග්ගයෙහි මහාවග්ගයට අයත් ඉද්ධිකථායෙහි 'ඉද්ධි' පිළිබඳ දක්වෙන විස්තරය මෙතැන් සිට එයි.

## දස වැදෑරුම් සෘද්ධිඃ

"ඉද්ධියොති දස ඉද්ධියො කතමා දස ඉද්ධියො අධිට්ඨානා ඉද්ධි, විකුබ්බනා ඉද්ධි, මනොමයා ඉද්ධි, ඤාණවිප්ඵාරා ඉද්ධි, සමාධිවිප්ඵාරා ඉද්ධි, අරියා ඉද්ධි, කම්මවිපාකජා ඉද්ධි, පුඤ්ඤවතො ඉද්ධි, විජ්ජාමයා ඉද්ධි, තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධීති" යන දශ සෘද්ධීහුයි. දශ සෘද්ධිහු නම් කවරේද? අධිෂ්ඨාන සෘද්ධිය, විකුර්වණ සෘද්ධිය, මනොමය සෘද්ධිය, ඥාණවිප්ඵාර සෘද්ධිය, සමාධි විප්ඵාර සෘද්ධිය, ආර්‍ය්‍ය සෘද්ධිය, කර්ම විපාකජ සෘද්ධිය, පුණ්‍යවන්තයින් ගේ සෘද්ධිය, විද්‍යාමය සෘද්ධිය, සම්‍යක් ප්‍රයෝග සෘද්ධිය යනුයි.

1. අධිෂ්ඨාන සෘද්ධිය: අභිඥාලාභී යෝගාවචර තෙමේ වශීකරගත් චතුර්ථධ්‍යානයෙන් නැගී සිට, එකෙක් වී සියයක් හෝ දහසක් හෝ වේවායි ආවර්ජනා කොට, ඒ ඥානයෙන් ම "බොහෝ දෙනෙක් වෙම්වා" යි අධිෂ්ඨාන කරයි. එවිට ඒ සිතූ පරිද්දෙන් ම බොහෝ දෙනෙක් වෙත්. මේ ආදි වශයෙන් බෙදා දක්වා වදාළා වූ සෘද්ධිය අධිෂ්ඨාන වශයෙන් සිදුවන බැවින්

අධිෂ්ඨාන ඍද්ධි නම්. චූලපන්ථක හිමි දැක්වූයේ මේ ඍද්ධිය යි. උන්වහන්සේ හුදකලා වූයේ ආරාමයෙහි දහසක් දෙනා වහන්සේ හැටියට පෙනී සිටියහ.

2. විකුර්වණ ඍද්ධිය: තමා ගේ ප්‍රකෘති රූපය ඇත්තා වූ රූපය හැර, කුමාර වේශයක්, නාග වේශයක්, ආදී වශයෙන් නා නා වේශයෙන් පෙනී සිටීමට හැකි, ප්‍රකෘති වර්ණය අත්හැරීම් වශයෙන් පවත්නා ඍද්ධිය යි. නන්දෝපනන්ද නාග දමනයෙහි දී මුගලන් හිමියෝ මේ විකුර්වණ ඍද්ධිය පෑහ. උන් වහන්සේ නාගයෙක්, ගුරුළෙක්, හැටියට පෙනී සිටියහ.

3. මනෝමය ඍද්ධිය: තමා ගේ ශරීරය ඇතුළෙන් අතික් ශරීරයක් ඉපදවීම වශයෙන් පවත්නා ඍද්ධිය යි.

4. ඥාණවිප්ඵාර ඍද්ධිය: මේ ආත්මයේදී ම රහත් වීමට හැකි උතුමන්ට ඒ රහත් වීමට පෙර හෝ පසුව හෝ ඒ මොහොතෙහිදී හෝ පවත්නා ඥානානුභාවයෙන් උපන් විශෙෂතාවය ඥාණ විප්ඵාර ඍද්ධියයි.

මෙයට උදාහරණ වශයෙන් බක්කුල හිමි, සංකිච්ච හිමි, භූතපාල දරුවා, යන අය ගේ ඍද්ධීහු දැක්වෙත්. බක්කුල හිමියෝ ළදරු කල මාළුවෙකු විසින් ගිලිනු ලැබුවෝ මරණයට පත් නොවී ආරක්‍ෂා වූහ. ඒ අන්තිම භවික උතුමෙකු නිසා, ඉදිරියට උපදින අර්හත් මාර්ග ඥානයෙහි බලයයි. සංකිච්ච හිමියෝ මෑණියන් ගේ කුසෙහි සිටිද්දී මෑණියන් කළුරිය කළෙත් එම සිරුර හුලින් අනිමින් දවන කල - දරුවා මරණයට පත් නොවී ජීවත් විය. මේ අද්භූත කාරණය වූයේ ද අර්හත් මාර්ග ඥානයෙහි බලවේගය නිසා යැ. භූතපාල දරුවා තම පියා විසින් දර කැල යට නිදිකරවනු ලැබූයේ යක්‍ෂ - රාක්‍ෂසාදීන් ගෙන් ආරක්‍ෂා විය. මෙසේ පැවතියා වූ ඍද්ධි විශෙෂය ඥාණවිප්ඵාර නම්. විස්තර විශුද්ධි මාර්ගයේ ඍද්ධිවිධ නිර්දෙශයෙන් බලාගත යුතුය.

5. සමාධි විප්ඵාර ඍද්ධිය: ධ්‍යාන ඉපදවීමේ ශක්තියක් ඇති උතුමන් පිළිබඳ වූ සමාධියෙන් පෙර හෝ පසු හෝ ඒ මොහොතෙහි හෝ සමථයෙහි ආනුභාවයෙන් උපදින ඍද්ධි විශෙෂය සමාධි විප්ඵාර යි. සැරියුත් හිමි, සඤ්ජීව හිමි, ආදීන් ගේ ඍද්ධිය මෙති. සැරියුත් හිමි කපෝතකන්දරායෙහිදී සඳ ඇති රැයක කෙස් බෑ අළුත එළිමහනෙහි වෙසෙද්දී සපුරු යක්‍ෂ

යෙක් මිතුරු යකෙකු විසින් වළක්වද්දී ම හිසට පහරක් (ටොක්කක්) ගැසීය. එය හෙණහඬක් මෙනි. එසේ වුවද උන්වහන්සේ ඒ මොහොතෙහිදීම සමවතට සමවැදීම නිසා රිදුමක් නොවීය. සඤ්ජීව හිමි නිරෝධ සමාපත්තියට සමවැදී සිටිද්දී ගොපලු දරුවෝ මළ කෙනෙකැයි සිතා දර ආදිය රැස්කොට ගිනි දැමූහ. එහෙත් උන් වහන්සේ ගේ සිවුරු කොනක් නමුදු නො පිළිස්සුණේය. සඤ්ජීව හිමි කකුසඳ බුදුපියාණන් ගේ දෙවැනි සවුයා.

6. ආර්ය සෘද්ධිය: පිළිකුල් කටයුතු දෙයෙහි පිළිකුල් නැතිව විසීම ආදී වශයෙන් දක්වෙනුයේ ආර්ය සෘද්ධිය යි.

7. කර්ම විපාකජ සෘද්ධිය: පක්ෂි ආදීන් ගේ අහසෙහි පියාසර කිරීම් ආදිය යි. ලෝකයේ මුලින් ම ඉපදුන මනුෂ්‍යයන් ගේ අහසින් යාම ද කර්මවිපාකජ සෘද්ධියකි.

8. පුණ්‍යවන්තයන්ගේ සෘද්ධිය: සක්විති රජතුමා ආදීන් ගේ අහසින් ගමන් කිරීම ආදිය යි. නිධාන් පහළ වීම ද මීට ම ඇතුළත් ය.

9. විද්‍යාමය සෘද්ධිය: විද්‍යාධරයන් මන්ත්‍ර ජප කිරීමෙන් අහසින් ගමන් කිරීම ආදිය විද්‍යාමය සෘද්ධිය යි. එසේම මැණික් නො වූ දෑම මැණික් ලෙස දක්වීම් ආදිය ද මීට ම ඇතුළත්ය.

10. සම්‍යක් ප්‍රයෝග සෘද්ධිය: යහපත් පිළිවෙත් නිසා හෝ උත්සාහයෙන් සෝදාගනු ලබන කර්මාන්තාදිය නිසා හෝ යම් යම් දේ නිෂ්පාදනය වීම ස්වභාවය සම්‍යක් ප්‍රයෝග සෘද්ධිය යි.

මේ දශ වැදෑරුම් සෘද්ධීන් ගේ සාමාන්‍ය හැඳින්වීමයි. විස්තර වශයෙන් දක්වනුයේ සෘද්ධිවිධ ඥානයට ඇතුළත් වූ අධිෂ්ඨාන, විකුර්වණ, මනෝමය, සෘද්ධිත්‍රය පමණි.

## සෘද්ධි සම්පාදනයෙහිලා පූර්ව ප්‍රතිපදාව:

සමාධි භාවනාමය ඥාණයෙහි දැක්වූ පරිදි පිරිසුදු ශීලයෙහි පිහිටා සමථ භාවනා සතළිස අතුරෙන් ඔදාත කසිණය තෙක් ඇති අට කසිණයන්ගෙන් සමාපත්ති අට අට ඉපදවිය යුතුය. කසිණයන්ට අනුව ධ්‍යාන ඉපදවීම ඉතා දුෂ්කර දෙයකි. එහෙයින් එය සම්පූර්ණ වනුයේ කලාතුරකින් කෙනෙකුට පමණි. "ආදිකම්මිකස්ස කසිණ පරිකම්මම්පි භාරො, සතෙසු සහස්සෙසුවා එකො ච සක්කොති, කතකසිණ පරිකම්මස්ස නිමිත්තුප්පාද

තං කාරණං, සබ්බසු සබ්බසොසනුවා එකොව සම්පජ්ජති උප්පන්නෙන නිමිත්තෙන තං වඩ්ඪෙත්වා අප්පනාධිගමො කාරණං, සබ්බසු සබ්බසොසනු වා එකොව සම්පජ්ජතී" - වි. ම. පළමු වෙන් කසිණ භාවනා කරන්නහුට කසිණ පරිකර්මය - පඨවි, පඨවි ආදී වශයෙන් ප්‍රගුණ කිරීම - බැරෑරුම්ය. සියක් දෙනා අතුරෙන් හෝ දහසක් දෙනා අතුරෙන් හෝ එකෙකුට පමණක් හැකි වෙයි. පරිකර්ම භාවනා කළහුට උග්ගහ, පටිභාග, නිමිති ඉපදවීම බැරෑරුම් දෙයකි. එය ද සිදුවනුයේ සියයකින් දහසකින් කෙනෙකුට ය. උපන්නා වූ නිමිත්ත වඩා අර්පණා (ධ්‍යාන) ලැබීම බැරෑරුම් දෙයකි. එය ද හැකිවනුයේ සියයකින් දහසකින් කෙනෙකුට ය. මෙසේ කසිණ භාවනාවෙන් ගෙන් ධ්‍යාන ඉපද වීමේ ඇති දුෂ්කර භාවය සිතා ගත යුතුය එසේම ධ්‍යාන ඉපද වූ පමණින් ම "අභිඥා" නම් වූ සෘද්ධි නො ලැබිය හැකිය. ඒ සඳහා ධ්‍යාන ලාභියා විසින් "කසිණානුලොමතො" ආදී වශ යෙන් දක්වෙන ක්‍රම දහතරට අනුව සිත දමනය කරගත යුතුය. මේ ක්‍රම තුදුස සමාධි භාවනාමය ඥානයෙහි විස්තර විය. එසේ සිත දමනය කර ගැනුම ද හැකිවනුයේ සියයකින් දහසකින් කෙනෙකුට පමණි. දමනය කළ සිත් ඇතියහු විසින් සෘද්ධි විකුර්වණය ප්‍රගුණ කළ යුතුය. එයට ද සමත් වනුයේ කලාතුරකින් කෙනෙක් ය. සෘද්ධි විකුර්වණය ලබා ගත්තහු විසින් "ඛිප්පනිසන්ති" භාවය ලබාගත යුතුය. ඛිප්පනිසන්ති භාවය යනු වහ වහා ධ්‍යානයන්ට සමවැදීමේ දක්ෂකම යි. මෙය ද සියයකින් දහසකින් කෙනෙකුට පමණක් ලැබෙන්නකි. මේ සෘද්ධි සම්පාදනයෙහිලා දක්වෙන පූර්ව ප්‍රතිපදාව යි.

## සතර ඉද්ධි භූමිහු:

"ඉද්ධියා චතස්සො භූමියො, ඉද්ධියා කතමා චතස්සො භූමියො? විවෙකජ භූමි පඨම ජ්ඣානං පීති සුඛ භූමි දුතිය ජ්ඣානං, උපෙක්ඛා සුඛභූමි තතියජ්ඣානං අදුක්ඛමසුඛභූමි චතුත්ථජ්ඣානං, ඉද්ධියා ඉමා චතස්සො භූමියො ඉද්ධිලාභාය ඉද්ධි පටිලාභාය ඉද්ධිවිකුබ්බනතාය, ඉද්ධි විසවිතාය, ඉද්ධි වසිතාය, ඉද්ධිවෙසාරජ්ජාය, සංවත්තන්ති" - ප. ම.

සෘද්ධියට භූමි සතරෙකි. ඒ කවරේද? ප්‍රථමධ්‍යානය විවේකජ භූමියි. ද්විතීය ධ්‍යානය ප්‍රීති සුඛ භූමිය. තෘතීය ධ්‍යානය උපෙක්ෂා සුඛ භූමියි. චතුර්ථ ධ්‍යානය අදුක්ඛමසුඛ භූමියි. සෘද්ධි යයි මේ භූමි සතර සෘද්ධිය ලැබීම පිණිස - ප්‍රතිලාභය පිණිස - විකුර්වණය පිණිස - විවිධ විශෙෂයක් පිණිස - ප්‍රතිලාභය පිණිස - වෛශාරද්‍ය භාවය පිණිස පවතිත්.

මේ භූමි සතර දක්වූයේ අධිෂ්ඨාන, විකුබ්බන, මනෝමය, ඍද්ධිත්‍රය සඳහා පමණි. "ඉද්ධියා චතස්සො භූමියොති අවිසෙසෙන වා යථාලාභවසෙන අධිට්ඨාන විකුබ්බනමනොමය ඉද්ධීනං එව භූමියො න සෙසානං" යනු අටුවා විසඳීම යි. එහෙයින් ඍද්ධි විධ ඥානය සඳහා මේ භූමි සතර අවශ්‍යම ය. එහි ප්‍රථම ධ්‍යානය විවේකජ භූමියැයි දක්වූයේ කාමච්ඡන්දාදී නීවරණ ධර්මයන් ගේ කැළඹීම් ස්වභාවයෙන් වෙන්වූවක් හෙයිනි. නීවරණ ප්‍රහාණය නමැති විවේකයෙන් හටගත්තේ නුයි විවේකජ නම් භූමි යනු ආධාර වීමයි. ඍද්ධි විධ ඥානය සඳහා ප්‍රථම ධ්‍යානය ආධාර වන හෙයින් විවේකජ භූමියැයි නම් ලත් එම ධ්‍යානය භූමියැයි කියැවිණි. සෙසු තන්හි ද මේ ක්‍රමය යි. ද්විතීය ධ්‍යානය ප්‍රීතියෙන් හා සුඛයෙන් යුක්ත නිසා පීතිසුඛභූමි නමි. ධ්‍යාන විස්තරයෙහි දී මෙයට "සමාධිජ" යැයි නමක් යෙදිණි. තෘතීය ධ්‍යාන උපේක්ෂායෙන් හා සුඛයෙන් යුක්ත නිසා උපෙක්ඛා සුඛභූමි නමි. චතුර්ථ ධ්‍යානය දුඃඛයෙන් ද සුඛයෙන් ද වෙන් වූ සැප වේදනාවකින් යුක්ත නිසා අදුක්ඛමසුඛයැ යි දක්විණ.

මේ ධ්‍යාන අතුරෙන් ප්‍රථම - ද්විතීය - තෘතීය ධ්‍යානත්‍රයෙන් ඒවාහි ඇත්තා වූ ප්‍රීතියත් සුඛයත් පතුරුවා, සුඛ සංඥාවට හා ලඝු සංඥාවට - සැපය යන හැඟීමට හා සැහැල්ලුය යන හැඟීමට බැස, මෘදු කර්මණ්‍යතාවයෙන් යුක්තව - මොළොක් වැඩට සුදුසු බැව් යන ගුණ දෙකින් යුක්තව - ඍද්ධියට පැමිණිය යුතු නිසා මේ ධ්‍යානත්‍රය සම්භාර භූමිහුයැයි දත යුතුය. ඍද්ධි ලාභය සඳහා චතුර්ථ ධ්‍යානය ප්‍රකෘති භූමියයි. ස්වභාවයෙන් ම උපකාර යැ. (සම්භාර යනු ප්‍රත්‍යය හී හේතුවයි) චතුර්ථ ධ්‍යානය හැර, සෙසු ධ්‍යාන ඍද්ධි සඳහා හේතුව නමා මිස, ඒවායින් ම ඍද්ධි සම්පාදනයට. නොවේ. ඍද්ධි සම්පාදනයට චතුර්ථ ධ්‍යානය ම අවශ්‍යය.

ඉක්බිති මේ භූමි සතරෙහි ඇත්තා වූ ඍද්ධි පිළිබඳ ආනිශංස දක්වූහ. ආනිශංස සයෙකි. ඍද්ධි ලැබීම පළමුවැන්නයි ඍද්ධි ලැබීම යනු තම සිතෙහි පහළවීම් වශයෙන් ලැබීමය. පිරිහුණා වූ ඍද්ධීන් ගේ නැවත ලැබීම හෝ පළමු ලැබීම හෝ ප්‍රතිලාභය නමි. ලාභ, ප්‍රතිලාභ, සමාන අදහස් ඇති පදයි. නානා අයුරින් ඍද්ධි දැක්වීම පිණිස පැවතීම විකුර්වණතාවය යි. එය ම විශේෂ වශයෙන් පැවතීම පිණිස උපකාර වීම විසවිතාවය නමි. ඍද්ධියෙහි ඊශ්වර ස්වභාවය - ප්‍රධාන බව - පිණිස පැවතීම ඉද්ධිවසී භාවය යි. කවර පිරිසක් අතර වුව ද කම්පා වීමක් නොමැතිම

සෘද්ධි පැවැත්මට ඇති දක්ෂතාවය පිණිස පැවතීම ඉද්ධි විසාරද භාවය යි. වෛශාරද්‍ය නතීය යි. මෙසේ සෘද්ධි පිළිබඳ ආනිසංස සෑක් සතර භූමින්හි පවතී.

## සතර සෘද්ධිපාදයෝ:

"ඉද්ධියා කතමෙ චත්තාරො පාදා? ඉධ භික්ඛු ඡන්ද සමාධිපධානසඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරිය චිත්ත - විමංසා සමාධි පධානසඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති ඉද්ධියා ඉමෙ චත්තාරො පාදා ඉද්ධි පටිලාභාය -පෙ- ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්ති"

සෘද්ධියාගේ සතර පාදයෝ කවරහු ද? මේ ශාසනයෙහි භික්ෂු තෙමේ ඡන්දය අධිපති කොට ලබාගත් සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් සෘද්ධි පාදය වඩයි. විරිය, චිත්ත, විමංසා - ප්‍රඥාව - අධිපති කොට ලබාගත් සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් සෘද්ධිපාදය වඩයි. මේ සෘද්ධි පාද සතර සෘද්ධිය ලැබීම පිණිස - පෙර සේ පද යෙදිය යුතු - සෘද්ධි වෛශාරද්‍යය පිණිස පවතිත්. මෙහි ආ සෘද්ධි පාද සතර නම් ඡන්ද, චිත්ත, විරිය, විමංස, යනුයි. ඡන්ද යනු කත්තුකම්‍යතා - කරනු කැමති බව ඇති ඡන්දය යි. ප්‍රඥාව විමංස නාමයෙන් ආයේය. මේ සතර සෘද්ධි ලබා ගැනීම සඳහා හේතුවන බැවින් පාදයෝ නමි.

## සෘද්ධියෙහි අෂ්ට පද:

"ඉද්ධියා කතමානි අට්ඨපදානි? ඡන්දඤ්චෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං ලභති චිත්තස්ස එකග්ගතං, ඡන්දො න සමාධි සමාධි න ඡන්දො, අඤ්ඤො ඡන්දො, අඤ්ඤො සමාධි, විරියං - පෙ -"

සෘද්ධියාගේ අෂ්ට පාදයෝ කවරහුද? භික්ෂු තෙමේ ඡන්දය නිසා - ඡන්දය අධිපති කොට - සමාධිය ලබයි (එහි) ඡන්දය සමාධිය, නො වෙයි. සමාධිය, ඡන්දය නො වෙයි. ඡන්දය අනිකකි. සමාධිය අනිකකි. විරියාදිය ද මෙසේ ම ය. මෙහි අෂ්ටපාදයෝ නම් හුදකලා වූ ඡන්ද, චිත්ත, විරිය, විමංස, යන සතර හා ඒවා සමඟ යෙදුනු සමාධි සතර, යන අටයි. "තත්ථ ඡන්දො චිත්ත විරිය වීමංසං චත්තාරි පදානි, තං සම්පයුත්තා චත්තාරො සමාධි චත්තාරි පදානීති එවං අට්ඨපදානි" යනු

අටුවායි. මෙයින් ඡන්දාදීන් සමග යෙදුනා වූ සමාධිහු ම සෘද්ධි ප්‍රතිලාභය පිණිස පවතිත්. ඒ නිසා පද අවක්ශයි කියන ලදී. පද යනු හේතුවයි. කාරණයයි.

## සෘද්ධියෙහි මුල් සොළොස:

"ඉද්ධියා කති මූලානි? සොළස මූලානි. අනොනතං චිත්තං කොසජ්ජෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, අනුන්නතං චිත්තං උද්ධච්චෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, අනභිනතං චිත්තං රාගෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං අනපනතං චිත්තං බ්‍යාපාදෙ -පෙ- අනිස්සිතං චිත්තං දිට්ඨියා -පෙ-, අපටිබද්ධං චිත්තං ඡන්දරාගෙ -පෙ-, විප්පමුත්තං චිත්තං කාමරාගෙ -පෙ-, විසංයුත්තං චිත්තං කිලෙසෙ -පෙ-, විමරියාදිකතං චිත්තං කිලෙසමරියාදෙ -පෙ-, එකත්තගතං චිත්තං නානත්තකිලෙසෙ -පෙ-, සද්ධාය පග්ගහිතං චිත්තං අස්සද්ධියෙ -පෙ-, විරියෙන පග්ගහිතං චිත්තං කොසජ්ජෙ -පෙ-, සතියා පග්ගහිතං චිත්තං පමාදෙ -පෙ-, සමාධිනා පග්ගහිතං චිත්තං උද්ධච්චෙ -පෙ-, පඤ්ඤාය පග්ගහිතං චිත්තං අවිජ්ජාය -පෙ-, ඔභාසගතං චිත්තං අවිජ්ජාන්ධකාරෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං ඉද්ධියා ඉමානි සොළස මූලානි ඉද්ධිලාභාය -පෙ- ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්ති"

1. කුසීත වශයෙන් නො නැමුණා වූ සිත කුසීතකමෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජ නම්. කුසීතකම යනු කම්මැලිකමයි. 2. උද්ධච්ච වශයෙන් නො නැමුනා වූ සිත උද්ධච්චයෙහි කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්. 3. රාග වශයෙන් විශෙෂ බලාපොරොත්තු පිණිස නො නැමුනා වූ සිත රාගයෙහි කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්. 4. ද්වේෂ වශයෙන් නො ගැටුනා වූ සිත ක්‍රොධයෙහි කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්. 5. මිථ්‍යාදෘෂ්ටි වශයෙන් මිශ්‍ර නො වූ – නො ගැවසුණු – සිත මිථ්‍යාදෘෂ්ටියෙහි කම්පා නො වේනුයි අනෙඤ්ජ නම්. 6. ප්‍රත්‍යුපකාර කිරීමේ – කළ උපකාරයට පෙරළා උපකාර කිරීමේ – කැමැත්ත වශයෙන් නො බැඳුනා වූ සිත ඡන්දරාගයෙහි – සත්වයන් කෙරෙහි දක්වන කැමැත්ත – කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්. 7. විෂ්කම්භන විමුක්ති වශයෙන් කාමරාග යෙන් මිදුනා වූ සිත කාමරාගයෙහි කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්. 8. විෂ්කම්භන වශයෙන් කෙලෙසුන් කෙරෙන් වෙන්වූවා වූ සිත කෙලෙසුන් කෙරෙහි කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්. 9. කෙලෙස් සීමාව ඉක්ම වූ සිත කෙලෙස් සීමාවෙහි

කම්පා නොවේනුයි ආනෙඤ්ජ නම්. 10. එක් අරමුණට පත් වූවා වූ සිත නොයෙක් අරමුණුවල පවත්නා වූ කෙලෙසුන් කෙරෙහි කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්. 11. ශ්‍රද්ධාවෙන් පරිගෘහීත වූ - වටකරන ලද - සිත අශ්‍රද්ධාවෙහි කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්. 12. වීර්‍ය්‍යයෙන් පරිගෘහීත වූ සිත කුසීත කමෙහි කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්. 13. සමෘතියෙන් - සිහියෙන් පරිගෘහීත වූ සිත ප්‍රමාදයෙහි - මුටඨසසතියෙහි - කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්. 14. සමාධියෙන් උද්ධච්චයෙහි - නොපෙරළෙති 15. ප්‍රඥාවෙන් අවිද්‍යාවෙහි - නොපෙරළෙති. 16. ප්‍රඥාලෝකයට ඇතුලත් වූ සිත අවිද්‍යා අන්ධකාරයෙහි කම්පා නො වේනුයි ආනෙඤ්ජ නම්.

මේ සෘද්ධියෙහි මුල් සොළසයි. මූල යනු කාරණයයි, හේතුවයි. මේ සොළස සෘද්ධිලාභය පිණිස හේතු වෙයි. එසේම ලබාගත් සෘද්ධින්හි වශීභාවාදිය පිණිස ද පවතියි.

මෙසේ ආවා වූ භූමි, පාද, මූල, ධර්මයෝ සෘද්ධි සම්පාදනයෙහිලා උපකාරීහු වෙත්. එහෙයින් පූර්ව ප්‍රතිපදාව සම්පූර්ණ කළා වූ යෝගාවචරයා ඉහත කී ධර්මයන් ගෙන් යුක්ත විය යුතුය සංක්ෂෙපයෙන් නමුදු මෙහිලා දක්වූයේ එහෙයිනි.

යම් යෝගාවචරයෙක් භූමි ආදී ධර්මයන් ගෙන් යුක්ත වූයේ නම් එබන්දහුගේ සිත සෘද්ධිවිධ ඥානයට යොමු කළ හැකිය. එසින් වදාළහ.

‘සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති” - වි. ප.

ඒ යෝගාවචරයා මෙසේ චතුර්ථ ධ්‍යානයෙන් යුක්ත වූ) සිත චතුර්ථධ්‍යානයෙන් සමාධිමත් වූ කල්හි, උපෙක්ඛා සති පාරිශුද්ධියෙන් පිරිසුදු වූ කල්හි, ඒ පිරිසුදු වූ නිසාම ප්‍රභාස්වර - ආලෝක වූ කල්හි, රාගාදි අඞ්ගණයන් - කෙලෙස් - ප්‍රහාණය වූ කල්හි, අස්වූවා වූ උපක්ලේශයන් .කෙලෙස් ඇති කල්හි, පඤ්චවශිතායෙන් වශීකර ගැනීම නිසා මෘදු වූ කල්හි, සෘද්ධි භූමි - සෘද්ධි පාද - සෘද්ධිමූල යන මෙතෙක් ධර්ම ප්‍රගුණ කිරීම නිසා සෘද්ධිවිධ ඥානය පිණිස කර්මණ්‍ය භාවයෙහි සිටි කල්හි, සොළොස් මූල ධර්ම සම්පාදනය නිසා ආනෙඤ්ජ නම් වූ නොසෙල්වීමට පත් වූ

කල්හි, ඒ ධර්මයන් ගෙන් සම්පූර්ණ භාවයට පත් වූ සිත ඍද්ධි විධ ඥානය පිණිස විශේෂයෙන් එළවයි. යොමුකරයි එයට ම නමයි. මේ විභඞ්ගප්පකරණයෙහි දක්වූ ක්‍රමයකි.

පටිසම්භිදා මග්ගයෙහි දක්වෙන ක්‍රමය (මේ ග්‍රන්ථයෙහි) මූලික වන හෙයින් ඒ පිළිබඳ විස්තරය මෙතැන් සිට දක්වමි.

‘‘සො ඉමෙසු චතුසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙත්වා පරිදමෙත්වා මුදුං කත්වා කම්මනියං කත්වා, කායම්පි චිත්තෙ සමොදහති, චිත්තම්පි කායෙ සමොදහති, කාය වසෙන චිත්තං පරිනාමෙති, චිත්ත වසෙන කායං පරිනාමෙති කාය වසෙන චිත්තං පරිනාමෙතූ’’ ති අධිට්ඨාති, ‘‘චිත්ත වසෙන කායං පරිනාමෙතූ’’ ති අධිට්ඨාති, කාය වසෙන චිත්තං පරිනාමෙත්වා චිත්ත වසෙන කායං පරිනාමෙත්වා කාය වසෙන චිත්තං පරිණාමෙතූති අධිට්ඨාය, චිත්ත වසෙන කායං පරිණාමෙතූති අධිට්ඨාය, සුඛ සඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච කායෙ ඔක්කමිත්වා විහරති, සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන ඉද්ධිවිධ ඤාණාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති’’

ඒ පූර්ව ප්‍රතිපදා සම්පූර්ණ කළ යෝගාවචරයා මේ සතර ඍද්ධිපාදයන් කෙරෙහි සිත පුරුදු කොට, දමනය කොට, මෘදු කොට කර්මණ්‍ය භාවයට පත් කොට, ශරීරය ද සිතෙහි ඇතුළත් කරයි. සිත ද ශරීරයෙහි ඇතුළත් කරයි. ශරීරය වශයෙන් සිත නැඹුරු කරයි සිත වශයෙන් සිරුර නැඹුරු කරයි. ශරීරය වශයෙන් සිත නැමේවායි අධිෂ්ඨාන කරයි. සිත වශයෙන් ශරීරය නැමේවායි අධිෂ්ඨාන කරයි. මේ අයුරින් ක්‍රියාකර සැපය යන හැඟීමත්, සැහැල්ලුය යන හැඟීමත් ශරීරයෙහි බහා වෙසෙයි. හේ එසේ පුරුදු කර ගත්තා වූ පිරිසුදු බබලන සිතින් ඍද්ධිවිධ ඥානය වෙත සිත යොමු කරයි. විශේෂයෙන් නැඹුරු කරයි.

මෙසේ ඍද්ධිපාදයන්හි සිත පුරුදු කිරීම යනු ඡන්දාදී එක් එක් අධිපති ධර්මයන් මූලික කොට නැවත නැවත ධ්‍යාන සමාපත්තීන්ට සමවැදීමයි. මෙසේ හැම ඍද්ධිපාදයකින් ම සමාපත්ති උපදවා පසුව වශිතාවයෙන් වශී කොට ඛිප්පනිසන්ති - වහා ධ්‍යානයට සමවැදීමට හැකි - ශක්තියක් උදාකර ගත යුතුය. එසේ පුරුදු කර ගත් සිත දමනය වූයේ ද වෙයි. මොළොක් වූයේ ද වෙයි. කර්මණ්‍ය - ඍද්ධිවිධ භාවය සඳහා වැඩට යෝග්‍ය - වූයේ

ද වෙයි. ඉක්බිති තමාගේ ශරීරය ඒ වශීභාවයට පත් වූ පාදකජ්ඣානය නම් ලත් සිතෙහි ප්‍රවේශ කළ යුතු. සිතට නැංවිය යුතු. ශරීරය, සිත හා සමාන කළ යුතුය. සිත ද ශරීරයෙහි නැංවිය යුතු. සමාන කළ යුතුය. මෙයින් අදහස් කරනුයේ ශරීරයත් සිතත් දෙකම සමාන කිරීම යනුයි. අතුරුදහන් වීම, පෙනී පෙනී අහසින් යාම, ආදී දෑ සිදුකරනුයේ මේ අයුරින් සිත පුරුදු කිරීම නිසාය. "කාය වශයෙන් සිත නැඹුරු කරයි" යනාදී පද ඉහතකී පද හා සමානයි. සමාන තේරුමය. "සුඛ සඤ්ඤඤ්ච ලහු සඤ්ඤඤ්ච ඔක්කමිත්වා" යනු චතුර්ථ ධ්‍යානයෙන් හටගත්තා වූ සුඛ සංඥාව හා ලඝු සංඥාව, සමවැදීම් වශයෙන් ශරීරයෙහි ඇතුලත් කිරීමයි. කාය සඤ්ඤය ඔක්කන්තන කායස්ස පනස්ස කරජකායො පි තූලපිචුවිය ලහුකො හොති' ඒ සංඥාවෙන් බැසගත්තා වූ තැනැත්තහුගේ ශරීරය ද කපුපුළුන් පිඩක් මෙන් සැහැල්ලු වෙයි. සෘද්ධිවිධ ඥානය හැඳින් වීමෙහිදී දක්වූ පාඨය මෙතැන්හිදී සිහිකළ යුතු. මෙසේ පුරුදු කළා වූ සිත, ඉක්බිති සෘද්ධිවිධ ඥානය වෙත යොමු කරයි නොයෙක් අද්භූත ද සිදුකරනුයේ මෙතැන් සිටය ඒ පිළිබඳ සාමාන්‍ය විස්තරයක් මෙතැනට යා කරමි. එකතු කරමි.

"සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති - බහුධාපි හුත්වා එකො හොති-ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති. සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජ නිමුජ්ජං කරොති, සෙය්‍යථාපි උදකෙ උදකෙපි අභිජ්ජමානො ගච්ඡති, සෙය්‍යථාපි පඨවියං ආකාසෙන පල්ලඞ්කෙන කමති, සෙය්‍යථාපි පක්ඛී සකුණො - ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති"

සෘද්ධිවිධ ඥානය වෙත, මනාසේ පුරුදු කළා වූ සිත යොමු කරගත් ඒ අභිඥාලාභියා නොයෙක් ආකාර සෘද්ධි ප්‍රභේද අනුභව කරයි. ඒ කෙසේද?) එක් කෙනෙක්ව බොහෝ දෙනෙක් වෙත්. බොහෝ දෙනෙක්ව එක් කෙනෙක් වෙයි. ප්‍රකට භාවයට පැමිණෙයි. සැඟවුණ බවට පැමිණෙයි. බිත්තියෙන් පිටතට - ප්‍රාකාරයෙන් පිටතට - පර්වතයෙන් පිටතට අහසෙහි මෙන් නොගැටී ගමන් කරයි. ජලයෙහි සේ පොළොවෙහි ගිලෙයි. මතු වෙයි- පොළොවෙහි සේ ජලයෙහි හැරීමක් නැතිව ගමන් කරයි.

පක්ෂීහු මෙන් අහසෙහි පලක් බැඳ ගමන් කරති. මහත් සෘද්ධි ඇති, මහත් ආනුභාව ඇති, මේ සඳ හිරු දෙදෙනා අතින් අල්ලයි. පිරිමදියි. බඹලොව තෙක් සිරුරෙන් ප්‍රධානකම පවත් වයි.

## 1. එක් කෙනෙක්ව බොහෝ දෙනෙක් වීම :

ඉහත සඳහන් වූ පරිදි සෘද්ධිවිධ ඥානය සඳහා පූර්ව කෘත්‍යයන් සිදුකොට, සැහැල්ලු කරගත් අභිඥාපාදක චතුර්ථ ධ්‍යාන සිත ඇතිව බොහෝ දෙනෙකු ආවර්ජනා කරයි. ආවර්ජනා කොට "සියයක් හෝ දහසක් හෝ ලක්ෂයක් හෝ වෙමි" යි අභිඥා ඥානයෙන් අධිෂ්ඨාන කරයි. ඒ අධිෂ්ඨානයත් සමගම බොහෝ දෙනෙක් වෙත්. චූල්ලපන්ථක හිමි ගේ සෘද්ධිය නිදර්ශනයි. උන් වහන්සේ තමන් වහන්සේ වැනි දහසක් දෙනා වහන්සේ මැවූහ. ඒ හැම නොයෙක් වැඩෙහි යෙදී සිටියහ. ඇතැමෙක් නොයෙක් දෙනා වශයෙන් මවත්. ඔව්හු වර්ණයෙන්, ක්‍රියාවෙන්, වයසින්, ආදී දෙයින් වෙනස් වෙත්. ඇතැමෙක් කළුයහ. ඇතැමෙක් තලඑලළුය, ඇතැමෙක් රතුයහ. ඇතැමෙක් සිවුරු වසත්. ඇතැමෙක් නාත්. ඇතැමෙක් ළදරු වයස්යහ. මේ ආදී වශයෙනි. "මෙසේ මැවීමට මෙතෙක් භික්ෂූහු මෙබඳු මෙබඳු වෙත්වා" යි ආදී වශයෙන් වෙන වෙනම අධිෂ්ඨාන කළ යුතුය. ඒ අධිෂ්ඨානය වූ පරිදිම සිදුවෙයි.

## 2. බොහෝ දෙනෙක්ව එක් කෙනෙක් වීම:

මෙහි ද පූර්ව කෘත්‍යය පෙර මෙනි. බොහෝ දෙනෙක් වූ තැනැත්තා නැවත එක් කෙනෙක් වෙමි යි අධිෂ්ඨාන කළ විට, කැමති පරිදි එක් කෙනෙක් වෙයි. බොහෝ සෙයින් මෙය කරනුයේ අල්පේච්ඡ භාවය නිසාය.

## 3. ප්‍රකට භාවයට පැමිණීම හා සැඟවුණු බවට පැමිණීම:
(ආවිර්භාව - තිරෝභාව)

සෘද්ධිමත් තෙමේ බිත්ති, පවුරු ආදී යම් කිසිවකින් මුවහවූ දෙයක් හෝ දුරවූ දෙයක් හෝ ඉතා පැහැදිලි ලෙස පෙන්වීමට සමත්ය. එසේ පෙන්වනුයේ ධ්‍යානයට සමවැද, එයින් නැගී "මේ අඳුරු තැන ආලෝක වේවා" යි කියා හෝ "මේ මුවහවූ දේ පෙනේවා" යි කියා හෝ අධිෂ්ඨාන කිරීමෙනි. අධිෂ්ඨානයත් සමඟ ම සිතූ පරිද්දෙන් ම සිදුවේ. ඒ එසේමය; බුදුපියාණෝ

යමාමහ පෙළහර පා, දෙව්ලොවට වඩින ගමනේ දී එක් පියවරක් පොළොවෙහි තබා; දෙවැනි පියවර යුගඳුරු - යුගන්ධර - පවු මුදුනෙහි තබා, පළමු පය මහමේර තබා, මෙසේ තුන් පියවරෙන් තව්තිසා දෙව්ලොවම වඩිනා අයුරු, රුස්ව සිටි සියලු දෙනාට පෙනෙන සේ අධිෂ්ඨාන කළහ. රැස්ව සිටියෝ සාධුනාද දෙමින් බල බලා සිටියාහුය. තලඟුරු වෙහෙර වැසි ධම්මදින්න හිමියෝ අපණ්ණක සූත්‍රය දේශනා කරද්දී වික්ෂිප්තව බණ අසන පිරිස දැක, "මොවුන්ට නරකය පෙන්වා බිය ගන්වා බණ දෙසමි" යි සිතා ධ්‍යානයට සමවැද එයින් නැගී විජිනිපත යටිකුරු කළ සේක. එවිට අවීචිය තෙක් මිනිසුනට පෙනී ගියේය. උඩුකුරු කළ විට බඹලොව තෙක් පෙනී ගොස්, දිවසැප දකීමෙන් කුල් මත්වූ පිරිස ශාන්තව බණ ඇසීය. මේ ආවිර්භාව සෘද්ධියයි.

තිරෝභාව යනු සැඟවුණු බවට පැමිණවීමයි. එය කරනු සඳහා සෘද්ධිමත් තෙමේ නීල කසිණයට සමවැද එයින් නැගී "මේ ස්ථානය අඳුරු වේවා" යි ඉටයි. ඒ සමඟම අඳුරු වෙයි. බිත්තියකින් හෝ වේවා පර්වතාදී යම් කිසිවකින් හෝ වේවා මුවහ කරනු කැමැත්තේ නම් පඨවි කසිණයට සමවැද එයින් නැගී "මෙතැන පර්වතයක් වේවා" යි ආදී වශයෙන් අධිෂ්ඨාන කිරීමෙන් එසේ සිදුකරයි. බුදුරජාණන් වහන්සේ අඞ්ගුලිමාලයාට ඔහු ගේ මෑණියන් නො පෙනෙන සේ පර්වතයකින් මුවහ කළහ. ලඟ ම සිටින යසකුල පුත්‍ර පියාට නො පෙනෙන සේ අධිෂ්ඨාන කළහ. මේ අයුරින් දක්වන්නා වූ සෘද්ධිය තිරෝභාව නම්.

## 4. බිත්ති ආදියෙන් නො හැප්පී යෑම:

මෙසේ කරනුයේ ආකාශ කසිණයට සමවැද එයින් නැගී "මම කිසි තැනක නො හැප්පෙමි" යි පරිකර්ම වඩා "අහස වේවා" යි අධිෂ්ඨාන කිරීමෙනි. ඒ වූ පරිදි ම සිදුවෙයි. පිණ්ඩෝල භාරද්වාජ හිමියෝ තමන් වහන්සේ විසින් ම අහසට නංවාගත් විශාල ගල්තලාව, දෙබෑකොට, තමන් වහන්සේව මහජනයාට පෙනෙන සේ වැඩ සිටියහ. මේ ආදිය නිදර්ශනයි.

## 5. ජලයෙහි මෙන් පොළොවෙහිද ඉල්පීම ගැලීම:

මෙසේ කරනුයේ ආපො කසිණයෙහි බලයෙන්ය. ආපෙ කසිණයට සමවැද එයින් නැගී "මෙතෙක් තැන් ජලය වේවා" යි අධිෂ්ඨාන කරයි. ඒ වූ පරිදිම එතැන ජලය වෙයි. එහෙයින් සෘද්ධිමතා කැමති පරිද්දෙන් එහි කිමිදීම, මතුවීම, සිදුකරයි.

කියන ලද මැයි. පටිසම්භිදා මග්ගයෙහි, "පකතියා ආපො කසිණ සමාපත්තියා ලාභී හොති, පථවිං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති උදකං හොතූති" ස්වභාවයෙන් ම ආපෝ කසිණ සමාපත්ති ලාභියෙක් වේ ද හේ ධ්‍යානයට සමවැද එයින් නැගී පොළොව ආවර්ජනය කරයි. ආවර්ජනා කොට අභිඥා ඥානයෙන් "ජලය වේවා" යි අධිෂ්ඨාන කරයි. පළමුකොට පොළොව ආවර්ජනා කළ යුත්තේ තමා ගිලෙන භූමි ප්‍රමාණය සීමාකර ගැනීම සඳහා ය.

## 6. පොළොවෙහි මෙන් ජලයෙහි ද නො ගැලී යාම:

ඍද්ධිමත් තෙමේ පඨවි කසිණ සමාපත්තියට සමවැද එයින් නැගී ජලය ආවර්ජනය කරයි. එසේ ආවර්ජනා කොට අභිඥා ඥානයෙන් "මෙතෙක් තැන පොළොව වේවා" යි අධිෂ්ඨාන කරයි එවිට හේ කැමති පරිද්දෙන් පොළොවෙහි මෙන් සක්මන් කරයි. හිඳ ගනියි. සෙසු ඉරියවු ද පවත්වයි. පළමුකොට ජලය ආවර්ජනා කරනුයේ සීමා සලකා ගැනීම සඳහා ය.

## 7. කුරුල්ලෙකු මෙන් අහසෙහි යෑම.

මේ සඳහා දළපකාරී වනුයේ පඨවි කසිණ සමාපත්තිය යි. සිතා ගත් ආකාශ ප්‍රමාණය "පොළොව වේවා" යි අධිෂ්ඨාන කොට කැමති පරිද්දෙන් සක්මන් කරයි. හිඳගනියි. නිදාගනියි. මුගලන් හිමි මසුරුසිටාණන් ගේ ගෙදර මා කවුළුව ඉදිරිපිට අහසෙහි සිටි යහ. මහාප්‍රජාපතී ගෞතමී අහසෙහි පලඟ බැඳ, ධර්මදේශනා කළහ. මේ ආදිය නිදර්ශනයි.

## 8. සඳ-හිරු ඇල්ලීම, පිරිමැදීම.

"ඉමෙ චන්දිමසූරියෙ පරිමජ්ජතීති ඉධ සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො චන්දිම සූරියෙ ආවජ්ජති. ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති හත්ථපාසෙ හොතූති, හත්ථපාසෙ හොති. සො නිසින්නකො වා නිපන්නකො වා චන්දිමසූරියෙ ආමසති, පරාමසති, පරිමජ්ජති"

මේ සඳ හිරු පිරිමදියි යනු ඒ ඍද්ධිමත් චිත්ත වශීභාවයට පැමිණි තැනැත්තා සඳහිරු ආවර්ජනා කරයි. ආවර්ජනාකොට අභිඥා ඥානයෙන් "අත්පස වේවා" යි අධිෂ්ඨාන කරයි. අත්පසෙහි වෙයි. හේ හුන්නේ හෝ නිපන්නේ හෝ සඳහිරු අල්ලයි පිරිමදියි.

මේ ඍද්ධිය සඳහා කසිණ සමාපත්ති නියමයක් නො මැත; පාදක ධ්‍යානය වශයෙන් ම සමෘද්ධ වෙයි. එයින් කීහ අටුවාවෙහි. “අසම්පන්නකාඉද්ධි අභිඤ්ඤා පාදකජ්ඣාන වසෙන ඉජ්ඣති. නත්ථෙත්ථ කසිණ සමාපත්ති නියමො” කියායි. ළඟට පමුණුවා පිරිමැදීම පමණක් නොව වෙතට ගොස් ද පිරිමැදිය හැකිය. අධිෂ්ඨාන බලයෙන් ඒ හැම දෙයක් ම සිදු කළ හැක. කිවයුත්තෙක් ඇත ඍද්ධිමත් තෙමේ සඳ-හිරු ළඟට පමුණුවා ගත්තේ ය යි කීයේ නමුදු සඳ-හිරු දෙදෙනා ගේ ගමන ද, ආලෝක කිරීම ද, නතර නොවෙයි. ඒ හැම ද සිදු වෙයි. අභිඥා ලාභී එක් කෙනෙකු නොව දහසක් නමුදු අධිෂ්ඨාන කළත් ඒ දහස වෙතමසඳ-හිරු ළඟා වෙයි. මෙයින් සඳ-හිරු දෙදෙනා ගේ වැඩි වීමක් ද නො වේ. එසේ නම් මේ ඍද්ධිය කෙසේ වේද යනු ප්‍රශ්නයක් පැන නගියි ඊට පිළිතුරු උපමාවකින් සැපයේ, ජලය පිර වූ පාත්‍රා දහසක් එළිමහනෙක තැබූ කල ඒ දහසෙහිම සඳහිරු පෙනේ. එසේම සඳ-හිරු දෙදෙනා ගේ ගමන් කිරීම ද සිදු වෙයි. ඍද්ධියත් මේ ක්‍රමයට අනුව සිදුවෙයි.

(සැලකිය යුතු:- මේ ග්‍රන්ථය සම්පාදන සමයෙහි විද්‍යාඥයෝ සඳ තරණයෙහි යෙදී සිටිති. ඇතැමෙක් සඳෙහි ගල්, පස්, ආදියද ගෙනෙති. එසේම ඔව්හු වෙනත් ග්‍රහ වස්තු වෙත ද යෑමට උත්සුක වෙති. මේ හැම කිරීමට ඔවුනට උපකාරී වනුයේ කාර්මික වූද භෞතික වූ ද චින්තන ශක්තිය පමණී. මේ චින්තන ශක්තියෙන් සඳ-හිරු ගෙන්වා ගැනීමට නම් කිසිදු දිනක ඔවුනට නො හැකි වෙයි. කාර්මික වූ ද භෞතික වූ ද විද්‍යාඥයෝ ගිනිකෙණී. චිත්ත වශීභාවයට පත් වූ විද්‍යාඥයෝ අනිකෙකි.)

## 9. බඹලොව තෙක් කාය වශයෙහි පැවැත්වීම.

මේ ඍද්ධියෙන් අදහස් කරනුයේ දුර වූ දෑයක් ළං කිරීම, ළං වූ දෑයක් දුර කිරීම් ආදී ප්‍රාතිහාර්යයන් ය. එය ලොව තෙක් පමණක් නොව සෙසු සැම තන්හි ම පැමැත් විය හැකිය. මෙහි බඹලොව යන්න යෙදුනේ දුර බව හැඟවීමටය. එහෙයින් ඍද්ධිමතා අභිඥා ඥානයෙන් “මේ දෑය ළංවේවා, මේ දෑය දුර වේවා, මෙපමණක් දෑ සවල්ප වේවා” ආදී වශයෙන් අධිෂ්ඨාන කරයි. ඒ අධිෂ්ඨානය වූ පරිදිම සිදුවෙයි. එසේ ම බඹලොව යනු කැමති නම් යයි. නොපෙනී යනු කැමති නම්, කය සිත දෙකම සම කිරීමෙන් සිරුර සැහැල්ලු කොට නො පෙනී යයි සෙසු බොහෝ වූ පෙළහර මෙයින් සිදු කළ හැක. ඒ එසේමය. බුදුපියාණෝ යුගන්ධර පර්වතයෙහි එක් පයක් ද, මහාමේරු පර්වතයෙහි අනික් පය ද තැබූ

සේක් මේ දුර දෑ ලං කිරීමේ සෘද්ධියෙනි. ලක්දිව "සුළුමුහුදු" (චූල සමුද්‍ර) නම් හිමියෝ තමන් වහන්සේ වෙත පැමිණි සත් සියයක් භික්ෂූන් සමඟ පොළොව හකුළුවමින් වැඩ පැලලුප් නුවර පිඬු පිණිස හැසිරුණහ. පසු භික්ෂූහු 'ස්වාමීනි, මේ කිනම් නගරයක් දැ''යි ඇසූවිට ඇවැත්නි, මෙය පැලලුප් නුවර යැයි පිළිතුරු දුන්හ. එයින් පුදුමයට පත්වූ භික්ෂූහු "ස්වාමීනි, පැලලුප් නුවර ඉතා දුර නොවේදැ''යි විමසූ විමසූ විට ඇවැත්නි, මහළු තෙරහු දුර වූ දෑය ලං කෙරෙතියි කීහ. ස්වාමීනි, එසේ නම් මහ මුහුදව වූයේ කුමක් දැයි ඇසූ විට, ඇවැත්නි, අප මීට පෙර බැස ආ කුඩා ඇළයයි පිළිතුරු දුන්හ. මේ දුරවූ දෑ ලං කිරීම හා මහත් දෑ කුඩා කිරීමට නිදර්ශනයි. බොහෝ වූ දෑයක් ස්වල්ප කිරීම්: මහා කාශ්‍යප හිමියෝ රජගහ නුවරදී බුදුපියාණන් සමඟ වසද්දී පන්සියයක් කුමාරිකාවන් පිදූ සියලු කැවුම් තමන් වහන්සේගේ පාත්‍රයට ම පිළිගත්හ. ස්වල්ප වූ දෑය බොහෝ කිරීම; පුවඟු දිවයිනෙහි වැඩම කළ මහරහත් හිමියෝ දුටුගැමුණු කුමරු විසින් පිදූ බත, ගෙන ගොස් පන්සියයක් භික්ෂූන්ටද පිළිගන්වා, තමන් වහන්සේත් වළඳා, ඉතිරි පිරූ පාත්‍රය දුටුගැමුණු කුමරුගේ අතටම එවූහ. අමිහිරි දෑ මිහිරි කිරීම; මහා අනුල හිමියෝ භික්ෂූන් පිඬු සිඟාලත් වියළි බත් (ව්‍යඤ්ජන නො මැති) වළඳත්දී ගඟ දෙස බලා "මේ ගඟ දිය ගිතෙල් බඳුනක් වේවා''යි අධිෂ්ඨාන කොට ඒ භික්ෂූන්ට ගිතෙල් සමඟ බත් වැළඳීමට සැලැස් වූ හ. මෙසේ සෘද්ධිමත් තෙමේ නොයෙක් ප්‍රතිහාර්‍ය්‍යයන් දක්වයි. (විස්තර කැමැත්තෝ විශුද්ධි මාර්ගයෙහි අභිඥා නිර්දේශය. පටිස ම්භිදාමග්ගයෙහි ඉද්ධිකථා බලත්වා!)

අධිෂ්ඨාන සෘද්ධිය සඳහා උපමාවකි මේ: "සෙය්‍යථාපි මාණව දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය, තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ-"- දී. නි. (සුභසූත්‍රය) මාණවකය' (තරුණ) රන්කරුවෙක් හෝ ඔහුගේ අතවැසියෙක් හෝ මනාසේ මෘදුභාවයට පත් කළ රන් කැබැල්ලකින් යම් ආභරණ විශේෂයක් යම්සේ බලා පොරොත්තු වෙයිද, ඒ වූ පරිදිම කරන්නේය. නිපදවන්නේය. එමෙන් අභිඥා ලාභී සෘද්ධිමත් භික්ෂු තෙමේ මෘදු භාවයට පත් කළා වූ සිතින් යමක් බලා පොරොත්තු වෙයිද, ඒ වූ පරිදි ම ගේ සිදුකරයි. යනු එහි සාමාන්‍ය තේරුමයි අධිෂ්ඨාන සෘද්ධියෙන් බොහෝ දෑයක් සිදු කිරීමට හැකි බව බුදුපියාණෝ මේ උපමාවෙන් පැහැදිලි කළහ.

මේ අධිෂ්ඨාන සෘද්ධිය යි.

## විකුර්වණ සෘද්ධිය

"සිඛී නම් වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ ගේ "අභිභූ" නම් ශ්‍රාවක තෙමේ බඹලොව සිටියේ සහශ්‍රී ලෝකධාතුව සවරයෙන් හැඟ විය. හෙතෙම පෙනෙන කයින් ද දහම් දෙසයි පෙනෙන්නා වූ යට කයින් හා නො පෙනෙන්නා වූ මතු අඩකයින් ද දහම් දෙසයි. හෙතෙම ප්‍රකෘති රූපය හැර තරුණ රුවක් හෝ දක්වයි. නාග රූපයක් හෝ දක්වයි. ගුරුළු රුවක් හෝ දක්වයි. යක් රුවක් හෝ දක්වයි. අසුර රුවක් හෝ දක්වයි. ශක්‍ර රූපයක් හෝ දක්වයි. දෙව් රුවක් හෝ දක්වයි. බඹ රුවක් හෝ දක්වයි. මුහුදු සටහනක් හෝ දක්වයි. පර්වත රූපයක් හෝ දක්වයි වන සවරූපයක් හෝ දක්වයි. සිංහ සවරූපයක් හෝ දක්වයි. ව්‍යාඝ්‍ර රූපයක් හෝ දක්වයි. දිවි රුවක් හෝ දක්වයි. ඇත් රුවක් හෝ දක්වයි. අස් රුවක් හෝ දක්වයි. රියක් ද දක්වයි. පාබල සෙනඟක් ද දක්වයි. මේ විකුර්වණ සෘද්ධියයි"- ප. ම. (සිං. ප.)

විකුර්වණ සෘද්ධිය සඳහා සෘද්ධිමත් තෙමේ පඨවි කසිණාදී ධ්‍යානයකට සමවැද එයින් නැගී, තමා ම අන් කෙනෙකු ගේ පෙනී සිටීමට කැමති නම් "මෙබඳු වර්ණ ඇති කුමාරයෙක් වෙම්"යි පරිකර්ම කොට අභිඥා ඥානයෙන් "මෙබඳු වර්ණ ඇති කුමාරයෙක් වෙම්වා" යි අධිෂ්ඨාන කරයි. ඒ සමඟ ම සෘද්ධිමත් තෙමේ සිතූ පරිදි කුමාරයෙක් වෙයි. මේ මිනිස් රූ පිළිබඳ ක්‍රමයයි. ඇත්, අස්, ආදී අනික් රුවක් මවනු කැමති නම් තමා ගැන නො සිතා, ඇතකු හෝ අසකු හෝ ආවර්ජනා කොට, ඇතෙක් වේවා අසෙක් වේවා" යි අභිඥා ඥානයෙන් අධිෂ්ඨාන කළ යුතුය. මෙසේ කැමති රූමක් මැවිය හැකිය. මුහුදක් මැවීමට ආපො කසිණ සමාපත්තිය අවශ්‍යය. සෙසු ඒවා ද මේ අයුරින් සලකා ගත යුතුය.

සෘද්ධි විකුර්වණයෙහි දක්වූ අභිභූ හිමියෝ සිඛී බුදුරජාණන් වහන්සේ ගේ අග්‍රශ්‍රාවකයාණ කෙනෙකි. සිඛී බුදුරජාණන් වහන්සේ අරුණවතී නගරයෙහි වැඩ වෙසෙද්දී දිනක් අභිභූ මහරහතන් වහන්සේට ආමන්ත්‍රණය කොට, "ආයාම බ්‍රාහ්මණ යෙන අඤ්ඤතරො බ්‍රහ්මලොකො තෙනුපසඞ්කමිස්සාම" බ්‍රාහ්මණය, එක් තරා බ්‍රහ්ම ලෝකයකට යමුයි කීහ. ඉක්බිති සිඛී බුදුරජාණන් වහන්සේ අභිභූ මහරහතන් වහන්සේත් කැටුව, එක් බ්‍රහ්ම ලෝකයකට වැඩ, පණවන ලද බ්‍රහ්මාසනයෙහි වැඩ හිඳ "පටිභාතු තං බ්‍රාහ්මණ බ්‍රහ්මුනො ච බ්‍රහ්ම පරිසාය ච බ්‍රහ්මපාරි

2019 10 05 Paññápárami Na Uyana Free Distribution

සජ්ජානඤ්ච ධම්මීකථා'' බ්‍රාහ්මණය, බ්‍රහ්මයාට ද, බ්‍රහ්ම පිරිස ට ද, බ්‍රහ්ම සේවකයන්ට ද, ධාර්මික කථාවක් ඔබට වැටහේවා 'යි අභිභූ හිමිට කීහ. අභිභූ හිමි ඒ පැවරීම පිළිගෙන බ්‍රහ්මයනට ධර්ම දේශනා කළහ. එවිට බ්‍රහ්මයෝ, 'ශාස්තෲන් වහන්සේ ගේ බ්‍රහ්ම ලෝක ගමන අපි බොහෝ කලකින් ලැබුයෙමු. එහෙත් මේ භික්ෂු ශාස්තෲන් වහන්සේ හැර ධර්ම දේශනා කිරීමට පටන් ගත්තේය'' යි දොෂාරෝපනය කළහ. මේ කරුණ දත් සිඛී බුදුපියාණෝ බ්‍රහ්මයන්ව සංවේගයට පත් කරන්නයැයි අභිභූ හිමිට දැනුම් දුන්හ. ඒ සමගම අභිභූ හිමියෝ ඉහත කී පරිද්දෙන් සෘද්ධි විකුර්වණය කොට, තමන් වහන්සේ ස්වරයෙන් සහශ්‍රී ලෝකධාතුව ම විඥාපනය කරමින් = ඇසෙන සේ මෙසේ ප්‍රකාශ කළහ.

''ආරභථ නික්කමථ - යුඤ්ජථ බුද්ධසාසනෙ
ධුනාථ මච්චුනො සෙනං - නළාගාරං ව කුඤ්ජරො
යො ඉමස්මිං ධම්මවිනයෙ - අප්පමත්තො විහෙස්සති
පහාය ජාති සංසාරං - දුක්ඛස්සන්තං කරිස්සති''

ආරම්භ වීර්‍යය කරවු. නෛෂ්ක්‍රම්‍ය වීර්‍යය කරවු. බුද්ධ ශාසනයෙහි යෙදෙවු. ඇතෙක් බටදඬුයෙන් කළ ගෙයක් මනසන්නා සේ මාර සේනාව පලවා හරිවු. යමෙක් මේ ශාසනයෙහි අප්‍රමාදීව වෙසෙද්ද, හේ ජාතිය හා සංසාරය හැර, දුක් කෙළවර කරන්නේ ය කියායි. මේ අයුරින් පවත්නා වූ සෘද්ධියි විකුර්වණ නමි.

## මනෝමය සෘද්ධිය

මනෝමය කායක් මවනු කැමති සෘද්ධිමත් තෙමේ ආකාශ කසිණ සමාපත්තියට සමවැද එයින් නැගී, ''සිදුරක් වේවා'' යි අධිෂ්ඨාන කරයි. ඒ සමග ම තම සිරුර සිදුරක් වෙයි. ඉක්බිති පඨවිකසිණ සමාපත්තියට සමවැදීමෙන් ඒ සිදුර ඇතුළත තමා හා සමාන ශරීරයක් මවයි. මවා පිටතට ගනියි. ඒ මැවූ ශරීරයද හැම අවයවයකින් ම සම්පූර්ණය. චක්ෂුරා දී ඉන්ද්‍රියන් ගෙන් ද යුක්තය. එවැනි රූපක් මැවීම මනෝමය සෘද්ධි නමි. එයින් වදාළහ:

''සො එවං -පෙ- ආනෙඤ්ජප්පත්තෙ මනොමය කායං අභිනිම්මිනාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති. සො ඉම මහා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති, රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිකං අභිනින්ද්‍රියං. සෙය්‍යථාපි මානව පුරිසො මුඤ්ජම්හා ඊසිකං පබ්බාහෙය්‍ය, තස්ස එවමස්ස: අයං මුඤ්ජා අයං ඊසිකා අඤ්ඤො, මුඤ්ජො අඤ්ඤා, ඊසිකා. මුඤ්ජම්හාත්වෙව ඊසිකා පබ්බාළ්හාති''= දී. නි. (සුභසූත්‍රය)

ඒ ඍද්ධිමත් තෙමේ මෙසේ පෙර මෙනි නොසෙල්වීම් බව පත්වූ කල්හි මනොමය ශරීරයක් මැවීම සඳහා සිත එළවයි. හේ රූපවත් වූ සියලු අඞ්ගයන් ගෙන් යුත් නොපිරිහුණු ඉන්ද්‍රිය ඇති අනික් මනොමය ශරීරයක් මේ ශරීරයෙන් මවයි. තරුණය, පුරුෂයෙක් මුදුතණ ගසකින් බඩයක් අදින්නේ යම් සේ ද (එමෙනි) ඒ බඩය අදින්නා වූ ඔහුට මෙබඳු අදහසක් වෙයි. ''මේ මුදුතණ ගසයි. මේ බඩයයි. තණ ගස අනිකකි. බඩය අනිකකි. තණ ගසෙන්ම වෙන්කර ගන්නා ලදී'' කියායි. මේ මනොමය ඍද්ධියයි.

අධිෂ්ඨාන ඍද්ධියට සේම විකුර්වණ, මනොමය, ඍද්ධීන්ට ද කය-සිත දෙකම එකක් වන සේ ව්‍යවස්ථාපන කළ යුතුය. එසේම සුඛසඤ්ඤා-ලඝුසඤ්ඤා වනට ද බැසගත යුතුය. එහෙයින් මේ දෙක ද අධිෂ්ඨාන වශයෙන්ම සැපයෙයි. මෙසේ කයත් සිතත් එක හා සමාන සිතීමෙන් සැප යන හැඟීම හා සැහැල්ලුය යන හැඟීම, අධිෂ්ඨාන වශයෙන් සමෘද්ධ කිරීමෙහි වූ ප්‍රඥාව ඍද්ධිවිධ ඥානය නම්.

ඉද්ධිවිධ ඤාණය නිමි.

## 51. සොතධාතු විසුද්ධි ඤාණය.

‘‘විතක්ක විප්ඵාර වසෙන නානත්තෙකත්ත සද්දනිමිත්තානං පරියොගාහණෙ පඤ්ඤා, සොතධාතු විසුද්ධි ඤාණං’’, විතර්ක වේගයෙන් නොයෙක් සවභාව ඇත්තා වූ ද, එකසවභාව ඇත්තා වූ ද ශබ්ද නිමිති දැනගැනීමෙහි නුවණ සොතධාතු විසුද්ධි ඤාණ නම්. මෙය ෂඩ් අභිඥා අතුරෙන් දෙවැනි වූ දිව්‍යශ්‍රොත්‍ර ඥානයයි. විතර්කය පිළිබඳ හැඳින්වීම සංස්කාරස්කන්ධයෙහි දී දක්විණ. මෙහිදී විතර්කය ක්‍රියා කරනුයේ අවට පවත්නා ශබ්ද ශ්‍රවණය කිරීම සඳහා ය. එද අභිඥා ඥානය, පිණිසය. එහෙයින් අභිඥා ඥානයට උපකාර සඳහා පවතින ශබ්ද විතර්කය ඉපදවීමට, ඍද්ධිවිධ ඥානයට කී පරිද්දෙන් ධ්‍යාන සමාපත්ති ප්‍රගුණ කළ යුතුය. ඉක්බිති දිව්‍යශ්‍රොත්‍ර ඥානය සඳහා පරිකර්ම වැඩිය යුතුය.

පාදක ධ්‍යානයෙන් නැගී, පළමු කොට තමා වෙසෙන තැන් සිට අවට ඇත්තාවූ මහත් මහත් ශබ්ද ආවර්ජනා කර, පිළිවෙළින් කුඩා කුඩා ශබ්ද තෙක් ඒ ආවර්ජනාව හරවා, ඒ ශබ්ද ඇසීමේ පුහුණුවක් ඇති වූ විට නැවත දිශා වශයෙන් ආවර්ජන සිත් විහිදුවා, කුඩා වූ ද මහත් වූ ද ශබ්ද ශ්‍රවණය කිරීමට උත්සාහ වීම පරිකර්මයි. මෙසේ පරිකර්ම සමාධිය ප්‍රගුණ කරන කල්හි, දූන්

දූන් දිව්‍යශ්‍රොත්‍ර ඥානය උපදීයයි කිවයුතු මොහොතේදී ක්‍රමයෙන් පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ, ජවන් සිත් ඉපිද, අන තුරුව රූපාවචර චතුර්ථ ධ්‍යාන චිත්තය උපදනේය. ඒ සිත හා උප දනා ඥාණය දිව්‍යශ්‍රොත්‍ර නම්.

මහත් මහත් ශබ්ද ඇසීමට පටන් ගත් තැන් සිට පවත්නා වූ චිත්තවීථිය ඉහත සඳහන් පාඨයෙන් අදහස් කෙරේ. අසන්නා වූ ශබ්ද ඇතැම් ඒවා නොයෙක් අයුරුය. ඇතැම් ඒවා සමානය. එහෙයින් නානත්ත - එකත්ත සද්ද නිමිත්තයැයි. දැක්වූහ. මෙසේ නොයෙක් අයුරු ශබ්ද ද එක් අයුරු ශබ්දද. අසා ගැනීම් සඳහා යොදවන ප්‍රඥාව, පරියොගාහණ නම්. දිව්‍ය ශ්‍රොත්‍රඥානයට සොත ධාතු විසුද්ධි ඥාණය යනු අනෙක් නමකි. එය ශ්‍රවණාර්ථයෙන් සොත නම්. නිජ්ජීවාර්ථයෙන් ධාතුයි. සොතවූ යේත් ධාතුවූයේත් එම නුයි සොතධාතු නම්. කාමච්ඡන්ද දී නිවරණයන් ගෙන් විනිර් මුක්ත හෙයින් විසුද්ධි යි. සොතධාතුව ම විසුද්ධි වූයේ නුයි සොත ධාතු විසුද්ධියි. එයම ඥාණය වූයේ සොතධාතු විසුද්ධි ඥාණ නම්.

''සොතධාතු විසුද්ධි ඤාණන්ති සවණට්ඨෙන ච නිජ්ජීවට්ඨෙන ච සොතධාතු, පරිසුද්ධත්තා නිරුපක්කිලෙසත්තා විසුද්ධි, සොතධාතු එව විසුද්ධි සොතධාතු විසුද්ධි, සා එව ඤාණං සොතධාතු විසුද්ධි ඤාණං''-ප. ම. අ.

## සොතධාතු විසුද්ධි ඥාණයෙහි ඇති ආනුභාව ශක්තියා:-

''සො දිබ්බාය සොතධාතුයා අතික්කන්තමානුසකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච, යෙ දූරෙ සන්තිකෙ චා ති'' ඒ අභිඥලාභී සෘද්ධිසුත් තෙමේ තෙමේ පිරිසුදු වූ මිනිස් බව ඉක්මවූ දිව්‍ය ශ්‍රොත්‍රධාතුයෙන් දිව්‍ය වූ ද, මනුෂ්‍ය වූ ද, දුර වූ ද, ලං වූ ද, (මේ) දෙවැදෑරුම් ශබ්ද අසයි. මෙහි ''මිනිස් බව ඉක්මවූ'' යන්නෙන් දැක්වූයේ දිව්‍ය ශ්‍රොත්‍ර ඥානයෙන් මිනි සුන් අසන්නා වූ ශබ්ද විෂයයන් ඉක්මවා, දෙවියන් අසන්නා වූ ශබ්ද විෂයෙහි පවා පවත්නා වූ සියලු ශබ්ද ශ්‍රවණය කිරීමට හැකි බවයි. දෙවියන් ගේ කණ් පිත්-සෙම් ආදී දූසිත් නො කිලිටි හෙයින් ද, පින්කම්හි ඇති විපාක ශක්ති ඇති හෙයින් ද ඉතා පිරිසුදුය ඇසෙන සුළුය. ඊටත් වඩා දිව්‍ය ශ්‍රොත්‍ර ඥානය උපදවා ගත් සෘද්ධිමතා ගේ කණ් නිර්මලය. එහෙයින් දෙවියන් අභිභවා ගෙන නමුදු ශබ්ද ශ්‍රවණය කිරීමට දක්‍ෂකමක් ඇති බව දත යුතුය. එසේම ඉතා දුර වු ද ශබ්ද ඇසීමට හැකිය. බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මයන් ගේ පවා චිත්ත විප්ඵාර ශබ්දය අසන සේක

විතර්ක විස්ඵාර ශබ්දය යනු යම් අදහසක් සිතෙහි උපදින අවස්ථාවේ දී ඒ අදහස සිතට නැම්මෙන විට ඇති වන සුළු ගතියකි. සෙසු ශබ්ද ගැන කියනු කිම? ලං වූ ද ශබ්ද අසන සෘද්ධිමතා තමාගේ සිරුරෙහි හැවසී සිටින කුඩා පණුවන් ගේ පවා ශබ්ද අසයි. මෙසේ දිව්‍ය ශ්‍රොත්‍ර ඥානයෙන් දෙවැදෑරුම් ශබ්ද ශ්‍රවණය කිරීමට හැකිවීම, සොතධාතු විසුද්ධි ඥාණයෙහි ඇති අනුභා ශක්තිය යි.

සොතධාතු විසුද්ධි ඥාණය නිමි.

## 52. චෙතොපරිය ඥාණය

අභිඥා ඥානයන් අතුරෙන් තුන් වැන්න චෙතොපරිය ඥාණයයි. පරචිත්ත විජානන ඥානය යනුද නමකි. මෙහි "චෙතොපරිය" යනු සිතෙහි පිරිසිඳීමයි. "පරියාය තීති පරි යං, පරිච්ඡින්දතීති අත්ථො" පිරිසිඳිනුයි පරිය නම්. "චෙතසො පරියං, චෙතොපරියං" සිතෙහි පිරිසිඳීම චෙතොපරියයි. "චෙතොපරියඤ්ච තං ඤාණඤ්චාති චෙතොපරිය ඤාණං" සිතෙහි පිරිසිඳීම ම ඥානය වූයේ නුයි චෙතොපරිය ඥාණය නම්. මෙයින් අදහස් කරනුයේ අනුන්ගේ සිත් දැන ගන්නා නුවණ චෙතොපරිය ඥාණය බවයි. එනම් චෙතොපරිය ඥාණය වශයෙන් උපදවා ගත් අභිඥා චිත්තය - චෙතොපරිය ඥාණය ඇතුළත් චතුර්ථ ධ්‍යාන සිත - අනුන්ගේ සිත් කෙරෙහි මෙහෙයවා, ඒ සිත් මේ මේ වශයෙන් පවතියැයි පිරිසිඳ දැන ගැනීමයි.

මෙම ඥානය උපදවා ගැනීමට කැමති අභිඥාලාභියා විසින් ප්‍රථමයෙන් දිව්‍යචක්ෂුරභිඥානය-දිවඇස-උපදවා ගත යුතුය. ඒ පිළිබඳ පරිකම් මතුවට ඇති පස්වැනි ඥානයෙහි එයි. දිව්‍යචක්ෂුරභිඥානය චෙතොපරිය ඥාණයට පරිකර්මයි. මූලික භාවනාවයි. එහෙයින් එම ඥානය උපදවා කසිණාලෝකය පතුරුවමින් අනුන්ගේ සිත වෙත එම ආලෝකය එල්ල කළ යුතුය. එවිට හෘදය වස්තුව ඇසුරුකොට පවත්නා ලේ ධාතුවෙහි ඇත්තාවූ වර්ණය පෙනෙයි. ඒ වර්ණයට අනුව මොහුගේ සිත සොම්නස් සහගතය, මොහුගේ සිත සොම්නස් සහගත යැ යි ව්‍යවස්ථාපනය - සනිටුහන් කිරීම - කොට, නැවත පාදක ධ්‍යානයට සමවැදී එයින් නැගී, "මොහුගේ සිත දනිම්'යි යනාදී ක්‍රමයෙන් පරිකම් කළ යුතුය. එසේ බොහෝ වාරයක් - සිය

දහස්වර ලක්‍ෂවාර නමුදු - පරිකර්ම භාවනා කරනවිට 'දැන් චෙතොපරිය ඤාණය උපදනේය'යි කිවයුතු අවස්ථාව පැමිණෙයි. එවිට උපචාර. අනුලොම, ගොත්‍රභූ, ජවන් සිත් ගමන් කර අවසානයේ චෙතොපරිය ඤාණය සහිත අර්පණා සිත උපදියි. එය චතුර්ථ ධ්‍යානිකය. එහින් කීහ පටිසම්භිදා මග්ගයෙහි:—

"තිණ්ණං චිත්තානං විප්ඵාරත්තා ඉන්ද්‍රියානං පසාද වසෙන නානත්තෙකත්ත විඤ්ඤාණ චරියා පරියොගාහණෙ පඤ්ඤා චෙතොපරිය ඤාණං"

සොමනස්සාදී තෙවැදෑරුම් සිත් පිළිබඳ වේගවත් කම නිසා ඉඳුරන්ගේ පැහැදිලි ගතිය වශයෙන් නොයෙක් අයුරු හා එක් අයුරු සිත් පිළිබඳ හැසිරීම බැසගැනීමෙහි නුවණ චෙතොපරිය ඤාණයයි

චෙතොපරිය ඤාණය සඳහා පරිකර්ම භාවනා කරන අවස්ථාවේදී අන්‍ය පුද්ගලයන්ගේ සිතෙහි පවතින සොමනස්ස, දෞර්මනස්ස, උපෙක්ඛා, මේ සිත් තුන සෙවිය යුතු හෙයින් "තිණ්ණං චිත්තානං විප්ඵාරත්තා" සිත් තුන පිළිබඳ වේගවත්කම නිසා යැයි දක්වූහ. මෙහිදී තම සිතෙහි වේගවත් ගතියද, අනුන්ගේ සිතෙහි වේගවත් ගතියද, යන දෙකම ගත යුතුය. පරිකර්ම කරද්දී අභිඥලාභියාගේ සිත වේගවත්ය එහෙයින් වේගයෙන් ගමන් කෙරෙන සිත, බැලිය යුත්තේද අභිඥ බලයෙන් තම සිත වේගවත් කිරීමෙනි. තෙවැදෑරුම් සිත අන්‍යයා සඳහාම කියන ලදී. මෙසේ පරිකර්ම කරද්දී තමාගේ සිත. තෙවැදෑරුම් සිත වෙත එල්ල කළ යුතුයෑ දෙවැනි කරුණ වශයෙන් ආයේ ඉන්ද්‍රියන්ගේ ප්‍රසාද භාවයයිෑ මෙහි "ඉන්ද්‍රියන්ගේ" යනුවෙන් බහු වචනයෙන් කී නමුදු ගතයුත්තේ හෘදය වස්තුව පමණි. මක්නිසාද? හෘදය වස්තුව හැම ඉඳුරන්ටම මූලික හෙයිනි, හෘදය වස්තුව ප්‍රසාද ගතියෙන් යුක්ත නම් සෙසු ඉන්ද්‍රියන් ගැන කියනු කිම? "විප්පසන්නානි ඛො තෙ ආවුසො ඉන්ද්‍රියානි පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො" ඇවැත්නි, ඔබ ගේ ඉඳුරන් පැහැදිලිය. පිරිසුදුය. මෙ වශයෙන් අස්සජි හිමිව දුටු අවස්ථාවේදී උපතිස්ස පරිව්‍රාජකයා (සැරියුත් හිමි) කීයේ උත්වහන්සේගේ සිතෙහි සිතෙහි ඇති පිරිසුදුකම නිසා ඇස්. කණ්, නාසාදී ඉඳුරන් පැහැදිලිව පෙනුන හෙයිනි. තවද ප්‍රසාද භාවය කීයේ නමුදු එහිලා අප්‍රසාද භාවයද ගතයුතු අන්‍යයන්ගේ සිත් හැම එකක්ම ප්‍රසාද නොමෙයි. බොහෝ සෙයින්ම අප්‍රසාදය කෙලෙසුන්ගෙන් ගහණය. "පසාදප්පසාද

වෙසනාති වත්තබ්බෙ අප්පසාද සද්දස්ස ලොපො කතොති වෙදිතබ්බං" ප්‍රසාද, අප්‍රසාද, වශයෙන් යයි කිවයුතු කල්හි අප්‍රසාද ශබ්දය ලොප් කරන ලද්දේයයි දත යුතුය" යන මේ අටුවා කියමනෙන් තවදුරටත් එය පැහැදිලි වෙයි.

නානා සවභාව, එක සවභාව, චිත්තයන්හි හැසිරීම තුන්වැනි කරුණයි. එහි, රාගාදි කෙලෙසුන් ගෙන් ගහණ සිත්හි හැසිරීම නානා සවභාව - නානත්ත - යන පදයෙන් කියැවේ. වීතරාගාදී නිර්මල සිත්හි හැසිරීම එක සවභාව පදයෙන් කියැවේ මෙසේ දෙවදෑරුම් වශයෙන් පවතින්නාවූ සිත් සියල්ල සොළොස් ආකාරයෑ.

"සො එවං සමාහිතෙ චිත්තෙ -පෙ- චෙතොපරිය ඤාණාය චිත්තං අභිනිහරති, අභිනින්නාමෙති, සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති, සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. ස උත්තරං වා චිත්තං ස උත්තරං චිත්තන්ති පජානාති. අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති" – දී. නි. (සුභ සූත්‍රය)

ඒ අභිඥලාභී තෙමේ මෙසේ සමාහිතවූ සිතක් ඇති කල්හි -පෙර මෙනි- චෙතොපරිය ඤාණය සඳහා සිත එලවයි. නැඹුරු කරයි. හේ අන්‍ය පුද්ගලයන්ගේ සිතින් සිත පිරිසිඳ දැනගනියි.

(ඒ කෙසේද?) ලෝභ සහගත සිත හෝ ලෝභ සහගත සිතයැයි දනියි. - සෙසු පදද මේ අනුවින් යොදා ගත යුතු - මෙහි ඇත්තාවූ සිත් සොළොස නම් සරාග, වීතරාග, සදෙස, වීත දෙස, සමොහ, වීතමොහ, සඞ්ඛිත්ත, වික්ඛිත්ත, මහග්ගත, අම හග්ගත, සඋත්තර, අනුත්තර, සමාහිත, අසමාහිත, විමුත්ත, අවිමුත්ත, යනුයි.

1. සරාග සිත: ලෝභය සහිතවූ සිත් අටයි.
2. වීතරාග සිත: දෙමනස්ස සිත් දෙක, මොමූහ සිත් දෙක හැර ඉතිරි සත්සැත්තෑ සිත්ය. (77)
3. සදෙස සිත: පටිඝසම්ප්‍රයුක්ත සිත් දෙක.
4. වීත දෙස ,, අකුසල් සිත් දොළොස හැර ඉතිරි සත් සැත්තෑව (77)
5. සමොහ සිත: මොමූහ සිත් දෙක හෝ අකුසල් සිත් දොළොස
6. වීතමොහ ,, : ඉහත කී කුශල, අව්‍යාකෘත සිත් 77
7. සඞ්ඛිත්ත සිත: ථිනමිද්ධ සහිතවූ සසඞ්ඛාරික අකුල් සිත් පසයි
8. වික්ඛිත්ත ,, : උද්ධච්චය යෙදුනු සිත හෝ අකුසල් සිත් දොළොස
9. මහග්ගත සිත; රූපාවචර, අරූපාවචර, සිත් සත්විස්ස
10. අමහග්ගත ,, ඉතිරි සිත් දෙසැට (62)
11. සඋත්තර සිත: කාමාවචරාදී භූමි තුනට ඇතුළත් එක් සැත්තෑ සිත් (71)
12. අනුත්තර ,, : ලෝකෝත්තර සිත් අට
13. සමාහිත සිත: උපචාර වශයෙන් හෝ අර්පණා වශයෙන් හෝ පැමිණි සිත්
14. අසමාහිත සිත: එසේ නොපැමිණි සිත්
15. විමුත්ත සිත: තදඞ්ග, විෂ්කම්භන, සමුච්ඡෙද

පටිප්පස්සද්ධිය, නිස්සරණ, යන අවස්ථා පහට අනුව කෙලෙසුන්ගෙන් මිදුනු සිත්ය මෙහි කාමාවචර සිත් (අකුසල හැර) තදඞ්ග විමුක්ති යයි. රූපාරූප සිත් විෂ්කම්භන විමුක්තියයි. ලෝකෝත්තර මාර්ග සිත් සමුච්ඡේද විමුක්තියයි. ඵල සිත් පටිප්පස්සද්ධිය, නිස්සරණ, විමුක්තිහුයි.

**16.** අවිමුත්ත සිත: මෙහි පස් අයුරින් නො මිදුනු සිත්ය

මෙසේ පවත්නාවූ සොළොස් වැදෑරුම සිත් අතුරෙන් පෘථග් ජන අභිඥලාභියාට ආර්යයන්ගේ මාර්ග ඵල සිත් නො පෙනෙන්නේය. ආර්යයනටද තමන් නොලත් මතු මතු මාර්ග-ඵල සිත් නො පෙනෙයි. මෙනයින් අන්‍යයන්ගේ සිත් දැනගන්නාවූ ධ්‍යාන සම්ප්‍රයුක්ත ප්‍රඥාව චේතොපරිය ඥාණය නමි.

24 වැනි පරිච්ඡේදය

## 53. පුබ්බෙ නිවාසානුස්සති ඤාණය

“පච්චය පවත්තානං ධම්මානං නානත්තෙකත්ත කම්ම විප්ඵාර වසෙන පරියොගාහණෙ පඤ්ඤා පුබ්බෙනිවාසානුස්සති ඤාණං” ප්‍රත්‍යය වශයෙන් පවත්නාවූ ධර්මයන් ගේ නානා ස්වභාව, එක ස්වභාව, කර්ම වේග වශයෙන් බැස ගැනීමේ ප්‍රඥාව පුබ්බෙනිවාසානුස්සති ඤාණ නම්. මේ උද්දෙස පාඨයෙන් පූර්වේ නිවාසානුස්මෘති ඥානය උපදවා ගැනීමට උපකාර වන්නාවූ පූර්ව කෘත්‍යයද, ක්‍රියාවේ යෙදෙන අයුරුද, ඒ සඳහා යෙදුනු නාමයද, යන කරුණු තුනම පැහැදිලි වෙයි. එහි “පච්චය පවත්තානං ධම්මානං” යන පදයෙන් පූර්ව කෘත්‍යය කියැවේ. “නානත්තෙකත්ත කම්මවිප්ඵාරවසෙන” යන්නෙන් ක්‍රියාවේ යොදවා ගත යුතු අයුරු ප්‍රකාශ වෙයි. “පුබ්බෙනිවාසානුස්සති” යන්නෙන් ඊට යෙදුනු නාමය දර්ශිතයි. මෙසේ කොටස් කර ගත් කල්හි මෙම ඥානය තේරුම් ගැනීමට පහසුය.

මෙහි පළමුවෙන් තේරුම් ගත යුත්තේ “පුබ්බෙනිවාසානුස්සති ඤාණය” යන පදයයි.

“පුබ්බෙ අතීත ජාතීසු නිවුත්ථ ඛන්ධා පුබ්බෙනිවාසො යාය සතියා පුබ්බෙනිවාසං අනුස්සරති සා පුබ්බෙනිවාසානුස්සති, තාය සතියා සම්පයුත්තං ඤාණං පුබ්බෙනිවාසානුස්සති ඤාණං” පූර්වයෙහි අතීත ජාතීන් පිළිබඳ විසූ ජීවිත-පඤ්චස්කන්ධ - පූර්වේ නිවාස නමි. යම් සිහියකින් ඒ පූර්වේනිවාසය සිහි කරයිද, ඒ සිහිය පූර්වේනිවාසානුස්මෘතියයි. ඒ සිහිය සමග යෙදුනු නුවණ පූර්වේනිවාසානුස්මෘති ඥාන නමි. පෙර විසූ ආත්ම පිළිබඳ සිහි කිරීම සඳහා උපයෝගී වන නුවණ පුබ්බෙනිවාසානුස්සති ඤාණය බව මේ විවරණයෙන් පැහැදිලි වෙයි. (විස්තර පසුවටණ.)

පූර්වේනිවාසානුස්මෘති ඥානය ලබාගනු කැමති අභිඥාලාභියා විසින් උද්දෙස පාඨයෙහි මුලින්ම දක්වූ “පච්චය පවත්තානං ධම්මානං” ප්‍රත්‍යය වශයෙන් පවත්නාවූ ධර්මයන්ගේ” යන පැහැදිලි කිරීමට අනුව පළමු කොට ප්‍රත්‍යය, ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් විනිශ්චය කර ගැනීම සඳහා ප්‍රත්‍යයසමුත්පාද ධර්මය ආවර්ජනා

කළ යුතුය. ඒ මෙසේය:- "ඉමස්මිං සති ඉදං හොති, ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති, යදිදං අවිජ්ජා පච්චයා සඞ්ඛාරා -පෙ- එවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති" මේ ප්‍රත්‍යය ඇති කල්හි මේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මය වෙයි. මේ ප්‍රත්‍යය ඉපදීම නිසා මේ ප්‍රත්‍ය සමුත්පන්න ධර්මය උපදියි. ඒ කෙසේද? අවිද්‍යාව නිසා සංස්කාර හටගනී - පෙර මෙනි - මෙසේ මේ හුදු දුක් රැසෙහි ඉපැත්ම වෙයි. මේ පිළිබඳ විස්තරය සඳහා ධම්මට්ඨිති ඤාණය බැලිය යුතු. මෙසේ ආවර්ජනා කරත්ම ඒ යෝගියාට ප්‍රත්‍ය වශයෙන් පවත්නාවූ ප්‍රත්‍යයෝත්පන්න ධර්ම අවබෝධ වෙයි. පෙර විසූ කඳ පිළිවෙල බැලීම සඳහා පළමු කොට උම්මනා වන්නේ ප්‍රත්‍ය සමුත්පන්න ධර්ම වශයෙන් පවතින නාම-රූප මෙනෙහි කිරීමේ නුවණයි. එසේ නාම-රූප වශයෙන් පිරිසි පසු ඒ නාම රූප ධර්මවූ තමාම ජීවිත පැවැත්ම වශයෙන් පෙනේ. කරුණු මෙසේ හෙයින් ප්‍රත්‍ය සමුත්පාද ධර්මය ආවර්ජනා කිරීම පූර්ව කෘත්‍ය වශයෙන් පවතී. "චතුසු ඉද්ධිපාදෙසු පරිභාවිත චිත්තස්ස පුබ්බෙනිවාසානුස්සති ඤාණං උප්පාදෙතුකාමස්ස තදුප්පාදන විධාන දස්සනත්ථං වුත්තං" යනුවෙන් අටුවාවෙහිද ඒ අදහසම දක්වේ.

ප්‍රත්‍ය සමුත්පන්න ධර්මයන්ගේ අනුසාරයෙන් ජීවිත නම්වූ ස්කන්ධ පරම්පරාව දැකීමේදී ක්‍රියාවේ යොදවා ගතයුතු අයුරු "නානත්තෙකත්ත කම්ම විප්ඵාර වසෙන" යන පාඨයෙන් පැහැදිලි කෙරේ. මෙහි නානත්ත - නොයෙක් අයුරු බව-යනු අකුශල කර්මයි. එකත්ත යනු කුශල කර්මයි. නැතහොත් කාමාවචර කර්ම නානත්ත නම්. රූපාවචර, අරූපාවචර, කර්ම එකත්ත නම්. පෙර විසූ ජීවිත මේ ක්‍රම දෙකට අනුව පැවතිණ. එහෙයින් ඒ ජීවිත බලද්දී මේ ක්‍රම දෙකට අනුව සිත මෙහෙයවිය යුතුය. "විප්ඵාර" යන්නෙන් දක්වූයේ එයයි. පෙර තෙමේම අකුශල කර්ම වේගයෙන් සතර අපායෙහි හෝ මිනිස් ලොව හෝ දුඃඛිත ජීවිත ලබා ඇත. කුශල කර්ම වේගයෙන් මිනිස් ලොව හෝ දෙව්ලොව හෝ සුඛිත ජීවිත ලබා ඇත. එසේම රූපාවචර කුශලයන්ගේ වේගයෙන් බ්‍රහ්මලෝකයෙහි ජීවිත ලබා ඇත. අරූපාවචර කුශලයන්ගේ වේගයෙන් අරූප භූමීන්හි ජීවිත ලබා ඇත. මේ නිසා පෙර ජීවිත බැලීමේදී කුශලාකුශල කර්ම වේගය අනුගමනය කිරීමට සිදුවෙයි. නානත්තෙකත්ත කම්ම විප්ඵාරයම ක්‍රියාවේ යොදවා ගත යුතු අයුරු යයි දක්වූයේ එහෙයිනි.

## පුබ්බෙනිවාසානුස්සති ඤාණය සඳහා පරිකම් භාවනා:-

"එවං අනුස්සරිතුකාමෙන ආදිකම්මිකෙන භික්ඛුනා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තෙන රහොගතෙන පටිසල්ලීනෙන පටිපාටියා චත්තාරි ඣානානි සමාපජ්ජිත්වා අභිඤ්ඤාපාදක චතුත්ථජ්ඣානතො වුට්ඨාය, වුත්තනයෙන පටිච්චසමුප්පාදං පච්චවෙක්ඛිත්වා (ඉදං විසුද්ධිමග්ගෙ නදිස්සති) සබ්බපච්ඡිමා නිසජ්ජා ආවජ්ජිතබ්බා -පෙ-" යනාදී වශයෙන් පටිසම්භිදාමග්ගට්ඨකථායෙහි පරිකර්ම භාවනා විධිය මෙසේ එයි.

පෙර විසූ කඳ පිළිවෙල සිහිකරනු කැමති ආදිකාර්මික භික්ෂුව විසින් පසු බත පිණ්ඩපාතයෙන් වැලකී, හුදකලාව රහසිගතව, පිළිවෙලින් ධ්‍යාන සතරට සමවැද, අභිඥා පාදක චතුර්ථ ධ්‍යානයෙන් නැගී පෙර කී පරිද්දෙන් ප්‍රත්‍යයසමුත්පාදය ප්‍රත්‍යවෙක්ෂා කොට – ආවර්ජනා කොට – (මෙය විශුද්ධිමාර්ගයෙහි නොපැනේ.) සියලු වැඩ වලටම පසුව කළ හිඳගැනීම ආවර්ජනා කළ යුතුයි – සිතිය යුතුයි – එතැන් සිට අසුන පැණවීම, සෙනසුනට පිවිසීම, පා - සිවුරු තැන්පත් කිරීම, වැළඳූ වේලාව, ගමෙන් පැමිණි වේලාව, ගමෙහි පිඬු පිණිස හැසුරුණු වේලාව පිඬු පිණිස පිවිසි වේලාව, වෙහෙරෙන් නික්මුණු වේලාව, සෑ බෝ වැඳි වේලාව, පාත්‍රය සේදූ වේලාව, පාත්‍රය ගත් වේලාව, ඊට පෙර මුව සේදීම, ඊට පෙර උදේ වරුවේ කළ දෑ, ඊට පෙර මැදුයම් රෑ කළ දෑ. පෙරයම කළ දෑ, මේ වශයෙන් මුලට මුලට සිහිකොට, එතැන් සිට දින, සති, මාස, අවුරුදු, තරුණ කාලය, බාල කාලය, ළදරු කාලය, ආදී වශයෙන් සිත යවා ප්‍රතිසන්ධිය ආවර්ජනා කළ යුතුය.

ප්‍රතිසන්ධියෙන් පසු අතීත භවයෙහි චුති–මරණ–වේලාවෙහි පැවතියාවූ නාම-රූප මෙනෙහි කිරීමට උත්සාහ ගත යුතුය. මේ අවස්ථාව ඉතා දුෂ්කරය. එහෙයින් නැවත නැවත ධ්‍යානයට සමවැදෙමින් ඥානය තියුණු බවට පත්කළ යුතුය. ඒ සඳහා උපමාවකි. එක් පුරුෂයෙක් ශාලාවෙක කැණි මඬලක් සෑදීම සඳහා ගසක් කැපීමට ගොස්, ගසෙහි අතු සිඳිද්දීම පොරොව මොට වූයේ එපමණකින්ම ඒ වැඩය නතර කිරීමට නොසිතා කම්හලට ගොස් පොරොව මුවහත් කොට ගෙන අවුත් ගස කපයි. දෙවැනි තෙවැනිවද මොට වූයේ නම් නැවත නැවතත් මුවහත් තබා ගස කපා හෙලා දමයි. එමෙන් ධ්‍යානලාභී ඒ භික්ෂුව විසිනිදු ප්‍රතිසන්ධි ක්ෂණයෙන් එහාට සිත

නැවීමට නොහැකි වීනම් නැවත නැවත ධ්‍යානයට සමවැද නුවණ තියුණු කර ගත යුතුය. මෙසේ තියුණු කරමින් බලත්ම අතීත භවයෙහි චුතික්ෂණයෙහිවූ නාම-රූප ධර්ම පෙනෙයි.

සිද ගැනීමේ සිට ප්‍රතිසන්ධිය තෙක් සිහි කිරීම පරිකර්ම භාවනායි. අතීත භවයෙහි චුති ක්ෂණයෙහි පැවති නාමරූප ධර්ම පෙනීම සිදුවනුයේ පිළිවෙලින් පරිකර්ම, උපචාර, අනුලෝම ගොත්‍රභූ ජවන් සිත් ඉපිද, චතුර්ථ ධ්‍යාන සම්ප්‍රයුක්ත අර්පණා ජවනය ඉපදීමෙනි, ඒ අර්පණා චිත්තය සමග යෙදුනාවූ ඥානය පුබ්බෙනිවාසානුස්සති ඥාණයයි ඒ සමග යෙදුනාවූ සිහියෙන් පෙර විසූ කඳ පිළිවෙල සිහි කරයි. ඒ කෙසේද?

‘‘එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාති සතම්පි ජාති සහස්සම්පි ජාති සතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ට විවට්ට කප්පෙ අමුත්‍රාසිං එවං නාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො අමුත්‍ර උදපාදිං තත්‍රාපාසිං එවං නාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නොති, ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති’’ - ප. ම.

ජාති එකක්, දෙකක් තුනක්, හතරක්, පහක්, දහයක්, විස්සක්, තිහක්, හතළිහක්, පණහක්, සියයක්, දහසක්, ලක්ෂයක්, නොයෙක් සංවට්ට කල්පයන්හි, නොයෙක් විවට්ට කල්පයන්හි, ඒ දෙකෙහිම, අසවල් තැන වූයෙමි. මෙනම් ඇත්තෙක් මෙනම් ගොත්‍ර ඇත්තෙක්, මෙබඳු වර්ණ ඇත්තෙක්, මෙසේ ආහාර ඇත්තෙක්, මෙසේ සුව - දුක් විඳින්නෙක්, මෙබඳු ආයුෂ සීමාව ඇත්තෙක් වීමි. ඒ (මම) එතැනින් චුතව අසවල් තැන උපන්නෙමි. එහිදී අසවල් කෙනෙක් වූයෙමි. මෙනම් ඇත්තෙක් වීමි. -පෙර මෙනි- ඒ (මම) එතැනින් චුතව මෙහි උපන්නෙමි’’යි මෙසේ ආකාර සහිතවූ නම් ගොත් වශයෙන් උදෙසීම් සහිතවූ නොයෙක් ආකාර පෙර විසීම් සිහි කරයි.

එක් භවයෙක ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය තෙක් ඇත්තාවූ ජීවිත පැවැත්ම මෙහි ජාතියැයි කියනු ලැබේ. මේ අයුරින්

පෙසු ජාතිද සැලකිය යුතු. ඉක්බිති කල්ප විස්තරයද මෙහිලා දතයුතුය. එහෙත් ග්‍රන්ථ දීර්ඝතාවයෙන් වැලකීමට අවශ්‍ය හෙයින් නොදක්වමි. කැමැත්තෝ විශුද්ධිමාර්ගය, ධර්ම ප්‍රදීපිකා පටිසම්භිදාමග්ගට්ඨ කථාදී පොත් බලත්වා!

පූර්වේනිවාසය සිහි කරන්නෝ සය දෙනෙකි. තීර්ථකය, ප්‍රකෘති ශ්‍රාවකය, අසූමහා ශ්‍රාවකය, අග්‍ර ශ්‍රාවකය, ප්‍රත්‍යෙක බුද්ධය, සම්‍යක් සම්බුද්ධය, යනුයි. බුද්ධ ශාසනයෙන් අන්‍යවූ කම්වාදී, ක්‍රියාවාදී තීර්ථංකර තාපසයෝ උඩත් පිරිස් වශයෙන් කල්ප හතළිසක් සිහිකරත්. ඔව්හු සිහිකරනුවෝ ස්කන්ධ - පිළිවෙලිනි. එසේම විදර්ශනා ඥානයක් නොමැති ඔවුන්ගේ සිහි කිරීම ඉතා දුර්වලය. සැරයටියෙන් ගමන් කරන අන්ධයෝ මෙනි. ප්‍රකෘති ශ්‍රාවකයෝ කල්ප සියක් දහසක්ද, අසූමහා ශ්‍රාවකයෝ කල්ප ලක්‍ෂයක්ද. අග්‍ර ශ්‍රාවකයෝ එකා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක්ද, පසේ බුදුවරයෝ දෙයා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක්ද, සිහිකරන අතර, සම්‍යක් සම්බුද්ධ මහෝත්තමයෝ කෙළවරක් නැති ජාති සිහි කරත්. බුදුරජාණන් වහන්සේලා සිහිකරනුවෝ තමන් වහන්සේලා සිතුපරිද්දෙන්මය. කෝටි ගණන් ජාති අතහැර වුවද සිහිකරන හැක

පුබ්බෙනිවාසානුස්සති ඤාණය නිමි.

## 54. දිබ්බචක්ඛු ඤාණය

“ඔභාස වසෙන නානත්තෙකත්ත රූපනිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා, දිබ්බචක්ඛු ඤාණං” තේජෝ කසිණාදී කසිණ සමාපත්ති බලයෙන් පැතිරවූ ආලෝකය වශයෙන් නොයෙක් සත්වයන්ගේද, එක ස්වභාව සත්වයන්ගේද රූප සටහන් දැකීම අර්ථයෙහිවූ ප්‍රඥාව දිබ්බචක්ඛු ඤාණය නම්. මෙයට චුතූපපාත ඤාණය යනුද නමකි. එසේම යථාකම්මූපග ඤාණයට හා අනාගතාංස ඤාණයටද හරවනුයේ මෙම ඤාණය මැයි, “ඔභාස වසෙනාති දිබ්බෙන චක්ඛුනා රූප දස්සනත්ථං පසාරිතස්ස තේජෝ කසිණ ඔදාතකසිණ ආලෝක කසිණානං අඤ්ඤතරස්ස චතුත්ථජ්ඣානාරම්මණස්ස කසිණොභාසස්ස වසෙන” ඉහතින් දැක්වූ පාඨයෙහි ආලෝක වශයෙන් යැයි කීයේ දිව්‍යචක්ෂුසින් - දිවැසින් - රූප දැකීම සඳහා පැතිරවූ තේජෝ කසිණ - ඔදාත කසිණ - ආලෝක කසිණයන් අතුරෙන් එක්තරා කසිණයක් අනුව උපදවාගත් චතුර්ථ ධ්‍යානය අරමුණු කොට ඇති කසිණ ආලෝකය වශයෙන් යනුයි. එහෙයින් දිබ්බචක්ඛු

ඥාණය සඳහා පරිකම් වශයෙන් එම කසිණයක් ප්‍රගුණ කළ යුතුය. එසේ ලබාගත්තාවූ ආලෝකයෙන් චතුර්ථ ධ්‍යානය දිබ්බචක්ඛු ඥාණය වශයෙන් උපදවා, ඉක්බිති එම ඥාණය මෙහෙය වන සත්ව විශේෂයන් පිළිබඳ පොදු වශයෙන් බෙදීමකි, 'නානත්තකත්ත රූපනිමිත්තානං'' යි දක්වූයේ මෙහි ''නානත්ත රූපනිමිත්ත'' යනු නානත්තකායා ආදී වශයෙන් නව සත්වාවාස බෙදීමේදී දක්වූ පරිදි නොයෙක් අයුරු රූප සටහන් ඇති සත්වයන්ගේ නිමිතිය සටහනුයි. ''එකත්ත රූප නිමිත්ත' යනු එකත්තකායා ආදී වශයෙන් දක්වූ සත්වාවාසයන්හිවූ එක් අයුරු රූප සටහන්ය. දිබ්බචක්ඛු ඥාණයෙන් සියලු සත්වයන් එම දෙවැදෑරුම් ක්‍රමයට අනුව ඒ අභිඥලාභියා දකියි. මෙහි විස්තර කළ යුතු යමක් ඇත්නම් ඒ සියල්ල සුතමය ඥාණයෙහි හා සමාධි භාවනාමය ඥාණයෙහිදී විස්තර කරන ලදී. (සුතමය ඥාණයෙහි ''සත්තවිසුද්ධඤාණට්ඨිති'' හා සමාධි භාවනාමය ඥාණයෙහි ''දසකසිණ'' බලන්න)

ඉක්බිති දිබ්බචක්ඛු ඥාණය යනු කවරේදැයි දතයුතුය. 'දිබ්බචක්ඛු ඤාණන්ති දිබ්බසදිසත්තා දිබ්බං, දෙවානං හි සුචරිත කම්ම නිබ්බත්ත පිත්තසෙම්හ රුධිරාදීහි අපලිබුද්ධං උපක්කිලෙස විමුත්තතාය දූරෙපි ආරම්මණං සම්පටිච්ඡන සමත්ථං දිබ්බං පසාද චක්ඛුං හොති, ඉදඤ්චාපි විරිය භාවනා බල නිබ්බත්තං ඤාණචක්ඛුං තාදිසමෙවාති දිබ්බසදිසත්තා දිබ්බං, දිබ්බවිහාර වසෙන පටිලද්ධත්තා අත්තනා දිබ්බවිහාර සන්නිස්සිතත්තාපි දිබ්බං ආලොක පරිග්ගහෙනාපි මහාජුතිකත්තාපි දිබ්බං තිරොකුඩ්ඩාදිගත රූපදස්සනෙන මහාගතිකත්තාපි දිබ්බං තං සබ්බං සද්ද සත්ථානුසාරෙන වෙදිතබ්බං දස්සනට්ඨෙන චක්ඛු චක්ඛු කිච්ච කරණෙන චක්ඛුමිවාතිපි චක්ඛු දිබ්බංච තං චක්ඛුචාති දිබ්බචක්ඛු දිබ්බ චක්ඛු ච තං ඤාණඤ්චාති දිබ්බ චක්ඛු ඤාණං'' - ප. ම අ.

දිබ්බචක්ඛු ඥාණ'' යන මෙහි දෙවියන්ට සමානවූ බැවින් දිබ්බ නම්. දෙවියන්ට වනාහි සුචරිත කර්මයෙන් ඉපදුනාවූ පිත් සෙම් ලේ ආදියෙන් බාධා නොවූ කිපීම ආදී කෙලෙසුන් ගෙන් මිදුනු නිසා දුරවූද අරමුණු පිළිගැනීමට සමත් දිව්‍යවූ ප්‍රසාද චක්ෂුසක් - ඔපය ඇති ඇසක් - වෙයි. වීර්‍ය භාවනා බලයෙන් ඉපදුනාවූ මේ ඥානචක්ෂුස - දිවැස - ද එබදු වූයේ නුයි දිබ්බ නම්. දිව්‍යවූ විහරණ (ධ්‍යානසමාපත්ති) වශයෙන් ලබාගත් බැවින් තමාගේ දිව්‍ය විහරණය ආශ්‍රයවූ බැවින්ද දිබ්බ

නම්. කසිණාලෝක පරිග්‍රහය = නැවත නැවත මෙනෙහි කිරීම-නිසා මහත් ආලෝකය ඇති බැවින්ද, දිබ්බ නම්. බිත්ති ආදියෙන් වැසුණාවූ රූප පෙනෙන නිසා මහත්වූ සවභාවයක් ඇති හෙයින්ද දිබ්බ නම්. ඒ සියලු ශබ්ද ව්‍යාකරණ ශාස්ත්‍රයට අනුව දතයුතු. දැකීම් අර්ථයෙන් "චක්ඛු" නම්, ඇසෙන් කළ යුතු දෑ කිරීම වශයෙන් ඇස වැනිනුයි "චක්ඛු" නම්. දිබ්බ වූයේද චක්ඛු වූයේද එම නුයි දිබ්බ චක්ඛු නම්. දිබ්බචක්ඛු වූයේද ඤාණය වූයේද එමනුයි දිබ්බචක්ඛු ඤාණය නම්.

කරුණු මෙසේ හෙයින් දිබ්බචක්ඛු ඤාණය යනු අභිඥා බලයෙන් උපදවා ගත් ප්‍රකෘති මනුෂ්‍ය චක්ෂුස ඉක්මවා සිටි, සියලු සත්ත්වයන් දැකීමට සමත් නුවණ බව දතයුතුය.

## පරිකම් භාවනා විධිය

දිබ්බ චක්ඛු ඤාණය උපදවනු කැමතියහු විසින් පළමුකොට කසිණ භාවනාමන්ට අනුව තම සිත හැම අයුරින්ම පාදක ධ්‍යානය නම්වූ චතුර්ථ ධ්‍යානයට නැඹුරු කොට, ඉක්බිති තේජෝ-ඔදාත- ආලෝක කසිණත්‍රය අතුරෙන් එක් කසිණයකට ලං කළ යුතුය. එනම් උපචාර සමාධියට පත්කොට තැබිය යුතුය යනුයි. අර්පනා නූපදවිය යුතු. යම් අයුරකින් අර්පනා ඉපදුව හොත් එය පාදක ධ්‍යානයෙහිම ආනිශංස වෙයි. පරිකර්මයට උපකාර නොවෙයි. එහෙයින් උපචාරයට පමුණුවා තැබිය යුතුය. ඉහත කී කසිණ තුන අතුරෙන් මෙහිලා ආලෝක කසිණය ශ්‍රේෂ්ඨ බව සැලකිය යුතුය. එහෙයින් ආලෝක කසිණයට අනුව චතුර්ථ ධ්‍යානය උපවා, නැවත උපචාරයටද පත්ව එම් කසිණාලෝකය පැතිර විය යුතු. පැතිරවූ හැම තැනම රූප පෙනෙන්නට පටන් ගනී එවිට ඒ රූප කෙරෙහිම සිත යොදවා ආලෝකය නොපැතිර වූවහොත් ආලෝකය අතුරු දහන් වෙයි. එහෙයින් රූප ගැන නොබලා ආලෝකයම නැවත නැවත පැතිර විය යුතු (මේ පරිකම් භාවනාවයි.) මෙසේ පැතිරවූ පසු ආලෝකය ස්ථිර බවට පත්වූ විට "මෙපමණ තැන් ආලෝක වේවා"යි සිතා පරිකම් කරත්ම පිළිවෙලින් පරිකම්, උපචාර, අනුලෝම, ගොත්‍රභූ ජවන් සිත් ඉපිද, ඉක්බිති අර්පනා ජවනය වශයෙන් චතුර්ථ ධ්‍යානය උපදියි ඒ ධ්‍යාන සිත සමග යෙදුනු ප්‍රඥා චෛතසිකය දිබ්බ චක්ඛු ඤාණයයි.

සැලකිය යුතු:- පරිකම් කරද්දී ආලෝකය නැති වූවහොත් එසින් නොනැවතී නැවත නැවත පාදකජ්ඣානය ඉපදවිය යුතු එවිට ආලෝකය නැවත උපදී.

## දිව්‍ය ඥානචක්ෂුරහි ඥානයෙහි ක්‍රියා කාරීත්වය.

“සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉමෙ වත භොන්තො සත්තා කාය දුච්චරිතෙන සමන්නාගතා වචී දුච්චරිතෙන සමන්නාගතා මනො, දුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨි කම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා ඉමෙ වා පන භොන්තො සත්තා කාය සුචරිතෙන සමන්නාගතා වචී සුචරිතෙන සමන්නාගතා මනො සුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨි කම්ම සමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති” - ප. ම.

පෙර කී අයුරින් කසිණාලෝකය පතුරුවා, පරිකර්ම භාවනා කොට, චතුර්ථ ධ්‍යානය වශයෙන් උපදවා ගත් දිබ්බචක්ඛු ඥාණයක් ඇති ඒ අභිඥාලාභියා මිනිස් ඇස ඉක්මවා සිටි, පිරිසුදු, දිව ඇසින් මරණයට පත්වන්නාවූ උපදින්නාවූ පහත්-උස්-ලස්සන-විරූප-යහපත් ගති ඇති-අයහපත් ගති ඇති සත්වයන් දකියි. කළාවූ කර්මයනට අනුව එළඹ සිටි සත්වයන් දකියි. (ඒ කෙසේද?) පින්වතුනි, මේ සත්වයෝ කාය-වාග්-මනඃ දුශ්චරිතයෙන් සමන්විතයහ. ආර්‍යයන්ට නින්දා කරන්නෝය. මිථ්‍යාදෘෂ්ටිකයහ. මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවාහුය. ඔව්හු කය බිඳී මරණින් පසු දුර්ගති, විවස ව වැටෙන, සැපයෙන් පහවූ (නිරය) අපායෙහි උපන්නාහුය. මේ සත්වයෝ කාය-වාග්-මනඃ සුචරිතයෙන් සමන්විතයහ. ආර්‍යයන්ට නින්දා නොකරත්. සම්‍යක් දෘෂ්ටිකයහ. සම්‍යක් දෘෂ්ටික කර්ම සමාදන් වූවාහුය. ඔව්හු කය බිඳී මරණින් පසු සුගති නම්වූ දෙව්ලොව උපන්නාහුයි කියායි. මෙසේ මිනිස් ඇස ඉක්මවා සිටි -පෙරමෙනි- සත්වයන් දකියි

### මෙහි පැහැදිලි කරගත යුතු පද:-

“චවමානෙ උපපජ්ජමානෙ” යන මෙහි දිබ්බචක්ඛු ඥාණයෙන් චුතික්ෂණයෙහි-මැරෙන මොහොතෙහි-හෝ උප්පත්ති ක්ෂණයෙහි හෝ සත්වයන් නොදකියි. දැකීමට හැක්කේ චුති අවස්ථාව

හෝ උපපත්ති අවස්ථාවට හෝ පැමිණ සිටින සත්ත්වයන්ය. "යෙ පන ආසන්නචුතිකා ඉදානි චවිස්සන්ති තෙ චවමානා" ආදි වශයෙන් එය අටුවාවෙහි පැහැදිලි කර ඇත.

"යථා කම්මූපගෙ සත්තෙ පජානාති" යන්නෙන් දක්වූයේ යථාකම්මූපග ඤාණයෙන් සත්ත්වයන්ගේ කුශලාකුශල කර්මයන් දැනගැනීමයි. මෙය දිබ්බචක්ඛු ඤාණයෙන්ම සිදු නොවෙයි. දිබ්බචක්ඛු ඤාණයෙහි පිහිටා ආලෝකය නැවතත් වඩා "මේ සත්ත්වයෝ කිනම් කර්මයක් කොට නිරයෙහි උපන්නාහුද?" යනාදි වශයෙන් මෙනෙහි කිරීමෙන් ඒ කර්ම අවබෝධ වීම් වශයෙන් ඒ කර්මම ආරම්මණය කොට යථාකම්මූපග ඤාණය ඉපදවිය යුතුය. එසේ උපදවා ගත් පසු සුගති, දුගීති, දෙකෙහිම වෙසෙන සත්ත්වයන්ගේ කර්මානුභවය බලත හැක.

"කාය දුච්චරිතෙන - පෙ -" යනාදී වශයෙන් දක්වූයේ සතුන් මැරීම් ආදී ත්‍රිවිධ කාය දුශ්චරිත, බොරුකීම ආදී චතුර්විධ වාග් දුශ්චරිත, විෂම ලෝභාද ත්‍රිවිධ මනෝ දුශ්චරිත, යන ත්‍රිවිධ දුශ්චරිතයෝයි. මේ දස වැදෑරුම් පාප ක්‍රියාවන්ගෙන් වෙන් වූ දස වැදෑරුම් කුශල කර්ම හා දානාදී සියලු පුණ්‍ය කර්ම කායසුචරිතෙන - පෙ -" යනාදී න්‍යායට ඇතුළත් වෙයි.

"අරියානං උපවාදකා" මෙයින් ආර්යෝපවාදය දක්විණි. "අරියානං උපවාදකාති බුද්ධ පච්චෙකබුද්ධ සාවකානං අරියානං අන්තමසො ගිහි සොතාපන්නානම්පි අනත්ථකාමා හුත්වා අන්තිම වත්ථුනා වා ගුණ පරිධංසනෙන වා උපවාදකා අක්කොසකා ගරහකාති වුත්තං හොති" ආර්යයන්ට නින්දා කරන් හෝ යනු බුදු - පසේ බුදු සව් වූ ආර්යයනට යටත් පිරිසෙයින් ගිහි සෝවාන් වූවනට ද අවැඩ කැමැත්තෝව ගුණයෙන් පිරිහෙළීම සඳහා බලපාන අන්තිම කරුණෙන් (පාරාජිකාවෙන්) හෝ ගුණ පිරිහෙළීමෙන් හෝ නින්දා, ආක්‍රොශ, ගර්හා, කරන්නෝයයි කියන ලද්දේ වෙයි. මෙහි අන්තිම වස්තුවෙන් නින්දා කිරීම නම් "මොවුන්ට ශ්‍රමණ ධර්මයක් නැත. ආශ්‍රමණයෝය" යනාදී වශයෙන් කීමයි. භික්ෂුවක් සඳහා මේ අයුරින් කීමේ නම් ඒ භික්ෂු පාරාජිකා වූවෙකුසේ හැඟෙන හෙයින් එසේ නින්දා කිරීම අන්තිම වස්තුවෙන නින්දා කිරීම නමි. "මොවුන් කෙරෙහි ධ්‍යානයක් හෝ මාර්ගයක් හෝ ඵලයක් හෝ නැතැ"යි නින්දා කෙරේ නම්

එය ගුණ පිරිහෙලීම් වශයෙන් කිමකි. මෙසේ නින්දා කිරීමෙන් ආර්යෝපවාදය සිදුවෙයි. ආර්යෝපවාදය දරුණු පාපකර්මයකි ආනන්තරිය කර්ම හා සමානය ඒ නිසාම ස්වර්ග, මාර්ග, දෙකම අවහිර කරන්නකි. එහෙත් "සතෙකිච්ඡං" පිළියම් කිරීමට පුළුවන. පිළියම් කිරීමේ පිළිවෙල මෙසේය. යම් ආර්යයෙකුට නින්දා කළේ නම් උන්වහන්සේ වෙත ගොස් තමා කළ වරදට සමාව ඉල්ලා ගතයුතු. තමාට වඩා වැඩි මහළු නම් දෙපා වැඳ ද; බාල නම් ඇඳිලි බැඳ ගෙන ද, සමාව යැදිය යුතු හමු නොවූයේ නම් ඒ ගිය දිසාව දෙසට හෝ හැරී සමාව යැදිය යුතු. කෙනෙකු හෝ පිටත්කර යැවිය යුතු. යටත් පිරිසෙයින් ඒ ආර්යයාගේ සිරුර දැවූ අළු තැන්පත් කළ ස්තූපය වෙත ගොස් හෝ සමාව ලබා ගත යුතුය. මෙසේ කළ කල්හි ස්වර්ග, මාර්ග, ආවරණය නොවෙයි. එසේ නොකළ හොත් මරණින් පසු අපාගාමී වෙයි මිච්ඡා දිට්ඨි, සම්මා දිට්ඨි, පද දෙක සුතමය ඥාණයෙහි විස්තර විණි.

මේ අයුරින් විස්තර කළ, කසිණාලෝක බලයෙන් නොයෙක් අයුරු වූ ද එක් අයුරු වූ ද රූප සටහන් දැකීම සඳහා බැහැ ගැනී මෙහි නුවණ දිබ්බචක්ඛු ඥාණය නමි. මෙතෙකින් බුද්ධ ශාසනයෙන් බැහැර වූ කම්මවාදී ක්‍රියාවාදී සාමිත්ව පවා විෂය වූ පඤ්චාභිඥා පිළිබඳ විස්තරය අවසානයි. ඒ පඤ්චාභිඥාවෝ මෙසේ සංග්‍රහ වෙත්,

"ඉද්ධිවිධං දිබ්බසොතං - පරචිත්තවිජානනං
පුබ්බෙනිවාසානුස්සති - දිබ්බචක්ඛූති පඤ්චධා,"

සෘද්ධිවිධ ඥානය, දිව්‍යශ්‍රොත ඥානය, චේතොපරිය ඥානය, පූර්වේනිවාසානුස්මෘති ඥානය, දිව්‍යචක්ෂුරභි ඥානය, යනුවෙන් පස්වැදෑරුම් ය. මේ ඥානයෝ හැම අයුරින්ම එළඹ සිටියෝ ශාන්ති නායක බුදුරජාණන්වහන්සේ වෙතයැ. එහෙයින් බුදු පියාණෝ ඥානයන්ගෙන් අගනැත්පත්යහ.

## 55. ආසවක්ඛය ඤාණය.

චතුසච්චිකයා ආකාරෙහි තිණ්ණං ඉන්ද්‍රියානං වසී භාවතා පඤ්ඤා, ආසවක්ඛයෙ ඤාණං." සූසැට අයුරින් ඉඳුරන් තුන් දෙනාගේ වසඟ කිරීම පිළිබඳ වූ නුවණ ආසවක්ඛය ඥාණයයි. මෙහි ඉඳුරන් තුන් දෙනා නම් සුතමය ඥාණයෙහි; 'අභිඤ්ඤෙය්‍ය" නිර්දේශයේ දැක්වූ දෙවිසි ඉඳුරන් අතුරෙන් ලෝකෝත්තර

මාර්ග - ඵල අවස්ථාවන්හිදී ප්‍රධාන වන්නාවූ ලෝකෝත්තර වූ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය, යනුයි. මේ ඉඳුරන් තුන් දෙනා මාර්ග - ඵල අවස්ථා අටෙහිදී ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්ම අටක් ඉදිරිපත් වීමෙන් වශග වෙයි. වශීභාවයට පත්වෙයි. (8 × 8=64) එසේ වශංකර ගැනීම නිසා කාමාදී ආශ්‍රව ධර්මයන් සම්පූර්ණයෙන් ක්ෂය වන හෙයින් ඒ පිළිබඳ යෙදුනු නුවණ ආසවක්ඛය ඤාණයැයි යෙදිණ.

## ආශ්‍රව ධර්ම

"කතමෙ ධම්මා ආසවා? චත්තාරො ආසවා කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො; තත්ථ කතමො කාමාසවො? යො කාමෙසු කාමච්ඡන්දො, කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං අයං වුච්චති කාමාසවො. තත්ථ කතමො භවාසවො? යො භවෙසු භවච්ඡන්දො, භවරාගො භවනන්දි භවතණ්හා භවසිනෙහො භවපරිළාහො භවමුච්ඡා භවජ්ඣොසානං, අයං වුච්චති භවාසවො. තත්ථ කතමො දිට්ඨාසවො? සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා යා එවරූපා දිට්ඨි, දිට්ඨිගතං, දිට්ඨිගහනං, දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං, දිට්ඨිවිප්ඵන්දිතං, දිට්ඨිසංයොජනං, ගාහො, පතිට්ඨාහො, අභිනිවෙසො, පරාමාසො කුම්මග්ගො, මිච්ඡාපථො, මිච්ඡත්තං, තිත්ථායතනං, විපරියෙසග්ගාහො, අයං වුච්චති දිට්ඨාසවො, සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨාසවො.

තත්ථ කතමො අවිජ්ජාසවො? දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං යං එවරූපං අඤ්ඤාණං අදස්සනං -පෙ- අකුසලමූලං ඉදං වුච්චති අවිජ්ජාසවො. ඉමෙ ධම්මා ආසවා.

ආශ්‍රව ධර්මයෝ නම් කවරහුද? ආශ්‍රවයෝ සතර දෙනෙකි. කාමාශ්‍රව, භවාශ්‍රව, දෘෂ්ටාශ්‍රව, අවිද්‍යාශ්‍රව, යනුයි, එහි කාමාශ්‍රව යනු කවරේද? රූපාදී පඤ්චකාමයන් කෙරෙහි යම් කැමැත්තක් - මේ පදයන්හි තේරුම ධම්මසඞ්ගණී ඥාණයෙහි දක්විණි - මේ කාමාශ්‍රව යැයි කියනු ලැබේ. එහි භවාශ්‍රව යනු කවරේද? භවයන් කෙරෙහි යම් කැමැත්තක් - පෙර මෙනි - මේ භවාශ්‍රව යැයි කියනු ලැබේ. එහි දිට්ඨාසව යනු කවරේද? පඤ්චස්කන්ධ ලෝකය ශාස්වත යැයි - නිත්‍ය, සදාකාලික වශයෙන් ගැනීම - කියා හෝ අශාස්වත - උච්ඡේද - යැයි කියා හෝ සුළුකීසුණු එළියක් - පරිත්ත කසිණාලෝකයක් - පතුරුවා වසන්නාවූ අභිඥලාභියා "ලෝකය එපමණයැ"යි සැලකීම් වශයෙන් ලෝකය කෙළවර ඇතැයි කියා හෝ කෙළවරක් නැතිව කසිණාලෝකය පැතිරවීම් වශයෙන් ගෙන ලෝකය කෙළවරක් නැතැයි කියා හෝ බිඳී යන්නාවූ සිරුරම ජීවයැයි ගැනීම නිසා සිරුර බිඳෙන්ම- මැරෙන්ම- ජීවයත් විනාශ වන්නේ යයි ගැනීම් වශයෙන් හෝ සත්වයා මරණින් පසු වෙයි කියා හෝ නොවෙයි කියා හෝ වෙන්නටත් පුළුවන, නො වෙන්නටත් පුළුවන කියා හෝ මෙබඳු යම් වැරදි දැකීමක් වැරදි දැකීමට බැස ගැනීමක් - ධම්මසඞ්ගණී ඥාණයෙහි තේරුම ඇත - මෙය දිට්ඨාසව යැයි කියනු ලැබේ. අවිජ්ජාසවය ධම්මසඞ්ගණී ඥාණයෙහි දක්විණි. මේ ධර්මයෝ ආශ්‍රවයෝයි.

මෙහි දැක්වූ කාමාශ්‍රවය නම් රූපාදී පඤ්චකාමයන් කෙරෙහි පවත්නා රාගයයි. රූපාරූප භවයන්හි ඡන්දරාගය ධ්‍යාන නිකාන්තිය නම් වූ සියුම් තෘෂ්ණාව, ශාස්වත දෘෂ්ටිය සමග යෙදුනු රාගය, භව වශයෙන් ප්‍රාර්ථනය භවාශ්‍රවයයි. දෙසැටක් මිථ්‍යා දෘෂ්ටිය දෘෂ්ටාශ්‍රවයයි. අට තැනෙක්හි නොදැනීම අවිද්‍යාශ්‍රවයයි.

## ආශ්‍රව යනු කවරේද?

"ආසවන්තීති ආසවා. චක්ඛුතොපි -පෙ- මනතොපි සවන්ති පවත්තන්තීති ආසවා" ගලා ගෙන යේ නුයි ආශ්‍රව නම් එනම් ඇසින්, කණින්, නැහැයෙන්, දිවෙන්, කයින්, සිතින්, ද ගලා ගෙන යේ, පවතින්නුයි ආශ්‍රව නම්. චක්ෂුරාදී ඉන්ද්‍රියන් ගෙන් රූපාදී ෂඩාරම්මණයන් ගැනීමේදී මනින්ද්‍රියේ ක්‍රියාකාරීත්වය නිසා ඒ ආරම්මණයන් කරා කාමාදී ආශ්‍රවයෝ ගමන් කරත්. එහෙයින් ඒ චක්ෂුරාදී ඉන්ද්‍රියන් ගෙන් ගලා ගෙන යේ යැයි දක්විණ.

"ධම්මතො යාව ගොත්‍රභු ඔකාසතො යාව භවග්ගං සවන්තීති වා ආසවා" නැතහොත් ධර්ම වශයෙන් ගොත්‍රභූ සිත දක්වා ද, අවකාශ වශයෙන් (ලෝක වශයෙන්) භවාග්‍රය - නෙවසඤ්ඤානාසඤ්ඤායතනය - තෙක් ද ගලාගෙන යේ නුයි ආශ්‍රව නම්. "ආසවන්ති" යන මෙහි "ආ" කාරය සියලු දෑ ඇතුලත් කිරීම සඳහා යෙදුනකි. කාමාදී ආශ්‍රවයෝ ලෝකෝත්තර මාර්ග චිත්ත වීථියෙහි ඇති ගොත්‍රභූ ජවනය දක්වා ම දිවෙත්. එසේ ම භවාග්‍රය තෙක් ද ලෝක වශයෙන් දිවෙත්. මේ දක්වූ සීමාවන් තුළ වෙසෙන්නාවූ සත්වයන් කෙරෙහි ආශ්‍රව ධර්ම පවතී යන තේරුම දක්වූ අයුරැයි මේ.

නවද තේරුමකි: 'ආසව' යනුවෙන් ධාන්‍යාදිය පල්කොට පෙරා ගත් මත්පැන් වලට කියනු ලැබේ. කාමාදී ආශ්‍රවයෝ ද සත්‍වයන්ගේ සිත් තුල බොහෝ කාලයක පටන් පල් වෙන හෙයින් ඒ ආශ්‍රව වැනිනුයි ආසව නම් වෙත්. "චිරපරිවාසිකට්ඨෙන මදිරාදයො ආසවා වියාතිපි ආසවා" යනු විග්‍රහයයි.

"ආයතං වා සංසාර දුක්ඛං සවන්ති පසවන්තීතිපි ආසවා" දීර්ඝ වූ සසර දුක ලබාදෙත්නුයි හෝ ආසව නම් යනුද නවත් තේරුමකි. මේ ආදී වශයෙන් පවත්නාවූ කෙලෙස් සමූහය ආශ්‍රව නම්.

ආශ්‍රව නමින් පවත්නාවූ කෙලෙස් සමූහය ගෙවා දැමීමෙහි - ක්ෂය කිරීමෙහි - නුවණ ආසවක්ඛය ඤාණයයි.

## ආශ්‍රවයන් ප්‍රහාණය කළයුතු පිළිවෙල.

"ජානතො අහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි, නො අජානතො නො අපස්සතො. කිඤ්ච භික්ඛවෙ ජානතො කිඤ්ච පස්සතො ආසවානං ඛයො හොති? යොනිසොව මනස්කාරං අයොනිසො ච මනසිකාරං. අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව ආසවා උප්පජ්ජන්ති, උප්පන්නා ච ආසවා පවඩ්ඪන්ති. යොනිසො ච භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව ආසවා න උප්පජ්ජන්ති, උප්පන්නා ච ආසවා පහීයන්ති. අත්ථි භික්ඛවෙ ආසවා දස්සනෙන පහාතබ්බා අත්ථි ආසවා සංවරා පහාතබ්බා අත්ථි ආසවා පටිසෙවනා පහාතබ්බා අත්ථි ආසවා අධිවාසනා පහාතබ්බා, අත්ථි ආසවා පරිවජ්ජනා පහාතබ්බා අත්ථි ආසවා විනොදනා පහාතබ්බා ආසවා භාවනා පහාතබ්බා." ම. නි. (සබ්බාසව සූ)

මහණෙනි, දන්නා වූ ද, දක්නා වූ ද, තැනැත්තන් සඳහා ආශ්‍රවයන් ගේ ක්‍ෂය කිරීම මම කියමි. නො දන්නා වූ ද, නො දක්නා වූ ද, තැනැත්තන් සඳහා නොවේය. මහණෙනි, කුමක් දන්නාවූ කුමක් දක්නාවූ තැනැත්තන්ගේ ආශ්‍රවයන්ගේ ක්‍ෂය කිරීම වෙයි ද? මහණෙනි, නුනුවණින් මෙනෙහි කරන්නා හට නූපන්නාවූ ආශ්‍රවයෝ උපදිත්. උපන්නා වූ ද ආශ්‍රවයෝ වැඩෙත්. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාට නූපන්නාවූ ආශ්‍රවයෝ නූපදිත්. උපන්නාවූ ආශ්‍රවයෝ ප්‍රහීණ වෙත්. මහණෙනි, දැකීමෙන් ප්‍රහාණය කළයුතු ආශ්‍රව ඇත සංවර වීමෙන් ප්‍රහාණය කළයුතු ආශ්‍රව ඇත. ප්‍රතිසේවනයෙන් ප්‍රහාණය කළයුතු ආශ්‍රව ඇත. අධිවාසනයෙන් ප්‍රහාණය කළයුතු ආශ්‍රව ඇත. පරිවර්ජනයෙන් ප්‍රහාණය කළයුතු ආශ්‍රව ඇත. විනොදනයෙන් ප්‍රහාණය කළයුතු ආශ්‍රව ඇත, වැඩීමෙන් ප්‍රහාණය කළයුතු ආශ්‍රව ඇත.

ආශ්‍රවයන් ප්‍රහාණය කළයුතු පිළිවෙලෙහි ප්‍රධාන අඞ්ගය යොනිසොමනසිකාරයයි. නිවණින් මෙනෙහි කිරීමයි. සිහි නුවණ දෙක ඇතියහුටම හැර අන් කෙනෙකුට නොහැකි බව මේ සූත්‍රයෙන් පැහැදිලි වෙයි. එසේ සිහි-නුවණ යොදවා ආශ්‍රවයන් ප්‍රහාණය කළයුතු පිළිවෙල ඉක්බිති දක්වෙයි. එහි ක්‍රම සතෙකි.

1. **දැකීමෙන් ආශ්‍රව ප්‍රහාණය:** නිවන් සඳහා පවත්නා නෛර්‍ය්‍යානික – ධර්‍ම නො දන්නා වූ පුද්ගලයා මෙනෙහි කළයුතු, මෙනෙහි නො කළයුතු දෑ නො දැනීම නිසා මෙනෙහි කළයුතු දෑ මෙනෙහි නො කරයි. මෙනෙහි නොකළයුතු දෑ මෙනෙහි කරයි. එහෙයින් ඔහුට ආශ්‍රවයෝ උපදිත්. ඒ මෙනෙහි නොකළයුතු දෑ නම් කඞ්ඛාවිතරණ විසුද්ධියෙහි දක්වූ සොළොස් වැදෑරුම් සැක කරුණු හා තමා කෙරෙහි ආත්මයක් ඇත, එය නිත්‍යයැයි ගන්නාවූ ආත්මදෘෂ්ටියයි. නිවන් සඳහා පවත්නා ධර්‍ම දන්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකයා මෙනෙහි නොකළයුතු දෑ මෙනෙහි නො කරයි. මෙනෙහි කළයුතු දෑ මෙනෙහි කරයි. එහෙයින් ඔහුට ආශ්‍රවයෝ නූපදිත්. මෙහි මෙනෙහි කළයුතු දෑ නම් දුක්ඛාදි ආර්‍ය්‍ය සත්‍ය ධර්‍මයි. මෙසේ මෙනෙහි කරන්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ සක්කාය දිට්ඨි, සීලබ්බතපරාමාස, විචිකිච්ඡා, යන සංයොජන ධර්‍ම ප්‍රහීණ වෙයි. වැරදි ලෙස දැකීමෙන් හා මෙනෙහි කිරීමෙන් ඇතිවූ ආත්ම දෘෂ්ටිය, විචිකිච්ඡා, ආර්‍ය්‍යසත්‍යය දැකීමෙන් හා මෙනෙහි කිරීමෙන් විනාශ වන නිසා මොවුහු දැකීමෙන් ප්‍රහාණය කළයුතු ආශ්‍රවයෝ වෙත්.

2. සංවරයෙන් ආශ්‍රව ප්‍රහාණය: නුවණින් යුතුව චක්ෂුරාදී ඉන්ද්‍රියන් සංවර කිරීමෙහි යෙදීම නිසා අසංවරයෙන් පැමිණෙන්නා වූ කාමාදී ආශ්‍රව ප්‍රහාණය වෙයි. එහෙයින් ඒ අයුරින් ප්‍රහාණය කළයුතු ආශ්‍රවයෝ සංවරයෙන් ප්‍රහාණය කළ යුත්තෝ නම් වෙත්.

3. ප්‍රතිසෙවනයෙන් ආශ්‍රව ප්‍රහාණය: සීලමය ඥාණයෙහි දැක්වූ ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලයෙහි එන පරිද්දෙන් නුවණින් විමසා බලා, සිවුරු ආදී සිවුපසය පරිභෝග කිරීම නිසා නුනුවණින් පරිභෝග කිරීමෙන් හටගන්නාවූ ආශ්‍රවයෝ ප්‍රහාණය වෙත්.

4 ඉවසීමෙන් ආශ්‍රව ප්‍රහාණය: ශරීරයට පැමිණෙන්නාවූ ශීත, උෂ්ණ, කුසගිනි, පිපාසා, මැසි මදුරු ආදීන්ගෙන් වන පීඩා, නපුරු මිනිසුන් කියන වචන, ශරීරයෙහි උපන් දුක් වේදනා ආදිය ඉවසීම නිසා, ඉහතකී දෑ නොඉවසීමෙන් හට ගන්නාවූ ආශ්‍රවයෝ ප්‍රහාණය වෙත්.

5 භාත්පසින්ම දුරුකිරීමෙන් ආශ්‍රව ප්‍රහාණය: නපුරු ඇත් - අස් - ගව - සුනඛාදී සතුන්ද කණු කටු සහිත මාර්ග වලවල් ප්‍රපාත දුගඳ දිය වලවල් ද, පාප මිත්‍රයන් ද, යන මේකී දෑ නුවණින් සලකා භාත්පසින්ම දුරුකිරිම නිසා, ඒවා ඇසුරු කිරීමෙන් උපදින ආශ්‍රවයෝ ප්‍රහාණය වෙත්.

6 නොඉවසීම් වශයෙන් දුරුකිරීමෙන් ආශ්‍රව ප්‍රහාණය: තම සිත තුළ උපන්නාවූ කාම ව්‍යාපාද-විහිංස විතර්කයන් නුවණින් සලකා, නොඉවසා දුරුකිරීම නිසා දුරු නොකිරීමෙන් උපදින ආශ්‍රවයෝ ප්‍රහාණය වෙත්.

7 භාවනා කිරීමෙන් - වැඩීමෙන් ආශ්‍රව ප්‍රහාණය: සුතමය ඥාණයෙහි භාවිතව්‍ය නිර්දේශයේ දැක්වූ සත්වැදෑරුම් බොජ්ඣංග, ධර්ම නුවණින් යුතුව සිත තුළ දියුණු කිරීම නිසා' ඒවා නොවැඩීමෙන් උපන් ආශ්‍රවයෝ ප්‍රහාණය වෙත්.

මෙසේ ආශ්‍රව ධර්ම ප්‍රහාණ විධි සප්තකයක් සබ්බාසව සූත්‍රයෙහි සඳහන්වෙයි. මෙ විස්තරය එහි සාරාංශයකි.

## ත්‍රිවිධ ඉන්ද්‍රියන්ගේ අවස්ථා භෙද:

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය සෝවාන් මාර්ග අවස්ථාව භජනය කරන්නකි. අඤ්ඤින්ද්‍රිය සෝවාන්ඵල. සකෘදාගාමි මාර්ග - ඵල අනාගාමි මාර්ග - ඵල අර්හත් මාර්ග, යන අවස්ථා හයක් භජනය කරයි. අඤ්ඤාතාවින්ද්‍රිය අර්හත් ඵල අවස්ථාව භජනය කරන්නකි. මෙසේ මේ ඉන්ද්‍රියන්ගේ අවස්ථා භෙද අටකි,

## ත්‍රිවිධ ඉන්ද්‍රියන්ගේ හැටහතරාකාර විධිය

"සෝතාපත්ති මාර්ගක්ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියට සද්ධින්ද්‍රිය නිසැක ඇදහීම් වශයෙන් පිරිවර වෙයි. විරියින්ද්‍රිය සිත එසවීම් වශයෙන් පිරිවරවෙයි සතින්ද්‍රිය එළඹ සිටීම් වශයෙන් පිරිවරවෙයි. සමාධින්ද්‍රිය නොවිසිරයාම් වශයෙන් පිරිවර වෙයි පඤ්ඤින්ද්‍රිය දැකීම් වශයෙන් පිරිවර වෙයි. මනින්ද්‍රිය දැනීම් වශයෙන් පිරිවරවෙයි සොමනස්සින්ද්‍රිය පිනාවීම් වශයෙන් පිරිවර වෙයි. ජීවිතින්ද්‍රිය වර්තමාන සන්තතියට සන්තති පච්චුප්පන්න-අධිපතිවීම් වශයෙන් පිරිවර වෙයි. සෝතාපත්ති මාර්ගක්ෂණයෙහි හටගත් විඥප්තිරූප හැර සියලු ධර්මයෝ කුශල ධර්මයෝ වෙත්. සියලු ධර්මයෝ ආශ්‍රව රහිතයෝ වෙත්. සියලු ධර්මයෝම වෘත්තයෙන් එතෙර කරන්නාහු වෙත්. සියලු ධර්මයෝම නිවණට පමුණුවන්නාහු වෙත් සියලු ධර්මයෝම ලෝකෝත්තර වෙත්. සියලු ධර්මයෝම නිවන් අරමුණු කොට ඇත්තාහු වෙත්. සෝතාපත්ති මාර්ගක්ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියට මේ ධර්මයෝ අටදෙන එක්ව පහලවන පිරිවරවෙත්. ඔවුනොවුන්ට පිරිවරවෙත් නිඃශ්‍රය වශයෙන් පිරිවර වෙත්. සම්ප්‍රයුක්ත වශයෙන් පිරිවරවෙත්. සහගව වශයෙන් පිරිවර වෙත්. එක්ව උපදිත්. මිශ්‍රවෙත්. එකට යෙදෙත්. ඒ ඉන්ද්‍රිය ධර්මයෝම ඒ අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියාගේ සොවස් ද වෙත් පිරිවරද වෙත්" ප. ම. (සිං. ප.)

මෙසේ සෝවාන් මාර්ග අවස්ථාවේදී යෙදෙන අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියට සද්ධා-සති විරිය සමාධි - පඤ්ඤා මන - සොමනස්ස ජීවිත, යන ඉන්ද්‍රියයෝ අටදෙන පිරිවරවෙත්. අර්හත් ඵලය හැර සෙසු මාර්ගඵල අවස්ථා හයක්හි යෙදෙන අඤ්ඤින්ද්‍රියට ඒ අවස්ථා සය නිසා සතලිස් අටාකාරයකින් ඒ ඉන්ද්‍රියන් අටදෙනා පිරිවර වෙත් අර්හත් ඵල අවස්ථාවේදී යෙදෙන අඤ්ඤාතාවින්ද්‍රියට ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් අටදෙනා පිරිවර වෙත්. එවිට ඒ සියලු ආකාර සූසැටකි. (64)

තවද සෝවාන්ආදී මාර්ග අවස්ථාවන්හිවූ චිත්තජ රූප හැර සියලු ධම්මයෝ කුශලයෝ වෙත්. ඵල අවස්ථාහිත්හි වූ සියලු ධර්මයෝ අව්‍යාකෘතයෝ වෙත්. ඒ හැම ධර්මයක්ම ආශ්‍රව රහිතය. ආදී වශයෙන් ඉහත කී පාඨයේ අවසාන පද වලින් දක්වූයේ ඒ ධර්මයන්ගේ ගුණ සමූහයයි. ඉක්බිති තිඉන්ද්‍රිය ධර්ම මිශ්‍රවන අයුරු කියැවිණ.

ආශ්‍රවයන් ක්‍ෂය වන අයුරු;- සෝවාන් මාර්ගයෙන් ඉතිරි නොවූ දිට්ඨාසවයද, අපායෙහි හෙලන කාමාසවය ද, එම භව අවිජ්ජා ආසවද, ක්‍ෂයවෙයි. සකෘදාගාමී මාර්ගයෙන් ඖදාරික ගොරෝසු කාමාසව හා ඒ සමග යෙදුනු භවාසවාදීහු ක්‍ෂය වෙත්. අනාගාමි මාර්ගයෙන් ඉතිරි නොවූ ඒ කාමාසවාදීහු ක්‍ෂය වෙත්. අර්හත් මාර්ගයෙන් ඉතිරි නොවූ සියලු කාමාසවාදීහු සම්පූර්ණයෙන් ක්‍ෂයවෙති. මෙහෙයින් සූසැට ආකාරයකින් ත්‍රිවිධ ඉන්ද්‍රියන්ගේ පුරුදු කිරීම් වශයෙන් පවත්නා ප්‍රඥාම ආසවක්ඛය ඤාණයයි කියනු ලැබේ.

ආසවක්ඛය ඤාණය නිමි

## 25 වැනි පරිච්ඡේදය

# 56, 57, 58, 59, 60, 61, 62, 63 යන අංකයන්ට ඇතුළත්වූ චතුසච්චඤාණද්වය හෙවත් දුක්ඛාදි අෂ්ටඤාණයෝ

දුක්ඛ ඤාණය, සමුදය ඤාණය, නිරොධ ඤාණය, මග්ග ඤාණය, යන ඤාණ සතර. ඒවාහි ඇති සොළොස් වැදෑරුම් නොවෙනස් වන තේරුම් ඇතුළත් කොට දේශනා කළ චතුරාර්ය්‍ය සත්‍යයන්වශයෙන් ද, දුක්ඛ ඤාණය, දුක්ඛ සමුදය ඤාණය, දුක්ඛ නිරොධ ඤාණය, දුක්ඛ නිරොධගාමිනී පටිපදා ඤාණය, යනුවෙන් දක්වෙන ඤාණ සතර ප්‍රත්‍යක්ෂ කිරීම අවස්ථාවේදී ඉදිරිපත් වන චතුරාර්ය්‍ය සත්‍යයන් පිළිබඳ වූ ප්‍රඥාව වශයෙන් දැයි මෙකී ක්‍රම දෙකට අනුව බෙදී ඇති බැවින් ඤාණ අටක් විය. ඒවා ම චතුරාර්ය්‍ය සත්‍ය ඥානද්වය නම්. මෙම ඥාන අට, පැහැදිලි කිරීම සඳහා ආරම්භ කරනුයේ චතුරාර්ය්‍ය සත්‍ය දේශනා මාර්ගයෙනි.

**චතුරාර්ය්‍ය සත්‍යයෝ:**

"චත්තාරි අරිය සච්චානි, දුක්ඛං අරිය සච්චං, දුක්ඛ සමුදයං අරිය සච්චං, දුක්ඛ නිරොධං අරිය සච්චං, දුක්ඛ නිරොධ ගාමිනි පටිපදා අරිය සච්චං." — වි. ප.

ආර්ය්‍ය සත්‍ය සතරෙකි. දුඃඛාර්ය්‍ය සත්‍යය, දුඃඛ සමුදයාර්ය්‍ය සත්‍යය, දුඃඛනිරොධාර්ය්‍ය සත්‍යය, දුඃඛ නිරොධගාමිනී ප්‍රතිපදාර්ය්‍ය සත්‍යය යනුයි. මෙහි "අරිය" යනු බුද්ධාදි උතුමන් සඳහා යෙදුනු නාමයෙකි. "සච්ච" නම් නොවෙනස් වන ඇත්තයි. මේ පද එක්වීමෙන් අරිය සච්ච විය. අදහස: බුද්ධාදි උතුමන් විසින් අවබෝධ කරගනු ලබන සත්‍යය යනුයි. "යස්මා පනෙතානි බුද්ධාදයො අරියා පටිවිජ්ඣන්ති තස්මා අරිය සච්චානීති වුච්චන්ති" යම් හෙයකින් මේවා බුද්ධාදී ආර්ය්‍යයෝ අවබෝධ කරද්ද, එහෙයින් ආර්ය්‍ය සත්‍යයැයි කියනු ලැබේ. යනු අටුවායි. (වි. ප. අ.) තවද තේරුමකි. බුදුරජාණන් වහන්සේ දෙව්යන්

මාරයන් - බ්‍රහ්මයන් - ශ්‍රමණයන් - බ්‍රාහ්මණයන් සහිත වූ ලෝකයේ ශ්‍රේෂ්ඨ වූ හෙයින් "ආර්ය" නම්. උත්තමයන්ගේ සත්‍යයවූ හෙයිනුයි අරිය සච්ච නම්. — අරියස්ස සච්චානි අරිය සච්චානි.

## 1. දුඃඛාර්‍ය සත්‍යය:

"තත්ථ කතමං දුක්ඛං අරිය සච්චං? ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, මරණම්පි දුක්ඛං, සෝක පරිදේව දුක්ඛ දෝමනස්සුපායාසාපි දුක්ඛා අප්පියෙහි සම්පයෝගෝ දුක්ඛෝ, පියෙහි විප්පයෝගෝ දුක්ඛෝ, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"

එහි දුඃඛාර්‍ය සත්‍යය යනු කවරේද? ඉපදීම දුකෙකි. දිරාපත්වීම දුකෙකි. මරණය දුකෙකි. ශෝක කිරීම, හැඬීම, ශාරීරික වේදනා - සිරුර පිළිබඳ උපදින වේදනා - මානසික වේදනා, බලවත් සිත් තැවුල් ද දුකකි. නො කැමැත්තන් හා එක්වීම දුකකි කැමැත්තන් හා වෙන්වීම දුකකි. යමක් බලාපොරොත්තු වෙයි ද ඒ දේ නො ලැබීම දුකකි. කෙටියෙන් මුළු පස්කඳ ම දුකකි

මෙසේ දුඃඛාර්‍ය සත්‍යය දෙලොස් වැදෑරුම් ලෙස දැක්වේ. ප්‍රථම දේශනාව වූ "ධම්මචක්කප්පවත්තන" සූත්‍රයෙහිදී දැක්වූයේ අටාකාරයකි. එහි ව්‍යාධි ලෙඩවීම - දුක ඇතුලත් වන අතර මෙහි සෝකාදී සංඛ්‍යාව බැහැර වෙයි. "ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛං අරියසච්චං, ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා, මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයෝගෝ දුක්ඛෝ, පියෙහි විප්පයෝගෝ දුක්ඛෝ, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා" යනුයි. මෙහි ඒ අටාකාරය දිස්වෙයි ශෝකාදිය ද එක්තරා ලෙඩවීම ගතියක් උසුලන නිසා ඒ පක්ෂයෙන් ම "ව්‍යාධි දුඃඛය" ගැබ්වෙන බව දතයුතුය.

දුක්ඛ යනු කවරේද?

"ඉධ 'දු' ඉති අයං සද්දෝ කුච්ඡිතෙ දිස්සති කුච්ඡිතං හි පුත්තං දුප්පුත්තොති වදන්ති 'ඛං' සද්දො පන තුච්ඡෙ, තුච්ඡං හි ආකාසං ඛන්ති වුච්චති ඉදං පඨම සච්චං කුච්ඡිතං අනෙක උපද්දවාධිට්ඨානතො තුච්ඡං බාලජන පරිකප්පිත ධුව සුභ සුඛත්තභාව විරහිතතො තස්මා කුච්ඡිතත්තා ච තුච්ඡත්තා ච දුක්ඛන්ති වුච්චති" - වි, ප, අ.

මේ ආර්‍ය්‍ය සත්‍ය දේශනායෙහි 'දු' ශබ්දය පිළිකුල්ය යන තේරුමෙහි පෙනේ. නරක පුතුට 'දුපුත්තයා' යි කියත්. 'ඛං' ශබ්දය වනාහි හිස්ය යන තේරුමෙහි එයි. හිස් වූ අහස ඛං යැ යි කියනු ලැබේ. මේ ආර්‍ය්‍ය දේශනායෙහි ප්‍රථම සත්‍යය වූ නොයෙක් උපද්‍රවයන් පිහිටීමට ස්ථාන වන හෙයින් පිළිකුල් කටයුතු ය. අඥානයන් විසින් සලකන ලද නිත්‍ය - සුභ - සුඛ - ආත්මභාවයන් ගෙන් හිස් හෙයින් තුච්ඡය. එහෙයින් පිළිකුල් කටයුතු බැවින් ද, හිස් වූ බැවින් ද, දුක්ඛයැ යි කියනු ලැබේ. කරුණු මෙසේ හෙයින් දුඃඛසත්‍යයැ යි දේශනා කළ ජාති, ජරා, මරණ ආදී කරදර පිණිස පවතින්. තේරුම් ගත් කිසිවෙකු නො කැමති වන හෙයින් පිළිකුල්යහ. සදාකාලිය - ඉතා යහපත්ය සැපදායකය - ආත්මයක් එහි පවතීය, මේ වශයෙන් ගතයුතු කිසිදු සාරයක් - හරයක් - නො මැති හෙයින් අසාරයහ හිස්යහ

## 1· ජාති දුක:

"තත්ථ කතමා ජාති? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චති ජාති"

එහි ජාති (දුක) නම් කවරේද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්වනිකායන්හි - කොට්ඨාසයන්හි - යම් ඉපදීමක්, සම්පූර්ණ ඉපදීමක්, බැසගැනීම් වශයෙන් පිළිසිඳ ගැනීමක්, පහළවීමක්, ස්කන්ධයන් ගේ පහළවීමක්, ආයතනයන් ගේ ප්‍රතිලාභයක් - ලැබීමක් වෙයි ද මෙය ජාතියැ යි කියනු ලැබේ. මෙහි විස්තරය අභිසඞ්ඛාන ඥාණයෙහි දක්විණි. එය බලන්න.

එහි දු මනුෂ්‍ය ලෝකයෙහි ගර්භසෙය්‍යක - මව් ගැබෙහි වෙසෙන - සත්වයන් පිළිබඳ පවත්නා සත්වැදෑරුම් ජාති දුක නො දක්විණි. (මේ සත ජලාබුජ සත්වයන් සඳහා පවතින්නකි) ඒවා මෙසේය:

මව් කුසෙහි වෙසෙන සත්වයාට, ගර්භාවක්‍රාන්ති මූලක දුඃඛය ගර්භ පරිහරණ මූලක දුඃඛය, ගර්භ විපත්ති මූලක දුඃඛය, විජායන මූලක දුඃඛය, මව් කුසින් බිහිවන දුඃඛය, ආත්මොපක්‍රම මූලක දුඃඛය, පරොපක්‍රම මූලක දුඃඛයැ යි දුක් සතක් පැමිණේ. එහි පිළිසිඳ ගැනීම් වශයෙන් මව්කුසට බැස ගැනීම් මුල් කොට ඇති දුක, ගර්භ වක්‍රාන්ති මූලක දුඃඛය නම්. මේ සත්වයා මව්කුසෙහි

ඉපදෙනුයේ නෙළුම්, මානෙල්, ආදී මල්හි නූපදිති. හුදෙක් මෑණියන් ගේ ආමාශයට යට පක්වාශයට මතු, උදරපටලයටත් පිටකටුවටත් මැද, අතිශයින් කරදර සහිත වූ, ඉතා අන්ධකාර වූ නොයෙක් කුණපයන් ගේ දුර්ගන්ධයෙන් ගැවසීගත්, ඉතා පිළිකුල් කුස ඇසුරු කොට, අවුරුදු විසි තිස් ගණන් පැරණි වූ අශුචි වළෙක උපදින පණුවෙකු සේ උපදියි ඒ සත්වයා එහි ඉපදුනේ මව්කුසෙහි හටගත් උෂ්ණයෙන් වණ්ඩුවෙන් තැම්බෙන බෙහෙතක් සේ දසමාසයක් මුළුල්ලේ වෙසෙයි. ඒ කාලසීමාව තුළ අත් - පා දිගහැරීම ආදී කිසිවක් ද නො කළ හැක්කේ යටි කස්සෙහි හැකුලූ අත් තබාගෙන, පා හකුළුවා ගෙන, තද වැස්සට හසු වූ වඳුරෙකු සේ උක්කුටිකවම වෙසෙයි. මේ ගර්භාවක්‍රාන්ති මූලක දුඃඛය යි.

මේ අයුරින් වෙසෙද්දී මෑණියන් ගේ හදිසි පැකිළීම - යෑම - හිඳීම - සිටීම - පෙරළීම ආදිය නිසා සුරාපානයෙන් මත්වූවෙකුට හසු වූ එළුවෙකු සේ, අහිතුණ්ඩිකයෙකුට හසු වූ නයි පැටවෙකු සේ ඔබ්බෙනොබ ඇදීම, විසිකිරීම, සෙලවීම්, ආදියට පත්වීමෙන් මහත් දුකක් විඳියි. මෑණියන් උණු ආහාරයක් ගනී නම් අවීචි යෙහි වැටුණු තිරිසනෙකු මෙන් මහත් දැවිල්ලක් විඳියි. සිසිල් ආහාරයක් ගනියි නම් ශීත නරකයෙහි උපන්නෙකු සේ ද, ලුණු ඇඹුල් ආදී කටුක ආහාරයක් ගනිද්දී, ආයුධයකින් සිරුර පලා, ලුණු ආදිය දමා කරනු ලබන කාරම් ආදිය දැමීම නිසා දුක් විඳින්නෙකු සේ ද, ඉතා මහත් වූ දුකක් විඳියි. මේ දරුගැබ දරා හැනීම මුල්කොට ඇති දුක නම් වූ ගර්භපරිහරණ මූලක දුඃඛය යි මව්කුසින් බිහිවන අවස්ථාවේදී යම්කිසි කාරණක් නිසා මූඪගර්භ වූවහොත් - දරුවා නියම අයුරින් බිහි නොවී හරස් වූවහොත් - නෑදෑ හිත මිතුරන් විසින් පවා නො දැකිය යුතු රහස් ප්‍රදේශයෙහි කැපීම, පැලීම, ආදිය නිසා දරුවාට යම් දුකක් පැමිණේ ද ඒ ගර්භවිපත්ති මූලක දුඃඛය නම්. - දරුගැබට පැමිණි කරදරය මුල් කොට ඇති දුකයි -

එසේම මව්කුසින් බිහිවන අවස්ථාවේදී මෑණියන් ගේ කම්මජ වාතයෙන් දරුවා පෙරලී අවුත් ඉතාමත් අවහිර වූ යෝනි මාර්ගයෙන් ඇදෙද්දී, යතුරු සිදුරකින් ඇදගනු ලබන ඇතෙකු සේ ද, පර්වත දෙකක් පෙරළී අවුත් දෙපැත්තෙන් ම මිරිකෙන තිරිසනෙකු සේ ද, යම් දුකක් විඳියි නම් එය විජාතන මූලක දුඃඛය නම්. - වැදීම (ප්‍රසූත කිරීම) මුල්කොට ඇති දුකයි - එසේ ඉපදුනා වූ සත්වයාගේ, අළුත හටගත් වණයක් බඳු සියුම් ශරීරයට

එඩා ගැනීම, නැවීම, සේදීම, රෙදි ඇන්දවීම, ආදිය සිදු කරද්දී කිඳිකටුවකින් විදින්නා සේ ද, දැලිපිහියකින් කපන්නා සේ ද උපදින දුක් පීඩුම ගතිය. බිහිවීම මුල්කොට ඇති දුකයි. ඉන්පසු තමා විසින් ම කරනු ලබන නැඩීම, නැගැසීම්, තුවාල සිදුකර ගැනීම් ආදිය ද, වැරදි අදහස් ගෙන සිරුරට දුක් දුක්දීම වශයෙන් අව් - ගිනි ආදීයෙන් සිරුර තැවීම, අජවුත ගොවුතාදිය රැකීම නිසා ඇතිවන වේදනා, කිපීම් වශයෙන් ආහාරයෙන් ආහාරයෙන් වැලකී සිටීම, ආදී යම් දුකක් විඳියි ද, ඒ අත්තොපක්‍රම මූලක දුඃඛ නම්. - තමා ගේ උපක්‍රමයෙන් මුල්කොට ඇති දුකයි. අනුන් විසින් කරනු ලබන තැලීම්, කැපීම්, වෙඩිතැබීම්, මැරීම් ආදිය නිසා විඳින දුක පරෝපක්‍රම මූලක දුඃඛයයි. මෙසේ ගර්භසෙයයක සත්වයනට ජාති දුක සත්වැදෑරුම් වන අතර, සෙසු සත්වයනට සුදුසු පරිද්දෙන් ජාති දුක පැමිණේ.

## 2. ජරා දුක:

‘‘තත්ථ කතමං ජරා? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො අයං වුච්චති ජරා’’

එහි (දුඃඛාර්ය සත්‍යයෙහි) ජරා නම් කවරේද? ඒ ඒ සත්වයන් ගේ ඒ ඒ සත්වනිකායන්හි යම් ජරාවක්, දිරන බවක්, කැඩෙන බවක්, පැසෙන බවක්, හැකුළුනු සම් ඇති බවක්, ආයුෂයෙහි පිරිහීමක් ඉඳුරන් ගේ මේරීමක් වෙයි ද, මෙය ජරා යැයි කියනු ලැබේ මේ ඒ පාඨයෙහි කෙටි අදහසයි.

මෙහි ‘ජරා’ යන පදයෙන් දිරාපත්වීම කියැවෙයි. ඒ දිරාපත් වීමේ ආකාරය සෙසු පදයන්ගෙන් දක්විණි. ජලයෙන් හෝ ගින්නෙන් හෝ සුළඟින් හෝ ගස් වැල් ආදිය හානි වූ පසු එහි ජලය ආදී දූයක් හෝ දැනුණත් ඒ ජලය ආදී ද ගිය මාර්ගය හානියට පත් වූ ගස්-වැල් ආදිය දැකීමෙන් පෙනේ. එමෙන් ජරාදුක, සත්ව ජීවිතයක ගමන් කිරීම නිසා කෙස් පැසීම, දත් වැටීම, හම රැළි හැසීම ආදිය දැකීමෙන් ඒ ගමන් මාර්ගය ප්‍රකට වෙයි. එහෙයින් ජරාදුක ශරීරය දිරායෑම, දත් වැටීම, හිස කෙස් පැසීම, හම රැළි හැසීම්, ආදියෙන් අවබෝධ කටයුතුය. එසේ ම ලබාගත් ජීවිතයට යම් ආයුෂ ප්‍රමාණයක් නියමිත ද ඒ ආයුෂයෙහි පිරිහීම සඟවාවග ද, දිරායෑම ආදියෙන් ම ප්‍රකට

වන හෙයින් ජරාදුක ආයුෂයා ගේ පිරිහීමකැ යි දක්විණ. ඉඳුරන් ගේ මේරීම ද ජරාදුකකි. ජරාදුක ගමන්කිරීම නිසා ඇස, කණ ආදී ඉඳුරන් පස්දෙනා ක්‍රමයෙන් පිරිහෙත්. තරුණ වයසෙහිදී ඈත තිබූ දෑය පවා පෙනීමේ ශක්තියක් තුබූයේ නමුත් වයස්ගත වෙත් ම ලඟ තුබූ දෑය පවා නො පෙනෙයි. කණ ආදිය පිළිබඳවත් එසේම ය. එහෙයින් ඉඳුරන් ගේ මේරීම ද ජරාදුකක් බව දතයුතු. මේ සියලු ජරාදුක් ප්‍රකට, ප්‍රතිච්ඡන්න, (පෙනෙන, වැසුණු) වශයෙන් දෙවැදෑරුම් ය. දත් වැටීම්, කෙස් පැසීම්, ආදිය ප්‍රකට ජරාදුකයි. චිත්ත - චෛතසිකයන් ගේ ජරා වට පත්වීම නො පෙනෙන හෙයින් ප්‍රතිච්ඡන්න ජරාදුකයි.

## 3. මරණ දුක:

"තත්ථ කතමං මරණං? යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චුමරණං කාලකිරියා ඛන්ධානං භෙදො කළෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො ඉදං වුච්චති මරණං"

එහි මරණය යනු කවරේද? ඒ ඒ සත්ත්වයන් ගේ ඒ ඒ සත්ත්ව නිකායෙයන් යම් පහවීමක්, පහවීම් බවක්, බිඳීමක්, අතුරුදහන් වීමක්, මරණයක්, කළුරිය කිරීමක්, ස්කන්ධයන් ගේ බිඳීමක්, සිරුර හැරදැමීමක්, ජීවත්වීම රඳා පවත්නා ස්වභාවය සිඳීයෑමක්, වෙයි ද මෙය මරණයැ යි කියනු ලැබේ. මරණ දුක පිළිබඳ විස්තර සමාධි භාවනාමය ඥාණයෙහි "මරණානුස්සති භාවනාව" දක්වූ තැන ඇත. එය බලන්න.

## 4. සොක දුක:

"තත්ථ කතමො සොකො? ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තොසොකො අන්තොපරිසොකො චෙතසො පරිජ්ඣායනා දොමනස්සං සොකසල්ලං අයං වුච්චති සොකො"

එහි ශෝකය යනු කවරේද? නෑයන් ගේ විනාශ වීමෙන් යුක්ත වූවහු ගේ හෝ භෝග - රෝග - ශීල දිට්ඨි විනාශයෙන් යුක්ත වූවහුගේ හෝ සෙසුත් විනාශ වීම ඇත්නම් ඒවා අතුරෙන්

එකකින් හමුක් යුක්ත වූවහු ගේ හෝ යම්කිසි සෝක දුකක් ඇතිවීමට හේතු වූ යමකින් යුක්ත වූවහු ගේ සෝකයක්, සෝක කරන බවක්, සෝක කල බවක්, ඇතුළෙහි වූ සෝකයක් ඇතුළෙහි වූ ශාන්පසින් ම පවතින සෝකයක්, සිතෙහි දැවෙන ගතියක්, නො සතුටු බවක්, සෝක හුලක්, වෙයි ද මෙය සෝකයැයි කියනු ලැබේ.

සෝකය යනු හිත් වේදනාවයි. ඒ හිත් වේදනාව ඇතිවීම සඳහා හේතුවන කරුණු "ඤාතීන් ගේ විනාශ වීම" ආදී වශයෙන් දක්විණි. සච්චවිභඞ්ග සූත්‍රයෙහි 'ඤාති' ආදී බෙදා දක්වීමක් නො මැතිව "අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස" නොයෙක් විනාශ වීම් අතුරෙන් එක්තරා විනාශ වීමකින් යුක්ත වූවහු ගේ යනුවෙන් කෙටි හැඳින්වීම පමණක් සඳහන්ය. යම්කිසි රෝගයකින් හෝ ජල - ගිනි ආදියකින් හෝ නෑයන් ගේ විනාශ වීම "ඤාති ව්‍යසන" නම්. ඤාති ව්‍යසනය දැනගැනීම, දැකීම, ඇසීම, නිසා සිතට මහත් දුකක් ඇතිවේ. එහෙයින් ඒ දුක් ඇතිවීම, සිරුරට යම්කිසි මුගුරු ආදියකින් පහරක් වැදීම හා සමාන නිසා 'ඵුට්ඨස්ස - හැප්පුනහු ගේ" යයි දේශනා කළහ. භෝග ව්‍යසනය නම් ගෙවල්, ඉඩම්, කුඹුරු, ධනය, ඇත්-අස්-ගවාදි සතුන්, යනාදී ජීවිත පෝෂණයට උපකාරී වන දෑ විනාශ වීමයි. මෙය ද ජල-ගිනි-සොරු-රජය ආදී කරුණක් නිසා සිදුවෙයි. අතීසාර, ජලභීතිකා, දියවැඩියා (මධුමෙහ) පිළිකා, භගන්දලා, කුෂ්ඨ, දද, ආදී රෝගයන් අතුරෙන් එකක් හමුදු වැලඳීම නිසා නිරෝගිකම විනාශ වෙයි. එහෙයින් එය රෝග ව්‍යසන නම්. සීල ව්‍යසනය නම් දුස්සීලකමට පත්වීමයි. නරක මිතුරන් ගේ ඇසුර නිසා හෝ ලබාගත් ඉගැනීම නිසා හෝ මිථ්‍යාදෘෂ්ටියට බැසගැනීම දිට්ඨි ව්‍යසනය යි. මිතුරන් ගේ විනාශය ආදි වෙනත් යම්කිසි විනාශයක් ඇත්නම් ඒ නො දක්වූ සියල්ල ඒලග පදයෙන් දක්වූහ. මෙසේ සෝකය ඉපදීමට යම්කිසි හේතුවක් පැමිණියේ නම් ඔහු ගේ සිතට ඇතිවන බලවත් වේදනාව සෝක දුක නම්. එහි සවභාවය 'සෝකො සොචනා-" යනාදි පද සමූහයකින් දේශනා කළහ. සිත් ඇතුළේ පවතින වෙදනාව නිසා ඇතැම්හු උණුලේ පවා වගුරුවත්. එසේ ම කුස, පපුව, උගුර ඈදී තැන් ද වියලීම් සවභාවයට පත් වෙයි. මෙසේ සෝක දුක ගිත්තක් සේ ද, හුලක් සේ ද, කඩු - කිණිසි ආදි ආවුධ පහරක් සේ ද සැලකෙයි.

"සත්තානං හදයං සොකො සල්ලං විය විතුජ්ජති
අග්ගිතත්තො ච නාරාචො භුසංච ඩහතෙ පුන"

2019 10 05 Paññāpārami Na Uyana Free Distribution

ශෝකය හුලක් මෙන් සත්ත්වයන් ගේ හෘදයෙහි ඇනෙයි. නැවත ගින්නෙන් රත් වූ යකඩයක් සේ බොහෝ සෙයින් ම දවයි.

## 5. පරිදේව දුක:

"තත්‍ථ කතමො පරිදෙවො? ඤාති ව්‍යසනෙන වා ඵුට්ඨස්ස -පෙ- ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා ලාලප්පිතත්තං අයං වුච්චති පරිදෙවො"

මෙහි ඤාති ව්‍යසනාදිය පෙර මෙනි. "ආදෙවනා" යනාදී පදයන්හි තේරුම මෙසේය. "මය්හං ධීතා, මය්හං පුත්තා ති එවං ආදිස්ස ආදිස්ස දෙවන්ති රොදන්ති එතෙනාති ආදෙවනා" මගේ දුව, මගේ පුතාය'යි මෙසේ පෙන්වමින් නැවත කරුණු කියමින් ඔහු සඳහා ම හඬන්නුයි ආදේවන නමි. ඔහු ගේ ගුණ කියමින් හැඬීම පරිදේවනා යි. සෙසු ඊළඟ පද සතර හැඬීමේ ස්වභාවය දැක්වීමේ පදයි. "වාචා" යන්නෙන් හැඬීම සමග කියන වචන දැක්වෙයි, ශෝකය නිසා ම මුඛයෙන් පිටවන, තේරුමක් නැති හිස් වචන "පලාප" නමි. (ප්‍රලාප - හිස් දෙඩීමයි) වචන අඩක් ම කීම ආදී වශයෙන් විකාර කියමන විප්පලාප යි. සෙසු පද ආකාර දැක්වීම සඳහා යෙදිණ. මෙසේ පරිදේව දුක වශයෙන් දේශනා කළේ යම්කිසි දුක් වේදනාවක් මුල් කොට හඬා වැලපීම යි. බොහෝ දෙනා හඬා වැලපෙද්දී පපුවට ගසා ගනිත්. හිස කෙස්වලින් අදිත්. පොළොවෙහි අත් - පා ගසත්. ඇතැම් විට ළිං-ගංගා-පොකුණු ආදියට ද පනිත්. දුම්රියට පනිත්. එහෙයින් පරිදේව දුක ඉතා භයානකය.

6, 7, දුක්ඛ, දෝමනස්ස, දුක් දෙක පඤ්චස්කන්ධ විස්තර යෙහිදී දැක්විණ.

## 8. උපායාස දුක

ශෝක, පරිදේව දුක් දෙකින් හටගත්තාවූ දැඩි වෙහෙස ක්ලාන්ත ගතිය, උපායාස දුක නමි. උපායාසයට පත්වූ තැනැත්තේ දඬු මුගුරු ආදියෙන් පහර ලැබූවෙකුගේ මලානික වෙයි. රෝගී වෙයි.

## 9. අප්පිය සම්පයොග දුක

"තත්‍ථ කතමො අප්පියෙහි සම්පයොගො දුක්ඛො? ඉධ යස්ස තෙ හොන්ති අනිට්ඨා අකන්තා අමනාපා රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, යෙ වා පනස්ස තෙ හොන්ති අනත්‍ථකාමා අහිතකාමා අඵාසුකාමා අයොගක්ඛෙමකාමා යා තෙහි සඞ්ගති සමාගමො සමොධානං මිස්සීභාවො අයං වුච්චති අප්පියෙහි සම්පයොගො දුක්ඛො"

එහි අප්‍රිය සම්ප්‍රයෝග දුක්ඛය යනු කවරේද? මේ ලෝකයෙහි, තමා කැමති නැති, සිත්කළු නොවූ සතුටු නැති රූප ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, යමක් වේද්ද නැතහොත් අවැඩ කැමති අහිත කැමති, කරදරයක්ම කැමති, පස්කම්හි යෙදීමට කැමති නැතහොත් රෝගාදී යම් කිසි බියක්ම වනවාට කැමති, පුද්ගලයෝ යමෙකුට වේද්ද, ඔවුන් සමග යම් හෝ එකතුවීමක්, වෙතට පැමිණ එකතුවීමක්, ලංව විසීමක් එකට වැඩ කිරීමක් වේද මෙය අප්‍රිය සම්ප්‍රයෝග දුඃඛයැයි කියනු ලැබේ.

අප්‍රිය සම්ප්‍රයෝග දුක ක්‍රම දෙකකින් ලැබෙන බව මේ දේශනා පාඨයෙන් පැහැදිලිවෙයි. තමන් කැමති නැති රූපාදී අරමුණු සමග හැපීමෙන් ඇතිවන අප්‍රිය සම්ප්‍රයෝග දුක, එක් ක්‍රමයකි. තමන්ගේ දියුණුව කැමති නැති, පිරිහීමම කැමති ඒ සඳහාම යොදවන පාප මිත්‍රයන් සමග ආශ්‍රය කිරීම නිසා ඇතිවන අප්‍රිය සම්ප්‍රයෝග දුක දෙවැනි ක්‍රමයයි.

## 10: පිය විප්පයොග දුක

"තත්‍ථ කතමො පියෙහි විප්පයොගො දුක්ඛො? ඉධ යස්ස තෙ හොන්ති ඉට්ඨා කන්තා මනාපා රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, යෙ වා, පනස්ස තෙ හොන්ති අත්‍ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා, මාතා වා පිතා වා, භාතා වා භගිනී වා මිත්තාමච්චා වා ඤාතිසාලොහිතා වා. යා තෙහි අසඞ්ගති අසමාගමො අසමොධානං අමිස්සීභාවො අයං වුච්චති පියෙහි විප්පයොගො දුක්ඛො."

එහි ප්‍රිය විප්‍රයෝග දුඃඛය යනු කවරේද? මේ ලෝකයෙහි තමා කැමති සිත්කළු, සතුටු, රූප-ශබ්ද- ගන්ධ-රස - ස්පර්ශයෝ යමෙකුට වේද්ද, නැතහොත් දියුණුව කැමති, හිත කැමති

සැප කැමති, ශීලාදී ගුණයක්ම කැමති, මවක් හෝ පියෙක් හෝ සහෝදරයෙක් හෝ සහෝදරියක් හෝ මිත්‍රයෝ හෝ නෑයෝ හෝ යමෙකුට සිටිත් ද, ඔවුන් සමග යම්හොත් එකතුවීමක් වෙතට පැමිණ එකතුවීමක් ලංව විසීමක්, එකට වැඩ කිරීමක්, නොවෙයිද, මෙය ප්‍රිය විප්‍රයොග දුඃඛයැයි කියනු ලැබේ.

මෙහිද ප්‍රිය විප්‍රයොග දුඃඛය දෙපරිද්දෙකින් ඇතිවන බව ප්‍රකාශිතයි. තමාගේ සිත පිනවන රූපාදී අරමුණු සමග ගැටීමක් නො සිදුවෙයිනම් එද ප්‍රිය විප්‍රයොග දුඃඛයකි. එසේම තමාගේ දියුණුව කැමති, දියුණුවේදී සතුටුවන පිරිහීමක් කිසිදු විටෙක නොසිතන්නාවූ මව් - පිය - සහෝදරාදීන් සමග සමගිවීමක් නොමැති කමද ප්‍රිය විප්‍රයොග දුඃඛයෙකි.

## 11. යමක් කැමතිද එය නොලැබීම නිසා ඇතිවන ඉච්ඡා විඝාත දුක.

"තත්ථ කතමං යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං? ජාතිධම්මානං සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති, "අහො වත මයං න ජාතිධම්මා අස්සාම නච වත නො ජාති ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං. ජරා ධම්මානං - පෙ - ව්‍යාධි ධම්මානං - පෙ - මරණ ධම්මානං - පෙ - සොකපරිදෙවදුක්ඛ දොමනස්සු පායාසධම්මානං - පෙ - න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං"

එහි, යමක් කැමතිද එය නො ලැබීම නිසා ඇතිවන දුක යනු කවරේද? ඉපදීම ස්වභාවකොට ඇති සත්වයන්ට "ඛේදයකි,- අනේ-අපි ඒකාන්තයෙන්ම ඉපදීම ස්වභාවකොට ඇත්තෝ නොවෙමු නම් යහපති. අප වෙත එය නොඑන්නේ නම් යහපති" කියා හෝ මෙසේ ආසාවක් උපදීයි. මේ කරුණ එනාගී කැමැත්තට අනුව නොපැමිණිය යුත්තකි. ජරා මරණාදියද මෙසේමය. මෙය යමක් කැමතිද එය නොලැබීම නිසා ඇතිවන දුක නම්.

මෙසේ නොලැබිය හැකි දේ ගැන, ලැබිය හැකියයි සලකා ගැනීමෙන් ඇතිවන්නාවූ ආශාව, බලාපොරොත්තුව හේතුකොට ගෙන උපදින දුක 'ඉච්ඡාවිඝාත දුකයා''යි කියනු ලැබේ. "මා නො දිරාමොත් හොඳය, නොමැරුණොත් හොඳය යනාදී වශයෙන් සිතීම නොලැබිය හැකි දේ ගැන ලැබිය හැකියායි සලකා ගැනීම ය යි. මේ බලාපොරොත්තු කඩවීමෙන් ඇතිවන දුකයි.

## 12. පඤ්චස්කන්ධ දුක

තත්ථ කතමෙ සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා? සෙය්‍යථීදං, රූපූපාදානක්ඛන්ධො, වෙදනූපාදානක්ඛන්ධො, සඤ්ඤූපාදානක්ඛන්ධො, සංඛාරූපාදානක්ඛන්ධො, විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉමෙ වුච්චන්ති සංඛිත්තෙන පඤ්චූපාදානක්ඛන්ධා දුක්ඛා’’

ධම්මට්ඨිති ඤාණයෙහි පඤ්චස්කන්ධය විස්තර කෙරිණි.

මෙසේ දුඃඛාර්ය සත්‍යය දොළොස් වැදෑරුම් වෙයි. සම්මෝහ විනෝදනියෙහි මේ දොළොස් වැදෑරුම් දුඃඛ සත්‍යය සත්වැදෑරුම් කොට දක්වෙයි. ඒ මෙසේය.

“ඉදං දුක්ඛං නාම අනෙකං නානප්පකාරං, සෙය්‍යථීදං? දුක්ඛ දුක්ඛං, විපරිණාම දුක්ඛං, සංඛාර දුක්ඛං, පටිච්ඡන්න දුක්ඛං අප්පටිච්ඡන්න දුක්ඛං පරියාය දුක්ඛං නිප්පරියාය දුක්ඛන්ති’’ – වි. ප. අ.

මෙහි කායිකවූද චෛතසිකවූද දුක් වේදනාව ස්වභාව වශයෙන්ද නාම වශයෙන්ද දුක් බැවින් දුක්ඛ දුක්ඛ නමි. සැප වේදනාව පෙරළීම නිසා දුක් ඉපදීමට හේතුවන බැවින් එය විපරිණාම දුක්ඛයි. මැදහත් වේදනාවද (උපෙක්ඛා) ඉතිරි ත්‍රෛභූමික සංස්කාරයෝද ඉපදීම් විනාශවීම් දෙදෙකෙන් පෙළෙන නිසා සංඛාර දුක්ඛ නම් වේත්. කණ් රුදා, ඇස් රුදා, රාගය නිසා ඇති වන දැවිලි ගතිය, ක්‍රෝධය නිසා හටගන්නා දාහය, ආදී කායික චෛතසික ආබාධ-ලෙඩ-අසා දැනගතයුතු හෙයින්ද, උපක්‍රමයේ අප්‍රකට-නොපෙනෙන-ගතිය හෙයින්ද, පටිච්ඡන්න දුක්ඛ නමි. අප්‍රකට දුඃඛයැයිද කියනු ලැබේ. ‘‘කණ්ණම්පි ඡින්දති නාසම්පි ඡින්දති’ කණද කපයි නැහැයද කපයි’’යනාදී වශයෙන් දක්වෙන; පෙර රජ දරුවන් දවස තුබූ දෙතිස් මහා කම්කටොළු වලින් හට ගත් ආබාධ, නොඇසුවත් දන්නා හෙයින්ද උපක්‍රමයේ ප්‍රකට භාවය නිසාද අපටිච්ඡන්න දුක්ඛ නමි. ප්‍රකට දුඃඛයැයිද කියනු ලැබේ. දුක්ඛ දුක්ඛය හැර දුක්ඛ සත්‍යය බෙදීමේදී ආවාවූ ජාති ආදී සෙසු සියලු දුක්ද ඒ ඒ දුකට වස්තු වන බැවින් පරියාය දුක්ඛ නමි. (කෙළින්ම නොකියා වෙනත් හැඟෙන වචනයකින් කීම පරියාය නමි.) දුඃඛ දුඃඛය නිෂ්පර්යාය දුඃඛයි.

මේ දුඃඛායයී සත්‍යයාගේ විස්තරයයි.

2. දුඃඛ සමුදයායයී සත්‍යයාගේ විස්තරය ධම්මට්ඨිති ඥාණයෙහි දක්විණි.

3. දුඃඛ නිරොධායයී සත්‍යයාගේ විස්තරය අනුලෝමගෝත්‍රභූ-මග්ග-ඵල ඥාණයන්හි ආයේය.

(දක්වූදෑ නැවත දක්වීම අනවශ්‍යයයි)

## 4. දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදායයී සත්‍යය.

"තත්ථ කතමං දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරිය සච්චං? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථිදං? සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මා ආජීවො සම්මාවායාමො සම්මාසති සම්මා සමාධි."

එහි දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදායයී සත්‍යය යනු කවරේද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයමැයි ඒ කෙසේද? සම්‍යක් දෘෂ්ටිය සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය සම්‍යක් සමාධිය යනුයි.

දුඃඛාදී ආර්ය සතර පිළිබඳව යෙදෙන ප්‍රඥාව මෙහිලා සම්මා දිට්ඨි නම්· කාමයන්ගෙන් දුරුවීම පිළිබඳ කල්පනා - අදහස් -, නො කිපීම පිළිබඳ අදහස්, සත්ව හිංසාවෙන් තොරවීම පිළිබඳ අදහස් යන තෙවැදෑරුම් කල්පනා සම්මාසඞ්කප්පයි. බොරු - කේලාම්-පරුෂ-හිස් යන සිව්වැදෑරුම් වචන නොකීම, ඒවායින් වැලකීම සම්මාවාචායි. සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, මේ තෙවැදෑරුම් වැරදි ක්‍රියාවලින් වෙන්වීම සම්මාකම්මන්ත නම්. කය-වචන දෙකට ඇතුලත්වූ සත්වැදෑරුම් වැරදි ක්‍රියා වලින් හෝ වෙනත් වංචනික, කූට, කපටි, වෙළදාම් ආදියකින් හෝ උපයාගත් දසින් ජීවත්වීම සම්පූර්ණයෙන් අත් හැරීම සම්මා ආජීව නම්. සතර සම්‍යක් ප්‍රධාන වීර්‍යය සම්මාවායාමයි. මෙය කීප තැනකම විස්තරවිණි. සතර සතිපට්ඨානයන්හි සිහිය පිහිටුවා ගැනීම සම්මා සතියයි. ධ්‍යාන චතුෂ්කයෙන් යුක්ත වීම සම්මා සමාධි නම. (ඉහතදී බොහෝ තැන්වල විස්තර කළ හීසා මෙසේ සංක්ෂෙප කළ බව හැලකිය යුතු.)

## චතුරාර්‍ය්‍ය සත්‍යයෙහි ලක්‍ෂණාදීහු:-

චතුරාර්‍ය්‍ය සත්‍යය අතුරෙන් දුඃඛ සත්‍යය පෙළීම ලක්‍ෂණ කොට ඇත්තේය. එහි කෘත්‍යය-වැඩය-තැවීමයි. පච්චුපට්ඨානය-වැටහෙන කාරණය-පැවැත්මයි. සමුදය සත්‍යය (දුක්, හටගැනීම ලක්‍ෂණකොට ඇත්තේය කෘත්‍යය නොසිඳ පැවැත්මේ ගතියයි. සත්‍යාවබෝධය වැලැක්වීම වැටහෙන කාරණයයි. නිරොධ සත්‍යය ශාන්ති ලක්‍ෂණයයි, නැසීම ගතියයි. පහනොවීම ( ච්‍යනොවම) කෘත්‍යයයි අනිමිත්ත - නිමිති නැති බව - පච්චුපට්ඨානයයි' (නිමිති නම් සංස්කාර නිමිතියි) මාර්ග සත්‍යය (නිවනට) පමුණුවන ලක්‍ෂණයයි. කෙලෙස් ප්‍රහාණයකෘත්‍යයයි කෙලෙසුන්ගෙන් හා සසර දුකින් නැගී සිටීම වැටහෙන කාරණයයි. තවද දුඃඛ සත්‍යය ප්‍රවෘත්ති පැවතීම - ලක්‍ෂණයයි. සමුදය සත්‍යයය ප්‍රවෘත්තක - පැවතීම කරවන ලක්‍ෂණයයි. නිරොධ සත්‍යය නිවෘත්ති නැවැත්ම-ලක්‍ෂණයයි.මාර්ග සත්‍යය නිවෘත්තක-නවත්වන ලක්‍ෂණයයි. මේ ලක්‍ෂණ සතර නිසාය ආර්‍ය්‍ය සත්‍ය සතරක් වූයේ.

චතුරාර්‍ය්‍යසත්‍යයන් අතුරෙන් දුඃඛ සත්‍යය 'පරිඥෙය්‍ය" නම්. සමුදය සත්‍යය "ප්‍රහාතව්‍ය'' නම්. නිරොධ සත්‍යය "සාක්ෂාත් කර්තව්‍ය නම්. මාර්ග සත්‍යය "භාවිතව්‍ය" නම්. එනම් හාත්පසින්ම දතයුත්තේ දුඃඛ සත්‍යයයි. අත්හළ යුත්තේ සමුදය සත්‍යයයි අවබෝධ කළ යුත්තත් නිරොධ සත්‍යයයි වැඩිය යුත්තේ මාර්ග සත්‍යයයි යනුයි. මෙසේ හෙයින් ආර්‍ය්‍ය සත්‍ය සතරක්විණි

## දේශනා ක්‍රමය

ඖදාරික - ගොරෝසු - බැවින්ද, සියලු සත්වයන්ට සාධාරණ බැවින්ද දැනගැනීමට පහසු නිසා එහි පළමුකොට දුඃඛ සත්‍ය දේශනා කරන ලදී.දුක්ඛයෙහිම හේතුව දැක්වීම වශයෙන් ඊට අනතුරුව සමුදයසත්‍යයිද,හේතුව නැතිකිරීම නිසා ඵලය විනාශවේයයි තේරුම් ගැනීමට පහසුවීම සඳහා ඊට පසු නිරෝධ සත්‍යයද, නිරෝධය ලබාගැනීමෙ උපාය මාර්ගය දැක්වීම සඳහා කෙළවර මාර්ග සත්‍යයිද දේශනාකරන ලදී. තවද ක්‍රමයෙකි. භව සැපයට ගිජුවූ සත්වයන්ට කලකිරීම ඉපදීම සඳහා පළමුකොට දුඃඛ සත්‍යය ද, ඒ දුකද තමා විසින් (පින්-පව් වශයෙන්) නොකරන ලද්දේම නොඑයි. ඊශ්වරයා විසින් මැවීම ආදියකින් වූවක්ද නොවේ. මෙසින්ම වේයයි දැනගැනීම සඳහා ඊට අනතුරුව සමුදය සත්‍යය

සද, ඉක්බිති හේතු සහිතවූ දුකින් මඩනා ලද බැවින් සංවේගයට-කණගාටුවට-පැමිණි හදවතක් ඇති, දුකින් නිදහස්වීමක් සොයන්නවුන්ට නික්මීම දැක්වීමෙන් ආශ්වාදයක්-සැනසීමක් - උපදවනු සඳහා නිරෝධ සත්‍යයද, ඊට පසු ඒ නිරෝධයට පැමිණීම පිණිස නිරෝධයට පමුණුවන මාර්ග සත්‍යයද, දේශනා කරන ලදී. මේ දේශනා කරනලදී. මෙ දේශනා ක්‍රමයයි.

## දෙවැරුම් සත්‍ය ඥාන

“දුවිධංහි සච්චඤාණං, අනුබොධ ඤාණඤ්ච පටිවෙධ ඤාණඤ්ච, තත්ථ අනුබොධ ඤාණං ලොකියං අනුස්සවාදි වසෙන නිරොධෙ මග්ගෙච පවත්තති, පටිවෙධ ඤාණං ලොකුත්තරං නිරොධාරම්මණං කත්වා කිච්චතො චත්තාරි සච්චානි පටිවිජ්ඣති”—පි. පි. අ.

සත්‍යඥානය දෙවැදෑරුම්ය. අනුබෝධ ඥානය, ප්‍රතිවෙධ ඥානය යනුයි. එහි අනුබෝධ ඥානය ලෞකිකය. පරම්පරාකථාදී වශයෙන් නිරෝධයෙහිද මාර්ගයෙහිද පවතියි, ප්‍රතිවෙධ ඥානය ලෝකෝත්තරයි. නිරෝධය අරමුණුකොට කෘත්‍ය වශයෙන් චතුස්සත්‍යයන් අවබෝධ කරයි. මෙයින් පැහැදිලි වනුයේ අනුබොධ ඤාණය බුදුරජාණන් වහන්සේ දේශනා, ශ්‍රාවකයන්ගේ දේශනා ආදී වශයෙන් පැවතගෙන එන දේශනා පිළිවෙලට අනුව නිවණ හා ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය පිළිබඳව පවතින නුවණයැයිද, ප්‍රතිවෙධඤාණය නම් ප්‍රත්‍යක්ෂ වශයෙන්ම සිවුසස් අවබෝධ කරවමින් නිර්වාණය අරමුණුකොට ඇති නුවණයැයිද කියායි. එයින් පළමුවැන්න ලෞකික ඥාණයකි. දෙවැන්න ලෝකෝත්තර ඤාණයකි. ප්‍රතිවෙධ ඤාණයෙන් කෘත්‍ය සතරම සිදුවෙයි.

“යො භික්ඛවෙ දුක්ඛං පස්සති, දුක්ඛ සමුදයම්පි සො පස්සති, දුක්ඛනිරොධම්පි පස්සති, දුක්ඛනිරොධගාමිනි පටිපදම්පි පස්සති” යනු උදාහරණයි.

## උපමා

දුඃඛ සත්‍යය බරක් මෙනි. ඒ බර ගැනීම මෙනි සමුදය සත්‍යය බර තැබීම මෙනි, නිරෝධසත්‍යය ඒ සඳහා යොදන උපාය මෙනි, මාර්ග සත්‍යය එසේම දුඃඛ සත්‍යය

රෝගයක් මෙනි. සමුදය සත්‍යය රෝග නිදානය මෙනි. නිරෝධ සත්‍යය රෝග සංසිඳීම මෙනි. මාර්ග සත්‍යය බෙහෙත මෙනි. මේ ආදී වශයෙන් උපමා දතයුතුය.

### ශූන්‍යතාවය දක්වීම.

"දුක්ඛමෙව හි න කොචි දුක්ඛිතො
කාරකො න කිරියා ච විජ්ජති
අත්ථි නිබ්බුති න නිබ්බුතො පුමා
මග්ගමත්ථි ගමකො න විජ්ජති"

දුක් වේදනාවම ඇත. දුක් විඳින්නෙක් නැත. කරවන්නෙක් නැත, ක්‍රියාවක් පෙනේ. නිවීමක් ඇත නිවුණු කෙනෙක් නොමැත. මාර්ගයක් නොමැත. මාර්ගයක් ඇති මාර්ගයෙහි යන්නෙක් නැත. මේ දැක්වූයේ චතුරාර්‍ය සත්‍යය පිළිබඳව පවත්නා ශූන්‍යතාවයයි. එනම් ආත්ම වශයෙන් නොගෙන ධර්ම ශක්ති විශේෂයක් පෙන්වීමයි

ආර්‍ය සත්‍ය විස්තර නිමි.

## දුක්ඛ ඥාණය, සමුදය ඥාණය, නිරොධ ඥාණය, මග්ග ඥාණය.

කෙසේ නම් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව දුක්ඛ ඥාණය වේද? ප්‍රහාණය කිරීමෙහි ප්‍රඥාව සමුදයෙහි ඥාණය වේද? ප්‍රත්‍යක්ෂ කිරීමෙහි ප්‍රඥාව නිරොධයෙහි ඥාණය වේද? වැඩීමෙහි ප්‍රඥාව මාර්ගයෙහි ඥාණය වේද? දුඃඛ සත්‍යයාගේ පීඩනාර්ථය, සංස්කෘතාර්ථය සන්තාපාර්ථය, විපරිනාමාර්ථය, පිරිසිඳ දතයුතු අර්ථය වෙයි. සමුදය සත්‍යයාගේ ආයුහනාර්ථය, නිදානාර්ථය, සංයෝගාර්ථය, පලිබොධාර්ථය ප්‍රහාණය කළ යුතු අර්ථය වෙයි. නිරෝධ සත්‍යයාගේ නිස්සරණාර්ථය, විවේකාර්ථය, අසංස්කෘතාර්ථය, අමෘතාර්ථය, ප්‍රත්‍යක්ෂ කළයුතු අර්ථය වෙයි. මාර්ග සත්‍යයාගේ නෛර්‍යාණිකාර්ථය, හෙත්වර්ථය, දර්ශනාර්ථය, අධිපතෙය්‍යාර්ථය, වැඩිය යුතු අර්ථය වෙයි. එය දැනීම් අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් පිරිසිඳ දතයුතු අර්ථයෙහි ප්‍රඥාව දුක්ඛයෙහි ඥාණ නම් ප්‍රහාණාර්ථයෙහි ප්‍රඥාව සමුදයෙහි ඥාණය නම් ප්‍රත්‍යක්ෂ කටයුතු අර්ථයෙහි ප්‍රඥාව නිරෝධයෙහි ඥාණ නම්. වැඩීමෙහි ප්‍රඥාව මග්ග ඥාණ නම්." – ප. ම. (සිං. ප.)

දුක්ඛ ඤාණාදී ඤාණ සතර, එක් එක් සත්‍යයෙක් ඇත්තා වූ නො වෙනස් වන තේරුම් සතර සතර බැගින් තේරුම් දසසයක් පිළිබඳව පවත්නා වූ නුවණ සතරක් බව මෙයින් පැහැදිලි වෙයි

එයින් දුඃඛ සත්‍යයෙහි නො වෙනස් වන තේරුම් සතරෙකි. එනම් පෙළීම, සකස්කළ බව තැවීම, වෙනස් වීම, යන සතරයි. මේ සතර කිසිදු දිනක වෙනස් නො වේ. එහෙයින් පරම සත්‍යයෙකි දුක, නො පෙලෙයි නම් නො සිදුවන කරුණකි එසේම තමා විසින් ම පල ලැබෙන සේ කුශලාකුශල කර්ම වශයෙන් සකස් කළ බව ද නො වෙනස් වන්නකි තැවීම ද එසේ ම ය, දුක, සැප, දෙකක් ලොව පැවතුනත් සැප නැතිවී යාම නිසා දුකක් ම වන හෙයින් දුක මිසක් සැපක් නො මැති බව දතයුතු ය. සැප දුකට ම පෙරළීම විපරිනාම දුකයි. මෙසේ දුඃඛ සත්‍යය පිළිබඳ තථ, අවිතථ, අර්ථ සතරෙකි. සමුදය සත්‍යයෙහි නො වෙනස් වන තේරුම් සතරෙකි. රැස් කිරීම, මුල් හේතුවීම, යෙදීම, පළිබෝධය - කරදර යනුයි. මේ සතර සමුදය සත්‍යයාගේ තථ අවිතථ, අර්ථයෝයි. නිරෝධ සත්‍යයෙහි එනුයේ නික්මීම, විවේකය, සකස් නො කළ බව, අමාව, යන සතරයි. නිවණ සියලු දුකින් හා කෙලෙසුන් ගෙන් නිදහස් වූවක් නිසා එහි නිශ්සරණ - නික්මීම - අර්ථ පවතී. කාය - චිත්ත - උපධි ත්‍රිවිධ විවේකයෙන් ම යුක්ත හෙයින් විවේකාර්ථය පවතී - කිසිව කින් සකස් නො කළ දෙයක් නිසා අසංඛතාර්ථ පවතී. නො මැරෙන (අස් නො වන) හෙයින් අමෘතාර්ථ පවතී. මාර්ග සත්‍යයෙහි නිවණට ම පමුණුවන බව, හේතුවීම, දැකීම, මුල්වීම බව, යන සතර නො වෙනස් වන කරුණුයි සෝවාන් මාර්ගයට පත් වූ විට ආර්ය අෂ්ටාඞ්ගික මාර්ග සම්පූර්ණ වෙයි. එහෙයින් එයට පැමිණි විට නිවන් තෙක් ම ගමන් කෙරෙන නිසා මාර්ග සත්‍යයෙහි නෛර්යාණිකාර්ථය - නිර්යාණටය - පවතී. එසේ ම නිවණට හේතු වීම නිසා හෙත්වර්ථ පවතී. නිර්වාණය දැකීම නිසා දර්ශනාර්ථය ද, නිවන් ලැබීමෙහිලා ප්‍රධාන වන හෙයින් ආධිපතෙය්‍යාර්ථ ද පවතී.

මෙසේ දක්වූ සොළොස් ආකාර අර්ථයෝ චතුරාර්ය සත්‍යයන් කෙරෙහි පවත්නා ලක්ෂණ වශයෙන් එක්නෝන්‍ය. ඒ එසේම ය. "දුක්ඛ දස්සනෙනෙව පීළනට්ඨො" දුක දැකීමෙන් ම පෙළීම අර්ථ සත්‍ය ලක්ෂණයෙකි. "දුක්ඛාසුභාන සමුදය දස්සනෙන සඞ්ඛතට්ඨො" දුක රැස්කරන හේතුව දැකීමෙන් සකස් කළ අර්ථ සත්‍ය ලක්ෂණයෙකි. සබ්බකිලෙස සන්තාප පහරන සුසීතල මග්ග දස්සනෙන සන්තාපට්ඨො" සියලු කෙලෙස් දැවිලි නැතිකරණ,

නො සිසිල් වූ මඟ දැකීමෙන් තැවීම් අර්ථය සත්‍ය ලක්‍ෂණයෙකි. ‘‘අවිපරිණාම ධම්ම නිරෝධ දස්සනෙන විපරිණාමට්ඨෝ’’ නො වෙනස්වන දහම වූ නිවණ දැකීමෙන් පෙරළෙන අර්ථය සත්‍ය ලක්‍ෂණයෙකි මෙසේ දුඃඛ සත්‍ය කෙරෙහි මේ සත්‍ය ලක්‍ෂණ සතර පවතියි. එසේ ම දුඃඛ සත්‍ය ලක්‍ෂණ දකීත් ම චතුරාර්‍ය්‍ය සත්‍යයන් ම දක්නා හා සමාන බව වේ අටුවා විවරණයෙන් පැහැදිලි වෙයි. ‘‘යො දුක්ඛං පස්සති සො දුක්ඛ සමුදයම්පි’’–පෙ– වශයෙන් ආයේ එහෙයිනි.

සමුදය සත්‍යයෙහි; ‘‘සමුදය දස්සනෙනෙව ආයූහනට්ඨෝ’’ හේතුව දැකීමෙන් ම රැස්කිරීම් අර්ථය ද, ‘‘සමුදයානුගත දුක්ඛ දස්සනෙන නිදානට්ඨෝ’’ හේතුයෙන් රැස්කරන ලද දුක දැකීමෙන් මුල් කරුණ යන අර්ථය ද, ‘‘විසංයොගභූත නිරෝධ දස්සනෙන සංයොගට්ඨෝ’’ යොදන තියක් නැති නිවණ දැකීමෙන් යොදවන අර්ථය ද, ‘‘නිය්‍යානභූතමග්ගදස්සනෙන පලිබොධට්ඨෝ’’ නිවණට පමුණුවන්නා වූ මඟ දැකීමෙන් වලක්වන, අර්ථය ද, යන සතර සත්‍යලක්‍ෂණයෝයි. මෙහි ද චතුරාර්‍ය්‍ය සත්‍ය ම දිස්වෙයි. අර්ථ සතරක් වූයේ එහෙයිනි.

නිරෝධ සත්‍යයෙහි; ‘‘නිරොධ දස්සනෙනෙව නිස්සරණට්ඨෝ’’ නිවණ දැක්මෙන් ම කෙලෙසුන් ගෙන් හා සසර දුකින් ද නික්මීම් අර්ථය ද, ‘‘අවිවෙකභූත සමුදය දස්සනෙන විවෙකට්ඨෝ’’ විවේකයක් නැති හේතුව - නතරවීමක් නැතිව ම දුක් උපදවන හේතුව-දැකීමෙන් විවේක අර්ථය ද, සඞ්ඛත භූත මග්ගදස්සනෙන අසඞ්ඛතට්ඨෝ’’ රැස්කරන ලද මඟ දැකීමෙන් හේතුවෙන් නොහටගත් බව, අර්ථය ද, ‘‘විසභූත දුක්ඛදස්සනෙන අමතට්ඨෝ’’ විස වූ දුක දැකීම නිසා මරණය නැති බව යන අර්ථය ද, යන මොවුහු සත්‍ය ලක්‍ෂණයෝය. මෙහි ද චතුරාර්‍ය්‍ය සත්‍යය ගැබ් වෙයි.

මාර්ග සත්‍යයෙහි: ‘‘මග්ගදස්සනෙන නිය්‍යානට්ඨෝ’’ මඟ දැකීමෙන් නිවණට පමුණුවන අර්ථය ද ‘‘නිබ්බාණසම්පත්තියා අහෙතු භූත සමුදයදස්සනෙන හෙතට්ඨෝ’’ නිවන් සම්පත් නිසා දුක් ඉපදීමට හේතුවක් නොමැත්තා වූ හේතුව දැකීමෙන් නිවණට කරුණු යන අර්ථය ද, ‘සුදුද්දස නිරෝධ දස්සනෙන දස්සනට්ඨෝ’’ දැකීමට ඉතා අපහසු නිවණ දැකීම නිසා දැකීම අර්ථය ද ‘‘කපණජනසදිසදුක්ඛදස්සනෙන උළාරකුල සදිසො ආධිපතෙය්‍යට්ඨෝ’’ (පාතුභවනි) දිළිඳු දන සම වූ දුක දැකීම

නිසා, මහත් කුල සම වූ ඉසුරු බැම් ප්‍රධානත්වයද – යන අර්ථය ද (පහළවෙයි) යන මොවුහු සත්‍ය ලක්ෂණයෝයි. මෙයද චතුරාර්‍ය්‍ය සත්‍ය ම වේ.

මෙසේ සොළොස් වැදෑරුම් අර්ථයෝ සත්‍යයෙන් සත්‍යය ගලපා අනුලෝම ප්‍රතිලෝම වශයෙන් බැලුව ද චතුරාර්‍ය්‍ය සත්‍යයන් පෙනෙන සේ එකට සම්බන්ධ කොට පවතින්නෝය එහෙයින් එක් ඤාණයක් දක්වීමේ දී සෙසු ඤාණ තුනම සම්බන්ධවෙයි. සෙසු ඤාණත් මෙසේ ම ය. කරුණු මෙසේ හෙයින් මේ ඤාණ සතරම එකට ම විස්තර කළෙමි.

## දුක්ඛ ඤාණය, දුක්ඛ සමුදය ඤාණය, දුක්ඛ නිරෝධ ඤාණය, දුක්ඛ නිරෝධගාමිනී පටිපදා ඤාණය, (60, 61, 62, 63)

“කෙසේ නම් දුක්ඛයෙහි ඤාණය, දුක්ඛ සමුදයෙහි ඤාණය, දුක්ඛ නිරෝධයෙහි ඤාණය, දුක්ඛ නිරෝධගාමිනී පටිපදායෙහි ඤාණය වේද? මාර්ගයෙන් යුක්ත වූවහු ගේ යම් ඤාණයක් වේ නම් එය දුක්ඛයෙහි ඤාණය ද වෙයි. දුක්ඛ සමුදයෙහි ඤාණය ද වෙයි. දුක්ඛ නිරෝධයෙහි ඤාණය ද වෙයි, දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදාවෙහි ඤාණය ද වෙයි” – ප. ම. (සිං. ප.)

මෙහි දක්වෙනුයේ සෝවාන් ආදී ලෝකෝත්තර මාර්ගයන්හි යෙදුනු, එක ම ප්‍රඥා චෛතසිකය දුක්ඛ ඤාණාදී සතර ඤාණයන්ට ම බෙදී ගිය බවයි. එහෙයින් ඒ පිළිබඳ විස්තර අනවශ්‍යය

චතුසච්ච ඤාණද්වය නිමි. (ඤාණ 8 යි)

## 64, 65, 66, 67, අංක ඇතුළත් වූ
## සුද්ධික පටිපදා ඤාණ චතුෂ්කය

මීට ඉහතදී දක්වූ 25, 26, 27, 28, අංකයන්ට අයත් අර්ථ පටිසම්භිදාදී චතු පටිසම්භිදාවෝ පූර්වයෝග, බහුශ්‍රැතාදී උපකාරක ධර්මයන් පුරුදු කළාවූ ඇතැම් ශ්‍රාවකයන් විසින් ද අවබෝධ කර ගනු ලැබෙත්. එහෙත් හැම ශ්‍රාවකයෙකුට ම ඒවා සාධාරණ නොවෙත්. මෙහිදීදක්වන චතුපටිසම්භිදාවෝ සියලු ආර්‍ය්‍ය ශ්‍රාවකයන්ට ම සාධාරණ ධර්මවෙත්. මක්නිසා ද? චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් පිළිබඳව පවත්නා හෙයිනි. සත්‍යධර්මයන් කෙරෙහි පවතින අර්ථ, ධර්ම නිරුක්ති, ප්‍රතිභාන, ඥාන සතර සත්‍යාවබෝධයත් සමඟ ම ලැබේ.

"යස්මා චං අනන්තරං උද්දිට්ඨං දුක්ඛාරම්මණං නිරොධාරම්මණඤ්ච අත්ථපටිසම්භිදා හොති, සමුදයාරම්මණං මග්ගාරම්මණඤ්ච ධම්මපටිසම්භිදා හොති, තදභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා, තෙසු ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා, තස්මා තම්පි අත්ථවිසෙසං දස්සෙතුං සුද්ධිකපටිසම්භිදාඤාණානි උද්දිට්ඨානීති වෙදිතබ්බානි" - ප. ම. අ.

යම් කරුණක් නිසා ඉහතින් කී අර්ථප්‍රතිසම්භිදාදී ඤාණ සතරට අනුව දක්වන ලද දුක්ඛාරම්මණය, නිරොධාරම්මණය, යන අරමුණු දෙක පිළිබඳ ඥානය අර්ථප්‍රතිසම්භිදා වේ ද, සමුදයාරම්මණය, මාර්ගාරම්මණය යන දෙක පිළිබඳ ඥානය ධර්මප්‍රතිසම්භිදා වේ ද, එය (වචන සෑදුනු අයුරු) කීමෙහි නුවණ නිරුක්ති ප්‍රතිසම්භිදා වේ ද, ඒ ත්‍රිවිධ ඥානයන්හි ඥානය ප්‍රතිභාන ප්‍රතිසම්භිදා වේ ද, එහෙයින් ඒවා හි ද අර්ථ විශේෂය - තේරුම් වෙසෙස දැක්වීමට ශුද්ධික ප්‍රතිසම්භිදා ඥානයෝ උදෙසන ලදහයි දතයුතු. කරුණු මෙසේ හෙයින් ඒ ඤාණ නැවත දක්වනුයේ චතුරාර්‍ය සත්‍යාවබෝධයත් සමඟ ම පවතින හෙයිනි.

**චතුපටිසම්භිදාවෝ:**

"අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා, ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, අත්ථධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා, අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදා - පෙ - පඤ්ඤාපකාසනෙ පඤ්ඤා පටිභාණපටිසම්භිදා"

මෙහි ප්‍රභේද - බෙදීම් - දශයෙකි. උද්දෙස, නානත්ත, වවත්ථාන, සල්ලක්ඛණ, උපලක්ඛණ, පභෙද, පභාවන, ජෝතන විරෝචන, පකාසන යනුයි. එහි උද්දෙස යනු මාතෘකාව තැබීම යි. නොයෙක් ආකාරය නානත්ත යි. පිරිසිඳ දැනීම වවත්ථානයි. හැම අයුරින් ම දැකීම සල්ලක්ඛණයි. එය ම බොහෝ කොට දැකීම උපලක්ඛණ පදයෙන් දර්ශිතයි. බෙදා දැක්ම පභෙද නමි. ප්‍රකට කිරීම පභාවනයි. ජෝතනය නම් දැක්වීම යි. නොයෙක් අයුරින් දැක්වීම විරෝචන යි. ප්‍රකාශ කිරීම පකාසන නමි.

එහි අර්ථයන්හි ඥානය අර්ථපටිසම්භිදා නමි. ධර්මයන් හි ඥානය ධම්මපටිසම්භිදා නමි. නිරුක්තීන්හි ඥානය නිරුත්තිපටිසම්භිදා නමි. ඥානයන්හි ඥානය පටිභාන පටිසම්භිදා නමි. මේ උද්දෙස ක්‍රම සතරයි, අර්ථ නානත්වයෙහි ප්‍රඥාව අර්ථපටිසම්භිදා

නම්, ධර්ම නානත්වයෙහි ප්‍රඥාව ධම්මපටිසම්භිදා නම්. නිරුක්ති නානත්වයෙහි ප්‍රඥාව නිරුත්ති පටිසම්භිදා නම්. ප්‍රඥා නානත්වයෙහි ප්‍රඥාව පටිභාන පටිසම්භිදා නම්. මේ නානත්වක්‍රම සතරයි. මේ අනුරින් සෙසු ක්‍රම ද යොදගත යුතු. ඒ සියල්ල සතළිසෙකි. එය දන්නා අර්ථයෙන් ඥාණ නම්. ප්‍රකාරයෙන් දැනීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එහෙයින් අර්ථාදී ප්‍රතිසම්භිදාවන්හි යෙදුනු ප්‍රඥාව සුද්ධිකපටිසම්භිදා ඥාණ නම් වෙයි.

සුද්ධික පටිසම්භිදා ඥාණ චතුක්කය නිමි.

මෙතෙක් විස්තර කළ සත්සැට (67) ඥාණයෝ ශ්‍රාවකයන් වහන්සේලාටත් සාධාරණයෝය. ශ්‍රාවක විෂයෙහි ද පවතිත්. එහෙත් මේ ඥාණ ඉපදීමෙහිලා මූලිකත්වය අයත් වනුයේ ශාස්තෘ නායක බුදුරජාණන් වහන්සේටමය. ශ්‍රාවකයෝ උන් වහන්සේලාගේ දේශනා අනුසාරයෙන් ලබන්නෝ වෙත්. එහෙයින් සියලු ඥානයන් ගෙන් අග තැන්පත් වනුයේ බුදුපියාණෝ ම ය.

“සො හි භගවා මහාපඤ්ඤො, පුථුපඤ්ඤො, හාසපඤ්ඤො, ජවනපඤ්ඤො, තික්ඛපඤ්ඤො, නිබ්බෙධිකපඤ්ඤො, පඤ්ඤාපභෙදකුසලො පභින්න ඤාණො අධිගත පටිසම්භිදො චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො අනන්ත ඤාණො අනන්ත තෙජො අනන්ත යසො අඩ්ඪො මහද්ධනො ධනවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛතා පසාදෙතා” – මහානිද්දෙස.

සාධාරණ ඥාණ නිමි.

# 26 අවසාන පරිච්ඡේදය

## ෂඩ් අසාධාරණ ඥාන

ඉන්ද්‍රිය පරෝපරියත්ති ඤාණය ආසයානුසය ඤාණය, යමක පාටිහීරඤාණය, මහාකරුණාසමාපත්ති ඤාණය, සබ්බඤ්ඤුත ඤාණය, අනාවරණ ඤාණය, මේ සය ෂඩ් අසාධාරණ ඥානයෝ නම් වෙත්. මොවුහු බුදුරජාණන් වහන්සේලාටම සාධාරණ වෙත්. ශ්‍රාවකයනට විෂය නොවෙති යනු අදහසයි. එසේම බුදුරජාණන් වහන්සේලාටම "ආවේණික" වෙත් ආවෙණික නම් වෙනම පැවැත්මයි. "ආවෙණිකානීතිවිනිබ්භූතානි විසුංභූතානි" - ප. ම, ගණිසීපද, ඒ ඥානයන්හි පටිපාටිය - පිළිවෙල - මෙසේය.

"තස්මාපි යස්මා තථාගතා සත්තානං ධම්මදෙසනාය භාජනාභාජනත්තං ඔලොකෙන්තා බුද්ධචක්ඛුනා ඔලොකෙන්ති. බුද්ධචක්ඛු නාම ඉන්ද්‍රියපරොපරියත්තාසයානුසය ඤාණද්වය මෙව. යථාහ අද්දසා ඛො භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ'ති ආදි සත්තසන්තානෙව ඔලොකෙන්තො පඨමං ඉන්ද්‍රිය පරොපරිපාකං ඔලොකෙන්ති. ඉන්ද්‍රිය පරිපාකඤ්ච ඤත්වා ආසයාදීනං අනුරූපෙන ධම්මදෙසනත්ථං තතො ආසයානුසය චරිතානි ඔලොකෙන්ති තස්මාපි පඨමං ඉන්ද්‍රිය පරොපරියත්ති ඤාණං උද්දිට්ඨං. තදනන්තරං ආසයානුසය ඤාණං. ධම්මං දෙසෙන්තාව යස්මා පාටිහාරියෙන විනෙතබ්බානං පාටිහාරියං කරොන්ති. තස්මා ආසයානුසය ඤාණානන්තරං යමකපාටිහීරෙ ඤාණං උද්දිට්ඨං. ඉමෙසං තිණ්ණං ඤාණානං හෙතුපරිදීපනත්ථං තදනන්තරං මහාකරුණා ඤාණං. මහාකරුණා ඤාණස්ස පරිසුද්ධභාවදීපනත්ථං තදනන්තරං සබ්බඤ්ඤුත ඤාණං උද්දිට්ඨං. සබ්බඤ්ඤුතා'පි සබ්බධම්මානං ආවජ්ජන පටිබද්ධභාවපරිදීපනත්ථං සබ්බඤ්ඤුත ඤාණස්ස අනාවරණභාව පරිදීපනත්ථඤ්ච තදනන්තරං අනාවරණ ඤාණං උද්දිට්ඨන්ති වෙදිතබ්බං." ප. ම. අ.

ඒ ෂඩ් අසාධාරණ ඥානයන්හි ද, යම් හෙයකින් තථාගතයෝ සත්වයන්ට ධර්මදේශනා කිරීම සඳහා සුදුසු නුසුදුසු බැව් බලනුවෝ බුදු ඇසින් බලත් ද. බුදු ඇස - බුද්ධචක්ඛු යනු ඉන්ද්‍රිය පරෝපරියත්ත - ආසයානුසය - යන ඤාණ දෙකම ය. එයින් කීහ. 'භාග්‍යවතුන්වහන්සේ බුදු ඇසින් ලොව බලනුයේ කෙලෙස් අඩු - වැඩි, තියුණු ඉඳුරන් ඇති - නැති, ආදීන් දුටුසේක. (මේ භව්‍ය අභව්‍ය - සුදුසු නුසුදුසු පුද්ගලයන් බලත් යන්නට උදාහරණයයි) (ඉක්බිති) සත්වයන්ගේ ද සිත් බලනුවෝ පළමු කොට ඉඳුරන්ගේ පැසුණු නොපැසුණු බව් බලත් ද, ඉඳුරන්ගේ පිරිපුන් බව දැන ආසය ආදීන්ට සුදුසු වූ පරිද්දෙන්ම ධර්මදේශනා කිරීම පිණිස, ඊටපසු ආසය - අනුසය - චරිත බලත් ද මේ කරුණු නිසා පළමු කොට ඉන්ද්‍රිය පරෝපරියත්ති ඤාණය දක්වන ලදි. ඊට අනතුරුව ආසයානුසය ඤාණය" දක්වන ලදි. ධර්මදේශනා කරනුවෝ යම් හෙයකින් ප්‍රාතිහාර්යයෙන් හික්මවියයුතු පුද්ගලයන්ට ප්‍රාතිහාර්ය පාත්ද, එහෙයින් ආසයානුසය ඤාණයට අනතුරුව පාටිහීර ඤාණය දක්වන ලදී. මේ ඥානත්‍රයෙහි හේතුව දැක්වීම සඳහා ඊට අනතුරුව මහා කරුණා ඤාණය දක්වන ලදී. එහිද පිරිසිදු බව දැක්වීම පිණිස ඊට අනතුරුව සබ්බඤ්ඤුත ඤාණය දක්වන ලදී. සර්වඥයන්ගේ ද සියලු ධර්මයන් පිළිබඳ ආවර්ජනා ප්‍රතිබද්ධ භාවය සිහිකිරීමේදී එකවරම සම්බන්ධ වූ බව - දැක්වීම පිණිස, සර්වඥතා ඥානයෙහි අවහිර කමක් නැතිබව දැක්වීම සඳහා ඊට අනතුරුව අනාවරණ ඤාණය දක්වන ලදීයයි දතයුතු. මේ ඥාන පටිපාටියයි.

**එයින් පළමුවැන්න ඉන්ද්‍රියපරෝපරියත්ති ඤාණයයි.**

## 68. ඉන්ද්‍රියපරෝපරියත්ත ඤාණය.

ධර්ම දේශනා කිරීමෙන් හික්මවා ගතහැකි සත්වයන් කෙරෙහි ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්ම කෙතෙක් දුරට බලපවත්තේදැයි ඉන්ද්‍රියන්ගේ උස් - පහත්කම් බලා දැන ගන්නා වූ නුවණ ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤාණ නම් මේ සාමාන්‍ය හැඳින්වීමයි. විස්තර මෙසේය. මෙහි "පරෝපරියත්ත" යනු උස් - පහත් බවයි. නැතහොත් අඩු - වැඩි කමයි 'පරානි ච අපරානි ච පරාපරානී නිවත්තනබෙබ සන්ධිවසෙන රොකාරං කත්වා පරෝවරානීති වුච්චති, පරෝපරානං භාවො පරෝපරියං, පරෝපරියමෙව පරෝපරියත්තං" මෙහි "පර" ශබ්දය උත්තමාර්ථයෙහි යෙදිණ. එහෙයින්

පර ශබ්දයාගේ බහුවචනය ගෙන "පරාති" යැයිද, විරුද්ධාර්ථය ගෙන අපරාතියැයි ද දක්විණ. ඒ පද දෙක ද්වන්ද්ව සමාස ක්‍රමයෙන් සමාස කර, සන්ධි කළවිට "පරාවරාති" යි එයි. ( මෙහි ප අක්ෂරය ව වි.) මෙසේ කිවයුතු කල්හි නැවත සන්ධි වශයෙන් "රෝ" කාරයක් කොට. "පරෝවරාති" යි කියනු ලැබේ එයම භාවාර්ථයට පමුණුවා "පරෝපරියං" යි දක්වා ස්වාර්ථයෙහි "තත" ප්‍රත්‍යය කොට පරෝපරියත්ත යැයි දක්විණ. මේ පද සාධනයයි. අදහස: උස් - පහත් බව යනු මැයි.

"වෙනෙය්‍ය සත්තානං සද්ධාදීනං පඤ්චන්නං ඉන්ද්‍රියානං පරෝපරියත්තං ඉන්ද්‍රිය පරෝපරියත්තං ඉන්ද්‍රියපරෝපරියත්තස්ස ඤාණං ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤාණං" හික්මයුතු සත්වයන් පිළිබඳ වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියන් පස්දෙනාගේ උස් - පහත් බව "ඉන්ද්‍රිය පරෝපරියත්ත" නමි. පිළිබඳ යෙදුනු නුවණ ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤාණයයි. මෙසේ ඉන්ද්‍රියපරෝ, පරියත්ත ඤාණය යන පදය සෑදී ඇත. තවත් මේ පදය පිළිබඳ විග්‍රහ ක්‍රම අටුවාවෙහි ඇත ද, මෙම ක්‍රමය ප්‍රමාණවත් වේ යනු මගේ හැඟීමයි. මක්නිසාද ? මෙයින් හැම අයුරින්ම ඉන්ද්‍රියපරෝපරියත්ත ඤාණය යන්නෙහි තේරුම පැහැදිලි වූ හෙයිනි. සෙසු ක්‍රමයන්හි එනුයේ පරියාය වචනයි.

"කෙසේ නම් තථාගතයන් වහන්සේ සත්වයන් තුළ (පවත්නා) ඉන්ද්‍රියන්ගේ උතුම් බව, හීන බව දැනගන්නා ඤාණය වේද? තථාගතයන් වහන්සේ ස්වල්පරාගාදි රජස් ඇත්තාවූ ද මහත් රාගාදී රජස් ඇත්තාවූ ද තියුණු ඉන්ද්‍රිය ඇත්තාවූ ද මෘදු ඉන්ද්‍රිය ඇත්තාවූ ද යහපත් ආකාර ඇත්තාවූ ද අයහපත් ආකාර ඇත්තාවූ ද පහසුවෙන් අවබෝධ කළ හැක්කාවූ ද පහසුවෙන් අවබෝධ නොකළ හැක්කාවූ ද ඇතැම් පරලොව සහ වරදෙහි භය දක්නාවූ ද ඇතැම් පරලොව සහ වරදෙහි භය නො දක්නාවූ ද සත්වයන් දක්නාහ." ප. ම. (සිං. ප )

මෙහි ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤාණය යනුවෙන් පැහැදිලි කළේ, බුද්ධ ඥානයෙන් ලොව දෙස බලා අල්පරජස්කාදී වශයෙන් පුද්ගලයන් බෙදා දැනගැනීමේ විශේෂ ඥානය වශයෙනි. එහිලා පුද්ගලයෝ දසාකාර වෙත්. එනම් අප්පරජක්ඛ, මහාරජක්ඛ, තික්ඛින්ද්‍රිය, මුදින්ද්‍රිය, ස්වාකාර, ද්වාකාර, සුවිඤ්ඤාපය, දුවිඤ්ඤාපය, අප්පෙකච්චෙ පරලොක වජ්ජභය දස්සාවී, අප්පෙ

සංවෙග පරලෝකවජ්ජභයදස්සාවී, යනුයි. රාගාදී කෙලෙස් නමැති රජස් අඩු අය අප්පරජක්ඛ නම්. වැඩි අය මහාරජක්ඛ නම්. මෙයින් ශ්‍රද්ධා, වීර්‍ය, ස්මෘති, සමාධි, ප්‍රඥා, යන ඉන්ද්‍රිය ධර්ම අතුරෙන් එකක් හෝ ඇති පුද්ගලයෝ අප්පරජක්ඛ ගණයට ගැනෙත්, ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයනට විරුද්ධ ධර්ම වූ අසද්ධා, කුසීත, මුට්ඨස්සති, අසමාහිත, දුප්පඤ්ඤ, යන මොවුන් අතුරෙන් එකක් හෝ ඇති පුද්ගලයෝ මහාරජක්ඛ ගණයට ගැනෙත්. “සද්ධො පුග්ගලො තික්ඛින්ද්‍රියො, අසද්ධො පුග්ගලො මුදින්ද්‍රියො” යනාදී වශයෙන් සෙසු පුද්ගල භේදයන් ද මෙසයින් දත යුතු. තික්ඛින්ද්‍රියාදී පදයන්හි තේරුම ඉහත දක්වා ඇත.

බුදුරජාණන් වහන්සේ මෙසේ පුද්ගලයන් දස අයුරින් බලා ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් අතුරෙන් එකක් නමුදු ඇති සත්වයන් විනෙය- නික්මවිය යුතු - ජනයා හැටියට වෙන් කළ සේක. එහෙයින් ඒ ඉන්ද්‍රියන්ගේ උස් - පහත් බැව් දක්නා බුද්ධ ඥානය ඉන්ද්‍රිය පරොපරියත්ත ඥාණයයි.

එයින් කීහ බුත්සරණයෙහි:

“ප්‍රඥා චක්‍ෂුසැ හුණු “ලෝභයැ ද්වෙෂයැ මෝහයැ මානයැ දෘෂ්ටියැ විචිකිත්සායැ ස්ත්‍යානයැ ඖද්ධත්‍යයැ පාපයෙහි ලජ්ජා නැති බවයැ පාපයෙහි භය නැති බවයැ’යි කියන ලද දශ ක්ලේශයන් විසින් මහාරජස්ක වූ සත්ත්වයන් දත්නා නුවණද මෙම ක්ලේශයන් අනාසෙවිත - අභාවිත - අබහුලීකෘත හෙයින් අල්ප රජස්ක වූ සත්ත්වයන් දත්නා නුවණ ද, අනාසෙවිත - අභාවිත - අබහුලීකෘත - අනුත්සදකෘත වූ ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියන් විසින් මෘදුවූ ඉන්ද්‍රියන් ඇති සත්වයන් දත්නා නුවණ ද, ආසෙවිත - භාවිත - බහුලීකෘත උත්සදකෘත වූ ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියන් විසින් තීක්‍ෂණෙන්ද්‍රිය වූ සත්වයන් දත්නා නුවණ ද......”

මෙහි “ප්‍රඥා චක්‍ෂුසැ හුණු” යනු නුවණ නමැති දෑසෙහි වැටුණු යනු තේරුමයි. ස්ත්‍යාන - ථිනය, අනාසෙවිත - සේවනය නොකරන ලද, අනුත්සදකෘත - වැඩි නොකළ; මේ නො තේරෙන පදයි.

ඉන්ද්‍රියපරොපරියත්ත ඥාණය නිමි.

## 69. ආසයානුසය ඥාණය

සත්වයන්ගේ සිත් තුළ පවත්නා වූ ආශය, අනුශය දැන ගැනීමෙහි බුද්ධ ඥානය ආසයානුසය ඥාණය නම්. මෙහි ආශය යනු කාමාදී කෙලෙස් හෝ නෛෂ්ක්‍රම්‍යාදී කුසල් හෝ ලැගිගෙන

මෙන් පවත්නා වූ සිතයි. ආසයන්ති නිස්සයන්ති එතං ඉති ආසයො" මෙයට අවුත් අවුත් ලැගෙන් අසුරු කරත්නුයි ආසය නම් "සම්මා දිට්ඨියා මිච්ඡා දිට්ඨියා වා කාමාදීහි නෙක්ඛම්මාදීහි වා පරිභාවිතස්ස සන්තානස්සෙතං අධිවචනං." සම්‍යක් දෘෂ්ටියෙන් හෝ මිථ්‍යාදෘෂ්ටියෙන් හෝ කාමාදියෙන් හෝ නෛෂ්ක්‍රම්‍යාදියෙන් හෝ පරිභාවිත - භාත්පපසින්ම අසුරු කරන ලද චිත්ත සන්තානයට - සිතට - මේ නමකි. මෙයින් පැහැදිලි කරනුයේ සත්වයන්ගේ සිත් තුල නිතර නිතර ගැවසෙමින් සේවනය කරමින් පවත්නා මනා අදහස් හෝ නරක අදහස් හෝ ආසය නම් යනුයි. එයින් කීහ.

"සස්සතුච්ඡෙද දිට්ඨි ච - ඛන්ති චෙවානුලොමිකා
යථාභූතඤ්ච යං ඤාණං - එතං ආසය සඤ්ඤිතං."

ශාස්වත - උච්ඡේද දෘෂ්ටිය - මිථ්‍යා දෘෂ්ටිය ද, කර්මවිපාකාදියට හා ප්‍රත්‍යයසමුත්පාදයට ද, අනුකූලව වැටහීම ද, නාමරූපයන් තත්වාකාරයෙන් (ඇති සැටියෙන්) දක්නා වූ යථාභූත ඥානය ද, යන මේ හොඳ අදහස් හා නරක අදහස් "ආසය" යනුවෙන් හඟිනා ලදී. සලකන ලදී.

අනුසය නම් සත්වයන්ගේ සිත් තුල නිදගෙන මෙන් පවත්නාවූ කෙලෙස්වලට නමකි. "සන්තානෙ අනුසෙන්ති අනුපවත්තන්තීති අනුසයා" සත්වසන්තානයෙහි අනුව පවතිත්නුයි අනුසය නම්. මෙය තවත් පැහැදිලි කරනුයේ "ථාමගතානං කාමරාගාදීනං එතං අධිවචනං" ශක්තිමත් බවට පැමිණියාවූ කාමරාගාදියට මේ නමකියි කීහු. කාමරාගාදීහු අනාදිමත් කාලයක සිට සත්වයන්ගේ සිත් තුල වෙසෙමින් ශක්තිමත් බවට පැමිණියාහුය. ඒවා සොයා ගැනිමට නොහැකි පරිද්දෙන් සැඟව පවතින නිසා අනුසයයැයි හඳුන්වන ලදී. අනුසය ධර්ම සතකි. සූත්‍රමය ඥාණය බලන්න.

මෙසේ ආසය, අනුසය, පද දෙක සමාස වූ විට ආසයානුසය යනුවෙන් සෑදේ (ආසයො ච අනුසයො ච = ආසයානුසයො" ද්වන්ද සමාසයි.) ආසයානුසය දැනගැනීමේ බුද්ධ ඥානය ආසයානුසය ඥාණයයි.

මෙම ඥාණයටම සත්වයන්ගේ චරිත අධිමුක්ති දැනගන්නා වූ නුවණ ද ඇතුලත් වෙයි. "යස්මා චරිතාධිමුත්තියො ආසයානුසය සඞ්ගහිතා, තස්මා උද්දෙසෙ චරිතාධිමුත්තීසු ඤාණානි ආසයානුසය ඤාණෙනෙව සඞ්ගහෙත්වා ආසයානුසයෙ

ඤාණන්ති වුත්තං" යම් කාරණක් නිසා චරිත, අධිමුක්තීහු ආසයානුසයට ඇතුළත් කරන ලද්දේ ද, එහෙයින් උද්දෙසයෙහි - මාතෘකාව තැබීමෙහි. - චරිත අධිමුක්ති පිළිබඳ ඥානයත් ආසයානුසයඤාණයෙන්ම සඞ්ග්‍රහ - ගෝණු - කොට ආසයානුසය ඤාණයැයි කියන ලදී. අනුශය දනී නම් චරිත ද දන්නේ ය. චරිත, අනුශය ධර්මයන්ට අනුව පවතින හෙයිනි. එසේම ආශය දනී නම් අධිමුක්ති ද දන්නේය. අධිමුක්ති, ආශයන්ට අනුව පවත්නා හෙයිනි. එහෙයින් චරිත, අධිමුක්ති දෙක ආසයානුසය ඤාණයටම ගෝණුවෙයි.

ආසයානුසය ඤාණය විස්තර කරන විද්‍යාචක්‍රවර්තීහු:-

"ශක්‍රයා කරන මෙහෙලත් සවාමිදරුවාණෝ පරසත්වයන්ගෙ පරපුද්ගලයන්ගේ "ලෝකය නිත්‍යයැ" යි කියාද, "ලෝකය අනිත්‍යයැ"යි කියාද, "අන්තයක් ඇත්තෙයැ" යි කියා ද, "අන්තයෙක් නැත්තෙයැ" යි කියාද, "හෙමැ ජීවයැ" යි කියා ද, හෙමැ ශරීරයැ" යි කියාද, "ජීවය අනෙකෙකැ"යි කියා ද, "ශරීරය අනෙකෙකැ" යි කියා ද, "සත්වතෙමේ මරණින් මත්තෙහි වෙයි" කියා ද, "සත්වතෙමේ මරණින් මත්තෙහි නොවෙයි" කියා ද, "සත්ව තෙමේ මරණින් මත්තෙහි වන්නෙ ද වෙයි නොවන්නෙද වෙයි" කියාද, ගන්නා ශාස්වත දෘෂ්ටි උච්ඡේද දෘෂ්ටි සඞ්ඛ්‍යාත වූ ආසය දන්නා නුවණ ද, මේ අන්තද්වය දුරැකලාහට "සියලු ධර්මයෝ ප්‍රත්‍යසමුත්පන්නයහ" යි උපදනා වූ අනුලෝම ක්ෂාන්තියැ'යි ද, යථාභූත ඥානයැ'යිද කියන ලද ආසය දන්නා නුවණ ද, කාම රාගානුසය, ප්‍රතිඝානුශය, මානානුශය, දෘෂ්ට්‍යානුශය, විචිකිත්සානුශය, භවරාගානුශය, අවිද්‍යානුශයැයි කියන ලද අනුශය දන්නා නුවණ ද, පුණ්‍යාභිසංසකාරයැ අපුණ්‍යාභිසංස්කාරයැ ආනෙඤ්ජාභිසංස්කාරයැ යනාදීහු චරිත දන්නා නුවණ ද, සත්වයන් ගේ හීනාධිමුක්තිකයැ ප්‍රණීතාධිමුක්තිකයැ යනාදී වූ අධිමුක්ති දන්නා නුවණ ද,"

-බුත්සරණ 269 පිටුව,

යනුවෙන් පැහැදිලි කළහ. මෙහිද මිථ්‍යා දෘෂ්ටි ද්වය, අනුලෝම ක්ෂාන්තිය, යථාභූත ඥානය; මේවා ආශය වශයෙන් දක්විණ මෙයද පටිසම්භිදා මග්ගයෙහි එන අනුවාදයක් නිසා එහි ද මෙහිද වෙනසක් නොමැත. මීටම සම්බන්ධ කළයුතු විස්තර මෙහිලා පටිසම්භිදාමග්ග නිද්දෙස පාළියෙහි අනුවාදයක් ලෙස දක්වමි.

ශාන්ති නායක බුදුරජාණන් වහන්සේ මේ ලෝකයෙහි සත්ත්වයන්ගේ ආශය - පුරුදු දන්නාහ. අනුශය - සිත්හි ලැගගෙන පවත්නා කෙලෙස් - ද දන්නාහ. චරිත ද දන්නාහ. බලවත් කැමැත්ත - අධිමුක්ති - ද දන්නාහ. සුදුසු නුසුදුසු සත්ත්වයන් ද දන්නාහ. සත්ත්වයන්ගේ ආශය යනු කුමක් ද? පඤ්චස්කන්ධ ලෝකය නිත්‍යයැයි කියා හෝ නිත්‍ය නොවේ යයි කියා හෝ ලෝකය කෙළවර සහිතයැයි කියා හෝ කෙළවර රහිතයැයි කියා හෝ ජීවයත් එයමය, ශරීරයත් එයමය කියා හෝ සත්ත්ව තෙම - තථාගතො - මරණින් පසු ඇතැයි කියා හෝ නැතැයි කියා හෝ ඇත්තේද වෙයි නැත්තේද වෙයි කියා හෝ සත්ත්වයා මරණින් පසු නොවෙයි නොවන්නේ ද නොවෙයි කියා හෝ ගනී නම් එය ආශය නමි. මෙසේ ශාශ්වත උච්ඡේද දෘෂ්ටි දෙක ඇතුලත්ය. මෙසේ සත්ත්වයෝ භව දෘෂ්ටිය ඇසුරු කළාහු වෙත්. විභව දෘෂ්ටිය ඇසුරු කළාහු වෙත්. මේ කෙළවර දෙකට නොපැමිණ, මේ හේතුව නිසා මේ ඵලය (ඉමස්මිං සති ඉදං හොති) යන පටිච්ච සමුප්පාද ධර්මයට අනුකූල වූ නුවණ හෝ ලද්දේ වෙයි. යථාභූත ඥාණය ලද්දේ හෝ වෙයි. කම්සැප විඳින පුද්ගලයාම කාමය ගරු කරන්නෙක, කාමාශය ඇත්තෙක, කාමයෙහි බලවත් කැමැත්ත ඇතියෙකැයි දන්නාහ. කම් සැප විඳින්නහුම කාමයෙන් වෙන්වීම ගරු කරන්නෙක. කාම වෙන්වීමේ - නෛෂ්ක්‍රම්‍යය - ආශය ඇත්තෙක, කාමයෙන් වෙන්වීමේ බලවත් කැමැත්ත ඇත්තෙකැයි දන්නාහ.

එසේම නෛෂ්ක්‍රම්‍ය, අව්‍යාපාද, ආලෝකසඥා, යන ධර්මයන් ද ඉහතින් දක්වූ ක්‍රමයට පැති දෙකට අනුව යොදා ගනිමින් ආශය තේරුම් ගත යුතු.

සත්ත්වයන් තුළ පවත්නා කාමරාගාදී අනුශය ධර්ම සත අනුව ද බුදුරජාණන් වහන්සේගේ නුවණ විහිදී පවතියි. එහෙයින් "මේ සත්ත්වයාගේ කාමරාගය අධිකය, මේ සත්ත්වයාගේ කාම රාගය මදය" යනාදී වශයෙන් බලන්නාහ. මේ ආශය, අනුශය, වශයෙන් බැලීමයි.

චරිත වශයෙන් බැලීම; සත්ත්වයන්ගේ චරිත නම් කුමක් ද? ස්වල්ප විපාක ඇත්තා වූ හෝ මහා විපාක ඇත්තා වූ හෝ පුණ්‍යාභිසංඛාර, අපුණ්‍යාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර, යන සත කුශලාකුශල කර්මයෝ වෙත් ද, මෙය සත්ත්වයන්ගේ චරිත නමි.

අධිමුත්ති වශයෙන් බැලීම: සත්වයන්ගේ අධිමුක්ති නම් කවරේ ද? හීන (පහත්) අදහස් ඇති සත්වයෝ ද ඇත්තාහ. උතුම් අදහස් ඇති සත්වයෝ ද ඇත්තාහ හීන අදහස් ඇති සත්වයෝ හීන අදහස් ඇති සත්වයන් සේවනය කරත් භජනය කරත් පයිරුපාසනය කරත්. උතුම් අදහස් ඇති සත්වයෝ උතුම් අදහස් ඇති සත්වයෝ උතුම් අදහස්ඇති සත්වයන් සේවනා කරත්. භජනය කරත්. පයිරුපාසනය කරත්. අතීතයෙහිද අනාගතයෙහිද මේ කරුණ මෙසේමය. මෙය සත්වයන්ගේ අදහස නම්.

සුදුසු නුසුදුසු (භව්‍ය - අභව්‍ය) සත්වයන් වශයෙන් බැලීම, කර්මාවරණ, විපාකාවරණ, ක්ලේශාවරණ, යන ආවරණ ධර්මයන් ගෙන් යුක්ත වූවෝ ද, ශ්‍රද්ධා - කුශලච්ඡන්ද - ප්‍රඥා නැත්තෝ ද නුසුදුසු පුද්ගලයෝය. එනම් ආර්‍ය්‍ය මාර්ගයට බැස ගැනීමට (මාර්ග ඵලාවබෝධයට) නුසුදුස්සෝය. ආවරණයන්ගෙන් නිදහස් වූ ශ්‍රද්ධාදීන්ගෙන් යුක්ත වූවෝ ආර්‍ය්‍ය මාර්ග ප්‍රතිලාභයට සුදුස්සෝය. මේ තථාගතයන් වහන්සේගේ ආසයානුසය ඤාණයයි.

මෙහි කර්මාවරණ යනු ආනන්තරිය කර්ම පඤ්චකය යි. වැදූ මව් මැරීම, ජනක පියා මැරීම, රහතන් මැරීම, බුදුන්ගේ සිරුරින් ලේ සෙලවීම, සඞ්ඝභේදය යන පසයි. (මාතු-පිතු අරහන්ත ඝාතකො, ලොහිතුප්පාදකො, සඞ්ඝභෙදකො) මේ කර්ම කොට "එයින් ගැලවෙමි"යි කවර කුශලයක් කළත් පිහිටක් නො මැතිව දෙවන ආත්මයේ නිරයෙහි ම උපපත්තිය ලැබෙන බැවින් ආනන්තර්‍ය්‍ය කර්ම නම්. ආනන්තර්‍ය්‍ය යනු මේ භවයෙන් අනික් භවයට අතරක් නැත යන අදහසයි. මෙයින් එකක් හමුදු කළේ නම් ඔහුට ධ්‍යානවත් නූපදී. මාර්ග ඵල ගැන කවර කථාද? තමා විසින් කළ කර්මය නිසා මාර්ග-ඵල ලැබුමට අවිහිර වීම කර්මාවරණයයි. ආනන්තර්‍ය්‍ය කර්ම හා සමාන වූ භික්ෂුණී දූෂණය ද කර්මාවරණයට ඇතුලත් වෙයි. අහේතුක හා ද්විහේතුක ප්‍රතිසන්ධිහු විපාකාවරණයෝයි. නියත මිථ්‍යාදෘෂ්ටිය ක්ලේශාවරණයයි.

ආසයානුසය ඤාණය නිමි.

## 70. යමක ප්‍රාතිහාර්‍ය ඤාණය.

"යමක පටිහිරෙ ඤාණන්ති එකං අග්ගික්ඛන්ධ උදකධාරාදීනං අපුබ්බං අචරිමං සකිං යෙව පවත්තිතො යමකං, අස්සද්ධාදීනං පටිපක්ඛ ධම්මානං හරණතො පාටිහීරං, යමකඤ්ච තං පාටිහීරං චාති සමකපාටිහීරං"-සද්ධම්මප්පකාසනී (ප අම.)

යමක ප්‍රාතිහාර්යයෙහි ඥානය යනු මෙහි ගිනිකඳ ජලදහරාදිහු පෙර පසු නොවී ඒ මොහොතෙහිම පවත්නා බැවින් යමක නම්. අශ්‍රද්ධාදී විරුද්ධ ධර්මයන් පලවා හරින බැවින් ප්‍රතිහාර්ය යි. යමක වූයේත් ප්‍රාතිහාර්ය වූයේත් එම නුයි. යමක ප්‍රාතිහාර්ය නම් මේ "යමකපාටිහීර" පදයෙහි නිර්වචන යි. යමක ප්‍රාතිහාර්ය සඳහා යෙදුනු බුද්ධ ඥානය යමක පාටිහීර ඥානය යි. බුදුරජාණන් වහන්සේ තුළ පවත්නා වූ සෘද්ධිවිධ ඥාන බලයෙන් එකවර ගිනිකඳ, ජලකඳ විහිදුවීම් ආදී වූ දෙක දෙක බැගින් සිදුකරමින් පාන ප්‍රාතිහාර්යය-පෙළහර-යමකප්‍රාතිහාර්යය බව ඉහත කී පාඨයෙන් පැහැදිලි වෙයි. යමක ප්‍රාතිහාර්යය පානුයේ විනේය ජනයන් තුළ පවත්නා වූ අශ්‍රද්ධා, අවිශ්වාස, ශඞ්කා, ආදී විරුද්ධ ධර්මයන් පලවා හැරීමටයැ. ඒ සඳහා බුදුරජාණන් වහන්සේ මේ ප්‍රාතිහාර්යය පමණක් නොව අතිකුදු ප්‍රාතිහාර්ය දෙකක් පාන බව ධර්මයෙහි සඳහන් වෙයි. එනම් ආදේශනා පාටිහාරිය, අනුශාසනී පාටිහාරිය යනුයි.

"තීණි මෙ ඉමානි කෙවට්ට පාටිහාරියානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදිතානි. කතමානි තීණි? ඉද්ධිපාටිහාරියං ආදෙසනා පාටිහාරියං අනුසාසනී පාටිහාරියං" - දී. නි. (කෙවට්ට සූත්‍රය)

කෙවට්ටය, මේ ප්‍රාතිහාර්ය තුනක් මා විසින් තෙමේම විශිෂ්ට ඥානයෙන් සාක්ෂාත්-අවබෝධ-කොට ප්‍රකාශ කරන ලදී. කවර නම් තුනක් ද? සෘද්ධි ප්‍රාතිහාර්යය, ආදේශනා ප්‍රාතිහාර්යය, අනුශාසනී ප්‍රාතිහාර්යය, යනුයි. මේ සූත්‍රයෙහි සෘද්ධි ප්‍රාතිහාර්යය දක්වනුයේ සෘද්ධිවිධ ඥානයෙහි ආ පරිද්දෙනි. ආදේශනා ප්‍රාතිහාර්යය යනු ඒ ඒ පුද්ගලයන් ගේ යම් යම් දේ සිතීම වශයෙන් "විතර්කණය" කරන අවස්ථාවේදී, ඒ විතර්කණ ශබ්දය - විතක්ක විප්ඵාර සද්දං - ප්‍රකෘති කණින් හෝ අභිඥා වූ දිව කණින් හෝ අසා "මොහු මෙබන්දක් සිතුවේය" යනාදි වශයෙන් සිතුදැ කියා පෑමෙන් කරනු ලබන ප්‍රාතිහාර්යය යි. "මෙසේ සිතවු, මෙසේ නො සිතවු, මෙසේ මෙනෙහි කරවු, මෙසේ මෙනෙහි නො කරවු, මෙවා පුරුදු කරවු," යනාදී වශයෙන් සත්වයන් ගේ හිතසුව සඳහා, කරනු ලබන අනුශාසනා අනුශාසනී ප්‍රාතිහාර්යය යි. මේ ප්‍රාතිහාර්යය පුරා අවුරුදු පන්සාළිසක් (45) ම පෑ සේක. මෙසේ ප්‍රාතිහාර්ය තුනෙකි. සියලු ප්‍රාතිහාර්යයන් ගෙන් ම සිදුවනුයේ සත්වයන් තුළ පවත්නා අශ්‍රද්ධාදී විරුද්ධ ධර්මයන් දුරුවීමකි. මොවුන් අතු

මෙරත් යමක ප්‍රාතිහාර්‍ය්‍ය බුදුරජාණන් වහන්සේලාට ම ආවේණික වූ සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය මැයි. මෙයම යමක ප්‍රාතිහාර්‍ය්‍යට හර වත්.

## යමක ප්‍රාතිහාර්‍ය්‍ය විලාශය.

"ඉධ තථාගතො යමකපාටිහීරං කරොති, අසාධාරණං සාවකෙහි. උපරිම කායතො අග්ගික්ඛන්ධො පවත්තති. හෙට්ඨිම කායතො උදකධාරා පවත්තති හෙට්ඨිම කායතො අග්ගික්ඛන්ධො පවත්තති. උපරිම කායතො උදකධාරා පවත්තති. පුරත්ථිම කායතො -පෙ- පච්ඡිම කායතො -පෙ- එකෙක ලොමකූපතො අග්ගික්ඛන්ධො පවත්තති. එකෙක ලොමකූපතො උදකධාරා පවත්තති. ඡබ්බණ්ණානං නීලානං පීතානං ලොහිතානං ඔදාතානං මඤ්ජෙට්ඨානං පභස්සරානං පවත්තති භගවා චඞ්කමති. නිම්මිතො තිට්ඨති වා නිසීදති වා. සෙය්‍යං වා කප්පෙති පෙ නිම්මිතො සෙය්‍යං කප්පෙති, භගවා චඞ්කමති වා තිට්ඨති වා නිසීදති වා. ඉදං තථාගතස්ස යමක පාටිහීරෙ ඤාණං"

(දේශනා පෙල දීඝ හෙයින් මෙහි පෙය්‍යාල ක්‍රමය දක්විණි.)

මේ ලෝකයෙහි තථාගතයන් වහන්සේ ශ්‍රාවකයන්ට සාධාරණ නොවූ යමක ප්‍රාතිහාර්‍ය්‍ය පාන් දක්වත්. (ඒ කෙසේද?) තමන් වහන්සේ ගේ උඩුකයින් ගිනිකඳ පවතියි. යටි කයින් ජල කඳ පවතියි. (නාවත) යටිකයින් ගිනිකඳ පවතියි. උඩුකයින් ජල කඳ පවතියි. (දියදහරා පවතියි.)" මේ ක්‍රමයෙන් සියලු අවයව වලින් ජලකඳ, ගිනිකඳ, පවත්වයි. ජලකඳ පැවැත් වූ පෙදෙසෙන් ගිනි කඳද ගිනිකඳ පැවැත්වූ පෙදෙසෙන් දියදහර ද පවත්වයි. මෙසේ ක්‍රමානුකූලව පවත්වා, අවසාන රෝමකූපයන්ට බසින්, එක් එක් රෝමකූපයකින් ගිනිකඳ, ජලකඳ, පවත්වයි. ඊට පසු සවණක් රැස් විහිදුවන් එතැන් සිට දෙවැනි බුදුරුවක් මවත්. එවිට බුදුරජාණන් වහන්සේ සක්මන් කරත්. නිර්මිත බුදුහු වැඩ හිඳිත් නැතහොත් සැතපෙත්. සිටිත්. නිර්මිත බුදුහු සක්මන් කරත්. බුදුරජාණන් වහන්සේ වැඩ හිඳිත්" මේ වශයෙන් ප්‍රතිවිරුද්ධ ඉරියවු පවත්වත්. මෙය තථාගතයන් වහන්සේ ගේ යමක පාටිහීර ඤාණයයි.

බුත්සරණ නම් වූ විද්‍යා චක්‍රවර්තීහු, බුදුරජාණන් වහන්සේ තීර්ථකයන් පරාජය කිරීම සඳහා ගණ්ඩබ්බ වෘක්ෂමූලයේදී පැවැත් වූ යමක ප්‍රාතිහාර්යය මෙසේ විස්තර කරත්.

“ඉදිරියෙහි දෙලොස් යොදුන් පිරිස යැ. පස්සෙහි දෙලොස් යොදුන් පිරිසයැ. දකුණෙහි දෙලොස් යොදුන් දෙලොස් යොදුන් පිරිසයැ. මෙසෙ සතර දිගින් සූවිසි යොදුන් පමණ තැන් පිරිස මැද රුවන් සක්මනට සම්බුදුයන් වහන්සෙ පැන නැගී සිටුත් මැ. ශ්‍රී ශරීරයෙන් නාභියෙන් මත්තෙහි තුස් ලොව ඔබ්බුලුවන්නා වූ මහගිනිකඳෙක් නැඟෙන්නට වන. නැවත නාභියෙන් පාත ශ්‍රී ශරීරයෙන් ආකාශ ගංගා ප්‍රවාහයක් සෙ මහදියකඳෙක් හෙන්නට වන. නැවත ගිනිකඳ නැගී ඌර්ධව කායෙන් දියකඳෙක් හෙන්නට වන. දියකඳ හුණු අධඃ කායෙන් ගිනිකඳෙක් නැගෙන්නට වන. ශ්‍රී ශරීරයෙහි ශ්‍රී මුඛාදිශායෙන් ගිනිකඳෙක් නැගෙන්නට වන. පිටදිසායෙන් දියකඳෙක් නැගෙන්නට වන. හෙද පෙරලී පිට දිසායෙන් ගිනිකඳෙක් නැගෙන්නට වන. අහි මුඛයෙන් දියකඳෙක් හෙන්නට වන-මෙසේ ක්‍රමයෙන් අවුත්-මෙසේ නැගෙන්නා වූ වහ්නිස්කන්ධය හා ජලස්කන්ධය ද අතර-තුරෙන් සවණක් ඝණ බුදුරැස් ඉන් ඒ වලඳමින්, ඉන් ඒ පෙරළෙමින්, ඉන් ඒ රැඳෙමින්, ඉන් ඒ සරකැවෙමින් මුළු සක්වල මැඩගෙන දිවෙන්න යැ. අග්නිස්කන්ධය හා ජලස්කන්ධය හා දෙකම බඹලොව දක්වා නැගී ආයෙ පෙරලා අවුත් දෙයාසුදනස් යොදුන් සක්වලගල් මුවපිට හැසී, පර සක්වල මැඩගෙන දිවෙන්නයැ” යනාදී වශයෙනි. (විස්තර, බුත් සරණ **111** වැනි පිටුව බලන්න.)

මෙම වර්ණනයෙන් යමක ප්‍රාතිහාර්යයෙහි ඇත්තා වූ අසහාය අද්භූත බව මැනවින් ප්‍රකට වෙයි. විද්‍යාචක්‍රවර්තීහු බුදුගුණ කීමට මැ මුවසරසා සිටි අයුරු බුත්සරණෙන් පැහැදිලි වෙයි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබූ අළුත දෙවියන් ගේ සැක දුරැකිරීමෙහිදි ද, ඥාති සමාගමෙහිදී ද, ගණ්ඩබ්බ වෘක්ෂමූලයෙහි දී ද, යමක ප්‍රාතිහාර්යය දක්වූ බව සිහිපත් විය යුතුය.

යමක පාටිහීර වර්ණනය නිමි.

# 71. මහාකරුණා සමාපත්ති ඤාණය.

ශාන්ති නායක වූ බුදුරජාණන් වහන්සේලා විෂයෙහි පවත්නා වූ සියළු ඥානයන් අතුරෙන් මහා කරුණා සමාපත්ති ඥාණය ඉතා ශ්‍රේෂ්ඨය. ලොව දත යුතු යම් තාක් ඇද්ද ඒ සියල්ල කෙරෙහි නො පැකිළ පවත්නා සර්වඥතා ඥානය ද මහා කරුණා ඥාන මුල් කොට ඇතියකි. මහා කරුණා ඥානය නො මැති නම් සර්වඥතා ඥානය ලබා ගැනුම කිසිසේත් නො සිදුවන්නකි. එහෙයින් මහා කරුණා ඥානය අග්‍රගණ්‍යයන්ගෙන් ද අග්‍රය. අනන්ත හිණිපෙත්තට ම උසස් බව මෙයින් සැලකා ගත යුතු. සර්වඥතා ඥානය වෙතට යොමු වූ කරුණා ඥානයෙහි ආරම්භය විසතාසඞ්ඛ්‍යකල්පලක්ෂයකට මුලිනි. එපමණ දීර්ඝ කාලයක සිට අවුත් සර්වඥතා ඥානය නිසා මුවවිටින් උතුරා යන පරිද්දෙන් අභ්‍යාසයින් ම පැතිරීම බවට පැමිණි හෙයින් එම කරුණා ඥානය මහා කරුණා ඥානය බවට පත් විය. කරුණු මෙසේ හෙයින් මහා කරුණා ඥානයෙහිත් සර්වඥතා ඥානයෙහිත් අන්‍යෝන්‍ය සම්බන්ධයක් පවතින බව සැලකිය යුතු. තවද මහා කරුණා ඥානය නිසා දශපාරමී ධර්මයන් "අසවල් දේ අඩුය"යි දැක්වීමට නො හැකි පරිද්දෙන් හැම අඞ්ගයක් ම සම්පූර්ණ වන සේ පිරූහ. සර්වඥතා ඥානය නිසා "අසවල් දේවල් දේ ගැන දැනුමක් නැත, අසවල් දේ ගැන දැනගත්තා වැරදිය, එය මේ අයුරින් දැනගත යුතුය" යනාදී වශයෙන් ලක් විය යුතු කිසිදු වරදකට නො හසු. වන සේ හැම කරුණක් ගැන ම තත් වූ පරිද්දෙන් දත වදාළහ. එසේ ම ප්‍රඥාව නිසා තමන් වහන්සේ සසරින් නිදහස් වී, මහා කරුණා ඥානයෙන් පරිභාවිත වූ සර්වඥතා ඥානය නිසා සෙසු බොහෝ දෙනෙකු සසරින් නිදහස් කළහ. එයින් කීහ:-

"දයාය පාරමී චිත්වා - පඤ්ඤායත්තානමුද්ධරි
උද්ධරි සබ්බධම්මෙච - දයායඤ්ඤෙච උද්ධරී"

කරුණාවෙන් පාරමී රැස්කොට, ප්‍රඥාවෙන් තමන් හා සියලු ධර්මයන් ඔසවා ගත්හ. අන්‍යෝද කරුණාවෙන් ඔසවා ගත්හ. එනම් සසර සයුරින් ගොඩ ගත්හ. මෙතෙක් දැක්වූයේ මහා කරුණා ඥානයෙහි ශ්‍රේෂ්ඨත්වයයි. එහි බලමහිමය මෙතැන් සිට එයි.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාට නොයෙක් ආකාරයෙන් ලොව දෙස බලද්දී මහා කරුණාව සත්වයන් කෙරෙහි පහළ වෙයි. (නොයෙක් ආකාර යනු එකූන් අනූ (89) ආකාරයැයි අටුවාවෙහි සඳහන් වෙයි) ඒ මෙසේය.

“ආදිත්තො ලොකසන්නිවාසො” මේ ලෝක සන්නිවාසය රාගාදී ගිනි ගෙන දැවෙන්නේ ය 'යි බුදුරජාණන් වහන්සේලාට මහාකරුණාව උපදියි. සත්වයා තෘෂ්ණා දෘෂ්ටි දෙකින් යුතුව වසෙන නිසා ලෝකයම ලෝකසන්නිවාස නම්.

“උය්‍යුත්තො ලොකසන්නිවාසො” ලෝකසන්නිවාසය නිතර නොයෙක් කටයුතුවල යෙදී වාසය කරන්නේය යි මහා කරුණාව උපදියි.

‘පයාතො ලොකසන්නිවාසො” ලෝක සන්නිවාසය ජීවිතයකින් ඇදහැලෙන නදියක් සේ මරණය කරාම නො නැවතී ගමන් කරන්නේය යි මහාකරුණාව උපදියි. “කුම්මග්ගපටිපන්නො ”ලෝක සන්නිවාසය ඉතා නින්‍දා කටයුතු මිථ්‍යාමාර්ගයට බැසගත්තේය යි මහාකරුණාව උපදියි. “විපථපක්ඛන්තො-” නා නා අයුරු මිථ්‍යාමාර්ගයට දිවූයේය-පෙරමෙනි. ”උපනීයති අද්ධුවො-” ජරාවෙන් මරණය කරා පමුණුවණු ලැබේ, අස්ථිරය- ‘අතාණො අනභිස්සරො-” සත්වයා අසරණය, ආරක්ෂාවක් නො මැති හෙයින් අනාරක්ෂකය, පිහිටවන්නෙකු නො මැති හෙයින් අනාථය යැ පෙරමෙනි. ‘‘අස්සකො, සබ්බං පහාය ගමනීයං” තමාගේය කියා ගතයුතු දෙයක් නො මැති හෙයින් අස්වාමිකයැ, සියල්ල අත්හැර (පරලොව) යායුතුයැ-පෙ. “ඌනො අතිත්තො තණ්හා දාසො-” සත්වයාට කෙතෙක් ලැබුණත් පිරීමක් නැත. ඇතිවීමක් (තෘප්තියක්) නැත. ආශාවට යටවූයේය -පෙ,

‘‘අතාණො-’’ සත්වයා පිහිටක් නැත්තෙකියි-පෙ. ‘‘අලෙණො-’’ සත්වයා සැඟවීමට තැනක් නැත්තෙකියි-පෙ. “අසරණො-’’ පැමිණි භය දුරුකරන්නෙකු නොමැති හෙයින් අසරණයැයි-පෙ. ‘‘අසරණීභූතො-’’ ඉපදීමත් සමග ම අසරණ ස්වභාවයට පැමිණියේයයි පෙ, ‘‘උද්ධතො අවූපසන්තො-’’ සත්වයාගේ සිතෙහි බොහෝ සෙයින් අකුශල් ම ඉපදෙන නිසා ඒ අකුශල් සමග යෙදෙන උද්ධච්චය ගෙන, සත්වයා විසිරී ගිය සිත් ඇත්තෙක, ඒ නිසා නො සන්සුන්ය යි මහා කරුණාව උපදියි.

“ලෝකසන්නිවාසො සසල්ලො විද්ධො සල්ලෙහි, න කොචි තස්ස සල්ලානං උද්ධතා මයා අඤ්ඤත්‍ර” ලෝකසත්ත්වයා විදින ලද රාගාදි බොහෝ හුල් සහිතය. ඔහුගේ හුල් ඉදිරීමට මා හැර අනිකෙකු නො මැතැයි බුදුරජාණන් වහන්සේලාට මහාකරුණාව උපදියි. “අවිජ්ජන්ධකාරාවරණො-” අවිද්‍යා අන්ධකාරයෙන් වැසුණේයයි පෙ. “කිලෙස පඤ්ජර පක්ඛිත්තො ලෝකසන්නිවාසො තස්ස ආලෝකං දස්සෙතා න කොචි අඤ්ඤත්‍ර මයා” සත්ත්වයා කෙලෙස් නමැති කූඩුවෙහි දමන ලද්දේය ඔවුට නුවණ නැමති ආලෝකයක් පෙන්වන මා හැර වෙන කෙනෙකු නො මැතැයි පෙ. “අවිජ්ජාගතො ලෝකසන්නිවාසො අණ්ඩභූතො පරියොනද්ධො තන්තාකුලකජාතො ගුලාගුණ්ඩිකජාතො මුඤ්ජබබ්බජභූතො අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතික්කමති-” ලෝකසත්ත්වයා අවිද්‍යාවෙන් යුක්ත වූයේය අවිද්‍යා නමැති අණ්ඩකෝෂයෙහි බිත්තරයෙහි- ඉමදුනෙක. අවිද්‍යා නමැති අණ්ඩකෝෂය නිසා හාත්පසින් ම වැදී වූවෙක. රෙදි වියන්නන්ගේ මීසත් කෑ නූල් පනුවක්, අග-මුල සොයා ගැනීමට නො හැකි පරිද්දෙන් අවුල් වීද, එමෙන් ප්‍රත්‍යසමුත්පාද ධර්මයට අනුව සත්ත්වයාද අවුල්විය. රෙදි වියන්නන්ගේ කෑද දමූ නූල් පනුවක් මෙන් අවුලෙන් අවුලටම පත්වූවෙක. මුදුතණ, බබුස්තණ, ආදියෙන් ඇඹරූ ලනුවක් සේ අග-මුල සොයා ගැනීමට නො හැකිය. නරකාදි සතර අපායෙන් යුක්ත වූයේ, දුගීතියට ම විවශව පතිත වූයේ සසර නො ඉක්මවයි. කියා බුදුරජාණන් වහන්සේලාට මහා කරුණාව උපදියි

“අවිජ්ජාවිසදොස සල්ලිත්තො-” අවිද්‍යාව කරණ කොට අකුශලයන් උපදින නිසා කුශල ජීවිත විනාශ කරන හෙයින් විෂක් බඳුවූ අවිද්‍යාව, එයම සිත් දූෂිත කරන බැවින් දොෂ බඳු අවිද්‍යාවෙන් බොහෝ සෙයින් තවරණ ලද්දේය. ආලේපනය කරන ලද්දේය යි මහාකරුණාව උපදියි. ‘කිලෙස සලිලභූතො-’ වැටුණු වැටුණු සත්ත්වයා එහි ම ගැලෙන-එරෙන-බැවින් රාගාදි කෙලෙස් මඩ වගුරක් බඳුය. එහි සත්ත්වයා ගැලී සිටියේය යි-පෙ. “රාගදොස මොහජටා ජටිතො ලෝකසන්නිවාසො, තස්ස ජටං විජටෙතා න කොචි අඤ්ඤත්‍ර මයා” සත්ත්වයා රාග, දොෂ, මොහ, අවුලෙන් අවුලට ම පත්වූයේය. ඔහුගේ ඒ අවුල නිරවුල් කරන්නෝ මා හැර අනිකෙක් නො මැතැයි-පෙ.

"තණ්හා සඞ්ඝාටපටිමුක්කො ලොකසන්නිවාසො" සත්වයා තෘෂ්ණා බන්ධනයට-ආසා පසුරට-අනුවූයේය. ආසා අබරණින් යුක්ත වූයේයයි. මහාකරුණාව උපදියි. "තණ්හාජාලෙන ඔත්ථටො" ආසා දැලෙන් වෙළී ගියේය. "තණ්හා සොතෙන වුය්හති-" ආසා දිය පහරින් පා වෙයි. "තණ්හා සංයොජන සඤ්ඤුත්තො" ආසා රැහැනින් බැඳුනේ වෙයි. 'තණ්හානුසයෙන අනුසටො" ආසා නිඳ නිසා බලවත් වූයේ වෙයි "තණ්හා සන්තාපෙන සන්තප්පති-" ආසා දැවිමෙන් දැවෙයි. 'තණ්හා පරිළාහෙන පරිඩය්හති-" ආසා දැවිල්ලෙන් වළෙට ම දැවෙයි. කියා මහා කරුණාව උපදියි.

"දිට්ඨි සඞ්ඝාටපටිමුක්කො-" වැරදි අදහස් වලින් බැඳුනේ වෙයි මෙසේම ජාල-සොත සංයොජන-අනුසය-සන්තාප-පරිළාහ ශබ්ද අනුවද යොදා ගත යුතුය.

"ජාතියා අනුගතො-" ජාතියට පිවිසියේය. "ජරාය අනුසටො-" ජරාවට අනුව දුවනු ලද්දේය. "ව්‍යාධිනා අභිභූතො-" රෝගයෙන් මඩනා ලද්දේය. "මරණෙන අබ්භාහතො" මරණයෙන් විනාශ වන ලද්දේය. 'දුක්ඛපතිට්ඨිතො-"දුකෙහි පිහිටියේය. "තණ්හාය උඩ්ඩිතො-" ආසාවෙන් එල්ලෙන ලද්දේය. "ජරාපාකාරපරික්ඛිත්තො ලොකසන්නිවාසො-" සත්වයා ජරාව නැමති ප්‍රාකාරයෙන් වටකරන ලද්දේය යි මහාකරුණාව උපදියි.

"මහාබන්ධනබද්ධො ලොකසන්නිවාසො රාගබන්ධනෙන දොසබන්ධනෙන මොහබන්ධනෙන දිට්ඨිබන්ධනෙන කිලෙසබන්ධනෙන දුච්චරිතබන්ධනෙන, තං බන්ධනෙන මොචෙතා න කොචි අඤ්ඤත්‍ර මයා', ලෝකසත්නිවාසය රාග-ද්වෙෂ-මොහ-දිට්ඨි කිලෙස-දුශ්චරිත බන්ධනයෙන් දැඩිලෙස බැඳුනේය. ඔහු මුදවන්නෙක් මා හැර-අන්කෙනෙක් නැත කියා මහාකරුණාව උපදියි. "මහා සම්බාධපටිපන්නො ලොකසන්නිවාසො -පෙ" සත්වයා මහත් කරදරයකට පිළිපන්නේ වෙයි. ඔහුට (ලොකොත්තර සමාධි, ප්‍රඥා) අවකාශයක් පෙන්වන්න, වූ කෙනෙක් මා හැර නැතැයි - පෙ. මහා පලිබොධෙන පලිබුද්ධො - පෙ'' සත්වයා මහත් අවහිරයකට පත්වූයේය. ඒ අවහිරය සිඳින කෙනෙක් මා හැර නැතැයි - පෙ. මහා පපාතෙ පතිතො ලොකසන්නිවාසො, තං පපාතා උද්ධතා න කොචි

අඤ්ඤත්‍ර මයා'' සත්වයා නරක - තිරශ්චීන-ප්‍රේත=මනුෂ්‍ය යන දිව්‍ය පඤ්ච ගති නමැති ප්‍රපංචයට වැටුණේ වෙයි. එයින් ගොඩ ගන්නෙක් මා හැර නැතැයි=පෙ.

''මහාකන්තාරපටිපන්නො ලොකසන්නිවාසො නං කන්තාරං තාරෙතා න කොචි අඤ්ඤත්‍රමයා'' සත්වයා ජාති ජරා මරණාදී මහා කාන්තාරයට පිළිපන්නේ වෙයි. ඔහු එයින් එතරකරවීමට මා හැර අන්කෙනෙක් නැතයයි මහා කරුණාව උපදියි "මහා සංසාර පටිපන්නො = පෙ" මහත් සසරට පිළිපන්නේ පෙරමෙනි. "මහා විදුග්ග සමපරිවත්ති'' මහත්වූ දුෂ්කර මාර්ගයෙහි බොහෝ සෙයින් නැවතී නැවතී සැරිසරයි (ඉපදීම් වශයෙනි) ''මහාපලිපෙ පලිපන්නො - පෙ''. මහත් වූ කාම නමැති මඩෙහි ගැලුනේ පෙ අබ්භාහතො ලොකසන්නිවාසො රාග දොස මොහ ජාති ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසඟ්ගිනා - පෙ'' සත්වයා රාගාදී ගින්නෙන් දවන ලදී. ඔහු නිවන කෙනෙක් මා හැර නැතැයි වහා කරුණාව උපදියි.

උපනීතකො හඤ්ඤති නිච්චමත්තාණො'' සත්වයා ජාති සෙන්ගෙන ජරාව ආදී උපද්‍රවයන්ට පමුණුවන ලදී. ආරක්ෂා නැත්තේ නිරතුරු පෙළෙයි කියා පෙ - ''පතතදණ්ඩො ලොකසන්නිවාසො තක්කරො' සත්වයා පැමිණෙන ලද දඬුවම් ඇත්තේ සොරෙක් මෙනැයි මහා කරුණාව උපදියි. වජ්ජබන්ධන බද්ධො ලො= ආඝාතන පච්චුපට්ඨිතො'' සත්වයා මරද නමැති බැම්මෙන් බැඳුනේ දංගෙඩියට එළඹ සිටියේයයි පෙරමෙනි. ''අනාථො ලොකසන්නිවාසො පරමකාපඤ්ඤප්පත්තො තස්ස තාණෙතා න කොචි අඤ්ඤත්‍ර මයා'' සත්වයා අනාථය, ජර මරණාදීන්ගෙන් වැලකීමට පින් නමැති ධනය නොමැති නිසා ඉතාම දිළිඳු බවට පැමිණියේය. මා හැර ඔහුට පිහිට වන්නාවූ කෙනෙක් නොමැතැයි පෙ

''අක්ඛාභිතුන්නො ලොකසන්නිවාසො චිරරත්තපීළිතො සත්වයා ජාත්‍යාදි දුඃඛයෙන් කම්පිත වූයේ බොහෝ කාලයක් පෙළෙන ලද්දේයයි මහාකාරුණාව උපදියි. ''ගධිතො නිච්චා පිපාසිතො'' ආසාවෙන් ගිජුවූයේ නිතර පිපාසා ඇත්තෙකැයි පෙ- 'අන්ධො අචක්ඛුකො'' අන්ධය ප්‍රඥා නමැති ඇස් නැත පෙ-''හතනෙත්තො අපරිණායකො', නුවණැස වැනසුනෙක සුගතියට පමුණුවන්නෙකු නොමැත.-පෙ ''විපථපක්ඛන්නො ලො

කාසත්ණිවාසො අඤ්ජසාපාරෙදධා, තං අරියපථං ආනෙනා න කොචි අඤ්ඤත්‍රමයා" සත්වයා වැරදි මගට බැස්සේය. තිවැරදි මග වරද්දා ගත්තේය. ඔහු අරි මගට පමුණුවන කෙනෙක් මා හැර නැත. පෙ මහොසපක්ඛනෙනා - පෙ" යසර නමැති මහත් සැඩ දිය පහරට ගියේ පෙරමෙති. "ද්විහි දිට්ඨිගතෙහි පරිණුට්ඨිතො" දෙවැදෑරුම් මිථ්‍යාදෘෂ්ටිවලින් වෙලෙන ලදී-පෙ "තීහි දුච්චරිතෙහි විප්පටිපනෙනා" දුසිරිත් තුනෙන් වැරදි මගට බැස්සේ - "චතුහි යොගෙහි යුතෙතා" සතර යෝගයෙන් යුක්ත වූයේ පෙ.

මෙපරිද්දෙන් ම සතර ග්‍රන්ථ, සතර උපාදාන, පඤ්චගති, පඤ්චකාම, පඤ්චනීවරණ, ඡ‍ව්වාද මූල ජතණ්හාකාය, ඡදිට්ඨිගත, සත්ත සංයොජන, සත්තමාන, අට්ඨලොකධම්ම, අට්ඨපුරිසදෙස, නව අාඝාත, නවමාන, නවතණ්හාමූලක දසකිලෙස වත්‍ථු, දස ආඝාත, දශ අකුශල, දස සංයෝජන, දසවත්‍ථුක මිථ්‍යාදිට්ඨි, දසවත්‍ථුක අන්තගගාහිමිච්ඡාදිට්ඨි, අට්ඨසත (108) තණ්හාසත (100) පපඤ්ච යන කරුණුද සොදාගත යුතුය. මෙතෙක් කරුණු අනුව ලෝකසත්තවාසය දෙස බලන්නා වූ බුදුරජාණන් වහන්සේලාට සත්වයා කෙරෙහි මහා කරුණාව උපදියි.

තවද, "මම වනාහි එතෙර වූයේ වෙමි. ලෝවැසි තෙම එතෙර නුවූයේය. මම වනාහි මිදුනේ වෙමි. ලෝවැසිතෙම නො මිදුනේය. මම වනාහි දමනය වූයේ වෙමි, ලෝවැසි තෙම දමනය නොවූයේය. මම වනාහි සංසිඳුනේ වෙමි. ලෝවැසිතෙම නොසන්සිඳුනේය. මම වනාහි නොඇලුනේය වෙයි. ලෝවැසි තෙම ඇලුනේය. මම වනාහි පිරිනිවියේ යෙමි. ලෝවැසිතෙම නොපිරිනිවියේය. එතෙර වූ මම එතෙර කරවන්නට සමර්ථ වෙමි. මිදුනාවූ මම මුදවන්ට සමර්ථ වෙමි. දමනය වූ මම දමනය කරවන්ට සමර්ථ වෙම. සංසිඳුනාවූ මම සංසිඳවන්ට සමර්ථ වෙමි. නොඇලුනාවූ මම නොඇලවන්ට සමර්ථ වෙමි. පිරිනිවියාවූ මම අනුනුදු පිරිනිවාලිමට සමර්ථවෙමැ"යි දක්නා වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාට සත්වයන් කෙරෙහි මහා කරුණාව පහලවෙයි. මෙය තථාගතයන් වහන්සේගේ මහාකරුණා ඥාණයයි.

ශාන්ති නායක බුදුරජාණන් වහන්සේ දිනපතා දවසට දෙවරක් මහාකරුණා සමාපත්තියට සමවදින සේක. එයින් කීහ ගුරුළුසෝම් මහ උවසුවාණෝ:-

"අපි ච බුදුහු පෙර බත දෙලොස් කෙල සුවහසක් වට මහකුළුණු සමවත් සමවදිති. දෙලොස් කෙළ සුවහසක් වට අර්හත් ඵල සමවත් සම වදිති. පසුබතද දෙලොස්කෙළ සුවහසක් වට මහකුළුණු සමවත් සමවදිති. දෙලොස්කෙල සුවහසක් වට අර්හත් ඵල සමවත් සමවදිති මෙසේ දවසෑ දවසෑ සූවිසකෙළ සුවහසක් වට මහකුළුණු සමවත් සමවදිති. සූවිසිකෙල සුවහසක් වට අර්හත් ඵල සමවත් සමවදිති" - ධර්මප්‍රදීපිකා 52 පිටුව

මෙසේ සමවැදීමේ අසහාය බලයක් ඇත්තාවූ බුදුරජාණන් වහන්සේ ලෝක සත්වයාගේ හිතසුව පිණිසම සමවදින සේක. මේ මහා කරුණා සමාපත්තිය නිසා මුළුලොව වෙසෙන සියලු සත්වග, එකම දරුකාලයේ පෙනීයයි. මහා කරුණා සමාපත්තියෙහි යෙදුනු ප්‍රඥාව මහාකරුණා සමාපත්ති ඥාන නම්

මහාකරුණා සමාපත්ති ඥාණය නිමි.

## 72, 73, සබ්බඤ්ඤුත ඤාණය හා අනාවරණ ඤාණය

සබ්බං සඞ්ඛතමසඞ්ඛතං අනවසෙසං ජානාතීති සබ්බඤ්ඤුත ඤාණං තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං"

හේතු ප්‍රත්‍යයෙන් සකස්වූද හේතු ප්‍රත්‍යයෙන් සකස් නොවූද සියලුද ඉතිරිවක් නොකොට දනීනුයි සබ්බඤ්ඤුත ඤාණ නම්. ඒ දැනීමෙහි ඇසීමක්, ආවරණයක් නැත්තේනුයි අනාවරණ ඤාණ නම්, මෙහි ඤාණ දෙකක්වූයේ කෘත්‍ය වශයෙනි. සර්වඥතා ඥානයෙන් සියල්ල දැනගනී. එහිලා කිසිම අවහිරකමක් නොවීම අනාවරණ ඤාණයෙන් සිදුවන්නකි. සියල්ල යන්නෙන් සංඛතවූ ද අසංඛතවූද ධර්ම හැම එකක්මකියැවේ,

සර්වඥතා ඥානයට පඤ්චවිධ ඥෙය මණ්ඩලය අන්තර්ගත වේ. පඤ්චඤෙය්‍යපථප්පභෙදං සබ්බං අභිඤ්ඤාසීති සබ්බඤ්ඤු සබ්බඤ්ඤුස්සභාවො සබ්බඤ්ඤුතා, සා එව ඤාණං සබ්බඤ්ඤුත ඤාණං" පඤ්ච ඥෙයමාර්ග ප්‍රභෙද - දතයුතු මග බෙදීම් පස - සියල්ල දැනගත්තේනුයි සර්වඥයි. සර්වඥයාගේ ස්වභාවය හැටී සර්වඥතා යි එයම ඥාණය වූයේ සර්වඥතා ඥානයයි. පඤ්ච ඥෙය මාර්ග ප්‍රභෙද නම් "සබ්බධම්මාහි සඞ්ඛාරෝ විකා

රං ලක්ඛණං නිබ්බානං පඤ්ඤත්තීති පඤ්චඤෙය්‍ය පථං හොන්ති" සියලු ධර්මයෝ වනාහි සංස්කාර, විකාර, ලක්ෂණ නිර්වාණ, ප්‍රඥප්ති යන පස්වැදෑරුම් දතයුතු මාර්ගයෝ වෙත්" යනුවෙන් දක්වූ පසයි. ලෝකයේ දතයුතු යම්තාක් ඇද්ද ඒ සියල්ල මෙ මාර්ග පසට ඇතුලත්වෙයි. එහි සංස්කාර නම් හේතු ප්‍රත්‍යයෙන් හටගත් සියලු දෑය. විකාර; රූප පරිච්ඡේදයේ විකාර රූප වශයෙන් දැක්වූ විඤ්ඤත්ති ද්වය. ලහුතා මුදුතා, කම්මඤ්ඤතා යන රූප පසයි. ලක්ෂණ යනු නොමෙ හස් වය අනිත්‍යාදී ලක්ෂණත්‍රයයි. සියලු උපාදානයන් ගෙන් තොරවූ තැන නිර්වාණ නම්. ලෝකයාගේ සම්මුතියෙන් පණවා ගත් දෑ ප්‍රඥප්තියයි. මෙය පඤ්චවිධඤෙය්‍ය මණ්ඩලය.

තවද බුදුරජාණන් වහන්සේ "සමන්ත චක්ඛු" නමින් ද හඳුන්වනු ලැබෙත්, ඒ සමන්ත චක්ඛු නාමයෙන් කියැවෙනුයේද සර්වඥතා ඥානයමැයි "සමන්ත චක්ඛු වුච්චති සබ්බඤ්ඤුත ඤාණං" යනු මහා නිර්දේශ පාඨයි. හැම දෙයක්ම හැම අයුරින්ම පෙනෙන නුවණට මේ නමකි. එයින් තීක සැරියුත් මාහිමියෝ:-

"න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාත මජානිතබ්බං
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං
තථාගතො තෙන සමන්තචක්ඛු' - මැ. නි. පා.

උන්වහන්සේගේ සර්වඥතා ඥානයට නොපෙනුණු එයින් තතු විමසා නොදත්, එයින් තීරණය කොට නොදත හැකි කිසිවකුත් මේ මේ මුළු තුන්ලෝකයෙහි නැත්තේය. දතයුතු යම්තාක් ඒ සියල්ලම උන්වහන්සේ වෙසෙසා දැන වදාළසේක. එයින් උන්වහන්සේ හාත්පසෙහිවූ සියල්ලම බලාලූ කෙණෙහි පෙනෙන නුවණ (සමන්තචක්ඛුයි) ඇතිසේක.

සර්වඥතා ඤාණය විස්තර කරන සැරියුත් මාහිමියෝ මෙසේද ප්‍රකාශ කරත්:-

"සො හි භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නිනෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො නත්ථි තස්ස භගවතො අනඤ්ඤාතං අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය"-ම. නි. පා.

ඒ භාග්‍යවත් බුදුපියාණෝ දන්නේ ම දනියි. දක්නේ ම දකියි. චක්ඛුමය වූයේ ධම්මය වූයේ බ්‍රාහ්මම වූයේ වක්තෘ - කියන්නා වූයේ ප්‍රකර්ෂයෙන්ම හැම අයුරින්ම වක්තෘවූයේ අර්ථයාගේ නිර්නෙතෘ වූයේ - පදයන්හි තේරුම පමුණුවන්නා - අමෘතය දෙන්නේ ධර්මස්වාමීවූ තථාගතයෝ යෑ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රඥායෙන් නොදන්නා ලද, නොදක්නා ලද, ප්‍රකට නොකරන ලද අවබෝධ නොකරන ලද, නුවණින් ස්පර්ශ නොකරන ලද කිසිවක් නොමැත, මෙයින් හැම දෙයක්ම දන්නා දක්නා බව කීහ.

එසේම බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥාණයට කාල ත්‍රය වර්තීවූ තුන් කාලයට පෙරලෙන - හැම ධර්මයක්ම හසු වෙත් "අතීතං අනාගතං පච්චුප්පන්නං උපාදාය සබ්බේ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති" අතීතවූද අනාගතවූද වර්තමානවූද ධර්ම පවත් සියලු ධර්මයෝ හැම අයුරින්ම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ඥානයෙහි හමුවට එත්. මෙයින්ද සර්වඥතා ඥාණයේ ස්වභාවය දක්වූහ.

"සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති සබ්බං වචීකම්මං ඤාණානුපරිවත්ති, සබ්බං මනොකම්මං ඤාණානුපරිවත්ති" බුදුරජාණන් වහන්සේගේ සියලු කාය - වාග් - මනඃ කර්මයෝ ඥානානු පරිවර්තිත ම වෙත්. එනම් තිදොරින් සිදු කරන හැමදේ ම නුවණ අනුවම යෙයි. මෙයින් නුවණ නොයොදවා සිදු කරන කිසිදු ක්‍රියාවක් බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොපැවතුන බව ස්ඵුට කළහ. එසේම දතයුතු යම් තාක් වෙයිද එතෙක් ඥානය ක්‍රියා කරයි. "යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං"

තවද, "යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො තිමිඞ්ගලං උපාදාය අන්තො මහාසමුද්දෙ පරිවත්තන්ති එවමෙවං සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තන්ති" යටත් පිරිසෙයින් "තිමිඞ්ගල" නම් මත්ස්‍ය රාජයාගේ පටන් සම කිසි මස් කැසුබු ආදීහු වෙත් නම් ඒ හැම මහමුහුදෙහිම ඔබී නොබ සැරිසරද්ද, එමෙන් දෙවියන් - මාරයන් - බ්‍රහ්මයන් - ශ්‍රමණයන් සහිත වූ දිව්‍ය මනුෂ්‍ය ප්‍රජාව (සියලු දෙනා) බුද්ධ ඥානයෙහිම ඔබීනොබ හැසිරෙත්. බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානය ඉක්මවා යන කෙනෙකු නොමැති බව මෙයින් කීහ

"යථා යෙකෙචි පක්ඛී අන්තමසො ගරුළං වෙනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති, එවමෙවං යෙපි තෙ සාරිපුත්තසමා පඤ්ඤාය තෙපි බුද්ධඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති, බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං ඵරිත්වා අභිභවිත්වා තිට්ඨති"

යොදුන් පස්පණසක් (55) දිග් වූ පියාපත් ඇති, සැට යොදුන් පිල් මැටි ඇති, තිස් යොදුන් ග්‍රීවා - බෙල්ල - ඇති, නව යොදුන් තුඩ ඇති, දොළොස් යොදුන් පා ඇති, එක්සිය පණස් යොදුන් ප්‍රමාණ වූ විනතාගේ පුත්‍රයා වූ ගුරුළු රජුගේ පටන් යම්කිසි කුරුළු සමූහයක් වේ ද, ඒ හැම අහසෙහි එක් පෙදෙසකම පියාසර කරන්නාසේ, සැරියුත් හිමිට සමාන වූ නුවණක් ඇති යමෙක් වේත් නම් ඒ හැම බුද්ධ ඥානයෙහි පෙදෙසකම පෙරළෙත් බුද්ධ ඥානය දෙව් මිනිසුන්ගේ ප්‍රඥාව යටකරගෙන මැඩ පවත්වා ගෙන සිටයි. සර්වඥතා ඥාණයෙහි බලමහිමයත්, නුවණින් අග තනතුරු ලත් සැරියුත් හිමියනට ද බුද්ධ ඥාණයාගේ පරතෙර සෙවීමට නොහැකි බවත්, මේ දේශනාවෙන් පෙන්නුම් කළහ.

මෙසේ පවත්නා වූ පරම ගම්භීර සර්වඥතා ඥානය, ගිනි ගෙන දිලිසෙන යකඩ කැබෙල්ලක් දිරාගිය පරඬලෙක විනිවිද යන්නාසේ තුන් ලෝකයෙහි පවතින හැම දෙයක් කෙරෙහි විනිවිද යෑම අනාවරණ ඥාණයාගේ කෘත්‍යයයි. එයින් කීහ.: 'ඔවුන් ගේ ඥාන විලාශ නම් කවරයත්? බුද්ධ ඥානය අතීතයෙහිද් අනාගතයෙහිද් ප්‍රත්‍යුත්පන්නයෙහිද් ක්‍රමයෙන් පවත්නා කල ජීර්ණපත්‍රපුටයෙහි තප්ත නාරාච සෙයින් නොපැකිල ශෝඝ්‍රයෙන් ඥෙය්‍ය පර්‍යන්තයෙහි නවතති'' - ධර්මප්‍රදීපිකා 22 පි. කරුණු මෙසේ හෙයින් අනාවරණ ඥාණය, බුද්ධ ඥානයෙහිම විශේෂයක් මිස වෙනම පවත්නා ඥානයක් නොවේය. අටුවාවෙහිද මෙයම දක්වෙයි. "නහි අනාවරණ ඤාණං ධම්මතො විසුං අත්ථි, එකමෙව හෙතං ඤාණං ආකාර භෙදතො ද්වෙධා වුච්චති'' - ප. ම. අ. අනාවරණ ඥානය ධර්ම වශයෙන් වෙනම නැත. මෙය එකම ඥානයකි. ආකාර භේදයෙන් දෙපරිදියයි කියනු ලැබේ. "සබ්බඤ්ඤුත ඤාණමෙව හි 'නත්ථි එතස්ස ආවරණන්ති කෙනචි ධම්මෙන පුග්ගලෙන වා ආවරණං කාතුං අසක්කුණෙය්‍යතාය අනාවරණන්තිවු වච්චති'' සියල්ල දන්නා නුවණම "මෙයට ආවරණ නැත්තේනුයි' යනු කිසියම් දහමකින් හෝ පුගුලෙකු විසින් හෝ ඇහිරීමක් කිරීමට නො හැකි බැවින් අනාවරණ ඥාණ යයි කියනු ලැබේ. මෙසේ අනාවරණ ඥාණය බුද්ධ ඥාණයෙහිම කෘත්‍ය විශේෂයකි.

එවද බුද්ධ ඥානය හැම කල්හිම නොපැකිල පවතී. 'අතීතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං අනාගතෙ අප්පටිහතං ඤාණං පච්චුප්පන්නෙ අප්පටිහතං ඤාණං" යි සර්වඥතා ඥානය ආවර්ජනා ප්‍රතිබද්ධය. එනම් සිතූ දේ පමණක් කෙරෙහි පැවතීමයි. යමක් නොසිතූයේ නම් ඒ දේ කෙරෙහි ඥානය නොපවතී.

සර්වඥතා ඥානය හා අනාවරණ ඥානය පිළිබඳ කළයුතු විස්තරය සුතමයඤාණයෙහි ඇතුලත් විය. එහෙයින් මෙම ඤාණයන් පැහැදිලි කිරීම මෙතෙකින් අවසානයි.

## චුද්දස බුද්ධ ඤාණයෝ

පටිසම්භිදාමග්ගයෙහි තෙසැත්තෑ ඤාණ කථා අවසානයේ තුදුස (14) බුද්ධ ඤාණයෝ දක්වෙත්. ඔවුහු නම්:- දුක්ඛ ඤාණය, දුක්ඛ සමුදය ඤාණය, දුක්ඛ නිරෝධ ඤාණය, දුක්ඛ නිරෝධගාමිනී පටිපදා ඤාණය, අත්ථපටිසම්භිදා ඤාණය, ධම්ම පටිසම්භිදා ඤාණය, නිරුත්තිපටිසම්භිදා ඤාණය, පටිභානපටිසම්භිදා ඤාණය, ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤාණය, ආසයානුසය ඤාණය, යමකපාටිහීර ඤාණය, මහාකරුණා සමාපත්ති ඤාණය, සබ්බඤ්ඤුත ඤාණය, අනාවරණ ඤාණය, යනුයි.

මෙයින් මුල් අට සාධාරණයි ඉතිරි සය අසාධාරණයි.

තෙසැත්තෑ ඤාණ කථා නිමි.

## ප්‍රාර්ථනය:

පූජ්‍යාධ්‍යාශයෙන් ලියූ, සවිසි පරිච්ඡේදයකින් පරිමිත, තෙසැත්තෑ ඥාණ කථා විවරණය, මෙතෙකින් සමාප්තයි. මෙම ග්‍රන්ථය හුදෙක් බෞද්ධ ජනතාව තුළ සැඟවී හෝ පිටත හෝ පවතින අශ්‍රද්ධා, අවිශ්වාස, අඥාන, ශඞ්කාදී පාපධර්ම නමැති අන්ධකාරය, හිරු දුටු අඳුරු සෙයින් පලවා හැරීමට ආලෝකයක් වේවා! යනු කතෘගේ ආශිංසනයයි.

සාධු!　　　සාධු!!　　　සාධු!!!

## පින්දීම:

"ඉමිනා පුඤ්ඤකම්මෙන - උපජ්ඣායා ගුණුත්තරා
ආචරියූපකාරා ච - මාතාපිතා පියා මමං
සූරියො චන්දිමා රාජා - ගුණවන්තා නරාපි ච
බ්‍රහ්මමාරා ච ඉන්දා ච - ලොකපාලා ච දෙවතා
යමො මිත්තා මනුස්සා ච - මජ්ඣත්තා වෙරිකාපි ච
සබ්බෙ සත්තා සුඛී හොන්තු - පුඤ්ඤානි පකතානි මෙ
සුඛං ච තිවිධං දෙන්තු - ඛිප්පං පාපෙථ වො මතං
ඉමිනා පුඤ්ඤකම්මෙන - ඉමිනා උද්දිසෙන ච
ඛිප්පාහං සුලභෙ චෙව - තණ්හුපාදාන ඡෙදනං
යෙ සන්තානෙ හීනා ධම්මා - යාව නිබ්බානතො මමං
නස්සන්තු සබ්බදා යෙව - යත්ථ ජාතො භවෙ භවෙ
උජුචිත්තං සතිපඤ්ඤා - සල්ලෙඛො විරියම්හිනා
මාරා ලභන්තු නොකාසං - කාතුඤ්ච විරියෙසු මෙ
බුද්ධාදි පවරො නාථො - ධම්මො නාථො වරුත්තමො
නාථො පච්චෙක සම්බුද්ධො - සංඝො නාථොත්තරො මමං
තෙසොත්තමානුභාවෙන - මාරොකාසං ලභන්තු මා"

සිවමස්තු.

# ශුද්ධි පත්‍රය

| පිටුව | පෙළ | වරද | නිවරද |
|---|---|---|---|
| 3 | 15 | බුදුචරයෝ | බුදුවරයෝ |
| 3 | 25 | බුදුරජාණත් | බුදුරජාණන් |
| 5 | 1 | සංචතකං | සංවතකං |
| 7 | 3 | සුතමයො | සුතමයෙ |
| 8 | 23 | එවම්භූතෙ | එවම්භූතෙන |
| 10 | 8 | සුතුව | යුතුව |
| 13 | 4 | තිතර | නිතර |
| 13 | 18 | නැගිත්වත් | හැගිත්වත් |
| 18 | 10 | නෙද | දෙන |
| 19 | 5 | තමො | නමෙ |
| 20 | 14 | දුදෑසෙ | දුදෑසො |
| 20 | 24 | සොතමත්තො | සොතමනෙතා |
| 21 | 9 | ප්‍රත්‍යසමුත්පාද | ප්‍රතීත්‍යසමුත්පාද |
| 28 | 21 | අභිහම්නය | අභිභවනය |
| 29 | 24 | වේදයෙහි | මේදයෙහි |
| 30 | 3 | රූපාතිසසති | රූභාතිපසසති |
| 30 | 24 | අනඪී | අනපී |
| 40 | 22 | ආගාර | ආහාර |
| 40 | 27 | සාති | සාහි |
| 41 | 25 | තාකතත | නාසතත |
| 52 | 21 | වීදසුත් | විදසුත් |
| 56 | 4 | ඵලාපුස්ඵං | පලාලපුස්ඵං |
| 62 | 1 | පුණුණු | පුහුණු |
| 68 | 23 | භාවනාය | භාවනාව |
| 82 | 6 | යතර | සතර |
| 87 | 17 | හැතෙන | හැඟෙන |
| 127 | 5 | වගයෙන් | වශයෙන් |
| 128 | 20 | පීතිසම්පොජ්ඣඞ්ග | පීතිසම්බොජ්ඣඞ්ග |
| 132 | 18 | මැදහක් | මැදහත් |
| 147 | 27 | ආනිසංසං | ආනිසංසා |
| 159 | 12 | මෙංවෙතී | මොංවෙති |
| 159 | 13 | අක්ඛති | දුක්ඛති |

| පිටුව | පෙළ | වරද | නිවරද |
|---|---|---|---|
| 167 | 11 | සො | යො |
| 168 | 30 | ප්‍රසාද | ප්‍රාසාද |
| 174 | 2 | දෙත | දෙක |
| 174 | 7 | ආජීවපාරිශු | ආජීවපාරිශුද්ධි |
| 174 | 8 | ප්‍රත්‍යසනාතිඃශ්‍රිත | ප්‍රත්‍යසන්නිඃශ්‍රිත |
| 174 | 15 | සුරිසුද්ධො | පරිසුද්ධො |
| 174 | 16 | සලනා | සලකා |
| 175 | 1 | හැසිරෙත | හැසිරෙන |
| 175 | 19 | එයස්ම් | එසේම |
| 180 | 14 | ගැප්පීම් | හැප්පීම |
| 188 | 1 | භික්ඛභෙමකබු | භික්ඛවෙ භික්ඛු |
| 188 | 26 | ඞිත්තං | ද්වීත්තං |
| 195 | 8 | කොර | කොට |
| 196 | 7 | පරිච්චනත | පරිච්චත්ත |
| 197 | 16 | ජීවිපතරියන්තං | ජීවිතපරියන්තං |
| 198 | 2 | පගිසම්භිදා | පටිසම්භිදා |
| 199 | 22 | විඞිංසා | විහිංසා |
| 231 | 27 | රූපමාය | පරූපමාය |
| 245 | 27 | පාරිකඛකා | පාටිකඛා |
| 246 | 18 | බ්‍රහ්මෙතං | බ්‍රහ්මමෙතං |
| 260 | 29 | කමෙසු | කාමෙසු |
| 261 | 10 | ගොතකෙහි | ගොතමකෙහි |
| 272 | 35 | සබ්බසෙ | සබ්බසො |
| 304 | 8 | විචිකිච්ඡාස | විචිකිච්ඡාය |
| 321 | 1 | විධාරයන් | විචාරයන් |
| 329 | 9 | නහාපකතෙතනවාසිවා | නහාපකනෙතනවාසිමා |
| 329 | 10 | චුණ්ණෙති | චුණ්ණොති |
| 334 | 21 | දෙමයුරිත්ම | දෙසයුරිත්ම |
| 341 | 25 | නොවෙයි | වෙයි |
| 342 | 26 | සාමධි | සමාධි |
| 352 | 17 | මාරහීත්වා | මාරහිත්වා |
| 352 | 17 | වචනවා | වචත්වා |
| 359 | 18 | සංම්භාර | සසම්භාර |
| 367 | 2 | අභික්කනතම්සසවා | අභික්කම්නතසසවා |
| 367 | 3 | පටික්කච්නතසසවා | පටික්කම්නතසසවා |
| 388 | 1 | අවෙති | පසෙති |

| පිටුව | පෙල | වරද | නිවරද |
|---|---|---|---|
| 429 | 3 | පුබ්බෙනතා | පුබ්බෙනත |
| 443 | 30 | අහෙතුතු | අහෙතුක |
| 444 | 8 | මහග්ගන | මහග්ගත |
| 447 | 4 | ඇතුලවත් | ඇතුලත් |
| 451 | 22 | භූප | රූප |
| 471 | 25 | ගොගසතම්න | ගොගනම්න |
| 475 | 24 | අඣී | අජ්ජි |
| 495 | 3 | නැගිත් නහුව | නැඟිටිත් නහුව |
| 499 | 5 | අඤ්ඤඤ අඤ්ඤඤං | අමඤ්ඤඤ අඤ්ඤඤං |
| 506 | 28 | ධම්මමානං | ධම්මානං |
| 510 | 17 | කම්ය | කම්ජ |
| 515 | 2 | ප්‍රතතජ | විතතජ |
| 515 | 18 | පුජොතං | පුරෙජාතං |
| 519 | 3 | පමුදයට්ඨිති | සමුදයට්ඨිති |
| 522 | 19 | සුද්ධිමම්මා | සුද්ධධම්මා |
| 523 | 22 | පරිච්චාගචිතනයෙ | පරිච්චාගචෙතනා |
| 529 | 19 | අඞ | දඞ |
| 532 | 7 | සාසමිතො | සාසවතො |
| 533 | 12 | කෙෂවරී | කෙශවරී |
| 556 | 22 | ශවිදර්කයෝ | විදශීකයෝ |
| 574 | 20 | කායසක්ඛින | කායසක්ඛි |
| 576 | 12 | අතිජ්ඣත්තං | අජ්ඣත්තං |
| 576 | 14 | රූපෙවුට්ඨා | රූපෙ |
| 577 | 16 | සබ්බත්ත | සබ්බත්තං |
| 587 | 10 | අඤ්ඤමිඤ්ඤං | අඤ්ඤමඤ්ඤං |
| 596 | 18 | කූටවත්ථු | කුටිවත්ථු |
| 632 | 30 | යඤ්ඤා | යඤ්ඤ |
| 638 | 32 | විමපස්සනා | විපස්සනා |
| 6676 | 11 | අනත්තවෙඨා | අනත්තවෙඨන |
| 6676 | 16 | තථපිවෙසනානි | තථවෙඨනානි |
| 6676 | 34 | පයත්නා | පවත්තා |
| 670 | 20 | හරාවත්තනං | පරාවත්තනං |
| 675 | 18 | ඡවිඵට | ජවවට්ට |
| 675 | 30 | කාමච්ඡතිදදීය | කාමච්ඡන්දදීය |
| 683 | 30 | ඡන්ධ, විරය, විමස, | ඡන්ද, විරිය, විමංස |
| 687 | 19 | පිහිතං | විහිතං |

| පිටුව | පෙල | වරද | නිවරද |
|---|---|---|---|
| 687 | 23 | උවුමුජ්ජ, නිවුජ්ජ, | උම්මුජ්ජ, නිමුජ්ජ |
| 687 | 27 | වසපිවෙත්තන්ති | වසංවත්තෙන්ති |
| 691 | 3 | සඉද්ධි | සා ඉද්ධි |
| 692 | 25 | කාරෙන්තාවසීවා | කාරෙන්තවසීමා |
| 696 | 28 | ශද්දෙ | සද්දෙ |
| 699 | 16 | විනදෙසං | විතදෙසං |
| 714 | 24 | අජානහො | අජානතො |
| 714 | 28 | පවඩංනති | පවඩ්ඪන්ති |
| 71[illegible] | 1 | සංවයෙත් | සංවරයෙත් |
| 720 | 19 | අථාරයකි | අවාකාරයකි |
| 721 | 17 | පාතුභාවෙය | පාතුභාවො |
| 724 | 15 | නිකෙඛාපො | නිකෙඛපො |
| 738 | 20 | අඤත්ත | අනත්ත |
| 739 | 14 | සත්තඝත්තාහෙව | සත්තසත්තාහෙව |
| 743 | 35 | ලැබගෙන | ලැගගෙන |
| 753 | 11 | සඩ්ඪයාට | සඩ්ඪාට |
| 757 | 31 | භූපිතා | භූතො |
| 758 | 27 | අත්තම්සෙ | අත්තම්සො |
| 758 | 30 | අනෙත්ත | අනෙත්තා |
| 761 | 12 | ඉන්දු | ඉන්දා |

# ශ්‍රී සද්ධර්ම ප්‍රකාශක නියෝජිත මණ්ඩලය

———o———

1. ඩී. ජේ. රණතුංග විශ්‍රාමලත් පාඨශාලාචාර්‍යතුමා,
කැත්දලියැද්දපාළුව.
2. ඇම්. සී. සෝමරත්න විශ්‍රාමලත් පාඨශාලාචාර්‍යතුමා, මීගමුව.
3. එන්. ධම්සේන විශ්‍රාමලත් පාඨශාලාචාර්‍යතුමා. (ම. වි. සේ. දා. ස. ප්‍රධාන ලේකම්) පස්ගම්මන.
4. කේ. ඒ. පෙරේරා මුදලාලි මහතා,
(ම. වි. සේ. ප්‍රධාන සැපකරු) මල්වතුහිරිපිටිය.

## අනුග්‍රාහකයෝ

### විශේෂ පරිත්‍යාග කළ භවත්හු:

1. එච්. බී. වීරසේකර මහත්මයා, දන්ගොල්ල
වලව්ව, මැණික්දිවෙල 500 00
2. ඇන්. ඇස්. ගොඩමාන්න චිත්‍ර ශිල්පී මහතා විසින් සාරානාථ බුද්ධ ප්‍රතිමාවේ ඡායා තහඩුව සහ පිටකවරයේ චිත්‍රයත් ඡායා තහඩුවත් පරිත්‍යාග කෙරිණි. මීගමුව.
3. වැලිපිල්ලෑවේ ශ්‍රී මහා විහාරයේ අෂ්ටාංගශීලවර්ධන
සමිතිය, කැත්දලියැද්දපාළුව. රු: 200 00
4. ඒ. ජේ. හිත්ති අප්පුහාමි මැතිණිය, අංක 8
සානර පාර, බම්බලපිටිය. රු: 150 00

### රුපියල් සියය (100) බැගින් ආධාර කළ භවත්හු:

1. පිල්ලවත්තේ සුධර්මාරාමාධිපති කිනවිත්තේ වක්කලී
ස්වාමිපාදයන් වහන්සේ, මිනුවන්ගොඩ.
2 උඳම්මිට ධම්මාචාර ස්වාමීන් වහන්සේ, අගුරුකාරමුල්ල.
3. රතනසාර ස්වාමීන් වහන්සේ, ගම්පහ.
4. සුධර්මා සිල් මාතාව, වඳුරව, කුරුඳුවත්ත.
5. ඩී. ජේ. රණතුංග විශ්‍රාමලත් පාඨශාලාචාර්‍යතුමා,
කැත්දලියැද්දපාළුව.
6. ඇම්. වී. රොස්ලින් මිය. එම
7. පී. සී. වැලිවිට මයා (පියාට පිං පිණිස) එම

8. ඩබ්ලිව්. ඇල්. සමරසිංහ මයා (මාපියනට පින් පිණිස) කැන්දලියද්දපාළුව.

9. පී. ඇම්. ජී. රොද්‍රිගු මයා (මාපියනට පිං පිණිස) එම

10. ඩබ්ලිව්. ඒ. ඇල්. ජෝන් පෙරේරා මයා. එම

11. පී. ඇම්. රාජපක්ෂ මැණිකේ එම

12. සෝමවතී මුණසිංහ මිය, සූරිපාළුව.

13. ඩබ්ලිව්. ඩී. ජී. ගුණවර්ධන විශ්‍රාමලත් ප්‍රධාන පාඨශාලාචාර්යතුමා, කොස්සින්න.

14. ජී. ඇම්. සිරිසේන වෛද්‍යාචාර්යතුමා, ගනේමුල්ල.

15. ඩබ්ලිව්. ජී. ආර්. ගුණසේකර සමාදාන විනිශ්චයකාරතුමා හෙයියන්තුඩුව.

16. ඩී. ඇම්. කළුබණ්ඩා විදානෙ මහත්මය, හීලෝගම.

17. ඩී. ආර්. රණවීර මිය [ඩී. බී. රණවීර මයා වෙනුවෙන්) කිඹුල්ගොඩ.

18. ඇම්. ඇල්. තිලක් සිරි පෙරේරා මයා නුගේගොඩ.

19. දොන් මාටින් රණසිංහ මුදලාලි මයා, හීලෝගම.

20. කේ. ඩී. කන්දෞරිස් වෛද්‍යාචාර්යතුමා, වරපලාන.

21. අයි. ඇල්. දබිලින්සිංඤෝ මයා ඇඹරළුව.

22. ඇම්. ඒ. අප්පුහාමි මයා

23. සචණී අභයනායක මැතිණිය, පාමන්කඩ.

24. ඇම්. සී. සෝමරත්න විශ්‍රාමලත් පාඨශාලාචාර්යතුමා, මීගමුව.

25. මහානාම රාජකරුණා මයා. ආනමඩුව.

26. ලිලී සමරනායක මිය (ආර්. බී. ජයසුන්දර විශ්‍රාමලත් පාඨශාලාචාර්යතුමාට පින් පිණිස) අහුගොඩ.

27 මහගොඩ විතානගේ ධනපාල ධම්වර්ධන මයා. ආනමඩුව.

28. ඩබ්ලිවු. බී. ඇස්. වීරසේකර මයා. දූවමොට්ටාව.

29. ඒ. ඇම්. කපුරුහාමි ඊ. මයා (අනුරාධපුර රත්නමාලි විශ්‍රාමශාලා නීකිණි දන සමිතිය) කොට්ටුකච්චිය.

30. ඇල්බට් වේලාරත්න මයා මීගමුව.

31. වයි. මුණසිංහ මිය. මල්වතුහිරිපිටිය.

32. ජී. ඩී. ඩී. ජයවර්ධනමයා පොල්ගස්ඕවිට.

33. එච්. ඇල්. ප්‍රනාන්දු මිය. මල්වතුහිරිපිටිය.

34. එච්. පී. සොබිනෝනා මිය එම

35. ඇස්. රාජපක්ෂ දොස්තර මහත්මයා ගම්පහ.

36. එච්. වජේසිංහ හාමිනේ [සිල් මැණියෝ] පස්යාල.
37. එච්. පොඩිනා උපාසිකා මිය ර්ගම්මන.
38. ඩී. ජේ. රණතුංග විශ්‍රාමලත් පාඨශාලාචාරිනී' යොක්ගම්මුල්ල.
39. මාතික මාතා සමිතිය, කලපලුවාව (රු: 110 යි)
40. ඇඹරළුවේ දායක පිරිසක්.
41. ඔබලිච් ලූවිනා උපාසිකා මිය නාරන්වල.

## රුපියල් සියයට අඩු ආධාර එකතුව

මාලිගාතැන්නේ විවේක සේනාසනයේ දායක දායිකාවන් විසින් රු: 1349 00

ඉහතින් නම් සඳහන් කළා වූ සද්ධර්ම ප්‍රකාශක නියෝජිත මණ්ඩලයට හා අනුග්‍රාහකයන්ට ද සෙසු ලොකු - කුඩා උපකාර කළ සැමදෙනාටද අපගේ පින්දීම එක හා සමානව අයත් වෙයි. එහෙයින් සැමදෙන නිවන් සැප පතාගනු මැනවි.

මෙට,

තෙනෑත්තා ඥාණ කථා සම්පාදක.